
දශජාතක කථා
වස්තුව.

පන්සිය පනස් ජාතක පොත්වහන්සේගේ

අවශාන භාගයවන මහානිපාත වණ්ණනා නම්

දශබ්‍රාහ්මණ කථා

ව.සත්‍ය ව.

උග්ගල්බඩ මල්අස්නේ මහා විහාරාධිපතිව වැඩ විසූ

කළුතර

විමලඥානාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේගේ

ශිෂ්‍ය වූ

කළුතර ගුණානන්ද සවාමීන් වහන්සේ

විසින්

ශුද්ධ කොට සකස්කරන ලදි.

මැටිවිලියේ ගඩහාරාම විහාරාධිපති

පන්නිල සාරානන්ද ස්ථවිර පාදයන් වහන්සේ

විසින්

අවශාන ශුද්ධිපත්‍රාවලෝකනයෙන්

පිළිගන්නා ලදි.

උග්ගල්බඩ—ඇම්. ඩී. ඇස්. ජයතිලක

මැටිවිලියේ—එච්. ජෙ. ඇඩ්වින් විජේසිංහ

යන අප විසින්

දකුණු කළුතර "විද්‍යාධාර" යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදි

බුදු. ව. 2470.

ක්‍රි. ව. 1926.

සංඥාපනය.

දශජාතක කථා වස්තුව.

මෙය වන්‍යාහි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සූත්‍ර ගෙය්‍ය වෙය්‍යා කරණාදි නවාඞ්ගශාස්තෘ ශාසනයෙන් "ජාතක" නම් අඞ්ගයෙහිවූ පන්සිය පනස් ජාතක දෙශනායෙහි මහා නිපාතවර්ණනා නම් අවශාන කොට සට ඇතුළත් තෙමිය ජාතකය පටන් වෙස්සන්තර ජාතකය අවසන් කොට ඇති ජාතකදශයයි. ඒ ජාතක කථාදශය සඞ්ගීති කාරක මහාකාශ්‍යප ස්ථවිරාදි මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේලා විසින් ධර්ම සඞ්ගායනාවන්හිදී පස් මහසහි අතුරෙන් ක්ෂුද්‍රගන්ථයහිසෙහි ජාතක පාළියට අන්තර්ගත කොට සඞ්ගායනා කරනලද්දේය. බුදුරජාණන් වහන්සේ‍ගේ ත්‍රිනිර්ණීත දෙශනා වශයෙන් පැවැති පන්සිය පනස්ජාතකය අක්ෂරපදාදි කිසිවකින් අනූනව රහතන් වහන්සේලාගේ මුඛපරම්පරාවෙන්ම පැවැත අවුත් ලක්දිව වැඩවිසූ මහරහතන් වහන්සේලා විසින් ලියනලද සිංහලාර්ථකථාවන්ට ඇතුළත්ව සිංහල භාෂාවෙන්ම පැවැත්තේය.

ඉක්බිති සම්බුද්ධ පරිනිර්වාණයෙන් 953 වැන්නෙහි පමණ ලක්දිවට වැඩම වූ අර්ථකථාචාර්‍ය්‍ය අනුබුද්ධ බුද්ධඝෝෂ මහාසවාම්පාදයන් වහන්සේ විසින් කලින්කල සම්මිශ්‍රව පැවැති විභජ්‍යවාදී මත බැහැර කරමින් විභජ්‍යවාදී (අනුරාධපුර) මහාවිහාර පාරම්පරික භික්ෂූන්වහන්සේලා‍ගේ මතානුගමනය කොට ශුද්ධ මාගධී භාෂායෙන් (අර්ථකථාවශයෙන්ම) ලියනලදී ශ්‍රී බුද්ධ වර්ෂ 1791 වැන්නෙහිදී පමණ සිරිලක රජ පැමිණි **පණ්ඩිත ශ්‍රී පරාක්‍රමබාහු** මහරජාණන් දවස එම රාජොත්තමයාණන්ගේ අමාත්‍ය ධුරන්ධර **පරාක්‍රම** නම් අමාත්‍යයාණන්ගේ ආරාධනායෙන් **විරසිංහ ප්‍රතිරාජ** නම් ඇමැති ස්තපුරුෂයා විසින් හෙළදිව් වැස්සන්ගේ උභයලොකාර්ථ සිද්ධිය පිණිස මිශ්‍ර සිංහල භාෂාවට නඟා ලියනලදි.

යථොක්ත පන්සියපනස් ජාතක දෙශනාවගේ අවශාතයවූ මෙහි සඳහන් වන ජාතකදශය පඤ්චවිධ අනන්තර්‍ය්‍යානයෙන් ප්‍රථම අනන්තර්‍ය්‍යානයවූ ප්‍රාර්‍ථනාපූර්ති අනන්තර්‍ය්‍යානාවශානයෙහි සිදුවන ජාතක පරම්පරායෙහිදී පළමුවැනිකොට පිරිහෙන දශජාතකයයි, ඒ බව මනෝරථපූරණීය ආදී අටුවා කථාවන්ගෙන් හා පූජාවලිය සඞ්ඝරාජාවතාරය ආදී ප්‍රකරණ පොත්වලින්ද ප්‍රකාශවේ. මෙහි දශජාතකය නම්:— තෙමියජාතකය, මහාජනකජාතකය, සාමජාතකය, නිමිජාතකය, ඛණ්ඩහාලජාතකය, මහාසුතසෝමජාතකය, භූරිදත්ත ජාතකය, විධුරජාතකය, උම්මඞ්ග ජාතකය, වෙස්සන්තර ජාතකය. යන ජාතකාර්ථකථායෙහිද ප්‍රකාශව එන මේ ජාතක දශයයි.

"තෙමීව ජනකෝ සාමෝ — නිමිඛණ්ඩා ච නාරදෝ,
භූරි විධුර උම්මඞ්ගෝ — වෙස්සන්තර ඉමේ දස" යන පුරාණ වචන් ව්‍යවහාරව එන මේ ගාථාවෙන්ද ඒ බව සනාථ වේ.

සාමාන්‍යයෙන් සියලු බෞද්ධයන් විසින් දැන ගතයුතු මාහැනි ධර්ම කොටස් අන්තර්ගතවූ විශේෂයෙන් ආණ්ඩුවේ "සිවිල් සර්විස්" ආදි උසස් විභාගවලට හා පාඨශාලාවන්හි ඉගැන්වීමටද බොහෝ සෙයින් භාවිතා කරන උම්මග්ගජාතකය ආදි දිසි ජාතකකථාවස්තූන් ගෙන් යුත් මේ උතුම් "දශජාතකය" සිංහල බණපොත් කියවීමට ආශායෙන් සිටින උපාසක උපාසිකාදි සියලු දෙනාටද ප්‍රයෝජන වන සේ සුලභ කරවුව හොත් යහපතැයි කීප දෙනකුන් විසින් අප වෙත සැලකර සිටියෙන් පැරණි පුස්කොළ පොත් කීපයක්ද දැනට මුද්‍රිතව තිබෙන තෙමියජාතකය, ආදි පොත්ද සපයා ගෙන මීට පළමු ශුඩියට නොපැමිණි ඛණ්ඩහාල ජාතකය, මහානාරද කාශ්‍යප ජාතකය, වෙස්සන්තර ජාතකය, යන මේවා හැකිතාක් ශුඛ කොටද මුද්‍රිතව තුබූ තෙමිය ජාතකය ආදි ඉතිරි ජාතක කථාවල පළමුවාරයන් හිදී ශුඩියට නොපැමිණ තුබූ බොහෝ තැන් විශේෂයෙන් ශුඛ කොටද සංස්කරණය කෙළෙමු. තවද වෙස්සන්තර ජාතකය පිළිබඳව වර්තමාන කථාවක් (සිංහල පොතෙහි) දක්නට නොලැබුණෙන් ජාත්කාර්ථකථායෙහි පැනෙන වර්තමාන කථාව අනුව අප විසින් ඒ වෙස්සන්තර ජාතක වර්තමාන කථාවද සම්පාදනය කොට යොදන ලද්දෙමු. පුරාණ ලෙඛක කර්තෘන්ගේ අදහස් ප්‍රකාශයි හැකුණ බොහෝ වාක්‍ය කැබලි "බ්‍රැකැට්ස්" (වරහන්) ලකුණුවලින් විශෙෂ කොට යෙදූ බවද සැල කියයුතු.

මේ දශජාතක කථාවස්තුව සම්බන්ධව ශුඩිපත්‍රයක් යෙදූ නමුත් හ්‍රස්ව වියයුතු තැන් දීඝ වීම් දීඝීවිය යුතු තැන් හ්‍රස්ව වීම් ආදි මුද්‍රණයෙහිදීවූ සුලු ප්‍රමාද දෙෂයන් ඇතත් එයින් අදහස් තේරුම් ගැනීමට බාධාවක් නැති හෙයින් ඒවා ශුඩි පත්‍රයට ඇතුළත් නොකෙළෙමු. එසේම බොහෝ තැන් වල පුරාණ පොත්වල හැටියට "සඛම්ප" කියා මෙහි යෙදී ඇතත් එහි ශුඛ පාඨය "සම්ප" කියාම බවද දතයුතු.

තවද මෙහි අපගේ ප්‍රමාදදියෙන්වූ යම් දෙෂයෙක් ඇත්නම් එය ප්‍රාඥයන් විසින් ශුඛ කරනු ලැබේවා

මහත් පරිශ්‍රමයක් වීද කරනලද අපගේ මේ ව්‍යාපාරය ලොකශාසන සඛ්‍රහය පිණිසම වේවා.

මෙම සත්කෘත්‍යය සම්බන්ධව පශ්චාගල ඇලබඩ විහාර නිවාසී කොට පිටියේ වංසානන්ද සථවිරපාදයන් වහන්සේ බොහෝ සෙයින් ආධාරකළ බවද ගෞරවයෙන් සිහිපත් කරමු.

මිට. ශාසනසපිති කාමී

කළුතර ගුණානන්ද භික්ෂු

2470 මැයි 3 වැනි ගුරු දින
1928 උත්තල්බඩ මල්අස්නේ
---මහා විහාරස්ථානේ දීඝ.

ශුද්ධිපත්‍රය.

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
2	35	කුමාරුහණ	කුමාරුහරණ
3	37	මේ සොරුන්ගෙන්	මේ සිරගෙන්
,,	40	එළවව	එළවව-
4	4	තෝ	තී
6	40	පඟකෙට	පහකොට
,,	41	දනුඟ	දනුම්ඟ
7	9	බිහරි	බිහිරි
,,	20	පොළඹන්ට	පොළඹවන්නට
,,	23	සන්‍ර පඟස්	සන්‍රිහු පඟස්
		ඔහු පමණෙක් නොවෙති	
11	4–5	බොහෝ දනව් වැස්සෝද	යනු වැඹිසි
		රැස්ව පඹුරු දෙන්නාහු වෙති	
,,	23	කවර	කවර
12	21	වැඩද	වැඹද
13	6	වහන්සේ	වහන්සේ
19	12	මහණවාවූහුය	මහණවූවාහුය
22	21	සිටු ා	සිටුවා
,,	30	එමුණු	බමුණු
23	17	එබස් අසා විවාළහ	විවාළහ එබස් අසා
26	20	සෙලොස්	සොළොස්
28	23	මහා	මාහා
,,	27	කවිය	කැවිය
31	3	කු ා කෙල්ල	කුඩා කෙල්ල
40	9	පමණක්	පමණවත්
,,	16	පමණක්	පමණවත්
42	15	හඳුකාපිලානිය	හඳුකපිලානිය
44	22	සඞ්ඝවිදෙහානං	සඞ්ඝවිදෙහානං
46	10	ගෙඳරවි	ගෙදෙරට
51	7	පණස්ගෙදුන	පනස්ගොදුන
,,	19	මහතරය	මහෘතරකය
52	21	මැරවවුන්	මැරවූවන්
,,	34	බෙ ත්	බෙහෙත්
63	17	යමපා හු	යමපල්හු
,,	41	කටුකයෙන්	කටුයෙන්
55	10	එබස්	යනුවැඹිසි
,,	22	පිරවරා	පිරිවරා
62	2	ඇනිනියාන්	ඇතිතියාත්
68	6	සකියක්	සතියක්

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
70	11	සඞ්ඛ්‍යත	සඞ්ඛ්‍යාත
,,	31	ඇතව	ඇතිව
,,	36	පරි රණය	පරිහරණය
86	14	කම්මුස්තන්	කම්මිස්තන්
92	15	සාමීපයට	සමීපයට
93	39	ශක්‍රදෙ ේන්ද්‍රයෝ	ශක්‍රදෙවෙන්ද්‍රයෝ
95	9	නාකියා	නොකියා
96	32	පාමිණියාවූ	පැමිණියාවූ
97	20	අඹුල	ඇඹුල
98	38	නිගාණ්ඨාජීවකයෙක්	නිගණ්ඨාජීවකයෙක්
99	10	අමා ෘයන්	අමාත්‍යයන්
,,	23	රජ්ජුරු ේ	රජ්ජුරුවෝ
100	25	ගුණන	ගුණ්‍යාම්
102	2	ශාස්ත්‍රාදියෙන්	ශස්ත්‍රාදියෙන්
,,	19–20	මිදෙන්නා	මිදෙන්නාහ
,,	34	නො වත්නාවූ	නොපවත්නාවූ
103	40–41	පිහිටියෙගි	පිහිටියෙමි
104	7	දූසොරඩකු	දූසොඩකු
,,	17	මු රි	මුඛරි
,,	43	කාමරනියම	කාමරතියම
105	28	විශෙෂකාට	විශෙෂකොට
106	11	බ්‍රාහමයණන්	බ්‍රාහමණයන්
108	23–24	බිජකන	බිජකනම්
,,	29	යසසවා	යසස්වා
,,	33	අඥනයත්	අඥනයන්
109	4	කම්ඵ ය	කම්ඵලය
,,	16	දෙකිස් ඔසුපත්	සොළොස්ඔසුපත්
,,	17	ෙ අලාත	මේ අලාත
110	12	පාපයනේ	පාපයන්
113	39	දිව්‍යපුත්‍ර	දිව්‍යපුත්‍රව
125	18	දෙනකුත් සිතවූ	දෙන කුත් සිතවූ
128	25	පිණිය	පිණිස
,,	40	බරණැස්නුවරක	බරණැස්නුවර
130	7	වදන	වදනා
,,	17	සුණුකාට්	සුණුකොට
133	36	වදසූ	වැසූ
134	44	ඇත්තා	ඇත්තාවූ
137	13–14	වේලෙහි	වේලෙහි
,,	32	බණා	බමුණා
,,	44	ධනධාන්‍යාදි	ධනධාන්‍යාදීන්
138	40–41	ඇ්හරණයන්	සම්හරණයෙන්

පිට	පෙළ	අශුඛ	ශුඛ
139	5	නැවත	නැවත
,,	6	යාච්ඤුවන්	යාච්ඤුවෙන්
,,	9	වම	මට
140	24	සිත්	සිත්
,,	35	ෙපපගේ	තොපගේ
142	23	ලද්දේ	ලදදෙ
143	7	වනයට	වනයට
,,	33	මාණීන්‍ය	මාණික්‍ය
144	2	හසින්	පසින්
,,	9	ප්‍රයවය	ප්‍රසවය
145	28	උතුම්වන්නේය	සුදුසුවන්නේය
150	4	දමසි	දම්සි
151	26	ආලම්බයා	ආලම්බනයා
,,	40	මා අතින	මා අතින්
152	38	පැරදයේ	පැරදගියේ
154	39	තුන්වෙක්	තුන්විටක්
155	23	රාජ්‍යහැර	රාජ්‍යයහැර
,,	25	නුඹවහන්වස්ත්	නුඹවහන්සේත්
157	17	තබති	නොතබති
158	15	කාණාරිටය	කාණාරිට්ඨ
,,	34	අත්පාමෙවෙහර	අත්පාමෙහෙවර
160	18	කෙට	කොට
165	42	දවේ	දෙව්
166	3	මහාමාතාදීන්ට	මහාමාත්‍යාදීන්ට
168	24	මහාබ්‍රාහමයා	මහාබ්‍රහ්මයා
173	22=23	හිම්ගහීයක්	හිම්ගහීයක්
175	34-35	නොකොරේද	නොකෙරේද
,,	35	පුරුෂය	පුරුෂයා
176	3	විමාංසභුෂණය	මාංසවිභූෂණය
,,	15	කොරෙව්‍ය	කොරව්‍ය
,,	21	ඥත	ඥත
179	24	කාමෙත්තේය	කාමෙත්තෝය
182	18	රජ්ජුවන්ගේ	රජ්ජුරුවන්නේ
183	8	එටුවන්	ඔටුවන්
,,	22	බදුම	බුදුවු
184	38	යක්	ඒක්
186	10=11	අජානීය	ආජානීය
187	38	කරවනැවැම්සන්	කරනාවැමියන්
188	27	ගැවසීගත් ාවූ	ගැවසීගත්තාවූ
189	22	මාණීකක්‍ය	මාණික්‍ය
191	20	අතුන්	ඇතුන්
,,	38	රජ්ජුරුවගන්ස	රජ්ජුරුවන්වහන්ස

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
192	3	මොකියන්නෙහිය	මොකියන්නෙහියැ
,,	25	රජ්ජුරු	රජ්ජුරුවන්
194	25	පැවැතිකලහි	පැවැතිසල්හි
,,	26	ගොස	ගොස්
195	19	ප්‍රසාදයයි	ප්‍රාසාදයයි
291	39=40	නොකකෙරේද	නොකෙරේද
206	13	හස්ත්‍යාවාශ්‍යිය	හස්ත්‍යාවාශ්‍යියන්
,,	44	විමලාවගන්ට	විමලාවන්ට
212	25	ආභාරණයෙන්	ආභරණයෙන්
213	3	අන්තැකින්	අන්තැයෙකින්
,,	20	සවමිව	සවාමීව
215	27	රජ්ජුවන්	රජ්ජුරුවන්
216	21	වැදුම්	වැදුම්
,,	22	වැන්දයතු	වැන්දයුතු
,,	23	නොකියාට	නොකියාම
218	2	අහුර රට	අහුරට
,,	33	ෙප	තොප
220	46	දව්‍ය	දිව්‍ය
221	6	මෙසේ ා	මෙසේ මහා
,,	20	ඉදින	ඉදින්
,,	25	නාගඝන්‍යා නිසා	නාගඝන්‍යාව නිසා
222	12	මසදවසක්	මාසදවසක්
225	41	ඛ වද	බදුවද
228	5	බුඩාඩකුරයණන්	බුඩාඩකුරයාණන්
,,	16	කෙනකුව නැතිව	කෙනකුට සෑහ නැතිව
231	4	එවම්හයි	එළවම්හයි
,,	2	එවා පියම්දූයි	එළවාපියම්දූයි
,,	40	තැනැතහු	තැනැත්තහු
234	25	විාවළසේඝ	විවාළයේඝ
238	5	නැහෙනහිරි	නැගෙනහිරි
240	35	නෙත් පිළි	තෙත් පිළී
241	43	ශ්‍රේෂ්ඨතරයකු	ශ්‍රෙෂ්ඨතරයකු
242	26	ශඛකි සමපන්න	ශකනිසමපන්න
244	9	වෙත්වූයි	වෙත්වයි
,,	19	යිපගෙළෙහි	සිපළෙහි
245	5	පෙනෙඛි	පෙනෙයි
,	25	ඤ්හරයදී	මුත්හරයදී
,,	37	ප්‍රයෙජන	ප්‍රයොජන
246	21	අවීවාශ්‍යී	අවීවශ්‍යී
247	9	වැදහොත්	වැදහොත්
,,	31	සමුනාණෙම	සමුනාණෙම්

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
248	31	සිමැදුර	සිමැදුරු
249	9–10	පහ දැසි	පහරිදැසි
257	40	අවිවි	අවිච්
260	7	සම්පතනයහ	සම්පත්තනයහ
263	17	අතිබව	ඇතිබව
266	37	නිතබා	ගිනිතබා
269	37	සවෙරුජ	සවෙරුජ
270	11–12	විව යෙන්	විවරයෙන්
,,	26	පුතණුන්ට	පුතණුවන්ට
271	22	යන්නාවූද	යන්නාද
274	30	සු විදිනේ	සුව විදිනේ
279	25	එතෙක්ම	එතෙක්ම
280	5	නනතුරු	තනතුරු
,,	9	නැතිව	නැතිව
,,	25	හිමා යවන	හිමාලය වන
281	6	සඬපාල	සඬපාල නම්
,,	7	කෙනක්	කෙනෙක්
282	36	රසය	රහස
284	29	රජ්ජ්රුවන්ට	රජුරුවන්ට
285	25	සෙවනාවෙන්	සෙනාවෙන්
,,	27	යුතුනොවේවයි	යුතුනොවෙයි
286	6	ප්‍රකාරවූවීනමූත්	ප්‍රකාරවීනවූත්
,,	41	පණ්ඩිගන්ගේ	පණ්ඩිතයන්ගේ
288	5	එකොළොස්	එකොළොස්
,,	31–32	පුත යුකනිය නපුරු කොට පසුන්බව. දැන	යතුවැඹියි
289	12	අස්වළල්ලට	ඇත්වළල්ලට හා අස්වළල්ලට
,,	25	රජ්රජුරුවෝ	රජුරුරුවෝ
290	37	වහ	වහා
291	26	වදුසේඛා	වදුළුයේඛ
,,	30	හීමාලයෙන්	හිමාලයෙන්
,,	39	හැරහෙන	හැරගෙන
292	11–12	කැමැත්තත්	කැමැත්තක්
293	39	සත්‍වයන්	සත්‍යයන්
294	2	දජ්දරුවෝ	රජ්දරුවෝ
,,	30	එරුපශ්වයිය	රූපෙශ්වයිය
296	25	මහවහ	මහ
299	19	එකතින්	එකතින්
303	6	පමණ	පමණක්
305	7	කිහ	කිය
,,	8	කිව්ය	කිහ
,,	9	කිහ	කිය
	36	ගිජුවූ	ගිජුව
306	41	යශදෘකවූ	යශදෘකවූ
309	25	ලද්දුනහි	ලද්දුනම්
,,	27	එවූස්ක	එවූසේක
312	29	වට	මට

පිට	පෙළ	අශුද්ධ	ශුද්ධ
314	21	තියා	කියා
"	33	ප්‍රකාශකො	ප්‍රකාශකොට
319	22	මහමරෙ	මහමෙරු
"	39	සුලු මහ උමඟ	සුලු උමඟ මඟ
321	32	පකාරී	උපකාරී
"	33	සහන්සේ	වහන්සේ
323	8	යෙවිට	මෙවිට
324	38	ෘ නව	මෑනව
325	20	ප්‍රත්‍ර්‍ත්‍යුත්පන්න	ප්‍රත්‍යුත්පන්න
344	38	රාජමානයන්	රාජමානයෙන්
346	2	වල්	වැල්
"	3	බඹුරුවු	බමරුවු
350	31	ආභරණයන්	ආභරණයෙන්
252	32	කු ා රිකාවන්	කුමාරිකාවන්
"	39	හොට	කොට
355	29	ඛනතිය	ඛත්තිය
356	22	අඤ්ඣරෙ	පඤ්ඣරෙ
357	17	චිතතානතය	චිතතානතය
360	12	පරබ්‍රාජිකාවන්	පරිබ්‍රාජිකාවන්
362	9	දකාරකඛනෙ	දකරකඛනො
"	31	මාහැ	මාහා
363	11	රකාව	කරව
"	12	තව	තනිව
"	27	ඡබෙඛ යි	ඡබෙඛතයි
365	17	ප්‍රතෙක්දූයි	යනු වැඩියි
266	2	පිවිරාජානං	පවිරාජානං
"	"	දූනි	දූතානි
368	11	අයි	ඇයි
"	24	අනිටඨාය	අනිහටඨාය
370	26	පණඩිතා	පණ්ඩිතං
372	8	ඇස්රොම්	අස්රොම්
"	30	අරාදෙවි	අමරාදෙවි
379	8	රපශ්‍රී	රූපශ්‍රී
"	12	වවසන	වසන
380	36	ගුගුළේය	ගුගුළාය
"	38	බ ඟ	බටඟ
381	15	ලකත්	ලතත්
382	22	ඝට	ර්ට
383	4	ඇනි	ඇතිනි
"	12	ර්මටම	ර්මමට
384	27	කිවාය	කිඟ
"	28	කිඟ	කිවාය
390	42	වෙනයපුත්‍ර	වෙතපුත්‍ර
395	30	සිගත	සිටගත
399	39	කනෙහි	තනෙහි
400	43	ආසිටිය	ඇසිටිය
401	36	කිඟ	කිය
406	38	සත්ස්මක්	සත්මසක්
407	32	අකෙපය	අකොපය

මහා නිපාත වණ්ණනාවෙහි

දශ ජාතක කථා වසත්‍රුව.

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

නෙමි ච ජනසො සාමො
නිමි ඛණෙඩා ච නාරදෙ
භූරි විඩුර උම්මගෙහා
වෙසසනතර ඉමෙදස.

මූගපක්ඛ (තෙමිය) ජාතකය.

තවද එක්සමයෙක්හි සකල ජනහිතවිධායක විසුඛබුද්ධි ඇති සරණා නිධානවූ සම්‍යක් සම්බුද්ධ සර්ඥරාජෝත්තමයාණන් වහන්සේ සැවැත්නුවර නිසා දෙවුරම්වෙහෙර වැඩවසතසේක් මේ මූගපක්ඛ ජාතක ධර්මදෙශනාව තමන්වහන්සේගේ මහඛිනික්මන් අරබයා ගෙනහැර දක්වා වදාළසේක.

එක් දවසක් ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂුහු බුදුන්ගේ මහඛිනිත්මණෙහි ගුණ කිය කියා උන්නාහුය. සර්ඥයන්වහන්සේ එතැන්හි වැඩ "මහණෙනි! දැන් මා එන්නාට පූර්වභාගයෙහි මේ ධර්මසභාවෙහි සාවර කථාවෙකින් යුක්තව උනුද"යි විචාරා, නුඔවහන්සේගේ ගුණ කිය කියා උනුම්හයි කී කල්හි, "මහණෙනි! දැන් පුරණලද බොධිසම්භාර ඇති මා විසින් රාජ්‍ය සම්පත්තිය හැර මහඛිනික්මන් කළ නියා ආශ්චර්‍යම් නොවෙයි. මම වනාහි නුමූහුකළාවූ ප්‍රඥ ඇති කල්හිද දැනසීලාදිවූ සම්නිස් පෙරැම් පුරන්නෙම්, මේ රජසැපත් හැර මහඛිනික්මන් කෙළෙම්මවේදැ"යි වදාරා, ඒ මහණුන් විසින් ආරාධිතවූ සර්ඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

මේ කෙසේදයන්?

පෙර බරණැස්නුවර කසි නම් රජෙක් දැහැමින් රාජ්‍යය කරන්නේය. ඒ රජහුගේ සොළොස් දහසක් බිසෝවරු වූවාහුය. ඔවුන් අතුරෙන් එකද සත්‍රියකටත් දුවක් හෝ පුතෙක් නූපන්නේය. නුවරවාසීහු අපගේ රජ්ජුරු වන් වහන්සේගේ වංශය රක්ෂාකරන්නාවූ පුත්‍රයෙක් නැතැයි කුසජාතඝා යෙහි ආවාවූ ක්‍රමයෙන් රැස්ව රජහට කියන්නාහු ප්‍රභාකු ප්‍රාර්ථනාකරවයි කීවාහුය. රජද ඒ සොළොස් දහසක් බිසෝවරුන්ට පුත්‍රයන් පතවයි කීයේය. ඒ සත්‍රීහු ඒඤ්ඤ සූර්‍යාදීන්ට වැඳීම් පිදීම් ආදීවූ උපස්ථාන කොට ප්‍රාර්ථනාකරන්නාහුද දරුවන් නොලැබූහුය. ඒ රජහුගේ සීලාචාරාදි ගුණ

ධර්මයෙන් යුක්තවූ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසවක් ඇත. ඒ බිසවුන්ට දරුවන් ප්‍රාර්ථනාකරවයි රජ කියේය. එකල්හි චන්ද්‍රාදේවීතොමෝ පෞර්ණමී දිනයෙහි පෙනෙවස් සමාදන්ව මිටියානෙක සැතපෙන්නී තමාගේ සීලය පරීක්ෂාකොට සත්‍යක්‍රියාකරන්නී මම අඛණ්ඩකොට රක්ෂාකළ සිල් ඇත්තෙමි මේ සත්‍යවචනය හෙතුකොටගෙන මට දරුවෝ ඇතිවෙත්වයි මෙසේ සත්‍ය ක්‍රියා කළාය. ඇගේ සීලානුභාවයෙන් ශක්‍රභවනය උණුඅඟුරු දැක්විය. සක්දෙවිරජතොමේ පරීක්ෂාකොට ඒ කාරණය දැන චන්ද්‍රාදේවී පුතකු පතන් නීය. ඇට සුදුසුවූ පුතකු බලනුයේ බොධිසත්වයන් දුටුයේය. එකල බොධි සත්වයන් වහන්සේ මියිඅවුරුද්දක් බරණැස රාජ්‍යයකොට එයින් චුතව ඔසුපත් නරකයෙහි උපන්සේක්ක් අසූදහසක් අවුරුදු එහි පැසී තවුතිසා භවනයෙහි උපන්සේක. ඒ දිව්‍යලොකයෙහිද ජීවිතාන්තය දක්වා සිට් එයින් චුතව මත්හෙහි දිව්‍යලොකයෙහි උපදනා කාමනිවිය. ශක්‍රදෙවෙඳුතොමේ උන්වහන්සේ සවම්පයට ගොස් කියනුයේ යහළු තොප මිනිස්ලොව උපන්කල්හි තොපගේ පාරම්ිතාන් පිරෙන්නාහ. මහජනයාට මහත් වැඩදවන්නේය. කසි රජහුගේ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසවුතොම පුතකු පතන්නිය. ඇගේ කුස පිළිසිඳ ගනුවසි කියේය. එකල්හි මහබෝසතාණන් වහන්සේ සක්දෙවිරජහුගේ වචනය පිළිගෙන පන්සියයක් දිව්‍යපුත්‍රයන් හා සමග ඒ දිව්‍යලොකයෙන් චුතව තමන්වහන්සේ චන්ද්‍රා නම් බිසවුන් කුස පිළිසිඳ ගන්සේක. සෙසු දිව්‍යපුත්‍රයෝද අමාත්‍යයන්ගේ භාර්‍යාවන් කුස පිළිසිඳ ගත්හාහුය. බිසවගේ කුස විදුරු පිරුවාක් මෙන් වූයේය. ඒ බිසව තොම ගබ පිහිටි බව දැන රජහට දැන්වූවාය. රජ ඒබව දැන ගබපෙරහර දෙවූයේය. ඕතොමෝ පිරුනු දරුගබ් ඇත්තී පින්ලකු ණු ඇත්තාවූ පුතකු වැදුවාය. එදවසම ඇමැත්තන්ගේ ගෙවලද පන්සියයක් කුමරුවෝ උපන්නාහ. එකල්හි රජ ඇමතිගණ පිරිවරා මතුමහල්තලයෙහි උන්නේය. ඉක්බිති ඒ රජහට කුමාරයා උපන්බව කීවාහුය. ඕහට එබස් අසාම පුත්‍රසෙනහය උපන්නේය. ඒ සෙනහය සිවිආදිය විනිවිද ගොස් ඇටමිදුලු පැහැර සිටියේය. ඒ චිත්තාඛ්‍යානාකාරයෙහි ද්‍රිනිය උපන්නීය. ළය සිහිල් වූයේය. මාගේ දුනුයාගේ ඉපදීමෙන් තෙපි සතුටුවූදැයි අමාත්‍යයන් විවාළේය. එසඳ අමාත්‍යයෝ කුමක් කියනසේක්ද දෙවයන්වහන්ස! අපි පෙර පිහිටක් නැත් තමින දැන් වනාහි පිහිටක් ලදුමින. අප විසින් හිමිකොනොකුන් ලබනලදැයි කීවාහුය. මාගේ පුත්‍රයාට පිරිවර උවමැනව එබැවින් අමාත්‍ය කුලයෙහි උපන් කුමරුවන් මෙහෙසැයි බලා නියම දැන එවයි මහාසෙනතුත්‍තය යන අමාත්‍යයකුට නියොගකෙළේය. ඒ අමාත්‍යතෙම පන්සියයක් කුමරුවන් දැක අවුත් රජහට දැන්විය. එසඳ රජ සතුටුව පන්සියයට කුමාරභණගමන්කාරවා පන්සියයක් කිරිමවුන්ද ගමන්කාරවිය. ඉතා උස් සත්‍රින්ගේ ඇතයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කර දික්වන හෙයින්ද ඉහා මිටි සත්‍රින්ගේ ඇතයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කර ලුහුඬුවන හෙයින්ද ඉතා වැහැරි සත්‍රින්ගේ ඇතයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කලවා රිදෙන හෙයින්ද ඉහා තරවූ සත්‍රින්ගේ ඇතයෙහි හිඳ කිරිබොන දරුවන්ගේ කකුල් බඳලවන හෙයින්ද ඉතා කළු සත්‍රියගේ ශරීරය සිහිල් හෙයින්ද ඵලළු සත්‍රියගේ ශරීරය උෂ්ණ හෙයින්ද හුනුතන ඇති සත්‍රියගේ කිරිබොන දරුවන්ගේ නාසා පැතලිවන හෙයින්ද සමහර සත්‍රින්ගේ කිරි ඇඹුල්රස හෙයින්ද

සමහර සත්‍රීන්ගේ කිරි කුළුරස ආදිවූ වෙන වෙන රස ඇති නෙසින්ද මේකී සියලු දෝෂ ඇති සත්‍රීන් හැර මධුරවූ කිරිඇති තනසිරි සිව්සැටක් කිරිමවුන් බෝසතාණන්ට තෝරාදී මහත්වූ සත්කාර කොට වඳුරුදෙවින්වද වරයක් දුන්නේය. ඒ වඳුරුදෙවිතොමෝ ඒ වරය කැමතිවිට ඇරගනිමියි නොගෙන තිබුවාය. ඒ කුමාරයාට නම් තබන්නාවූ දිනයෙහි ලක්ෂණ කියන්නාවූ බ්‍රාහ්මණයන්ට බොහෝ සත්කාර කොට ඔහුට මහු උපද්‍රවයක් ඇද්ද නැද්දැයි විවාළේය. ඔහු ඒ කුමාරයාගේ සාමුද්‍රිකා ලක්ෂණ සමුදය දැක මහරජ්ජුරුවන් වහන්ස! මේ තෙම ඉතා පින්ඇති කුමාරයෙක. මේ එකදිවසින තබා සතරමහා දිවසින රාජ්‍යය කරන්ට සමර්ථවන්නේය. ඔහුට වාහි කිසි උපද්‍රවයක් නුදුටුම්හයි කීවාහුය. ඒ බමුණන් කී නිමිති අසා සතුටුවූ රජ තෙම කුමාරයාට නම් තබන්නේ මොහු උපන්දවස සියලු කසිරට තෙමා වැසි වටහෙසින්ද තමාගේද ඇමති ආදීන්ගේද සිත් තෙමෙමින් උපන් හෙයින්ද "**නෙමිය කුමාරයෝය**"යි නම් තුබුයේය. ඉක්බිති උපන් එක්මැසි කුමරුවා සරහා රජහුගේ සමීපයට ගෙනගියාහුය. රජතෙම ප්‍රියවූ පුත්‍රයා බලා වඩාගෙන ඇසයෙහි හිදුවා සතොසයෙන් සතහා උන්නේය. එකෙ නෙහි සොරුන් සතරදෙනෙකු ගෙනාවාහුය. රජ ඔවුන් අතුරෙන් එකකුට කටු සැමිටියෙන් දහසක් පහරදෙවයි කියා එකකු ඇඟිල්ලේ ලවයි කීයේය. එසෙකුගේ අත්පා සාපාහරුවයි කීයේය. එකකු උල නිබවයි නියොග හෙළේය. මහබෝසතාණෝ පිය රජ්ජුරුවන්ගේ වධයෙහි යෙදීම් අසා භයින් තැතිගෙන මාගේ පිය රජ්ජුරුවන් වහන්සේ. රාජ්‍යය කිසා නිරය ගාමීවූ බොහෝ අකුසල් සොට නැසෙනසේකැයි සිතුසේක. දෙවෙනි දවස් උන්වහන්සේ සේසතයට සරහනලද ශ්‍රී යහන් මසාසනයෙහි පිනවූවාහුය. ඒ කුමරුද මදක් සැනපී පිබිදුනේය. ඇසහයා සේසත බලන්නේ මහත් ඓශ්වර්‍යයි දුටුසේය. සවභාවයෙන්ම අකුසලයෙහි හා ඇත්තාවූ ඔහුට ඓශ්වර්‍යයි දැක අධිකතරවූ භය උපන්නේය. ඒ රාජකුමාරතෙම මම මේ රජගෙට සොතැන්හි සිට ආයෙම්දැයි ජාතිසමරණඥානයෙන් බලනුයේ දිව්‍ය ලොකයෙහි සිට ආබව දැන එයින් ඇතත් බලනුයේ නරකයෙහි පැසුනුබව දුටුසේය. එයිනුදු ඇතත් බලන්නේ එම නුවර රාජ්‍යය සළබව දුටුසේය.

තමන් විසිඅවුරුද්දක් රාජ්‍යයකොට එතැන්හි සිඛවූ අකුසලයෙන් අපු දහසක් අවුරුදු නරකයෙහි පැසුනෙමි. නැවතත් දැන් මෙම සිරගෙයිම උපනිමි. මාගේ පියරජ්ජුරුවන වහන්සේද ඊයේ දවස් සොරුන් සතර දෙනකු ගෙනාකල්හි ඔවුන්ට කැපීගවූ තෙපුල් කියනුයේ තමාත් නරකයෙහි ඉපදීමට සුදුසුබස් කීසේය. ඉදින් මම් මහු රාජ්‍යය කෙරෙම්නම් නරකයෙහි ඉපිද මහත් දුක් අනුභවකෙරෙමියි සිතින් සලකන්නාහට මහත් භය උපන්නේය. ඔහුගේ රන්වන්වූ ශරීරය අතින් පිරිමදිනලද පියුමක් මෙන් මලා නිසාව නිසෙසොභාවිය. මේ සොරුන්ගෙන් කෙසේ මිනුම්දිය පියා දිනා හොත්තේය. පෙර ඔහුට එක් ජාතියෙක වවූ සේසතයෙහි වසන එක් දෙවතාවක් ඔහු අස්වසා එබඳු හෙම්‍යකුමරුය! නොබයවන්නයි කියා ඉදින් මේ රාජ්‍ය සම්පත්තියෙන් මිදෙනු කැමැත්තේවීනම් නොපිළිගත් [illegible] දිව නොගොළුව ගොළුවව මේතුන් අහ ඉවාගෙන [illegible] නොනහවා අන්තඃපුර පිටි පුරවාසී ජනයාට අභයදුන්නා මේ කාල කණ්ණියා රජගෙන් නිකුත් කරවයි කියා නිතුකරුන පිරිද්දෙන් පවත්නේ

වෙහිද? එසේ සාල්හි තොපට නොකැමැති රාජ්‍යය හැර තපඃසමයාමෙන් වැඩ සිඳවන්නේයයි කිවාය. ඒ කුමාරතෙම දෙවිදුවගේ බස් අසා එම්බල දිව්‍ය සත්‍රිය! තෝ මට වැඩ පිණිස යමක් කියෙහිද? ඒ තොප කී පරිද්දෙන් නොරෙමියි තුන්අත ඉඩාගෙන ඒවූ පරිද්දෙන් පවත්නේය.

එසේසාල්හි ඒ කුමාරයා උකටලිනොවන පරිද්දෙන් ඒ පන්සියයක් කුමාරවරු ඔහු එක්ව වසන පරිද්දෙන් සැලැස්වූයේය. ඒ පන්සියයක් කුමරුවෝ කිරට හඬති. මහබෝසතාණන්වහන්සේ අපාය භයින් භයපත්වූ සේක් රාජ්‍යය කිරීමට වඩා නිරුනාරව ඉයයාම උතුමැයි කිරට නොහඬන සේක. කිරිමවූ එපවත් චන්ද්‍රාදෙවීන්ට කිවාය චන්ද්‍රාදෙවී රජ්ජුරුවන්ට දැන් වූවාය. රජ්ජුරුවෝ නිමිති දන්නා බ්‍රාහ්මණයන් කැඳවා විචාළෝය. බමුණෝ කියන්නාහු දෙවයන්වහන්ස කුමාරයා කිරිබොනවේලාවඉක්මවා කිරිදෙන්ට වටනේය. එසේ සාල්හි ඒ කුමාරතෙම අඩමින් තනය දැඩිකොට ගෙන තෙමේම කිරි බොන්නේයයි කීවාහුය. එහෙන්පටන් ඒ කුමාරයාට වේලා ඉකුත් නොට කිරිදෙන්නාහුය. එසේ දෙන්නාහුද් සමහර දවසෙක වේලක කිරි නොදෙති සමහර දවසෙක දෙවේලෙහිම කිරි නොදෙති ඒ කුමාරතෙම එසේත් නොහඬන්නේය. එසේසාල්හි නොහඬන්නාවූ ඒකුමාරයාට මෑනියෝ හෝ කිරිමවූ හෝ මාගේ දරුවෝ සතින් පීඩිතයහයි කිරි පොවති සෙසු දරුවෝ කිරි නොලත්සාල්හි මහහඬින් හඬති. ඒ කුමාරතෙම එසේ නොහඬන්නේය නොනිදන්නේය අනපයද නොදික්කරන්නේය සතා නොඅසන්නේය.

එසේසාල්හි ඔහුගේ කිරිමවූ පිළු අයගේ හඤ්ඤාදයෝ මෙසේ නොවෙති ගොළු අයගේ හනුතෙළවර මෙබදු නොවෙති බිහිරි අයගේ කන්සිදුරු මෙසේ නොවෙති මේවූසකලි පවාකොට ගත්දෙයක් වන ඒ පරිඤ්ඤාකරම්හයි සිහා පළවූකොට කිරෙන් පරිඤ්ඤාකරම්හයි රැ දුවල් කිරි නොදෙති. ඒකුමාර තෙම කිරිනොබී වියලෙන්නේත් කිරට නොහඬන්නේය. එසේ නොහඬන කල ඔහුගේ මෑනියෝ මාගේ දරුවෝ සාදුකින් පීඩිතයෝය. ඕහට කිරි දෙවයි කියා දෙවන්නාහ. මෙසේ අතරතුරෙහි කිරිනොදී අවුරුද්දක් මුළුල්ලෙහි පරිඤ්ඤාකරන්නාහු මේ කාරණය නුදුටුවාහුය. නැවත පරිඤ්ඤාකරන්නාහු බාලදරුවෝනම් පූපාපූපයට කැමතිවෙති. ඉන් ඔහු පරිඤ්ඤාකරම්හයි පන්සියයක් කුමරුවන් ඔහුලහ හිදුවා නොයෙක් පූපාපූපයන් ඵලවා ලහ තබා තොප කැමති අවුලක් ගනුවයි කියා සැහවී සිටියාහුය. එසේසාල්හි සෙසු දරුවෝ විවාදකොට ඔවුනොවුන් පහරනාහු ඒ ඒ අවුළුනෙහ අනුභව නොරෙහි. මහබෝසතාණන් වහන්සේ වහාහි එම්බා තෙමිය කුමාරයෙනි! තොපි නරඇදුක් කැමැත්තහුද? මේ කැවුම් කැමැත්තහුදැයි කියා නරඇ භයින් භයපත්ම ඒ කැවුම් දිසාවද නොබැලූසේක. මෙසේ අවුරුද්දක් පූපාපූපයෙන් පරිඤ්ඤාකොට එසිනුදු සිදුරක් නොදැක බාලදරුවෝනම් පලා පල කැමතිවෙති. බොහෝ පලාපල ගෙන්වා එසිනුදු පරිඤ්ඤාකළාහ. සෙසු කුමරුවෝ සටන් කරත්නවුන් මෙන් පලාපල උදුරා කති. මහබෝසතාණන් වහන්සේ ඒ දිසාවත් නොබලනසේක.

මෙසේ පලාපලයෙහුත් අවුරුද්දක් පරීක්ෂා කළාහුය. නැවත බාල දරුවෝ තම් කෙළිබඩුවට ප්‍රියවෙති. රත්රන් රිදියෙන් කරනලද ඇත් රූ අස් රූ ආදිය එලවා තිබුවාහුය. සෙසු දරුවෝ උදුරාගන්නවුන් මෙන් කෙළිති. බෝසතාණන් වහන්සේ ඒ දිසාවත් නොබැලූසේක. මෙසේත් අවුරුද්දක් පරීක්ෂාකළෝය. බෝසතාණන් සතර ඇවිරිදි වයසට පැමිණි කල්හි සතර අවුරුදු කුමරුවෝ නම් භොජනයට ප්‍රියවෙති එසිනුත් මොහු පරීක්ෂාකරම්හයි නොයෙක් ආහාර එලවූහ. සෙසු කුමරුවෝ පිඬුපිඬුකොට අනුභව කෙරෙති. මහබෝසතාණන් වහන්සේ වූකලී නරක හසින් භය පත්ව එබඳු තෙමිය කුමාරයෙති! තොප ආහාර නොලත් ජාති ගණනෙක් නැත මේත් එබදු කොට සලකවයි ආහාර තිබූ දිසාවත් නොබැලූසේක. කිරිමවු තමන් සිත් නොසැහෙන හෙයින් තුමූම ගෙන අතින් වැළඳවූවාහුය. ඉක්බිති පස්ඇවිරිදිවූ කල්හි කුමරුවෝ නම් හින්නට භයවෙති එසිනුත් විමසම්හයි නොයෙක් දෙරණි මහත් ගෙයක් කරවා තල්කොළවලින් සොයවා සෙසු කුමරුවන් හා සමඟ බෝසතාණන් ඒ ගෙමැද හිඳුවා ගේ හිනිඇවුළුවාහුය. සෙසු කුමරුවෝ අඩා ගෙසින් නික්මුණාහුය. බෝසතාණන්වහන්සේ ව්‍යාඝ්‍රි නරක හින්නෙන් පැසීමට වඩා මේ උතුමැයි නිරෝධ සමාපත්තියට සමවන්නාහු මෙන් නිශ්චලව උන්සේක් ඉක්බිති හිනි එන කල්හි එසින් පහකළාහුය.

ඉක්බිති සාවිරිදිකල්හි සාවිරිදි කුමාරයෝ නම් මහතුන්ව බැනී. ඇතුන් හික්මවා සෙසු කුමරුවන් පිරිවරා රජගෙයි මලුවෙහි හිඳුවා ඇතුන් මුදති. ඔහු කුසඳනාදයොට සොඬ බිම ගසා දිව එති. සෙසු කුමරුවෝ මරණ භයින් භයපත්ව ඒ ඒ දිග දිවෙති. මහබෝසතාණන් වහන්සේ නරක භයින් භයපත්ව එහිම රැඳහිදිනාසේක. භික්ෂූනු ඇත්තෙම උන් වහන්සේ සොඬින් ගෙන ඇත්මැත්තොට නොමිරිකාම යන්නේය. සත් ඇවිරිදි කාලයෙහි කුමරුවන් හා උන් බෝසතාණන් සමීපයට දළ උපුටා මුඛ බැඳ සපියින් ඇරියාහුය. සෙසු කුමරුවෝ මහඬින් හඬා දිවයෙති. මහබෝසතාණන් වහන්සේ නරක දුක් සලකා ඒ නරකදුක් විදීමට වඩා සපියාගේ මුඛයෙන් විනාසවීමම උතුමැයි නිශ්චලව හිඳිනාසේක. සපියෝ සියලු ශරීරය වෙලා මුදුන්හි පෙනයනොට හිඳිති. එසේත් නිශ්චලවම උන්සේක. මෙසේ අතරතුරෙහි පරීක්ෂාකරන්නෝත් සිදුරක් නුදුටුවාහුය. ඉක්බිති අටඇවිරිදි කුමරුවෝ නම් නළුනාටක කැමැත්තෝයයි පන්සියයක් කුමරුවන් හා සමඟ ඔහු රාජාඞ්ගණයේ හිඳුවා නළුනාටක පෑවැත්වූවාහුය. කුමරුවෝ නැටුම් ආදිය දැක යහපතැයි යෙති. මහත්තොට සිනාසෙති. බෝසතාණෝ වූකලී නරක යෙහි උපන් නොපට ඇසිල්ලකුත් සිනාවෙක්වත් සොම්නසෙක්වත් නැත්තේම වේදූයි නරකදුක් සලකා ඒ නැටුම් නොබලා නිශ්චලව හිඳිනාසේක. මෙසේ අතරතුරෙහි පරීක්ෂාකොටත් සිදුරක් නොදැක නැවත මොහු කඩුවෙන් පරීක්ෂාකරම්හයි කුමරුවන් හා සමඟ රජගෙයි මලුවෙහි හිඳුවා ඔවුන් පෙළනාකල්හි එක් පුරුෂයකු එවති. ඒ පුරුෂතෙම දූවානසේ සුදුවූ කඩුවක් ඉස සිසාරම්න් පැන පැන නාදකරම්න් නසී රජ්ජුරුවන්ගේ එක් කාලකණ්ණි පුතෙක් ඇත්ද, ඒ කොයිද? ඔහුගේ ඉස මේ කඩුවෙන් සිඳිම්යි දිව ඈය. ඔහු දැක සෙසු කුමරුවෝ මහඬින් හඬා පලා ගියාහ. බෝසතාණෝ වූකලී නරක දුක් සලකා නොදන්නාක්හු මෙන්

නිශ්චලව උන්සේක. ඉක්බිති ඒ පුරුෂතෙම කඩුවෙන් ඉස පිරිමැද තොප ගේ ඉස මේ කඩුවෙන් කපමියි භයගන්වා වලිතකොට ගතනොහී පහවිය. වෙස් අතරතුරෙහි විමසා සිදුරක් නුදුටුවාහුය. දසඇවිරිදිකල්හි වනාහි මොහුගේ බිහිරිබව විමසම්හයි, බෝසතාණන් හෝනා ඇඳ තිරයකින් වටකර සතරපිට සිදුරු සතරක් තබ්බවා ඔහු නොදක්වාම ඇඳයට සක්පිඹින්නන් හිඳුවා එසපැහැර සක් පිඹවති. රජගෙය එකතින් නාදවන්නේය.

අමාත්‍යයෝ ඇඳ සතර දිශාවෙහි සිට තිරයෙහි සිදුරෙන් බලා එස දවසකුත් බොධිසත්ත්වයන්ගේ සිහැඟෙනිවීමක්වත් අතපය දිගුකිරීමක්වත් සෙලවීම් පමණවත් නුදුටුවාහුය. මෙසේ අවුරුද්දක් ගිය කල්හි නැවත අනික් අවුරුද්දෙත් බෙරහඬින් විමසන්නාහු අතරක් නුදුටුවාහුය. ඊට ඉක්බිත්තෙන් පානින් පරිභෝගකාරම්හයි රාත්‍රිභාගය අදුරෙහි අතපය සොල වන්නේ නොවේදැයි කළය ඇතුළේ පානක් අවුළුවා සෙසු පඟන් නිවා මදක් අදුරෙහි ඉඳුවා කළයෙන් පානගෙන එසවිටම එලිකොට ඉඳිම් සිටිම් අඳිද්දෙ හෝසි විමසති. මෙසේත් අවුරුද්දක් විමසන්නාහු ඔහුගේ මදකුත් අතපය සෙල්වීමක් නුදුටුවාහ. ඉක්බිති පැණියෙන් විමසම්හයි සඛකීය ශරීරය පැණි ගල්වා බොහෝ මැස්සන් ඇතිතෙනක පිතුවා මැස්සන් උතුළුවති. ඒ මැස්සෝ ඔහුගේ ඇහවසාගෙන ඉදිකටුවෙන් විදිනාමෙන් විදිති එතෙම නිරොධසමාපත්තියට සමවන්නාක්හු මෙන් නොසැලෙන්නේය. මෙසේත් අවුරුද්දක් විමසන්නාහු ඔහුගේ සිදුරක් නුදුටුවාහුය. ඉක්බිති ඔහු තුදුස් ඇවිරිදි කල්හි දැන් මේතෙම මහත්වූයේය. පවිත්‍ර කැමැත්තේය. අපවිත්‍ර යට පිළිකුල් කරන්නේය එසේහෙයින් අසුචියෙන් විමසම්හයි, එතැන්පටන් ඔහු නොනාවති අතපය පිරිසිදු නොකෙරෙති එතෙම මලමූත්‍රකොට එහි සැතපෙන්නේය දුගඳියෙන් ඔහුගේ අතුනුබත්හු පෙරලෙන සලක්මෙන් වූයේය.

එකල්හි ඔහු ඇඟ මැස්සෝ වසාගෙන සිටි එබඳු තෙමිය කුමාරයෙනි! දැන් නොපි මහත්ව ගියන ඇමතුල්හි කවරෙක් තොප අතපය පිරිසිදු කරන්නේද? හොපට ලජ්ජානැත්තේ කිම්ද? කුමක්හෙයින් සැතපෙව්ද නැගිසිට තොපගේ සිරුරු පිළිදුහුම්කරවයි කියා නිසුකෙරෙති එතෙම එබඳු පිළිකුල්වූ අමෙධ්‍යයෙහි ගැළුනේද සියක් යොදුනෙන් ඇත සිටිය වූන්ගේ ශරීරයෙහි ගඳින් බඩපෙරලෙන තරම්වූ අමෙධ්‍යනරකයෙහි දුගඳිය සලකා උපෙක්ෂාවූයේය. මෙසේ අතරතුරෙහි අවුරුද්දක් පරීක්ෂා කරන්නාහු ඔහුගේ සිදුරක් නොදුටුවාහුය. උතුණෙන් පිඹිනව වෙදනා සහනයකොට ගතනොනී වලිතවූයේවීනම් යෙහෙකැයි සිතා ඉක්බිති ඔහු හොත් ඇඳයට ගිනිකබල් තිබුවාහුය. ඇඟ පොළමෙන් බිබිලි නැංගේය එසේත් මහබෝසතාණෝ අවිවිමහානරකයෙහි ගිනිදැල් සියයක් යොදුනෙහි පැනිර සිටින්නේය ඒ නරකයෙහි ඉපිද විඳිනා දුකට වඩා මේදුක් සියයක් ගුණෙන්ද දහසක් ගුණෙන්ද ඉතා උතුමැයි ඉවසා නිශ්චලවූසේක.

ඉක්බිති ඔහුගේ මවුපියෝ ළය පැලියන්නාක්මෙන් සොහව මිනි සුන් පහකරවා ඔහු ඒ ගින්නෙන් පහසෙට පුත තෙමිය කුමාරයෙනි! අපි තොපගේ නොපිළිබැව් ආදිය දනු හ ඒ එසේවය ඒ පිළු ආදින්ගේ පය මුව කන්සිදුරු මෙබදු නොවෙති තොප අප විසින් ප්‍රාර්ථනාකොට ලත්

පුතෙක අපා නොනසව සියලු දඹදිවෙහි රජුන්ගේ සම්පයෙන් වත නිසුවෙන් අප මුදවයි යාච්ඤාකළාහුය. ඒ කුමාරතෙම ඔවුන් විසින් මෙසේ යාච්ඤා කරනලද්දේනොඇසෙන්නාක්හුමෙන් නිශ්චලවම්හොත්තේය. ඉක්බිත්තෙන් ඔහුගේ මවුපියෝ එතනින් අඩමින් පහව සමහර කලෙක පියරජ තනිව හොස් යාච්ඤාකරයි සමහර කලෙක මැනියෝ හොස් යාච්ඤාකෙරෙත් මෙසේ අවුරුද්දක් මුළුල්ලෙහි අතරතුරෙහි විමසන්නාහුද ඔහුගෙන් සිදු රක් නුදුටුවාහුය ඉක්බිති සොළොස්වයස් පිරුනුකල්හි කොරඅය වේවා ගොළුබිහිරිඅය වේවා මූනුකළ වයස්හි ඇලුම් කටයුතු දෙයෙහි නොඇලෙන් නාහුද අප්‍රිය වසතුවෙහි ප්‍රියවන්නාහුද නැත මල්පිපෙන කල මල් පිපෙන් නාක්මෙන් මේතෙම ලොකසවභාවයෙන එහෙයින් මොහුගේ සම්පයට කාවකසත්‍රීන් ගමන්කරවා පරීක්ෂාකරම්හයි සිතා ඉක්බිති දෙවහනන් බදුවූ උතුම් රූඇති සත්‍රීන් කැඳවා නොප අතරෙන් යම් සත්‍රියක් කුමාරයා සතුටුනරන්නවවත් කෙලසබඤ්ඣනයෙන් බඳින්නටවත් හැකිවේද ඕම ඔහට අගමේහෙසුන් වන්නීයයි කියා කුමාරයා සුවඳපැනින් නහවා දෙව්කුමරු වකුමෙන් සරහා දෙව්විමනක් බදුවූ ශ්‍රී යහන් ගබඩාවෙහි මනාකොට පනවනලද යහන්මත්තට වඩා සුවඳදුම් මල්දම් සුවඳ ආදියෙන් ඇතුළු ගබඩාව එහා සුවඳ පිඩක්මෙන් කොට ඉක්බිති ඒ නාටඤසත්‍රිහු ඔහු පිරිවරා නැටීම් ගී කිම් මිසුරුබස් කිම් ආදීවූ නොයෙක් ආකාරයෙන් සිත් පොළඹන්ට උත්සාහ කළාහුය ඒ තෙමිය කුමාරතෙම තමා හුවණැතිබැවින් එසේ නොයෙක් ආකාරයෙන් සිත්ගන්ට උත්සාහකරන සත්‍රීන් බලා මොහු මාගේ ශරීරයෙහි සුවඥාහස් නොවින්දහෙත්වාසි සුසුම් රදවා මළමිනියක් සේ දැඩිකොළේය එවේලෙහි සත්‍රීහස් වින්දනොහී මේ කුමාරතෙම සජීප්‍ර කාරයෙන් දැඩිවූ සවභාව ගුණ ඇත්තේය මේ එකාන්තයෙන් තදඑකෙ කැසි මවුපියන්ට දැන්වූහ මෙසේ අතරතුරෙහි විමසන්නාවූ මවුපියෝ ඔහුගේ අතරක් නුදුටුවාහුය මෙසේ සොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි සොළොස් මහාපරීක්ෂාවකින් හා නොයෙක් කුඩාපරීක්ෂාවලින් පරීක්ෂාකරන්නාහු දැනගත නුහුනුවාහුය ඉක්බිති පියරජ්ජුරුවෝ කලකිරි නිමිත්ත පාඨකයන් ගෙන්වා තොපි කුමාරයා උපන්දවස් මෙතෙම මහපිනැත්තේය මෝහට උපද්‍රවයෙක් නැතැයි කිව එතෙම දැන් කොර ගොළු බිහිරි වූයේය එහෙයින් තොපගේ කථා සමනොවන්නෝයයි කිවාහුය දැන් කුමක් කර මෝදැයි බමුණන් අතින් විවාළකල්හි බමුණෝ කියන්නාහු මේ කුමාරතෙම මේ රජතෙයි වසන්නේවීනම් නුඹවහන්සේගේ ජීවිතයට හෝ රාජ්‍යයට හෝ අගමෙහෙසුන් බිසවට හෝ උපද්‍රව වන්නේය එසේනෙයින් අවමතුල් රථයට අවමතුල් අපුන්යොදා එහි ඔහු ඉදුවා බටහිරිදොරින් නිකුත්කොට අමුසොහොනෙහි ඔහු වළලන්ට යුතුපතැයි කිවාහුය රජතෙම උපද්‍රව අසා හයින් යහපතැයි ගිවිස්සේය වඤ්ඣාදෙවී එපවත් අසා රජහු කරා පැමිණ රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ විසින් පළමු වෙන් මට වරයක් දෙනලදී ඒ වරය මට දුනමැනවයි කීවාය රජහු විසින් තොප කැමති වරයක් ගනුවයි කීකල්හි මාගේ පුත්‍රයාට රාජ්‍යය දෙවයි කීවාය දෙවීනි! තොපගේ පුත්‍රතෙම කාලහණ්ණියෙන එහෙයින් රාජ්‍යය දියනොහැක්කේයයි කියේය.

රජ්ජුරුවන්වහන්ස! දිවිනිමියෙන් නොදෙනසේක් ඒනම් සත්අවු රුදිදසට දුනමැතවැයි ඉල්වා එසේත් නොලැබ සාවුරුදිදකටය. පස්අවු රුදිදසටය යහාදි ක්‍රමයෙන් පසළොස්දවසක්දක්වා ඉල්වා එසේත් නොලැබ ඉක්බිති සත්දවසකට දෙවයි ඉල්වාගෙන ඕතොම රජකුමාරයන් කුමාර හරණයෙන් සරහා තෙමිය කුමාරයන්ගේ රාජ්‍යයයි නුවර බෙරලවා නුවර සරහවා පුත්‍රයා ඇතුපිට තබ්බවාගෙන සේසත මුදුනට කරවා නුවර පැදකුණුකොට ආවා ඔහු ශ්‍රී යහන් මත්තෙහි සතප්පවා පුත තෙමියකුමාර යෙනි! තොප නිසා පොළොස් අවුරුදිදක් නිදිනොලැබ හඬන්නාවු මාගේ ඇස් විලිස්සි හියේය සොඳයෙන් ළය පැලෙන්නාක්මෙන් විය තොප සොර පිළු ගොළු බිහිරි බැව් ආදිය නොවනබව දනිම් තෙපි මා අසරණ නොකරවසි සියලු රාත්‍රිය මුළුල්ලෙහි යාච්ඤාකාළාය මෙම ක්‍රමයෙන් දෙවෙනි දවස්ද තුන්වෙනි දවස්දැයි පස්දවසක් යාච්ඤාකළාය සවෙනි දවස් රජතෙම සුනන්ද නම් රථාචාර්‍යයා කැඳවා එම්බල රථාචාර්‍යය! තෝ සෙට උදැසන අව මතුල් රථයක් අසුන් යොදා කුමාරයා එහි නඹාගෙන බස්නාහිරි වාසල් දොරින් ගෙනගොස් අමුසොහොනෙක්හි සිව්රැස් වළක් කැණ ඔහු ඒ වළෙහි ලා උදලුපිටින් ඔළුව තලා මරාපියා මුදුනෙහි පස්ඹබා ඉස්සොඳ නහා එවයි විධාන කෙළේය. සවෙනි රාත්‍රියෙහිද යාච්ඤාකරන්නාවූ මැනියෝ පුත තෙමියකුමාරයෙනි! කසිරජතෙම සෙට තොප අවුසොහොනෙක්හි වළලන්ට නියොග කෙළේය. සෙට මරණට පැමිණෙව දරුවෙනි කීවාහුය. ඒ අසා එම්බල තෙමිය! නා විසින් සොළොස් අවුරුදිදක් කළ වීර්‍යඵල මුදුන් පැමිණෙන්නේයයි සිතන්නාවු මහබෝසතාණන්වහන්සේට ප්‍රීතිය උපන්නීය. මැනියන්ට ළය පැලෙන්නාක්මෙන් සොක උපන්නේය. එසේ කල්හිද මාගේ සිත මුදුන් පැමිණෙන්නේයයි මැනියන්ට කථානොකළසේක. ඉක්බිති ඒ රාත්‍රිය පාන්වූකල්හි උදැසනම් සුනන්ද නම් රථාචාර්‍යයා රථය යොදා ගෙන දොරකඩ නඹා ශ්‍රීයහන් ගබඩාවට වැද දෙවිනි! මට නොකීපෙව රජහු ගෙන් නියොග ලදිම් ආම් ඉවත්වුව මැනවැයි පුත නුවන් සිපගෙන හොත් මැනියන් පිටිඅත්ලෙන් ඉවත්කොට කුමාරයා මත්තඹක්මෙන් වඩාගෙන මාලිගාවෙන් බස්නටවන මවුබිසවු ළෙහිඅත්ගසා මහහඬින් මතුවාල්තෙලෙහි උන්හ. වැටී හුන් මැනියන් දැක මා බැනනොනැගි කල්හි ළය පාලී මිය යහියන් අලාභය බැන නැගෙම්මෙනෝසි සිතා ඉදින් බැන නැගෙම් නම් සොළොස් අවුරුදිදක් ගත් දුක් හිස්වන්නේය බැන නොනැගෙම් නම් දෙමවුපියන් වත් මටත් පිහිටවෙමිසි ඉවසුසේක. ඉක්බිති රථාචාර්‍යයා සවාමිදරුවන් රථ යෙහි ලාගෙන බස්නාහිරි වාසල්දොරට අභිමුඛව පැදේ ය. රථසඟ එලි පහෙනි වැද හියේය මහබෝසතාණන් වහන්සේ රථසඟෙහි අඩ අසා මාගේ සිත මුදුන් පැමිණියේයයි ඉහා සතුටුවූසේක. රථය නුවරින් නික්ම දෙවියන් නේ මිහිමයෙන් දෙළොස්ගවුවක් හියකල්හි එතන සුපුෂ්පිත වනලැහැබක් අවුසොහොනඟැයි සිතා වළලන්ට මෙතන යහපතැයි මාවනින් ඉවත්කොට රථය නඹා රථයෙන් බැස බොධිසත්ත්වයන්ගේ ආභරණ පොදියක් කොට නඹා උදැල්ල ගෙන නුදුරු තෙනක වළක් කපන්නට පටන්ගත. එවේලෙහි සවාමි දරුවෝ උන්සාහසඟරන්ට සලැයි සිතා සොළොස් අවුරුදිදක් අතපය නො සෙල්වූයෙමි. කිමෙක්දෝයි මට අතපය වසඟ වේදෝයි බලන පිණිස නාභීසිට වමනින් දකුණතද දකුණතින් වමතද දැතින් පයද මිරිඟා රථයෙන්

බැස ඔබමොබ සක්මන්කොට මෙසේම යෙමිනම් එකදු සාරසියයක් ගවු යන්ට ශක්තිය ඇත්තෙමියි දැන ඉදින් මේ රථාචාර්යතෙම මට විරුද්ධවිනම් ඔහු මැඩපවත්වන්ට මට ශක්තිය ඇත්තේමෙහෝයි කායබල පරීක්ෂාකරනු පිණිස රථය පසු කෙළවර අල්වා පැටියන් කෙළනා යානාවක් මෙන් ඔසවා එබදු ශක්තිය ඇතැයි දැන සිටි ඒ බෝසතාණන්ට ආභරණ පැළඳිමට සිත් උපන් නේය. ඒ සිත හා සමග සක්දෙවිරජහුගේ පඬුඇඹුල්සලස්න හුණුවිය. සක් දෙවිරජ ඒබව දැන තෙමිය කුමාරයන්ගේ මනොරථය මුදුන් පැමිණියේය. ආභරණයෙන් සැරසෙමියි සිත් උපන. මෝහට මිනිස් පළඳනායෙන් කිම් දැයි දිව පළඳනාව හා සමග විශ්වකර්මයා එවූයේය. ඒ අවුත් දහසක් සළු පටින් ඉස වෙළා බැඳ නොයෙක් නිර්මිත පළඳනායෙන් සක්දෙවිරජහු මෙන් සුරහා ගියේය. ඔහු ගියපසු රථාචාරිහු වළකණින තෙනට ගොස් සමීපයෙහි සිට රථාචාර්යයා හා සමග කථාකරනසේක් රථාචාර්ය! පුහුව කුමක්නිසා වළකණිද? වළකාණ ගතයුතු අලජාතියෙක් පෙනෙන්නේත් නැත. අමුතුව වළසන්වා ලිය යුතු දෙයක් පෙනෙන්නේත් නැත. මාවිවාරනලද සබඳ! තෝ කියව. වළින් තට ප්‍රයෝජන කිම්දැයි? විවාළසේක. එබස් ඇසූ රථාචාර්යයා වළ සාරසාරම උඩනොබලාම කසිරජහුගේ කොරපිළි බිහිරිවූ පුතෙක්උපන. ඔහු වළලන පරිද්දෙන් නියොග අසාගෙන රථයකින් ගෙන හැර තෙල තැන තබා වළ කණිමි කිය.

එබසට එම්බල රථාචාර්යය! මම ගොළුවූයේත් නොවෙමි බිහිරිවූයේත් නොවෙමි කොරපිළුවූයේත් නොවෙමි ඉදින් සැක ඇත්තේවිනම් රන් තෙ හෙල්කඳන් වැනි මාගේ කලවා බල එරාවණයාගේ සොඩවැනි මාගේ අත් සඟල බල කුරළි තෙපුල්වැනි මියුරු තෙපුල් අස, කොර පිළි ගොළු බිහිරි පුතකු වළලන්ට රජහු නියොගකළබව මුත් මාසේ ලක්ෂණ සම්පන්න දිව කුමරුවකුවැනි පුතණුකෙනකු වළලන්ට මපියාණන්වහන්සේ නොවදුරන සේක. නොකිවාකරන්නාවූ තෝ අධර්මයක්කරන්නෙහියයි සිතමියි කිසේක. එබස් අසා රථාචාර්යතෙම කර ඔසවා බලන්නේ රුවින් අගපැමිණියාවූ ඒ කුමාරයන් දැක දෙවතාවෙක්ද්‍යෙහෝ මිනිසෙක්ද්‍යෙහෝයි තෝරාගතනොහී විචාරන්නේ සවාමිනි! නුඹවහන්සේ ගාන්ධාරී දිව්‍යපුත්‍රයාණ කෙනෙක්ද? ශක්‍ර දෙවෙන්ද්‍රයාණ කෙනෙක්ද? කාගේ පුතණුකෙනෙක්දැයි විවාළේය. එබස් අසා ගාන්ධාරීදිව්‍යපුත්‍රයෙකුත් නොවෙමි සක්දෙවිරජත් නොවෙමි. යම් රජක්හුගේ පුතකු වළලන්ට ගෙනායේවිනම් ඒ කසිරජහුගේ පුත්වූ ඒ තා කිඹන තෙමිය කුමාරයෝ නම් මමය. සැතපුනු රුකින් පතක් බිඳීම මිත්‍රධර්මය නොවෙයි. තට බත්දෙන රජ්ජුරුවෝ සැතපෙන්නට සෙවන දෙන රුක වන්නේය. මම ඒ රුක ශාඛා වැන්නෙමි. තෝ ඒ රුක් සෙවන සැතපුනු එසක්හු වැන්නෙහිය. සැතපුනු රුකින් පතක් බිඳි තැනැත්තේ මිත්‍රද්‍රොහිවනකල තට බත් පිළිදී රක්නා රජහුගේ පුත්වූ මට මේසා අපරාධයක් සිතන්නාවූ තෝ කෙසේ නම් මිත්‍රද්‍රොහී නොවෙහිදැයි වදුළසේක. මෙසේ බෝසතාණන් කියන කල් හිත් අදහා නොගත්තේය. ඉක්බිති බෝසතාණන් වහන්සේ මොහුට මාගේ කථාව අදහවම්යි වනදෙවියන්ගේ සාධුකාරයෙන් තමන් වහන්සේගේ කට හඬින් ඒ වනය එකතුන් නාදකෙරෙමින් ගාථා දසයකින් මෙසේ මිත්‍ර ගුණ වදුළසේක.

එම්බල රථාචාර්යය! මේ ලොකයෙහි යමෙක් තමාට වැඩකරන්නාවූ මිත්‍රජනයාට ද්‍රෝහ නොකෙරේද හෙවත් හිත සිත් ඇත්තේ වේද ඒ පුරුෂ තෙම තමා ගෙන් නික්ම අන්තැන හියෙත් නිද්‍රකින් බොහෝ කනබොන දෑ ලබන්නේද ඔහු නිසා බොහෝ දෙනා ජීවත්වන්නාහුද වෙනි නැවත යම් දනව්වකට හෝ නියම්ගමකට හෝ සේද ඒ හිය හිය තැන්හි බොහෝ ජනයාගෙන් පූජාලබන්නේය. තවද ඒ මිත්‍රද්‍රෝහි නොවන්නාවූ පුද්ගලයා සොරහුද මැඩපැවැත්ත නොහෙන්නාහුය. අපරාධ ඇහත් රජදරුවෝ ඕහට අවමන් නොකොට හෙන්නාහු වෙනි තෙමේ සියලු සතුරන් මැඩපවත් වින්නේය තමාගේ ගෙට පවා කිපි සිත් නැතුවම එන්නේය මහජනයා උන් සභාවට පැමිණි කල්හිද මිත්‍රද්‍රෝහි ජනයාගේ නුගුණ කියනු අසා තමාගේ ගුණයෙන් තෙමේ ඉහා සතුටුවන්නේය. එබදු පුරුෂතෙම තම සිත ක්‍රෝධ නැහිහෙයින් අනුන්ට සත්කාර කොට තෙමේත් සත්කාර ලබන්නේය අනුන්ට ගෞරව කොට හෙමේත් ගෞරව ලබන්නේය. තමාගේ ගුණ කථාව හා සතුති ඝොෂාව නොනසා රක්ෂාකරන්නේය මිත්‍රද්‍රෝහි නොවන්නාවූ පුරුෂතෙම තමා උපකාරී හෙයින් පූජාකටයුත්තට පූජාකොට තෙමේත් පූජාලබන්නේ බුබාදි මහඋන්ට නමස්කාර කිරීමෙන් පරලොව තෙමේත් නමස්කාර ලබන්නේය මහත් පරිවාර සම්පත්තියට හා ගුණ කථාවට පැමිණෙන්නේය මහත් ගිනිකඳක් මෙන් තේජසින් දිලිසෙන්නේය දෙවතාවකුසේ ශරීර වර්ණයෙන් බබලන්නේය ඓශ්වර්‍යයෙන් නොපිරි හෙන්නේය ඕහට ගෙරිසරක් බොහෝ වෙනි කෙත්වත් වපුලබිජු නොනැසී පලදෙන්නේය බොහෝ දූදරුවන් ලබන්නේය මිත්‍රද්‍රෝහී නොවන්නාවූ පුරුෂතෙම යම් කලෙක කඳුරැලියකින් හෝ ප්‍රපාතයකින් හෝ රුකකින් හෝ වැටුණොත් අතර පිහිටක් ලබන්නේය හාත්පස හටගත් මුල් ඇසටු හා අරළු ඇති මහත් නුගරුක් මාරුතය යම්සේ උදුරාලිය නොහේද? එසේම මිත්‍රද්‍රෝහි නොවන්නාවූ ඒ පුරුෂයා සතුරෝ මැඩපැවැත්ත නොහැක්කාහු වෙනි එසේ හෙයින් සුනන්‍දය! තා විසිනුදු මිත්‍රද්‍රෝහ නොකටයුත්තේයයි වදාළසේක.

එකල්හි සූනන්‍ද නම් රථාචාර්‍යයා මෙසේ බණ වදාරන්නාවූ මහ බෝසතාණන්වහන්සේ හැඳිනගත නොහී මේ කවරෙක්දැයි විමසනු පිණිස රථය බලා එහි තෙමිය කුමාරයනුත් ආභරණත් නොදැක නැවත ඇවිත් බලන්නේ බෝසතාණන් හැඳින පය වැදහෙව නැහිට දෙහොත් මුදුනෙහි බැඳ කියනුයේ සවාමීනි! රාජකුමාරයන් වහන්ස! නුඹවහන්සේ මාගේ බසින් දැන් නුවරට මා හා කැටිව වැඩියමැනව නුඹවහන්සේගේ පියරජ්ජුරුවන්ගේ මාලිගාවටම කැඳවාගෙන යමි කියේය. එකල්හී බෝසතාණෝ එම්බල රථාචාර්‍යය! තා විසින් කියනලද ඒ රාජ්‍යයෙන්ද නැයන්ගෙන්ද මට කම් නැත රාජ්‍යය නම් අධර්මයෙන්ම ලැබෙන දෙයකැයි වදාළසේක.

එබසට රථාචාර්‍යතෙම සවාමීනි! රාජකුමාරයන්වහන්ස! නුඹවහන්සේ මාගේ බසින් දැන් නුවරට වැඩිසේක්වීනම් සත්රුවන් වැසි වස්නාක්මෙන් නුවර වැස්සෝද නුඹවහන්සේගේ මවුපිය දෙදෙනාද මට සතුටුපඬුරු දෙති ඔහු මතු නොවෙති අන්තඃපුර සත්‍රීහුද රාජකුමාරයෝද වෛශ්‍යයෝද සතුටුව මට පඬුරු දෙන්නාහු වෙති ඇතරුවෝද අසරුවෝද රථාචාරීහුද පාබල

සෙනහඳ යන සියල්ලෝම සතුටුසිනින් මට පඬුරු දෙන්නාහු වෙති ඔහු පමණෙක් නොවෙති බොහෝ දනව්වැස්සෝද රැස්ව පඬුරු දෙන්නාහුවෙති ඔහු පමණෙක් නොවෙති බොහෝ දනව්වැස්සෝද රැස්ව පඬුරුදෙන්නාහු වෙති එහෙයින් මා කෙරෙහි කරුණාවෙන් වැඩවදුළ මැනවසි යාච්ඤා කෙළේය. එබසට මහබෝසතාණන් වහන්සේ එම්බල රථාචාර්‍යය! මම මවුපිය දෙදෙනා විසින් හරන ලද්දෙමි නියංගම් වැස්සන් හා රට වැස්සන් විසිනුත් හරන ලද්දෙමි. නැවත සියලු රජකුමරුවන් විසිනුත් හරන ලද්දෙමි මා සන්තක ගෙයකුක් එහුවරෙහි නැත්තේය. වර ඉල්වා දරුවන්ට රාජ්‍ය සම්පත්තිය දෙන මැනියන් විසිනුත් හරන ලද්දෙමි එසේම සෙනහ ඇති පිය රජ්ජුරුවන් විසිනුත් මම් නිරපෙක්ෂව හරන ලද්දෙමි එබැවින් හුදකලාව මේ වලට පැමිණියාවූ මම පැවිදිවනු කැමැත්තෙමියි වදාළසේක.

මෙසේ තමාගේ ගුණ සිහිකරන්නාවූ බෝසතාණන්ට ප්‍රීතිය උපන්නීය. ඒ ප්‍රීතියෙන් උදන් අනනසේක් එම්බා රථාචාර්‍යය කල්බලා ක්‍රියා සිඩියට යුහුසුළු නොවන මනුෂ්‍යයන්ගේ ආසාඵලය සිඩවන්නේය ඒ එසේ මය මම සොළොස් අවුරුද්දකින් සිඩවූ මනොරථය ඇත්තෙමි තවද එම්බල රථාචාර්‍යය! ඉතා ශීඝ්‍රතොව ක්‍රමයෙන් උපමායෙන් අර්ථසිඩිය කැමැත්ත වුන්ට මනාවූ වැඩෙක්ම සිඩවන්නේය. ඒ එසේමය. කිසි භයක් නැතිව මේ ගිහිගෙයි බන්ධනයෙන් නික්මුණාවූ මම සමෘඩවූ මනොරථය ඇත්තෙමි මාගේ අදහස මෙසේම දනුවසි වදාළසේක.

එකල්හි රථාචාර්‍යතෙම සාමිනි! තෙමිය කුමාරයන් වහන්ස! ගොළු නොව කිසි පැකිලීමක් නැති ලීලාවෙන් යුක්තවූ මෙබදු මධුර තෙපුල් ඇත්තාවූ නුඹවහන්සේ කවරහෙයකින් මවුපිය දෙදෙනා සමීපයෙහිදී කථාවක් නොකළසේක්දැයි විචාළේය. එබසට බෝසතාණෝ එම්බල රථාචාර්‍යය! මම කලවා ආදීන්ගේ ශුෂ්කවීම නිසා කොරවූයේත් නොවෙමි ශ්‍රොත්‍රප්‍රසාදය නැත්තේත් කිහිරිවූයේත් නොවෙමි දිව නොපෙරළෙන්නේත් ගොළුවූයේත් නොවෙමි එතකුදුවුවත් පෙර මේ බරණැස් නුවර රාජ්‍යයට පැමිණ විසි අවුරුද්දක් රාජ්‍යශ්‍රී අනුභව කොට එහි කරනලද පවින් නරකයෙහි ඉපිද එහි අසූදහසක් අවුරුදු පැසි මහදුක් වින්දෙමි පූර්ජාතිය සිහිකරන්නාවූ මම රාජ්‍යයෙහි අභිෂෙක කරන්නාහුයයි සිතා මවුපිය දෙදෙනා හා සමඟ කථා නොකෙළෙමි එම්බල රථාචාර්‍යය! එක් දවසෙක මාගේ පියරජතෙම මා උකුලෙහි තබාගෙන රාජ්‍යය අනුශාසනා කරනුයේ එකෙණෙහි බැඳ ගෙන එන්නාවූ සොරුන් සතරදෙනකු දැක එකකු මරවයි කීය. එකකු සිරගෙයි ලවයි කීය එකකු සැතින් විද කාරං ලවයි කීය එකකු දිවස් උලතබවයි කීය ඒ රජහුගේ පවිටු බස් ඇසුවාවූ මම නොගොළුව ගොළු වීමෙන්ද නොපිළුව පිළුවීමෙන්ද මාගේ මල මුත්‍රයෙහිද තැවරී වාසය කෙළෙමි. එම්බල රථාචාර්‍යය! මෙලොව සත්ත්වයන්ගේ ජීවත්වීම තෙමේ දුක්ය බොහෝ කලක් පවත්නේනම් යෙහෙක ඉදින් සවලජකාලයක් පවත්නේ නමුත් දුක් නොවී නම් යෙහෙක මොහු වූකලී එසේ කොවන්නේය. ඉතා සවලජකාලයක් පවත්නේය එතෙමේත් සසරදුක් නොහැර පවත්නේය හෙවත් දුකින් මඩනාලද්දේය. එසේ හෙයින් මේ සවලජ ජීවිකාව නිසා කවර කාරණයකින් ප්‍රාණඝාතාදි අකුසල් කෙරේදැයි යනහොත් අනිත්‍යය

දුඃඛය අනාත්මය යන තිලකුණු දැනගන්නා විදර්ශනා නුවණ නැතිවෙයිනේද ස්‍රෝතාපත්ති ආදිවූ මාර්ග ඵලවලට වෙයිනේද ඒ සැම හෙම දුක්වූ සවලප ජීවිතාව නිසා ප්‍රාණඝාතාදි අකුසල් කරන්නේය. එසේ වෙයින් ඒ දුකින් මිදෙමියහයි ඉතා යුහුසුළු නොවන්නාවූ සත් පථයෙහි පවත්නාවූ ජනයන්ට ඉෂ්ටඵලය සිඳුවන්නේය. ඒ එසේමය සොළොස් අවුරුද්දකින් දැන් මාගේ මනොරථය සිඳුවියයි විඳුළසේක.

එකල්හි ඒ අතිමධුරවූ බණ කථාව ඇසූ සුනන්දහෙම මේ රාජකුමාර හෙම මෙබඳු රජ ඉසුරු කුණපයක් මෙන් දමා තමා සිතාගත් අධිෂ්ඨානය නොබිඳ පැවිදිවෙමියි මේ මහාවලට වැදුන. මට මේ දුඃඛ ජීවිතාවෙන් කවර ප්‍රයොජනද? මමද මුන්වහන්සේ හා සමග මහණවෙමියි සිතා හෙමිය කුමාරයන්වහන්ස! නුඹවහන්සේට මතු වැඩෙක් වේවා! නුඹවහන්සේගේ මේ පැවිදිවීම මටත් කැමතිවිය. එබැවින් නුඹවහන්සේගේ සමීපයෙහි මමත් පැවිදිවනු කැමැත්තෙමි මාත් කැඳවාගන මැනවයි කියේය. මෙසේ ඒ රථාචාර්යයා යාච්ඤාකළ කල්හි බෝසතාණෝද ඉදින් මම මූ දැන්ම් පැවිදි නොළෙමි නම් මාගේ මවුපියෝ මෙතනට නොපැමිණෙති එසින් ඔවුන්ට මහත් පිරිහීම වන්නේය. මේ රථයෙහි යෙදූ අශ්වයෝද රථයද ආභරණද මෙතනම නැසෙන්නාහුය. තෙමිය කුමාරයා නම් එක් යක්ෂයෙක රථාචාර්ය හෙම ඔහු විසින් මරාඝාත ලද හෙයින් දැන් නුවරට නොආයේයි මට නිතුව කුත් වන්නේයයි සිතා තමන් නිතුවෙන් මිදීම හා මවුපියන්ට මතු වන්නාවූ වැඩද නුවණින් සලකා උපායකින් රථාචාර්යයා නුවරට ගමන්කරවනු කැමතිසේක් එම්බල රථාචාර්යය! මා මේ වල්හි හැර නොප යන්නට ආ පමණක් මුත් මේ රජ්ජුරුවන්ගේ අසුන් හා රථයද දමනු නිසා ආයේනොවෙති‍ය. එසේ හෙයින් මේ රථය ගෙනගොස් රජ්ජුරුවන්ට දී ණයින් මිදී වර ණය නැත්තහුගේ පැවිදිවීම බුඩාදිවූ ඍෂිවරයන් විසින් පසස්නාලදුයි වදුළසේක.

ඒ අසා රථාචාර්යතෙම ඉදින් මා නුවරට යද්දී මුන්වහන්සේ අන් තැනකට වැඩිසේක් වී නම් එපවත් අසා ආවාවූ පියරජ්ජුරුවෝ මපුතණුවන් වහන්සේ මට දක්වයි කියා නොදැක්වූවහොත් මට නිග්‍රහ කරන්නාහුවෙති. එබැවින් තමා ගුණ කියා ප්‍රතිඥාකරගන්නා කැමැත්තෙමි සවාමීවූ තෙමිය කුමාරයන් වහන්ස! නුඹවහන්සේට වැඩෙක් වේවා යම්හෙයකින් මම නුඹ වහන්සේට කිකරුවීම්ද? එහෙයින් මා විසින් යාච්ඤාකරනලද නුඹවහන්සේද මාගේ වචනය කරන්ට සුදුසු සේක. යම්තාක් කලකින් මම නුඹවහන්සේගේ පිය රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙන එම්ද? ඒතාක් නුඹවහන්සේ මෙතැන්හිම සිටිය මැනව ඉදින් ඒ පියරජ්ජුරුවන් වහන්සේ අවුත් තොප දැක සතුටුවූසේක්වීනම් යෙහෙකැයි කියේය. එබසට බෝසතාණෝද එම්බල රථාචාර්යය! තෝ මට යමක් කියන්නෙහිද ඒ මම්ද කරන්නෙමි ඒ එසේමය. මමත් පියාණන් දක්නා කැමැත්තෙමි එබැවින් එම්බා රථාචාර්යය තෝ නුවරට ගොස් සුහුව වර මාගේ ඤාති ජනයන්ට මා නිදුක් බවද කියා දෙමවුපියන්ට මා බසින් නමස්කාර කරවයි කියා රන්කෙසෙල් ගසක්මෙන් බරණැස් නුවර දිසාවට නැමී මවුපියන් පසඟපිහිටුවා වැඳ රථාචාර්යයාට මේ අසුන් දුන්නේය. ඒ අසුන් ගෙන මහබෝසතාණන්ගේ පයවැඳ පැදකුණුකොට නුවර වැද් මාලිගා දොරකඩට පැමිණියේය.

එකල්හි වඤ්ඣාදෙවිතොම මාගේ පුත්‍රයාණන්ගේ පවත් කවරේදැයි සිව්මැදුරු කවුළුවට හැර රථාචාර්යයා එන පෙරමග බලන්නී සිස් රථය ගෙනා එන්නාවූ රථාචාර්යයා දැක මේ රථාචාර්යතෙම සිස්රථය ගෙන එන්නේයයි කදුලෙන් තෙත් මුහුණු ඇතිව විලාප කිය කියා අඬන්නී මේ රථාචාර්යතෙම් මාගේ පුත්‍රයා පසින් යවනොට එන්නේය ඒ හුම්බිනවූ මාගේ පුත්‍රතෙම් පොළොව කැණ පස් වසන ලදිදේ නැසුනේවන ඒ එසේමය. මාගේ පුත්‍රයා නසා ආවාවූ මේ රථාචාර්යයා දැක සතුරෝ සතුටුවෙනසි සිතම් යනාදීන් විලාප කිය කියා රථාචාර්යයා අතින් ඊවාරන්නී එබඳු රථාචාර්යයෙ! මාගේ පුත්‍රතෙම කිමෙක්ද? සැබැවින්ම හොඳවෙද්ද? නොරෙක්ද? බිහිරෙක්ද? බිම්කැණ පසින් යවනුරනු ලබන්නේ විලාප කිය කියා හැඩිද නොකොත් තමා නොමරවයි කොර හැර අතපය ගසා හැඩිද මේ සියල්ල නොවලහා කියවයි කිවාය. එකල්හි රථාචාර්යතෙම ඉදින් තෙමිය කුමාරයෝ හොඳ බිහිරි නොවන්නාහ මිහිරි කථා ඇත්තාහ බණ කියන්නාහුයයි කිම් නම් එසේවුව කවරහෙයකින් තෝ කැඳවා ගෙන නොආයෙහිදැයි රජ මිට කිපී නිග්‍රහයක් කෙළේනම් නපුර එබැවින් පළමුකොට අභය ඉල්වම් කියා ඉදින් ආයාචනාවෙනි! නුඹවහන්සේ මට අභයදෙනසේක්වීනම් තෙමිය කුමාරයන්ගේ සම්පයෙහි මා දුටුදෙය නොවලහා කියන්නෙම්වේදැයි කියේය.

එබසට වඤ්ඣාදෙවි තොම එම්බල රථාචාර්යයිa1 තට අභය දෙන්නෙමි. තෙමිය කුමාරයන්ගේ නා දුටු ඇසූ සියල්ලම නොවලහා කියවයි කිවාය. එකල්හි රථාචාර්යතෙම කියනුයේ එම්බා වඤ්ඣාදෙවීන්වහන්ස! නුඹවහන්සේගේ පුත්‍රවූ තෙමිය කුමාරයන් වහන්සේ ගොඳව බිහිරිව පිළිව උපන් නොත කුන් වහන්සේ නොවනසේක. උන්වහන්සේ වනාහි නොපැකිල පවත්නා මධුරවූ තෙපුල් ඇතිසේක. ලීලොපෙතවූ ගමන් ඇතිසේක. එතකුදුඋවක් රාජ්‍යසම්පත්තියට භයින් බොහෝවඤ්චාවෙන් දවස්හළසේක. ඒ එසේමය;

පෙර මේ බරණැස්නුවර විසි අවුරුද්දක් රාජ්‍යයකොට එපවින් තරසා යෙහි අසූදහසක් අවුරුදු පැසී දැන් නුඹවහන්සේට පුත්‍රව උපන්සේක. ජාති සමරණඥානයෙන් ඒ අපායෙහි විඳි දුක් නොපගේ ඒ තේමිය කුමාරයන් වහන්සේ සිහිනොට රාජ්‍යශ්‍රිය විඳීමට භයගෙන මෙසේ මට රාජාභිෂෙන කරති සිතා මවුපිය දෙදෙනාගේ සම්පයෙහි කථානොකොට ගොළු බිහිරි කොර ආකාර දැක්වූ පමණක් මුත් සම්පූර්ණ හස්තපාදාදි අවයව ඇතිසේක. යහපත්වූ ආරොහ පරිණාහද ඇතිසේක. නොපැකිල පවත්නා තෙපුල්ද ඇතිසේක. සූක්ෂ්මවූ ප්‍රඥ ඇතිසේක. දැන් වනාහි දිව්‍යලොකගාමී මාර්ගයෙහි වැඩසිටිසේක. ඉදින් එම්බා දෙවීන් වහන්ස! නුඹවහන්සේගේ ඖරස පුත්‍රවූ ඒ තෙමිය කුමාරයන් වහන්සේ දක්නා කැමතිසේක්වි නම් දැන් ඔහු වසන තෙනට තොප කැඳවාගෙන යෙම් කියේය. ඒ තෙමිය කුමාර වනාහි රථාචාර්යයා නුවරට ගමන්කරවා තෙමේ පැවිදිවනු කැමතිවිය. ඔහුගේ චිත්තාචාරය දැන සක්දෙව් රජතෙම විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා කොල තෙමිය! කුමාරයෝ පැවිදිවනු කැමැත්තෝය, ඔවුන්ට පන්සලක්ද තවුස් පිරිකරද නිර්මාණයකොට දෙවයි කියා එවිය. එද මහත් වේගයෙන් අවුත් ඒ වන යෙහි තුන් යොදුනක් තැන් පන්සලක් මවා රාත්‍රිස්ථාන දිවාස්ථාන ලිං පොකුණු පලරුක් ආදිසෙන් සමෘඩකොට සියලු තවුස් පිරිකරද මවා දෙව්ලොව

වම් ගියේය. මහබෝසතාණෝ ඒ පන්සල දැක මේ සක්දෙව්රජහු විසින් හැරතලද නිර්වාණයකැයි දැන පන්සලට වැද හන්සළු තබා සතවැහැරි උපරිවා අදුන් දිවිසම් එකාංශයෙහිකොට දළ මඩුළු බැඳ පිරිහරකද ක්රතබා සැරයටිය අහින්ගෙන හවුස් වෙස්දරා ඔහිමොබ සක්මන්කොට ඉතා සැපය ඉතා සැපයයි උදන් අනමින් පන්සලට වැද දඩුමැස්සෙහි වැඩඋන්සේක් පඤ්චාභිඤ්ඤාප්පත්තා උපදවා සවස්වේලෙහි පන්සලින් නික්ම සක්මන් කොළවර යිරි කරගසින් කොළ කඩාගෙනවුත් සක්දෙව්රජහු මවාදුන් බදු නෙහි ලුණුනැති දියෙන් උයා අමාවක්මෙන් අනුභවකොට සතරමහාබ්රහ්ම විහාරයන් සිත්හි වඩා එහැන්හි වාසය කළසේක.

කාසිරජහු සුනන්දයාගේ බස් අසා මහාසෙනඟුත්ත නම් අමාත්යයා කැඳවා ගමන් සැරහිමට විධානකරනුයේ එම්බා සෙනඟුත්තය! මේ දෙළොස් යොදුන් බරණැස් නුවර ඇති මඬගලරථ සඬග්රාමරථාදීවූ රථයානාවෝ ආජානෙය සෛන්ධවයන් යොදා ධජ පතාක තංවා ගමනට සරහනු ලැබෙත්වා. නොයෙක් හස්තිහුද රුවන් සහනාහරණ රන්පොරෝදු බැඳ සදනු ලැබෙත්වා. නොයෙක් සියදහස් ගණන් සක්සින්නම් දලහන් මිහිතුබෙර පනා මද්දල ආදිවූ තූර්ය්‍ය ජාතිහුද මෙහිම වයනු ලැබෙත්වා. මම වනාහි මාගේ පුත්වූ හෙමිය කුමාරයන් සමීපයට ගොස් උන්ට අවවාදකොට එතැනදීම රුවන් රැසඟ සිටුවා අභිසෙකදී කැඳවා එනු කැමැත්තෙමි, සියලු නියම්ගම් වැස් සෝද අන්තඃපුර සත්රිහුද සියලු රජකුමරුවෝද වෛශ්යයෝද සියලු බමුණෝද යන සියල්ලෝත් මා හා කැටිව යන ලෙසට යානාවන් සඳ රැස් වෙත්වා. තවද සියලු ඇතරුවෝද අසරුවෝද රථාචාරීහුද පාබල සෙනඟද යන සියල්ලෝම තමතමන්ගේ යානාවන් සඳ සැරසෙත්වා. තවද මෙහි රැස්වූ නියම්ගම් වැස්සෝද දනව් වැස්සෝද තමතමන්ගේ යානාවන් සඳ වහා මෙතැන්හි රැස්වෙත්වා. මම වනාහි මාගේ පුත්රයාට අවවාද කරන පිණිස දැන්ම යන්නෙමි කියේය.

මෙසේ රජහුගෙන් නියොග ලද්දාවූ රථාචාරීහු ශීඝ්ර ජව හා මහත්බල ඇති සෛන්ධව ජාතියෙහි උපන් අශ්වයන් යොදා ධජ බැඳ සේසත් නඟා රජු නැගීමට සුදුසු රථයක් මාලිගා දොරකඩ තබා රජහට දන්වූවාහුය. රජද ඒ රථාචාර්‍යියාහට එම්බල පුරුෂය! සථූල ගාත්‍ර ඇති අශ්වයෝ ශකතියෙන් පිරිහෙති. කෘශවූ දෙහ ඇති අශ්වයෝ ශකතියෙන් පිරිහෙති. එබඳු අශ්වයන් නොගනුවසි කියේය. රථාචාරීහුද වර්ණයෙන් ජවයෙන් බලයෙන් යුකතවූ මනා අශ්වයෝම අප විසින් යොදනලද්දාහුයයි කීවාහුය. රජ ක්ෂත්රිය බ්රාහ්මණ වෛශ්‍ය ක්ෂුද්‍ර යන චතුර්වර්ණයන්ද එසින් පිටත් අටලොස් ගෙණෙහි ජනයාද රැස්කරවීය. මෙසේ සෙනඟ කැටිකරන්නාවූ රජහට තුන්දවසක් ඉක්මිය. ඉක්බිති සතරවෙනි දවස් අශ්වයන් යොදාලද රථ යානාවට නැඟි අන්තඃපුර සත්රීන්ද තමා හා සමඟ එන ලෙස නියොගකොට වල්විදුනාවය නලල්පටය මගුල් කඩුවය සේසතය රන්මිරිවැඩිසඟලය යන පඤ්ච ककුධ භාණ්ඩයන් බෝසතාණන්ට අභිෂෙක කරන පිණිස ගෙන්වා ගෙන ඒ සුනන්ද නම් රථාචාර්‍යියා ඉදිරිකොට මහසෙනඟ පිරිවරා බෝසතා ණන් වසන තැනට පැමිණියේය. එසේම මහත් තේජසින් දිලිහි දිලිහී අමාත්යමණ්ඩලයා පිරිවරා තමන් වසන තැනට පැමිණි පියරජ්ජුරුවන්ට බෝසතාණන් වහන්සේ වඳුරනසේක් කිවෙක්ද? මහරජ! තට නිදුක්ද?

රොග පීඩාවෙක් නැද්ද? අපගේ මව්වූ සියලු රාජස්ත්‍රීහුත් නිරොගිහුදැයි විවාළේය. එකල්හි රජද එම්බා පුත්‍රයාණෙනි! මට කිසි දුකකුත් නැත්තේය. ශරීර පීඩාකරවූ කිසි ව්‍යාධියකුත් නැත්තේය. තොපගේ මව්වූ සියලු රාජකාන්තවෝද දැන් නිරොගියහයි කියේය. නැවත බෝසතාණන් වහන්සේ වදාරනසේක් එම්බා මහරජ්ජුරුවෙනි! කිමෙක්ද තෝ මද්‍යපානය නොකරන්නෙහිද? සුරාපානය තට ප්‍රිය නොවේද? කිමෙක්ද නිරන්තරයෙන් සත්‍යවචනය රක්ෂාකරන්නෙහිද? පුරනලද දශරාජධර්මය ඇත්තෙහිද? තාගේ චිත්තය දන්දීමෙහි ඇලෙන්නේදැයි විචාළසේක. එම්බා පුත්‍රයාණෙනි! මම මද්‍යපානයද නොකරන්නෙමි. මෙලෝ පරලෝ දෙක්හි අනර්ථ කරන්නාවූ ඊත් මට ප්‍රිය නොවන්නේය. එමතු නොවෙයි සත්‍යවචනයෙහිද තොප විසින් විචාරනලද දශරාජධර්මයෙහිද මාගේ සිත ඇලෙන්නේයයි කියේය. නැවතත් බෝසතාණන් වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි! කිමෙක්ද තොපගේ රථයානාදියෙහි යෙදියයුතුවූ අශ්වවෘෂභාදීහු නිරොගිවෙද්ද? තවද හස්ත්‍යශ්වාදීවූ වාහන සුවසේ පවත්නෝද? ශරීරය පෙළෙන්නාවූ කාශසඨාසාදි ව්‍යාධිහු නොපට නැත්තාහුදැයි විචාළසේක.

එබසට මහරජතෙම කියනුයේ එම්බා තෙමිය කුමාරයෙනි! එසේය රථගැල් ආදියෙහි යෙදියයුතු අශ්වයන් හා වෘෂභයෝ කිසි පීඩාවක් නැත්තාහුය හස්ති අශ්වාදි වාහනද නිදුකින් පවත්නාහ. මටද ශරීර පීඩා කරවූ කිසි ව්‍යාධිකෙනෙක් නැත්තාහුයයි කියේය. කිමෙක්ද? මහරජ! සියලු පසල් දනවිව සුභික්ෂද? හොජනය ඇත්තේද? රටමැද සියලු ගම්නියම්ගම්හි බොහෝ ජනයාගේ විසීම ඇත්තේද? සියලු කොටු ගෙවල් හා රත්රුවන් ගබඩා ධනධාන්‍යයෙන් සම්පූර්ණවම සුරක්ෂිතව තිබෙද්දැයි විචාළසේක. එසේය තෙම්ය කුමාරයෙනි! සියලු ප්‍රත්‍යන්තජනපදයෝත් සුභික්ෂයෝය. ජනයාගෙන් සම්පූර්ණය රටමැද සියලු ගම්නියම්ගම්ද නිරන්තරව වසන්නාවූ බොහෝ ජනයා ඇත්තේය සියලු කොටු ගෙවල් හා ගබඩා ධනධාන්‍යයෙන් පිරුනාහයි කියේය. එකල්හි බෝසතාණන් වහන්සේ රජහට ඉදිරා ලෙස අවසර දෙනු කැමතිසේක් එම්බා මහරජ්ජුරුවෙනි! මෙලෝ පරලෝ දෙකින් වැඩ සිඩවන හෙයින් මෙතැන්හි තොපගේ ඊම යහපත් ඊමක් වන්නේය. කිසිසේත් නපුරු ගමනක් නොවන්නේය. එබැවින් යම්බදු අස්නෙක ඉන්නෙහිද එබදු අස්නක් දනුවයි වදළසේක. රජතෙම මහබෝසතාණන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් අස්නෙහිනූන්නේය. එකල්හි මහබෝසතාණන් වහන්සේ එම්බා මහරජ! කොළ ඇතිරිමත්තෙහි හිඳුව එසේ උන්නාවූ තොපගේ පාදයන් මේ පරිභොග ජලයෙන් ධොවන්ය කෙරෙත්වායි වදළසේක. එසේ කිවත් ඒ මහරජ උන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ඒ කොළ ඇතිරි මත්තෙහිත් නොහිඳ බිම උන්නේය. මහබෝසතාණන් වහන්සේ ඇතුළු පන්සලට වැද උයාතිබූ කරකොළ ගෙනවුත් එම්බා මහරජ්ජුරුවෙනි! මේ මා විසින් උයා තබනලද ලුණු නැති කරකොළය එය අනුභව කරව ඒ එසේමය. මෙතැන්හි ආවාවූ තෝ මා විසින් ආගන්තුක සත්කාර කටයුතු වන්නෙහිය්යයි වදළසේක.

එබඳුව රජතෙම කියනුයේ එම්බා තෙමිය කුමාරයෙනි! මම මේ පලා අනුභව නොකරන්නෙමි. මේ අපගේ භොජනයක් නොවන්නේය. මිහිරි රසයෙන් හෙබුණු සුවඳැති සාලේ බත්ම අපගේ භොජනයයි කියේය. මේසේ ඒ සරුසාර ප්‍රතිසේධපතාට නැවතත් බෝසතාණන් කෙරෙහි ගෞරවයෙන් මිදුන් අතින් ගෙන එම්බා තෙමිය කුමාරයෙනි! තොපි මේබඳු ආහාරය අනුභව කරවිදුයි බෝසතාණන් හා සමඟ ප්‍රිය කතා කියා කියා උන්නේය. එතෙණෙහි චන්ද්‍රාදෙවිතොම අන්තඃපුර සත්‍රීන් පිරිවරා අවුත් බෝසතාණන් පය අල්වා වැඳ සඳලු පිරුණු ඇස් ඇතිව එතන්පසෙක උන්නාය. ඉක්බිති රජතෙම සොඳුර! තොපගේ පුත්‍රයාණන් අනුභවකරන ආහාරය බලවයි මිදුන් කර සොළ ගෙන වන්ද්‍රාදෙවීන් අත තිබුයේය. එසේම සෙසු සත්‍රීන් අතවද දුන්නේය. ඒ සියල්ලෝම සවාමිනි! නුඹ වහන්සේ මෙබඳු ඉහා තින ආහාරයක් අනුභව කරනසේක්දැයි නින්දාකොට නැවත ඉනා දුෂ්කරයක් කරනසේනැයි කියා වැඳ වැඳ උන්නාහුය. එසඳ රජතෙම නැවතත් එම්බා තෙමිය කුමාරයෙනි! මේ වනමැද උදකලාව මෙබඳු ආහාරය අනුභවකොට වසන තොප දුටුවෑවූ මට එක් ආශ්චර්‍යයක් වැටහෙන්නේය. මෙබඳු ආහාරය අනුභවකොට වසන්නාවූ තොපගේ ශරීරවර්ණය කවරහෙයකින් ප්‍රසන්න වන්නේදැයි විචාළේය. එසේ විචාළාවූ රජහට ඒ ප්‍රකාශකොට වදාරන්නාවූ මහබෝසතාණන් වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි! මම සිලසමාදානයෙන් යුකතව මේ තණ ඇතිරියෙහි තනිවම සයනය කරන්නෙමි නොපට මෙන් සඬුගෙන රැකවල් සිටින රාජ පුරුෂයෝද නැත්තාහ. ඒ සැපසෙය්‍යාව හෙතුකොට ගෙන ශරීරවර්ණය පහදන්නේය. මහරජ තවද අනිකුදු කාරණයක් ඇත. මම ඉකුත් සැප තට සොඳ නොකරමි මිතු සැපයක්ද ප්‍රාර්ථනා නොකරන්නෙමි දැන් ලද යම් දෙයකින් යැපෙමි එහෙයින් අපගේ ශරීරවර්ණය පහදනේය. මහරජ නැවතද අනිකුදු කාරණයක් මේලෝ බාලජනයෝ නැසුනු වසතුවට සොඳ කෙරෙහි නොලත් වසතුව ප්‍රාර්ථනා කෙරෙති. එහෙයින් ඒ තෘෂ්ණා සොඳ දෙකින් තැවී තැවී විසලි දුර්ණිවන්නාවූ දෙහ ඇති සතුතෙම මුලින් කපා අවිවට දමනලද නළදණ්ඩක් වැන්නේයයි වදාළසේක.

ඉක්බිති රජතෙම මොහු අභිෂෙක කොට නුවරට කැඳවාගෙනයෙමියි සිතා බෝසතාණන්ට යවිසඳහරනුයේ එම්බා තෙමිය කුමාරයෙනි! බොහෝ ඇන්සෙනඳ අස්සෙනඳ රථසෙනඳ සන්නාහ සන්නඬවූ පාබලසෙනඳ නෙවන් සෞරභ්‍යය බලපරාක්‍රම ඇන්නාවූ යොධයන්ද දිව්‍යප්‍රාසාදසේ මනොහරවූ මාලිගාද යන මේ සියල්ලන් දෙමි. ඒ මතුද නොවෙයි සර්‍වාභරණයෙන් සැරසුනාවූ බොහෝ සත්‍රීන්ද දෙමි. ඔහුද තමන්ගේ රූපශ්‍රියෙන් හා නාට්‍යනිතගෙන් තොපගේ සිත් පොළඹන්නාහුවෙති. අසම්නිත්‍යාවූ ක්ෂත්‍රිය වංශ ඇති රජදරුවන්ගෙන් තොපට රාජකුමාරිකාවන්ද ගෙනාම් ඔවුන් තොපට දැකොට දරුවන් වැදූකල්හි පසුව තොප පැවිදිවන්ට සුදුසු වන්නේය. එම්බා තෙමිය කුමාරයෙනි! තොපි පළමු යෞවන වයසෙහි යහපත් ශ්‍රී ඇතියව එබැවින් දැන් රාජ්‍යශ්‍රිය අනුභවකරව උදකලාව මේ වල්හි විසීමෙන් කුමක් සිඬනරම්දැයි කියේය. එකල්හි ඕනට බණ වදාරන්නාවූ බෝසතාණෝ එම්බා මහරජ්ජුරුවෙනි! තරුණවූ පුරුෂයාද මෛථුනයෙන් වැලකීමයයි කියනලද බ්‍රහ්මචරියාව රක්ෂාකරන්නේය. එසේම බ්‍රහ්මචරියාව

රක්ඛාකරන්නහුගේම යෞවනය පවත්නේය. බාල වයස සිටියහුගේ පැවිදි වීමෙක් ඇද්ද ඒ බුබාදීවූ සෘෂිවරයන් විසින් පසස්නාලද්දේය. එබැවින් මම බ්‍රහ්මචරියාව රක්ෂාකරන්නෙමි. තොපගේ රාජ්‍යයෙන් මට ප්‍රයොජන නැත ඒ එසේමය. ඉතා බාලයන්වූ බොලඳ බසින් මැනියෙනි පියාණෙනි ප්‍රිය තෙපුල් කියන්නාවූ මැනියන් විසින් බෙහෙත් අනුභවකොට දෙවියන්ට යාඳ දුකින් ලද්දාවූ ප්‍රිය පුත්‍රයන් ජරාවට නොපැමිණ බාලවයසම නැසුනවුන් දක්නෙමි මනාවූ රූප ශ්‍රී ඇති ඉතා ළදරුවූ කුමාරිකාවරුන්ද ජීවිත විනාස යෙහි සඩාදැමූ උණ කිළිල්ලේ තරුණ වයසෙහිම නැසුනවුන් දක්නෙමි. එබැවින් මෙලොව බාලවුවද වෘඩවුවද සියලු සත්‍රීන් හා පුරුෂයෝද එකාන්ත යෙන් මරණට පැමිණෙන්නාහුවෙති. එසේ නියමයක් නැත්තාවූ මේ ජීවිත යෙහි නුවණැති කවර නම් පුරුෂයෙක් විශ්වාසකරන්නේද? තවද මහ රජ්ජුරුවෙනි! වළ දිය සිදී මඩව යාමෙන් සියලු මත්ස්‍යයන්ගේ විනාසය මෙන් සත්වයාගේ මවුකුස පිළිසිඳගත් තැන් පටන් රාත්‍රි දිවාභාගයෝ ඉක් මෙන්නාහු වෙති ඔවුන්ගේ ඉක්මීමෙන් ආයුසය දවසින් දවස ඉතා සවල්ප වන්නේය. එසේ ගෙවියාමෙක් ඇතිකල්හි සත්වයාගේ කුමාරබවෙක්නම් කෙසේ වන්නේදැයි නැවතත් කාරණා දක්වන්නාවූ මහබෝසතාණන් වහන්සේ එම්බා මහ රජ්ජුරුවෙනි! මේ ලෝවැසිතෙම නිරන්තරයෙන් ව්‍යාධියෙන් ඉතා පහරනු ලබන්නේය.

තවද මහරජාණෙනි! මේ ලෝවැසිතෙම මරහු විසින් පහරනු ලබන් නේය. ජරාව පිරිවරකොට ඇත්තේය.. මේ ක්ෂයවන්නාවූ රාත්‍රි දිවාභාග යෝද තුමූ පමණක් ක්ෂයනොව සත්වයාගේ ආයුසය හා සමඟ ක්ෂයවෙති. එසේ වන කල තෝ කවරහෙයකින් මට අභිෂෙක කරනු කැමැත්තෙහිද? යම්සේ මහරජ! නූල් සැද බැඳි කල්හි යම් යම් භාගයක් වියනු ලැබේද? එසින් ඉතිරිය යම්සේ සවල්ප වන්නේද? සත්වයන්ගේ ජීවත්වීමත් එසේම දවසින් දවස සවල්ප වන්නේය. තවද යම්සේ පිරුණු ගංවතුරෙක් සමුද්‍රය කරා යනුයේ කෙසඟක් විවරත් ආපසු නොයේද? එපරිද්දෙන් සත්වයන්ගේ ආයුසයත් දවස් අවුරුදු වශයෙන් ගෙවී යනුයේ නැවත නොඑන්නේය. තවද යම්සේ මහරජ! සැඩවහවතුරෙන් දෙගං ඉවුරෙහි සිටි වෘක්ෂයන් මුල් සෝදා ඵලාගෙනයේද? එපරිද්දෙන් සත්වයෝද ජරාමරණ දෙකින් විනාස යට පමුණුවනු ලැබෙතිසි වදාළ ඉක්බිති රජ්ජුරුවෝ බෝසතාණන් වහන් සේගේ බණකථා අසා ගිහිගෙහිවිසීමෙහි උකටලිවීමෙන් මහණවනු කැමතිව මමද නුවරට නොගොස් මෙතැනදීම පැවිදිවෙමි. ඉදින් මාගේ පුතණුවෝ නුවරට ෙගත් නම් මාගේ සේසත දෙමිසි ඔහු විමසනු පිණිස නැවත රාජ්‍ය යෙන් ආරාධනා කරනුයේ දරුවෙනි! මම තොපට ඇත්ඇණිද රථඇණිද සන්නාහ සන්නාඩවූ අශ්වයන්ද සිත්කළුවූ සර්වාභරණයෙන්සැරහුනාවූ සත්‍රීන්ද දෙමි. ඔවුන්කෙරෙහි තොපි මනාව පවතුව තවද නෘත්‍යගීතයෙහි දක්ෂවූ සත්‍රීහු පඤ්චවිධ කාම කොට්ඨාසයෙන් තා සිත් අලවති මේ ජන ශූන්‍යවූ වල්හි විසීමෙන් තෝ කවර වැඩක් සිඳකෙරෙහිද? තවද පුත්‍රය! තට සතුටුවූ රජදරුවන්ගෙන් සැරහුනාවූ රාජකන්‍යාවන් ගෙනවුත් පාවාදෙති. ඔවුන් ගෙන් දරුවන් ලැබ පැවිදිවෙව. තවද පුත්‍රය! මම තොපට සියලු ධාන්‍යයෙන් පිරූ කොටුගෙවල්ද මුතුමැණික්ආදීන්පිරූ ගබඩාද සෙනාවාහනද දෙමි. තවද පුත්‍රය! ප්‍රිය තෙපුල් කියන්නාවූ මනා සත්‍රීන් හා දාස ජනයා පිරිවරා රාජ්‍යශ්‍රිය අනුභවකරව මේ වනයෙහි විසීමෙන් තට කවරවැඩෙක් සිඹවේදැයිකියේය.

නැවතත් රජහට තමා නොකමැති බව ප්‍රකාශකරන්නාවූ බෝසතාණන් වහන්සේ එම්බා මහරජ්ජුරුවෙනි! වස්තුව නම් තමා මියපරලොව යාමෙන් හෝ වස්තු නැසීමෙන් හෝ නියමයෙන් ක්ෂයවන්නේය. එබඳු වස්තුවෙන් ප්‍රයෝජන කවරේද? තමා විසින් ප්‍රාණයමෙන් රක්ෂාකරනලද සත්‍රියද තමාට පළමුව මිය පරලොව යන්නී හෝ වෙයි. ඇට පළමුව හෙමේ හෝ පරලොව යන්නේය. එබඳු සත්‍රින් හා විවාහ කිරීමෙන් ප්‍රයෝජනකවරේද? යම් යෞවනයෙක් එකාන්තයෙන් ජරාව විසින් මඩනාලැබේද එබඳු යෞවනයෙන් ප්‍රයෝජන කවරේද? එහි කවරසතුටුවිමෙක්ද? කවරක්‍රීඩාවෙක්ද? කවර ඇල්මෙක්ද? කවරවස්තුසෙවිමෙක්ද? මට දරුවන්ගෙන් හා භාර්‍යාවන්ගෙන් කවර ප්‍රයෝජනයෙක්ද? එම්බා රජ්ජුරුවෙනි! ඒ පුත්‍රදාරාදි බන්ධනයෙන් මිදුනෙමි. මාරතෙම මේ සත්වයන්ගේ විනාශයට ප්‍රමාදනොවන්නේය. මමද යථොක්ත කාරණයෙන් මරහු පමා නොවෙතියි දනිමි. එසේ මරහු විසින් මඩනාලද්දාවූ මට රාජ්‍යසම්පත්තියෙහි කවර ඇල්මෙක්ද? වස්තුවෙහි කවර අභිලාෂයෙක්ද? තවද රජ්ජුරුවෙනි! හිරුරැසින් නැවී විලිකුණාවූ රාත්‍රියෙහි ආපොරස වැළඳි ලිහිල්වූබන්ධනඇති ඵලයන්ගේ වැටීමමෙන් උපන්නාවූ සත්වයන්ට මරණය එකාන්තයෙන් පැමිණෙන හෙයින් නිරන්තරයෙන් භයකරවන්නේය. උදැසන දුටු බොහෝ ජනයාගෙන් සවස සමහරෙක් නොදක්නා ලැබෙති. සවස දුටු ජනයාගෙන් සමහර කෙනෙක් උදැසන නොදක්නා ලැබෙති. එබැවින් මහරජ්ජුරුවෙනි! අදම මහත් භීෂ්මකටයුත්තේය. සෙට දවස් වන්නාවූ මරණය කවරක්හට දනේද? ඒ එසේමය. පස්විසිහය දෙතිස් කම්කට්ටල අවානුවක් රොගාදි වශයෙන් මහසෙනහ ඇති මරහු විසින් අසවල් දවස අසවල් මස අසවල් අවුරුද්දෙහියයි කළ ප්‍රතිඥාවෙක් නැත. තවද මහ රජ්ජුරුවෙනි! මෙලොව සොරකම්කොට ජීවත්වන්නාවූ ජනයෝ තමන්ගේ ජීවිතයත් නොසලකා වස්තුවම ප්‍රාර්ථනාකරන්නාහුවෙති. මම වනාහි ඒ ධන බන්ධනයෙන් මිදුනෙමි. එම්බා මහරජ්ජුරුවෙනි! තොපිත් මාහා සමගම අවුත් ඒ බන්ධනයෙන් මිදෙව් මට වනාහි තොපගේ රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත්තේයයි වදළසේක.

මෙසේ නිවන් අවසන්කොට බෝසතාණන් වහන්සේ ධර්මදේශනා කළ කල්හි අති මධුරවූ ධර්ම කථාව අසා රජ්ජුරුවන් හා චන්ද්‍රාදේවිය ප්‍රධාන කොට ඇති මේ සොළොස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් හා අමාත්‍යයෝ පැවිදි වනු කැමතිවූවාහුය. රජ්ජුරුවෝද මාගේ පුත්‍රයාණන් හා සමඟ පැවිදිවනු කැමති කෙනෙක් පැවිදි වෙත්වාසි නුවර බෙර හසුරුවා රන්රුවන් ගබඩා දොර හරවා අසවල්තැන මහත් නිධාන ඇත. ඒ කැමති කෙනෙක් ඇරගනිත්වාසි රන්පත ලියවා මාලුමහල්වැඩෙහි බැන්දවූහ. නුවර වැස්සෝද සල්පිල් සැදුව නමතබා දොර ඇරිවනින්ම ගෙවල්හැර රජ්ජුරුවන් සමීපයට ගියාහුය. එනල පිය මහරජාණෝ මහජනයා හා සමඟ බෝසතාණන් සමීපයෙහි පැවිදිවූවාහුය. ශක්‍රයා විසින් මවාදෙනලද ආශ්‍රමපදය තුන්යොදුන් පමණවූයේය. මහබෝසතාණෝද පන්සල බෙදාදෙනසේක් ස්ත්‍රීහු නම් බිය සුලුවෙතියි ඔවුන්ට මෑ පන්සලද පුරුෂයන්ට වටකොට පන්සල්ද දුන් සේක. සියලු තාපසවරු පෙහෙවස් සමාදන්වූ කල්හි බිම සිටම විශ්වකර්මයා විසින් මවාදෙනලද ගස්වල ඵලගෙන අනුභවකොට මහණදම් පුරති. ඔවුන් කෙරෙන් යම් කෙනෙක් කාම විතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ සිතද්ද? ඔවුන්ගේ සිත් දැන මහබෝසතාණන්

වහන්සේ අහස වැඩහිඳ ධර්මදේශනා කරනසේක. ඔහු ඒ ධර්මදේශනාව අසා වහා පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවති. එකල එක් පසල්රටෙක රජකරන රජෙක් කසිරට රජ මහණවියයි අසා බරණැස් රාජ්‍යය ගනිමිසි නුවරට වැද සරහනලද නුවරදෙක රජගෙයි මතුමහල්තලයට නැගි උතුම් සත්රුවන් බලා මේ වසතුව නිසා වන එක් භයකින් ගියේයයි සිතා රු සොඬුන් කැඳවා රජ්ජුරුවෝ තවර වාසල් දොරකින් නික්ම ගියෝදැයි විචාරා නැගෙනහිර වාසල් දොරිනැයි අසා තෙමේත් එම දොරින් නික්ම ගහ සමීපයෙන් ගියේය. මහ බෝසතාණන් වහන්සේ ඔහු එනි අසා වන කෙළවරට ඇවින් අහස වැඩහිඳ බණදෙසා පිරිවර හා සමග ඔහු පැවිදිකරවූසේක.

මේසේ අතිකෙක අනිකෙකැයි රජදරුවෝ තුන්දෙනෙක් රාජ්‍යයහැර අවුත් මහණවාවූහුය. එසමයෙහි ඔවුන් ඇරගිය නුවරවල ඇත්තුද අස්සුද වල්ව ගියාහුය. රථයන් එහිම දිරාගියාහ. ගබඩාවල කහවනු පන්සල් මළු යෙහි වැලිකොට විසුරුවූවාහුය. සියලු තාපසවරු අෂ්ටසමාපත්ති උපදවා කෙළවර බඹලොවඋපන්නාහුය. ඇත් අස් ආදිවූ තිරිසන්හුද ඒ තාපසවරන් කෙරෙහි සිත් පහදවා දෙව්ලොව උපන්නාහුයයි මෙසේ මේ ජාතක ධර්ම දෙශනාව ගෙනහැර දක්වා වදාරා මහණෙනි, මේ ජාතියෙනි මෙන් පෙරත් මහඛිනික්මන් කෙළෙම්වේදැයි වදාරා **චතුස්සත්‍යය** ප්‍රකාශකොට මේ **තෙමිය ජාතක** ධර්මදේශනාව නිමවා වදාළසේක. එකල්හි සේසතෙහි වාසය කළාවූ දිව්‍යසත්‍රි නම් දැන් මේ ශාසනයෙහි උත්පලවණ්ණ සථවිරිය. එකල්හි රථාචාර්‍යයා නම් දැන් ශාසනයෙහි ශාරීපුත්‍ර සථවිරයෝය. එකල්හි තෙමිය කුමාරයන්ගේ මවුපිය දෙදෙනා නම් දැන් ෙ බුඩොතපාදකාලයෙහි මහා මායා දේවීන් හා සුඩොදන මහරජ්ජුරුවෝය. එකල්හි පණ්ඩිත් නම් දැන් බුඩ පණ්ඩිත්ය. එකල්හි මූගපක්ඛ පණ්ඩිතයෝ නම් දැන් ලොවුතුරා බුදුවූ සම්‍යක් සම්බුඩ සර්ව්ඥ රාජොතතමයාණන් වහන්සේමය.

(මේ ලක්දිව මඩහනනම් වෙහෙර විසූ බුදුකනිසස නම් තෙරුන්වහන්සේද, කැටකදුරු වෙහෙර විසූ ථූසදෙව නම් තෙරුන් වහන්සේද, මණ්ඩල විහාරයෙහි විසූ මහාරක්ඛිත තෙරුන් වහන්සේද, හඟිරි ෙහෙර විසූ මහා තිසස තෙරුන් වහන්සේද, වමත්ථවි වෙහෙර විසූ මහාසිව නම් තෙරුන් වහන්සේද, කළුවෙල වෙහෙර විසූ මහාමලියදෙව තෙරුන් වහන්සේද යන මේ සථවිරවරු බුදුල සමාගමයෙහිද මූගපක්ඛ සමාගමයෙහිද අයොඝර සමාගමයෙහිද හත්ථිපාල සමාගමයෙහිද හැමටම පසුව තවුස් පැවිදිවූවාහුය. ඒ එසේමය. එයින් මඩ වෙහෙරවැසි මහානාග තෙරුන් වහන්සේද මහා මලියදෙව තෙරුන් වහන්සේද යන මේ දෙදෙනා වහන්සේ පිරිනිවන්පානා දවස් වදාරනසේක් ඇවැත්නි! මූගපක්ඛ ජාතියෙහි බෝසතාණන් වහන්සේ හා සමඟ පැවිදිවූ තාපසපම්බිද් අද නිමාවටපැමිණියායයි කීවාහුය. ඇවැත්නි! අපි එකල්හි සුරාධූතීයම්හ, සියල්ලවුන් තාපසවූ හෙයින් අප හා එක්ව බොන්නවුන් නොලැබ අපිත් පසුව ගොස් තාපසවූම්හ. දැහැත් ඇවිදි පසුව අධිගම ලදුම්හ. එබැවින් නුවණැති මහොතතමයන් විසින් මදකුත් පින් කිරීමෙහි පමා නොවිය යුතුයයි වදාළසේක.)

මූගපක්ඛ (තෙමිය) ජාතකය නිමි.

මහා ජනක ජාතකය.

තවද කරුණා නිධානවූ සියලු සත්වයන් ජාතිකාන්තාරාදියෙන් එතර ලන හෙයින් ශාස්තෘත්වූ සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥ රාජෝත්තමයාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයේහි **නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව** අරබයා මේ ජාතකය දක්වා වදාළසේක.

හේ කෙසේදයන්?

එක් දවසක් සවස්වේලෙහි ධර්මසභා මණ්ඩපයෙහි රැස්ව වැඩඋන් ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදි භික්ෂූන් වහන්සේ කථාවක් උපදවනසේක් ඇවැත්නි! සර්ව්ඥයන් වහන්සේ සුඛෝදන රජ්ජුරුවන් වැනි පියාණ කෙන කුන් හා යසොධරාදෙවීන් ප්‍රධානවූ අන්තඃපුරයක් හා සත්දවසකින් පැමිණෙන චක්‍රවර්තිරාජ්‍යය හා ඟවූ දෙගවූ තුන්ගවූ සතරගවූ වට ඇති පොළව අවසන්කොට ඟැඹුරු ඇති නිධාන සැල හා මේනියාවූ රාජ්‍යශ්‍රියත් අලුයම දූමූ සොළ පිඬක් කොටත් නොසලකා මහඛිනික්මන් කළ නියාව අප්‍රමේයයයි යනාදීන් මහඛිනික්මන් කථාව කිය කියා වැඩ උන්සේක. එබස් සර්ව්ඥයන් වහන්සේ ගඳකිළියෙහි වැඩහිඳ දිවකණින් අසා වදාරා අඳනා ඔවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනයෙන් ඇඳ ර්පිට රන්වන් පට්ඨාතුන් වහන්සේ බැඳ සඛණි පළිතයක් බදු වදමල්දම් සමූහයකින් වසන්නාසේ සුගත් මහා පාංශුකූල චීවරය පෙරවා ධර්මසභාමණ්ඩපයට වැඩවදාරා පනවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ ධර්මාඝ්‍යය සිසාරා වැඩහුන් භික්ෂූන් වහන්සේ බලා මේ භික්ෂූහු කපක් මුළුල්ලෙහි මා බැණ නොනැගී උන්නත් මට පලමු බසක් කියන කෙනෙක් නැත. එසේ හෙයින් මම පළමුකොට කථාවක් උපදවම් සිතා "මහණෙනි! මා එන්නාට පූර්ව්යෙහි කිනම් කථාවකින් යුකතව උනුදැසි" විචාරා එක්තරා භික්ෂූ කෙනකුන් වහන්සේ බඩාඤ්ජලිව දෙහොත් මුදුනෙහි තබා සවාමිනි! නොකියන්ට වදාළ දෙනිස් කථාවෙන් යුකතවනුනුම්හ. සර්ව්ඥයන් වහන්සේ මහඛිනික්මන් කළ නියාව අප්‍රමේයයයි කිය කියා උනුම්හයි දන්වූසේක. එපවත් අසා වදාරා "මහණෙනි මා දැනට බුදුවන ජාතියෙහි මහඛිනික්මන් කිරීමෙහි අප්‍රමේය කිම්ද? පෙර නුමුහු කළ නුවණැති සමයෙහි පවා රාජ්‍යය හැර මහඛිනික්මන් කෙළෙම් වේදැ"යි වදාළ ඉක්ඛිති අතීතයෙහි මහඛිනික්මන් කළ නියාව ශ්‍රී බුඩියට මිසක් අපට නොදැනෙයි එසේ හෙයින් වදාළොත් යහපතැයි ආරාධිතවූ සර්ව්ඥයන් වහන්සේ හිමගඟියක් මඩ්‍යයෙන් චන්ද්‍රබිම්බයක් පානාක්මෙන්ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේදයන්?

යටගිය දවස වෙදෙහරට මිසුලු නුවර මහාජනක නම් රජ්ජුරුකෙන කුන් රාජ්‍යය කරන සමයෙහි අරිට්ඨජනකය පොළෝජනකය යන රාජකුමාර වරුන් දෙදෙනකු ලැබ දශරාජධර්මයෙන් රාජ්‍යය කරන්නාහු අරිට්ඨජනක නම් රාජකුමාරයන්ට යුවරජ තනතුරදී පොළෝජනක කුමාරයන්ට සෙනෙවි

රත් තනතුරු දී දූහැමෙන් රාජ්‍යය කොට මහාජනක රජ්ජුරුවෝ කම් වූ පරිදිදෙන් මියපරලොව ගියහ. ඒ අරිට්ඨජනක නම් යුවරජ්ජුරුවන් වහන්සේ රාජ්‍යයට පැමිණ සෙනෙවිරත් ධූරයෙහි සිටි පොළෝජනක නම් මල් රාජ කුමාරයන්ට යුවරජ තනතුරු දී දූහැමෙන් රාජ්‍යය කරන සමයෙහි එක් අමාත්‍යයෙක් ගොසින් අරිට්ඨජනක රජ්ජුරුවන්ට කියන්නේ සාමිනි! යුව රජ්ජුරුවන් වහන්සේ නුඹවහන්සේට වරදිදන්ට උත්සාහකරනසේකැයි බොරුකියා රජ්ජුරුවන්බිඳවීය. රජ්ජුරුවෝත් යුවරජ්ජුරුවෝ මට එසේනොසිතනිකියා නොගිවිස්සහ. නැවතත් වරින්වර නුඹවහන්සේට වරදිදන්ට හා රාජ්‍යයට උත්සාහ කරනසේකැයි කියා බිඳවීය. රජ්ජුරුවෝ මූ කියන්නේ සැබෑයයි සිතා මල් යුවරජ්ජුරුවන් දහගෙයි ලැවූහ. යුවරජ්ජුරුවෝ බොහෝ දුක්බිඳ සිතන්නාහු මා විසින් මාගේ බෑයන් වහන්සේට නොකට යුත්තක් නොසිතා ඉන්දදීම මට මෙසේවූ දෙයක් පැමිණියේයයි සිතා දම් පුපුරුවන නිසා සත්‍යක්‍රියා කරන්නාහු මම රජ්ජුරුවන් වහන්සේට සැසින් වවසිණ් ද්‍රොහයක්කරමියි නොසිතිම් නම් මා මැසූ දම් පිපිරේවායි සත්‍යක්‍රියා කළාහ. ඒවූ නියායෙන්ම දමත් පිපිරිණ දෙරත් ඇරිණ. එවිට එතනින් පලා ගොස් පිටිසර ගමක ඉඳ එගම මනුෂ්‍යයන් සිත්ගෙන වාසය කරන්නාහ. රාජ්‍යඝකරන රජ්ජුරුවන් වහන්සේ යුවරජ්ජුරුවන් පිටිසරගමක ඉදිනි අසා පිරිස් යැවූහ. එවිට එගම්වාසීහු අසල් ගම්වල මනුෂ්‍යයනුත් එක්කොට ගෙන අප සාමීන් නිකම් උන්පසු සේවාකමට ඔබින් ආපසු ඉතිබේ සේවා කම්කරම්හයි කියා රැස් පිරිස් කඩක්කට්ටු කරගෙන ගොස් මියුලුනුවර වට කොට ගත්හ. මියුලුනුවරින් ඇත් අස් රථ වාහන පාබල සෙනඟ ඇති අමාත්‍යයෙක් තමාගේ පඤ්ඳ හා සමඟ ගොස් යුවරජ්ජුරුවන් දක්වා ගත. යුවරජ්ජුරුවෝ රජ්ජුරුවන්ට කියා යවන්නාහු නුඹවහන්සේ හා පළමු සතුරු කමක් නැතිව ඉන්ද දී නුඹවහන්සේ මා හා සතුරුවූසේක. එහෙයින් මමත් පළමු සතුරුකමෙක් නැතත් දැන් සතුරුවීම් එසේ හෙයින් මා හා කැවිව යුඬ කරන්නක්වත් රාජ්‍යය දෙන්නක්වත් කළමැනවයි කියා යවූහ. අරිට්ඨජනක නම් රජ්ජුරුවෝ එපවත් අසා කෝපයෙන් කියා යවන්නාහු මාගේ අඩුබල සෙනාබලයෙන් අඩුවක් නැතිව ඉන්දදි මාගේ රාජ්‍යය කුමට දෙමිද? යුඬකෙරෙමි කියා යවා අමාත්‍යමණ්ඩලයා හා සෙනාව සමඟකොට නික්ම සිට එකලට අග්‍රමහෙසිකාවන්ගේ දරුගබිය මුහුකුරා තිබි හෙයින් ලඟට කැඳවා කියන්නාහු සටන් නම් වපලය දිනුම් පැරදුම් නොදැනෙයි එසේ හෙයින් දිනා ආවොත් ආනියාය සටනෙහි පරාජයෙක් වීනම් තෙපි ගබීය ඉදුරා රැකගෙන නොප දන්නා තැනකට පලායවයි කියා චතුරංගිනී සෙනාව ගෙන අරිට්ඨජනක නම් රජ්ජුරුවෝ නුවරින් පිටත්ව මල් රජ්ජුරුවන් හා ඒ සෙනාවත් ඉදිරියට අවුත් දෙසේනාව යුඬ කළාහ. එවිට පොළෝජනක රජ්ජුරුවෝ අරිට්ඨජනක රජ්ජුරුවන් හා යුඬකොට අරිට්ඨජනක රජ්ජුරුවන් මරා රාජ්‍යයට පැමිණියාහ. එවිට අරිට්ඨජනක රජ්ජුරුවන්ගේ බිසවු රජ්ජ මළ පවත් අසා බොහෝ සොකයට පැමිණ උවමනා මුතු මැණික් ආදීවූ අනඝී සම්පත් පැසඟ ලාගෙන රිටිට කසළ නොයෙක්දෑ ලාගන කිලිටි සඹක් ඇඳගෙන නුවර උතුරු වාසලින් පිටත්ව තවුන් පළඳ අද්‍රහන රටක් ගමක් නැති හෙයින් කාළවම්පායයි නම් පමණක් අසා එසේවීනම් ඒ නුවරට යෙමි සිතා නික්මුණාහ. ඔබ පිළිසිඳි දරුගබිය නම් අප මහාබොධි

සත්වයෝය. උන්ගේ ආනුභාවයෙන් ශක්‍රයන්ගේ පඬු ඇඹුල් සලස්න නොහැකි වන තියාසෙන් උණුවිය. එවිට දහසක් නෙත්වලින් ලොව බලා බොධිසත්ව යන්ගේ මිටියිසවුන් දැනට පැමිණිබව දැන එතනට මහලු වේසයකින් රථයක් ඇරගෙන අවුත් කාළවම්පානුවරට යන්නෝ ඇද්දැයි කියා ඔසවුන් කරා රථය ළංකළේය. ඔසවු එසේ නොවේ මම කාළවම්පානුවරට යෙමි කිය. එවිට ශක්‍රයෝ රථයට නැගෙවයි කිහ. එවිට ඔසවු කියන්නෝ සවාමිනි! මම හරිවැඩ දරුගෙන් ඇත්තෙමි. එහෙයින් රථයෙහි ඉදිම නොපිළිවන මේ පැස තිබන්ට අවසර දුන මැනව මම රථය පසුපස්සෙහි එමියි කිහ. එවිට ශක්‍රයෝ සිටියන්නාහු මා හා සමාන රථපදිනා රථාචාර්‍යයෙක් මේ මුළු දඹදිව නැත. එහෙයින් හෙපි නොබා රථයට නැගෙව නිරුයාසව රථය පැදලම් සියා ඔසවුන් රථයට නංවාගෙන පෙරවරු නිස්යොත්නක් ගොසින් ගෙක් සමීපයෙහිදී පලාඛත්මූලක් ඔසවුන්ට දී ඔසවුන් බත් කෑ ඉක්බිති රථ වැඳිරියෙහි තිබූ යහපත් දිව්‍යවස්ත්‍රයක් ඔසවුන්ට දී යහනෙහි සැත පෙවයි කිහ. ඔසවු ශක්‍රයන් කිලෙසම කොට යහනේ සැතපුනාහ. එවිට ශක්‍රයෝ පස්වරු අනිත් නිස්යොත්නක් ගෙවා කාළවම්පානුවරට වන්හ. එවිට ඔසවු පිබිදී මේ තාවර නුවරෙක්දැයි විවාළහ. ශක්‍රයෝ කියන්නාහු කාළවම්පානුවරයයි කිහ. එවිට ඔසවු මේ කුමන ආශ්චර්‍යයෙක්ද? අපගේ නුවරට මේ නුවර සැටයොත්නක්වුව මේ දැන් නිස්පැයක් දුතුරෙහි ආසේ නොසේදැයි කිහ. එසස් අසා ශක්‍රයෝ ලඟ මහකින් ගෙනාමි කියා ඔසවුන් නුවර වාසල සමීපයෙහි සිටුව දෙව්ලොව ගියාහ. ඔසවු වාසලින් ඇතුළට අවුත් ශාලාවකට වැද උන්නාහ. එසමයෙහි ඒ නුවර ප්‍රසිඛ බ්‍රාහ්මණයෙක් හමා අකුරු කරවන පන්සියයක් මානවකයන් පිරිවරා ජලසන්නාය කරන්ට යයි යන්නේ ශාලාවේ උන් ඔසවුන් දුටු ගමනේම බඛ උන්නාවූ බොධිසත්ව යන්ගේ ආනුභාවයෙන් නැඟිණියෝය යන්නක් සිතා මානවකයන් පන්සිය යම් මැන රඳවා බමුණු තෙමේ ශාලාවට වැද තෙපි කවිරුද? කෙසේ ආ ගම නෙක්ද? කවර නුවරෙහ විසුවානුදැයි විවාළේය. එවිට ඔසවු කියන්නාහු මිසුලුනුවර අරිට්ඨජනක රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා ඔසව නම් මමය. උන් වහන්සේ සවනේ නැසී ගිය හෙයින් දරුගබීය රකිනා නිසා ආමි කිහ. එවිස් එබමුණු අසා මේ නුවර නොපහේ නැසිය හෙතෙක් ඇද්දැයි විවාළේය. ඔසවු නැසිය හෙතෙක් නැඟැයි කිහ. එවිට බමුණු මේ නුවර බොහෝ ගිටයන්ගේ අකුරු කරවා දිසාපාමොක් ආචාරිව ඉන්නා බ්‍රාහ්මණ නම් මමය එහෙයින් නොපි සැකයක් නොසිතව. තොප හා තොපගේ ගබීය රකිම් හෙපි නැසෙම් අනවා බැයන් වහන්සේයයි මාගේ පාපිට සොකයෙන් අඩා වැවේවාසිසැලැස්වූහ. ඔසවුන්එලෙසමහඩාඋන්හ එවිට බමුණා ණෝත්ඇඹුහ. ඒ දැන වට සිටි අහවැස්සෝ මූ නුඹවහන්සේට කුමක්වේදැයි විවාළාහ. එවිට බමුණු කියන්නාහු පෙර විසයාවට පැමිණි මාගේ නැගණියෝයයි කිහ. එවිට මිනිසුන් සලස්වා මුන් ඉස් සොධා නහවා කවා පොවා ඇදීම් පැළඳීම් සියල්ලෙන් අඩු නොසොට සලස්වවයි බැමිණියට කියා යැවූහ. බැමිණිත් එනී පරිද්දෙන්ම කළාය බමුණු ත් ඉස් සොධා නහා නොබෝ වේලාවකින් ගෙට අවුත් ඔසවුන් කැටුව ඉදුවා බත්කෑමෙන් නැහැම් ඇහවූහ. මේ නියා යෙන් කල්යන අවසථාවෙහි ආඥ තේජස් ගුණනුවණ ඇති බොධිසත්වයන් වහන්සෙ උපන්සේහ ඒ උපන් ගමනේ මුතුන් රජ්ජුරුවන්ගේ නමම **මහාජනකයයි** නම් තැබූහ.

ඒ කුමාරයෝත් බොහෝ කුමාරවරුන් හා එක්ව කෙළින්නාහ. කෙළි මින් සිටි කඩා කොල්ලන්ට ඇතලන්නාහ. කුඩාකොල්ලෝ තමන්ට රිදෙනා තෙක්ක් මැන්දඹු දුනෙක් මා මරසිදුසි නියති. එවිට බොධිසත්වයෝ මැනියන් කරා ගොස් අම්ම කෙළිමඩලේ කෙළිනා කුඩාකොල්ලෝ මට වැන්දඹු දුනැයි කියති. මට තමා පියෝ ඇද්ද නැද්දැයි විචාළාහ. එවිට බිසවු කියන්නාහු මේ සිටිනා බමුණාණන් වහන්සේ කුඩිගේ පියාණයි කිහ. දෙවෙනි වාරයෙහ කෙළිනා කැනෙහිත් කෙළිනා කුමරුවන් වැන්දඹු දුනැයි බිණුන විසින් මැනියන් වහන්සේ කරා ගොස් සුරතල් පෑ කිරිබොන පරිද්දෙන් තනය කවලා ගෙන අම්මි! මාගේ පියාණෝ අසවල්හුයයි නියම දැන විනා නොහරිමි කියා තනය බැගත්තාහ. එවිට බිසවු ආයාස ඉවසානනොහී කියන්නාහු පිය රජ්ජුරුවන් සටහේ මළ නියාව පවත් ආදීවූ දෙය තත්වූ පරිද්දෙන් කිවාහ. කුමාරයෝ ඒ අසා එතැන්පටන් රාජධෙයිසියෙන් කිසිකෙනකුවත් නොහවා උගතමනාශිල්පශාස්ත්‍ර ඉගෙන සොළොස් ඇවිරිදි වයසට පැමිණ රාජ කුමාර මැනියන්කරාගොස් මාගේ පියරජ්ජුරුවන් වහන්සේගේ භූවිර ඇර ගන්නා නියායෙන් පිරිස් ආණඩුකරන්ට මුතුමැණික් ආදිවූ සම්පත් ඇද්දැයි එබස් අසා විවාළහ. මැනියෝ මුතුමැණික් ආදිවූ අනගි සම්පත් මා ගෙනාවා ඇතැයි කිවාහ. ඒ අසා කුමාරයෝ ඉන් භාගයක් දුන්නොත් වෙළඳුම්කොට වසතු එක්කෙරෙමි කිවාහුය. මැනියෝ ඒ අසා කිසිත් පිටිවහලක් නැති සමුද්‍රයෙහි යන්නා බලාත් මාගේ බොහෝ සම්පත්ඇරගෙන පිරිස් ආණඩුකරවයි කිහ. එසේකිවත් මැනියන් කිබස් අසා නොගිවිස භාගයක් සම්පත්ඇරගෙන වෙළඳුන් සත්සියයක් හා කැටිව නැවක නැඟී යාත්‍රාවට තික්මුණාහ. එදවස් පොළෝජනක රජ්ජුරුවෝත් ගිලන්බවට පැමිණියාහ. මහාජනක රාජකුමාරයන් නැඟි නැව වණ්ඩවූ පවන්වේගයෙන් සත්දවසින් සත්සියක් යොදුන් දිව මුද මධ්‍යයෙහිදී නැව නසින්ටවන් අවසථාවෙහි මස් කැස්බෝ නැව වටකොට ගත්තාහ. බොධිසත්වයෝ ඒ දැක එළඟිතෙල් හා සකීරු බඩපුරා කා පිළිසහ ලක් තෙලින් තෙමා තරකොට ඇඳ එළඟිතෙල් සළිඹගයෙහි ගල්වා කුසිඅගට නැඟි මියුලුනුවර දිසාව බලා මත්ස්‍යයන් වලඟා ඉස්බක්හැන් පැනපුවාහ. එදවසට මියුලුනුවර රාජ්‍යයකරන පොළෝජනක නම් රජ්ජුරුවෝ පැමිණි යාවූ ව්‍යාධියෙන් පරලොව ගියාහ. එකල්හි බොධිසත්වයන් සදවසක් සමුද්‍රයෙහි පිනාෆිසත්වන දවස් ආකාශය බලා පිරුණුපෝය දැක ලුණු පැන්න් කට සොධා අටසිල් සමාදන්ව පිනන අවසථාවට මහා සමුද්‍රයෙහි දෙමිවුපියන් රක්නා සිල්වත් ගුණවත් කෙනකුන් වැටුණොත් එසේවූවන් ගොඩ ලවයි කියා සතරවරම් දෙවියන් විසින් මහමුහුද රැකවලට සිටුවන ලද ඉඹි මෙබලා නම් දිව්‍යස්ත්‍රී තමාගේ සම්පත් එඟවයි මදයෙන් පැරක්කුව සදව සක් මහමුහුද නොබලා සත්වැනි දවස් කිම්අහෝයි සමුද්‍රය බැලූ තැනැත්තී බොධිසත්වයන් දැක එවිට සිතන්නී මාකෙළේ කිම්දැයි සදවසක් ජනනදූතුරේ නොබැලීමියි ඉදින් මේ කුමාර සමුද්‍රයේ මළානම් දෙවනාවෝ මිය සමාගමයට වැද්දනොදෙතියි එසේ හෙයින් මා වමා උන්කරා යාදූතුයයි සිතා බොධිසත්වයන් කරා අවුත් ආකාශයෙහි සිට කියන්නී කිසි පිහිටක් නැත්තාවූ සමුද්‍රයෙහි පිනා කොහිපරතෙරක් දැක්කහැකිදැයි දෙවිදුව කිව. එවිට බොධිසත්වයෝ කියන්නාහු එම්බල දිව්‍යඞගනාව මියෑකළවුනට සමාව නොදෙයෙක් නැතැයි කියා පුළුයෙහි කියන බස අසා මියෑයකොට පරතෙරක්

දකිනාතුරු වීර්‍යය කෙරෙමි කිහ. ඊට දෙව්දූ කියන්නී මහා සමුද්‍රයේ පර තෙරක් දක්න නොහැකි තැනදී වීර්‍යකිරීමෙන් තමාට පෙනෙන උවදුරක් විනා මින් පෙනෙන සාර්ථකයෙක් නැත මේ කුමන අඥානකමෙක්දැයි කිව. එබස් අසා බොධිසත්වයෝ කියන්නාහු එම්බල දිව්‍යාඞ්ගනාව! වීර්‍යකළවුන්ට නොසැදෙන දෙයෙක් නැත. වීර්‍යය නොකොට මළකළ ඇසුකෙනෙක් අස වල්හැනෙන්නේ යන්තම්වීර්‍යයක්වත් නොකොට නැසීගියේයයි නින්දාකරන්නාහ. එසේහෙයින් නිහැවෙන් මිදෙනු නිසාත් අසවලා තමාට පිළිවන්විවර වීර්‍යය කෙළේයයි වණන්නාවූ කීර්තිය හා යසස්තකාත් පසුව තමාටයිතෙන කල වීර්‍යයනොකළාමිසක් නැත්නම් ගැලවීයෙමි සිතන පශ්චාත්තාපයෙනුත් මිදෙමි. එසේහෙයින් වීර්‍යය කෙළෙමි කිහ. යම්කෙනෙක් තමාව පිළිවන් විවර වීර්‍යය නොකළෝනම් අඥානයෝත් පින්මද මනුෂ්‍යයෝත් ඔව්හුමය. එසේහෙයින් මාහා කැටිව එකවිට පඬව් නැංගාවූ සත්සියයක් වෙළඳුන් එක සේම තමන්ගේ වීර්‍යය මදහෙයින් මත්ස්‍යයන්ට බත්වයාදී මා කළාවූ වීර්‍ය බලයෙන් තොපසේ වූ දිව්‍යසම්පත්තියක් මා දුටුවා වීර්‍යානුභාවයෙන් වේද? එසේ හෙයින් මා කළාවූ වීර්‍යයෙන් පරතෙරක් දකින්නක්වත් මියන්නක්වත් වූවොතින් විනාමාගේ වීර්‍යය නොහරිමියි බොධිසත්වයෝ කිහ.

එබස් අසා බොධිසත්වයන් කී බසට දෙව්දූව සතුටුව තුන්විටක් සාධු කාරදී වීර්‍යවන්ත පුරුෂය! තොපසේවූවන් දැකීමම ඇඟපත. තොපි කොයි ගන්ට උත්සාහ කරන්නහුදැයි කිහ. එබස් අසා බොධිසත්වයෝ මියුලුනුවරට යෙමි කිහ. එබස් දෙව්දූ අසා තමාගේ පුතකු වඩාගන්නාක්මෙන් වඩාගෙන උරෙහි සතපාගත. බොධිසත්වයෝත් සත්දවසක් නිදි වර්ජිතකොට පිතු හෙයින් දෙව්දූවගේ උරමඬලේ වැදහෙව නිදුපුවාහ. දෙව්දූ බොධිසත්වයන් අරගෙන ගොස් මියුලුනුවර අඹුයහනේ මහුල් සලවට මත්තේ වැද හොවා උයන් දෙවතාවන්ගේ ආරක්ෂාව සලස්වා තමාගේ විමානයට ගියාය. ඊට පළමු පොළෝජනක රජ්ජුරුවන් සවර්ගීසථවන අවධියෙහි අමාත්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නාහු දෙවයන් වහන්ස නුඹවහන්සේගේ සීවලී නම් දිය නියන් වහන්සේ මිසක් අනිකුත් රාජකුමාරයෙක් නැත්තාහ. නුඹවහන්සේ ගේ ඇවැමෙන් රාජ්‍යය කවුරුන්ට සලස්වමෝදැයි විචාළාහ. එබස් රජ්ජු රුවෝ අසා යම්සේ සීවලී බිසවුන්ගේ චිත්තාරාධනයකළ කෙනෙක් ඇත්නම් වත් සිව්රියස්යානේ ඉස්දෙර පාමුල දැනගත් කෙනෙක් ඇත්නම් වත් නැත්නම් දසක්දෙනා නඟා බාන මාගේ දුන්න ඇදපු කෙනෙක් ඇත්නම් වත් සොළොස් මහ නිධානය තුබූ තැන් දැනගන්නා කෙනෙක් ඇත්නම් වත් එසේවූවන්ට රාජ්‍යය දෙවසිකිහ. එබස්අසා අමාත්‍යයෝ සොළොස්නිධානයට කිසි සංඥාවෙක් ඇද්දැයි විචාළහ. එවිට රජ්ජුරුවෝ ඒ අසා යහපතැයි සොළොස් නිධානය තැබූතැන් සඟවා කියන්නාහු ඉරනැගෙන තැන නිධාන යෙහ ඉර බස්නානාතැන නිධානයෙක ඇතුළේ නිධානයෙක පිටත නිධානයෙහ මධ්‍යයේ නිධානයෙහ නැගෙහ තැන නිධානයෙක බස්නා තැන නිධානයෙක සල්ගස් අතළේ නිධාන සතරෙක අවවින් යොත් නක් මිඳ්‍යයෙහි නිධානයෙක දළගෙහි නිධානයෙක වලගෙහි නිධානයෙක කොබුකොහි නිධානයෙක සල්ගස් අග නිධානයෙකැයි මෙසේ සොළොස් මහා නිධාන තිබූ ස්ථාන කියා පොළෝජනක රජ්ජුරුවෝ සවර්ගීසථවූහ. එවිට අමා ත්‍යයෝ රජ්ජුරුවන්ට කළ්‍යතා ආදාහණ කෘත්‍යයකොට ඉක්බිති රාජාඞ්ගන තයට රැස්ව ඇයි? රජ්ජුරුවන් වහන්සේ කී මානය කළමනාවේදැයි පළමු

කොව සිවලිඛිසවුන්ගේ අභිප්‍රාය දනමනාවේදැයි සිතා පළමුකොට උඩුමාලට නැගී සෙනෙවිරදුන් යව්වාහ. සෙනෙවිරද්දු උඩුමාලට ගොස් තමන් ආ නියාව ඛිසවුන්ට කියාගවූහ. ඛිසවු සෙනෙවිරද්දු එන්නාහයි කියා ගවූහ. සෙනෙවිරද්දු ඇවිත් ලඟ සිටියාහ. ඒ වේලාවට ඛිසවු මුගේ ධෛර්‍ය්‍ය බලන්නට උවමැනවයි සිතා සදල්ලවට දුවවයි කිහ. ඒ මානයට දිව ලඟට වැදින. පය අල්වවයි කියා පය අල්වාඋන් සෙනෙවිරදුන්ගේ ළමැදට පයින් ඇන හෙලා බෙල්ල අල්වා ඉණින් පාතට දමාපිහ. එවිට සෙනෙවිරද්දු කරබාගෙන මුදලිවරුන් උන්ගෙට ගියාහ. එවිට මුදලිවරු ඛිසවුන්ගේ අභිප්‍රාය දන්නේ ඇද්දැයි විවාළාහ. එවිට සෙනෙවිරද්දු තමන්ටවූ ගැහැට නොකියා ඇ කුමක්දැයි යකින්නක් හා සමානය මා සමඟ කිසිකථාවකුත් නොකොට නෙපි නොපගේ ගෙට පලායවයි කිහ.

එබස් අසා අමාත්‍යයෝ එසේවීනම් මම ඛිසවුන්ගේ සිත ලබම්සි වෙන වෙන පිටිකර පාරකා ගියාහ. මේ නියාගෙන් සත්දවසක් පලාගිය කල්හි පුරෝහිත බ්‍රාහ්මණ අවුත් අමාත්‍යයන්ට මෙසේ කියා රජදරුවන් නැති රාජ්‍යය යහපත් නොවෙයි. එසේහෙයින් පුස්රථය නුවර හැර පින්ඇති කෙනකුන් දිසාවට රථය තෙමේම ගොස් සිටියේනම් උන් රාජ්‍යයට තබා ඟනුම්හයි ඒ නියාවට පුස්රථය පිට සේසතය නලල්පටය රුවන් මිරිවැඩිය රුවින් වාමරය මඟුල් කඩුවය යන පඤ්චකකුධ භාණ්ඩ තබා රජදරුවන් ඇති රථයෙක් වීනම් ධුරය හා සිව්රහ සෙනහ ඉදිරියේ යන්නාහ. රජදරුවන් නැති රථය හෙයින් සිව්රහ සෙනහ හා ධුරය පස්සේ යනලෙස සලස්වා මන්ත්‍රය පිරුවා රථයට පැන් ඉස පින්ඇති කෙනෙක් ඇද්ද ඔවුන් කරා යේවායි රථය අලඟ. ඒ රථයත් රජගෙය තුන්විටක් පැදකුණුකොට එතනින් පිටත්ව නුවර තුන්විටෙක ප්‍රදක්ෂිණාකොට නුවරින් පිටත්ව මඟුල්උයන බලා නික්ම්ණ එවිට බොහෝ අමාත්‍යයෝ රථය තමන්තමන්ගේ ගෙය කරා එයි සිතූ සිතිවිල්ල ඇර රථය උයන බලා නික්මුණුහෙයින් පළමුගොස් අභ්‍යාසය නිසා යෙයි. රථය වලක්වයි අමාත්‍යවරු කිහ. එබස් අසා පුරෝහිත බ්‍රාහ්මණ කියන්නේ කොයි යතත් නොවලක්වයි කිය එවිට රථයත් උයනට ගොස් බොධිසත්ත්වයන් වැදහොත්තාවූ සලවට ගාවාට ගොස් නුවරට මුණ ලා බොධිසත්ත්වයන් දිසාවට පිටිපෑ සිටියේය. ඒ වේලාවට පුරෝහිත බ්‍රාහ්මණ ගොසින් බොධිසත්ත්වයන්ගේ පය වසාතිබූ ඉනකඩ ඉවත්කොට පය ලක්ෂණ බලා මුළු දඹදිව රාජ්‍යය කරන්නට ලක්ෂණ ඇති නියාව දැන නැවත ධෛර්‍ය්‍ය බලන නිසා පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාදයෙන් එසහෙලා ධුරය කරවිය. එවිට බොධිසත්ත්වයෝ ඊට වකිනයක් නොවී දකුණු දිසාවට නැමී වැදහොත් නාහ. එවේලෙහි බ්‍රාහ්මණ ගොසින් කියන්නේ සාමිනි! නුඹ වහන්සේට මේ මියුලුනුවර රාජ්‍යය පැමිණෙයි කිය. ඇයි මේ නුවර රාජ්‍යයකරන රජ්ජුරුවෝ කොයිදැයි විවාළාහ. අදින් සත්දවසය රජ්ජුරුවන්වහන්සේ සවඟියට වූවාහුයයි කිය. එබස් අසා රජ්ජුරුවන්ගේ දරුකෙනෙක් නැද්දැයි විවාළාහ. සිවලි ඛිසවුන් මිසක් රාජකුමාර කෙනෙක් නැතැයි කිය. එබස් අසා යහපතැයි ගිවිස්සාහ. එවිට රුවන් රැසක් පිට සිටුවා ඉස් සොඬා නහවා අභිෂේක ආදිවූ කළමනා ඉරින් සාරවා රථයපිට නංවා මහත්වූ පෙරහරින් නුවරට වඩා ගෙනාහ. ඒ නුවරත් මහාජනක රජ්ජුරුවන්ගේ ආඥ පතුරුවා රජගෙට අවුත් වන සිවලී ඛිසවුන් රජ්ජුරුවන් ආ පවත් අසා සෙස්සන්සේ රුවාවිය

ඇතැයි සිතා තමන්ගේ මිනිසුන් අත වහා වඩිනේ යහපතැයි සැඳවා යවූහ. එබස් අසාත් ඊට වඤ්චලව වහා නොගොසින් සෙමෙන් සිට මාලිගාවේ ඒ ඒ තැන සිතුවම් ආදිවූ දෙය බලබලා බිසෝ ගෙට ගියාහ. බිසවුත් රජ්ජුරුවන්ගේ ආඥ පෙරැසින් උන්පල ඉදඟහ නොහී තැගී සිට පෙරගමන්කොට අවුත් අතදී තමන්ගේ වාසස්ථානයට ඇරගෙන ගියාහ. රජ්ජුරුවෝ සත රැස් යානාව දැක ඉසනිබු රන්ඉද්ද ගලවා බිසවුන් අතට දුන්හ. බිසවු ඒ රන් ඉද්ද ගෙන ගොසින් ඉස්දෙර තිබුවාහ. එවිට රජ්ජුරුවෝ ඉස්දෙර දැන අමාත්‍යයන් අතින් තොපගේ රජ්ජුරුවන් සවඟිසථවන ගමනේ කි දෙයෙක් ඇද්දැයි විචාළහ. සවාමිනි! සිවලි බිසවුන් අභිප්‍රාය ලත් යම්කෙනෙක් ඇද්ද සතරැස් යානේ ඉස්දෙර පාළිල දැනගත් කෙනෙක්ඇද්ද දහසක්දෙනා නහා ලන බාලන දුන්නේ දුනුදිය ලූ කෙනෙක් ඇද්ද සොළොස් මහා නිධානය දත් කෙනෙක් ඇද්ද ඔවුන් රාජ්‍යයට පමුණුවයි කිසේක.

එබස් අසා සොළොස් නිධානයට කි නිධන් ලක්ෂණයෙක් ඇද්දැයි විචාළහ. එවිට අමාත්‍යයෝ නොදැනෙන පමණක් විනා ලක්ෂණ කිසේකැයි කියන්නාහු ඉරුනැනෙන තැන නිධානයක ඔස්නාතැන නිධානයෙක ඇතුළෙහි නිධානයෙක පිටහනිධානයෙක මඬ්‍යයෙහිනිධානයෙක සල්ගස්සතරේ නිධාන සතරෙක අවටින් යොත්තක් මඬ්‍යයෙහි නිධානයෙක දළගෙහි නිධානයෙක වලගෙහිනිධානයෙක කොබුකෙහි නිධානයෙක සල්ගස්අග නිධානයකැයිකියා මේසේ සෙළොස් මහා නිධානයට කි සලකුණුකිහ. එබස් රජ අසා සිවලි බිසවුන් මට ලැබුණු නියාව දන්නවාදැයි යාන ඉස්දෙරත් මේයයි කියා යාන පිට ඉඳ දුන්න ගෙන්වාගෙන දහසක්දෙනා ඇදලන දුන්න සත්‍රියක රෙද්දක් අදිනාසේ යානපිට ඉදම් දුන්න දුනුදිය ලා දුන්නඇද සොළොස් නිධානයපානා රජ්ජුරුවෝ තොපගේ රජ්ජුරුවන්ගේ ගෙට සිඟාඑන පසේබුදු කෙනකුන් වහන්සේ ඇද්දැයි විචාරා ඇතැයි අසා ඉරනැනෙනතැන නිධානය නම් පසේබුදුන් වහන්සේ ඇවිත් වැඩ සිටිනා තැන නිධානය ඉරබස්නා තැන නිධානය නම් පසේබුදුන් වහන්සේට පසුගමන්කොට රජ්ජුරුවන් වැළකුණු තැන නිධානය ඇතුළේනිධානය නම් එලිපතින් ඇතුළත නිධානය පිටත නිධානය නම් එලිපතින් පිටත නිධානය මඬ්‍යයේ නිධානය නම් එලිපත මඬ්‍යයේ නිධානය සල්ගස් සතර මූල නිධාන සතර නම් සල්දණ්ඩන් යාන් කකුල් කළවිසින් යාන් කකුල් සතර යට නිධානය අවටින් යොත්තෙක නිධානය නම් සහන් කකුල් සතර මඬ්‍යයේහි නිධානය නැනෙන තැන නිධානය නම් ඇතුනැනෙනතැන නිධානය බටතැන නිධානය නම් ඇතුගෙන් බස්නාතැන නිධානය දළ අග නිධානය නම් ඇතුගේ දළ තිබූ ඡායායෙහි නිධානය වලග නිධානය නම් මහුලසාගේ වල්ග ඡායායෙහි නිධානය කොබුකෙහි නිධානය නම් මහුල්පතස මඬ්‍යයෙහි නිධානය සල්ගසඅග නිධානය නම් මඬ්‍යාහ්නවේලාවට ඡායා අග වැටුණු තැන නිධානයයි කියා මේ සෙළොස් මහානිධානය ලක්ෂණ කියා නිධාන සොළොසම උඩනංවා අමාත්‍යයන්ට පෑ තවද රජ්ජුරුවන් කි දෙයක් ඇද්දැයි විචාරා නැතැයි කියා අමාත්‍යයෝ මහා සන්තොෂයට පැමිණී යාහ. රජ්ජුරුවෝත් දන්සැල් කරවා මහත්වූ දැන පරිත්‍යාගය යාචකයන්ට සලස්වා රාජ්‍යය කරන්නාහ. අවසෙස රජ දරුවෝ රජ්ජුරුවන්ගේ පනත් අසා සතුටුව පඬුරු පාකඩුඩම් එවා සිත්ගෙන දවස් අරින්නාහ එසමයෙහි රජ්ජුරුවෝත් තමන් මැනියන් හා තමන්ට උපස්ථාන කළාවූ දිසාපාමොක් ආචාරීන් හා දෙන්නාට බොහෝ පඬුරු පාකඩුඩම් යවා බොහෝ වාල්සරක් ගම්බම් ආදිවූ වසතු දී රැක්කාහ.

එක් දවසක් නුවර මුළුල්ලෙහි මහත්වූ අලඞ්කාරයෙන් දිව්‍යපුරයක් මෙන් සරහා රජගෙයත් සුධම්මානම් දිව්‍යසභාව මෙන් සරහා රජ්ජුරුවෝත් ශක්‍රදෙවෙන්ද්‍රයාමෙන් සැරහී සිංහාසනාරූඪව වැඩහිඳ ඒ ඒ දිසාභාගයෙහි අමාත්‍ය පණ්ඩිත බ්‍රාහ්මණ පණ්ඩිත ගෘහපති පණ්ඩිත සොළොස් දහසක් නාටකස්ත්‍රීන් ඒ ඒ තැන සිට දක්වන්නාවූ නැටීම් හිනිම් ආදිවූ භාවභාව උත්සව ක්‍රීඩා හා දහස් ගණන් අත් ඔසවා කියන්නාවූ වන්දිභට්ටයන්ගේ කිත්තිඝොෂාව හා ඒ ඒ තැන සිට ගසන්නාවූ ආතතය විතතය විතතාතතය ඝනය සුසිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ඝොෂාවෙන් මාලිගාව එකනින් නාදවීය. මෙසේ මහත්වූ රාජ ඓශ්වර්‍ය්‍යය හා ප්‍රතාපයදැක මේ සියල්ලම මා ලද්දේ සමුද්‍රය පිතා කළාවූ වීර්‍ය්‍යබලයෙනැයි සිතා උදන් අනන්නාහු වීර්‍ය්‍ය කළවුන්ට සියල්ලම සිඩවෙයි කියා පූර්‍ණවාර්‍ය්‍යවරයන්, කියන්නාවූ බසෙහි සැක හරනා ලදැයි යමක් සිතුවොත් සිතුවක් නොවනා නියාවත් මාගෙන්ම දනිමි. මා සිතුසේ වෙළඳුම් කොට අර්‍ථය උපදවා රැස් පිරිස් ආණ්ඩුකොට පිරිසට පඬිලවා යුඬකොට රාජ්‍යයේ ඇරගනිමිසි කියායි. ඒ සිතූ සිතිවිල්ල නොවී මෙසේ ඇවිත් කුසල බලයෙන් කිසි ආයාසයක් නොවිඳ රාජ්‍යය ලදිමි කියා මෙලෝ පරලෝ දැන පසේබුදුන් වහන්සේට දන්දී වාසය කරන්නාහ.

එසමයෙහි සීවලී බිසවු රාජකුමාර කෙනකුන් වැදූහ. ඒ කුමාරයන්ට **දීඝායු කුමාරයෝසසි** නම් තබා ඒ කුමාරයන්ට සොළොස් ඇවිරිදි වයස වූ කල යුවරජ තනතුර දී වසන සමයෙහි උයන්ගොවිවෙක් උයන්හි වූ පලවැල රජ්ජුරුවන්ට ගෙන ගොස් පෑය. රජ්ජුරුවෝ දැක යහපතැයි අපි උයනට යම්හසිකිහ. යහපතැයි උයන් ගොවිවත් උයනට ගොස් නදුනුයනසේ සරහා රජ්ජුරුවන්ට කියා යවිය. රජ්ජුරුවෝත් මහාසෙනාව පිරිවරා ඇතු සරහා ඇතු පිටට පැන නැඟී ශක්‍රදෙවෙන්ද්‍රයාමෙන් උයනට ගොස් උයන් දෙරකඩ සිටි පලඳ, අඹරුකක්ද නොපලඳ, අඹරුකක්ද දැක පලඳ, අඹගසින් අඹගෙඩියක් කඩා අනුභවකොට පස්‍රුව එනකල අඹකඩා කම්හසි සිතා රජ්ජුරුවෝ නික්මුණහ. පස්සේයන යුවරජ සෙනෙවිරද්ආදීවූ අමාත්‍යමණ්ඩලයා හා රැස් පිරිස් අඹ පොලු ගසා කඩාකැමෙන් ගස අතුපතු බිඳුවාපුවාහ. නොපලඳ, ගසට කිසිම හානියෙක් නොවී තුබුයේය. රජ්ජුරුවෝත් දවල් දවස උයන් කෙළ සවස් වේලෙහි රජගෙට යන්නාහු උයන් දෙරකඩ සිදිබිදී පියා තුබු අඹනස දැක අමාත්‍යයන් අතින් විවාරන්නාහු ඇසි යනවේලාවට ගස්දෙකම කිසි හානියක් නොවී දැන් මේ ගසට මෙසේ හානිවන්ට කාරණා කිම්දැයි විවාළහ. එබස් අසා අමාත්‍යයෝ කියන්නාහු දෙවයන් වහන්ස! පලඳ, වෘක්ෂය මිනිසයට පැමිණියේය. නොපලඳ, වෘක්ෂයට කිසිහානියක් නුවූයේයසිකිහ. එබස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු සම්පත් ඇතිවීමෙන් වන්නාවූ හානි අඹගසටවූවාක්මෙනැයි සම්පත් නැතිව සැපසේ තපස්කොට ජීවත්වීම නොපලඳ, අඹගස මෙනැයි කිසි හානියක් නොයෙදේයයි සිතා ගිහිගෙහි ඇලුම් හැර මහණවීමෙහි ඇලීම ඇතිව රජගෙට අවුත් එක් අමාත්‍යයකුට කියන්නාහු තා විසින්එකවේලක බත් හා දෑවිටි දඬු පෙරැ පැන් ආදීවූ දෙය ඇරගෙන තෝම උඩුමාලට එවයි කියා සලස්වා මේ නියායෙන් සත්මසක් උඩුමාලෙන් පාත නොබැස තපස් රැක්කාහ. නුවරවාසීහු සවාමීනි! සත්මසක් දුහුරේ කෙළි සිනාඋකුත් නැතුව උඩුමාලේ භාවනා කරන කෙනකුන්මෙන් වැඩ සිටියාසේනා. මේ කිම්දැයි ඇලලි මිශ්‍රලුහුවර මහත්වූ කොලහලවීයයි කිහ. මහා

ජනක රජ්ජුරුවෝත් පසේබුදුන්ට පූජා සත්කාර කරන හෙයින් මහණවන අභිප්‍රාය ඇතිව රාජ්‍යයෙහි කලකිරී ශක්‍රභවනයක් හා සදෘශවූ රාජ්‍යයහැර කවරදා, මහණවෙම්ද චිරි පවුරු වාසලින් සොභමාන මේ නුවර හැර කවරදා, මහණ වෙම්ද සප්තවිධ ධාන්‍යයෙන් හා ක්ෂෙත්‍ර භූමි ආදීවූ දෙයින් සොභා වත්වූ නුවර හැර කවරදා, මහණ වෙම්ද රත්රන් අම්බරන් ආදීවූ සම්පත්තීන් පිරුණාවූ භාණ්ඩාගාර ගෙවල්හැර කවරදා, මහණ වෙම්ද දිව්‍යස්ත්‍රීන් හා සමානවූ ස්ත්‍රීන් හැර කවරදා, මහණවෙම්ද කසිපිළි පවපිළි පටකඩ දෙවඩහ ආදීවූ විසිතුරු පිළියෙන් සරහන්නාවූ යහන් හැර කවරදා, මහණවෙම්ද ධවලඡත්‍රය හා සිංහාසන ආදීවූ දෙය හැර කවරදා, මහණවෙම්ද කළුවැල් තුවරලා කපුරු ආදීවූ නොයෙක් සුවඳහැර කවරදා, මහණවෙම්ද උදුන පුෂ්කරණී පුෂ්පාරාම ආදීවූ විසිතුරු ස්ථානහැර කවරදා, මහණවෙම්ද හස්ති,අශ්ව රථ පාබලසෙනඟ යන චතුරඞ්ගිනී සෙනාව හැර කවරදා, මහණ වෙම්ද ඇලි ඉඇලි කුතම් ආදීවූ යාන වාහන හැර කවරදා, මහණවෙම්ද මේ කියනලද සියලු ඓශ්වර්‍යයෙන් සමාඩවූ මිථිලා නම් රාජධානිය හැර කවරදා, මහණවෙම්ද කවරදා, තුන් සිවුරු පාත්‍රධරව සැදි ආහාර ගෙවලින් සිහා වළඳම්ද කවරදා, ඒ ඒ රුක්මූල හිඳ භාවනාකොට මහණදම් පුරම්ද මේ නියායෙන් දවස් පතා සිත සිතා ඉන්නාහ.

එසමයෙහි මනුෂ්‍යයන්ගේ ආයුෂය දසදහසක් අවුරුදුය. ඒ රජ්ජුරුවන්ගේ ආයුෂයත් සත්දහසක් අවුරුදු ඉක්ම සිටියේය. එවිට රජ්ජුරුවෝ මෙහි ඉඳ කාරිය කිම්දැයි සිතා කාටත් නාඟවා තුන්සිවුරු පාත්‍ර චීවරයට මිනිසුන් යවා ගෙන්වාගෙන මහුල්කපුවා ගෙන්වා ඉසක්කපා මහණවූහ. මේ නියාවට මහණව පාත්‍රය පිටබැඳ සැරයටිය අතින්ගෙන සක්මන්කොට මටවූ සැපය සොඳනියායයි සිතා එමද රෑ එතනම ලැඟ දෙවන දවස් මහඛිනික්මන් නෙරෙමි සිතා ඉණින් පාතට බස්නා නිසා ඉණි ඉසට ගියහ. ඒ වේලාවට සිවලි ඛිසවුත් සත්සියයක් ඛිසෝවරුන් පිරිවරා සත්සියයක් දෙනත් තුමුත් සම්‍පාලඞ්කාරයෙන් සැරහී රජ්ජුරුවන් රදවාගන්ට දකින්ට නික්මුණාහ. උඩුමාලට නැඟෙන්නාහු මහණවේසයෙන් බස්නාවූ රජ්ජුරුවන් දැක ඇඳිනගත නොහී පසේබුදුනැයි සිතා වැඳලා උඩුමාලට පැන නැංගාහ. රජ්ජුරුවෝත් රාජාඞ්ගන මධ්‍යයෙන් නික්මුණාහ. සිවලි ඛිසවුත් රජ්ජුරුවන්ගේ කෙස් වැටිය හා ආභරණ හා සළු දැක එසේවීනම් සවාමීන් වනැයි සිතා වහ වහා බැස රාජාඞ්ගනයේ යන රජ්ජුරුවන් දැක ඉසක්කේ මුදු පිටට හෙලා ළෙඟි අත් ගසා ඛිසෝවරුන් සත්සියය සමඟම පා පිට අඩා වැටුනාහ. ඛිසවුන් මහා සත්සියයක් ඛිසෝවරුන් හා අනන්‍යපූර්වාසීන් පිටිපුරවාසීන් ඇතුළුවූ මෙතෙක්දෙනා හැර වඩිනේ කුමටද? වැරැද්දෙක් ඇත්නම් ආඥා කරවන පමණක් විනා වඩිනේ ඇසිදැයි අඬ අඬා යාදීත් බොධිසත්වයෝත් නොබලාම නික්මුණාහ. නුවරවාසී සියල්ලෝත් අලලී රජ්ජුරුවන් කරා අවුත් සවාමිනි! වැරැද්දෙක් ඇත්නම් ඇතුළේ වුවත් පිටත වුවත් දැන් අපි පිරිමසා ලමිහ. නුඹවහන්සේ මිසක් මේ රාජ්‍යය කරන්ට නිස්සෝ කව්රුද? එසේහෙයින් නුඹවහන්සේ වඩිනේ නොහාවදැයි කිහ. එසේකිවත් රජ්ජුරුවෝ නික්මුණාහ. ඛිසෝවරු අඩිමින් වලපමින් රජ්ජුරුවන් හා කැටිව සිවලි ඛිසවුන් ප්‍රධානකොට ගියාහ. රජ්ජුරුවෝ ඛිසෝවරුන් අමාත්‍යයන් ආදීවූ සියලු ජනයන් පසුපස්සේ අඬ අඬා ආවත් සිතන්නාහු පඤ්චකාම විෂයන් අනුභව

කොට රජ්‍යයකරන්නා බලන්නේ හිමාලය වනයෙහි තපස්කොට ජීවත්වීම මට රජ්‍යයක් හා සමානයයි සිතා නික්මුණාහ. මේ නියායෙන් රජ්‍යයෙහි ඇල්ම නැතිව යන්නාවූ රජ්ජුරුවන් දැක සිවලී බිසවු අමාත්‍යයන් කැඳවා කියන්නාහු රජ්ජුරුවෝ රජ්‍යයෙහි ඇල්මක් නැතිව නික්මෙන්නාහ. ඉදිරියේ මාලු ගෙවල් ගිනි ලාපියවයි කිහ. අමාත්‍යයෝත් එසේම මාලු ගෙවල් ගිනිලැවූහ. සිවලී බිසවු රජ්ජුරුවන් කරා ගොස් දෙවයෙනි! නික්මුණු මාවත ගිනි පෙනෙන්නේය. එසේහෙයින් මේ ගමන යහපත් නොවෙයි. බොහෝ සම්පත් නසිනා දැක දැක යන්නේ ඇයිදැයි කිහ. බොධිසත්ත්වයෝ සිවලිනි! මාගෙන් නස්නේ කිම්දැයි කියා නික්මුණාහ. නැවත සිවලී බිසවු සතුරන්වන් තැනක්සේ අමාත්‍යයන් ලවා සටන් බෙරගස්වා ආයුධවල අලවා වළකා මනුෂ්‍යයන් ශරීරයෙහි අලවා ගා ඒ ඒ තැන ගෙනයන්ට වන්නාහ. එවිට සිවලී බිසවු නුඹවහන්සේ නික්මුණු පමණකට මේගම උහුන් කොටන්ට වන්හ. එසේහෙයින් ඒ කියන භය සංහිදුවා වැඩියොත් යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ එහි ඇල්මක් ඇතොත්වේද මට ඒ උවමනාය මට ඉන්නාම් කිම්දැයි නික්මුණාහ. නික්ම අඩගවුවක් පමණ තැන් ගියපසු මංසන්ධියක් දැක අමාත්‍යයන් අතින් මේ සන්ධිය කිනම් තැනෙක්දැයි විචාරා මේ මිශ්‍රලුනුවර සීමාව මෙතනින් නිමියාය සවාමිනි කිවාහ. එවිට රජ්ජුරුවෝ මුන් ඇම රඳවම් සිතා තොප ඇම එන්නේ මාතකා උව එසේහෙයින් මාගේ අණ ඇත්නම් මේ ඉරින් මෙපිට නේවාසි සැරයටියෙන් ඉර ඇන්දහ. එවිට සීවලී බිසවු ඉර මඩ්‍යයේ අඩා වැටී ඉර මතා නුඹවහන්සේගේ පුතණුවන් වහන්සේවූ දීඝායුකුමාරයන් වහන්සේට රජ්‍යය පමුණුවා වැඩිය මැනවයි කීහ. රජ්ජුරුවෝ තෙපි අමාත්‍යමණ්ඩලයා හා එක්ව රජ්‍යය තකාගනුවයි කියා නික්මුණාහ.

එවිට මහාසේනා පසු පස්සේ එන්නාහු සිවලී බිසවුන් කැටිවම එන්නාහ. මේ නියාගෙන් සැටගොත්තක් ගිය පසු එසමයට නාරද නම් තාපස තෙනෙක් හිමාලය වනයෙහි ගල්ගුහාවෙක්හි සත්දවසක් ධ්‍යාන සැපයෙන් දවස් යවා සත්වන දවස් ධ්‍යානයෙන් නැගී මවවූ සැපය යහපතැයි සිතා මේ නියා සැපතක් තවත් පතන්නෝ ඇද්දැයි දිවැසින් බලා මහාජනයා රජ්ජුරුවන් තාපස වෙසය ඇරගෙන එන්නවුන් දැක උන් කරා ගොස් උන්ට අවවාද කියම් සිතා ආකාශයෙන් ගොස් රජ්ජුරුවන් කරා බැස රජ්ජුරුවෙනි! තොපි කවුරුද? කොයි යව්දැයි විචාරන්නාහු සවාමිනි! හිමාලය වනයට තපසට යෙමි කී විසින් සේනා සමඟයෙන් මේ තපසට ආ නියාවද පඤ්චකාමයෙහි ඇල්ම ඇර තොපට තපස් කරන්ට සුවදැයි කිහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු දිව්‍ය සම්පත් හා සමාන සම්පත් හැර ආ මට තපස් කරන්ට කුමන අවාසදැයි කීහ. එවිට තාපසයෝ මෙසේ මෙසේ කළ මැනවයි අවවාද කියන්නාහු එක්වන් නිද්‍රාවද වඤ්චල අලස වීම්ද උකටලී වීම්ද පමණ නොදන ආහාර වැළඳීම්ද පංචකාමයෙහි ඇල්ම කිරීම්ද යනාදීන් මේ කියන සියල්ලම නොවැද්දද් රක්කොත් මිසක් තපසට ඌනය සංසාරයෙන් ගැලවී යන්වත් උගහටයයි කිහ. රජ්ජුරුවෝ එබස් අසා සතුටුව නුඹ වහන්සේ කවුරුදැයි විචාළාහ. ඊට තාපසයෝ කියන්නාහු කාශ්‍යප කුලයෙහි උපන් නාරද තාපසයෝ නම් මමය තොප ගත්තාවූ වෙසය තොපට නිසිය එසේ හෙයින් උකටලී නොව සතර ඉර්ධිවිහරණය පඤ්චඝාඩි අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගිය මැනවයි අවවාද කියා තමන් වසන්නාවූ ගල්ගුහාවට ගියාහ.

ඉක්බිති මිගාජින නම් තාපස කෙනෙක් සත්දවසක් ධ්‍යානයෙන් ඉඳ ගොඩනැගී ලොව බලා බොධිසත්වයන් දැක කියන්නාහු මියුලුනුවර රජ්‍යශ්‍රිය හැර කුමක් නිසා අවුද? නුවර වාසින්ගේ කලකිරීමක් නිසා මහණ වුදැයි විචාළාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු නුවර වාසින්ගේ හා මාගේ වැරැද්දක් නොවෙයි. මා විසින් පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යාවේ ඇල්ම කොට මහණ වීමියි කිහ. එබස් මිගාජින නම් තාපසයෝ අසා තොපගේ බස් බුදුන් රහතුන් අභිප්‍රාය තරම් බස්මයයි සතුටුව කියන්නාහු තොපට මහණවන්ට උපදෙස් දෙනලද්දේ බුදු පසේබුදු රහතුන් විසින්ද කවුරු මේ උපදෙස් කිවෝදැයි විචාළාහ. රජ්ජුරුවෝ මිගාජින නම් තාපසයන්ට කියන්නාහු මම අනික් උපදෙසකින් මහණවූ ගමනෙක් නොවෙයි. එක් දවසක් මහත්වූ පෙරහරින් උයනටගියෙමි යම්න්සිට උයන් දෙරකඩ සමීපයේ පලදු ගසක් හා නොපලදු ගසක් දැක පලදු ගසට වූ හානිය දැක මේ ගස පලදු විසින් ගසට හානිවිය ඇතුන්ට දළ නිසා හානිවෙයි දිවියන්ට සම් නිසා හානි වෙයි මනුෂ්‍යයන්ට සම්පත් නිසා හානිවන නියාව දැන මම පඤ්චකාම්යෙහි ඇලුම් ඇර මහණ වීමියි කිහ. එබස් තාපසයෝ අසා සතුටුව තමන්ගේ වාසස්ථානයට ගියහ. සිවලි බිසවුන් කැටුවම ගොස් සවාමීනි! නුඹ වහන්සේ මහණවූ කල් මම කුමක් කෙරෙම්දැයි විචාරා නොපිත් රාජ්‍ය සම්පත් හැර මහණ වනුවසි කියා මේ නියායෙන් කථාකරන කලට රැවගිය. ඒ වේලෙහි සිවලි බිසවුන් සේනාවත් එක් තැනක සැදවුරු බැඳගෙන උන්නාහ. බොධි සත්වයෝත් රැ ගසක් මූල වැඩහිඳ මෛත්‍රිභාවනා කොට කය සතපාගෙන නික්මුණාහ. සිවලි බිසවුන් සෙනාව පස්සේ එන්ට සලස්වා තුමූ කැටිව නික්මුණාහ. මහාජනක රජ්ජුරුවෝත් ථූන නම් නුවරට ගොස් වන්හ. ඒ වේලාවට එක් මිනිසෙක් දඩමස් කැටියක් අත මිලට අරගෙන කම්පස් කොට පුළුස්සා ලවසි අරක්කැමියාට දින අරක්කැමිත් පුළුස්සා නිවෙන්ට තැබීය. ඒ වේලාවට එක් බල්ලෙක් අරක්කැමියාගෙන් අවසරයක් දැක ඒ දඩමස් කටිය ඩැහැගෙන දිවපිය මිනිසාත් පසුපස්සෙහි දිව වැටී නැවතින. බලුන් දිවන්නේ රජ්ජුරුවන් හා බිසවුන් ඇතුළු නුවරට වඩිනවුන් දැක දෙන්නා මඩ්‍යයේ එලා දිවපිය. බොධිසත්වයෝ මස් කැටිය තමන් පාපිට එලාපු හෙයින් කැපය කියා වැලිපිස දඩමස් කැටිය පාත්‍රයේ ලා ගත්හ පැන් පාසු තැනකට ගොස් වළඳන්ට උන්කලට බිසවු කියන්නාහු සවාමීනි! දැන දැන බලු ඉදුල් පිළිකුල් නොවී වළඳද්දැයි කිව්ය. එබස් රජ්ජුරුවෝ අසා එබබල! කැපවූ ආහාරය හෙයින් එයම ප්‍රමාණයයි කියා වළඳ පාත්‍රය සොධා අතකට සොධාපුසේක.

එවිට බිසවු කියන්නාහු වංශවත් කෙනෙක් කීප වේලක සසින් උන් තුන් බලු ඉදුල් කුදිද? නුඹ වහන්සේ රාජ්‍යයෙහි පිහිටා සිට මේ කෙළේ කිමැයි කියකියා එවිට රජ්ජුරුවෝ. කියන්නාහු මිනිස් ඉදුල් වුවත් කැප හෙයින් ලත් දෙයක් වළඳනැයි කියා දෙන්නම ඇතුළු නුවරට වන්හ. ඒ වේලාවට කෙළිනා නම් කුමාරිකාවක් අතක වලලු දෙකක් හා එක් අතක වලලු දෙකක් පැන්වළඳන්නේ පැන්වළඳන්නී කෙළිනා විසින් වලලු දෙක ඇති අත අඩන්නේය. එක වලලුවේ නාදනොනේය බොධිසත්වයෝ එය දැක සිවලි දෙවිනි! මා කෙරෙහි ප්‍රේමයෙන් බොහෝ කොට නිතුබස් උපදිසි එසේ හෙයින් වැලි කෙළිනා කුඩා කෙල්ල දෙවාම දෙස් කියවමි සිතා කෙළිනා කුඩා කෙල්ල

අසින් විචාරන්නාහු ඇයි තොපගේ එක් අතෙක වලලු අඩන්නේත් එක් අතෙක වලලු නාඩන්නේත් කුමක්දැයි විචාළහ. එවිට ක ා සෙල්ල කියන්නී සවාමිනි! වලලු ෙදක තිබූ හෙයින් එක් අතෙක් අඩන්නේය එක් අතෙක් එසා වලල්ල නිසා නොහඩන්නේයයි කිය. එසේ හෙයින් රජ්ජුරු වන් වහන්ස, රාජ්‍යය සේසත ඇරපියා ආපසු තනිව ගොස් තවුස් කරතොත් විනා බිසවුන් හා සමග මේ කිම්ද කිව එබස් අසා සතුටුව බිසවුන්ට කියන්නා හු බිසවුනි! නිසම් අඥත මිනිසුන් ලවා මට නිතු නොකරවා තොප මේ මග පලායවයි මග පෑ කියන්නාහු අද පටන් තොපි මට බිසෝ නොවෙක්ද නොවෙව තොපට මම සවාමි නොවෙක්ද නොවෙමි කිහ. මේ මග පලායවයි කි බසට ඒ බිසවු පොරොත්තු කළනොහි එසේ වීනම් නුඹවහන්සේ දකුණ මග ගිය මැනව මම වම් මග යෙමි කියා සිහිත්තක් නැන් නික්මි නැවතා සොක ඉවසාගත නොහී මහට බැස රජ්ජුරුවන්ට කථා කෙරෙමින් එක්වම නුවරට වන්හ. වීපියෙහි සිහාගෙන යම්න් සිටි කලට රුවඩුවකුගේ ගෙදරට පැමිණියාහ. ඒ රුවඩුවා කාඹියේ රිදඹු ගල ගලා එක ඇසකින් රිදණ්ඩ ඇද මඹිනවුන් දැක බොධිසත්වයෝ විචාරන්නාහු ඇයි තා එක ඇසින් රිදණ්ඩ ඇද අරනේ කුමක්නිසා දැයි කිහ. රුවඩු කියන්නේ දැසින් බැලුවොත් නොපෙනෙයි එක ඇසින් බැලුවොත් පෙනෙයි කියා නැවත අවවාද කියන් නේ මෙසේ නුඹ වහන්සේත් තනිව තපස් කළමැනවයි අවවාද කිය බොයි සත්වයෝත් නුවර බත් සිනා පාත්‍ර තැනකදී වළඳ, පාත්‍රය සොධා උරයේ බහා ගෙන සීවලී බිසවුනි! තොපි රදවයි කියා නික්මුණාහ. එසේ කිවත් එක්වම එන හෙයින් වනය සමීපයෙහිදී තණ පදුරක් අතින් කඩා දෙකැබලි කොට බිසවුනි! මේ කැඩූ තණ දෙමිට එක්වේ නමුත් නොප හා මා එක්වීමෙක් නැත තෘෂ්ණාව අළෙමි රදවයි කිහ. එබස් අසා බිසවු සොකයෙන් මූර්ච්ඡාව මුනින් වැටුනාහ. ඒ ප්‍රස්ථාවේදී රජ්ජුරුවෝ වහා වලට වැද ගැලවී යෙමි සිතා හිමාලය වනයට නික්ම අතරමඟ වන විසාර බල බලා හිමාලය වන තුළට වැද අතික් තුන්දැසක් අවුරුදු තාරද මිණ්ඩිත තාපසවරුන් කි නියා වට සොර තපස් කොට සතර බ්‍රහ්මවිහරණයෙන් භාවනා කොට බඹලොව ගියාහ. එවිට සීවලී බිසවුන් පසු පස්සේ ආ අමාත්‍යයන් හා සෙනාව සිවලී බිසවුන්ට පැන් ඉස සන්තර්ජණය කොට සම්භාවනා කළහ. සිවලී බිසවු නැඟී සිට අමාත්‍යයන් අතින් සවාමින් නොයි දැයි විචාළහ. අමාත්‍යයෝ නියන්නාහු නුඹ වහන්සේ වේද කැවිව ආ ස්කැඳි කියා අමාත්‍යයන් හා බිසවුන් සමඟ වන මුළුල්ල බලා නොදැක මහරජ්ජුරුවන් වියෝ වූයේ මෙතැනදීයයි එතැන දැගැබක් බඳවා නැවත මිපුලු නුවරට එන්නාහු රුවඩුවා ගේ ගෙදෙර දැගැබක් බන්ද වැලි කෙළිනා කුඩා කෙල්ල දුටු තැන දැගැබක් බඳවා මස්කැටිය වැළඳු තැන දැගැබක් බඳවා මිණ්ඩිත නම් තාපසයන් හා කථාකළ තැන දැගැබක් බඳවා නාරද නම් තාපසයන් අවවාද කි තැන දැගැබක් බඳවා මිපුලු නුවර මහුල් උයනට අවුත් දීඝායුකුමාරයන් වොටුනු පළඳවා රාජ්‍යයට සලස්වා අමාත්‍යයන් හා රජ්ජුරුවන් නුවරට යවා සිවලී බිසවු තුමූම මහු ල් උයනේ මහණව කිසුණු පිරියම් භාවිනාකොට කෘෂ්ණ පරිදි දෙන් මිය පරලොව ගියහයි වදාරා දෙකල් ගලපා මේ මහාජනක ජාතකය නිමවා වදාළසේක.

මහණෙනි! එසමයෙහි මණිමේඛලා දිව්‍ය සත්‍රී නම් උපුල්වන් මහාසථවිරිය. එසමයෙහි මිගාජින තාපසයෝ නම් සාරිවත්තයන් කෙරෙහි අග තැන් පත්වූ මුගලන් මහාසථවිරය. නාරද තාපස නම් නුවණැත්තන් කෙරෙහි අග්‍රවූ ශාරීපුත්‍ර මහාසථවිරය. වැලිකෙළි කුමාරිකා නම් දකුණත් සවිවූ බෙමා නම් මහාසථවිරිය. එසමයෙහි රූවඩුවා නම් ධම්මභාණ්ඩාගාරිකවූ ආනන්ද සථවිරය. එසමයෙහි සිවලි බිසවු නම් යසොධරා සථවිරිය. දීඝායු කුමාරයෝ නම් රාහුල සථවිරය. එසමයෙහි පිය අරිටු ජනක රජ්ජුරුවෝ නම් සුඩොදන මහරජ්ජුරුවෝය. මව් බිසවු නුම් මෙකල මහාමායා දෙවිය. පැමිණියාවූ රාජකන්‍රිය හැර මහාභිනික්මන් කළ මහාජනක රජ්ජුරුවෝ නම් දැන් දෙවොසි දෙවූ ශක්‍රාත්ම භාවයෙන් සමන්න භද්‍රවූ තිලෝගුරු සම්මාසම්බුදු රජවූ මම්ම වේම්දැයි තමන්වහන්සේ දක්වා වදළසේක.

මහා ජනක ජාතකය නිමි.

සාම ජාතකය.

භවද එක් සමයෙක්හි සනරාමර ලොක දිවාකර අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සකල ජනනඳන නඳන වනප්‍රතිභාග සුඳරතර තරුවිරාජිත ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් දුක් ගෙන මවුපියන්ට උපස්ථාන කරන එක් භික්ෂුකෙනකුන් වහන්සේ අරබයා මේ ජාතකය වදළසේක.

තේ කෙසේදයන්?

සැවැත්නුවර වනාහි අසූකෙළක් වසතුවෙන් ආඪ්‍යවූ එක් සිටු කුලයක එක් පුත්‍රයෙක් ඇත්තේය. එතෙම මවුපියන්ට අතිශයින් ප්‍රිය මනාප වන්නේය ඔහු මෑත භාගයෙහි එක් දවසක් ප්‍රාසාද තලයට ගොස් සිව් මැදුරු කවුළුව හැර වීජිය බලන්නේ ගඳ දුම් මල් පහන් ගත් අත් ඇතිව බණ අසන පිණිස ජෙතවනාරාමයට යන්නාවූ මනාජනයා දැක මමද ගොස් බණ අසා එම් සිතා ගඳ දුම් මල් ආදිය ගෙන්වා ගෙන විහාරයට ගොස් සිවුරුපිළි බෙහෙත් පාන වතීහයන් සඬ්ඝයා වහන්සේට පිළිගන්වා නැවත ගඬමාලා දීන් භාග්‍යවතුන් වහන්සේට පූජා කොට වැඳ එකත්පස්ව හිඳ බුදුරජාණන් වහන්සේගේ අති මධුරවූ ධම්දෙශනාව අසා කාමයෙහි ආදීනව හා ප්‍රව්‍රජා යෙහි ආනිසංස සලකා පිරිස් අතරෙන් නැඟි සිට බුදුරජාණන් වහන්ස් කරා එළඹ පැවිදි ඉල්වා මවුපියන් අනුමොදත් දරුවන් සඬ්ඝයෝ මහණ නොකෙරෙති යනු අසා මවුපියන් කරා ගොස් මහණවීමට අවසර ඉල්වා නොලැබුන හෙයින් සතියක් තිරාහාරව ඉඳ මවුපියන් අනුදන්වා ගෙන බුදුරජාණන් වහන්සේ කරා අවුත් මහණවීමට ආරාධනා කෙළේය. එවිට බුදුරජාණන් වහන්සේ එක් භික්ෂු කෙනකුන් වහන්සේ කැඳවා මොහු මහණ කරවයි වදළසේක. උන්වහන්සේද ඔහු මහණකළසේක. එසේ මහණවූ උන්වහන්සේට බොහෝ ලාභ සත්කාර උපන්නේය. උන්වහන්සේ ආචාර්‍ය්‍ය උපාධ්‍යාය

සන්ව උපස්ථාන කොට සිත්ගෙන ලබනලද උපසම්පද, ඇතිසේක් පස්අවු රුද්දක් ඇතුළත ශාසනධර්මය පුහුණු කොට ගෙන සිතනසේක් මම දැන් මෙහි භණ්ඩනිකාවෙන් යුකතව වසන්නෙම් එසේ විසිම යහපත් නොවෙයි සිතා ආරණ්‍යයෙහි විදර්ශිනාධුරය පුරනු කැමතිව උපාධ්‍යායයන්ගේ සමීපයෙන් කමටහන් ගෙන එක් පිටිසර ගමකට ගොස් ඒ ගම ගොදුරු හම් කොට ආරණ්‍යයෙහි වාසය කෙළේය. එසේ වසන්නාවූ උන්වහන්සේ විදර්ශිනාවට එළඹ දෙළොස් අවුරුද්දක් උත්සාහ කොටත් ඉණ විශෙෂයක් උපදවාගත නොහැකි වූසේක.

උන්වහන්සේ මහණවූ තැන්පටන් උන්වහන්සේගේ මවුපිය දෙදෙනා කල් යන්යත් දුක්පත්බවට පැමිණියාහුය. යම් බදුවූ ඔවුන් සතු කෙත්වත් හෝ වෙළඳුම් හෝ ඒ සියල්ලෙහි යම්යම් කෙනෙක් යෙදී සිටියාහු වේද ඔවිහු මේ කුලයෙහි පුත්‍රයෙක් හෝ මල්බෑකෙනෙක් හෝ මේ සියල්ලම විවාරාගන්ඨි නිසි හිමියෙක් නැතැයි කියා තම තමන්ට හසප්‍රාප්ත දේ ගෙන කැමති කැමති තැන්වලට ගියාහුය. දැසි දැස් කම්කරු ආදීහු ගෙයි තුබූ හිරණ්‍ය සුවණ්ණාදිය ගෙන ගියාහුය. එයින් මැතහාගයෙහි ඒ දෙදෙනා විවරක් තේරී අතට පැන් මාත්‍රයකුදු දිලන්ට නිසි සහායක් නොලැබ විසූ ගේද විකොට අනාගාරික කරුණට පැමිණ කුණු වැකුණු කිලිටි කඩමාලු හැඳ කබල් ගත් අත් ඇතිව සිහා කා ඇවිදිනාහුය.

එකල එක් භික්ෂුකෙනකුන්වහන්සේ සැවැත්නුවර ජෙතවනාරාමයෙන් නික්ම ක්‍රමයෙන්ගොස් උන්වහන්සේගේ පන්සලට වැඩිසේක. ඒ නෙවාසික තෙරුන්වහන්සේ ආගන්තුක තෙරුන්වහන්සේට වත් සපයා සුවසේ හුන් කල සඞ්ඝස්වාමීනි කොතනක සිට වැඩිසේක්දැයි විවාරු දෙවිරම සිට යයි කී කල බුදුරජාණන් වහන්සේගේ හා අසූමහසඞ්ඝයා වහන්සේගේද දුක්සැප විවාරා මවුපියන් පවත් විවාරනසේක් සවාමීනි! සැවැත්නුවර අසවල් සිටුකුලයෙහි ඇත්තෝ නිරෝගීහුදැයි කියා මවුපියන් දෙදෙනාගේ සුවදුක් විවාළසේක. එවිට ආගන්තුක තෙරුන්වහන්සේ කියනසේක් ඇවැත්නි! ඒ සිටුකුලයේ ඇත්තන්ගේ පවත් මා අතින් නොවිචාරවයි කීසේක. එවිට නෙවාසික තෙරුන්වහන්සේ සවාමීනි! එසේ වදුරන්ට කාරණා කවරහුදැයි විවාළසේක. එවිට ආගන්තුක සඞ්ඝස්වහන්සේ කියනසේක්. ඒ කුලයාගේ වත්‍රාහි එකම පුත්‍රයෙක් ඇත්තේය. එහෙම සසුන්වැද මහණවිය. ඔහු මහණවූ කල් තැන්පටන් ඒ කුලයෙහි භවභොගාදිය ක්‍රමයෙන් පිරිහි මහත් පරිහානියට පැමිණියේය. දැන් ඔවිහු දෙදෙන පමණක් සිහා කා ඇවිදිනි කීසේක. එවිට නෙවාසික තෙරුන් වහන්සේ ආගන්තුක තෙරුන් වහන්සේ වදාළ වචනය අසම්න්ම සවභාවයෙන් සිවුපියනොගි කඳුළුපිරුණු ඇස්ඇතිව අඬන්ට පටන් ගත්සේක. ඇවැත්නි කුමක්නිසිස ඔබවිදැයි විචාළකල කියනසේක් සවාමීනි! ඒ දෙදෙනා නම් මාගේ මවුපිය දෙදෙනය මම ඔවුන්ගේ පුත්‍රයෙමි කීසේක.

එවිට තෙරුන් වහන්සේ වදාරනසේක් ඇවත්නි! තොපගේ මවුපියෝ තොප පැවිදිවුහ නිසා විනාසයට පැමිණියෝය. එහෙයින් තොප ගොසින් ඔවුන් පිළිදගුවයි කීසේක. එසේ කියන්නේ උන්වහන්සේ මෙසේ සිතූසේක.

මම දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි වියඹ්නොවත් මාගිහියක් හෝ ඵලයක් උපදවාගත නුහුනුයෙමි. එහෙයින් අහව්‍ය වීමි මේ ප්‍රව්‍රජ්‍යායෙන් මට කවර ප්‍රයොජනද? හිහිව සිට මවුපියන් පොෂ්‍යය කෙරෙමින් දැන සිලාදි කුසල් කොට සවඟිහ පදප්‍රාප්තවෙමි සිහා අරණ්‍ය වාසය ඒ ආගනතුඛ තෙරුන් වහන්සේට දී දෙවන දවස් එසින් නික්ම ක්‍රමයෙන් ගොස් සැවැත්නුවරට නුදුරුවූ දෙව්රම් වෙහෙර පිවිසසට පැමිණිසේක. එතැන්හි දෙමාගිහයෙක් විය. එකෙක් දෙව්රමට යන මඟය එකෙක් සැවැත්නුවරට යන මඟය, උන් වහන්සේ ඒ දෙමංසඤියෙහී සිට කිමෙක්ද මම පළමුකොට මවුපියන්දකින්ට යම්ද නොදැහැත් බුදුන් දකින්ට යම්දැයි සිතා මා විසින් මවුපියන් බොහෝ කොට දුටුවිරුය. මෙතැන් පටන් වනාහි මට බුඩ දෂීනය දුලීභවන්නේය. අද සම්මාසම්බුදුරජාණන් වහන්සේ දැන ශ්‍රී සඩම්දෙශනාවද අසා සෙට උදැසන මම්මවුපියන් දක්නා පිණිස යෙමියි සිතා සැවැත්නුවරට යන මඟ හැර සවස් වේලෙහි ජෙතවනාරාමයට පැමිණිසේක.

එදවස් වනාහි මාගේ සවාමිදරුවූ බුදුරජාණන්වහන්සේ මහාකරුණා සමාපත්තියෙන් තැගී අලුයම් වේලෙහි ලොව බලා වදරනසේක් එකි භික්ෂූන් වහන්සේ සෝවාන් වන්ට නිසි හෙතු සම්පත් ඇති නියාව දැක වදරා ඔහු එනකල **මාතුපොසඤ** සූත්‍රයෙන් මවුපියන්ගේ ගුණ හා මව්පියන් රැකීමෙහි අනුසස් විසිතුරුකොට වදළසේක. එකල ඒ භික්ෂූන් වහන්සේ සඟ පිරිස් කෙළවර සිට බණ අසමින් මෙසේ සිතූසේක. මම ගිහිව සිට මවුපියන් රක්ෂා කරන්නට හැකිවෙමියි සිනිමි. ශාසනාවූ බුදුරජාණන් වහන්සේ වනාහි ප්‍රව්‍රජිත පුත්‍රවම සිට උපකාර කටයුතුයයි වදරනසේක. ඒ මම බුදුන් නොදැක ගියේවිමි නම් ඒකානතයෙන් මෙබඳුවූ ප්‍රව්‍රජාවකින් පිරිහෙන්නෙමි. දැන් වනාහි ගිහිනොව පැවිදිව සිටෙහනම මවුපිය දෙදෙනා රක්ෂාකෙරෙමියි සිතූසේක. එතෙම එසේ සිතා එදවස් දෙව්රම්වෙහෙර වැස දෙවන දවස් උදැසනම සැවැත්නුවරට පැමිණ කිම්දෑඳ ගනිම්ද මවුපියන් දකිම්දැයි සිතා දුප්පතුන් සමීපයට සිස් අතින් යන්ට සුදුසු නොවෙයි සිතා හුළුකැන් ගෙන ඔවුන්ගේ පළමු විසූ ගෙදෙරටම ගියසේක. ඒ වේලාවට මවුපිහෝ කාඳ සිනාඇවිද වෙහෙසි හිසාතියසමීපයට එළඹ වැටීහුන්නාහුය. ඔවුන්දැක උපන් නාවූ මහත් සොකයෙන් කඳුළු පිරුණු ඇස් ඇතිව ඔවුන්ට නුදුරුව වැඩසිටි සේක. ඒ මවුපියෝ උන්වහන්සේ දැක හැඳිනගත නුහුනුවාහ.

ඉක්බිති උන්වහන්සේගේ මවුතොමෝ පිඬු පිණිස සිටි කෙනෙක් විය යුතුය යන සංඥවෙන් සවාමීනි නුඹවහන්සේට දියයුත්තක් නැත. අනික් තැනකට වැඩිය මැනවයි කිවාය. උන්වහන්සේ මැනියන්ගේ බස් අසා ළඟිරුණු සොඳ ඇතිව ඇස් පිරුණු කඳුළු ඇතිව එහනම වැඩසිටිසේක. දෙවනුව තුන්වනුව කියනු ලබන්නේද වැඩසිටිසේක්මය.

ඉක්බිති උන්වහන්සේගේ පියාණෝ මැනියන්ට මෙසේකිහ. සොදුර! මෙතෙම නොපගේ පුතණුවෝ වියයුතුය ගොසින් බලා දැනගනුවයි කිහ. මැනියෝ නැගී සිට ගොස් බලා ඇඳින පාමුල වැටී හඬුවාහ. පියාණෝද එසේම කළහ. තෙරුන්වහන්සේ මවුපියන් දැක සවභාවයෙන් සිටපිය නොහි කඳුළු පවත්වා හඬා සොක ඉවසාගෙන සොක දුක් නොකළ මෙනුවයි මවුපිය

දෙදෙනා අස්වසා ගෙනගිය කෑද අනුභවකරවා එකත් පසෙක හිඳුවා නැවත බත් ගෙනැවිත් අනුභව කරවා තමන් වහන්සේ පිඬු සපයා සමීපයට ගෙන ගොස් නැවතත් බතින් පවරා ආහාර කෘත්‍යයකොට ඒ දෙදෙනා එක්තැනක හිඳුවා එතැන් පටන් උන්වහන්සේ මෙම නියායෙන් මවුපියන් පෝෂණය කෙරෙති. තමන් වහන්සේට පැමිණි පසු බත් ලාබත් ආදිය මවුපියන් දෙදෙනාට දී තමන් වහන්සේ පිඬු සිඟා ලද දෙයක් වළඳනසේක. වස්ත්‍රාසික විසින්ද අන්කිසි විසින්ද ලබනලද වස්ත්‍රද ඔවුන්ට දෙනසේක. ඔවුන් විසින් අඳිනලද දිරාගිය කිලිටි කඩකෑබලි ගොතා පඬුපොවා තමන් වහන්සේ වළඳිනසේක. ආහාර ලබන දවසටත් වඩා නොලබන දවස්වූහ. අදනා පොරෝනාද ඉතා රළුවූහ. මෙසේ උන්වහන්සේ මවුපියන් පොෂ්‍යය කෙරෙමින්ම මෑත භාගයෙහි කෘශවූ පඬුවන්වූ ශරීර ඇතිවූසේක.

ඉක්බිති උන්වහන්සේගේ සහාග භික්ෂූන් වහන්සේ ඇවැත්නි! තෙපි මීට පළමු ශරීරවර්ණයෙන් හොබනහුය. දැන් පඬුවන්වූ ශරීර ඇතිවිය. තොපට එක්තරා ව්‍යාධියෙක් උපන්දැයි විවාළසේක්ලාය. ඇවැත්නි! මට ව්‍යාධියෙක් නැත. එක් පළිබොධයක් ඇතැහි කියා එපවත් වදාළසේක. එවිට භික්ෂූන්වහන්සේ කියනසේක් ඇවැත්නි! සඩාදෙය්‍යවිනිපාතය වලකන ලද තොප වනාහි සැදැ ඇත්තන් විසින් දෙනලද දෙය ගෙන ගිහියන්ට දී රැකීම ඉතා දුසුදුසුයයි කීවාහුය. උන්වහන්සේ ඒ භික්ෂූන් වහන්සේලා කීවා අසා ලජ්ජාවෙන් ඇකිළ ගියසේක. එයින් කිසිකෙනෙක් නොසතුටුව බුදුන් කරා ගොස් ස්වාමීනි! අසවල් මහණතෙම සැදැහැයෙන් දුන් දෙයින් ගිහින් රක්නේය කියා බුදුන්ට දැන්වූවාහුය.

සර්ව්ඥයන් වහන්සේ එකී භික්ෂුව කැඳවා සැබෑද? මහණ! ගිහින් පුස් නේදැයි විචාරා වදාරා සැබෑව ස්වාමීනි! කිකල ඝනරාමර ලොක දිවාකරවූ බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේගේ ඒ ක්‍රියාව වර්ණනාකරන පිණිස තමන් වහන්සේගේ පූර්වචරිත්‍රය ප්‍රකාශකරන්නු කැමතිව ගිහින් රක්ෂාකරන්නාවූ මහණ! තෝ කවුරුන් රක්ෂා කෙරෙහිදැයි විචාරා වදාළකල ස්වාමීනි! මවුපිය දෙදෙනාගයි කීහ. එකල ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ඔහුට ඒ මවුපියන් රැකීමට දෘඪ උත්සාහ උපදවන පිණිස සාධු සාධු සාධු යි තුන්විටක් සාධුකාරදී වදාරා තෙපි මා ගියාවූ මාර්ගයෙහි සිටියහුය. පෙර මමද සසර සැරිසරනකල මවුපියන් රැක්කෙමියි වදාළසේක. ඒ භික්ෂූන්වහන්සේ මවුපියන් රැකීමෙහි දෘඪ උත්සාහ ලත්සේක. ඒ කථා සවරූපය අසනු කැමති මහා සඞ්ඝයා වහන්සේ ස්වාමීනි බුදුරජාණන් වහන්ස! නුඹවහන්සේ විසින් පෙර මවුපියන් රැක්ෂාපරිදි අසනු කැමැත්තම්හයි ආරාධනයකළ කල්හි සකලජන කාණ්ඩස්සායනවූ මේ **අතීත කථාව** ගෙනහැර දක්වා වදාළසේක.

ඒ කෙසේදයත්?

යටගිය දවස බරණැස් නුවර පිළියක් නම් රජ්ජුරු කෙනකුන් රාජ්‍යය කරන සමයෙහි එම බරණැසට නුදුරුනැන ගඩොවෙක්විය. ඒ ගම මෙතෙර පන්සියයක් ගෙවල් ඇති එක් වැදිගමෙක් විය. ගම එතෙරත් එසේම පන්සියයක් ගෙවල් ඇති වැදිගමෙක්විය. එගම් දෙකෙහි ගම්මුදලියෝ දෙදෙනා බාලනාල පටන් අති විශ්වාස ගෙයින් මෙසේවූ කතිකාවක් කළාහුය. ඉදින්

අප කෙරෙන් එක්කෙනකුන්ට දුවක් වූවාද එකෙක්හට පුතෙක්වීද ඔහු දෙදෙනා අවාහ විවාහ වෙත්වාසි සතිකාකොට උන් ඉක්බිති බඹලොවින් බ්‍රහ්මයෙක් චුතව අවුත් ගඟ මෙතෙර ගම්වසන නෙසාද ජ්‍යෙෂ්ඨයාගේ ගෙයි පුත්‍රව උපන, ඔහු උපන් ක්ෂණයෙහි දුහුලකින් පිළිගත් හෙයින් ඕහට **දුකූල කුමාරයෝ** යයි නම් තුබූහ. එසේම අනික් ගම්දෙටුවාගේ ගෙයිත් බ්‍රහ්ම යෙක් අවුත්පිළිසිඳ දුවව උපන්නිය. පරතෙරඋපන්හෙයින් ඇට **පාරිකායයි** නම් තුබූහ. ඔහු දෙදෙනම රන්වන් ශරීරයෙන් හා ප්‍රසාදවහ රූපසෞන්දර්‍යයෙන් යුක්තවූහ. වැදි කුලයෙහි ඉපිදත් ප්‍රාණවධ නොකෙරෙති. මෑත භාගයෙහි සොළොස් ඇවිරිදිවූකල දුකූලකුමාරයන්ට මවුපියෝ මෙසේකීහ. පුත හොපට කුමාරිකාවක් ගෙනැවිත් පාවාදෙමෝදැයි විවාළහ. ඔහු බඹ ලොවින් ආ හෙයින් පිළිකුල්කොට දෙකණ අතවසා ගිහිගෙන් කම් නැහ මෙසේවූ බස් නොකිව මැනවයි කීහ. තුන්විටක් කියතුදු නොඉවසූයේමය. පාරිකා කුමාරිකාවටද එසේම මවුපියෝ මැනියෙනි අපගේ යහළුවක්හුගේ පුත්‍රයෙක් ඇත. එතෙම මනාවූ රූපසොභා හා රන්වන්වූ ජවිවණි ඇත් තේය. ඕනට නුඹ පාවා දෙමෝදැයි මවුපියන් කිසල ඕද බඹලොවින් ආ බැමින් එසේම කියා කණ වැසුවාය. දුකූල කුමාරයෝ රහසින් ඇට පතක් සවන්නෝ මෛථුනධම්මය කැමැත්තිනම් අනික් පුරුෂයකුගේ ගෙට යව මා මෛථුන ධම්මයෙහි ඇල්මක් නැතැයි කියා යවූහ. ඇද එසේම දුකූලකුමාර යන්ට ග්‍රාමධම්ය කැමතිහොත් අනික් සත්‍රියකු පාවාගත මැනවයි රහසින් පත් යව්වාය මවුපියෝ ඔහු දෙදෙනා නොකමැති පරිද්දෙන්ම අවාහ විවාහ කළාහුය. ඔහු දෙදෙන කෙලෙස් මුහුදට නොබැස බ්‍රහ්මයන් දෙදෙනකුසේ එනතැන විසූහ. දුකූල කුමාරයෝ මසුන් හෝ මාංශ හෝ නොමරති. යටත් පිරිසෙසින් මරා ගෙට ගෙනා මස්වත් නොවිකුණති.

ඉක්බිති මවුපියෝ පුත! තෙපි වැදිකුලයෙහි ඉපදත් ප්‍රාණවධ නොකෙරෙති. ගෘහවාසයත් නොකැමැත්තහු කුමක් නම් කරව්දැයි විවාළහ. එවිට දුකූල කුමාරයෝ මැනියන්වහන්ස! පියාණන්වහන්ස! නුඹවහන්සේලා අනුදනිහු නම් අදම මහණවෙමියි කීහ. එසේවීනම් යවයි කියා අවසර දුන්හ. ඔහු දෙදෙන මවුපියන් වැඳ නික්ම ගංතෙර හිමවතට පැමිණ යම් තැනකින් **මිගසම්මත** නම් ගඩහාතොමෝ හිමවතින් බැස ගඩහාවට පැමිණි ඵාද ඒ ස්ථානයට ගොස් මහා ගඩහාව හැර මිගසම්මත නම් ගඩහාව අභිමුඛ කොට නැඟී හියාහුය.

එකෙණෙහි සක්දෙව් රජහුගේ පඬුඇඹුල් සලස්න උණුවිය. ශක්‍රයෝ ඒ කාරණය දැන විශ්වකම්දිව්‍යපුත්‍රයා කැඳවා දරුව! දුකූල පණ්ඩිතාදි දෙදෙනා මහණ වන්ට නික්ම හිමාලය වනයට ප්‍රවිෂ්ටවූය. තෝ ගොස් මිගසම්මත ගඩහාවට අවිඳුනක් පමණ අතරේ ඔවුන්ට පන්සලක් ද නවුස් පිරිකර ද මවා දි එවයි කීය. ඔහු යහපතැයි පිළිගෙන **මූගපක්ඛ ජාතකයෙහි** කී සැටියෙන්ම සියල්ල නිමවා අමනාප ශබ්ද ඇති වණඹ මෘගයන් පහකොට එක් පියවර සටහන් මාගීයක් මවා දෙව්ලොව හියෝය. දුකූල පණ්ඩිතාදි දෙදෙනා ඒ මාගීය දැක එයින් ගොස් අසපුවට පැමිණියාහුය.

ඉක්බිති දුකුල පණ්ඩිතයෝ පන්සලට පැමිණ තවුස් පිරිකර දැක ශක්‍රයන් විසින්ම අපි දක්නා ලද්දමෝය. මේද ඔහු විසින් දෙන පිරිකරයයි දැනගත්හ. සළු මුදහැර රත් වැහැරි සිවුර හැඳ පෙරවූ අදුන් දිවිසම් එකස් කොට ජටා මඬුල්ල බැඳ සෘෂි වෙස් ගෙන පාරිකා කුමාරිකාවටද ප්‍රව්‍රජ්‍යාව දී දෙදෙනාම ලොකික **මෛත්‍රී භාවනා** කෙරෙමින් එහා පන්සල වැසුහ. ඔවුන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් හා තපෝ තේජසින් ඒ වෙනෙහි වසන් නාවූ සියලු මෘග පක්ෂීහු ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා වාසය කෙරෙති, නසින්ට ගොදුරුවූ මැඩියෝ පවා පෙණ නමැති ඡත්‍ර ඡායාවෙහි සැනපී සිත්සේ වාසය කෙරෙති. සිංහයන්ට ගොදුරුවූ ඇත්පොව්වෝ පවා තමන්ගේ හස්තයෙන් කෙසරයන් තනා ඇවිදිනි දිවියන්ට ගොදුරුවූ මුවෝ දිවියන්ගේ මුවට මුව දී සිත්සේ ඒ වෙනෙහි වාසය කෙරෙති. මයුර නාදයට භීතියපත්වූ නාගයෝ පවා මොණරුන්ගේ පිය ගැබෙහි වාසය කෙරෙති. මෙසේ ඒ වෙනෙහි වාසය කරන සියලු ප්‍රාණීහු ඔවුනොවුන් කෙරෙහි සෑහ නැතිව වෙසෙති.

පාරිකා තාපසිකා තොමෝ බොන පැන් නහන පැන් තබා දසපුව ඇමද සියලු කටයුතු කෙරෙසි දෙදෙනාම පලාපල ගෙනැවිත් අනුභව කොට තමන් තමන්ගේ පන්සල්වල හිඳ මහණදම් කෙරෙමින් වාසය කළෝය. ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඔවුන්ට උපස්ථානයට එති එක් දවසක් ශක්‍රයෝ දිවැසින් බලන්නාහු ඒ දෙදෙනාගේම ඇස් අඹරීමට අන්තරායක් දැන දුකුල පණ්ඩිත යන් කරා එළඹ වැඳ එනත්පසෙක හිඳ මෙසේ කීහ. සාමීනි! නුඹවහන්සේ ලාට එක් අන්තරායෙක් පෙනෙසි, ඒ මතු රක්නා පිණිස පුත්‍රයෙක් ලබන්ට වටනේය. එහෙයින් ලොකධර්මය සෙවනය කළ මැනවයි කීහ.

එවිට තාපසයෝ කියන්නාහු ශක්‍රදෙවෙන්ද්‍රය! මේ නොකිය යුත්තක් කුමට කියාද ගෙයි වසනකල පවා මේ ලොකධර්මය නානා පණුකැලෙන් වැකුණු දුගඳක් අසුචි රාශියක් මෙන් පිළිකුල් කොට හැර විවෙක ජනාලය වූ හිමාලය වනයට පැමිණ වසී කළ පසිදුරන් ආති ඉසී වෙස් ධරා කෙසේ නම් මෙසේවූ නොසිරිතක් කෙරෙම්දැයි කිකල එසේ නොකරතොත් පාරිකාවන් මල්වර කල අතින් නාභිය පිරිමැන්ද මැනවැයි කීහ. තාපසයෝ මැනවැයි ඉවසූහ. ශක්‍රයෝ වැඳ අවසර ගෙන දෙව්ලොවට ගියෝය. තාපසයෝ එපවත් පාරිකා නම් තාපසිකාවට කියා ඈ උතුනි කල අතින් නාභිය පිරිමැන්දහ.

එකල පුරන ලද බොධි සම්භාර ඇති අප මහබෝසතාණෝ දෙව් ලොවින් චුතව අවුත් පාරිකාවන් කුස පිළිසිඳ ගත්සේක. ඕතොමෝ දසමස් ඇවැමෙන් රන්වන් පුතකු වැදුවාය. ජාම්බොනද සුවර්ණයකට බදු රූ ධරන හෙයින් **සාමකුමාරයෝ**යයි නම් තුබූහ. මැනියෝද පළිත අතරේ වසන කිනරාඩඛනාවෝද ඒ සාමකුමාරයන්ට කිරිමවුකම් කෙරෙති, මවුපිය දෙදෙන බොධිසත්වයන් නාවා කිරිපොවා පන්සල නිදිගන්වා පලවැල නිසා වල්ගිය කල්හි ඒ වෙනෙහි ලිය කිදුරෝ අවුත් සාමකුමාරයන් වඩාගෙන තමන්තමන්ගේ වාස්ස්ථානවූ පළිත ශිඛර මස්තකයෙහි ගෙන ගොස් මෘදුවූ මල් යහන්හි පිනවා සිරියලින් තිලකදී වෙනෙහි ඇති නන් කුසුම් සුවඳින් පූජාකොට පඬුඇඹුල් සලස්න පිට හුන් දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ

සක්දෙව් රජහට කරන නෘත්‍ය ගීතයක්මෙන් සියලු සිව්පාවෝ එක්ව නොයෙක් සුවඳින් මලින් හා නෘත්‍ය ගීතයෙන් මහත්වූ පූජොත්සව කොට පලවැල සොයා වල් ගිය දෙමවුපියන් පන්සලට එන කලැයි නියම දූත දෙවනුව සාමකුමාරයන් ගෙනවුත් පන්සල්හිම පිනවා යන්නාහ.

මේ නියායෙන් කෙළ ඇවිද ඒ වෙනෙහි සිව්පා සතුන් එක්ව ඒ ඒ තැන්හි විසිතුරුවූ පොකුණු ගං හෝ ඇල කඳුරු ආදි ස්ථානයන්හි හිඳ නොයෙක් කුසුමයන්ගේ සුගන්ධයන් හාත්පසින් ගෙන එන්නාවූ පවනින් හා අති ධවලවූ වැලිතලා වලින් යුක්තවූ නොයෙක් වෘක්ෂ ජායාවන්හි සිත්සේ කෙළ ඇවිද දවස් හැර සොළොස් ඇවිරිදිවූ කල්හි ඒ සාමකුමාරයන් තවුස් වෙස් ගන්වා පලවැල නිසා යානොදී දෙමවුපිය දෙදෙනා තුමූම පලවැල ගෙනවුත් රක්ෂාකරන්නාහ.

මෙසේ එක්දවසක් දෙමවුපියෝ සාමයන් පලවැල වළඳවා පන්සල්හි සිටුවා පලවැල පිණිස වනයට නික්මුණු කල්හි නැංගාවූ අකාල මෙඝයෙක් ධාරා නිපාතයෙන් වසින්ට පටන්ගත. ඒ තාපසයන් ඉදෙන ගසක් මූල සුඹසක් විට සෑක නැතිව සිටි කල්හි ඔවුන් ඇඟින් තෙමී බට ඩාදිය බින්දු ඒ සුඹස් කට ඔත් නාරජුගේ නාසාපුටයේ වැහුරුණේය. එක්ෂණයෙහි මහත්වූ විෂ තේජස් ඇත්තාවූ ඒ නාරජ කොපාග්නි වේගයෙන් දිලිහී විෂ ධූමයක් හැර ඒ දෙදෙනාගේ ඇස් සතරම අන්ධ කෙළේය. එකල්හි ඔහු දෙදෙනා කියන බස් මිස ඔවුනොවුන්ට නොපෙනෙන හෙයින් උන්ගේ අත අල්වාගෙන අඩා වැලප ඇවිදිනාහුය.

මෙසේ ගුණවත්වූ දෙදෙනාහට එකවිටම ඇස් නටුයේ කවර අකුසලය කින්දෙහෝයි යතහොත් මේ දෙදෙනා වහන්සේ එක්කලෙක වෛද්‍ය කුල යෙහි ඉපද වෛද්‍ය ශාස්ත්‍රයෙහි නිපුණව මෙසේම ඇස් නොපෙනෙන මිනිස කුගේ ඇස් දෙක කුලී ගිවිස්වා ගෙන වෙදකම් කොට නොබෝදවසකින් ඇස් ගුණවූ කල්හි ගිවිසි පදම් නොදෙමියි කී නිසා තමන් අඹුවට කී තැන ඕ කියන්නි කුලි නොදෙත් නම් බෙහෙදක් ලා ඇස් අන්ධ කරවයි කීය. අඹුවන්ගේ බස් ගිවිස මායම් කියා ඇස බෙහෙදක් ලූ කල්හි පෙරසේම ඇස් අන්ධ වූය. ඒ අකුසල බලයෙන් මෙතැන්හිදී ඒ දෙදෙනාගේ ඇස් අන්ධවූහයි දතයුතුයි.

එකල පන්සල උන් බොධිසත්වයෝ සවස් වනතුරු ගුරු දෙදෙනා එන පෙරමඟ බල බලා ඉඳ නොදැක මෙතෙක් කල් තබා එනුවන් දැක දැන් මේ වේලාව වනතුරු නොඑන්නේ කවර උවදුරෙක් ඒදෙහෝයි සිතමින් පන් සලින් පිටත්ව නොබෝ තැන් ගිය කල්හි ඔවුන් දෙදෙනා අඬනා හඬ අසා මවුපිය දෙදෙනාට හඬගැ කල්හි ඒ ඇසූ දෙමවුපියෝ පුත්‍ර ප්‍රේමයෙන් අඬගා කියන්නාහු එම්බා පුත සාමයෙනි! මෙතැනට නොඑව මේ වල උවදුරෙක් ඇත ඉවත්ව සිටුවයි අඬගා කීහ.

එකල්හි බොධිසත්වයෝ වලින් දික් ලීයක් කඩාගෙන අතට දික්කොට ලී කෙළවර අල්වාගන්ට කියා මවුපිය දෙදෙනා ලඟට කැඳවාගෙන ඇස් නට පවත් විචාරන්නාහු ඒ තතු විශෙෂයෙන් අසා ඒ අසල තුබූ සුඹස දැක මෙහි වසන්නාවූ විෂ ඝොර සර්පයකු විසින් හළ විෂධූමයෙන් ඇස් නටගසි නියම

දැන බොහෝ කම්පාව අඩ අඩා වැලප එක්ෂණයෙහි සිහසුනහුය. ඒ දෙදෙනා සිහසුනු අඩ අසා එම්බා සාමයෙනි! අපගේ දුක් ඉවසිය නොහී අඩා වැලපෙමින් සිටි තොප මේ ක්ෂණයෙහි සිහසෙන්ට කාරණා කිම්දැයි විචාළ දෙදෙනා වහන්සේට සිහාදුන කාරණය කියන සාමයෝ නුඹ දෙදෙනා වහන්සේ ළදරු වයසෙහිම මේලෙස ඇස් නව පසු මාගේ දිවි පවත්නාතෙක් කළමනා වහාවතින් හා පලාපලයෙන් කිසිත් අඩුනොව පොෂ්‍යය කොට බොහෝ කලක් දුක් ගනිමි යන සන්තොෂයෙන් සිටහ පහළ කෙළමිසි දන්වා එතැනින් ගුරු දෙදෙනා පන්සලට කැඳවා ගෙන ගොස් ඉන්නා සිටිනා තැන් හා යන තැනට එල්ලා යන වැල් බැඳ කළමනා කියමනා සියලු සත්කාර කොට දවස් යවා හිරු උදාකල්හි පන්සල්හි කළ මනාවත් සපයා සුදුසු පලවැල වළඳවා දෙගුරුන් වැඳ පුදා වල්ගොස් පලවැල ගෙනවුත් පන්සල තබා ගඟට ගොස් නහා ගිම් නිවා පැන් ගෙනවුත් පන් සල තබා දෙගුරුන් අතපය සෝධවා වඩා හිඳුවා පළමුව වළඳවා පසු තමන් වහන්සේ වළඳා මෙසේ නිරන්තරයෙන් මුව ගණ පිරිවරා වල්ඇවිද පලවැල ගෙනවුත් පන්සල්හි තබා මේ සැටියේ මවුපිය දෙදෙනා සියලු පොෂ්‍යයෙන් රකිනා කල්හි එකල බරණැස් නුවර රජ මුව දඩෙහි හිඳුව මේසේ අන්තඃපුර පිටිපුර සියලු රාජ්‍යය මවු බිසවුන්ට භාරකොට දුනු හී විවරක් ඇරගෙන වනාන්තරයට වැද ක්‍රමයෙන් ගොස් ඒ සාමයන් හා දෙමවුපියන් ඉඳිනා පන්සලට ආසන්නයේ මිගසම්මත නම් ගඩගාව දැක එහි බෑස නා හිම් නිවා එයින් නැඟී සිට බලනුයේ ඒ පන්සල සිට ගඟට පැහැට එන මුවන්ගේ පද සලකුණෙන් මේ ගඟට පැනට බස්නා මුවන් වනැයි කල්පනා කොට කොටු පත කඩා සිට දුන්න තරයේ ඇද විෂපෙවූ ශරයක් අතින් ගෙන සැහැලි සිට ගත් කල්හි එදවස් පලවැල සොයා ගිය සාමයන් පන්සල්හි පලවැල තබා කළය ගෙන මුවගණ පිරිවරා පැන්තොටට බැස නහා වල් කැලෑ ඇඳ කළයට පැන් උකා ඔසවාගෙන උරයේ තබන අතරෙහි කොටුපත කඩා සිටි රජ තමා උපන් තැන් පටන් මෙවැනි රූපයක් නුදුටුවිරූ හෙයින් කවුරුන් බවත් නොදන්න දෙවියෙක් දෝහෝ නාගයෙක් දෝහෝ සිඩ විද්‍යාධරයෙක් දෝහෝයි මොහු විදලා ඔබලත්වූ කල්හි විචාරා ගනිමි සිතා උරපුරා ඇද විෂපෙවූ ශරය අළ කල්හි දකුණැලයෙන් වැදගෙන වම් ඇලයෙන් නැඟී ශරය බිම සැහ වුනේය.

එකල්හි කැටිව සිටි මුවෝ මරණභයින් තැතිගෙන ඒ ඒ තැන්හි දිව පැහ. ඒ ශර පහර ලත් සාමයෝ විත් කා වැටෙන මේලෙහිත් ගුරුන් උන් දිසාව සලකා එදෙසට හිස නමා කළයද සෙමෙන් බා තබා රන්පිළිමයක් මෙන් වැල්ලේ වැදහොත්සේක් මඳක් සිහි එලවා විද්දවූ ඒ පිළියක් රජ නොදැක වදුරනසේක් උපන්තැන් පටන් මෙතැන් දක්වා නිරන්තරයෙන් අඛණ්ඩ අෂ්ටාඞ්ගශීලය රක්ෂාකොට දසපින්කිරියවත් පුරා මෛත්‍රී භාවනා කොට දවස් අරනා මට මේ වෙනෙහි සතුරුව හිඳිනාහු නැත. එසේවූ මාගේ මිනීමසින් ප්‍රයෝජනයකුත් නැතිව නිවැරදිවූ මා විදලා කුමට සැහ වුනුද මට මේ සා දුකක් කුමකට දුනවූද කුමට පව් අත බැන්දදැයි යනාදීන් කියන ලද්දවූ නොයෙක් බැගෑ තෙපුල් අසා සිටි පිළියක් රජ සිහන්නේ මෙවිට එලිබැස පෙනී මගේ බල අහව, මෙවුන් හා එක්ව කථා කෙරෙමියි කොටුපතින් එලිබැස සාමයන්ට කියන්නේ බරණැස රජකරන පිළියක් රජ

නම් මම්ය මුව දඩෙහි හිඳුව වතයට ආයෙමි නුඹවහන්සේ දැක කවුරුන් බවත් දැනගත නොහී විද්දෙමි නුඹවහන්සේගේ බැගැපත්වූ අදෝනා අසා ලඟට ආමිසි නොයෙක් සැබෑ බොරුවෙන් සාමයන් සිත්ගෙන් කියන්නාහු නුඹ තමා කවුරුද? කාගේ නැසිය කෙනෙක්ද? පැනට නුඹ තමා එව්වෝ කවුරුද? ඒ මට නොවලහා කිව මැනවයි කී කල්හි එසඳ සාමයෝ මම් මේ වෙතෙහි උපන්මි ඇස් අඹිවූ මවුපියන් රකිනා එකෙක්මි ඉන් පැනට ආවාවූ මා විද්දේ ඉහා නොතරම්ය මා මෙතැන විත් කා ඔත් බව මාගේ මවුපිය දෙදෙනා නොදනිති පමාවූ හෙයින් අඩා වැලපෙති පැන් පමණක් නොලැබ මසුන්සේ වියලෙති ඇස් නටහෙක් පවන් දවසකට දෙවිටක් නාවම් තුන් විටක් කවම් අහපය සෝදා නෙල්හා කොළසුන් පිට පිනවම් දැන් වනාහි උන් දසවිටක් කිවත් පැන් විසක් දෙන්නෝ කවුරුද? කවුරු සහහද්ද? කෙසේ රැකෙද්දැයි යනාදීන් මවුපිය දෙදෙනාගේ දුක් ඉවසිය නොහී තමන් වහන් සේගේ දුක් නොසිතා දෙගුරුන්ගේ දුකට අඩ අඩා කියන්නාහු මෙතන මා විත් කා වැටී පමාවූ හෙයින් පෙරවිග බල බලා ඉඳ සොල්මන් අසා මාගේ බස් පමණක් නොඇසූ දෙමවුපියෝ වෙනෙහි ඒ ඒ තැන අඩා වැලප ඇවිද දුක් විඳිනිසි සිතමි. අනේ මට විද්දාවූ නිරිදුනි! මාගේ දෙගුරුන් මූනත් නොබැලුය මේ ලොකයෙහි දුක් සැප දෙක පිරිමින්ට නියමය ඉතුත් දෙගුරුන් දුක් ඉතා බලවත්ව මහන්වූ බල ඇති බ්‍රහ්මචාරී සේක. මේ විදින් මා මලොත් මවුපිය දෙදෙනත් මියත් මුත් රැකි යාමෙක් නම් නැත. අනේ දුක් නම් දෙගුරුන් නොදකිනා දුක්මයසි බැගැපත්ව හැඬුසේක.

එකල්හි පිළියක් රජ සිතනුයේ මොහු මේ විදින් මෙලේ වීනම් මොහු ගේ ගුරු දෙන්නත් මියෙති මෙසේ බ්‍රහ්මචාරීවූ තුන්දෙනෙක් මලොත් එකානනයෙන් නිරා වදිත් මුත් අන් පිටිවහලෙක් නැතැයි හසින් තැතිගෙන අවුත් ඒ සාම කුමාරයන් දැක පින්වත්වූ සාමයෙනි නොපගේ ශරීර වෙදනා වට මුත් මවුපිය දෙදෙනාගේ දුක්ව නොඟඩව කියා මාගේ දිවි ඇතිතෙක් නුඹ ගුරු දෙදෙනාටම කළමනා වතාවතින් අඩුවක් නොව රකින්නෙම්මයසි අස්වසා සතුටුසින් ඇතිව සාම කුමාරයෝ ඉතා යහපත මාගේ දෙගුරුන් දිවි ඇතතෙක් රකිමි කී නොපට නමස්කාර වේවා දියුණ දියුණා වැඩෙක් වේවා දුකක් නොවේවා මා ගුරු දෙදෙනාත් යෙහෙන් රැකෙත්වා යනාදීන් රජු සොරෙනි මෛත්‍රී පතුරුවා ඉක්බිති ඒ රජුට කියන්නාහු මෙතනැවිත් කා හුනු බවද දෙගුරුන් පා වැඳි බවද දෙවනු දක්ක නොහෙන බවද දෙමවු පියන්ට සියවසි පන්සැටට සලකුණුද කියා ඔත්තාවූ සාමයන්ගේ ඒ පිළියක් රජහු බල බලා සිටියදීම යුගනෙත් වැසි ගියේය. අතපය විසිර ගියේය සාම යන්ගේ දිවි නැසී ගියේය යනාදිවූ අවමතුල් වෙස් දැක ඒ රජ මහා සොක තැවුලියෙන් ඉස අත තබාගෙන අඩා වැලප ඇඹිදි කල්හි ඒ සාමයන්ට සත් වැනි ජාතියෙහි මවු වූ ඛණ්ඩසාධිදී නම් දෙවි දූ දිවැසින් බලන්නී සාමයන් මිත් කා වැල්ලේ හුනු බවත් තමන් එතනට නොගිය හොත් සාමයන්ගේ දිවි යන බවත් පිළියක් රජ පැලෙන බවත් සාමයන්ගේ දෙමවුපියන්ගේ ජීවිත විනාසවන බවත් දැක ආකාශයට පැන නැඟී සාමයන් ලඟට අවුත් ඒ රජහට භයගන්වා තදින් දොළොකින් කටයුතුකාරිය කියා රජුහට ඔවාදී දෙගුරුන් මෙතැන් පටන් රකුවසි භාරකොට සාමයන්ට රැකවල් ලා ගෙන සිටියදී ඒ පිළියක් රජ සාමයන් නොදමා නිබ්බ පැන් කළය හමුදා ඇරගෙන

අසඤ්ඤතවූ ගමනින් පදසටහනින් පන්සලට එන්නවුන්ගේ එන වේග යෙන්මු දැන ඇස්නට හෙයින් දැකගත නොහී සාමයන්ගේ ගමනෙක් නොවෙයි සිතා දෙර කවුරුදැයි විචාරා මම පිළියක් රජයයි කී කල්හි තෙල පන්සල ඉඳ මිහිරිවූ පලවැල අනුභව කරවයි කී බස් අසම්න්ම පසුව අනුභව කෙරෙමි කීයා පන්සල ඉඳ කඩා තිබූ පලවැල දැක ඇස් ඇනි කෙනකුන් කැඩූ පලවැලයක් මෙනැයි රජ කී බස් අසා එසේය මපුතණුවූ සාමයන් ගෙනා පලවැලයයි මැනියන් වහන්සේ කී කල්හි එසේය මැනියන් වහන්ස! මම ඔවුන් දිවිමි. මුවන් කෙරෙහි කළ ලොභයෙන් මුවකුට හළ ශරය ඒ සාමයන්ගේ දකුණැලයෙන් පැහැර වම් ඇලයෙන් පැන නැංගේය. මෙසේ තමන් විදි පවත් හා සාමයන් වැල්ලේ හුනු බවත් විශෙෂයෙන් සාමයන්ගේ දෙමවුපියන්ට කී කල්හි ඒ ගුරු දෙදෙනා ඔවුන් පාමුල්හි අඩා හී අනේ මාගේ සාමයන් අප දෙදෙනාගේ මසැස් පෙරළී දිවැස් ලදුවාසේ ඇස් නට තැන් පටන් සියලු අත් පා මෙහෙයෙන් අඩුවක් නොව සුවපහස් දෙන්නාවූ මාගේ සාමයෝ කොයි ගියෝද අප දෙදෙනා ඇතුළුවූ සියලු සත්වයන්ට නපුරක්ලෙස බසක්නොකියා සිතිනුත් නොසිතන උපන්තැන් පටන් තුඩ බොරුවක් නොවකා ප්‍රාණඝාතයක් නොකොට නිරන්තරයෙන් පඤ්චශීලය රක්ෂා කළාවූ මාගේ සාමයෝ කොයි ගියෝදෝහෝයි මෙතැන්පටන් කෙසේ රැකෙමෝදැයි ඇස් නටුයේ අදවේදැයි යනාදීන් බැගෑපත්ව අඩනා ලෙස රජ දැක තෙමේද බොහෝ කම්පාවෙන් හඩා සාමයන් මළත් උන් සිටියාසේ සියලු පලවැලයෙන් මම රකිනෙම්වේදැයි නොයෙක් ක්‍රමයෙන් අස්වසා කිවත් නොගිවිස අඩාවැලප ඉක්බිති ඒ මවුපිය දෙදෙනා කියන්නාහු රජ්ජුරුවෙනි! නොපගේ අත්පා මෙහෙය අපසිහට නොනැහෙයි. අප රකුනම් අප අත සැරයටිය අල්වාගෙන සාමයන් ලඟවයවයි කීකල්හි රජතෙම ඒ දෙදෙනා වහන්සේගේ සැරයටි අග අල්වාගෙනවුත් වැල්ලේ වැදහොත් සාමයන් ලඟ සිටුවා තෙල වැලි වැකි ශරීරයෙන් වැදහෝනා නොපගේ පුතණුවන් බලවයි අන අල්වා පෑ කල්හි කල්‍යාණන්න වන්නියක් මෙන් ළෙහි වැද ගත් මහත් ශොකාග්නියෙන් අඩා හී ඒ මවුපිය දෙදෙනා සාමයන්ගේ සිරි පතුල් දෙක මැනියෝ ඔර තබා පියාණෝ ඉස ඔර තබාගෙන නොයෙක් අදෝනායෙන් අඩා වැලප ලොකපාල දෙවියන්ට යැද ඉක්බිති මැනියෝ සිතන්නාහු පණ නමා කඳ ඇද්දෙහෝයි පරීක්ෂාකරන මැනියෝ ළෙහි අත තබා පණකඳ සැහවුණු බව දැන එසඳ සත්‍යක්‍රියා කරන්නාහු මාගේ පුතණුවූ සාමකුමාරයන් උපන්තැන් පටන් ජීවිතාන්තය දක්වා අඛණ්ඩවූ බ්‍රහ්මචරියාව රක්ෂාකෙළේ සැබෑවිනම් ඒ සත්‍යක්‍රියාවෙන්ද මඟණවූ හැන් පටන් අද හිමිකොට අඛණ්ඩකොට රක්ෂා කළාවූ අෂ්ටාඞ්ග ශීලයෙහි ආනුභාවෙන්ද මේ ජාතියෙහි පටන් නිවන්දකිනා ජාති දක්වා බුඩාදි රත්නත්‍රය විනා අන්‍ය සමයක් නොගනුමෝද නිරන්තරයෙන් තිලකුණු සඳහන් කළමෝද යනාදීන් ඒ දෙදෙනා කළාවූ සත්‍යක්‍රියාවෙන්ද ඒ වෙනහි දෙවියන්ගේ ආනුභාවයෙන්ද සාමකුමාරයෝ සිහි ලැබ වැදහොත් ඇලයෙන් දෙවන ඇලයට නැමුණු කල්හි පියාණන් වහන්සේද මෙසේම සත්‍යක්‍රියාකළ කල්හි දෙවනඇලයෙන් නැමී වැදහොත්හ. සත්වන ජාතියෙහි තමන්ට මව්වූ බහුසොඩරී නම් දෙව්දුවගේ සත්‍යක්‍රියා බලයෙන්ද මවුපිය දෙදෙනාගේ ඇස් ලැබීමද සාමයන්ගේ දිවි ලැබීමද දිවයුරු උදුවීමද යන මේ තුන් කාරණය එකවිටම වූය.

එසඳ සාමකුමාරයෝ අඩන දෙමවුපියන් අසා බියගෙන උන් රජහට අවවාදානුශාසනා කොට පඤ්චශීලයෙහි පිහිටුවා මේ ජාතියේ දෙමවුපියන්ට උපස්ථාන කළවුන්ට දෙවියන් සහායවූබවත් තමා ජීවිතයලත් බවත් මවුපිය දෙදෙනා ඇස්ලත්බවත් ප්‍රත්‍යක්ෂකොට දුටුවේදැයි රජහට අනුශාසනාකොට දශරාජ ධර්මයෙන් රාජ්‍යයකොට රක්‍ෂාවන ලෙසට සමුදී නුවරට යවා තමන් වහන්සේ ජීවිතානිත්‍යය දක්වා දසපින් කිරියවත් පුරා කම්වූ පරිදිදෙන් බ්‍රහ්ම ලොකයෙහි උපන්නාහ. එසේහෙයින් මේ ධර්මදෙශනාව ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ගෙනහැර දක්වා වදාරා දෙමවුපියන් රක්‍ෂාකිරීම නම් නුවණැති පණ්ඩිතවූ මහොත්තමියන්ගේ වංශයෙහැයි වදාරා ජාතකය නිමවා වදාළසේක. මේ දෙශනාවගේ අවසානයෙහි දෙමවුපියන් රක්‍ෂාකළ භික්‍ෂුව සෝවාන් ඵලයෙහි පිහිටියේය.

එකල්හි සිළියක්ඛත්ත නම් ආනන්ද සථවිරයෝය, දිව්‍යසත්‍රී නම් උප්පල්වන් මහාසථවිරිය, ශක්‍රදෙවෙන්ද්‍රයෝ නම් අනුරුඬ මහාසථවිරයෝය, පියාණෝ නම් මහාකාශ්‍යප සථවිරයෝය, මෑනියෝ නම් භද්දකාපිලානිය, සාමපණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම වෙමි දැසි තමන් වහන්සේ දක්වා වදාළසේක.

සාම ජාතකය නිමි.

නිමි ජාතකය.

තවද එක් සමයෙක්හි දෙවාතිදෙවවූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මානි බ්‍රහ්මවූ වන්දනීයානි වන්දනියවූ පූජනීයානි. පූජනීයවූ දසබලධාරීවූ ශාක්‍යසිංහවූ පරදුකඹ දුඃඛිතවූ කාරුණා නිධානවූ ළයට සෙනෙහැනිවූ සසරට ප්‍රතිපක්‍ෂවූ නිවනට දෙර හළුවාවූ සවඥායට හිනි පෙති පෙළක් බදුවූ අපායට අකුල් හෙළූ ච්‍යත්ඛණ්ඩි අහසැන් පත්වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මියුලුනුවර නිසා මුව දෙවි නම් අඹ උයන්හි වැඩවසනසේක් ඕනා පහළකිරීමක් අරබයා මේ (**නිමි**) **ජාතකය** වදාළසේක.

ඒ කෙසේදැයි?

එක් දවසක් බුදුහු සවස් වේලෙහි බොහෝ භික්‍ෂු සඞ්ඝයා පිරිවරා මුව දෙවි නම් උයනට වැඩ සැරිසරා ඇවිදිනා සේක් එක්තරා සිත්කළුවූ භූමි ප්‍රදේශයක් දැක පුළුල් චරිතය සඳහන්කොට ඕනා පහළ කළසේක. ඒ දැන අනඳ මහතෙරුන්වහන්සේ තරුණ පිරිවැරූ පුන්සඳක් සෙයින් සිව්වණක් පිරිස් මැද වැඩහිඳ නොකරුණක බුදුහු ඕනහ පහළ නොකරනසේකැයි සිතා හුනස්නෙන් නැගී වම්පසින් දකුණත් පසට ගොස් උක්කුටුකයෙන් හිඳ දෙහොත් මුදුනෙහි තබා සවාමීනි! ඕනා පහළකළ කාරණු කිමෙක්ද? ඒ අසන්නා කැමැත්තම්හයි පුළුවුත්හ. එබස් අසා බුදුහු වදාරනසේක් එම්බා

ආනන්දයෙනි! මේ භූමිප්‍රදේශය නම් මා පෙර මඛාදෙව රජකල ධ්‍යාන කෙළි කෙළ විසූ හැනයයි සිතා සිතා පහළකළ කරුණ වදළසේක. ඔබ්ස් අසා අනඳ මහතෙරුන් වහන්සේ සවාමීනි! ඒ විශෙෂයෙන් අසනු කැමැත්තම්හයි ආරාධනා කළසේක. එකල මාගේ සවාමි දරුවූ බුදුරජාණන් වහන්සේ යුග දුරු මුදුනෙහි දිලියෙන සහස්‍ර කිරණයායේ ප්‍රඥප්ත වර බුඩාසනාරුසව වැඩ හිඳ බ්‍රහ්මඝොෂා විහිදුවා මේ අතීතඛථාව ගෙනහැර දක්වා වදළසේක.

ඒ කෙසේදයත්?

යටගිය දවස වේදෙහරට මිසුලුනුවර මඛාදෙව නම් රජ්ජුරුකෙනෙක් වූහ. ඒ රජ්ජුරුවෝ සුවාසූදහසක් අවුරුදු කුමාරකෙළි කෙළ සුවාසූදහසක් අවුරුදු යුවරජකම් කොට සුවාසූදහසක් අවුරුදු මහරජකම් කරන කල්හි මහුල් කපුවාට මෙසේ කීහ. යහලු කපුව යම්දවසෙක තෝ මාගේ හිස නර කෙස් දුටුයෙහිම්නම් එකල මට කියවයි කීහ. මැනහාගයෙනි කපුවා හිස නර කෙසක් දැක රජහට කියා රන්අඹුවෙන් උදුරා අත්ලෙහි තුබූකල නරකෙස් දැක මරණ ඇමිත් නලලට පැමිණියාක් වැනි භීයයි නුවණින් බලා දැන් මට මහණවන්ට කලැයි සිතා මහුල් කපුවාට ගම්වරයක්දී ජ්‍යෙෂඨ පුත්‍රයා කැඳවා දරුව රාජ්‍යය පිළිගනුව මම මහණවෙමි කී කල නුඹවහන්සේ මහණවන කාරණය කවරේදැයි විවාළ සඳ–

උත්තමඞ්ගරුහා මයහං—ඉමේ ජාතා වයෝ හරා
පාතුභූතා දෙවදූතා—පබ්බජ්ජා සමයෝ මමනති

යනාදීන් පුත! සඞ්ගයන්ට හිස නරකෙස් හටගැනීම නම් මරණ ළංබව කියන්ට එන දෙවදූතයන්වැන්න එසේහෙයින් මාගේ හිසනරකෙස් හටගත. ඒ කාරණයෙන් මම ජරාවට පැමිණියෙමි. මහණවනු කැමැත්තෙමි. තෙපි රාජ්‍යයකරව් කියා ඔහු රාජ්‍යාභිෂෙක කොට තෙපිද මා කළ පිළිවෙළ නොරදවා කරව් කියා අවවාදකොට නුවරින් නික්ම මුවදෙව් නම් උයනෙහිදී සෘෂි ප්‍රව්‍රජාවෙන් පැවිදිව අසූසාරදහසක් අවුරුදු සතර බ්‍රහ්මවිහාර භාවනා කොට නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියහ. ඒ මඛාදෙව මහරජහුගේ පුත්‍ර ව රජ්ජුරුවෝද හිස නරකෙස දැක මහුල්කපුවාට ගම්වරයදී දෙව පුත් හට රාජ්‍යයදී මුවදෙව් නම් උයනට ගොස් මහණව නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොක පරායණවූහ මෙසේ ඔහුගේ පුත්‍රයායයි දෙදෙනෙක් අඛු සුවාසූදහසක් රජහු හිස නරකොස් දැක මහුල්කපුවාට ගම්වරය දී දෙව පුත් හට රාජ්‍යයදී මෙම අඹ උයනෙහි පැවිදිව සතර බ්‍රහ්ම විහාර භාවනාකොට බඹලොව ගියපසු පළමුව උපන් මඛාදෙව නම් රජහෙම බඹලොව සිට තමා ගේ වංශයබලන්නේ දෙදෙනෙක් උනු සුවාසූදහසක් රජහුපැවිදිව බඹලොව ගිය බව දැක සතුටුව මෙයින් මතු පවතිදැයි බලා නොපවත්නා බව දැන මාගේ ප්‍රව්‍රජ්‍යා වංශය මම් ම නඩනොකොට පිහිටුවම්යි සිතා එයින් චුතව මිසුලුනුවර මහරජහුගේ අගමෙහෙසුන් කිසවුන් කුස පිළිසිඳ දසමසකින් මවුකුසින් බිහිවූයේය.

ඔහට නම් තබන දවස් නිමිත්ත පාඨකයෝ ලක්ෂණ බලා මහරජ්ජුරු වන් වහන්ස! මේ රජ කුමරුවා නුඹවහන්සේගේ වංශය රක්ෂාකිරීමට උපන් හේය. නුඹවහන්සේගේ වංශය නම් පැවිදිවන වංශය මොහු ඉක්ම නොපවත්නේයයි කීවාහුය. එබස් අසා රජහෙම කියනුයේ මේ රාජකුමාර තෙම

මාගේ වංශයට රජු සකෙහි තෙම්යක් මෙන් වංශය රකිමින් උපන් හෙයින් **නිමිකුමාරඅඝ්ඝසි** නම් තැබිය. ඒ නිමිකුමාරයෝ බාලකල පටන් දන්දෙමින් නිති පන්සිල් හා පොහොය පෙහෙවස් රකිමින් කුසල කරණයෙහි අනිරති ඇතිව වෙසෙති. ඉක්බිති පිය රජ්ජුරුවෝ පළමු ලෙසටම නරසෙස දූක මහුල්සාප්‍රවාට ගම්වරයදී නිමිකුමාරයන්ට රජ්‍යයදි අඹුයනේ පැවිදිව බ්‍රහ්ම ලොක පරායණවූහ. ඉක්බිති නිමි රජ්ජුරුවෝ දන්දීමෙහි ඇලුම් ඇතිහෙයින් නුවර සතර දොර හා නුවර මැදදැසි දානශාලා පසක් කරවා දවස පන්ලක්ෂ යක් ධන විසදා මහදන් පැවැත්වූහ. නිරන්තරයෙන් පන්සිල් හා පොහොය අවසිල් රකිති. එහා ජනයාද දානාදි කුසල ධම්යෙහි සමාදන්කොට සවගිහි මානිය කියා අනුශාසනාකොට නැවත නරක භයින් තැති ගන්වා ධම්දෙශනා කරනසේක. ඒ රජ්ජුරුවන්ගේ අවවාදයෙහි සිට දානාදි පින්කම්කොට මළාවූ සත්වයෝ දිව්‍යලොකයෙහි උපදිති. එකල දෙව්ලොව පිරි නරකාදිය සිස්වූ කලක්මෙන් විය. එකල තව්තිසා දිව්‍යලොකයෙහි දෙවියෝ සුධම්මා නම් දිව්‍යසභාවට රැස්ව අහෝ අපගේ ආචාර්‍යවූ නිමි රජ්ජුරුවන් නිසා බුදු නුවණින්නුදු පිරිසිඳ නොදහැකි මෙසා දිව්‍යසම්පත්තියක් අපි ලැබ අනුභව කරමිහසි කියා ඒ මහානුභාවයන්ගේ ගුණ වර්ණනා කළාහුය. මිනිස් ලොවද ඔබගේ ගුණ මුහුදු පිට ඉසි තෙලිත්තක් මෙන් පතලේය. ඒ බව ප්‍රකාශ කොට වදාරණ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක.

අවෙජරං වත ලොකසම්මං–උප්පජ්ජන්ති විවක්ඛණා
යදා අහූ **නිමිරාජා**–පණ්ඩිතෝ කුසලත්ථිකෝ
රාජා සබ්බවිදෙහානං–අදා දානං අරින්දමෝ

තස්ස හං දදතෝ දානං–සික්ඛාපෙසා උපොසථේ
දානං වා බ්‍රහ්මචරියං වා–කතමං සුමහප්ඵලන්ති.

ඒ නිමිරජ්ජුරුවෝ පසළොස්වක් පොහෝදිනයෙහි සම්මාදන් ගලවා ශ්‍රී යහනෙහි තබා පෙහෙවස් සමාදන්ව සැනපී පශ්චිම යාමයෙහි පිබිද පලක් බැඳ යනන් මිතුයෙහි හිඳ මෙසේ සැකයක් සිතූහ. **කොසේඛු සක්කාසක්දශක්?** මම වනාහි මහජනයාට නිගිපතා ප්‍රමාණාතික්‍රාන්තවූ මහදන් දෙමි නිත්‍ය යිල වශයෙන් පන්සිල් රකෙමි මේ දෙකින්ද දානයෙහි ඵල මහත් වේදෝ හෝ සිලයෙහි ඵල මහත් මේ දෙකෙහිම ඵල මහත් වේදෝ යන්න මේ අහෝසි මෙසේවූ සැකයක් සිතා ඒ සැකය පසිඳ විය නොහි උන්හ. ඔහු එසේ සිතූ ක්ෂණයෙහි දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝනයාඩ මින බොල් පොළොව හුණුවිය. සදද් දහතලා සත්කුල පව්විද හුණුවිය හිරි මුහුදු පබළු මුහුදු වෛඩූර්‍යයි මුහුදු එක පැහැර හුණුවිය. එක්ලක්ෂ අටසැට දහසක් දියුණුවූ තුන්ලක්ෂ සතලිස් දහසක් ගවු උස මේර මුදුනෙහි පිහිටි දසදහසක් යොදුන් තව්තිසා දෙව්නුවර හුණුවිය. සක්දෙව් රජහුගේ එකපුණ්ඩරික නම් උයනෙහි පිහිටි සියක් යොදුන් උස ඇති පරසතුරුක මූල පැහැ නැති දිග සැටයොදුන් පුළුල පණස් යොදුන් උස පසළොස් යොදුන් බිදුවද පෙත්තක බදු පැහැ ඇති උන්හල නාහිය දක්වා ගැලියන නාගිකල බෙර ඇසක් සේ සම්වන පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. එවිට සක්දෙව් රජ අස්සෙහි හිඳ විය නොහී කාටවූ විසඳන්නේ හෝසි දහසක් නුවණැස් ලා බලහුයේ මිහබෝසතුන් සිත උපන් කුකුස දූන උදකලාවම් වහා දිවුත් සියලු රාජභවනය එකාලොක කොට ශ්‍රී යහන් ගබඩා විට පැමිණ ආලොක පතුරුවා ආකාශයෙහි සිටියේය.

එවිට නිමි රජ්ජුරුවෝ ලොමු දැහැගැස්ස ශරීර ඇතිව ශක්‍රයන් අතින් මෙසේ විචාරනු ලැබූ මේසා වණ්ණයකින් යුක්තව සිටියාවූ තෙපි මහානුභාව සම්පන්න දෙවතාවෙක්ද? ගාන්ධර්වයෙක්ද? නොකොත් ශක්‍රදෙවෙන්ද්‍රයාදැයි විචාළාහ. එවිට ශක්‍රයෝ මහරජ භයනුවුව මැනවූ. නුඹවහන්සේගේ සිත උපන් සැක පයිදන පිණිස අවාවූ මම ශක්‍රයෙමි. මනුජේන්ද්‍රය තොපට කැමති පැණයක් මා අතින් විචාළ මැනවයි කිහ. මේසේ ශක්‍රයා විසින් අවකාශ ලත් මහරජ්ජුරුවෝ කියන්නාහු එම්බා භූතෙඤ්ඣරවූ ශක්‍රදෙවෙන්ද්‍රය **දූනඤ සිලඤඤි** කියන ලද ස්ත්‍රීප්‍රකාර ධර්මයන් හෙරෙන් කවරෙක් මහත්ඵල දැයි විචාළසේක. එවිට ශක්‍රයෝ—

හිනෙන බ්‍රහ්මචරියෙන-ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං-උත්තමෙන විසුජ්ඣති.

යනු හෙයින් මහරජ හීනබ්‍රහ්මචරියාවෙන් රජව උපදනේය. මධ්‍යම බ්‍රහ්මචරියාවෙන් දෙවිව උපදනේය. උත්තම බ්‍රහ්මචරියාවෙන් පිරිසුදු වන්නේය. ඒ තිර්‍යග්‍යෝනියෙහි මෛථුන් විරතිය හින නම් වෙයි. ධ්‍යාන යාගේ උපචාර මාත්‍රයක් මධ්‍යම වෙයි අෂ්ටසමාපත්ති ඉපදවීම උත්තම වෙයි. ඒ කාරණයෙන් බාහිර තාපසයෝ බඹලොව උපදනා හෙයින් ධ්‍යානය නිර්‍වාණයයි කියති හෙවත් මේ ශාසනයෙහි වනාහි පිරිසුදු සිල් ඇති මහණ එක්තරා දිව්‍යනිකායෙක් පහානම් ඔහුගේ බ්‍රහ්මචරියා චෙතනාව හීනහෙයින් හීන නම්වෙයි. ඔහු පැතූ ලෙස දිව්‍යලොකයෙහි උපදනේය. පිරිසුදු සිල් ඇත්තහුගේ අෂ්ටසමාපත්ති ඉපදවීම මධ්‍යම වන්නේය. ඔහු බ්‍රහ්මලොකයෙහි උපදනේය. පිරිසුදු සිලයෙහි සිට විදර්ශනා වඩා රහත්ඵල උත්තම වන්නේය. මේ කාරණයෙන් පිරිසුදු වන්නේයයි මෙසේ ශක්‍රයෝ කිහ. දැනයට වඩා සහසහසු ගුණයෙන් **සිල්ඛන්ධ මහන්ඵල මහානිසංසයි** වණ්ණනා කළහ.

ඒවද මහරජ අතීතයෙහි **දුද්දභ, ඝාඝරඅ, සෙලඅ, මුඛලිඤ්ඣ, භගීරථඅ, උසීනරඅ, අවාහභඅ, අසඤ්ඤඅ, පඤ්චජ්ජුනඅ,** යන මේ මහ රජදරුවෝද අනිසුදු ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි බොහෝදෙනාද අනෙකා ප්‍රකාර දන් දී මරණින් මත්තෙහි කාමසවඟියෙහිම උපන්හ. **ඝාමණ්ඩු** නම් තාපසයෝය, **සොම්මඝොඝ** නම් තාපසයෝය, **මනෝජව** නම් තාපසයෝය, **සමුද්‍ර** නම් තාපසයෝය, **මාඝ** නම් තාපසයෝය, **භරත** නම් තාපසයෝය, **ඛාලිඝරඛාඛිය** නම් තාපසයෝය, **අංගීරස** නම් තාපසයෝය, **ඝ යැප** නම් තාපසයෝය **කිසවච්ච** නම් තාපසයෝය, **අසිතඤ්ඣි** නම් තාපසයෝය, යන මේ ඍෂිවරයෝ එකොළොස්දෙන සිල් රකුණාකොට දෙව්ලොව ඉක්මි බඹලොව උපන්නාහ

නවද සීලය මහත් බව භග්වත පිණිස කථාවක් දක්වන්නාවූ ශක්‍රයෝ මහරජ අතීතයෙහි උතුරු හිමවත සබඳි පළිත දෙකට අතරෙන් පැවැත්තාවූ බොහෝදුරට හියාවූ ගැඹුරුවූ ඉතා සියුම්වූ ජල ඇති හෙයින් යටත් පිරිසෙයින් මොණර බිලකුදු එහි බහාලුව සිදහැ යන හෙයින් ද නම්වූ ගඞ්ගාවක් වූවාය. ඒ සිදු නම් ගංතෙර රන් පළිහයෝ දිදුලන හිනිදැලක් මෙන් ආලෝක කෙරෙති. ඒ ගඞ්ගාවගේ දෙගොඩ තුවරලා ආදි සුගන්ධ ද්‍රව්‍යයෙන් හා පුෂ්ප ඵල පල්ලව භාරධාරිත වෘක්ෂයෙන් සසඳුන්නාවිය.

මෙසේ සිත්කළුවූ භූමි ප්‍රදේශයෙහි දසදහසක් ඍෂිවරයෝ වාසය කෙරෙති. ඒ සියල්ලෝ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභීහුමය. ඔවුන් හෙරෙන් කිසි හෙනෙක් සිහායන වේලෙහි උතුරුකුරු දිවයිනට යෙති. කිසි හෙනෙක් මිහදඹ ගෙනෙති කිසි හෙමනක් හිමාලයෙහිදීම මිහිරි පලාපලයන් ගෙනැ විත් වළඳති. සමහර හෙනෙක් දඹදිව ඒ ඒ තුවරවලටම ගොස් සිහා වළඳති. ඉත් එක හෙනකුදු රස තෘෂ්ණායෙහි නොබැඳි ධ්‍යාන සුවයෙන්ම දවස් අරිති. එකල්හි එක් තාපස හෙනෙක් ආකාශයෙන් බරණැස් නුවරට ගොස් මනාහොට හැඳ පෙරව පිඬු පිණිස හැසිරෙමින් පුරොහිත බ්‍රාහ්මණයාගේ ගෙදොරට පැමිණියේහ. පුරොහිත තෙම උන්වහන්සේගේ ඊර්ෂ්‍යා පථයෙහි පැහැද ඇතුළු ගෙට වඩා ගෙන ගොස් දන් වළඳවා එසේම කිප දවසක් උපස්ථාන හොට විශ්වාස බවට පැමිණ සිටියේය. නුඹවහන්සේ වසන තැන් නොහිදුසි විචාරා අසවල් තැනයසි කී කල්හි කිමෙක්ද නුඹවහන්සේ තනිවම වැඩවසන සේක්ද? අනික් හෙනෙක් ඇද්දැයි කී කල පින්වත කුමක් නියාද? ඒ ආශ්‍රම පදයෙහි අසූදහසක් ඍෂිහු වෙසෙති. ඔව්හු සියල්ලෝම පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති ලාභීහුයයි කීසේක.

එව්ව උන්වහන්සේලාගේ ගුණ අසා ඔහට මහණවීමට සිත නැමී නැවත සිටියේය. මාද එහනට කැඳවා ගෙන ගොස් පැවිදි කරවා වදුල මැන වයි කී කල තාපසයෝ කියන්නාහු ඇවැත්නි! නුඹ රාජපුරුෂයෙක පැවිදි කරනට නොහැකියයි කී කල එසේ වී නම් සිටියේය. මම රජ්ජුරුවන් විචාරා අවසර ගනිමි නුඹවහන්සේද සෙට මෙතනට වැනිය මැනවයි කිවුය. තාපසයෝද ඉවසූහ. පුරොහිතතෙම උදය බත් අනුභව හොට රජ්ජුරුවන් කරා ගොස් දෙවයන් වහන්ස! මම මහණවන්නට කැමැත්තෙමි අවසර දුන මැනවයි කිය. ආචාර්යයිනි! කවර කාරණයක් පිණිස මහණ වන්නහුදැයි විචාළ කල කාමයෙහි ආදීනව හා මහණ වීමෙහි ආනිසංස දැනයයි කිය. එසේ වී නම් තෙපි මහණව මා දක්වයි කීකල ඔහු යහපතැයි පිළිගෙන ගොස් පුත්‍රදාරාවන්ට අනුශාසනා හොට සියලු සැපත් දක්වා දී තමන් ශ්‍රමණ පරිෂ්කාර ගෙන තාපසයන් එන පෙර මහ බලමින් උන්නේය: තාපසයෝද එසේම ආකාශයෙන් අවුත් ඇතුළු නුවරට පැමිණ ඔහුගේ ගෙට වැඩියේහ. ඔහු උන්වහන්සේ සකස් හොට වළඳවා සිටියේය! මා විසින් කුමක් කටයුතු දැයි විචාළේය. උන්වහන්සේ ඔහු නුවරින් පිටතට ගෙන ගොස් අත අල්වා ගෙන තමාගේ ආනුභාවයෙන් ඒ ආශ්‍රමයට ගෙන ගොස් පැවිදිකරවා දෙවන දවස් බත් සිනා ගෙන දී සතිය පරිකර්ම ඉගැන්වූසේක. ඔහු කිප දවසකින්ම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා තෙමේම පිඬු සිහා අනුභව හොට මෑත භාගයෙහි මම රජ්ජුරුවන්ට දුන් ප්‍රතිඥාවෙන් මිදෙමියි සිතා තාපසවරුන් වැඳ ආකාශයෙන් බරණැසට ගොස් සිතමින් රාජවාරයට පැමිණියේහ. රජ්ජුරුවෝ තාපසයන් දැක ඇඳින ඇතුළු රජගෙට කැඳවා සත්කාර හොට සිටියේය! නොහැන්නි වසනසේක්දැයි විචාළහ. මහරජ! උතුරු හිමවත්පස සවඹේ පළිත අතරෙන් පවත්නා සිදු නම් ගංතෙරයයි කීසේක. කිමෙක්ද නුඹවහන්සේ පමණක් උදකලාව වසනසේක්ද? අනික් හෙනෙක් එහි ඇද්දැයි විචාළහ.

එවිට තාපසයෝ මහරජ කුමක් කියවද? අභිඥ සමාපත්ති ලාභීවූ දස දහසක් තාපසවරු එහි වසන්නාහුයයි කිසේක. රජ්ජුරුවෝ ඒ තාපස වරුන්ගේ ගුණ කථා අසා හාමුදෙනා වහන්සෙවම් දන්දෙනු කැමතිව ඒ තාපසයන්ට මෙසේ කිහ. සවාමීනි! මම ඒ සියලු සෘෂීන් වහන්සේලාට දන් දෙනු කැමැත්තෙමියි කී කල මහරජ මම කුමක් කෙරෙම්ද? සෘෂිවරයෝ රසයෙහි ගිජු නොවන හෙයින් මෙහි කැඳවා ගෙන එන්ට නොහැක්කෝයයි කී කල සවාමීනි! නුඹවහන්සේ නිසා ඒ සියලු තාපසවරුන් වළඳවම් ඊට මට උපායෙක් කිව මැනවයි කිවුය. මහරජ එසේ උන්වහන්සේලාට දන්දෙනු කැමැත්තහු නම් මෙයින් නික්ම ගොස් සීදු නම් ගංතෙර වසමින් ඒ තාපස වරුන්ට දන් දෙවයි කිසේක. එවිට රජ්ජුරුවෝ යහපතැයි පිළිගෙන සියලු උපකරණ ගෙන්වා ගෙන චතුරඞ්ගිනී සෙනාව හා සමිඟ නික්ම තමන්ගේ රාජ්‍ය සීමාවට පැමිණියෝය. නැවත ඒ තාපසයෝ තමන්ගේ ආනුභාව යෙන් සෙනාව හා සමඟ රජ්ජුරුවන් සීදු නම් ගංතෙරට පමුණුවා ගංතෙර කඳවුරක් කොට ආකාශයෙන් තමන් වසන තැනට ගොස් දෙවන දවස් නැවත අවුය. ඉක්බිති රජ්ජුරුවෝ තාපසයන් සතස්කොට වළඳවා සවාමීනි! සෙට දවස දහසක් තාපසවරුන් කැඳවා ගෙන මෙතනටම වැඩිය මැනවයි කිහ. තාපසයෝ යහපතැයි කියා ඒ වචනය පිළිගෙන ගොස් දෙවන දවස් භික්ෂාචාර වේලාවට තාපසවරුන් කරා ගොස් මේසේ කිවුය. පින්වත්නි! බරණැස් රජ්ජුරුවෝ නුඹවහන්සේලාට දන්දෙමියි අවුත් සීදු නම් ගංතෙර ඉඳ නුඹවහන්සේලාට ආරාධනා කළහ. ඒ රජ්ජුරුවන් කෙරෙහි කරුණා වෙන් කඳවුරට ගොස් ආහාර වැළඳුව. මැනවයි කී කල යහපතැයි පිළිගෙන හැමදෙනම ආකාශයෙන් ගොස් කඳවුරට නුදුරු තෙන බටසේක්ලාය රජ්ජු රුවෝ ඉදිරියට ගොස් කඳවුරට වඩා ගෙන ගොස් අසුන්වල වඩා හිඳුවා ප්‍රණීත ආහාරයෙන් සන්තර්පණය කොට ඔවුන් රාජ්‍යාභිෂේකයෙහි පැහැද සෙට දවසටද ආරාධනා කළහ. මේ ආකාරයෙන් දසදහසක් අවුරුදු දන් දුන්හ. දන් දෙමිනුත් එම ගංතෙරම නුවරක් කරවා ගොවිතැන් කම්හන්ත කරවූහ.

මහරජ! ඒ රජ්ජුරුවෝ වනාහි අනික් කෙනෙක් නොවෙති මම්මය. මෙසේ මම එකල දන්දීමෙන් ශ්‍රේෂ්ඨව මහදන් දී දෙව්ලොව ඉක්මවා බ්‍රහ්ම ලොකයෙහි ඉපදීමට නොහැකි විමි. මා දුන් දන් වළඳ සිල් රැකි තාපසවරු කාම ලොභය ඉක්ම බඹලොව උපන්නාහ. මහරජ මම දානයෙන් ශ්‍රේෂ්ඨ වීමි. ඒ තාපසවරු සීලයෙන්ද ඉන්ද්‍රිය දමනයෙන්ද උපචාර සමාධියෙන්ද අර්පණ සමාධියෙන්ද භාය භීවෙනා චිත්ත විවේකයෙන්ද යන මේ ආදී වූ සමාදානයෙන් උත්තමවූහ අභිඥාවෙන් ශ්‍රේෂ්ඨවූහ.

භවද මහරජ දසදහසක් තවුසන් අතරෙන් එක්තෙනකුදු කායවඞ්කා දියක් නැති හෙයින් හිතයයි නොහැර ජාති නොවිචාරා ඔවුන්ගේ ගුණයෙහි පැහැදී සිතින් ඉතා බොහෝවූ කලක් තමස්කාර කෙරෙමි කුමක්නිසාද කිව හොත් සත්‍යයා මේ කුශලකර්මය බැඳුනොට ඇත්තේය. කර්මය පිළිසරණ කොට ඇත්තේයයි මෙසේ දැන සීලාදී කුශල ධර්මයන් වර්ණනාකොට කියා මහරජ! දානයට වඩා සීලය මහත්ඵල මහානිශංස වන්නේය. මහරජ! හෙපි වනාහි දැන සීල දෙන සිතව් මේ දෙකෙහිම අප්‍රමාදව දන්දෙව සිල් රකුවයි අනුශාසනා කොට දේවලොවටම ගියාහ. එසේ ගිය සක්දෙවිරජහු දැන ඒ

දෙව්ලෝ වැසි දෙවියෝද සහාරවරම් රජහුද බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරයෝද මාතලි දෙව්පුත් ඇතුළුවූ සුදම්දෙවි සභාවට රැස්වූ දෙවියෝ හැම දෙනාම මහරජාණෙනි! කොහි ගොස් ලස්වූදැයි තුළුවුත් කල්හි සක්දෙව්රජ කියන්නේ මිනිස්ලොව මියුලුනුවර රජකරන නිමි මහරජාණන් සිත උපන් කුකුස් වත් පසිඳින්ට නියෙමි කිය. එබස් අසා හැමදෙවියෝ කියන්නාහු ඒ නිමි මහරජාණෝ අපගේ හුරැය උන්නේ අවවාදයෙහි සිට මිනිස්ලොවදී පින් කොට දිවසැපත් ලදුම්හ. එසේ හෙයින් උන් කරා ගොස් බණඅසා එන්ට යම් හයි කිවුය. එබස් අසා සක්දෙව්රජ කියන්නේ තොප හැම ඔබගියොත් අසුරයෝ අවුත් නොප හැමගේ විමන් හැර ගත්තුනම් අනෙතුය ඒ නිමිමහරජාණන් මොබ ගෙන්වාගෙන බණ අසම්හයි කිය. එබස් අසා හැමදෙවියෝ සතුටුව නිවිස්සාහ. සක්දෙව්රජ මාතලිදෙව්පුත් කැඳවා කියන්නේ මා නැහෙන පන්සියයක් යොදුන් නාරිවාහන නම් රථය සේක්ඛවයන් දහසක් යොදා දිවමල් දිවසුවඳ දිවසළු දිවඅබරණ ගෙන මිනිස්ලොව මියුලුනුවර රජකරන නිමි මහරජාණන් කරා ගොස් ගදදියෙන් නාවා දිවසළු හඳවා දිවමල් දිව අබරණ පළඳවා දහසක් දිවදුහුලින් ඉස සිසාරා සරහා කැඳවාගෙන එවයි කිය. ඒ අසා මාතලිදෙව්පුත් නාරිවාහන රථය දහසක් සෙක්ඛවයන් යොදා ගෙන දිවමල් දිවසළු දිවඅබරණ නෙත තවිනිසා දෙව්ලොවින් අවුත් පැදුම් මුහුදින් නැහෙන දෙපෝ මැද පුන්සඳක්සේ මියුලුනුවර තුන්වටක් පැදකුණු කොට නිමි මහරජාණන් පාකුස්හි රථය එලවා සිට කියන්නේ නිමි මහරජාණෙනි! දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ නායක සක්දෙව්රජ තමන් නැහෙන පන්සියයක් යොදුන් නාරිවාහන නම් රථයෙහි දහසක් සෙක්ඛවයන් යොදා දිවගඳ දිවසළු දිවමල් දිවපළඳනා පළඳවා දෙව්ලොව ගෙන යන්ට එවිය නුඹවහන්සේ සුවද පැනින් නහා දිවසළු හැඳ දිවමල් දිවපළඳනා පැළඳ දහසක් දිවදුහුලින් හිස සිසාරා සැරහී රථයට නැඟී අවමැනවයි කිය. මාතලි දෙව්පුත් අතින් එබස් අසා සතුටුව තමන්ගේ ඇමති මහජනයා කැඳවා කියන්නාහු දෙදෙව්ලොවට අධිපතිවූ සක්දෙව්රජ දෙදෙව්ලෝ වැසි දෙවියන් හා සමඟ අප අතින් බණ අසන පරිද්දෙන් දෙව්ලෝ ගෙනයන්ට තමන් නැහෙන නාරිවාහන නම් පන්සියයක් යොදුන් රථය දහසක් සෙක්ඛවයන් යොදා දිවසළු දිවමල් දිවඅබරණ දී මාතලි දෙව්පුත් එවිය. අප ඔබ ගොස් බණ කියා එනතෙක් තුබු පිළිවෙළ යොවරදවා රකුවයි කියා සත්රුවන් වොටුනු පුදා පමානොවී දන් දෙවයි දන්වැට පවත්වා සතතයෙන් පන්සිල් පොහොය අටසිල් රැකා වාසය කරවයි අවවාද දී මියුලු නුවර පැදකුණුකොට බොහෝදෙනා කරතලද පූජාසත්කාර විඳ රන්ගල් ගුහාවකින් නික්මුණු සෙසරසිංහ රාජයකුසේ දෙපෝමැද නැඟි පුෂ්පසඳක්සේ රථයට නැංගාහුය. රථය බොහෝදෙනා බලා සිටියදීම සවණිණනංස රාජයකුසේ ආකාශයට පැන නැඟී ගමන්ගත් කල්හි මාතලි දෙව්පුත් කියන්නේ මහරජාණෙනි! පින්බලවුන් වසන දෙව්ලොව බලා පදිම්ද පවුකළවුන් වසන නරකය බලා පදිම්දැයි කිය. නිමි මහරජාණෝ නරකය බලා පදුවයි කීහ. නරකය බලා පදුන්මි නිමි මහරජහට තුන්ගවුපමණ සිරුර විය ගවු පමණ මිණිමොවුන්න විය. මහවැලිගඟ සා මූත්හර විය. අහසගිරි වෙහෙර සා මිණිමොවුල් විය. සැටගැලක් පමණ ආහරණ විය. දෙලොස් යොදුන් දිවදුහුල් විය නිරිටි රන්සඳත් විය. මේසේ ශක්‍රවෙස් පහළවිය. මාතලි දෙව්පුත් රථය

නරකය බලා පදනේ පළමුකොට **වෙතරණී** නම් නරකය දැක්විය. ඒ නරක යෙහි දිග සැට යොදුන පුළුල සැටයොදුන ගැඹුර සැටයොදුන ඒ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් සෙමිවූයේය. මුදු නෙහි පියාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යඩියන්පතින් සෙමිවූයේය. මේ නරකය සතිය සකියා තිබෙන ලෝදියෙන් පිරුණේය. මේ ලෝදියෙන් නැඟෙන ගිනිමුදුනේ පියාලනලද නවයොදුන් බොල යක ඛල මත්තේ නවයොත්තක්වට ඇවිලෙන ගිනි නැගෙයි. මේ නරකයෙහි ලෝදිය අතරතුරෙහි ගවුපමණ යෙල ගවුපමණ සියුම් මුවහත් ඇති කඩුපත් වේරුතින් ගැවසී ගත්තාහ. මේ නරකයෙහි අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේදයත්? දෙඕතුන්සී කළ තණ මිටියක් සෙසින් ඇට නහර කැඩිකැඩී බිදිබිදී සුන්සුන්ව යෙත්මය. නැවත කම්බලයෙන් ඉපද එම් දියෙහි රැළගැසී ගෙන් උඩුයටිපැසි පැසී සුන්සුන්වයෙත්. මෙසේ මහදුක් ගෙන පැසෙන්න වුන් දැක නිමි මහරජාණෙනි භයින් වෙව්ලා ගොස් මාතලිය! මේ නරකයේ මෙසේ දුක්ගෙන පැසෙන නිරිසත්තු කුමන පවිකොලොදැයි විවාළහ. එබස් අසා මාතලිදෙවිපුත් කියන්නේ මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කල්හි අනාවාසව තුබූ දැගැබ් පිළිමගෙවල් කැලයෙ වල් කොටා දැවුවන් හා කුසලාන් බුඩහොග කැවුන් හා අසුන්වල හිඳ නොබදු බදු කළවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට නැවත **බසුපත්** නම් නරකය දැක්විය. ඒ නරකයෙහි දිග පණස් යොදුන පුළුල පණස් යොදුන ගැඹුර පණස් යොදුන මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් සෙමෙවූයේය. මුදුනෙහි පියාලනලද නවයොදුන් බොල ගිනිගෙන දිලියෙන යපියන් පතින් සෙමිවූයේය. මේ නරකයෙහි කඩි සිති සෙනකුන්ගේ මහත කියත් රියසත් හා ඇස් ඇත්තාහ. ගවුදිග දළ ඇත්තාහ. නාඹ ඇතුන් හා බඳ ඇත්තාහ. මේ නරකයෙහි පැසෙන පවුකළවුන් මේ සත්තු උනුන් වටලා ඇට නහර බිඳිති. නැවත නැවත කම්බලයෙන් උපදිත්. මොවුන් විදිනා දුක් දැක නිමිමහරජාණෙනි මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විවාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි සෙනසුන් දැගැබ් බෝකොටු බඳවම්හයි කියාද අම්බලම් ඒදඹු ලවම්හයි කියාද වසතුසිහාගෙන ඒ ඒ නම් නැගූ දෙය නොකරවා ලොභකොට තමන්ගෙන් දෙම්හයි කියා විකොට කැවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **ලෝහකුඹ** නම් නිරය දැක්විය. ඒ නරකයෙහි දිග දහසක් යොදුන පුළුල දහසක් යොදුන ගැඹුර දහසක් යොදුන මේ නර කය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් සෙමෙවූයේය. මුදුනෙහි පියාලනලද නවයොදුන් බොල යඩියන්පතින් සෙමිවූයේය. මේ නරකයෙහි සහර දිශායෙහි සහරමහා පෙරකින් සෙමිවූයේය. මේ නරකය දහසක් යොදුන් පල්ලේ සිට මෝවිට දක්වා ගිනිගෙන දිලියෙන ලෝදියෙන් පිරුණේය. මේ නරකයෙහි ලෝදිය රසදියසේ කකිය කකියා නිවබසී. මේ සේවූ ලෝදිය වාන වේගයෙන් රැළ ගැසුනාල දැඩි ඇවිල නැගෙන්නේය. අකු සල් කළාවූ සත්වයෝ මෙහි වැටී පැසෙන්නාහුය. උදුන් අත්පතලයක බහාලූ වෙඩුරක්සේද තුතුයෙක ලා කකියවන ලද තඹ දියත්තක්සේද දැඩි විරි විරි

සුන්සුන්ව ගොසින් නැවත කම්බලයෙන්උපදිත්. මෙසේ මොවුන් විඳිනා දුක් දැන නිම්මිහරජාණෙනි මහලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි කුකුලන් වඩා මස් සා වල නොයෙක් සතුන් මරා මාලු පල හා අවුලුකොට සා සුරාපානය කළවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **සිත** නම් නරකය දක්වීය. ඒ නරකය දිග තුන්සියයක් යොදුන පුළුල තුන්සියයක් යොදුන ගැඹුර තුන්සියයක් යොදුන මේ නරකය සිසාරා ගිනිගෙනදිලියෙන නවයොදුන් බොල යපවුරෙන් කෙළම වූයේය. මුදුනෙහි පිහාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළම්වූයේය. මෙහි බදුම් දියසේ නිල්වූ දිය ඉහා සිසිලව බල වත්වූ දියෙන් පිරුණේය. මේ දියෙන් නැහෙන සිත මුදුනේ පියාලූ නව යොදුන් බොල යපියන්පතින් උඩ දානක් යොදුන් හමයි. මේ නරකයෙහි පැසෙන අකුසල්කොළෝ මේ දියෙහි රළගැසීමෙන් උඩුයටිව ඇට නහර මස් සුන් සුන්ව විලුල්ව වැහිරෙති නැවත නැවත කම්බලයෙන් උපදින් මොවුන් විඳිනා දුක් දැන නිම්මිහරජාණෙනි මහලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි දැනධම් කරන්නවුන් ජීවිතාව නසා කඩතොට සිට අනුන් අතමිට තුබූ දෙය ගත්නවුන් හා ගෙවිස්නා සොරකම් කළවුන් පැසෙන නරකයයි කිය.

ඒ නරකය අදිස්නාකොට **සඤ්ඤා** නම් නරකය දක්වීය. ඒ නරකය දිග සත්සියයක් යොදුන පුළුල සත්සියයක් යොදුන ගැඹුර සත්සියයක් යොදුනා මේ නරකය සිසාරා ගිනිගෙනදිලියෙන නවයොදුන් බොලයපියන්පතින් කෙළමවූයේය. මේ නරකයෙහි බදුම් දියවැනි දියෙන් පිරුණේය. මේ දියෙහිවසන පණු කොනාතුන්ගේ මහා කියතහොත් යොදුන්විවන් බඳ ඇත් තේය. එක් දඩු ඔරුසා නහුවූ ඇත්තේය. ගවුදිග දළ ඇති පණුවන්ගෙන් ගැවසිගත්තේය. ඒ පණුවෝ නරකයෙහි හුනුවුන් ලුහුබඳවාගෙන ඇඟමස් උදුරා කා ඇටනහරදඹිද කන්නාහුය. නැවත කම්බලයෙන් උපදිති. මෙසේ මොවුන් විඳනා දුක් දැන නිම් මහරජාණෙනි මාහලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළකල්හි මහරජ! මේ නිරිසත්හු තමන් මිනිස් පියලත් කල්හි වළඹිද උල් සිටවා සක්පානපටවා අඟමලපටවා උගුළු සොරමල පටවා සතුන් මැරුවන් හා දුගැබ් මහඹෝ පෙනිපිළිම නොවැඳ බණ නොඅසා සිඟන්නන් දෙර සිටියත් අහ නොසලා උදෙක් පව්පුරා ඇවිදින් දුක්විඳිනයි කිය.

ඒ නිරය අදිස්නාකොට **නාම** නම් නරකය දක්වීය. ඒ නරකයෙහි දිග නවසියයක් යොදුන පුළුල නවසියයක් යොදුන ගැඹුර නවසියයක් යොදුන ඒ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් කෙළම වූයේය. මුදුනෙහි පිහාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළම්වූයේය. මේ නරකයේ තඹ වැනි දියෙන් නැහෙන ගිනි නවසියයක් යොදුන් දැඩි ඇවිලී නැහෙයි. මේ නරකයෙහි පැසෙන අකුසල් කළවුන්ගේ උස යොදුන් පමණ ඇත්තේය. මොවුන් පැසෙන පරිදි කොසේ දයත්? සතරගාහය එක්කොට බැඳලා ගිනිගත් දියට දමාලයි. මේ දියෙහි රළගැසීමෙන් විර විරි සුන්සුන්ව ගොස් පැසෙති. මේසේ දුක්විඳ පැසෙන්නවුන් දැක මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ. මහරජ මේ

නිරිසතුන් තමන් මිනිස් පියලත් කල්හි කුකුලන් සිලිබිලන් ආදී නොයෙක් පියාසර ගත් සඳියන් මැරුවන් හා උකුණන් බුන්නවුන් හා ඇඳ මකුණන් බුන්නවුන් හා ඇඳමකුණන්ට උණුපැන් වත්කළවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **අතුරුමැල** නම් නරකය දැක්විය. ඒ නරකයෙහි දිග පණස් යොදුන පුළුල පණස්යෙදුන ගැඹුර පණස්යොදුන මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොලයපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලනලද නවයොදුන් බොල ගිනිගෙන දිලියෙන යපියන්පතින් කෙළවුයේය. මේ නරකයෙහි පවුකළවුන් පැසෙන පරිදි කෙසේදයත්? ගින්නට ඉටි විරෙන්නාසේ මේ නරකයෙහි අතුරු අතරතුරෙහි දඩ, මහ හඬින් හඬ හඬා දෙනින් අතුරු තමන්ගේ ඉසින් කණින් ලාගෙන විරි විරි සුන්සුන්වයෙන්. මෙසේ විඳින දුක් දැක නිමි මහරජාණෙනි මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විවාළහ. එබස් අසා මාතලි දෙවිපුත් කියන්නේ මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස්පියලත්කල්හි සතුන්මරා ඇනමස්පල හා කෑවුන් හා අතුන් මස් ගෙට ගෙනගොස් පිසවා කනකල මස් රස යහපතැයි කිවවුන් හා වලයන සතුන් ඇහ දැක හෙල් බොහෝකොට ඇතැයි කිවවුන් පැසෙන නරකයයි කිය.

ඒ නරකය අදිස්නාකොට **දළඇස්මැලි** නම් මහනරය දැක්විය. ඒ නරකය දිග තුන්සියයක් යොදුන පුළුල තුන්සියයක් යොදුන ගැඹුර තුන්සියයක් යොදුන මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලනලද ගිනිගෙනදිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළවුයේය. මේ නරකයෙහි වසන කුවුඩන්ගේ මහත කියත්, යොදුන්, පමණ බඳ ඇත්තාහ. ගවු දිග තුඩු ඇත්තාහ. ගවු දිග පියා ඇත්තාහ. නාඹ ඇතුන් සමාන උකුස්සන්ගෙන් ගැවසිගත්තේය. මේ නරකයෙහි පවුකළ මිනිසුන් පැසෙන පරිදි කෙසේදයත්? මේ නරකයෙහි ගිනි වේගයෙන් පැසී මහහඬින් හඬහඬා දුක්විඳිනවුන් මේ කපුටුවෝ හඬවහඬවා තමන්ගේ ගවුදිග තුඩු ඇන ඇස් උදුරාගෙන කති. උකුස්සෝ බඩවැල් ඇද කති. නැවත කම්බල යන් උපදිති. මොවුන් මෙසේ විඳිනා දුක් දැක නිමි මහරජාණෙනි මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විවාළහ. මහරජ! මේ නිරිසත්හු තමන් මිනිස්පියලත්කල්හි නොගන්නා බඩුවෙ අගය කළවුන් හා ගන්නා බඩුවෙ අගය වඩවඩා ගත්තවුන් හා මිහත් ලාස් නැළි පෙට්ටිතබා ගෙන මඳක්දිලා අධිමියෙන් වෙළඳුම්කොට ඇවිද්දවුන් හා තරවියෙහි බොල් ලා දුන්නවුන් හා කුඩා ලාසෙන්දී මහ ලාසෙන් මන්නාගත්තවුන් හා නොදෙනදෙයක් දෙමිනයි කියා ඇවිද්දවුවන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **සොකුරුපත්** නම් නරකය දැක්විය. ඒ නරකයෙහි දිග සාරසියයක්යොදුන පුළුල සාරසියයක් යොදුන ගැඹුර සාරසියයක් යොදුන, මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළවුයේය. මේ නරකයෙහි වසන කිනිකුල් සොහොකුන්ගේ මහහකියක් දෙගවු පමණ බඳ ඇත්තාහ. ගවු පමණ දළු ඇත්තාහ. ගවු දිග නකුල් ඇත්තාහ. මෙසේවූ කිනිකුල්ලන්ගෙන් ගැවසිගත්තේය. මේ

නරකයෙහි පැසෙන අකුසල් කළවුන් මේ සඟවු ඇවතහර බිඳෙති. නැවත නැවත සම්බලයෙන් උපදිති. ඔවුන් මෙසේ විඳිනා දුක්දුක නිම්මිහරජාණෙනි මහාලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ. මහරජ මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කළ්හි සතුන් සිල්වතුන්ව ආක්‍රොශපරිභව බිඹු සඬයන් හා යඬසොදයියා ඔවුනොවුන්සොරෙහි බිඳවුමන් හා මවුපියන් නැදිමසිලන් බැණුන්දසා උනස්නෝනිද යථායුතනිකොට බිඹුවවුන්පැසෙනනරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **චෙරළ** නම් නිරය දැක්විය. ඒ නරකය දිග පණස්යොදුන පුළුල පණස්යොදුන ගැඹුර පණස්යොදුන මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල ඝපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලන ලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළවුයේය. මේ නරකයෙහි රත් සුදු කඹුරු බලුකොන්නකුන්ගේ මහත කියත්. යොදුන් දිග බඳ ඇන්හාත. ගවුදිග පා ඇන්හාත. ගවුදිග දළ ඇන්හාත. මේ නරකයෙහිපැසෙන අකුසල්කළවුන්ගේ උසකියත්. යොදුන්පමණඇත්හාත. මේසේවූ උසඅති පවුකළවුන් මේ බල්ලෝ ඔබාගෙන ගඩාවගඩාවා සද්දසද්දං ඇවතහර බිඳ කති. නැවත සම්බලයෙන් උපදිති මොවුන් මෙසේ විඳිනා දුක්දුක නිම්මිහරජාණෙනි මාහලිය! මොහු කුමනපවුකළ මිනිස්සුදැයි විචාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කළ්හි බල්ලන් වඩාගෙන ගොස් මූනවි උරාලා කලුවැදි යිකුපාවුන් මැරුවන් හා ගෝණන් උරන්. මුවන් විද බල්ලන් හැරගෙන ලුහුබඳවා මැරුවවුන් හා නරක් නොමින් අතහු බිලිකටු ගෙන කුඩවස්සන් මැරවවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට **අඵකුඹු** නම් නරකය දැක්විය. ඒ නරකය දිග පණස්යොදුන පුළුල් පණස්යොදුන ගැඹුර පණස්යොදුන මේ නරකයසිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලන ලද නවයොදුන් බොල යපියන්පතින් කෙළවුයේය. මේ නරකයේහි අකුසල් කළවුන් පැසෙන්නේ කෙසේදයත්? මේ නරකයෙහි ගින්නෙන් දැවිරිවිරි සුන් සුන්ව අඵයට පාහාලයේ ගැලී ඇට නහර මස් විරිවිරි නැතිව නොසින් නැවත සම්බලයෙන් උපදිති. මොවුන් මෙසේ විඳිනා දුක් දුක් නිම් මිනරජාණෙනි මාහලිය! මොහු කුම අකුසල් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් පියලත් කළ්හි පොහොදු හොට වන් රදවුන් හා කඹිමිල් දෙමහෙසළවුන් හා ඔසප්වෙලා ඔසප්වූ බව නොකියා සොයියා හා කැවිවි ලැබි මාගමුන් හා මාගම් ඔසප් බව දැන දැන ඇ ඇලයෙ ලැග සිටි පිරිමියා හා බෙහෙත් හබා දරාගැබි එලවුවන් හා දරුවන් එලන්ට බෙහෙත් දුන්නවුන් පැසෙන නරකයයි කිය.

ඒ නරකය අදිස්නාකොට **ඉඹුල්වන** නම් නරකයදැක්විය. ඒ නරකයෙහි දිගසැට යොදුන පුළුල සැට යොදුයා ගැඹුර සැට යොදුන ඒ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල ඝපවුරෙන් කෙළවුයේය. මුදුනෙහි පියාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් කෙළවූයේය. යොදුන් උස ඇති ඉඹුල්වනයෙන් යුක්තය. ඒ ඉඹුල්ගස් එක්පිටකින් ගිනිගෙන දිලියෙන සොළොසඟුල් දිග කටු බිම බලා තිබෙති. එක් පිටෙක කටු උඩබලා තිබෙති. මෙසේ දෙපෙළ සිටි කටු ගිනිබුරබුරා තිබෙති. මේ නරකයෙහි සිටිනා යමපලුන්ගේ මහත කියත්, යොදුන් උස ඇත්තාහ. ගවු

දිග බඳ ඇත්තාහ. ගවුදිග දළුවන් දැළිරැවුළු ඇත්තාහ. ගැල්සක් නා ඇස් ඇත්තාහ. මෙසේවූ යමපලුන් අත ගිනිගෙන දිලියෙන නාඹ තල්කඳ සා යකඳ, යකුළය මේ නරකයෙහි පැසෙන අකුසල්කළ ගැණු පිරිමින්ගේ උස යෙල ගවු පමණය. ඔවුන් පැසෙන පරිදි කෙසේදයත්? මහහඬින් හඬ්ව හඬවා දෙපත්ල දඬුවා ගිනිගෙන දිලියෙන ආභරණ පළඳවනි. මේසේ පැළඳුවූ ආභරණයේ ගින්නෙන් ද මහහඬින් හඬ හඬා සිටියදී ගැහැණිය විටු යම පල්හු යකඳ, යකුලින් පන්සියයක් පහර ගසා බිම බලා බුරබුරා හිඳෙන කාටු පෙළින් උඩ නන්වත්. සොළොසතුල් පමණ කාටු හැන් හැනි මහහඬින් හඬ හඬා ඇට නහර සුන්සුන්ව බිදිබිදි කැඩිකැඩී විරිවිරි ලෙසින් නෙත්ව ගවුවක් උඩ නැගී මහහඬින් හඬහඬා කම්මබලයෙන් නියක්කියාලසි ඇඟෙරෙහි ගන් ප්‍රේමයෙන් ගිනිගත් ආභරණ පැළඳගෙන හඬමින් සිටි පුරුෂයා මහහඬින් හඬව හඬවා හීනඩ අසා උඩබලා සිටියාවූ යමපල්හු පන්සියයක් පහර ගසා බිම බලා තිබූ කාටුපෙළින් මරා උඩ නංවති. එසේමවූ කාටුයේ ඇනි ඇනි බිදි බිදී මහහඬින් හඬ හඬා කැඩි කැඩී විරි විරී සුන් සුන්ව නැවත ලෙසින් නෙත්ම ඉපදීමෙන් මාගම සිටී තැනට ආසන්නවත් මේ කාටුයේ ඇනි ඇනි සුන් සුන්ව උපදිමින් බිමට බසිති. බිම සිටි යමප හු නාඹ තල්කඳ සා යකඳ, යමුනුරු බාලා පන්සියයක් පාරගසා බිමබලා තිබූ කාටුපෙළින් උඩව නංවා ලති. ගිනිගෙන දිලියෙන පළඳනා පළඳවති. යමපලුන්ගෙන් නොයෙක් ගැහැට විඳ නැගී බැස මෙසේ දුක් විඳිනවුන් දැක නිමි මහරජාණෙනි නුඹින් නැහිගෙන වෙවුලාගොස් මාතලිය! මෙසේවූ කාටුයේ ඇනිඇනි කැඩිකැඩී බිදි බිදී සුන්සුන්ව දුක්විඳින්නෝ කුමන පව්කළ මිනිස්සුදැයි විවාළහ. එබස් අසා මාතලි දෙව්පුත් මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස් ලියලත් කල්හි සිය සැමියා උපයනුකා අඳපැළඳ වඤ්චාව පරපුරුෂයන් හා කැටිව බැදුණු මාගම හා තමාගේ මානම අතින් පොඹයා විඳ ඇට දෙවැනි බැහැර මාගම කෙරේ බැඳී ඇවිදි පුරුෂයා ඇවිත් පැසෙන නරකයයි කිය. මේ නරකයේ දුක්විඳින් නවුන් ගැලවෙන්නේ කෝතෙක් කලකින්දැයි විවාළහ. එබස් අසා මාතලි දෙව්පුත් කියන්නේ දහඅක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව ආකාශයට සත්ගවුවක් උස වඩනාතුරු පැසී ඒ ඉඛුල්වන නරකයෙන් ගොඩ දැක එක්ෂිය සතිසක් නිරයෙහි පැසී ගොඩදැසා කුසල් නැති පන්සියයත් ජාතිපුංසකව උපදිනිසි කිය.

ඒ නිරය අදිස්නා කාව **කිඹිරතුරු** නම් නරකය දැක්විය. ඒ නරකය දිග සත්සියයක් යොදුන පුළුල සත්සියයක් යොදුන ගැඹුර සත්සියයක් යොදුන, ඒ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන් නවයොදුන් බොල යපවුරෙන් සෂෙම්වූයේය. මුදුනෙහි පියාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පතින් සෂෙම්වූයේය. මේ නරකය යොදුන් උස ඇති කොනතළුන වැනි සූක්ෂමවූ කාටුයෙන් ගැවසී ගත්තේය. මේ නරකයේ නැගෙන ගිනි මුදුනෙහි පියාලනලද නවයොදුන් බොලයපියන්පතින් මත්තෙහි යක්යොදුන් දුරදී ඇවිල්ල නැගෙයි. මේ නරකයේ අකුසල් කළවුන් පැසෙන පරිදි කෙසේදයත්? බාග අකුසල් කොළෝ ගිනිගෙන දිලියෙන නහුල් මියදණ්ඩක් ගැටබාන් සඟලක් කැවිටක් ඉසහබාතෙන මහහඬින් හඬා මේ කාටුසයන් ඇනි ඇනි පැසෙති. බාග අකුසල් කොළෝ ගිනිගත් රැකක් ඉස නවාගෙන පැසෙති. බාග අකුසල්කොළෝ මහහඬින් හඬහඬා දිව දෙතුන්පොටකොට

ඉස හබාගෙන පැසෙති. බාග අකුසල් කොළෝ ගිනිගත් යකඩ කඩක් ඉස හබාගෙන පැසෙති. මොවුන් මෙසේ විඳිනා දුක් දැක නිමි මහරජාණෙනි මාහලිය! මොහු කුමන අකුසල් කළ මිනිස්සුදැයි විචාළහ. මහරජ! මේ නිරි සත්හු තමන් මිනිස්පිය ලත් කල්හි බ්‍රහ්මා පත්වා සීසැවුන් හා දිව ඇද සා මිළඳුවුන් හා සුණු සිරියල් සා මළවුන් හා සර වැල් ලා මළවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට රෞරව නම් මහ නරකය දැක්විය. ඒ නරක යෙහි දිග දහසක් යොදුන පුළුල දහසක් යොදුන ගැඹුර දහසක් යොදුන මේ නරකය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පනින් සෙවූ වූයේය. මේ නරකයෙහි සිටිනා සමපලුන්ගේ උස යොදුන් පමණ ඇත්තාහ. ගවුදිග නියපොතු ඇත්තාහ. ගවුදිග දැළිරුවුළු ඇත්තාහ. ගැල්සන් සා ඇස් ඇත්තාහ. ගවුදිග රකුසු දළ ඇත්තාහ. අසුරියන් බැම ඇත්තාහ. මෙසේවූ යමිපලුන් අත නුවර මහදොර සා වැයක් හා තාඹ තල්සඳ සා මිට ඇති පත් සෙවෙරියක් ගෙන සිටිති. මේ නරකයෙහි පැසෙන අකුසල් කළවුන්ගේ උස යොදුන් පමණ ඇත්තාහ. මොවුන් ගත්නා දුක් කෙසේදයත්? ඉස සිට දෙපත්ල දක්වා සසිති. ගිනිගත් කළු හුය ගසති. පොරෝ ගෙන පොලු ගසති ඉරති පලති කම්මබලයෙන් උපදිති. මොවුන් මෙසේ විඳුනා දුක් දැක නිමි මහරජාණෙනි මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ. මහ රජ! මේ නිරිසතුන් තමන් මිනිස්පියලත් කල්හි සිත්තම් ඉගෙන ලොභයෙන් දිමන් ගන්නා පිණිස නිහඬ පිළිම කැළල්කොට ඉදුරු සිතියම් නොකොට වඩා බරපැන් ගත්නවුන් හා පෙනිපිළිම අරගෙන විකොට කැවුන් හා කුසල් කරම්නසි යියා බොරුයෙන් දනාගේ බත්කඩ සිහාගෙන කැවුන් හා සොරා පෙති අනුන්ගේ රන් රිදී මසුරන් ආදිය හා වී සහල් ගෙරි ගව එළු කුකුළු මිනිසුන් ඇන්නැයේ උදුරාගෙන පොහොසත්ව රැකෙම්හයි සිතා ගත්තවුන් පැසෙන නරකයයි කිය.

ඒ නිරය අදිස්නාකොට පදුම නම් නරකය දැක්විය. ඒ නිරයේ දිග දහසක් යොදුන පුළුල දහසක් යොදුන ගැඹුර දහසක් යොදුන් ඒ නිරය සිසාරා ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපවුරෙන් සෙවූවූයේය. මුදු පොහි පියාලනලද ගිනිගෙන දිලියෙන නවයොදුන් බොල යපියන්පනින් සෙවූවූයේය. මේ නරකයෙහි තඹ දිය රස දියසේ කකිය කකියා නිබෙයි. මේ නරකයෙහි වසන කුරුවුන් කෙනකුන්ගේ මහත කියත්. දිග සියක් යොදුන කකුල් සියක් යොදුන මේ නරකයෙහි තල ඇටක් එලා ලන අවසර නැතිව පැසෙන අකුසල් කළ මේ සත්හු උනුන් වටලා ඇට නහර බිඳ සල්ව සල්වා හදව හඬවා ඇද කති සුන් සුන්කොට කති. නැවත කම්මබලයෙන් උපදිති. මොවුන් මෙසේ විඳිනා දුක්දැක නිමි මහරජාණෙනි මාතලිය! මොහු කුමන පවුකළ මිනිස්සුදැයි විචාළහ මහරජ! මේ නිරිසතුන් තමන් මිනිස්පිය ලත් කල්හි කකුළුවන් ඉල බෙල්ලන් මැරුවන්හා වල වසන සතුන්ට වස මැඩ මැරුවන් හා දරුකැව සැමිකැව ඉසපාලව ඇතුළුලාලවයි හැවුවවුන් හා කේලාම් කියා ඔවුනොවුන් බිඳුවන් පැසෙන නරකයයි කිය.

මෙසේ ඔසුපත් ගෙනහැර එක්සිය සතිස් නරකය නොබලනතුරු සක්දෙව් රජු හා සහරවරම් රජු හා සදෙව්ලොව වැසි දෙවියන් හා හැම දෙවියෝම සුදම් දෙව් සභාගෙහි රැස්ව හිඳ නිමි මහරජාණෙනි මාතලි දෙවිපුත්ද ලස්වූය. මහරජ! බ්‍රහ්මදෙව්පුතු කැඳවා උන්නරු යවුව ඉනවයි සක්දෙවිරජහට කිවුය. ඒ අසා සක්දෙවිරජ බ්‍රහ්මදෙව්පුතු කැඳවා නිමි මහරජාණෙනි ලස්වූය. උන් කැඳවාගෙනඑවයි කිය. ඒ අසා බ්‍රහ්මදෙව්පුත් මියුලු නුවර වැද නොදැක නරකය බලා ගොස් දැක මහරජාණෙනි! නුඹ අහින් බණ අසන්ට දෙව සමාගම රැස්ව ඉඳ නුඹ ලස්වූ හෙයින් කැඳවාමි එවූය, සතින වැනිය මැනවයි කිය. එබස් එබස් අසා නිමි මහරජාණෙනි මැනවයි ගිවිස මාතලිය! රථය දෙවිලොව බලා පදුවයි කිහ.

එබස් අසා මාතලි දෙවිපුත් දෙවිලොව බලා රථය පැද පළමුකොට බිරණි නම් දෙව්දුඹගේ විමන දැක්විය. ඒ ප්‍රාසාදය මැවුණු නියා කෙසේද යත්? ධැම් ඝනරහින් නිමියාහ. දුව මරු මිණියෙන් නිමියාහ. උළුවස වෙනි සත්රුවනින් නිමියාහ. පේකඹ සත්රුවනින් නිමියාහ. හිපාති ඉදුනිල් මිණියෙන් නිමියාහ. මේ ප්‍රාසාදයෙහි පන්සියයක් ගබඩා ය, එකි එකි ගබඩා කෙළ ලක්ෂයක් වටනාහ. එකි එකි ගබඩායෙහි කෙළක් වටනා යහන් දවස දවස දෑ සමන් මල් යාලක් අතුරති ඒ මල් වසා අසූකෝටියක් වටනා දිවදුහුලක් අතුරති. නොයෙක් ගඳ විලවුන් ගෙන කෙළක් වටනා යාන රන්සුණුයාලක් අතුරති. අනූකෝටියක් වටනා දිවදුහුලකින් රන්සුණු වසා අනූකෝටියක් වටනා දිවදුහුලක් හැඳ දිව්‍යාභරණ පැළඳ සෙළොස් දහසක් සුරසුන්දරීන් පිරවරාහුන් දෙව්දුවගේ විමානය දැක නිමි මහරජාණෙනි මාතලිය! මොහු කුමන පින්කොට අවුත් මෙසේවූ දිව්‍යප්‍රාසාදයෙක්හි හිඳ සුව විඳිද්දැයි කිහ. එබස් අසා මාතලි දෙවිපුත් කියන්නේ මේ දෙවිදු සසි රට බරණැස් නුවර සුදත්ත නම් බමුණාගේ මිඹිය. නොසොල් හා බරණැස් දෙරට වැසියන් ගඳ දුම් මල් පහන් ගෙන දෙවිරම් වෙහෙර බණ අසන්නට යන්නවුන් දැන ඒ සුදත්ත නම් බමුණුතෙමේද බණ අසන්නට යන උපාසක වරුන්, හා කැටිව දෙවිරම් වෙහෙරට ගොස් කසුප් සම්මා සම්බුදුරජාණන් වහන්සේ අතින් බණ අසා බණෙහි පැහැද සෝවි අනුවක් දෙනා සෝවාන් ඵල පිහිටියා දැක් සුදත්ත නම් බමුණු තෙමේද සෝවාන් ඵලෙහි පිහිටියා බණෙහි පැහැද තමා හැඳගෙන ගිය උතුරු සළුව පුදා වැඳ මහන්වූ සතුටු සොම්නසින් දන් දෙමියි මහ පෙම් ඇතිව ගෙට අවුත් තමාගේ අඹු බැමිණිය කැඳවා කියන්නේ කසුප් සම්මා සම්බුදුරජාණන් වහන්සේට මෙනකොට දනක් දෙමියි ඊට දන් ඉදිකාරුවයි කිහ. එබස් අසා බැමිණි කියන්නී ඒ මුඳු මහණුන්ගේ තෙපුල් ගෙන පෙපි මාගේ ගෙහි වස්තුව වියදම් කාරහුදැයි රැහැනිව දන් නොපිසම් කිව. ඒ අසා අඹුවට රැහැනිව තමාගේ එක්සිය විසි වයස් ගිය මැනියන් කැඳවා මැනියන් වහන්ස! දන් ඉදිකළ මැනවයි කිය එබස් අසා ඒ මැහැලින් තතනතතනා රැහැනිව කියන්නී තොපගේ උපයනු කා සුව විඳිනා අඹුවන් දන් නොපිසන කල මම කුමට පිසම්දැයි කියා එහන නොසිට පලාගියාහ. මුන් දෙදෙනා රැහැනිව දන් නොපිසම්හයි කියත්ම තමාගේ බිරණි නම් දැසිය කැඳවා කියන්නේ කෙල්ල! ති අදහිඹකොට නිද හස් කෙරෙමි බණ අසා පැහැද දන් දෙමි කියා ආමි. අද පටන් දවසකට අටමස්සක් හැරගෙන දවස් පතා සාල් මාලු උපකරණ ගෙන දන් දිසවයි

කිය. එබස් අසා කිරණි නම් දැසි සතුටුව සොම්නසින් පැහැද කියන්නී යහපත මම දන් පිසම් දන් දුන්නෙහි පින් ඔබටය. අන් කුසල් මටය කියා සතුටුව සසුප් සම්මාසම්බුදුරජාණන් වහන්සේට දන් පිසමිසි කී හෙයින් නිදහස් පත්තඬ ලැබ සිහා වැඩි සවිඥයන් වහන්සේට පසහපිහිටුවා වැඳ හොජන ශාලාව මිනාතොට හැමද ගොම පිරිබඬ ගෙන ඊමත්තෙහි සඳුන් පිරිබඬගෙන තා සපු දුනුකේ දෙඉදිද දැසමන් ආදිවූ සුවඳමල්පුදා සරහා පන වතලද ආසනයෙහි වඩා හිඳුවා ආගහතුකව ඇ දරාගෙනකුන් දුටුකෙණෙහි වැඳ මිවත් යම්සේ සතුටුවේද එපරිද්දෙන්ම නිරන්තරයෙන් ප්‍රේම වඩා දෙවි යන්ට නිමිත්ත සළ හොජනයක් මෙන් ආදර සිතින් වළඳවන්නීය. මෙම නියාසෙන් දවසකට අවමස්සක් ගෙන සාල්මාලු විටියල සපයා තබා තොමෝ ඉස් සොධා නහා සුදුපිරුවටක් හැඳ දන් පිසන හෙයින් ගෙයි ගොම පිරිබඬ ගෙන උඩුවියන් බැඳ සුවි පවිත්‍රව දන් පිසන්නීය. සමහර දවසෙක තම්බා ගෙනුත් දන් පිස දෙන්නීය. තොමෝද නිරන්තරයෙන් පඤ්චශීලයද පොහොය අෂ්ටාඞ්ග ශීලයද අඛණ්ඩකොට රක්ෂා කරන්නීය. මෙසේ දෙන් නාවූ දන එලය හා ශීලානුභාවයෙනුදු සවාමියාට කීකරුව දන් පිසූ කුසල යෙනුදු මේ දිව්‍ය ප්‍රාසාදයෙහි දිවසාපත් විඳිනිසි කිය.

මෙසේ කිරණි නම් දිව්‍ය ස්ත්‍රියගේ සම්පත් හා කළ පින් කියා ඉදිරියට රථය පදින්නේ **සෝන** නම් දිව්‍යපුත්‍රයාගේ රන් මාලිගා සත දැක්විය. රජ්ජුරුවෝද දිව්‍යපුත්‍රයාගේ සම්පත් දැක ඔහු කළ පින් විමාලාහ. මාතලි දෙවිපුත් කියන්නේ මහරජ! මේ දිව්‍යපුත්‍රයා යටගිය දවස සසුප් සම්මාසම් බුදුරජාණන් වහන්සේ සමයෙහි කසී රට එක්තරා නියම් ගමෙක්හි සොන නම් සිටුව උපන් සමයෙහි සඳන්හල් කරවා නොයෙක් යාචකයන්ට දන් දුන්නේය. භික්ෂු සඞ්ඝයා වහන්සේ උදෙසා ලැගුම් ගෙවල් සතක් කරවා ඒ ලැගුම් ගෙවල ලගිනා භික්ෂූන් වහන්සේට සිව්පසයෙන් උපස්ථාන කෙළේය. නිරන්තරයෙන් පඤ්චශීලය රක්ෂා කෙළේය. පොහොය අෂ්ටාඞ්ග ශීලය රක්ෂා කෙළේය. මෙසේ කළාවූ දන පරිත්‍යාගය හා ශීල රක්ෂණයෙහි ආනුභාවයෙන් ඒ ආත්ම භාවයෙන් චුතව මේ දිව්‍යලොකයෙහි ළහිරු මඩ ලක් මෙන් බබලන්නාවූ දිව්‍ය විමානයෙහි සැට ගැලක් පුරාලන ආභරණ යෙන් සැරසී දිව්‍ය නාටඟ ස්ත්‍රීන් විසින් පිරිවරන ලදුව දිව සැපත් විඳිනිසි කිය.

මෙසේ **සෝන** නම් දිව්‍ය පුත්‍රයාගේ පින්පල කියා රථය ඉදිරියට පැද සියගණන් සත්රුවන් වැම් ඇති නොයෙක් සියගණන් කුළු ගෙවල් ඇති පලග ලෙලදෙන රන් රුපු දැල් හා නහනලද රන්රිදීමය ධ්වජ පතාකා ඇති පස්විසි යොදුන් උස ඇති ස්ඵටික මාණික්‍යමයවූ දිව්‍ය විමානයක් හා නා සුපු දුනුකේ දෙඉදිද දැසමන් මුරුවා යනාදිවූ නොයෙක් සුගඞ්ධ පුෂ්ප පංක්තීන් සැදුණු උයන් හා ඔත්සාළුවූ පය් පියුමෙන් සැදුම්ලද පොකුණු හා නැටුම් ගිකිම් ආදියෙහි දක්ෂවූ දිව්‍ය ස්ත්‍රීන් විසින් ගැවසීගත්තාවූ සුර විමන දැක නිමි මහරජාණෙනි මාතලියා! මොහු කුමන පින්කොට මෙහි සුව විඳිද්දැයි කිය.

එබස් අසා මාතලිදෙව්පුත් කියන්නේ මහරජ! මේ දෙඛිනින්න තමන් මිනිස් පියලත් කල්හි කාශ්මීර ගඤ්ඣාර දෙරට වසන චුල්ලසුභද්‍රා මහාසුභද්‍රා යන නම් ඇති දෙඛිනි කෙනෙක්ව එරට මැද රජවිහවත සමි අවරියන් වන පස දණෙඩන් ගදකිළියක්කාරවා තණින්සොයවා ඇඳ කළ හල් පහන් පැදුරු පාන් කඳු බොතලා ගිනිතබල් පත්කඩ බිසිකඩ ආදිය ලවා එතනට වැඩි රහත් පුහුදුන් සතුන් වඩා හිදුවා සිව්පසයෙන් උපසථානකොට වස් අනන යෙහි රහත් සඟනට ලක්ෂයක් වටනා අටපිරිකරද පුහුදුන් සඟනට දහසක් වටනා අටපිරිකරද දන්දී තමන්ගේ ආයු පමණින් මිනිස්ලොව හිඳ එයින් සැව ඇවින් මේ දිව්‍ය ප්‍රසාදයෙහි සුව විඳිනියි කිය.

ඉක්බිති **කාශ්මීර නම් දෙව්පුතුන්ගේ විමන** දැක්විය. ඒ දෙව්පුතුන් ගේ විමන නිමියාව කෙසේදයත්? තිරුකොත් මිණියෙන් ටැම් නිමවා සද කොත් මිණියෙන් දැව වලලුබැඳ දුරහමිණියෙන් මඩුලුබැඳ කොතමිණියෙන් ගොනැස් බැඳ මරු මිණියෙන් පැලැන් නිමවා ඝනරනින් පෝවිටු නිමවා නිල්මිණියෙන් සෙවෙනි නිමවා හිකති ඉදුනිල් මිණියෙන් නිමවා දෙර බා ඝනරනින් නිමවා නිල්මිණියෙන් පා කවුළු නිමවා නිල්මිණියෙන් බිම්කොට මුතු සුණු දෙලොස් යාලකින් ගේ පිරිබඳගෙන රුජ වත්තයෙන් වත්කොට අනුකෙළක් වටනා සෙල් වියන් බඳවා ඒ වියන්පිට රන්තරු රිදිතරු කිඹුණිඝ ජාලයෙන් මුතු දැල් එල්වා මේ ප්‍රාසාදයෙහි දහසක් ගබඩාය, එකි එකි ගබඩායෙහි අනුකෙළක් වටනා දහසක් යහන දෙලොස් යොදුන් දිවඳුහුලක් හැඳ දිව්‍යාභරණ පැලඳ දහසක් සුර සුඳුරින් පිරිවරා සිටිති. දවසකට රන් සුණු දෙලොස් යාලකින් ඇඟ ඔප්ලනලද දහසක් දෙනය දහසක් ගබඩාවල දහසක් මිණිදඬු වැට පහන්ය. මේ ප්‍රාසාදයෙහි මුදුනේ රන්කොත දෙලොස් යොදුන් උසය. ඒකොත තන්හි තන්හි එබූ මැණික් ලක්ෂයෙක. මේ ප්‍රාසාදය සිසාරා සත්රුවනින් පවුරක් හා නිල්මිණියෙන් පවුරක් හා රිදියෙන් පවුරක් හා වෛඩූර්‍යයෙන් පවුරක් ඇතුළුව පස් එවුරකින් සෙමවූයේය. මේ ප්‍රාසාදය සිසාරා නදුනුයනසේ උයන් සතලිසෙක. සදද්දඝතලා හා සමවූ පොකුණු දෙලොසෙක. ඝන ඝනකමය පියගැටය. මේ ප්‍රාසාදයෙහි කෙළක් වටනා යඟහෝහි යාලක් දැසමන් මල් අතුට රිමත්තෙහි කෙළක් වටනා දිවඳුහුලක් වසා දෙලොස් දහසක් නළුනාටකයන් පිරිවරා දෙලොස් යොදුන් දිවඳුහුලක් හැඳ සැටගැලක් දිව්‍යාභරණ පැලඳ දෙපෝ මැද නැඟි පුන්සඳක් සේ උන් දෙව්පුතුගේ විමන දැක කුල්මත්ව කුමන පිනක්කොට මෙසේවූ දිව්‍ය සම්පත් ලදින් සුව විඳිද්දැයි විවාළහ.

එබස් අසා මාතලි දෙව්පුත් කියන්නේ මහරජාණෙනි! මේ දෙව්පුත් අතීතයෙහි දඹදිවිතෙලෙහි තෙසැතිපුර නම් දෙලොස් යොදුන් නුවරෙක සිටුව උපන් කල්හි පියුමතුරු නම් බුදුරජාණන් වහන්සේට විහාරයක් කරවා, අනුකෙළලක්ෂයක් සඟනට සතතයෙන් විසිදහසක්හවුරුදු දන්දී බුදුපාමොක් මහසඟනටද දෙලොස් වාරයෙක දන් වතින් දන්දී අටපිරිකරද දන්දී ඛණ පිළු ව්‍යාධින්ට අවුරුදු පතා දන්දී වෙදවෙදඩහයෙහි පාරගත බමුණන් සැට දහසක් දෙනාට දෙලොස් වාරයෙක දන්දී සුවාසූදහසක් හවුරුදු සිටු සැපත් වළඳ සත්වෙනක තෙවලා ඝනරන් පත ලියවා සත්රුවන් බඳවා ඇණ පියන් ලවා සුවාසූදහසක්‌ වටනා වස්නෙන් වසා ඝනරන් පොත්දෙණ නවා

ඒ දෙණ සුවඳතෙල් දැසමින් කුසුම් පුරා තෙවලා පොත් දෙණට වඩා සුවඳ වෙලින් පහන්පූජා කරවා මහදනකට වින්දි ආයු පමිණින් නරලොව සැපත් වළඳා ඉන් සැව අවුත් මේ දිව්‍ය ද්‍රාසාදයෙහි සුම විඳ සිළුමිණිසෑය වඳිනට යනකල නොයෙක් නළුනාටකයෝ දෙළොස් දහසක් දෙන ඔබිඹි පිල් සහ ළොස් යොදනෙහ ගෙන සිටිත්. රන් ධජ රිදී ධජ රන් කළස රිදී කළස ගෙන දෙළොස් යොදනෙක පැහැර සිටිති. නොයෙක් ආභරණ පැලඳ සුර සුඳුරිහු දෙළොස් යොදනෙහ පැහැර සිටිති. නොයෙක් වීදුඛරයෝ දෙළොස් යොදනෙහ පැහැර සිටිති. මෙසේ නොයෙක් ඓශ්වර්යයෙන් පිරි වරාගෙන දෙළොස් යොදනෙහ රන් සේසත් ඉසව කරවා සිළුමිණිසෑය වැඳ පිදුමිතුරා නම් බුදුරජාණන් වහන්සේගේ අවදියෙහි පටන් මේහාප බුදුවූ කකුසඳ, කොණාගමන, කාශ්‍යප, ගෞතම යන සතර බුදුන්ගේ දවස මෙසේ සුවඳ අනාගතයෙහි බුදුවන මෙතේ බුදුන් බුදුව අසූදහසක් අවුරුදු බුදුලෙස් පෑ කල්හි කරනලද බුඩිකෘත්‍යය දැක අහුරුදන් නොවනතුරා ඝනරතින් නිස්යොදුන් ඇඟැයක්කොට සිරුර දැ වඩා තුන්යොදුන් ත්‍රුවරවාසින් එතැන සිට බුදුනිසබලා මත්තෙහි සක්විනිරජව දසදහසක් යොදුන් දඹදිවට නායක වෙනිසි කිය.

ඒ විමන තෝරනොට **දුනු මුඩු සුතුන් සතරදෙනාගේ විමන්** දැක් විය. මුන් සතරදෙනාගේ විමන් නිමි නියාව කෙසේදයත්? මිණි පබළු යෙන් ටැම් පිහිටුවා ඉදුනිල්මිණියෙන් දැව වලලු බැඳ දැරග මිණියෙන් දැව වලලු නන්වා ඝනරතින් ලී නිමවා හිරුකොත් මිණියෙන් සෙවෙනි නිමවා නිකති සත්රුවනින් නිමවා මුහු සුන්නෙන් බිම නිමවා මෙසේ නිමි ප්‍රාසාද යෙහි සාරදහසක් ගබඩාය. එහි එකි ගබඩායෙහි ඉකළුන් වටහා සාරදහසක් යහන. එකි එකි යහනෙහි අසූකොළුන් වටහා දිවදුහුලක් අතුට අසූකොළක් වටහා සෙල් වියන් බැඳ මෙසේ සාරදහසක් ගබඩායෙහි සාරදහසක් සුර සුඳුරිහුය. ඒ දෙවිපුත් සතරදෙනාගේ එකි එකි යහන අනූකෝටියක් වට නේය. යාල යාල දැසමින් අතුරති. දැරග මිණිවැට ලඹයෙහ. සැට යාලක් ගඳ පිලවුන් ගනිති. සතිස් යාලක් ඝනරන් සුන්නෙන් ඇඟ ඔප් ලා ලති. සැට ගැලක් ආභරණ පලඳිති. අනූකෙළක් වටහා දිවදුහුල් අදිති. සතරදෙනාගේ දිවපිරිස් සැටයොදනක් තැන පැහැර සිටිති. දෙළොස් යොද නෙහ දිව බෙරගසා සිටිති. සතරදෙනා දිව්‍ය ඓශ්වර්යයි විඳිමින් සිට මෙතේ බෝසතුන් වඳින්ට හා සිළුමිණිසෑය වඳින්ටද යහකල සැට යොදනෙක දිව පිරිස් සිටිති. දිවබෙර දෙළොස් යොදනෙක ගසා සිටිති. රන්ධජ රිදී ධජ රන්කඹ රිදිකඹ පබළුකඹ ගෙන සැටයොදනෙක සිටිති. චාමර පිල් සත්සලා සැට යොදනෙක සිටිති. රන් සේසත් දෙළොස් යොදනෙක ගෙන සිටිති. මෙසේ නොයෙක් ඓශ්වර්යයෙන් ගොස් වැඳයෙති. මොවුන් සතරදෙනාගේ ප්‍රාසාදසතරද සඳත්දහඩලා හා සමානවූ පොකුණු සොළොසෙක. නදුනුයහ හා සමවූ උයන් සාරසියයෙක. **විත්‍රා, සුභද්‍රා, නන්දා, සුබද්‍රා** යයි මෙසේ නොයෙක් ඓශ්වර්යයි විඳිනා දෙව්දුවන් සතරදෙනාගේ දිව සැපත් දැක නිමි මහරජාණෙනි මාහලිය! මේ දෙව්පුත්හු සතරදෙන කුමන කුමන පින්කොට මෙසේ සුව විඳිදිදැයි විවාළහ.

එබස් අසා මාහලි දෙව්පුත් කියන්නේ මහරජාණෙනි! අතීතයෙහි දිවකුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේ දවසැ මැදුම් පිහසැ මේ සතරදෙ නාම දුහු මුඩු කුලයෙහි ඉපද තමන් වළඳන රට සතරදෙනා කථාකොට ගෙන සම්මාසම්බුදුරජාණන් වහන්සේට සත්රුවන්මයවූ දෙළොස් යොදුන් පමණ සිසු මුහුණින් තුන්ගවුවක් පමණවූ සතරපායක් කරවා එහි පෙත් මං හතා සතර මලුවෙ සත්රුවන් අතුරවා බිසිනඩ පත්තඩ කළ හල් පාන්හදු පාන්තෙල් කොහලා හිනිකබල් ඇතුළුවූ නොයෙක් දෑ ලවා සෙනසුන් පිළිගන්වා අතවස බුදුන් ඇතුළුවූ හෙළලක්ෂයක් මිනිසුන්ට සිවුපසයෙන් දන්දී වටතා අවපිරිකර දන්දී ලක්ෂයක් රහත් සඟුන්ට අනුදනසක් අවුරුදු තිති දන්දී දවස්පහා පන්සිල් රැක බුදුන්ගෙන් බණ අසා පැහැද තමන්තමන්ගේ රට ඇතිතාක් බොහෝ දෙනාට පන්සිල් හා පොහොය අටසිල් ගන්නා ලෙස සමාදන් කරවා මෙසේ දැහැමින් වැස නරලොව ආයු පවණින් සැපත් වළඳ, ඉන් සැව අවුත් දිවකුරු බුදුන් දවස පවත් මෙම නියායෙන් සැපත් වළඳ, කසුප් සම්මා සම්බුදුන් දවස දඹදිව වෙස් පුර නම් නුවර එක්තෙනෙක් රජ වෙති. එක්තෙනෙක් අනතන නම් පුරයෙහි රජවෙති. එක්තෙනෙක් මිතු ගෞතම නම් බුදුන් පිරිනිවි කල සිරි ලක්දිව පඬුවස්දෙව් නම් රජව ඉපද අවතුරා සියක් වැටු බඳවා දවස්පතා කුසල්කොට අනුරාධ නම් පුරය කරවා සම්පත් වළඳ, සැව අවුත් නැවතත් මේ ප්‍රාසාදයෙහි සුව විඳිනේයය. එක් තෙනෙක් මහ රට පැළලුප් නුවර තමාගේ මසිල් කුමර රජව සම්පත් වළඳ, සැව අවුත් නැවතත් මේ ප්‍රාසාදයෙහි සුව විඳිනේයයි කිය.

ඒ විමන හොරකොට **තෙසැනි දෙව්පුතුන්ගේ විමන** දක්විය. ඒ ප්‍රාසාදය නිමි නියාව කෙසේදයත්? ටැම් ගුදුනිල්මිණියෙන් නිමියාහ. දුව වළලු දුරහමිණියෙන් නිමියාහ. මඩුලු කොත මිණියෙන් නිමියාහ. ගොනැස් ඉදුනිල් මිණියෙන් නිමියාහ. සෙවෙනි සත්රුවනින් නිමියාහ. නිකයි වෛඩූර්යයියෙන් නිමියාහ. මෙසේ නිමි ප්‍රාසාදයෙහි දහසක් ගබඩාය. හෙළ ලක්ෂයන්වටතා යනහාය. මේ ප්‍රාසාදයේ දිග යොදනෙක, පුළුල යොදනෙක, උස යොදනෙක, මේ ප්‍රාසාදයෙහි විදුරුමිණි එබු කවුළු දොර ලක්ෂයෙක, නිසවතු සඳකැන් මිණියෙන් නිමියාහ. මේ ප්‍රාසාදයෙහි තන්හි තන්හි සිංහ ව්‍යාඝ්‍ර රූ හා ඇත් නිදුලිනිණි කොස්ලිනිණි ජීවඤ්ජීවක ලිහිණි ගිරා මොණර ආදි අස් මේ ආදි රූ ඔතරතින් නිමියාහ. මෙසේ නිමි ප්‍රාසාදයෙහි සතර දෙස රන් හොරණ රිදී හොරණ මිරුමිණි හොරණ විදුරු හොරණ ආදි නොයෙක් හොරණින් යොදුන් යොදුන් ගැවසී ගත් සිටියාහ. මේ ප්‍රාසාදයෙහි සිඹ විෂ්ණුධරයන්ගේ ගිනුම් පසඟතුරු රැවිහඬ කලක් සෙසින් ශබ්ද පවත්මා නළුවෝ ගඳ විලවුන් ගතිනි. ඒ සුවඳ විලවුන් ගත් කුසුම්සුවඳ බඹලොව එක්නිස් තලය පැතුරුණේය. මේ ප්‍රාසාදය සිසාරා පවුරු අටසියයක් යොදුන, පාකුළුවල ටැම් දහස් සුවහස් ගැවසී ගත්තාහ. නඳුන් උයන් හා සමවූ සියයක් උයන, සැටදහසක් මිණි දඹුවැට පහන, සෝපිඅනුවත් වටතා දිවදුහුලක් අදිනේය. හෙළක් සුර සුන්දරින් හා හෙළක් අතනන් හා හෙළක් නළු නාටකයන් සිරිවරා ගෙන දසදහසක් ශ්‍රී යහන් ඇතිව සැප විඳිනා දෙව් පුතුන් දැක නිමිමහරජාණෙනි මාහලිය! මේ දෙව්පුතු කුමන පින්කොට අවුත් මෙසේවූ සුව විඳිද්දැයි විවාළහ. එබස් අසා මාහලි දෙව්පුත් කියන්නේ මහ රජාණෙනි! මේ දෙව්පුත් අතීතයෙහි දඹදිව් තෙලෙහි තෙසැනි පුර නම්

දෙලොස් යොදුන් හුවරෙක මහාධන සිටුව උපන් කල්හි පියුමතුරා නම් බුදු රජාණන් වහන්සේට මහාරයක් සාරවාදී කොළඹ ලක්ෂයක් රහත් සහනට සතර පසයෙන් දසදහසක් අවුරුදු දන්දී බුදුපාමොක් රහත් පුහුදුන් සහනට දෙලොස් වාරයෙහා ලක්ෂ වටනා අටපිරිකර දන්දී තණ පිළු ව්‍යාධින්ට අවුරුදු පහා දන්දී වෙදවෙදඹයෙහි පාරගත බමුණන් සැටදහසකට දන්දී සුවාසූදහසක් අවුරුදු සිටු සම්පත් වළඳා සත් විඩෙහා තෙවලා ඝනරන් පහලියවා සත්රුවින් බඳවා ඇණ පියන් පන්ලවා සුවහස් වටනා ඝනරන් පොන් දෙණ සරවා ඒ දෙණ දැ සමින් කුසුම් පුරා තෙවලා පොත් දෙණට වඩා තොසෙක් සුවඳ තෙලින් පුරා තිනි පහන් පූජාකරවා මහදනහට පින්දී ආයු පමණින් නරලොව සැපත් වළඳා ඉන් සැව අවුත් මේ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳිනසි කිය. මෙසේවූ දිව්‍ය ප්‍රාසාදයෙහි සුව විඳිමින් සිට සිළුමිණිසෑය වඳින්ට යන කල්හි සිඩ විදුරයෝ දෙලොස් යොදනෙක සිටිනි. ඔබබි පිල් සන් ගෙන දෙලොස් යොදනෙක සිටිනි. නොයෙක් පසඳාඛන හෙරින්ගෙන දෙලොස් යොදනෙක සිටිනි. නොයෙක් දහස් සුර සුන්දරිහු දෙලොස් යොදනෙක සිටිනි. මේසේ නොයෙක් ඓශ්වර්‍යයෙන් ගොස් සිළුමිණිසෑය වැඳ පියුමතුරා නම් බුදුන් සමයෙහි පවන් මැන භද්‍රකල්පයෙහි බුදුවූ කකුසඳ, කොණාගමන, කාශ්‍යප, ගෞතම යන සතර බුදුන් දවසින් අනාගතයෙහි බුදුවන මෛත්‍රේ බුදුන් බුදුව අසූදහසක් අවුරුදු බුඩරාජ්‍යය කොට හැමසතුන් නිරහතරයෙන් නහා නිරුපාක් මහපියුමෙන් සදවා නාලොව සිට නරලොව ආදිකොට සරනලද බුඩ කාර්‍යයන් අහනඩාන නොවනහුරු තිස්යොදුන් රුවන් ඇගැයක් කොට සිරුරු එයට වඩා තුන්ලෝවාසින් එතැනට රැස්වූ කල්හි එතැන සිට බුඩකෘත්‍යයන් කොට මත්තෙහි සක්විති රාජ්‍යයට පැමිණ දශදහසක් යොදුන් දඩදිවට නායක වන්නාහසි කිය.

ඒ විමන තොරකොට **අවතිංස** මඩුලු නම් දෙවිපුතු හා **කුමාර** මඩුලු නම් දෙවිපුතු යන දෙදෙනාගේ විමන් දැක්විය. මුන් දෙදෙනාගේ ප්‍රාසාදය නිමි නියාව කෙසේදයත්? සතර මුහුණින් අටසියයක් යොදුනෙහි සුදුවූ විදුරු වැඩින් නිමියාහ. දැ වලලු දුරහ මිණියෙන් නිමියාහ. දෙර ලී දෙරබා සදකැන් මිණියෙන් නිමියාහ. මඩුලු ඉදුනිල් මිණියෙන් නිමියාහ. ගොනැස් ඝනරතින් නිමියාහ. ලී ඉදුනිල් මිණියෙන් නිමියාහ. සිකනි දුරහ මිණියෙන් නිමියාහ. උළු සත්රුවනින් නිමියාහ. කොත දුරහ මිණියෙන් නිමියේය. මෙසේ නිමි ප්‍රාසාදය පන්සියයක් යොදුනකට දිලියෙයි. අසුර ලොව කුම්භාණ්ඩයන් සවනට ආකල මේ ප්‍රාසාදය දකිමින්ම මේ ප්‍රාසාදයේ දෙව් විරිස් රැස්ව සිටිනි කියා බියෙන් බලා පලායන්නාහ මේසේ වූ ප්‍රාසාදයෙහි දෙලොස් යොදනක් තැන පැතිරුණු රන් හොරණින් රිදී හොරණින් සැරසුණේ ශක්‍රයන්ගේ ප්‍රාසාදය වැන්න, එකි එකි ප්‍රාසාදයේ තෙළක් සුර සුන්දරිහු සිටිනි. සුවාසූ යාලක් ඝනරන් සුන්නෙන් යහන් අදුට රිමින්තේ තෙළ ලක්ෂයක් වටනා දිව දුහුලක් අතුට මේසේ වූ යහන් මත්තේ උන් දෙවිපුතුන් දෙදෙනා දෙලොස් දහසක් නළුනාටකයෝ පිරිවරා සිටිති. සිළුමිණිසෑය වඳින්ට යනකල නොයෙක් ආභරණ පැලඳ දිව සිරිස් සැටයොදනෙක සිටිනි. නොයෙක් සුර සුන්දරිහු සැටයොදනෙක පැතිර සිටිනි. සිඩ විදුරයෝ සැටයොදනෙක සිටිනි. මේසේ නොයෙක් ඓශ්වර්‍යයෙන් සුවවිඳිනාවූ දෙවිපුතුන් දෙදෙනාගේ විමන් දැක නිමි මහ රජාණෝ සතුටු සොමනස්ව මාතලියි! විදුරුගල් කුළක්සේ අපූ ඉදිරියේ පෙනෙන්නේ කෙසේවූ දෙවිපුතුන්ගේ විමන්දැයි විවාළහ.

එබස් අසා මාතලි දෙවිපුත් කියන්නේ මහරජ! මේ දෙවිපුතුන් දෙදෙනා දඹදිව අවතිඤ මිඹුලු නම් නුවර සිටුකුලයෙක ඉපද දෙදෙනාගේ අසූකෝටියක් ප්‍රමාණ ධන ඇත්තේ එක්සිය විසියොදනක් තැන නොයෙක් තැනට ගොස් වෙළඳුම් කොට උනුකොවන සම්පත් දැන උනුන් හා කථා කොට උනුන්ගේ සම්පත් විවාරා බලා කියන්නාහු පෙර තළ පිනින් පිරිසුදු කුලයෙක ඉපද මෙතෙක් සම්පත් ලදුම්හ. මේසේවූ සම්පත් තබා පරලොව ගියොත් නපුරුයි සියා එසේවූ සැපත් ගෙන කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණන් වහන්සේට ගඳකිළියක් කරවම්හයි කථාකොට එනුවර රජ්ජුරුවන්ට සුවහස් කොටි වසතු දී විහාරයට බිම් ගෙන අගල වටකොට බිඳ පවුරක් බඳවා මෙතෙක් ධන අප සැටිව ගෙනගිය මැනවයි කියා මොහොතක් අවදියට විහාරයක් කරවන්නාහු සත්රුවන්මය කොට කරවා රාත්‍රි සථාන දිවා සථාන කරවා පොහොමලු කරවා පෙත් මං කරවා මලුසේ සතරදෙසෙහි අස් රූ සිංහ රූ සත රතින් කරවා මෙති රන් කළස රිදී කළස තබා අහල දහසක් වටනා ගොසි සඳුනෙන් පිරිබඳගන්වා රජමලුව සඹ පද්ම දෙදෙනා ලවා ගඳකිළියට වඩනා මහ සත්රුවන් අතුරවා කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණන් වහන්සේ වඩා හිඳුවා සඝනටද බුදුරජාණන් වහන්සේවද සිව්පසයෙන් දන් දී සුවහස් වටනා අටපිරිකර දී නිබඳයෙන් තමන්ගේ ආයු පමණින් අසූ දහසක් අවුරුදු දන් දී සිල් රැක භාවනාකොට සිනෙහැති පෙම්බර දෙමව්පියන් දරුවන්ට තරන ප්‍රේමයක් සෙසින් මිනිස් අමිනිස් නිරිසතුන් කෙරෙහි පෙම් ඇතිව අසූදහසක් ගවුරුදු දිව සැපතට හෙතුවූ පින්කොට දුන් මේසේ සුව විඳිනිසි කිය.

ඒ විමන හොරකොට සුමඛදේවී නම් දෙවිදුවගේ විමන දැක්විය. ඒ දෙවිදුවගේ විමන නිමිනියාව කෙසේදයත්? මරකත රජත වණ්ණ මිණියෙන් වැම් හිඳුවා මරමිණියෙන් දුව වලලු බැඳ ගෝසි සඳුනෙන් සැපතිපත් ඔබා විදුරෙන් කොබෝ ගෙඩි බැඳ ගොනැස් සතරතින් නිමවා පා කවුළු නිල් මිණියෙන් නිමවා සෙවෙනි දැරහ මිණියෙන් නිමවා නිල්මිණියෙන් හිකති නිමවා පළල විසිඑයොදනක් හා උස පන්නිස් යොදනක්වූ ප්‍රාසාදය සත්රුවනින් නිමවා ගඹඩාවල කොට්ටා දහස් යහන් උඩ අනුලඤ්ඡයක් එවනා සළුවක් බැඳ කෙළලඤ්ඡයක් සුර සුන්දරීන් පිරිවරා සිටිනා දෙළොස් දහසක් දෙනා ගඳවිලවුන් ගන්වති. දෙළොස්යාලක් රන්සුන්නෙන් ඇතඔප් ලවා වෙසවුඳුණු මහරජහටසේ තිති වීණ ගායනා කෙරෙති. සඳද්දහ තලා හා සරි පොකුණු සොළොසෙහා, සත්රුවනින් පියගැට ලඤ්ඡයෙක, දඹුවැට පහන් ලඤ්ඡයක, මෙසේ නොයෙක් ඉසුරෙන් යුකතව හුන් දෙවිදුවගේ විමන දැක නිමි මහරජාණෙණි මාතලිය! මේ දෙවි දූ කුමන පින්කොට අවුදින් මෙසේවූ දිවසැප විඳිද්දූයි විවාළාහ. එබස් අසා මාතලි දෙවිපුත් කියන්නේ මහරජ! මේ දෙවි දූ අතීතයෙහි තණ්හඞ්කර බුදුරජාණන්වහන්සේ සමයෙහි පැදුම් පියෙසැ සුමඛතල නම් ගමෙහ සුමන නම් දැරියක්ව තමා සත්නැවිරිදිකල සඟතයෙන් පන්සිල් රැක පොහොය අටසිල් රැක බුදුන් කෙරෙහි බණ අසා බණහි පැහැද මවුපියන් දෙදෙනා ප්‍රධානකොට ඇති තමාගේ කුලෙහි මහලු නැයන් වැඳ පුදා මසිලන් වැඳ පුදා නුවර වැස්සන් ලවා ගුණ කියවා වෙසෙයි. මවුපිය දෙදෙනා සතලිස් කොටියක් ධන ඇත්හානු එතෙක් වස්තු දැනිව පින් නොකොට පරලොව ගියාහ. වැඩිමහලු නැයෝ සම්පත්

උහුන් නොසා සියල්ලවුන් සෙරේ ඇ මෛත්‍රී ඇති තියාත් මත් කිරිමෙහි උන්සාහ ඇති තියාත් දුන හොපතේ දෙමිවුපියන්ගේ වස්තු හෙන දන්පින් සැවසි කිය. එසඳ තුඹරිකොව් දෙමවුපියන්ගේ නුහුවණ සමි සිහා මම මේ වස්තු යන පරිභෝග නොව සදිව්‍යසම්පත් විදිමියි සිහා මල් ගොණවු රිත් පැහැ ඇදි සරවා එයි ලැයි බලණන් ආදිවූ යාචකයන්ට දන්දී ඒ පිරි මසන්ට පරිවාර සලස්වා ඇල්පැන් ගොණවු ඇති තැන පොකුණු බදවා නිති නහුරු විළඳ පත්‍රාදි ඇතිසොට තබා ගඳදුම්මල් ඇතිතැරවා දෙළොස් වාර යෙන යියලු අවධිරිසර බෙහෙත්බඩු දන් දී සිල් සිප් නිතිරි කුටු නොයෙක් රෝහිණිවි දන් දී මේමි නියායෙන් බොහෝ කුසල් රැස්නොට සාලිස්දහ සක් අවුරුදු බඹසරවස් රැක නිති තුනුරුවන් මෙනෙහි නොට කුසල් නොට ඇතිනාක් ජීවිතයන්ට දන් දී සාලිස් දහසක් අවුරුදු කුසල් නොට එයින් සැව අවුන් වේ දිව්‍යස්ත්‍රාසාදයෙහි සුව විඳිනියි කිය. මෙසේ දෙම් දූ හණහසිකාර බුදුරජාණන් වහන්සේගේ සමිසේ පවත් මෙතේ බුදුරජාණන්වහන්සේ දන්වා දිව්‍ය සම්පත් වළඳ මෙතේ බුදුරජාණන් සොරෙහි පැහැද එයින් මත් සෙහි බුදුරජාණන් වහන්සේට දෙළොස් මාල් පායක් සරවා මෙම තියා යෙන් තුන් පායක් සරවා පිළිගන්වා සසුන් වැද මිහණිව සාරදහසක් අවුරුදු මිනිසුන්ගේ පුරා රහත්ව නිවන්දකිනි මහරජ! යි කිය.

එසඳ දෙව් සමාගමයට බණ අසන්ට රැස්වූ දෙවියෝ කියන්නාහු නිබි මහරජාණන් ගෙනෙන්ට ගිය මාතලිදෙව්පුත්ද බ්‍රහ්මදෙව්පුත්ද ලස්වූය. ඔවුන් යුහුව සාදවාගෙන එන ලෙසට දෙව්පුතකු යවුව මැනවයි සක්දෙව් රජනට කිය. එබස් අසා සක්දෙවිරජ නිමි මහරජාණන් සාදවා යවු මාතලි දෙව්පුත් ලැබූ බැවින් උන් සාදවා යවූ බ්‍රහ්ම දෙව්පුත්ද ලස්වූයයි තුන් වැනිව කුරුදෙව්පුතු යවූය. ඒ දෙව්පුත් එසේම ගොස් නිමි මහරජහට යුහුව වැඩිය මැනවියි දුන්විය. ඒ අසා මාතලිදෙව්පුත් රථය පැදගෙන ගොස් සක්දෙවිරජහට වාසස්ථානවූ දසදහසක් යොදුන් දෙව්පුරය හා සුධර්මා සභා දිව්‍ය සභාව හා සුදර්ශන නම් රුවන් දෙරටුව දුක්විය. එතැන්හි සිට යියල්ල එක්කොට දක්වන්නේ දසදහසක් සක්වළ රුවන් මහමෙර ද සතර මහා සාගරය ද මිරු මුහුදු ද වෛඩූර්‍යමී මුහුදු ද පැ දසදහසක්සක්වළද සත් කුළු පව්වන්ද සදන්දහතලා ද ගං හෝ තෙත්වත් මහවැවුද පැ සතරවරම් රජුන්ගේ සතර මහ නුවරද ත්‍රිකූට මධ්‍යයෙහි දසදහසක් යොදුන් අසුර පුර යද මෙරපල්ලේ. සුවාසුදහසක් සක්වළ හිමවු ගල්ගුහාද පැ අසුරයන්ගේ සිත්තළු පළොල් රැකද පැ දෙවිලෝ වැසියන්ගේ අනෙක සුවහස් විමන් පැ සුධර්මා චිත්‍රා සුජාතා නමැ යන සතරදෙනාගේ විමන් දුක්විය. නදුන් උයන් පැ චිත්‍රලතා වනය පැ හැම බුදුවරයන් වහන්සේ විජම් බණ දෙසන පරසතුරුසාමුල මැවුණු පා ඤ්ඡුකබ්බලශෛලාසනයද පැ අටවිසි නකුත සබඳිවූ තරු යන ගනියද තිරසඳ දෙදෙනාගේ විමන්ද සියක් යොදුන් උස ඇති මහා දඹගසදැයි මෙසේ නොයෙක් වස්තු ඇතිවිලස් වෙන වෙන සොව පාමින් සිටියදී සුදම්දෙව්පුතු යවූහ. එසඳ නිබු තැන් පසුව බලම්හයි සැවයොදුන් සුදර්ශන මහා විජියට බැස සුදම්දෙව්සභාවට නික්මුණුසේක. එසඳ බ්‍රහ්ම විෂ්ණු ශක්‍රාදී දෙවියෝ එක්ව බොධිසත්වයන් බුදුවූ කල පූජා කරන්නාසේ චිත්‍රකූට දෙරටුයෙහි පවත් සුදම්දෙව්සභාව දක්වා රන්කළස රිදීකළස පබළුකළසයෙන්ද රන්ධජ රිදීධජ පහාකායෙන්ද පෙළ නන්වා

සක්දෙව් රජහු උයන්සෙළියට නික්මුණුකල්හි පැදුම්සක්වළ මුව මිටෙහි තමාගේ සෙනහ එවා රිදී මුවා අසිපත් අහලූ සෙළසුවහයි ගාඤ්චියත් පිරිවරා සෙළලක්ෂයක් රිදී දඹුවැට පහන් ඇතිව සෙවහාභරණ පැළඳ දිව අසකු නැගි ධෘතරාෂ්ට්‍ර නම් වරම් දෙවිරජ පැදුරු දෙසෙහි අරක් ගනියි. දකුණු සක්වළ මුව මිටෙහි තමාගේ සෙනහ එවා මිණිමුවා අසිපත් අහලූ කිරිමණ කුම්භාණ්ඩයන් සමග මිණිදඹුවැට පහන් ඇතිව කනකාභරණයෙන් සැදී මිණිමුවා අසකු නැගි විරූළ්හක නම් වරම් දෙවිරජ දකුණුසක්වළ අරක් ගනියි. පැල සක්වළ මෝ මිටෙහි තමාගේ සේනාව යවා පබළුමුවා අසිපත් අහලූ නි පමණ නාගහටයෙන් හා සමග මිණිදඹු වැට පහන් ඇතිව පබළුමය ආභරණයෙන් සැරසී පබළු පැ වැනි දිව අසකු නැගි විරූපාක්ෂ නම් වරම් දෙවිරජ පැල දෙසෙහි අරක් ගනියි. උතුරු සක්වළ මුවමිටෙහි තමාගේ සෙනහ ගෙහා කනකමය අසිපත් අතලූ එහෙක් යක්ෂහවයන් විවිධවරා කී පමණ මිණිදඹුවැට පහන් ඇතිව කනකාභරණයෙන් සැදී දිව අසකු නැගි කුවෙරාහ්වම් වරම් දෙවිරජ සවණිණපාසව නම් පළිහයට නැගී අරක් ගනියි. සුධම්මා නම් ගාඤ්චි පුත්‍රයෙක් සමිගඤ්ඤ නම් බෙරයක් අතලා සැවැදහසක් හෙරීන් පිරිවරා සැටයොදනෙක රහ මඟුලු බැඳ සිටියි. ගාඤ්චි නම් දෙවි පුත් වෛෂ්ණවී සළස තබා උඩසෙල් වියන් බඳවා රන්තරු රිදිතරු කිඹුකි ණිකජාලා මුදු දුල් එල්වා දෙපස නොයෙක් සුවහස් ධජපෙළ නන්වා සඳු පුල් සුරනි කිණිකිරි දැ සමන් දෙ ඉද්ද පරසතු කොබෝලිල මඳරා මානෙල් මල් ඉසිමින් සඬ්ඛපද්ම දෙදෙනා ලවා සත්රුවන් අතුරුවා ගණසාල් ඉස්වා අසූහුන්සෙළඟ් සුර සුඳුරින් ලවා පටහ වීණා කංස මිහිතු මෘදඞ්ග අතොවා ගඳවිලවුන් ගන්වා ගඳදියෙන් නාවා දිවසළු හඳවා දිව ආභරණ පලඳවා දිව දුහුලින් හිස සිසාරා ශක්‍රයෝ තමා පලන් ආභරණ පලඳවා ගවු පමණ වොටුනු පලඳවා චාමර සලවා රන්සේසත් කරවා සුධම්මා, සුජාතා, නඳා, චිත්‍රා, යන අගමෙහෙසුන් සතරදෙනා හා අඩුතුන්සෙළඟ් දිව්‍ය සත්‍රින් හා එක්තිස්තල වාසී බඹුන් අතින් පූජාසත්කාර ලබන බුදුන් වැඩ හිඳ ධර්ම දෙශනා කරනලද දිග සැටයොදුන් පුළුල පණස්යොදුන් බොලපසළොස් යොදුන් බදුවද පෙත්තක පාහැ වැනි පැහැ ඇති පාණ්ඩුකම්බලශෛලාසනය ට නිමි මහරජාණන් වැඩිහ. සුවාසූදහසක් යොදුන් මහාසාගරය ඇලලූ සෙයින් මහාසාගරය ඔදවඩනා කලක් මෙන් රැස්වූ දෙවියන්ට නිදසුපුර දෙවියන්ගේ ආයුෂයෙන් සතියක් දිවාරාත්‍රියෙහි බණ දෙසූහ. ඒ මිනිස් ලොව ආයුගණනායෙන් සත්යියයක් අවුරුදුය. සඤ්ජීව නරකයෙහි පැසෙන පවුකළවුන්ගේ ආයුෂයට එක් පැයෙක් වෙයි. මෙසේ සතියක් බණ දෙශනා කළ කල්හි දෙවියෝ සතුටුවූහ. සක්දෙවිරජද සතුටුව තමාගේ ශක්‍ර සම්පත් සරියේ දෙකක් කොට බෙදා දී පාණ්ඩුකම්බල ආසනයද සරියේ කළුහුය ගසා බෙදා දී දිව්‍යසම්පත් වළඳා වැඩහුන මැනවයි පැවරූහ. නිමි මහරජාණෝ කියන්නාහු දිවසැපත් උදෙසා මෙහි රැඳුණහොත් මාගේ පාරමිතාවන් පිරිහීමට කාරණය එබැවින් මනුෂ්‍යලොකයට යනු කැමැත්තෙමි කියා සක්දෙව් රජ අතින් සමුගෙන නඳා නම් උයනට වැඩියාහ.

එසඳ සක්දෙව්රජ මාතලි දෙව්පුතු කැඳවා නිමි මහරජාණන් පෙර සේම මිනිස්ලොවට ගෙනගොස් ඇරලාපියවයි කිය. නිමි මහරජාණෝද දිව්‍ය බ්‍රහ්මාදි දෙවියන්ට පින්දී අවවාද කොට සමුදී මාතලි දෙව්පුතු ගෙනෙනලද වෛජයන්ත නම් රථයට නැංගාහ. රථයට නැගි බෝසතුන් ගෙනවුත් මුවදෙව් නම් උයන්හි ලා දෙව්ලොව ගියේය. එවත් දෙටුපුත් රජ අසා උයන සරහා තමාගේ සිව්විරහ සෙනඟ ගෙන උයනට ගොස් නිමි මහරජාණන් දැසා වැඳ නැගි සිට සවාමිනි! නුඹවහන්සේගේ රාජ්‍යය රක්ෂා කළ මැනවයි ආරාධනා කළහ. නිමි මහරජාණන් ලෝවැස්සන්ට අකොප්‍යව දශරාජධර්මයෙන් රාජ්‍යය කරන කල්හි මනුල්කපුවාට මෙසේ කිහ. යම් දවසෙකු මානිස නරඝොසක් දිටිනම් මට කියවයි කිහ. මෙසේ කල්යාමකින් නරඝොසක් පෙනුණු සඳ සුවඳ දියෙන් අත්දෙව රන් අඬුවෙන් නරඝොස උදුරා පෑයේය. එකල නිමි මහරජාණෝ—

"පාතුභූතා දෙවදූතා—පබ්බජ්ජා සමයෝ මම
ඉදානෙව අගාරස්මා—නපොධක්ඛඤ්ඤ හොමහං"

යනාදීන් කියා මනුල් කපුවාට ගම්වර දී ජ්‍යෙෂ්ඨ පුත්‍රයාට මා කළ පිළිවෙළ නොවරදවා රකුවයි අවවාද දී නික්මුණාහ. එසඳ ජ්‍යෙෂ්ඨ පුත්‍රතෙම නෙත් පුරා හඳුළු ගෙන මුව පුරා වැලපෙමින් යන කරුණු කිම්දෝහෝයි උවසරව අනින් මුව වසා නුඹ පැවිදිවන කරුණු කිම්දෝහෝයි පුළුවුත්ය. එසඳ නිමි මහරජාණෝ හෙපිදු මෙසේම සුවාසූදහසක් හවුරුදු රජකොට සුවාසූදහසක් හවුරුදු බ්‍රහ්මවිහරණයෙන් දවස් යවා පින් පුරවයි අවවාද දී මුවදෙව් නම් උයන්හි තාපස් වැද සුවාසූදහසක් හවුරුදු නිරන්තර බ්‍රහ්ම විහරණයෙන් දවස් යවා ධ්‍යානභාවනාකොට බඹලොව ගියාහ.

උහුද නිමි මහරජාණන් දුන් පිළිවෙළ නොවරදවා රජකොට හිස නරඝොස් දුටුසඳ මනුල්කපුවාට ගම්වර දී දෙටුපුත් හට රාජ්‍යය දී මා කළ පිළිවෙළ නොවරදවයි අවවාද දී එමතෙක් අවුරුදු බඹසර වස් රැක ධ්‍යාන භාවනා කොට බඹලොව ගියාහ. මෙම නීයායෙන් බෝසතුන් කළ පිළිවෙළ නොවරදවා කොට දහසක් රජුන් බඹලොව උපන්කල්හි පසුව රජපුත් පිළිවෙළ විරදවා දන්හල් ගිනිලා සසුන් වැසියන් සී වැසියන් කොට රු බී මත්ව දුස්සිලව අකුසල් කොට නරකයට යන බව දැන බඹලොව සැපත් හැර එසින් සැව අවුත් මේ නුවණ නැති රජහු දෙව්ලොව ගෙනගිය මැනවයි සිතා ඒ රජු නිසා අග බිසව බඩ පිළිසිඳගෙන දසඑකඩමසක් පුරා මෙඝ මුඛයකින් බස්නා පුන්සඳ මඩලක් සෙයින් බිහිව වැඩී සුවාසූදහසක් අවුරුදු යුව රජකම් කොට තමන් පියරජහට බණ කියා වැඩෙහි යොදා පෙර සෙයින්ම දන් දෙවා නිබඳ පන්සිල් රැක පොහොය අටසිල් රැක බඹසර වස්රැක භාවනාකොට බඹලොව උපදනාවන්කළහයි වදාරා මේ නිමිජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නිමිමහරජව උපන්නේ නම් බුදුවූ මම්ම වෙමිදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

නිමිජාතකය නිමි.

ඛණ්ඩහාල ජාතකය.

තවද එක් සමයෙක්හි විවිතොපවිත පාරමිතා සම්භාරයෙන් සිද්ධවූ සර්වඥඥානයෙන් ලෞකික ලොකොත්තරාදි භෙදනිත්‍ය සකල ධර්ම සමූහය යථාසභාවාවබොධ ප්‍රතිවෙධ ලක්ෂණ ඥානයෙන් මනාකොට දන්නාවූ නිලොතුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර තිසා ගිජ්ඣකූළු පව්වෙහි වසන සේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

• එක් සමයෙක්හි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අනුපිය නම් නුවර නිසා මල්ලරජුන්ගේ අනුපිය නම් නියම්ගම වසන කල්හි ප්‍රසිද්ධප්‍රසිද්ධවූ ශාක්‍ය කුමාරවරු සම්ඥයන් වහන්සේ සමීපයෙහි මහණවන්නාහුය. එසමයෙහි මහානාම නම් ශාක්‍ය කුමාරයන් හා අනුරුද්ධ නම් ශාක්‍යකුමාරයෝ සහෝදර දෙබෑයෝය. ඔවුන් දෙදෙනා අතරෙන් අනුරුද්ධ නම් ශාක්‍යකුමාරයෝ ඉතා සිව්මැල්ලෝය. ඊන්ට ප්‍රාසාද තුනෙක් වන්නේය. එක් ප්‍රාසාදයෙක් නෙම නා කාලයෙහි වසිමට සුදුසු වන්නේය. එනෙක් ග්‍රීෂ්මකාලයට සුදුසු වන්නේය. එනෙක් වර්ෂාකාලයට සුදුසු වන්නේය. ඒ අනුරුද්ධ ශාක්‍යකුමාරයෝ වර්ෂඍතුවට සුදුසු ප්‍රාසාදයෙහි වර්ෂාරම්භය පුරුෂයන් නැතිව සත්‍රීන් විසින්ම පවත්වනලද ආතත විතත්තාදිවූ පඤ්චාඞ්ගික තූර්‍යනාදයෙන් සිත් අලවමින් මනුමාලෙන් යටමාලයට නොබැස දිවසැපත් විඳිනාවූ දිව්‍යකුමාරයකු මෙන් මහත්වූ ශ්‍රී විභූතීන් අනුභව කෙරෙමින් වාසය කරන්නාහ.

එකල්හි මහානාමනම් ශාක්‍යරජ්ජුරුවෝ සිතුන්නෝ දැන්වූකලී ප්‍රසිද්ධ ප්‍රසිද්ධවූ ශාක්‍ය කුමාරවරු බුදුරජාණන්වහන්සේ සමීපයෙහි මහණ වන්නාහුය. අපගේ කුලයෙන් මහණවූ කිසි කෙනෙක් නැත. එසේහෙයින් මම් වත් අනුරුද්ධ කුමාරයන් වත් අප දෙදෙනාගෙන් එක්කෙනකුත් මහණවූ වොහින් යහපත් වන්නේයයි සිතා ඒ මහානාම ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුද්ධ නම් ශාක්‍ය කුමාරයන් සමීපයට ගොස් මෙසේ කිවුය. මල අනුරුද්ධ කුමාරයෙනි! දැන් ප්‍රසිද්ධප්‍රසිද්ධවූ ශාක්‍ය රාජ කුමාරවරු සම්ඥයන් වහන්සේ සමීපයෙහි මහණ වන්නාහ. අපගෙන් ගොස් බුදුන් සමීපයෙහි මහණවූ කිසිකෙනෙක් නැත්තාහ. එසේ හෙයින් නෙපි හෝ මහණවව, මම් හෝ මහණවෙමියි කිවුය. එබස්ඇසූ අනුරුද්ධ කුමාරයෝ කියන්නෝ බැනත් වනන්ස! මම ඉතා සිවුමැල්ලෙමි. එසේ හෙයින් මම ගිහිගෙයි ආලය හැර ශාසනයෙහි මහණව මහණදම් පුරන්නට අසමර්ථයෙමි, නුඹවහන්සේ මහණවූව මැනවැයි කිවුය. එසඳ මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවෝ එසේවීනම් මල! මෙසේ එව මම හොපට ගිහිගෙයි වසන්නාවූත් විසින් කළමනා කමිනන්න ප්‍රනාශකොට සියමි. මාගියන්නාවූ වචනය එසනව අසව.

පළමුකොට කුඹුරු සැමිය යුත්තේය. කුඹුරේ සාරා වැපිරිය යුත්තේය. වපුරවා වප්පැන් සපා අළ යුත්තේය. වප්පැන් සපා නැවත කිප සතියකින් කුඹුරෙහි දිය බැන්ද යුත්තේය. දිය බැඳ ක්‍රමයෙන් ගොයම් අවගත් කල්හි නෙලිය යුත්තේය. නෙලා ඉක්බිති ගොයම් පැසිඹිය කල්හි ගොයම් දුවිය යුත්තේය. ගොයම් දවා ඉක්බිති කොළලැවිය යුත්තේය. කොළ ලවා ඉක්බිති කඳුකළ යුත්තේය. කඳුකරවා ඉක්බිති කලවිට කොළනැගිය යුත්තේය. කොළ නංවා ඉක්බිති මැඩවිය යුත්තේය. මඩවා ඉක්බිති පිදුරු වැඩිය යුත්තේය. පිදුරු වඩා ඉක්බිති රඹුගසා අළ යුත්තේය. රඹුගසා ඉක්බිති සුළඟට පා පැස්ස යුත්තේය. පැස ඉක්බිති විමැණ මෙහෙකැයි නියම දැන කොටු ගුලව ගෙන්වා ලැවිය යුත්තේය. වී කොටුගුල ලවා ඉක්බිති නැහෙන අවුරුද්දෙහිත් මෙසේම කළ යුත්තේය. මෙසේම කළයුතුයයි කියා කම්මන්ත නොගෙවෙන්නේය. කම්මන්තයෙහි කෙළවරෙක් නොපෙනෙන්නේයයි කිවුය.

එබස් ඇසූ අනුරුඬකුමාරයන් විසින් බැනන්වහන්ස! කවර කලෙක්හි කම්මන්ත ගෙවේද කවර කලෙක්හි කම්මන්තයෙහි කෙළවරක් පෙනේද කවර කලෙක්හි අපි උපයා කැවිල්ලෙහි නිරාසාඝව පඤ්චකාමය අනුභව කෙරෙමින් සතුටුව වාසය කරමෝදැයි කිකල්හි මල අනුරුඬ කුමාරයෙනි! ජීවත්වන තෙක් එසා දවසකුත් කම්මන්ත නොගෙවෙයි. කම්මන්තයෙහි කෙළවරක් නොපෙනෙයි. කම්මන්තයෙහි කෙළවරක් නැතිව තිබියදී දෙමවුපියෝද මුතුන් මිත්තෝද මිය පරලොව ගියාහුයයි මහානාම ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුඬ කුමාරයන්ට කිවුය. එබස් ඇසූ අනුරුඬ කුමාරයෝ එසේවීනම් බැනන් වහන්ස! නුඹවහන්සේලාහිහිගෙයි වැස සම්පත් අනුභවකළ මැනව, මම බුදුරජාණන් වහන්සේ සඬම්පයෙහි මහණව මහණදම් පුරමියි කිවුය.

ඉක්බිත්තෙන් අනුරුඬ ශාක්‍යකුමාරයෝ මැනියන් සඬම්පයට ගොස් කියන්නෝ මැනියන් වහන්ස! මම ගිහිගෙන් ගොස් ශාසනයෙහි මහණව මහණදම් පුරනු කැමැත්තෙමි. මහණවීමට මට අනුදත මැනවැයි කිවුය. මෙසේ කී කල්හි අනුරුඬ නම් ශාක්‍යකුමාරයන්ගේ මැනියෝ කුමාරයන්ට මෙසේ කිවුය. පුත! තෙපි දෙබැයෝ නම් මට ඉතා ප්‍රියයහ, සිත්කලුහ. මනවඩන්නාහ. තොප දෙදෙනා මළ විටෙක මුත් සෙසු සැරියේ වෙන්වන්නා නොකැමැත්තෙමි. එසේ හෙයින් තොප දෙදෙනා ජීවත්ව ඉන්දදී මහණවන්ට කුමක්පිණිස අනුදනිම්දැයි කිවුය. දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඬ කුමාරයෝ මැනියන්ට කියන්නෝ මැනියන්වහන්ස! මම ශාසනයෙහි මහණවනු කැමැත්තෙමි මට මහණවීමට අනුදත මැනවැයි කිවුය. මෙසේ කීකල්හි අනුරුඬකුමාරයන්ගේ මැනියෝ පුත! තෙපිදෙබැයෝ නම් මට ඉතා ප්‍රියයහ. මනවඩන්නාහ. මරණින් විනා කැමැති පරිද්දෙන් වෙන් නොවෙමි. තොප දෙදෙනා ජීවත්ව ඉන්දදී කුසික්නිසා මහණවීමට අනුදනිම්දැයි මහණවීමෙහි අනභිප්‍රාව කිවුය.

එසමයෙහි භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ සියලු ශාක්‍ය රජදරුවන්ට ප්‍රධානව රාජ්‍යය කරන්නාහ. ඒ භද්දිය ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුඬ නම් ශාක්‍ය කුමාරයන් හා යහලුව වෙසෙති. ඉක්බිත්තෙන් අනුරුඬකුමාරයන්ගේ මැනියෝ සිතන්නෝ මෙ භද්දිය ශාක්‍ය රජ්ජුරුවෝ සියලු රජදරුවන්ට නායකව රාජ්‍යය කෙරෙති. ඌතුමූ මුන්ම යහලුව වෙසෙති. ඒ රජ්ජුරුවෝ

රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණවන්ට උත්සාහ නොකෙරෙතිසි සිතා අනුරුඬ කුමාරයන්ට කියන්නෝ පුත අනුරුඬ කුමාරයෙනි! භද්දිය රජ්ජුරුවෝ රාජ්‍ය ශ්‍රී හැර මහණ වෙත් නම් තෙපිත් උන් හා සමග ගොස් ශාසනයෙහි මහණව මහණදම් පුරවයි කිවුය.

එකල්හි අනුරුඬ කුමාරයෝ භද්දිය නම් ශාක්‍ය රජු කරා ගොස් රජ්ජුරුවන් වහන්ස! මාගේ මහණවීම නුඹවහන්සේ පිළිබඳදැයි කිවුය. එබස් අසා භද්දිය රජ්ජුරුවෝ සබඳ අනුරුඬ කුමාරයෙනි! තොපගේ මහණවීම ඉදින් මා පිළිබඳවීනම් රාජ්‍යශ්‍රී හැර මම මහණවනු නොකැමැත්තෙමි. එසේ නෙයින් මහණවීමට තොපහා මා එක්වීමෙක් නැත. තොපගේ මහණවීම මා පිළිබඳ නොවෙයි. මා මහණවෙනි නොසිහා තෙපි සැපසේ ගොස් මහණවයි කිවුය. දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඬ ශාක්‍යකුමාරයෝ භද්දිය ශාක්‍යරජ්ජුරුවන්ට කියන්නෝ සබඳ භද්දිය ශාක්‍ය රජ්ජුරුවන් වහන්ස! බැඹිය මැනව අපි දෙදෙන රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම ශාසනයෙහි මහණව මහණදම් පුරම්හයි කිවුය. එකල භද්දිය ශාක්‍ය රජ්ජුරුවෝ සබඳ අනුරුඬ කුමාරයෙනි! මම මහණවිය නොහෙමි. මා විසින් නොපව කරන්නට නිසි සෙසු යම් කාරියෙක් ඇත්නම් එය කරන්නට පිළිවන. මම මහණවිය නොහෙමි. තෙපි මහණවවයි කිවුය. එබස් අසා අනුරුඬ කුමාරයෝ කියන්නෝ රජ්ජුරුවන් වහන්ස! මැනියන් වහන්සේ මට කියනසේක් ඉදින් පුත අනුරුඬ කුමාරයෙනි! භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවන් වහන්සේ මහණවන්ස්ක්වීනම් තෙපි උන්වහන්සේ හා සමග මහණවවයි කිවුය. එබස් ඇසූ භද්දිය රජ්ජුරුවෝ කියන්නෝ සබඳ අනුරුඬකුමාරයෙනි! තොපගේ මහණවීම මා පිළිබඳයයි නොපගේ මැනියන් විසින් කියනලද්දේ වීනම් මහණවීමට නොපහා, මා එක්වීමෙක් නැත. තොපගේ මහණවීම මා පිළිබඳයයි නොසිතා සැපසේ ගොස් මහණවවයි කිවුය. නැවතද දෙවැනිවත් තුන්වැනිවත් අනුරුඬ කුමාරයෝ කියන්නෝ සවාමීනි භද්දිය රජ්ජුරුවන් වහන්ස! බැඹිය මැනව. අපි දෙදෙනම ගොස් ශාසනයෙහි මහණව මහණදම් පුරම්හයි කිවුය.

එසමයෙහි මනුෂ්‍යයෝ සත්‍යවාදීහ. එසේහෙයින් භද්දිය නම් ශාක්‍ය රජ්ජුරුවෝ අනුරුඬ කුමාරයන්ට කියන්නෝ සබඳ අනුරුඬ කුමාරයෙනි! එයේවීනම් සත් අවුරුදුදක් බලව සත් අවුරුදුදක් ගියකල දෙදෙනම එක්ව ගොස් මහණ වම්හයි කිවුය. එවිට අනුරුඬකුමාරයෝ රජ්ජුරුවන්වහන්ස! සත්අවුරුදුදක් කල් ඉතා බොහෝය. සත්අවුරුදුදක් බලා ඉදිනට නොපිළිවනැයි කිහ. එසේ වීනම් සාවුරුදුදක් බලව පස්අවුරුදුදක් සතර අවුරුදුදක් තුන් අවුරුදුදක් දෑවුරුදුදක් අවුරුදුදක් බලව අවුරුදුදක් ගියකල දෙදෙනම ගොස් මහණවම්හයි භද්දිය රජ්ජුරුවෝ කිවුය. අනුරුඬකුමාරයෝ සබඳ රජ්ජුරුවන් වහන්ස! අවුරුදුදක් කල් ඉතා බොහෝය. අවුරුදුදක් බලා ඉදිනට මට නොපිළිවනැයි කිහ. එසේවීනම් සබඳ අනුරුඬකුමාරයෙනි! සය්මසක් බලව සත්මසක්ගියකල දෙදෙනම ගොස් මහණවම්හයි කිවුය. රජ්ජුරුවෙනි! සත්මසක් කල් ඉතා බොහෝය. සත්මසක් ඉවසා ඉදිනට නොපිළිවනැයි අනුරුඬකුමාරයෝ කිහ. එසේවීනම් සමසක් බලව තවද පස්මසක් සාරමසක් තුන් මසක් දෙමසක් දෙපෝයක් බලව දෙපෝයක් කල්ගිය කල්හි

දෙදෙනම් හොස් මහණවම්හයි කිහ. සබඳ රජ්ජුරුවන් වහන්ස! දෙපෝයක් සල් ඉහා බොහෝය. දෙපෝයක් සල් බලා ඉඳිනට මට නොපිළිවනැයි කිවුය. එසේමනම් යහලු අනුරුධ කුමාරයෙනි! යම්පමණ කාලකින් දරුවන් හා මිල්බැයන්ව රාජ්‍යය පාවාදී අවවාදානුශාසනා කෙරෙත් නම් එපමණවූ සතියක් සල් ඉවසුවයි කිවුය. අනුරුධ කුමාරයෝ එබසට සතුටුව සබඳ භද්දිය රජ්ජුරුවන් වහන්ස! සතියක් නම් බොහෝ කාලෙක් නොවෙයි. එපමණ සල් ඉවසන්නෙම් වේදැයි කිවුය.

ඉක්බිත්තෙන් **භද්දිය** ශාක්‍ය රජ්ජුරුවෝය, **අනුරුධ** කුමාරයෝය, **ආනන්ද** කුමාරයෝය, **භගු** කුමාරයෝය, **කිම්බිල** කුමාරයෝය, **දෙවදත්ත** කුමාරයෝය යන මොහු සදෙන **උපාලි** නම් නාපුවා හා සමග පෙර යම්සේ සිව්විධ සෙනග සමග උදාන ක්‍රීඩාවට යෙත්නම් එපරිද්දෙන්ම සියුරහසෙනග හා සමග මහණවන්නට නික්මුණාහ. ඔහු හැම දුරට ගොස් සේනාව රඳවා අන්රාජ්‍ය සිමාවෙහට පැමිණ හමන්හමන් පලන් ආභරණගලවා උතුරුසළුවේ පොදියක් කොට බැඳ උපාලි නම් නාපුවාට කියන්නාහු එම්බා උපාලිය! මේ ආභරණ භාණ්ඩය ඇරගෙන නැවත නුවරට පලායව හට ජීවිතෝපාය දක්ෂ රුදෝහට මෙපමණෙක්ම සැහෙන්නේයයි කිවුය.

ඉක්බිත්තෙන් උපාලි නම් නාපුවා ආභරණ පොදිය ඇරගෙන පෙරළා එන්නට සිටි හැනෑත්තවුට මෙසේවූ සිතිවිල්ලෙක් විය. ශාක්‍ය රජදරුවෝ නම් ඉහාම වණ්ඩයෝය. එරුළුයෝය. මේ නාපුවා කුමාරවරුන් මරාපියා ආභරණගලවා පොදියබැඳගෙන නුවරවපලාආයයි නුවර රැඳුණ රජදරුවන් වහන්සේ මා මරවාපියන්ටත් නිසිසේක. එසේහෙයින් මෙබඳුවූ ශාක්‍යකුමාරවරු පවා මිහසෙපත් හා ගිහිගෙයි ඇලුම් හැර නික්ම මහණවෙති. මට වූකලී කියනුම කිම්දැයි උපාලි නම් නාපුවා ආභරණ පොදිය මුදා සියලු ආභරණම ගසක එල්වා මේ ආභරණ මා විසින් දෙන ලද්දේමය. යම්කෙනෙක් දුටුහු නම් උහුමූ ඇරගනිත්වයි කියා ඒ භද්දිය රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති ශාක්‍ය කුමාරවරුන් සවම්පයට ගියේය. ඒ රාජකුමාරවරු උපාලි නම් කපුවා දුරින්මී එන්නහු දැක සවම්පයට පැමිණි කල්හි කියන්නාහු සගය උපාලිනම් කපුව! කුමක් නිසා අප සවම්පයට පෙරළා ආයෙහිදැයි කිහ. එකල්හි මහුල් කපුවා කියන්නේ සවාමිදරුවනි! නුවරට නික්මෙන්නට සිවි මම සිතන්නෙම් ශාක්‍ය රජදරුවෝ නම් වණ්ඩයෝය එරුළුයෝය මෙහොක් කුමාරවරුන් මරාපියා ආභරණ ගලවා පොදිය බැඳගෙන පලා ආයයි නුවර උන් රජදරුවන් වහන්සේ මා මරවාපියන්ටත් නිසිසේක. එසේ හෙයින් මෙබඳුවූ ශාක්‍ය රජදරුවන් වහන්සේ පවා රාජ්‍යශ්‍රී හැර ගිහිගෙන් නික්ම මහණවනසේක. මට වූකලී කියනුම කිම්දැයි සිතා මම ඒ ආභරණ පොදිය මුදා සියලු ආභරණම ගසක එල්වා යම් කෙනෙක් දුටුහු නම් උහුමූ ඇරගනිත්වයි මා විසින් දෙනලදමැයි කියා එතැන සිටම වැලක පෙරළා නුඹවහන්සේලා සවම්පයට ආම්කිහ. එබස්අසා රාජකුමාරවරු කියන්නෝ සගය උපාලි නම් කපුව! ශාක්‍ය රජදරුවෝ නම් ඉතා වණ්ඩයෝය. මේ තෙමේ කුමාරවරුන් මරාපියා ආභරණ ගලවා පොදියබැඳගෙන ආයයි මරවාපියන්නට නිස්සෝයයි සිතා නැවත අප සවම්පයට ආවාවූ හා නළුසේ ඉහාම සඟපත් වන්නේයයි කියා ඒ ශාක්‍ය කුමාරවරු උපාලි නම් කපුවා කැඳවා ගෙන බුදුරජාණන්වහන්සේ සවම්පයට ගොස් නමස්කාර කොට එකත්පස්ව

හිඳ මෙසේ කිහ. සාමිනි! අපි ශාක්‍යයෝ නම් ඉතා මානියෙමහ. එසේ හෙයින් මේ උපාලිතෙම් කපුවා අපට බොහෝ දවසක් මෙහෙකරුව සිටියේය. ඔහු පළමුව මහණකොට වදුළ මැනව. ඔහු මහණවූ කල්හි අපි ඕනව අනිවා දන පච්චුපට්ඨාන අඤ්ජලිකම්ම කරම්හ එසේ කල්හි අපගේ ශාක්‍යමානය මැඩියන්නේයයි කිහ. එකල්හි සම්බුදුන් වහන්සේ උපාලි නම් කපුවා පළමු වෙන් මහණකොට පසුව රාජකුමාරවරුන් සදෙනා මහණකරවූසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ එම විස් සාරමස ඇතුළත සූඛවිහාරසමාපත්තිය, දිව්‍යසුඛවිහාරනිමිත්තය, ආශ්‍රවක්ෂයකර ඥානය,යි කියනලද ත්‍රිවිද්‍යාව සාක්ෂාත් කළසේක ආයුෂ්මත්වූ අනුරුඛ ස්ථවිරයන්වහන්සේ දිවැස් ඉපදවූසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ශ්‍රොතාපත්ති ඵලය සාක්ෂාත් කළසේක. දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ලෞකිකවූ ඉඩිය ඉපදවූසේක. එසමයෙහි ආයුෂ්මත් භද්දිය ස්ථවිරයන්වහන්සේ ආරණ්‍යය, වෘක්ෂමූලය, ජනවිවික්තසේනාසනය,යි කියනලද මේ හැමතැනට පැමිණ ඉතා සැපය ඉතා සැපය'යි එක්වන් උදන් අනන සේක. එකල බොහෝ භික්ෂූන්වහන්සේ බුදුරජාණන් වහන්සේ සවිමිපසට ගොස් දන්වනසේක් සවාමීනි! මේ ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ ආරණ්‍යයට වෘක්ෂමූලයට සූන්‍යාගාරයට පැමිණ **අහෝ සුඛං අහෝ සුඛං**'යි එක්වන් ප්‍රීතිවාක්‍ය පවත්වති. සවාමීනි! එතැනැතයෙන් මේ ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ ශාසනයෙහි ඇලුම් නැතිව හෝ බඹසර වස් රහිති. නොහොත් පළමු තමන් අනුභව කළ රාජ්‍යශ්‍රී සැපයම සලකමින් ආරණ්‍ය වෘක්ෂමූල සූන්‍යාගාරයට පැමිණ ඉතා සැපය ඉතා සැපය'යි එක්වන් උදන් අනති සිතම්හයි දන්වූසේක.

ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ එබස් අසා ඒ භික්ෂූහු කැඳවා මහණ! තෙපි මෙසේ මා කී නියාව කියා භද්දිය ස්ථවිරයන් කරා ගොස් ඇවැත්වූ භද්දිය ස්ථවිරයන්වහන්ස! බුදුරජාණන්වහන්සේ නුඹවහන්සේ කැඳවනසේකැයි කියා කැඳවා ගෙන එවයි වදුළ සේක. යහපත සවාමිනි කියා ඒ භික්ෂූහු බුදුරජාණන්වහන්සේට ප්‍රතිවචනදී භද්දිය ස්ථවිරයන් වහන්සේ කරා ගොස් ඇවැත්වූ භද්දිය ස්ථවිරයන්වහන්ස! බුදුහු නුඹ වහන්සේ කැඳවනසේකැයි කිවුය. එසේද ඇවැත්නි! කියා ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ ඒ භික්ෂූන්ට ප්‍රතිවචනදී බුදුරජාණන්වහන්සේ කරා ගොස් නමස්කාර කොට එකත්පස්ව හුන්සේක. එකල්හි බුදුහු භද්දියයෙනි! සැබෑද? තා ආරණ්‍ය වෘක්ෂමූල සූන්‍යාගාරයට පැමිණ ඉතා සැපය ඉතා සැපය'යි එක්වන් උදන් අනවුදැයි විමාළසේක. එසේය සවාමීනි! යි දන්වූ කල්හි භද්දියයෙනි! තෙපි කවර අවී කොට්ඨාසයක් සලකා, ආරණ්‍ය වෘක්ෂමූලසූන්‍යාගාරයට පැමිණ '**අහෝ සුඛං අහෝ සුඛං**'යි එක්වන් ප්‍රීතිවාක්‍ය පවත්වවුදැයි නැවතත් විමාළසේක.

සවාමීනි! පෙර මා රාජ්‍යශ්‍රී අනුභව කරනකල අන්තඃපුරයෙහි රැකවලුන් ඉතා තරවන්නේය. අන්තඃපුරයෙන් පිටත රැකවලුන් ඉතා තරවන්නේය. ඇතුළු නුවර රැකවලුන් ඉතා තරවන්නේය. පිටි නුවර රැකවලුන් ඉතා තරවන්නේය. ඇතුළු ජනපදයෙහි රැකවලුන් ඉතා තරවන්නේය. සවාමීනි! එසේ බලවත්වූ රැකවලින් රක්ෂිත ගොපිතව ප්‍රාසාදයෙහි මතු මහල්තලයෙහි වසන්නෙම් භයපත්ව උද්වෙග ඇතිව

සාංඝා සහිතව හැතිගෙන වෙසෙමි. දැන් වූනලි ආරණ්‍යවෘක්ෂමූල සූන්‍යාගාරයට පැමිණියෙමි නිර්භීතව උද්වෙග නැතිව සාංඝා නැතිව තැනි ගැන්මක් නැතිව රැසාවල් ලැබීමෙහි උත්සාහයක් නැතිව මන් නැතිව අනුන් නිසා ජීවත් වන්නෙමි වෙනෙහි වසන්නාවූ මෘග පක්ෂිජාතීන් මෙන් නිසි වෙක්හි අභිලාෂයෙක් නැතිව නිර්භීතව වෙසෙමි. සවාමීනි! මම මේ අර්ථ සොඳුන්සය සලකා ආරණ්‍යවෘක්ෂමූල සූන්‍යාගාරයට පැමිණ **'අහෝ සුඛං අහෝ සුඛං'** යි එක්වරක් ප්‍රීතිවාක්‍ය පවත්වමියි දැන්වූසේක.

ඉක්බිත්තෙන් බුදුරජාණන්වහන්සේ උන්වහන්සේට ප්‍රසංසා කරන සේක් යම්ක්‍රුගේ සන්තානයෙහි ක්‍රොධ මානාදී අකුශල ධර්මයෝ නැද්ද ශාස්වත දෘෂ්ටි උච්ඡේද දෘෂ්ටි සඤ්ඤා භවාභවය ඉක්ම සිටියේද පහවූ භය සොඟ ඇතිතෙසින් සන්තුෂ්ටවූ සිත් ඇති ඒ උත්තම පුරුෂයා දෙවතාවෝත් හැම්වේලෙහි රක්ෂා ඇත්තෝ වේදැයි මෙසේ හැඳින්විය සථවිරයන්වහන්සේට ප්‍රසංසාකොට ඒ අනුපිය නම් නියම්ගමින් නික්ම කොසඹෑ නුවරට වැඩ කොසඹෑනුවර නිසා සොහිතාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි දෙවදත්ත සථවිරයන්වහන්සේ එක් දවසක් තමන්වහන්සේ කවර නම් කෙනකුන් පහදවා ලාභසත්කාර උපදවම්දෝ හෝ යි සිතනසේක් මේ අජාසත් කුමාරයෝ බාලයෝය. මිතු ඇතිවන හැනැත්තෝය. එසේ හෙයින් මේ අජාසත් කුමාරයන් පහදවා ගෙන ලාභ සත්කාර ඉපදවූයෙම් වීම් නම් යනපැවැත් වන්නේයයි සිතා පාසිවුරු තැන්පත් කොට තබා රජගහනුවරට ගොස් එහි පිවිසුසේක.

ඉක්බිත්තෙන් ඒ දෙවදත්ත සථවිරයන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රමණභාවය අනාදරකොට බාල කුමාර රූපක් මවා සර්පමේඛලාවක් පැලඳ අජාසත් කුමාරයන්ගේ ඇතයෙහි පෙනී හිඳසේක. ඒ අජාසත් කුමාරයෝ භයපත්වූහ. උන් භයපත්වූ නියාව දැන දෙවදත්ත සථවිරයන් වහන්සේ කුමාරයෙනි! නොපි මට බවුදැයි කීසේක. එසේය බම් තෙපි කවුරුදැයි විචාළහ. මම දෙවදත්ත සථවිරයෙමි කී කල්හි සවාමීනි! ඉදින් නුඹවහන්සේ එහාම් මේ කුමාර රූපය අනාදරකොට ශ්‍රමණරූපයෙන් නිර්මුඛයෙහි සිටිය මැනවැයි කීහ. එකල්හි දෙවිදත් තෙරුන්වහන්සේ කුමාර රූපය අතුරුදහන් කොට පාසිවුරු ධරා ශ්‍රමණරූපයෙන් අජාසත් කුමාරයන්ගේ අභිමුඛයෙහි සිටිසේක. එකල්හි අජාසත්කුමාරයෝ දෙවිදත් මහතෙරුන්වහන්සේගේ මේ ඉර්ධි ප්‍රාතිහාර්‍යය පැහැදවස සිවුදැසත පන්සියයක් රථ විරිවරා උපස්ථානයට යෙහි. බත්වසුන් පන්සියයකුත් තිරන්තරයෙන් දියයුතු කොට තැබූහ.

ඉක්බිත්තෙන් මෙබඳුවූ ලාභසත්කාරයෙන් හා කීර්තියෙන් මඩනා ලද්දාවූ දෙවදත්ත සථවිරයන්වහන්සේට මමත් භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරෙම්යි මෙබඳුවූ පාපාඛ්‍යාසයෙක් උපන්නේය. ඒ සිතූ සිත හා සමහම ඉර්ධියෙන් පිරිහුණුසේක. එසමයෙහි ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන්වහන්සේට උපස්ථායකවූ **සංඝුඛ** නම් කොලිය පුත්‍රයෙක් කාලක්‍රියා කොට එක්තරා මිනොමියවූ දිව්‍යනිකායෙක උපන්නේ මුගලන් මහතෙරුන්වහන්සේ කරා අවුත් මෙසේ කීය. සවාමීනි! දෙවිදත් තෙරුන්වහන්සේ (ලාභ සත්කාර යෙන් මඩනාලද සිත් ඇති තැනැත්තන්වහන්සේ) ට මමත් භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරෙම්යි මෙබඳුවූ පාපාඛ්‍යාසයෙක් උපන. ඒසිතූ සිතහා සමහ සවාමීනි! දෙවිදත්තෙරුන්වහන්සේ ඉර්ධියෙන් පිරිහුණුසේක්වේදැයිකියා මුග ලන් මහතෙරුන්වහන්සේ වැඳ පැදකුණුකොට එතැන්හිම අතුරුදන්විය.

ඉක් බිත්තෙන් මුගලන් මහතෙරුන් වහන්සේ සම්මුදුරුවන් වහන්සේ සවිමිපයට ගොස් වැඳ එකත්පස්ව ඉඳ දන්වනසේක් සාමිනි! මට උපස්ථාය කළු කකුධ නම් බොලිය පුත්‍රයා එක්තරා මනොමයවූ දිව්‍ය නිකායෙහි උපන් හෙතැත්තේ මා සවිමිපයට අවුත් කියන්නේ සාමිනි! දෙව්දත් තෙරුන් වහන්සේ (මානයෙන් මඩනාලද හෙතැත්තන්වහන්සේ)ට විමිත් භික්ෂුසඞ්ඝයා පරිහරණය කෙරමිසි මෙබඳුවූ පාපාඛ්‍යාසයෙක් උපන. එසේවූ සිත හා සමඟ ඉඩියෙන් පිරිහුණුසේක් වේදැයි කියා ඒ කකුධ නම් දිව්‍ය පුත්‍රයා මා වැඳ පැදකුණුකොට එහෙන්හිම අතුරුදන්වියයි දන්වූසේක. එඛස් ඇසූ සම්මුදුරුවන් වහන්සේ වදාරනසේක් මෞද්ගල්‍යායන සථවිරයෙනි! ඒ කකුධ නම් දිව්‍යපුත්‍රයා පරසිත් දැන යම්බසක් කී නම් ඔහු කී බස සත්‍යයම වන්නේ යයි වදාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේත් සාමිනි! කකුධ නම් දිව්‍යපුත්‍රයා යමක් කීනම් ඔහු කීබස් විෂම වන්නේ අන් පරිද්දකින් නොවන්නේයයි දැන්වූ සේක. එකල්හි සම්මුදුරුවන් වහන්සේ මෞද්ගල්‍යායන සථවිරයෙනි! මේ බස රැකපියව අන්කිසි කෙනකුන්ටත් නොකියව. ඒ තුවජ්පුරුෂයා තමා කළ අකාරියෙන් තෙමේම ප්‍රකාශ වන්නේ වේදැයි වදාළසේක.

ඉක්බිත්තෙන් භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ නොයෙක් කාරණා වදාරා කොසඹෑත්‍රවරින් නික්ම රජගහනුවරට වැඩ රජගහනුවර නිසා වෙළඹ නාරාමයෙහි වැඩවසනසේක. එකල්හි බොහෝ භික්ෂූන් වහන්සේ සම්මුදුරුවන් වහන්සේ කරා පැමිණ දන්වනසේක් සාමිනි! දෙව්දත් තෙරුන්වහන්සේට අජාසත්කුමාරයෝ පන්සියයක් රථයෙන්පිරිවරනලදුව සරහාපිළියෙළකරන ලද උතුම්වූ රථයකට පැනනැඟි උදැසන සවස උපස්ථානයටයෙති. බත්වපුන් පන්සියයකුත් නිරන්තරයෙන් දෙනු කොට තැබවූයයි දැන්වූසේක. එකල්හි සම්මුදුරුවන් වහන්සේ වදාරනසේක් මහණෙනි! දෙවදත්ත සථවිරයන්ට ඒ ලාභ සත්කාර සිලොකය නිසා අවැඩෙක් විනා වැඩෙක් නැත. මහණෙනි! යම්සේ චණ්ඩවූ බලුකුකුරුවකුගේ නාසාපුටයෙහි තබා පිතක් බිඳපු නම් එකල්හි ඒ බලුකුකුරුවා වඩ වඩාලා ඉතාම චණ්ඩව මිනිසා ඇවිදිද, එපරිද්දෙන්ම දෙවදත්ත සථවිරයන්ට අජාසත් කුමාරයෝ පන්සියයක් රථ දිරිවරා ගොස් උදැසන සවස උපස්ථාන කෙරෙත්නම් පන්සියයක් බත්වපුන් නිරන්තරයෙන් තබා දෙත් නම් ඒ ලාභ සත්කාරය නිසා දෙවදත්ත සථවිරයන්ට අවැඩෙක් විනා වැඩෙක් නොපැමිණෙන්නේය. මහණෙනි! දෙවදත්ත සථවිරයන්ට ආත්මවධය පිණිස ඵලදායක ලාභ සත්කාරාදිය පහළවිය. විනාශය පිණිස දෙවදත්ත සථවිරයන්ට සිලොකය පහළවිය. මහණෙනි! යම්සේ කදලි වෘක්ෂය ආත්මවධය පිණිස ඵලදායක වේද පරිහානිය පිණිස ඵලදායක වේද යම්සේ හුණගස් ආත්මවධය පිණිස ඵල ගනිද පරිභවය පිණිස ඵල ගනිද යම්සේ බටගස් ආත්මවධය පිණිස ඵල ගනිද පරිහානිය පිණිස ඵල ගනිද යම්සේ ආජානීය වෙලඹ ආත්මවධය පිණිස ගැබ් ගනිද පරිහානිය පිණිස ගැබ් ගනිද මහණෙනි! එපරිද්දෙන්ම ආත්මවධය සඳහා දෙවදත්ත සථවිරයන්ට ලාභ සත්කාර හා කීර්ති උපදී. බලවත්වූ විනාශය සඳහා දෙවදත්ත සථවිරයන්ට ලාභ සත්කාර හා කීර්ති උපතැයි වදාළසේක.

ඉක්බිත්තෙන් සම්බුදුරජාණන් වහන්සේ සියුවණක් පමණින් පිරිවරා සරාජිකා පබ්බජ්ජාවෙහි බැඳිගිය ධර්මදේශනා කරනසේක. එකල්හි දෙවදත් තෙරුන් වහන්සේ හුනස්නෙන් නැගී මහාකොට හැඳ පොරවා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරකොට දෙකොන් මුදුනෙහි බැඳ කියන්නාහු ස්වාමීනි! දැන් බුදුරජාණන් වහන්සේ වැඩිවිය පියසේක. මහලුව හියසේක. පශ්චිම වයසට පැමිණිසේක. එසේනමුත් සම්බුදුරජාණන්වහන්සේ නිස්සුසඞ්ඝයා පරිහරණය නිරිමෙහි මිසතුහසාකව දැවටුණ සැපය අනුභව කෙරෙමින් වාසය කරනසේක් විසි මට නිස්සු සඞ්ඝයා වහන්සේ ඇරපියන සේක්වසි මම නිස්සු සඞ්ඝයා පරිහරණය කෙරෙමියි කිසේක. එකල්හි සම්බුදුරජාණන් වහන්සේ දෙවදත්තයෙනි! නොකැමැත්තෙමි නිස්සු සඞ්ඝයා පරිහරණය කරන්නට තොපට අනුදැන්නා නොවෙයි වදාළසේක. දෙවැනිවත් තුන්වැනිවත් දෙවිදත් තෙරුන් වහන්සේ මම නිස්සු සඞ්ඝයා පරිහරණය කෙරෙමියි කිසේක. සම්බුදුරජාණන් වහන්සේ නොකැමැත්තෙමියි වදාරා දෙවදත්තයෙනි! ශාරීපුත්‍ර මෞද්ගල්‍යායන දෙදෙනාට පවා නිස්සු සඞ්ඝයා පරිහරණය කරන්නට පවා නොදෙමි. හොපසේවූ චණ්ඩාල ගුණ ඇති ලාමක සත්වයන්ට කුමක් නිසා පවා දෙමිදැයි වදාළසේක. එකල දෙවිදත් තෙරුන් වහන්සේ සරාජිකා පබ්බජ්ජාවෙහිදී බුදුරජාණන් වහන්සේ මට චණ්ඩාල වාදයෙන් නිගුහ කළසේක. සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ උත්තාසී කොට හුඹු සේකැයි තිබී නොසහුවුවු සිත් ඇතිව බුදුරජාණන් වහන්සේට වැඳ පැදකුණුකොට හියසේක. මෙසේ දෙවදත්ත සථිරයන්ගේ මේ ජාතියෙහි පළමුවන වෛර බැඳීම් විය.

ඉක්බිත්තෙන් දෙවිදත් තෙරුන් වහන්සේ අජාසත් කුමාරයන් කරා හොස් කියනසේක් කුමාරයෙනි! පෙර මනුෂ්‍යයෝ දීඝායුෂ්කයෝය. දැන් මිනිස්සු මිදුයුෂ්කයෝය. එසේහෙයින් තෙපි කුමාරව සිටම රාජ්‍ය ශ්‍රී නොලැබ සාත්‍රාදියා නෙළේනම් කාරණා නොවෙයි. තෙපි පියරජ්ජුරුවන් මරා රජවව. මම බුදුන් මරා බුදුවෙමියි කිසේක. එකල්හි අජාසත් කුමාරයෝ ආයුමෙත්වූ දෙවදත්ත සථිරයන් වහන්සේ මහත්වූ ඉර්ධානුභාව ඇතිසේක. එසේ හෙයින් දැන පිනා නොදැන නොකියනසේකැයි කලවේ සිරියක් බැඳ ගැන වසා පියලි ඇඳ දෙවන දුවල් බබා ඉගි කරුව ඇහ මැහ බල බලා සැඟ ඇවිදිනා තැනිගෙන වහ වහා අන්තඃපුරයට වන්නාහු රැකවල සිටි මනුෂ්‍යයෝ දැක අල්වා ගෙන පරීක්ෂා කරන්නාහු කලවේ බැඳි සිරිය දැක කුමාරයන් වහන්ස! කුමක්නිසාද නැමැතිසේක්දැයි කිවුය. සඟයෙනි! පියාණන්වහන්සේ මිරිනු කැමැත්තෙමියි කිසේක. පියාණන්වහන්සේ මරන්නට ප්‍රයෝග කොට උත්සාහ කරවූවෝ නවුරුදුයි විවාළ කල්හි දෙවදත්ත සථිරයන් වහන්සේ නියොග කළසේකැයි කිවුය. එබස් ඇසූ සමහර අමාත්‍ය කෙනෙක් අජාසත් කුමාරයනුත් දෙවිදත් තෙරුන්වහන්සේත් සියලු භික්ෂූන් වහන්සේත් මැරිය යුතුයයි මන්ත්‍රණය කළාහ. සමහර අමාත්‍ය කෙනෙක් භික්ෂූන් වහන්සේ නොමැරිය යුතුය. භික්ෂූන් වහන්සේ කළ අපරාධයෙක් නැත. අජාසත් කුමාරයනුත් දෙවිදත් තෙරුන්වහන්සේත් මැරිය යුතුයයි කිවුය. සමහර අමාත්‍ය කෙනෙක් අජාසත් කුමාරයනුත් දෙවදත් තෙරුන්වහන්සේත් භික්ෂූන්වහන්සේත් නොමැරිය යුතුය. රජ්ජුරුවන් වහන්සේට මේපවත් දන්වම්හ. දැන්වූ කල යමක් කිසේක් නම් එලෙස කරම්හයි කිවුය.

ඉක්බිත්තෙන් මහාමාත්‍යයෝ අජාසත් කුමාරයන් ඇරගෙන බිම්සර රජ්ජුරුවන් කරා ගොස් එපවත් දන්වූහ. රජ්ජුරුවෝ සගයෙනි! තොප හැම මහාමාත්‍යයන් විසින් කෙසේ මන්ත්‍රණය කරන ලදදැයි විචාළෝය. සමහර අමාත්‍ය කෙනෙක් කුමාරයනුත් දෙවිදත් තෙරුන්වහන්සේත් භික්ෂු සඞ්ඝයා වහන්සේත් මැරිය යුතුයයි මන්ත්‍රණය කළහ. සමහර අමාත්‍ය කෙනෙක් භික්ෂූන්වහන්සේ කළ අපරාධයෙක් නැත. එසේ හෙයින් උන් වහන්සේලා නොමැරිය යුතුය. කුමාරයනුත් දෙවිදත් තෙරුන්වහන්සේත් මැරිය යුතුයයි කිවුය සමහර අමාත්‍ය කෙනෙක් කුමාරයනුත් දෙවිදත් තෙරුන් වහන්සේත් භික්ෂු සඞ්ඝයා වහන්සේත් නොමැරිය යුතුය. රජ්ජුරුවන් වහන්සේට දන්වම්හ. දැන්වූකල යමක් කිවොත් එලෙස කරම්හයි මන්ත්‍රණය කළාහුයයි කිහ.

එබස් ඇසූ බිම්සර රජ්ජුරුවෝ කියන්නෝ සගයෙනි! බුදුහුත් ධර්මයත් සඞ්ඝයාත් කුමක් කෙරෙත්ද? බුදුරජාණන් වහන්සේ විසින් පළවූව දෙවදත්ත සථවිරයන් වහන්සේට රජගහ නුවරදී ප්‍රකාශනීය කර්ම කරන ලද්දේය. පළමු දෙවදත්ත සථවිරයන් වහන්සේගේ අන් ප්‍රකෘතියෙක. දැන් අන් ප්‍රකෘතියෙක. දෙවදත්ත සථවිරයන් වහන්සේ කයින් වචසින් යම් අක්‍රියාවක් කොළෝ නම් ඒ අක්‍රියායෙන් බුදුහුත් ධර්මයත් සඞ්ඝයාත් නොදැක්ක යුත්තේය. දෙවදත්ත සථවිරයෝම ඒ අක්‍රියායෙන් ප්‍රකාශව දැක්ක යුත් තෝයයි කියා යම් මහාමාත්‍ය කෙනෙක් කුමාරයනුත් දෙවිදත් තෙරුන් වහන්සේත් භික්ෂු සඞ්ඝයා වහන්සේත් මැරිය යුතුයයි කිවුද සමහරු භික්ෂූන් වහන්සේ කළ අපරාධයෙක් නැත. කුමාරයනුත් දෙවිදත් තෙරුන් වහන්සේත් මැරිය යුතුයයි කිවුද ඔවුන් හැම දෙනා යටත් තනතුරෙහි තුබූහ. යම් අමාත්‍ය කෙනෙක් කුමාරයනුත් නොමැරිය යුතුය. දෙවිදත් තෙරුන්වහන්සේත් නොමැරිය යුතුය. භික්ෂු සඞ්ඝයා වහන්සේත් නොමැරිය යුතුය, රජ්ජුරුවන් වහන්සේට දන්වම්හ. දැන්වූකල යමක් කීසේක් වීනම් එලෙස කරම්හයි කිවු නම් ඔවුන් හැම දෙනා උසස් තනතුරෙහි තුබූහ.

ඉක්බිත්තෙන් බිම්සර රජ්ජුරුවෝ අජාසත් කුමාරයන් සමීපයට කැඳවා කුමාරයෙනි! කුමක් නිසා තෙපි මා මරනු කැමැත්තහුදැයි විචාළහ. රාජ්‍යය නිසාය නුඹවහන්සේ මරනු කැමැත්තෙමි කී කල්හි ඉදින් තෙපි මා රාජ්‍යය නිසා මරනු කැමැත්තහු වීනම් මේ තොපගේ රාජ්‍යය වේදැයි කියා අජාසත් කුමාරයන්ට රාජ්‍යය පාවා දුන්හ. ඉක්බිත්තෙන් අජාසත් කුමාරයෝ රාජ්‍යයට පැමිණ සෝවාන් පෙලෙහි පිහිටියාවූ ධර්මිෂ්ඨවූ පියරජ්ජුරුවන් යටිපත්ල කේදිවත්කොට ලුණු ඇඹුල් ගල්වා බලවත් වෙදනායෙන් පීඩිතකොට බත් වැද්දනොදී ආහාරක්ෂයින් ජීවිතක්ෂයට පැමිණවූහ. මෙසේ දෙවිදත් තෙරුන්වහන්සේ අජාසත් කුමාරයන්ට නොයෙක් උපාය කියා සෝවාන්ව සිටි බිම්සර රජ්ජුරුවන් මරවා අජාසත් රජ්ජුරුවන් කරා ගොස් මහරජ්ජුරුවෙනි! තොපගේ මනදෙළ මුදුන්පැමිණියේයයි කීසේක. ස්වාමිනි! නුඹවහන්සේගේ මනදෙළ කවරේදැයි විචාළකල්හි බුදුන් මරා මම බුදුවන්නා කැමැත්තෙමි. මේ මාගේ මනදෙළයයි කීසේක. එසේ කල අප විසින් මිට කළමනා කිම්දැයි කී කල්හි දුනුවායන් රැස්කරවයි කීසේක. යහපත ස්වාමිනි කියා අජාසත් රජ්ජුරුවෝ අක්ෂණවෙධී ධනුර්ධරයන්ගෙන් පන්සියයක්

රැස්කරවා ඒ පන්සියයක් දෙනාගෙන් එක්නිස්දෙනකුහෝරාගෙන දෙවිදත් තෙරුන් වහන්සේ කිවා කරවයි කියා දෙවදත්තාසථවිරයන් සමීපයට යවූහ. ඒ තෙරුන් වහන්සේ දුනුවායන් එක්නිස්දෙන අතරෙන් ප්‍රධාන දුනුවායා සමීපයට කැඳවා උපාසකයා! ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වසනසේක. අසවල් වේලේ දිවාසථානයෙහි සක්මන් කරන සේක. නෝ එහැනට ගොස් ඒ බුදුන් විෂපෙවූ කියකින් විද ජීවිතක්ෂයට පමුණුවා එවයි කියා යවා. නැවත අනික් දෙදෙනකුට කියනසේක් පෙපි දෙදෙන සිටි මහින් එක් පුරුෂයෙක් එයි පෙපී දෙදෙන ඔහු මරා අසවල් මහින් එවයි කියා එමහ දෙදෙනකු සිටුවූසේක. තවද කියනසේක් පෙපි සතරදෙනා සිටි මහින් පුරුෂයන් දෙදෙනකු එති. පෙපි ඔවුන් මරා අසවල් මහින් එවයි කියා එමහ සතරදෙනකු සිටුවූසේක. තවද පෙපි අටදෙන සිටි මහින් පුරුෂයෝ සතරදෙනෙක් එන. පෙපි ඔවුන් මරා අසවල් මහින්එවයි කියා එමහ අටදෙනකු සිටුවූසේක. තවද පෙපි සොළොස්දෙනා සිටි මහින් පුරුෂයෝ අටදෙනෙක් එති. පෙපි ඔවුන් මරා අසවල් මහින් එවයි කියා එමහ සොළොස්දෙනකු සිටුවූසේක. දෙවිදත් තෙරුන් වහන්සේ එලෙස කුමක් පිණිස කරවූසේක්දයත්? තමන් වහන්සේ කළ අකාරිය කිසිකෙන කුන්වත් නොඇහවා සඟවන පිණිස කළසේක.

ඉක්බිත්තෙන් ඒ නායක දුනුවායා සඬුවැවිළුරෙහි බැඳ එල්වාගෙන තියවුර පිට බැඳගෙන මැඩගතු දුන්න අහින්ගෙන සම්බුදුයන් වහන්සේ සමීපයට ගොස් බුදුන් විදිමිසි සිතා දුන්නෙහි දුනුදිය නහා රිය ඉදුවාගෙන ඇද අසුර ගලවන්නට අසමර්ථවිය. සඟල ශරීරය තදව යතකලා මිරිකන්නාක් පරිද්දෙන් බලවත්වූ වේදනාවට පැමිණිස්සේය. ඒ දුනුවායා දුන්න උරයපුරා ඇදගෙන සිනියම් ඇද ලූවාක්මෙන් මරණභයින් තැතිගෙන නිශ්චලව සිටි සේය. එකල්හි සම්බුදුයන් වහන්සේ ඔහු දැක මධුරස්වර විහිදුවා තෝ නොබව පුරුෂය! මෙසේ එවයි වදාළසේක. එකෙණෙහි ඒ දුනුවායා ආයුධය දමා බුදුරජාණන් වහන්සේගේ අනෝතත්තරශාන මඬහල ලක්ෂණයෙන් විරාජමාන වූ ශ්‍රීපාද පද්මයෙහි වැටිගිඳ සවාමිනි! අඥානවූ මොහිවූ කාරණාකාරණා සලකාගත නොහෙන්නාවූ මා දෙඝ මැඩපවත්නේය. එසේ දෙඝිවූ මම නුඹවහන්සේගේ ගුණ නොදන්නෙම් නුවණ නැති දෙවිදත් තෙරුන් වහන්සේගේ බසින් නුඹවහන්සේ මරන්නට ආමි. එසේනොයින් සවාමිනි! සාපරාධවූ මාගේ දෙඝය නොසලකා මට ක්ෂමාකොට වදාරන්නේ යහපතැයි කියා ක්ෂමා කරවා එකත්පස්ව හුන්නේය. එකල්හි සම්බුදුයන් වහන්සේ ඕනට දුකඛ සමුදය නිරෝධ මාර්ගය යි කියනලද චතුරාර්යසත්‍යය ප්‍රකාශ කිරීමෙන් ධර්මදේශනාකොට සෝවාන් පෙලෙහි විහිටුවා උපාසකයා! දෙවිදත් තෙරුන් කි මහින් නොගොස් අනික් මහකින් යවයි කියා යවූසේක. ඔහු යවා සක්මනින් බැස එක්තරා රුක්මුල් වැඩහුන්සේක.

ඉක්බිත්තෙන් ඒ නායක දුනුවායා නොඅා හෙයින් අන්‍යවූ දුනුවායෝ දෙදෙන මෙහු කල්‍යවන්නට කාරණා කියමේක්දැයි පෙරමනට යන්නාහු දැක බලධාරිවූ බුදුරජාණන්වහන්සේ දැක සමීපයට ගොස් වැඳ එකත්පස්ව හුන්නේය. සම්බුදුයන්වහන්සේ ඔවුන් දෙදෙනාවත් චතුරාර්යසත්‍යය ප්‍රකාශකොට ධර්මදේශනාකොට සෝවාන් පෙලෙහි පිහිටුවා උපාසකවරුනි! දෙවිදත් තෙරුන් කී

මහින් නොයව් අන්‍ය මහකින් යව්යයි කියා යවූසේක. මෙම උපායෙන් අන්‍යවූ සතරදෙනාත් අටදෙනාත් සොළොස්දෙනාත් අවුත් උන් කල්හි වතුරාර්‍ය සත්‍යය ප්‍රකාශකොට ධම්දෙසා සොවාන් පෙලෙහි පිහිටුවා අනික් මහ කින්ය වූසේක. ඉක්බිත්තෙන් පළමුකොට ආවාවූ දුනුවායා දෙව්දත්තෙරුන් වහන්සේ කරා පැමිණ සවාමීනි! මම සම්‍යක් සම්බුඩයන් වහන්සේ ජීවිතක්ෂයට පමුණුවන්නට අසමර්ථ වීමි. ඒ බුදුරජාණන් වහන්සේ මහත්වූ ඉඩිඇති සේක. මහත්වූ ආනුභාව ඇතිසේකැයි කිවුය. මෙසේ කියා නැවත බුදුන් කරා ගොස් බුදුරජාණන් වහන්සේ නිසා අපගේ ජීවිතය ලබනලදැයි හැම දෙනම සඵිඤයන් වහන්සේ සවමීපයෙහි මහණව අර්හත්ඵලයට පැමිණියා හුය. මේ ප්‍රවෘත්තිය භික්ෂුසඩ්ඝයා වහන්සේ කෙරෙහි ප්‍රකාශවිය. භික්ෂූන් වහන්සේ ධම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ ඇවැත්නි! දෙවදත්ත සථවිරයෝ එකම සඵිඤයන් වහන්සේ කෙරෙහි වසිර සිතින් බොහෝදෙනා මරවන්නට උත්සාහ කොළෝය. ඔහු හැම්දෙනම සඵිඤයන් වහන්සේ නිසාම දිවිලද්දෙ වේදැයි මෙසේවූ කථාවක් උපදවා උන්සේක. එකල්හි සඵිඤයන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමනකින් ධම්සභා මණ්ඩපයට වැඩ පනවනලද බුඩාසන මස්තකයෙහි යුගදුරා මුදුනෙහි දිලියෙන්නාවූ ළහිරු මඩලක් මෙන් දිලිහි දිලිහී වැඩහිඳ මහණෙනි! මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි කිනම් කථාවක් තොපට අඩාලවිදැයි විවාළකල සවාමීනි! නුඹ වහන්සේ විසින් නොකියන්නට වදරනලද්දාවූ රාජකථා, චොරකථාදිවූ එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. දෙවදත්ත සථවිරයන් එකම සඵිඤයන් වහන්සේ කෙරෙහි බඩාසාතයෙන් බොහෝදෙනා නසවන්නට උත්සාහකළ කියාවත් ඔහු හැමදෙනා සඵිඤයන්වහන්සේ නිසා දිවිලත් තියා වත් කියකියා උනුම්හයි දැන්වූ කල්හි මහණෙනි! දැන් මතු නොවෙයි පෙරත් දෙවදත්ත සථවිරයෝ තනි මා ම නිසා මා කෙරෙහි වසිර සිතින් බොහෝ දෙනා මරවන්නට උත්සාහ කොළෝ වේදැයි වදරා මුවෙන් නොබැණ වැඩ උන් කල්හි ඒ භික්ෂූන් වහන්සේ විසින් සවාමීනි! දැන් මේ දෙවදත්ත සථවිරයන් එකම සඵිඤයන් වහන්සේ නිසා බොහෝදෙනා මරවන්නට උත්සාහ කළ නියාව අප හැමට ප්‍රකාශය. අතීතයෙහි එකම තැනැත්තන් වහන්සේ නිසා බොහෝදෙනා මරවන්නට උත්සාහකළ නියාව භවයෙන් පවිඡිජ්ජන ඥයින් අප්‍රකාශය ප්‍රකාශකොට වදළහොත් යහපතැයි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදළසේක.

මේ කෙසේදයන්?

යටගිය දවස බරණැස් නුවර පුෂ්පවතී නම් නුවරෙක් විය. ඒ නුවර වසවර්‍ත්ති නම් රජ්ජුරු කෙනකුන්ගේ පුත්‍රවූ **එකරාජ** නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන්නාහ. ඒ එකරාජ නම් රජ්ජුරුවන්ගේ පුත්‍රවූ **චඤ්ඣකුමාර** නම් රාජකුමාරයෙනෙක් යුවරජකම් කරන්නාහ. **ඛණ්ඩහාල** නම් බ්‍රාහ්මණයෙක් පුරොහිත තනතුරෙහි සිට ඒ රජ්ජුරුවන්ට අර්‍ථයෙන් ධර්‍මයෙන් අනුශාසනා කරන්නේය. ඒ රජ්ජුරුවෝ ඔහු නුවණැති එහෙකැයි සිතා මිනිසුන්ය මණ්ඩලයේ හිඳ සියලු සඵියන්ගේ යුක්ති අයුක්ති විවාරන ලෙස අධිකරණයට නායක කොළෝය. ඒ ඛණ්ඩහාල නම් පුරොහිතයා අත්ලස්ම ඛනකොට ඇත්තේය. සිඹල්ලවුන් ගෙන් අත්ලස්ගෙන අහිමියන් හිමි කෙරෙයි හිමියන් අහිමි කෙරෙයි.

ඉක්බිත්තෙන් එක් දවසක් යුධාභියෙන් පැරදී එක් පුරුෂයෙක් අධිකරණ ශාලායෙන් මුරහා ගෙන නික්මෙන්නේ රාජසේවයට යන්නාවූ චන්ද්‍ර කුමාරයන්ගේ දෙපය වැඳ වැතිර හියේය. එකල්හි ඒ කුමාරයෝ පින් වන්වූ පුරුෂය! මේ කිමෙක්දැයි කිවූය. සවාමීනි! බණ්ඩහාල නම් බමුණා විනිශ්චය මණ්ඩලයෙහි සොල්ලකන්නේ මම ඔහු වියින් අත්ලස් ගෙන පරාජයට පමුණුවන ලදීම් කිය. එකල්හි කුමාරයෝ තෝ නොබවයි අස් වසා විනිශ්චය මණ්ඩලයට කැඳවා ගෙන ගොස් යුකති විචාරා හිමිනැනැත්තහු හිමිකළාහ. ඒ දැක මහජනයා උහඬින් සාධුනාද පැවැත්විය. රජ්ජුරුවෝ ඒ සාධුනාදය අසා මේ කිනම් ශබ්දයෙක්දැයි විචාරා චන්ද්‍රකුමාරයන් විසින් බණ්ඩහාල නම් බ්‍රාහ්මණයා නපුරුකොට විචාරන ලද්දාවූ යුකතිය මනාකොට විචාළ හෙයින් එතැන්හි පැවැත්වූ මේ සාධුකාර ශබ්දයයි කිහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එදවත් අසා කුමාරයන් අවුත් වැඳලා සිටි තැනැත්තවුට පුහ! තොප විසින් එක් යුකතියක් විචාරා පසිඳනා ලදදැයි විචාළහ. එසේය සවාමීනි කි කල්හි එසේ වීනම් පුහ! මෙතැන් පටන් තෙපිම යුකති විචාරවයි විනිශ්චය මණ්ඩලයට නායක කොට තුබූහ. එතැන් පටන් බණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට යුක්තියෙන් විදිනා අය නැතිව හියේය. එතෙමේ මුන් නිසා වේද මට යුක්තියෙන් විදිනා අය නැතිවූයේයයි කුමාරයන් කෙරෙහි ආඝාත බැඳ නොරතුරක් දෙෂයක්ම බලා ඇවිදිනේය. ඒ එකරුජ රජ්ජුරුවෝ මුඹ ප්‍රශ්නයෝය. ඒ රජ්ජුරුවෝ එක් දවසක් අලුයම් වේලේ සුවප්නයක් දක්නාහු මනාකොට සරහනලද දෙරටු ඇති සත්රුවන් මයවූ පවුරු ඇති සැටයොදුන් පමණ සඟණි මහාවීථි ඇති දහසක් යොදුන් උස ඇති වෛජයන්ත ප්‍රාසාදාදීවූ ප්‍රාසාද පඬිකනියෙන් හෙබියාවූ නන්දනවන චිත්‍රලතාවනාදීවූ නොයෙක් උදාන පරම්පරායෙන් සිත්කලුවූ නානු නම් පුෂ්කරණිය ප්‍රධාන කොට ඇති නොයෙක් සියගණන් පුෂ්කරණියෙන් සිත් අලවන්නාවූ දෙතිස් දිව්‍ය පුත්‍රයන් ප්‍රධාන කොට ඇති ලක්ෂ කෙළගණන් දිව්‍යපුත්‍රයන් ගෙන් ගැවසී ගත්තාවූ **නවුතිසා භවනය** සුවප්නයෙන් දැක ඒ තුයත්‍රිංශත් දිව්‍යලෝකයට යනු කැමැතිව ආවායීවූ බණ්ඩහාල නම් බ්‍රාහ්මණයා උදුසනම රාජසේවයට ආ කල්හි ඔහු අතින් දිව්‍යලෝකයට යායුතු මාර්ගය විචාරා ඔහු විසින් කියනලද මාර්ගයෙන් දිව්‍යලෝකයට යෙමිසි සිතුවාහුය. ඒ බණ්ඩහාල නම් බ්‍රාහ්මණයාත් උදුසනම රජගෙට ගොස් රජ්ජුරුවන් විචාරන්නේ සවාමීනි! රාත්‍රියෙහි සැපසේ සෙය්‍යාව කළසේක්දැයි විචාළේය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඕනට ඉදිනා අස්නක් දෙවා එහි ඉඳුවා ප්‍රශ්නයක් විචාළෝය. තවද පුෂ්පවති නම් රාජධානියෙහි වසන්නාවූ ප්‍රාණඝාතාදී රෞද්‍ර ක්‍රියා ඇති ඒ එකරාජ නම් රජ්ජුරුවෝ බ්‍රාහ්මණයා බණ්ඩිකොට ඇත්තේ මුසුවූ බණ්ඩහාල නම් බ්‍රාහ්මණයා අතින් සුගතීමාර්ගය විචාරන්නාහු පුරෝහිත බ්‍රාහ්මණය! පෝ සුචරිත ධර්මය හා ආචාර විනය දන් මෙහි දක්ෂ යෙහිය. එසේ හෙයින් මනුෂ්‍යයෝ කුසල් කොට මේ මනුෂ්‍යලෝකයෙන් සුගතීලෝකයට යම් පරිද්දකින් යෙත් නම් එබදුවූ සුගතියට යන්නාවූ මාර්ගය මට විශෙෂයෙන් ප්‍රකාශ කොට කියවයි කීහ. ලොවුතුරා සම්‍යක් සම්බුදු වරයන් වහන්සේවත් ඒ සර්ඥයන් වහන්සේ නැති කල්හි බෝධිසත්ත්වවරයන් වහන්සේවත් සමීපයට ගොස් විචාළ යුතුවූ මහාඥීවූ මේ ප්‍රශ්නය

රජ්ජුරුවෝ යම්සේ සතියක් මංමුළාවූ පුරුෂයෙක් එසේම සතියක් මංමුළාවූ අනික් පුරුෂයකු අතින් මං විචාරාද එපරිද්දෙන්ම ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා (කිසි කාරණා කාරණයක් නොදන්නාවූ අඥානවූ තැනැත්තහු) අන්න් විචාලෝය. එකල්හි ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා මේ මාගේ පසෙහුරා විටු දකිනා කලක් තියා වේදයි සිතා දැන් චන්ද්‍රකුමාරයන් ජීවිතක්ෂයට පමුණුවා මාගේ පුතුදෙළඟ පුරමිසි සතුටුවූ සිත් ඇතිව රජ්ජුරුවන්ට ආමන්ත්‍රණය කොට කියන්නේ රජ්ජුරුවන් වහන්ස! මේ ලොකයෙහි සත්පුරුෂයෝ අතිදුනය දී නොමැරිය යුක්තවුන්ම මරා මෙබඳුවූ කුසල් කොට සුගතිලොකයට යන්නාහුය. නුඹවහන්සේද එබඳුවූ කුසල් කොට සුගතිලොකයට වැඩිය මැනවයි කිය

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඔහු අතින් විචාරන්නාහු මේ සත්ත්වලොකයෙහි අතිදුනය නම් කවරේද? නොමැරිය යුත්තෝ නම් කවුරුද? ඒ කාරණය මට කියා යාගත් කරම්හ දනුත් දෙම්හ එසේ හෙයින් අතිදුනයෙහි විශෙෂ මට නෝරා කියවයි කිවුය. එබස් ඇසූ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේට ද්‍රිය පුත්‍රයන් සතර දෙනකු හා ප්‍රිය දූන් සතරදෙනකු හා අග්‍රමහෙෂිකාවූ ප්‍රිය භාර්‍යාවන් හා සිටුවරුන් හා සේනාඛයෙන් ඛවලවූ වෘෂභරාජයන් හා මිහුලසුන් හා සමන අවශෙෂවූ සියලු ඇත් අස් ආදීන්ගෙනුත් සතර සතරදෙනකු හා මෙසේ සම්පතුම්කයකින් යාග කටයුත්තේය. මේ සියල්ලවුන්ගේ කඩුවෙන් ඉස සපා තලියේ ලේ වත්කොට ඒ වත්කළාවූ ලේ තලියෙන් යාගාවාටයේ බහා යාග කරන්නාවූ රජ්ජුරුවෝ ශරීරය සමඟ දිව්‍යලොකයට යන්නෝවේද, මහරජ්ජුරුවන් වහන්ස! තවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා දුගීමගී යාචකයන්ට බත්පිළි පමණක් දීම දැන නම්වෙයි පුත්‍රදාරාදීන් මරා ඔවුන්ගේ ගලලොහිතයෙන් යාග කිරීම අතිදුන නම් වෙයි කියා මෙසේ ඒ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා දිව්‍යලොකයට යන්නට රජ්ජුරුවන් විසින් මං විචාරනලද්දේ නරකයට යන්නට මං කීයේය. තවද අනෙක ප්‍රකාරයෙන් කාරණා කියා රජ්ජුරුවන් ගිවිස්වා ගත්තේය. මෙසේ ඒ ඛණ්ඩහාල බ්‍රාහ්මණයා ඉදින් චන්ද්‍රකුමාරයන් නැති තැනැත්තවුන්ම ඇල්වූයේ විනම් වයිරයෙන් අඳ්වූවා කොට සිතුනි සිතා ඒ කුමාරයන් බොහෝදෙනා අතරේ ලා ඔවුන් හා සමඟ මරන්නට යෙදුයේය. මෙසේ කථාකරන්නාවූ රජ්ජුරුවන් හා පුරොහිත බ්‍රාහ්මණයාගේ බස අසා අන්තඃපුර වාසී ජනයෝ හසින් තැතිගෙන එක පැහැර මහහඬින් හඬන්නට පටන්ගත්හ. තවද මේ වචනය අසා අන්තඃපුරයෙහි අවශෙෂ රාජකුමාරවරුන් හා රාජකුමාරිකාවරුන් හා අග්‍රමහෙෂිකාවෝ එක පැහැර සියලු රාජභවනය එකඝොෂා කෙරෙමින් මහහඬින් හැඬුවාහුය. සියලු රාජකුලය කල්පාන්ත මාරුතයෙන් පැහැර ළුණුලද්දාවූ සල්වනයක්මෙන් විය. ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! කිමෙක්ද? යාග කරන්නට එනසේක්ද? නොඑන සේක්ද්දැයි විචාළේය.

එබස් ඇසූ රජ්ජුරුවෝ ආචාර්‍යයෙනි! කුමක් කියවුද? යාගකොට දිව්‍යලොකයට යන්නෙම් වේදැයි කිවුය. ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! ශීරෂවූ දුෂ්ටවූ ආඛ්‍යාස ඇති පසුතැවිලියට

පැමිණෙන්නාවූ සත්වයෝ යාග කරන්නට අසමර්ථ වෙති. එසේ හෙයින් නුඹවහන්සේ එබදු සත්වයන්සේ නොව මෙතැනට සියල්ලම රැස්කරවූව මැනව. මම යාගාචාර්යයේ 'සළමනා කම්මන්ත කෙරෙමියි කියා තමාට සැහෙන පමණක් සේනාව හා මෙහෙකරුවන් ගෙන නුවරින් නික්ම යාගාචාර්යය සමීපයට පැමිණ වටින් වැට කරවූයේය. ධාර්මිකවූ ශ්‍රමණබ්‍රාහ්මණයෙක් වත් අවුත් වැළකුයේ නිසාම කාරණා නොවන්නේයයි යාගාචාර්යය වටකොට වැට කරවීම සිරිතෙසැයි කියා පුරාතන බ්‍රාහ්මණයන් විසින් තබනලද්දේය. රජ්ජුරුවෝත් රාජපුරුෂයන් කැඳවා කියන්නෝ එම්බා දරුවෙනි! මම මාගේ දූදරුවන් හා බිසෝවරුන් මරා යාග කොට දිව්‍යලෝකයට යෙමි. එසේ හෙයින් තෙපි හැම ගොස් ඒ පුත්‍රදාරුවන්ට කියා සියල්ලවුන්ම මෙතැනට කැඳවාගෙන එවයි කියා පළමුකොට පුත්‍රයන් සහරදෙනම කැඳවාගෙන අවුත් එක් තැනෙක්හි රැස්කොට සිටුවයි කිවුය.

එබස් ඇසූ රාජපුරුෂයෝ පළමුකොට චන්ද්‍රකුමාරයන් සවිමීපයට ගොස් කියන්නාහු කුමාරයන් වහන්ස! නුඹවහන්සේ මරා නුඹවහන්සේගේ පියරජ්ජුරුවන් වහන්සේ දිව්‍යලෝකයට යනු කැමතිව නුඹවහන්සේ අල්වන පිණිස අප එවූසේකැයි කීහ. කවුරුන්ගේ බසින් මා අල්වන්නට එවූසේක් දැයි චන්ද්‍රකුමාරයන් විචාළ කල්හි ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගේ බසිනැයි කීහ. ඒ බ්‍රාහ්මණයා මාම අල්වාද? නොහොත් සෙස්සහුත් අල්වා මරවා දැයි චන්ද්‍රකුමාරයෝ විචාළෝය. රාජපුරුෂයෝ කියන්නෝ සෙස්සහුත් අල්වවන්නේය. සම්භවතුම්ක නම් යාගයක් කරවනු කැමැත්තෝයයි කීහ. එකල්හි චන්ද්‍ර කුමාරයෝ සිතන්නෝ ඒ බ්‍රාහ්මණයාට සෙස්සවුන් හා වසිරයෙක් නැත. විනිශ්චය මණ්ඩලයෙහි අත්ලස් කන්නට නොලබමී සිතා මා එසා තැනැත්තහු කෙරේ වසිරයෙන් බොහෝ දෙනා මරවන්නේය. පියාණන් වහන්සේ ඉදින් දැකපිම් නම් සියලු සත්වයන් මරණින් ගැලවීම්ට භාරයැයි කියා ඉක්බිත්තෙන් ඔවුන් හැම දෙනාටම පියාණන් වහන්සේ කිවා කරවයි කිවුය. එසඳ ඒ රාජපුරුෂයෝ කුමාරයන් අල්වා ගෙන ගොස් රාජාඟණයෙහි එකත්පසෙක සිටුවා අන්‍යවූ **සුසීම** කුමාරයෝය **භද්දසෙන** කුමාරයෝය, **සූර** කුමාරයෝය යන තුන්බැයනුත් ගෙනවුත් චන්ද්‍ර කුමාරයන් සවිමීපයෙහිම සිටුවා සවාමිනි! කුමාරවරුන් සතරදෙනාව ගෙන ආම්හයි කියා රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඔවුන්ගේ බස් අසා දරුවෙනි! දැන් මාගේ දූන් සතරදෙනාත් කුමාරවරුන් සවිමීපයෙහිම සිටුවවයි විධාන කරන්නාහු **උපසෙනිය, සොකිලය, මුදුනාය, චන්ද්‍ර කුමාරිකාය** යන කුමාරිකාවරුන් සතරදෙනා ළඟට ගොස් රජ්ජුරුවන් වහන්සේ යාග නිසා කුමාරිකාවරුන් කැඳවාගෙන යන්නට එවූසේකැයි කියා කැඳවාගෙන අවුත් එක් තැනෙක රැස්කොට සිටුවවයි කිවුය. ඒ පුරුෂයෝත් එසේම කරම්හයි රජ්ජුරුවන්ට ප්‍රතිවචන දී ඒ කුමාරිකාවරුන් සවිමීපයට ගොස් ඔවුන් සතර දෙනා අඩමින් වලපමින් සිරියදීම කැඳවාගෙන අවුත් මල් බැයන් සවිමීප යෙහිම සිටුවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ තමන්ගේ ප්‍රිය භාර්‍යාවූ බිසෝවරුන් අල්වාගෙන එන පිණිස නියොගකරන්නෝ මාගේ අග්‍රමහෙෂිකාදිවූ **විජයා** නම් බිසවුන්ද, **එරාපථි** නම් බිසවුන්ද, **සුසෙසි** නම් බිසවුන්ද, **සුනන්දා** නම්

කිසවුන්ද, යන උතුම්වූ සුසැවක් සත්‍රීලක්ෂණයෙන් යුක්තවූ මේ බිසෝවරුන් සතරදෙනාට රජ්ජුරුවන්වහන්සේ යාග නිසා කැඳවනසේකැයි කියා කැඳවා ගෙන අවුත් එක්තැනෙක රැස්කොට සිටුවවයි කිවුය. රාජපුරුෂයෝ ඒ සතරදෙනාත් කැඳවා ගෙන අවුත් කුමාරවරුන් සවිමීපයෙහිම සිටුවූවාහුය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සිටුවරුන් සතරදෙනා කැඳවා ගෙන එන්නට නියොග කරන්නාහු **සුණ්මුඛය, භද්දිසය, සිහාලය, චණ්ඩිසය,** යන සිටුවරු සතරදෙනාට රජ්ජුරුවන්වහන්සේ යාග නිසා කැඳවනසේකැයි කියා කැඳවා ගෙන අවුත් එක් තැනෙක සිටුවවයි කීහ. එබස් ඇසූ රාජපුරුෂයෝ ගොස් සිටුවරුන් සතරදෙනාත් ගෙනවුත් කුමාරවරුන් සවිමීපයෙහිම සිටුවූහ. හවද රජ්ජුරුවන්ගේ දූදරුවන්ත් හා බිසෝවරුන් ඇල්වූ කල්හි සියලු නුවර වාසීවූ සත්වයෝ කිසිවක් නොකීහ. සිටුවරු සතරදෙන වනාහි ඤාති සම්බන්ධයෙන් බොහෝ දෙනා හා එක්ව සිටියහ. එසේ හෙයින් සිටුවරුන් ඇල්වූ කල්හි සියලු නුවරවාසීවූ සත්වයෝ ඇලලී ගොස් රජ්ජුරුවන් වහන්සේ විසින් මේ සිටුවරුන් මැරිය නොදෙම්හයි කියා සිටුවරුන් පිරිවරා ඒ සිටුප්‍රත්‍රයන් සතරදෙනාගේ බන්ධුවගීයා හා සමඟම රජගෙට ගියාහුය. ඉක්බිත්තෙන් සිටුවරුන් සතරදෙනා නැයන් විසින් පිරිවරන ලදුව රජ්ජුරුවන් අතින් තමන් ජීවිත දානය ඉල්වන්නාහු රජ්ජුරුවන් වහන්ස! අප හැමදෙනාගේ ඉසකේ කපා මුදුනේ කුණිම්බි තබා නුඹවහන්සේට අපි ගැති කළ මැනව. අපි නුඹවහන්සේට ගැති මේ කරම්හ. නොහොත් එසේ නොඅදහනසේක් විනම් අටලොස් මහාසේනීන් රැස්කරවා ඔවුන් මඛ්‍යයෙහි ක්‍රියපත්‍රය ලවා ගැනිකොට ඇල්වුව මැනව. අපි නුඹවහන්සේට ගැති නියාව ප්‍රතිඥා කරම් හයි කීහ. මෙසේ සිටුවරුන් සතරදෙනා යාඥාකොටත් ජීවිත දානය ලැබ ගන්නට අසමර්ථවූහ. එකල්හි රාජපුරුෂයෝ සිටුවරුන්ගේ බන්ධුවගීයා හා අවශෙෂ ජන සමූහයා තලා මරා ඉවත්කොට සිටුවරුන් සතරදෙන අල්වා ගෙන ගොස් කුමාරවරුන් සවිමීපයෙහි සිටුවූහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඇතුන් අසුන් ආදීන් ගෙනෙන පිණිස විධාන කරන්නාහු **අභඞ්කර** නම් හස්තිය, **රාජගිරිය, අච්චුතය, වරුණ දණ්ඩය,** යන මේ හස්තීන් සතරදෙනාව හා ගෙනෙව්. තවද **සබ්බසිරි** නම් අශ්වය, **සුරමුඛය, සුණ්මුඛය, විනදය,** යන මේ අශ්වයින් සතරදෙනා යාගය සඳහා වහා ගෙනෙව්. තවද මාගේ ගවයන්ට උතුම්වූ ප්‍රධාන වෘෂභයන්ද අවශෙෂවූ චතුෂ්පද සමූහයන්ද වහා ගෙන එව්. මෙසේ ගෙනවුත් සවී චතුෂ්ක වශයෙන් යාගාවාටය සවිමීපයෙහි සියල්ලවුන්ම සිටුවව් එසේ කල්හි සම්භවතුෂ්ක යාගය නම් යාග විධිය කරම්හ. යාචක බ්‍රාහ්මණයන්ට දනුත් දෙම්හ. මෙසේ මාවිසින් කියනලද සියලු වස්තූන් යුහුව සපයා මාගේ යාග සිඳිය කරවියයි විධාන කළාහුය. තවද රජ්ජුරුවෝ කියන්නෝ මාගේ යාගය වූකලී සෙට ඉරු නැඟි කල්හි උදුසන්හිම කෙරෙමි. එසේ හෙයින් අද මේ එක රාත්‍රියෙහි පඤ්චකාමගුණයෙන් සිත් අලවන්නට කුමරුවින්ට නියවි. අද මේ පශ්චිම රාත්‍රියයයි නියවි. අවශෙෂවූ උරන් මුවන් ගෝණන් එළුවන් ආදී වතුෂ්පදීන් හා කුකුළන් මොණරුන් වලිකුකුළන් විලිකුකුළන් ආදීවූ පක්ෂිජාතීන්ත් යාගයට සුදුසුවූ අවශෙෂ යාගොපකරණත් වහා රැස්කරවා සෙට උදුසන්හිරු නැඟි කල්හි යාගය කරම්හයි කීහ. ඒ එක රාත්‍රි නම් රජ්ජුරුවන්ගේ දෙමවුපියෝ එකලට ජීවත්ව උන්නාහුය. එසේ

හෙයින් මනුෂ්‍යයෝ හොස් කියන්නාහු නුඹවහන්ස්ගේ පුත්‍රදරුවන් මරා යාග කරවනු කැමතිසේක් දැයි දෙමවුපියන් ගෙන් විමසූ සේය. එබස් අසා ඒ එකරාජ රජ්ජුරුවන්ගේ මැනියෝ කියන්නාහු දරුවෙනි! කුමක් කියවුදැයි ඇතින් ළය වමා ගෙන අඬමින් වලපමින් අවුත් සැබෑද පුත! දූදරුවන් හා කිසෝවරුන් ජීවිත විනාශකොට යාගයක් කරවුදැයි විමසූ සේය. එබස් අසූ රජ්ජුරුවෝ කියන්නෝ මැනියන්වහන්ස! මට ඉතා ප්‍රියවූ චන්ද්‍රකුමාරයන් මරන්නට පාඩාදුන් විටම අවශෙෂවූ දූදරුවන් හා කිසෝවරුන් යාගයටම හරහලද්දාහුය. එසේ හෙයින් එවැනි දරුවන් හා යාගකොට මේ මනුෂ්‍ය ශරීරයෙන්ම මහාවූ ගති ඇති සවගීලොකයට යන්නෙමි වේදැයි කිවූය.

ඉක්බිත්තෙන් මැනියෝ පුතණුවන්ට කියන්නාහු පුතණුවන්වහන්ස! දරුවන්මරා කරන්නාවූ මේ යාගය හෙතුකොටගෙන දිව්‍යලොකොත්පත්තිය වන්නේයයි යම් හෙනෙක් කිවු නම් එබස අදහා නොගනුව මේ දරුවන් මරා කරන්නාවූ යාගය නම් සතර අපායට මාගීය දිව්‍යලොකයට මාගීයෙක් නොවෙයි. හවද හොණඩසඳ්ධ ගොත්‍රයෙහි උපන්නාවූ පුත! නොපට මම කියමි. වර්තමාන කාලයෙහිවූ මේ සියලු සත්ත්වයන්ට පාණිප්‍රහාරාදීවූ කිසි හිංසාවක් පීඩාවක් නොකොට මහොඝයක් පරිද්දෙන් මහදන් දෙව. මෙසේ දන්දීම සම්පන්නකාම සවගීයට යන්නට මාගීය වන්නේය. මෙබදුවූ පුත්‍රයාග යෙන් සවගීලොකොත්පත්තියට මාගීයෙක් උපායෙක් නොපෙනෙන්නේයයි කිවූය. එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නාහු මැනියන්වහන්ස! චන්ද්‍ර කුමාර යන් සූය්‍යකුමාරයන් ප්‍රධාන කොට ඇති මේ පුත්‍රදරුවන් මරන්නාවූ මම ඛණ්ඩහාල නම් පුරොහිත බ්‍රාහ්මණයා මට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට මට ආචාය්‍යව සිටි හෙයින් ඔහුගේ බසින් මරවමි. මාගේ අභිප්‍රායෙන් සිතින් සිතා ගෙන මරවන්නෙමි. නොවෙමි. සෙනහයෙන් දුරුකොට පිය නොඇක්කාවූ පුත්‍රදරුවන් සම්භ යාගකොට මෙබදු මේ මනුෂ්‍යශරීරයෙන් දිව්‍යලොකයට යෙමි කිවූය.

ඉක්බිත්තෙන් ඒ රජ්ජුරුවන්ගේ මැනියෝ තමන්ගේ බස් ගිවිස්වා ගත නොහි අඩා වැලප ගියාහුය. පියරජ්ජුරුවෝ එපවත් අසා අවුත් පුතණු වන්ට කියන්නෝ පුත! තොපි චන්ද්‍රකුමාරයන් ප්‍රධාන කොට ඇති දූදරුවන් මරා යාග කරවිදැයි විමසූ සේය. එකල්හි රජ්ජුරුවෝ කියන්නාහු පියාණන් වහන්ස! චන්ද්‍රකුමාරයන් මරන්නට පාඩා දුන්විට අවශෙෂවූ පුත්‍රදරුවන්හුත් පාඩා දෙනලද්දාහුමය. මෙවැනි දරුවන් හා සම්භ යාගකොට මම දිව්‍ය ලොකයට යනු කැමැත්තෙමි කීහ. එකල්හි පියරජ්ජුරුවෝ කියන්නෝ පුත! දරුවන් මරා යාගකොට දිව්‍යලොකයට යෙතිසි යම් හෙනෙක් කිවු නම් ඒ බස අදහා නොගනුව. මේ තෙමේ නරකයට මාගීය සවගීයට මාගීයෙක් නොවෙයි. එසේ හෙයින් හොණඩසඳ්ධ ගොත්‍රයෙහි උපන්නාවූ පුත! වර්තමාන කාලයෙහි උපන්නාවූ සියලු සත්ත්වයන්ට පාණිප්‍රහාරාදීවූ කිසි හිංසාවක් පීඩාවක් නොකොට මහවනුරක් මඩනා සලක්පරිද්දෙන් මහදන් දෙව. සප්පාවිධ කාමසවගීයෙහි උපදනට මෙම (හෙතු) වන්නේය. පුත්‍රයාගයෙන් සවගී ලොකොත්පත්තියෙක් නොවන්නේයයි කීහ. එබස් අසා එකරාජ රජ්ජුරුවෝ කියන්නාහු පියාණන්වහන්ස! පුත්‍රදරුවන්ගේ මරා යාගය කරවන්නාවූ මම මාගේ අභිප්‍රායෙන් සිතින් සිතා කරවන්නෙමි නොවෙමි. ඛණ්ඩාහාල නම් පුරොහිත බ්‍රාහ්මණයාගේ වචනයෙන් කරවන්නෙමි. සෙනහයෙන් දුරු කොට පිය නොඇක්කාවූ මෙබදු දරුවන් හා සම්භ යාගකොට සවගීලොක යට යෙමි කිවූය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පුතණුවන්ට කියන්නාහු නොණ්ඩසුදු හොත්‍රයෙහි උපන්නාවූ පුත්‍රය! සියලු සත්වයන්ට හිංසා පීඩාදියක් නොකොට මහදන් දෙව, තොපගේ ප්‍රියපුත්‍රයන් විසින් පිරිවරනලදුව මේ සියලු කසිරට හා මෙයින් වෙන්ව සිටියාවූ ඒ ඒ ජනපදයන්ද පරිපාලනය කරවයි කිව්ය. ඒ පියරජ්ජුරුවෝත් මෙතෙක් කාරණා කියාත් තමන්ගේ බස් ගිවිස්වාගත නුහුනුවාහුය. එකල්හි චන්ද්‍රකුමාරයෝ සිතන්නෝ මේතෙක්දෙනාට දුක් උපන්නේ මා එකතැනැත්තහු නිසාය. එසේහෙයින් මපියාණන් වහන්සේට කියා මෙතෙක් දෙනා මරණදුකින් මුදවම් සිතා පියාණන් හා සමග කථා කරන්නාහු පියරජ්ජුරුවන් වහන්ස! අප නොමැරුව මැනව, ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට අප හැමදෙනා ගැනිකොට පාවාදුන මැනව, නොහොත් එසේ කරනු නොහැමැතියේක් වීනම් මහ ඇකිල්ලෙන් මසනලදුව ඇත්ඉලත්ති දැමුමෝ නම් යහපත. අස්ඉලත්ති දැමුමෝ නම් යහපත. තවද රජ්ජුරුවන් වහන්ස! අප නිකරුණේ නොමැරුව මැනව, නුඹවහන්සේ යමෙක්හට අප ගැනිකොට දෙනු කැමැතිසේක් වීනම් ඕහට අප කැමැති පරිද්දෙන් ගැනි කොට පාවා දුනමැනව. තවද දෙවයන් වහන්ස! ඉදින් අපගේ කිසි දෙෂ යෙක් ඇත්නම් රටින් හෝ නෙරපුව මැනවැසිකියා හැඹුහ. චන්ද්‍රකුමාරයන් ගේ අනෙකප්‍රකාරවූ මේ වාක්විලාපය අසා රජ්ජුරුවෝ ළය පැළී යන්නාක් මෙන් දැස කඳුළු පුරාගෙන අඩමින් මාගේ දරුවන් කිසි කෙනකුන් විසින් මරන්නට නොලැබෙයි, මට දිව්‍යලොකයෙන් ප්‍රයෝජන නැතැයි කියා ඒ චන්ද්‍රකුමාරයන් ප්‍රධානකොට ඇති සියල්ලවුන් මුදන්නට විධාන කළහ. තවද රජ්ජුරුවෝ කියන්නාහු තමන්ගේ ජීවත්වීම කැමැතිව බැහැපත්ව අඩන්නාවූ මේ දරුවෝ අපට සෝදුක් උපදවන්නාහුය. එසේහෙයින් දැන් මරණයට පැමිණි මේ රාජකුමාරවරුන් මුදා ඇර පියව දරුවන් මරා කරන යාගයෙන් මට ප්‍රයොජන නැත. ඉදින් දිව්‍යලොකොත්පත්තිය සිඩවේ. නවුත් මම නොකැමැත්තෙමි කීහ. රජ්ජුරුවන් වහන්සේගේ මේ කථාව අසා රාජකුමාරවරුන් සහරදෙනා ප්‍රධානකොට පක්ෂීන් කෙළවරකොට ඇති ඒ සියලු ප්‍රාණී සමූහයා හැරපුවාහුය. එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයාත් යාග චාටයෙහි කම්මාන්ත විධාන කරන්නේය. ඕහට එක් පුරුපයෙක් කියන්නේ කොල! දුෂ්ට ඛණ්ඩහාලය! රජ්ජුරුවන් වහන්සේ දරුවන් මුදවා ඇරවූසේක. දැන්වූසැලී නෝ තාගේ දරුවන් මරා ඔවුන් ගල ලොහිතයෙන් යාගකරවයි කීහ. එබස් ඇසූ ඛණ්ඩහාලයා රජ්ජුරුවන් වහන්සේ වීසින් කවර අකාරියෙක් කරනලදදැයි කියා වේගයෙන් ගොස් රජ්ජුරුවන්ට කියන්නේ මහ රජ්ජුරුවන් වහන්ස! මේ යාගය නම් දෙය නුඹවහන්සේ වැනි හිරුක ජාති ඇති රජදරුවන් විසින් නොකොට හැක්කේය. දුක්සේ මූත් නුඹවහන්සේ වැනි රජදරුවන්ට මෙබදුවූ යාගය සඟ නොවන්නේයයි පළමුකොට ම, විසින් කියන ලද්දේය. එසේද වුවත් මෙසේ මහොත්සාහයෙන් සැපයූ මේ උකතප්‍රකාර යාගයට දැන් කුමක් විඝ්නය බාධා කරනසේක්ද? මහරජ්ජුරුවන් වහන්ස! යාගයට ව්‍යාකුල නොකළ මැනවැයි කිය. තවද මහ රජ්ජුරුවන් වහන්ස! යම් සත්වයෙනෙක් යාග කෙරෙද්ද අනුන් ලවා යාග කරවද්ද නැවත අනුන් ලවා කරවන්නාවූ යාග අනුමෝදන් වෙද්ද ඒ සියලු සත්වයෝම සුවගිලොකයට යන්නාහ. මෙසේ යාගකරන්නාවූ සත්වයන් විසින් කරනලද යාගය මෙබදුවූ ඇනුසස් ඇත්තේය. එසේහෙයින් නුඹ වහන්සේ දැන් මෙබදුවූ යාගයට කුමක් නිසා බාධා කරනසේක්ද? රජ්ජුරුවන් වහන්ස! ව්‍යාකුල නොකළ මැනවැයි කිය.

ඉක්බිත්තෙන් ඒ චන්ද්‍රකුමාරයෝ විසරජ්ජුරුවන්ට කාරණා කියා අනවන්නාහු මහරජ්ජුරුවන් වහන්ස! ඉදින් මා මැරියදුත්තේ ඒතරම් (මේට පළමුව) මා උපන් කල්හිම මේ බ්‍රාහ්මණයා අහින් මේ කුමාරයන්ට මන අනතුරය කවරේදැයි නුඹවහන්සේ විසින් විචාරන ලදහ. අපගේ ලක්ෂණ බලා දෙවියන් වහන්ස! නුඹවහන්සේගේ ඇවැමෙන් රාජ්‍යයට පැමිණෙන්නී. කුමාරයන්ට අහෝසි වන අනතුරුයෙන් නැහැසි අපගේ නැයන් මධ්‍යයෙහි එදවස් වැළඳ කුමන්ත්‍රණ කිඳ? මොහු බොරු කියා වධිරයෙන් මැරවන බවට මේ කාරණා නොවේද? එසේ හෙයින් මොහුගේ කථා යෙහි ප්‍රතිපර සම්භාෂයෙක් නැහ. එසේ වුවත් යාග පිණිස අප හැම දැන් මැරවන්නට උන්සාහ කරන්නේ වේද? එසේම නුඹවහන්සේම අප මරන්නට සිතන කල පළමු අප බාල්‍ය අවස්ථායෙහිම නුඹවහන්සේ සිය අතින් මරන් නාස්වන් අන්‍යන් ලවා මරවන්නාස්වන් නොකරවූයේ ඇයිද? දැන් වූකලී අපි තරුණයම්හ. සෞවනයට පැමිණියම්හ. පුත්‍රදාරාවන් ඇතිව ප්‍රථම වයසෙහි පිහිටියම්හ. මේසේ මේ අවස්ථාව වනතුරුත් නුඹවහන්සේට දොහි නූනම්හ. පියාණන්වහන්ස! මේසේ නිරපරාධවූ අප කුමක් පිණිස මරවනසේක්ද? නුවද රජ්ජුරුවන් වහන්ස! අප සහෝදරයන් මාණික්‍යාමයවූ සන්නාහයෙන් සන්නද්ධව ඇතුන් අසුන් පිටට පැන නැඟි සතුරු සෙනග ඇමින් නුවර වටලා සිටි කල්හි අප වැනි දරුවන් ඒ සතුරන් හා එක්ව යුද්ධකරන්නට පටන්ගත් කල්හි අපගේ බලපරාක්‍රමය නුඹවහන්සේගේ ප්‍රිය වක්ෂුස්සින් බලා වදුල මැනව. දරුවන් නැති රජදරුවෝ නම් අනාථ අසරණයෝය එසේ හෙයින් මෙබඳුවූ සෞරභ්‍යයෙහි හා බාහු වික්‍රම ඇති අප සහෝදරයෝ යාගඝාත නිසා නිහරුණේ මරවාපියන්නට නිස්සඟෝද? රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ නුවණ නැති තැනැත්තන් වහන්සේ නිසා විනා නුවණැති රජදරු කෙනෙක් ඒනම් අප වැන්නවුන් මරවා පියාදීද? නුවද පියාණන් වහන්ස! පසළුදනව්ව කිවි කලවත් වල් සොරුන් නැඟි කලවත් අප වැනි සෞරභ්‍යයෙහි ඇති දරුවන් ඒ පසමිතුරන් අල්වා මරන පිණිස යැවිය යුතු නොවේද? එසේ අප සෞරභ්‍යයෙහි ඇත්තමෝ මේ නමුත් දැන් නිහරුණේ අස්ථානයේ නසින්ට සිටියමෝ වේද? නුවද රජ්ජුරුවන් වහන්ස! යම්සේ නිරශ්චීනවූ පසෙක් ජාතියෙක් කැදලි බැඳගෙන වෘක්ෂ පර්වතලතා ආදියෙහි වාසය කෙරෙත්ද, එසේවූ පක්ෂීන්ට පමා දරුවෝ ප්‍රිය වන්නාහ. එසේද වුවත් නුඹවහන්සේ දැන් අප මරවන්නට උත්සාහ කරන සේක් වේද? නිහරුණේ අප මරවන්නට උත්සාහ නොකළ මැනවැසි කිව්ය. මහරජ්ජුරුවන්වහන්ස! බණ්ඩනාළ නම් බ්‍රාහ්මණයා මා නොමරවන්නේයයි කියන්නාවූ කිසිවක්හුගේ බස් අදහා නොගත මැනව. ඒ බණ්ඩනාළ බ්‍රාහ්මණයා එකානතයෙන් සැකයක් නැතිව මා මරා ඉක්බිති නුඹවහන්සේත් මෑසේම මරන්නේය. ඊට සැකයක් නොකළ මැනව. නුවද මහරජ්ජුරුවන් වහන්ස! ඒ බ්‍රාහ්මණයාට උතුම්වූ ගම්නියම් ගම්වර හා අනුභව කටයුතු වූ උපභොග පරිභෝග වස්තූන් නුඹවහන්සේ උපකාර කොට දෙන සේක. නුවද අග්‍රොදකය අග්‍රදක්ෂිණාද ලබන හෙයින් දක්ෂිණෙය්‍ය පුද්ගලද වන්නේය. යම් රජදරු කෙනකුන් වහන්සේගේ ගෙයක් ගෙයක් පාසා ඩැහැ ආහාරපාන වස්ත්‍රාභරණාදීයන් අනුභව කෙරෙද්ද, එබඳුවූ ආහාරපාන වස්ත්‍රාදිය දීමෙන් උපකාරවූ ඒ රජදරුවන් වහන්සේට හා අමාත්‍යාදීවූ සියලු ක්ෂත්‍රියන්ට පවා මේ ලිමුණු ගැහැවියෝ දොහි වූ කෙනෙක්

තාන. එසේ හෙයින් මහරජ්ජුරුවන් වහන්ස! බමුණෝ නම් බොහෝසේම තෙළෙහි ගුණ නොදන්නෝය. එසේවූ අකෘතඥවූ බමුණාගේ බසින් අප වැනි දරුවන් නොමරාපුව මැනව. තවද රජ්ජුරුවන් වහන්ස! නිරපරාධවූ අප නිකරුණේ නොමැරුව මැනව, ඉදින් කැමැතිසේක් වීනම් බණ්ඩහාල බ්‍රාහ්මණයාටම අප ගැනි කොට පාවා දුන මැනව, නැවත අප ඔහට දස්කොට දෙනු නොකැමැතිසේක් වීනම් නුඹවහන්සේ හා ඒ බමුණා හා දෙදෙනාගේ සිත හැනියන තෙක් මහ ඇකිල්ලෙන් මසනලදුව ඇතුන් අසුන් හෝ රක්ෂා කරන්නමිහ. ඊටත් අප ගවියක් ඇතැයි නොසිතුව මැනව. තවද රජ්ජුරුවන් වහන්ස! නිරපරාධවූ අප නිකරුණේ නොමැරුව මැනව ඉදින් කැමැතිසේක් වීනම් බණ්ඩහාල. බ්‍රාහ්මණයාට ගැනි කොට පාවාදුන මැනව, එසේ නොකැමැතිසේක්වීනම් මහදඹින් මසනලදුව ඇත්බෙටි අස්බෙටි ආදිය හෝ දම්මිහ. නොහොත් අප ඒ බණ්ඩහාල බ්‍රාහ්මණයා හැර සෙසු යම් කෙනකුට ගැනි කොට පාවාදෙනු කැමැතිසේක් වීනම් එසේ දුන මැනව, නැවත අප රටින් හෝ නෙරපුව මැනව, එසේ රටින් නහන ලද්දාවූ අපි කබල් ගත් අත් ඇතිව දිළිදුව දෙර දෙර සිහා කා ඇවිදුම්හ. ඊටත් අපට කුල ගවියෙක් නැත්තාන. මිත්‍රද්‍රොහිවූ දුෂ්ටවූ ඒ බ්‍රාහ්මණයාගේ බසින් නිහතමානිවූ සෙනේ වියෂ්‍ය ඇත්තාවූ මෙලෝ පරලෝ වැඩ සාධාදීලන්නට නිසිවූ රාජවංශයට තිලකයක් වැනිවූ නුඹවහන්සේගේ ඇවැමෙන් සියලු රාජ්‍යය පරිපාලනය කරන්නට: සමර්ථවූ අප බදුවූ දරුවන් නිකරුණේ නරකාදිවූ සියු අපායට මංවූ යාගයක් නිසා නොමරවාපුව් මැනවැයි කීහ.

එකල්හි එකරාජ රජ්ජුරුවෝ චන්‍ද්‍රකුමාරයන්ගේ මේ වාක් විලාපය අසා කියන්නාහු නොයෙක් කාරණා කියා අඩා වලප්නාවූ දරුවෝ තමන්ගේ ජීවිතාශායෙන් දිවි රක්නා කැමැතිවී අඩනි. උන්ගේ ඇඩීමෙන් මා සිතට බොහෝ දුක් උපදවන්නේය. එසේ හෙයින් දැන් මේ කුමාරවරුන් මුදා හැර පියව, පුත්‍රයාගයෙන් ඉදින් දිව්‍යලොකොත්පත්තිය සිඩවේ නමුත් මට ඉන් ප්‍රයොජන නැතැයි කියා නැවත මුදවාපුව. නැවත බණ්ඩහාල බ්‍රාහ්මණයා අවුත් කියන්නේ රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ වැනි ශූරවීර ජාති ඇති රජ්දරුවන් විසින් පුත්‍රයාගය නොකට හැක්කේය. නොලැබිය හැක්කේයයි පළමු මා විසින් කියනලද, එසේද වුවත් අප දුකට සරුලු මේ යාගයට දැන් බාධා නොකළ මැනව, නුවද රජ්ජුරුවන් වහන්ස! යම් කෙනෙක් තුමූ යාග කෙරෙද්ද, අනුන් ලවා කරවද්ද, කළාවූ යාගය අනුමෝදන් වෙද්ද, ඒ සියලු සත්වයෝම සුගතිලොකයට යන්නාහුය. එසේ හෙයින් යාග කරන්නාවූ සත්වයන්ට මේ පුත්‍රදරුදිවූ යාගය නම් මෙබඳුවූ මහත්ඵල මහානිශංස වන්නේයයි කියා නැවත කුමාරවරුන් අල්වා බැන්දවූයේය.

එකල්හි චන්‍ද්‍රකුමාරයෝ රජ්ජුරුවන් හිවිස්වන පිණිස කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! ඉදින් දරුවන් මරා යාගකොට සත්වයෝ මේලොවින් පරලොවට යන්නාහු වීනම් බණ්ඩහාල බ්‍රාහ්මණයා තෙමේම පළමුකොට යාග කෙරේවයි ඔහු යාගකොට පුත්‍රදරුවන් හා සමඟ හොස් දෙව්ලොව උපන් කල්හි නුඹවහන්සේ පසුව යාග කළ මැනව, රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ මධුර රස ඇති භොජනයක් ලබා පළඟුකොට අනුන් ලවා

අතුලවා පසුව අනුභව කරනසේක. එසේවූ නුඹවහන්සේ පුත්‍ර මරණය පරීක්ෂා නොකොට යාග කරන්නට කාරණා කවරේද? නවද රජ්ජුරුවන් වහන්ස! පුත්‍රයාගය කොට සඬෙයෝ ඉදින් මිය දිව්‍යලෝකයට යෙත් නම් බණ්ඩාළ බ්‍රාහ්මණයා තමාගේ පුත්‍රදුරුවන් මරා යාග කෙරේවයි දරුවන් මරා යාග කොට දෙව්ලොව උපදිනුයි දන්නාවූ මේ බ්‍රාහ්මණයා තමාගේ මල්බැයහුත් පුත්‍රදුරුවන් ආදිවූ අවශෙෂ බන්ධුවර්ගයාත් තමාත් කුමක් පිණිස පළවූකොට නොමරවාද, ඉදින් අනුන් මරා සඬෙයෝ දිව්‍යලොකයට යෙත් නම් මොහු තමා මරා බ්‍රහ්මලොකයට යායුතු වන්නේය. එසේ හෙයින් යාගයෙහි ගුණ දන්නාවූ මොහු විසින් අනුන් නොමරවා තමාම මැරිය යුත්තේය. මේ වූකලි එසේ නොකොට මා මරවන්නේය. මහරජ්ජුරුවන් වහන්ස! මේ කාරණයෙනුත් මේ බමුණා විනිශ්චයෙන් අත්ලස් කන්නට නොලබමියි මා කෙරෙහි ගෑන් වයිරයෙන් පුත්‍රයාගය පිටලා මා මරවන්නට උත්සාහ කරන තියාව නුවණැනිසේක් විනම් නුඹවහන්සේ දැනගත මැනවැයි කීහ. නවද රජ්ජුරුවන් වහන්ස! යම් කෙනෙක් මෙසේ යාග කෙරෙත් නම් කරවත් නම් අනුමෝදන් වෙත් නම් ඒ සියලු සඬෙයෝම එකාන්තයෙන් සැකයක් නැතිව නරකයටම යෙති. යාග කරන්නාවූ සඬෙයන්ට මේ දරුවන් මරා කරන්නාවූ යාගය නම් මෙබඳුවූ මහත් දෙෂ ඇත්තේයයි කීහ.

කුමාරයෝ මෙහෙක් දැ කියාත් පියාණන්ට තමන්ගේ බස් නංවා (ගිවිස්වා) ගත නොහී රජ්ජුරුවන් පිරිවරා සිටියාවූ පණ්ඩිත උදෙසා කියන්නාහු ගෘහස්වාමිවූ සත්‍රින් හා අවශෙෂ ගෘහපතීහු රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ ළෙඟි දරුවන් නොමැරුව මැනවැයි කියා රජ්ජුරුවන් වහන්සේ සමීපයට ගොස් කුමක් හෙයින් නොනියද්ද? හැමකල්හිම මාගේ පිය රජ්ජුරුවන් වහන්සේට මෙලොවින් පරලොවින් වැඩ කැමැත්තෙමි. අවැඩක් නොකැමැත්තෙමි. උන්වහන්සේගේ ජනපදයටත් හැමකල්හිම වැඩක් විනා අවැඩක් නොකැමැත්තෙමි. අප අනින් අත්ලස් ගත්තුය එශ්වයශ්‍ය මදයෙන් මත්ව මරා හලා අපට බොහෝ පීඩා කොළෝයයි මා සමඟ කලහයක් වයිරයක් කළාවූ කිසි සඬෙයෙක් නැත්තේය. මෙසේ රජ්ජුරුවන් වහන්සේටත් දනවු වාසී සඬෙයන්ටත් වැඩක් කැමැත්තාවූ මා මූතුවූ මෙවැනි ගුණයෙන් සම්පන්නයෝයයි පියාණන්වහන්සේ සමීපයට ගොස් දනවු වාසී සඬෙයෝ කුමක් පිණිස නොදන්වත්දැයි කිවුය. මෙසේ කී කල්හිත් කිසි සඬෙයකුට බසක් බැණගත නොහැකි වූයේය.

ඉක්බිත්තෙන් වඳ කුමාරයෝ රජ්ජුරුවන්ගේ භාග්‍යවන්ට යාඤ්ඤ කරන්නට විධාන කරන්නාහු පින්වත්වූ ගෘහිණිවරුනි! මව්පියාණන්වහන්සේටත් බණ්ඩාළ නම් බ්‍රාහ්මණයාටත් මෙපවත් ගොස් කියව්, දෙවයන්වහන්ස! සිංහ සමානවූ සෙනරවියෝ ඇති කිසිවක්හටත් ද්‍රෝහී නොවන්නාවූ සියලු ලොකවාසීන් විසින් ප්‍රාර්ථනීයවූ මේ රාජකුමාරවරුන් නිකරුණේ මරා මැනවැයි මෙසේ ගොස් යාඤ්ඤ කරවියයි කීහ. එබස් අසූ බ්‍රාහ්මණවරු ගොස් රජ්ජුරුවන්ට යාඤ්ඤ කොට කිවුය. එසේ කීවත් රජ්ජුරුවෝ උන්ගේ මුහුණ පමණකුත් නොබැලුවාහ. ඉක්බිත්තෙන් රාජකුමාරයෝ අනාථඅසරණව කිසි සෙනකුන්ගේ පිටිවහල් බස් පමණකුත් නොලදින් අඩන්නාහු මව් වූකලී සොම්මාර කුලයේවත් කඹුරුකුලයේවත් කුලුප්පොහු කුලයේවත් ඉදින්

උපන්නෙම් වීම්නම් යහපත් වන්නේය. එසේ වීනම් මව්යාණන් වහන්සේ අද මා යාග නිසාත් නොමරවනසේවේක්දැයි ඇඬුහ. මේසේද සියා නැවත තමන්ගේ බිසෝවරුගේ රජ්ජුරුවන්ට යාඥ කරන්නට නියොගකොට යවන්නෝ පින්වත්වූ මාගේ සියලු අන්තඃපුර සත්‍රීනි! තෙපි හැම මව්යාණන්වහන්සේගේත් ඛණ්ඩහාල නම්. බ්‍රාහ්මණයාගේත් පතුල් පිට අඩා වැරී දෙවියන් වහන්ස! චන්ද්‍රකුමාරයන් වහන්සේ හා අප නුඹවහන්සේට කළ අපරාධයෙක් නොදකුම්හ. ඉදින් චන්ද්‍ර කුමාරයන්ගේ දෝෂයෙක් ඇත්නම් උන්ට ක්ෂමා කරවයි කියා මෙසේ යාඥ කොට මරණින් මුදන්නට නියි බසක් කියවයි විධාන කළහ. ඉක්බිති චන්ද්‍ර කුමාරයන්ගේ නැනතිවූ සෙල කුමාරිකාවෝ සොකදුක් ඉවසාගත නොහී පියරජ්ජුරුවන් වහන්සේගේ දෙපත්ලෙහි වැටී අඬන්නී මව්යාණන්වහන්ස! මෙලෝ පරලෝ නොදන්නා නුවණ නැති බමුණාගේ බසින් මාගේ කුසඔත් බැඳන් නිකරුණේ යාග පිණිස මරා කුමක් නිසා නිරා යන සේක්දැයි බැගෑපත්ව ඇඬුය. රජ්ජුරුවෝ ඒ කුමාරිකාවහේ බසුත් බසෙකැයි නොගත්තාහ. ඉක්බිති ඒ චන්ද්‍රකුමාරයන්ගේ පුත්‍රවූ වාසුල නම් කුමාරයෝ පියාණන් දුකට පැමිණියා දැක මම මිත්තණුවන් වහන්සේට යාඥ කොට මව්යාණන්වහන්සේට ජීවිතදානය දෙවමියි රජ්ජුරුවන්ගේ දෙපයේ වැටිහී අඬන්නෝ දෙවියන්වහන්ස! අපි තවම බාලයම්හ. යෞවනයට නොපැමිණියම්හ. මෙබදුවූ අප කෙරෙහි අනුකම්පායෙනුත් අපගේ පියාණන්වහන්සේ නොමැරුව. මැනවැයි කියා මිත්තණු රජ්ජුරුවන් අනිමුඛයෙහිම ඇත්මැත් බල බලා පෙරළී පෙරළී ඇඬුහ. රජ්ජුරුවෝ ඒ වාසුල නම් කුමාරයන්ගේ බැගෑ අඩ අසා ළය පැළියන්නාක් මෙන් සොකයට පැමිණ දැස කඳුළු පුරා තුබූ කුමාරයන් වැළඳ ගෙන පුත! තෙපි අස්වැසිලි ලබව, තොපගේ පියාණන් අරවමිසි කිහ. තවද රජ්ජුරුවෝ කියන්නෝ වාසුල නම් කුමාරයෙනි! ඒ තොපගේ පියාණන් සවමීපයට ගොස් අස්වසා ලව, අමාත්‍යයෙනි! අන්තඃපුරයේ අඩන්නාවූ සියල්ලන්ම අස්වසාලව, මේ කුමාරයෝ මට අපමණවූ සොක දුක් උපදවති. එසේ හෙයින් දැන් මේ රාජකුමාරවරුන් හැරපියව්, දරුවන් මරා කරන්නාවූ යාගයෙන් මට ප්‍රයොජන නැතැයි නැවත බන්ධනයෙන් මිදවූහ.

එකල ඛණ්ඩහාල බමුණා වහා අවුත් කියන්නේ දෙවියන්වහන්ස! නුඹවහන්සේ වැනි ජීරාකා ජාති ඇති රජදරුවන් විසින් මෙබදුවූ උතුම් යාගයක් සොටගත නොහැක්කේයයි පළමු මම නුඹවහන්සේට කියෙම් වේද? එසේදවුවත් අප විසින් දුකසේ සරහාගත් මේ යාගයට අහරේ බාධාවක් නොසළ මැනව, යමෙක් යාග කෙරෙත් නම් කරවත් නම් අනුමෝදන් වෙත්නම් ඒ සියල්ලෝම සවර්ගලොකයට යන්නාහ. එසේ හෙයින් යාග කරන්නාවූ සත්ත්වයන්ට දරුවන් මරා කරන්නාවූ යාගයෙහි අනුසස් මෙබදුවන්නේයයි කියා හිඹිස්විය. ඒ රජ්ජුරුවෝත් තමන් නුවණ නැති බැවින් නැවත ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ බසින් දරුවන්අල්වා බැඳගන්නට විධාන කොළෝය. එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයා සිතන්නේ මේ රජ්ජුරුවන් වහන්සේ මෘදුසිත් ඇතිසේක. විටෙක අල්වා බඳින්නට විධාන කරනසේක විටෙක බැඳගත්තවුන් අරින්නට කියනසේක. එසේ හෙයින් නැවත දරුවන්ගේ බසින් චන්ද්‍රකුමාරයන් ද්‍රඩාන කොට ඇති සියල්ලවුන් මුදා අරවාපුසේක් වීනම් කාරණා නොවන්නේය. උන්ගේ බස් හිඹිස්නට

පළමුවම් යාගාවාටයට ඇරගෙන යෙමි සිතා ඉක්බිත්තෙන් ඒ රජ්ජුරුවන් යාගාවාටයට යන පිණිස උත්සාහකොට හියන්නාවූ ඛණ්ඩහාල බ්‍රාහ්මණ තෙමේ මහරජ්ජුරුවනි වහන්ස! හත්තිරතනාදිවූ සියලු රතනයෙන් යාගය දැන් සරහා නිමවන ලදී, එසේ හෙයින් එකරාජ රජ්ජුරුවන් වහන්ස! නුඹ වහන්සේගේ අලංකෘතවූ ප්‍රාසාදයෙන් අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මෑහට නික්මුණ මැනව, යාගකොට නුඹවහන්සේ සවතීලොකයට ගොස් රූප ශබ්ද දිවූ පඤ්චකාමයෙන් සතුටුවනසේක් වේද, එසේ හෙයින් ලස් නොව වහා නික්මුණ මැනවැයි කිය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන් ඇරගෙන යාගාවාටයට යන්නට පටන් ගත් කල්හි බොධිසත්ත්වයන්ගේ අන්තඃපුර සත්‍රිහු එක්වම නික්මුණාහ. තවද වන්ද්‍රකුමාරයන්ගේ සත්සියයක් පමණ ළදරුවූ යෞවනයෙහි පිහිටියාවූ ඒ ප්‍රධානස්ත්‍රිහු ඉසඳෙස් උනා පිටිකර හෙළා අනෙකප්‍රකාරවූ වාක්විලාපයෙන් හඬමින් නික්මුණාහ. තවද සොකයෙන් අඩමින් නික්මුණාවූ කාම්මුත්තන් හා සේවතුන් හා අන්‍යවූ පුරසත්‍රිහුද නඳුනොඬුනයෙහි චුතවන දිව්‍යපුත්‍රයන් පිරිවරා යන්නාවූ දිව්‍යාඞ්ගනාවන් මෙන් ඉසකේ උනා පිටිකර හෙළා අනෙක ප්‍රකාරවූ වාක්විලාපයෙන් හඬමින් වන්ද්‍රකුමාරයන් සමඟ නික්මුණාහ. (මෙහැන් පටන් අන්තඃපුර සත්‍රින්ගේ වාක්විලාපය වන්නේය.)

සසි දෙසයෙහි උපන් පිරිසුදුවූ සළු හඳනාවූ සවණිකුණ්ඩලාභරණයන් කණ පළඳින්නාවූ කළුවැල් හා සදුන් විලවුන් ගල්වනලද ශරීර ඇති වන්ද්‍ර සූය්‍ය කුමාරයන් දෙදෙනා එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට දැන් ගෙන යන්නට සිටියෝ වේද, මාංශ රසයෙන් යුක්තවූ සුවඳ ඇල්සාලේ බත් අනුභව කළාවූ සපුවන් හා කිළිනුන් විසින් රන්සුන්නෙන් උලා සුවඳ පැනින් මනාකොට නහවනලද්දාවූ මාණික්‍යාභරණ කුණ්ඩලාභරණ පලඳින්නාවූ වන්ද්‍ර සූය්‍ය කුමාරයන් දෙදෙනා එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට දැන් ගෙනයන්නට සිටියෝවේද, තවද මීට පූර්ව භාගයෙහි උත්තමවූ අලඞ්කෘතවූ ගඞ්ගාදැවියන්ගේ කුම්භයෙහි රුවුනාභරණයෙන් සැරහී හිඳ උද්‍යාන ක්‍රීඩාදියට යම් කුමාරයෙකුත් යෙද්ද, එසේම වන්ද්‍ර සූය්‍ය කුමාරයන් දෙදෙනා දැන් පසින් නික්මුණෝ වේද, රුවුනාභරණයෙන් සැරහී අලංකෘතවූ උත්තම අඹයන්ගේ පූර්ණාසනයෙහි හිඳ සෞර්‍ය ඇති පාබලසේනාව හා පරිවාර අඹයන් විසින් පිරිවරන ලදුව උද්‍යාන ක්‍රීඩාදියට යම් ඒ රාජකුමාරවරු පෙර යෙද්ද, එසේවූ වන්ද්‍ර සූය්‍ය කුමාරයන් දෙදෙනා අද එකලාව පසින් යන්නෝ වේද, උතුම්වූ රථාලඞ්කාරයෙන් සරසන ලද්දාවූ උතුම් රථ මඩ්‍යයෙහි පහවනලද රාජාසන මස්තකයෙහි හිඳ සියගණන් රථ පිරිවරා උද්‍යානක්‍රීඩාදියට යම් ඒ රාජකුමාර කෙනෙක් යෙත්නම් එසේවූ වන්ද්‍ර සූය්‍ය කුමාරයෝ දෙදෙන දැන් උදකලාව පසින් නික්මුණෝවේද, පෙර යම් රාජකුමාර කෙනෙක් සපතිය රසරතනාලොකයෙන් දිලියෙන්නාවූ රන්සඳින් සදනලද යම් අඹකොනකුත් හා සමඟ ගම් නිගම්ගම් රාජධානි හා ගෘහොද්‍යාන වනොද්‍යානාදිවූ ඒ ඒ ස්ථානයන්ට නික්මුණාහු වෙද්ද, එසේවූ වන්ද්‍ර සූය්‍ය කුමාරයෝ දෙදෙන දැන් පසින් නික්මුණෝවේදැයි අනෙකප්‍රකාරවූ වාක් විලාපයෙන් හැඬූහ. මෙසේ අන්තඃපුර සත්‍රින් අඬමින් වලපමින් සිටියදීම බොධිසත්ත්වයන් නුවරින් පිටත්කළහ. සියලු නුවරවාසී සත්ත්වයෝ ඇලල් හොස්

දුවරින් නික්මෙන්නට පවත්ගත්හ. මහජනයෝ නික්මෙන්නට පවත්ගත් කල්හි යන්නට වාසල්දොර නොසෑහෙන්නේය. එකල ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා ඉතා බොහෝවූ ජනයා දැක සවුරුදනිදිද, කුමකින් කුමක් වේදැයි සිතා වාසල්දොර වස්වා අතුළු ලැව්වේය.

එකල්හි මහජනයෝ නික්මෙන්නට අවසර නොලැබ ඇතුළතුවර වාසල් දොර සමීපයෙහි එක් උයනෙක් ඇත. ඒ උයන සමීපයෙහි සිට මහබෝධීන් හැඩිවාහුය ඒ මහජනයාගේ හඬින් පක්ෂීන්ගේ හඬින් පක්ෂිසමූහයා ඇලලා ගොස් අඩා ආතා ශයට පැන නැංගාහ. එකල මහජනයෝ ඒ ඒ පක්ෂීන්ට ආමිසානුග්‍රහයකොට අඬන්නාහු ලිහිණියෙනි! ඉදින් තෙපි මිස් කැමැත්තාහු වීනම් පුෂ්පවතී නම් රාජධානියට පූර්වදික්භාගයෙන් හිඟකල්හි යාගාවාටයෙක් ඇත. ඒ යාගාවාට යෙහි එතැන්හි රජ්ජුරුවෝ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගෙන් මුළාවූසේක් හමන්වහන්සේගේ දරුවන් සතරදෙනාගෙන යාගකරනසේක. ඉදින් තෙපි මැස්සැමැත්තාහු වීනම් එතැනටගොස් කැමැති පරිද්දෙන් මිස් අනුභවකරව්, හවදැලිහිණියෙනි! ඉදින් තෙපි මිස් කැමැත්තාහු වීනම් පුෂ්පවතී නම් රාජ ධානියට පූර්වදික් භාගයෙන් හිඟකල යාගාවාටයෙක් ඇත. එතැන රජ්ජුරු වන් වහන්සේ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයාගේ වචනයෙන් මුළාවූසේක් අග මහෙෂිකාවරුන් සතරදෙනකු ගෙන යාග කරනසේක. එසේම දුවරුන් සතරදෙනකු හා සිටුවරුන් සතරදෙනකුද ඇතුන් සතරදෙනකු හා අසුන් සතරදෙනකුද, වෘෂභයන් සතරදෙනකු හා එළුවන් සතරදෙනකුදැයි මේසේ හසත්‍යාදිවූ හැම විසතුරෙන් සතර සතර ගෙන යාගකරන්නෝය. එසේ හෙයින් තෙපි මස් කැමැත්තාහු වීනම් එතැනට ගොස් කැමැති පරිද්දෙන් අනුභව කරවියයි මෙසේ අනෙක ප්‍රකාරයෙන් වාක්විලාපය කියා ඇඬුහ.

මෙසේ මහජනයෝ ඒ උයන සමීපයෙහි සිට අඩා මහබෝසතාණන් වීසූ සථානයට ගොස් ප්‍රාසාදය පැදකුණු කෙරෙමින් අන්තඃපුර කුවාගාර උදුනාදිය බල බලා අඬන්නාහු මෙසේද කියා ඇඬුහ. මේ ඒ චන්ද්‍ර කුමාර යන්ගේ ප්‍රාසාදයය, මේ අතිරම්‍යවූ උත්තම සත්‍රීන්ගෙන් ආකිණ්ණවූ අන්තඃපුර යය, මේබදුවූ ප්‍රාසාද වසතු හා අන්තඃපුරය හැර චන්ද්‍රකුමාරයන්වූ අපගේ සවාමී පුත්‍රයෝ සතරදෙන දැන් මරන පිණිස ගෙනයන ලද්දාහු වෙද්ද. තමන්ද චන්ද්‍ර කුමාරයන්ගේ සවණීමවූ පුෂ්පධූමයෙන් ගැවසීගත්තාවූ අතිරම්‍යවූ මේ කුවාගාර භවනය වන්නේය. මේබදුවූ කුවාගාරය හැර චන්ද්‍රකුමාරයන්වූ අප ගේ ඒ සවාමීපුත්‍රයෝ සතරදෙන දැන් යාග නිසා මරන්නට ගෙනයන ලද්දාහු වෙද්ද, ඇමි කල්හිම මල් පිපී සිටියාවූ අතිරම්‍යවූ චන්ද්‍රකුමාරයන්ගේ මේ නෝපලුවනය වන්නේය. හැම කල්හිම මල් පිපී සිටියාවූ අතිරම්‍යවූ මේ නිනිහිරි වනය වන්නේය. හැම කල්හිම මල් පිපී සිටියාවූ අතිරම්‍යවූ මේ පලොල් වනය වන්නේය. හැම කල්හිම මල් පිපී සිටියාවූ ඉතා සිත්කලුවූ මේ අඹ උයන වන්නේය. මෙබදුවූ උදුනාදිය හැර චන්ද්‍රකුමාරාදී අපගේ සවාමීපුත්‍රයෝ සතරදෙන දැන් යාග නිසා මරනු ලබන්නෝ වේද, තවද ඒ චන්ද්‍රකුමාරයන්ගේ රත් නෙළුම් හා හෙළ නෙළුම් වලින් ගැවසීගත්තාවූ මේ පුෂ්කරණීය වන්නීය. සවණී කම්මා න්තයෙන් විසිතුරු කරතලද්දාවූ ඒ චන්ද්‍ර කුමාරයන් ජලක්‍රීඩාව කරන්නාවූ නාවුකාව මේතොමෝවන්නීය. මේ චන්ද්‍ර කුමාරයන්ගේ සමානරූප කුමාරවරුන් හා සමඟ ඇත මැත දිව පැන වැලි

කෙළනාවූ අතිරමණීවූ වැලිතලා පඬියකි වන්නේය. මෙබඳුවූ ප්‍රාසාදාදී ආදිය හැර වන්ද්‍රකුමාරාදීවූ අපගේ සවාමිපුත්‍රයෝ සතරදෙන දැන් යාග නිසා නිසරුණේ මරනු ලබන්නාහු වෙද්දැයි මෙසේ අනෙක ප්‍රකාරයෙන් වාක්විලාප නොට ඒ ඒ තැන සිට අඩා නැවත ඇන්ගල් ආදිය කරගොස් අඩන්නාහු මේ වන්ද්‍රකුමාරයන් වහන්සේගේ එරාවන නම් හස්තියාගයයි කියනලද හස්තිසම්පත්තාවූ වටමවූ නාදළ ඇති මඬුල හස්තිරතනය වන්නේය. තවද ඒ වන්ද්‍රකුමාරයන් වහන්සේගේ එකඛුරයයි කියනලද බඳ කුර ඇති මේ උතුම්වූ මඬුල අශ්වරතනය වන්නේය. ගමන්හත් කල්හි සැළලිහිණීඡන්ගේ හඬමෙන් මධුරනාද පවත්නාවූ සුන්දරවූ සප්තරතනයෙන් විචිත්‍රවූ යම් රථයෙක්හි හිඳ යන්නාවූ සවාමිපුත්‍රයෝ නන්දනොද්‍යානයෙහි ක්‍රීඩාවට යන්නාවූ දෙවතාවන් මෙන් ඉතා හෙළියෝද, මේ චන්ද්‍ර කුමාරයන්ගේ මහුලසුන් යොදනලද ඒ රථය වන්නේය. මෙබඳුවූ හස්තිරතනාදිය හැර ඒ වන්ද්‍ර කුමාරාදීවූ අපගේ සවාමිපුත්‍රයෝ සතරදෙන දැන් යාග නිසා නිසරුණේ මරන්නට ගෙන යන්නාහු වේද, රන්වන්වූ ශරීර ඇති ජාතියෙන් ඔවුනොවුන් හා සමානවූ අනිඳිහිවූ අඹු ප්‍රත්‍යඹු ඇති රත්සඳුන් විලවුන් ගල්වන ලද ශරීරයෙන් යුක්තවූ මෙබඳු පුත්‍රයන් සතරදෙනා ගෙන බමුණාගේ බසින් මුළාවූ එකරාජ රජ්ජුරුවන් වහන්සේ කෙසේ නම් පුත්‍රඝාතය කරනසේක්ද, එසේම රන්වන්වූ ශරීර ඇති ජාතියෙන් ඔවුනොවුන් හා සමානවූ අනිඳිහවූ අඹු ප්‍රත්‍යඹු ඇති රත්සඳුන් විලවුන් ගල්වනලද ශරීරයෙන් යුක්තවූ දූවරුන් සහරදෙනකුද, සිටුවරුන් සතරදෙනකුදැයි මෙසේ සියලු වස්තුයෙන් සතරක් සතරක් ගෙන බමුණාගේ බසින් මුළාවූ එකරාජ රජ්ජුරුවන් වහන්සේ කෙසේ නම් යාග කරනසේක්ද, යම් ගම්නියම්ගම් රාජධානියෙක් මනුෂ්‍ය විහරණයෙන් සූන්‍යව මහවල්වේද, එපරිද්දෙන්ම මේ පුෂ්පවතී නම් රාජධානියත් ප්‍රසිඛවූ මේ චන්ද්‍ර කුමාරාදීන්ගේ අභාවයෙන් මහවල් වන්නේ යයි කියා නුවරින් පිටත්ව ගතනොහී ඇතුළු නුවරම ඒ ඒ ප්‍රසිඛ ස්ථානයන්හි ඇවිද මෙබඳුවූ වාක් විලාපයෙන් මහජනයෝ ඇඬුහ.

මහබෝසතාණන් අවශෙෂ බ්‍රාහ්මණයා හා සමඟ යාගාවාටයට ගෙන යන ලදහ. එකල්හි මහබෝසතාණන්ගේ මැනියෝවූ **ශෛලනමෂදවී** නොමෝ දෙවයන් වහන්ස! මේ දරුවන්ට ජීවිතදානය දුන මැනවැයි කියා රජ්ජුරුවන්ගේ දෙපත්ලෙහි වැටී ඇත මැත පෙරළී පෙරළී අඬන්නී මෙසේ කීවාය. රජ්ජුරුවන් වහන්ස! අනිවාඩියකට නොපැමිණ දුකින් පීඩිතවූයෙම් ඒ ඒ තැන වැටී ඇත මැත පෙරළීමෙන් පස් වැකුණාවූ ගාත්‍රා ඇතිව ඇවිල්ලකින් වියරැහි ඇවිදිමි. ඉදින් මාගේ ඇසක් වැනිවූ උතුම්වූ චන්ද්‍ර කුමාරයන් එකාන්තයෙන් මැරුනම් මා දිවි නොතබමි. එකාන්තයෙන් මාගේ දෙවැනි ඇසක් වැනි උතුම්වූ සූර්‍ය්‍ය කුමාරයන් ඉදින් මැරුනම් එවිටම මාදිවි නොතබමි, කියා ඇඬිය. මෙසේ මහබෝසතාණන්ගේ මැනියෝ අනෙක ප්‍රකාරයෙන් වලාවී කියා අඩාත් රජ්ජුරුවන් ගෙන් අස්වැසීමකට සුදුසුවූ කිසි බසක් නොලැබ මාගේ පුතණුවෝ තොප හැමදෙනාට කිපී ගියෝ වත. තොප හැමදෙන බැණ නොනැගී ඉදිනේ එසේ හෙයින් වේද? කුමක් නිසා මපුතණුවන් ගෙන යන ගමන නොනැවැත්වූදැයි චන්ද්‍ර කුමාරයන්ගේ බිසෝවරුන් සතරදෙනා වැළඳගෙන අඬමින් මෙසේ කිවුය. **සඛිඝා** නම් බිසවුද, **ඔපරකඛි** නම් බිසවුද, **පොක්ඛරකඛී** නම් බිසවුද, **ගාසිඝා** නම් බිස

වුද යන මේ බිසෝවරුන් සතරදෙන වන්ද්‍ර සූර්‍ය්‍ය කුමාරයන් දෙදෙනා අති මූඛයෙහි සිට හී කියා තවමින් ඔවුනොවුන්ට ප්‍රිය තෙපුල් බණින්නාහු කවර කාරණයකින් මා දරුවන් තමන් කෙරෙහි පස්කම් ගුණයෙන් නොඇලවූ ඥෙහෝ නොහොත් නැටීමෙන් හී කීමෙන් හා ප්‍රිය තෙපුල් බිණීමෙන් මුත් සහදරදෙනාහා සමවූ අන්‍යවූ යක්‍රී කෙනෙක් මේ මුළු දඹදිව නැත. එවැනිවූ බිසෝවරුන් සහදරදෙන මා දරුවන් තමන් කෙරෙහි පස්කම් ගුණයෙන් නොඇලවා කුමකට උකටලී නොලෝඥෙහෝසි මෙසේ විලාප කියා හැඬූහ. තවද මහබෝසතාණන්ගේ මැනියෝ යෙහෙළුනියන් සතරදෙනා වැළඳ ගෙන මෙසේ අනෙක ප්‍රකාරයෙන් වාක්විලාප නොට හඬා අතිකක් කියා සොට ගන්නට නිස්සෙක් නොදුක බණ්ඩහාල නම් බ්‍රාහ්මණයාට හවන්නට පටන්ගත්හ.

දුටුවූ බණ්ඩහාල නම් බ්‍රාහ්මණය! මපුතණුවන් චන්ද්‍රකුමාරයන් මරන්නට යාගාවාටයට ගෙන ගිය කල්හි මාගේ ළෙහි යම් දරුගින්නෙක් උපන් නේනම් ඒ මාගේ හෘදයශොකය බමුණ හා මව කරා පැමිණේවා. මා කුසෙන් නැගි දළ ගිනි තා මව විඳුවාවා, තවද බමුණ! මා දරුවන් චන්ද්‍රකුමාරයන් හා සූර්‍ය්‍යකුමාරයන් මරන්නට යාගාවාටයට ගෙන ගිය කල්හි මා ළෙන් නැගි යම් දරු ගින්නෙක් ඇත්නම් ඒ මාගේ දරු ගිනි බමුණ! තා ම විඳුවාවා, මා ළෙන් නැගී යම් ශොකාග්නියෙක් ඇත්නම් ඒ මාගේ දරු ශොකාග්නිය තාගේ භාය්‍යාව කරා පැමිණේවා, මා කුසෙන් නැගි ශොකාග්නිය තාගේ භාය්‍යාව විඳුවාවා, තවද බමුණ නිරපරාධවූ සිංහසමානවූ බලපරාක්‍රම ඇති රාජකුමාරවරුන් යමෙක් මැරවිනම් එසේ රෞද්‍ර ක්‍රියා ඇති තාගේ මවු තමා දරුවන් නොදකිවා, තමාගේ සවාමිපුත් නොදකිවා, බමුණ! මුළුලෝවාසින් විසින් පැතිය යුතුවූ මහත්වූ සෞර්‍ය්‍ය ඇති මේ රාජකුමාරවරුන් යමෙක් මැරවීනම් එබදුවූ වණ්ඩ ඵරුෂ ගුණයෙන් යුක්තවූ තාගේ මවු තමා දරුවන් නොදකිවා, තමාගේ වල්ලභයාත් නොදකිවා, සි මෙසේ අනෙක ප්‍රකාර යෙන් ආක්‍රොෂ කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ යාගාවාටය සමීපයෙහි සිට පිය රජ්ජුරුවන්ට යාඥා කරන්නාහු මහරජ්ජුරුවන් වහන්ස! නිරපරාධවූ අප නිසරුණේ නොමැරුව මැනව, එසේම නුඹවහන්සේගේ සිත නොනැමේ නම් මේ බණ්ඩහාල බ්‍රාහ්මණයාට අප දස්කොට පාවා දුන මැනව, එසේ දස් කරනු නොකැමැතිසේක් නම් නුඹවහන්සේගේ සිත මොලොක්වන තෙක් මහදම්න් මසතලදුව ඇත්තල කම්නොට ඇතුන් අසුන් රකුම්හ. එසේ කරනු නොකැමැතිසේක් වීනම් පන්නම්කොට ඇත්බෙටි අස්බෙටි දමම්හ. තවද මහරජ්ජුරුවන් වහන්ස! නිසරුණේ නිරපරාධවූ අප නොමැරුව මැනව, ඉදින් නුඹවහන්සේගේ සිත අප කෙරෙහි ඉතාම කලකිරී ගියේ නම් මේ බණ්ඩහාල බ්‍රාහ්මණයාට අප දස්කොට පාවා දුන මැනව,එසේ නොහොරි අන්‍යවූ යම් කිසිවක්හට ගැනීකොට දෙනු කැමැතිසේක් වීනම් ඕහට ත්‍රයපත්‍රය ලියා අප දස්කොට දුන මැනව,අප රටින් හෝ නගරයුව මැනව, එසේ රටින් නෙරපා ලද්දාවූ අපි කබල් ගත් අත් ඇතිව දිළිඳුව දෙරදෙරා සිඟාකා ඇවිදුමෝ නම් එයත් යහපත් වන්නේය. තවද මහරජ්ජුරුවන්වහන්ස! දරුවන් කැමැත්තාවූ දිළිඳුවූ සත්‍රීහු බොහෝ පිදේනි වසනු ගෙන ගොස් ප්‍රදූ දරුවන්

පතා ප්‍රසිද්ධවූ දෙවාලයවල පේව වැදෙන්නාහ. සමහර සත්‍රී කෙනකුන්ට උපන්නාවූ දෙළ නොලැබ ගහිය විසලී නස්නේය, සමහර සත්‍රී කෙනෙක් ලද්දාවූ දෙළ අනුභව නොකොට හැර දැමුවන් නොලබති. අපගේ මැනියන් වහන්සේ වූසලී හමින් වහන්සේට අභිප්‍රාවූ දෙළ ලදින් ඒ අනුභව කොටම උපන්නාවූ ගහිය නොහසා අප වදු වඩා වඩිනගළසේක. එසේවූ දුකසේ ලත් අප කුමක් නිසා නිකරුණේ යාග පිණිස මරවනසේක් වේද? මහ රජුනි! අපට දරුවෝ උපදිත්වයි කියා සමහර සත්‍රී කෙනෙක් ප්‍රාර්ථනා කරන්නාහ. සමහර සත්‍රී කෙනෙක් අපගේ දරුවන්ගෙන් දරුවෝ උපදිත්වයි මෙසේ ආශා කරන්නාහ. පුත්‍ර ප්‍රතිලාභය දුක් වුවත් නුඹවහන්සේ දැන් යාග නිසා අප මරවනසේක් වේද? තවද පියාණන් වහන්ස! දෙව භාරධනායෙන් සත්‍රීහු දූදරුවන් ලබන්නාහ. එබැවින් නුඹවහන්සේ දුකසේ ලද දරුවන්වූ අප යාග පිණිස නොමැරුව මැනව, බැගෑව ලද්දාවූ දරුවන් යාග නිසා අපගේ මැනියන් වහන්සේ කෙරෙන් වියෝ නොකළ මැනවැයි මහත්වූ සොකයෙන් ඇඬුහ.

මේසේ ඒ මහබෝසතාණෝ මෙතෙක් කාරුණිකයා හඬාත් පියාණන් සමීපයෙන් නිසි බසක් පවණවත් නොලැබ මැනියන් පාපිට වැටී වැදහෙව් අඬන්නෝ මැනියන් වහන්ස! නුඹ වහන්සේ චන්ද්‍රකුමාරයන්ගේ මලමූත්‍රාදිය දැමීමෙන් බොහෝ දුක්ගෙන වැඩූ පුතණුවන් දැන් ඇසිල්ලකින් නොලබන සේක්වේද එසේහෙයින් නුඹවහන්සේගේ දෙපා වඳිමි. පියාණන් වහන්සේ අප මරා යාගකොට මිය පරලොව ගොස් ප්‍රමාණාතික්‍රාන්තවූ සම්පත්තීන් සමෘද්ධිවූ දිව්‍යලොකොත්පත්තියද ලබනසේක්වා, තවද මැනියන් වහන්ස! නුඹ වහන්සේ කෙරෙන් අපගේ වියොගවීම් වන බැවින් මාවැළඳ ගෙන සිඹසන හාවා, ඉක්බිති මා වඳනට නුඹවහන්සේගේ දෙපතුල් දුන මැනව, නුඹ වහන්සේගේ දෙපය වැඳ ඉක්බිති රජපුරුවන් වහන්සේගේ යාගය පිණිස නුඹවහන්සේ කෙරෙන් වියෝ වන්නෙම්වේද, තවද නුඹවහන්සේගේ ළයට සොකදුක් උපදවා මාපියන්ගේ ළයටත් සොකදුක් උපදවා නුඹවහන්සේ ප්‍රධානකොට ඇති සියලු මහජනයා කෙරෙන් වියෝවන්නෙම් වේදැයි මෙසේ නොයෙක් පරිද්දෙන් විලාපකොට ඇඬුහ.

ඉක්බිත්තෙන් චන්ද්‍රකුමාරයන්ගේ මැනියෝ වහසොසියා අඹින්නාහු පුත චන්ද්‍රකුමාරයෙනි! මේ හොපගේ අන්තිම අවස්ථාව වන බැවින් **පද්මපත්‍ර** වෙඨන නම් ප්‍රසාධනයෙන් හළල හා කන්සක වැටී නුණු කෙසඟලාපය සකස්කොට නහා ගෙන බුදුවද සප්‍රමල් පෙත්තෙන් මුසුකොට ගොතනලද චිණ්ගඩි සවපන්නවූ අහන්මවූ මේ සුවඳ මල්දම්ද පද්මපත්‍රවේඨන නම් මිල් සෝපුව බුදු හැන් පටන් අලඬකාර පිණිස මත්තේ සියලු කෙස්වැටිය විදුකොම වෙළුම් බැඳ ගනුව, මෙලෙස මිල්සෝලුයෙන් කෙසේ වෙළා බැඳීම හොපගේ පියමුතුන් ආදිවූ පුරාතන රජදරුවන් කොට ගෙන එන චාරිත්‍ර ඉසක් වන්නේය. පුත චන්ද්‍රකුමාරයෙනි! යම් රකත වඳන විලෙපනාගකින් මතාකොට සතල ශරීරයහි ගල්වන ලදුව මෙතැනට රැස්වූ රාජපමුඛ මධ්‍ය ගෙහි සැරසී සිටිනුම් එබඳු රත්සඳුන් මිලවුන් ගෙන ඇරගෙව, මේ මිලවුන් ශ්‍රේෂ්ඨ කාලයේ මේ ලුදුවා ඇරගිමෙක් ඉඳිරියේ නැත්තේවේද, තවද පුත! හොපව මරණය සවඳිපව සිටි බැවින් මොලොක්ව ලබිය අගතා කසිසළු හැඳ

ගනුව, යම් කාශික වස්ත්‍රයක් මතාකොට හැඳ මේ රාජපෂිත් මධ්‍යයෙහි සැරසී සිටු නම් එසේවූ කාශික වස්ත්‍රයෙක් හැඳ සැරහෙව, මේ සළු හැඳ සැරසීමෙන් දෙවන සැරහීමෙක් ඉදිරියේ නොපට නැත්තේවේද, නවද පුත! යම් හස්තාභරණයකින් සැරහුණාවූ තෙපි මේ රාජපෂිත් මධ්‍යයෙහි විශෙෂයෙන් සැරසී සිටු නම් එසේවූ උත්තමවූ අනඝී මුක්තාමාණික්‍යයෙන් හා ජාම්බොනද සුවර්ණයෙන් යොදා සාරතලද හුජාභරණයන් පැලඳ සැරහෙව, මේ හුජාභරණයෙන් සැරහීමෙන් දෙවන සැරහීමෙක් නොපට ඉදිරියේ නැත්තේ වේදැයි මෙසේ අනෙක ප්‍රකාරයෙන් වාක්විලාප කොට ඇඬිය.

ඉක්බිත්තෙන් ඒ වඳු කුමාරයන්ගේ චන්ද්‍රා නම් අගමෙහෙසුන් බිසව රජ්ජුරුවන්ගේ දෙපත්ලෙහි වැටී තෙව අඩන්නී ජනෙශ්වරවූ පෘථිවීශ්වරවූ ජනපද සාමිවූ මේ එකරාජ රජ්ජුරුවන් වහන්සේ දරුවන් විෂයෙහි දෙමවුපියන් මහත්ව උපදවන්නාවූ පුත්‍රස්නෙහය නුපදවූසේකැයි සිතමිහයි කියා ඇඬිය. ඒ චන්ද්‍රාදෙවීන්ගේ බස් අසා එකරාජරජ්ජුරුවෝ කියන්නාහු චන්ද්‍රාදෙවීනි! දරුවන් මනකල් නොපට මතුනොවෙයි, මවටත් මනකල්හුමය, එසේම මාගේ ආත්මය මට ඉතා ප්‍රියය, යෙහෙළිවූ තෙපි හැම දෙනාත් මට ප්‍රියයහ, මාගේ බිසෝවරුද මට ඉතා ප්‍රියයහ, එසේවුවත් දිව්‍යලොකය ප්‍රාර්ථනා කරන්නාවූ මම ඒ දිව්‍යලොකොත්පත්ති කාරණයෙන් මාගේ දරුවන් ආදීවූ මෙතෙක්දෙනා මරමි. මරන්නේ මුත් ශොකයක් නොකෙරෙමි. මොහු හැමදෙනම මා සමඟ දිව්‍යලොකයෙහි එක්ව වෙසෙති. තෙපි ඊට සැකයක් නොකරවයි කිහ. එකල්හි චන්ද්‍රාදෙවි කියන්නී දෙවයන්වහන්ස! මාගේ සාමිපුත්‍රයාණන් වහන්සේ මරන්නට පළමුකොට මා මැරුව මැනවු, මා බලබලා සිටියදී මාහිමියාණන් මරා මට සොකදුක් දී මා ළය නොපැළුව මැනව, මහරජ්ජුරුවන්වහන්ස! භුඹවහන්ගේ පුත්‍රවූ චන්ද්‍රකුමාරයෝ සිංහාභරණයෙන් සැරහී සිරිහෙයින් ඉතා නොඛිති, දුටුවන් සිත් පහදවති, ඉතා සිවුමැල්ලෝය, මදකුත් දුක්ගත නොහෙති, එබදුවූ පුතණුවන් කුමක් නිසා නිකරුණේ මරනසේක්ද? නවද මහරජ්ජුරුවන් වහන්ස! ඉදින් භුඹවහන්සේ නොවලක්වා මරනසේක් වීනම් මාහිමියාණන්ට පළමුකොට මා මැරුව මැනව, එසේ නුවණැත්තාවූ වඳු කුමාරයන් හා එක්ව ගොස් දිව්‍යලොකයෙහි උපදිමි. භුඹවහන්සේ යාග ඒධි සඛ්‍යාත බොධෙයි කුසල්කළ මැනව, අපි දෙදෙන වූකලී එක්වම මරන ලද්දෝවේ වීනම් දිව්‍යලොකයට ගොස් මතුත් එක්ව සුව විඳිනමෝවේද, දෙවයන් වහන්ස! අපගේ සවගීලොකොත්පත්තියට බාධා නොකළ මැනවැයි කීවාය. එකල්හි අසා රජ්ජුරුවෝ කියන්නාහු චන්ද්‍රාවෙනි! නොපටමරණයනොකැමැතිවව, දිගුපුළුල් නිල්ලුවන්ඇති නෙතැත්තියි! තොපගේ සාමිවූ චන්ද්‍ර කුමාරයන්ගේ මල්බෑයෝ බොහෝ වන්නාහ. චන්ද්‍ර කුමාරයන් යාගනිසා මැරූ කල්හි චන්ද්‍රකුමාරයන්ගේ මල්බෑයෝ නොපෑ පසුවකාමයෙන් පිනවන්නාහ. එසේනොසිත් නොප ශොකාතුරව නොඉඩවයි කිවුය. මෙලෙස කියාල්හි චන්ද්‍රාදෙවී නාථෝ තමන්ගේ දෙඅත ළෙහි සපා ගත්තීය. මෙසේ ළෙහි අත් ගසා කෑවන අඬන්නාවූ චන්ද්‍රාවෝ මට ජීවිතයෙන් කම් නැත. විෂයක් කා ජීවිතක්ෂයට පැමිණෙම්. චන්ද්‍ර කුමාරයන් නැති රට හිද මාදිවි නොතබම්. නවද දෙවයන් වහන්ස! භුඹවහන්ඉස්ගේ ළෙහි ද දරුවන් නොමැරුව, චන්ද්‍ර කුමාරයන් නොමැරුව මැනවැයි යම්කෙනෙක් පැරැත්ත පමිණුවත් නොකියත්නම්

එසේ හෙයින් මේ රජ්ජුරුවන් වහන්සේගේ එබඳුවූ ඉශ්වාසයන් හා අමිහාස යන් හා ඝනඵවන් හා නැයන් නැහැයි සිහිමි. එසේ නැති හෙයින් වේද චන්ද්‍ර කුමාරයන් නොමැරුව මැනවැයි නොකියන්නේ, ඇත්තනම් කියන් නෝමි වේද, භවද රජ්ජුරුවන් වහන්ස! භාග්‍යවතුන්වහන්සේ නිසා උපන් මේ දරුවන් නොමරා මාගේ මේ වාසුල කුමාරයන් ආදිවූ සෙසු මල්දම් පැලැන්දවූ සෙසුරහරණ පැලැන්දවූ දරුවන් ගෙන දිව්‍යලොකොත්පත්තිය පිණිස යාග කළ මැනව, මා දරුවන් මරුවත් මාහිමියන් නොමරා හැරපුව මැනව, භවද මහරජ්ජුරුවන්වහන්ස! මාතාපිතෘන් කොට කපා සියයක් කොවස්කොට එක්තැනෙක හලා සත්තැනෙකත් යාගකළ මැනව, නිරපරාධවූ සිංහසමාන සෞරචියයි ඇති සියලු ලෝවැස්සන් විසින් ප්‍රාර්ථනියවූ භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රධාන පුත්‍රවූ මේ චන්ද්‍රකුමාරයන් නිසාරුණේ නොමැරුව මැනවැයි කියා ඇඬියය. මේසේ චන්ද්‍රා නම් බිසවු එකරාජ රජ්ජුරුවන් සමීපයෙහි සිට නොයෙක්දෑ කියා අඩා අස්වැසිමනට නිසි බසක් පවසන්නට නොලදින් මහ බෝසතාණන් සමීපයට ගොස් අඩ දඩා සිටියාය.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ චන්‍රා නම් බිසවුන්ට කියන්නෝ චන්‍රාවෙනි! මා ජීවත්ව සැපසේ ඉන්නාකල තොපට මා විසින් ඒ ඒ ළඳ බොළඳ ප්‍රිය තෙපුල් බිණු කල්හි ඒ ඒ කණිරසායනවූ ප්‍රිය කථා කී කල්හි මාහැඟිවූ මුඛභා මාණික්‍යාදිවූ රතනයෙන් විසිතුරු කොට කරනලද නොයෙක් ආභරණ දෙනාලද, දැන් වියෝලි තොපට දෙන්නාවූ මේ අන්තිම වස්තු පරිත්‍යාගයය, එසේ හෙයින් මට ප්‍රියවූ චන්‍රාවෙනි! තොපට මා පැලඳ සිටියාවූ මේ ආභරණ දැන්ගලවා දෙමි. මා දුටුවාසේම ආභරණ පැලඳගෙන නැමේවේලෙහිම මා සිහිනොව කොට හිඳුවයි කිහ. එබස් ඇසූ චන්‍රා දෙවි නොමෝ වඩ වඩා අඬන්නට පටන්ගත්තිය. මීට පූර්ව භාගයෙහි යම් රාජ කුමාර හෙනකුන්ගේ ස්කන්ධයෙහි ප්‍රබුද්ධසුගන්ධ කුසුමදාමයන් හා ගෙතීමෙන් විචිත්‍රවූ සුගන්ධ කුසුම දාමයෝ පෙරළි පෙරළි පවතිද්දී, දැන් වූකලී ඒ රාජ කුමාරයන්ගේ ස්කන්ධයෙහි විභජිතවූ අතිශ්‍රේෂ්ඨවූ මුවහත් ඇති ඛඩ්ගපත්‍රයන් පවත්නේ වේද, තුව නොබෝකලකින් මේ රාජකුමාර වරුන් කර බඳු පත් වැවෙන්නේය, එසේ වුවත් මාගේ හදවත තව දක්වා නොපැළෙයි, එසේ හෙයින් මාගේ ළය වූකලී සවිර බන්ධනයන් යුක්තාවූයේ වන, මෙබදු වූවන්ගේ මරණ බල බලා සිටියදී මා ළය නොපැළෙන්නේ ලෙහි ගලක් ලා මැසූ හෙයින් වන්ද, තවද පිරිසුදුවූ කසී සළු හැඳ සවණ්ණකුණ්ඩලාභරණයන් පැලඳ රත්සඳුන්විලවුන් ගල්වා සැරහී සිටියාවූ දුටුදුටුවන් සිත් පිනවන්නාවූ චන්‍රසූර්‍ය කුමාරයෝ දෙදෙන එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට මැණියන් වහන්සේටත් මටත් මා දරුවන්ටත් මහජනයාටත් ශොක උපදවා නොබෝකලකින් ගෙනයනු ලබන්නෝ වේද, තවද උතුම්වූ රසමසවුලෙන් යුක්තවූ තුන්අවුරුදු හිය සුවඳ ඇල්සාලේ බත් අනුභව කරන්නාවූ කපුවන් හා කිලිහුන් විසින් රන්සුන්නෙන් උලාසුවඳ පැන් සොළොස් කළයකින් නාවා අනෙකප්‍රකාර රාජාභරණයෙන් සරහා මාණික්‍යාමය කුණ්ඩලාභරණයන් පලඳනා ලද්දාවූ සකල ශරීරය රත්සඳුන් විලවුන් ගල්වා චම්පකනවමාලිකාදිවූ උතුම් විසිතුරු මල්දම් මල්සෝලුයෙන් මුදුන් මිල්කඩ හා කණ්ණාවතංසයෙන් විශෙෂයෙන් සැරහුණාවූ චන්‍ර සූර්‍ය කුමාර දෙදෙන එකරාජ රජ්ජුරුවන් වහන්සේගේ යාගයට දෙමවුපියෝ දෙදෙනාටත් නගුන්මල්බැයන්ටත්

මටත් මා දරුවන්ටත් සෙසු මිහජනයාටත් මහත් දුක් උපදවා ළය පතියව, නොබෝ බලකින් ගෙන යනු ලබන්නෝ වේදූයි මෙසේ අනෙක ප්‍රකාර වාක්විලාප කියා ඇඬිය. මේසේ චන්ද්‍රා නම් බිසවුන් අඬමින් වැලපෙමින් සිටියදීම යාගාවාටයෙහි කම්මන්තයෙහි නියම්වූහ. ඉක්බිත්තෙහි චන්ද්‍රකුමාරයන් ගෙන ගොස් කර නම් මිරන්තට ඉදුවූහ, එකල ඛණ්ඩහාල බ්‍රාහ්මණයා රන්තලිය කුමාරයන් සමීපයෙහි තබා කඩුව ඇරගෙන කුමාරයන්ගේ බොටුව කපා ගල ලොහිතයෙන් තලිය පුරා තලියෙන් ලේ ගෙන ගොස් යාගාවාටයෙහි වත්තොට යාග කිරීමෙන් මතදෙළ පුරවමිසි සිතා සිටි කල මහබෝසතාණන් වහන්සේගේ භායාවූ චන්ද්‍රා දෙවී සිතන්නී ඉනින් විළි සරණක් නැත. මාගේ සත්‍යක්‍රියා බලයෙන් සවාමිපුත්‍රයාණන් වහන්සේට සඝාසථයක් කෙරෙමිසි සිත සිතා දෙතොත්මුදුනෙහි තබා දසදිග වඳිමින් පතිත් අතරතුරෙන් ඇවිත් සත්‍යක්‍රියා කළාය. ඒ අවිය ප්‍රකාශ කරන්නාවූ තිලොගුරු බුදුරජාණන් වහන්සේ බුදුව වැඩහිඳ මෙසේ වදාළසේක.

සබ්බසමිං උපක්කමවතිං – නිසිදි තෙ චන්දියා යසස්සුනියා
අයඤ්චාල රාජසිනා – සුසඤ්ඤලිකා සබ්බපරිස මනුපරියා'සි

තවද සත්‍යක්‍රියා කරන්නාවූ චන්ද්‍රා නම් බිසව් තොමෝ යම් සබවසකින් මේ ඛණ්ඩහාල නම් බ්‍රාහ්මණයා එකාන්තයෙන් පවිටුකම් හෙරෙද්ද, නුවණ නැත්තේද, ඔහු පාපිෂ්ඨ බවත් අඥාන බවත් සත්‍යද, ඒ සත්‍යක්‍රියා යෙන් මාගේ සවාමිපුත්‍රයාණන් වහන්සේ හා සමඟ එක්වෙම්වයි, තවද මේ සඳලොකයෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, යම්බදුවූ දෙව් සඛ්‍යාතවූ යක්ෂ කෙනෙක් ඇද්ද, අනිවෘධියට පැමිණ සිටි සඳ සඛ්‍යාතවූ යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, දැන් අනිවෘධියට පැමිණෙන්නාවූ සඳ කොනෙක් ඇද්ද, ඔහු හැමදෙනම දැන් මට මෙහෙවර හෙරෙත්වයි, මාගේ සවාමිපුත්‍රයාණන් හා සමඟ දැන් මම එක්වෙම්වයි, තවද මෙහැනට ආවාවූ යම් දෙවතාවන් හා යක්ෂ රක්ෂස භූත ප්‍රෙත පිසාචයන් හා අවශෙෂවූ සඳ කොනෙක් ඇත්නම් සියලු සඳයෙනි! තොපට මම කියමි. මාගේ බස් අසව, මම පිහිටක් සොයමි අනාථ අසරණයෙමි. මා රැක ගනිව්. මම තොපට ආරාධනා කෙරෙමි. මාගේ සවාමිහු කෙරෙන් මම නොපිරිහෙම්වයි තොප හැමදෙනාගේ ආඥා යෙන් හා බලයෙන් මිහිමයෙන් මාගේ සවාමිපුත්‍රයාණන් වහන්සේ මරු පිය නොදී ගලවා හැරවියව්'යි මෙසේ සත්‍යක්‍රියාකොට දෙවහොබ්බානය කළහ. එකල්හි සක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ චන්ද්‍රා දෙවීන් මෙසේ අනෙකප්‍රකාරයෙන් අඬන්නාවූ අඩ අසා එපවත් දැන හිතිගෙන දිලියෙන්නාවූ යකුලන් ඇරගෙන ගොස් රජ්ජුරුවන් හැනි ගන්වා චන්ද්‍ර කුමාරයන් ප්‍රධාන කොට ඇති සියලු සත්වයන් බන්ධනයෙන් මුදවා මරණයෙන් ගැලවූහ.

එහෙයින් වදාළහ බුදුහු–

"හං සුත්වා අමනුසෙසා අයකූටං පරිබහ මෙත්ථා භය මිසස ජන යනෙතා
රාජානං ඉදම වොච'යි

තවද ශක්‍රදෙවේන්ද්‍රයෝ රජ්ජුරුවන්ට කියන්නාහු රාජ මුඛය! රාජ සාණහය! දැන් වූකලී දූනගෙන කාරණා සලකා මම තාගේ හිස්මුදුන ගිනි ගෙන දිලියෙන යකුලින් යම්තාක් කල් තළා නොබිඳිම් නම් එතාක් කලකින්

නිරපරාධවූ සිංහසම්භවවූ සෞර්‍යය ඇති තාගේ ප්‍රධාන පුත්‍රයා නොමරා යුහුවහැරපියව, තවද රාජ්‍යඛිය! සවගිලොකොතපත්තිඛහාමාත්‍යවුන් විසින් නිරපරාධවූ සිටුවරුන් හා දූදරුවන් හා හාත්‍යාමෝ යාග නිසා මරනු ලබන්නාහු හා විසින් කොතිදැ නවර කරුණ දක්නාලදහුදැයි මෙසේ ශක්‍රදෙවෙන්ද්‍රයෝ රජ්ජුරුවන්ට ආක්‍රොශ පරිභව බැණ අහෙතුප්‍රකාරයෙන් භය ගැන්වූහ. එකල ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ උයහප්‍රකාර බස් අසා ඒ පාපිවූ එකරාජ රජ්ජුරුවන් හා බ්‍රහ්මණයාද යන දෙදෙනා මේ අදෘෂ්ටපූර්වූ ශක්‍ර දෙවෙන්ද්‍රයන් දැන තුවූ දෙදෙන නිත්‍යාපින් මෙන් බඹුන ගතවූ සියලු සත්ත්වයන් එසෙණෙහිම බඹුයෙන් මිදුහ.

මෙසේ හත්‍ථි අශ්වාදිවූ සියලු සත්ත්වයන් බඹුනයෙන් මිදූ කල්හි එදවස් ඒ යාගශාලාතලයෙහි යම් පමණ මනුෂ්‍ය නොනෙක් රැස්වූ නම් ඒ සියලු මනුෂ්‍ය යෝම එකපැහැර ඔල්වරාඩ ගසමින් නොලාහල නෙරෙමින් බ්‍රාහ්මණයාට මෙම වධයයි එකී එකී නැවක් ගසා එහැන්හිම මරු ජීවිතක්ෂයට පැමිණවූහ. මෙසේ මහජනයා ඒ බ්‍රාහ්මණයා මරු රජ්ජුරුවන් මරන්නට පටන්ගත් කල්හි මහබෝසතාණෝ පියාණන් වැළඳගෙන මැරිය නුදුන්නාහ. මහජනයෝ කියන්නාහු මේ පවිටුවූ රජ්ජුරුවන් වහන්සේට ජීවිතදානය පමණක් නුඹවහන්සේ නිසා දෙම්හ. රාජ්‍යයත් නොදෙම්හ. මේ නුවර විසිය නොදෙම්හ වණ්ඩාල නොට පිටිනුවර වසවම්හයි කියා රාජවෙසය හරවා නසා සඬක් හඳවා කසාරෙදිදකින් හිස වෙළා වණ්ඩාල ගොට වණ්ඩාලග්‍රාමයෙහි ලැවූහ. (අකුසල් කොට සවගීලොකයෙහි උපදින්නට නොපිළිවන් බැවින් යම් පමණ කෙනෙක් ඒ පසුඛාත යාගය කොළෝ නම් කරවූ නම් අනුමෝදන්වූ නම් ඒ සියලු සත්ත්වයෝම අවීචි මහ නිරය ආදිවූ සතරඅපායෙහි උපදනාහුය.) තවද එමෙසේ සියලු ජනයා බඹුනයෙන් මිදී සතුටුවූ කල්හි එතැනට රැස්වූ මහජනයෝ අමාත්‍ය මණ්ඩලයා හා සමඟ කථා කොට ඒ කාලකණ්ණිවූ බ්‍රාහ්මණයා හා රජ්ජුරුවන්හා දෙදෙනාම දුරුකොට චන්ද්‍ර කුමාර නම්වූ බෝසතාණන්ට අභිෂෙක කොට රාජ්‍යයෙහි පිහිටුවම්හයි කියා රාජ්‍යාභිෂෙකයට සුදුසුවූ උපකරණ හා පඬුරාජ කකුධ භාණ්ඩයන් එතැනට ගෙන්වාගෙන මහබෝසතාණන් රාජ්‍යාභිෂෙකයෙන් අභිෂෙක කොට පුරය ප්‍රදක්ෂිණා කරවා දිව්‍යප්‍රාසාදයක් හා සමානවූ උතුම්වූ ප්‍රාසාදයේ මහුමහල් හෙලෙහි ශ්‍රියාසන්දි මසතායේ හිඳුවා රාජ්‍යයෙහි පිහිටුවූහ. මෙසේ මහබෝසතාණන් රාජ්‍යයෙහි පිහිටුවූ කල්හි එතැනට රැස්වූ රාජපුත්‍රයන් හා රාජකන්‍යාවෝත් දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවෝත් වෙන වෙනම් සතුටුව මහබෝසතාණන්ට අභිෂෙක ජලය වත්කරන්නාහු .සවණ් සඬය රජත සඬය සෙත සඬයයි ඨිය නලද ත්‍රිවිධවූ සඬයෙන් රාජපුත්‍රයන් හා රාජකන්‍යාවෝ අභිෂෙක ජලය වත්කළහ. දෙදෙව්ලොව දෙවියන්ට අධිපති ශක්‍රදෙවෙන්ද්‍රයෝ විජයුත්තර සඬය ගෙන දිව්‍ය පානීත් හා සමඟ අභිෂෙක ජලය වත්කළහ. ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ අග්‍ර මහෙෂිකාවූ සුජාතා නම් දිව්‍යාඞ්ගනා තොමෝ සාකුට පාදිනී නම් දිව්‍යාඞ්ගනාව හා සමඟ අභිෂෙක ජලය වත්කළාය තවද ඒ මහබෝසතාණන්ගේ අභිෂෙක මඬලග්‍රයෙහි රතනතිල සෙතාදිවූ පැහැ ඇති වස්ත්‍රයෙන් ධජ තංවා ආසාශයට උතුරු සළ දමා සාටවම්න් විසඝණයෙන් සතුතුවව අපගේ වන්ද්‍ර කුමාරයන් වහන්සේ බඹුනයෙන් සම්සේ මිදුණසේක්ද, එපරිද්දෙන්ම සියලු සත්ත්වයෝත් අඳුබඹුන සඬලිත බඹුනාදියෙන් මිදෙත්වයි කියා කුල්මත්ව හඬගසා මහජනයෝ නුවර සතොණ හෙරිතාද පැවැත්වූහ.

එසේ හෙයින් වදළහ බුදුහු:—

සබ්බස්ස විපපමුත්තොසු-ඔහු ආනන්දිනෝ අහූ
සුනන්දිපපවෙසි නගරෙ-බණ්ඩන මොක්ඛා අහෝ සිපි.

ඉක්බිත්තෙන්, මහබෝසතාණෝ පියාණන්ට වැටුප් වියදම් තබා දුන්හ. නුවර වැස්සෝ වූකලී උන් වණ්ඩාල ග්‍රාමයෙහි ලූ බැවින් ඇතුළු නුවරට වැදීද නොදෙති. වැටුප් වියදම් නිමා ගිය විට මහබෝසතාණන් උපන්කෙළි ආදියට නික්මුණු කල්හි මහබෝසතාණන් කරා ගොස් මම නුඹ වහන්සේගේ පියාණෝයයි කීහ. දෙහොත් මුදුනෙහි බැඳ සඟවා නිති! බොහෝ කලක් ජීවත්වුව මැනවැයි කියති, කුමකින් ප්‍රයොජනද? විවාළ කළ බත්පිළී ආදිය නැති නියාව කියති, එකල මහබෝසතාණෝ ඒ සැඩොල්වූ පියරජ්ජුරුවන්ට වැටුප් වියදම් දෙවන්නාහ. මෙසේ ඒ මහබෝසතාණෝ දශරාජධම්යෙන් අකොපය කොට රජ්ජය කෙරෙමින් ජීවිතාන්තයෙහි සහ පිරිවරින් ගොස් දිව්‍යලොකයෙහි උපන්නාහ. ශාස්තෘවූ ත්‍රිලොගුරු බුදුරජාණන් වහන්සේ මේ ධම්දෙශනාව හෙන හැර දක්වා වදාරා මහණෙනි! දැන් මතු නොවෙයි, පෙරත් මේ දෙවදත්ත ස්ථවිරයෝ තනි මා නිසා බොහෝ දෙනා මරන්නට උත්සාහ කොළෝවේදැයි වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ **බණ්ඩභාල ජාතකය** නිමවා වදළසේක.

එසමයෙහි බණ්ඩභාල බ්‍රාහ්මණයා නම් දැන් මේ දෙවදත්ත ස්ථවිරය, ගෞතමදෙවී නම් මහාමායා දෙවිය, චන්ද්‍රාදෙවී නම් බිම්බාදෙවිය, වාසුල කුමාරයෝ නම් රාහුල කුමාරයෝය, සෙල කුමාරි නම් උත්පලවණ්ණ මහාස්ථවිරිය, වාමගොත්‍රවූ ශූරකුමාරයෝ නම් මහාකාශ්‍යප ස්ථවිරයෝය, භද්‍රසෙන කුමාරයෝ නම් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයෝය, සූරඤ්ඤකුමාරයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, එසමයෙහි චන්ද්‍රරජ්ජුරුවෝ නම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදළසේක.

බණ්ඩභාල ජාතකය නිමි.

මහානාරද කාශ්‍යප ජාතකය.

නවද එක් සමයක්හි ත්‍රිභුවන වන්දනීයවූ ත්‍රිලොගුරු සම්‍යක් සම්බුදු රජාණන්වහන්සේ රජගහනුවර නිසා ලටසිවනොදහනයෙහි වසනසේක් උරුවෙල කාශ්‍යප දමනය අරභයා මේ ජාතකය වදළසේක.

යම් සමයෙක්හි ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ පවත්වනලද ධම්යක් පෑමතුන් සූත්‍රදෙශනා ඇතිසේක් උරුවෙල කාශ්‍යපාදී තුන්බෑ ජටිලයන් දමනයෙහි ලා ඔහුගේ රජ්ජුරුවන්ගේ ප්‍රතිඥා ලදුනු ත්‍රිශත පුරාණ ජටිලයන් දහසක් දෙනා හිසින් පිරිවරන ලදුව ලටසිවනොදහනයට වැඩිසේක්ද, එසම

යෙහි ඒ සමණයෙහි විසිදහසක් පමණ බ්‍රාහ්මණ ගෘහපතීන් හා සමඟ අවුත් දශබලධාරීවූ බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට උන්නාවූ මගධෙ ශ්‍රේෂ්ඨවූ බිම්සර රජ්ජුරුවන්ගේ පෂ්ඨි අහරෙහි බ්‍රාහ්මණ ගෘහපතීන්ට සාංඝා මෙක් උපදනේ කිමෙක්ද. උරුවෙල කාශ්‍යපයෝ ශ්‍රමණ භවත් ගෞතමයන් සමීපයෙහි බඹසරවස් රකිද්දෝ නෝ නොහොත් ශ්‍රමණ භවත් ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන් සමීපයෙහි බඹසරවස් රකිද්දෝ හෝයි මෙසේවූ සැකයෙක් උපන. එකල්හි භාග්‍යවන්වූ බුදුරජාණන්වහන්සේ උරුවෙල කාශ්‍යපයන් මා සමීපයෙහි මහණවූ නියාව ප්‍රකාශ කෙරෙමියි සිතා එපවත් වදාරන්නේක් කාශවූ ඝෝෂ ඇති නාපසවරුන්ට අවවාද දෙන්නාවූ උරුවෙල් දනම් වැසිවූ කාශ්‍යපය! නුවර අරමුණක් දැක ගිනිදෙවියාට කරන්නාවූ පූජාව ඇරපීද? මේ කාරණය හා අහින් විචාරමි, කියව හාගේ වත්හි පූජාව කුම කැයි දුරුකරන ලදදැයි උරුවෙල කාශ්‍යප ස්ථවිරයන්වහන්සේ අහින් විමාළ සේක. එකල්හි තෙරුන්වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අභිප්‍රාව දැන ගිනිදෙවියාට කරනලද පූජාව හළ නියාව වදාරනසේක් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, යයි කියනලද පඤ්චකාමයන්ද නැවත මේ පඤ්චකාමයට වස්තුවූ සත්‍රීන්ද යාග කාරක බ්‍රාහ්මණයෝ යාගයයි කියති. ස්නාක්ෂොපයි සෙලශොපයි ආදීන් හෙරෙහිද උකුතප්‍රකාරවූ මේ සියල්ල ඇසාමිනි! කිළුටෙ කැයි දැන යම් කාරණයකින් වෙසෙම්ද, ඒ කාරණයෙන් දැනයෙහිත් නො ඇලිනිමි, යාගයෙහිත් නොඇලිනිමියි මෙසේ කියා තමන්වහන්සේගේ ශ්‍රාවක බව ප්‍රකාශකරන පිණිස සම්බුදුන්වහන්සේගේ පතුල්පිට හිස තබා සාමිනි! නුඹවහන්සේ මට ශාස්තෘසේක. මම නුඹවහන්සේගේ ශ්‍රාවකයෙමි කියා එක්තලෙහ දෙතලෙහ තුන්තලෙකැයි යනාදීන් සත්තලක් පවණ සත්විටෙහ ආකාශයට පැන නැගී බැස බුදුරජාණන්වහන් ස්ට නමස්කාර කොට එකත්පස්ව උන්සේක. ඒ ප්‍රාතිහාර්‍යය දැක මහජනයෝ කියන්නාහු සම්බුදුන්වහන්සේ නම් ඉතා මහත්වූ ආනුභාව ඇතිසේක. මෙසේ බල ප්‍රාප්තවූ දෘෂ්ටි ඇති මා තෙරෙහිමුත් අනික් කෙනකුන් තෙරෙහි රහත් ගුණ යෙක් නැතැයි මෙසේ රහත්කම් තමා තෙරෙහිම තබා දක්නාවූ උරුවෙල කාශ්‍යපයෝ පවා දෘෂ්ටිජාලා බිඳ සම්බුදුන්වහන්සේ විසින් දමනයෙහි ලන ලද්දේ වේදූයි බුදුරජාණන්වහන්සේගේ ගුණ කිය කියාම උන්හ. එකල්හි සම්බුදුන්වහන්සේ ඒ පෂ්ඨිවට ආමන්ත්‍රණය කොට එම්බා සඞ්ඝයෙනි! දැන් සම්බුබවට පාමිණියාවූමාළුසින් මොහුදමනයෙහිලීමආශ්චර්‍යනොවන්නේය. පෙර රාගචෙතෝදිවූ කෙලශයන් ගෙන් උකුසන්න කාලයෙහිත් මම නාරද නමි බ්‍රහ්මව ඉපද මොහුගේ දෘෂ්ටිජාලය බිඳ සන්තාන ගතවූ කෙලශ නමැති විෂ විනාශ නොළෙමි වේදූයි වදාර මුවෙන් නොබැණ වැඩඋන් කල්හි ඒපෂ්ඨින් විසින් සාමිනි! දැන් මේ උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටිජාලය බිඳ දමන යෙහි ලූ නියාව අප සියල්ලවුන්ටම ප්‍රකාශය, අතීතයෙහි සරාගී කාලයෙහි නාරද නම් බ්‍රහ්මව මුන්ගේ දෘෂ්ටිජාලය බිඳ දමනයෙහි ලූ නියාව අන්‍ය භව යෙන් පිළිසන් හෙයින් අප හැමට ප්‍රකාශව නොදනෙයි. එය ප්‍රකාශකොට වදාළ නොත් යෙහෙකැයි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ගේ කෙසේදයන්?

යවගිය දවස විදෙහ රට මියුලු නුවර **අඞ්ගති** නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරන්නාහුය. ඒ රජ්ජුරුවෝ ධර්ම්මිෂ්ඨයෝය, දශරාජධර්ම්මයෙන් අකොපය කොට රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවන්ගේ රැජා නම් දියණී කෙනෙක් වූහ. ඒ කුමාරිකා විශිෂ්ටවූ රූ ඇත්තිය. දුටුදුටුවන්ට ප්‍රසාද එළවන්නීය. කලලලක්ෂණයක් මුළුල්ලෙහි පහනලද ප්‍රාප්තා ඇත්තිය. මහ කුසල් ඇත්තිය, මෙබඳුවූ කුමාරිකා තොමෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ ගෙන දසඑකඛමසකින් මවුකුසින් බිහිව වැඩිවිය පැමිණ නුවණැතිවූවාය, ඒ රජ්ජුරුවන්ගේ අවශෙෂවූ සොළොස් දහසක් පමණ පුරගතෝ වඳවූහ. එසේ හෙයින් ඒ කුමාරිකා තොමෝ රජ්ජුරුවන්ට ඉතා ප්‍රිය වන්නීය. සිත්කලුය, මනවඩන්නීය, ඒ අඞ්ගති නම් රජ්ජුරුවෝ කුමාරිකාවන්ට නොයෙක් සුවඳමල් පිරූ කරඬු පස්විස්සක් හා කාසිකොසල දෙශයේහි උපන්නාවූ සියුම්වූ වස්ත්‍රයන් පරිවාර ස්ත්‍රීන් අතට පාවාදී මෙසින් තමන්ගේ තුනු සරහත්වසි කියා දවසක් පාසා යවන්නාහ, නිරන්තරයෙන් යවන්නාවූ ඛාද්‍ය භොජ්‍යයෙහි පමණෙක් නැත්තේය, දෙපෝයක් දෙපෝයක් පාසා මාගේ දියණියෝ දුගී මගී යාචකයන්ට කැමැති පරිදි දෙන් සැපසේ දන් දෙත්වසි කියා දහසක් දහසක් වස්තු යවන්නාහ, ඒ අඞ්ගති නම් රජ්ජුරුවන්ගේවූ ඛාලී **විජයස,සුමනස,අලාතස**, යන අමාත්‍යයෝ තුන්දෙනෙක් වූහ. ඒ රජ්ජුරුවෝ පිපි අඹුලමල් ඇති ඉල්මස මැදි පොහෝ දිනයෙහි උලෙලව උත්සව කොළි පවත්නා කල්හි නුවරත් අන්තඃපුරයත් දිව්‍යපුරයක් මෙන් සැරහූ කල්හි සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සොධා නහා සකල ශරීරයෙහි සුවඳ විලවුන් ගල්වා සම්භාරණයෙන් සැරහී රාත්‍රී භොජනය නිමවා හරනලද සිවිමැදුරු කවුළුඇති ප්‍රාසාදයේ මතුමහල්තලයෙහි අමාත්‍ය සමූහයා විසින් පිරිවරන ලදුව අභූ, මහික, ධූම, රජෝ, රාහුය, යන පඤ්චොප කෙලශයෙන් විනිර්මුක්තවූ නිම්ලවූ ආකාශතලයට නැඟෙන්නාවූ චන්ද්‍රමණ්ඩලය දැක පින්වත්වූ අමාත්‍යයෙනි! චන්ද්‍රමරිවියෙන් පහවූ අන්ධකාර ඇති මේ රාත්‍රිය ඉතා සිත්කලුය, චන්ද්‍රකාන්තියෙන් අපගතාන්ධකාරවූ නිර්ද්‍රෙශවූ රාත්‍රිය ඉතා ප්‍රසාද එළවන්නීය, එසේ හෙයින් අද මේ රාත්‍රියෙහි කවර රතිය කින් සිත් අලවමෝදැයි අමාත්‍යයන් අනින් විමසන ලදහ. ඒ රජ්ජුරුවන් විසින් විචාරනලද්දාවූ අමාත්‍යයෝ තුන්දෙන තමන්ගේ අදහස්වූ පරිදි දෙන් කිහ.

ඉක්බිත්තෙන් ඒ තුන්දෙනා අතරෙන් අලාත නම් සෙනෙවිරදුවූ රජ්ජුරුවන්ට කියන්නෝ දෙවයන්වහන්ස! නුඹවහන්සේට සඞ්ඛ්‍යා වශයෙන් බොහෝවූ හස්ති අශ්ව ගවමහිෂාදීවූ වාහන ඇතිසේක. සුවණ්ණරජත මාණික්‍යාදීවූ අපමණ ධනයෙන් යුක්තසේක. එසේම ප්‍රමාණාතික්‍රාන්තවූ බලකාය ඇතිසේක. එසේ හෙයින් තුටුපහටු සිත් ඇති හස්ත්‍යශ්වාදී වාහන ඇති මහසෙනහ හා සියලු සේනාව යුඞ්ගමයට සරසම්හ, අපමණවූ බලකායයෙන් යුක්තව සඞ්ග්‍රාමයට නික්මෙම්හ, මහරජ්ජුරුවන්වහන්ස! යම් සතුරුවූ කෙනෙක් නුඹවහන්සේගේ වසඟයට නොපැමිණියේ නම් නුඹවහන්සේගේ ආඥයෙහි නොපවතින් නම් සියලු සතුරන් අප වසඟකරවම්හ, යම්කෙනෙක් අප ඔසින් ජය නොගන්නාලද්දේ වී නම් ඔවුන් යුඞ්ගයෙන් ජය ගනුම්හ, මේ මාගේ අදහස වන්නේයයි කිහ. රජ්ජුරුවෝ ඒ අලාහනම් සෙනෙවිරදුන්ගේ

බසට සතුටුවීමක්වත් වැලකීමක්වත් නොකළහ. රජ්ජුරුවෝ අලාභ නම් සෙනෙවිරදුන්ගේ බසට සතුටුවීමක්ව ත් වැලකීමක්වත් නොකළ නියාව දැන මේ රජ්ජුරුවන්වහන්සේ යුද්ධයෙහි අදහස් ඇති තෙනකුත් වහන්සේ නොවෙති, එයේ හෙයින් මම මුන්වහන්සේ සිත් ගෙන පඤ්චකාම ගුණයෙහි ඇල්ම ප්‍රකාශ කෙරෙමි සිතා සුමන නම් සෙනෙවිරද්දු මෙසේ කිහ. මහරජ් ජුරුවන් වහන්ස! සියලු පසළොස්හුරෝ නුඹවහන්සේගේ වසඟයට පැමිණියහ. පසල්දනවු වාසින් යුද්ධ නොඩිරිමේන් තබනලද කඩු ඇත්තාහ. තවද පහ නවූ මානඩිජ ඇතිව නුඹ වහන්සේට යටත්ව අනුව පවත්නාහ. අද වූනලි උපුම්වූ මහුල් දවසෙහ. මේසේවූ උත්සව දිනයෙහි යුද්ධාධ්‍යාසයෙක් මට අභිප්‍රා නොවන්නේය. එසේහෙයින් මහ රජ්ජුරුවන් වහන්ස! මනොඥවූ රසමසවුලෙන් යුක්තවූ ආහාර හා අනෙකප්‍රකාරවූ පානවගී හා අනෙකවගී යෙනිවූ කෑදු නුඹවහන්සේට සුහුව එළවවා ඒ උතුම්වූ ආහාර පානවගී අනුභවසොට පඤ්චකාමයට හෙතුවූ නැටුම් ගීකිම් සිත්හලුවූ බෙරවැයිම් ආදි යෙනි සිත් ඇලවුව මැනව. මේ මාගේ අභිප්‍රායයි කිවුය, රජ්ජුරුවෝ සුමන නම් සෙනෙවිරදුන්ගේ බසටත් සතුටුවීමක්වත් වැලකීමක්වත් නොකළාහ. ඉක්බිත්තෙන් විජය නම් සෙනෙවිරද්දු සිතන්නෝ මේ රජ්ජුරුවන්වහන්සේ මෙවුන් දෙදෙනාගේ බස් අසා මුවෙන් නොබැණම සිටියේක. නුවණැත්තෙක් නම් බස් ඇසිමෙහි ලොල්වන්නාහ. එසේහෙයින් මුන්වහන්සේට ධම්ශ්‍රවණය වණිනා කෙරෙමියි සිතා මහරජ්ජුරුවන් වහන්ස! සියලු රූපාදි පඤ්චකාමයෝ හැම කල්හිම නුඹවහන්සේට එළඹ සිටියාහ. නුඹවහන්සේ පඤ්චකාමයෙන් සතුටු කරවන්නට ඒ කාමය දුර්ලභ නොවන්නේය. කාමය නම් හැම කල්හිම ලැබෙන දෙයෙක. එසේහෙයින් මේ පඤ්චකාමයෙන් සතුටුවීම මා සිත් නොවද්දි, බොහෝ ඇසූ පිරූ තැන්ඇති පාලි අර්ථ හා පාලිධම්ය දන්නාවූ යම් තෙනෙකුත් වහන්සේ අපට අද උපන් සැක දුරුකෙරෙත් නම් සමීප පාපිවූ එබදු ශ්‍රමණසෙනකුත් කරා හෝ බාහිත පාපිවූ එබඳු බ්‍රාහ්මණ නෙනකුත් කරා හෝ එළඹෙම්හයි කිවුය. මෙසේ විජය නම් අමාත්‍යයාගේ බස් අසා අඛාති නම් රජ්ජුරුවෝ කියන්නෝ මේ විජය නම් අමාත්‍යයෝ යම්බදුවූ කාරණය ක් කියා නම් එම කාරණය මටත් අභිප්‍රා වන්නේයයි කිහ. බොහෝ ඇසූ පිරූ තැන්ඇති පාලි අර්ථ හා පාලිධම්ය දන්නාවූ සෘෂිකෙනෙක් අද අපට උපන් සැක දුරුකෙරෙත් නම් සමීප පාපිවූ එබඳු ශ්‍රමණයක්හු කරා හෝ බාහිත පාපිවූ බ්‍රාහ්මණයක්හු කරා හෝ එළඹෙම්හ. මේ සභායෙහි ඉන්නාවූ තෙපි හැමදෙන එක්ව සිතා කාරණයක් කියා බලව්, කවර ප්‍රාඥයක්හු කරා එළඹෙමෝද, අර්ථ ධම් දන්නාවූ කවර සෘෂිකෙනෙක් අද අපට උපන් සැක දුරු කෙරේදැයි කිහ. වැදූරට වාසිවූ අඛාති නම් රජ්ජුරුවන්ගේ මේ වුකතුකාර වචනය අසා අලාභ නම් සෙනෙවිරද්දු කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! මේ මෘගදාය නම් උද්‍යානයෙහි නිර්භරණයෙහි ප්‍රසිඩවූ නිගණ්ඨාජීවකයෙක් ඇත. කාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ ඒ ගුණනම් ආජීවක තෙමේ බහුශ්‍රැතය, මධුරකථා ඇත්තේය, ගණාචාර්ය්‍ය, එසේහෙයින් මහරජ්ජුරුවන් වහන්ස! ඒ නිගණ්ඨාජීවකයා කරා එළඹෙම්හ. ඒ ආජීවක තෙමේ අපගේ සැක දුරුකරන්නේයයි ඒ අලාභ නම් සෙනෙවිරද්දු තමාගේ කුලූපගවූ ඒ ගුණනම් ආජීවකයා රජෝද්‍යානයෙහි වසන්නේය, මොහු දැන් රාජකුලූපග කෙරෙමියි සිතා රජ්ජුරුවන්ට මෙපවත් කිවුය.

එකල්හි අලාත නම් සෙනෙවිරදුන්ගේ බස් අසා අඞ්ගාති නම් රජ්ජුරුවෝ රථාචාර්‍යයාට නියොග කරන්නාහු රථාචාර්‍යය! මිගදය නම්වූ උයනට යනු කැමැත්තමිහ. එසේනෙසින් ආජානීය සෙන්ධවයන් යොදනලද උතුම්වූ රථයක් මේ රාජාඞ්ගණයෙහි ගෙන හැර තබවයි නියොග කළහ. මෙසේ අඞ්ගාති රජ්ජුරුවෝ පසළොස්වක් මැදිපොහෝ දවස් ප්‍රථමයාමයෙහි පිපී කුමුදු මල් ඇති වර්ෂා සාරමස්හි පශ්චිමදිනයවූ ඉල්මස මැදිපොහෝ දවස් අමාත්‍යයන් සන්ථාගාර ශාලාවට රැස්කරවා නුවණැත්තාවූ ශ්‍රවණධාරණයෙන් සමුඛවූ සමිත පුඛිඛමවූ කථා රස ඇති සථානොචිත ප්‍රඥ ඇති විජයය, සුමන, අලාතය යන මේ අමා ත්‍යයන් අතරෙන් එකි එකි අමාත්‍යයක්හු අතින් ප්‍රිය කථා ශ්‍රවණයෙහි අභිප්‍රායෙන් වෙන වෙනම විචාරන්නාහු තොප කැමැති දෙනාගේ අභිප්‍රාවන් වෙන වෙනම මට කියව්. අද පිපී ඇඹුලමල් ඇති ඉල්මස මැදි පොහෝ දවසය, ශුකලපක්ෂ නිශ්‍රිතවූ චන්ද්‍රයාත් නැංගේය. එසේ හෙයින් රාත්‍රාන්ධකාරයත් ඒ චන්ද්‍රයා විසින් නසනලද්දේය, මේ බදුවූ අද මේ රාත්‍රියෙහි කවර ඇල්මකින් යුක්තව වසමෝදැයි විචාළහ. එඞ්ස් අසා අලාත සේනාපතිහු කියන්නෝ දෙවයන් වහන්ස! සේනාව සන්නඞ්කොට යුඞ්කිරීමෙන් සියලු සතුරන් ජයගනුම්හයි කිහ. සුමන සෙනෙවිරද්දු කියන්නෝ රජ්ජුරුවන් වහන්ස! රසමිසවුලෙන් යුක්තවූ ආහාර පානවගි අනුභවකොට පඤ්චකාමය අනුභව කරම්හයි කිවුය, විජය නම් සෙනෙවිරද්දු කියන්නෝ බහුශ්‍රැත ඍෂිකෙනකුන් සවම්පයට ගොස් අප සිතට උපන් සැක දුරුකර ම්හයි කිවුය, ඒ විජය නම් සෙනෙවිරදුන්ගේ බස් අසා මටත් හොපි කිවාමි අභිප්‍රාවින්නේය, ඍෂි කෙනකුන් දැසා අප සිතට උපන් සැක දුරුකරම්හයි අඞ්ගාති නම් රජ්ජුරුවෝ කිහ.

එඞ්ස් අසා අලාත නම් සෙනෙවිරද්දු තුණ නම් ආජීවකයාගේ තුණ කිවුය. එකල්හි රජ්ජුරුවෝ එසේවීනම් තුණ නම් ආජීවකයා දක්නා පිණිස මිගදයට යනු සඳහා රථයානාවක් සරහාගෙන එවයි මෙසේ ඝට කියනලද පරිදි විධාන කළහ. එකල්හි දළමයවූ කොතුරු පේකඬ ඇති රිදීමයවූ වෙහෙරිපත් ඇති පිරිසුදුවූ මටසිලුටුවූ රථ පිරිවරකොට ඇති ධවල බැවින් රාත්‍රියෙහි චන්ද්‍රයා වැනිවූ රථයක් යොදා එළවිය. පවන් හා සමානවූ ජව ඇති මනාව හික්මුණාවූ කරබැඳි රන්මාලා ඇති තලමල් වැනිවූ පැහැ ඇති සෙන්ධව ජාතියෙහි උපන්නාවූ අශ්වයෝ සතරදෙනෙක් ඒ රථයෙහි ගෙන බැඳුන ලද්දාහුය. තවද ඒ රථයෙහි නඟනලද ඡත්‍රයත් ධවලය රථය තෙමේත් ධවලය, රථයෙහි යොදනලද අශ්වයෝත් ධවලයහ. ඒ රථයේ හිඳ සලන්නාවූ වල්ගුනාත් ධවලයහ. වැදුරට වාසිවූ ඒ අඞ්ගාති නම් රජ්ජුරුවෝ අමාත්‍යමණ්ඩලයා හා සමඟ අලඞ්කෘතවූ මෙබඳු රථයේ හිඳ යන්නාහු අහස ගමන්ගත් පුන්සඳක් මෙන් එදවස් වෙසෙසින් බැබියහ. එසේවූ බොහෝවූ පතුළු අඟ් බඳුවූ අග් ඇති කඩුගත්තාවූ ශක්ති සම්පන්නවූ අසුන් නැංගාවූ ප්‍රාඥවූ යොධ පුරුෂයෝ ඒ රාජෙන්ද්‍රවූ අඞ්ගාති නම් රජ්ජුරුවන් අනුව සම්මැට ගෙන ගියහ. එකල්හි ඒ රජ්ජුරුවෝ ඇසිල්ලකින්ම මාගධ්‍ය නම්වූ උදීනයට ගොස් නැගී ගිය රථයානායෙන් බිමට බැස පසින්ම තුණනම් ආජීවකයා සවම්පයට අමාත්‍යයන් හා සමඟ එළඹියහ. ඒ මුවදෙව් නම් උයන්හි පළමුව ගොස් ඔහු හා කථාකෙරෙමින් උන්නාවූ බ්‍රාහ්මණ ගෘහපතීන් හා යම් රාජකුමාර කෙනෙක්වූනම් ඔහු හැමදෙන රජ්ජුරුවන්ගේ සේවකයන් විසින්

උත්සාරණය කොට දුරුවව, හුනස්නෙන් නැඟෙව යනාදීන් අවසාන නොකරනලද, ඒ උතුන භූමියට මහත්වූ පෙරහරින් ආ රජ්ජුරුවෝ ඒ බ්‍රාහ්මණ ගෘහපතින් දැක අප පසුව ආ හෙයින් අපගේම දෙශවේද, එසේහෙයින් තෙපි හැමදෙන නොසෙල්වී හුනස්නේම හිඳුවයි අවසර දුන්හ. මෙසේ ඒ අඛ්‍යාති නම් රජ්ජුරුවෝ නොයෙක් දෙනාගෙන් ව්‍යතිමිශ්‍රවූ පක්ෂීන් පිරිවනලදුව පිළිසඳර කථාකරනු පිණිස එසාත්පස්ව උන්හ.

කෙශේදයන්?

ඒ උයනට හිය ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මොලොක්වූ විසිතුරු ඇතිරි අතුළ සුවපහස් ඇති වස්ත්‍රාස්ථරණ අතුළ මොලොක්වූ බිස්සෙහි ආජීවනයාහට එසාත්පස්ව උන්හ. රජ්ජුරුවෝ මෙසේ විසිතුරුවූ සම්බිස්සෙහිත්තේ හිඳ සතුටුවිය යුතු කථාකළහ ඒ ප්‍රියකථා කොට උන් ඉක්බිති සිහිකටයුතුවූ සුවදුක්කථාකරන්නාහු වහන්ස! කිමෙක්ද? නුඹගේ ශරීරය සතර ඉසයෙන් පෙළෙන්නේද? ශරීරයෙහි වාතයන්ගේ විෂමවිසෙක් නැද්ද? ඒ ඒ ස්ථානයෙහි මුළුමුළුව ගිට වාතයෝ නුඹගේ ශරීරය නොපෙළාද? කිමෙක්ද? නුඹගේ ජීවිකාවෘත්තිය නිදුකින් වේද? යැපෙන පමණ අහර ලැබේද? ඉරියව් පෙළෙන බලවත්වූ රොගයෙක් නැද්ද? නුඹගේ ඇස් නොපිරිහිණිදැයි රජ්ජුරුවෝ මෙයේ සුවදුක් විචාළහ. ඉක්බිත්තෙන් ගුණ නම් ආජීවකයා රජ්ජුරුවන් හා සමඟ කථාකරන්නේ මහරජ්ජුරුවෙනි! එසේය මාගේ ශරීරය සතරපසයෙන් නොපෙළෙන්නේය. වාතයන්ගේ විෂම වෙළීමක් නැත්තේය. නිදුක්වූ ජීවිකාවෘත්ති ඇත්තෙමි. කෙණෙහි අහරින් යැපෙමි. විෂමව පෙළෙන වාත රොගකුත් නැත. ජීවිකාවෘත්තියත් නිදුකින්ම වන්නේය. යැපෙන පමණ ආහාරත් ලැබෙයි. ඉරියව් පෙළෙන රොගයෙකුත් නැත. වයඋරුදිවූ ඉන්ද්‍රියයෝත් නොපිරිහුණහයි මෙසේ ඒ ගුණ න ආජීවක තෙමේ ආචාර්‍ය්‍ය ත්වයෙහි ඇලුම් ඇත්තාවූ ඒ අඛ්‍යාති නම් රජ්ජුරුවන් හා සමඟ ප්‍රියකථායෙන් සතුටුව නැවත පිළිසඳර කථා කරන්නේ වැදෑරට වාසිවූ අඛ්‍යාති නම් රජ්ජුරුවෙනි! තොප අතින් විවාරමි. කිමෙක්ද? පසල්දනවූ වාසිහු ගොප මැඬ නොපවත්වද්ද? තොපගේ යෙදිය යුතුවූ ගව මහිෂාදීන්ට රොග නැද්ද? හස්ත්‍යශ්වාදීවූ වාහනයෝ උසුලද්ද? කිමෙක්ද? තොපගේ ශරීරයට පීඩාකරන්නාවූ බලවත්වූ ව්‍යාධියෙක් නැද්දැයි විවාළේය. එකල්හි කුශලධර්මයන් කැමැත්තාවූ රාජොත්තමවූ ඒ අඛ්‍යාති නම් රජ්ජුරුවෝ ගුණ නම් ආජීවකයාට්සින් නැවත පිළිසඳර කථාකරනලද්දේ ඊට අනතුරුව පාලි අර්‍ථ හා ලෙහලෞකික පාරලෞකික අර්‍ථද, පාලිධර්මය හා දශකුශලධර්මයද, කාරණා යුක්තියද මේ මතු කියන පරිදෙන් විවාළහ. සාශ්‍යප ගොත්‍රයෙහි උපන්නාවූ ගුණාජීවකයෙනි! මේ ලොකයෙහි සත්වයෝ දෙමව්පියන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? අනුශාසිකවූ ආචාර්‍ය්‍යයන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? පුත්‍ර දාරාවන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? ඥාතිවර්ධයන් වයෝවර්ධයන් තපොවර්ධයන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? සේනාව කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? දනවු වාසීන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිරෙද්ද? මේ සියල්ලවුන් කෙරෙහි කෙසේ දැහැමින් හැසිර සත්වයෝ පරලෝ සම්ප්‍රාප්තවූ සුගතියට යෙද්ද? අධර්ම සමාදානයෙහි පිහිටියාවූ සමහර සත්ව කෙනෙක් නරකය හා අවශෙෂ අපායයන්හි අධඃ ශීර්ෂව කෙසේ හෙද්ද? මට මෙයවූ පරිද්දෙන්

කියා ඇහුවයි කීහ. ලොවුතුරා බුදුන් පසේබුදුන් බුදුස්විවන් මහබොධිසත්ව යන් අතරෙන් පුළුපුළුවූ මහතුන් නුපන් කල්හි පශ්චිම පශ්චිමවූ මහතුන් අතින් විවාළයුතුවූ මහානුභාව සම්පන්නවූ මේ ප්‍රශ්නය රජ්ජුරුවෝ කිසිවක් නොදන්නාවූ නග්නභාවය අනුභව කරන්නාවූ නීශ්‍රීක වූ නාලකඤ්ඤිවූ අඥ්‍යාවූ සිත කිසිත් ගුණයක් නැත්තාවූ නමින් ගුණනම්වූ ආජීවකයා අතින් විවාළහ. මෙසේ රජ්ජුරුවන් විසින් විවාරනලද්දවූ ප්‍රශ්නය ඒ ගුණ නම් පවිටු නිවටා ප්‍රඥාවට සුදුසුවූ විසඥ්ජනයක් නොකොට සමණ තණ කන්නාවූ ගොනකු නොලු පිටින් ගසා ඉවත් කරන්නාවූ මොළ ගොනකු මෙන්ද, අනුභව කරන්නට පුරා එළවූ බත්පලියක කසළ ලන්නාක්හු මෙන්ද, අසව මහ රජ්ජුරුවෙනි! කියා අවකාශ කරවාගෙන තමාගේ මිථ්‍යාවාදයට පවන් ගත්තේය.

ඒ කෙසේදයන්?

•මහරජ්ජුරුවෙනි! මාගේ සැබෑවූ අතුවඡවූ කාරණය තත්වූ පරිද්දෙන් අසවයි අවසර ගෙන කියන්නේ රජ්ජුරුවෙනි! කරන ලද්දවූ කලණවූ හෝ පවිටුවූ හෝ කුශලාකුශල ධර්මයාගේ ඉෂ්ටානිෂ්ට විපාකයෙක් නැත. පරලොව කුත් නැත. පරලොව නැති හෙයින්ම පරලොවින් මෙලොවට ආයේ කවරේද? මෙලොවට ආ එකකුත් නැත. මහරජ්ජුරුවෙනි! සත්‍රී පුරුෂවූ මුතුන් මිත්තෝත් නැත. ඔවුන් නැති හෙයින් මවුපියෝ කොයින්ද? අනුශාසකාචාර්‍යවරයෝද නැත. ඔවුන් නැති හෙයින් අවවාද අනුශාසනායෙන් නොදැමුණාවූ සත්වයන් කවරෙක් දමනයෙහි ලාද? මේ ලොකයෙහි සත්වයෝ විශෙෂයෙන්ම සමයහ. හීන මධ්‍යමොත්කෘෂ්ටය යන විභාගයෙක් නැත. එසේ හෙයින් කුලදෙටුවන් පුදන්නාහු නැත. බලයෙක්වත් වීර්‍යයෙක්වත් සත්වයන්ට නැත. එසේ හෙයින් උත්ථාන වීර්‍යයෙන් යුක්තාවූ පුරුෂාකාරයෙක් කොයින්ද? එබඳුවූ පුරුෂාකාරයෙක් නැත්මය. නැවත අනුව යන්නාවූ ගැල්වත යම්සේද එපරිද්දෙන්ම සත්වයෝ නියම අනුව පවත්නාහ. අතරෙහි කුශලයෙන් පිරිහිදුවීමක් නැතිව චතුරාශීතිකල්ප ප්‍රමාණවූ කාලයක්ම අනුව පවත්නාහ. තවද මහරජ්ජුරුවෙනි! මේ ලොකවාසී සත්වයා තමා විසින් ලද්දා වූ සැපදුක් විඳින්නේය. එසේ ලැබෙන සැප දුක්වලයෙහි විපාකයෙක් කොයින්ද? විපාකයෙක් නැත. දුනවලයෙහි විපාකයෙක් නැති කල්හි දන් දෙන්නාවූ සත්වතෙම තමා වසඟව දන් දෙන්නේ නොවෙයි. තමා ශක්තියෙනුත් දන් දෙන්නේ නොවෙයි. වැළි කුමක් නිසා දන්දේද යත්? දුන ඵලය ඇතැයි යන බයින් දන් දෙන්නාවූ අඥබාල පාප ජනයන් දැක මෙහි දුන විපාකයෙක් ඇද්දෝහෝයි සිතා දන්දෙන බවමුත් නොවේ තමාට වසඟව තමාගේ ශක්තීන් අදහා දෙන්නේ නොවෙයි. අන්නපානාදිවූ දුනය දියයුතුයයි පනවනලද්ද නුවණැත්තවුන් විසින් පිළිගන්නාලද්ද එසේ හෙයින් තමා වසඟයෙහි නොපවත්නාහු නුවණැත්තම්හයි මානියාව සිතන්නාවූ සමහර අඥාන සත්වතෙනෙක් පණ්ඩිතයන්ට දන් දෙන්නාහුය.

මෙසේ දුනයෙහි නිෂ්ඵල බව වර්ණනාකොට පාපයෙහි නිෂ්ඵල බව වර්ණනා කරන ලද්දාවූ කාරණා කියන්නේ මහරජ්ජුරුවෙනි! ශාස්වතවූ වස්තුමානවූ මේ සත්වනිකායෝ සත්දෙනෙක, ඔහු කවරහුද? ආපොධාතුවය, තෙජෝධාතුවය, වායොධාතුවය, පඨවීධාතුවය, සුඛය, දුක්ඛය, ජීවය, යන සප්ත සමූ

හයෝ කිසිවක්හු විසින් ශාස්ත්‍රාදියෙන් නොකැපිය හැක්කාහ. බුද්ගරුදි කිසිවකින් කොපායකොට තැළිය නොහැක්කාහ. මේ ව්‍යක්තප්‍රකාරවූ සත්ව සමූහයන් නසන්නෙක් නැද්ද, ඒ සත්වසමූහයන් නසන්නෙක්වත් දන්නෙක්වත් නැද්ද, නැවත යමෙක් නසනු ලැබේනම් එබඳුවූ කිසිවෙක් නැද්දැ, මෙබඳුවූ සත්වසමූහයන්ගේ විනාශය පිණිස කිසිවෙක් ශස්ත්‍රාදියක් එවුයේවි නම් ඒ ශස්ත්‍රයෝ සත්වසමූහයන්ගේ අතරේ ඉක්ම යන්නාහ. පෘථිවිධාත්වාදි වූවාවූ තමන් තමන්ගේ විෂයට වන්නාල්හි ගැසූ ශස්ත්‍රාදි ප්‍රහාරයන් සිස්ව (ඉක්මී) යන්නේය. යම් සත්වයෙක් මෙරමාහේ ඉස අල්වා ගෙන තීක්ෂණවූ බඹඹ පත්‍රයෙන් කපන්නේ වී නම් ඒ සත්වයාට ඒ ශරීරයන් කැපිය නොහෙන්නේය. එසේ ඉස් කැපිය නොහෙන කල අකුශලයෙහි විපාකයෙක් නොඇත්ද, පෘථිවිධාතුව පොළොවට වැදයන්නේය. අපෝ ධාතුව ජලයට වැදයන්නේය. තෙජෝධාතුව වහ්නියට වැද යන්නේය. වායෝධාතුව පවනට වැද යන්නේය. සුඛය, දුක්ඛය; ජීවය, යන තුන්දෙන අහසට පැන නැහෙයි. එළවූ ශස්ත්‍රාදිය (ශරීරයටවැදුනොදී) සිස්ව නැගී යන්නේය. එසේ හෙයින් ශස්ත්‍රාදීන් කිසිවන්හට විනාශයක් නැත්තේයයි. මේ කාරණයෙන් අකුශලවිපාක නැතැයිගනුව, නවද මහරජ්ජුරුවෙනි! මේ සියලු සත්වයෝ මේපොළොව එකමස්කලවිටක් නොවත් චතුරාශීති කල්ප ප්‍රමාණවූ මෙතෙක්කල් මුළුල්ලෙහි සසර ඇවිදිනාහුම සසරදුකින් මිදෙන්නා . සංසාරය හැර සත්වයන් ශුද්ධකරන්නට සමර්ථවූ අන්කිසිවෙක් නැත. මහාමේඝයනම් ඒ සසරින් ශුද්ධව දුකින් මිදී නිවන් දක්නාහ ව්‍යක්තප්‍රකාරවූ ඒ සුවාසූ කල්පය අසම්ප්‍රාප්ත කල්හි සීලසංයමයෙන් යුක්තව පිරිසුදුවූ සිල් රැක් කේවිනඹුන් අතරෙහි ශුද්ධව දුකින් නොමිදෙන්නේය. දෘෂ්ටාදි වශයෙන් බොහෝවූ දෘෂ්ටකුශලධර්මයෙහි හැසිරන් කියනලද මේසුවාසූකප අසම්පූර්ණ කල්හි ශුද්ධව දුකින් නොමිදෙන්නේය. තවද ප්‍රාණඝාතාදි වශයෙන් බොහෝවූ දෘෂ්ටකුශලධර්මය කළත් ඒ චතුරාශීති මහා කල්පය ඉක්ම නොපවත්නේය. මේ ලොකවාසී සත්වයෝ දානසීලාදි අනෙකප්‍රකාර කුශලකර්මයෙහි නියුක්ත වූවාහු වීනමුත් සුවාසූ කප සම්පූර්ණ නොවීනම් ඒ තාක්කල් ශුද්ධ නොවන්නාහ. ජීවිතාන්තය දක්වා ප්‍රාණවධාදිවූ නොයෙක් අකුසල්කළාත් නියමිතවූ ඒ කාලය ඉක්ම නොපැවත සුවාසූකල්පය සම්පූර්ණවූ තැනදීම ශුද්ධවන්නාහ. සුවාසූවන කල්පයෙහිදී අපගේ සංසාරශුද්ධිය ක්‍රමයෙන්ම වන්නේය. ආදියෙහි පටන් ඒ කල්පාන්තය දක්වා අතරෙහි විශේෂදයක් නොව මෙය පිළිවෙළින් වන්නේය. එපමණ කලක් ඉක්මුණු කල මුත් අතරෙහි ශුද්ධව සසරින් මිදී නිවන් දැකීමෙක් නම් නොවන්නේය. වෙරළ ඉක්ම නොවත්නාවූ සාගරය මෙන් චතුරාශීති මහාකල්පය ඉක්ම නොපවතී. එහෙනදී ශුද්ධව සසරින් මිදී නිවන් දකුම්හයි කීය. මෙසේ ගුණ නම ආජීවකයා සුවාසූ කපකින් ඔබ්බට නොයමිහයි ගත් බලවත් මිථ්‍යාදෘෂ්ටි ඇති හෙයින් උවේඛදවාදී වූයේ තමාගේ ශක්තියෙන් සඛකියවූ වාදය නිරවශේෂ කොට කිවුය.

එකල්හි කාශ්‍යපගොත්‍රයෙහි උපන්නාවූ ගුණ නම් පවිටු නිවටාගේ මේ තෙපුල් අසා අලාත නම් සෙනාපතිතෙමේ ක්‍රියන්නේ පින්වත්වූ ආජීවකයෙනි! තෙපි යම් ලෙසක් කිවු නම් මටත් එයම අනිප්‍රා වන්නේය. මමත් මා ඇවිදින්නාවූ පූජිජාති සිඟි කෙරෙමි. මම වූකලී පෙර දරුණුවූ ගෙරිල් මරු ජීවත්වන්නාවූ පිඹගල නම් මානවකයෙක් වීමි. එකල වස්ත්‍රාභරණ ධන

ධාන්‍යාදියෙන් පිරුණාවූ මේ බරණැස් නුවරදීම් මං විසින් බොහෝ පවුකම් කරණලදහ. උරෝය,එළුවෝය,යනාදී නොයෙක්ප්‍රාණීහිංසාවිසින් මරනලදහ බොහෝප්‍රාණීන්මරා ජීවත්ව ජීවිතාන්තයෙහි බරණැස්නුවරින්චුතවූයෙමේමේ මියුලුනුවර ධනධාන්‍යයෙන් සමෘද්ධවූ සෙනෙවිරත් කුලයෙහි උපන්මි. ගිය ජාතියෙහි දරුණු පවුකම් කෘත්‍රවූ මම යම් හෙයකින් නරකයට නොගියෙවිද එසේ හෙයින් අකුශලයෙහි විපාක නැතැයි අදහම් කිය. ඒ අලාත නම් සෙනාපතිතෙමේ කාශ්‍යපසම්බුදුරජාණන්වහන්සේගේ ධාතු පිහිටුවා කරනලද සන රන්දාගැබට අතොජාමල්දම්වින් පූජාකොට මිය යන වේලෙහි පාපානුභාව යවූ පරිදීදෙන් අන්‍යවූ අකුශල කර්මයකින් දමනලදුව සංසාරසාගරයෙහි ඇවිදින්නේ ගොඝාතකකුලයෙහි ඉපද බොහෝවූ පවුකෙළේය. ඉක්බිත්තෙන් ඕහට මරණාසන්න කාලයෙහි අළුයෙන් සැහවී තුබූ ගිනිපුපුරක් මෙන් මේ තෙක් කල් මුළුල්ලෙහි සැහවී සිටියාවූ ඒ කුශල කර්මය අවසර දුන්නේය. ඒ සෙනාපතිතෙමේ දාගැබට අතොජාමල්දම්වින් කරන ලද පූජාසඞ්ඛ්‍යාවූ කුශලානුභාවයෙන් මේ සෙනෙවිරත්කුලයෙහි ඉපද මහත්වූ ශ්‍රී විභූතියට පැමිණියේය. ජාතිසමරණඥානයෙන් සිහිකරන්නේ මේඅත් බවටපළමුඅත් බැවින් මත්තෙහි සිහිකරන්නට අසමර්ථවූයේ ගොඝාතක කර්මය කොට මෙහි උපන්මියන සංඥායෙන් ගුණනම් ආජීවකයාගේ මිථ්‍යාවාදයටවහල්ව පින්වත්වූආජීවකයෙනි! තෙපි යමක් කිවු නම් ඒ මටත් ප්‍රියවන්නේය. යනාදී මේ තෙපුල් කියේය.

ඉක්බිත්තෙන් ඒ මිථිලා නම් රාජධානියෙහි දිළිඳුවූ බැගෑවූ බිජක නම් දාසයෙක් විය. ඒ තෙමේ පේවස් වසන්නේ ගුණ නම් නිවටා සමීපයට එක්තරා අවවාදයක් අසණ පිණිසගියේය. එකලඒ දාසයාකාශ්‍යපබුදුරජාණන් ගුණ නම් ආජීවකයාගේත් අලාත සෙනාපතිහුගේත්වූකතාප්‍රකාර තෙපුල්අසා එතෙණෙහි සිහිසුන්ලන්නේ අඩමින් කඳුළු පෙරීය. එකල්හි අඩගාති නම් රජ්ජුරුවෝ අඬන්නාවූ බිජක නම් දාසයා දැක විචාරන්නාහු සබඳ! තා කුමක් නිසා නියඬුරුහුරු ලෙස් අඬන්නෙහිද? තා විසින් කුමක් අසන ලදද? කුමක් දක්නාලදද? කායික චෛතසිකවූ කවර දුකඬ වෙදනාවකට පැමිණියෙහිද? අඬන්නාවූ කාරණය මට කියාලවයි කිය. එසද අඩගාති නම් රජ්ජුරුවන්ගේ වචනය අසා බිජක නම් දාසයා කියන්නේ මහරජ්ජුරුවන් වහන්ස! මට කායික චෛතසික දුකඬවෙදනායෙක් නැත. මාගේ තෙපුල් ඇසුව මැනව. මම වූකලී පූර්ජාතියෙහි විඳිමින් උන් සැපයක් සිහිකෙරෙමි. මම පෙර සාකෙත නම් නුවර දානසීලාදියෙහි ඇලුණාවූ අසූසොළක් ධනඇති භාවනම් සිටුපුත්‍රයෙක් විමි. ඒ ජාතියෙහි දාන සංවිභාගයෙහි ඇලුම් ඇත්තේවූයෙමි. පිරිසුදුවූ කාය වාක් මනඃ කර්මයෙන් බබුණන් හා හොඳින් විසින් සමඟාවිනවූයෙමි. පූජ්‍යවූයෙමි. මා විසින් කරනලද සුළුපමාණවූ අකුශල කර්මයෙකුත් නැත. රජ්ජුරුවන් වහන්ස! එතකුදුවුවත් මම ඒ ජාතියෙන් චුතව මේ මියුලුනුවර දිළිඳුවූ බැගෑවූ දාසියගෙ කුස උපන්මි. යම්තැනෙක උපන්නෙමිද, එමඋපන් තැනම ඉහාදිළිඳුව දුකසේ ජීවත්වෙමි මෙසේ දිළිඳුවූයෙමි මි නම්මුත් කාය වාක් මනඃ යන තුනම සමකොට පැවත්වීමෙහි පිහිටියෙහි. එකලයමෙක්මාගෙන්ආහාරාදි කිසිවක්කැමැත්තේ නිනම්හිමට මාකෙන බත්දෙකොටයක්කොට් එක්කොටයක් ශුඬවූ වෙතනායෙන් දුනිමි. තුදුස්වක් පොහොයෙහිත් පස ලොස්වක් පොහොයෙහිත් හැමකල්හිම පෙහෙවස්

විසූයෙමි. තවදසඬියන්ටපිඩාවකුත් නොතෙළමි. සොරසාමුත් දුරුකෙළෙමි අලාත නම් සෙනෙවිරදුන්වහන්සේ යම් අකුශල කර්මයෙක නිෂ්ඵලබව කීසේක්ද, මමත් (ඒ සෙනෙවිරදුන් වහන්සේගේ බස්අසා)මනාකොට පුරාදුසළාවූ චුක්තප්‍රකාර දානාදිවූ කුශලකර්මයිගල්ලම නිෂ්ඵල වන්නේයයිහගිමි. මහරජ්ජුරුවන් වහන්ස! මා විසූ පෙනෙවසුත් ප්‍රයොජන නැතැයි සිතමි. එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස! දුනෙළ්‍රියෙහි නොහික්මුණාවූ දුසොරඩකුමෙන් මම එකානතයෙන්මේ පරාජයක්ම ගත්මි. භික්මුණාවූ ලිහිණි වැද්දකුමෙන් අලාත නම් සෙනෙවිරදුන්වහන්සේ සමය නිෂ්ඵලබැවින් ජයගත්සේක. මහරජ්ජුරුවන් වහන්ස! යම් උපායකින් සුගතියට යෙමි නම් එසේවූ උපායක් දන් මම නොදක්මි. මේ ගුණ ජීවකයන්ගේ බස් අසා කුශලකර්මයෙහි විපාකනැතැයි දත්තෙමිද, එසේහෙයින් දැන් මම හඩමි කියා. ඒ බීජක නම් දුසයා වූකලී කාශ්‍යප සම්බුදුයන් වහන්සේ සමයෙහි වල ගිය ගොනකු සොයන්නේ මංමුළාවූ එක් භික්ෂුකෙනකුන්වහන්සේ විසින් මහ විවාළතල්හි මූවෙන් නොබැණසිට නැවතාද උන්වහන්සේ විසින් මහ විවාරනාලද්දේ කිපි ශ්‍රමණ සොල්ලෝ නම් මූඛරියෝවේද, (තාපසයකු විය යුතුය) ශ්‍රමණවූ හෙයින් වේද, හා අතිමූ රිවූයේයයි කීය. ඒ අකුශලකර්මය එසමයෙහි විපාකනොදී අළුයෙන් සැඟවුණාවූ ගිනිපුපුරක් මෙන් මරණාසන්න කාලයෙහි අන් කර්මයක් එළඹිය. ඒ කර්මයවූ පරිද්දෙන් ඒ පුරුෂතෙමේ සසර ඇවිදින්නේ කුසල්වූ එම කර්මයෙන් චුක්තප්‍රකාරවූ සිටුපුත්‍රව ඉපිද දානාදිවූ පින්කම් කෙළේය. ඔහු ඒ සිටුපුත්‍රව කළාවූ කුශලකර්මය වූසාලි පාපිච්චියෙන් සැඟවුණාවූ නිධානයක් මෙන් සිටියේ අවසරයක් ලැබ මතු විපාක දෙන්නේය. භික්ෂූන්වහන්සේට ආක්‍රොශ කරන්නාවූ ඔහු විසින් කළ යම් අකුශල කර්මයෙක් ඇත්නම් ඒ අකුශල කර්මය ඕහට මෙකියන (දුසව උපන්) ආත්මභාවයෙහි විපාක දිණ. ඒ බීජකයා ජාතිසම්භරණ ඥානයෙන් නත්වූ පරිද්දෙන් සිහිකොටගත නොහී. අන්‍යවූ අකුශලකර්මී විපාකයෙන් කෙල්ල බඩ උපන්මි යනු නොදැන "දානාදිවූ සුචරිතයෙහි විපාක නැත" යනාදිවූ මේ කාරණා කීයේය.

ඉක්බිත්තෙන් ගුණ නම් නිවටාගේ හා අලාත නම් සෙනාපතිහුගේ බස් අසූ අනතුරුව බීජක නම් දුසයාගේද බස් අසා දැඩිකොට මිථ්‍යාදෘෂ්ටි ගෙන අඩ්‍යානි රජ්ජුරුවෝ කියන්නෝ දිව්‍යලොකොත්පත්තියට උපායෙක් නැත. එසේ හෙයින් චතුරාශීති කල්ප ප්‍රමාණවූ කාලයම බල, ඒ කල්පයම සඬ්ඛයන් ශුඛකරන්නේය. සැපයෙක් වත් දුකෙක් වත් ඇත්නම් එය නියත සඛ්‍යාතවූ චතුරාශීති කල්ප ප්‍රමාණ කාලය මුළුල්ලෙහිම ලැබේවි, එසේ හෙයින් බීජකය! අප හැමදෙනාට සංසාරයෙන්මේ ශුඛිය වන්නේය. නියතවූ ඒ සුවාසූ තප නොදැමිණි කල්හි අතරතුරෙහි දිව්‍යලොකයට යමි. නෝ ඉක්මින් නොව, මමත් ප්‍රථියෙහි ශකනිවත්තවූයෙම් බමුණන් හා ගොවීන්ට අත් පා මෙහෙවර කිරීම් වැඳීම් පිදීම් ආදීවූ උපස්ථානයෙහි නියුක්තවූයෙමේ මිනිසුවය සථානයෙහිද රාජ්‍යභාරයතු විචාරන්නෙම් අධිකරණයෙහිද යුක්තිබණන්නෙම් ඒ කාර්‍යයෙහි නියුක්තවූ එතෙක් කල් මුළුල්ලෙහි උතුම්වූ පඤ්ච කාමරතියෙන් පිරිහුණෙමිසි මෙසේ බීජක නම් දුසයාගේ බසට අනුව බස් කීහ. මෙසේද කියා වහන්ස කාශ්‍යපයෙනි! අපි මෙතෙක් කල් මුළුල්ලෙහි ප්‍රමාදව උනුම්හ. දැන් වූකලී ආචාර්‍යී කෙනෙක් ලබ්ධ ලද්දෙමු. මෙතැන් පටන් කාමරතියම අනුභව කරම්හ. එසේ හෙයින් නුඹවහන්සේ සඬ්ඝ

මෙහි සිටීමෙන් අපට ප්‍රයෝජන වන්නේය. එසේ හෙයින් නුඹ සිටිනු මැනව, අපි යම්හයි කියන්නාවූ රජ්ජුරුවෝ වහන්ස! යන එන අතරමහදී ඉඳින් අප දෙදෙනාගේ එක්වීමෙක් වීනම් එහැනදී නැවතත් දක්නට් වේද, ඉඳින් එසේ අතරමහදී දැක්මෙක් නොවීනම් (තෙක පතහා) බුදු දුක්වීව ඊමෙන් අපට වන කුසල ඵලය නවරේදැයි කීහ. මෙසේ කියා අඛ්‍යාති නම් රජ්ජුරුවෝ රථයට පැනනැගි තමන්ගේ භවනයවූ **වඤ්ඤක** නම් ප්‍රාසාදතලය ටම පෙරළා ගියහ. පළමු මහත්වූ පෙරහරින් ගුණාජීවකයා සමීපයට ගිය රජ්ජුරුවෝ ඔහු වැඳලා ගිය ප්‍රශ්න විචාළහ. පෙරළා යන තැනැත්තෝ වුකලි නොවැඳුම් ගියහ. ගුණාජීවකයා තමාගේ ගුගුණ කී බැවින් රජ්ජුරුවන් ගෙන් වැඳීම් පමණකුත් නොලැබ ආහාරාදීවූ සත්කාරයක් කුමකැයි ලබාද, නොලද්දේමය. රජ්ජුරුවෝත් ඒ රාත්‍රිය ඉකුත්කොට දෙවන දවස් අමාත්‍යයන් රැස්කරවා මට පඤ්චකාම ගුණය එළවව්, මම මෙතැන් පටන් පඤ්චකාම සැපයම අනුභව කෙරෙමි. අනික් රාජකටයුත්තෙක් නාකිය යුතුය. රාජකටයුතු අසවල් අසවල් අමාත්‍යයා කෙරේවයි කියා විධානකොට තුමූ පඤ්චකාමය අනුභව කිරීමෙහිම නිරතවූහ. බඹුණු ගැහැවියන්ට අත් පා මෙහෙකිරීම් ආදීවූ කිසි කායික්‍යයෙක්හි ව්‍යාවෘත නොවූහ.

ඒ අඛ්‍යාති නම් රජ්ජුරුවෝ පඤ්චකාමයෙහි ඇලුණු තැන් පටන් තුදුස් දවසක් ගියකල රජ්ජුරුවන්ගේ ළෙහි ද දරුවූ ප්‍රියවූ **රුජා** නම් රජ කුමාරිකාවෝ පියරජ්ජුරුවන් සමීපයට යනු කැමැතිව කිරිමවුට කියන්නාහු සෙට පසළොස්වක් පොහෝ දවසය, එසේහෙයින් වැදුරට වාසිනිව රිශවරවූ මාගේ පියරජ්ජුරුවන් වහන්සේ සමීපයට යනු කැමැත්තෙමි. මා යුහුවිසි ඝෝහරණයෙන් සරහව, මාගේ යෙහෙලිවූ පන්සියයක් කුමාරිකාවරුනුත් නානාවණ් පුෂ්පවස්ත්‍රාභරණයෙන් ඔවුනොවුන් සරහව, මාගේ පන්සියයක් පරිවාර කුමාරිකාවනුත් නානාවණ් පුෂ්ප වස්ත්‍රාදීන් ඔවුනොවුන් සමනොකොට සරහවසි කිවුය. එකල්හි රුජා නම් රාජකන්‍යාවට වමපත නවමාලිකාදීවූ අනෙකප්‍රකාර සුගන්ධ කුසුමයන් හා මාහැගිවූ සදුන් විලවුන් හා මුතු මැණික් ආදියෙන් විශෙෂ කාට කරනලද ආභරණ හා සෙසු බොහෝ රන් රුවන් හා නොයෙක් පැහැයෙන් යුත් පිළී ඒ කුමාරිකාව සුවඳ පැනින් නහා සැරහෙන පිණිස එළවූහ. සිත්කලුවූ ශරීරවණ් ඇති ඒ රුජා නම් රාජ කන්‍යාව බොහෝ පරිවාර සත්‍රීන් පිරිවරා සවණ්මයවූ හද්‍රපීඨයෙහි උන් කල්හි දිව්‍යප්සරාවන් පිරිවැරූ **සුජාතා** නම් අසුර කන්‍යාව මෙන් විශෙෂයෙන් බැබළියහ. පෙර ඒ රුජා නම් රාජකුමාරිකාවෝ තුදුස්වක් පොහොයෙහි පන්සියයක් කුමාරිකාවරුන් විසින් පිරිවරන ලදුව කිරිමවු සමූහයා කැඳවා ගෙන මහත්වූ ශ්‍රී විලාසයෙන් සත්මාලක් ඇති **රතිවඩ්ඪන** නම් ප්‍රාසාදයෙන් බැස පියරජ්ජුරුවන් දක්නා සඳහා වඤ්ඤක නම් ප්‍රාසාදයට ගන්නාහ. එකල පියරජ්ජුරුවෝ කුමාරිකාවන් දැක සතුටුවූ සිත්ඇතිව සත්කාර සම්මානකොට යවන්නාහු දුවණියෙනි! දන් දෙවයි කියා දහසක් දී යවන්නාහ. ඒ රාජ කුමාරිකාවෝ ඒ දහස ගෙන තමන්ගේ ප්‍රාසාදයට හොස්දෙවිවා දවස් පෙහෙවස් වැස දුගී මගී යාචකයන් හා ගුණ කියා ඉල්වන වැඳිහට්ටයන් ආදීවූ නුවර සියලු යාචකයන්ට මහදන් දෙන්නාහ. රජ්ජුරුවන් විසින් ඒ කුමාරිකාවන්ට එක් ජනපදයකුත් දෙනලද්දේය. ඒ ජනපදයෙන් ලත් අය පඬුරින් දන්පින් ආදීවූ සියලු කාය්‍යකරන්නාහ. එදවස් වුකලි රජ්ජුරුවන්

වහන්සේ විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නාලදින් සියලු නුවර කොලාහල විය. රාජාවන්ගේ සිරිමඟුල් එපවත් අසා ගොස් කියන්නි ආර්‍යාවන් වහන්ස! නුඹ වහන්සේගේ පියරජ්ජුරුවන් වහන්සේ ගුණාජීවකයාගේ කථා අසා මිථ්‍යා දෘෂ්ටි ගත්සේක. උන්වහන්සේ සහර වාසල්දෙර දන්හල් බිඳවා අනුන් අයිතිවූ සත්‍රීන් හා කුමාරිකාවරුන් බලාත්කාරයෙන් ගෙන්වනසේක. රාජ්‍යය නොවිචාරනසේක. කාමයෙන් මත්වූසේකැයි කිවය. ඒ රාජා නම් රාජකුමාරිකාවෝ කිරිමඟුල් කි මේ බස් අසා නොඅතුටුවූ සිත් ඇතිව මහියාණන් වහන්සේ මෙබඳුවූ පහවූ කුශලධර්මයන්. ඇති නිර්ලජ්ජීවූ නග්නභාවය අනුභව කරත්නාවූ සිහ කිසිත් ගුණයක් නැති ගුණනම් නිවටා කරු ගොස් ප්‍රශ්න විචාරනසේක. ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මයණයන් හා කම් හා කම්පල ඇතැයි කියන්නාවූ ධර්මවාදීන් කරු ගොස් විචාළභාල නපුරුද, එසේහෙයින් මුන්වහන්සේ ඉතා අඥානසේක. දැන් වූකලි මා ඇර අනික් කෙනෙක් මහියාණන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටීන් ගලවා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවන්නට සමර්ථයෝ නැත. මම වූකලි අතීතයෙන් සත්ජාතියක් හා අනාගතයෙන් සත්ජාතියකැයි මෙසේ තුදුස් ජාතියක් ජාතිසමරණඥානයෙන් සිහි කෙරෙමි. එසේහෙයින් පෙර මාවිසින් කළ පාපකර්ම කියා අකුශල ඵලය මහියාණන් වහන්සේට දක්වමි. ඉදින් අදම හියෙම් වීම්නම් එකල්හි මහියාණන් වහන්සේ මැනියෙනි! පෙර දෙපෝයෙන් දෙපෝයට මා සන්නිපයට එන්නෙහිය. අද වූකලි කුමක් නිසා යුහුව අවුදැ?සි කියනසේක. එතැන්හිදී ඉදින් මම නුඹවහන්සේ විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නාලදැයි යනු අසා ආමි, කියෙම් වීම් නම් මාගේ බස් ගරුකොට නොගන්නාසේක. එසේහෙයින් අද නොගොස් අදට තුදුස්වැනි දවස් අවතුදුස්වක් දින කිසිවක් නොදන්නියහ මෙන් පෙර යන සැටියෙන්ම ගොස් එනවේලෙහි දන්දෙන පිණිස දහසක් ඉල්වමි. එවිට මාගේ පියාණන් වහන්සේ මිථ්‍යාදෘෂ්ටි ගත් නියාව කියනසේක. එකල මම උන්වහන්සේට මාගේ බලයෙන් නොයෙක්කාරණා කියා මිථ්‍යාදෘෂ්ටි අරවමියි සිතුහ. එසේ සිතා තුදුස්වැනි දවස් පියාණන් සන්නිපයට යනු කැමැතිව තමන්ගේ යෙහෙලිවූ පන්සියයක් කුමාරිකාවරුන් හැමදෙනම අනෙක ප්‍රකාරවූ නොයෙක් ආභරණයෙන් හා නොයෙක් පැහැ ඇති පුෂ්පවස්ත්‍ර සුගන්ධානුලේපනයෙන් එක්කෙනකුන් එක්කෙනකුන් හා සමනොකොට වෙන වෙනම විශේෂකොට සැරහිගෙන එන්නට කියා ඒ රාජා නම් රාජ කුමාරිකාවෝ ගොස් සුවඳපැන් සොළොස් කළයකින් නහා සර්වාභරණයෙන් සැරහි පියරජ්ජුරුවන් සන්නිපයට දන්දෙනු පිණිස දහසක් වසතු ඉල්වාගෙණ එන්නට ගොස් චන්ද්‍රක නම්වූ ප්‍රාසාදයේ මතුමහල් තලයට මෙඝ ගර්ජියක් ඇතුළුව වන්නාවූ සියරැළි විදුලියක් මෙන් සර්වාභරණයෙන් සැරහුණාවූ පන්සියයක් යෙහෙලියන් හා සමග වන්නාහුය.

මෙසේ පියරජ්ජුරුවන් සන්නිපයට ගොස් ආවාර විනයෙහි ඇලුණාවූ ඒ රාජා නම් කුමාරිකාවෝ රජ්ජුරුවන්ට නමස්කාර කොට සප්තාරතනයෙන් විචිත්‍රවූ සර්ණිමයවූ හද්‍රපීඨයෙන්හි එකත්පස්ව උන්හ. එකල වැදූරටවාසිවූ අර්හාති රජ්ජුරුවෝ දෙවියන්ගේ සමාගමයක් බඳුවූ අලඞ්කාරවූ සත්‍රී සමාගමය දැක යෙහෙලි සමූහයාගේ මධ්‍යවර්තීවූ රාජා නම් රාජකන්‍යාවට මෙසේ කිවුය. දරුව රාජාවෙනි! ගෘහොද්‍යානයෙහි පිහිටියාවූ නානු නම් පුෂ්කරණිය හා සමානවූ මුහුදින් කරවා දෙනලද ඒ පොකුණෙහි ජලක්‍රීඩාව කෙරෙමින්

එසේම මා විසින් කරවාදුන් වෛජයන්ත ප්‍රාසාදය වැනි රතිවඩින නම් ප්‍රාසාදයෙහි කිමෙක්ද ඇලිවසවිද? නොයෙක් වර්ණයෙහිවූ කනබොනදෑ තොපට හැම දවස්මඑළවද්ද, තොපට මම දවස්පතා මල්කරඬු පස්විස්සක් යවමි. අනෙකප්‍රකාරවූ සුගඬ කුසුමයන් රැස්කොට ගොනා මේ පරිවාර සත්‍රීහු ක්‍රීඩා රතියෙහි ඇලුණාහු ඒ මල්ගෙනා විගසම යහපත්කොට ඔවුනොවුන් පරදවන්නවුන් මෙන් තොපට වෙන වෙනම මල්ගෙවල්, මල්ගඬ්, මල්හසුන්, මල් යහන් කෙරෙද්ද? මෙලෝවැසි සත්‍රීහු මුඛය ඔප් නහන්නාහු දුඟට රුධිරය හා වේයන් තල කැලල කුරුලෑ ආදිය නසන පිණිස පළඹුකොට අඹකල්ක යෙන් මුහුණ උලන්නාහ ඉක්බිති රුධිරය සමකරනු සඳහා සිනිදුවූ මැටි කල්කයෙන් උලන්නාහ. නැවත ඡවි ප්‍රසන්නකරනු පිණිස නිලකල්කයෙන් උලන්නාහ. එසේහෙයින් තෙපිත් ලුණු සුන්නෙන් හා මැටිකසා නිලකල්කයෙන් හොබවන මුහුණු ඇති තැනැත්තියෝය. එසේවූ මුහුණු ඇති තැනැත්තියෙනි! තොපට කවර වසතුවකින් විකලපයෙක් අරුමයෙක් ඇද්ද? ඌනවූ වසතුයෙක් ඇත්නම් සියල්ලම වහා ගෙනවුත් තොපට දෙමි. තවද මේ ලොකයෙහි චන්‍ද්‍රයාට වඩා ලැබගත නොහැක්කාවූ වසතුයෙක් නැත. ඉදින් තෙපි එය මට වුවමනායයි කියා අභිප්‍රා ඇතිවූ චන්‍ද්‍රයා සමානවූ වසතුයෙහිත් ඇලුම්කොට කියව් නම් ඒ නොලැබ ගතහැක්කාවූ වසතුත් තොපට අවුනොකොට සපයා දෙමි කිහ. ඒ අඩහාති රජ්ජුරුවන්ගේ බස් අසා රුජා නම් රාජකන්‍යාතොමෝ පියරජ්ජුරුවන්ට කියන්නී මහරජ්ජුරුවන්වහන්ස! පෘථිවීශ්වරවූ නුඹවහන්සේ සවම්පයෙන් මෙකී සියල්ලම ලැබෙන්නේය. එසේහෙයින් ඉන් අඩුවෙක් නැත. සෙට පසළොස්වක් පොහෝ දවසය. මා දන්දෙන දවසය, මසුරන් දහසක් දුනමැනව, සියලු යාචකයන්ට පෙර මා දී එන ලෙසින් දන්දෙනු කැමැත්තෙමි කීවාය.

එබස් අසා අඩහාති රජ්ජුරුවෝකියන්නෝ "වැඩ නැත්තාවූ නිෂ්ඵලවූ දන්දීමෙහි හා උපොසථවාසයෙහි නියුක්තවූ තොපවිසින් බොහෝ වස්තු නිෂ්කාරණයේ නසනලද, පෙහෙවස් විසිමෙන් නිරන්තරයෙන් යම් ආහාරපාන වර්ගයක් තෙපි අනුභව නොකරව් නම් ඒ අන්නපාන අනුභව නොකිරීම චතුරාශීති කල්පප්‍රමාණ කාලය නියතවශයෙන් තොප විසින් අනුභව නොකරයුත්තේමය, පවුකළත් පින්කළත් හැම සත්වයන්ම චතුරාශීති කල්පය ඉක්මුණු කල්හි ශුද්ධවන නෙයින් පෙහෙවස් වැස බත් කන්නාහටත් නොකන්නාහටත් පින් නැතැයි" පළමු නොඉල්වාම මැනියෙනි දන්දෙවයිකියා දියණියන්ට මසුරන් දහසක්දී යවන අඩහාති රජ්ජුරුවෝ එදවස් යාඥාකොට ඉල්වමින් සිටිය දීත් මිථ්‍යාදෘෂ්ටි ගත් බැවින් දියණියන්ට මසුරන් දහස නොදී මේ යථොක්ත කාරණා කිහ. තවද රජ්ජුරුවෝ දියණියන්ට කාරණා කියන්නාහු අකුශල කර්මබලයෙන් දුසත්‍වයට පැමිණි මේ බීජකයාද මෘගදුය නම් උද්‍යානයෙහිදී එදවස් ගුණාජීවකයා විසින් "නත්ථි ධම්මස්ස චරිතස්ස ඵලං කල්‍යාණං පාපකං" යනාදින් කියනලද වචනය අසා එකෙණෙහි නියඬුරු හුරුලමින් අඩ අඩා කඳුළු පෙරියසිද බීජකයාත් පෙරකුසල් කොට ඒ කුශල විපාකයෙන් කෙල්ල බඩ උපන්නේයයි බීජක වසතුවත් ඒ රාජකුමාරිකාවන්ට උදාහරණ කොට ගෙනහැර දැක්වූහ. තවද රජ්ජුරුවෝ කියන්නෝ සොඳුර! ගුණාවාරින්විසින් "මෙලෝ නැත, පරලෝ නැත, මවු නැත, පියානැත, කර්මනැත, කර්මඵලනැත, උපදනාකෙනකුත් නැත,මියයක කෙනතුත් නැත. ලොකයෙහි සත්පථයෙහි

ගියාවූ සුවිශීනධම්මයෙහි විඤ්ඤාදනාවූ මහණ බමුණු නෙහකුත්නැහැ''යි කියන ලදහ, එසේහෙයින් පරලොව ඇති නැත්ති මේලොවකුත් විය යුතුහුය. පරලොව මුලින්මනාහ. මෙ පියන් ඇති නැත්ති දුදරුවෝ ඇතිවන්නාහ. මවුපියෝ මුලින්මනාහ. ධර්ම්ය ඇතිනැත්ති ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතිවන්නාහ. ධර්ම්ය මුලින්ම නැහ එසේහෙයින් දන්දීමෙන් සිල්රැකීමෙන් පෙහෙවස් විසීමෙන් ප්‍රයොජන නැහ. මෙසේ පරලොවත් මවුපියනුත් ධර්ම්යත් මහණ බමුණුනුත් කුශලාකුශල විපාකයත් නැති කල දන්දීම් සිල්රැකීම් ආදියෙන් හා පෙහෙවස් විසීමෙන් ඉහළැහැ නොකා නොබී නොපරිභෝග කරන ශරීරයට කුමකට දුක්දෙවිදු? එසේහෙයින් රාජාවෙනි! යම්හාක් තෙපි ජීවත්ව ඉඳු නම්ඒහාක් කල් මුළුල්ලෙහි ඉතාවස් විසීමෙන් ප්‍රයොජන නැහ. රාත්‍රි භොජනය අනුභව නොකරම්මනොසිටා හැමදවස්ම රාත්‍රිභොජනය අනුභව කරවයි අවවාද කළහ.

එබස් අසා සිත්කලුවූ ශරීරවර්ණ ඇති රාජා නම්වූ රාජකුමාරිකා, තොමෝ අතීතයෙන් සත්ජාතියක් දුකිම් වශයෙන් පූර්ව ධර්ම්යන් හා අනාගත යෙන් සත්ජාතියක් දුකිම් වශයෙන් අනාගත ධර්ම්යන් තත්වූ පරිද්දෙන් දන්නී ඉයරජ්ජුරුවන් මිථ්‍යාදෘෂ්ටියෙන් මුදවනු කැමතිව කියන්නී මහරජ්ජු රුවන් වහන්ස! යම් පුද්ගලයෙක් යම්සේ අඥානයන් සෙවුණේ ඒනම් ඒ පුද්ගලයාත් අඥානබවට පැමිණෙන්නේයයි මා විසින් මීට පළමූ අසනලද්දේ මය. දැන්වූකලි ප්‍රත්‍යක්ෂකොට ඇස් හමුයේ දක්නාලද, මංමුළා එනක්හු කරා පැමිණි මංමුළා එනෙක් මුළාවන්නාසේ දෘෂ්ටිමූඝයා කරා පැමිණි දෘෂ්ටි මූඝවූ තැනැත්තේ මතුමත්තෙහි මුළාබවට පැමිණේද, එපරිද්දෙන්ම මහ රජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ ජාති ගොත්‍ර කුල ප්‍රදෙශ ඇශ්වය්‍ය ප්‍රඥ ඝන මෙයින් හිනවූ අලාත සෙනාපතිහු විසින් හා අභිශයින් හිනවූ බිජක නම් දසයා විසින් ග්‍රාම්දරකයක්හු වැනිවූ නිලිජ්ජි අඹබාල මේ නිවටා කරා පැමිණ මුළාවීම ඔවුන් දෙදෙනාට සුදුසුය. එසේ මුළාවීම ඒ ගැහැවියන්ට සුදුසු බව මූත් දෙවයන් වහන්ස! නුඹවහන්සේ වැනි පෘථිවීශ්වරවූ රජදරු වන්ට සුදුසු නොවන්නේයයි මෙසේ අලාහ බිජක දෙදෙනාට නිදුකොට පියරජ්ජුරුවන් දෘෂ්ටියෙන් ගලවනු පිණිස උසස්කොට වර්ණනා කරන්නාවූ රාජාවෝ මෙසේ කිවුය. මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ යසසව, යසකුශල, පව්ත්‍රවාස, යොනිසොමනස්කාර, සාහාවජ්ඣ යන මේ සියල්ලෙන් ලබනලද ප්‍රඥයෙන් සමන්විතසේක. ඒ කාරණයෙන් අවලවූ ධෛර්ය්‍ය ගුණ ඇතිසේක. අවල හෙයින්ම අවිතථ කාරණාකාරණ දන්මෙහි සම්පිසේක. එහෙයින් නුඹවහන්සේ මේ අඥානයත් හා සම්ව මේලොව පරලොව වරදවන මෙන් නිනවූ මේ මිථ්‍යාදෘෂ්ටියට කෙසේ පැමිණිසේක්ද? නවද රජ්ජුරුවන් වහන්ස! සංසාර මාගියෙන් සත්ත්වයෝ ඉදින් ශුද්ධවෙත් නම් ගුණ නිවටාගේ ප්‍රඥාව ව්‍යර්ථවන්නේය. කුශලාකුශල කර්ම්යක්හුගේ සිදියක් නැතිව හුදක් සංසාරයම සත්ත්වයන් ශුද්ධකරන්නේ නිනම් ප්‍රවුජිතයෙන් කර්ම්නැති බැවින් රාත්‍රි භාගයෙහි ඇවිලෙන්නාවූ ගිනි දැක ඒ ගින්නෙන් දන්නාවූ දුක් නොදැන ගින්නෙහි වැටී මහදුකට පැමිණෙන්නාවූ පලඟැටියකුසේ මේ ගුණ නම් නිවටා පඤ්චකාමය හැර මොහයෙන් මූඝව ආශ්වාද රහිතවූ ප්‍රවුජිත වෙසයකි ගත් මේ නග්න වෙසයට නොපැමිණෙන්නේය. යම්හෙයකින් තෙමේ නග්නවූ ප්‍රවුජිතවෙසයෙන් සුභාවව වෙසේද, මේ කාරණයෙන් සංසාරය සත්ත්වයන් ශුද්ධ නොකරන්නේය. නම්ගම සත්ත්වයන් ශුද්ධකරන්නේය. නවද

කතීව්‍යාතනිවය නොදන්නාවූ බොහෝ ජනයෝ සංසාරයෙන් මිදී ශුඛිවන් නේයයි කිඹිවන්හුගේ බස් නොගෙන දුසග්‍රාහ වශයෙන් පළමුකොට වන් නාවූ කුශලාකුශලකර්මයන්ගේ ඵල නැතැයි ගත් හෙයින් කර්මය හා කර්මඵලය නසන්නාහ. මෙසේ ඔවුන් පූර්වයෙහි ගත්තාවූ ඒ පරාජය ග්‍රාහය වරදව, ගන්නා ලද්දේවත් සම්‍යක් මිථ්‍යාදෘෂ්ටිය හෙතුකොටගෙන දෙලොවින් වන අර්ථයක් මෙන් (ඒ පරාජය ග්‍රාහයා) ගෙන සිටියාවූ අඥානවූ සත්වයෝ බිලියක් ගැල සිටි මනුෂ්‍යයන් බිලියෙන් දුකසේ වත් නොගැලවිය හැක්කාසේ ඒ මිථ්‍යාදෘෂ්ටියෙන් දුකසේවත් නොගැලවිය හැක්කාහ. තවද මහරජුරුවන් වහන්ස! සම්‍යක් සම්බුද්ධ ශාසනයෙහි සමාන පණ්ඩිත කෙනෙක් උපදිනසුත් අර්ථ දුනන්නාහ. එහෙයින් හුඹවහන්සේට උපමා දක්වමි. රජ්ජුරුවෙනි! මෙළඳුන්ගේ නැවක් අඩුණවූ බර ගෙන යන්නේ ඉතා බර බැවින් අධිකවූ වස්තුභාරය නෙත සාගරයෙහි යම්සේ ගැලේද, ඒ අධික භාරය හෙතුකොට ගෙන සාගරාවසීදනය කරන්නාවූ නැව මෙන් මේ ලොකවාසී සත්වයා අකුශල කර්මය මදින්මද රැස්කරන්නේ ඒ අධිකවූ පාපභාරය හෙතුකොටගෙන අවමහා නරකය හා දෙතිස් ඔසුපත් නරකය හා **ලොකාන්තරික** නරක යෙහි ගැලෙන්නේය. පෘථිවීශ්වරවූ රජ්ජුරුවන් වහන්ස! මේ අලාත සෙනා පතිහුගේ නරකයට පමුණුවන්නාවූ පාපභාරය යටපත්කරන ලද්දාවූ සම් කුශලයෙක් ඇද්ද, වැළඳි අලාත නම් සෙනාපතිතෙමේ මෙලොව යම් සැප යක් ලබාද, මෙබඳුවූ හේතුවෙයහ්‍යය ඒ චුකතප්‍රකාරවූ කුශලකර්මයාගේ විපාක වෙන් වන්නේය. ගොඝාතක කර්මයාගේ විපාකයෙන් නොවන්නේය, පාපකර්මය ඉක්මවා නුවූයේය. තවද ඒ අලාත නම් සෙනෙවිරදුන්ගේ යථොක්තවූ කුසලය දුන් ක්ෂයවන්නේය. ඒ අකුශල කර්මයෙහි ඇලී කුශලමාර්ගය දුරු කොට අපායගාමීවූ අකුශල මාර්ගයට දිවන්නේය, එසේහෙයින් පළමු කළ පුණ්‍යපූජා සඞ්ඛ්‍යාතවූ කුශලයෙන් සෙනෙවිරත් තනතුරු ලාභ සම්පත් අනුභව කෙරෙයි. ඒ කුශලය මේ ජාතියෙන්ම ගෙවීයන්නේය. දුන් අකුසල් කරණකොට නරකයෙහි වැටී මහදුක් අනුභව කරන්නේය. වස්තු ධාන පිණිස ගන්වනලද උතුරු ඇති මනාකොට අල්වා නොගන්නාලද්දාවූ තරුදිය බඳු නැතු කල්හි යම්සේ බිමට බසිද, නැවත භාරය ඇරවූ කල්හි තරුදියේ හිස යම්සේ උඩ බලා නැගේද, ඒ බඳුහළ තරුදිය උඩනැහෙන්නා සේම සඞ්ඛතෙම දැන සීලාදීවූ කුශලධර්මය මදින්මද රැස්කරන්නේය. අකුශල භාරය බහා තබා කුශලකර්මය නමැති හිස් නහා සුගතියෙහි උපදනේය. ඒ බීජක නම් දුසයාද මධ්‍යවූ විපාක ඇති කුශලකර්මයෙහි විපාකයෙන් මතු දිව්‍යලොකයෙහි මහ සම්පත් අනුභව කරන්නේය. දැන්වුකලි ඒ බීජක නම් දුසයා දුරිද්‍රතාදීවූ යම්දුකක් තමා දකීතම් (විඳීතම්) ඒදුක පූර්ජාතියෙහි නිග්‍රන්ථනාතපුත් වහන්සේට ආක්‍රෝශ කරන්නහු විසින් කරනලද අකුශල කර්මයෙන් පැමිණි දුකකය වන්නේය. එතෙමේ දැන් දුසඞ්ඝයට පැමිණ ආක්‍රෝශ විපාකයෙන් උපන්නාවූ දුකකය අනුභව කරන්නේය, තවද රජ්ජුරුවන් වහන්ස! මේ බීජකයාගේ පූර්ජාතියෙහි කරනලද අකුසලය දැන් දුකඃ විපාක අනුභව කිරීමෙන් ගෙවීයන්නේය. ආචාර විනයෙහි ඇලුණාවූ හුඹවහන්සේ වූකලී අශ්‍රිකවූ නග්නවූ මේ ගුණ නම් නිවැඩිකරු පැමිණ අපායගාමීවූ අකුශලකර්ම නමැති අසත්පථයේ නොගිය මැනවැයි ඒ රුජා නම් කුමාරිකාවෝ ප්‍රියරජ්ජුරුවන්ට අවවාද කළහ.

තවද පියරජ්ජුරුවන්ට පාපමිත්‍රයන් සෙවනය කිරීමෙහි දෝෂ හා කල්‍යාණ මිත්‍රයන් සෙවනය කිරීමෙහි ගුණ දක්වන්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කීහ. මහරජ්ජුරුවෙනි! සත්පුරුෂවූ හෝ අසත්පුරුෂවූ හෝ සිල් වත්වූ හෝ දුස්සීලවූ හෝ යමෙක් යමෙක් සත්ත්වයෙමේ සෙවනය කරන්නේ ද්‍රිනම් එබදුවූ පුරුෂයාගේ වසභයට යන්නේය, ඔහු පවු කරන කල්හි හෙමේත් පවු කරන්නේය. ඔහු පින් කරන කල්හි තෙමේත් පින් කරන්නේය. තවද මේ ලොකයෙහි සත්ත්වයෙක් යම් බදුවූ පුරුෂයක්හු තමා මිත්‍ර කරගන්නේ නම් යම් බදුවූ පුරුෂයක්හු කරු ඒක්වන් එළඹෙන්නේ නම් ඒ සත්ත්වයාත් එබදුම වන්නේය. සහවාසය නම් තමා වැන්නක් කරන්නේ පාප මිත්‍රයා පාපයන් හා සෙවුණේ නම් කරු එළඹෙන්නාවූ පාපයන් හා එක්නොවූ මෙරමා තමා හා එකාබ්‍යාසකිරීමෙන් පාපයනේ එක්කරන්නේය. වුකතප්‍රකාරවූ ඒ පාප මිත්‍රයා පාපයන් හා එක්ව නොසෙවුණාවූ මෙරමා තමා හා එකාබ්‍යාස කිරීමෙන් පාපයන් හා එක්කරන පරිදි කුමක්මෙන්ද යත්? ගලාගල විෂපෙවූ එක්සරයක් හියවුරෙහි බොහෝ සර අතරෙහි ලූ කල ඒ සර මූළුල්ලම විෂමිශ්‍ර වන්නාක් මෙන් වන්නේය. එසේහෙයින් සංසර්ගී පාපයෙහි භය ඇත්තාවූ ප්‍රඥවන්තවූ සත්ත තෙමේ පාපමිත්‍රයන් හා යහළු නොවන්නේය. තවද රජ්ජුරුවන් වහන්ස! යම් පුරුෂයෙක් පූති මාංසයක් තණ කැරැල්ලකින් වසා බැන්දේ ද්‍රිනම් එකල්හි ඒ තණකැරැල්ල මාංස සම්බන්ධයෙන් දූගඳ වහනය කරන්නේය. අඥානයන් හා එක්වීමත් පෙර දූගඳ නුවූ කුසතෘණය මාංස හා එක්කිරීමෙන් දූගඳ කළාසේම අඥාන සත්ත්වයන්ගත සම්ප්‍රාප්තවූ සාධුජනයෝත් ප්‍රාණාතිප්‍රාතාදීවූ අසාධුජන ක්‍රියායෙහි එක්කිරීමෙන් අපාය භාග් වන්නාහ. තවද යම් පුරුෂයෙක් තුවරලා හා සෙසු සපුදුනුකේ ආදීවූ යම්කිසි සුවඳ බඩුවක් යම්කිසි පත්‍රයකින් වසා බැන්දේ ද්‍රිනම් ඒ වසා බැඳි පත්‍රයත් සුවඳ වහනය කරන්නේය. අෂ්ට ලොක ධර්මයෙන් අකම්පිත සත්ත්වභාව ඇත්තාවූ ප්‍රාඥයන් සෙවනය කිරීමත් සුවඳ බඩු වසා බැඳි පත්‍රපුටය මෙන් ප්‍රාඥයෝ තමන් කරු සම්ප්‍රාප්තවූ සත් පුරුෂජනයන් දූන සීලාදිවූ සාධුක්‍රියායෙහි එක්කිරීමෙන් සුගතිලොකයට පමුණුවන්නාහ. යම් හෙයකින් තුවරලාදිය වසා බැඳි පත්‍රපුටය සුවඳ බඩු වේද, ඒ කාරණයෙන් තමාගේ පණ්ඩිත සත්ත්වභාවය දූන පණ්ඩිතවරුන් කරු එළඹීමෙන් මමත් පණ්ඩිත වෙමිසි මෙසේ තමාගේ ප්‍රාඥභාව දූන තමහට වැඩ කැමැත්තාවූ ප්‍රාඥ පුරුෂතෙමේ දෙලොව වරදවන්නාවූ අසත්පුරුෂයන් කිසිකලෙකත් නොසෙවුණේය. දෙලොවින්ම වැඩ සාධා දෙන්නාවූ සත් පුරුෂයන් එක්වන් සෙවුණේය. (කුමක් හෙයින්ද යත්? අසත්පුරුෂයෝ දෙවදත්තාදීන් මෙන් තමන් හා එක්වූවන් නරකයට පමුණුවන්නාහ. ශාරී පුත්‍ර සාරිපුත්‍රාදීන් තමන් හා එක්වූවන් සුගතියට පමුණුවන්නාක්මෙන් සුගතියට පමුණුවන්නාහ.) එසේහෙයින් මහරජ්ජුරුවන් වහන්ස! සර්ව්ප්‍රකාරයෙන්ම අසත්පුරුෂයන් දුරුකොට සත්පුරුෂයන් හා එක්ව කුසල්කොට සුගතිලොකොත්පත්තිය කළමැනවැයි මෙසේ ඒ රූපා නම් රාජකුමාරිකාවෝ පියරජ්ජුරුවන්ට අවවාද කළහ.

මෙසේ ඒ රාජකුමාරිකාවෝ පියරජ්ජුරුවන්ට ධර්මදේශනා කොට අතීතයෙහි තමන් අනුභව කළාවූ දුක් දක්වන්නාහු මේසේ කිවුය. මහ රජ්ජුරුවන් වහන්ස! මෙලොව ඇත, පරලොව ඇත, කර්ම ඇත, කර්මඵල ඇත, සංසාරය සත්ත්වයන් ශුද්ධකරන්නට අසමර්ථ වන්නේය. තමන් විසින් කරනලද කුශලකර්මයෙන්ම සත්ත්වයෝ ශුද්ධවන්නාහ. අලාත සෙනාපති හා බීජක නම් දාසයා හා දෙදෙනා එක ජාතියක් සිහි කෙරෙනි. එසේ හෙයින් උදක් ජාතිසම්මරණඥානය ඇත්තෝ ඔහු දෙදෙන මතු නොවෙති, මමත් අතීතයෙන් සත්ජාතියක්ම ඇවිද්දාවූ ජාති සිහි කෙරෙමි. අනාගතයෙහිත් මෙයින් චුතව යායුතුවූ සත්ජාතියක් දනිමි. තවද ජනප්‍රධානවූ මහරජ්ජුරුවන් වහන්ස! අතීතයෙහි මාගේ යම් සත්වැනි ජාතියෙක් වීද, ඒ සත්වැනි ජාතියෙහි මගධරට රජගහනුවර තරහල් පුත්‍රයෙක් වීමි. ඒ තරහල් පුත්‍රව උපන්නාවූ මම පාපමිත්‍රයකු කරා පැමිණ බොහෝ අකුසල් කෙළෙමි. එසේම පාපමිත්‍රයන් හා එක්ව පරස්ත්‍රීන් සෙවනය කරන්නමෝ අජරාමරයන් මෙන් ඒ ඒ තැන ධ්‍රුවය ඇතිද්දම්හ. ඒ ජාතියෙහි මා විසින් කළාවූ ඒ පරදාර කර්මය අළුයෙන් සැඟවුණු ගින්නක්මෙන් භවයෙන් ප්‍රවිජ්ඣාවේ නිධානකොට තබනලද වසතුවක්සේ අවකාශයක් ලත් කල්හි මතු විපාක දෙනුව සිටියේය නැවත අන් පාපකර්මයක් හෙතුකොටගෙන වංග නම් රට උපන්මි. තවද මහරජ්ජුරුවන් වහන්ස! කොසඹෑනුවර සප්තවිධ ධාන්‍යයෙන් සමෘද්ධවූ වස්ත්‍රාභරණයෙන් පිරුණාවූ නිධානකොට තබනලද බොහෝ වසතු ඇති සිටු කුලයෙක සත්කාර ගරුකාර කොට සියල්ලවුන් විසින් පුදනලද එකම පුත්‍රයෙක් වීමි. කොසඹෑනුවරදී මධුර විපාකවූ කුශලකර්මයෙහි ඇලුණාවූ ප්‍රාඥවූ ශ්‍රවණධාරණයෙන් සමන්විතවූ ගුණ ඇති මිත්‍රයකු සෙවනය කෙළෙමි. මහරජ්ජුරුවන් වහන්ස! ඒ කල්‍යාණ මිත්‍රයා දැනසිලාදිවූ කුශල ධර්මයෙහි මා පිහිටුවිය, තුදුස්වක් පොහොෝහිද පසළොස්වක් පොහොයෙහිද නිතර පෙහෙවස් විසිමි. එකල මා කළාවූ ඒ කුශල කර්මය දිය දක්නාතුරු කරනලද නිධානයක් මෙන් මතු විපාක දෙනුව භවයෙන් සැඟවී සිටියේය, ඊට අනතුරුව මගධරටදී පරදාර සංඛ්‍යාතවූ යම් අකුශල කර්මයක් කරනලද්දේ විනම් ඒ පරදාර කර්මයාගේ විපාකය හලාහල විෂ සහිත භොජනයක් අනුභව කොට සිටියාවූ සත්ත්වයෙක් හට ඒ කකීශවූ හලාහල විෂය පසුව කිපෙන් නාක් මෙන් කාලාන්තරයකින් විපාකදීම් වශයෙන් මා කරා පැමිණියේය. තවද මහරජ්ජුරුවන් වහන්ස! කොසඹෑ නුවර සිටුකුලයෙන් චුතවූ මම භයානකවූ රෞරව නරකයෙහි මා කළාවූ ඵරදාර කර්මය හෙතුකොට ගෙන බොහෝ කලක් පැසුණෙමි. ඒ දුක් සිහිකරන්නාවූ මම සිතට සැපයක් නොලබමි. මේසේ මා සිතට භය උපදනේය, ඒ රෞරව නරකයෙහි ආයු පමණින් බොහෝ කලක් දුක්විඳ ඒ දුක් ගෙවා රෞරව නරකයෙන් චුතව කාණ්ඨා නම් රට බ්‍රහ්මඛරණය කරනලද්දව ශක්‍රති සම්පන්නවූ එක්තරා එළුවෙක් වීමියි මෙසේ තමන් අතීතයෙහි කළාවූ දුක් දක්වන්නෝ ඒ එළුවා වූකලී ශක්‍රති සම්පන්නාවූ බැවින් පිටට නැඟී ඔහු ලවා උස්ස්‍රලවාගෙන යන්නාහ. යානාවෙහිත් හොඳන්නාහ. එපවත් දක්නාවූ රාජකුමාරිකාවෝ මහරජ්ජුරුවන් වහන්ස! රාජපුත්‍රයන් හා අමාත්‍ය පුත්‍රයෝ මා පිටට නැඟීත් රථයෙහි හොඳගෙනත් යන්නාහ. ඒ කවර කර්මවිපාකයෙක්ද යත්? මා පූර්ජන්මයෙහි කරනලද පරදාර සෙවන සඞ්ඛ්‍යාතවූ අකුශල කර්මයාගේ විපාකය වන්නේය, රෞරව නරකයෙහි උත්පත්තියත් එළුව උපන්කල

බීජොඩ්‍රණයත් පිටින් ඉසිලීමත් රථ හා ගැල් ආදියෙහි යෙදීමත් යනමේ සියල්ලම පරස්ත්‍රී සේවනයෙහි විපාකවන්නේය. ඒ එළයොනියෙන් චුතව අවුත් ආරණ්‍යයෙහි වානර යොනියෙහ පිළිසිඳගත්තේය. එකල්හි වානර පොතකයා උපන් දවස් වානරෙන්ද්‍රයාට දැන්වූහ. ඒ සුඵල්ලවූ වානරයා මාගේ පුතු මෙහි ගෙන එවයි සවමිපයට ගෙන්වා වැළඳ ගන්නා ාකාරයින් මෙන් හරකොට මැඩ අල්වාගෙන වානර පොතකයා අඩව අඩවා දෑතින් ඛාහු බීජොඩ්‍රණය කෙළේය. එපවත් දක්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කිවුය. මහරජ්ජුරුවන් වහන්ස! මම ඒ එළයොනියෙන් චුතවූයෙම් මහ වනයෙහි වානරව උපන්මි. එකල්හි තෙජස් ඇත්තාවූ ප්‍රධාන වානරයා විසින් දෑතින් ඛාහු උපුටා පියකලද එලය ඇත්තෙම් විමි. එකල්හි බීජොඩ්‍රණයට පැමිණීමින් පූර්ව්ජන්මයේ කළ පරදාර කර්මයාගේ විපාකයෙන් වූයේයයි කිහ.

ඉක්බිත්තෙන් අන්‍යවූන් ජාති දක්වන්නාවූ රාජකුමාරිකාවෝ මෙසේ කිහ. රජ්ජුරුවන් වහන්ස! ඒ වානරයොනියෙන් චුතවූ මා සෝණ නම් රට ගොන්ව උපනිමි. එසේ ගොන්ව ඉපද වසු අවස්ථායෙහි මඛාලද එලය ඇත්තෙම් ජවබල සම්පන්නවීමි. එසේ හෙයින් බොහෝකල් මා විසින් ඉනා බරවූ රථ යානා අදනාලදිමි. එබදුවූ බර ඉසිලීමින් පූර්ව්ජන්මයෙහි කළ පරදාර කර්මයෙහි විපාකයෙන්ම වන්නේය. තවද මහරජ්ජුරුවන් වහන්ස! ඒ ගවයොනියෙන් චුතවූ මම වැදූරට ධනධාන්‍යාදියෙන් සමෘඩ්ධවූ සිටුකුලයක උපනිමි. එබදුවූ සමෘඩ් කුලයෙහි ඉපද දුලීභවූ මනුෂ්‍යත්ව භාවයකුත් ලැබ නොගැණී නොපිරිමිව නපුංසකව උපනිමි. ඒ ඉපදීමත් පූර්වයෙහි කළ පරදාර කර්මයාගේ විපාකයෙන් වන්නේය. තවද මහරජ්ජුරුවන් වහන්ස! ඒ නපුංසකාත්මභාවයෙන් චුතවූ මම තව්තිසා භවනයෙහි නන්දනොද්‍යානයෙහි කාමැනි කාමැනි ආතමභාව මවාගන්නට සමර්ථවූ දිව්‍යප්‍රසාදයක් උපනිමි. එසේ උපන්නාවූ මම විසිතුරුවූ දිව්‍ය වස්ත්‍රාභරණ ඇත්තෙම් බහා පලඳනාලද මිණි කොඩොල් ඇත්තෙම් නැටීම් ගිකීම් ආදියෙහි දක්ෂව අප්‍රමාණවූ දිව්‍යානුභාවයෙන් යුක්තවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේට අගමෙහෙසුන් විමි. මහරජ්ජුරුවන් වහන්ස! තව්තිසා භවනයෙහි සිටියාවූ මම මේ යථොක්තවූ ජාතීන් ගිහිකෙළෙමි. මෙයින් චුතව අනාගතයෙහි යම් අනික් ජාතියකට යන්නෙම්ද, එසේ අනාගතවූ සත්ජාතියකුත් සිහිකෙළෙමි. ඒ මගධරට සෝණීකාර පුත්‍රව කළාවූ පරදාරකර්මය නරකය, එළු, වදුරු, ගොන්, නපුංසකාදී මෙතෙක් ජාතියෙහි උපදවා දුක්විඳුවා ඒ අකුශලකර්මය ක්ෂයවූ පසු කොසඹෑනුවරදී කළාවූ දානසීලාදී සුචරිත කර්මය මෙතෙක් කල් නිබී දැන් තමාගේ බලට අවුත් විපාක දෙන්නට සිටියේය. මේ මියුලු නුවරින් චුතවූ මම දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාතවූ සුගතියෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් ඇවිදිමි. මහරජ්ජුරුවන් වහන්ස! වැදූරට නපුංසකවූ උපන් ජාතිය, දෙව්ලොව දිව්‍යස්ත්‍රීව උපන් ජාතිය, මේ මියුලු නුවර උපන් ජාතිය සි මේසේ සත්ජාතියක් ඇත්තෙමි. සතතයෙන් දිව්‍ය මනුෂ්‍යයන් විසින් කරනලද පූජාසත්කාරයෙන් සමන්විතවූ ලදිමි. දිව්‍යලොකයෙහි උපන් පස් ගතියක, මේ මියුලු නුවර උපන් ගතිය, යයි මෙසේ සජාතියෙක සම්පත්තිභවයෙන් තොම් දුණෙමි. මහරජ්ජුරුවන් වහන්ස! මෙයින් චුතව මත්තෙහි සත්ජාතියෙක දිව්‍යලොකයෙහි මහත්වූ ඉර්ෂ්‍යානුභාව ඇති දිව්‍යපුත්‍රව උපදනෙමි. මා ඒ

නක්ඛත්තයෙන් චුතව මේ මනුෂ්‍යලෝකයෙහි උපන් නියාව නොදැන අද දක්වා කදු සොට මාගේ පරිවාර සත්‍රිහු මාතිසා මල් ඉගාතන්නාහුය. යම් දිව්‍යපුත්‍රයෙක් ගසින් වැටෙන මල් අහ එළවා ගනී නම් ඒ ජවන නම් දිව්‍යපුත්‍රයා ඒ අනතුරු ජාතියෙහි මාගේ සැමි පුත්‍රවන්නේය. මහ රජ්ජුරු වන් වහන්ස! දැන් මට යම් මේ සොළොස් අවුරුද්දක් ඇත්නම් ඒ සොළොස් අවුරුද්ද දිව්‍යලොකයට මඳ ඇසිල්ලෙක් වන්නේය. මනුෂ්‍ය ලොකයෙහි අවුරුදු සියයෙක් (තව්තිසා) දිව්‍යලොකයට එක දවසෙක් වන්නේය. මේසේ මෙබඳු ආයුෂයෙන් යුකතවූ අසඞ්ඛ්‍ය ජාතියෙක වුවත් කුශලාකුශල කර්මය මෙකී පරිදිදෙන් සත්ත්වයන් අනුව යන්නේය. විපාක දිවුත් කුශලාකුශල කර්මය අහරෙහි නොනස්නේයයි කිහ.

ඒ රැජා නම් රාජකුමාරිකාවෝ වූසැලී (දිව්‍යලොකයෙහි දිව්‍ය සත්‍රිව උපන්කල) දිව්‍යලොකයෙහි සිට මම මෙබදුවූ දිව්‍යලොකයට ආයෙමි කොයි සිට දෝ.හෝයි බලන්නාහු වැදෑරට මහාභොන කුලයෙහි නපුංසකාත්මභාව යෙන් චුතව ඒ දිව්‍යලොකයෙහි උපන් බව දුටහ. ඉක්බිති තවර කුශල කර්මයකින් මෙබදු සිත්කලුවූ ස්ථානයෙක උපන්නෙමිදෝහෝයි බලන්නාහු කොසඹැනුවර සිටුකුලයෙහි ඉපද කළාවූ දැනදිවූ කුශලකර්මය දැක ඒ කුශල කර්ම විපාකයෙන් මෙතැන්හි උපනිමියි දුටහ. අනතුරුවූ නපුංසකාත්මභාව යෙහි උපන්නෙමි කොයි සිට ආයෙමිදෝහෝයි බලන්නාහු සඞ්ඛ්‍යරට ගවයෝ නියෙහි ඉපද දුක් අනුභව කළ නියාව දුටහ. ඉක්බිති අනතුරු ජාතිය සිහිකරන්නාහු වානර යොනියෙහි ඉපද බීජොතපාටනය කළ නියාව දුටහ. ඊට අනතුරුව සිහිකරන්නාහු කණ්ණාට රට එළු යොනියෙහි ඉපද බීජොතපාටනය ලත් නියාව දුටහ. ඊට අනතුරුව සිහිකරන්නාහු රෞරව නරකයෙහි උපන් නියාව දුටහ. නරකයෙහින් තිරිසන් යොනියෙහින් ඉපද දුක් සිහිකරන්නාවූ තැනැත්තන්ට භය උපන. ඉක්බිති තවර අකුශල කර්මයකින් මෙබඳුවූ දුක් අනුභව කෙළෙම්දෝ හෝයි සවැනි ජාතිය බලන්නාහු ඒ ජාතියෙහි කොසඹැ නුවරදී කරනලද කුශලකර්මය දැක සත්වැනි ජාතිය බලන්නාහු මඟධ රට පාපමිත්‍රයා නිසා කරනලද පරදාර කර්මය දැක මේ මහත් දුක් මා විසින් අනුභවකරන ලදැයි දක්ෂ. ඉක්බිත්තෙන් එයින්චුතව අනාගතයෙහි කොහි උපදිම්දෝ හෝයි බලන්නාහු එහි ආයු පමණින් සිට නැවත ශක්‍රදෙවෙන්ද්‍රයන්ටම අගමෙහෙසුන්ව උපදිමියි දක්ඛ. මේසේ නැවත බලන්නාහු තුන්වැනි ආත්මභාවයෙහින් ශක්‍රදෙවෙන්ද්‍රයන්ටම අගමෙහෙසුන්ව උපදිමියි දක්ඛ. සතරවැනිජාතියෙහිත් එසේම දක්ඛ. තවද පස්වැනි ජාතියෙහි වූකලී එම දිව්‍යලොකයෙහි ජවන නම් දිව්‍යපුත්‍රයාහට අගමෙහෙසුන් වෙමියි දක්ඛ. සවැනි ජාතියෙහි අඛ්‍යාති රජ්ජුරුවන්ගේ අග්‍රමහෙෂිකාවන් කුස උපදිමියි දක්ඛ. ඒ උපන් ජාතියෙහි මට රැජාවෝයයි නමෙක් වන්නේයයි දැන ඊට අනතුරුව කොයි උපදිම්දෝ හෝයි බලන්නාහු සත්වැනි ජාතියෙහි මියුලු නුවරින් චුතව තව්තිසා භවනයෙහි මහත්වූ ඉර්ෂ්‍යානුභාව ඇති දිව්‍යපුත්‍ර ඉපද සත්‍රිභාවයෙනුත් මිදෙමියි දක්ඛ. එසේ දැන කුමාරිකාවෝ රජ්ජුරුවන්ට කියන්නාහු දිව්‍යලොකයෙහි සිටියාවූ මම අතීතයෙන් සත්ජාතියක් හා අනාගතයෙන් සත්ජාතියක් සිහිකෙළෙමි කියා නැවත රජ්ජුරුවන් වහන්ස! දෘෂ්ටධර්මවෙදනීයකර්මය එම ආත්මභාවයෙහි විපාක දෙන්නේය. උපපද්‍ය වෙදනීයකර්මය අනතුරු ආත්මභාවයෙහි විපාක දෙන්නේය. අපරාපරියවෙදනී

කර්මය වූකලී විපාක නොදී අතරෙහි නොනස්නේය. මම පරදාර කර්මවිපාකයෙන් නරකයෙහිත් තිරිසන් යොනියෙහිත් ඉපද මහදුක් අනුභව කෙළෙමි. මේ කාරණයෙනුත් පරලොව හා කුශලාකුශල කර්මයෙහි විපාක ඇති නියාව දත මැනව. ඉදින් නුඹවහන්සේ ගුණාජීවකයාගේ බස්ගෙන පරදාරකර්මය කළසේක්නම් මාවිසින් අනුභව කරනලද දුක් හා සමානවූ දුක් අනුභව කරනසේක. එසේහෙයින් එබන්දක් නොකළ මැනවැයි ඒ රුජා නම් කුමාරිකාවෝ අඛාති රජ්ජුරුවන්ට අවවාද කළහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කරන්නාවූ කුමාරිකාවෝ මෙසේ කිවුය. යම් සත්‍රී පුරුෂයෙක් උපනුපන් ජාතියෙහි පිරිමිවනු කැමැත්තෝවූනම් ඒ සත්‍රී හෝ පුරුෂයා හෝ දෙපාඇති එකක්හු මඩවලහන් නාක්මෙන් පරසත්‍රීන් පරපුරුෂයන් දුරුකරන්නේය. යම් සත්‍රියක් උපනුපන් ජාතියෙහි පුරුෂවනු කැමැත්ති නම් සුජාතා නම් අසුරකන්‍යාව ප්‍රධානකොට ඇති අවශෙෂ දිව්‍යාඞ්ගනාවන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ට උපස්ථාන කරන්නාක්මෙන් තමන්ගේ සවාමිපුත්‍රයාහට අතවරතයෙන් සකසා අත්පා මෙහෙවර කරන්නේය. යම් සත්ත්වයෙක් දිව්‍යවූ උපභොග පරිභොග වස්තු හා දිව්‍යවූ ආයුෂ හා දිව්‍යවූ යසස් හා දිව්‍යවූ පඤ්චකාම සැප කැමැත්තේ විනම් පණිවා ආදිවූ පවුකම් දුරින්දුරුකොට ත්‍රිවිධවූ සුචරිතධර්මයෙහි සකසා හැසිරෙන්නේය. නුවණැත්තාවූ සත්‍රියක්වත් පුරුෂයෙක්වත් කයින් සිඳවන ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර යයි කියනලද ත්‍රිවිධවූ අකුශලධර්මයෙහිද තෙපුලෙන් සිඳවන මෘසාවාද, පිශුනාවාච, ඵරුෂාවාච, සම්ඵප්පලාපයයි කියනලද චතුර්විධ අකුශලධර්මයෙහිද මනසින් සිඳවන අභිධ්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටියයි කියනලද ත්‍රිවිධ අකුශල ධර්මයෙහිදැයි මෙසේ දශඅකුශල ධර්මයෙහි විරමණ වශයෙන් අප්‍රමාදවිනම් මහරජ්ජුරුවන්වහන්ස! එය සත්‍රී පුරුෂවූ තමහට වැඩ පිණිසවන්නේය. තවද මහරජ්ජුරුවන්වහන්ස! මේ ලොකයෙහි යම් සත්ත්වකෙනෙක් පරිවාර සම්පත් ඇත්තෝද, සම්භාරයෙන් සම්පන්නවූ අවශෙෂ සියලු සම්පත් ඇත්තෝද, ඒ සත්ත්වයන් විසින් පූර්වජාතියෙහි සැක නැතිව කුසල් කරනලදහ. එසේහෙයින් මේ සත්ත්වයෝ වූකතප්‍රකාර සියලු සම්පත් ලබන්නාහ. වර්ණසංස්ථාන ජාත්‍යාදි වශයෙන් නානාප්‍රකාරවූ සියලු සත්ත්වයෝ තමන් තමන් කළ කුශලකර්මයාගේ විපාකම අනුභව කරන්නාහ. මවුපියන් විසින් කළ කුසල් දූදරුවන්ට විපාක නොදෙන්නාහ. දූදරුවන් කළ කුසල් මවුපියන්ට විපාක නොදෙන්නාහ. අවශෙෂවූ නහුන් මල් බැබුන් ආදීන් විසින් කළ කුසල් තමන්තමන්ට මූත් අවශෙෂයන්ට විපාක නොදෙන්නාහ. එබැවින් මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේත් සිතා බැලුව මැනව, දිව්‍යාඞ්ගනාවන් හා සමානවූ සම්භාරණයෙන් අලඞ්කෘතවූ රන්දැලින් වැසුණාවූ නුඹවහන්සේගේ මේ සොළොස් දහසක් පමණ පුරාණනාවන් හා ධනධාන්‍ය යශොකීර්ති පරිවාර සම්පත් ආදිවූ මේ ඓශ්වර්‍ය්‍ය සම්පත් කිසිවෙක්හි නිර පෙක්ෂකව නිදුපිමෙන් ලබනලද්දේදේ හෝ මංපැහැරීම් උමංඛිදීම් ආදිවූ අනෙකප්‍රකාර පාපයන් කොට ලබනලද්දේදේ හෝ දැනසීලාදිවූ දශකුශල කර්මයන් කොට ලබන ලද්දේදේ හෝයි සිතා බැලුව මැනවැයි කියා මනාවූ වූතසමාදාන ඇති රුජා නම් රාජකුමාරිකාවෝ මෙබදුවූ මධුරවවනයෙන් අඛාති නම් පියරජ්ජුරුවන් සතුටුකළහ. මංමුළා එකක්හට මං කියන් නක්හු මෙන් දෘෂ්ටිවූසවූ තමන්ගේ පියරජ්ජුරුවන්ට සුගති මාර්ගය කියා සුචරිතධර්මය හා නොයෙක් කාරණා දක්වා කිහ.

මෙසේ ඒ රැජා නම් රජකුමාරිකාවෝ පෙරවරු පටන් සකල රාත්‍රියෙහි පියරජ්ජුරුවන්ට ධර්මදේශනා කොට දෙවයන් වහන්ස! මිථ්‍යාදෘෂ්ටි ඇති ගුණ නම් නිවටාගේ බස් නොගත මැනව, මෙලෝ ඇත, පරලෝ ඇත, කර්ම ඇත, කර්මඵල ඇත, මවු ඇත, පියා ඇත, කළාවූ කුශලාකුශලයෙහි විපාක ඇතැයි කියන්නාවූ මෙබදු කල්‍යාණ මිත්‍රයන්හුගේ බස් ගත මැනව, නොතොටින් එතර නොවුව මැනවැයි කීහ. මේසේ නොයෙක් කාරණා කියාද පියාණන් මිථ්‍යාදෘෂ්ටියෙන් අරවන්නට නොපොහොසත්වූහ. අඩහාති රජ්ජුරුවෝද දුවණියන්ගේ බස්අසා සතුටුවූහ. දෙමවුපියෝ වනාහි ප්‍රියවූ දරුවන් විසින් කියනලද වචනයෙහි සතුටුවෙති. ඒ ගත්තාවූ දෘෂ්ටි නොහරිති. ඒ මියුලුනුවරද රැජා නම් රාජ ධීතාවෝ පියරජ්ජුරුවන් වහන්සේට ධර්මදේශනා කොට මිථ්‍යාදෘෂ්ටි අරවත්ලසි එක කොලාහල විය. නුවණැත්තාවූ රාජකන්‍යාවන්වහන්සේ අද දවස් පියාණන්වහන්සේ මිථ්‍යාදෘෂ්ටියෙන් මුදා නුවර වාසින්ට සෙතක් කරනසේකැයි මහජනයා සන්තොෂයට පැමිණියේය. ඒ රාජකුමාරිකාවෝද පියරජ්ජුරුවන් ගිවිස්වා ගත නොහෙන තැනැත්තෝ කරමින් සිටි උත්සාහය නොහැරම යම්කිසි උපායකින් මාගේ පියාණන් වහන්සේට සැපයක් කෙරෙමියි දෙහොත් මුදුනෙහි තබා සතරදිශය, සතර අනුදිශය, අකාශය, පාතාලයයි කියනලද දශදිග වැඳ මේ ලොකයෙහි ලොව රක්නාවූ ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීහුද, ලෝකපාල දෙවතාවෝද, ශක්‍රාදි දෙවතාවෝද, බ්‍රහ්මයෝද යන සියල්ලෝම ඇත. ඔහු හැමදෙනම අවුත් තමන්ගේ බලයෙන් මාගේ පියාණන් වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටි අරවන්නට උත්සාහ කෙරෙත්වයි උන්වහන්සේගේ ශීල සමාධ්‍යාදි ගුණයක් නැතත් මාගේ ශීලසමාධි ගුණයෙන්ද, මාගේ ශක්තියෙන්ද, මාගේ සත්‍ය වචනයෙන්ද, මේ සියල්ල හෙතුකොටගෙන අද හැම දෙවියෝම මෙතැනට අවුත් මුන්වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටිය හරවා සියලු ලොකයාහට සැපයක් කෙරෙත්වයි කියා නමස්කාර කළහ.

එකල්හි මහබෝසතාණෝ නාරද නම් මහාබ්‍රහ්මව ඉපදුන්හ. ඒ මහබෝසතාණෝ තමන්ගේ මෛත්‍රී භාවනායෙහි ආනුභාවයෙන්ද සියලු සත්ත්වයන් කෙරෙහි කරනලද දයායෙන්ද සියලු සත්වයන්ට වඩා මහත් බැවින්ද දැනමානාදිවූ සුචරිත කිරීමෙන් මොනවට පිළිපන්නාවූද, ප්‍රාණඝාතාදි අකුසල් කිරීමෙන් නපුරුකොට පිළිපන්නාවූද සත්වයන් දක්නා පිණිස කලින්කල මනුෂ්‍ය ලොකය බලන්නාහ. එදවස්ද ඒ නාරද නම් මහා බ්‍රහ්මයාණෝ මනුෂ්‍යලොකය බලන්නාහු රැජා නම් රාජකන්‍යාව පියාණන්ගේ මිථ්‍යාදෘෂ්ටි හරවන පිණිස ලොව රක්නාවූ දෙවතාවන්ට නමස්කාර කරන නියාව දැක මා හැර අනිකෙක් මේ රජ්ජුරුවන්ගේ මිථ්‍යාදෘෂ්ටි හරවන්නට සමර්ථයෙක් නැතැයි අද මාවිසින් රාජකුමාරිකාවන්ට සඟ්ගහද රජ්ජුරුවන්ට හා පිරිවර ජනයන්ට සවඥ්ඤ භාවයද කොට ඊම සුදුසු යයි නිශ්චයකොට කාවර වෙශයක් ගෙන යෙමිදෝයි සිතා මනුෂ්‍යයන්ට ප්‍රවුර්ජිතයෝ ප්‍රියදවෙති, ගරු කටයුතුද වෙති, ඇදහියයුතු වචනයන් ඇත්තාහුද වෙති, ඒ කාරණයෙන් ප්‍රවුර්ජිත වෙශයක් මවාගෙන යෙමියි සතිටුහන්කොට ප්‍රසාදවහවූ රන්වන්වූ ශරීර ඇති මනුෂ්‍යත්තමභාවයක් මවාගෙන මනොඥවූ ජටාමුඩුල්ලක් බැඳගෙන ජටාව අතරෙහි රන්ඉදිදක් බහා ඇතුළත්වූ ඉද්දමත්තෙහි මොණරපිල් තකා රත්වූ පවුලක් හැඳ රන්තරු

වෙන් විසිතුරු කරනලද රිදීමයවූ අදුන්දිවිසමක් එකාංශකොට බහා මුතුමයවූ සාල්ලෙක්හි තබනලද සඹණිමයවූ හිඹෑහාජනයක්ද රන්කෙණ්ඩියක්ද තුන්තැනකින් වක්වූ සහ බැඳ මුතුමයවූ සාල්ලෙක්හි තබනලද පබළුමයවූ සම්පිලාවක්ද ඇරගෙන මේබඳුවූ තාපසවෙශයෙන් උපලක්ෂිතව ආකාශතල යෙහි විසූ දිව්‍යපුත්‍රයාමෙන් බබළමින් ආකාශයෙන් අවුත් මොනවට සරහන ලද්දාවූ විසූසා ප්‍රාසාදයාගේ මිතුමහල්තලයට වැද අඹහාති රජ්ජුරුවන්ට අභිමුඛව ආකාශයෙහි සිටියාහ. ඒ අවස්ය ප්‍රභාශකරන්නාවූ ලොවුතුරා සම්බුදුන් වහන්සේ මෙසේ වදාළසේක.

එම්බා මහණෙනි! ඉක්බිත්තෙන් නාරද නම් බොධිසත්වයෝ බ්‍රහ්ම ලොකයෙන් (ජම්බුවිපය අපෙක්ෂාකොට) මනුෂ්‍ය ලොකයට අවුත් ගුණ නම් ආජීවකයාගේ සමීපයෙන් ගන්නාලද මිථ්‍යාදෘෂ්ටි ඇති අඹහාති නම් රජ්ජුරුවන් කෙරෙහි අනුකම්පායෙන් අවුත් අමාත්‍ය සමූහයා විසින් පිරිවරන ලදුව උන්නාවූ ඒ රජ්ජුරුවන්ගේ ඉදිරියෙහි ඒ ප්‍රාසාදය සමීපයෙහි පියවර නොපෙනෙන්නාවූ සථානයෙහි පියවර දක්ව දක්වා ආකාශයෙහි සිටියාහ. පැමිණියාවූ ඒ නාරද තාපස්ත්‍රීන් රැජා නම් කුමාරිකාවෝ දැක දැන් මා කෙරෙහි අනුග්‍රහයෙන් මා කෙරෙහි කරුණායෙන් එක් දිව්‍යරාජයෙක් ආයේ වනැසි සුලඟින් නැමෙනලද රන්කෙහෙල් කඳක් පරිද්දෙන් නමිනව නාරද මහා බ්‍රහ්මයන් පසඟ පිහිටුවා වැන්දහ. අඹහාති රජ්ජුරුවෝද ඒ මහා බ්‍රහ්මයාණන් දැක බ්‍රහ්ම තෙජසින් මඩනාලද්දාහු අස්නෙහි ඉඳිනට අපොහොසත්ව බැස බිම සිට ඒ බ්‍රහ්මයාණන් ආනැන්ද නාමගොත්‍රයද විචාරන්නාහු දිව්‍යරාජයකුට බදුවූ ශරීරවණ්ණි ඇති විසූ දිව්‍යපුත්‍රයාමෙන් ආලොක කෙරෙමින් මා සමීපයෙහි සඤ්චාරණය කරන්නාවූ තෙපි මෙතැනට කොයිසිට අවුද? විචාරන ලද්දාවූ මට තොපගේ නාමගොත්‍රය කියව, මනුෂ්‍ය ලොකවාසීහු තොප කවුරුනැයි දනිද්දැයි විචාළහ.

ඉක්බිත්තෙන් නාරද නම් බ්‍රහ්මයාණෝ මේ රජ්ජුරුවෝ පරලොවෙක් නැතැයි හඟනාහ. ඕනට පරලොව දක්වා කියමියි සිතා කියන්නෝ මේ වනාහි දැන් දිව්‍යලොකයෙන් මෙහැනට ආමි. විසූ දිව්‍යපුත්‍රයා පරිද්දෙන් බබළමින් මේ සථානයෙහි හැසිරෙමින් තොප විසින් විචාරන ලද්දාවූ මම මාගේ නාමගොත්‍රය කියමි. මා මහා නාරද කාශ්‍යපයෝයයි දනිතියි කිවුය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පරලොව පසුවත්විචාරම්, මේසා මහත් ආනුභාවයක් ඇතිව ආකාශයෙහි ඇවිද්දන්නට සමර්ථවූ ඉඬිකාරණ පළමු කොට විචාරමියි සිතා මෙලෙසින් විචාළහ. එම්බා නාරද නම් තාපස්ත්‍රී! තොපගේ යම් බඳුවූ ශරීරවණ්ණියක්වේද, එයත් ආකාශයෙහි සිටීමත් ඇවිදීමත් එසානතයෙන් ඉතා ආශ්චර්‍යය, මේ කාරණය තොප අතින් විචාරමි, තොප මෙබඳුවූ ඉඬියට කවර කාරණයක් මුල්කොටගෙන පැමිණියෝදැයි විචාළහ. නාරද තාපසයාණෝ කියන්නෝ එම්බා රජ්ජුරුවෙනි! වාක්සත්‍යයද ත්‍රිවිධවූ සුචරිතධර්මය හා කිපුණු සිරියම් නිමිත්තකොට පැමිණෙන්නාවූ ප්‍රථම ධ්‍යානාදි ධ්‍යාන ධර්මයද වඤ්චරාදි පඤ්චේන්ද්‍රියයන්ගේ මනාකොට පිහිටුවීමද තමාගේ කෙලෙස පරිත්‍යාගය හා දානමානාදි දෙය්‍යධර්ම පරිත්‍යාගයද යන බුබාදි මහොත්තමයන් විසින් පුරාදුකරනලද මේ පුරාතන ගුණධර්මයෝ අප විසින් පූර්ණජාතියෙහි (සම්පුණ්) කරනලදහ. මේ යථොක්තාවූ කුශල

ධර්මයන් මොනවට සෙවූනාලද්දාවූ සත්‍යයන් විසින් දිව්‍යමයවූ ශරීරවර්ණද ආකාශයෙන් කැමැති දිගකට යන්නට නිසිවූ ඉර්ධි ලබන්නාහුයි කිවුය. රජ්ජුරුවෝ ඒ නාරද තාපස්වින් මෙලෙස ධර්මදේශනා පේන කථා කියමින් සිටිය දිත් මිථ්‍යාදෘෂ්ටිය නමා හරකොට ගන්නාලද බව හෙතුකොටගෙන පරලොව්ක් නොඅදහන්නාහු කුශලයන්ගේ විපාකයෙක් ඇද්දෙයෝයි විචාරන්නාහු මෙසේ කිවාහ. කුසල්කිරීම මහත්ඵල මහානිශංස ඇති බව තොප විසින් ආශ්චර්යකොට කියනලද, ඉදින් ඒ කුශලාකාරණය යම් පරිද්දෙකින් කිවුද, ඒ කාරණය තොප අතින් විචාරමි. මනාව ප්‍රකාශකොට කියාලවයි කීහ. නාරද තාපසයෝ කියන්නෝ මේ මිහුලුනුවරට නායකවූ රජ්ජුරුවෙනි! විවාළයුතුවූ යම්කිසි ප්‍රශ්නයෙක් ඇත්නම් තොප විසින් යම් සැකයක් කරන ලද්දේවිනම් ඒ සියල්ලම විචාරව. ඊට කාරණා කිමෙක්දැයි මාගේ නුවණින්ද ඒ කුශලධර්මයන්ගේ උත්පත්ති කාරණයන්ද තොප ගිවිස්වා සැකනැති බවට පමුණුවාලම්යි කිවාහුය. නැවත රජ්ජුරුවෝ කියන්නෝ නාරද තාපසයෙනි! තෙපි බොරුවක් නොකියා කියව, මේ ලොකයෙහි යම් සත්‍යයක්හු විසින් දෙවියෝ ඇත, මවුපියෝ ඇත, මෙලොව ඇත, පරලොව ඇත, කම් ඇත, කම්පල ඇතැයි කියන ඒ සියල්ලම තොප අතින් විචාරම්, ඒ ප්‍රකාශකොට කියාලවයි කිවාහ. නාරද තාපසයෝ කියන්නෝ රජ්ජුරුවෙනි! දෙවියෝත් ඇත, මවුපියෝත් ඇත, මෙලොවත් ඇත, පරලොවත් ඇත, සුභාත දුශ්චරිත කර්මයන්ගේ විපාකයත් ඇතැයි මෙලොව පරලොව දන්නා යම් සත්වයෙක් කියේ නම් ඒ ඇත්තමය, වසතුකාම කෙලෙස කාමයෙහි ගිජුවූ මෝහයෙන් මූසාවූ සත්වයන්ට මෙලොවත් පරලොවත් වන්ධ්‍යාවූ විපාක නොදනෙනිසි කිවාහ.

ඉක්බිත්තෙන් නාරද තාපසයන් කිබස් අසා හාසයකොට කියන්නාවූ රජ්ජුරුවෝ නාරද තාපසයෙනි! මළාවූ සත්වයන්ට පරලෙව්හි වසන්නාවූ ස්ථානයක් ඇතැයි කියා තෙපි අදහව් නම් මෙලොවදී මට කහවණු පන්සියයක් ණයට දෙව, තොපට පරලොවදී පොලී හා සමග කහවණු දහසක් දෙමියි කිහ. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ පණිත් මඩ්‍යයෙහි ඒ රජ්ජුරුවන්ට නින්දාකොට කියන්නාහු "ඉදින් අපි මේ තෙමේ සිල්වතැයි කියාද සබවසක්ම කියන්නේයයි කියාද ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මේ අවස්ථායෙහි මෙසේවූ දෙය්‍ය ධර්මය පරිත්‍යාගකොට මෙසේවූ ප්‍රයෝජනයෙක් වන්නේයයි දැනුමෝ නම් මොවුන්ට පොලියට කහවණු පන්සියයක් දෙමිහ. තෙපි වනාහි සාහසික ක්‍රියාවක් කරන්නාහ. මිථ්‍යාදෘෂ්ටිගෙන දන් හල් වැද දුගිමිගී යාචකයන් පලවා පරදුරුදීවූ නොයෙක් අකුසල්කොට මෙසින් චුතව නරකයෙහි උපදුව. මෙසේ රෞද්‍ර ක්‍රියාකොට නරකයෙහි වැස දුක් විඳිනාවූ තොපකරු ගොස් කවරෙක් කහවණු දහස මට දෙවයිකියා ඉල්වන්නේ වේද, තවද මහරජ්ජුරුවෙනි! මුන්ට මෙසේවූ පරිත්‍යාගයක්කොට මෙබදු දෙයක් ලැබෙන්නේයයි දැනෙන්නාවූ සැබෑබසක්ම කියන සුලුවූ සිල්වත්වූ උට්ඨාන වීර්‍යයෙන් යුක්තවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදි උත්තමයන්හට තමන්ගේ ප්‍රයෝජනයෙහි සලසාගෙන වසතු උපදවාගෙන අප සන්තකදෙය දෙවැනිව ගෙනහැර දෙන්නේයයි වසතු ඇත්තෝ තුමූම සම්‍යක්තනින් පවරති. එසේවූ සථානයට දුන්දෙය ලැබෙන්නේයයි කිවුය. මෙසේ රජ්ජුරුවෝ බොධිසත්වයන් විසින් මැඩ කියනලද්දේ කිසිවකුත් නොවැටහෙන්

නෝ මුවෙන් නොබැණ හුන්නාහ. මහජනයා තුටු පහටුව දිව්‍යවූ තපස්වීන් වහන්සේ මහත්වූ ඉඞ්ධි ඇතිසේක. මහත්වූ ආනුභාව ඇතිසේක. අද දවස් රජ්ජුරුවන් වහන්සේගේ මිථ්‍යාදෘෂ්ටි අරවනසේකැයි සියලු මිනිසුලුනුවර එහා මෙහාලාහාල විය. මහබෝසතාණන්ගේ ආනුභාවයෙන් සත්‍යොදුන් පමණ මිනිසුලුනුවර මුළුල්ලෙහි ඔවුන්ගේ ධර්මදේශනාව නැසූ කෙනෙක් නම් නැත.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මේ රජ්ජුරුවෝ ඉතා තරකොට මිථ්‍යාදෘෂ්ටි ගත්හ. නරක හයින් මොහු තැතිගන්වා මිථ්‍යාදෘෂ්ටි හරවා නැවත දිව්‍යලොක සුවපතිය දක්වා අස්වසම් සිතා මහරජ්ජුරුවෙනි! ඉදින් තෙපි තොප ගත් ලබ්ධිය නොහරණහු විනම් මෙපරිද්දෙන් අපමණවූ දුක් ඇති නරකයට යන්නහුදැයි කියා නිරය ප්‍රතිබද්ධවූ කථාවට පටන්ගත්හ. රජ්ජුරුවෙනි! මෙලොවින් ඒ නරකයට ගියාවූ තෙපි ලෝතුඩු ඇති කපුටු සමූහයා විසින්ද අවශෙෂවූ කපුටුවන් විසින්ද ගිජුලිහිණියන් විසින්ද උකුස්සන් විසින්ද තුඩින් විද ඇද කඩාකනලද ගාත්‍රා ඇතිව වැහෙන්නාවූ රුධිර ඇතිව මෙලෙසින් ඒ නරකයෙහි පැසෙන්නාවූ තොප අතින් නරකයට ගොස් කවර නම් සත්වයෙක් මස්සෙන් දහසක් මට දුනමැනවැයි ඉල්වන්නේදැයි කිහ. **ඒ කාලාපකාල** නම් නරකය වර්ණනාකොට ඉදින් මේ නරකයෙහි නූපදනේ විනම් **ලොකානන්තරික** නරකයෙහි උපදනෙහියයි ඒ නරක යෙහි දෙස් දක්වනු පිණිස කියන්නෝ මහරජ්ජුරුවෙනි! ලොකාන්තරික නරකයෙහි තිර්යක්හු උපදනාහ. ඒ නරකයෙහි වක්ෂුර්විඥානයාගේ උත්පත්තිය වලකන්නාවූ ඝනවූ අන්ධකාර ඇත්තේය. දරුණුවූ සවභාව ඇත්තේය. එහි චන්ද්‍රසූර්‍යාදී දෙදෙනාත් ආලොකකොටගත නොහෙන් නාහ. රූප දැවලය යන විභාගයක් නොදන්නේය. එබදුවූ ස්ථානයට ගොස් වසනු කැමැත්තාවූ කවර නම් සත්වයෙක් මාගේ කහවණු දහස දෙවයි කියා ඉල්වන්නේද? ඒ රජහට ලොකාන්තරික නරකය විස්තර හෙයින් වර්ණනාපොට ඕහාර්ජ! මිථ්‍යාදෘෂ්ටිය නොහරනාවූ තෙපි උදක් මේ නරකයෙහිම දුක් විඳිනාහු නොවෙති. අනික් නරකයකත් දුක්විඳිනාහයි දක්වන්නාහු මෙසේ කීහ. එම්බා රජ්ජුරුවෙනි! මෙලොවින් චුතව පරලොවට පැමිණියාවූ සත්වයන් කඹුරුවන් පැහැ ඇත්තාවූද සමවන් පැහැ ඇත්තාවූද කරකැවුණාවූ ශරීර ඇත්තාවූද සුනඛයෝ දෙදෙනෙක් ගිනිගෙන දිලිසෙන්නාවූ යකඩමය දළුවලින් ඔවුනොවුන් ඇද ඇද සුණුවිසුණුකොට කන්නාහ. තවද නරකයෙහි වසන්නාවූ සත්වයාද දරුණුවූ ව්‍යාඝ්‍රයන් විසින්ද වණ්ඩමෘගයන් විසින්ද සිදිනාලද්දාවූ ගාත්‍රා ඇතිව වැහෙන්නාවූ රුධිරයන් ඇතිව දුක් විඳින්නේය. එසේ පැසෙන්නාවූ තොප අතින් පර ලොවදී කවර නම් සත්වයක් කහවණු දහස ඉල්වන්නේද? තවද රජ්ජුරුවෙනි! පුථිජාතියෙහි අකුසල්නළාවූ කාලාපකාල නම් නරකයෙහි උපන්නාවූ පසමිතුරුවූ කාලාපකාල නම් නිරයපාලයෝ ගිනිගෙන දිලිසෙන්නාවූ ඊතල වලින්ද මොනවට සතගාහ ලද්දාවූ මුවහත් ඇති අඩයටි වලින්ද දෙසිදුරු කොට අනින්නාහුද වෙයි, තවද රජ්ජුරුවෙනි! නිරයපාලයෝ වටකොට ගෙන නෙරයික සත්වයන් හැන දෙසිදුරු කරන්නාහ.

මෙසේ ජ්වලිතායුධයෙන් හැන විද බොහෝ දුකට පමුණුවනලද්දාවූ නරකයෙහි වග්නිජ්වාලා අතරෙහි දුක් ඉවසාගත නොහී ඔබ මොබ දිවන් නාහු ඇලයෙහිත් බඩෙහිත් ශරකුන්න මුද්ගරාදියෙන් පහරනු ලබන්නාහු ප්‍රහූත තජ්ජා ජ්වලිතායුධයෙන් පළනලද බඩ ඇති තොප ඒ දුක් ඉවසාගත නොහී සැලෙමින් වෙවුලමින් දුක්විඳිනා තැනට ගොස් ඔබදී ණයට දුන් කහ වණු පන්සියය පොලී වැඩිගියේය. එසේහෙයින් පොලි හා සමඟ මස්සෙන් දහස දුන මැනවැයි නරකදුක් බලා නොබා සිට කවර කෙනෙක් තොප අතින් ණය ඉල්වද්ද? තවද රජ්ජුරුවෙනි! ඒ නරකයෙහි අඩයටිය, ශරය, තොමරය, හෙල්ලය යන අනෙකප්‍රකාරවූ ආයුධ නමැති වැසි නහා වසින් නේය. නැවත දරුණුවූ පවුකම් කළ නිරිසතුන් මුදුනෙහි ගිනිගෙන දිලියෙන්නාවූ කිහිරහුරු මෙන් ගිනිඅහුරු ඉසි දිලියෙන්නාවූ ගිනිසළා ඇති නොයෙක් ආයුධයෝ දුමමින් දිලියෙමින් හුහුරමින් අහසින් අවුත් නෙරයික සත්ත්වයන්ට භය උපදවමින් ඇන විද බොහෝ දුක් උපදවන්නාහ. වැසි වස්නා කල්හි සෙනගසන හඬමෙන් ගිනිගෙන දිලියෙන්නාවූ ගල්කුළු සමූහ නමැති වෂ්ාත් දුමමින් දිලියෙමින් හුහුරමින් අවුත් ඒ නෙරයිසා සත්වයන්ගේ මුදුනෙහි වස්නේය. තවද ඒ නරකයෙහි ඉතා ඉවසිය නොහැකි ගිනිරැස් වැනිවූ හුණු පවන් හමන්නේය. එසේහෙයින් ඒ නරකයෙහි සවලාවූත් සැපයෙක් සිතට කිසිවිටෙකත් නැත්තේය. මෙබඳුවූ ආශ්වාදයක් නැති නරකයෙහි දුක් කම්කටුලු විඳීමෙන් දුක්පත්ව ඝන්නට සුදුසුවූ සථානයක් නොලැබ ගිනිගත් යපොළොව ඒ ඒ තැන දිව ඇවිදිනාවූ තොප සමීපයට පලාගොස් වහන්ස! මාගේ මස්සෙන් දහස දුනමැනවැයි නරකදුකට නොබා සිට කවර නම් කෙනෙක් ණය ඉල්වද්ද? තවද මහ රජ්ජුරුවෙනි! ගිනිගෙන දිලියෙන්නාවූ ඒ ඒ රථයෙහි වාරයෙන් වාරය යොදාගෙන ගිනිගෙන දිලියෙන්නාවූ කැවිටින් පහරන ලදුව ගිනිගෙන දිලියෙන්නාවූ නවසොදුන් බොල ඇති යපොළොව වග්නිජ්වලා අතරෙහි දෙපයින් ගිනි මැඩගෙන ඒ දුක් ඉවසාගත නොහී ඇත් මැත් බලා දිවන්නාවූ තොප සමීපයට ගොස් කහවණු දහස දුනමැනවැයි ණය ඉල්වන්නෝ කවුරුද? තවද රජ්ජුරුවෙනි! ඉතා තියුණුවූ කර මුවහතින් ගැවසී ගත්තාවූ ඛාත්පයින් ගිනිගෙන දිලියෙන්නාවූ දැක්ම හා සමඟ අපමණ භයඋපදවන්නාවූ නැගීමෙන් බැසීමෙන් කයට විඛාදෙන්නාවූ එබඳුවූ ඒ අයපළිතයට යමපලුන් විසින් පහරන ලදුව නැගී බැස දුක් විඳිනා කල්හි, තොපගේ සඛීඛහයෙහි මස් ලොඹුවේ තබා සැත්බානාලද මස්කැවියක් මෙන් ඒ කරමුවහතින් කැපී සුණුවිසුණු වන්නේය. මෙසේ ගිනිගෙන දිලියෙන්නාවූ කරමුවහතින් කැපී ලේ පෙරපෙරා අනෙකවාරයෙහි අය පළිතයට නැගී බැස දුක්විඳිනාවූ තොප සමීපයට ගොස් පොලී හා සමඟ මස්සෙන් දහස දුනමැනවැයි මෙබඳුවූ දුක් බලබලා සිට කවරකෙනෙක් තොප අතින් ණය ඉල්වද්ද? තවද මහරජ්ජුරුවෙනි! ඛාත්පයින් ගිනිගෙන දිලියෙන්නාවූ දැක්ම හා සමඟ අපමණ භය උපදවන්නාවූ අහුරු රැසට යමපලුන් විසින් පහරනලදුව නැගී විශෙෂයෙන් දැවාවූ ශරීරඇතිව බැගෑව අසරණව දුක් ඉසකබාවලප්නාවූ තොප සමීපයට ගොස් පරලොවදී කහවණු දහස දුනමැනවැයි කවුරුණය ඉල්වද්ද? තවද රජ්ජුරුවෙනි! ඉතා තීක්ෂණවූ නිරිසතුන්ගේ වෙර ලේ බොන්නාවූ මෙබඳුවූ ගිනිගත් සොළොසාඟුල් කටුයෙන්ගැවසීගත්තාවූඅයොමයවූහිඹුල්රුක් නිල්වලාකුලක්

මෙන් උස්ව සිටිනාහ. පරස්ත්‍රී පරපුරුෂ සෙවන වශයෙන් ලොභයෙන් අන්‍යෝන්‍ය රාගාන්ධ කළාවූ ස්ත්‍රීපුරුෂයෝ තිතිගෙන දිලියෙන තෙප් ගත් අත් ඇති යමපලුන් විසින් මරා මෙහෙයන ලද්දාහු ඒ තිඛුල්වනයට ගඩමින් වදමින් නොඇමියිව නැහෙන්නාහ. මෙබඳුවූ සොළ තිඛුල්වනයට යම පලුන් විසින් හොප මරා නානාවිධ කල්හි සොළොසාහුල් කටුයෙන් තොප ගේ සකල ශරීරය කැපී පැලී ලෙහෙයෙන් රුධිර රහන් පෙරෙහියාක්මෙන් බලන්නාවූ සඩයන්ට පෙනෙන්නේය. නැවත සම් මස් නහර නැළීමෙන් ඉදිමී පුයාගත් හෙයින් පිපි තියාක් වැනිවූ දුක්ඛවේදනායෙන් පිඹිතවූ ශරීර ඇතිව සෘණක්ෂණයෙහි සුසුම්ලමින් මහදුක් අනුභව කරන්නාවූ මෙසේවූ පූර්වජාතියෙහි කළ අකුසලකම් නමැති බලවත්වූ අපරාධ ඇති තොප ඒ කොළනිඛුල් රුසට නැගී දුක් අනුභවකරන තැනැත්තන් සඩමීපයට ගොස් ණය ඉල්වන්නෝ කවුරුදෝ! තවද රජ්ජුරුවෙනි! අයොමයවූ අනිත්‍යක්ෂණවූ තෙරසින සඩයන්ගේ ශරීරයෙහි රුධිර පානයකරන්නාවූ ගිනිගෙන දිලියෙන ඛඩගපත්‍රයෙන් ගැවසිගත්තාවූ අසිපත්‍ර වෘක්ෂයෝ නිල්වලාකුළක්මෙන් උස්ව සිටිනාහ. මෙබඳුවූ අසිපත්‍ර වෘක්ෂයට යමපලුන් විසින් තොප මරා නැඟූ කල්හි නිත්‍යක්ෂණවූ ඛඩිගපත්‍රයෙන් කන්නාසා ආදිය කැපී සකල ශරීර යෙන් ලේපෙරපෙරා මහදුක් විඳිනාතැනට ගොස් පරලොවදී මාගේ කහවණු දහස දුනමිනවැයි කවුරු නොබා සිට ණය ඉල්වද්ද?

ඉක්බිත්තෙන් මෙසේ හසා පාදුදිය ඡේදනයෙන් මහත්වූ දුක් ඇති අසිපත්‍ර නරකයෙන් මැත්වූ නොබෝකලකින්ම ගිනිගෙන දිලියෙන ලෝ දියෙන් පිරී බස්නාවූ වෙතරණී නම් ගංගායෙහි යමපලුන් විසින් මරාගෙන ගොස් හෙළා කල්හි එහි වැටී මහදුක් අනුභව කරන්නාවූ තොප සඩමීපයට ගොස් ණය ඉල්වන්නෝ කවුරුදෝ! තවද රජ්ජුරුවෙනි! ඒ එරැඹවූ ක්ෂාරෝදකයෙන් යුක්තවූ ගිනිගෙනදිලියෙන්නාවූ හැසිය බැලිය වැඳිදනොහෙන හෙයින් දුදුළුවූ සියුම්වූ මුවහත් ඇති යපොකුරුපතින් ගැවසීගත්තාවූ ඒ වෙතරණී නම් නදිය නියුණූ මුවහත් ඇති යපොකුරුපත් පිරින් වැහෙන් නේය. කිසි විටක්හි නැත්තාවූ වුකත ප්‍රකාරවූ ඒ වෙතරණී නම් ගංගාජල යෙහි යපොකුරු පතින් කැපෙන ලද ශරීර ඇතිව ලේ පෙරපෙරා කලෙක උඩුබුනවද කලෙන යටිගහවද ඇදගෙනගොස් මෙසේ නොයෙක් පරිද්දෙන් දුක් විඳිනාවූ තොප සඩමීපයට ගොස් කහවණුදහස දුන මැනවැයි පරලොවදී කවුරු ණය ඉල්වද්දැයි මෙසේ මහ බෝසතාණන් විසින් කියනලද මේ නරක කථාව අසා අඩහානිරජ්ජුරුවෝ භයින් තුසටව මහබෝසතාණන් පිහිටකොට සිටා කියන්නාහු ඍෂින්වහන්ස! කම්ඵල දූක්විම් වශයෙන් නුඹවහන්සේ විසින් කියනලද්දාවූ මේ යථොක්තවූ කාරණා අපා භාජනලද රැකක් මෙන් භය ගෙන වෙවුලමින් මුළාවූ සිත් ඇත්තෙම් දිග් ව්‍යවසථාවක් ලොට ගත නොහෙමි. සවර දිනක කොතැනක සිටි බවත් මට නොදැනෙන්නේය. මා කළ පාපකර්මයින් තැවෙමි. මට මහත්වූ නරකභය උපන. එසේ හෙයින් මෙතැනදී නුඹවහන්සේ විනා මට අන් පිහිටෙක් නැහ. මතු මත්තෙහි මා සිතට දුක් නුපදවා මා සිත සැනසුව මැනව, තවද ඍෂින්වහන්ස! නුඹ වහන්සේ ගිනිගත් කල්හි ගඟමැදකට වන්කලක්මෙන්ද, ගංගායෙහිත් සමුද්‍ර යෙහින් නැව් බිඳී තරඹ වෙගයේන් ඇත් මැත් බලා ගසා දමනලදුව පිහිට නොලබන්නාවූ සඩයක්හට දිවයිනක් මෙන්ද, ඝනාඛකාරයෙහි ඇවිදිනාවූ

සත්‍වයන්හට ප්‍රදීපයක් මෙන්ද, නුඹවහන්සේම පිහිටවූසේක. තවද මහර්ෂීන්වහන්ස! නුඹවහන්සේ මව එහලොකික පාරලොකික අර්ථයෙන් හා දශකුශල ධර්මයෙන් අනුශාසනා කළ මැනව, මා විසින් ගිය දවස අකුශල කර්මයෙහි යෙදීම් වශයෙන් අපරාධ කරනලද, එසේ යෙසින් සෘෂීන්වහන්ස! යම්සේ මම නුඹවහන්සේ විසින් කියනලද අනෙක ප්‍රකාරවූ දුක්කර්මකටුළු ඇති නරකයෙහි හොස් නොහෙන්නේවීනම් එපරිද්දෙන් මට කුශලමාර්ගය සකස් කොට කිව මැනවැයි කීහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ ඒ අඛ්‍යාතිරජ්ජුරුවන්ට කුශල මාර්ගය කියනු සඳහා කුශලමාර්ගයෙහි මනාව පිළිපන්නාවූ පුරාතන රජදරුවන් උදහරණ වශයෙන් ගෙන හැර දක්වන්නාහු මෙසේ කීහ. මහරජ්ජුරුවෙනි! **ඛෘතරාෂ්ට්‍ර** නම් රජ්ජුරුවෝය, **විශවම්භු** නම් රජ්ජුරුවෝය, **ෂාමනශ්‍රි** නම් රජ්ජුරුවෝය, **අර්ඨක** නම් රජ්ජුරුවෝය, **සිත්තර** නම් රජ්ජුරුවෝය, යනමේ රජදරුවන් පස්දෙනාහා මොවුන් කෙරෙන් අන්‍යවූ රජදරුකෙනෙක් ඇද්ද, ඒ සියලු රජදරුවෝම මහණබමුණන්ට අත්පා මෙහෙකොට යම්සේ ශක්‍ර සම්පත්ශියට පැමිණියෝද, එපරිද්දෙන්ම තෙපිත් පණ්ඩිවා ආදීවූ අධර්මසමාදානය දුරුකොට ත්‍රිවිධවූ සුචරිතධර්මයෙහි හැසිරෙව, තවද පෘථිවීශ්වරවූ මහරජ්ජුරුවෙනි! තොපගේ ප්‍රාසාදයෙහිත් ඇතුළු නුවරත් පිටිනුවරත් ගම් නියම්ගම් දනවු ආදියෙහිත් ආහාරපානවර්ග ගත් අත් ඇති පුරුෂයන් කවරෙක් සය ඇත්තෝද? කවරෙක් පිපාසඇත්තෝද? කවරෙක්මල්පලදිද?කවරෙක් සුවඳ විලවුන් ගල්වාද? නොයෙක් පැහැයෙන් යුකතවූ වස්ත්‍රගත්තාහු කවරෙක් හඳිදූසි අනෙක ප්‍රකාරවූ රතනාභරණයන් කවරෙක් පලඳි දැයි මෙසේ කියා අඩගා ඇවිදුවත්වයි මාර්ගයෙහි යන්නාවූ සත්‍වයන්ගෙන් කවර කොතකුන්ට කුඩයෙන් ප්‍රයොජන ඇද්ද? මොලොක්වූ මනොඥවූ වහනින් කවුරුන්ට ප්‍රයෝජන ඇද්දැයි මෙසේ මෙසේ උදෘසන සවස තොපගේ මාලිගාවෙහිත් ඇතුළු නුවරත් පිටිනුවරත් ගම්නියම්ගම් දනවු ආදීවූ නොයෙක් තැනත් සිට මෙසේ කියා අඩගාවත්වයි, තවද මහරජ්ජුරුවෙනි! තොපට උපස්ථායකවූ අධිකාර,සෙනෙවිරත්, ඇපා,මාපා, මණ්ඩලීය, යන පසළු ප්‍රධාන මණ්ඩලින්හා අවශෙෂවූ රාජසෙවකයන් අතරෙන් ජරාජීර්ණවූ අමාත්‍යාදීන් හා රාජපුරුෂයන්ද, එසේම ජරාප්‍රාප්තවූ ගෙරිමිවුන් හා හස්ත්‍යශ්වාදීන්ද, පළමුපරිද්දෙන් ඒ ඒ රාජකාර්‍යයෙහි නොයොදව, තුරුණු අවස්ථායෙහි තමන් සියලු කාර්‍ය්‍ය කරන්නට සමර්ථයෙසින් ඒ ඒ කාර්‍ය්‍ය නොපිරිහෙළා කරන්නට තරුණ අමාත්‍යාදීහු සමර්ථ වෙති. ජරාවට පැමිණි කල්හි පෙරසේ රාජකාර්‍ය්‍ය නොපිරිහෙළා දුර්ලභයෙසින් කොට ගතනොහෙති. ගෙරිමිවුන්හා ඇතුන් අසුන්ආදීවූ තිරශ්චින සත්වයෝ ජරාවට පැමිණි කල්හි පළමු පරිද්දෙන් රථසකටාදිවූ භාරෝද්වහනයකොට කර්මාන්තකරන්නට අසමර්ථයහ. ඔවුන් අතරෙන් එකකුත් පළමුපරිද්දෙන් කර්මාන්තයෙහි නොයොදව; ජරාවට පැමිණි කල්හි ඔහු තමන් දුර්ලභයෙසින් බරඉසිලීම් සිසෑම් ආදීවූ නොයෙක් කර්මාන්තකොට ගන්නට අසමර්ථයහ. තවද තොපගේ අමාත්‍යාදීන් අතරෙන් යමෙක් පෙර බලිව තොපට අනුන් විසින් කොට ගතනොහැක්කාවූ උපකාරයක් කෙළේවීනම් නොබවහැකි රාජකාර්‍ය්‍යයක් කෙළේවීනම් ඕහට මහත්වූ පෙරහර තබාදී ඛත්ගම් දී දිවෙල් දැසි දැස ගවමහිෂාදීන් දීමෙන් මහත්වූ උපකාර කරව, අසත්පුරුෂයෝ වූකලී තමන්ට උපකාර කළවුන්ට උන් සමර්ථවූ අවස්ථායෙහිම උපකාරකොට සම්මාන ලබන්නාහ. උන් අසමර්ථ අවස්ථායෙහි මූණදී බැණ නැගීමක්වත් ඇස් ලා බැලීමක්වත් නොකරන්නාහ. සත්පුරුෂයෝ

වූකලී උපකාර කළවුන්ට සමර්ථ අවස්ථායෙහිත් අසමර්ථ අවස්ථායෙහිත් වෙනසක් නැතිව එකාකාරයෙන්ම ප්‍රත්‍යුපකාරකොට මහපෙරහරදී සත්කාර සම්මානකරන්නාහ. මහරජ්ජුරුවෙනි! එසේහෙයින් තෙපිත් සත්පුරුෂ ධර්මයෙහි පිහිටා තොපට උපකාරවූවන්ට ප්‍රත්‍යුපකාර කොට මහත්වූ ඵලයක්‍ෂීදීමෙන් හා සත්කාර සම්මාන කිරීමෙන්සම්භාවනා කිරීමෙන් ජීවිතානන්තය දක්වා එකාන්තිකකොට රකුවයි මෙසේ මහබෝසතාණෝ අඩහාතිරජ්ජුරුවන්ට අවවාද අනුශාසනාකොට දානශීලභාවනා කථාවන් කිරීමෙන් සවණ්මාණ්ඩ අදුන්වා ධර්මදේශනාකරන්නාහු මෙසේ කිහ.

මහරජ්ජුරුවෙනි! මේ ශරීරය දෙවියකු මරකු බඹකු ඊශ්වරයකු විෂ්ණු ආදි දෙවතාවකු විසින් මවනලද්දේ නොවෙයි. මුතුමැණික් රන්රිදී ශඛළ ආදි දශවිධරත්නයෙන් උපන්නේත් නොවෙයි. රත්සඳුන් හෙළ සඳුන් ආදියෙන් උපන්නේත් නොවෙයි. රත්පියුම් හෙළපියුම් ඇඹුල ඉපුල හෙල් මැලි ආදිවූ පුෂ්ප ගණියෙන් උපන්නේත් නොවෙයි. වැළිකුමකින් උපන්නේදයත්? "කෙසින් ලොමින් නියෙන් දතින්, සමින්, මසින්, නහරින්, ඇටින්, ඇට මිදුලෙන්, වකුගඩුයෙන්, හදවතින්, අක්මාවෙන්, දලබුවෙන්, බඩදිවින්, පපුනාණින්, අතුනෙන්, අතුනුබහතින්, නොපැසුණු අහරින්, පැසුණු අහරින්, හිස්මුලින්, පිතින්, සෙමින්, පූයාගෙන්, ලේගෙන්, සෝදියෙන්, මේ හොලින්, කඳුළෙන්, වසාතෙලින්, කෙළින්, සොටුයෙන්, සඳ මිදුලෙන් වටන් දියෙනැ"සි මේ **දෙතිස් කුණපයෙන්** උපන්නේය. නැවත රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය, යි කියනලද පඤ්චස්කන්ධයෙන් උපන්නේය. මෙහි රූපස්කන්ධය නම්, සතබඩලක්‍ෂණවූ පෘථිවීධාතුවය, ද්‍රවලක්‍ෂණවූ ආපෝධාතුවය, උෂ්ණලක්‍ෂණවූ තෙජෝ ධාතුවය, සමුදීරණලක්‍ෂණවූ වායෝ ධාතුවය, යන මේ භූත රූපයෝ සතරදෙනය, මේ සතරමහාභූතයන් නිසා පවත්නාවූ සුවිසිඋපාදාරූපයන් ගෙන් චක්‍ෂුප්‍රසාදය, ශ්‍රොතප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය, යනමේ ප්‍රසාදරූපයෝ පස්දෙනය, රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, යන මේ විෂයරූපයෝ පස්දෙනය, ස්ත්‍රීභාවපුරුෂභාවයයි කියනලද භාවරූපය, හෘදය වස්තුවයයි කියනලද හෘදය රූපය, ජීවිතෙන්ද්‍රිය යයි කියනලද ජීවිතරූපය, කබලිඞ්කාරාහාරයයි කියනලද ආහාර (ඕජා) රූපය, ආකාශධාතුයයි කියනලද පරිච්ඡේදරූපය, කාය විඥප්තිවාක් විඥප්ති සඞ්ඛ්‍යාතවූ විඥප්තිරූපය, ලඝුමෘදුකර්මණ්‍යතාවයයි කියනලද ත්‍රිවිධරූපයන්ගේ වැඩීමය. පැවැත්මය, ජරාවය, භඞ්ගයයි කියනලද මේ චතුර්විධවූ ලක්‍ෂණරූපයයි මෙසේ උපාදාන රූපයෝ සුවිස්සක් භූතරූපාදිවූ කර්මජරූපයන් අටළොස් දෙනකු හා ආකාශධාතුවාදිවූ අකර්මජරූපයන් දශදෙනකු හා සමඟ මේ අටවිසි රූපය **රූපස්කන්ධ** නම් වෙයි, සුඛවෙදනාවය, දුක්ඛවෙදනාවය, උපේක්ෂාවෙදනාවය සෞම්නස් වෙදනාවය, දෞම්නස් වෙදනාවයයි කියනලද පඤ්චවිධවූ වෙදනාව **වෙදනාස්කන්ධ** නම්වෙයි. වස්තු හැඳින ගන්නා පිණිස ලකුණු කිරීමක් මෙන් අරමුණු අදුනන ආකාරයෙන් පවත්නාවූ සංඥාව **සංඥාස්කන්ධ** නම් වෙයි. වෙදනා සංඥා දෙකින් අවශෙෂවූ චෙතනාවය, ස්පර්ශය, මනස්කාරය, ජීවිතෙන්ද්‍රියය, එකාග්‍රතාවය, චිත්තය, විතර්කය, විචාරය, ව්‍යායාමය, ප්‍රීතිය, ඡන්දය, අධිමොක්‍ෂය, ශ්‍රද්ධාවය, සමෘතිය, හ්‍රීය, ඔත්තප්පය, අලෝභය, අවෙෂය, අමෝහය, තත්‍රමධ්‍යත්තතාවය, කායප්‍රශ්‍රබ්ධි චිත්තප්‍රශ්‍රබ්ධි

දෙදෙනාය, කායලඝුභ චිත්තලඝුභ දෙදෙනාය, කායමෘදුභ චිත්තමෘදුභ දෙදෙනාය, කායකර්මණ්‍යතා චිත්තකර්මණ්‍යතා දෙදෙනාය, කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා දෙදෙනාය, කායඍජුතා චිත්තඍජුතා දෙදෙනාය, කරුණාවය, මෘදුතාවය, සම්‍යක්වාචාය, සම්‍යක් කර්මාන්තය, සම්‍යගාජීවය, ලෝභය වෙෂය, මොහය, මිථ්‍යාදෘෂ්ටිය, ඖද්ධත්‍යය, අහිරිකය, අනපත්‍රාප, සංශය, මානය, ඊර්ෂ්‍යාවය, මාත්සර්‍යය, පශ්චාත්තාපය, පිනය මිඩය, යන මේ චෛතසික ධර්මයෝ පනස්දෙන සංස්කාරස්කන්ධ නම් වෙයි. (එතොත්පාද එක නිරෝධ එකාලම්බන එකවස්තුකව උපදනාවූ චෛතසික ධර්මයන් පනස් දෙනාට ප්‍රධානව උපදනාවූ) විෂය විජානන ලක්ෂණයෙන් එකවිධවූ කුශලා කුශල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධවූ කාමාවචර, රූපාවචර, අරූපාවචර ලොකොත්තර වශයෙන් චතුර්විධවූ වේදනා ඤන සංස්කාරාදි භෙදයෙන් එකූනානූවක් ප්‍රමාණවූ චිත්තය විඤ්ඤාණස්කන්ධ නම් වෙයි.

මෙසේ දක්වනලද රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඤ්ඤාණස්කන්ධය,යි කියනලද පඤ්චස්කන්ධයෙන් මේ ශරීර රථය උපන්නේ වෙයි. මෙසේ දෙතිස්කුණප කොට්ඨාසයෙන් හා පඤ්චස්කන්ධයෙන් උපන්නාවූ තොපගේ මේ කය රථයෙකැයි දන්නාලද්දේ වෙව, මෙබඳුවූ මේ ශරීරය රථයක් කොට සිතා ගනුව, සවහා රථයෙහි රථාචාර්‍යයා මෙන් තොපගේ මේ කාය නමැති රථයෙහි පහළවූ පිනම්ඩ ඇති ඛැවින් මන සඞ්ඛ්‍යාතවූ කුශලචිත්ත නමැති රථාචාර්‍යයා ඇත්තේය, සවහා රථයෙහි අකුරමෙන් තොපගේ මේ කාය නමැති රථයෙහි මෛත්‍රී නමැති විශෙෂ කර්මාන්ත කොට නිමවනලද අකුරකින් සමන්විත වන්නේය, පියවි රථයෙහි රථ පරිවාර මෙන් කාය නමැති රථයෙහි දානසංවිභාග නමැති රථ පරිවාර ඇත්තේය, පියවි රථයෙහි නිම්වලලු මෙන් මේ ශරීර නමැති රථ යෙහිත් සන්සුන් පියොවින් ගමන් කිරීම් සඞ්ඛ්‍යාතවූ පාද නමැති නිම්වලලු ඇත්තේය, පියවි රථයෙහි වෙහෙළිපත් මෙන් කාය නමැති රථයෙහි මෙර මාඝට පාණිප්‍රහාරයෙන් හිංසා නොකොට සන්හුන් පියොවින් අත දික්කිරීම චක්කිරිමයයි කියනලද හස්තසංයම නමැති වෙහෙළිපත් ඇත්තේය, පියවි රථයෙහි නොගැසී සැපසේ ගමන්කරනු පිණිස ඒ ඒ තැන රථ සන්ධියෙහි ලන වඳුන් තෙල් මෙන් කාය නමැති රථයෙහි කුසින් ගිනි නොනැහෙන පිණිස ප්‍රමාණ දන ආහාර අනුභව කිරීමයයි කියනලද කුක්ෂි සංයම නමැති වඳුන්තෙල් ඇත්තේය, සවහා රථය නොගැසී යන කල්හි නොගඩන්නාක් මෙන් මේ කාය නමැති රථයෙහි බොහෝ කොට නොදවා ප්‍රමාණ දන බස් කීමයයි කියනලද වාක් සංයම නමැති නොගැසිම්හා නොගැඩීම් ඇත්තේය. පියවි රථයෙහි වටකොට එල්වනලද සවණ් කිංකිණිකජාලා ආදි රථාභරණයන් මෙන් තොපගේ ශරීර නමැති රථයෙහි බොරු නොකියා සත්‍ය වචන කිම් නමැති සම්පූර්ණවූ රථාභරණයන් ඇත්තේය, සවහා රථයෙහි සන්නිවුධාදීන්ගේ මනාව වැද ගෙන පිහිටීමක් මෙන් කාය නමැති රථයෙහි මට ඇලුටුවූ කණ්ඨරසායනවූ නිර්දෙෂවූ ප්‍රිය තෙපුල් බිණීමයයි කියනලද මට ඇලුටුවූ නිර්දෙෂවූ රථාඛ්‍යයන් ඇත්තේය, සවහා රථයෙහි ඒ ඒ රථඅඞ්ග නොසියිලෙන පිණිස ලනලද බදුම්ලාටුවක් මෙන් කාය නමැති රථයෙහි ප්‍රමාණ දන යුක්තප්‍රාප්තවූ බස්කීම් නමැති සඞ්ග බඳන ලඟටු ඇත්තේය, පියවි රථයෙහි සැරහිම් පිණිස බඳනාලද ධජ පතාකාදි රථාලඞ්කාර මෙන් කාය නමැති

රථයෙහි කම්ඵල ඇදහීම සඟහාව සොඵ ඇති ශ්‍රද්ධාව හා වස්තු පරිත්‍යාග චේතනා ලක්ෂණවූ අලෝභ නමැති සුන්දරවූ රථාලඞ්කාරයන් ඇත්තේය, පියවි රථයෙහි උභය පාර්ශ්වයෙහි කිඹුල්තලු මෙන් කාය නමැති රථයෙහි සිල්වතුන්ට යටත්ව පැවතීම් හා ඇදිලි බැඳ නමස්කාර කිරීම් නමැති දැල යෙහි පිහිටි කිඹුල්තලු ඇත්තේය, සඟහා රථයෙහි රිය හිස මෙන් කාය නමැති රථයෙහි අඵරුෂවූ මෘදු සඟහාව සඞ්ඛ්‍යාතවූ නොදුඞ් බැව් නමැති නම්නවූ රියහිස ඇත්තේය, පියවි රථයෙහි පිසහිස බැඳ අල්වාගෙන සිටිනා රුහාණ මෙන් කාය නමැති රථයෙහි අඛණ්ඩවූ පඤ්චශීලය හා වක්ඛුරින්ද්‍රියාදින්ගේ නානාලම්බන ග්‍රහණය කොට ඒ ඒ අත දිවිය නොදී අකුලවා ගැන්ම යයි කියනලද සීලසංවර නමැති ගෙන හිඳිනා රුහාණ ඇත්තේය, පියවි රථයෙහි ගල්වුල් ආදියෙහි නොපැකිල යාම මෙන් කාය නමැති රථයෙහි වෙෂ කවයුතු වස්තුයෙහි වෙෂ නොකිරීම නමැති නොපැකිලීම් ඇත්තේය, පියවි රථයෙහි නහනලද ධවලවර්ත්‍රය මෙන් ශරීර නමැති රථයෙහි දශ කුශල ධම් නමැති නහනලද ධවලවර්ත්‍ර ඇත්තේය. සඟහා රථයෙහි වැතිර හිඳිනා පිටාටුව මෙන් කාය නමැති රථයෙහි අවිසන්නිශ්‍රිතවූ බහුශ්‍රුත භාව භාව නමැති වැතිර හිඳිනා පිටාටු ඇත්තේය, සඟහා රථයෙහි පනවනලද පර්‍යේෂක සඞ්ඛ්‍යාතවූ සිංහාසනයක් මෙන් කාය නමැති රථයෙහි ලාභය, අලාභය, අයසය, යසසය, නින්දය, පසංසාය, සුඛය, දුක්ඛය,යි කියනලද අෂ්ටලෝක ධම්යෙහි අකම්පය සඟහාවයෙන් පිහිටියාවූ අවික්ඛිප්පභාවයට පැමිණියාවූ සිත් නමැති විසිතුරු ඇතිරි අතුරනලද රාජපර්‍යේෂකයෙන් සම්පාදිතය, පියවි රථයෙහි ඇණ ආදිවූ සියලු දැරැ සම්භාරය ගැට ආදිය නැතිවීමෙන් නිස්කලඞ්කවූ හර ඇතිවූයේම කැමැතිවිය යුත්තේය, ගතයුත්තේය, එසේ සාල ඒ රථය දික්මාගියෙහි ගමන් කිරීමට සමර්ථ වන්නේ වේද, එපරිද්දෙන්ම කාය නමැති රථයත් මේ දන්දෙන්නට කල. මේ සිල් රක්ෂා කරන්නට කල,මේ පෙහෙවස් රක්ෂාකරන්නට කලැයි මෙසේ කල්දැන කරන ලද පිරිසුදුවූ දැනදිවූ කුශල චිත්තාරම්ණ නමැති සාරථියෙන් යුක්තවෙයි. සඟහා රථයෙහි රියහිස නොහෙනු සඳහා කොකු ගන්වා හෝ දඬු අවුලා හෝ තබන්නාහ. එපරිද්දෙන්ම කාය නමැති රථයෙහි නානාලම්බනවූ සිත් නමැති රියහිස නොහෙනු සඳහා ප්‍රඥා නමැති දඬු කොකු අවුලා තිබීම් ඇත්තේය, පියවි රථයෙහි යොදනලද සෙක්ඛාව අශ්වයෝ සැපසේ රථය ඇදගෙන යන්නාහ. එපරිද්දෙන්ම කාය නමැති රථය නුවණැත්තන්ගේ අවවාදයෙහි පවත්නා බවයයි කියනලද යටත්ව පැවතීම් නමැති මොලොක්වූ වියරැණින් බඳනාලද පඤ්චේන්ද්‍රිය සඞ්ඛ්‍යාත අස්හු සැපසේ යෙති, සඟහා රථයෙහි අසුන් කර යොදනලද සැහැල්ලුවූ වියදඬු මෙන් කාය නමැති රථයෙහි අධික මානය නොකිරීමයයි කියනලද සැහැල්ලුවූ වියදණ්ඩන් යුක්තවෙයි. පියවි රථයෙහි දළකඩමයවූ මහත්වූ පෝරු අතුළ කල්හි බලන්නාවූ සඟයන්ට ඒ රථය ප්‍රසාදවහව සැරසී සිටීද, එපරිද්දෙන්ම කාය නමැති රථයත් කුශලධම් විෂයෙහි නොපසු බැස පවත්නාවූ සිත් නමැති මහත්වූ පෝරු ඇති වෙයි. සඟහා රථයෙහි විෂමවූ ගල් බොරළු හා රජස් නැහෙන්නාවූ මාගීයෙන් යන්නේ රජසින් ගැවසීගත් හෙයින් නොහොඵද, සමතලාවූ රජස් ධූලි නොනැහෙන්නාවූ මාගීයෙන් යන්නේම බලන්නාවූ සඟයන්ට ප්‍රසාදවහව විශෙෂයෙන් හොඵද, එපරිද්දෙන්ම හොපුගේ කාය නමැති

රථයත් උදාසීන වෘඩයන්ගේ සෙවනය නොකිරීමෙන් සමතලාවූ සෘජුවූ මාර්ගයෙහි පිළිපැද පැවතීමෙන් නසනලද කෙලෙස් නමැති රජස් ඇතිවෙයි. පියවි රථයෙහි යොදනලද අසුන් සන්කරන කැවිටක් මෙන් කාය නමැති රථයෙහි ප්‍රතිෂ්ඨාභාව සාධකවූ ආලම්බන්වූ සංවරණය කරන්නාවූ සම්‍යමය කැවිට වන්නේය, සවහා රථයෙහි ඒ ඒ රථසඤ්ඤ බඳනා පිණිස මනාකොට අඹරා තබනලද රැහැණ මෙන් කාය නමැති රථයෙහි නොසිදී අතුරු නැතිව පවත්නාවූ වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත ඩෙයිය්‍යය හා හිත ප්‍රතිපත්තියෙහි යුක්තබවයයි කියනලද යොගය මනාකොට අඹරනලද සපිරවූ රැහැණ වෙයි. පියවි රථය නොහික්මුණාවූ අශ්වයන් යොදනලද්දේ අමාර්ගයෙහි දිවේද, මොනවට දමනයෙහිලීමෙන් හික්මුණාවූ සෛඛ්‍යවයන් යොදනලද්දේ සෘජුවූ මහවතම දිවේද, එපරිද්දෙන්ම චිත්තයත් කෙලස නමැති විෂ විනාශ කිරීමෙන් මනා කොට දමනයෙහි ලනලද්දේ අකුශල ධර්ම නමැති අසත්පථය හැර කුශලධර්ම නමැති ඍජුමාර්ගයෙහි යන්නේය. එසේ හෙයින් මොනවට දමනයෙහි ලන ලද්දාවූ ආචාරසම්පන්නවූ චිත්තය තොපගේ කාය නමැති රථයට සෛඛ්‍ය කෘත්‍යය සිඩ කෙරෙයි. සවහාරථය සෘජුවූ මහමාවතින් ක්ෂේම භූමියට පැමිණේද, එපරිද්දෙන්ම අප්‍රාප්ත වස්තුයෙහි ඉච්ඡාවය, ප්‍රාප්ත වස්තුයෙහි ලොභය, යන මේ ඉච්ඡා ලොභ දෙකකුත් සිත වූ අපාය මාර්ගය නම් වන්නේය. දශකුශල කර්මපථමාර්ගය හා සම්‍යක් දෘෂ්ටි ආදිවූ අෂ්ටාඞ්ගිකමාර්ග වශයෙන් පවත්නාවූ ශීලසංයමය තෙමේ සෘජුවූ ප්‍රශස්තවූ සුගති මාර්ගය නම් වන්නේය. එසේ හෙයින් තොපගේ කාය නමැති රථය නීරයවූ ක්ෂේම භූමි නමැති සුගතියට පමුණුවන්නට දශකුශලමාර්ගය හා (ආර්‍ය්‍ය) අෂ්ටාඞ්ගික මාර්ගය රජමහවතෙක් වෙයි. පියවි රථය ඇදගෙන අමාර්ගයෙහි දිවන්නාවූ අශ්වයන් ගසා වලකා රජමහවතට පමුණුවන්නාවූ කැවිටක් මෙන් රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය, යන පඤ්චකාම ගුණයෙහි ඇල්ම නොට මෙසේ අමාර්ග ප්‍රතිපන්නව දිවන්නාවූ තොපගේ ශරීර නමැති රථයෙහි යොදනලද්ද ලොභාදීවූ අකුශලකර්ම නමැති අශ්වයන් ගසා නවතාලන්නට ආලම්බනයෙහි යථා සභාව ප්‍රතිවෙධ කරන්නාවූ උතුම්වූ තොපගේ ප්‍රඥාව (කැවිටිකෘත්‍යය) ප්‍රභාකෘත්‍යය සිඩ කෙරෙයි. තවද ඒ උතුම්වූ ප්‍රඥාව තොපගේ ශරීර නමැති රථය අකුශලධර්ම නමැති අමාර්ගයෙන් වලකා ඍජුවූ මාර්ගයට පමුණුවාලන්නේය. සවහා රථයට රථාචාර්‍ය්‍යයකු ඇති කල්හිම හොඳිද, ඒ රථාචාර්‍ය්‍යාම රථය පැදගෙන ගොස් කැමැති තැනකට පමුණුවා අති මනාර්‍ථය සිඩ කෙරේද, එපරිද්දෙන්ම තොපගේ මේ දෙහ නමැති රථයට අන්‍යවූ රථාචාර්‍ය්‍යයෙක් නොමැත්තේ තොපගේ ආත්මයම රථාචාර්‍ය්‍යව සිට කාය නමැති රථය සුගති සඞ්ඛ්‍යාතවූ ඊප්සිත ස්ථානයට පමුණුවා ඉෂ්ටාර්ථ ප්‍රසවය කෙරෙයි. මහරජ්ජුරුවෙනි! ඉදින් මේ වුකත්ප්‍රකාර ශරීරය නමැති රථවාහනයෙන් යන්නාවූ යමෙක්හට කායවාරාදීන් සමව හැසිරීම හා නොසිදී පවත්නාවූ වීර්‍ය්‍ය සපිරව පවත්නේවීනම් යම්හෙයකින් මේ කාය නමැති රථයත් ඕහට ප්‍රාර්ථනා කරනලද සියලු සම්පත් සාධා දෙන්නේය, එසේ හෙයින් මෙබඳු කාය රථයෙන් යන්නාවූ තෙපි එකාන්තයෙන් කිසිකලෙකත් නරකාදීවූ සතර අපායට නොගොස් චාතුර්මහාරාජිකාදිවූ සදිව්‍යලොකයෙහි ඉපිද අපමණවූ දිව සැපත් අනුභව කොට කෙළවර නිර්වාණ සම්පත්තියටත් පැමිණෙන්නේය. මෙසේ ඒ මහබෝසතාණෝ අඹහාති රජ්ජුරුවන්ගේ ශරීරය රථොපමායෙන් වර්ණනා කොට කුශලමාර්ගය හඟවා රජ්ජුරුවන් සතුටු කරවූහ.

තවද මහබෝසතාණෝ රජ්ජුරුවන්ට කාරණා කියන්නාහු.

ආචික්ඛ මේ නාරද සුඩ්මඝාහං
යථා අහං නෝ නිරයං පතෙය්‍යං.

මෙසේ මහරජ්ජුරුවෙනි! හෙපි යම් වචනයක් මට කිවු නම් ඒ නොප කි වචනයට මා විසින් අනෙක ප්‍රකාරයෙන් කාරණා කියා ගඟවනලදුයි මෙසේ ඒ රජ්ජුරුවන්ට ධර්මදෙශනා කොට මිථ්‍යාදෘෂ්ටිය හරවා ශීලයෙහි පිහිටුවා මෙහැන් පටන් පාපයන් දුරුකොට කල්‍යාණ මිත්‍රයන් සෙවනය කරව, නිරන්තරයෙන් දැනදිවු දශකුශල ධර්මයෙහි හැසිරීමෙන් හා දශරාජ ධර්මයෙන් අකොප්‍ය කොට රාජ්‍යය කිරීමෙන් අප්‍රමාදව වාසය කරවයි කියා අඛ්‍යාති නම් රජ්ජුරුවන්ට අවවාද කොට රෑජා නම් රාජකුමාරිකාවන්ගේ ගුණ වර්ණනා කොට රාජපර්ෂදටත් රජ්ජුරුවන්ගේ අන්තඃපුර ස්ත්‍රීන්ටත් අවවාද කොට ඒ රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියල්ලවුන් බල බලා සිටියදී මහත්වූ ඉර්ධ්‍යානුභාවයෙන් බ්‍රහ්මලොකයටම ගියාහ.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙන හැර දක්වා වදාරා මහණෙනි! දැන් මතු නොවෙයි. පෙරත් මා විසින් දෘෂ්ටිජාලය බිඳ උරුවෙල කාශ්‍යප සථවිරයෝ දමනයෙහි ලනලද්දේම වේදෑයි වදාරා පූර්‍වාපර සඤ්ඤා ගළපා මේ **මහා නාරද කාශ්‍යප ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි අලාතසෙනාපති නම් දැන් දෙවදත්ත සථවිරයෝය, සුමන සෙනෙවිරද්දු නම් හද්දිය සථවිරයෝය, විජය සෙනෙවිරද්දු නම් ශාරිපුත්‍ර සථවිරයෝය, බිජකයා නම් මෞද්ගල්‍යායන සථවිරයෝය, ගුණාජීවකයා නම් සුනකඛත්ත ලිච්ඡවි පුත්‍රය, රාජකුමාරිකාව නම් ධර්මභාණ්ඩාගාරිකාවූ ආනන්ද සථවිරයෝය, පාපදෘෂ්ටිත් අඛ්‍යාති රජ්ජුරුවෝ නම් උරුවෙල කාශ්‍යප සථවිරයෝය, එසමයෙහි බ්‍රහ්මලොකයෙන් අවුත් අඛ්‍යාති රජ්ජුරුවන්ගේ දෘෂ්ටිජාලය බිඳ රජ්ජුරුවන් හා සියලු රාජපර්ෂදට අවවාදානුශාසනා කොට සවඟිලොකොතපත්තිය කරවූ නාරද මහාබ්‍රහ්මවූයේම නිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙමිදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

මහා නාරද කාශ්‍යප ජාතකය නිමි.

තුරිදත්ත ජාතකය.

එක් සමයෙක්හි ශාක්‍යකුල ප්‍රධානවූ නිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජෙතවන මහාවිහාරයෙහි වාසයකරන සේක් පෙනෙවස් මිසු උපාසකවරුන් අරභයා මේ ජාතකය වදාළසේක.

කෙසේදයන්?

ඒ උපාසකවරු පොහෝදවස් උදැසනම පෙනෙවස් ඉවා දන්දී වළඳා ඉක්බිති ගඳදුම්මල්පහන් ආදිය ගත් අත්ඇතිව ජෙතවන විහාරයට ගොස් බණ අසනවේලෙහි එකත්පසව උන්නාහුය. එකල්හි බුදුරජාණන්වහන්සේ

ධම්සභාමණ්ඩපයට වැඩ පනවනලද බුඛාසන මසුනකයෙහි යුගදුරු මුදුනෙහි සඟසුරශ්මීන් බබළන්නාවූ බාලාකී මණ්ඩලය මේන් නීලපීතලොහිතාවදාත මාඤ්ජෂ්ඨ ප්‍රභාසවරයයි කියනලද ෂට්වර්ණ ඝන බුඩරශ්මිමාලාවන් විහිදුවමින් දිලිහි දිලිහී වැඩහිඳ භික්ෂුසඞ්ඝයාවහන්සේ බලා වදාළසේක. භික්ෂූන් වහන්සේ ප්‍රධානකොට ඇති සිවුවණක්පමණින් අතරෙන් යම් කෙනකුන් අරහයා ධම්මකථාවෙක් උපදිනම් ඔවුන් හා සමඟ සම්බුදයන් වහන්සේ කථා කරනසේක. එසේ හෙයින් අද උපාසකවරුන් අරහයා පූර්වචරිත ප්‍රතිසංයුක්තවූ ධම්මකථාවෙක් උපදනේ යයි දැන උපාසකවරුන් හා සමඟ කථා කරනසේක් උපාසකවරුනි! පෙෂ්‍යවස් විසූදැයි විචාරා එසේය සවාමීන්වහන්සැයි දැන්වූ කල්හි යහපත උපාසකවරුනි! පෙහෙවස් වසන්නාවූ තොප හැම විසින් කළසේ ඉතා යහපත් වන්නේය, එතකුදුවුවත් තෙපි හැම මා බදුවූ අවවාද දයකවූ සම්බුදකෙනකුන් ලැබ පෙහෙවස් වසන්නාහුවූනම් ඒ තෙමේ ආශ්චය්‍ය නොවන්නේය. පුරාතනයෙහි නුවණැත්තෝ අවවාද දයකවූ කිසිම ආචාය්‍යවරකෙනකුන් නැතිව මහත්වූ යසස් හැර පෙහෙවස් විසූවෝම වේදැයි වදාරා මුවෙන් නොබැණ වැඩඋන් කල්හි ඒ උපාසකවරුන් විසින් සවාමිනි! දැන් අප බොහෝදෙනා පෙහෙවස් රක්ෂාකරන නියාව සියල්ලන්ටම ප්‍රකාශය, අතීතයෙහි නුවණැත්තෝ අවවාද දයකවූ කිසිම ආචාය්‍යවර කෙනකුන් නැතිව සවබුඩින් කල්පනාකොට මහත්වූ යසස් හැර උපෞෂථ ශීලය රක්ෂාකළ නියාව භවාන්තර ප්‍රවෂ්‍යනයෙයින් අප්‍රකාශය, ඒ ප්‍රකාශ කොට වදාළහොත් යෙහෙකැයි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඝටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනකුන් දෙහෙමින් රාජ්‍යය කරන්නාහු පුතණුවන්ට යුවරජ තනතුරු දී උන්ගේ මහත්වූ යශපිරිවර දැක මාගේ රාජ්‍යය ඇරගනිද්ඒහෝයි උපන්නාවූ සැකයෙන් පුත! තෙපි මේ නුවරින් නික්ම යම්තැනක් නොපට අභිප්‍රාය වීනම් එතැන්හි වැස මාගේ ඇවැමෙන් අවුත් කුල සන්තකවූ රාජ්‍යය ගනුවයි කීහ. ඒ රාජකුමාරයෝ යහපත සවාමිනි! කියා පියරජ්ජුරුවන්ට ප්‍රතිවචනදී වැඳ සමූගෙන නුවරින් නික්ම ක්‍රමයෙන් යමුනා නම් ගංගාවට ගොස් යමුනාවටත් සමුද්‍රයටත් පර්වතයටත් අතරෙහි පන්සලක් කොට ගෙන වනමූල් වනඵලා ඵල අනුභවකෙරෙමින් වාසයකරන්නාහ. එසමයෙහි සමුද්‍රයෙහි පිහිටියාවූ නාග භවනයෙහි වසන්නාවූ මළාවූ වල්ලභයන් ඇති එක් නාගමානවිකාවක් අන්‍යවූවන්ගේ සම්පත් හා යසස් බලා කෙලෙස් නිසා නාග භවනයෙන් නික්ම සමුද්‍රතීරයෙහි ඇවිදිනී රාජකුමාරයන්ගේ පියවර සටහන් දැක පදානුසාරයෙන් ගොස් ඒ පන්සල දුට, එකල්හි රාජකුමාරයෝ ඵලාඵලයට ගියාහ. ඒ නාගමානවිකා පන්සලට වැද දඩුමැස්සත් සෙසු තවුස්පිරිකරත් දැක සිතන්නී මේ එක් තපස්වීකෙනෙක් වසන තැනක් වන, එසේ හෙයින් ඒ තපස්වී සැදැහැයෙන් පැවිදිවූයේ ඒහෝ නොහොත් රටින් නහන ලදුව පැවිදිවූයේ ඒහෝයි පරීක්ෂාකරම්, ඉදින් සැදැහැයෙන් පැවිදිවූයේ නම් නෛෂ්ක්‍රම්‍යයෙහි ආලය ඇත්තෝවීනම් මා විසින් සරසනලද යහන නොඉවසති, ඉදින් පඤ්චකාමයෙහි ඇලුණෝවීනම් සැදැහැයෙන් මහණ නුවුනම් මාගේ යහනෙහි සැතපෙති, එකල්හි ඒ තපස්වීන් මට සවාමිකොට මෙහිම වෙසෙම් සිතා ඒ නාගමානවිකා නාග භවනයට ගොස් දිවමල් හා දිවසුවඳ

ගෙනවුත් මල්යහනක් සරහා පන්සල මුළුල්ලෙහි සුවඳමල් තනා සුවඳමල් විසුරුවා පන්සල සරහා නාගභවනයට ගියාය. රාජකුමාරයෝ සවස්වේලෙහි අවුත් පන්සලට වන් තැනැත්තෝ ඒ ක්‍රියාව දැක මේ යහන කවුරුන් විසින් සරහනලද්දේ දෝහෝයි සිතමින් එලාඵල අනුභවකොට මල්සුවඳත් ඉතා යහපත් නියාය එකාන්තයෙන් යහපත්කොටම යහනත් පනවනලද්දේයයි සිතා සැදැහැයෙන් පැවිදිනුවූ බැවින් සොම්නසට පැමිණ සුවඳමල් යහනේ වැදහොත් තැනැත්තෝ කාමයෙන් මත්ව නිදා දෙවැනි දවස් හිරු නැඟි කල්හි නැගිසිට පන්සල නොහැමද ඵලාඵලයට ගියාහ. එකෙණෙහි නාග මානවිකා අවුත් යානේ මිරිකි මලානිකවූ මල් දැක මේ තාපසයෝ පඤ්චකාම යෙහි ඇලුණාහුය. සැදැහැයෙන් පැවිදිනුවූය, එසේ හෙයින් මේ තපස්වීන් වසඟකොට ගන්නට පිළිවන් වන්නේයයි දැන පරණ මල්ගෙන හැරදමා අලුත් මල්ගෙන අවුත් යහනත් සරහා පන්සලත් සරහා සක්මන මල් විසුරුවා නාග භවනයට ගියාය.

ඒ තපස්වී එදවසුත් මල්යහනේ සැතපී තෙවැනි දවස් මේ පන්සල කවර කෙනෙක් සරහද්දෝහෝයි සිතා ඵලාඵලයට නොගොස් පන්සලට නුදුරු තැන සැඟවී සිටියාහ. නාගමානවිකාත් බොහෝ සුවඳමල් ගෙන අසපුවට ගියාය. රාජකුමාරයෝ උතුම්වූ රූප ශ්‍රී ඇති නාගමානවිකාව දැක පිළිබඳවූ සිත් ඇතිව තමන්වහන්සේ නොදන්වාම සිට ඒ නාගමානවිකාවන් පන්සලට වැද යහන සරහන්නට පටන්ගත්කල්හි ගෙට වැද තෝ කවරෙක් හිදුයි විවාළෝය. සවාමිනි! මම නාගමානවිකාවක්මි කී කල්හි සස්වාමිකා යෙහිද අස්වාමිකයෙහිදුයි විවාළෝය. සවාමිනි! මම අස්වාමිකයෙමි වැන්දඹු වෙමි කියා තෙපි වූකලි කවර කෙනෙක්දැයි විවාළිය. මම බරණැස් රජ්ජුරු වන්ගේ පුත්‍රවූ බ්‍රහ්මදත්ත කුමාරයෙමි කියා තෝ වූකලි නාග භවනය හැර කුමක් පිණිස ඇවිදිනෙහිදැයි කිවුය, සවාමිනි! මම නාගභවනයෙහි සස්වාමිකවූ නාගමානවිකාවන්ගේ යසස් බලා කෙලෙස් නිසා උකටලීව එයින් නික්ම වල්ලභයක්හු සොයමින් ඇවිදිමි කිව. මමත් සැදැහැයෙන් මහණ නොවීම් මපියාණන්වහන්සේ නුවරින් නෙරපුහෙයින් මෙතැනට අවුත් වෙසෙමි. තෝ සැකයක් නොකරව මා නිව සවාමි වෙමි. දෙදෙනම මෙතැන සමඟව වසම්හයි රාජකුමාරයෝ කීහ. ඒ නාගමානවිකා රාජකුමාරයන්ගේ බස් අසා යහපතැයි පිළිගෙන එතැන්පටන් ඔවුහු දෙදෙනම එතැනම සමඟව වසුහ. නාගමානවිකා තමන්ගේ ආනුභාවයෙන් මාහැඟිවූ ගෙයක් මවා මහාඍිවූ පර්‍යඞ්කයන් ගෙනවුත් යහන් පැනවූහ. එතැන් පටන් රාජකුමාරයෝ වනමූල් වනඵලාඵල අනුභව නොකොට දිව්‍යවූ ආහාර පානවලියම අනුභවකළාහ. ඉක්බිත්තෙන් නාල්‍යාමකින් නාගමානවිකා දරුගැබක් ලැබ කුමාරයෙනකුන් වැදුය, ඒ කුමාරයාට "සාගරබ්‍රහ්මදත්ත යෝ"යයි නම් තුබුහ. ඒ රාජකුමාරයන් පියවර නහා ඇවිදිනාකල්හි නාගමානවිකා කුමාරිකාවක් වැදුය, ඒ කුමාරිකාවට සමුද්‍රතීරයෙහි උපන් බැවින් "සමුද්‍රජාවෝය "යි නම් තුබුහ.

එකල්හි බරණැස්නුවරවාසී වසන්නාවූ එක් වනචරකයෙක් එතැනට පැමිණ සුවඳුන් කථාකොට ඒ රාජකුමාරයන් ඇඳිනගෙන කීපදවසක් එතැන්හිම වැස දේවයන්වහන්ස! මම නුඹවහන්සේ මෙතැන වසන නියාව

රජ්ජුරුවන් වහන්සේට දන්වම් කියා එතැනින් නික්ම නුවරට ගියේය, එකල්හි රජ්ජුරුවෝ කාලක්‍රියාකළහ, අමාත්‍යයෝ රජ්ජුරුවන්ට කළමනා ආදාහනකෘත්‍යයකොට සත්වැනිදවස් කථාකරන්නාහු රාජ්‍යයනම් අරාජකව නොතිබෙන්නේය. රාජකුමාරයන් වහන්සේ වසනතැනක්වත් ඇති තැනි නියාවක්වත් නොදනුම්හ. පුස්රථය හැර රජ්ජුරුකෙනකුන් ගනුම්හයි මන්ත්‍රණය කළාහ. එකෙණෙහි වනචරකයා නුවරට පැමිණ ඒ කථාව අසා අමාත්‍යයන් සමීපයට ගොස් කියන්නේ මම රාජකුමාරයන් වහන්සේ සමීපයේ තුන්සතරදවසක් වැස ආමි කිය. එබස් අසා අමාත්‍යයෝ ඔහට සත්කාර සම්මානකොට ඒවනචරකයා මාගීනායක කෙරෙමින් කුමාරයන්වසන තැනට ගොස් කරනලද පිළිසඳර කථා ඇතිව රජ්ජුරුවන් කලුරියකළ නියාව කියා දේවයන්වහන්ස! රාජ්‍යය පිළිපැද්ද මැනවැයි කිහ. ඒ රාජකුමාරයෝ නාගමානවිකාවන්ගේ අභිප්‍රාව දනිමියි සිතා ඇකරා ගොස් සොඳුර! මාගේ පියාණන්වහන්සේ ඉකුත්වූසේක, අමාත්‍යයෝ මට දළපුඩුසේසත් නන්වන්නට ආහ. යමු සොඳුර! දෙදෙනම දෙළොස්යොදුන් පමණ ඇති බරණැස් නුවර රාජ්‍යය ගනුම්හ. සොළොස්දහසක්පමණ පුරාඞ්ගනාවන්ට ප්‍රධානවන් නෙහිවේදැයි කිහ. එකල්හි නාගමානවිකාවෝ යන්නට නොපිළිවනැයි කිව. කුමක් නිසාදැයිකිකල්හි අපි උගුවූ විෂතෙජස් ඇත්තම්හ. ක්ෂණකොපියම්හ. සවලපමාත්‍රවූත් දෙඇසට කිපෙන සුලුවම්හ සැපත්තිරොඝය නම් ඉතා බැරෑරුම් දෙඇස එසේහෙයින් මම ඉදින් කිසිවක් දැකවත් අසාවත් කිපි බැලිනම් රඩුම්ටක්මෙන් සියල්ලෝම සුණුවිසුණුව විසිරයෙති. මේ කාරණයෙන් මා යන්නට නොපිළිවනැයි කිව.

රාජකුමාරයෝ දෙවැනිදවසුත් යාච්ඤාකොට කීවාහුය. ඉක්බිත්තෙන් ඒ නාගමානවිකා රාජකුමාරයන්ට කියන්නී මම වූකලී කිසිම කාරණයෙකින් නොයෙමි. මේ මාගේ පුත්‍රයෝ නාගකුමාරයෝ නොවෙති. තොප නිසා උපන්හෙයින් මනුෂ්‍යජාති ඇත්තාහ. ඉදින් මා කෙරෙහි තොපගේ සෙනහයෙක්ඇත්නම් මේ දරුවන්කෙරෙහි ඒ පෙම්කොට අප්‍රමාදවව, මේදරුවෝ වූකලී දිගබිජුවවින් උපන්හ. එසේහෙයින් ඉතා සිවුමැලියෝය මාගීයෙහි ගෙනයනකල අවිසුළහින් මිරිකි මියයියෝනම් කාරණා නොවෙයි. එසේහෙයින් එක් ඔරුවක් කණවා පැන්පුරා මේ දරුවන් ඒ ඔරුවෙහි ලා දියකෙළි කෙළවමින් ගෙනගොස් නුවරට ගියකල්හි න් තොපගේ ගෘහොද්‍යානයෙහිම පොකුණක් කණවා එහි හැම වේලෙහිම ජලක්‍රීඩාකරවව, එසේකළකල්හි මේ දරුවන්ට කිසි පිඩාවෙක් නොවන්නේයයි කිවාය. මෙසේද කියා රාජකුමාරයන් වැඳ පැද කුණුකොට දරුවන් වැළඳ සිඹසනසා ළෙහි ඔවාගෙන ඉස් මුදුන සිඹ රාජකුමාරයන්ට පාවාදී අඩා වැලප එතැන්හිම අතුරුදන්ව නාගභවනයට ගියාය. ඒ රාජකුමාරයෝත් දෙමිනසට පැමිණ දැස කදුළු පුරාගෙන පන්සලින් නික්ම දැස කදුළු පිස අමාත්‍යයන් කරා ගියෝය. එකල්හි අමාත්‍යයෝ කුමාරයන්ට රාජ්‍යය පාවාදී එතැන්හිදීම අභිෂෙකකොට දේවයන්වහන්ස! අපගේ නුවරට යම්හයි කිහ. එසේවිනම් වහා ඔරුවක් කණවා ගැලකට නහා පැන් පුරවා දියපිට වණිණගඬයෙන් යුකතවූ කොයෙක් මල් විසුරුවව, මාගේ දරුවෝ දියබිජුවවින් උපන්හ. එසේහෙයින් දරුවෝ ඒ නැවින් දියකෙළි කෙළිමින් සැපසේ යන්නෝවේදැයි කිවුය. අමාත්‍යයෝ එපරිද්දෙන්ම කළහ, රජ්ජුරුවෝ බරණැස්නුවරට පැමිණ සරහා පිළියෙළකරන

ල්ද නුවරටවැද සොළොස්දහසක් පමණ පුරවතිතාවන්හා අමාත්‍යයන් විසින් පිරිවරනලදුව ප්‍රාසාදයේ මතු මහල්තලයෙහි ශ්‍රියගර්භ්‍යකයේ හිඳ සතියක් මුළුල්ලෙහි මහත්වූ සුරාපානයකොට දරුවන් සෙළනා පිණිස පොකුණු කැණවූහ. දරුවෝ එහි නිරන්තරයෙන් දියකෙළි කෙළනාහ.

ඉක්බිත්තෙන් එක් දවසක් පොකුණට සොරොව්වෙන් පැන් වදන කල්හි එක් කැස්බෙක් පොකුණ ඇතුළට වැද නික්මෙන්නට නිසි මහක් නොදක්නේ පොකුණ පත්ලේ වැදහෙව දරුවන් සෙළනාකල්හී දියෙන් කැඟී ඉස් මැත්කොට ඒ දරුවන් බලා නැවත දියෙහිම ගැලිගියේය. ඒ රාජ කුමාරවරු කැස්බා දැක භයින් ත්‍රස්ථව පියාණන් සවම්පයට ගොස් පියාණන් වහන්ස! පොකුණේ එක් යක්ෂයෙක් අප භයගන්වන්නේයයි කිහ. එබස්ඇසූ රජ්ජුරුවෝ යව ඔහු අල්වවයි රාජපුරුෂයන්ට විධානකළෝය. ඒ රාජ පුරුෂයෝ ගොස් දැලක්දමා කැස්බා බඳගෙන රජ්ජුරුවන්ට දැක්වූහ. කුමා රවරු ඔහු දැක පියාණන්වහන්ස ! මේ යක්ෂයාය මේ යක්ෂයාය කියා අඩගා සූහ, රජ්ජුරුවෝ පුත්‍රස්නෙහයෙන් කැස්බාට කිපියව මොහු ඇරගෙනගොස් වධකොට මරවයි නියොගකළහ. එහැන්හි සමහර කෙනෙක් කියන්නෝ මේ රාජද්‍රොහියාය, එසේහෙයින් මොහු වනලා මෝලින් කොටා සුණුකොට දමන්නට වටනේයයි කිහ. සමහර කෙනෙක් කියන්නාහු මොහු තුන්පාක යකින් පිස කන්නට වටනේයයි කිහ. සමහරකෙනෙක් කියන්නාහු අහු රෙහි ලා පලා අහුරුමස් කන්නට වටනේයයි කිහ. සමහර කෙනෙක් මොහු තමාගේ ඉදුබු කබලින් පලහන්නට වටනේයයි කිහ. එකල්හි උදකහිරිකවූ අමාත්‍යයෙක් කියන්නේ මොහු යමුනානම් ගංගාවෙහි මහත්වූ සළාවැටුම කට දමන්නට වටනේය, එසේ කල්හි මේතෙමේ එහි මහත් විනාශයට පැමි ණෙන්නේය, මෝහට මිට වඩනාවූ අනික් වධයෙක් නැතැයි කිය. එකල්හි කැස්බා ඒඅමාත්‍යයාගේ බස් අසා ඉදුබුකබලින් ඉස පිටත්කොට කියන්නේ එම්බල පින්වත්වූ පුරුෂය ! මාවිසින් තට කෙසේවූ අපරාධයක් කරනලදද! මෙබඳුවූ දුක් කම්කටුල් කුමක් නිසා මට නියෝගකෙරෙහිද! මාවිසින් පළමු මේ සියල්ලවුන් කි වධ ඉවසන්නට පිළිවන මේ තාවිසින් කියනලද්දාවූ වධය ඉතා චණ්ඩය. එසේහෙයින් ඒ වධය මම ඉවසාගත නොහෙමි. මෙබන්දක් මට නොකියවයි කිය. එබස් අසා රජ්ජුරුවෝ මෝහට ඒ වධ ඉවසන්නට පිළිවන. මේ තා විසින් කියනලද්දාවූ වධය ඉතා චණ්ඩය ඒ වධයම කරන්නට වටනේයයි කියා යමුනානම් ගංගාවෙහි සළාවැටුමට දැම්මවූය.

ඒ කැස්බා එසේ දමනලද්දේ නාගභවනයට ගියේය, එකල්හි ඔහු ඒ ජලප්‍රවාහයෙහි කෙළනා ධුතරාෂ්ට්‍රනම් නා රජ්ජුරුවන්ගේ පුත්‍රවූ නාගමාන වකයෝ දැක මේ කොල්ලා අල්ලවයි කිහ, එකල්හි කැස්බා සිතන්නේ මම බරණැස් රජ්ජුරුවන්වහන්සේ අතින් මිදී මෙබඳුවූ වණ්ඩඵරුෂවූ නසින් අාව පැමිණියෙමි. කවර උපායකින් මුන් අතින් මිදී යෙම්දෝයි සිතා එතෙමේ මේ උපාය ඇහැත් වන්නේයයි බොරුවක් හොතාගෙන කියන්නේ හෙපි හැම ධුතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන්වහන්සේ සන්තකව සිට කුමක් නිසා මෙසේ කියව්ද, මම චිත්‍රසූල නම් කැස්බෙක්මි, බරණැස් රජ්ජු රුවන් වහන්සේගේ දූතයෙමි ධුතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේ සමීපයට මෙහෙවර ආම් අපගේ රජ්ජුරුවන් වහන්සේ ධුතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් වහන්සේට තමන්වහන්සේගේ දූ කුමාරිකාවන් දෙනු කැමැතිව මා එවූ සේක. ඒ නා රජ්ජුරුවන්වහන්සේට මා දක්වවයි කිවුය.

ඒ නාගමානවකයෝ සතුටුව ඒකැස්බාඇරගෙන රජ්ජුරුවන්වහන්සේ සවිමිපයට ගොස් එපවත් දැන්වූහ, රජ්ජුරුවෝ ඔහු මෙසේ ගෙනෙවයි සවිමිපයට ගෙන්වා දැක නොසතුටුවූ සිත් ඇතිව මෙබඳුවූ ලාමක ශරීර ඇත්තාවූ සත්වයෝ දූතමෙහෙවර කරන්නට අසමර්ථයෝයයි කිහ, එබස් අසා කැස්බා කියන්නේ කිමෙක්ද රජ්ජුරුවන්වහන්ස! රජදරුවන්ගේ දූතයෝ නම් තල් පොල්සේ උස්මියයුතුද? ශරීරය කුඩාවුවත් මහත්වුවත් ඒ පමණ නොවෙයි, හියතැන කායශ්‍රී සිඛකිරීමම පමණ වන්නේවේද? තවද රජ්ජුරුවන්වහන්ස! අපගේ රජ්ජුරුවන්වහන්සේගේ බොහෝදූතයෝ වන්නාහ,ගොඩදූත මෙහෙවර මනුෂ්‍යයෝ කෙරෙති, අවකාශයෙහි දූත මෙහෙවර පක්ෂීහු කෙරෙති, දියෙහි දූත මෙහෙවර මම කෙරෙමි. මම වූකලී "**චිත්‍රසූලයාය**"යි නම් නනතුරු ලැබ රාජවල්ලභව සිටි එකෙක්මි, එසේ හෙයින් මට නීතුපරිභව නොකරවයි කියා නමාගේ ගුණ වණිණනා කෙළේය, එකල්හි ඔහු අතින් ධ්‍රතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවෝ විවාරන්‍යෝ කවර කාරණයෙකින් රජ්ජුරුවන් වහන්සේ තා එවූසේක්දැයි විචාළෝය, මහරජ්ජුරුවන්වහන්ස! අපගේ රජ්ජුරුවන්වහන්සේ මට කියනසේක් සියලු දඹදිව රජදරුවන් වහන්සේලා හා සමඟ මා විසින් මිත්‍රධර්මය කරනලදි. නොකෙළේ නම් ධ්‍රතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් හා සමඟමය අපගේ "සමුද්‍රජාවෝ" නම් දියණියන් පාවාදීමෙන් ඒ නාරජ්ජුරුවන් හා මිත්‍රධර්ම් තරකොට ගන්නට උවමනාවයි කිසේක, එසේ හෙයින් දැන් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්වහන්ස! මා හා සමඟ පෂිත් එවා නෂත් දවස් නියමකොට රාජකුමාරිකාවන් වහන්සේ පාවාගත මැනවැයි කිය, ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ එබසට සතුටුව ඔහට සත්කාර කොට ඒ කැස්බා හා සමඟ නාගමානවකයන් සතරදෙනකු යවන්නෝ යව රජ්ජුරුවන්ගේ බස් අසා දවස් නියමකොට ගෙන එවයි කියා යැවූය, ඒ නාගමානවකයෝ සතරදෙන යහපත සවාමීනි! කියා කැස්බා ඇරගෙන නාගභවනයෙන් නික්මුණාහ, එකල්හි කැස්බා යමුනාවටත් බරණැස් නුවරටත් අතරේ එක් පියුම් විලක් දැක එක් උපායෙකින් පලායෙමි සිතා කියන්නේ පින්වත්වූ නාගමානවකයෙනි! අපගේ රජ්ජුරුවන්වහන්සේත් උන්වහන්සේ දූදරුවෝත් මා දියෙහි ඇවිදිනා තැනැත්තවූ රජගෙට ගියකල දැකලාම අපට ඇඹුල ඉපුල නෙළුම්මල් දෙව, නෙළුබල හා නෙළුඳුලි දෙවයි ඉල්වන සේක. එසේ හෙයින් මම උන්වහන්සේලා නිසා නෙළුම්මල් ආදිය කඩා ගන්නා කැමැත්තෙමි, මා මෙහැනටම ඇරලා නුදුටත් පෙරාදුකොටම තෙපිහැම රජ්ජුරුවන්වහන්සේ සවිමිපයට යව, එතැන්හිදී මාදක්නෝවේදැයි කිවුය, ඒ නාගමානවකයෝ ඔහුගේ බස් අසා අදහා එහැන්හිදිම කැස්බා විලට ඇරපූහ, ඒ කැස්බා එහැන්හිම එක් තැනක සැඟවිණ, නාගමානවකයෝත් ඔහු නොදක රජ්ජුරුවන්වහන්සේ සවිමිපයට ගියේවැයි සිතා මානවක වෙශයෙන් රජ්ජුරුවන්වහන්සේ සවිමිපයට ගියාහ, රජ්ජුරුවෝ පිළිසඳර කථාකොට කොයි සිට අවුදැයි විචාළෝය, ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් සවිමිපයෙහි සිට ආමිහ, මහරජ්ජුරුවන්වහන්සැයි කිසාල්හ කුමක් නිසා අවුදැයි කිහ, මහරජ්ජුරුවන්වහන්ස! අපි උන්වහන්සේගේ දූහයම්හ. ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේගේ සුව දුක් විචාළ සේක, තවද තමන්වහන්සේගේ නානභවනයෙහි මුකතාමාණිඛ්‍යාදි සම්කියි රත්නයෙක් ඇත්නම් ඒ සියලු රත්නයම නුඹවහන්සේට පඬුරුකොට දී

එවනසේක, කැමැතිසේක් වීනම් ඒ සියලු රත්නාදිය ගතමැනව, නුඹවහන්සේගේ දුවු සමුද්‍රජාවින් අපගේ රජ්ජුරුවන්වහන්සේට පාදපරිචාරිකාකොට දුනමැනවැයි කිහ, එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු අප විසින්ද කිසිකල නත් නසින් හා විවාහයක් කළ විරු නැත. අපි මනුෂ්‍යජාති ඇතිව සිට තිරශ්චීනයන් හා සමග නුසුදුසුවූ විවාහබන්ධනය කෙසේනම් කරමෝදැයි කිහ, එබස් අසා නාගමානවකයෝ කියන්නෝ ඉදින් නුඹවහන්සේට ධුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්වහන්සේ හා සමග සම්බන්ධය නුසුදුසුවීනම් එසේ කල කුමක් නිසා නුඹවහන්සේගේ සේවනාවූ චිත්‍රසුල නම් කැස්බා සමුද්‍රජා නම් රාජකුමාරිකාවන් දෙම්සි අපගේ නාරජ්ජුරුවන්වහන්සේ සඟම්පයට දුන මෙහෙවර එවූසේක්ද? එසේ එවාලා දුන් හිඳ අපගේ රජ්ජුරුවන්වහන්සේට පරිහව කරන්නාවූ නුඹවහන්සේට කළමනා කටයුතු අපි දනුම්හ, අපි නසි නියාව නොදන්නාසේක්දැයි කියා රජ්ජුරුවන් භයගැන්වූහ, තවද ජනෙශ්වරවූ රජ්ජුරුවන්වහන්ස! එකාන්තයෙන් නුඹවහන්සේගේ ජීවිතයත් රාජ්‍යයත් හරනලදමය. මේබදුවූ මහානුභාව සම්පන්න නසින් කිපිකල්හි නුඹවහන්සේ බදු ආනුභාව රහිතවූ රජදරුවෝ ජීවත්ව ගත නොහෙති. අතරතුරෙහිම විනාශයට පැමිණෙති, එසේ හෙයින් රජ්ජුරුවන්වහන්ස! මනුෂ්‍යජාතිව සිට කිසි ආනුභාව මහිමයක් නැතිව මහානුභාවසම්පන්නවූ සෘඩිමත්වූ වරුණ නම් නාරජ්ජුරුවන්වහන්සේගේ ප්‍රිය පුත්‍රවූ යමුනා නම් ගංගාවයට උපන්නාවූ ධුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්වහන්සේට කුමක් පිණිස නිසුකොට කියනසේක්ද? එසේ කිම නුඹවහන්සේට සුදුසුනොවෙයි කිහ.

ඉක්බිත්තෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා කියන්නෝ මහත්වූ යශපිරිවර ඇත්තාවූ ඒ ධුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට මම නිසුකොට නොනියමි. ධුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ පන්සියයක් යොදුන් පමණ ඇති නාගභවනයෙහි බොහෝ නසින්ට නායකයහ. එසේ මහානුභාව සම්පන්නව සිටියෝ වී නමුත් සජීජානි ඇති බැවින් මාගේ දියණියන්ට නුසුදුස්සෝය. වේදේහරාජපුත්‍රයෝත් මාගේ දියණියෝ සමුද්‍රජාවෝත් දෙදෙනම විශිෂ්ටවූ ජාති ඇත්තාහ. ඔහු දෙදෙන ඔවුනොවුන් හා සංවාසයට සුදුස්සෝය. මණ්ඩූකභක්ෂණය කරන්නාවූ සර්පයින්ට මාගේ දියණියෝ සමුද්‍රජාවෝ සුදුසු නොවෙනියි කිහ.

එකල්හි නාගමානවකයෝ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් එනැන්හිදීම නාසාවාතයෙන් මරනු කැමැතිවත් නැවත අප දවස් නියමකරනු දණිස එවූවන්ට මුන් මරා යාම සුදුසුනොවෙයි ගොස් රජ්ජුරුවන්වහන්සේට කියා මුන්ට නියම් දනුම්හයි සිහා නාගමානවකයෝ එහැන්හිම අපොළෝ කිම්ද ගොස් නාලොවට වැද ධුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් විසින් කිමෙක්ද? දරුවෙනි! හොප පියින් රාජකුමාරිකාවෝ ලබනලදදැයි විවාළකල්හි ඔහු සතර දෙන කිපි දේවයන්වහන්ස! අපි නිස්කාරණයේ කුමක් පිණිස ඒ ඒ තැනට යවනසේක්ද? ඉදින්මරනුකැමැතිසේක්වීනම් මෙතැන්හිදීම මරවාපුව මැනව, ඒ රජ්ජුරුවෝ නුඹවහන්සේට ආක්‍රොශපරිභව බෙණෙති. තමන්ගේ දියණියන් ජාතිමදයෙන් උසස්කොට කියති කියා ඒ රජ්ජුරුවන් කිදෙයත් නොකිදෙයත් කියා නාරජ්ජුරුවන්ට කොප ඉපදවූහ. එකල්හි නාරජ්ජුරුවෝ තමන්ගේ පියින් රැස්කරන්නට විධාන කරන්නාහු මෙරපත්ලෙහි

වසන්නාවූ කම්බලසතර නම්වූ මාගේ මවුපසෘයෙහි නසින්හා අවශෙෂවූත් සතරදිගය සතර අනුදිගයයි අටදිශ්හි වසන්නාවූ යම්පමණ මා කිවා කරන්නාවූ නාගපෂ්දෙක් ඇත්නම් ඒ සියලු නාගපෂ්දට ගොස් කියව,විහා රුස්කර වයි විධානකළහ. ඉක්බිත්තෙන් ඒ සියලු නාගපෂිත්ම වහ වහා රුස්ව නාරජ්ජුරුවන් සමීපයට අවුත් දෙවයන්වහන්ස! කුමක් කරමෝදැ? කව රක්හු නාසාවාතයත් පැහැර හසමකරමෝදැයි කී කල්හි රාජකුමාරිකාවන් කෙරෙහි පිළිබඳවූ සිත් ඇති බැවින් උන්ට විනාශයක් නොකැමැතිව කියන්නෝ බරණැස් නුවරට යව ගොසින් තෙපි හැමදෙන කවුරුන්වත් කිසිත් පිඩාවක් නොකරවයි කිහ. එකල්හි නාරජ්ජුරුවන්ට නාගයෝ කියන්නෝ ඉදින් කිසි මනුෂ්‍යයෙක් නොමැරිය යුත්තේවිනම් ඒ බරණැස් නුවරට ගොස් කුමක්කරමෝදැයි කිහ.

ඉක්බිත්තෙන් නාරජ්ජුරුවෝ නසින්ට තෙපි හැමත් මේ මේ දේ කරව, මෙත් මෙනම් දෙයක් කරමි කියන්නාහු ප්‍රාසාදයෙහින් අවශෙෂ මනුෂ්‍යයන්ගේ ගෙවලත් පොකුණෙහිත් වීථියෙහිත් විවිධාභරණයෙහිත් වෘක්ෂයෙහිත් තොරණයෙහිත් මහත්වූ ශරීර මවාගෙන එලෙව මෙපමණක් විනා කිසි සත්ත්වකෙනකුන්ට විනාශයක් නොකරව, තවද මෙසේ එලෙන්නාවූ තෙපි හැම ප්‍රාසාදාදියෙහි වූකලී ඇඳ පුටු යටත් වියන් උඩත් ගබඩා ඇතුළෙහිත් පිටතත් පොකුණෙහි දියපිටත් වීථි ආදියෙහි දැලවරත් මධ්‍යයෙහිත් මහත්වූ ශරීර මවාගෙන මහත්වූ පෙණකොට කඹුරුසම් මධනා සාලක්ෂමින් සු සු යන අනුකරණ ශබ්ද පවත්වමින් එලෙව, තොප හැමවූකලී බාලදරු වෝය, වෘද්ධයෝය ගර්භිනීහුය, සමුද්‍රජාවෝය, යන සතර පක්ෂයට නොදක්වව, මමත් සර්ෂයෙන් ධවලවූ මහත්වූ නාගශරීරයක් මවාගෙන ගොස් ඉහා මහත්වූ කශිපුරය සත්දරණපවකින් වටලාගෙන මහත්වූ පෙණ ගර්භයනින් නුවර වසා එකාන්ධකාරකොට කශිපුර වාසින්ට භය උපදවමින් සු සු යන අනුකරණ ශබ්ද පවත්වා වැදහෝමියි කිහ. ඒ නාරජ්ජුරුවන්ගේ බස් අසා රකත නිල ශ්වෙතාදිවූ නොයෙක් පැහැ ඇති නාගවෙස් මවා මධ්‍යම රාත්‍රී වේලෙහි නුවරට වැද ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් විසින් කියනලද ක්‍රමයෙන් ඒ සියලු නාගයෝ කිසිකෙනකුන්වත් හිංසා වක් පිඩාවක් නොකොට ප්‍රාසාදයෙහින් සෙසු ගෙවලත් පොකුණෙහිත් වීථියෙහිත් සතරමංසන්ධියෙහිත් ගස්උඩත් තොරණයෙහිත් මනුෂ්‍යයන්ගේ සංචාරයෙහිත් එලෙන්නට පටන්ගත්හ. දූහව ආවාවූ නාගමානවකයෝ සතරදෙන රජ්ජුරුවන්ගේ යහනෙහි පාසහර වෙලාගෙන හිස්මුදුනට මහත්වූ පෙණගබ්කොට තුබින් හිසට ඇන ඇන කට දල්වා සුස්ම සුස්මා සිටියාහ. ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝත් පළමු තමන් කී සැටියේම නුවර සත්දරණකින් වෙළා නලකටක් වැසුකාලක් පරිද්දෙන් පෙණ ගර්භය දැසා එකාන්ධකාරකොට සුස්මමින් මනජනයාට භය ඉපදවූහ. මහජනයෝ රාත්‍රි පිබිද යම් යම් හැනෙක අතක්වත් පයක්වත් දික්කොළෝනම් ඒ ඒ තැන සර්පයින් විටම අහපය හබා සර්පයෙක සර්පයෙකැයි මුර්ගැසූහ. යම් ගෙයක පහන් ඇවිලේනම් ඒ ගෙවල සත්‍රීහු පිබිද උඩබලන්නාහු ගොණුස් ආදියෙහි එලෙන්නාවූ නසින් දැක බොහෝදෙන එකපැහැර අඬන්නට පටන්ගත්හ.

තවද පාන්ව ගියකල්හි තසින්ගේ ආඥාප්‍රඥාවසයෙන් සියලු නුවරත් මාලිගාත් උපුටපියන කලක්මෙන් වූකල්හි හසින් තුසටවූ මනුෂ්‍යයෝ නාරජ්ජුරුවෙනි! කුමක් නිසා අප හැමට පිඬාකරවිදුසි කිවුය. තොපගේ රජ්ජුරුවන්වහන්සේගේ දියණියන් දෙම්හයි ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් සමීපයට දූතයන් යවා නැවත උන්වහන්සේගේ දූතයන් අවුත් දූනමැන වැයි කිකල්හි අපගේ නාරජ්ජුරුවන්වහන්සේට ආක්‍රොශ පරිභව කළසේක. ඉදින් අපගේ නාරජ්ජුරුවන් වහන්සේට දියණියන් දුන්සේක්වීනම් ඇරපියම්හ නුදුන්සේක්වීනම් සියලු නුවරවාසින්ගේ දිවිනැත්තේවේදසි කිකල්හි එසේවීනම් අපට අවසර දූනමැනව, අපි හැම ගොස් රජ්ජුරුවන් වහන්සේට යාචිඤ්ඤාරම්හයි කියා යාචිඤ්ඤාකොට අවසර ලැබගෙන මාලිගා දොරට ගොස් මහහඬින් හැඬූ ය. රජ්ජුරුවන්ගේ බිසෝවරුන් තමන් තමන්ගේ ගබඩාවලම වැදහෙව දියණියන් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට දූන මැනවයි එකපාහැර ඇඬූහ. ඒ නාගමාතවකයෝ සතරදෙනත් දූනමැනවයි කියා රජ්ජුරුවන්ගේ හිස තමන්ගේ තුඩින් පැහැර පැහැර සිටියහ.

ඒ ධ්‍රතරාෂ්ට්‍රරජ්ජුරුවෝ වැදහොත් හැනැත්තෝම නුවරවාසින් හා බිසෝවරුන් අඩන අඩත් අසා නාගමානවකයන් සතරදෙනා විසින් භය ගැන්වූ බැවිනුත් මරණභයින් භයපත්ව මාගේ දියණියන් සමුද්‍රජාවන් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට දෙම් දෙමියි තුන්වීටක් කිහ. එබස් අසා සියලුම නාරජදරුවෝ ගවුවක් පමණ තැන් පසුබාගෙන දිව්‍යපුරයක්මෙන් එක් නුවරක් මවා ඒ නුවර සිට දියණියන් එවූව මැනවයි පඬුරු යැවූහ. රජ්ජුරුවෝ උන් ගෙනගිය පඬුරුගෙන තෙපි හැමයව මම දියණියන් අමාත්‍යයන් අතට පාවාදී එවම්හි නාගමානවකයන් යවා දියණියන් සමීපයට කැඳවා ප්‍රසාදයේ මතුමහල්තලයට ගෙනගොස් සිවුමැදුරු කවුළුව හැර කියන්නෝ මැනියෙනි! මේ සරහා පිළියෙළකරතලද නුවර දුටුවාද? ඒ නුවර එක් රජ්ජුරුකෙනකුන්ට අගමෙහෙසුන්වව, නුවර දුරුනොවෙසි, සිතට දුකක් උපන්වීවම පෙරළා එන්නටත් පිළිවන, එසේ හෙයින් හොප ඒ නුවරට යාසුදුයයි හිවිස්වා ඉස් සෝධා නාවා සණිහරණයෙන් සරහා මනාව සරහඇලද යානාවෙක හිඳුවා අමාත්‍යයන් අතට පාවාදී යවූය. එකල්හි නාරජ්ජුරුවෝ පෙර ගමන්කොට අවුත් මහත්වූ සත්කාර කළහ. එකල අමාත්‍යයෝද සමුද්‍රජාවන් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ව පාවාදී බොහෝ සම්පත් ගෙන පෙරළා නුවරටම ආහ. රාජකුමාරිකාවන් ප්‍රාසාදයේ මතු මහල්තලයට ගෙනගොස් සරහනලද දිවයහනෙක සැහැප්පූහ. එකෙණෙහිම නාගමානවිකාවෝ කුරුන් කුදුන් වෙස්ගෙන මනුෂ්‍ය පරිවාරිකාවන්මෙන් විරිවිරාගත්හ. රාජකුමාරිකාවෝ දිවයහනේ හොත් පමණකින්ම දිවපහස් විඳ හිඳන්නට පටන්ගත්හ. ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝ එකල්හි සමුද්‍රජාවන් ගෙන නාගපතිත් හා එතැන්හිම අනතඹානව නාගභවනයෙහි පහළවූහ. ඒ රාජකුමාරිකාවෝ පිඹිද සරහනලද දිවයහනත් අත්‍යවූ රන්රිදී මැණික්මයවූ ප්‍රාසාදදියත් උතුන පුෂ්කරණීත් සරහනලද දිව්‍යපුරයක් වැනිවූ නාගභවනයත දූක කුරුන් කුදුන් දැදිවූ පරිවාර සත්‍රීන් අතින් විවා රන්නාහු මේ නුවර ඉතා සැපතිවන්නේය. අපගේ නුවරසේ නොවෙසි, මේ තැනේ නුවරෙක්දැයි විවාළෝය. එකල්හි පරිවාර සත්‍රීහු කියන්නෝ දේවීන්වහන්ස! නුඹවහන්සේගේ සැමියුත්‍රයාණන් වහන්සේ සත්තඹ නුවර වන්නේය. මේ පින් ඇත්තා සැවෝ මෙබඳු සම්පත් නොලබසී. නුඹ වහන්සේ මිනවින් ඇති බැවින් මේසා මහත්වූ ඓශ්වර්‍යයසී හා සම්පත් ලබන ලදැයි කිහ.

ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවෝත් පන්සියයක් යොදුන් පමණවූ නාග භවනයෙහි බෙරලවන්නාහු යමෙක් සමුද්‍රජාවන්ට සර්පවෙශයක් දක්වූසේ වීනම් ඔහට රාජාඥවන්නේයයි බෙරලැවූහ. එසේ හෙයින් එකකුත් සමුද්‍ර ජාවන්ට සර්පවෙශයක් දක්වන්නට අසමර්ථවිය. සමුද්‍රජාවෝ මනුෂ්‍යලොකය යන සංඥාවෙන් මෙසේ ඒ නාගභවනයෙහි ඒ නාරජ්ජුරුවන් හා සතුටුව ප්‍රියසංවාසයෙන් විසූහ.

ඉක්බිත්තෙන් ඒ සමුද්‍රජාවෝ මෑතභාගයෙහි ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ් ජුරුවන් නිසා දරුගබියක් ලැබ පුතණුකෙනකුන් වැදූහ. ඒ කුමාරයන්ට ප්‍රියවූ දෑකුම් ඇති බැවින් **සුදර්ශනකුමාරසෝෂයි** නම් තුබූහ. නැවත අනික් පුතණුකෙනකුන් වැදූය. උන්ට **දත්තකුමාරසෝෂයි** නම් තුබූහ. ඒ කුමාරයෝ වනාහි බොධිසත්වයෝය. නැවත එක් පුතණුකෙනකුන් වැදූය. උන්ට **සුභගකුමාරසෝෂයි** නම් තුබූහ. නැවත එක් පුතණුකෙනකුන් වැදූය. උන්ට **අරිට්ඨකුමාරසෝෂයි** නම් තුබූහ. මෙසේ ඒ සමුද්‍රජාවෝ පුතුන් සතරදෙනකු වදත් නාගභවනය නියාව නොදන්නාහ. ඉක්බිත් තෙන් එක් දවසක් අරිට්ඨ කුමාරයන්ට නාගමානවිකාවෝ කියන්නෝ හෝපගේ මැනියෝ මනුෂ්‍ය සත්‍රීය, නාගමානවිකාවක් නොවෙයි කිහ. එබස්අසා අරිට්ඨකුමාරයෝ පරීක්ෂා කෙරෙමියි සිතා එක්දවසක් කිරිබොමින් ඉඳ සර්පවෙශයක් මවා නහුවින් මැනියන්ගේ පිටපත්ලට ඇනයද්‍ය. එකල්හි මැනියෝ ඔහුගේ සර්ප ශරීරය දැක භයින් ත්‍රාසඨව මහත්කොට අඬගසා ඔහු බිමට දමන තැනැත්තෝ නියෙන් ඔහුගේ ඇස ඇන සිල්ගලහ. ඇසින් ලේ වැගිරෙන්නට පටන්ගත, රජ්ජුරුවෝ සමුද්‍රජාවන් අඬගැසූ අඬ අසා සමුද්‍රජාවෝ කුමක් නිසා අඬගැසුදැයි විචාරා අරිට්ඨකුමාරයන් විසින් කරන ලද ක්‍රියාව අසා ගනුව, ඒ කොල්ලා අල්වාගෙන ජීවිතක්ෂයට පමුණුවයි කියා තැතිගන්වමින් සබමිපයට අවූය. එකල්හි රාජකුමාරිකාවෝ කුමාරයන්ට කිපි නියාව දැන පුත්‍රස්නෙහයෙන් කියන්නෝ දේවයන්වහන්ස! මාගේ පුතණුවන්ගේ ඇස නැසීගියේය, උන්ට ක්ෂමාකළ මැනවැයි කිවූය. රජ්ජු රුවෝ එබස් අසා මුන් මෙසේ කියනකළ කුමක් කරන්නට පිළිවන්දැයි ඉව සූය, එදවස් මේ නාගභවනයයි සමුද්‍රජාවෝ දත්හ. එතැන් පටන් **අරිට්ඨ කුමාරයෝ ඛාණාරිට්ඨකුමාරසෝෂයි** මෙනමින් ප්‍රසිඛවූහ. දරුවෝ සතර දෙන ක්‍රමයෙන් වැඩිවිය පැමිණ විඥඛවට පැමිණියහ.

ඉක්බිත්තෙන් ඒ සහරඛැගන්ට පියරජ්ජුරුවෝ යොදුන් සියයක් යොදුන් සියයක් පමණකොට රාජ්‍යය දුන්හ. මහත්වූ යශපිරිවර වූයේය. සොළොස්දහසක් සොළොස්දහසක් පමණ නාගකන්‍යාවෝ පිරිවරවූහ. පිය රජ්ජුරුවන්ට යොදුන් සියයක් පමණ රාජ්‍යය වූයේය. තුන්ඛැගෝ මසක් පාසා දෙමවුපියන් දක්නට එන්නාහ, මහබෝසතාණෝ වූකලී අඛමසින් අඛමස දෙමවුපියන් දක්නට එන්නාහ, නාගභවනයෙහි උපන්නාවූ ප්‍රශ්න යෙක් ඇත්නම්මහබෝසතාණෝම විසඳ කියන්නාහ. පියරජ්ජුරුවන් හා සමඟ විරූපාක්ෂ නම් වරම් මහරජ්ජුරුවන් සබමිපයටත් උපස්ථානයට යන් නාහ, ඒ රජ්ජුරුවන් සබමිපයෙහි උපන් ප්‍රශ්නයෙක් ඇත්නමුත් මහබෝ සතාණෝම විසඳ කියන්නාහ.

ඉක්බිත්තෙන් එක් දවසක් විරූපාක්ෂ නම් වරම්මහරජ්ජුරුවන් නාග පති‍ත් හා සමඟ ත්‍රයත්ත්‍රිංශත් දිව්‍යලොකයට ගොස් සක්දෙව් රජ්ජුරුවන් පිරිවරා උන්කල්හි දෙවියන් අතරෙහි ප්‍රශ්නයක් උපන්නේය. ඒ ප්‍රශ්නය කියන්නට සමර්ථවූ එකද නෙතෙක් නූවූයේය. උතුම්වූ පඤ්චකයට නැඟී හිඳ මහාබොධිසත්ත්වයෝම ප්‍රශ්නය විස්සජ්ජිතයකළහ. එකල්හි බොධිසත්ත්වයන්ට ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිවසුවඳම් ආදියෙන් පූජාකොට දත්තයෙනි! තෙපි පොළොවහා සමානවූ මහත්වූ විපුලවූ ප්‍රඥාවෙන්යුක්තයහ. එසේහෙයින් මෙතැන් පටන්හුරිදත්තානම් වේවයි **භූරිදත්තකුමාරයෝය** යි මහබෝසතාණන්ට නම් තුබූහ. එහැන්පටන් මහබෝසතාණෝ ශක්‍රදෙවෙන්ද්‍රයන්ට උපස්ථානයට යක හැනැත්තෝ අලඞ්කෘතවූ වෛජයන්ත ප්‍රාසාදය හා ඉහා සිත්කලුවූ හා වහාවලී ශාඛාවාක්ෂමණ්ඩසමිතයෙන් යුක්තවූ දිව්‍යප්සරාවනුත් අතිමනොහරවූ ශක්‍රසම්පත්තියත් දැක දිව්‍යලොකොත්පත්තියෙහි තෘෂ්ණාවකොට මට මේ මණ්ඩූක භක්ෂණයකරන්නාවූ ආත්මභාවයෙන් ප්‍රයොජනකිම්ද? නාගභවනයට ගොස් දෙමවුපියන් අතින් විචාරන්නාහු මැනියන්වහන්ස! පියාණන් වහන්ස! මම පෙහෙවස්රැක දිව්‍යලොකයෙහි උපදනා කැමැත්තෙමි. එහෙයින් මට පෙහෙවස් රැක්කිරීමට අවසරදුනමැනවැයි කිහ. එබස් දැසු දෙමවිපියෝ යහපත පුත! පෙහෙවස් රකුව පෙහෙවස් රක්ෂාකරන්නාවූ තෙපි මෙතැනින් ඔබ්බට නොගොස් මේ නාගභවනයෙහි ශූන්‍ය විමානයක හිඳ පෙහෙවස් රකුව නාගභවනයෙන් ඔබ්බටගියාවූ නසින්ට ගුරුළන් හා මනුෂ්‍යාදීන්ගෙන් මහත්වූ භය උපදනේයයි කිහ. මහබෝසතාණෝ යහපතැයි පිළිගෙන ඒ නාගභවනයෙහිම ශූන්‍යවිමාන ආරාමොද්‍යානාදියෙහි වැස පෙහෙවස් රක්ෂාකරන්නාහ. එකල්හි බොධිසත්ත්වයන් ආතත විත්තාදීවූ පඤ්චාංගික තූර්‍යනාද ගත් ඇති නාගකන්‍යාවෝ පිරිවරන්නාහ. මහබෝසතාණෝ මෙබි වසන්නාවූ මට උපෝෂථකර්ම මස්තකප්‍රාප්ත නොවන්නේය. මනුෂ්‍ය පථයට ගොස් උපෝෂථශීලය රක්ෂාකරම් සිතා. වලකන්නාහුය යනහසින් දෙමවුපියන්ට නොකියාම තමන්ගේ භාර්‍යාවූ නාගකන්‍යාවට කියා සොඳුර! මම මනුෂ්‍යලොකයට ගොස් යමුනානම් ගංතෙර මහත්වූ නුගගසෙක් ඇත නුදුරුතැන තුඹසක්මත්තේ දරණවැලලාගෙන චතුරඞ්ගසමන්නාගතවූ උපෝෂථශීලය ඉටා වැදහෙව පෙහෙවස් රක්ෂාකරම් මා සියලු රාත්‍රියෙහි වැදහෙව පෙහෙවස් රක්ෂාකළකල්හි අරුණු නැහෙන වේලෙහිම නොපගෙන් දෙදෙනෙක් දශදෙනෙක් වාරයෙන් වාරයට තූර්‍යභාණ්ඩගත් අත් ඇතිව මා සවිමීපයටඅවුත් මා ගදින් මලින්පුදා නටා ගීකියා කැඳවාගෙන නාගභවනයට එවයි කියා ඒ යමුනානම් ගංතෙර පිහිටි නුගගස සවිමීප්යට ගොස් තුඹසමත්තෙහි දරණවැලලාගෙන යමෙක් මාගේ සම්මස් නහර ඇට ලේ කැමැත්තේවිනම් ඒ තෙමේ සම් ආදිය ගෙන යෙවයි කියා සියුරහින් යුක්තාවූ පෙහෙවස්ඉටා නහුලිසක්පමණ ශරීරයමවා වැදහෙව පෙහෙවස්රක්ෂාකළහ. අරුණු නැහෙමින් සිටියදීම නාගමානවිකාවෝ ගොස් මහබෝසතාණන් කීසැටියේම පිළිපැද නාගභවනයට ගෙනයන්නාහ. මෙසේ මේ ප්‍රකාරයෙන් පෙහෙවස් රක්ෂාකරන්නාවූ ඒ බෝසතාණන්ට බොහෝකලක් ඉකුත්වූයේය.

එසමයෙහි බරණැස්නුවර වහසල් දෙර ගම්වැසිවූ එක් බමුණෙක් "**සොමදත්ත**" නම් පුතකු හා සමඟ වනයටගොස් උතුල් ඇටවීමය, යතුරු දුනු තිබීමය, යහුල් බැඳීමය, මලඵබීමය, දැල්බැඳීමය, ඝනාදියෙන් මුවන් මරමරා

මස් කඳින් ගෙනවුත් ජීකුටජීවත්වන්නේය. ඒ තෙමේ එක් දවසක් ගොයකු පමණකුත් නොලැබ පුතාට කියන්නේ පුත සෝමදත්තයෙනි; ඉදින් සිස් අනින් ගියෙමු නම් තොපගේ මැනියෝ කිපෙති. එසේ හෙයින් යම් කිසි වක් ඇරගෙනම යම්හයි කියා බොධිසත්වයන් වැදහොත් තුඹසට අභිමුඛව ගොස් පැන්බොන්නට යමුනාවටබස්නාවූ මුවන්ගේ පියවර සටහන් දැක පුත! මුවන්යන්නාවූ මෘගයක් පෙනෙන්නේය. එසේ හෙයින් තෙපි ඉවත් වෙලාසිටුව,මම පැන්බොන්නට ආවාවූ මුවාවිදිමිසි දුන්නගෙන මුවන්ගේ ඊම බලමින් එක් ගසක්මූල සිරියේය. එකල්හි එක් මුවෙක් සවස්වේලෙහි පැන් බොන්නට ආයේය, වැදි බමුණා මුවාදැක ඊදිදේය. මුවා සරප්‍රාහාරය ලදින් එතැන්හි නොවැටි සැරවෙගයෙන් තැතිගන්වනලද්දේ ලේවතුරුව වතුරුවා දිවගත්තේය. දෙපුතුපියෝ ඔහු පුස්සේහි ලුහුබඳවාගෙන ගොස් හුණුතැන දිම සමගසා මස්කොට මස් ඇරගෙන වනායන් නික්මි හිරුඟසතයට යනවේලෙහි නිග්‍රොධවෘක්ෂය සමීපයට පැමිණ දැන් වේලා නොවෙයි යන්නට නොපිළිවන්; මෙතැන්හි වසම්හයි කියා මස් එක් තැනෙක තබා ගසුළුඩට නැගි වේලෙප් අතරෙහි වැදහොත්තාහ. බමුණා අලුයම්වේලෙහි පිබිද මුවන්ගේ අඩඅසන පිණිස ඝණනමාලා වැදහොත්තේය. එකෙණෙහි නාගමානවිකා වෝ අවුත් මහබෝසතාණන්ට මල්අස්නක් පැනවූහ. මහබෝසතාණෝ සපිවෙශය අනන්තඤාණයට දිව්‍යශරීරයක්මවා සම්භාරණයෙන් සැරසී ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලායෙන් පුෂ්පාසන මස්තකයෙහි උන්නාහුය. නාගමානවිකා වෝත් මහබෝසතාණන්ට සුවඳ මල් ආදියෙන් පූජාකොට දිවබෙරගසා නවන්නට ගීකියන්නට පටන්ගත්හ. එකල්හි වැදිබමුණා ඒ හෙරිතුයෂ්ශබ්දය අසා මේතෙමේ කවුරෙක් දෝහෝයි ඔහුගේ ප්‍රවෘත්තිය දනිම්හයි සිතා එබම්ලපුතැයි කියාත් පුතාඅපාඛයාගතනොහි වන්නාට මේතෙම්ගේ හෝනේමය. මේතෙමේ මිරිකුනේවන මමම යෙමි සිතා වෘෂභයෙන් බැස මහාබොධිසත්වයන් සවම්පයට ගියේය, නාගමානවිකාවෝ බමුණා දැක තුයෂ්හාණ්ඩයන් සමඟ පොළොවකිම්ද නාගභවනයටම ගියාහුය. මහාබොධිසත්වයෝ එසේලා වුහ. එකල්හී බමුණා බොධිසත්වයන් සවම්පයෙහි සිට විචාරන්නේ සුවඳමල් ආදියෙන් පූජාකරණලද මේවනමධ්‍යයෙහි රත්වූ ඇස් ඇතිව විශාලවූ වක්ෂස්ථල ඇතිව උතුම්වූ රූපශොභාවෙන් බබලන්නාවූ තෙපි කවුරුද? සවණ් කොයුරාහරණයෙන් පුලන්නාවූ මනාවස්ත්‍ර අදනා සත්‍රිහු දසදෙනෙක් තොප පිරිවරා නොපට නමස්කාරකොට සිටිනි. ඔවුන් කවුරු? ද තවද දශීනියවූ මහත්වූ බාහුඇති මේවනමධ්‍යයෙහි ගිතෙල් වත්කළ වහ්නිස්කන්ධයක්මෙන් විශෙෂයෙන් දිලිහෙන්නාවූ ශරීර ඇතිව සියලුවනය එකාලොකකොට බබුළුවමින් මේ පුෂ්පාසන මස්හසයෙහි ඉඳිනාවූ තෙපි කෙසේවූ කෙනෙක්ද? මහානුභාවසම්පන්නවූ එක්තරා දිව්‍යපුත්‍රයෙනෙක්ද? නොහොත් ආනුභාව ඇති නාගරාජ කෙනෙක්ද? නොපගේ සවරූපය මට තත්වූපරිදිදෙන් කිය වසි කීහ. එබස් අසා මහබෝසතාණෝ ඉදින් මම ශක්‍රාදීන් අතරෙන් එක්තරා එකෙකි කිම්නම් මේ බමුණා මාකිබස් අදහන්නේමය, එබැකුදුටුවත් අද මාවිසින් සැබෑබසක්ම කියන්නට වටනේයයි සිතා තමන් නාගරාජ නියාව කියන්නාහු මම මහත්වූ සෘඩ්ධානුභාව ඇතිවූ උග්‍රවූවිෂතේජස් ඇත්තාවූ අත්‍යසත්වකෙනෙකුන් විසින් මැඩපැවැත්වීය නොහැක්කාවූ නාගරාජයෙක්මි. ඉදින් මම කිපී වසත්‍රාභරණඛාඛාත්‍යදීන් සමෘඩ්ධවූ ජනපදයක්ව නමුත් දඟට කෙළෙම්නම් පොළොව මාගේ දළ වැදගත් පමණකින් පොළොව හා සමඟ

මාගේ උග්‍රවූ විෂතෙජසින් සියලුජනපදය භස්මවන්නේමය. මාගේ මැනියෝ සමුද්‍රජාතම් බිසවුය මාගේ පියාණෝ ධතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවෝය. මම මාගේ බෑයන් සුදර්ශන නාරජ්ජුරුවන්ට මල්වසිටියෙමි, පන්සියයක් යොදුන් පමණ ඇති නාගභවනයෙහි දිව්‍යනාගරාජයෝ මා භූරිදත්තනම් නාරජ්ජුරුවෝයයි දනිති කිහ. මෙසේදකියා මහබෝසතාණෝ සිතන්නාහු මේ බමුණා වණ්ඩය පරුෂය අභිතුණ්ඩිකයක්හට කියා මාගේ උපෝෂථ ශීලයට අන්තරා කරන්නට නිසිය, එසේහෙයින් මොහු නාගභවනයට ගෙනගොස් මහත්වූ යසස් දී මාගේ උපෝෂථශීලය බොහෝකාලක් පැවැත්වූයේවිනම් යහපත් වන්නේයයි සිතූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ මෙසේ සිතා ඔහට කියන්නාහු බමුණ! තට මහත්වූ යසස්දෙමි, සිත්කලුවූ නාගභවනයට වර, මා හා සමඟ නාගභවනයට යම්හයි කිහ. එබස් අසා බමුණා කියන්නේ සවාමීනි! මාගේ පුත්‍රයෙක් ඇත, ඔහු එතොත් යෙමි කිය. එකල්හි මහබෝසතාණෝ යව බමුණ! තාගේ පුත්‍රයා කැඳවාගෙන එවයි කියා තමන්ගේ වාසස්ථානය කියන්නාහු ඉතා ගැඹුරුවූ හැමකල්හිම කරකැවෙන්නාවූ සළාවැටුම් ඇති භයානකවූ යම් මේ ගංගාවෙක් දුටුයේවීනම් මේ සත්පුරුෂ ප්‍රමාණවූ මාගේ දිව්‍යවූ වාසස්ථානය වන්නේය, තවද බ්‍රහ්මණය! උභයතීරයෙහි වනලැහැප්වල වසන්නාවූ මොණරුන් හා කොස්ලිහිණියන් විසින් රැවුපිළිරැවූ දෙන්නාවූ නිල්වූ ජලතලා ඇති යමුනානම් ගංගාව මේ මඛ්‍යයෙහි වැහෙන්නේය. එබදුවූ යමුනානම් ගංගායෙහි පිහිටියාවූ ආචාරශීලයෙන් යුක්තවූවන් වසන්නාවූ සාන්තවූ ක්ෂේමභූමියට තා නිර්භීතව වැද වාසයකරවයි කිහ. එබස් අසූ බමුණාගොස් තමාගේ පුත්‍රයාට මෙපවත් කියා ඔහු කැඳවාගෙන ආයේය. මහබෝසතාණෝ ඔවුන් දෙදෙනාම කැඳවාගෙන යමුනානම් ගංතෙරට ගොස් එතැන්හි සිට කියන්නාහු බමුණ! තෝ තාගේ පුත්‍රයා හා සමඟ අපගේ නාගභවනයට පැමිණ මා සන්තකවූ වස්තුකාම කෙලෙසකාම යෙන් පුදනලදුව ඒ නාගභවනයෙහි සැපසේ වසවයි කිහ. මෙසේ කියා මහබෝසතාණෝ දෙපුතුපියන් තමන්ගේ ආනුභාවයෙන් නාගභවනයට ගෙනගියහ. ඔවුන් දෙදෙනාට ඒ නාගභවනයෙහිදී දිව්‍යාත්මභාවය පහළවූයේය. එකල්හි ඔවුන්ට මහබෝසතාණෝ මහත්වූ දිව්‍යසම්පත්දී සාරසියයක් සාරසියයක් නානාකාමයන් පාවාදුන්හ ඔහු දෙදෙන ඒ නාගභවනයෙහි වැස මහාසම්පත් අනුභවකළාහුය. මහබෝසතාණෝත් අප්‍රමාදව උපෝෂථ ශීලය රක්ෂාකරන්නාහු දෙපෝයෙන් දෙපෝයෙහි දෙමවුපියන් සමීපයට උපස්ථානයට ගොස් බණකථා කියන්නාහු එතැනිසිට බමුණා සමීපයට ගොස් සුවදුක් විචාරා යමකින් තට ප්‍රයෝජනවීනම් ඒ මට කියව උකටලී නොව සිත් අලවා වසවයි කියා සොමදත්තයා හාත් පිළිසඳර කථාකොට තමන් වසනතැනට යන්නාහ.

නෙසාදබ්‍රාහ්මණයා අවුරුදුදක් පමණ කල් නාගභවනයෙහි වැස පින් මදහෙයින් උකටලීව මනුෂ්‍යලෝකයට යනු කැමතිවිය. සිත්කලුවූ නාගභවනය නරකයක්මෙන්ද, අලඞ්කෘතවූ ප්‍රාසාදයස්ථ බඹුනාගාරයක්මෙන්ද, සීහභරණයන් සැරහුණාවූ නාගකන්‍යාවන් යක්ෂණීන් මෙන්ද වැටහුණාහුය. එකල්හි ඒ බ්‍රාහ්මණයා සිතන්නේ මම උකටලීවීම්, සොමදත්තයන්ගේ සිත් ප්‍රීතිකෘ කෙරෙමිසි ඔහු සමීපයට ගොස් කියන්නේ කිමෙක්ද? දරුව! උකටලී නොවී මේ නාගභවනයෙහි වසන්නෙහිදැයි කිය. එබස් අසා සොමදත්තයා කියන්නේ කුමක්නිසා උකටලීවෙම්ද? මා උකටලී

චුයේ නැත. පියාණන්වහන්ස! නුඹවහන්සේ වූකලී මේ නාගභවනයෙහි කලකිරිගියසේක්දැයි විචාළේය. එසේය පුතැ කිකල්හි කුමක්නිසාදැයි විචාළේය. තොපගේ මැනියන් හා මල්බෑයන් නොදැක්මෙන, වරෝ පුත සොම දත්තයෙනි! යම්හයි කිය එබස් අසා සොමදත්තයා නොයෙමි කිහ. නැවත නැවත පියාණන්ගේයාචඤ්ඤවන් යහපතැයි ගිවිස්සේය. එකල්හි නෙසාදබ්‍රාහ්මණයා සිතන්නේ මාගේදරුවන්ගේ අභිප්‍රාවත් මම දැනගතිමි. ඉදින් මම භූරිදත්තනම් නාරජ්ජුරුවන්ට මේ නාගභවනයෙහි කලකිරිගියෙමියි කියේවිනම් වමවඛවඩාලා යශපිරිවර දේකි. එසේ කල්හි මාගේ ගමන නොවන්නේය. එක් උපායකින්ම ඒ නාරඤ්ඤරුවන්ගේ සම්පත්තිය වර්ණනාකොට තෙපි මෙබදුවූ සම්පත් හැර කුමක් නිසා මනුෂ්‍යලොකයට ගොස් පෙහෙවස් වසව්දැයි විචාරා සවගීලොකොත්පත්තිය නිසායයි කිකල්හි තෙපි වූකලී මෙබඳු සම්පත් හැර සවගීලොකොත්පත්තිය නිසා මනුෂ්‍යලොකයට ගොස් පෙහෙවස් රක්ෂාකරවිද? කිමෙක්ද? අපි අනුන්ගේ වෘත්තියෙන් ජීවත්වමෝද? මමත් මනුෂ්‍යලොකයට ගොස් නැගන් දැක පැවිදිව මහණදම් කෙරෙම්යි නාරජ්ජුරුවන් ගිවිස්වාගනිමි. එකල්හි මට ඒ නාරජ්ජුරුවෝ ගමන් අනුදනිති සිතා එක්දවසක් මහාබොධිසත්වයන් ගොස් කිමෙක්ද? බමුණ! උකටලි නොව වෙසේදැයි විචාළකල්හි නුඹවහන්සේ සවම්පයෙන් අපට දෙන වස්තුයෙන් කිසි අඩුවක් නැතැයි කියා ගමන් පිළිබඳ කිසිවක්ම නොකියා පළමු කොට ඒ මහබෝසතාණන්ගේ සම්පත් වර්ණනාකරන්නේ මෙසේ වර්ණනා කෙළේය. පින්වත්වූ භූරිදත්ත නම් නාරජ්ජුරුවෙනි! තොපගේ මේ නාගභවනයෙහි ගාත්පසින් සියලු දිශාභාගයෙහි පෘථිවිය රන්රිදී මුතුමැණික් වැල්ලෙන් ගැවසීගත්තේය, ඉතා සමතලාය, බොහෝ තුවරලාගසින් සමන්විතය, රන්වන්වූ රනිදුගොවිවන් විසින් ගැවසීගත්තේ උතුම්වූ නිල් පැහැ ඇති හිතණ වනයෙන් ගැවසීගත්තේය. සිත්කලුවූ වනඝටයෙන් හොබනේය. තවද සිත්කලුවූ හංසයන් විසින් ගත් ගද සවරයෙන් නාද පවත්වන ලද්දාවූ වහුළ පියුම් පෙත්තෙන් ගැවසීගත් ජලතලා ඇති තොපගේ කුශල සමෘඩියෙන් මනාව නිර්මිතවූ පුෂ්කරණිහු නා නා ස්ථානයෙහි බබළන්නාවූ සත්වයන් පිනවමින් සැදී සිටියහ. තවද තොප වසන්නාවූ ප්‍රාසාදයෙහි අටැස් කොට කරනලද වෛඩූර්‍යමාණික්‍යමයවූ සියලු සඵහයෝ වන්නාහ, ඒ වෛඩූර්‍යමාණික්‍යමයවූ ටැඹින් දහසක් ටැම්ඇති තොප වසන්නාවූ ප්‍රාසාදයෝ නාග කන්‍යාවන් විසින් පිරුණාහු විශෙෂයෙන් බබළන්නාහ. තවද ඉතා විශාලවූ සාරතවූ රම්‍යවූ බොහෝ සැපයෙන් යුක්තවූ එබදුවූ විමානයෙහි තොපගේ දිව්‍යවූ කුශලානුභාවයෙන් උපන් යම්හෙයකින් දෙදෙවි ලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ යසස් සමෘඩියක් වැනිවූ තොපගේ මේ මහත්වූ ශ්‍රී සමෘඩියවිද? එසේ හෙයින් තොප මේ රක්ෂාකරන්නාවූ උපෝෂථශීලයෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ වෛජයන්ත ප්‍රාසාදය හා මහත්වූ ශ්‍රී සමෘඩිය ප්‍රාර්ථනා නොකෙරෙති සිතම්. ශක්‍රසම්පත ඩා උත්තරිතරවූ අනිත් මහත් තනතුරක් ප්‍රාර්ථනාකෙරෙති සිතම් කිය. එබස් අසා මහබෝසතාණෝ බමුණ! තෝ එසේ නොකිය, ඒශක්‍රදෙවෙන්ද්‍රයන්වහන්සේගේ යසස් බැලුකලට අපගේ යසස මහමෙර සවම්පයෙහි තිබූ අබැවක්මෙන් වැටහෙන්නේය. අපි ශක්‍රදෙවෙන්ද්‍රයන්වහන්සේගේ සේවකයන් පමණකුත් නොවටනම්හයි කියා තවද කියන්නාහු බමුණ! ආනුභාව සම්පන්නවූ ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේගේ යසස් නම් තුන්සතරදවසකින් පස්දවසකින්

මෙතැකැයි කියා කියන්නා තබා සිතින් සිතාත් නිමවා දැක්කනොහැක්කේය, ඒ ශක්‍රදෙවෙන්‍ද්‍රයන් වහන්සේ තබා යම් සතරවරම් මහරජදරුකෙනෙක් උන්වහන්සේ පිරිවරත්තම් ඒ ශක්‍රදෙවෙන්‍ද්‍රයන් වහන්සේ නායක කොට පරිවරු ඇවිදිනාවූ පඤ්චකාමය තමන් වසඟයෙහි පවත්වන්නාවූ සතරවරම් මහරජදරුවන්ගේ යශසටත් අප තිරිසනුන්ගේ යශස සොළොස්වන කොටසඟෙන් කොයිසයකුත් නොඅහනේ වේදැයි කිහ. මෙසේද කියා ශක්‍රදෙවෙන්‍ද්‍රයන් වහන්සේගේ විමානය තාගේ වචනය අසා සිහිකෙරෙමි. මම වූකලී වෛජයන්ත ප්‍රාසාදය ප්‍රාර්ථනාකරන්නෙමි උපෝෂථගිලය රක්ෂාකරමියි ඒ තමන්ගේ ප්‍රාර්ථනාව කියන්නාහු සැපයෙහි පිහිටියාවූ ඒ දෙවතාවන්ගේ වෛජයන්ත ප්‍රාසාදාදීවූ මහත්වූ ශ්‍රී සම්‍ඛය ප්‍රාර්ථනාකොට පෙහෙවස් ඉටාතුඔස මත්තේ වෙසෙමි කිහ. එබස් අසා බමුණා දැන් මම අවසරයක් ලදිමියි සොම්නසට පැමිණ ගමනට අවසර ඉල්වන්නේ නාරජ්ජරුවන්වහන්ස! මම මස් විකොට ජීවත්වනු සඳහා මුවන් පරීක්ෂාකොට ඇවිදිනෙමි මාගේ දරුවන් හා සමඟ මේ වනයට වනිමි. එසේ වනයට වන්නාවූ මා මළබවත් උන්බවත් මාගේ නැයෝ නොදනිති. එසේ හෙයින් කාසිරජ්ජුරුවන්ගේ දියණියන්ගේ පුත්වූ මහත්වූ යශපිරිවර ඇති භූරිදත්ත නම් නාරජ්ජරුවෙනි! තොපට මම කියමි. ඉදින් තොපි අපට අවසරදුන්නු නම් අපගේ නැයන් දක්නමෝවේදැයි කීය. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ කියන්නාහු බ්‍රාහ්මණය! මෙබදුවූ වසතුකාම කෙලෙසකාමයෙක් මනුෂ්‍යලොකයෙහි සුලභ නොවන්නේය. එසේ හෙයින් තෝ මා සමීපයෙහි වෙසේනම් එසේ විසිම එකාන්තයෙන්ම යහපත් වන්නේය. ඉදින් තා පඤ්චකාමයෙන් පුදනලදුව මා සමීපයෙහි වසන්නට නොකැමැත්තෙහිවීනම් මම තට අවසර දෙමි. සැපසේ ගොස් තාගේ නැයන් දැක සිත් සතුටුකරවයි කිහ.

මෙසේ කියා මහබෝසතාණෝ සිතන්නෝ මේ තෙමේ මා නිසා ජීවත් වේනම් මා පෙහෙවස් රක්ෂාකොට තුඔසමත්තේ වැදහොතා නියාව කියි. කෙනකුන්ටත් නොකියන්නේවේද?. එසේ හෙයින් මෝහට ඉෂ්ටාර්ථප්‍රසවය කරන්නාවූ අනඝී මැණිකක් දෙමි සිතා ඔහට මැණික දෙන්නාහු එම්බල නෙසාදබ්‍රාහ්මණය! යම්කිසිවෙක් මේ දිව්‍යවූ මාණික්‍යාරත්නය ධරන්නේවී නම් මේ මාණික්‍යානුභාවයෙන් එතෙමේ වසතුවත් ග්වමහිසාදීන් හා දූදරුවනුත් අන්‍යවූත් යම්කිසි ඓශ්වර්‍යයක් කැමැත්තේවීනම් ඒ සියල්ලත් ලබන්නේය. රෝදුක් නැතිව සුඛිත මුදිතවන්නේය. එබදුවූ ආනුභාව සම්පන්නවූ මේ මාණික්‍යාරත්නය ඇරගෙන ගොස් තාගේ පුත්‍රදාරාදීන් පෝෂ්‍යයකොට සැපසේ ජීවත්වෙවයි කිහ. ඉක්බිත්තෙන් බමුණා කියන්නේ භූරිදත්ත නම් නාරජ්ජරුවෙනි! ඉපගේ බස නිරවද්‍යය සැබෑමය එබසට උත්තරයක් නොකියමි, සතුටුවෙමි. එතකුදුවුවත් මම වූකලී ජරාවට පැමිණියෙමි. එසේ හෙයින් පැවිදිවෙමි. පඤ්චකාමය ප්‍රාර්ථනා නොකෙරෙමි එසේවූ මට මැණිකෙන් ප්‍රයෝජන කිම්දැයි කීය. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු බමුණ! බ්‍රහ්මවර්‍යාවාසය නම් ඉතා දුෂ්කරදෙයෙක. එහි නොඇලුණ තැනැත්තහුට බ්‍රහ්මවර්‍යාව භඞ්ගවන්නේය. එකල්හි නිහිවූ තට සම්පත්තීන් ප්‍රයෝජනයක් පෙනීගියේවීනම් එබදුවූ අවස්ථායෙහි සැකයක් නැත්වූ බොහෝ මා සමීපයට වර, එකල්හි මම තට බොහෝ සම්පත් දෙන්නේමේවේදැයි කීය. එබස් අසා බමුණා ක්‍ෂත්‍රිය භූරිදත්ත නම් නාරජ්

ජූරුවෙනි! තොප කිබස් සැබෑමය. ඊට මම උත්තරයක් නොකියා සතුටුව වෙමි. ඉදින් මට වස්තුයෙන් ප්‍රයොජනයෙක් පෙනිනැත්නම් එදවස්. තොප සැමීපයට නැවතත් එන්නෙම්වේදැයි කිය.

ඉක්බිත්තෙන් මහාබෝසතාණෝ ඒ බමුණා නාගභවනයෙහිවසන්නට අභිප්‍රාය නැති නියාවදැන නාගමානවකයන් කැඳවා මේ බමුණන් ගෙනගොස් මනුෂ්‍යලොකයෙහි ලාභියවසි කිවුය. එබස් අසා නාගමානවකයෝ සතරදෙනෙක් බොධිසත්ත්වයන්ගේ නියොගයෙන් ඒ බමුණන් යමුනා නම් ගංගාවෙන් උඩතහා බරණැස් නුවරටයන්නාවූ මාගීයෙහිසිටුවූය. මෙසේ ඔවුන්දෙදෙනා මාගීයෙහි සිටුවා නෙවි හැම යවසි කියා නාගමානවකයෝ සතරදෙන නාග භවනයටපෙරළාආවාහුය. නෙසාදබ්‍රාහ්මණයාත් පුතසොමදත්තයෙනි! මෙතැනදීඋරකුවිද්දම්හ, මෙතැනදීඋරකුවිද්දම්හයි පුත්‍රයාටකියන්නේ අතරමහ පොකුණක්දැක පුත සොමදත්තයෙනි! නාම්හසිකිය. යහපත පියාණන්වහන්සැයි කිකල්හිදෙදෙනම දිව්‍යාභරණහා දිව්‍යවස්ත්‍රාගලවාඅකුලාපොදියක්කොට පොකුණුතෙර තබා දියට බැස නාන්නට පටන්ගත්හ. එකෙණෙහි ඒ දිව්‍යවූ වස්ත්‍රාභරණ අන්තර්ධානව නාගභවනයටමගියේය. පළමු ඔවුන්දෙදෙනා නාග භවනයට යන දවස් ඇඳගෙන ගිය කළු දුලිරෙදි දෙකම ඔවුන් දෙදෙනාගේ හින වැළඳගත්තේය. දුනු ඊදඬු හා තෙප් හා මස්කපන කැති ආදිය ගත් අත් ඇතිව පළමු පරිද්දෙන්ම වැදිවෙසින් සිටියාහ. එකල සොමදත්තයා පියාණන් වහන්ස! නුඹවහන්සේ විසින් අපි නසන ලද්දමෝවේදැයි හඬා වලප්නට පටන්ගත. එකල්හි පියා කියන්නේ පුත! තෙපි සැකයක් නොක රව වල මුවෝ ඇත්නම් වලින් මුවන් මරා ජීවත්වම්හයි කියා පුතු අස්වැසිය. සොමදත්තයාගේ මවු ඔවුන් දෙදෙනා එන නියාව අසා පෙරමහට ගොස් කැඳවාගෙන ගෙවඅවුත් බත්පැන් අනුභව කරවා සන්තර්පනය කළාය. වැදි බමුණා බත් අනුභවහොට නිදන්නට පටන්ගත්තේය. එකල්හි සොමදත්ත යන්ගේ මවු පුතා අතින් විචාරන්නී පුත සොමදත්තයෙනි! මෙතෙක් කල් කොයිගියාදැයි විචාළිය. මැනියෙනි! භූරිදත්ත නාරජ්ජුරුවන් වහන්සේ විසින් නාගභවනයට ගෙනයන ලද්දමෝ එහි බොහෝ දවසක් වැස කලකිරී ඔබසිට දැන් ආම්හයි කිය. කිමෙක්ද? තොප විසින් යම් රත්නයෙක් නොගෙනෙන ලදදැයි කිකල්හී මැනියන් වහන්ස! නොගෙනාම්හුයි කිය. කිමෙක්ද? තොපට භූරිදත්ත නම් නාරජ්ජුරුවන් වහන්සේ විසින් කිසිවක් නොදෙන ලදදැයි විචාළ කල්හි මැනියන් වහන්ස! භූරිදත්ත නම් නාරජ්ජුරු වන් වහන්සේ විසින් මපියාණන් වහන්සේට කැමැති කැමැති වස්තු සදෘදි ලන්නාවූ අනඝිවූ මාණික්‍යයක් දෙනලද, මුන්වහන්සේ විසින් මැණික නොගන්නාලදැයි කිය. කුමක් නිසාදැයි විචාළ කල්හි පැවිදිවෙමි කියා මැණික නොගත්සේකැයි කිය. එබස් අසා සොමදත්තයන්ගේ මවු මෙතෙක් කල් මුළුල්ලේ දරුවන් මට භාරකොටලා ගොස් නාගභවනයේ වැස දැන් තෙපි පැවිදිවව්දැයි කිපී මී බද්නා සැන්දෙන් පිටදැමඛ්‍යයේ තළා කොල දුඹටවූ බමුණ! පැවිදිවෙමියි කියා මාණික්‍ය රතනය නොගත්තාවූ තෝ එසේ කල පැවිදි නොවී කුමක් නිසා මෙතැනට අසිද? මාගේ ගෙයින් නික්මෙවයි කියා තැතිගැන්වූය. එකල්හි බමුණු කියන්නේ සොදුර! හොපි මට නොකි පෙව. වල මුවෝ ඇත්නම් ඒ මුවන් මරා මම තොපත් තොපගේ දරුවනුත් පොෂ්‍යය කෙරෙමියි කියා සුතු හා සමඟ වනයට ගොස් පළමු පරිද්දෙන්ම සතුන්මරා ජීවිකාවාත්තියි කෙළේය.

එසමයෙහි දක්ෂිණ මහා සමුද්‍රයෙහි දික්හිඹුලේ වසන්නාවූ එක් ගරුඩ පක්ෂියෙක් පක්ෂමාරුතයෙන් මුහුදුදිය දෙබේකොට එක් නාගරාජයෙක් හිස ඩැහැගත්තේය. එසමයෙහි ගරුඩයෝ නසින් අල්වන්නටනොදනිති. පසුව පණ්ඩරනාග ජාතකයෙහිදී ගුරුළෝ නසින් අල්ලනසේ දූනගත්හ. ඒ ගරුඩ පක්ෂියා වූයාලි නාගරාජයාගේ හිස ඩැහැගෙන දෙබේවගිය දිය එක්වන්නට පළමුකොටම උඩඔසවා එල්වාගෙන හිමාලය වනමස්තකයෙන් නික්මුණේය. එකල්හි කාසීරට වාසිවූ එක් බමුණෙක් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලයවන ප්‍රදේශයෙහි පර්ණශලක් කොටගෙන වසන්නේය. ඒ තාපස්වීන්ගේ සක්මන් කෙළවර මහත්වූ නුගගසෙක්ඇත. ඒ තපස්වී ඒ නුගගසමුල දිවාවිහාරකොට වෙසෙති. එකල්හි ගරුඩරාජයා නුගගස මත්තෙන් නාගරාජයා එල්වාගන යන්නේ නාගරාජයා එලෙන තැනැත්තේ ගැලවෙන පිණිස නහුට නුගගසට වෙළාගත්තේය. ගරුඩපක්ෂියා ඔහු නුගගසවෙළාගත්තියාවනොදනම මහත්වූ ශක්තිඇති බැවින් ආකාශයෙහි පක්ෂප්‍රහාරයකොට නික්මුණේය. නුගගස මුල් හා සමඟ උපුටාපැනනැංගේය. ගරුඩයා නාරජ්ජුරුවන් දික්හිඹුල්වනයට ගෙනගොස් තුඩින් පැහැර බඩපලා නාගරුධිරය අනුභවකොට ශරීරය සමුද්‍ර මස්තකයෙහි හෙළුවේය. නුගගස නාගරාජයා හා සමඟ සමුද්‍ර මස්තකයෙහි වැටෙන්නේ පවන් වැදගෙන මහත්වූ ශබ්ද පැවැත්වූයේය. එකල්හි ගරුඩ රාජයා මේ කවර ශබ්දයක්දෝ යි තෙලනිඹුලෙහි ඉඳ යට බලන්නේ නුග ගස වැටෙන්නා දූන මේ නුගගස මාවිසින් කොහැනකින් උපුටාගෙන එන ලද්දේදෝ යි සිතා තාපසයන්ගේ සක්මන් කෙළවර සිටි මේ නුගගසවන් නේයයි තක්කෙසින් දූන මේ නුගගස මේ තපස්වීන් වහන්සේට බොහෝ උපකාරව සිටියේය. එසේහෙයින් මාවිසින් අකුශලයෙක් රැස්කරන ලද්දේ හෝ නොහොත් රැස්නොකරන ලද්දේහෝයි ඒ තපස්වීන් අතින්ම විචාරා දනිමියි සිතා තරුණ මානවක වෙශයක් මවාගෙන ඒ තපස්වීන් සමීපයට ගියේය. එකෙණෙහි තාපසයෝ ඒ නුගගස ඉදිරිගියතැන සමතලා කරන්නාහ. හරුඩරාජයා තාපසයින් වැඳ එකත්පස්ව ඉඳ නොදන්නා කෙනෙකුන් මෙන් සවාමීනි! මේ කුමක් පිහිටි තැනෙක්දැයි විවාළේය. එකෙණෙහි තාපසයෝ කියන්නෝ එන් ගරුඩරාජයෙක් ගොදුරු පිණිස නාගරාජයකු ගෙනයන්නේ නාගරාජයා විසින් නැලවෙන පිණිස නුගගස වෙළුප නහුටින් වෙළාගත් කල්හි තමා මහත් බල ඇති බැවින් දිවගෙන ගියේය. එකල්හි මෙතැන්හි සිටි නුගගස උපුටා ගියේය. මේ ඒ නුගගස උපුටා ගියතැනැයි කිහ. කිමෙක්ද? සවාමීනි! ඒ ගුරුළාට අකුසල් වේදැයි විවාළේය. තපස්වී කියන්නේ ඉදින් ඒ තෙමේ නුගගස ඉදිරියෙයි නොදනී නම් එබදුවූ සිත් නැති බැවින් අකුසල් නොවෙයි කිය. සවාමීනි! නාගරාජයාට වූකලී අකුසල් ඇද්ද? නැද්දැයි විවාළේය. තපස්වී කියන්නේ ඒ නාගරාජයා මේ ගස නස මිසි වෙළාගත්තේ නොවෙයි, තමා ගැලවෙන පිණිස වෙළාගත්තේය. එසේ හෙයින් ඔහටත් අකුශලයෙක් නැතැයි කිය. ඒ ගරුඩරාජයා තාපස්වීන්ට සතුටුව සවාමීනි! මම ඒ ගරුඩරාජයා වෙමි, නුඹවහන්සේගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි විශෙෂයෙන් සතුටුවීමි. නුඹවහන්සේ වනයෙහි වසනසේක, මම සපියන් අල්වන්නට සුදුසුවූ ආලම්බන මන්ත්‍රයක් දනිමි. මේ මන්ත්‍රය ඉතා අනර්ඝය, මම නුඹවහන්සේට ඒ මන්ත්‍රය දෙමි පිළිගත මැනවැයි කිය. තාපස්වී මන්ත්‍රයෙන් ප්‍රයොජන නැතැයි කිය. ගරුඩරාජයා තපස්වීන්ට නැවත නැවත යාච්ඤාකොට ගිවිස්වාගෙන මන්ත්‍රයද් ඖෂධයත් කියා ගියේය.

එක. ්හි බරණැස් නුවර එක් දිළිඳු බමුණෙක් බොහෝ ණයගෙන ණය දීගත නොහී ණයවැද්දන් විසින් තුඩවැඩිබස් බණන ලද්දේ ඉවසාගත නොහී මට මෙහි විසීමෙන් ප්‍රයොජන කිම්ද? එනයට වැද මියයාම් උතුමැයි සිතා නුවරින් නික්ම ක්‍රමයෙන් අවුත් ඒ තපස්වීන්ගේ පන්සලට වැද තාපසයන් තමාගේ මනාවූ වත් පිළිවෙත් ආදියෙන් සිත්ගෙන සිටියේය. එකල්හි තාපසයෝ මේ බමුණා මට ඉතා උපකාරිය, එසේනෙයින් ගරුඬරාජයා විසින් දෙනලද දිව්‍යමන්ත්‍රය මොහුට දෙමි සිතා බමුණ! මම් ආලම්බන නම් මන්ත්‍රයක් දනිමි. ඒ මන්ත්‍රය තටදෙමි, නෝ ඒ මන්ත්‍රය ඇරගනුවයි කියා සවාමීනි! මට මන්ත්‍රයෙන් ප්‍රයොජන නැත. නොකැමැත්තෙමියි කිකල්හි නැවත නැවත නිමන්ත්‍රණයකොට ගිවිස්වාගෙන මන්ත්‍රය දුන්නාහුය. ඒ මන්ත්‍රයට සුදුසුවූ ඖෂධත් මන්ත්‍ර විධිත් සියල්ලම කීහ. බමුණා මාවිසින් ජීවත්වන්නට උපායෙක් ලබනලදැයි සතුටුව කිපදවසක් එතැන්හිම වැස සවාමීනි! මට රැජාවෙක් පැහැර පීඩාකරන්නේයයි ව්‍යාජයක් කියාගෙන තාපසයන් විසින් පල කියා හරන ලද්දේ තපස්වීන් වැඳ ක්ෂමාකරවාගෙන වනයෙන් නික්ම ක්‍රමයෙන් යමුනා නම් ගංතෙරට පැමිණ ඒ මන්ත්‍රය පිරිවමින් මහමාවතින් යන්නේය. එකල්හි භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ පරිවාරිකාවූ දහසක් පමණ නාගමානවිකාවෝ රිද්ධිතාභී සිඩිය කරන්නාවූ මාණික්‍යරත්නය ගෙන නාගභවනයෙන් නික්ම යමුනා නම් ගංතෙර වැලිගොඩ මත්තෙහි තබා ඒ මාණික්‍යාලොකයෙන් සකල රාත්‍රියෙහි ජලක්‍රීඩාකොට අරුණෝද්ගම නවේලෙහි සමීහරණයෙන් සැරහී මාණික්‍යරත්නය පිරිවරාගෙන තමන්ට මාණික්‍ය ශ්‍රී දක්වමින් උන්හ. බමුණාත් මන්ත්‍රය පිරිවමින් එහැනට පැමිණියේය. ඒ නාගමානවිකාවෝ මන්ත්‍රය පිරිවන අඩ අසාලාම මොහු ගරුඩ රාජයක්හු වියයුතුයයි හසින් නුසැඟව ඒ මාණික්‍ය රත්නය නොගෙන පොළොව කිමිද නාගභවනයට ගියාහ, බමුණා මාණික්‍යරත්නය දැක දැන්ම මාගේ මන්ත්‍රයෙහි ඵල සමුඛිය වීයයි සතුටු සිත් ඇතිව ඒ මාණික්‍ය රත්නය ගෙන නික්මුණේය.

එකල්හි වැදි බමුණා සොමදත්ත නම් තමාගේ පුතු හා සමග මුවන් මරන පිණිස වනයට වැද ඇවිදිනේ අතතුබු මාණික්‍යරත්නය දැක පුතුට කියන්නේ පුත! මේ මැණික අපට භූරිදත්ත නම් නාරජ්ජුරුවන් වහන්සේ දුන් මැණික නොවේදැයි කිය. එසේය පියාණන්වහන්ස! මේ ඒ මැණිකයයි කිය, එසේවීනම් මේ බමුණාට මේ මැණිකෙහි නුහුණ කියා මොහු වංචා කොට මේ මාණික්‍යරත්නය ගනුම්හයි කිය. එකල්හි සොමදත්තයා කියන්නේ පියාණන්වහන්ස! නුඹවහන්සේ පළමු භූරිදත්ත නාරජ්ජුරුවන්වහන්සේ මැණික දෙනගමනේ නොගත්සේක. දන්වූකලී මේ බමුණා නුඹවහන්සේම වංචාකරන්නේය. මුවෙන් නොබැණ හුනමැනවැයි කිය. එකල්හි නෙසාද බ්‍රාහමණයා කියන්නේ වන්නාට පුත! ඔහුගේත් මාගේත් වංචාකරන්නට නිසි නොනිසි බව දන්නවාදැයි කියා ආලම්බනයා හා සමග කථාකරන්නේ අභිවාඩිකරවූ අභිමතාර්ථ සාදාදෙන්නාවූ සිත්කලුවූ රත්නයන් අතුරෙන් උතුම්වූ සමීකාරයෙන් සම්පූර්ණවූ ලක්ෂණ සම්පන්නාවූ මේ මැණික ඇරගෙන එන්නාවූ තොප කොයිදී මේ මැණික ලැබුයයි විවාළේය. ඉක්බිත්තෙන් එබස් අසා ආලම්බනයා කියන්නේ බ්‍රාහමණය! මම අද උදැසනම මිහිමාවතයන්නෙමි රත්වූ ඇස් ඇති දහසක් පමණ නාගමානවිකාවන් විසින් හාත්

හසින් පිරිවරන ලද මේ මැණික ලදිමි. මා දැන ඔහු හැමදෙනම තැකිගෙන මේ මැණික හැර පලායියෝයසි කිය, එබස් අසා වැදිබමුණා ඔහු විංවාකරනු කැමැතිව මාණික්‍ය රත්නයෙහි අවණී ප්‍රකාශකොට තමා ගන්නා කැමතිව කියන්නේ යමෙක් මේ මාණික්‍ය රත්නයට උපචාර කරන්නට තමාගේ ජීවිතයත් මෙන්ම මානයකරන්නට පුදන්නට මනාකොට තබන්නට දන් නේදිනම් ඔහුටම (මේ මාණික්‍ය රත්නය මනාකොට උපචාරකිරීම් පිදීම් ධැරීම් මානයකිරීම් නිබිම් වශයෙන් සම්භාවනා කරනලද්දේ) සියලු ඉෂ්ටාථී ප්‍රයෝජන කරන්නේය. තවද මේ මාණික්‍යරත්නය උපචාර විපත්තාවූ සත්වයා විසින් නිබිමෙන්වත් ධැරිමෙන්වත් තුනුවණින් නිරාදරව පරිහරණය කරන ලද්දේවිනම් ඔහුට විනාශයට මෙයම සැහෙන්නේය. එසේහෙයින් මේ මාණික්‍ය රත්නයට උපචාරකොට සම්භාවනා කරන්නට සමර්ථවූ සත්වතෙමේ මේ මැණික ධරන්නට සුදුසුවන්නේය, අපගේ ගෙයි බොහෝ මැණික්ඇත, එසේහෙයින් අපි මේ අනඝිවූ මැණිකට කළමනා විධිවිධාන දනුම්හ. මම තට මැණික් සියයක් දෙමි, නෝ ඒ ඇරගෙන මට මේ මාණික්‍යරත්නය දෙවයි කියේය. එසේ කී පමණක්විනා ඒ වැදි බමුණාගේ ගෙයි එක රත්නයෙකුත් නැත්තේය. ඒබමුණාවූකලී ඒ මැණික කැමැති කැමැති වස්තු සිඩකොටදෙන නියාව දන්නේය. එසේහෙයින් ඒ බමුණු සිතන්නේ ඉස්සෝදැ නහා මැණිකට පැන් ඉස මට මැණික් සියයක් දෙවයි කියමි, එකල්හි මේ මැණික තමාගේ ආනුභාවයෙන් මැණික් සියයක් දෙන්නේය. මම ඒ මැණික් සියය මෝහට දෙමි සිතා නිර්නිතව මැණික් සියයක් ඇරගෙන මේ මැණික මට දිපියවයි කියේය. එකල්හි ආලම්බනයා කියන්නේ මේ මැණික මාගෙන් කිසිසොනෙකුත් විසින් ගව මහිෂාදි වස්තුයෙන්වත් රන්රුවන් ආදියෙන් විකිණියගත යුතුනොවෙයි. මාගේ මේ මැණික ලක්ෂණ සම්පන්නය, එසේ හෙයින් කිසි වස්තුවකට මිලකොට විකිණියයුතු නොවෙයි කිය. එබස් අසා වැදි බමුණු කියන්නේ බමුණ! හා විසින් ගෙරිහරක් හා රන්රුවන් ආදියට මිලකොට මේ මැණික ඉදින් නොදියයුතුවීනම් එසේනම් මේ මැණික කවර වස්තුවකට මිලකොට දියයුතුද? ඒ මට කියවයි කිය. එපවත් අසා ආලම්බනයා කියන්නේ බමුණ! යමෙක් තෙජස්වූ අන්‍යවූ සත්වයකු විසින් මැඩ පැවැත්ත නොහැක්කාවූ නාගරාජයකු වසන තැනක් මට කීවේවීනම් ඕහට මම ප්‍රභා සම්ඛියෙන් බබළන්නාවූ මේ මැණික දෙමැයි කිය. එබස් අසා තෙසාදබ්‍රාහ්මණයා කියන්නේ බ්‍රාහ්මණවෙශයෙන් ඇවිදිනාවූ තෝ පක්ෂීන්ට නායකවූ ගරුඩරාජයෙක්ද? ගරුඩරාජයකු හෙයින්වේද ගොචරයට සුදුසුවූ නයකු වසන තැන් විචාරන්නේ, තා ගුරුළකු වියයුතුයසි සිතමි කිහ. එකල්හි ආලම්බනයා කියන්නේ මම ගරුඩ රාජයෙක් නොවෙමි. ගරුඩරාජයන් මා දුටුවිරුත් නැත, ඝජියන් මර්දනයකිරීම් ඇති ආලම්බන නම්වූ විෂ වෛද්‍යවාරිවූ බ්‍රාහ්මණයෙකැයි ලෝවැස්සෝ මාදනීති කිය. එබස් අසා වැදිබමුණා කියන්නේ ආලම්බනය තාගේ කවරබලයෙක් ඇද්ද? තාගේ කවරශිල්පයෙක් ඇද්ද? හෝ කවරක් උපසථාහකකොට එළඹ සිටින් කෙරෙහි නිරාදරවන්නෙහිදැයි කිය. එකල්හි ආලම්බනයා තමාගේ ශක්තිය ප්‍රකාශකොට කියන්නේ ගෝඝිකගෝත්‍ර ඇති පැවිදිවූ බොහෝකල් ඇති වල්හි වසන්නාවූ එක් ඍෂිතෙනකුන්වහන්සේට ගරුඩරාජයෙක් නිරුත්තරවූ උතුම්වූ විෂමන්ත්‍රයක් කිය, භාවනාභියෝගයෙන් වඩනලද සිත්ඇති හිමාල පර්වතප්‍රාන්තයෙහි වසන්නාවූ ඒ තපස්වීන්ට රෑ දුවල් නොපමාව

සඟස්කොට උපස්ථානකෙළෙමි. එකල්හි මා විසින් සිත්ගෙන අත්පාවෙහෙ
වර කරනලද්දාවූ උතුම්වූ ශීලවෘත සමාදානයෙන් හා බ්‍රහ්මචර්‍යායෙන්
යුක්තවූ නපුස්වින්වහන්සේ තමන්වහන්සේගේ අභිප්‍රායෙන්ම මා විසින්
කරනලද යාච්ඤාවක් නැතිව දිව්‍යවූ ආලම්බන මන්ත්‍රයක් උගන්වා ඖෂධ
කියා ඊට නිසි විධිවිධානත් කීසේක. මම ඒ මන්ත්‍රය උපස්ථාන කොට ඒ
මන්ත්‍රානුභාවයෙන් සර්පයින්ට නොබිම්, බිෂබාන්නට සමර්ථවූ සර්පයන්ට
මම ආචාර්‍යයෙමි. ලොකයෙහි සර්පයෝ ආලම්බන නම් විෂවෛද්‍යාචාර්‍යයයි
මා දනිති කියා.

එබස් අසා නෙසාද බමුණා සිතන්නේ මේ ආලම්බනයා යමෙක් මෝහට
නයකු දක්වූසේවීනම් ඔහට මාණික්‍යරතනය දෙන්නේය, එසේහෙයින් මෝ
හට භූරිදත්තනම් නාරජ්ජුරුවන් දක්වා මැණික ඇරගනිමි සිතා ඉක්බිත්
තෙන් පුතු හා සමඟ කථාකරන්නේ පුත සොමදත්තයෙනි! මේ මැණික
බමුණා අතින් ඇරගනුමෝද? තොප සිතටත් යහපතැයි වැටහෙන්නේ
නම් පරීක්ෂාකොට කියව, තමා කරා පැමිණීත්‍රීකාන්තාව දණ්ඩන් ගසා දුරු
කරන්නට කාරණා නොවන්නේවේද? එසේහෙයින් මේ අනඳිවූ මැණික
ඇරගනුමෝදැයි කියා. එබස් අසා සොමදත්තයා කියන්නේ බමුණාණන්
වහන්ස! ඒ භූරිදත්තනම් නාරජ්ජුරුවන්වහන්සේ නාගභවනයට පැමිණියාවූ
නුඹවහන්සේට දිව්‍යවූවසතුකාමකෙලඹකාමයෙන්සත්කාර සම්මානකළසේක
එසේහෙයින් සත්පුරුෂවූ නාරජ්ජුරුවන් වහන්සේට නුඹවහන්සේ කුමක්
නිසා මොහයෙන් ද්‍රොහකරන්නට සිතනසේක්ද? ඉදින් පියාණන්වහන්ස!
නුඹවහන්සේ වසතු කැමැතිසේක්වීනම් භූරිදත්තනම්නාරජ්ජුරුවන්වහන්සේ
දෙනසේක. උන්වහන්සේ සමීපයට ගොස් ඉල්වුව මැනව, එකල්හි නුඹ
වහන්සේට උන්වහන්සේ බොහෝ වසතු දෙනසේක්වේදැයි කියා, එබස් අසා
චැදිබමුණා කියන්නේ පුත සොමදත්තයෙනි! තෙපි ඉතාබාලය, එසේහෙයින්
ලොකව්‍යවහාර නොදනුව, මම මූකළහෙයින් සියලු ලොකප්‍රවෘත්ති දනිමි
යමක් අතට පැමිණියේ නම් වත් භාජනයට පැමිණියේ නම් වත් ඉදිරියෙහි
තබනලද්දේනම් වත් අනුභවකරන්නට උතුම්වන්නේය. දුර තුබූ දෙයින්
ප්‍රයොජන නැත. එසේහෙයින් පුත සොමදත්තයෙනි! තමාකරා පැමිණි
ශ්‍රීභාන්තාව ගසා දුරුකරන්නාක්මෙන් හස්තප්‍රාප්තවූ මේ මාණික්‍යරත්නය
ඇරනොගෙන ඉවත්කොට පීම කාරණා නොවෙයි කියා. එකල්හි සොම
දත්තයා කියන්නේ පියාණන්වහන්ස! යමෙක් මිත්‍රද්‍රොහකම් කෙළේවිනම්
ඒ සත්තෙමේ රෞද්‍රවූ නරකයෙහි පැසෙන්නේය. තවද මිත්‍රද්‍රෙහිවූ සත්වයා
ජීවත්ව හින්දදීම පොළොව පැළී විවරව නරකයට ගෙනයන්නේය, තවද
මිත්‍රද්‍රොහිවූ අසත්පුරුෂ ගුණඇති තමාහට වත වැඩහසන්නාවූ සත්ව තෙමේ
ඉදින් ජීවත්ව හුන්නේවීනමුත් බත්පැන් නොලැබ වියලී මනුෂ්‍යප්‍රෙතවන්
නේය. එසේහෙයින් නුඹවහන්සේ එබදුවූ මිත්‍රද්‍රොහකම් නොකළ මැනව,
ඉදින් වස්තු කැමැතිසේක්වීනම් භූරිදත්තනම් නාරජ්ජුරුවන්වහන්සේ නුඹ
වහන්සේට වස්තු දෙනසේක. ඉදින් නුඹවහන්සේ මා කිවා නොකොට අසත්
පුරුෂකම්කළසේක්වීනම් ඒ පාපය නොබෝකලකින්ම නුඹවහන්සේට
විපාකදේයයි සිතම් කියා. එබස් අසා බමුණා කියන්නේ පුත සොමදත්ත
යෙනි! තෙපි බාලයව, එසේහෙයින් තොප දන්නා කාර්‍යයෙක් නැත. මම
චූකලී සියලු යහපත නපුර දනිමි, මාකියන්නක් අසව, මේ ලොකයෙහි

බ්‍රාහ්මණයෝ නම් යම් කිසි අකුසල කර්මයක් කොට පියා යාගකර්මයෙන් පාප ප්‍රවාහයකොට පිරිසුදුවෙති. එසේහෙයින් අපිත් යාගකොටපියමිහ. එකල්හි කළාවූ අකුසලකර්මයෙන් මිදියන්නමෝවේදැයි කිය. එකල්හි සොමදත්තයා කියන්නේ පියාණන්වහන්ස! මෙසේ පාපකාරිවූ මෙලෝපරලෝ නොදන්නා වූ නුඹවහන්සේ හා සමඟ අද මම එකපියවරක් පමණකුත් නොයමි, එබැවින් දැන්ම පලායෙමි කිය. මෙසේද කියා නුවණැති මානවකයා පියාණන්සිහට තමාගේවචනය නංවාගතනොහැකිවූ ශබ්දයෙන් දෙවතාප්‍රකාශනයකොට මෙබදුවූ පාපකාරිවූ තැනැත්තන් හා සමඟ නොයමිකියා පියාණන් බලබලා සිටියදීම පලාගොස් හිමාලයවනයට වැද පැවිදිව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන්ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්නේය.

ඉක්බිත්තෙන් නෙසාදබ්‍රාහ්මණයා සොමදත්තයා තමන්ගේ නෙය හැර කොසියේදැයි සිතාමින් ආලම්බනයා සවම්පයට ගොස් ඔහු මඳක් නොස තුටුවූ සිත්ඇති නියාව දැක ආලම්බනය! තෝ සැකයක් නොකරව, තට භූරිදත්තනම් නාරජ්ජුරුවන් දක්වමි කියා ඔහු කැඳවාගෙන නාරජ්ජුරුවන් පෙනෙවස් රක්ෂාකරන තැනට ගොස් තුඹස මත්තේ දරණවැලලාගෙන වැදහොත්තාවූ නාරජ්ජුරුවන් දැක නුදුරුහැනක සිට අත දික්කොට කියන්නේ එම්බල බමුණ! තෙල මහානාරජ්ජුරුවන් අල්වාගෙන තාගේ මැණික මටදී පියව, තවද යම් නාරජ්ජුරුකෙනකුන්ගේ රතිදුගොව්වන් පිට පෑ සමානවූ රතුවූකිස් ඇද්ද, මනාකොට පොළනලද පුළුන්පිඬක් වැනිවූ ධවලවූ ශරීර ඇද්ද, එබඳුවූ රූපශොභා ඇති මේ නාරජ්ජුරුවෝ තුඹස මත්තේ වැදඔවිති, බමුණ! තා ඒ නාරජ්ජුරුවන් අල්වාගනුවයි කිය. එකල්හි මහබෝසතාණෝ ඇසදල්වා බලා වැදිබමුණා දැක මේතෙමේ මාගේ උපෝෂථශීලයට අන්තරායකරන්නේයයි සිතා මොහු නාගභවනයට ගෙන ගොස් මහාසම්පත්තියෙහි පිහිටුවීම්, මාවිසින් දුන් මැණික එදවස් නොගත්තේය. දැන්වූකලී අහිගුණ්ඨිකබ්‍රාහ්මණයකු ගෙයා ආයේය. ඉදින් මම මේ මිත්‍රද්‍රොහියාට කිපියෙම්විම්නම් මාගේශීලය බණ්ඩවන්නේය, මාවිසින්පළමු චතුරාඩ්‍යකින් යුක්තවූ උපෝෂථශීලය ඉටනලද, එසේහෙයින් ඒ තෙමේ සිටිතැනම සිරිවයි. ආලම්බනයාවූකලී මා කඩි කඩනොට කපානමුත් අතු රේලා පලහා නමුත් උලඅමුනානමුත් ඕහට මම කිපි විෂඝ්‍රමයක්වත් විෂවහ්නියක්වත් හැර පීඩාවක් නොකෙරෙමියි සිතා ඉදින් මම මොවුන් දෙදෙනා කිපි බලාපුයෙම්විම් නම් විෂතෙජයින් රඳුම්වක්මෙන් සුණුවිසුණුවන්නාහුය. එසේ කල්හි මාගේ උපෝෂථශීලය බිඳියාවන්නේයයි ඇස පියාගෙන අධිෂ්ඨානපාරමිතාව දෙරදැරිකොට දරණවැල අස්සේ ඉසතබාගෙන නිශ්චලව වැදහොත්තාහුය. එකල්හි නෙසාදබ්‍රාහ්මණයාත් පින්වත්වූ ආලම්බනය! මේ නාරජ්ජුරුවන් අල්වාගෙන මැණික මට දීපියවයි කිය. ආලම්බනයා නාරජ්ජුරුවන් දැකලාම සතුටුවූ සිත් ඇතිව මැණික කිසිවක්කොටත් නොසිහා නිරාසාව බමුණ! මේ මැණික ඇරගනිවයි කියාබමුණා අතට මැණිකදමූ ඇය. ඒ මැණික ඔහු අතින් ගිලිනි බිම වැටිණ,වැටුණු පමණකින්ම පොළොවට වැදනාගභවන යටනියේය. වැදී බමුණා මාණික්‍යරත්නයෙන, භූරිදත්ත නම් නාරජ්ජුරුවන් හා මිත්‍ර ධර්මයෙන, පුත්‍රයාගේනැසිඋනින්ම පිරිහී සිතන්නේ සියි පිහිටක් නැතිවීම්, මාගේ දරුවන්ගේ බස් නොනිවිස්සෙම්සි ගඩමන්

වැලපෙමින් තමාගේ ගෙට ගියේය. ආලම්බනයාත් දිව්‍යඖෂධයෙන් තමාගේ ශරීරය වසාගෙන මදක් අනුභවකොට ශරීරාභ්‍යන්තරයත් පරිභාවිත කොට දිව්‍යමන්ත්‍රය පිරුවමින් බොධිසත්වයන් කරා ගොස් නහුවගසා අල්වා ගෙන ඇද හිස හරකොට මිරිකමින් මුඛය අල්වා ඖෂධසපා බොධිසත්වයන්ගේ මුඛයෙහි කෙළවත්කෙළේය, පවිත්‍රශීලීවූ නාරජ්ජුරුවෝ ශීලභේදභයින් තිපී ඇසදල්වාත් නොබැලූහ. එකල්හි අභිභූණ්ඩිකා බ්‍රාහ්මණයා මහබෝසතාණන් ඖෂධයෙන් මත්කොට නහුව අල්වා ඉස යටිකුරුකොට සලා අනුභවකළ ගොදුරු වමාර්වා බිම දිග වැදහොවා .සාල් බිස්සක් මිරිහන කලක්මෙන් දැනින් මැඩිඩේය, එකල්හි සකලශරීරයෙහි ඇට සුණුවිසුණුව යන්නාක්මෙන්විය. නැවත අභිභූණ්ඩිකා බ්‍රාහ්මණයා නහුව අල්වාගෙන රදවූ පිළී අපුලන්නාක්මෙන් බිම අපුල්ලාපිය. මහබෝසතාණෝ මෙබඳු දුක් අනුභවකරන්නාහු කිසිවිටෙහත් බමුණාට නොකිපියෝය. මෙසේ අභිභූණ්ඩිකබ්‍රාහ්මණයා මහබෝසතාණන් දුම්ලකොට වැලින් පෙට්ටියක් වියාගෙන් මහබෝසතාණන් පෙට්ටියෙහිලන්නටපටන් ගත. ශරීරය මහත් බැවින් ඒ පෙට්ටියේ නොවදනේය. එකල්හි බොධිසත්වයන්ට විඑඹින් ඇත ඇත දමා පෙලාව ඇරගෙන එක් ගමකට ගොස් ගම මධ්‍යයෙහි පෙලාව තබා නයින්ගේ නැටුම් දක්නා කැමැති කෙනෙක් එත්වයි කියා හඬගැයේය. එකල්හි යියලු ගම්වැස්සෝ එහැනට රැස්වූහ. එකෙණෙහි ආලම්බනයා මහනාරජ්ජුරුවෙනි! පෙලායෙන් නික්මෙවයිකිය. එකල්හි මහබෝසතාණෝ සිතන්නාහු අදමා පමිත්සතුටුකොට කෙළින්නට වටනේය. එසේ කල්හි ආලම්බනයා බොහෝ වසතුලාභ සතුටුව මාහැරපියන්නේය, එසේ හයින් මේ අභිභූණ්ඩිකයා මාලවා යමක් යමක් කරවනු කැමැත්තේවීනම් ඒ ඒ දෙය කෙරෙමියි සිතූහ. එකල්හි අභිභූණ්ඩිකයා නාරජ්ජුරුවන් පෙලායෙන් පිටත්කොට මහත් වෙවයි කිය. මහබෝසතාණෝ එබස් අසා මහත්වූය. නැවත කුඩාවෙවයි කිය. බොධිසත්වයෝ එකල්හි කුඩාවූය. නැවත වටවෙවයි කිය. බොධිසත්වයෝ වටවහියෝය, සතරැස්ව අවැස්ව සොළොසැස්වෙවයි කිය. බොධිසත්වයෝ එපරිද්දෙන්ම කොලෝය. නැවත බිම හා සමභූමිවයි කිවූය, එකල්හි බොධිසත්වයෝ කිසිකෙනකුන්ටත් නොපෙනෙන්නාක්මෙන් බිමඇලී ගියාය. නැවත පෙණඑකක්මවා ගනිවි. දෙකක් තුනක් සතරක් පසක් සයක් සතක් අටක් නවයක් දශයක් විස්සක් තිසක් සතලිසක් පනසක් පමණ මවාගනුවයි කිය. එකල්හි බෝසතාණෝ පනසක් පමණ පෙණමැවූය. නැවතසියයක් පමණමවවයි කිය. සියයක් පමණමැවූය,නැවත උස්වයව, මිටිවයව,පෙනෙන්නාවූද නොපෙනෙන්නාවූද ශරීර ඇතිවයව පෙනෙන්නාවූ අසීශරීර ඇතිව යව, නිල්වයව, රන්වන්වයව, රත්වයව, සුදුවයව, මදටවන්ව ගිනිදැල් හරුව, දියකඳහරුව, දුම්කඳහරුවසි, කී කල්හි මේ මේ ආකාරයෙන් ඒ අභිභූණ්ඩිකබ්‍රාහ්මණයා විසින් කී නොකී ආත්මභාව මවා නැටුම් දැක්වූය. ඒ දැක සමහර මනුෂ්‍යයෙනෙක් කඳුඑධරාගත නුහුණුවාහ, මනුෂ්‍යයෝ සතුටුව බොහෝ රත්‍රන් හා වස්ත්‍රාභරණාදිය දුන්හ. මෙසේ ඒ බමුණා ඒ ගම්වැසියන්ම ලාභයක් පමණ වස්තුවලද්දේය. ඒ අභිභූණ්ඩිකබ්‍රාහ්මණයා මහබෝසතාණන් අල්වන ගමනේදී එකානනයෙන්ම දහසක් වස්තු ලැබ මොහු ඇරපියාම සිතූනැනැත්තේ එතෙක් වස්තුලාභත් මේ කුඩා ගම් වැලදීම මවිසින් මෙතෙක් වස්තු ලබනලද නුවරවාසීන්ට නොවූ කල්හි කොපමණ බොහෝවූ වස්තුනොලැබේදැයි වස්තුලොභයෙන් බොධිසත්වයන් නො

හැරියේය. ඒ බමුණා ඒ ගමදිම් කුටුම්බසණ්ඨාපණයකොට සත්රුවන්මයවූ පෙලාවක් කරවා එහි මහබෝසතාණන් ලාගෙන සරහා පිළියෙළකරනලද සැපවූ යානාවකට නැගී මහපෙරහරින් නික්ම බොධිසත්වයන් නුවර වාසල් ළඳුර ගම්සතර ප්‍රධානකොට ඇති ඒ ඒ තැන මසක් පමණ කල් කෙළවූයේය. පසළොස්වක්දිනයේවනාහිඅදනුඹවහන්සේට හෙළවම්සිරජ්ජුරුවන්ටදන්වා යැවූහේය. එකල්හි රජ්ජුරුවෝ නුවර බෙරලවා මහජනයා රැස්කරවූයේය. රාජාඛාණයෙහි මහජනයෝ ඇඳ පිට ඇඳතබා මැසිපිට මැසිබැඳ නැටුම් බලන පිණිස ඒ මැසි ආදියට පැන නැංගාහ.

ඉක්බිත්තෙන් ආලම්බනයා විසින් මහබෝසතාණන් ඇල්වූ දවස්ම බොධිසත්වයන්ගේ මැනියෝ සුපත්නයක් දක්නා තැනැත්තෝ රත් ඇස් ඇති කළුවූ පුරුෂයකු කඩුවක්ගෙන තමන් අත කපා ලේ පෙරපරා ගෙන යන්නා දුටහ. මෙසේ දැන සමුද්‍රජාවෝ භයින් තැතිගෙන නැගී සිට දකුණත අහගා බලා සුපත්නයක් නියාව දන්හුය, එකල්හි සමුද්‍රජාවන්ට සිතෙන්නේ මව්සින් තක්ෂවූ දුසුපත්නයක් දක්නාලද, එසේහෙයින් දරුවන් සතරදෙනාටවත් ධ්‍රුතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් වහන්සේටවත් මටවත් උපද්‍රවයෙක් වියයුතුයයි සිතිණ, එතකුදුවුවත් මහබෝසතාණන් උදෑසන අධිකකොට සිතිවිලිගෙන ශොකකළහ. කුමක් නිසාදයත්? අවශෙෂයෝ තමන්ගේ නාගභවනයෙහිම වෙසෙති. මහාබොධිසත්වයෝ වූකලී සිල් රක්ෂාකිරීමෙහි බලවත්වූ අදහස් ඇති බැවින් මනුෂ්‍යලොකයට ගොස් පෙහෙවස් රක්ෂා කෙරෙති. එසේහෙයින් මාගේ පුතණුවන් අහිගුණ්ඩිකා යෙක්වත් ගරුඩයෙක්වත් අල්වාගනිද් දෝහෝසි බොධිසත්වයන්ගැනම අධිකතර කොට සිතිවිලි කළහ. ඉක්බිත්තෙන් දෙපෝයක් ඉකුත්වූකල්හි මාගේ පුතණුවෝ අඩමසක් ඉකුත්වූකල මාහැර වසන්නටපළමු අසමර්ථ වෙති, එසේ හෙයින් එකාන්තයෙන්ම උන්ට කිසි භයක් උපන්නේවනැයි දෙම්නස්වූහ. තවද මසක් ඉකුත්වූකල්හි සමුද්‍රජාවන්ගේ ඇසින් කදුළු නොවැගිරෙන වේලෙක් නම් නැත. ළය වියලී ගියේය. හැඩමෙන් දැස් රත්ව ගියේය. ඒ සමුද්‍රජාවෝ භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගැන ශොකකරමින් තමන් දකින්නට ආවාවූ ඒ සුදර්ශන නම් නාරජ්ජුරුවන් හා සමග කිසි කථාවක් නොකළාහ. එකල්හි ඒනාරජ්ජුරුවෝ සිතන්නෝ මාගේ මැනියන්වහන්සේ මා පෙර ආකල සතුටුවනසේක. සුවදුක් කථාකරනසේක. අද වූකලී දෙම්නසට පැමිණිසේක. මීට කාරණා කවරේදැයි සිතා ඉක්බිත්තෙන් මැනියන් අතින් ඒ කාරණය විචාරන්නාහු මෙසේ කීහ. මැනියන්වහන්ස! පළමු නුඹවහන්සේ දක්නට මා ආකල්හි මා හා සමග සතුටුව කථාකරනසේක. එසේවූ නුඹවහන්සේ මහත්වූයශපිරිවරින් සමෘඩ්ධවආවාවූ මාදැස දැන්කථානොකරනසේක. දැන් නුඹවහන්සේගේ චක්ෂුරාදී ඉන්ද්‍රියයෝත් ප්‍රසන්න නොවෙති. රන් කැඩපතක් හා සමාන මුඛයත් කෘෂ්ණවර්ණවී ගියේය. තවද මැනියන් වහන්ස! අතින් මිරිකනලද පද්මයෙක් යම්සේ මලානිකව වේද, එමෙන් නුඹවහන්සේත් මලානිකව නිශ්ශොභාවිය. මෙබදුවූ මහත්වූ ශ්‍රී සමෘඩ්ධින් නුඹවහන්සේ දක්නා පිණිස ආවාවූ මා සමග පළමු පරිද්දෙන් සතුටුව කථා නොකරන්නේ කුමක් නිසාදැයි කිවුය. ඒ සමුද්‍රජාවෝ සුදර්ශන නම් නාරජ්ජුරුවන් විසින් මෙසේ කී කල්හිද බසක් බැණ නොනැංගාහ. එකල්හි සුදර්ශන නම් නාරජ්ජුරුවෝ සිතන්නෝ කිසිකෙනෙකුන් විසින් ආක්‍රොශ

පරිභවයෙක් මූන්වහන්සේට කරනලද්දේදෙගෝයි සිතා ඉක්බිත්තෙන් එපවත් විමාරන්නාහු මැනියන් වහන්ස! පෙර නුඹවහන්සේ මා ආකල සතුටුව සුවදුක් කථාකරනසේක. එසේවූ නුඹවහන්සේ දැන් මා හා කථා නොකරනසේක. නුඹවහන්සේගේ මුඛයත් මලානිකව ගියේය. කිමෙක්ද? නුඹවහන්සේට ආක්‍රොෂපරිභව බිණ්ඩිමෙන් පිඬාවක්කළකෙනෙක්ඇද්ද? නොහොත් නුඹවහන්සේගේ ශරීරයට බලවත්වූ වෙදනාවෙක් ඇද්ද? ඒ මට නත්වූ පරිදිදෙන් කිව මැනවැයි කිවුය. එකල්හි නාරජ්ජුරුවන්ට සමුදුජාවෝ තමන් නොසතුටුවූ කාරණය කියන්නාහු පුත සුදශීනයෙනි! මීට මසකින් යටි සවප්නයක් දක්නෙම් එක් කළුවූ රත් ඇස් ඇති පුරුෂයෙක් මාගේ දකුණත කපාගෙන ලේ පෙරපෙරා මා අඬඬින් සිටියදීම පලාගියේය. මම ඒ සවප්නය යම් දවසක දිටිම් නම් එදවස් පටන් අද දක්වාම මසක් දුතුරෙහි රාත්‍රි දිනයෙහි මාගේ සිතට සැපයෙක් නම් නැත්තේයයි කිවුය. මේසේද කියා පුත! මාගේ ප්‍රියපුත්‍රවූ තොපගේ මලණුවන් නොදකිම්. උන්ට හයෙක් උපන්නේවනැයි සිතම් කියා අඬන්නාවූ මැනියෝ මෙසේ කියා ඇඬුහ. මනාවූ හාව හාව ලීලාකටාක්ෂමන්‍දසම්මිතයෙන් යුක්තවූ සම්භාරණයන් පැලැන්දවූ උතුම්වූ රූපශොභා ඇති සොළොස්දහසක් පමණ නාගමාන විකාවෝ යම් නාරජ්ජුරු කෙනකුන් පිරිවරා ඇවිද සිත් ඇලවූද, එසේවූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් අද මම නොදක්නෙම්වේද, තවද පෙර යම් නාරජ්ජුරුකෙනකුන් උතුම් ඛඩ්ගපත්‍රයන් ධරන්නාවූ සවණිණාලඞ්කාරයෙන් සැරසුණුබැවින් සුපිපි කිණිහිරිමල් වනයක්මෙන් බබළන්නාවූ නාගමානවකයෝ පිරිවරා ඇවිද්දේද; එසේවූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන් අද මම නොදක්නෙම්වේද, තවද පුත සුදශීනයෙනි! එබැවින් දැන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාලිගාවට ගොස් ධම්මයෙහි පිහිටියාවූ සිල්වත්වූ තොපගේ බැඟන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් දකුම්හයි කියා සුදශීන නම් නාරජ්ජුරුවන්ගේත් තමන්ගේත් පමිත් හා සමඟ භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාලිගාවට ගියෝය.

එකල්හි භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ බිසවවූ නාගමානවිකාවෝ බොධිසත්වයන් පෙහෙවස් රක්‍ෂාකරන්නාවූ තුඹ්‍ය මත්තේ නොදකා මැනියන් වහන්සේගේ ගෙයිවනැයි නොඅසාඅා නිශ්ශංකාව වැදඋන්හ. තවද ඒ නාගමානවිකාවෝ අපගේ සවුදුජාවන් වහන්සේ පුතණුවන් නොදකා එනසේක්ලයිඅසා පෙරගමන්කොට ආයුෂ්මාවන්වහන්ස! නුඹවහන්සේපුතණුවන් වහන්සේ නොදක්නේ දැන් අදට මසෙක. මළුබවත් උන්බවත් නොදනුම් හයි මහහඬින් හඬා දෙපත්ලෙහි වැටිහුනහ. එකල්හි භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මැනියෝ යෙහෙලියන් හා සමඟ විහිමඬ්‍යයෙහිදී අඬා වැලපඔවුන් කැඳවාගෙන භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේප්‍රාසාදයට නැඟී පුතණුවන්ගේ යහනත් සිංහාසනයත් බලා අඬන්නාහු මෙසේ කියා ඇඬුහ. සිස්වූ කැදැල්ලෙක දරුමළු ලිහිණියන් යම්සේ බොහෝකලක් ශොභා දුබයෙන් නැවේද, එපරිදිදෙන්ම භූරිදත්ත නම් නාරජ්ජුරුවන් නොදක්නාවූ මම බොහෝකලක් ශොකදුඃඛයෙන් නැවී නොසැනහෙමි. පැන්සිදීගිය මඩ වළෙක පියා වහුළ සක්වාලිහිණියෙක් මසුන් නැතිව යම්සේ ශොකගෙන ඉඳිද, එපරිදිදෙන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් නොදක්නාවූ මම බොහෝකලක් ශොකාග්නියෙන් පැහී සැනහීමකට නොපැමිණියෙමි. භාග්‍ය

රන්ගේ උදුන යම්සේ ඇතුළෙන්ම දැඳ, පිටතින් නොදැඳ, එපරිද්දෙන්ම භූරිදත්තනම් නාරජ්ජුරුවන් නොදක්නාවූවම් ශොකාග්නියෙන් ඇතුළෙන්ම දවමිසියා මෙසේ භූරිදත්තනම් නාරජ්ජුරුවන්ගේ මැනියන් අඩන්නටපටන් ගත් නල්ගි උන් හා සමග අවශෙෂයන් ඇඩීමෙන් භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාලිගාව සමුද්‍ර ඝොෂාවක් මෙන් එහාතිඝොෂාවිය. එහාද සඩයෙක් සිටියේ සිටපියන්නටද අසමර්ථවිය, සියලු රාජභවනය යුගාන්ත මාරුතයෙන් ජාඩාර එළනලද සල්වනයක් මෙන්විය. එකල්හි අරිඤ්ජය, සුභගය, යන දෙබෑයෝත් දෙමවුපියන්ට උපස්ථානයට ඝන්නාහු ඒ විලාප ශබ්දය අසා භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ මාලිගාවට වැද මැනියන් අස්වසන්නාහු මැනියන් වහන්ස! ශොක නොකළ මැනව, අස්වැසිලි ලද මැනව, ලොකයෙහි සඩයෝ දුනි උත්පත්ති දෙක සමභාවකොට ඇත්තාහ. මේ දුනිඋත්පත්ති දෙකින් මිදුණාවූ එහාද සඩයෙක් නැත්තේය. එසේහෙයින් නුඹවහන්සේ ශොක නොකළ මැනවැයි කිහ. එබස් අසා සමුද්‍රජාවෝ කියන්නෝ දරුවෙනි! ලොකයෙහි සඩයෝ උපදිති, මියති, දුනි උත්පත්ති දෙකින් නොමිදුණු නියාව මමත් දනිමි. එහතුදුවූවත් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් නොදක්නාවූ මම ශොකයෙන් මඩනා ලදිමි. තවද සුදර්ශන නම් නාරජ්ජුරුවෙනි! දැන් දැනගනුව ඉදින් අද මේ රාත්‍රියෙහි භූරිදත්ත නම් නාරජ්ජුරුවන් නුදුටුයෙම්වීමනම් මාදිවි නොනිබෙයි කිවුය. එබස් අසා පුත්‍රයෝ කියන්නාහු මැනියන්වහන්ස! අස්වැසුන මැනව, ශොකනොකළමැනව, බැයාණන්වහන්සේ සොයා ඒ ඒ දිග ගොස් නොබෝකලකින් උන්වහන්සේ වෙතැනට ගෙනෙම්හ. තවද ගිරිදුගීය ගම්නියම්ගම් රාජධානිය යනමේ සියලු තැන ඇවිද බැයාණන් වහන්සේ දැක කැඳවාගෙන එම්හ. දශරාත්‍රියකින් වෙපිට බැයාණන්වහන්සේ ගෙනවුත් පාලන නියාව දුටමැනවැයි කිහ.

ඉක්බිත්තෙන් සුදර්ශන නම් නාරජ්ජුරුවෝ සිතන්නෝ ඉදින් අපි තුන්දෙනම එක් දිගකට ගියමෝ නම් ප්‍රජක්ඛ වන්නේය. එසේ හෙයින් තුන්දෙන තුන්අතකට යන්නට වටනේය. එක්කෙනකුන් දිව්‍ය ලොකයටත් එක්කෙනකුන් හිමාලය වනයටත් එක්කෙනකුන් මනුෂ්‍ය ලොකයටත් යාසුතුය. ඉදින් කාණාරිඤ්ඣයෝ මනුෂ්‍යලොකයට ගියෝනම් යම් තැනකදී භූරිදත්ත නම් නාරජ්ජුරුවන් දුටුහුනම් ඒ ගමත් නියම්ගමත් දවා අඤ්ඣමිටක්කොට එති. කණ්හයෝය, වණ්හඑරුඤයෝය, එසේහෙයින් උන් මනුෂ්‍යලොකයට යවන්නට නොපිළිවන් වන්නේයයි සිතා මල අරිඤ්ඣයෙනි! නෙපි දිව්‍යලොකයට යව, ඉදින් දෙවතාවන් විසින් බණ අසනු කැමැතිව භූරිදත්ත නම් නාරජ්ජුරුවෝ දිව්‍යලොකයට කැඳවාගෙන යනලද්දේ වීනම් ඒ දිව්‍යලොකයෙන් උන්කැඳවාගෙන එවයි අරිඤ්ඣයන් දිව්‍යලොකයට යැවූහ. සුභගයන්ට කියන්නෝ මල සුභගයෙනි! නෙපි හිමාලයවනයටගොස් පඤ්චමහා ගංගායෙහි භූරිදත්ත නම් නාරජ්ජුරුවන් පරීක්ෂාකොට එවයි හිමාලයවනයට සුභගයන්යැවූහ. තුමූවනාහි මනුෂ්‍යලොකයට යනු කැමැතිව සිතන්නෝ ඉදින් මම මානවක වෙශයකින් ගියෙම්වීමනම් මනුෂ්‍යයෝ මාදැක ඇකිළෙති. මාවිසින් තාපස වෙශයකින් යන්නට වටනේය. මනුෂ්‍යයන්ට වූකලී ප්‍රව්‍රජිතයෝ ප්‍රියවන්නාහ. සිත්කැලුවන්නාහයි සිතා ඒ සුදර්ශන නම් නාරජ්ජුරුවෝ තාපස වෙශයක් මවාගෙන මැනියන් වැඳ නික්මුණාහ, මහ බෝසතාණන්ට දූසැලි අවිමුඛි නම් වෙනමවුන් නැහණිකෙනෙක් ඇත. ඒ නැහණියන්ට බොධිසඩයන් කෙරෙහි බලවත්වූ සෙනහය වන්නේය. එසෙනෙයින් ඒ වෙනමදුන් දරුවූ නැහණියෝ සුදර්ශන නාරජ්ජුරුවන් දැක

කියන්නෝ බැඟින්වහන්ස! ශොකයෙන් බොහෝසේ මිරිහෙමි. මවත් භූඹ වහන්සේ හා යෙමිසිකිවුය, මැනියෙනි! මාහා සමඟ යන්නටනොදිළිවන, මම ප්‍රවුජාවෙශයකින් යෙමි කිවුය. එසේවීනම් මම කුඩා මැඬිපැටියකෙමින් නුඹ වහන්සේගේ දළමඹුල්ල අස්සේ වැදගෙව යෙමි කිවුය. එසේවීනම් එවිසි කිහල්ගි නාගමාතවිකා තොමෝ මැඬිපැටියක වෙස්මිවාගෙන තපස්වීන්ගේ ජටාව අස්සේ වැදගොත්තේය, සුදශීන නම් තාරජ්ජුරුවෝ මූලපටන් විවාරා බලා පරීක්ෂාකොටගෙන යෙමි සිතා බොධිසත්වයන්ගේ ඕසෝවරුන් අතින් බොධිසත්වයන් පෙගෙවීය් රක්ෂාකළ තැන් විවාරා පළමුවෙනා ගොස් ආලම්බනයා විසින් බොධිසත්වයන් අල්වාගත් තැන ලේ හා වැලිත් පෙලාව කළ තැනුත් දැක භූරිදත්ත නම් තාරජ්ජුරුවන් අභිභුණ්ඩික බ්‍රාහ්මණයකු විසින් අල්වාගන්නාලද්දේවනැයි දැන උපන්නාවූ බලවත්වූ ශොකඇතිව. කඳුළු පිරුණාවූ දැසින් යුකතාව ආලම්බනයා ගියාවූ මාර්ගයෙන්ම පළමුවෙනාට කෙළවූ ගමට ගොස් මනුෂ්‍යයන් අතින් විවාරන්නෝ මේබදුවූ තාරජ්ජුරු කෙනකුන් ගෙනවුත් කිසිවෙක් මේ ගමදී කෙළවූදැයි විවාළහ. අභිභුණ්ඩික බ්‍රාහ්මණයකු විසින් මිට මසකින් මත්තේ මෙගමදී කෙළවනලදැයි කිකල්ගි කිසිවක් ඔහු විසින් ලබන ලදදැයි විවාලෝය. එසේය මෙගමින් ඉක්ෂයක් වස්තු ලබනලදැයි කිහ. දැන් කොසිගියෝදැයි විවාළ කල්හි අසවල් ගමට ගියෝයයි කිහ.

ඒ සුදශීන නම් තාරජ්ජුරුවෝ එතැන්පටන් විවාරමින් ක්‍රමයෙන් යන තැනැත්තෝ රජ්ජුරුවන්ගේ මාලිගාදොරට ගියාහුය. එහෙණෙහි ආලම්බනයාත් ඉස්සෝධා නහා සකලශරීරයෙහි සුවඳවිලවුන් ගල්වා පට ඝඩක් ඇඳ රන්පෙලාව ගෙන්වාගෙන මාලිගාදොරටම ගියේය. එකල්හි මහ ජනයෝ රැස්වූහ. රජ්ජුරුවන්ට ඉදිනා අසුන් පනවනලද, රජ්ජුරුවෝ මාලිගාඇතුළේම සිට කියන්නෝ මම දැන් එමි. තාරජ්ජුරුවන් අභිභුණ්ඩික බ්‍රාහ්මණයාට කෙළවන්නට කියවයි කියාගැවූහ. එකල්හි ආලම්බයා විසිතුරු ඇතිරියක්මත්තේ රන්පෙලාව තබා හැර මෙහි එව තාරජ්ජුරුවෙනියි කිය, එහෙණෙහි සුදශීන නම් තාරජ්ජුරුවෝ පිරිස් සෙළවර සිටියහ, මහබෝසතාණෝ පෙලායෙන් ඉසමැත්කොට ඒසියලු පෂිත්බැලූය. නාගයෝ තවත් නට පටන්ගන්නා අවස්ථායෙහි කාරණා දෙකකින් පෂිත් බලන්නාහු ගරුඩයන්ගේ උපද්‍රවයක්වත් නැයින්වත් දක්නා පිණිස බලන්නාහ, නැයන් දැන ලජ්ජායෙන් නොනටන්නාහ, මහබෝසතාණෝ වූකලී පෙලායෙන් ඉස මැත්කොට ඒ සියලු පෂිත්බැලූය. පෂිත්අතරෙහි සිටියාවූ බැයන්දැක දැස කඳුළු පුරාගෙන පෙලායෙන් නික්ම බැයන් සමීපයටගියාහ, මහජනයෝ තාරජ්ජුරුවන් එන්නාදැක භයින්ත්‍රස්ථව ඉවත්වගියහ. උදකලාව සුදශීනනම් තාරජ්ජුරුවෝ සිටියාහ. මහබෝසතාණෝ ගොස් ඒ තපස්වී තාරජ්ජුරුවන්ගේ පතුල්වට හිසතබා ඇඬුහ. සුදශීන නම් තපස්වී තාරජ්ජුරුවෝත් ඇඬුය. මහ බෝසතාණෝ අඩා වැලප පෙරළාගොස් පෙලාවටවන්හ. ආලම්බනයා මේ තාරජ්ජුරුවන්විසින් තාපසයෝ දඬුකොළෝවන, එසේගෙයින් උන්අස්වසා ලම්විඝිතා සමීපයට ගොස් කියන්නේ තපස්වීනි! මාඅතින මිදුණාවූ මේ තාරජ්ජුරුවෝ ගොස් තොපගේ දෙපත්ලේ වැටිළන්නාහ. කිමෙක්ද? තොප දඬුතොකොළෝද? ඉදින් තොප දඬුකොටපූතම් එකානතයෙන් විඝබෑම මවහාරවන්නේය, තොපි සැකයක් නොකරව, සැපසේ නොබාසිටුවයි කිවුය.

එබස් අසා සුදශීන නම් තපස්වී ආලම්බනයා සමඟ කථාකරනු කැමැතිව කියන්නේ ආලම්බනය! තෑගේ මේ නාරජ්ජුරුවෝ මට කිසි දූසක් කරන්නට අසමර්ථයහ. උඹතුමූ අද මා දෙවොතොට නොගෙනි ලොකයෙහි සජීවීන් අල්වා කෙළවා සා ඇවිදිනාවූ යම් පමණ අහිතුණ්ඩිකා බ්‍රාහ්මණයෙකුනෙක් ඇත්නෝ වීනම් ඒ යියල්ලෝම මට වැඩියනොවෙති. මම උන් ඇමටම වැඩිමි, මට වඩා නුවූ අහිතුණ්ඩිකායෙක් මේ දඹදිවුතෙලෙහි නැතැයිකිහ. එකල්හි ආලම්බනයා මූතුමූ අසවල්නොනසයි නොදැන කිපි කියන්නේ තපස්වී වෙශයෙන් අවුත් පණිත් මධ්‍යයෙහි සිට තමා හා හරිසමානකොට වාසි කියන්නාවූ මේතෙමේ නොයිසිට ආවෙකෝද? නුවණැතිවියරුහුණු එකෙක්ද? මෙතැනට රැස්වූ සියලු පණිත් මාකිවා අසත්වා, මාගේ දෙඟයෙක් නැත. මට නොකිපෙව මම මේ නාරජ්ජුරුවන්ලවා මොහුදෙවොකරවම්සිකිය, එකල්හි සුදශීනනම් නාරජ්ජුරිවෝ ඕනට කියන්නාහු ආලම්බනය! තෝ මා නාරජ්ජුරුවන් ලවා දෙවොකරවූයෙහිවිනම් මම මාගේ මැඬිපැවිවාලවා නාදෙවොකරවම්,මෙතැනටරැස්වූ පණිත් හැමදෙනාම මා කිවා අසත්වා, අප දෙදෙනාගේ මේ යුඬයෙන් පන්දහසක් වසතු ඔට්ටුනිඹියසුතුය. පැරදිකෙනෙකුන් දිනාගියකෙනෙකුන්ට පන්දහසක් වසතු දියයුතුයි කිහ. එබස් අසා ආලම්බනයා කියන්නේ හාසසයෙනි! මම්වූසාලී ප්‍රසිඬව ප්‍රභූව සිටිමි. තෝ වූසාලී ඉතා දිලිදුව සිටියෙහිය, එසේවූ තට ඇපවන්නෝ කවුරුද? ඔට්ටුහැබූ මිල දෙන්නෝ කවුරුද? ඇප හෝ ඔට්ටු නොසින් සොයව්ද? මා නිඹියයුතුවූ පරදුවත් එබඳු ඇපයෙක්වත් ඇත්නම් වහාතබමි. පන්දහසකින් මට ඔට්ටුව නිඹියයුත්තේයයි කිහ. සුදශීනයෝ ඔහුගේ බස් අසා අප දෙදෙනා විසින් පන්දහසක්වසතු පරදුකොට නිඹියයුතුයයි කියා නිර්භීතව රජ්ජුරුවන්ගේ මාලිගාවටනැඟී මයිලණුවන් සාගර බ්‍රහ්මදත්තනම් රජු සවම්පයෙහි සිට කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේට වැඩෙක්වේවා මා කිවා අසත්වා කීර්තියෙන් යුක්තවූ මහරජ්ජුරුවන්වහන්ස! පන්දහසක් වසතුවට මට ඇපවුවමැනවැයි කිහ. එබස් ඇසූ සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සිතන්නෝ මේ තාපසයෝ බොහෝ සම්පත් මා අතින් ඉල්වති, මිට කාරණා කිමෙක්දෝහෝයි සිතා නියන්නෝ තපස්වීනි! කිමෙක්ද? හොපගෙන් මා ඇරගෙන කැණයෙක් ඇද්ද? අපගේ දෙපක්ෂයෙහි ඇත්තන් ගත් දුන් ණයක් නැතිව නිඹියදී කුමක් නිසා නෙවී මෙසේ බොහෝවසතු මාඅතින් ඉල්වවිදැයිකිහ. මෙසේ කිකල්හි සුදශීන නම් නාරජ්ජුරුවෝ මේ ආලම්බනයා නාරජ්ජුරුවන් ඇරගෙන මා දෙවොකරවා ජයගනිම් කියයි, මම මාගේ මැඬිපැටවා ගෙනු බ්‍රාහ්මණයා දෙවොකරවා ජයගනිම්යි රජ්ජුරුවන්ට කියන්නෝ අභිවෘඬිකරවූ මහරජ්ජුරුවන් වහන්ස! දැන් නුඹවහන්සේ ක්ෂත්‍රියසමූහය, පිරිවරා ඒ අප දෙදෙනාගේ යුඬය දක්නා පිණිස රාජාඩහණයට වැඩවදුළ මැනව, අපදෙදෙනාගේ යුඬයෙහි ඉදින් අහිතුණ්ඩිකබ්‍රාහ්මණයා පැරදගියේවීනම් මට පන්දහසක් වසතු දෙන්නේය ඉදින් මම පැරද යේවිමිනම් මම ඔහට පන්දහසක් දෙමි, එසේ නෙයින් නුඹවහන්සේගේ අතින් ඔට්ටු තබන්නට බොහෝ වසතු ඉල්වමි, නුඹවහන්සේ නොලැස්ව වහාදුනමැනව, අපදෙදෙනාගේ යුඬය දක්නා පිණිස වැඩියමැනවයි කිවුය. රජ්ජුරුවෝ එබස් අසා එසේවීනම් යම්හයිකියා තාපසයන් හා සමඟ නික්මුණාහ. ඒ රජ්ජුරුවන්දැක ආලම්බනයා සිතන්නේ මේ තාපසයෝ ගිය ඇසිල්ලෙහිම රජ්ජුරුවන් කැඳවාගෙන අවුය. එසේහෙයින් මුන් රාජකුලූපග කෙනකුන් වියයුතුයයි හඟපත්ව ඒ තපස්වීන්ට අනුවනී

නය කොට කියන්නේ තාපසයෙනි! මාගේ ශිල්පවිද්‍යයෙන් නෙපි ඉක්ම නොපවනිසි විෂවිද්‍යයෙන් නෙපි මහත්ව සිටියව, නොප හා සමාන කෙනෙක් නැත, එසේවුවත් මාගේ මහානුභාවසම්පන්නවූ මේ නා රජ්ජුරුවන් කිසි චක්ඛොටත් නොයිතව, උන් දියබරණකු කොටත් නොසිතා නිරාදරව පවත්නාහෙයින් එපමණකට නොපට කාරණා කියමිකිය.

ඉක්බිත්තෙන් සුදශීනයෝ කියන්නෝ අහිතුණ්ඩිකබ්‍රාහ්මණය! ඔබත් විෂවිද්‍යයෙන් නා මැඩ නොපවත්වම්, එහකුදුවුවත් මේ විෂනැත්තාවූ නාර ජුරුවන් ඇරගෙන ලොකවාසි සත්වයන් අනිසයින්වැඩුවාකොට ඇවිදිනෙ නිය. මේ නාරජුරුවන් විෂනැතිකියාව මාදන්නාසේ මේලෝවැස්සෝදනින් නම් නොපට අක්සුණුපමණකුත් නොලැබෙන්නේය,බවුණ! නුවවුන් කෙළවී මෙන් වසතු නොසින් ලැබේද? වස්තුවෙන යන දෙයක් කාලම නොලබන් නෙහිවේදැයි කිවුය, එකල්හි ඒ තාපස්වීන්ට අහිතුණ්ඩිකබ්‍රාහ්මණයා කිපි කියන්ඹන් නියසනිතවූ සකීඝවූ අදුන් දිවිසම් අඳනාවූ ජටාධරවූ කිසිසැරකි මක් නැත්තාවූ අඹුවූ හෝමේ පණිත්මඩ්‍යයට අවුත් මෙසේ උග්‍රවූවිෂතෙජස් ඇත්තාවූ මාගේ මේ නාරජුරුවන් විෂනැත්තේයයි නින්දුකොට කියන් නෙහිය. එසේවිනම් දැන් නෙපි උග්‍රවූ විෂතෙජසින් සම්පූණිවූ මේ නාරජුරුවන් සවමීපයටගොස් උන් විෂ අැති නැති නියාව පරීක්ෂාකොට බලව. ඉදින් හෝ ඒ නාරජුරුවන් සවමීපයට නිර්භිතව ගියෙහි නම් ඇසිල්ලකින් ඒ නාරජුරුවෝ නා අඳමිටක්මෙන් නාරහිසි සිතමි කිය.

ඉක්බිත්තෙන් ඒ අහිතුණ්ඩිකබ්‍රාහ්මණයා හා සමඟ කෙළනාවූ සුදශීන නම් තපස්වී මෙසේ කිහ. අහිතුණ්ඩිකය! ඉදින් ගැරැඬියකු දිය බරණකු පණුවුල්ලකු පමණවත් විෂනැති රත්වූ හිස් ඇති මේ නාගරාජයාගේ විෂයෙක් කිසිත් නැත්තේයයි කිහ. එකල්හි ආලම්බනයා සුදශීනයන්ට කියන්නේ තපස්වීනි! මේ ලොකයෙහි දුශකයෝ දන්දී සවගීලොකයට යන්නාහුයයි කියා නිකෙලසිවූ කායවාක් සංයමය ඇත්තාවූ තපස්විවරයන් ගෙන් මා විසින් අසනලදමය. එසේහෙයින් තොප විසින් ශ්‍රමණ බ්‍රාහ්මණ යන් විෂයෙහි දියයුතු කිසිවක් ඇත්නම් ඒ සියල්ල ජීවත්ව ඉන්දදීම දීපියව, මළකල දන්දෙන්නට නොපිළිවන් වේද, මේ නාගරාජයා මහත්වූ සාඛ්‍යානුභාව ඇත්තේය. තෙජස්විය, ලාමකවූ සත්වකෙනකුන් විසින් මැඩ පැවැත් විය නොහැක්කේය. එසේහෙයින් ඔහු ලවා නා දඝකරවම්, ඒ තෙමේ නා විෂතෙජසින් භඤ්ඤකරන්නේයයි කිය. එබස් ඇසූ සුදශීනයෝ කියන්නෝ මේ ලොකයෙහි දුශකයෝ දන්දී සවගීලොකයට යන්නාහයි කියා නිකෙලසිවූ කායවාක් සංයමය ඇත්තාවූ තපස්විවරයන් ගෙන් මා විසිනුත් පළවූ අසනලදමය, එසේ හෙයින් ඉදින් තාගේ දියයුතු වස්තුවෙක් ඇත්නම් ජීවත්ව හින්දදීම දීපියව, මළකළ තට දන්දෙන්නට නොපිළිවන් වේද, මේ අඞ්විමුඛී නම් මැඩි පැටි තොමෝ උග්‍රවූ විෂ තෙජසින් සම්පූණිය, ඇය ලවා නා දඝකරවම්. ඔතොමෝ නා දඝකොට භඤ්ඤකරන්නිය. තවද ඒ අවිමුඛී තොමෝ ධෘතරාෂ්ට්‍ර නම් නාරජුරුවන් වහන්සේගේ දූවූ වෙතමවුන් දරුවූ මාගේ නැඟණියෝය. උග්‍රවූ විෂ තෙජසින් යුකතයෝය, උන්ගේ විෂයෙහි උග්‍රබව ඇසිල්ලකින් දක්නෙහිවේදැයි කිහ. මෙසේද කියා මැනියෙනි! මාගේ ජටා අතරෙන් නික්ම අත්ලෙහි පිහිටාවයි මහජනයා මඩ්‍යයෙහිදීම නැඟණියන්

කැඳවා අත දිගුකොට ලූය. එකෙණෙහි අවිවිමුඛි නම් මැඩි පැරී ඒ තපස්වීන් බැණවූ අඩ අසා දළමිඹුලු අස්සෙහි වැදහොත් තැනැත්ති තුන්විටෙක මැඩි හඬ හඬා නික්ම දසරුවෙහි හිඳ පැනගොස් අත්ලේහිඳ විෂඛින්දුතුනක් තපස්වීන්ගේ අත්ලෙහි යෙළා නැවත ඒ තපස්වීන්ගේ දළමිඹුලු අස්සටම වන, එකල්හි සුදශීනයෝ විෂය අත්ලෙන් ගෙන ගිව මේ ජනපදය විනෙෂ යෙන්ම නස්නේයයි තුන්විටක් කිහ. උන්ගේ ශබ්දය දෙලොස් යොදුන් පමණ ඇති බරණැස් නුවර ඇසා සිටියේය. එකල්හි රජ්ජුරුවෝ කුමක්නිසා ජනපදය නසිදැයි විචාළෝය, සුදශීනයෝ කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! මේ විෂය ඉසපියන තැනක් නොදක්මි කිවූය, දරුව! පොළොව මහත මේ පොළොවහි ඉසපියවයි කිකල්හි නොපිළිවන මහජ්ජුරුවන් වහන්සැයි කියා රජ්ජුරුවන්ගේ බස් වලකා කියන්නාවූ සුදශීනයෝ බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන් වහන්ස! මා කියන්නක් අසාදන මැනව, ඉදින් මම මේ විෂය කිමට දැමීමිනම් කිම හටගත්නාවූ තෘණලතා හා ඖෂධවෘක්ෂයෝ සෑහෙයක් නැතිව එකාහතයෙන් වියලි යන්නාහ. එසේහෙයින් පොළොවට දමන්නට නොපිළිවනැයි කිවූය. එබස්අසා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කියන්නෝ එසේවිනම් දරුව! උඩ ආකාශයට දමවයි කිහ. එබස්අසා සුදශීනයෝ ආකාශයටත් දමන්නට නොපිළිවනැයි දක්වා කියන්නාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස! මා කියන්නක් අසා වදාළ මැනව, ඉදින් මම මේ විෂය ආකාශයට දැමීමිනම් සත්ඟවුරුදින් මුළුල්ලෙහි වැසි නොවස්නේය, ඝටත්පිරිසෙයින් හිමඛින්දුවක් විවරත් ගිම නොවැටෙන්නේයයි කිවූය, එසේවීනම් මේ විෂය දියෙහි ඉසපියවයි කිකල්හි දියෙහි ඉසපියන්නටත් නොපිළිවනැයි දක්වන්නාවූ සුදශීනයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් වහන්ස! මා කියන්නක් ඇසුව මැනව, ඉදින් මේ ඛිෂඛින්දුතුන දියේ ඉසපුයෙම්වීමිනම් දියෙහි හටගත්තාවූ මිස්කැස්බන් ආදිවූ යම් පමණ ප්‍රාණිකෙනෙක් ඇත්නම් ඒ සියල්ලෝම නසින්නාහුය. එසේහෙයින් දියටත් දමන්නට නොපිළිවනැයි කිහ. එකල්හි රජ්ජුරුවෝ සුදශීනයන්ට කියන්නෝ දරුව! අපි කිසිවක් නොදනුම්හ. අපගේ රට යම්සේ නොනසිනම් ඒ නොනැසීමට සුදුසු උපාය හෙපිම දනුවයි කිහ. එබස්අසා සුදශීනයෝ කියන්නෝ මහරජ්ජුරුවන් වහන්ස! මේ සප්තැනෙහි පිළිවෙළින් වළවල්තුනක් කැණවුව මැනවැයි කිහ, රජ්ජුරුවෝත් එපරිද්දෙන්මි කැණවූය, සුදශීනයෝ මධ්‍යයේ වළ අනෙකප්‍රකාරවූ හෙෂජ්‍යයෙන් පිරවූය. දෙවැනිවළ ගොමයෙන් පිරවූය, තුන්වැනිවළ ඖෂධියෙන් පිරවූය, ඉක්බිත්තෙන් සුදශීනයෝ විෂඛින්දු මධ්‍යයේ වළලූහ. එකෙණෙහිම දුම්නැගී ගිනිදැල් උඩ නැංගේය. ඒ වහ්නිජ්වාලාව ගොස් ගොමපිරුවළ වැදගත්තේය. වළ්‍රි උත්වහ්නිජ්වාලානැගී අන්‍යවූ දිව්‍යවූඖෂධ පිරුවළ වැද ඖෂධ නිමවා නිවිගියේය, ආලඹනයා ඒ වළට නුදුරුවූ තැන සිටියේය. එකල්හි ඔහුගේ ඇගේ විෂ ඌෂ්ණය වැදගෙන සකලශරීරයෙහි ජවිය ඉපිළගෙන ගියේය. එකල්හි ඒ තෙමේ සෙවතකුෂ්ඨ ඇති එකක්ෂුමෙන්වී මරණභයින් භයපත්ව නාරජ්ජුරුවන් හරිමිකියා තුන්වෙක් හඬගැසිය, ඒ හඬ අසා මහබෝසතාණෝ රත්නපෙලායෙන් නික්ම සම්භරණයෙන් සැරහුණාවූ දිව්‍යාත්මභාවය මවාගෙන ශක්‍රදෙවෙන්ද්‍රවිලාසයෙන් සිටියහ, සුදශීනයෝත් අවවිමුඛිත් එතැනම සිටියහ.

ඉක්බිත්තෙන් සුදර්ශනයෝ රජ්ජුරුවන්ට කියන්නාහු මහරජ්ජුරුවන් වහන්ස! අප අදුනන සේක්ද? අපි කාගේ දරුවෝ දැයි විචාළෝය. නොදනිමියි කිකල්හි අපවූකලී නුඹවහන්සේ නාදුනනසේක්ද? කහි රජ්ජුරුවන්ගේ දුවූ සමුද්දජාවන් වහන්සේ ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන්ට දුන් නියාව දන්නාසේක්දැයි විචාළෝය, එසේය දනිමි, උඹ මාගේ බාලනැගණියෝවේදැයි කිවුය, එබස්අසා සුදර්ශනයෝ අපි ඒ සමුද්දජාවන් වහන්සේගේ දරුවෝය, නුඹවහන්සේ අපගේ මසිලණුවන් වහන්සේයයි කිවුය, එකල්හි රජ්ජුරුවෝ එබස් අසා ඔවුන් තුන්දෙනා වැළඳගෙන ඉසිසිඹ සනසා අඹා වැලප ප්‍රාසාදයෙහි මහමහල් තලයට ගෙනගොස් මහත්වූ සත්කාරකොට භූරිදත්ත නම් නාරජ්ජුරුවන් හා සමඟ සිළිසඳර කථාකොට විචාරන්නාහු. දරුව! තොප මෙබඳුවූ උගුවූ ඍර්ධිතේජස් ඇති තැනැත්තේ ආලම්බනයා කෙසේ අල්වාගත්තේදැයි විචාළෝය, මහබෝසතාණෝ ඒ සියලු ප්‍රවෘත්තිය විස්තර්හෙයින් කියා මහරජ්ජුරුවන් වහන්ස! රජදරුවන් වහන්සේ නම් මේ ක්‍රමයෙන් රාජ්‍යයකරන්නට වටනේයයි මසිල් රජ්ජුරුවන්ට ධර්මදේශනා කළහ. එකල්හි මසිලණුවන්ට සුදර්ශනයෝ කියන්නෝ මසිලණුවන්වහන්ස! මාගේ මැණියන් වහන්සේ භූරිදත්තනම් නාරජ්ජුරුවන් නොදැක ශොකදුක් ඉවසා පිඬිතව වසනසේක. එසේහෙයින් අපි බැහැර කල්යවන්නට නොපිළිවනැයි කිහ, එබස් අසා සාගරබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කියන්නාහු යහපත දරුවෙනි! හොපි නැඹ යව, මම්වූකලී මාගේ නැනණියන් දක්නා කැමැත්තෙමි, කෙසේ උන් දකිම්දැයි විචාළෝය, මසිලණුවන් වහන්ස! අපගේ මුත්තණුවන්වූ කඟිරජ්ජුරුවන් වහන්සේ කොසිදැයි සුදර්ශනයෝ කිකල්හි දරුව! මාගේ නැඟණියන් ඇර විසිය නොහි මපියාණන් වහන්සේ රාජ්‍යභාර පැවිදිව අසවල් වනලැහැබ වසනසේකැයි කිවුය, එබස්අසා සුදර්ශනයෝ කියන්නෝ මසිලණුවන්වහන්ස! මාගේ මැනියන්වහන්සේ නුඹවහන්වස්ත් මුත්තණුවන්වහන්සේත්දක්නාකැමැතිසේක,නුඹවහන්සේඅසවල්දවස්මාගේ මුත්තණුවන් වහන්සේ සමීපයට වැඩිය මැනව, අපි හැම මැනියන් වහන්සේ හා කැටිව මුත්තණුවන් වහන්සේගේ පන්සලට එම්හ, එතැන්හිදී නුඹ වහන්සේ අපගේ මැනියන් වහන්සේ දක්නාසේක් වේදැයි මසිලණුවන්ට දවස් නියමකොට මාලිගාවෙන් බටහ, රජ්ජුරුවෝ බැණන්යවා හඬාවැලප වැලැක්කාහුය, ඔහු තුන්දෙනාත් පොළොව කිම්ද නාගභවනයට යියහ, මහබෝසතාණන් නාගභවනයට පැමිණිකල්හි සියලු නාගභවනය මහහඬින් එකකොලාහල විය, ඒ මහබෝසතාණෝ මසක් මුළුල්ලෙහි පෙලාවේ වැද හෙව බොහෝ පිඬිතවූ බැවින් ගිලන්ව වැදහොත්තාහුය. මහබෝසතාණන් සමීපයට විචාරන්නට යනඑන්නාවූ නසින්ගේ පමණක් නැත. මහබෝසතාණෝ ඒ නසින් හා සමඟ කථාකරන්නාහු ආයාසයට පැමිණෙති. භාණාරිවිඨයෝ දිව්‍යලොකයට ගොස් මහබෝසතාණන් නොදැක පළමුව නාගභවනයට අවුය, එකල්හි මේ තෙමේ චණ්ඩය, එරැවය, නාගපමිද වල කාලන්නට සමර්ථයයි මහබෝසතාණන් සැතපුණුතැන දෙරසඛ [illegible]නවල සිටවූහ. සුහගයෝත් සියලු හිමාලයවනය පරීක්ෂාකොට ඉක්බිත්තෙන් මහා සමුද්දයත් අවශේෂ ගංගාවනුත් පරීක්ෂාකොට යමුනා කම් ගංගාව පරීක්ෂාකරමින් එමින් සිටියාහ, එකල්හි නෙසාද බ්‍රාහ්මණයාත් ආලම්බනයා කුණරොහීවූවහු දැක සිතන්නේ ආලම්බනයා භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ට පීඩාකොට ශ්වේතකුණ්ඩයෙන් විරූපිවිය, මම් වූකලි මට බොහෝ උපකාර

කළාවූ ඒ භූරිදත්තනම් නාරජ්ජුරුවන් මාණික්‍යයෙහි ලොභයෙන් අභිභූත වූයේ බ්‍රාහ්මණයාට දුන්නේමි. ඒ අකුසලකර්මය මා කරා එන්නේය, යම්හාක් ඒ පාපය මා කරා නොඑන්නම් ඊට පළමුකොට මම යමුනා නම් ගංගාවට ගොස් පයාගතිත්ථයෙහි පාපප්‍රවාහය කෙරෙමියි සිතා ඒ යමුනාවට ගොස් මාවිසින් භූරිදත්ත නම් නාරජ්ජුරුවන් විෂයෙහි මිත්‍රද්‍රොහකම් කරනලද, ඒ අකුසල කර්මය සෝධා ශුද්ධකොට දියෙහි යවාපියමියි කියා යමුනා නම් ගංගාවේ පයාගතිත්ථයෙහි ගැලිගැලි ඉල්පෙමින් සිටියේය. එසමයෙහි සුභගයෝ එහැනට පැමිණි තැනැත්තෝ ඔහුගේ ඒ වචනය අසා මේ පාපකාරිවූ පුරුෂයා ඒසා මඟත්වූ යශ පිරිවර දුන්නාවූ මාගේ බෑයන් වහන්සේ මැණික්කක් නිසා ආලම්බනයාට දන්වනලද, එසේහෙයින් ඔහුගේ දිවිනොදෙමියි තනුරින් ඔහුගේ දෙපය වෙළා ඇදගෙන දියයට ගිල්වා ආශ්වාස ප්‍රශ්වාසය නැති කොට මදක් ලිහිල්කොළෝය. ඒ තෙමේ එකල්හි ඉස එසවිය. නැවතත් ඔහු ඇද දියෙහි ගැලුවේය, මෙසේ නොයෙක්වර ඒ සුභගයන්විසින් දියෙහි ගිල්වා පීඩාවට පමුණුවනලද්දාවූ වැදිබමුණු ඉසඔසවාකියන්නේ ප්‍රාප්ත්‍රිවාහය තිරිමෙහි සමර්ථයසි ලෝවැස්සන් විසින් දන්නාලද පයාගතිත්ථයෙහි සිටියාවූ මෙබදුවූ ජලසනානය කරන්නාවූ මේ යමුනා නම් ගංගාවේ දියයටවැද කවර සත්ත්වයෙක් මා අනුභවකරන්නට අල්වාගත්දැයි බැගෑපත්ව කිය, එකල්හි ඕහට සුභගයෝ කියන්නාහු නෙසාදබ්‍රාහ්මණය! ලොකාධිපතිවූ මහත්වූ යශපිරිවර ඇති යම් මේ ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුසෙනකුන් වහන්සේ බරණැස්නුවර හාත්පසින් වෙළා මුදුනෙහි පෙණගර්භයෙන් වසා සියලු සත්ත්වයන්ට භය ඉපදවූසේක්ද, මම ඒ නාගාධිපතිවූ ධ්‍රතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවන්වහන්සේගේ පුත්‍රයෙමි. බමුණ! මා සුභගනම් නාරජ්ජුරුවෝයසි ලොකාවාසි සත්ත්වයෝ දනිනිකින, එකල්හි වැදිබමුණා සිතන්නේ මූතුමූ භූරිදත්ත නම් නාරජ්ජුරුවන්ගේ බෑයෝය, එසේහෙයින් මාගේ දිවිනොනබන්නේය. මම මූන්ගේත් දෙමවුපියන්ගේත් ගුණකිමෙන් සිත මොලොක්කොට මූන්ගෙන් මාගේ ජීවිතය ඉල්වාගත්තෙම් වීමිනම් යහපත්වන්නේයයි සිතා මෙසේ කිය, සුභගයෙනි! ඉදින් තෙපි දීඝායුෂ්ක බැවින් අමරනම්වූ නාගයන්ට අධිපතිවූ කාශිරජ්ජුරුවන් වහන්සේගේ දියණියන්ගේ පුත්‍රවූනම් තොපගේපියවූ ධ්‍රතරාෂ්ට්‍රනම් නාරජ්ජුරුවෝ මහෘද්ධිකයාවූ දිව්‍යනාගරාජයන් අතරෙන් එක්තරා කෙනෙක්වීනම් තොපගේ මැනියෝ මනුෂ්‍යලොකයෙහි කාශිකොසල දෙරටටඅධිපතිවූ කාශිරජ්ජුරුවන් වහන්සේගේ රූපාග්‍රප්‍රාප්තවූ දියණිකෙනෙක් වීනම් මේබදුවූවන්ගේ දරු මුණුබුරුව සිටියාවූ කෙනෙක් මුණන්ගේ දැසයකු දියෙහි ගලා මරන්නට සුදුසු නොවෙති, මහානුභාවසම්පන්නවූ බ්‍රාහ්මණයකු මරන්නට කැලම සුදුසු නොවෙති. එසේහෙයින් නොපවැනිවූ උත්තමයන්ට මා මැරීම කාරණා නොවෙයි කියා සුභගයන්ගේ වංශය උසස්කොරෙමින් වණිතාකොට තමහට ජීවිතදානය ඉල්වූයේය. එකල්හි ඕහට සුභගයෝ කොල දුෂ්ට බමුණ! තෝ මා වඤ්චාකොට මිදෙමියි නොසිතව, තාගේ දිවිනොදෙමියි කියා ඔහු විසින් කළාවූ ක්‍රියාව ප්‍රකාශකොට කියන්නාහු බ්‍රාහ්මණය! තෝ ගසකට බඳදීගෙන සිට පැන්බොන්නට යමුනා නම් ගංගාවට ආවාවූ එක්මුවකු විදපුයෙහිය, ඒ විදිනලද්දාවූ මුවා ශරවෙගයෙන් තැතිගන්වන්ලද්දේ දුරට දිවගෙනගොස් එක් තැනක හුණුගේය. එසේ හුණුවාවූ මුවා දැක ආරණ්‍ය සංඛ්‍යාතවූ මහවනයෙහිදී මස්කොට-ගන මස්කඳුන් ඇරගෙන සවස්වේලේහි ගිරවුන් සහ සැළලිහිණියන්

විසින් රැවු පිළිරැවූ දෙනලද්දුවූ මිහිරිවූ කොවුල්හඬ ඇති ජලනිදීතවූ භූමි යෙහි හටගත් බැවින් නිරන්තරයෙන් නිලිගෙන සිටිනාවූ රනිදුගොවිවන් විසින් ගැවසීගත්තාවූ රම්‍යවූ හිතණුවනයෙන් යුක්තවූ භූමිප්‍රදෙශයක් ඇති පරිණතඵලයෙන් පිනුවන්වූ සියගණින් අරළු සමූහයෙන් ගැවසීගන්නා වූ නුගගසක් සමීපයට පැමිණියෙහිය. ඒ නුගගසවූල සිටියාවූ සෘද්ධියෙන් හා යශපරිවාරයෙන් දිලියෙන්නාවූ ආනුභාව ඇති නාගසාහස්‍රයාවින් විසින් විදිව රනලද මාගේ බැයන්වහන්සේ තව ප්‍රකාශව පෙනුණුසේක. එකල්හි උන් වහන්සේ තා දැක තමින්වහන්සේගේ ආනුභාවයෙන් නාගභවනයට කැඳවා ගෙනගොස් වසනුකාම කෙලසකාමයෙන් පිනවා බොහෝ දවසක් උපස්ථාන කළසේක. එසේ උපකාරව සිටියාවූ මාගේ බැයන්වහන්සේට හෝ නිස්කාරණයේ මිත්‍රද්‍රොහකම් කොළෙහිය. ඒ තාවිසින් කරතලද්දුවූ මිත්‍රද්‍රොහ සංඛ්‍යාතවූ පාපකර්මය දැන් මෙතැනට පැමිණ සිටියේය. එසේහෙයින් තාගේ දිවි නොගලවම්, වහාම කර දික්කොටලව, බැයන් වහන්සේට කළාවූ මිත්‍ර ද්‍රොහය සිහිකරන්නාවූ මම තාගේ හිස දැන් මෙතැනදීම කපාහළුමියි කිය. එකල්හි වැදිබමුණා සිතන්නේ මේ සුභගයෝ එකාන්තයෙන් මාගේ දිවි හබති, එසේහෙයින් යම්කිසි උපායක් කියා මුන් අතින් ගැලවෙන්නට සුදුසුවන්නේයයි සිතා කාරණයක් කියන්නේ සුභගයෙනි! මේ ලොකයෙහි බ්‍රාහ්මණයෝ නම් සෘග්වේදය, යජුර්වේදය, සාමවේදයයි කියනලද වේදත්‍රය හදාරා වෙදමන්ත්‍ර පිරවීමෙහි සමර්ථයහ, සියලු සත්ත්වයන් විසින් දෙනලද්දුවූ දානය පිළිගන්නට යොග්‍ය බැවින් දක්ෂිණාගියහ. නිරන්තරයෙන් තිල තණ්ඩුලමුද්ගාදියෙන් හා ඝෘත සම්පාදියෙන් ගිනිදෙවියාට පූජාකරන්නාහ. එසේ හෙයින් මේ හුන්කාරණයෙන් බ්‍රාහ්මණයෝ නොමැරිය යුත්තෝය. තොප විසින් බමුණන් මරන්නට නොපිළිවන් වන්නේය. තෙපි කුමක් කියව්ද? ඉදින් යමෙක් බමුණකු මැරුයේවීනම් ඒ තෙමේ නරකයෙහි ඉපිද මහදුක් අනුභව කරන්නේයයි කිය. එබස් අසා සුභගයෝ ශංඛයට පැමිණ මොහු නාගභවනයට ගෙනගොස් මල්බැයන්විචාරමෝහට භාර්‍යා දන්නෙම් වේදූයි සිතා නාගභවනය වර්ණනා කරත් මල්බැයන් වසන තැන් කියන්නාහු ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජ්ජුරුවන් වහන්සේගේ යම් පුරයෙක් යමුනා නම් ගංගාවෙන් ඔට පිහිටියේද, යමුනාවට නුදුරු තැන පිහිටියාවූ හිමාලය වනය පැහැර සර්වාකාරයෙන් සවර්ණමය සුදර්ශනලොකයක් මෙන් හැමකල්හිම බබළාද, ඒ නාගභවනයෙහි පුරුෂ ශ්‍රේෂ්ඨවූ මාගේ සහොදරවූ මල්බැයෝ වසන්නාහ. එහි වසන්නාවූ මල්බැයෝ මා විසින් හා එහැතට ගෙන්ගියකළ යමක් කිව්නම් බමුණ! තට එදවස් උන් කිවක් වන්නේවේද. ඉදින් තා සැබෑවක් කියෙහි වීනම් තාගේ දිවි ඇත, ඉදින් තා බොරු කියෙහි වීනම් එතැන්හිදීම තාගේ හිස කපම්. මෙසේ ඔහට කියා බොටුව අල්වා දමදමා ආක්‍රොෂ පරිභව බැණ හඝගන්වමින් මහඛේදතාණන් වසන්නාවූ මාලිගාදෙරට ගෙනගියහ.

එකල්හි දෙරටුපාලව හුන්නාවූ කාණාරිට්ඨයෝ මෙසේ ආක්‍රොෂපරිභව බැණ බොටුව අල්වා අදිමින් ගෙනෙන්නාවූ ඒ බ්‍රාහ්මණයා දැක පෙර මිහට ගොස් සුභගයෙනි! නොමරව, බමුණෝ නම් මහා බ්‍රහ්මයාගේ දරුවෝය, ඉදින් මහාබ්‍රහ්මයා දන්නේ වීනම් මාගේ දරුවන් මරන්නට කාරණා කවරේදූයි කිපී අපගේ සියලු නාගභවනය නසාපියන්නේය, ලොකයෙහි

බ්‍රාහ්මණයෝනම් ශ්‍රේෂ්ඨයහ. මහත්වූ ආනුභාව ඇත්තාහ. මම ඒ බමුණන්ගේ ආනුභාව මහත්භාවය දනිමි කිහ. (ඒ කාණාරිට්ඨයෝනම් අනතුරු භවයෙහි යාගභද්‍රාවූ බ්‍රාහ්මණයෙක, එසේහෙයින්) මෙසේ කියා පළමු අත්තභාවයෙහි තමා මිථ්‍යාදෘෂ්ටිව සිටුවූ යාගයෙහි එල්බ බමුණා උසස් කොට සිතා ඒ මිථ්‍යාප්‍රතිඥාව යාගකරන සුලුව සුභගයන් හා නාගපර්ෂදට ආවේණික කරණයෙකොට දෙසේ එව, යාගකරන බ්‍රාහ්මණයන්ගේ ගුණ හොප හැමට වර්ණනාකරමියි කියා යාගයෙහිගුණ වර්ණනාකරන්නට පටන්ගෙන මේසේ කිහ, සුභගයනි! මේ ලොකයෙහි යාගයන් වේදයන් ලාමක නොවන්නේය. මහානුභාවසම්පන්නවන්නේය. ඒ වේදයහා යාගයද අලාමකවූ බ්‍රාහ්මණයන් හා එක්වූ බැවින් බ්‍රාහ්මණයෝත් ලාමකනොවෙති. මහානුභාව සම්පන්නයෝමැය, එසේහෙයින් නින්ද නොකටයුතුවූ මහානුභාව සම්පන්නවූ බමුණන්ට නින්ද කරන්නාවූ සත්ත්වයෙමේ නම්ගේ සම්පත්තියත් සත්පුරුෂධර්මයත් ප්‍රාර්ථනාකටයුත්ත හැරපියන්නේය. එසේහෙයින් බමුණන්ට අගෞරවකිරීම් කායක්‍රියෙක් නොවෙයි කිහ, මේ කාරණය කියන කාණාරිට්ඨයෝ මොහු විසින් භූරිදත්තනම් කාරජ්ජුරුවන් විෂයෙහි මිත්‍රද්‍රොහකරන ලදුයි බමුණාට කිසිඛසක් නොකියනු කැමැතිව නාගපර්ෂත් හා සුභගයන් අස්වසා කිහ.

ඉක්බිත්තෙන් කාණාරිට්ඨයෝ නැවතත් සුභගයන්ට කාරණා කියන්නාහු සුභගයෙනි! මේලොකය කවුරුන් විසින් මවනලද්දේදැයි තෙපි දනු දැයි විචාරා නොදනිමි කිකළුහි බ්‍රාහ්මණයන්ගේ මුත්තණුවන්වූ මහාබ්‍රහ්ම යාවිසින් මේ ලොකය නිර්මිතනරනලදුයි කිහ. තවද මහාබ්‍රහ්මයා බමුණන් ආදිවූ චතුර්වර්ණයන්මවා ආයාචිවූ බ්‍රාහ්මණයන්ට කියන්නේ තෙපි හැම වෙද මන්ත්‍ර හදාරව, අන්කිසිවක් නොකරවයි සම්මත කෙළේය. රජදරුවන්ට නියන්නේ තෙපි හැම පොළොව ජයගෙන පෘථිවියට අනුශාසනාකරව, අන් කිසිවක් නොකරවයි කිය. වෙළඳුන්ට කියන්නේ තෙපි හැම කෘෂිවණිජ් ආදියමකරව, අන්කිසිවක් නොකරවයි කිය, ශූද්‍රයන්ට කියන්නේ තෙපි හැම ක්ෂත්‍රියාදිවූ හුන්පසෙයෙහි ඇත්තන්ට අත්පා මෙහෙවරකොට උපස්ථානකරව, අන්කිසිවක් නොකරවයි විධානකෙළේය. එතැන් පටන් වෙන වෙනම තමන් තමන්ගේ කුලප්‍රදෙශයට සුදුසු පරිදිදෙන් මහාබ්‍රහ්මයාවිසින් කියන්නලද ක්‍රමයෙන්ම උත්තමවූ බ්‍රාහ්මණයෝ වෙදමන්ත්‍රම හදාළහ, රජදරුවෝ පෘථිවියවරව ප්‍රජාපරිපාලනයෙහිකාට පොළොව ජයගත්හ. වෙළෙන්දෝ සී සැමෙන් හා වෙළඳාම් කිරීමෙන් ජීවත්වූහ. ශූද්‍රයෝ රජදරුවන් ආදිවූ හුන්පසෙයෙහි ඇත්තන්ට අත්පාමෙහෙවර කළහ. මෙසේ ඒ මහාබ්‍රහ්මයා විසින් ලොකනිර්මිතය කරන්නාවූ අවස්ථායෙහි චතුර්වර්ණයන් අතරෙන් බ්‍රාහ්මණයන් ශ්‍රේෂ්ඨකොට තබනලදුයි පූර්වාචාර්යවරයෝ කියති. එසේහෙයින් බමුණෝ නම් මහත් ගුණ ඇත්තාහ. යමෙක් මේ බමුණන් කෙරෙහි සිතපහදවා දන්දුන්නේවීනම් අන්තැනක ඕහට ප්‍රතිසන්ධිවශයෙන් බ්‍රහ්මලෝකයක් නැත්තේය. දිව්‍යලොකයටම යන්නේයයි කියා බ්‍රාහ්මණ දූතයෙහි විඥාපනය කියන්නෝ සුභගයෙනි! ධෘතරාෂ්ට්‍ර නම් දිව්‍යරජ්ජුරුවෝද, විරූඪක නම් දිව්‍යරාජ්ජුරුවෝද, කුවේර නම් දිව්‍යරජ්ජුරුවෝද, සෝම නම් දිව්‍යරජ්ජුරුවෝද, සුමන නම් දිව්‍ය රජ්ජුරුවෝද වඤ්ඣදිව්‍යපුත්‍රයෝද, සුයාමදිව්‍යපුත්‍රයෝද යන මේ සියලු දිව්‍යරජදරුවෝ අනෙකප්‍රකාරවූ යාගකොට නැවත වෙදමන්ත්‍රධරන්නාවූ බ්‍රාහ්මණයන්ට සියලු වස්තුකාම කෙලෙසකාමයන්ද පිනවා, මෙබඳුවූ දිව්‍යඓශ්වර්‍යයට පැමිණියහ. තවද

සුභගයෙනි! හයඞ්කාරවූ සෙනා ඇති ශක්තිසම්පන්නවූ **සහස්සබාහුඅර්ජුන** නම් රජ්ජුරුවෝ පන්සියයක් දනුවායන්ගේ අත් දහසකින් ඇදලිය යුතුවූ දුන පන්සියයක බල ඇති දුන්න ඇදීමෙන් සහශ්‍රබාහුඅර්ජුන රජ්ජුරුවෝයයි මෙනම්ප්‍රසිඩව පොළොතෙලෙහි අඟදෑහවූවික්‍රමයෙන්යුක්තවූවානු රාජයකි අනුභවකොළේද? එසේවූ බාහුවික්‍රම ඇති සහශ්‍රබාහුඅර්ජුන රජ්ජුරුවෝ පවා එසමයෙහි බමුණන් විස්තුකාමකෙලසකාමයෙන් පිනවා තිහිදෙවියාට පූජාකොට බ්‍රාහ්මණධනයෙන් හා වහ්නිපාරි භයයිනයෙන් දිව්‍යලොකයෙහි උපන්හ. එසේහෙයින් මේ ලොකයෙහි බ්‍රාහ්මණයෝනම් නියල්ලවුන්ටම ශ්‍රේෂ්ඨයෝයයි කිහ.

තවද ඒ කාණාරිට්ඨයෝ මත්තෙහිත් බ්‍රාහ්මණයන් වඤ්චනාකොට කියන්නාහු සුභගයෙනි! යම් පුරාතන බරණැස් රජ්ජුරුහොතෙක් තමන්ගේ ශක්තිවූ පරිද්දෙන් ආහාරපානවගියෙන් ප්‍රසන්නවූ සිත්ඇතිව බ්‍රාහ්මණයන් අනුභවකරවූද, ඒ බරණැස් රජ්ජුරුවෝ බ්‍රාහ්මණධනය අනුමෝදන්වී මහෙශාක්‍යවූ දිව්‍යරාජන්ව උපන්හ. මේසේ ඒ බ්‍රාහ්මණයෝනම් අග්‍ර දක්ෂිණාර්හ වන්නාහ්සි කියා නැවත සුභගයන්ට මත්තෙහිත් කාරණා හෙනහැර දක්වා කියන්නාවූ කාණාරිට්ඨයෝ සුභගයෙනි! යටගිය දවසබරණැස්පුවර **මුවලිඳ** නම් එක් රජ්ජුරුකෙනෙක් බමුණන් කැඳවා ගෙන්වාගෙන සවඞ්මාගිය විවාලෝය. එකල්හි බමුණෝ ඒරජ්ජුරුවන්ට කියන්නෝ රජ්ජුරුවන්! බමුණන්ටත් බ්‍රාහමණ දෙවතාවාණන්ටත් සත්කාරකළ මැනවැයි කියා බ්‍රාහ්මණදෙවතාවා නම් කවරෙක්දැයි කිකල්හි ගිනිදෙවියාය, ඒ වහ්නි දෙවතාවා අලුත්ගිතෙලින් පිනවුව මැනවැයි කිහ. එබස් අසා මුවලිඳ නම් රජ්ජුරුවෝ බ්‍රහ්මලොක ප්‍රමාණවූ දැරැසඹාරයක්ලුවත් දවා හස්මකරන හෙයින් බොහෝ වසතු භක්ෂණය කරන්නාවූ සවණ්වණ්වූ ශොභා ඇති බැමින් අලංකතවූ ප්‍රභාඇති ගිනිදෙවියා එළගිතෙලින් පිනවන්නට සමිථිවූහ. මෙසේ ඒ රජ්ජුරුවෝ ගිනිදෙවියාටයාගවිධිසඞ්ඛ්‍යාතවූපූජාකොට දිව්‍යලොකයට ගියෝවේදැයි කිහ. භවද සුභගයෙනි! යටගිය දවස **දුද්දිප** නම් එක් රජ්ජුරුකෙනෙක් පන්සියයක් අවුරුදු රාජ්‍යශ්‍රී අනුභවකොට බ්‍රාහ්මණයන්ට සත්කාරකොට අපරියන්තවූ රථසෙනාව හැර පැමිදිවූය, එසෙවූ දහසක් අවුරුදු ජීවත්වන්නට තිසිවූ මහානුභාව සම්පන්නවූ ආරොහපරිණාහයෙන් හා උතුම්වූ රූපශොභායෙන්ද ප්‍රඛ්‍යාණාතික්‍රාන්තවූ සෙනාවාහනාදිය අතිනි ඒ දුද්දිපනම් රජ්ජුරුවෝ පවා බමුණන්ට පූජාකොට සවඟිලොකයට ගියෝයයි කිහ. නැවත අන්‍යවූ උදාහරණයක් හෙනහැර දක්වා කියන්නාවූ කාණාරිට්ඨයෝ භවද සුභගයෙනි! යටගිය දවස **සාගර**නම් එක් රජ්ජුරුකෙනෙක් මහාසමුද්‍රය අවසන්කොට ඇති මුළු දඹදිව ජයගෙන බමුණන් අතින් සවඞ්මාගීය විවාරා සවණ්මයවූ යාගසථමහයක් ඉදුවුව මැනවැයි කිකල්හි පසුඝාතනය පිණිස සුන්දරවූ සවණ්මයවූ මහත්වූ යාගසථමහයක් ඉදුවා එහි මෘගපක්ෂි ආදීන් බැඳ ඔවුන්මරා පසුඝාතනයකොට ගිනිදෙවියාටත් පූජාකොට බ්‍රාහ්මණයන්ටත් පූජාකොට මහෙශාක්‍යවූ එක්තරා දිව්‍යරාජයෙක්ව උපන්නේ වේදැයි කිහ.

තවද පින්වත්වූ සුභගයෙනි! **පංචමහානදියක් සමුද්‍රයත් කවරකෙනකුන් විසින් කරනලද්දේදැයි තෙපිදනුදැයි විවාරා මම කවුරුන් කළබවත් නොදනිමි කිකල්හි තොපදන්නේ කුමක්ද? තොපදන්නේ බමුණන් මරන සේමවේද? අතීතයෙහි අහුනම්වූ යටිපත්ලේ ලොම් ඇති බරණැස්රජ්ජු**

රුවෝ බඹුණන් අතින් දිව්‍යලොකයට යන්නට මං විවාරා ඔවුන් විසින් හිමාලය වනයට වැද බඹුණන්ට සත්කාරකොට හිතිදෙවියාටත් පූජාකළ මැනවැයි කියකල්හි ක්‍රමාණාහි ක්‍රාහතවූ හෙරිමිවුන් ඇරගෙන හිමාලයවනයට වැද බඹුණන්ට ඔසුපසයෙන් උපස්ථාන කිරීමෙන් සත්කාරකොට හින්නෙහි එළනිහෙල් මත්සොව හිතිදෙවියාව පූජාකොළෝය. එකල්හි බඹුණන් අනුභවසොව ඉනිරි කිරි ආදි කුඹක්කවයුතුදැයි විචාළකල්හි දමාපියවයි කීහ. ඒ කිරි දිදෙනින් මිදමිද කිරන් දැමූතන්හි සුලුගංගොවිය. බොහෝ කිරි දැමූ තන්හි මහා ගංගාවිය. ඒ කිරි හොස් යම්තැනෙහ රැස්ව මිදි සිටියේම්හම් ඒ මහාසමුද්‍රතම්විය. මෙසේ ඒ අතුරපිඳුරුවෝ මෙබඳුවූ සත්කාරකොට බඹුණන් විසින් කියනලද ක්‍රමයෙන් හිතිදෙවියාට පූජාකොට ත්‍රයත්‍රිංශත් දිව්‍යලොකයට යියෝ වේදැයි මෙසේ මේඅතීත කථාවත් ගෙනහැර දක්වා කීහ

තවද පින්වත්වූ සුභගයෙනි! දැන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ සෙනාපතිවූ මහත්වූ සෘඛ්‍යානුභාව ඇති මහත්වූ යශපිරිවර ඇති යම් දිව්‍යපුත්‍රයෙක් ඇද්ද, ඒ දිව්‍යපුත්‍රයාත් පෙර බරණැස්නුවර රජව ඉපද බඹුණන් අතින් සවිනීමාගිය විචාරා ඔවුන් විසින් නොම යාගයෙන් තමන්ගේ පාපමල ප්‍රවාහය කොට දිව්‍යලොකයට යවයි කියකල්හි බඹුණන්ට මහත්වූ සත්කාර සම්මානකොට ඔවුන් විසින් කියනලද විධියෙන් හොමයාගකොට ඒ හොමයාගයෙන් තමන්ගේ පාපමල ප්‍රවාහයකොට ඒ බරණැස් රජුරුවෝ දැන් මේ ත්‍රයත්‍රිංශත් දිව්‍යලොකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයන්ට සෙනාපතිව උපන්හයි මේ අතීතකථාවත් ගෙනහැර දක්වා කීහ.

තවද සුභගයෙනි! යම් මේ මහාබ්‍රහ්මයකු විසින් මෙලොවත් පරලොවත් හඟිරති නම්වූ ගංගාවත් හිමාලය පර්වතයත් ගිජ්ඣකූට පර්වතයත් කරනලදද, ඒ මහාබ්‍රහ්මයාත් බ්‍රහ්මොත්පත්තියෙන්පුළුභාගයෙහි යම්කලෙක බ්‍රාහ්මණ මානවකව උපන්නේද, එසමයෙහි හිතිදෙවියාට පූජාකොළේය. හිතිදෙවියාට පූජාකොට මහත්වූ සෘඛ්‍යානුභාවඇති මහත්වූ යශපිරිවර ඇති බ්‍රහ්මව ඉපද මෙලොව පරලොව ආදීවූ සියල්ල කෙළේය. එසේහෙයින් මේ බඹුරජාණන් මහත්වූ මහිමා ඇත්තාහුයයි මේ අතීත කථාවත් ගෙනහැර දක්වා කිවුය.

තවද සුභගනම් නාරජුරුවන් වහන්ස! යටගිය දවස බරණැස්නුවර එක් රජුරුවෙනෙක් බඹුණන් අතින් දෙවිලෝ යන්නට මං විවාරා බඹුණන්ට සත්කාරසම්මාන කළවැනවැයි කියකල්හි බඹුණන්ට මහදන් දෙන්නට පටන්ගෙන මාගේ දානයෙහි කුමක් නැද්දැයි විචාරා දේවයන්වහන්ස! සියල්ලම් ඇත. බඹුණන්ට ඉදිනට අසුන් පමණක් නොසැගෙන්නේයයි කියකල්හි උළින්බැඳ ආසනශාලවූහ. එසමයෙහි උළින් බඳනාලද ආසන පිහිකාවෝ බඹුණන්ගේ ආනුභාවයෙන් වැඩි හිමාලය පර්වතය, ගිජ්ඣකූටපර්වතය, සුදර්ශන පර්වතය, නිසභ පර්වතය, කාකතෙරුපර්වතය, යනාදි අනෙකාකාරවූ පර්වතව හියාහ. තවද මේ පර්වතවලින් අන්‍යවූත් මහත්වූද කුඩාවූද යම් පර්වත කෙනෙක් ඇත්නම් ඒ සියලු පර්වතයෝමත් බඹුණන්ගේ ආනුභාවයෙන් පර්වතවූහ. එසේනමින් මේ සියලු පර්වතයෝම පෙරයාගකරන්නාවූ බඹුණන් විසින් තමන්ට ආසනනිසා උළින් බඳවා සසුව තමන්ගේ ආනුභාවයෙන් වඩා පර්වත කළහයි පුරාතන ආචාර්‍යවරයෝ කියති කීහ.

තවද සුභගතම් නාරජ්ජුරුවන්ට කියන්නෝ බැහැන්වහන්ස! නුඹ වහන්සේ මේ සමුද්‍රය කවරකාරණයෙකින් සමුද්‍රයවීද? කවර කාරණයෙකින් නොපියහැකි ලවනජලයවීදැයි දන්නාසේක්දැයි විචාරා නොදනිමි අරිට්ඨයෙනි, කීකල්හිඉක්බිත්තෙන් ඒ සුභගයන්ට තෙපි බඹුණන් මරන්නවමදනුව,සමුද්‍රා දිය ඇතිවූ නියාව නොදනුව, තොප නොදන්නාබැවින් මාගෙන් අසවඹි කියා සමුද්‍රොත්පත්තිය කියන්නාහු සුභගයෙනි! අනුන් වෙදමන්ත්‍ර හදාරවන්නවූ තමාවිසිනුත් හැමවේලෙහිවිවෙදමන්ත්‍රවිරචිමකරන්නාවූ තපනිත්‍රිතවූ බ්‍රාහ්මණයාටමේ ලොකයෙහි සත්‍වයෝ යොගීයයි කියති, එසේවූ බඹුණෙක් එක්දවසක් පාපප්‍රවාහයකෙරෙමියි කියා ගොඩසිට සමුද්‍රයෙන් පැන් ඇරගෙන තමාගේ ඇහට දමදමා ජලසන්තානයකරන්නේය. එකල්හි ඒ බඹුණා මෙසේ ජලස්නානය කරන්නහු මහරැළෙක් අවුත් ගසා හෙළා සමුද්‍රයට ඇරගෙනගොස්. නුදුඩත්කෙළේය, ඒ කාරණය මහාබ්‍රාහ්මණයා අසා සමුද්‍රය විසින් මාගේ පුත්‍රවූ බ්‍රාහ්මණයා ගසා මරනලද්දේයයි සමුද්‍රයට කිපී සමුද්‍රජලය නොපියහැකි ලවන රස වේවයි කියා සස්කෙළේය, ඒ කාරණයෙන් මේ සමුද්‍රය පැන් නොපියහැකිව ලවන රස විය, එසේහෙයින් මේ බඹුණෝ තම් මෙබදු මහත්වූ ආනුභාව මහිමයෙන් යුක්තයෝයයි කියා නැවතත් බඹුණන් හා යාගය උතුම්කොට කියන්නාහු සුභගයෙනි! පෙර බඹුණන්ට දන්දී ශක්‍රභවනයට පැමිණියාවූ ශක්‍රදෙවෙන්‍රයන්වහන්සේට කුශලක්ෂෙත්‍රවූ අග්‍රදක්ෂිණෙය්‍යවූ බොහෝ බඹුණෝ පොළෝතලයෙහි විද්‍යමානයහ. දැනුත් බ්‍රාහ්මණයෝ පූර්ව දක්ෂිණ පශ්චිම උත්තරයයි කියනලද සතර දික්හි විද්‍යමානවන්නාහ, ඒ වාසව සංඛ්‍යාතවූ ශක්‍රදෙවෙන්‍රයන්වහන්සේට මහත්වූප්‍රීතිසොම්නස් එළවන්නාහුය. එසේහෙයින් හැමකල්හි බඹුණෝ නම් අග්‍රපුද්ගලයෝයයි බඹුණුනුත් යාගයත් වෙදයත් වණීනාකොට කිවුය.

ඒ කාණාරිට්ඨයන්ගේ සියලු කථා අසා මහබෝසතාණන්ට ගිලානුපසථානයට ආවාවූ බොහෝ නාගයෝ ඇත්තක්ම කියන්නේයයි මිථ්‍යාදෘෂ්ටිගත්තාවූ ආකාරයට පැමිණියාහුය, එකල්හි මහබෝසතාණෝ ගිලානසෙය්‍යායෙන් වැදහොත් තැනැත්තෝ ඒ කාණාරිට්ඨයන්ගේ සියලු කථා ප්‍රවෘත්තිය ඇසුහ, නාගයෝත් ගොස් මහබොසතාණන්ට එපවත් දන්වූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ සිතන්නෝ මේ කාණාරිට්ඨයෝ මිථ්‍යාමාගීය වණීනාකෙරෙති. එසේහෙයින් උන්ගේ වාදය බිඳ නාගපුත්‍රයන් සම්‍යක්දෘෂ්ටි කෙරෙමියි ඒමහබෝසතාණෝ යහතින් නැගිසිට සම්‍පාහරණයෙන් සැරසී ශක්‍රදෙවෙන්‍ර ලීලායෙන් ධර්මාසන මස්තකයෙහි වැඩහිඳ සියලු නාගපුත්‍රයන් රැස්කරවා කාණාරිට්ඨයන්ගේ සමීපයට කැඳවා අරිට්ඨයෙනි! තෙපි නැත්තක්කියා වෙදයත්යාගයත් බ්‍රාහ්මණයනුත් වණීනාකරව, බ්‍රාහ්මණයන්ගේ වෙදවිධියෙන් යාගකිරීම නම් අනිෂ්ටඵයි ලෝවැස්සන් විසින් දන්නාලදහ, ඉන් සුගී ලොකොත්පත්තිය නොම එළවන්නීය, ඒ නොපගේ වාදය අහුන නියාව බලවයි කියා යාගවාදභෙදයටපවත්ගණ්නාවූ මහබොසතාණෝ මෙසේ කිවාහුය, මල කාණාරිට්ඨයෙනි! මේ වේදමන්ත්‍ර හැදෑරීම නම් නුවණැත්තාවූ සත්‍වයන්ට පරාජයසංඛ්‍යාතවූ අකුශලග්‍රහණය වන්නේය, අඥානවූ සත්‍වයන්ට ජය සඞ්ඛ්‍යාතවූ කුශල ග්‍රහණය වන්නේය, මේ වෙද මන්ත්‍ර නම් මිරිඟුජලයක් වැන්නේය, මහ අවුවෙහි පෙනෙන්නාවූ මිරිඟු

ජලය දූන මාඝයෝ බොන්නටතිසිවූ ජලයෙනැයි යන සංඥයෙන් සමීපයට දිවෙති, මාඝයන් සමීපයට දිවුයේ අවිද්‍යමානවූ වස්තුවහෙයින් නැති වන්නේය. එපරිද්දෙන් මෙම වෙද මන්ත්‍රයත් යථාසභාව පරීක්ෂානොකළ බැවින් යුක්තා යුක්ති නොදන්නාවූ අඥානසත්වයෝ භූතසංඥයෙන් නිරවද්‍ය සංඥායෙන් ඇත්තෙක, යහපතැයි සිතා හදාරන්නාහ, මෙබඳුවූ වෙදමන්ත්‍ර සංඛ්‍යාතවූ මායානොවිස්මයය නුවණැත්තාවූ පුරුෂයා වංචානොටගත නොහෙන්නේය, නුවණැතිසත්වයෝ මේවෙදමන්ත්‍රය ඇත්තෙකැයිකියාවත් ඉෂ්ටයයි කියාවත් දිව්‍යලොකොත්පත්තියට මාර්ගයෙකැයි කියාවත් නොගනිති, එසේහෙයින් සත්කාරයෙන්ම වෙදමන්ත්‍රයනම් අභිවාඩිකාරවස්තුයෙක් නොවෙයිකියා මා කිවා අදහාගනුවයි කිහ. තවද අරිට්ඨයෙනි! තමහට වන අභිවාඩිනසන්තාවූ මිත්‍රද්‍රෝහිවූ ඒ සත්වයාහට වෙදමන්ත්‍රයපිහිටවන්ට අසමර්ථවන්නේය, කායදුශ්චරිත වාක්දුශ්චරිත මනොදුශ්චරිතයයි කියනලද ත්‍රිවිධවූ දුශ්චරිතයෙන්සදෙසිවූ සිත්ඇතිපාපකාරිවූපුරුෂයා යම්සේවහ්නියහෙතෙක් දවසක් පුරුදුකළත් මද ප්‍රමාදයකින්ම සත්වයා දහනයහෙරේද, එපරිද්දෙන්ම වෙදමන්ත්‍රයත් හොතෙක් දවසක් හදාරා පිරුවා වාවොද්ගතකොට සිත්හි තබා පුරුදුකළත් ඉෂ්ටඵලදායක නොවී නරකාදීවූ සතර අපායට පමුණුවන හෙයින් සත්වයා පුරුදුකළාවූ වහ්නියම දහනයකරන්නාක්මෙන් වෙදමන්ත්‍රයත් පුරුදුකළාවූ සත්වයා රැකගත නොහෙන්නේය. තවද දෙබලවූ දිවින් රස දූන්මෙහි සමර්ථ බැවින් 'ජිවසඤ්ඤ' යන නම් ඇති අරිට්ඨයෙනි!- ඉදින් මේලොකයෙහි උපභොග පරිභොග වස්තු හා මුක්තාමාණික්‍යාදීවූ දශවිධ රත්නයන් ඇති මනුෂ්‍යයෝ තමන්ගේ යම් පමණ සම්පත්තියෙක් ඇත්නම් එපමණවූ සම්පත් හා සමඟ දර හා ධන මිශ්‍රකොට ඉදින් ගින්නෙහි ලා දැවුවාහු වීත්‍රාම් මෙසේ බ්‍රහ්මලොක ප්‍රමාණවූ දැරැසම්භාරය හා සමඟ ඒ සත්වයන් විසින් දවනු පිණිස ගින්නෙහි ලනලද්දවූ සියලු වස්තු සම්භාරය දවා භස්මකරන්නට සමර්ථවූ අසදෘශවූ තෙජස් ඇති ඒ වහ්නිය තෘප්තියකට නොපැමිණෙන්නේය. මෙසේ තෘප්තියකට නොපැමිණිය හැක්කාවූ ඒ වහ්නිය ගිතෙල් ආදිය වත්කිරීමෙන් තෘප්තියකට පමුණුවන්නට කවරෙක් සමර්ථවේද? මල අරිට්ඨයෙනි! මෙසේ අතෘප්තිකරවූ සියලු ලොව ඇති වස්තු සාරයතාක් දවා භස්මකරන්නට සමර්ථහෙයින් බහුභක්ෂණවූ ඒ වහ්නිය පින්වා කවර නම් සත්වයෙක් දිව්‍යලොකයට යේද? එසේහෙයින් තෙපි කියන්නාවූ කථායෙහි දෙෂ බලව, තවද අරිට්ඨයෙනි; යම්සේ හිරි විපරීත සභාවයට පැමිණෙන්නේ දී මිදී දෙවනුව වෙඩරු නැගීමටත් පැමිණේද, එපරිද්දෙන්ම වහ්නියත් පෙරළෙන්නාවූ සභාව ඇත්තේ ගිනිදඬු කැටිමෙන්මෙරමාගේ උත්සාහයෙන්ම උපදනේය, මෙසේ අනුන්ගේඋත්සාහයෙන් උපන්නාවූඅවෙතනිකවූවහ්නියට තෙපි ගිනි දෙව්යායයි කියයි, මෙසේ හෙයින් තෙපි කියේ නැත්තෙක්මවේද? තවද අරිට්ඨයෙනි! ව්‍යලිදඬුගෙනියි අඹුදඬුයෙහිත් ඇතුළේතුබුවහ්නියගිනිදඬුගත් අත් ඇති පුරුෂයකු ගිනිදඬු සටා ගිනි හෙළෑකල්හි මුත් සාමාන්‍යයෙන් බැලූ කල පිටින් සත්වයන්ට නොපෙනෙන්නේය. එසේ හෙයින් ගිනි කැමැත්තාවූ පුරුෂයාගේ ගිනිදඬු කැටීම් ආදිවූ ක්‍රියාවක් නැතිව තෙමේ තමාගේ සභාවයෙන් ගිනිනුපදනේය, ඉදින් වහ්නිය අඹුදණෙහි ඇතුළේ තිබේ නම් මේ ලොකයෙහි වනයේ ගටගත්තාවූ සියලු වෘක්ෂලතා ආදිහු ඇතුළෙහි තුබූ ගින්නෙන් නැවී වියලෙන්නාහ. අඹුව නොසිටිනාහ, ඉදින් සියලු වෘක්ෂලතාවෝ ඇත්තාහුවේ සියලු වෘක්ෂලතාවෝ ඇතුළෙහි තුබූ ගින්නෙන් දිලිහී

ද හම්මවන්නාහ. තවදඅරිට්ඨයෙනි! මේ ලොකයෙහි සත්වයෙක් ප්‍රතාපවත්වූ ධුම්සිඛායෙන් යුක්තවූ මහ්නිදෙවතාවා දර හා තණ ගින්නේලීමෙන් අනුභව කරවන්නේ ඉදින් කුසල්කරන්නෝ ඒතම් අහුරුබැලයෝත් ලුණු පැන් කකාරු ලුණුකරන්නාවූ ලුණුකරුවෝත් බත් පිසන්නාවූ අරක්කැමියෝත් මිනී දවන්නාවූ සොහොන්ගොවුවෝයයි කියනලද සුඩුප්පුලිත් බොහෝසේ දර දවනහෙයින් කුසල් කරන්නාහුමය, එසේ නොවී ඉදින් අහුරු බැල ආදීවූ සත්වයෝ දර දැවීමෙන් කුසල් නොකෙරෙත් නම් මන්ත්‍ර හදරන්නාවූ බ්‍රාහ්මණයෝත් තෙල් තලතෙල් ආදිය හා උදුමුන් තලකලන් ආදිය ගින්නෙහිලාදවා ගිනිදෙවියාට පූජාකිරීමෙන් කුසල්නොකරන්නාහුය, මේ ලොකයෙහි අවශෙෂවූත් යම් කිසි සත්වකෙනෙක් ඇත්නම් ඒ සියල්ලෝම ධුම්සිඛාවක්කොට ඇති තෙජස්වීවූ ගිනිදෙවියා දර ආදිය ලා දැවීමෙන් පිනවන්නාහු ඒකාන්තයෙන් කුසල් නොකෙරෙත්මය. තවද අරිට්ඨයෙනි! හොපගේ වාදයෙහි ලෝවැස්සන් විසින් පිදියයුතුයයි කියනලද ගිනිදේවියා අමනොඥවූ ගඬි ඇති බොහෝදෙනාට අප්‍රියවූ ප්‍රතික්කූල ජිගුප්සාකටයුතුවූ දුර්ගන්ධවූ අහිකුණපාදිවූ යම්යම් කුණපයක් දුර්ගන්ධ බැවින් සත්වයෝ දුරින් දුරුකෙරෙද්ද, එසේවූ දුගඳ පිළිකුල් ගෙරිකුණු මිනි කුණු ආදීවූ සියලු කුණපය මලඅරිට්ඨයෙනි! කෙසේනම් තොප විසින් ප්‍රශංසාකරනලද ගිනිදෙවියා පිළිකුල්නැතිව අනුභවකෙරේද? මේ ලොකයෙහි සමහර සත්වකෙනෙක් වහ්නිය දෙවතාවන් අහරෙන් එක්තරා දෙවතාවෙකැයි කියති; නුවණැති මෙලවඡජාතිවූ සමහර සත්වකෙනෙක් ජලය දෙවතාවෙකැයි කියති, මෙසේ කියන්නාවූ ඒ සියලු සත්වයෝම නැත්තක් විනා ඇත්තක් නොකියති, ගිනිදෙවියෙක් නොවන්නේය, මෙසේ අනිඳ්‍රිය ප්‍රතිබඛවූ අවෙතනිකවූ සියලු ලොක වාසිවූ සත්වයාට බත් පිසීම ආදීවූ කම්නානාකරන්නාවූ සත්වයෝ කෙසේනම් සවර්ග ලොකයට යෙද්ද? එසේහෙයින් වහ්නිදෙවතායයි කියන්නාවූ තොපගේ බස බසෙක්ම නොවන්නේය.

තවද අරිට්ඨයෙනි! මේලොකයෙහි ජීවිකාර්ථවූ සමහර බමුණුසෙනෙක් මහාබ්‍රහ්මයා සියලු ලොකවාසිවූ සත්වයන් මැඩපවත්නේය, සියලු ලොකය ඔහු විසින් මවනලදැයි කියති, නැවත එම මහාබ්‍රහ්මයා ගිනිදෙවියාට පූජාකොට උපස්ථානකරන්නේයයි කියාත් කියති, ඉදින් ඒ මහාබ්‍රහ්මයා ගිනිදෙවියාට පූජාකරන්නේවීනම් ඒ මහාබ්‍රහ්මයා සියල්ලවුන් මැඩපවත්නේවීනම් තෙමේ තමාගේ වසඟයෙහිම පවත්නේවීනම් සියලු ලොවත් ඔහු විසින් මවනලද්දේවීනම් එසේකල කුමක් නිසා තෙමේ සවයම්භුව සිට අනික් කෙනකුන් විසින් නිම්නය නොකරනලද්දේ තමා විසින්ම මවනලද ගිනිදෙවියාට නමස්කාරකෙරේද? ඉදින් වැන්දේ නවුත් නොවැන්දේ නම් වන්නේය, මෙසින් තොප කී නියාව යහපත් නොවන්නේය.

තවද අරිට්ඨයෙනි! බමුණන්ගේ බස්නම් සිතාවට යුතුවන්නේය. නුවණැත්තන්ගේ සිතට වදනා බසෙක් නොවන්නේය, සම්මාකාරයෙන් අසත්‍යවන්නේය, ගිනිදෙවියාට පූජාකිරීමෙන් සවර්ගලොකොත්පත්තිය නොවන්නේය, මෙබඳුවූ මෘෂාවාද තමන්ට ලාභ සත්කාර නිසා මේ බ්‍රාහ්මණයෝ පුරාතනයෙහි ලොව පැතිරවූහ. නැවත ඒ බ්‍රාහ්මණයෝ මෙපමණකිනුත් ලාභ සත්කාර නොලබන හෙයින් සත්වයන් එක්කොට ගොදුරු, ප්‍රාණවධයෙන් යුක්තවූ තමන්ගේ ලබ්ධි ධර්ම සඞ්ඛ්‍යාතවූ ශාසනිධර්මය ආගන්තුකයෙකැයි

තමන්ගේ සැබෑවින් උපදවා ගොනාගත්ත, එසේහෙයින් ප්‍රාණවධකොට කරන්නාවූ යාගය නම් දිව්‍යලොකොත්පත්තියට මං නොවන හෙයින් බමුණන්ගේ බස් අසත්‍ය තියාව මේ කාරණයෙන් දනුව, තවද අරිට්ඨයෙනි! බ්‍රාහ්මණයෝ වෙදමන්ත්‍රය හැදෑරීමෙන් හා රජදරුවෝ පොළොව ජයගැනීමෙන් හා වෙළෙඳහු කෘෂිවනිජ් ආදිය කිරීමෙන්ද, ශූද්‍රයෝ ක්ෂත්‍රියාදි වතුර්ණයන්ට මෙහෙවර කිරීමෙන්ද, වෙනවෙනම තමන් තමන්ගේ කුලප්‍රදේශයට සුදුසුවූ පරිද්දෙන් හා බ්‍රහ්මයා විසින් කියනලද ක්‍රමයෙන් ඒ ඒ කාර්‍යය කිරීමට පැමිණියාහුයයි බ්‍රාහ්මණයන් විසින් කියන ලද්දාවූ මේ වචනය ඉදින් සත්‍යවීනම් පළමු රාජවංශයෙහි නුපන් පුරුෂයෙක් රාජ්‍යයත් නොලබන්නේය, පළමු බ්‍රාහ්මණවංශයෙහි නුපන් පුරුෂයෙක් වෙදමන්ත්‍රත් නුගන්නෙය, වෙළඳුන් හැර අන්‍යවූ සත්ත්වයෙක් ගොවිතැනුත් නොකරන්නේය, ශූද්‍රයෝත් හැම කල්හිම අනුන්ට මෙහෙවර කිරීමෙන් නොමිදෙන්නාහුය, යම්හෙයකින් බමුණන් විසින් කියන ලද්දාවූ මේ වචනය අභූතද, අසත්‍යද, හරයක් නැද්ද, එසේහෙයින් මේ බඩගැනිවූ බමුණුකොල්ලෝ නැත්ත ඇතිකොට බොරුම කියන්නාහුය, නුවණ මඳවූ සත්ත්වයෝ බමුණන්ගේ ඒ අසත්‍ය වචන සත්‍යවචන වශයෙන් අදහාගනිති, කාරණාකාරණා දන්නාවූ නුවණැති සත්ත්වයෝ බමුණන්ගේ අසත්‍ය වචනයකැයි අදහාගනිති, නුවණැති සත්ත්වයෝ බමුණන්ගේ අභූත වචන සදෙෂයයි තමන්ගේ නුවණැසින්ම දක්නාහ.

තවද මලණ්ඩ අරිට්ඨයෙනි! රජදරුවෝ වෙළඳුන්ගෙන් කරවුවරයයි කියනලද (බදු) අයපඬුරු ගන්නාහ, බ්‍රාහ්මණයෝ ආයුධගෙන සේවාකම් කොට ඇවිදිනාහුය, එසේහෙයින් මේ බ්‍රහ්මයා විසින් තබනලද මර්‍යාදාව බිඳ ඇලලිවෙන්වැව්රාඩයට පැමිණියාවූ මෙබඳුවූ ලොව තොපගේ ඒ බ්‍රහ්මයා විසින් මවනලද ලොවෙක්වීනම් ඔහු තබාලූ ප්‍රමාණවෘත්තිය හැම දවස්ම තුබුවමනාවේද? බ්‍රහ්මනිර්මිතයක් නොවනහෙයින් ලොව මවන දෙයෙක් නොවෙයි කියා දැනගනුව, තවද අරිට්ඨයෙනි! ඉදින් යම් සත්ත්වකෙනෙක් අන්‍යසත්ත්වයක්හුමරා නිවන්දනිත්නම් මරනලද්දාවූ සත්ත්වයාත් සවර්ගලොකයෙහි උපදිත් නම් බමුණෝම බමුණන් මරත්වා, යම්කෙනෙක් බමුණන්ගේ වචනය ඇත්තෙකැයි අදහාගනිත්නම් ඒ තමන්ගේබස්අදහාගන්නාවූ උපස්ථායකයන්ම බමුණෝ මරත්වා, බමුණෝ වූකලී බමුණන් හා තමන්ගේ බස් අදහන උපස්ථායකයන් නොමරා අනෙකප්‍රකාරවූ නිරිසතුන් මරවති, එසේහෙයින් බමුණන්ගේ බස් බොරු නියාව මේ කාරණයෙනුත් දනුව, තවද අරිට්ඨයෙනි! ගෙරිමීවුන් භූරන් ආදීවූ සත්ත්වයන්අතරෙන් කිසි සත්ත්වකෙනෙක් අප මරාපියවයි මැරුකල්හි අපිහැම සවර්ගලොකයට යම්හයි මරන්නට යාවැඳුකොට කියන්නාවූ ප්‍රාණිකෙනෙක් නැත. එතකුදුවුවත් බ්‍රාහ්මණයෝ යාගවිධියකැයි සලසාගෙන ජීවත්වනු කැමැත්තාවූ මෘගපක්ෂි ආදීවූ මේ සත්ත්වයන් සල්ව සල්වා මරන්නාහ.

තවද ඒ අඥානවූ බ්‍රාහ්මණයෝ සත්ත්වයෙනි! මේ යාගසම්භාරයෙහි ගවමහිෂාදීන් බැන්දහු වීනම්, මේ යාගාවාටයෙහි මුක්තාමාණික්‍ය ශංඛ ශිලාප්‍රවාල මසාරගල්ල රජත සුවර්ණයයි කියනලද දශවිධ රත්නය හා සාලිව්‍රීහාදීවූ සප්තවිධ ධාන්‍යයලූනම් තොප හැමට පරලෝකයෙහිදී මේ යාගසම්භාරයට කරනලද සත්කාරයෙන් කැමැති කැමැති වස්තු සාධ්‍යදිලන්නේය. අප්‍රමාදී

ඔවත් කරන්නේයයි විසිතුරුවූ කාරණයෙන් නොයෙක් දූ කියා සත්වයන් මිථ්‍යාදෘෂ්ටි ගන්වන්නාහ, ඉදින් යාගසම්භාරයෙහිවත් අවුදණෙඩහිවත් වියලි දණෙඩහිවත් මුතුමැණික් රන්රිදී ධනධාන්‍ය ඇත්නම් යාගසම්භාරය දිව්‍ය ලොකයෙහිදී ඉශ්වාදීප්‍රසවය හෝරේනම් බ්‍රාහ්මණ සමූහයා වෙන්වෙන්වගෙන තුමූතුමූම යාගකරන්නාහ; වසතුව නිසාත් සංගීලොභොත්පත්තිය නිසාත් බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණජාතියෙන් අන්‍යවූ සත්වයන් ලවා යාග නොකරවන්නාහ, යම්හෙයකින් තමන්ට වසතුකාමතිව අන්‍යන්ලවා යාගකරවද්ද? එසේ හෙයින් මේ බමුණෝ නම් අසත්‍යවාදී සත්හෙනෙකැයි මේ කාරණයෙනුත් දැනගනුව. ඉදින් ඒ මහාබ්‍රහ්මයා සියලු ලොකවාසීන්ට ඉසුරුමත්ව නායකව සිටියේවීනම් බොහෝවූ සත්ත්වයාවූ ප්‍රජාවට අධිපතිව ලොකනිර්මාණය කෙළේවීනම් සියලු ලොකවාසිවූ සත්වයන්ට කුමක් නිසා දුක්කෙරේද? කුමක් නිසා සැපකෙරේද? බ්‍රහ්මයා විසින්ම ලොකනිර්මාණය කළපසු ලෝවැස්සන්ට හැමකල්හිම සැප විඳුවනවා මිස දුක් නොකළමනාවේද? ලොකයෙහි දැනත් සැපත් දෙකම ඇතිහෙයින් බ්‍රහ්මනිර්මිතයක් නොකළ නියාව මේ කාරණයෙනුත් දනුව, ඉදින් බ්‍රහ්මයාම ලොක නිර්මාණයකොට දුක්සැප දෙක ඇතිකෙළේවීනම් තොපගේ බ්‍රහ්මයා හා සමානවූ ලොකය විනාශකරන්නාවූ සොරකු නැතැයි කියමිහ.

තවද අරිට්ඨයෙනි! ඉදින් මහාබ්‍රහ්මයා සියලු ලොකයට ඉසුරුමත්වී නම්ප්‍රජානායකා ජිනම්ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මෘෂාවාදය සුරාපානයමායාසාඨෙය්‍යසඨම්භ සාරම්භ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය මදමඩ පලාස මානා තිමානමදප්‍රමාද යනමේ අධර්ම හා එක්කොටලෝවැස්සන් කුමක්නිසාදෙයිද? ඉදින් අරිට්ඨයෙනි! මහාබ්‍රහ්මයා තෙමේ මේ ලොව ඇතිකළේනම් සියලු සත්වයෝ බ්‍රහ්මයා නිසා ඇතිවූනම් ඒ බ්‍රහ්මයා දශකුශලධර්මය ඇතිවනිබෙද්දී දශඅකුශල ධර්මයකුත් ඇතිකෙළේය, එසේහෙයින් ඔහු අධර්ම්ෂ්ටයයි කියමිහ. තවද අරිට්ඨයෙනි! පණුපලඟැටියන් හා නයින් මඩුවන් හා මැසි මදුරුවන් ආදිවූ ක්ෂුද්‍රප්‍රාණීන් මරා ලොකයෙහි සත්වයෝ පිරිසුදුවෙති, නිවන් දකිති කියා මෙසේකියන්නාවූ අනාර්‍ය්‍ය සවරූපඇති මේ ධර්මයෝ කාම්බෝජ රාජ්‍යවාසීවූ බොහෝ සත්වයන්ගේ අසත්‍ය වචනසේ අසත්‍ය වන්නාහ, ඔවුන් විසින් අධර්මයධර්මයෙකැයි විරුඬකොටගන්නාලදි. එසේහෙයින් ඒ කාම්බෝජ රාජ්‍ය වාසීවූ සත්වයනුත් තොපගේ බ්‍රහ්මයා මැවිවයි සිතම් කියහ.

මෙසේ මහබෝසතාණෝ කාණාරිට්ඨයන්ට වෙදමන්ත්‍රාදිය ඇත්තක් නොවනනියාව නොයෙක් පරිද්දෙන් කියා නැවතත් ප්‍රාණඝාතයකොට සවගී ලොකොත්පත්තිය වේනම් මහවනයෙහි වියලිදණෙඩහිවත් අවුදණෙඩහිවත් මුතු මැණික් රන්රිදී ධනධාන්‍යාදිය කොයින් ඇතිවේද? මෙසේ වසතුව තමා අවිද්‍යමානකල දිව්‍යලොකයෙහිදී කැමැති කැමැති වසතු සාධාදිලන්නටත් අජරාමර කරන්නටත් යාගසම්භාය කෙසේ සම්පූර්වේද? එසේහෙයින් බමුණන්ගේ බස්නම් සම්ප්‍රකාරයෙන්ම අසත්‍යවන්නේය. තවද අරිට්ඨයෙනි! මේ බමුණෝ නම් කෙරාටිකයහ, වංචාගුණ ඇත්තාහ, නිස්කාරුණිකයහ. එබඳුවූ ගුණඇති ඒ බමුණෝ අඥානවූලෝවැස්සන් වංචාකොටොලඹාගෙන සත්වයෙනි! තොපි ගිනි හැරගත්ත ගිනිදෙවියාටත් පූජාකරව්. අටවත් වසතු දවේ මෙසේ කරනලද වත්තිහොමයෙන් හා සම්පත්ති දැනයෙන් වසතුකාම කලුණකාමියන් ලැබ සුඛිතසුඛිතවන්නේයයි මෙසේ අතෙකප්‍රකාර රූවිසඳුන් කාරණයෙන් නොයෙක්දූ කියා සත්වයන් මිථ්‍යාදෘෂ්ටිගන්වන්නාහ.

තවද අරිට්ඨයෙනි! මේ බ්‍රාහ්මණයෝ රජයුවරජ මහඇමතියන්ගෙන ගිනිගල්ගෙට වැද ඒ යාගශාලායෙහිදී රාජරාජ මහමාත්‍යාදීන්ට විසිතුරුවූ සාරණා කියා ඔවුන්ගේ කෙස් හා දැළිරුවුල් හා අන්තියත් කපා වෙදමන් ත්‍රය නිසා මේ මේ දැ කවයුත්තයයි කියන්නාහු වෙදයෙන් ඒ රාජරාජමහාමාත්‍යාදීන් සන්හඳ ධනය නොයෙක් පරිද්දෙන් නසන්නාහුය. තවද අරිට්ඨයෙනි! ඒ බ්‍රාහ්මණයෝ නුපුටු සමූහයා විසින් තනිතැනකදී වටලාගත් බහුශ්‍රුතකු මෙන් බොහෝදෙන එක්ව එක්, ප්‍රධාන පුරුෂයකු වටලාගෙන අනෙකප්‍රකාරවූ කුහකකථාකොට යාගවර්ණනාකිරීමෙන් වංචාකොට ඔහු සන්හඳවූ අනෙකප්‍රකාරවූ උතුම්වූ රසමසවුලෙන් යුක්තවූ භොජනය අනුභව කොට ඉක්බිත්තෙහින් ඔහු ඉසකේ කපා මුඩුකොට ගිනිගල්ගෙයින් පිටත් කොට යාගාවාටයට ගෙනයන්නාහ, මෙසේ ඒ ප්‍රධාන පුරුෂයා බොහෝ බමුණන් විසින් එක්වගෙන තනිකොට වංචාකරනලද්දේ නැවත ඒ බමුණෝ ඒ ඒ වස්තුව හා එක්කොටගෙන යොදා නොයෙක් සාරණා කියා ඔහු සන්හඳ විද්‍යමානවූ ධනය පැහැරගෙන ඔහු පළමු නුදුටු දිව්‍යලෝකය වර්ණනා කොට ගිනිදෙවියාට පූජාකිරීමෙන් හා යාගකිරීමෙන් මෙබඳුවූ දිව්‍යලෝකයෙහි ඉපිද අජරාමරවෙති කියා ඔහුගේ සිත සතුටුකරන්නාහ. තවද අරිට්ඨයෙනි! මේ බ්‍රාහ්මණයෝ රජදරුවන් විසින් මෙතෙක් මෙතෙක් අයපඬුරු ගනුවසි නියොගකරන ලද රාජපුරුෂයන් වෙන් යාගකරවන්නාවූ පුරුෂයා සන්හඳ වස්තුව නොයෙක් සාරණා කියා යාග පිටමලා පැහැරගන්නාහ. එසේහෙයින් මේ බමුණෝ නම් තරවුවර ගන්නාවූ රාජපුරුෂයන් හා උමං බිඳිම් මං පැහැරිම ආදිවූ සොරකම්කොට ජීවත්වන්නාවූ සොරුන් හා සමානයහ. නොකළමනා කාර්‍යය කරනහෙයින් වධයට නියමයහ, යාගකරන්නවුන් සන්හඳ වස්තුව නොයෙක් පරිද්දෙන් පැහැරගෙන යාගකොට ඒ සත්වයන් දිව්‍යලෝකයට නොපමුණුවා නරකාදීවූ සතර අපායට පමුණුවන හෙයින් අසත්පුරුෂයහ, එසේහෙයින් මල අරිට්ඨයෙනි! මේ ලොකයෙහි මෙබඳුවූ අසත්පුරුෂ ගුණඇති පවිටුවූ සොර බමුණන් නොමරනකල මරන්නේ කවුරුන්ද?

තවද අරිට්ඨයෙනි! බමුණන් කියන්නාවූ මේ බොරුවකුත් අසාබලව, ඒ බ්‍රාහ්මණයෝ යාගස්ථානයෙහි මහත්වූ කැලලියක් ඉදුවා මේ තෙමේ ශක්‍ර දෙවෙන්ද්‍රයන්ගේ දක්ෂිණ බාහුවයයි කියා කැලලිය කපා පොලුගසන්නාහ, ඉදින් කැලලිය කැපීමෙන් ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ අත කැපී යන්නේය යන මේ බමුණන්ගේ වචනය සත්‍යවේනම් ශක්‍රදෙවෙන්ද්‍රයෝ අතකොටවූ තැනැත්තෝ බාහුබලයෙන් අසුරයන් හා යුද්ධකොට කෙසේනම් සටනෙන් ජයගත්තුද? එසේහෙයින් බමුණන්ගේ බස් බොරුනියාව සිතව, තවද ඒ ශක්‍ර දෙවෙන්ද්‍රයෝ නුසුන්නාවූ බාහු ඇත්තාහ, අන්‍ය සත්වයන් විසින් නසාලිය නොහැක්කාහ, මහත්වූ උත්සාහවූ කුශලානුභාවයෙන් යුක්තයහ, එසේහෙයින් බමුණන්ගේ මේ වෙදමන්ත්‍රයෝ නම් ලොකයෙහි දෘෂ්ට ප්‍රත්‍යක්ෂවූ වංචා කොඩාශයෝ වන්නාහ, ඒ තුච්ඡවූ වෙදමන්ත්‍රයන් හා යුක්තවූ බමුණෝත් නිස්ඵලවූ වචන ඇත්තාහුය.

තවද අරිට්ඨයෙනි! කාළගිරි පර්වතය, හිමාලය පර්වතය, ගිජ්ඣකූට පර්වතය, සුදර්ශන පර්වතය, නිසභ පර්වතය, කාළතෙරු පර්වතය යන මේ පර්වතයෝත් අන්‍යවූ මහාපර්වතයෝත් යාගකරන්නාවූ බ්‍රාහ්මණන් විසින් ආසනවශයෙන් බඳවන්ලද පර්වතයෝයයි යම් මේ වචනයක් කියවිනම් අපව්සින් දක්නාලද මේ පර්වතයෝ නිශ්චලයහ, එකඝනයහ, ශෛලමයහ, උළින්බඳනාලද ආසන සඞ්ඛ්‍යාතවූ පර්වතයෝ වලිතයෝය, එකඝන නොවෙති, ශෛලමය නොවෙති, එසේහෙයින් උළින් බඳනාලද ආසනයෝ කල්යාමකින් පර්වතයෝ නොවන්නාහ, අයලොහ, තාම්බ්‍රලොහ, කන්සලොහ, බට්ටලොහ, හාරකූට ලොහත් නොවන්නාහ, යාගකාරක බ්‍රාහ්මණයෝ යාග වර්ණනාකරන්නාහු බරණැස් රජ්ජුරුවන් යාගකාරක බ්‍රාහ්මණයන් ඉදිනා පිණිස උළින් බඳවනලද අස්සුන් බ්‍රාහ්මණයන්ගේ ආනුභාවයෙන් ක්‍රමයෙන් වැඩී පර්වතවගියෝයයි කිහ. තවද වෙදමන්ත්‍ර හදාරන්නාවූ තපනිශ්‍රිතවූ යාවයොගීවූ මන්ත්‍රයෙන් යුක්තවූ බ්‍රාහ්මණයා සමුද්‍රතීරයෙහි සිට ඇඟට පැන් දමදමා නා නා තැනැත්තවුන් සමුද්‍රයෙන් රැළ අවුත් ගසාගෙනගොස් මුහුදුබත් කෙළේයයි එබස් අසා මහාබ්‍රහ්මයා කිපී මාගේ දරුවන් මේ සමුද්‍රයෙන් නස්නට කාරණා කවරේද? එසේහෙයින් මේ සමුද්‍රජලය අන්‍ය සත්වයන්ට නිෂ්ප්‍රයොජනව ලවනරස වේයයි කියා සස්කළේයයි බමුණන් කියන්නාවූ මේ වචනය ඉදින් සත්‍යවිනම් සම්පූර්ණකොට උගන්නාලද වෙදමන්ත්‍ර ඇති බමුණන් දහසක්දෙනා මන්ත්‍ර පිරුවමින් සිටියවුන් ගංගාජලය ඇදගෙන ගොස් නසාපිය, ඒ බ්‍රාහ්මණයන් දහසක්දෙනා කරකවා යටගලා ජීවිතක්ෂයට පැමුණුවන්නට සමර්ථවූ ගංගාජලය ලවනරස නුවූයේ කුමක්නිසාද? එසා බමුණකු නසාපුහෙයින් සමුද්‍රජලය ලවනරසවූයේ කුමක්නිසාද? කිමෙක්ද? තොපගේ මහාබ්‍රහ්මයා ගංගායෙහි ජලය ලවනරසකොට ගන්නට අසමර්ථද? සමුද්‍රජලයම ලවන රසකොට ගන්නට සමර්ථද? එසේහෙයින් බමුණන්ගේ බසෙහි පූර්වාපරසන්ධියෙක්වත් හරයෙක්වත් නැති නියාව මින්ම දතුව.

තවද මනුෂ්‍ය ලොකයෙහි ලිං පොකුණු කණන්නාවූ මනුෂ්‍යයෝ තමන්ට කුසල් නිසා බොහෝසේ ඒ ඒ තැන ලිං පොකුණු කණති. ඒ ලිං පොකුණු ආදියෙහි බමුණෝ වැටී බොහෝසේ මියයන්නාහ, එසේහෙයින් කළ ලිං පොකුණු ආදියෙහි ජලයෝත් ලවනරස වුවමනා නොවේද? තවද අරිට්ඨයෙනි! ප්‍රථම කල්පයෙහි කවුරුකවුරුන්ට භාර්‍යාතම් වෙත්ද? එසමයෙහි ස්ත්‍රීලිඟු නැත්තේය. පසුව වයංවය සමාපත්ති වශයෙන් දෙමවුපියෝ නම්වූහ. එසමයෙහි සත්වයෝ මනොමයව උපන්නාහ. 'චිත්තයම මනුෂ්‍යයා ඉව්පදවිය' යන මේ කාරණයෙනුත් ජාතියෙන් යටත්වූ කිසිවෙක් නම් නැත්තේය, එසමයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදිවූ චතුර්ණී විභාගයකුත් නැත්තේය, එසේහෙයින් බ්‍රාහ්මණයෝම ජාතියෙන් ශ්‍රේෂ්ඨයෝය, අවශෙෂයෝ ජාතියෙන් හීනයෝයයි යම් බසක් බමුණෝ කියත්නම් ඒ බස අහුතවන්නේය, මෙසේ ක්ෂත්‍රියාදි විභාගයක් නැතිව පවත්නාවූ මේ ලොකයෙහි පුරාතන ප්‍රවෘත්තිය හැර පසුව තමන් විසින් සිතුසිතු ලෙස කරනලද ක්‍රියාවන්ගේ වශයෙන් ක්ෂත්‍රිය බ්‍රාහ්මණයෙක් නම් ලොකයෙහි සම්මාකාරයෙන් නැත්තේය, එසේහෙයින් සියලු බමුණෝ සිංහ ව්‍යාඝ්‍රාදිවූ තිරශ්චීනයන්ටත් වඩා හීනයෝය, මේ බමුණන්ගේ මනුෂ්‍යත්වය නම් ගවමහිෂාදීන්මෙන් දතයුත්තේය, කුමක් නිසාද? ඒ බමුණන් තුවණ නැති බැවින් ගෙරින්ගේ

සටහන් අනිකෙක, බමුණන්ගේ අනිකෙකැයි ගෙරින් හා සමානය, ජාතියම සම්නොවන්නේය, ප්‍රඥයෙන් හා ශෞරව්‍යයෙන් පුරුෂත්වයක් නැති බැවින් මනුෂ්‍යයන් හබා තිරශ්චීනවූ සිංහාදීන්ටත් යටත්ව සිටිහෙයින් බමුණෝ නම් ගෙරින් හා සමානයෝමය.

තවද අරිට්ඨයෙනි! ඉදින් මහාබ්‍රහ්මයා දුන්බැවින් රජදරුවෝම මුළු පොළොව ජයගෙන තමන් හා එක්ව ජීවත්වන්නාවූ අමාත්‍යයන්ගෙන් යුක්ත යෝ නම් තමන්කිවා කරන්නාවූ පණිත් ඇක්හෝවීනම් එසේකල්හි රජ්ජුරුවන්ට පණිත් හා සමග යුඬකොට රාජ්‍යයදියයුතුනම් නොවෙයි, රජ්ජුරුවෝ තුමූ උදකලාවමිසතුරුසමූහයා ජයගන්නාහුය,එසේකල්හි යුඬයෙන්දුක්නැති බැවින් ඒ රජ්ජුරුවන්ගේ ප්‍රජාව නිරන්තරයෙන් සැප විඳිනාහ, යම් හෙයකින් රජ්ජුරුවෝ උදකලාවම සතුරන් ජයගනිති, උන්ගේ ප්‍රජාව යුඬ නොකොට නිරන්තරයන් සැපවිඳිති යන්නෙක් නැද්ද, එසේහෙයිනුත් බමුණන්ගේ බස් අභූතවන්නේය. තවද අරිට්ඨයෙනි! රාජනීතිය හා වෙද මන්ත්‍රය තමන්ගේ ආඥයෙන් හා අභිප්‍රාව පරිද්දෙන් මෙම කටයුතුයයි රජදරුවන් හා බමුණන් විසින් පවත්වනලද බැවින් අර්ථයෙන් මේ දෙකම සමවන්නේය, රාජනීතියෙහි අර්ථ රජදරුවෝත් වෙදමන්ත්‍රයෙහි අර්ථ බමුණෝත් නිශ්චයකොට ගතනොගී ආඥාවශයෙන්ම ගන්නාහු විප්‍රකාරවූ අර්ථයමවතුදු ක්ෂත්‍රිය ආදිවූ චතුර්වර්ණයෝවූහ, තමන්තමන් විසින් කරනලද ක්‍රියා විභාගයෙන්ම ඒ ඒ සත්වයන් අතරෙන් සමහර නෙනෙක් ක්ෂත්‍රියවූහ. සමහර සොනෙක් බ්‍රාහ්මණවූහ, සමහරසෙනෙක් වෛශ්‍යවූහ, සමහර කෙනෙක් ශූද්‍රවූහයිමේ විභාගය නුවණැත්තෝ කියති. එසේහෙයින් බ්‍රාහ්මණයෝම ශ්‍රෙෂ්ඨයෝය යන මේ වචනය අසත්‍යවන්නේය.

තවද අරිට්ඨයෙනි! ඉදින් මහාබ්‍රාහ්මයා විසින් බ්‍රාහ්මණයන්ටම වෙදමන්ත්‍රය දෙනලද්දේවීනම් සෙස්සන්ට නොදෙනලද්දේවීනම් වණ්ඩාලපුත්‍රවූ, මන්ත්‍ර පිරුවනනැත්තවුන්ගේ ඉස සත්කඩක්ව නොපැළෙන්නේ ඇයිද? යම්හෙයකින් ඔහුගේ හිස නොපැළේද, එසේහෙයින් මේ බමුණන් විසින් ආත්මවධය පිණිස මන්ත්‍ර කරනලද්දේය, ඒ පුරාතන බමුණන්ගේ මුසාවාදී බව ප්‍රකාශ නොකරන්නාහු තමන්ගේම ගුණ විනාශකරන්නෝනම් වෙති, නවද මේ වෙදමන්ත්‍ර නම් මුසාවාදයෙන්ම සිතා කරනලද්දේය. ලාභයෙහි ගිජුවූ බ්‍රාහ්මණයන් විද්‍යමාන වස්තුවෙකැයි උගන්නාලද්දුවූ වෙදමන්ත්‍රය මසකු ගිලූ බිලියක්මෙන් ගලවාලිය නොහැක්කේය, කාව්‍යකාරක බ්‍රාහ්මණයෝ යමක් කියත්‍ර කැමැත්තෝ වීනම් ඒ දෙය බොරුයෙන් ගොතා බඳනාහ, එසේහෙයින් කාව්‍යකාරක බ්‍රාහ්මණයන්ගේ බස් අනුවයන්නේ ඒ අඥානයන්ගේ විපරීතඥානයෙහි පිහිටිහෙයින් අඥානවූ සත්වයෝ තමන් නුවණ මදහෙයින් ඒ වෙද මන්ත්‍රය ඇත්තෙකැයි අදහාගන්නාහ. තවද අරිට්ඨයෙනි! සිංහයන් ව්‍යාඝ්‍රයන් දිවියන් ආදිවූ ශක්තිසම්පන්න සත්වයන්ගේ යම් පුරුෂත්වයෙක් ඇත්නම් ඒ පුරුෂත්වය බමුණන්ට නැත්තේය, ශක්තියෙන් යුක්ත ගැල් හිමෙන් සැඟවී නොපෙනෙන්නාවූ මාර්ගයක් මෙන් දූනගත නොහෙන්නාහ.

තවද අරිට්ඨයෙනි! රාජනීතිත් වෙදමන්ත්‍රත් ශබ්දඵ හෙයින් සමාන වන්නේය, කුමක්නිසාද? බ්‍රාහ්මණයෝම ශ්‍රේෂ්ඨයෝය, අන්‍යවූ ක්ෂත්‍රියාදි වූවන් හීනයෝයයි බමුණෝ කියන්නාහ, එසේහෙයින් ලාභය, අලාභය, අයශය, යශසය, නින්දය, ප්‍රශංසාය, සුඛය දුඃඛය, යන මේ අෂ්ටලෝකධර්ම ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීවූ චතුර්වර්ණයන්ගේ සභාවධර්මයෙක, අෂ්ටලෝකධර්මයෙන් විනිර්මුක්තවූ එකද සත්වයෙක් නම් නැත්තේය, එසේහෙයින් බ්‍රාහ්මණයෝ සර්වසාධාරණවූ ලෝකධර්මයෙන් නොමිදී සිට අපි හැම ශ්‍රේෂ්ඨයිහයි නැත්තක් කියන්නාහ. තවද අරිට්ඨයෙනි! මේ මනුෂ්‍ය ලොකයෙහි බොහෝ ශූද්‍රයෝ ධන ධාන්‍යාදිය නිසා අනෙක ප්‍රකාරවූ කර්මාන්තයන් කෙරෙද්ද, එපරිද්දෙන්ම පොළෝතෙලෙහි බොහෝ බ්‍රාහ්මණයෝත් කෘෂිගොරක්ෂණාදීවූ කර්මාන්ත බොහෝසේ කරන්නාහ. එසේහෙයින් මේ බ්‍රාහ්මණයෝ ගොවීන් හා සම්වන්නාහ තවද නිරන්තරයෙන් කර්මාන්තකිරීමෙහි උත්සාහවත්ව පංචකාමකොට්ඨාශයෙන් යුක්තවූවාහු පොළෝතෙලෙහි විද්‍යාමානවූ කෘෂිගොරක්ෂණාදීවූ සියලු කර්මාන්ත කරන්නාහුද, එසේහෙයින් මල, අරිට්ඨයෙනි! ඒ අඥානවූ අන්ධවූ මොහිවූ බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණධර්මයෙන් දුරින් දුරුවන්නාහ, පුරාතනවූ බ්‍රාහ්මණ ධර්මය දැන් සුනඛයන් කෙරෙහි පෙනෙන්නේය, (යනාදීන් අඩෙහාත්‍රපඤ්චකයෙහි කියනලද ක්‍රමයෙන්ම දතයුතු වෙයි,) මෙසේ මහබෝසතාණෝ ඒ කාණාරිට්ඨයන්ගේ මිථ්‍යාවාදයන් බිඳ තමන්ගේ වාදයෙහි පිහිටුවූහ. ඒ මහබෝසතාණන්ගේ ධර්මකථා අසා නාග පෂිත් සොම්නසට පැමිණියාහ. මහබෝසතාණෝ තෙසාද බ්‍රාහ්මණයාට ආක්‍රොෂ පරිභව පමණකුත්කළනොදී නාගභවනයෙන් පිටත්කොට මනුෂ්‍ය ලොකයෙහි ලැවූහ.

සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් පළමු තමන් නියමකළ දවස් නොසික්මවා හස්ති අශ්වරථ පාබල සඞ්ඛ්‍යාතවූ චතුරංගිනී සෙනාවෙන් පිරිවරනලදුව තපස්වීව සිටි පියරජ්ජුරුවන් සමීපයට ගියහ. මහබෝසතාණෝ මසිලණුවන් හා මුත්තණුවන් දක්නට යෙමිසි නාගභවනයෙහි බෙරහසුරුවා මහත්වූ ශ්‍රී සෞන්දර්‍යයෙන් යමුනා නම්වූ ගංගාසෙන් උඩනැඟි ඒ රාජතපස්වීන්ගේ පන්සලට නික්මුණාහුය, ඒ බොධිසත්වයන්ගේ අවශෙෂවූ මල්බැයන් හා දෙමවුපියොත් බොධිසත්වයන් පසුපස්සේ නික්මුණාහ.

තවද සාගර බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මහබෝසතාණන් බොහෝ පෂිත් පිරිවරා මහත්වූ ශ්‍රී විභූතීන් හා උතුම්වූ රූපශොභායෙන් යුක්තව එන තැනැත්තවුන් ඇඳිනගත නොහී පියරජ්ජුරුවන් අතින් විචාරන්නාහු මෙසේ විචාළහ, රාජතපස්වීන් වහන්ස! මහබෙර, පණබෙර, මිහිකුබෙර, ගැටබෙර, පටහබෙර හා සක්සින්නම් ආදිවූ හෙරිතූර්‍යනාද භාණ්ඩයන් ගසමින් පිඹිමින් රූපොත්තමවූ ඒ රජ්ජුරුවන් සතුටුකාරවමින් ගසනා පිඹිනා අය ඉදිරියේ නික්මුණාහ, මොවුහු කවුරුන්ගේ ගසන්නෝද? පිඹින්නෝද? තවද තපස්වීන් වහන්ස! නළල්කෙළවර බඳනාලද නළල්පට්යෙන් මෙඛ මුඛය බබළවන්නාවූ විදුලියක් මෙන් මුඛය බබළවන්නේය, ඒබඳුවූ මුඛය කාගේ මුඛයක්ද? හිඟවුරු බැඳ දුන්න හා හිඳඹු අතටගෙන් කඩුව උරයේ එල්ලා යුඩසන්නඩවූ තරුණ පුරුෂයකුමෙන් මහත්වූ ශ්‍රී විභූතීන් බබළමින් එන්නාහ, මෙබඳුවූ පින්වත් මහිමගුණයෙන් යුක්තව එන්නාවූ මූ කවුරුද?

උදුනෙහි ලා තකියවනලද වාම්කර සඛණියක් වැනිවූද ඇවිලෙන්නාවූ කිහිරහුරු රැසක් වැනිවූද ප්‍රභාසහිතවූ මුඛය ළඟිරුම්ඩලක්මෙන් බබළන්නේය, මේබදුවූ රූපශ්‍රීන් දිලියෙමින් එන්නාවූ මූ කෙබඳුකෙනෙක්ද? හවද තපස්වීන්වහන්ස! සිත්කලුවූ කුඩාගොනැසින් යුක්තකොට සරහනලදජාම්බොනද සඛණියවූ මේ ධවලාතපත්‍රය කාගේද? මෙබඳුවූ ධවලාත පත්‍රයෙන් සූයශ්‍රී රශ්මීන් වලක්වමින් ඉහත්වූ ශ්‍රී විභූතියෙන් දිලියෙමින් එන්නාවූ මූ කවුරුද? තවද තපස්වීන් වහන්ස! ඇඟයෙහි රන්මිටි හිඳුවාගෙන උතුම්වූ වල්විදුනන් ගෙන තෙල එන්නාවූ උත්තම පුරුෂයාගේ මස්තකයට අනවරතයෙන් සලන්නාහ, මෙබඳු චාමර සල්ව සල්වා එන්නාවූ මූ කෙසේවූ කෙනෙක්ද? සප්තරත්නයෙන් විචිත්‍රවූ තපනීය සඛණියෙන් හා අනෙකප්‍රකාරවූ මාණික්‍ය යෙන් කම්මතන කරනලද මිටි ඇති මෘදුවූ මොනරපිල් කලඔක් තෙල එන්නාවූ මහාපුරුෂයාගේ මුඛය දැලයෙහි සලන්නාහ. මෙබඳුවූ මයූරපිංඡකලාපයන් සල්වසල්වා එන්නාවූ මොහු කවුරුද? දිලියෙන්නාවූ කිහිරහුරුරැසක් හා සමානවූ උදුනෙහි ලා තකියවනලද වාම්කර සඛණිමයවූ සිත්කලුවූ කුණ්ඩලාභරණයෝ දෙදෙන තෙල එන්නාවූ මහොත්තමයාගේ මුඛය දෙපසින් හොබවන්නාහ. මෙබඳුවූ මාණික්‍ය කුණ්ඩලාභරණයන් පැලඳගෙන එන්නාවූ මොහු කවුරුද? තවද තපස්වීන් වහන්ස! සිනිදුවූ මොලොක්වූ කෘෂ්ණ වර්ණවූ කෙසකලාපය පවනින් පහරනලද්දේ නිල්වූ අහසින් නැගී විදුලියක් වැනිවූ නළල් හෙළවර හොබවන්නේය, මෙබඳුවූ කෙසකලාපයෙන් යුක්තව එන්නාවූ මූ කවුරුද? තවද මේ එන්නාවූ පින්වත්හුගේ දිහුපුළුල්නිල්නුවන් ඇති මුඛය විශෙෂයෙන් හොබනේය. විශාල නෙත්‍ර ඇති මොහු කවුරුද? දිවිදළින් ඔප්නහනලද රන්කැඩපතක් හා සමානවූ මේ පෙම්බර මුහුණ කාගේද? තවද මුඛයෙහි පිහිටියාවූ පිරිසුදුවූ සක්කැබලි පඬිතියක් හා සමානවූද නොදකාකුළු හා සමානවූද ගෙල්මැලි කාකුළු හා සමානවූද දන්ත පඬිතිහු කථාකරන්නාවූ මේ පින්වත්හුගේ මුඛය හොබවන්නාහ. මෙබඳුවූ දන්තපඬිත්තින් හොබනාවූ මොහු කවුරුද? ලාඤ්ඡාරසයෙන් පුරවනලද රත්පියුම්ගැබක් හා සමානවූ සැපසේ වැඩුණාවූ මේ අතුල්තල පතුල්තල කාගේද? බිම්බඵලයක් හා සමානවූ අධරයුගලයෙන් යුක්තවූ මේ උත්තම පුරුෂයා දිව්‍යාභාගයෙහි සූයශ්මණ්ඩලයක් මෙන් බබළමින් එන්නේය, මෙබඳු රත්පියුම්පෙතිවැනි අතුල්පතුල් හා අධරපල්ලවයේන් ශොභාමත්ව එන්නාවූ මූ කවුරුද? වසන්තඍතුයෙහි හිමාලය වනයේ අගසිට මුල දක්වා පැළී පිපී ගියාවූ මල් ඇති මහසල්රුකක් මෙන් ධවලවූ උතුරුසළුවක් පොරවා අසුර මර්දනයකොට ජයගෙන එන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයා මෙන් සියලු දික් බබළුවමින් එන්නාහ, මෙබඳු උතුරුසළුව පොරවා එන්නාවූ මොහු කවුරුද? රන් බුබුලෙන් ගැවසීගත්තාවූ මැණික්මයවූ කඩුමිටින් විසිතුරුවූ විදුලිය කලඔක් වැනිවූ කඩුව තිරිප්පුකොට පත්තිම්බ්‍යයේ බැස එති, තපස්වීන් වහන්ස! මේබඳු ඛඩ්ගපත්‍රයක් ගෙන යුඩයට නික්මුණු වරම්රජදරුවක්හු මෙන් එන්නාවූ මූ තුමූ කෙසේවූ කෙනෙක්ද? තවද තපස්වීන් වහන්ස! රන්කම්හාරන ලද සප්තරත්නයෙන්විචිත්‍රවූ මොතවට කොට නිම්වනලද විසිතුරුවූකම්මතන විශෙෂ ඇති වහන් පයින්ගලවා භූඔවාන්සේට නමස්කාරකොට සිටියාවූ මොහු කවුරුදැයි විචාළහ. මෙසේ සාගරබ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් විචාරනලද සෘද්ධිමත්වූ අභිඥලාභීවූ තාපසයෝ පුත! මොහු ධෘතරාෂ්ට්‍ර චම්නාරජ්ජුරුවන්ගේ පුත්‍රවූ තොපගේ බැණාවූ නාරජ්ජුරුවෝයයි කියන්නාහු

සාඛ්‍යානුභාව ඇති මහත්වූ යශපිරිවරඇති මේ නාරජ්ජුරුවෝ නම් ධ්‍රතරාෂ්ට්‍ර නම් නාරජුරුවන් නිසා සමුද්‍රජාවන්ගෙන් උපන්නාවූ තොපගේ බෑණනුවූ නාරජුරුවෝයයි කීහ.

මෙසේ දෙදෙනා කථාකරමින් සිටියදීම නාගපෂීත් අවුත් තාපසයන් ගේ දෙපතුල් වැඳ එකත්පස්ව උන්නාහුය. සමුද්‍රජාවෝත් පියරජුරුවන්ට නමස්කාරකොට අඩා වැලප නාගපෂීත් හා සමඟ නාගභවනයට ගියාහ, සාගරබ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් රාජ්‍යතපස්වීන් සවමීපයෙහි කීපදවසක් වැස බරණැස් නුවරට ගියාහ. සමුද්‍රජාවෝ නාගභවනයේදීම සවගීසථවූහ, මහ බෝසතාණෝ දිවි පමණින් සිල් රකුණාකොට පෙහෙවස් වැස ජීවි. ාවසාන යෙහි නාගපෂීත් හා සමඟ ගොස් සවගීලොකයෙහි උපන්නාහ, ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධම්දෙශනාව ගෙනහැර දක්වා වදාරා උපාසකවරුනි! මෙසේ පුරාතනයෙහි නුවණැත්තෝ අබුඩෝත්පාද කාලයෙහිත් එඩිදුවූ නාගසම්පත්තියෙ හැර පෙහෙවස් විසුවෝමවේදැයි වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ භූරිදත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දෙමවුපියෝ නම් දැන් සුඩොදන රජ්ජුරුවන් හා මහාමායා දෙවිය, නෙසාදබ්‍රාහ්මණයානම් දෙවදත්තසථවිරයෝය, සොමදත්තයෝනම් ආනන්දසථවිරයෝය, අච්චිමුඛිනම් උත්පලවණ්ණා මහාසථවිරිය, සුදශීනයෝනම් ශාරිපුත්‍ර සථවිරයෝය, සුභගයෝ නම් මහාමොඳ්ගල්‍යායන සථවිරයෝය, කාණාරිඨයෝ නම් සුනකඛත්ත නම් ලිච්ඡවිපුත්‍රය, එසමයෙහි ජීවිතය පරිත්‍යාගකොට පෙහෙවස් ඉටා උපොෂථ ශීලය රකුණාකළාවූ භූරිදත්ත නාරජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙමිදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

භූරිදත්ත ජාතකය නිමි.

විධුර ජාතකය.

තවද එක් සමයෙක්හි ජානිකාන්තාරාදියෙන් සත්වයන් තරණයකොට නිර්‍වාණ ක්ෂෙමභූමියට පමුණුවනහෙයින් ශාස්තෘනම්වූ බුදුරජාණන්වහන්සේ සුගන්ධ ද්‍රව්‍යයෙන් නිරන්තරවූ ඡායූදක සම්පන්න රම්‍යභූමිභාගඇති ජෙතවන මහා විහාරයෙහි වැඩවසනසේක් සවී බුඩකෘත්‍ය කරණයෙහි විභඩාක්‍රියා ලක්ෂණ භවානන්තරගතවූ ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් හිරු අස්තාචලගත වේලෙහි ශීලස්කන්ධ ප්‍රඥාදියෙක ප්‍රකාරගුණ ප්‍රතාපාලඩකෘත ත්‍රිභවෙකවරවීරු දෙහත්‍රිසාර විරාජිතාශෙෂ දෙශාඩිකාර ප්‍රකීර්ණ සවීඥ බුඩානුබුඩ තපොනිධාන මහාකාශ්‍යප සථවිර ප්‍රමුඛ භික්ෂූහු තමන්තමුන් වහන්සේ වසන කුටාගාර පරිවේණාදි රාත්‍රිස්ථාන දිවාස්ථානයෙන් අවුත් සංග්‍රාම භූමියකට නානාස්ථානයෙන් සන්නඹව රැස්

වන්නාවූ සුවිනීත යුඛස්‍රම යොධහටයන්සේ මණිකාවවයෙහි සන්නාඛ අලඛෘත ගඛිඝස්තින්සේ සඛ්‍යාඝ්‍රන ප්‍රභාබද්ධ සුවිශුඛ පාංශුකූල චීවරධරව බ්‍රහ්මාමරනරනාඝ නයනරසායනව අලඛෘතවූ ධර්මසභායෙහි ශාස්‍රාගමනය බලමින් සුධර්මා නම් දිව්‍යසභායෙහි රැස්ව උන් දිව්‍යසමූහයක්සේ බුඛාසන්නය පිරිවරාහිද සර්ඥයන් වහන්සේගේ ප්‍රඥාපාරමිතාව වර්ණනාකරනසේක්, ඇවැත්නි! සර්ඥයන් වහන්සේ මහත්වූ අර්ථධර්ම නිරුකනිප්‍රතිභාන ශීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්තිඥන දර්ශනසකඛ්‍යයන් හා මහත්වූ සථානාසථාන විහාර සමාපත්ති ආර්‍යසත්‍ය සම්‍යක්ප්‍රධාන ඍර්ධිපාද ඉන්ද්‍රියබල බොඛ්‍යඞ්ග ආර්‍යමාර්ග ශ්‍රාමාණ්‍යඵල අභිඥ නිර්‍වාණ ප්‍රතිවෙධ කළහෙයින් අගාධවූ අපාරවූ මහාසාගරයසේ අතිගම්භීරවූ දුරවගාහවූ සම්පූර්ණවූ මහත්වූ ඥානඛ්‍යාති ඇතිසේක.

නානාප්‍රකාර ධාත්වායතන ප්‍රතීත්‍යසමුත්පාද ශූන්‍යතා අර්ථධර්ම නිරුකනි ප්‍රතිභාන ශීලසමාධි ප්‍රඥාවිමුක්ති විමුක්තිඥනදර්ශනසකඛ්‍යාදියෙහි ප්‍රවෘත්තවූ ඥානගති ඇතිහෙයින් නානාප්‍රකාර ප්‍රඥ ඇතිසේක. භාසුබහුලවූ ප්‍රඥ ඇතිසේක. අතීතානාගත ප්‍රත්‍යුත්පන්න ආධ්‍යාත්මික බාහ්‍යඕදාරික සූක්ෂ්මගත ප්‍රණීත දූරසන්තිකවූ රූපයන් හා සියලු වේදනා සංඥ සංස්කාර විඥන යන පඤ්චස්කන්ධයෙහි අධිකවූ ජවන හංසගතියක් මෙන් අනිත්‍යාදි වශයෙන් ශීඝ්‍රව දිවන්නාවූ ඥානගති ඇතිහෙයින් ජවන ප්‍රඥයෙන් යුක්තවන්සේක. උත්පන්න කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසා විතර්කයන් හා අවශෙෂ අකුශල ධර්මයන් අනුත්පත්තිවශයෙන් ප්‍රහානයකළහෙයින් හා චතුර්විධමාර්ග ශ්‍රාමාණ්‍ය ඵල ප්‍රතිසම්භිද පඤ්චාභිඥවන් සාක්ෂාත් කළහෙයින් හා ජීර්ණපර්ණපුටයෙහි අස්ඛලිත ප්‍රවෘත්ත සංදීපනී අයශ්ඡලඝර්මෙන් සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්‍වාණ, ප්‍රඥප්ති ඇත පඤ්චප්‍රකාර ඥෙයමණ්ඩලයෙහි ප්‍රවෘත්ත ඥානගතිඇතිහෙයින් බුදුහු තීක්ෂණප්‍රඥ ඒතිසේක.

සියලු සංස්කාරයන් කෙරෙහි උවෙග බහුලව උත්ත්‍රාස බහුලව උත් කණ්ඨාබහුලව අනිර්‍වේදපූර්‍වවූ අප්‍රදලිතපූර්‍වවූ ලොභ වෙෂ මොහ ක්‍රොධොපනාහමක්ෂපලාස ඊර්ෂ්‍යාමාත්සර්‍යෂ්‍ය මායාසාඨෙය්‍යස්තම්භ සාරම්භ මානාතිමාන මදප්‍රමාදාදිවූ සකලක්ලෙශයන් උන්මූලනයකොට විනිවිද ප්‍රදලනයකොට පවත්නාවූ මහාවජ්‍රඥානයෙන් යුක්තහෙයින් බුදුහු විනිවිද පවත්නාවූ ඥාන උත්තනිගති ඇතිසේක. තමන්වහන්සේගේ ප්‍රඥානුභාවයෙන් ක්ෂාන්‍රිය පරිඛ්‍රාජකාදීන් ඥානයෙන් සකස්කොටසිතනලදසූක්ෂ්මවූප්‍රශ්නයන් විසඳීනයකොට ඒ ක්ෂාන්‍රියාදීන් දමනයෙහි ලා ඔවුන් සන්තානගතවූ ක්ලෙශ නමැති විෂ විනාශ කොට ශරණශීලයෙහිත් පඤ්චශීලයෙහිත් පිහිටුවා නිර්‍වාණගාමීවූ මාර්ගයට පැමිණවූසේකැයි මෙබඳු කථාවක් උපදවා වැඩහුන්සේක.

එකල්හි ලොකඛ්‍යාමීවූ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ සඛ්‍ය සුරභි ගන්ධප්‍රඝ්පොපහාරාදියෙන් සම්පාදිත භූමිභාගඇති සුගන්ධවූ ගන්ධකුටියෙහි වැඩහුන්සේක් ධර්මසභායෙහි ප්‍රවෘත්තවූ කථාව දිවකර්ණින් අසාවදාරා ගඳකිළි පිරිවෙනින් නික්ම භූත්වරා ගමනින් එක්වරාගමනාක්‍රමින් ධර්මසභාමණ්ඩපයට වැඩ පනවනලද බුඛාසන මස්තකයෙහි උදය සූර්‍යයා මෙන් වැඩහුන්සේක් අනල්ප කල්පකොටියක් මුලුල්ලෙහි පුරනලද වාක් සුචරිතානුභාවයෙන් සුගන්ධවූ චතුර්ජාතිකගන්ධ සම්පූර්ණවූ සුගන්ධභාරණ්ඩයක් විවෘතකරන්නාක්මු

මෙන් මනහරවූ බුබපද්මය විවෘතකොට සකල ධර්මසභාව එකපැහැර සුවඳ කෙරෙමින් මහණෙනි! දැන් මේ ධර්මසභායෙහි මා එන්නාට පූර්භාගයෙහි කවරකථාවකින්යුක්තව රැස්වුන්නාහුදැයි මත්තෙහි දෙශනාවආරම්භකරනු පිණිස විචාරා තොපට නොනිමි කථාවක් ඇත්තම් ඒ මාගේ අනන්‍ය සාධාරණවූ සර්ව්ඥතාඥානයෙන් නිමවා දෙමියි සිතා ආහ්, කැමැතිවුව විචාරවයි මෙසේ ශ්‍රාවක ප්‍රත්‍යේකබුඩයන්ට අසාධාරණවූ සර්ව්ඥප්‍රවාරණයෙන් පැවරූ කල්හි තමන්වහන්සේගේ හෘදයට අමෘතාභිෂේකයක් බඳුවූ ප්‍රේමණීයවූ කර්ණරසායනවූ සවරයෙන් වදාළ තෙපුල් ඇසූ ඒ භික්ෂූහු සවාමීනි! නුඹවහන්සේ විසින් ප්‍රතික්ෂිප්තවූ රාජකථාදීවූ එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹවහන්සේගේ ප්‍රඥාපාරමිතාව වර්ණනාකොට කොට උනුම්හයි කීකල්හි, මහණෙනි! සර්ව්ඥවරයෝ උතුම්වූ සම්‍යක් සම්බෝධියට පැමිණ පරවාදීන් බිඳ ක්ෂත්‍රියාදීන් විනයනය කොළෝය, යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්‍ය්‍ය නොවන්නේය. පූර්ව්ජන්මයෙහි සර්ව්ඥතාඥාන ප්‍රතිවේධය නිසා පාරමිතා ධර්මයන් පුරන්නාවූ සර්ව්ඥවරයෝ ප්‍රඥාවන්තයෝමය. පරවාදීන් මථනය කොළෝමය. ඒ එසේමය, මම වූකලී විධුර කුමාර කාලයෙහි සැටයොදුන් උස ඇති කාළගිරි පර්වතමස්තකයේදී පූර්ණක නම් යක්ෂසෙනාධිපතිහු මාගේ ප්‍රඥාබලයෙන්ම දමනයෙහි ලා ඔවුන් සන්තානගතවූ මානමදීනය කිරිමෙන් කෙලශතමැති විෂ විනාශකොට ඔවුන්ගෙන් මම ජීවිතදානය ඇරගත්තෙම් වේදැයි වදාරා ඒ ආශ්චර්‍ය්‍ය ශ්‍රවණයෙහි කෞතූහල සිත් ඇති භික්ෂූන් විසින් ආරාධිතවූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ එනාග්‍රවූ භික්ෂූ පර්ෂදද තමන්වහන්සේගේ ශබ්ද ශ්‍රවණයෙහි අභිලාෂා ඇතිබව දැන භිමිගහී යක් ප්‍රදීපනයකොට වඳුබිම්බයක් ගෙනහැර පාන්නාක්හු මෙන්ද, කඩතුරුවක් පහකොට විවිත්‍රවිත්‍ර කර්ම්මාන්තයක් දක්වන්නාක්හු මෙන්ද, භූමිගතවූ නිධිකුම්භයක් නහා පාන්නාක්හු මෙන්ද, මහා ජම්බුවෘක්ෂය මූල ශුද්ධ සලන්ත්‍යාක්හු මෙන්ද, පොළෝතෙලෙහි ඔජස් පෙරළා ගෙනහැර පානා එකාක්හු මෙන්ද, යොජන ප්‍රමාණවූ මධුපටලයක් චක්‍ර යන්ත්‍රයෙන් පෙළා මධුපානය කරවන්නාක්හු මෙන්ද, චතුකුණ්ඩාපලක්ෂිතවූ ගෘහයෙක්හි ප්‍රදීප සහශ්‍රයක් දල්වන්නාක්හු මෙන්ද, පාංශුප්‍රච්ඡන්න ජාතිරඹඹ මාණික්‍යායක් දක්වන්නාක්හුමෙන්ද, භෂම ප්‍රච්ඡන්නාවූ ජාතවෙදයක් දක්වන්නාක්හු මෙන්ද, භාවානන්තර ප්‍රච්ඡන්නාවූ ප්‍රඥාපාරමිතාව ප්‍රකාශකරන්නාවූ සර්ව්ඥයන් වහන්සේ අතීත කාලයෙහි ප්‍රවෘත්තවූ කථාසවරූපය ගෙනහැර දක්වා වදාළසේක.

යටගියදවස කුරුරට ඉඳිපත්නුවර ධනඤ්ජයකෞරව්‍යනම් රජ්ජුරුකෙන කුන් දැන ප්‍රිය වචන අව්වයෂ්‍ය සමානාත්මතායයි කියනලද සතර සංග්‍රහ වස්තුයෙන් ජනරඤ්ජනය කෙරෙමින් දශරාජධර්මයන් අකොප්‍යකොට රාජ්‍යය කරන කල්හි විධුර පණ්ඩිත නම් අමාත්‍යයෙක් ඒ රජ්ජුරුවන්ට අව්වයෙන් ධර්මයෙන් ආනුශාසනාකරන්නේය. ඒ විධුර පණ්ඩිතතෙමේ මිහිරිවූ කථා ඇත්තේය. මහාධර්මපිඨය. සියලු ජම්බුව්පයෙහි රජදරුවන් හස්තිකාන්තමණි සවරයෙහි ප්‍රලුබ්ධවූ හස්තීන්මෙන් තමාගේ මධුර ධර්මදෙශනායෙන් ප්‍රලොභනය කොට ඒ ඒ රජදරුවන්තමන් තමන්ගේ රාජධානිවලට යානොදී සර්ව්ඥ ශීලාසයෙන් මහජනයාට ධර්මදෙශනා කරමින් මහත්වූ යශශ්‍රී සම්පත්ත්‍යෙන් යුක්තව ඒ නුවර වාසය කරන්නේය.

එසමයෙහි බරණැස්නුවර ගිහි ගත්වූ බමුණු මහසල්කුලයෙහි උපන් තාවූ බ්‍රාහ්මණයෝ සතරදෙනෙක් කාමයෙහි ආදීනව දැක හිමාලය වනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ට සමාපත්තීන් උපදවා වනමුල් වනඵලාඵල අනුභවකොරෙමින් එහිම බොහෝකල් වැස ලුණු ඇඹුල් සෙවුනා පිණිස සැරිසරා ඇවිදිනාහු අහුරට කාලඉමපා නම් නුවරට පැමිණ රාජොද්‍යානයෙහි වැස දෙවැනි දවස් නුවරට පිඬු සිඟා වන්හ.

ඒ නුවර ගත්වූ කෙළෙඹි පුත්‍රයෝ සතරදෙනෙක් ඒ තපස්වීවරයන් සතරදෙනාගේ සථානතිසඤ්ඤිවූ ඊර්ෂ්‍යාපථයෙහි පැහැද නමස්කාරකොට භික්ෂාභාජන ගෙන එහි එහි තපස්වී කෙනකුන් තමන් තමන්ගේ ගෙයිදී උතුම්වූ මධුරාහාරයෙන් වළඳවා ප්‍රතිඥ ගෙන උයනෙහිම වැස්වූහ. තාපස වරු සතරදෙන කෙළෙඹි පුත්‍රයන් සතරදෙනාගේ ගෙයිදී වළඳා දිවා විහාර පිණිස එක්කෙනෙක් තවතිසා භවනයට යන්නාහ. එක්කෙනෙක් නාගභවනයට යන්නාහ. එක්කෙනෙක් ගරුඩභවනයට යන්නාහ. එක් කෙනෙක් ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවන්ගේ මිගාරුවි නම් උද්‍යානයට යන්නාහ. ඔවුන් සතරදෙනාගෙන් යම් කෙනෙක් දිව්‍යලොකයට ගොස් දිවාවිහාර කෙරෙත් නම් ඒ තපස්වී ශක්‍රදෙවෙන්ද්‍රයන් යශස් බලා තමන්ගේ උපස්ථායනයාහට එම වණීණනා කරන්නාහ. යම්කෙනෙක් නාගභවනයට ගොස් දිවා විහාරකෙරෙත්නම් ඒ තපස්වී නාරජ්ජුරුවන් සම්පත් බලා තමන්ගේ උපස්ථායකයා හට එම වණීනා කරන්නාහ. යම් කෙනෙක් ගරුඩභවනයට ගොස් දිවා විහාරකෙරෙත් නම් ඒ තපස්වී ගරුඩ රජ්ජුරුවන්ගේ ශ්‍රී විභූතිය බලා තමන්ගේ උපස්ථායකයාහට එම වණීනා කරන්නාහ. යම් කෙනෙක් කොරව්‍ය නම් රජ්ජුරුවන්ගේ උයනෙහි දිවා විහාර කෙරෙත් නම් ඒ තපස්වී ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ ශ්‍රී සෞභාග්‍යය බලා තමන්ගේ උපස්ථායකයාහට එම වණීනාකරන්නාහ.

එබස් අසා ඒ කෙළෙඹි පුත්‍රයෝ සතරදෙනම ඒ ඒ තැන් පතාදෙනාදිවූ පින්කම්කොට ආයුෂයාගේ කෙළවර එක් කෙනෙක් ශක්‍රදෙවෙන්ද්‍රව උපන්නාහ. එක්කෙනෙක් ප්‍රත්‍යූරුවන් හා සමඟ නාගභවනයෙහි උපන්නාහ. එක්කෙනෙක් ගරුඩභවනයෙහි ගුරුළු රජව උපන්නාහ. එක්කෙනෙක් ධනඤ්ජය කොරව්‍යරජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව කුසපිළිසිඳගත්තාහ. ඒ තාපසයෝ සතරදෙන බ්‍රහ්මලොකයෙහි උපන්නාහ. කොරව්‍යකුමාරයෝ මවුකුසින් බිහිව වැඩිවිය පැමිණ පිය රජ්ජුරුවන් ඇවැමෙන් රාජ්‍යයෙහි පිහිටා දැනැමෙන් රාජ්‍යකළහ. දූහෙළිය සැපත්කොට එහි සතුටුවවසන්නාහ. ඒ රජ්ජුරුවෝ විධුර පණ්ඩිතයන්ගේ අවවාදයෙහි පිහිටා දන්දෙති. සිල් රකිති. පෙහෙවස් වෙසෙති.

ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ උපෝෂථ ශීලය සමාදන්ව විවෙකව වසමිසි උයනට ගොස් සිත්කලුවූ තැනෙක හිඳ මහණදම් කළහ. ශක්‍රදෙවෙන්ද්‍රයෝත් තමා සමාදන්වූ පෙහෙවස් ඇත්තාහු දිව්‍යලොකයෙහි පළිබොධ වන්නේයයි මනුෂ්‍යලොකයෙහි මිගාරුවිනම් උයනට ගොස් සිත් කලුවූ තැනෙක හිඳ මහණදම් කළහ. වරුණ නම් නාරජ්ජුරුවෝත් සමාදන්වූ පෙහෙවස් ඇත්තාහු නාගභවනයෙහි පිළිබොධ වන්නේයයි එම උයනට ගොස් සිත්කලුවූ තැනෙක ඉඳ මහණදම් කළහ. ගරුඩ රජ්ජුරු

වෝත් සමාදන්වූ පෙහෙවස් ඇතිව ගරුඬභවතයෙහි පිළිබොධ වන්නේයයි එම උයනට ගොස් ඇලෙන තැනෙක හිඳ මහණදම් කළහ. ඔහු සතරදෙනම සවස්වේලෙහි තමන් තමන් උන් තැනින් නික්ම මහුල් පොකුණු තෙරදී එක් තැන් වූවාහු ඔවුනොවුන් දැක පූර්ව සෙනෙහ වශයෙන් සමඟ සතුටුව ඔවු නොවුන් කෙරෙහි මෛත්‍රීඵලවා මිහිරිවූසුවඳුක් කථාකොට ශක්‍රදෙවෙන්ද්‍රයෝ ටහුල් සලවට මත්තෙහි උන්හ. අන්‍යවූ තුන්දෙනාත් තමන් තමන් ඉඳි තට සුදුසුවූ තැන් බලා උන්හ.

එකල්හි ඔවුන් තුන්දෙනාට ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නෝ අපි සතර දෙනම රජදරුවෝය, අප සතරදෙනාගෙන් කවුරුන්ගේ ශීලය මහත්දැයි කිහ. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයාණන්ට වරුණ නම් රජ්ජුරුවෝ කියන්නෝ තොප තුන්දෙනාගේ ශීලයට වඩා මාගේ ශීලය මහතැයි කිහ මීට කාරණා කවරේදැයි කිකල්හි මේ ගරුඬ රජ්ජුරුවෝ වූකලී උපන්නාවූත් නූපන්නා වූත් අප හැමදෙනාහටම පසම්තුරුව සිටියාහ. මම මෙබඳු අප හැමගේජීවිත ක්ෂය කරන්නාවූ පසම්තුරා දැක දැකත් කොප නොකෙරෙමි. මේ කාරණා යෙන් මාගේ ශීලය මහතැයි කියා තමන්ගේ ශීලයට ප්‍රශංසාකරන්නාහු මෙසේ කිහ. ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් අතරෙන් යම් සාධු ජනයෙක් තෙමේ කොප කටයුතුවූ පුද්ගලයා කෙරෙහිහා චෙතොත්පතතියට සුදුසුවූ ඒඒ වස්තු යෙහි ක්ෂාන්තිවාදී තාපසයන් මෙන් කොප නොකෙරේද, නැවත නැවත සත්පුරුෂතෙමේ කිසිකලෙකත් නොකිපෙන්නේමය වාසනා සහිතවූ කෙලෙස බලයෙන් ඉදින් කිපුනේවී නමුත් සවසන්තානවර්තිවූ කොපය බොධිරාජ කුමාරයන්මෙන් අනුන්ට පහළ නොකෙරේද,සබ්බලොකයෙහි මෛත්‍රීක්ෂමෝ පසමාදියෙන් යුකතවූ එබදුපුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සම්මත පාපයන් ඇති හෙයින් ශ්‍රමණයයිකියති. එසේහෙයින් මෙකී ගුණයෝ මා කෙරෙහි ඇත්තාහ. එබැවින් මාගේ ශීලයම මහත් වන්නේයයි කිහ.

එබස් අසා ගරුඬ රජ්ජුරුවෝ කියන්නාහු මේ නා රජ්ජුරුවෝ ට අග්‍ර භොජනය සිටියහ. යම්හෙයකින් මම මෙබඳුවූ අග්‍ර භොජනය දැක දැකත් ක්ෂුධාව ඉවසාගෙන ආහාරය නිසා පාපයක් නොකෙරෙමිද, එසේහෙයින් මාගේ ශීලය යහපත් වන්නේයයි කියා තමාගේ ශීලය වර්ණනාකරන්නාහු යම් පුරුෂයෙක් තෙමේ සාකුස් ඇතිව ක්ෂුධා දුඃඛය ඉවසාද ඉන්ද්‍රිය දමනයෙන් සමන්විතද, ශීලසමාපත්තිතපනිශ්‍රිත වන්නේද, ආහාරාදී ප්‍රතිග්‍රහණයෙහි මාත්‍රඥව පමණින් යුකතවූ ආහාර පානවලින් අනුභවකෙරේද, ඉතා සාකුස් ඇත්තේ වීනමුත් අනුභව කටයුතුවූ ආහාරපානාදිය නිසා දම් සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ මෙන්ම ලාමක ක්‍රියාවක් නොකෙරේද, සබ්බලොකයෙහි මෙබඳුවූ සම්‍යක් ආජීවයෙන් යුකත වූ පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සම්තපාපයන් දැනි හෙයින් ශ්‍රමණයයි කියති. මම වුකලී ආහාරය නිසා පාපකර්මයක් නොකෙරෙමි. එසේ හෙයින් මාගේ ශීලය මහතැයි කිහ.

ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රයෝ කියන්නාහු මම්වුකලී නොයෙක්සැප යට පිහිටවූ දිව්‍යලොක සම්පත්තිය හැර සිල් රක්නා සඳහා මනුෂ්‍යලොකයට ආමි.එසේහෙයින් මාගේ ශීලය මහතැයිකියා තමන්ගේශීලය වර්ණනාකරන්නාහු යම් සත්වයෙක් සබ්බලොකයෙහි කායික වාචසික සියලු ක්‍රියාව හා දිව්‍ය

පඤ්චකාම ගුණයෙහි ඇලුම් දුරුකොට සවලපවූත් බොරුවක් නොකියාද, කෙලෙසොත්පත්තියට හෙතුවූ විමාංසභූතණය ජවිවිභූතණය යන මේ විවිධවූ විභූතණයෙන් විරමණ වශයෙන් දුරුවීද, එහි අනුභව කටයුතුවූ ව්‍යඤ්ජන සහිතවූ ප්‍රණීතාහාරය මාංස විභූතණය නම් වෙයි. මල් සුවඳ හා වස්ත්‍රාභරණාදිය ජවි විභූතණය නම් වෙයි. යම් අකුශල චිත්තයකින් ඒ මාංස විභූතණය ජවි විභූතණය යන දෙක යම් සවියෙක් කරන්නේ වීනම් ඒ විභූතණය ය ඒ සවියාගේ කෙලෙසොතපත්තියට කාරණා වන්නේය. එසේහෙයින් එබදුවූ විභූතණයෙන් දුරුවීද, අන්‍යෝන්‍ය රඤ්ජන සවභාවවූ මෛථුනසෙවනයෙනුත් දුරුවීද, ස්ත්‍රීඛාරති මෘෂාවාද විභූතණ මෛථුනාදි අකුශල ධර්මයන් දුරුකිරීමෙන් යුකතවූ මෙබදුවූ පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සම්මත පාපයන් ඇති නෙසින් ශ්‍රමණයයි කියති. මම වූකලී අද දිව්‍යප්සරාවන් හැර මෙතැනට අවුත් මහණදම් නොරෙම්. එසේහෙයින් මාගේ ශීලය මහතැයි කියා වර්ණනා කළහ.

එවස් අසා ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ මම අද මහත්වූ අනෙක ප්‍රකාරවූ වස්තු කාමය හා සොළොස් දහසක් නාටක ස්ත්‍රීන්ගෙන් සම්පූර්ණවූ අන්තඃපුරය හැර මේ උද්‍යානයෙහි මහණදම් කෙරෙමි. එසේ හෙයින් මාගේ ශීලය මහතැයි කියා තමන්ගේ ශීලය වර්ණනා කරන්නාහු මේ ලොකයෙහි යම් නෙනෙක් අනෙක ප්‍රකාරවූ සියලු වස්තු කාමය හා එම වස්තු කාමය විෂය කොට පවත්නාවූ තෘෂ්ණා නැමැති සියලු කෙලෙස කාමය ඤාතතීරණ ප්‍රහාන පරිඥා වශයෙන් දැන යථොක්තවූ වස්තු කාම කෙලෙස කාමයන් හැර නිරපෙක්ෂව නැගීයේද, එවැන්නවුන්ට ප්‍රාඥයෝ ශ්‍රමණයයි කියති. මේ ස්කන්ධාදීන්ගේ සවභාවය දැන්ම ඥාතපරිඥා නම් වේ, පඤ්චස්කන්ධාදියෙහි නුගුණ පරිඤ්ඤාකොට නිරණය කිරීම තීරණ පරිඥා නම් වේ. ඒ පඤ්චස්කන්ධාදීන්ගේ දෙෂ දැන ඡන්දරාගය දුරුකිරීම ප්‍රහාන පරිඥා නම් වේ. මෙබදු ත්‍රිවිධවූ පරිඥාගෙන් විශෙෂ වශයෙන් පිරිසිඳ දැන වස්තු කාමකෙලෙසකාමයන් හැර යම් කෙනෙක් නිරපෙක්ෂව නැගියේද්ද, එබදුවූ මහොත්තමයන්ටත් ප්‍රාඥයෝ ශ්‍රමණයයි කියති. යම් සවියෙක් කොපත් තොවී ඉන්ද්‍රිය දමනයෙන් යුකත මිථ්‍යා විතර්කාදීන්ගේ අභාවයෙන් අකම්ප්‍ය සවභාව ඇත්තේද, ධනධාන්‍යාදියෙහි මමය මාගේය යන තෘෂ්ණාව නැත්තේද, පුත්‍රදාරාදීන් කෙරෙහි ඇල්මෙක් නැත්තේද, වස්තු කාමය දුරුකොට දැන්ත ගුණයෙන් යුකතවූ මෙබදු පුරුෂයා එකාන්තයෙන් ප්‍රාඥයෝ සම්මත පාප ඇති නෙසින් ශ්‍රමණයයි කියති. අද මම්මහත්වූ ඓශ්වර්‍යය හැර මේ උයන්හි මහණදම් කෙරෙමි. එහෙයින් මාගේශීලය මහත්යයි ඒ ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ තමන්ගේ ශීලය වර්ණනා කළහ.

මේසේ ඔහු හැමදෙනම තමන් තමන්ගේ ශීලයම මහතැයි වර්ණනා කොට ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවන් විචාරන්නාහු මහරජ්ජුරුවෙනි! යමෙක්අපගේසිතවඋපන්නාවූ සැකදුරුකරන්නේවීනම් එබදුවූ කිසි පණ්ඩිත කෙනෙක් තොව සවමීපයෙහි ඇද්දැයි විචාළහ. එසේය රජදරුවෙනි! මට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන්නාවූ ප්‍රඥයෙන් තමන් හා සමධුරයක් ඇති කෙනකුන් ලොකයෙහි නැතිහෙයින් අසමධුරවූ විධුරනම් පණ්ඩිත කෙනෙක් ඇත. ඒ පණ්ඩිතයෝ අපගේ දෙනාගේ ශාඛා දුරුකරන්නාහ. එසේහෙයින් උන් සවමීපයට යම්හයි කොරව්‍ය රජ්ජුරුවෝ කීහ. ඒ ශක්‍රාදි තුන්දෙනා රජ්ජුරුවන්ගේ බස් යහපතැයි ගිවිස්සාහ.

ඉක්බිත්තෙන් ඔහු සතරදෙනම උඇතින් නික්ම ධර්ම සභාවට ගොස් ධර්ම සභාව දිව්‍ය විමානයක් මෙන් මොනවට සරහා බොධිසත්වයන් උතුම්වූ පඤ්චඛකාමධ්‍යයෙහි හිඳුවා පිළිසඳර කථාකොට එකත්පස්ව උන්නාහු පණ්ඩිතයෙනි! අපට සාංකායෙක් උපන. අපගේ ඒ සාංකාව දුරුකරවයි කියා විවාරන්නාහු අලාමකවූ උතුම්වූ නුවණැත්තාවූ සියලු සාඛ්‍යයෙහි නියුක්තවූ අමාත්‍යයාණන් අතින් සාංකා කාරණයන් විවරමිහ. ඒ කියව අපගේ ශිල විවාද වශයෙන් ප්‍රවෘත්ත සංසව උපන්නාවූ විවාදයෙක් ඇත. ඒ සංකාව හා නැවත නැවත උපදනාවූ සැකය මෙබඳුවූ රාජ සමාගමය ඇත්තාවූ අද වජ්‍රායුධයෙන් මහමෙර කපන්නාක්හු මෙන් තීක්ෂණවූ ප්‍රඥා නමැති වජ්‍රායුධයෙන් සිඳ අපට උපන් සාංකා දුරුකරව, අපි හැමදෙනම තොප කරණකොටගෙන අපට උපන්නාවූ සංසය අද දුරුකොට සැකනැතිවම්හයි කිහ.

මහබෝසතාණෝ ඔවුන්ගේ බස් අසා මහරජ්ජුරුවෙනි! තොප හැම දෙනාගේ ශිලය නිසා උපන්නාවූ විවාද කථාව යහපත් කොට කී නියාවත් නපුරුකොට කී නියාවත් කෙසේ දනිම්දැයි කියන්නාහු මෙසේ කිහ. ජනප්‍රධානවූ රජදරුවෙනි! යම් ප්‍රාඥකෙනෙක් ශුභාශුභාදීක්නට සමර්ථවෙත්ද, ඒ ප්‍රාඥයෝ යුකත ප්‍රාප්ත කාලයෙහි ශිලවිවාදයක් කිකල්හි නුවණින් යෙදී ඒ ශුභාශුභ අර්ථයන් කියන්නාහ. දක්ෂවූත් ඒ ප්‍රාඥයෝ ප්‍රකාශකොට කියන ලද්දාවූ තොපගේ ශිල විවාදයන්ගේ ශුභාශුභ අර්ථය ප්‍රකාශ කරන්නාහ. දක්ෂවූ ඒ ප්‍රාඥයෝ ප්‍රකාශකොට නොකියන ලද්දාවූ තොපගේ ඒ ශිල විවාදයන්ගේ ශුභාශුභ අර්ථය කෙසේනම් නුවණින් පරීක්ෂාකොට කියද්ද, එසේ හෙයින් මේ කාරණය වූකලී මට කියව. රජදරුවෙනි වරුණ නම් නා රජ්ජුරුවෝ කෙසේ තමන්ගේ ශිලය උතුමැයි කියද්ද? විනතාවගේ පුත්‍රවූ ගුරුළු රජ්ජුරුවෝ කෙසේ කියද්ද? සක්දෙවි රජ්ජුරුවෝ කෙසේ කියද්ද? කුරුරට වාසින්ට ශ්‍රේෂ්ඨවූ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ කෙසේකියද්දැයි විමැළහ. එකල්හි මහබෝසතාණන්ට ඔහු හැමදෙන මෙසේ කිහ. පණ්ඩිතයෙනි! වරුණනම්නාරජ්ජුරුවෝ කොප කටයුතුවූ පුද්ගලයාකෙරෙහි අවෙහ සංඛ්‍යාතවූ අධිවාසන ක්ෂාන්තිය වර්ණනා කෙරෙති. විනතා නම් ගරුඩ මාතාවගේ පුත්වූ ගුරුළු රජ්ජුරුවෝ අල්පාහාර සංඛ්‍යාතවූ ආහාර හෙතු පාපියාගේ අකාරණය කියති. ශක්‍රදෙවෙන්ද්‍රයෝ පඤ්චකාමරතියගේ ප්‍රහානය කියති. කුරුරට වාසින්ට ශ්‍රේෂ්ඨවූ ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ වසතුකාම කෙලෙසකාමයෙහි නිරපෙක්ෂබවයයි කියනලද නිෂ්පළිබෝධය කියති. ඔවුන් සතරදෙනාගේබස්අසාමහබෝසතාණෝකියන්නාහුරුජෙන්ද්‍රයෙනි! තොපගේ මේ වුකනප්‍රකාර සියලුගුණයෝ තොප හැමදෙනාවිසින් කියනලදහ. කිතියා යහපත, මේ ශිල විවාදයෙහි නපුරුකොට කියනලද්දාවූ කිසිවෙක් නැත, තොප හැමදෙනම කී නියාව යහපත, ගැල්නැබෙහි මනාකොට පිහිටියාවූ දෑවිපරිද්දෙන්ම මේ යථොකතාවූ ගුණයෝ යම් පුද්ගලයක්හු කෙරෙහි මොනවට පිහිටියාහුද, වුකනප්‍රකාරවූ චතුර්විධගුණධර්මයෙන් සමන්විතවූ පුද්ගලයා ප්‍රාඥයෝ සමිත පාපයන් ඇතිහෙයින් ලොකයෙහි ශ්‍රමණයයි කියති. මෙසේ මහබෝසතාණෝ සතරදෙනාගේම ශිලය එකඟකොට කිහ. එබස් අසා ශක්‍රාදීවූ සතරදෙන සතුටුව මහබෝසතාණන්ට සතුතිකරන්නාහු පණ්ඩිතයෙනි තෙපි සර්වඥයන්ට උත්තමය, තොපට වඩා උත්තරිතර කෙනකුන් ලොකයෙහි නැතිහෙයින් නිරුත්තරය, සුවරිත ධර්මය හා ප්‍රවේණී ධර්මය

රක්ෂාකරව, පාලි අර්ථ හා පාලිධර්මය දනුව, සුන්දරවූ ප්‍රඥ ඇත්ත! එසේහෙයින් වප්‍රයක්සේ ඉතා තියුණුවූ තොපගේ ප්‍රඥයෙන් අතිගැඹුරුවූ මේ ප්‍රශ්නය මෙයට කාරණා මේයයි විශාරදවූ බුද්ධීන් තත්ත්වයෙහින් දැන නිශ්චලවූ ගුණ ඇති තෙපි අප සිතට උපන් සැක දුරුකළහ. කුමක්මෙන්දයත්? දළවඩුවකු ඇත්දළ කපන්නාක්මෙන් සංකාව හා නැවත නැවත උපදනා සංසය සිදහැර සැක දුරුකළහයි මෙසේ ශක්‍රාදිවූ සතරදෙනම මහබෝසතාණන්ගේ ප්‍රශ්න විස්සර්ජනයෙන් සතුටුසිත්ඇතිව සතුතිකළහ. ඉක්බිත්තෙන් ඒ බෝධිසත්වයන්ට ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිවඳුහුල්කින් පූජාකළහ. ගුරුළු රජ්ජුරුවෝ රන්මාලාවකින් පූජාකළහ. වරුණ නම් නාරජ්ජුරුවෝ කණ්ඨමාණික්‍යයෙන් පූජාකළහ. ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ ගව සහශ්‍රයකින් පූජාකරන්නාහු පණ්ඩිතයෙනි! ගවයන් දහසක්ද ඒ ගවයන් දහස ප්‍රධානකොට ඇති නැතෙන්ට සුදුසුවූ ඇතකුද ආජානීය සෛන්ධව අශ්වයන් යොදනලද රථ දහසක්ද ගම්වර සොළොසක්ද යනමේ වුකතප්‍රකාර වස්තූන් තොපගේ මේ ප්‍රශ්න ව්‍යාකරණයෙන් සහතුෂ්ටවූ මම සතුටු පඬුරුකොට තොපට දෙමි කියා පූජා පිණිස දුන්හ.

ඉක්බිත්තෙන් ශක්‍රාදි සතරදෙන මහබෝසතාණන්ට පූජාකොට තමන්තමන් වසන්නාවූ ස්ථානයන්වම ගියහ. ඔවුන් සතරදෙනා අතරෙන් නාරජ්ජුරුවන්ගේ භාර්‍යාවූ විමලා නම් බිසවු ඒ වරුණ නාරජ්ජුරුවන්ගේ කරපලඳනාවූ කණ්ඨමාණික්‍යය නොදුන නාරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේගේ කණ්ඨමාණික්‍ය නොසිදුයි විචාළාය. එකල්හි වරුණ නම් නාරජ්ජුරුවෝ කියන්නාහු සොඳුර! චන්ද්‍රබ්‍රාහ්මණයාගේ පුත්‍රවූ විධුර පණ්ඩිතයන්ගේ ධර්මකථාව අසා ප්‍රසන්නාවූ සිත් ඇති මම කණ්ඨමාණික්‍යයෙන් පණ්ඩිතයන්ට පූජාකෙළෙමි. හුදක් මම් මහු නොවෙයි. ශක්‍රදෙවෙන්ද්‍රයෝත් පණ්ඩිතයන්ට දිවඳුහුලකින් පූජාකළහ. ගරුඩ රජ්ජුරුවෝත් රන්මාලායෙන් පූජාකළහ. ධනඤ්ජයකොරව්‍ය නම් රජ්ජුරුවෝ ගව සහශ්‍රාදියෙන් පූජාකළහයි කිහ. එබස් අසා විමලාවෝ දෙවයන්වහන්ස! ඒ විධුර පණ්ඩිතයෝ ධර්මකථා කයෝදැයිවිචාළහ. නාරජ්ජුරුවෝ කියන්නාහු සොඳුර! කුමක්කියවිද? සියලු දඹදිව බුබොත්පාදයක් මෙන් පැවැත්තේය. සියලු ජම්බුද්වීපයෙහි එයියයක් රාජධානියේ රජදරුවෝ ඒ පණ්ඩිතයන්ගේ මධුරවූ ධර්මකථායෙහි බැඳී හස්තික්‍රාන්ත විණාස්වරයෙහි බැඳී ලුබ්ධවූ මත්තහස්තීන් මෙන් තමන්ගේ රාජ්‍යවලට නොයන්නාහ. ඒ විධුර පණ්ඩිතයෝ මෙබඳුවූ ධර්මකථා ඇත්තෝයයි වර්ණනාකළහ. ඒ විමලා නම් බිසවු විධුරපණ්ඩිතයන්ගේ ගුණකථා අසාලන්ගෙන් බණඅසනුකැමැතිව සිතන්නාහු ඒ විධුරපණ්ඩිතයන්ගේ ධර්මකථාවඅසනුකැමැත්තෙමි. එසේහෙයින් ඒ පණ්ඩිතයන් මෙතැනටකැඳවා ගෙනඅවමැනවැයි ඉදින් මම්කියෙම්වීම්නම් පණ්ඩිතයන් මාසවමී පයට කැඳවා ගෙන නොඑන්නාහ. එසේහෙයින් මම මට දෙලක් උපනැයි ගිලන් ආකාරයක් කෙළෙමි වීම්නම් යනපත් වන්නේයයි සිතා එපරිද්දෙන් කොට පරිවාර සත්‍රීන්ට එපවත් කියා වැඳඔත්තාහු නාරජ්ජුරුවෝ උපස්ථාන වේලායෙහි ඒ විමලාවන් කොසිදුයි පරිවර සත්‍රීන් අතින් විචාරා දෙවයන් වහන්ස! ගිලන් සේකැයි කී කල්හි ඒ විමලාවන් සවමීපයට ගොස් යාන අස ඉඳ අත්ලෙන් ඇඟ පිරිමැදීමින් මෙසේ කිහ. විමලාදෙවනි! තෙපි දුඛිතාලාඨවණීව (සුදුමැලිව) ගියව. අනිකාශව සින්වගියව. වැහැරී අඟුන්නිව ගියවි, තොපගේ වණී

රූපසංඛ්‍යාතවූ ශරීර ලාවණ්‍යය මීට පළමු මෙබඳු නොවෙයි, පෙර තෙපි අනිඳිත අඞ්ගප්‍රත්‍යඞ්ග ඇතියව, දැන්වූකලී පෙරළී අමනොඥ සභාවයට පැමිණියෙව, එසේහෙයින් මාවිසින් විචාරනලද්දාවූ තෙපි මේ කාරණයකියව, තොපගේ ශරීරයට පීඩා කවරේද? රෝදුක් කවරේදැයි විචාළහ. එකල්හි විමලාවෝ නාරජුරුවන්ට තමන් ගිලන්ව වැදහොත් කාරණා කියන්නාහු ජනප්‍රධානවූ රජුරුවන් වහන්ස! සත්‍යයන් කෙරෙහි සත්‍රීන්ට දෙළ නම් දෙයක් සභාවයයි කියති. එසේහෙයින් නාගොත්තමයාණන් වහන්ස! දැහැමෙන් සෙමෙන් එළවනලද විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ප්‍රාර්ථනා කරමි. ඒ හෘදයමාංශය ලබන්නාවූ මම ජීවත්වෙමි. නොලබන්නාවූ මට මෙතැන්හිම මරණය වන්නේයයි කීහ. එබස් අසා නාරජුරුවෝ කියන්නාහු විමලාවෙනි! තෙපි කිසිවක්හු විසින් ලැබගත නොහැක්කාවූ, සදුට දෙළගතුව, එබදුවූ හිරුටත් දෙළගතුව, එසේවූම සුළඟටත් දෙළ ගතුව, ප්‍රාර්ථනායෙන් අසාධ්‍යවූ අසමධුරවූ විධුර පණ්ඩිතයන් ගෙනෙන්නා තබා දැක්මත් දුර්ලභවන්නේය. සියලු දඹදිව රජදරුවෝ ඒ විධුර පණ්ඩිතයන්ට ධාර්මිකවූ රක්ෂාවරණගුප්තියළුවා ඇවිදිති. කිසි සත්වයෙක් ඒ පණ්ඩිතයන් දැකගත නොහෙන්නේය. එසේහෙයින් ඒ නොලැබිය හැක්කාවූ විධුර පණ්ඩිතයන් මේ නාගලොකයට කවරහම් සූර පුරුෂයෙක් ඒ නුවර වාසීන් අභිභවා හැරගෙන එන්නේදැයි කීහ. විමලාවෝ එබස් අසා විධුර පණ්ඩිතයන් නොලබන්නාවූ මට මෙතැන්හිම මරණය වන්නේවේදැයි කියා නාරජුරුවන්ට පිටිපා ඇලයෙන් පෙරළී සළුකොතින් මුහුණ වසාගෙන වැදහොත්තාහ. එකල්හි නාරජුරුවෝ තමන්ගේ ශ්‍රියහන් ගබඩාවට වැද යහන්මත්තේ උන්නාහු විමලාවෝ විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙන්වනුම කැමැත්තේය. ඒ පණ්ඩිතයන්ගේ හෘදයමාංශය නොලබන්නාවූ විමලාවන්ගේ දිවි නොතිබෙන්නේය. එසේහෙයින් උන්ගේ හදවත නසේ ලැබේදෝහෝයි සිතූහ. එකල්හි ඒ වරුණ නම් නාරජුරුවන්ගේ දුවූ ඉරන්දතී නම් නාගකන්‍යාතොමෝ සහෝදරණයෙන් සැරහී මහත්වූ ශ්‍රී විලාශයෙන් නාරජුරුවන්ට උපස්ථානයට අවුත් පියරජුරුවන් වැද එකත් පස්ව සිටි තැනැත්තී වක්ෂුරාදි ඉන්ද්‍රියවිකාර දැක පියාණන් වහන්ස! නුඹවහන්සේ ඉතා දෙම්නසට පැමිණියේක. ඊට කාරණා කිමෙක්දැයි විචාරන්නී මෙසේ කීවාය. පන්සියයක් යොදුන් මාළිකා නාගභවනයට ඊශ්වරවූ නාරජුරුවන් වහන්ස! නුඹවහන්සේ ශොකාතුරව කුමක් සිතනසේක්ද? පෙර සෞම්‍යවූ නුඹවහන්සේගේ මේ මුහුණ දැන් පියුමක් මෙන් අතිශයින් මලානිකව ගියේය. පසමිතුරන් තවන්නාවූ නාරජුරුවන් වහන්ස! කුමක් නිසා දුර්මුඛවූ සවරූප ඇතිසේක්ද? නුඹවහන්සේ කායික්‍යයක් නිසා චිනම ශොක නොකළමැනවැයි කීවාය.

ඒ ඉරන්දතියගේ බස් අසා වරුණනම් නාරජුරුවෝ තමන් ශොක කරන්නාවූ කාරණා කියන්නාහු පුත ඉරන්දතිනි! තොපගේ මැනියෝ අස මධුරවූ විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය පතති. ඒ විධුර පණ්ඩිතයන් ගෙනෙන්නා තබා දැක්මද දුර්ලභවන්නේය. එසේ නොලැබිය හැක්කාවූ විධුර පණ්ඩිතයන් මේ නාගලොකයට කවරහම් වීරපුරුෂයෙක් ඒ නුවරවාසීන් කැමැති කරවා ඇරගෙන එන්නට සමර්ථදැයි කීහ. මෙසේ කියා ඉක්බිත් තෙන් නාරජුරුවෝ ඉරන්දතීට කියන්නාහු මැනියෙනි, මා සමීපයට

විධුර පණ්ඩිතයන් ගෙනෙන්නට සමර්ථ එකෙක්නම් නැත. තොපි තොපගේ මැනියන්ට ජීවිත දානය දෙව, විධුර පණ්ඩිතයන් ඇරගෙන එන්නට සමර්ථවූ සවාමිපුත්‍රයකු පරීක්ෂාකොට සොයා ගනුවයි විඛානකරන්නාහු ඉරාදැතිනි! යම් ශූරපුරුෂයෙක් විධුර පණ්ඩිතයන් මේ නාගභවනයට තමාගේ කිසියම් බලයකින් ගෙනෙන්නේවීනම් එසේවූ ශෞරව්‍යයෙන් සවාමිපුත්‍රයකු පරීක්ෂාකොට සොයා ඇවිද බලාගනුවයි මෙසේ වරුණ නම් නාරජ්ජුරුවෝ කෙලෙස් කාමයෙහි බලවත්ව ඇලුණු බැවින් දුවට කියන්නට නුසුදුසුවූ බස්කිහ. ඒ නාගමාතවිකාවෝ පියරජ්ජුරුවන්ගේ බස්අසා උන් අස්වසාලා මැනියන් සවම්පයට ගොස් ඔවුනුත් අස්වසාලා තමාගේ ශ්‍රියඛන්ගබඩාවට ගොස් සම්භරණයෙන්සැරසිඑක්වනුක්මල්රතක්ඇඳ එක්වනුක්මල්රතක්එකාංශකොටබහා එම රාත්‍රියෙහි දිය දෙබේකොට නාගභවනයෙන් නික්ම හිමාලය වනප්‍රදේශයෙහිවූ සමුද්‍රනිරයෙහි පිහිටියාවූ සැටයොදුන් උසඇති එකඤ්ඤනවූ කාළගිරි නම්වූ අඤ්ජනගිරිපර්වතයට ගොස් කෙලෙසකාමයෙන් තප්පාව සවාමිපුත්‍රයකු සොයමින් ඇවිදිනිය. මෙසේ ඇවිදිනාවූ නාගමාතවිකාතොමෝ හිමාලය වනයෙහි වණ්ණ ගන්ධ රස සම්පන්නවූ යම් පුෂ්පජාති කෙනෙක් ඇත්නම් ඒ සියල්ල ගෙනවුත් සියලුපර්වතය මැණික් ඇගැයක්මෙන් සරහා පර්වත මස්තකයෙහි මල් ඇතිරියක් අතුට සිත්කලුවූ ආකාරයෙන් නටනටා මියුරු ගී ගායනා කෙරෙමින් මෙසේ කිව, කවරනම් ගන්ධර්ව දිව්‍ය පුත්‍රයෙක්, කවරනම් රාක්ෂසයෙක්, කවරනම් දිව්‍ය නාගයෙක්, කවරනම් කිම්පුරුෂයෙක්, කවරනම් මනුෂ්‍යයෙක්, මෙකී ගන්ධර්වාදීන් අතරෙන් අභිමතාර්ථ සිද්ධකරන්නට සමර්ථවූ කවරනම් පණ්ඩිතයෙක් බොහෝකලක සිට දැඩි උපන්නාවූ මාගේ මැනියන්ට විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය දීමෙන් මනදැඩි පුරා මටත් සවාමි වන්නේදැයි කිව.

එකෙණෙහි වෙසවුණු රජ්ජුරුවන්ගේ බැණණුවූ පූර්ණක නම් යක්ෂ සෙනාධිපතිතෙමේ තුන්ගවුවක්පමණමනොමයසෛන්‍යවයකුපිටපැනනැඟී කාළගිරිපර්වත මස්තකයෙන් රත්ගල්තලාවෙහි යක්ෂ සමාගමයට යන්නේ ඒ ඉරාදැතිනම් නාගකන්‍යාවගේ ගීතිකා ශබ්දය ඇසීය. අනතුරු ආත්මභාවයෙහි භාර්‍යාවවූ සත්‍රියගේ ගීතිකා ශබ්දය ශ්‍රවණාදිය විනිවිදගෙන ගොස් ඇට මිදුළු පැහැර සිටියේය. ඒපූර්ණකනම් යක්ෂසෙනාධිපතියා ඉරාදැතී නම් නාගකන්‍යාව කෙරෙහි පිළිබඳවූ සිත් ඇතිව කරකැවී සෛන්‍යවයා පිට හිඳම කියන්නේ සොඳුර! මම මාගේ ප්‍රඥයෙන් දැහැමින් සෙමින් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙනෙන්නට සමර්ථයෙමි, නී ශොකයක් නොසිතවයි කියා ඇ අස්වසමින් මෙසේ කිය, අගර්හිතලොචනයන් ඇත්තාවූ නාගකන්‍යාව! නී අස්වැසිලි ලබව, බයකුත්නොසිතව, මම නිට සවාමිවෙමි, භ්‍රාතෘවෙමි, මාගේ ප්‍රඥව විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙනෙන්නට සමර්ථවෙයි, එසේහෙයින් නී අස්වැසිලි ලබව විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙනෙන්නට මා සමර්ථහෙයින් නී මට භාර්‍යාවන් නෙහිවේදැයි කීවේය.

ඉක්බිත්තෙන් යක්ෂ සෙනාධිපතියා මෙසේ කියා ඒ කන්‍යාව අසුපිට ඉදුවාගෙන යෙමි සිතා පර්වත මස්තකයෙන් බැස ඒ නාගකන්‍යාව අල්වා ගන්නට අත දික්කෙළේය. ඔතොමෝ තමාගේ අත අල්වාගත නොදී ඔහු දික්කළ අත තොමෝ අල්වාගෙන අනතුරු ජාතියෙහි සවාමිව ආවාවූ ඒ

පූණ්ණකනම් යක්ෂයා කෙරෙහි පූජිජාති ඇයන් වාසනාව ආවාවූ සිතින් යක්ෂයාට කියන්නී සවාමිනි! මම අනාථ අසරණ එකියක් නොවෙමි. මාගේ පියාණෝ වරුණ නම් නා රජ්ජුරුවෝය. මැනියෝ විමලානම් බිසවුය. එසේහෙයින් මාගේ පියාණන්වහන්සේ සවමීපයට දෙන්නම යමිහ. අප දෙදෙනා ඔබ ගිය කල්හි අපගේ පිය රජ්ජුරුවන්වහන්සේ තොප අප දෙදෙනාගේ ආවාහ විවාහ වෘත්තයෙන්වූ මේ මඩගලාර්ථය කියනසේකැයි ඒ ඉරඳතී නම් නාග කන්‍යාතොමෝ පූණ්ණකනම් යක්ෂයාට කිව, මෙසේ කියා නාගකන්‍යාතොමෝ සමීපාහරණයෙන් සැදී මනාවූ සිඑහැඳ මල් පැලඳ සඳුන්විලවුන් ගල්වාගත්තී පූණ්ණකනම් යක්ෂයා අතඅල්වා ගෙන පියරජ්ජුරුවන් සවමීපයට ගියාය. පූණ්ණකනම් යක්ෂයාත් තමා ආ බව කියා ඔවා නාරජ්ජුරුවන් සවමීපයට ගොස් ඉරඳතී නම් නාගකන්‍යාව තමා හිමිකොට ඉල්වමින් මේසේ කිය. නාගොත්තමයාණන්වහන්ස! මාගේ තෙපුල් අසව, තොපගේ බඹුකුලයට සුදුසුවූ තොප දුව නිසා මා පඬුරුකොට දියයුතුවූ මේ වසතුව ඇරගන්‍නුව, මම තොපගේ දුවූ ඉරඳතී මටම භාර්‍යාවකොට පතමි. තොපි ඉරඳතිය හා මා සමඟ බව කරව, නාරජ්ජුරුවෙනි! ඇතුන් සියයක්ද අසුන් සියයක්ද උත්තම අශ්වයන් යෙදූ රථයියයක්ද, නොයෙක් රත්නයෙන් සම්භාර යෙන් සම්පූර්ණවූ බඩහල් සියයක්ද, යන මේ වුකතප්‍රකාර ඒ වසතූන් ඇර ගනුව, තොපගේ දුවූ ඉරඳතිනම් නාගකන්‍යාව මට භාර්‍යාකොට පාවා දෙවයි කිහ.

ඉක්බිත්තෙන් ඔහට නා රජ්ජුරුවෝ කියන්නාහු පින්වත්වූ යක්ෂ සෙනාධිපතිය! මම තට මාගේ දුව දෙම්මය, මදක් නෝ ඉවසා මා කියන්නක් අසව මල්බෑ ආදීවූ නෑයන් හා මිත්‍රයන් හා සබඳ ජනයන්ගෙන් මේ කටයුතුද? නොකටයුතුදැයි මෙසේ කතීව්‍යාකතීව්‍ය විචාරීම යම්තාක් කල කින් කරමෝ නම් ඒතාක්කල් ඉක්මන්නොවී හැම්මෙව. ඊට කාරණා කවරේද? සත්‍රීහු වනාහි ගියතැන ඇලෙන්නාහුත් වෙති. නැලෙන්නාහුත් වෙති. සවාමිකුලයට ගියාවූ සත්‍රීන් අනභිරතියෙන් පිඬිනව් නැවත දෙමවු පියන්කරා ආ කල්හි නෑයන් ආදීවූ ජනයෝ අප හා සමඟ කථානොකොට කළාවූ කාර්‍යය මෙබඳු වන්නේවේදැයි පැමිණි කාර්‍යයක් සොයාගෙන්ව නොබැඳෙන්නාහ. එසේ කල්හි බඹුන් හා කථානොකොට කරනලද කාර්‍යය පසුතැවිලියට පමුණුවන්නේයයි කිහ. ඉක්බිත්තෙන් ඒ වරුණ නම් නාරජ්ජුරුවෝ පූණ්ණකනම් යක්ෂයා පිටත රඳවා විමලා දෙවීන් වසන ප්‍රාසාදයට වැද භාර්‍යාවවූ විමලා දේවීන් සවමීපයට කැඳවා කියන්නාහු මේ පූණ්ණකනම් යක්ෂ සෙනාධිපතියා අපගේ ඉරඳතීනම් නාගකන්‍යාව ඉල්වන්නේය. මුතුමැණික් ආදීවූ බොහෝ වස්තු ලාභය ලෙසින් ඇරගෙන අපගේ ප්‍රියවූ ඉරඳතීනම් නාගකන්‍යාව ඔහට භාර්‍යාකොට පාවාදෙමෝද? විමලා දෙවි යි විවාළහ.

එබස් අසා විමලාදේවී කියන්නී නාරජ්ජුරුවන් වහන්ස! අපගේ දුවූ ඉරඳතී තොමෝ ඒ මුකතාමාකන්‍යාදීවූ වස්තු නිසාවත් අවශෙෂවූ සෘද්ධාභිකාරණයක් නිසාවත් ඔහට නොලැබෙන්නීය. වස්තු නිසා සන්තොෂකාරණා නිසා ඔහට අපේ ඉරඳතිය පාවානොදෙම්හ. ඉදින් විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය ගෙනාවොත් ඉරඳතිය පාවාදෙම්හ. කැත්තම් මෙයින් එටත්

අනික්වස්තුවකට අපගේ දුව පාවා නොදෙම්හයි කීවාය. විමලාවන්ගේ වානී, නන්තරයෙන් ඒ වරුණ නම් නාරජ්ජුරුවෝ විමලාවන් වසන ප්‍රාසාදයෙන් මෑතට ඉක්ම පූණිකනම් යක්ෂයා කැඳවා විමලාවන් කි වාතීනාව කියන්නාහු යක්ෂසෙනාධිපතිය! අපගේ දුව ඉරන්දති තොමෝ මුක්තාමාණික්‍යාදි වස්තු වක් නිසාවත් සන්තෝෂ කාරණයක් නිසාවත් නොපට නොලැබෙන්නීය. ඉදින් විධුර පණ්ඩිතයන්ගේ දෑහැමින් සෙමින් ලද්දාවූ හෘදයමාංශය මේ නාගභවනයට ගෙනෙන්නට නෙපි සමර්ථයෝනම් මේ සන්තෝෂ කාරණයෙන් නොපට කුමාරිකාව ලැබෙන්නීය, මෙයින් පිටත් අනික් වස්තුවක් මන්නෙහි නොපහම්හ. අපට වස්තු නමුත් සතුටු නමුත් විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශයමය, මෙයින් පිටත් අනික් වස්තුවකට අපගේ දුව පාවා නොදෙම්හයි කිහ.

එබස්අසා පූණිකයා කියන්නේ මේ සත්ලොකයෙහි සමහරකෙනෙක් යම්කිහු පණ්ඩිතයයි කියන්නම් ඔහු නැවත අනික් සමහර කෙනෙක් අඥානයයි කියති, මේ ප්‍රඥාවත් පුද්ගලයා කෙරෙහි ජනයෝ මෙසේ විරුධයක් කියති, නාරජ්ජුරුවෙනි! මේ කාරණය මට වූ පරිදිදෙන් කියව, නෙපි නුවුරුන්නම් පණ්ඩිතයයි කියවුදැයි විවාළේය. එබස්අසා නාරජ්ජුරුවෝ කියන්නාහු කුරුරටවාසිවූ ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුවන්ගේ ප්‍රඥයෙන් යශසින් කීර්තියෙන් ලුළුලොව සමයක්හු නැනිහෙයින් විධුර නම්වූ අමාත්‍ය යෙක් ඇත. ඉදින් තොප විසින් නමින් පුවතින් අසනලදවිරූ ඇත්නම් ඒ විධුරපණ්ඩිතයන් දෑහැමින් සෙමින් ලැබ අපහරු ගෙනෙව, එසේකල්හි අපගේ දුවූ ඉරන්දතිතොමෝ නොපට පාදපරිචාරිකා වන්නීයයි කිහ. ඒ පූණිකනම් යක්ෂසෙනාධිපතියා වරුණනම් නාරජ්ජුරුවන්ගේ වුකතප්‍රකාරවූ වාතීනාව අසා විශෙෂයෙන් ප්‍රීතිමත්වූයේ හුනස්නෙන් නැගී සිට එතැන්හිම සිටියේ තමාගේ උපස්ථායක පුරුෂයක්හට නියොගකරන්නේ අශ්වාලංකාරයෙන් සරහනලද කාරණ කාරණා දන්නා සෙඬව අශ්වයකු මෙතැනට ගෙනෙවයි නියොගකෙළේය. මෙසේ විධානකොට නැවත ඒ අශ්වයා වර්ණනාකරන්නේ සුවිශුද්ධ සවණ්ණමයවූ කන් සහලක් ඇති පද්මරාග මාණික්‍යමයවූ කුරඇති ජාම්බොනද සවණ්ණයෙන් කරනලද්දාවූ උරසැන්මාලාව හා කරපලඳනා ග්‍රීවාභරණයන් ඇති මෙබඳුවූ සෙඬව අශ්වයකු මෙතැනට වහාම සරහා ගෙනෙවයි නියොගකෙළේය. ඒ පුරුෂයා එකෙණෙහිම ඒ මනොමයවූ සෙඬවයා සියලු අශ්වාලඞ්කාරයෙන් සරහා එතැනටම ගෙනායේය. එකල්හි සර්වාභරණයෙන් හෙබියාවූ මණ්ඩනවශයෙන් සරහනලද කෙස් හා දැලි රුවුල් ඇති පූණික නම් යක්ෂසෙනාධිපතිතෙ. මේ දිව්‍ය සංඛ්‍යාතවූ ඉසිලියයුත්තාවුන් උසුලන්නාවූ යාමට කාරණා වූ ඒ මනොමය සෙඬව අශ්වයා පිටට පැන නැගී වෙහාස සංඛ්‍යාතවූ ආකාශයෙන් ගියේය. ඒ පූණිකනම් යක්ෂසෙනාධිපතියා පසුබැසගාම රාගයෙන් ලොල්වූයේ ඉරන්දතිනම් නාගකන්‍යාව පතමින් ගොස් යක්ෂෙශ්වරවූ පරිවාර සමපත් ඇති වෙසාණනම් රාජධානියට නායක ඒ කුවෙර නම් රජ්ජුරුවන්ට මෙසේ කිහ. මහරජ්ජුරුවන්වහන්ස! වරුණ නම් නාරජ්ජුරුවන්ගේ රාජභවනයෙහිවූ ප්‍රාසාදය හිරණ්‍ය සවණ්ණ මුක්තා මාණික්‍යාදි අනෙකප්‍රකාරවූ අප්‍රමාණ වස්තුයෙන් සමුඬි හෙයින් භොගවතී යයි කියාද සථාන ගමනාදි චතුර්විධ ඊර්‍යාපථයෙන් නිරන්තර වාසස්ථාන හෙයින් වාසභවතියාද, සවණ්ණාකාරාදියෙන් පරිශ්ශිපනහෙයින් කිරණඤ්ඤවතී

යයි කියාද කියනු ලැබෙයි, නැවත ඒ රජ්ජුරුවෝත් පුණ්‍යකර්මයෙන් නිර්මිතයහ, හාත්පසින් සතකමය විචිත්‍ර විශාල උත්තම හොඳම ශබ්දයෙන් සමන්විතය, අනෙකප්‍රකාර විසිතුරුවූ කර්මාන්තයෙන් කොට නිමවන ලද්දේය,

තවද මහරජ්ජුරුවන්වහන්ස! උත්පත්ති ක්ෂණයෙහි පරිපූර්ණායතන ඇති බැවින් ඔපපාතිකවූ මහත්වූ සෘද්ධි ඇති වරුණ නම් නාරජ්ජුරුවෝ යම් නාගභවනයෙක වෙසෙත් නම් ඒ නාගභවනයෙහි එටුවන්කරසටහනින් කරන ලද්දාවූ පද්මරාගමාණික්‍යමයවූ අට්ටාල හා මැසිරිගල්මයවූ අනෙක ප්‍රකාරවූ අට්ටාලයෝද ඇත, නැවත ඒ නාගභවනයෙහි රන්උළින් රුවන් උළින් සොයන ලද්දාවූ මාණික්‍යමයවූ අනෙකවිධවූ ප්‍රාසාදයෝද ඇත. තවද ඒ නාගභවනයෙහි අඹගස්, ඇසළගස්, දඹගස් රුක්අත්තනගස්, දියමදෙල්ලගස්, දුනුකේ වැටකේගස්, පියල්ගස්, එරහැන්දගස්, මීඅඹගස්, එරබදුගස්, රත්නික්ගස්, එළනිසගස්, සපුගස්, නාගස්, ගිරිතිල්ල, යොහොඹු, කළුගස්, ආදි කුසුම්ත ඵලිත ආදි වූක්තප්‍රකාර මේ වෘක්ෂයෝ අන්‍යෝන්‍යාශක්ත ශාඛායෙන් ආකුලව්‍යාකුලව හිඳී ගැවසී සිටියාහු වරුණනම් නාරජ්ජුරුවන්ගේ භවනය හාත්පසින් හොබනාහ.

තවද ඒ නාරජ්ජුරුවන් වසන්නාවූ නාගභවනයෙහි ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ හිඳිගස් බොහෝ වන්නේය. ඒ ඉඳිරුක් රන්වන් මලින් හැමසෘතුයෙහි සතහයෙන් මල්ගෙන සිටිනේය. ඒ වරුණ නම් නාරජ්ජුරුවන්ගේ කුමාර අවස්ථායෙහි පුරුදුවූ භාර්‍යාවක්ඇත, නිර්මලවූ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති හෙයින් ඕ තොමෝ නමින් විමලානම් වන්නීය, රන්රූසක් බදුමශරීර ඇත්තේය, ලීලොපෙත කථාවැල් දලුවක්මෙන් සෘජුව වැඩුනීය, කොසඹ ඵලයට බදුවූ සථහන් ඇති තනපුඩු ඇත්තීය, මනඃකල්දකුම්ඇත්තීය, රුවින් ලාක්ෂාරස මෙන් අයි රකතවූ අතුල්තල පතුල්තලයන්හි සියුම් මනාඡවි ඇත්තීය, මෝලොක් කොමල රත් අතුල් පතුල් ඇත්තීය, වාසස්ථානයෙහි මූලපටන් ශාඛාග්‍රය දක්වා පිපීසිටි කිණිහිරිරුකක් වැන්නීය, තවුතිසා දිව්‍යපුරයෙහි ලීලාපෙත නව හැසිරෙන්නාවූ දෙවඟනක වැන්නීය, මෙඝවලා අතරෙන් නික්මුණාවූ විදුලියකලඹක් වැන්නීය, සිනා පෙරදැරිවූ තෙපුල් ඇති මේඛදුවූ ශරීර සෞන්දර්‍යයී ඇති විමලානම් නාගකන්‍යා තොමෝ හටගත් රෝළ ඇත්ති විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංසය පතන්නීය, භූතෙශ්වරවූ වෙසවුණුමහරජ්ජුරුවන්වහන්ස! ඒ විධුර පණ්ඩිතයන්වහන්සේගේ හෘදය මාංශය මම ඔවුන්ට දෙමි, ඒ විමලාවන් හා වරුණ නම් නාරජ්ජුරුවන් හා දෙදෙන ඒ හෘදය මාංශය ලැබීමෙන් සතුටුවූවාහු තමාදුව ඉරන්දතීනම් නාගකන්‍යාව මට පාවා දෙන්නාහුයයි කීය. මෙසේ පූර්ණකනම් යක්ෂ සෙනාධිපති තෙමේ වෙසවුණු රජ්ජුරුවන් විසින් අනුනොදන්නාලද්දේ යාතොහී ඒ රජ්ජුරුවන්ට තමා යන නියාව දන්වනු පිණිස මේ වූක්තප්‍රකාර නාග ලොකවර්ණනාව කෙළේය. වෙසවුණු මහරජ්ජුරුවෝ වූකලී ඔහුගේ කථාව නොඅසා දිව්‍යපුත්‍රයන් දෙදෙනකුගේ විමන්ශුක්තියක් පසිඳිනාහ. පූර්ණකනම් යක්ෂයා තමාගේ වචනය නොඇසූ නියාව දැන ජඟගන්නාවූ දිව්‍ය පුත්‍රයා සමීපයෙහි සිටියේය වෙසවුණු මහරජ්ජුරුවෝ යුක්ති විචාරා සනිටුහන්කොට පැරදි දිව්‍ය පුත්‍රයා නොයවා නොපැරදි දිව්‍යපුත්‍රයාටකියන්නේ තා ගොස් නාගේ විමානයෙහි

වසවසි කිහ, පුණ්ණයා තෝ පලායයි කී බස් හා සමඟ මාගේ මයිලණුවන් වහන්සේ එයින් මා යැවූ නියාව හැමදෙනම දනුවයි දිව්‍යපුත්‍රයන් කීප දෙනකු සාක්ෂිකොට භූතෙශ්වරවූ යශ පිරිවර ඇත්තාවූ විසාණනම් රාජධානියට රජවූ කුවෙර නම් රජ්ජුරුවන්ට කියා හුනස්නෙන් නැගී එතැන්හිම සිට පුරුෂයස්සයක්හට නියොග කරන්නේ කනකමයවූ කන් සඟලක් ඇති පද්මරාග මාණික්‍යමයවූ කුරඇති ජාඹොනද සවණිණයෙන් කරනලද්දාවූ උරසැත් මාලා ඇති කරපලඳනා අවශෙෂවූ අශ්වාභරණයන් ඇති මෙසේ මෙබඳුවූ අශ්වාලඞ්කාරයෙන් සරහනලද කාරණා කාරණා දන්නාවූ සෙඞ්ඛ අශ්වයකු මෙතැනට ගෙනෙවයි නියොග කෙළේය.

ඉක්බිත්තෙන් සඞ්ගාහරණයෙන්හෙබියාවූ මණ්ඩනවශයෙන් සරහා සිටුවනලද හෙස් හා දුළි රුවල් ඇති පූණ්ණනම් යක්ෂ සෙනාධිපතිතෙමේ දිව්‍යමයවූ තමාඋසුලන්නාවූ යානවිකාරණාවූ වුක්තප්‍රකාර ඒ මනොමය සෙඞ්ඛව අශ්වයා පිටට පැන නැගී වෙහාස සඞ්ඛ්‍යාතවූ ආකාශයෙන් ගියේය. පූණ්ණක නම් යක්ෂයා ආකාශයේ යෙමින් සිට සිතන්නේ විධුර පණ්ඩිතයෝ මහත්වූ පිරිවර ඇත්තාහ, එසේහෙයින් උන් අල්වා ගන්නට නොපිළිවන, ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරුවෝ වූකලී දුකෙළියෙහි බලවත්වූ අභිලාෂ ඇත්තෝය, එසේහෙයින් උන් හා කැවිව දුකෙළ ඒ රජ්ජුරුවන් දුකෙළියෙන් පරදවා මම ජයගෙන විධුර පණ්ඩිතයන් ගනිමි, ඒ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයේ බොහෝ රන් රුවන් ඇත, එසේහෙයින් ඒ රජ්ජුරුවෝ මඳක් අගනා පරදුකොට නිබියයුතු වස්තුයෙන් දූ නොකෙළිනි, මාහැඟි රත්නයක් ගෙනයන්නට වටනේය. අන් රුවනක් රජ්ජුරුවෝ නොගනිති, රජගහ නුවර සවිමපයෙහිවූ වෙපුල්ල පර්වතාභ්‍යනතරයෙහි වක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පරිභොගයට සුදුසුවූ මාණික්‍ය රත්නයෙක් ඇත, ඒ මහානුභාව සමපන්නවූ මාණික්‍ය රත්නය ගෙන ඒ මැණිකෙන් රජ්ජුරුවන් පොළඹවා ගෙන රජ්ජුරුවන් ජයගනිමි සිතා එපරිද්දෙන්ම කෙළේය.

ඉක්බිත්තෙන් අහු රජ්ජුරුවන්ගේ රාජ්‍යාණ්ඩුවූ ශත්‍රු රජ්ජුරුවන් විසින් මැඩපිය නොහැක්කාවූ බොහෝ කනදා හා බොහෝ බත් ඇති සක්දෙවි රජහුගේ මෙරමිදුනෙහි මවනලද හෙයින් මඝකකාරයයි කියනලද ශක්‍රභවනය වැනිවූ අති රම්‍යවූ මෙබඳුවූ රජගහනුවරට ඒ පූණ්ණක නම් යක්ෂ සෙනාධිපතිතෙමේ ඒ මනොමය සෙඞ්ඛයා පිටටපැනනැඟී ගියේය, මොණරුන් කොස්ලිහිණින් කුරවිකෙවිල්ලන් හිරවුන් ආදිවූ ලිහිණි සමූහයා විසින් රැවූ විළිරැවූ දෙනලද්දාවූ මනොඥවූ හෙළිව තිබෙන්නාවූ රම්‍යවූ භූමිභාග ඇති සපු දුනුක් ආදිවූ නොයෙක් කුසුම් පතරින් ගැවසීගත් හිමාලයපර්වතය වැනිවූ පර්වතයන් අතරෙන් උස්වූ කිම්පුරුෂකින්නරාඞ්ගනාවන් විසින් ගැවසීගත් මෙබඳුවූ වෙපුල්ලනම් පර්වතයට ඒ පූණ්ණකනම් යක්ෂ සෙනාපතිතෙමේ පැනනැංගේය, ඒ මාණික්‍යරත්නය කුම්භීරනම් යක්ෂයෙක් කුමාණ්ඩයක් ලක්ෂයක්දෙනා විසින් පිරිවරනලදුව රක්නේය. ඒ යක්ෂයා වූකලී පූණ්ණකයා විසින් කිපී බැලූ පමණකින්ම හසින් තැතිගෙන පලාගොස් සක්වළ ගලමුදුනට පැමිණ වෙවුලමින් බල බලා සිටියේය. මෙසේ ඒ යක්ෂයා පලවා පූණ්ණනම් යක්ෂ සෙනාධිපතියා නහොමධ්‍යගතවූ සුගතී මණ්ඩලය මෙන් දිලියෙන්නාවූ, පරිවාර මාණික්‍යරත්න සමූහයෙන් සශ්‍රීකවූ මහානුභාව

සම්පන්නවූ, ඒ මාණික්‍යරත්නය ආකාශයෙහි විදුලියක් මෙන් බබළන්නේය, ප්‍රභාවිහිදුවන්නාවූ, ජාතිමත්වූ සිතූ පැතූ කැමැති වසතු ළඟවන්නාවූ, ඒ මාණික්‍යරත්නය දැක මානැගිවූ, සිරුරින් කැමැති වසතු ළඟවන හෙයින් මනොහරතම්වූ මහත්වූ රත්නානුභාව ඇති ඒ මාණික්‍යරත්නය ඇරගත්තේය. මෙසේ ඇරගෙන අලංකාරවූ ශරීරවර්ණ ඇති ඒ පූර්ණක නම් යක්ෂතෙමේ ඒ මනොමය සෛන්ධව අශ්වයා පිටට පැනනැගී ආකාශයෙන් ගියේ කුරුරට ඉදිපත් භූවරට ගොස් අසුපිරින් බැස අසු නොපෙනෙන පරිදි දෙන් අදෘශ්‍ය මානවූ කයින් සිටුවා රාජ්‍යකාර්‍ය්‍ය ආදියෙහි සාමග්‍රිවූ නොයෙක් ජනයන්ගේ රැස්වීම් ඇති කුරුරට වාසී රජදරුවන්ගේ සභාවට ප්‍රසාදවහවූ මානවක වෙසයකින් ගියේය. ගොසින් නිර්භීතව සිට රැස්ව උන් ඒ සියයක් රජදරුවන් දැක ක්‍රීඩාවට කැඳවා ගෙන්වීය. ඒ කෙසේදයත්? මේ රාජසමාගමයෙහි රජදරුවන් අතරෙන් භාවරතම් රජෙක් මා සන්තකවූ මේ උත්තම රත්නය ජයගෙන 'මම පරදවමි' කියන්නට සමර්ථද? මේ උත්තම ධනයෙන් අපිකවරකෙනකුන්ප රදවමෝද? දිනන්නමෝත් අසදෘශවූඋත්තමරත්නයෙන් අපි කවරහොතකුන් ජයගනුමෝද? නැවත උතුම්වූ ධනයෙන් කවර රජ්ජුරුනොතෙක් අප පරදවද්දැයි මෙසේ ඒ පූර්ණකනම් යක්ෂයා සතරපරිද්දෙන්ම විශෙෂයෙන් ඤාතව්‍ය කොරව්‍ය නම් රජ්ජුරුවන් උදෙසා කිහ.

ඉක්බිත්තෙන් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ මාවිසින් මිට පළවූ මෙසේ නිර්භීතව කියන්නාවූ එකක්හු දුටුවිරුතැන් නැත. මේතෙමේ තව රෙක්අඟෝසි සිතා විචාරන්නාහු මෙසේ කිහ. මානවකය! තාගේ රට කොයිද? තාගේ මේකියන්නාවූ ඔස් අපගේ කුරුරට වැසි පුරුෂයන්හුගේ හොපුල්වැන්නේනොවෙයි. අපහැමගේ ශරීරප්‍රභාවන් තාගේශරීරප්‍රභායෙන් මැඩපැවැත්තෙහිය. එසේහෙයින් තාගේ නම ගා තාගේ නැයන් වූපරිදි මට කියාලවයි කිහ. එබස් අසා පූර්ණකයා සිතන්නේ මේ රජ්ජුරුවන් වහන්සේ මා අතින් නම විචාරනසේක, පූර්ණකයයි කියාදැසයන්ට නමෙක් වන්නේය. ඉදින් මම පූර්ණකයයි කියෙම්වීනම් මේතෙමේ එක් දැසයෙක් වන්නේය. එසේහෙයින් නොජස්වීව බුහුවිබැවින්ම මෙසේ කියන්නේයයි මට නිතු කොට හෙලා දක්නාසේක, එසේහෙයින් අනතුරුවූ අතිනාතමහච්ඡයෙහි මාගේ නම මුන්වහන්සේට කියම් සිතා මෙසේ කිහ. ධනඤ්ජය නම් මහ රජ්ජුවන්වහන්ස! මම **කාත්‍යායන** නම් මානවකයෙක්මි. අනුනයයි කියාත් සුනිමිත්‍රයෝ මා කැඳවන්නාහ. අනුනශබ්දය පරිපූර්ණාර්ථය ප්‍රකාශකරන හෙයින් අනන්තර ජාතියෙහිවූ කාත්‍යායන නාමය කියා තමාගේ පූර්ණක නාමය අනුන ශබ්දයෙන් හඟවා කියන්නේ රජ්ජුරුවන්වහන්ස! මාගේ නැයන් ගා අවශෙෂ බඹුහු අඟුරට කාලවමපා නුවර වසන්නාහ. දැනත ක්‍රීඩායෙහි අභිලාෂයෙන් මේ කුරුරටට පැමිණියෙමියි කිහ. එකල්හි ඕහට රජ්ජුරුවෝ කියන්නාහු මානවකය! තෝ කෙළියෙහි පැරැද්දේවී නා කුමක් දෙසිද? තාගේ කෙබඳු වස්තුවෙක් ඇද්දැයි විචාරන්නාහු මෙසේ කිහ. තා පරදවන්නාවූ අෂ්ඨඩ්ඪීතනතෙමේ ගෙනවයි කියා යම් ධනවක් ඛාලවා ගෙන්වා නම් එසේගෙනහැරදන්නට සුදුසුවූ තාගේමුඛ්‍යාමාත්‍යාදීවූ කවර රත්න විශෙෂයෙක් ඇද්ද? රජ්ජුරුවන්ගේ වූඛාලී මුඛ්‍යාමාත්‍යාදී අනෙකවිධ රත්නයෝ ඇත. ඒ තෝ එබඳු රත්න විශෙෂයක් නැති හෙයින් දිළිඳුවූයෙහිවේද, එසේ බොහෝ වස්තු ඇති රජදරුවන් කවරකාරණයෙහින් දැයුතක්‍රීඩා ශ්‍රේෂ්ඨ කැඳවසිදැයි විචාළහ.

ඉක්බිත්තෙන් පූණිකයා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! මාගේ මේ මාණික්‍යරත්නය මතසින් ප්‍රාර්ථිතවූ වස්තුව එළවන හෙයින් මනොහර නම්. එසේම සිතූ පැතූ වස්තු එළවන්නාවූ මහත්වූ ආනුභාව ඇති මාණික්‍ය රත්නයද ශත්‍රුසංහතාපයකරන්නාවූ මේ ආජානීය අශ්වරත්නයද යන මේ වස්තු දෙක අක්ෂුධ්‍රීතෙමේ දුකෙළ මා පරදවා ඇරගන්නේය දුකෙළ පැරදී කල්හි දියයුතු මාගේ වස්තූන්ම මේ දෙනය, එහෙයින් කවුරුන් වුවත් මා හා සමඟ දුකෙළ මා පරදවා පියා මේ වස්තු දෙක ඇරගනිති කියා. එබසට රජ්ජුරුවෝ කියන්නාහු මානවකය! තාගේ තෙල එක මාණික්‍යරත්නය කවර අවශ්‍යතාවයක් කොට පියන්නට සමර්ථද? තෙල තාගේ එකම අජානීය සෛන්ධවයා කවර අභිවෘද්ධියක් කරන්නට සමර්ථද? මහරජ්ජුරුවන් වහන්සේලාට වූකලී බොහෝවූ මාණික්‍යරත්නයෝත් ඇත, පවන් හා සමානවූ ජව ඇති අජානීය සෛන්ධවයෝත් පමණ නැත්තාහයි කීහ. ඒ පූණික නම් යක්ෂයා නැවතත් රජ්ජුරුවන්ගේ බස් අසා මහරජ්ජුරුවන් වහන්ස! කුමක් කියනසේක්ද? එකම අශ්වයා අසුන් දහසකටත් වඩා වටින්නේය, එකම මැණික මැණික් දහසකටත් වඩා වටින්නේය, සියලු අශ්වයෝ එක සාදෘශ්‍ය නොවෙති, එසේහෙයින් මේ අශ්වයාගේ වූකලී ජව බැලුව මැනවැයි කියා අසුපිටට පැනනැඟී පවුරසේ ඉසින් විහිදුවූයේය. සත්යොත්නක් පමණ ඉදිපත්තුවර අශ්වයන් කරින්කර පහරනවුන් සිසාරාක්මෙන්විය. ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් අශ්වයා නොපෙනෙන්නේය, යක්ෂයාත් නොපෙනෙන්නේය, වටසිසාළ අලාත චක්‍රයක් මෙන් බඳවට සිසාළ රන්පටකඩම අතුරු නැතිව වට අයාලූවාක්මෙන් පෙනෙන්නේය. ඒ පූණික නම් යක්ෂයා අසුපිටින් බැස මහරජ්ජුරුවන් වහන්ස! අශ්වයාගේ ජව දුටුසේක්දැයි කීය. එසේය, දුටිමි කීකල්හි දැන් බැලුව මැනව මහරජ්ජුරුවන් වහන්ස!යි කියා අසු ඇතුළුතුවර ගෘහොද්‍යානයෙහි පොකුණ පිට ජල මස්තකයෙහි විහිදුවිය. අශ්වයා කුරඅක් නොතෙමම්න්ම දියපිට දිවගත. ඉක්බිත්තෙන් ඔහු පොකුණෙහි පියුම්පත් මත්තේ ඇවිදුවා අත්ලෙන්අත්ල ගසා අත දික්කෙළේය. එකල්හි අශ්වයා අවුත් සතරකුරෙන් අත්ලෙහි සිටියේය. ඉක්බිත්තෙන් මහරජ්ජුරුවන් වහන්ස! මෙබඳු අශ්වරත්නය පරදු තබන්නට විතේදැයි කීකල්හි මානවකය! පරදු තබන්නට වටනේයයි කීහ. මහරජ්ජුරුවන් වහන්ස! අශ්වරත්නය වූකලී තව තුබුණ මැනව. මාණික්‍ය රත්නයාගේ ආනුභාව බැලුව මැනවැයි කියා මාණික්‍යරත්නයෙහි ආනුභාව ප්‍රකාශකොට දක්වන්නේ මෙසේ කීය. දෙපා ඇත්තවුන්ට උතුම්වූ මහරජ්ජුරුවන් වහන්ස! නුඹවහන්සේ මාගේ මේ අභිමතාවාප්තිය කරන්නාවූ උතුම්වූ මාණික්‍යරත්නය බලා වදාළමැනව. මේ මාණික්‍යරත්නයෙහි සම්භාරණයෙන් අලඞ්කෘතවූ නානාප්‍රකාර සත්ත්වරූපද, එසේම සම්භාරණයෙන් අලඞ්කෘතවූ අනෙකප්‍රකාර පුරුෂරූපද, තැවත මේ මාණික්‍යරත්නයෙහි නානාප්‍රකාර මෘගපක්ෂි සමූහයාගේ රූපද, මයූර චක්‍රවාකාදි අනෙකප්‍රකාර පක්ෂීන්ගේ රූපද, නාගෝපනාගාදි අනෙකප්‍රකාර දිව්‍යනාගරාජයන්ගේ රූපද, විශාලදෙනඩාරිවූ නොයෙක්ගරැඩරාජයන්ගේරූපද, යනමේ ආශ්චර්‍ය වස්තු මේ මාණික්‍ය රත්නයෙහි මවනලදුව පෙනෙන්නා බලාවා. මැනව. භාවත මහරජ්ජුරුවන්වහන්ස! අලඞ්කෘතවූ අනෙකප්‍රකාර ඇත්ආණීද, රථාලඞ්කාරයෙන්අලඞ්කෘතවූ රථආණීද, එසේම අශ්වාලඞ්කාරයෙන්,අලඞ්කෘතවූ අශ්වයන්ද, සන්නාහාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ ශූරවූ පදාති යොධයන්ද, රක්ත

නීල ශෙවනාදි භෙදයෙන් භින්නවූ නානාප්‍රකාරවූ ධජපඞ්ක්තිද යන මේ චිත්‍රතාප්‍රකාරවූ සියුරණ සෙනහද, උත්තමවූ මේ මාණික්‍යරත්නයෙහි මවන ලදුව පෙනෙන්නා බලා වදුළමැනව, මහරජ්ජුරුවන්වහන්ස! හස්ත්‍යාචාර්‍යයන්ද, අශ්වාචාර්‍යයන්ද, රථාචාර්‍යයන්ද, දක්ෂවූ පදාති යොධයන්ද, සමූහ වශයෙන් යුඛයට සැරහී දැන්ව බෙදී මුළුමුළුව සිටියාවූ මහසෙනහද, බලා වදුළ මැනව. තවද මහරජ්ජුරුවන්වහන්ස! අන්‍යප්‍රාකාරයකි කියනලද පද නෙන් යුක්තවූ අනන්තවූ ප්‍රාකාරයෙන් හා තොරණින් සමන්විතවූ අති මනොහරවූ නුවරද, පරිශුඛවූ සතරමංසන්ධිද, නුවර ඒ ඒ ස්ථානයෙහි විචිත්‍රවූ භූමිභාගද, මේ මාණික්‍යරත්නයෙහි පෙනෙන්නා බලාවදුළමැනව, මහරජ්ජුරුවන් වහන්ස! නුවර හිදුවනලද්දාවූ එයිකාසනාගාරද, අඟුළුදිද, නුවර දොරටුවුළුද, අට්ටාලදොරටුද යනමේසියල්ල මේ මාණික්‍යරත්නයෙහි පෙනෙන්නා බලාවදුළමැනව, මෙතෙකැයිවිභාගකරනලද කොටස්හෙයින්පමණ කරනලද්දා යෙක් ආපණිකජනයන්විසින් ආකිණ්ණවූ නානාරත්නයෙන්සැදුම්ලද සල් පිල්ද, ගෘහයන් හා ගෘහවස්තූන්ද ගෘහසන්ධි හා මැදින් විනිවිද නොයාහැකි කොවේද, මැදින් කඩා යාහැකිමහවිපිද, නිර්මිතව පෙනෙන්නා බලා වදුළ මැනව. තවද මහරජ්ජුරුවන් වහන්ස! මත්‍යමාංශාදියෙන් හා සුරාපාන යෙන් සමෘඩ්ධවූ රාගෙවල්ද, එහි රත්න කුණ්ඩලාභරණාදියෙන් මණ්ඩිතව ආපානභූමිය හොබවමින් හුන්නාවූ රාසොඬුන්ද, මත්‍යමාංශාදියෙන් හා සම්පොපකරණයෙන් සමෘඩ්ධවූ අභාණ්ඩද, ආභාරපානවර්ගයෙන් සමෘඩ්ධව නිබෙන් නාවූ මුලුතැන් ගෙවල්ද, වෛශ්‍යාසන්ත්‍රීන්ද, යන මේ සියල්ල මේ මාණික්‍ය රත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදුළමැනව. තවද රජ්ජුරුවන් වහන්ස! මල්ගොතා පසිපුරාගෙන ඒ ඒ තැන මල්වියකුට ඇවිදිනා මාලාකාර යින්ද, පිළිපොදි පිටබැඳගෙන ඇවිදිනාවූ රදවුන්ද, සුවඳ බඩු කරන්නාවූ ගඳනාවඩුවන්ද, නැවත පිළී විකුණන්නාවූ වැපාරිකන්ද, අනෙකප්‍රකාර රත්නාභරණයන් කරන්නාවූ තරුලුන්ද, මැණික්සැට්ටරුන් හා ගල්වඩුවන්ද, යන මේ සියල්ලවුන් මේ මාණික්‍යරත්නයෙහි මවනලදුව පෙනෙන්නා බලා වදුළමැනව. තවද මහරජ්ජුරුවන් වහන්ස! මාලු පිසන අරක්කැමියන් හා ඛත්පිසන අරක්කැමියන්ද, නවන්නවුන් හා නටාහිකියන්නවුන්ද, අත්ලාලා හිකියන්නිවුන් හා කළබෙර ගසන්නවුන්ද, මහබෙර හා මිහිඟුබෙරද, ශෙවත රජත කනකාදීවූ නානාප්‍රකාරවූ සඞ්ඛද, පනාබෙර හා ඩැක්කිද, යන මේ සියලු බෙරගසන්නවුන්ද, නැටුම් හා මධුරස්වරයෙන් කියනලද ගීති කාද, බෙරහැසීමෙන් ප්‍රතිරාවදෙන ආකාරද, බලා වදුළමැනව. තවද මහ රජ්ජුරුවන් වහන්ස! මේ මාණික්‍යරත්නයෙහි කරනම් පහන්නාවුන්ද, දැත්පොළාගොස් මිටින් නෙරතුඅන්නා මල්ලවයන්ද ඉඳුජාලපානාවුන්ද, හැඳ පැලඳ සුවඳවිලවුන්ගෙන ජනමනොඛඞ්ගය කෙරෙමින් අන්තරවීථියේ ඇවිද නුවර හොබවන්නාවූ සත්‍රීපුරුෂයන්ද, මළමිනිහන්නාවූ සෝන් ගොව්වුන්ද, දැළිරැවුල්සපා අන්දමිතබන කරවනාවැමියන්ද, යහා මේ සියල් ලවුන් මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදුළමැනව. තවද රජ්ජුරුවන් වහන්ස! සත්‍රීපුරුෂයන් විසින් ගැවසීගත්තාවූ ඇද මැන් නෙහි ඇඳ බැන්දාවූ සථානඇති නෘත්‍ය මණ්ඩලයෝද පෙනෙන්නාහ. මෙබඳුවූ ආශ්චර්‍යවූ විශෙෂය මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදුළමැනව, තවද රජ්ජුරුවන් වහන්ස! මල්ලරඞ්ගයයි කියනලද ආකාශභූමියෙහි දැත්පොළා උනුන්ට වෙරවැදී නටා සිටියාවූ මේ මල්ලව

භවයන්ද බැලුව මැනව, නැවත දිනාසිටි මල්ලවයන්ද, බිඳී පැරදී සිටි මල්ලවයන්ද බලා වදාළමැනව. තවද රජ්ජුරුවන් වහන්ස! පළිතප්‍රාන්ත යෙහි සිටිනා බොහෝවූ අනෙකප්‍රකාර සියුපා සමූහයන් බලා වදාළමැනව, සෙසේවූ අනෙකප්‍රකාර සියුපා සමූහයන්දයන්? සිංහයන් හා ව්‍යාඝ්‍රයන්ද, වලසුන් හා සරබිනා වලසුන්ද, උරුවන් හා මුවන්ද, කොක්නාවුන් හා කානහිලුන්ද, කහමිසණුන් හා ගවරුන්ද, වල්මීවුන් හා ගිත්මුවන්ද, රුරුමුවන් හා එනිමිගයන්ද, මුවන් හා ගෝණුන්ද, පැටහුරන් හා කාළ සිංහයන්ද, කොකෙල්මුවන් හා බොහෝවූ ගිසිතුරු මුවන්ද, වල්බාවුන් හා සාවුන්ද, මීවිත්නන් හා හුරුමියන්දැයි මෙසේ අනෙකප්‍රකාර සියුපා සමූහයන් ගිසින් ආකිණ්ණව මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදාළමැනව, තවද මහරජ්ජුරුවන් වහන්ස! කිඹුලුන් හා දැතිමෝරුන්ද, පැටකිඹුලුන් හා මිස්සාවුන්ද, කැස්බන් හා ඉදිබුවන්ද, පෙටියන් හා ලූත් මසුන්ද, වලයින් හා මුදුන්ද, සුංගන් හා රේමසුන්දැයි මෙසේ ලැහැප්බැඳ ඇවිදිනා මස්කාලන් විසින් සෙවුනාලද රන්වැල්ලෙන් ගැවසීගත්තාවූ තීර ප්‍රදෙශ ඇති බස්නව සැපවූ තොට ඇති මෙබදු නදීහු විප්‍රසන්නයෙන් වහනය කරන්නාහ. මෙසේ වුකතප්‍රකාර මස්කාලන් විසින් ගහණවූ ගඹහා වෝ මේ මාණික්‍යරත්නයෙහි පෙනෙන්නාහ. මහරජ්ජුරුවන් වහන්ස! මේ විසතර බලා වදාළමැනව. තවද රජ්ජුරුවන් වහන්ස! කෙතකී වම්ප නාදි අනෙකප්‍රකාර දුම් සමූහයන් විසින් ආකිණ්ණවූ හංසවක්‍රවාකාදි අනෙක ප්‍රකාර පක්ෂි සමූහයන්ගෙන් ගහණවූ වෛඩූර්‍යමාණික්‍යමය ගලතෙලෙහි පැනැර හඬන්නාවූ පක්ෂි සමූහයන් මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදාළමැනව. තවද මහරජ්ජුරුවන්වහන්ස! මේ මාණික්‍ය රත්නයෙහි තිවිවාර වශයෙන් මනාකොට විභාගකරනලද්දාවූ සතරදික්අති නොයෙක් ලිහිණි සමූහයා විසින් ආකිණ්ණවූ පිළිපොතු ඇති මහමසුන් විසින් සෙවුනාලද මෙබදුවූ පුෂ්කරණීන්ද බලා වදාළමැනව. තවද මහරජ්ජුරුවන් වහන්ස! හාත්පසින් සරදියවලල්ලෙන් ගැවසීගත් ාවූ සාගරයම කුණ්ඩලා කරණකොට හිමාලයවන රෙඛායෙන් විශෙෂයෙන් හොඛනාවූ මේ පෘථිවි මණ්ඩලයද බලා වදාළමැනව. තවද මහරජ්ජුරුවන් වහන්ස! පූර්වදිග්භාග යෙන් පූර්වදෙහයද, නැවත පශ්චිමදිග්භාගයෙහි අපරගොයානද, උතුරු දිග්භාගයෙහි උතුරුකුරු දිවසින හා දකුණුදිග්භාගයෙහි මේ ජම්බුද්වීපයද යන සතරමහාද්වීපය මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතව පෙනෙන්නා බලා වදාළමැනව. තවද මහරජ්ජුරුවන් වහන්ස! පූර්වපශ්චිමදිග්භාගයන් බැඳුණු වන්නාවූ මේරගල වට ඇවිදිනාවූ චන්ද්‍රමණ්ඩලය හා සූර්‍යමණ්ඩලය යන මේ සඳ හිරු දෙදෙනාද, මහමේරු පර්වතය හා හිමාලය පර්වතයද, මහාසාගරයද, මහත්වූ ආනුභාව ඇති ධෘතරාෂ්ට්‍ර, විරූළ්හ, විරූපාක්ෂ, වෛශ්‍රවණය යන සතරවරම් මහරජදරුවන්ද, පුෂ්පාරාම ඵලාරාමයන් හා වන ලැහැබ්ද, අතලගල් හා මනොඥවූ කිඳුරන් විසින් ගැවසීගත්තාවූ ඉතා උස් පාංශුපර්වතද, බොරළුමුනුවනය හා චිත්‍රලතාවනයද, ශ්‍රීකවනය හා නන්දනොද්‍යානයද, වෛජයන්ත ප්‍රාසාදයද, සුධර්මාභාම් දිව්‍යසභාවද, තාවතිංස දිව්‍යපුරයද, සුප්‍රතිෂ්ඨිතවූ පරසතුරුකද, ඓරාවන නම් හස්තිරාජයාද, ආකාශයෙහි නැගාවූ විදුලියමෙන් නන්දනොද්‍යානයෙහි ලීලාපෙනව ඇවිදිනාවූ දිව්‍යාඞ්ගනාවන්ද, දිව්‍යපුත්‍රයන් තව්තිසාමන්ගේ භාවාකාරවිභ්‍රමයෙන් පොළඹවන්නාවූ දිව්‍යඉන්ද්‍රීන්ද, නැවත දිව්‍යපුත්‍රයන් හා මහාවලීලාදයන් තව්තිසාමන්

නෙරේ අලවන්නාවූ දිව්‍යසත්‍රීන්ද මේ මාණික්‍යරත්නයෙහි නිර්මිතවූ පෙතෙන්නා බලා වදාළමැනව. නවද මහරජ්ජුරුවන්වහන්ස! වෙරළුම්ණිමය පුවරු අතුළාවූමතොඤවූ පැහැයෙන් දිලියෙන්නාවූ දහසකටඅධිකවූ තවුතිසා දිව්‍ය පුරයෙහි මෙබඳුවූ ප්‍රාසාදයන්ද, වාහුමිහාරාජිකය,තාවතිංසය,යාමය,තුෂිතය, නිම්මානරතිය, පරනිර්මිතවසවත්තී යන, මේ සැදිව්‍යලොකයන්ද නවද පිරිසුදු අතිප්‍රසන්නාවූ ජල ඇති හෙල්මැල්ලෙන් හා රත්පියුම් හෙළපියුම් හා රතුපුල් නිලුපුල්මලින් ගැවසිගත් මෙබඳුවූ පුෂ්කරණීන්ද, බලා වදාළමැනව, නවද රජ්ජුරුවන් වහන්ස! මේ චක්‍රතප්‍රකාර මාණික්‍යරත්නයෙහි සිත්අලවන්නාවූ සුදුඉරි දශයෙක, නිල්ඉරි දශයෙක, පිහුවන් ඉරිවිස්සෙක, තඹවන් ඉරි විස්සෙක, සාමවන් ඉරි තුදුසෙක, රන්වන්ඉරි විස්සෙක, එසේම රිදිමියඉරි විස්සෙක, රතිදුගොව්වන් විටපැහා සමානවූ වණ ඇති මනොඤව පෙනෙන්නාවූ රත්ඉරි තිසෙක, කළුඉරි සොළොසෙක, මඳටවන්ඉරි පස්විස්සෙක, එකලුම දටවන්ඉරි විස්සෙක, බදුවදමලින් හා නිලුපුල්මලින් යුතුවූ වාක්‍යමෙන් විසිතුරුව සැදුමිලද කළුඉරි බදුවදමලින් මිශ්‍රවයාමෙන් හොබනේය. මඳටවන්ඉරි නිල්මහනෙල්මලින් මිශ්‍රවයාමෙන් හොබනේය, ඒප දෙත්තමවූ මහරජ්ජුරුවන් වහන්ස! මෙසේ සියලුකාරණයෙන් හා සියලු අවයවයෙන් සම්පූර්ණවූ ප්‍රභාවිහිදෙන්නාවූ ශුභලක්ෂණයයි කියනලද නිඛියයුතු පරදුව බලා වදාළමැනව, මහරජ්ජුරුවන් වහන්ස! යමෙක් දූකෙළියෙන් පැරදවූයේ මිනම් ඔහට මාදියයුතු විසතු බලා වදාළමැනවැයි කිය. මෙසේ කියා ඒ පූණිණ නම් යක්ෂසෙනාධිපතියතෙම් මහරජ්ජුරුවන් වහන්ස! මමවූනාලි දූකෙළියෙන් පැරද්දේවිම්නම් මේ මාණික්‍යරත්නය දෙමි. නුඹවහන්සේ තුමක් දෙනසේක්දැයි කිය. දරුව! මාගේ ශරීරයන් ධවලවර්ත්‍රයත් හැර සෙසු මා සන්තක සියල්ල වඩිඹිවේවයි කිවුය. එබස්අසා පූණිණයා එසේවිනම් මහරජ්ජුරුවන් වහන්ස! කල්නොයැවුව මැනව, මම දුරසිට ආමි, දයූතශාලාව වහා සැරසුව මැනවැයි කිය. රජ්ජුරුවෝ එපවත් අසා අමාත්‍යයන්ට දයූතශාලාව සරසන්නට විධාන කළහ. එබස්ඇසූ අමාත්‍යයෝ වහා දයූතශාලාව සරහා රජ්ජුරුවන්ට උතුම්වූ කම්මත්ත කරනලද ආසනරණයක් හා අවශෙෂ රජදරුවන්ටත් අසුන් පනවා පූණිණයාදිත් හිඳිනට සුදුසුවූ අස්නක් නියම කොට සලසා රජ්ජුරුවන්ට දයූතක්‍රීඩාවම කල්දන්වූහ.

ඉක්බිත්තෙන් පූණිණයා රජ්ජුරුවන්ට කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! දයූතශාලායෙහි කළමනාකාරයා කොට නිවිවනලද, එසේ හෙයින් අමාත්‍යයන් පිරිවරා දූකෙළනා ස්ථානයට වැඩියමැනව, නුඹවහන්සේගේ මෙබඳුවූ අනිවඩගලසම්මතවූ මාණික්‍යරත්නයක් හාණ්ඩාගාරයෙහි නැත, මහරජ්ජුරුවන්වහන්ස! හෙළනමෝ දෙන්නම ධම්යෙන්ම දනම්හ. අධම්යෙන් නොදනම්හ, වැළි නුඹවහන්සේ මාවිසින් ඉදින් දිනනලදසේක්වීනම් යුහුවම නුඹවහන්සේ දෙමියි ප්‍රතිඥකළ වස්තූන් මට දුන මැනවැයි කිය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඔහට කියන්නෝ මානවකය! මුත්වහන්සේ රජ්ජුරුකෙනකුත්වහන්සේ වේදැයි මාකෙරෙහි භයනොවව, අප දෙදෙනාගේ ජය පරාජය දැහැමින්ම වන්නේය. බලාත්කාරයෙන් නොවන්නේයයි කිහ. එබස් අසා පූණිකයා කියන්නේ අප දෙදෙනාගේ ජය දැහැමින්ම වනසියාව දනයුතුයයි රජදරුවන් සාක්ෂිනොරෙමින් මේසේ කී ය. ප්‍රසිඩවූ පඤ්චාලදෙශයෙහි වසන්නාවූ රජ්ජුරුවන්වහන්සේද, ඉරවූ

සෙනාව ඇති **ශූරසෙන** නම් රජ්ජුරුවන්වහන්සේද, මච්ඡනම්රට **මච්ඡ** නම් රජ්ජුරුවන්වහන්සේද, මද්දරට මද්දනම් රජ්ජුරුවන්වහන්සේද, කෙකනම් දහසට හා සමඟ පවත්නාවූ **කෙක** නම් රජ්ජුරුවන්වහන්සේද, යන මේ රජවරුන් අප දෙදෙනාගේ අවසථායෙන් කරනුලබන්නාවූ දූතයුඩය බලත්වා, ජනසභායෙහි කිසිදෙයක් නොකරන්නෝ නොවෙති, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් දෙස්ගන්වත්මය, එසේහෙයින් ඉදින් මේ දූතයුඩයෙහි කිසි අයුක්තියෙක් උපනි නම් අපි නුදුටුවමිහ. නොඇසුම්හයි කියන්නට සුදුසුනොවන්නේය. එසේහෙයින් රාජසභායෙහි උන් හැම රජදරුවන් වහන්සේම ඇසුදුටු යුක්තිය පක්ෂපාතනොවී මධ්‍යස්ථව කියයුතුයයි ඒ පූණිකයා සභායෙහි රජදරුවන් මෙසේ දෙස්ගැන්විය.

ඉක්බිත්තෙන් ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ එක්සියයක් රාජධානියේ රජදරුවන් විසින් පිරිවරනලදුව පූණිඛ නම් යක්ෂසෙනාධිපතියා කැඳවාගෙන ගොස් දූතශාලාවට වන්හ. සියලු රජදරුවෝ තමන් තමන්ට සුදුසු අසුන්වල හුන්හ. රාජ්ජුරුවෝද දූපෝරුයෙහි රන්පස ඇව තුබූහ. පූණිඛයා යුතුව කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! පසඇටෙහි අයනම් මලියය, සාවටය, බහුදුය, සන්නිහදුය, යනාදි ඒස්සක් අය ඇත, එබඳුවූ අයින් නුඹවහන්සේට අභිප්‍රාය අයක් ගතමනාවැයි කිය, එබස් අසා රජ්ජුරුවෝ යහපතැයි ගිවිස බහුලනම් අය ගත්හ. පූණිකයා සාවට නම් අය ගත, එකල්හි රජ්ජුරුවෝ ඔහුට කියන්නාහු එසේවී නම් දරුව මානවකය! පස ඇට දමවයි කිවුය, එබස් අසා මානවකයා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! පළමුකොට මට වාරය නොවන්නේය, නුඹවහන්සේ පළමුකොට පස ඇට දැමුව මැනවැයි කිය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා යහපතැයි ගිවිස්සහ. ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන්ගේ වූකලී තුන්වැනි ආත්මභාවයෙහි මැනියෝම ආරක්ෂාදෙවතාවූහ. එසේහෙයින් දිව්‍යාඞ්ගනාවගේ ආනුභාවයෙන් රජ්ජුරුවෝ දූකෙළියෙහි ජයගත්තාහ. එකල්හි ඒ දිව්‍යසත්‍රී දූසෙළනා රජ්ජුරුවන්ට නුදුරුතැන සිරියාය. රජ්ජුරුවෝ දිව්‍යසත්‍රිය සිනිකොට **සඛවසසාරස තුණහාසස** යනාදීන් අභිමත දූතගීතිකාවක් කිය කියා පස ඇට අතින් ඝටා ආකාශයට දැමූහ. එකල්හි පූණිකයාගේ ආනුභාවයෙන් පස ඇට රජ්ජුරුවන් පරදවමින් දූපෝරුවේ වැටෙන්නට එන්නේය, රජ්ජුරුවෝද දූකෙළියෙහි දක්ෂබැවින් තමන්ට ප්‍රයොග පස ඇට බස්නා දැන දූපෝරුයෙහි නොපියදී ආකාශයෙහිදීම ඇද අල්වාගෙන නැවත පස ඇට ආකාශයට දැමූහ. දෙවනුත් තමන්ට පරාජයව එන නියාව දැන පළමුපරිද්දෙන් ආකාශයෙහිදීම පස ඇට ඇල්වූහ.

ඉක්බිත්තෙන් පූණිකයා සිතන්නේ මේ රජ්ජුරුවන්වහන්සේ මාබඳු යක්ෂයකු හා සමඟ දූකෙළනාසේක් වැටෙන්නාවූ පස ඇට දූපෝරුයෙහි නියනොදී උඩසිස්පිටදීම ගසා අල්වාගන්නාසේක. මීට කාරණා කිම්දෝහෝයි සිතා ඒ පූණිකයා රජ්ජුරුවන්ගේ ආරක්ෂා දිව්‍යසත්‍රියගේ ආනුභාව නියාව දැන ඇස් දල්වා කිපී එනක්හුමෙන් දිව්‍යසත්‍රිය මුහුණබැලීය. එකල්හි ඒ දිව්‍යසත්‍රී භයින් තුසඨව පලාගොස් සක්වළගල මුදුනට පැමිණ වෙවුලවෙවුලා සිටියාය. රජ්ජුරුවෝ එපවත් නොදැන තුන්වැනිවාර යෙහිත් පස ඇට දමා තමන්ට පරාජයව පස ඇට බස්නා නියාව දැන දැනත් පූණිකයාගේ ආනු

භාවයෙන් අතදිගුකොට පස ඇට අල්වාගන්නට අසමර්ථවූහ. එකල්හි ඒ පස ඇට රජ්ජුරුවන් පරදවමින් දූපෝ ෘයෙහි වැටිහිණ. ඉක්බිත්තෙන් ඒ පුණ්ණකයා රජ්ජුරුවන් පැරදිනියාව දැන අතින් අතපොළා අත්පොළසන්දී මහත්වූ ශබ්දයෙන් "ජයගනිමි, ජයගනිමි" කියා තුන්විටෙක හඬගැසුයේය. ඒ ශබ්දය සියලු දශදහසක් යොදුන් දඹදිව පැතිර සිටියේය. එකල්හි රජ්ජුරුවෝ පැරදිනැනැත්තෝ නොසතුටුවූ සිත් ඇතිවූහ.

ඉක්බිත්තෙත් පුණ්ණකයා රජ්ජුරුවන් නොසතුටුවූ නියාව දැන අස්වසා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! ජය පරාජය යනදෙක ඊශ්වරයන් නාවූ දෙදෙනකු අතරෙන් එකකුහට වන්නේය. තුල්‍යබව නොවන්නේය. එසේහෙයින් පැරුද්දෙමියි දෙමිනස් නුවුවමැනව, ජනෙන්දවූ මහරජ්ජුරුවන්වහන්ස! උතුම්වූ ධනයෙන් දැන් පිරිහුණුසේක. එසේහෙයින් මාවිසින් පරදවනලද්දාවූ නුඹවහන්සේ මට වහා ජය පඬුරු දුනමැනවැයි කිය, එකල්හි ඔහට රජ්ජුරුවෝ ජයපඬුරුගනුවයි කියන්නාහු කාත්‍යායනය! ඇතුන්අසුන් හා ගෙරිමිවුන්ද, මුකතාමාණික්‍යාදීවූදශවිධරත්නයන් හා මාණික්‍යමයවූ කුණ්ඩලාභරණයන්ද, පොළෝතෙලෙහි ධනයන් අතරෙන් උතුම්වූ මාසන්නක යම් අන්‍යවූ රත්නයෙක් ඇත්නම් ඒ සියල්ලද තා කැමැති පරිදි දෙන් ඇරගනුව, එසේ ඇරගෙන යම් මාගීයකින් යනු කැමැත්තේවී නම් ඒ මාගීයෙන් නික්මෙවයි කීහ. එබස් අසා පුණ්ණකයා කියන්නේ මහරජ්ජුරුවන්වහන්ස! අතුන් අසුන් හා ගෙරිමිවුන්ද, මුතු මැණික් ආදිවූ දශවිධරත්නයන් හා මාණික්‍ය කුණ්ඩලාභරණද, පොළෝතෙලෙහි ධනයන් අතරෙන් උතුම්වූ නුඹවහන්සේ සන්තක අන්‍යවූ රත්නයෙක් ඇත්නම් ඒ යථොක්තවූ වස්තුද යනමේ සියල්ලට වඩා විධුරතම් අමාත්‍යතෙමේ උතුම් වන්නේය. දූකෙළ පරදවන්නාවූ මාවිසින් විධුර පණ්ඩිතතෙමේ පරදවනලද්දේය. එසේහෙයින් ඔහු මට ජය පඬුරුකොට දුනමැනව, පොළෝතෙලෙහි යම් කිසි රත්නයෙක් ඇත්නම් ඒ සියලුම රත්නයම මාවිසින් පරදවනලද, එසේවුවත් ඒ සියලු වස්තූන්ට වඩා උතුම්වූයේ නුඹවහන්සේගේ අමාත්‍යරත්නයය. දූකෙළ නුඹවහන්සේ පරදවන්නාවූ මා විසින් ඔහු පැරදවීම්. ශරීරයත් ශෛවතවජත්‍රයත් නබා ඉතිරි කිසියම්රත්නයෙක් ඇත්නම් දෙමියි පළමුම ප්‍රතිඥකළ බැවින් නුඹවහන්සේගේ ඒ අමාත්‍ය රත්නය මට දුනමැනවැයි කියා රත්නයෙහිම අන්තර්ගතකොට ඉල්විය. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු පුණ්ණකය! ඒ විධුර පණ්ඩිතයෝ මාගේ ආත්මයය උදෙක් ආත්මය මතුත්නොවෙයි මට සරණය, පිහිටය, රක්ෂාස්ථානය, නිලීනස්ථානය, පිළිසරණය, මාගේ ඒ අමාත්‍ය තෙමේ සප්තාවිධ රත්නයෙන් සමානනොකොට ගැක්කේය. ඒ අමාත්‍ය තෙමේ මාගේ ජීවිතය හා සදෘශය, එසේහෙයින් පළමුකොට ආත්මය නබා සෙස්සදෙමියි මා විසින් ප්‍රතිඥකළ බැවින් මේ පණ්ඩිත තෙමේ නම් මාගේ ආත්මයය, එසේහෙයින් ඔහුදෙන්නට නොපිළිවන්වේදැයි කීහ. එකල්හි පුණ්ණකයා කියන්නේ මහරජ්ජුරුවහන්ස! නුඹවහන්සේගේ හා මාගේ මේ කලහය බොහෝ කලක් පවත්නේය. එසේහෙයින් ඒ පණ්ඩිතයන් සවම්පයටමගොස් විවාරම්හ. නුඹවහන්සේගේආත්මය ආත්මය නොවෙයි යන කාරණය ඒ පණ්ඩිතයෝ තුමූම අපට ප්‍රකාශ කෙරෙත්වයි ඒ පණ්ඩිතයෝ තුමූ යම් කාරණයක් කිවූ නම් ඒ උන් කී කාරණාව අප දෙපසෙහි යටම බස්වේවයි කීය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කියන්නාහු මානවකය! එසාන්නයෙන් හෝ සැබෑවක්ම කියන්නෙහිය, අධර්මයක් නොකියන්නෙහිය, හා කිවාසේ ඒ පණ්ඩිතයන් සරණ ගොස් මේ කාරණය විචාරව්හ. එකල්හි අපි දෙදෙන ඒ පණ්ඩිතයන් කී කාරණයක් හෙන සතුටුවෙමුයි කිව. මේසේ කියා රජ්ජුරුවෝ එයියැක් රජදරුවනුත් පුණ්ණයාත් සැදුවාහෙන සතුටුවූ සිත් ඇතිව එක එකා ධර්මාසනයෙහි හිඳිය. එකල්හි පණ්ඩිතයෝ ධර්මාසනයෙන් බැස රජ්ජුවන් වැඳ එකත්පස්ව සිටියාහ.

ඉක්බිත්තෙන් පුණ්ණයා මහබෝසතාණන්ට ආමන්ත්‍රණය කොට කියන්නේ පණ්ඩිතයෙනි! තෙපි ධර්මයෙහි පිහිටියව, ජීවිතය නිසාවත් බොරු නොකියව, තොපගේ කීර්ති ඝොෂාව සියලු ලොව පැතිර සිටියේය. මම වූකලී අද තොප ධර්මයෙහි පිහිටි තියාව දන්නා කෙමැත්තෙමියි කිය, මේසේ කියා නැවත බෝධිසත්වයන් අතින් එපවත් විමාරන්නේ පණ්ඩිතයෙනි! 'කුරුරට විධුරනම් අමාත්‍යතෙමේ දස කුශල ධර්මයෙහි පිහිටියේ ජීවිතය විනාශවතුත් බොරුවක් නොකියන්නේය'යි දෙවතාවෝ මේසේ කියති. එසේකියන්නාවූ දෙවතාවෝ සැබෑවක් කියද්දෝ හෝ නොඑන්බොරුවක් කියද්දෝ හෝ පොදුවූකලී නොවලහා සැබෑවක්මකියව, තෙපි රජ්ජුරුවන් එහන්සේගේ මුන්හඬු කෙනෙක්ද? නොඑන්ත් රජ්ජුරුවන් වහන් සේගේ හැසෙනෙක්ද? මේ සත්ත්වලොකයෙහි විඛ්‍යාත යනමේ ප්‍රඥප්තිය නොව සවඥඥතඥානකුනැයි ප්‍රකාශකෙරේද? නෙපි රජ්ජුරුවන්ගේ ගැන්හඬු කෙනෙක්ද? නොඑන්ත් ඉහා හිනකෙනෙක්ද? රජ්ජුරුවන්වහන්සේ හා සම කෙනෙක්ද? රජ්ජුරුවන්වහන්සේටත් වඩා අනනි කෙනෙක්ද? නොව බොරු නොකියනිසි ලොභප්‍රසිඩ හෙයින් නොවලහා මට ඇනි සැටියම කිය වසි කිව. එකල්හි මහබෝසතාණෝ සිතන්නාහු මේ මානවකයා මා අතින් මේසේ විචාරන්නේය. මම වූකලී රජ්ජුරුවන්සේගේ නැසෙනෙක්මි කියා වත් රජ්ජුරුවන්වහන්සේට උත්තරිතරයෙමි කියාවත් රජ්ජුරුවන්වහන් සේට මා වන දෙයෙක් නැතැයි කියාවත් මොහු ගිවිස්වන්නට සමර්ථයෙමි, එසේදවුවත් මේ ලොකයෙහි සත්‍යය සමානවූ පිහිටෙක් නවත් නැත්තේය අද මා සැබෑවක්ම කියන්නට සුදුසුවන්නේයයි සිතා මානවකය! මම රජ්ජුරුවන්වහන්සේගේ නැ එකකුත් නොවෙමි. රජ්ජුරුවන්වහන්සේට උත්තරිතර එකකුත් නොවෙමි, මේ ලොකයෙහි දැසයෝ සතරපසෙකයෙක් ඇත. ඒ සතරපසෙකයෙහි දැසයන් අතරෙන් මමත් එක් දැසයෙක්මියි දක්වන්නාහු මේසේ කිව. මානවකය! මේ ලොකයෙහි සමහර කෙනෙක් ගෙයිදැම්මියක කුසඹන්නාහු දැසවන්නාහ. සමහර කෙනෙක් වසතු දී වික්‍රයකොට ගත් නාහු දැසවන්නාහ. සමහර කෙනෙක් තුමූම බන්ඳව නිසා සෙවක බවට පැමිණ දැසවන්නාහ. සමහර කෙනෙක් රාජ චොර භයින් සාමි විසයෙන් චුතකොට බලාත්කාරයෙන් පරවිසයට පමුණුවනලද්දාහු දැසවන්නාහ. අන්‍ය යාගත වහල, රන් දීගත් වහල, සවයං දැසබවට පැමිණි සෙවක වහල නොල්ලගත්වහල, යන මේ චතුඃප්‍රකාරසතරපසෙකයෙහි ඇත්තෝසත්ත්වයන්ගේ දැස වන්නාහ, එසේහෙයින් එකාන්තයෙන් මමත් චතුර්විධ දැසයොනියෙන් උපස්ථායකබවයෙන් සවයං දැසභාවයට පැමිණි දැසයෙක්මි, රජ්ජුරුවන්වහන් සේට වැඩෙක්වුවත් අවැඩෙක්වුවත් බොරු කියන්නට නොපිළිවන, දුරට ගොසිනුත් මම දෙවයන්වහන්සේට ගැත්තෙම්මය, රජ්ජුරුවන්වහන්සේ

ජය පඬුරට තබා තට මා දෙනසේක් අධර්මයෙන් නොව ධර්මයෙන්ම දෙන සේකැයි කිහ. එබස් අසා පුණ්‍යයා අතිශයින් සන්තුෂ්ටවූ සිත් ඇතිව නැවතත් අත්පොළසන්දී කියන්නේ පළමු දෑතන්ත්‍රීඛාවෙන්ලද්දාවූ ජය මාගේ පළමුවැනි ජය වන්නේය, බොධිසත්වයන් අවිරෝධකොට මැදහත්ව කී මේ ප්‍රශ්න ව්‍යාකරණය අද මාගේ දෙවැනි ජය වන්නේය, මා විසින් විචාරන ලද්දාවූ විධුර පණ්ඩිතයෝ මේ ප්‍රශ්නය ප්‍රකාශකොට කිහ, මේ රජ්ජුරුවන් වහන්සේ එකාන්තයෙන් අධර්මිසවරූප ඇතිව බොරු කියන සුලුසේක. විධුර පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනාකොට කියනලද, මෙසේ සත්‍යවාදිවූ පණ්ඩිතයන් කවර කාරණයකින් මට නොදෙන සේක්දැයි කිය.

එබස් අසා රජ්ජුරුවෝ සිතන්නාහු මේ විධුර පණ්ඩිතයෝ මාබදුවූ යශ පිරිවර දුන් එසක්හු මුහුණ නොබලා දුන් දුටු මානවකයා මුහුණ බැලූ හයි මහබෝසතාණන්ට කිපී ඉදින් ඌ තුමූ දැසවුනම් ඇරගෙන යවයි කියන්නාහු ක්‍රාත්‍යායනය! මම දැසයෙමි, රජ්ජුරුවන් වහන්සේගේ නෑ එකෙක් නොවෙමියි මේ පණ්ඩිතයෝ ඉදින් අපට මේ ප්‍රශ්නය පහළකොට කිවුනම් එසේහෙයින් මුළුලොව රත්නයන් අතරෙන් උතුම්වූ මේ අමාත්‍ය රත්නය ඇරගෙන යම් මාගියකින් යනු කැමැත්තේවිනම් ඒ මාගියෙන් නික්මෙවයි කිහ. මෙසේද කියා රජ්ජුරුවෝ සිතන්නාහු පණ්ඩිතයන් ඇරගෙන මානවකයා කැමැතිපරිද්දෙන් යන්නේය, උන් ගියවේලේ පවන් මට මිහිරිවූ ධර්මකථාවන් දුල්භවන්නේය, එසේහෙයින් මුන් සිටි පූජ්‍යස්ථානයෙහිම සිටුවා ගෘහ වාස ප්‍රශ්නය විචාළෙම්විනම් යහපත් වන්නේ යයි සිතූහ, මෙසේ සිතා ඉක්බිත්තෙන් මහබෝසතාණන්ට කියන්නාහු පණ්ඩිතයෙනි! නොප ඇරගෙන ගිශ කල්හි මට මධුරවූ ධර්මකථා දුල්භ වන්නේය, එසේහෙයින් අලඞ්කෘතවූ ධර්මාසනයේ හිඳ සකලලොක පූජිතවූ උත්තමවූ නොපගේ පණ්ඩිත ස්ථානාන්තරයෙහි හිඳ ගෘහ වාස ප්‍රශ්නය කිය වයි කිහ. මහබෝසතාණෝ රජ්ජුරුවන් කීබස් යහපතැයි පිළිගෙන සරහා පිළියෙළකරනලද උතුම්වූ ධර්මාසන මස්තකයේ හිඳ රජ්ජුරුවන් විසින් ප්‍රශ්න විචාළ කල්හි තුමූ විස්සජ්නය කළහ.

ඒ කෙසේදයන්?

විධුර පණ්ඩිතයෙනි! තමාසතු ගෙයි වසන්නාවූ ගෘහස්ථයාහට කවර ගුණයකින් යුක්තවූ කල සසරහය නැතිව විසිය හැකිද? නැවත ඒ ගෘහස්ථයාගේ දැන, ප්‍රියවචන, අර්ථවර්‍ය්‍යා, සමානාත්මතා, යන සතර සංග්‍රහවස්තු සංඛ්‍යාතවූ සංග්‍රහයවේද, සත්‍වයෙමේ නිදුක් නිරොගිවූයේ කෙසේවන්නේද? කෙසේ සත්‍යවාදීවේද? මෙලොවින් පරලොවට ගොස් පරලෙව්හි කෙසේ ශොක නොකෙරේදැයි රජ්ජුරුවෝ විචාළහ. එකල්හි ඥානගතියෙන් ගතිමත්වූ නිරන්තර ප්‍රතිභාන වීර්‍ය්‍යයෙන් ධෛර්‍යවත්වූ විඥානයෙන් සමාහිමත්වූ සති සූක්ෂම අර්ථ දක්නාවූ ඥානයෙන් අර්ථදර්ශිවූ පිරිසිඳ දන්නාවූ ඥානයෙන් සියලු ධර්මයන් නාමඉහසින් කියන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ ධාර්ත්‍රාෂ්ට්‍ර කොරව්‍ය රජ්ජුරුවන්ට ධර්ම සභායෙහිදීම මේ වක්ෂ්‍යමාන ගෘහවාස ප්‍රශ්නය කිහ. පරස්ත්‍රී සෙවනය කරන්නාවූ පුරුෂයා සංවාසයෙන් සියලු සත්‍රීන්ට සාධාරණ හෙයින් සාධාරණ නම්වෙයි. එසේ සාධාරණ නොව සවදරුවන් විෂයෙහිම සන්තොෂවීමෙන් අසාධාරණ වන්නේද, ප්‍රණීතාහාරයක් ලදින්

අහුන්ට බෙදනොදී උදකලාව ඉද අනුභව නොකරන්නේද, අනර්ථ නිශ්‍රිතවූ සැහීම් මොක්ෂාවහ නොවන්නාවූ අනෙකස්ත්‍රීනිසා විතණ්ඩ සල්ලාපයයි කියනලද රාම සීතා හාරතාදි කථා සෙවනය නොකෙරේද, මෙසේ ප්‍රවෘත්තවූ මේ නිරර්ථක කථාව ප්‍රඥ වර්ධනය නොකරන්නේය, එසේහෙයින් මෙබදු කථා නොකිය යුත්තේය, තවද අඛණ්ඩ පඤ්චශීලයෙන් සමන්විත වන්නේද, ගෘහවාස වෘත්තියෙන් හා රාජ වෘත්තියෙන් සමන්විතද, දාන ශීලාදි කුශල ධර්මයෙහි ප්‍රමාද නොවේද, සභා නොවිත ප්‍රඥ ඇත්තේද, ගුණවෘද්ධ වයෝවෘද්ධයන් කෙරෙහි සවත්වූ පැවැතුම් ඇතිව අධිමානය නොකොට අවවාද අනුශාසනා පිළිගනිද, තද මසුරු නොවේද, කුශල ධර්මයෙහි මනාව ඇලුණේද, කීකරුද, ප්‍රේමනීයවූ මවසිලුටුවූ තෙපුල් ඇත්තේද, කායාදි චාරිත්‍රයෙන් මොලොක්ද, යමෙක් දාන ප්‍රිය වචනාදිවූ යමකින් සතුටුවේනම් ඕහට ඉන් සංග්‍රහ කරන්නේද, ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා කෘපණඬ්ඨ යාචකාදීන්ට නොහැඳින දෙයදී අනුභව කෙරේද, මෙකල සාන්නට සුදුසුය, මෙකල වපුරන්නට සුදුසුයයනාදීන් මෙසේ කෘෂිකර්මාන්තයෙහි සියලු කෘත්‍යවිධානයෙන් සමන්විතද, මහණ බමුණන් ගෙනාගෙනා භාජන බත්පැන්පුරුදීමෙන් හැම කල්හි පිනවන්නේද, ප්‍රවේණිධර්ම හා සුචරිතධර්මය කැමැතිව නොහැර වූපරිද්දෙන් පිළිපදිද, බොහෝ ඇසු පිරූ තැන් ඇත්තේද, ධාර්මිකවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ "කිං භන්තෙ කුසලං කිං අනවජ්ජං" යනාදීන් ප්‍රතිපත්ති පුළුවුස්නා සුලුවන්නේද, සිල්වත්වූ බොහෝ ඇසු පිරූ තැන් ඇත්තාවුන් සමීපයට ගෞරව ඇතිව එක්වන් එළඹිද, ගිහිගෙයි වසන්නාවූ මේබදු ගෘහස්ථයාට වුක්තප්‍රකාර ගුණාඩ්ගවලින් සමන්විතවූ කල්හි සසර හඟනැතිව විසිය හැක්කේය. ඒ ගෘහස්ථයාගේ දාන, ප්‍රියවචන, අර්ථචර්‍යා, සමානාත්මතා, යන සතර සංග්‍රහවස්තුයෙන් සංග්‍රහය යනාදි ගුණවලින් යුක්තවූශේෂ නිදුක් නිරොගිවන්නේය. සඞ්ඛෙපෙමේ මේසේපැවතිකල්හි සත්‍යවාදීවන්නේය. මේකී ගුණයෙන් යුක්තවූයේ මේලොවින් පරලොවගොස සොඝනොකරන්නේයයි කිය. මේසේ මහබෝසතාණෝ ගෘහවාස ප්‍රශ්නය කියා ධර්මාසනයෙන් බැස රජ්ජුරුවන්ට වැන්දහ රජ්ජුරුවෝත් මහබෝසතාණන්ට මහත් සත්කාර නොට ඒ සියයක් රජදරුවන් විසින් පිරිවරන ලදුව තමන්ගේ මාලිගාවටම ගියහ, මහබෝසතාණෝ වූකලි එතැනම රැඳී සිටියහ. එකල්හි බෝධිසත්වයන්ට පූජිකයා කියන්නේ විධුර පණ්ඩිතයෙනි! තොපගේ රජ්ජුරුවන් විසින් නිරාලයව තොපි මට දෙන ලදහ, එසේහෙයින් දැන්වවරෝ යම්හ, මට වැඩෙහි හැසිරෙන්නාවූ තොපවිසින් තොපගේ සවාමිවූ රජ්ජුරුවන්ට වැඩෙහි හැසුරුණා නම්වෙයි. මාත් තොපට මෙතැන්පටන් ඉසුරු බැවින් ඒ තොපගේ සවාමිහට භළ යම් අනිවෘත්තියෙක් ඇත්නම් මටත් එලෙසම කරව, සවාමියාහට පක්ෂපාතවීම බුදු පසේබුදු මහරහතුන් නොහැරසොට දා ධර්මාගීයෙ කැයි කිය. එබැවසා විධුරපණ්ඩිතයෝ කියන්නාහු මානවකය! තා විසින් මම් ලබනලද්දේවේමිසිදනිමි, ලබන්නෙහිත් අනික්පරිද්දකින් ලදුයේ නොවෙයි. මට ඊශ්වරවූ රජ්ජුරුවන් වහන්සේ විසින් තට නිරාලයව දිපියතලද්දෙමියි දනිමි. එතකුදුවුවත් යම් පමණ කලකින් අපගේ දුදරුවන්ට අවවාද අනුශාසනා කරමෝ නම් එපමණවූ හුන්දවසක් කල් තා අපගේ ගෙයි වස්වනු කැමැත්තම්හ. මම තට බොහෝ උපකාර කෙරෙම්, රජ්ජුරුවන් වහන්සේගේ මුහුණනොබලා ඇත්තක්මකිම්, එසේහෙයින් තාවිසින් මම ලද්දෙමි, මම ඉදින් අනිතක් කිම්නම් නෝ මා ලැබගත නොහෙන්නෙහිය. එසේ

හෙයින් මා තට උපකාරිනියාව සලකව, නවද මා මහත් නියාවත් දැන මාගේ පුත්‍රදූරුවන්ට අවවාදානුශාසනා කරනතෙක් තුන්දවසක් ඉවසා මාගේ ගෙයි වසවයි කීහ. එබස් අසා පූණිකයා සිතන්නේ පණ්ඩිතයෝ ඇත්තක්ම කීහ. මුන් මට උපකාරී නියාව ඇත්තමය. එසේහෙයින් සතියක්වත් දෙපොළ් යක්වත් ඉවසන්නට වුවමැනැවැයි ඉදින් කීවත් ඉවසිම යුතුමයයි සිතා සියන්නේ පණ්ඩිතයෙනි! යමක් තොපි කිවුනම් ඒ සියල්ල එපරිද්දෙන්ම වේවයි තොප කී තුන්දවස තොපගේ ගෙයි වසම්හ, පින්වත්වූ තෙපි අද පටන් තුන්දවසක් ගෙයිකළමනා යම් කෘත්‍යවිධානයෙක් ඇත්නම් ඒ සියල්ල කරව, තොප මා හා කැටිව ගිය කල්හි පසුව තොපගේ පුත්‍රදූරුවෝ යම් පරිද්දෙකින් සුවපත් වෙත්නම් එපරිද්දෙන් පින්වත්වූ තෙපි අද පටන් තුන්දවසක් පුත්‍රදූරුවන්ට අවවාදානුශාසනා කරවයිකීය. මෙසේ කියා පූණිකයා මහබෝසතාණන් හා සමඟ උන්හේ මාලිගාවට වන, තවද මහත්වූ උපභොග පරිභොග වස්තු ඇති ඒ පූණික නම් යක්ෂසෙනාධිපතියා ආචාර්‍යයන් කෙරෙන් උතුම්වූ බුඩාඞ්කුරවූ ඒ විධුර පණ්ඩිතයන්ගේ තෙපුල් ගහප තැයි පිළිගෙන පණ්ඩිතයන් හා සමඟගියේය. ගොයින් හස්තීන් හා ආජානීය සෛන්ධවයන්ගෙන් ගැවසීගත්තාවූ ඒ මහබෝසතාණන්හේ අනතඃපුරයට වන්නේය. මහබෝසතාණන්හේ වූකලී තුන් ඍතුවට කරනලද සොළොස්ව තම් ප්‍රාසාදය මයූර නම් ප්‍රාසාදය ප්‍රිෂතොක නම් ප්‍රසාදයයි මෙසේ ප්‍රාසාදත්‍රයෙක් වන්නේය. ඒ තුන් ප්‍රාසාදයන් අතරෙන් බොධිසත්වයෝ තුවූ යම් ප්‍රාසාදයෙක්හි වෙසෙත්නම් එහි බොහෝ ඝනබොන දැ හා බත්පැන් ඇත්තේය. එසේ ඇත්තාවූ සක්දෙව් රජ්ජුරුවන් මහන්සේගේ මෙර මුදුතෙහි චිඟිටි ශක්‍රභවනය වැනිවූ අතිරම්‍යවූ ඒ ප්‍රාසාදයට පූණිකයා කැඳවාගෙන ගියහ. ගොස් අලඞ්කෘතවූ ප්‍රාසාදයාගේ සත්වැනි මාලයෙහි ශ්‍රියහන් ගබඩා වත් මතුමාලත් සරහා ශ්‍රියභවනක් පනවා සියලු ආහාර පානවලින් එළවා දිව්‍යාඞ්ගනාවන් සමානවූ පන්සියයක් සත්‍රීන් මොහුට පාදපරිචාරිකා වෙත්වයි උකටලී නොව වසවයිකියා ඔහට පාවාදී තමන් වසන්නාවූ සථාතයටමගියහ. ඒ බොධිසත්වයන් ගියකල්හි තවුතිසා දිව්‍යලොකයෙහි දිව්‍යප්සරාවන් මෙන් සම්හරණයෙන් අලඞ්කෘතවූ උත්තමසත්‍රීහු ඒ අලඞ්කෘතවූ ප්‍රාසාදයෙහි නටන්නාහ. ගීකියන්නාහ. නැවත උතුම්වූ නෘත්‍යගීතයෙන් ඔවුනොවුන් පරදවන්නාහ. ඉක්බිත්තෙන් ප්‍රවේණී ධර්ම හා සුවරිත ධර්ම රක්ෂාකරන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ පූණික නම් යක්ෂයා නෘත්‍යගීතවාදිතයෙහි දක්ෂවූ පන්සියයක් උත්තම සත්‍රීන් හා එක්කොට ප්‍රණීතවූ අනෙකප්‍රකාරවූ ආහාරපාන වර්ගයෙන් පිනවා තමන්ට ප්‍රයොජනාර්ථයක්ම සිතන්නාහු එසල්හි තමන්ගේ ප්‍රධාන අග්‍රමහෙෂිකාවන් සවම්පයට ගියහ, මෙසේ ගොස් ඒ මහබෝසතාණන් රත්නදුන් විලවුන් ගත්තාවූ ජාඔහොඳ සවණී පුඤ්ජයක් වැනිවූ ඒ තමන්ගේ ප්‍රධාන බිසවුන්ට කියන්නාහු තාම්‍රනෙත්‍රයන් ඇත්තාවූ පින්වතිය! මෙසේ වර, මං කියන්නක් අසව, මාගේ ධර්මපාල කුමාරයන් ප්‍රධානකොට ඇති පුතුන් හා දුන් මා සවම්පයට කැඳවා ගෙනෙවයි කීහ, එකල්හි විධුර පණ්ඩිතයන්ගේ අනොජා නම් අගබිසවූ තොමෝ අතිප්‍රියවූ ඒ ස්වාමිහුගේ අති මධුරවූ නියොග වචනය අසා මා ගොස් දරුවන් කැඳවන්නට සුදුසු නොවන්නේය. එසේහෙයින් යෙහෙලිය යවම් සිතා ඒ වෙනා නම් යෙහෙලිය සවම්පයට අඩම්න්වලපමන්ගොස් තාම්‍රවර්ණවූ නියඇති සුනිල් දිගුපුළුල් මනා ඇස් ඇති තමන්ගේ යෙහෙලියට කියන්නාහු නිලුපුල් මල්පැහැ මෙන්

සම්පත්වූ පැහැ ඇති වෙතාවෙති! සම්පිවූ ගුරුවූ සත්‌ත්‌වාභරණයෙන් ප්‍රතිමණ්ඩිතවූ මාගේ දරුවන් මා සවමීපයට කැඳවාගෙන එවයි කිහ. එබස් අසා ඒ වෙතා තම් යෙහෙලි තොමෝ යහපතැයි ප්‍රතිවචනදී දරුවන් වසන ප්‍රාසාදයක් පාසා ඇවිද තොපහැමට අවවාදදෙනුහැමැතිව පියාණන්වහන්සේ කැඳවහසේක. මේ තොපගේ පියාණන් වහන්සේගේ පශ්චිම දර්ශනය වන්නේයයි ඒ බොධිසත්වයන්ගේ යහළුවිශ්වාසයන් හා දුදරුවන් රැස්කරවී. ධම්පාල කුමාරයෝ වූකලි ඒ වචනය අසමින් අඩමින් වලපමින් මලුන් පිරිවරා පියාණන්සවමීපයටයිහ. මහබෝසතාණෝ ඒ දරුවන්දැක සිටිසේ සිටපියතොහි සාදුළු පුරාගෙන වැළඳ ඉස සිඹ සතහා ප්‍රධාන පුත්‍රවූ ධම්පාල කුමාරයන් ඇසිල්ලක් ළෙහි වැද හොවා ළෙන් බහා සිටුවාගෙන ශ්‍රියහන් ගබඩාවෙන් නික්ම මතුමාල්තලයේ පය්‍යඞ්කා මඛ්‍යයෙහි හිඳ පුත්‍රයන් දහසක්දෙනාට අවවාද දුන්හ.

කෙසේදයත්?

ඉඡොනිඡටයෙහි අවලව නිර්විකාරවූ ප්‍රවෙණී ධම්හා සුචරිතධම්ය රක්‍ෂාකරන්නාවූ මහබෝසතාණෝද තමන් දක්නට ආවාවූ ධම්පාල කුමාරාදීවූ ඒ දරුන් වැළඳගෙන ඉස සිඹ සතහා ඉක්බිත්තෙන් මොබ එවසි ධම්පාල කුමාරයන් තමන් සවමීපයට කැඳවා කියන්නාහු දරුවෙනි! රජ්ජුරුවන් වහන්සේ විසින් මේ මානවකයාට මා ජයවසතුතොට දීපියතලද්දෙමි. එසේ හෙයින් අද පටන් තුන්දවසක් මම මා සන්තක සැපයෙන් සුවපත්වෙමි. තුන්දවසින් මත්තේ සතරවැනි දවස්පටන් එසානන්තයෙන් ඒ මානවකයාට අයිතිවෙමි. ඒ තෙමේ මා හැරගෙන යම් මාගීයකින් යනු කැමැත්තේවීනම් ඒ මාගීයෙන් යන්නේය. එසේහෙයින් මම තොපට රක්‍ෂාවක්කොට තොතබා කෙසේ නැතිසෙමිදැයි සිතා තොපට අනුශාසනා කරනු පිණිස ආමි, මිත්‍රයන්ට උපකාරකොට තමන්වහන්සේ කෙරෙහි ඇල්ම වන්නාවූ බොහෝ උපභොගපරිභොග වස්තූන් ඇති කුරුරට වසන්නාවූ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් වහන්සේ මිට පූර්භාගයෙහි තොපගේ පියාණෝ කවර අනුශාසනාවක් කොළෝදැයි ඉදින් තොපඅතින් මෙසේ විචාළසේක් වීනම් අපගේ පියාණන් වහන්සේ අපට මෙනම් මෙනම් අවවාද කිසේකැයි කියවි. දරුවෙනි! මා දුන් අවවාද රජ්ජුරුවන්වහන්සේට කීකල්හි තොප කෙරෙහි සතුටුව තොප හැමදෙනාම මා හා සමඟ සම් ආසනව එකඟස්නේ හිඳුවසි මේ රාජකුලයෙහි තොප කෙරෙන් අන්‍ය කවරනම් රජෙක් කවරනම් මනුෂ්‍යයෙක් මා හා සමඟ එක ඟස්නේ හිඳිනට සුදුසුද, නෙපිම සුදුසුයයි මෙසේ කියා රජ්ජුරුවන් වහන්සේ හා එක අස්නේ හිඳිනට කැඳවූසේක්වීනම් එසේ කී රජ්ජුරුවන් වහන්සේට දෙහොත් නහා මිදුනෙහි බැඳගෙන සිට දරුවෙනි! නෙපි මෙසේ කියව්, මහරජ්ජුරුවන් වහන්ස! එසේ නොකියනුමැනව, නුඹවහන්සේ හා කැටිව අප එක ඟස්නේ ඉදීම කාරණයෙක් නොවෙයි. අපගේ ප්‍රවෙණී ධම්ය කුත් නොවෙයි, මහරජ්ජුරුවන්වහන්ස! කෙශා සිංහරාජයක්හට හීන ජාතීඇති ජරසිගාලයෙක් කෙසේ සම අසුන් ඇතිවේද? යම්සේ ජරසිගාලතෙමේ මෘගරාජයන්හට සමාන්‍යාසනිකනොවේද? එපරිද්දෙන්මඅපිත් දේවයන්වහන්සේට සමානාසනිකවන්නට සුදුසු නොවම්හයි මෙසේ රජ්ජුරුවන්වහන්සේට දන්වව්යයි මහබෝසතාණෝ ධම්පාලකුමාරයන් ප්‍රධානකොටඇති පුත්‍රයන් දහසක් දෙනාට අවවාදානුශාසනා කළාහ. මහබෝසතාණන්ගේ මේ කථාව

අසා දූ දරුවන් හා සුහි මිශ්වාසයන් හා දැසි දස් ආදිහු සිටිසේ සිටිය නොදී මහ හඬින් හඬන්නට පටන්ගත්හ. එකල්හි මහබෝසතාණෝ ඔවුන් හැමි දෙනාටම නොයෙක් කාරණා කියාහි විස්සුහ

ඉක්බිත්තෙන් විශ්වාසයන්හා නතුන් මල්බෑයෝ ආදිවූනැයන් කෙරෙහිත් නොපැසුබටවූ සිත් ඇති ඒ විධුර පණ්ඩිතයෝ සියලු බැඳුම් වතියා අඩා වැලප සමීපයට අවුත් මුවෙන් නොබැණ උන්කල්හි කියන්නාහු දරුවෙනි! මා කරා මෙසේ එව්, නෙපි කිසි සැකයක් නොකරව්, සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ, යශසතම් විපත්තිය කෙළවරකොට ඇත්තේය. එතකුදු වුවත් තොපට රාජ වසුනි නම්වූ යශස් ලැබීමට කාරණයක් කියමි. යම් කාරණය කින් රජකුලයට පැමිණ රජ්ජුරුවන්වහන්සේ සමීපයෙහි එක්වන් හැසිරෙන්නාවූ රාජ පුරුෂතෙමේ සථානාන්තරයට පැමිණ හස්ත්‍යශ්වාදි මහත්පිරිවර සම්පතටත් පැමිණේද, එසේවූ රාජපාරිවය්‍යාව කියමි. දරුවෙනි! මා සමීපයෙහි එකඟවූ සිත් ඇතිව මෙසේ අවුත් හිඳ අවිඝ්නභාව අසවසි සිටිහු විලාසයෙන් රාජ වස්තිය කියන්නට පටන්ගත්හ. කෙසේදයත්? දරුවෙනි! රාජසෙවයට පැමිණියාවූ අප්‍රකාශ ගුණඇති සත්තෙමේ රජදරුවන් ගෙන් සම්පත් නොලබන්නේය, ශෞර්‍ය විය්‍යනැති පුරුෂයාත් සම්පත් නොලබන්නේය. නැවත ත්‍රුවණනැති පුරුෂයාත් සම්පත් නොලබන්නේය. රාජකාය්‍යයෙහි ප්‍රමාද පුරුෂයාත් කිසිකලෙකත් සම්පත් නොලබන්නේය. යම් කලෙක රජ්ජුරුවන්වහන්සේ යම් සෙවකයකුගේ ආචාර සම්පත්තියත් ප්‍රඥාවත් කායබලයත් පවිත්‍ර ශිලි බවත් අවශෙෂවූ යම්කිසි ගුණයක් ඇත්නම් එයත්තම්හෙයින් දන්සේක්වීනම් එකල්හි සියලුගුණ තම්හෙයින් දන්නාවූ කාරණයෙන් එසේ ඒ සෙවකයා කෙරෙහි විශ්වාසීව ප්‍රෙම උපදවනසේක. එසේ ඒ සෙවකයාහට සැඟවියයුතු යම් කිසි රහසෙක් ඇත්නමුත් නොවලහා කියනසේක. රජදරුවන් වහන්සේ නම් තමන්වහන්සේ කෙරෙහි බලවත් විශ්වාස ඇතැයි දත් යම් කෙනකුන්ට සිත ඇත්තක් නොවලහා කියා දවසින් දවස බලවත් විශ්වාස ඇතිව ප්‍රෙම උපදවනසේක. තවද දරුවෙනි! මනා කොට ගන්නා ලද්දාවූ සම්වූ දඬු ඇති මනාකොට සම්වූ බඳු දරන්නාවූ තරුදිය යම්සේ බිමට නොබසිද, උඩ නොනැගේද, එපරිද්දෙන්මරුජසෙවකයාත් රජ්ජුරුවන් වහන්සේ විසින් මෙනම් කටයුත්තක් කරවයි නියොගකරන ලද්දේවීනම් ඡන්දයින් අගතියට නොගියේ කම්පානොවේද, චලිතනොවේද, මනාකොටගන්නාලද වුකනප්‍රකාර තරුදියමෙන් සියලු රාජකාය්‍යයෙහි සමව පවතීද, එබඳුවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙන රාජභවනයෙහි වසන්නේය. මෙපරිද්දෙන් රජ්ජුරුවන් වහන්සේට සියලු රාජකාය්‍යය අවලව කරන්නට සමර්ථවීනම් හසුති අශ්ව දැසි දැස ක්ෂෙත්‍ර භූමි ගව මහිසාදීවූ බොහෝ සම්පත් ලැබ උතුම් තනතුරටත් පැමිණෙන්නේය. ත්‍රුවණැත්තාවූ රාජාමාත්‍ය තෙමේ දුවල්වත් රාත්‍රියෙහිවත් රාජකාය්‍යයෙහිලා මෙනම් කටයුත්තක් කරවයි රජ්ජුරුවන් වහන්සේ විසින් නියොග කරන ලද්දේ ඡන්දයෙන් අගතියට නොගොස් කම්පානොවේද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන රාජභවනයෙහි වසන්නේය. රාත්‍රියෙහිත් දිවාභාගයෙහිත්සියලුරාජකාය්‍යයෙන්එක්රාජකාය්‍යයකත් ප්‍රමාදයක් නැඟුව විශෙෂකොට කෙරෙමියිඋත්සාහ කරන්නේවීනම් එසේවූ අමාත්‍ය තෙමේ ඡන්දයෙන්, වෙෂයෙන්, භයින්, මොහයෙන්, කළමනා දෙයකොට

අමාත්‍යයෙනි අකාර්‍යයෙහි නොයෙදවව හෙතුකොටගෙන රජ්ජුරුවන් වහන්සේගේ සිත ඉහි දූන කාර්‍යකරනහෙයින් රජ්ජුරුවන් වහන්සේට සමීප වාරිව වැස සම්පත් ආදිය හා තන් තනතුරු ලබන්නේය.

තවද යම් ගමන් මාර්ගයෙක්වත් යම් රාජ වීථියෙක්වත් රජ්ජුරුවන් වහන්සේ වඩනට මනාකොට ධජපතාක කෙරෙන් තොරන් පුන්කලස් ඔසවා යෙන් සරසතලද්දේවිනම් එබදු රජ්ජුරුවන් වහන්සේ වඩනට සුදුසුවූ රාජ මාර්ගයකි නිවත් රාජවීථියෙන්වත් රජ්ජුරුවන් වහන්සේ විසින් නෙපි මේ මාර්ගයෙන් රාජවීථියෙන් යවයි ඉදින් නියොගකළත් නුවණැත්තාවූ රාජා මාත්‍යාදීන් විසින් එබදු රාජවීථියෙන් හා රාජමාර්ගයෙන් නොයායුත්තේය.

තවද දරුවෙනි! රූපාදි පඤ්චකාමය අඳුභව කිරීම් කිසිකලෙකත් රජ්ජුරුවන් හා සමඟ අනුභවනොකටයුත්තේය. වැළි කෙසේ අනුභව කට යුතුදයත්? සියලු රූප, ශබ්ද, ගන්ධ, රස ස්ප්‍රෂ්ටව්‍ය, යන පඤ්චකාමයෙහි රජ්ජු රුවන් වහන්සේට යටත්ව ඉතාතීනව අධම් පඤ්චයක්සේ පඤ්චකාම සෙවනය කටයුත්තේය. යමෙක් මෙසේ කෙරේනම් එසේවූ රාජාමාත්‍යතෙමේ රජ්ජුරු වන් වහන්සේගේ අභිප්‍රායලෙස වාසය කෙරෙමින් තමා බොහෝ යශ පිරිවර ලබන්නේය. තවද රජ්ජුරුවන්වහන්සේගේ සළු ඇඳුම් හා සමව පිළිතොහඳනේය. රජ්ජුරුවන් වහන්සේ මල් පලඳනාසේ මලුත් නොපලඳනේය. රජ්ජුරුවන් වහන්සේ සුවඳ විලවුන් ගල්වනලෙස සුවඳ විලවුන් නොගල් වන්නේය. රජ්ජුරුවන් වහන්සේගේ ඉඳුම් සිටුම් ආදිවූ ආකෘතිය වන මාගේ ඉඳුම් සිටුම් ආදිවූ ආකෘතිය නොකරන්නේය. රජ්ජුරුවන් වහන්සේගේ බස් බිණුම්ලෙස තමා බස් නොකියන්නේය. රජ්ජුරුවන් වහන්සේගේ ආකෘතිය හැර අනික් ආකෘතියක්ම කටයුත්තේය. රජදරුවන් වහන් සේගේම සමීප වාරිව වසනු කැමැත්තාවූ අමාත්‍යාදීන් විසින් මේ කීලෙස පැවත රජදරුවන් වහන්සේ සිත්ගෙන යශ පිරිවර හා තන් තනතුරු ලැබ ගතයුත්තේය.

තවද දරුවෙනි! රජ්ජුරුවන් වහන්සේ අමාත්‍යයන් හා අන්තඃපුර සත්‍රීන් විසින් පිරිවරත ලදුව යම් කලෙක සෙලනාසේක් වීනම් එසේවූ සථාන යෙහිදී නුවණැති අමාත්‍යයන් විසින් ඔසෝවරුන් හා රාජකන්‍යාවන් හා අව ශෙෂවූ අන්තඃපුර සත්‍රීන්කෙරෙහි ස්නෙහ අභිප්‍රායෙන් විශ්වාස භාවයෙන් ඇසින් තරැල්මි බැමනැගිම් හස්තපාද චලනාදී යම්කිසි කාර්‍යවිකාරයක් පුර සත්‍රීන්ට නොහැඟවිය යුත්තේය. තවද දරුවෙනි! යම් අමාත්‍යයෙක් උඹතු නොවේද, මණ්ඩනශීලීනොවේද, මුහුකළ නුවණ ඇත්තේද, එක්වන් රජ්ජුරු වන්වහන්සේගේ අඹුප්‍රත්‍යඹු හෝ පුරසත්‍රීන්ගේ අඹුප්‍රත්‍යඹු හෝ අනු රාගවශයෙන් නොබලන්නේද, අවලවූ සුප්‍රතිෂ්ඨිතවූ විත්තසන්තානයෙන් සමන්විතද, එසේවූ නුවණැති අමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත් ගෙන රාජභවනයෙහි වසන්නට සුදුසුවන්නේය.

තවද යම් අමාත්‍යයෙක් ඒ රජ්ජුරුවන් වහන්සේගේ පුරසත්‍රීන් හා එක්ව සිනාසී නොසෙල්ලේද, රහසිව හොස් ඒ පුරසත්‍රීන් හා කථානොසෙ කෙරේද, ඒ රජ්ජුරුවන් වහන්සේගේ භාණ්ඩාගාරයෙන් මුතු මැණික් ආදි වස්තූන්හිර නොනහීද, එසේවූ අමාත්‍යතෙමේ රජ්ජුරුවන්වහන්සේගේ සිත් ගෙන රාජභවනයෙහි වසන්නට සුදුසු වන්නේය. තවද යමෙක් නිද්‍රායෙහි

බලවත් ඇලුම් නැත්තේද, බොහෝකොට නොතිදෙද, පුරුෂමේදය පිණිස රූ නොබොන්නේද, ඒ රජ්ජුරුවන් වහන්සේගේ උදුනාදිවූ අභයසථානයෙහි ඹුවන් ආදිවූ සියුපාවුන් නොමරන්නේද, ඒ සෙවකභාවමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන රාජභවනයෙහි වසන්නට සුදුසු වන්නේය.

තවද යම් රාජසෙවකයෙක් ඒ රජ්ජුරුවන් වහන්සේගේ විසිතුරුවූ පුටුවකටද, සිංහාසනයකටද, බිදවෙළුවකටද, උන්වහන්සේ නැහෙන මිනිලෑතු හා මැලුසු පිටටද, උන්වහන්සේ නැහෙන මඟුල් රියවද, රජ්ජුරුවන් වහන්සේගෙන් නැහෙන්නට සම්මතයක් ඇතත් නොනැත්තේද, එසේවූ රාජසෙවකභාවමේ රජ්ජුරුවන්ගේ සිත් ගෙන යශ පිරිවර ලබන්නට සුදුසු වන්නේය. තවද සථානොචිත ප්‍රඥ ඇති පුරුෂභාවමේ රජ්ජුරුවන් වහන්සේට ඉතා දුරත් ආසන්නයෙහිත් නොහිඳිද, නොසිටිද, ඒ රාජාමාත්‍යභාවමේ තමාගේ සවාමිවූ රජ්ජුරුවන් වහන්සේට පෙනෙන පරිදිදෙන් අනිවිඛයෙහිදු කුදු මහත් බස් ඇසෙන තැන බල බලා ඒ රජ්ජුරුවන්ව වහන්සේට විශ්වාස තැන සිටින්නේවීනම් රාජභවනයෙහි වැස සැපත් ලැබගන්නට සුදුසු වන්නේය.

තවද දරුවෙනි! එකාන්තයෙන් රජ්ජුරුවන් වහන්සේ නම් තමාට යහළුත් නොවනසේක. යම් හෙයකින් විශ්වාසත් නොකටහැකිසේක. ජාතියෙන් වයසින් තමාහා සමානත් නොවනසේක. ඕබූවක් දිවර කසළ වැටීමෙන් ඇලලීගිය ඇසක් මෙන් රජදරුවන් වහන්සේ නම් යුහුව කිපෙන සුලුසේක. යම්සේ සසළක් සඟිතවූ නෙත්‍රය තමාගේ ප්‍රභාති අවස්ථාභාර එකෙණෙහිම බාෂ්පජලයවහනය කෙරේද, එපරිදිදෙන්ම රජ්ජුරුවන් වහන්සේත් මඳ වරදක්වුවත් වහාම කිපී හස්ත පාද කර්ණී නාසච්ඡේදාදිවූ අනෙක ප්‍රකාර වධබන්ධන කරවනසේක. එසේහෙයින් රජ්ජුරුවන් විශ්වාසනොකට හැක්කේය.

තවද ශ්‍රියුම් නුවණ ඇති ඥානවන්තවූ පුරුෂභාවමේ බාලාවස්ථායෙහි කවා පොවා උලා නාවා නොයෙක් පරිදිදෙන් රජ්ජුරුවන්වහන්සේ පොෂ්‍යය කෙළෙමි. මේ කාරණයෙන් මම ප්‍රසිඛවෙමි. පූජ්‍ය වෙමි. රාජවල්ලභවෙමි, එසේ හෙයින් මා කිවක් නැකෙසිඳිසිතා සුළුහරණයෙන් සැරහී පමිත් මඩ්‍ය යෙහි සිටියාවූ රජ්ජුරුවන් වහන්සේට කිපෙන්නට සුදුසුවූ එරූප වචනයක් එබදු සථානයෙහිදී අවවාද වසයෙනුත් කිසිකලෙකත් නොකියන්නේද, එසේවූ නුවණැති රාජසෙවකභාවමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන තමන්ට සැපත් ඵලවාගන්නට සුදුසු වන්නේය.

තවද දරුවෙනි! රාජවල්ලභ හෙයින් කියා යවා වැදීමෙක් නැහැයි ලා හෙලා රජගෙට නොවැද එන්නට හිසවයි රජ්ජුරුවන් වහන්සේගෙන් ලබන ලද අවසර ඇතිවම රජගෙට වැදීම ලබත්ද, දවසකට කිපවාරයක් ඇතුළු රජගෙට වදිනත් කියාගවා ලත් අවසරයෙන්ම ඇතුළු රජගෙට යම් රාජසෙවකයෙක් වදිද, රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි විශ්වාස ඇත්තෙම්යි නිර්වචිසථා නොවේද, ගිනි සමීපයෙහි සිටින්නක්හුමෙන් රජ්ජුරුවන් වහන්සේගේ සමීපයෙහි හැමවේලේම අප්‍රමාදව සිහිඇතිව සිටින්නේවේද, එසේවූ රාජසේවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන සැපත් ලබන්නේය

හවද දරුවෙනි! රජ්ජුරුවන්වහන්සේ ප්‍රතිඤ්ඤ හෙනකුන්ට හෝ මල් බැහෙනකුන්ට හෝ රාජසෙවකයන් හා එක්ව කථාහොට ගම්දීමෙන් හෝ නියම්ගම් දීමෙන් හෝ රට දීමෙන් හෝ දනවු දීමෙන් හෝ සංග්‍රහ කරන සේක්වීනම් එසේවූ සථානයේදී ත්‍රුවණැත්තාවූ රාජාමාත්‍යහෙමේ මුවෙන් නොබැණ උපේක්‍ෂා වන්නේද,ගුණයක්වත් ත්‍රුගුණයක්වත් නොකියන්නේද, මේ ගම් නියම්ගම් ආදිය අසවලාහට දෙමෝද? නොදෙමෝදැයි රජ්ජුරුවන් වහන්සේ සෙවකයන් හා එක්ව කථානළ කල්හි දරු මල්බෑ ආදීන් අතරෙන් අසවලුන්ට මේබදුවූ ගම්බිම් රටවල් දුන්කල යහපතැයි කියාද, නොහොත් අසවලුන්ට දියයුතුය. අසවලුන්ට නොදිය යුතුය, යනාදී එහි යහපත නපුර නොකියයුත්තේය. නැවත රජ්ජුරුවන් වහන්සේගේ හස්ත්‍යාචාර්‍යයන් අශ්වාචාර්‍යයන් රථාචාර්‍යයන් හා පාබල සෙනාවගේ හස්ති ශිල්පාදිවූ ඒ ඒ ශිල්ප හා ශෞර්‍යය ආදිවූ සම්පත්තා දැක සහතුෂ්ටව ගම් දිවෙල් හා බොහෝ බත්වැටුප්වඩා තබා දෙනසේක්වීනම් එසේවූ තැනසිට ඔවුන්ට ලාභාන්තරාය යමෙක් නොකරන්නේවීනම් එසේවූ රාජසෙවක හෙමේ රජ්ජුරුවන් වහන් සේගේ සිත්ගෙන රාජභවනයෙහි වැස සම්පත් ලබන්නේය.

හවද ත්‍රුවණැත්තාවූ රාජාමාත්‍යහෙමේ රජ්ජුරුවන්වහන්සේට කිසා රුව අවතාව දුන්නක් මෙන් නැමේද, හුණපදුරකින්මතුව වැඩිසිටි පවතින් වෙවුලන හුණ දණ්ඩක්මෙන් විශෙෂයෙන් රජ්ජුරුවන් වහන්සේට හසින් වෙවුලාද, රජ්ජුරුවන් වහන්සේට ප්‍රතිපක්‍ෂව නොපවත්නේද, එසේවූ රාජාමාත්‍ය හෙමේ රජ්ජුරුවන්වහන්සේගේ සිත්ගෙන සැපත් ලැබගන්නේය. තවද යම් රාජසෙවකයෙක් මහොදරනොව දුනුම්වක් මෙන් කුඩා බඩ ඇත්තේද, නොහොත් මඳ පමිත් ඇත්තේද, සථානොචිත ප්‍රඥාඇති වන්නේද, යම්සේ මත්ස්‍යයා දිවතැතිහෙයින් කථානොකෙරේද, එපරිද්දෙන්ම කේලාම් කිම් හා සම්ඵප්‍රලාපාදිවූ වාග්දුශ්චරිතයෙහි නොහැසිර මඳ කථා ඇතිබැවින් දිව නැත්තෙක්මෙන්වේද, හොජනයෙහි පමණදන්න අනුභවකෙරේද, මුහුකළ ත්‍රුවණඇත්තේද, ශෞර්‍යයෙන් ඇත්තේද, එසේවූ රාජසෙවකහෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන සම්පත් ලැබගන්නේය.

තවද දරුවෙනි! තෙජස් නැසීම දන්නාවූ සත්‍වතෙමේ අනාචරතයෙන් සත්‍රීන් කරගොස් සංවාසය නොකරන්නේය. නැවත නැවත කෙලශරහි වශයෙන් ප්‍රඥාඇති ප්‍රරුෂතෙමේ කාශසවාසය, කාශපිඩාය, දුර්ලබවය, යනාදී මේතෙක් රොගයට පැමිණෙන්නේය. ප්‍රමාණාතික්‍රාන්ත මය්‍යීද, ඉක්මවා රජ්ජුරුවන් වහන්සේ සවිපයෙහි සිට බොහෝකොට කථානොකට යුත්තේය. හැමකල්හිම මුවෙන් නොබැණත් නොගිදියයුත්තේය. වැළි කුමක් කවයුත්තේදයත්? නොවිසිරි පිඬුව පවත්නාවූ බොරුවෙන් අමිශ්‍රවූ පමණින් යුක්තවූ කථාකරන්නට බස් බණන්නට සුදුසුවූප්‍රස්තාව පැමිණිකල්හි එසේ කළයුත්තේය. තවද වෙෂකටයුතු වස්තුයෙහි වෙෂ නොකරේද, අනුන් හා නොගැටේද, සැබෑබස විහිටියේද, මට සිලුටුවූ තෙපුල් ඇත්තේද කේලාම් නොකියාද නිරර්ථක කථා නොකියාද, එසේවූරාජසෙවක හෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සිත්ගෙන රාජභවනයෙහි වැස සම්පත්හි ප්‍රතිලාභයට පැමිණෙන්නේය.

තවද යම් රාජසෙවකයෙක් ආචාර සම්පන්නද, තමාගේ වංශයෙහි උගත්කුල ශිල්ප උගතීද, චක්ෂුවාරාදි සෘද්ධ පොසියඉවත් නොකොට ඉන්ද්‍රිය දමනයෙන් යුක්තවේද, වසඟකරන ලද ආත්ම ඇත්තේද, සම්පත් තිසා උඩඟුනොව අවලඝභාව ඇත්තේද, මත් නැති බැවින් මොලොක්ද, කළමනා රාජ කටයුත්තෙහි ප්‍රමාද නොවේද, පිරිසුදුවූ කාය වාක් මනඃ කර්ම ඇත්තේද, රාජූපස්ථානයෙහි දක්ෂද, එසේවූ රාජාමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙන යසස් ලැබ ගන්නේය. තවද රහස් කිරීමෙන්නා අප්‍රකාශවූ රහස් නොවලහා කිම් ආදිවූ දූතක්‍රියායෙහිද නියුක්තකොට අන්‍යරජදරුවන් විසින් තමාගේ රජ්ජුරුවන්වහන්සේ සමීපයට එවනලද දූතජනයාදරුනෙරන්නේද උන්හා කිසි කථාවක්නොකරන්නේද, ඉදින් කරනු කැමැතහොත් රජ්ජුරුවන් වහන්සේ සම්මුඛයෙහිම කථාකෙරේද, තමාට බොහෝ ඉපුරු දුන් සවාමිහුම බලන්නේද, අතික් රජදරු කෙනකුන් සමීපයෙහි වසන්නට නොයිතාද, කියිසේත් අන් රජදරු කෙනකුන් සම්මුඛයෙහි නොවේද, එසේවූ ඇමාත්‍යතෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත ඉහි දැන රාජභවනයෙහි වැස තමාට බොහෝ යශ පිරිවර ලැබගන්නේය.

තවද දරුවෙනි! සිල්වත්වූ ඇසූ පිරූ තැන් ඇති සමිතපාපිවූ ශ්‍රමණයන් කරා හෝ බාහිත පාපිවූ බ්‍රාහ්මණයන් කරා හෝ නැවත නැවත ගෞරවයෙන් සඟසා එළඹේද, එසේවූ රාජසෙවකතෙමේ රජ්ජුරුවන් වහන්සේගෙන් ඉපුරු ලැබගන්නේය. තවද දරුවෙනි! සිල්වත්වූ බොහෝ ඇසූපිරූ තැන් ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා සඟසා එළඹ පෙහෙවස් වෙසෙම්න් උන් හා අනුව වෙසේද, නැවත එබදුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් බතින් පැනින් කැමැති පරිද්දෙන් පිනවන්නේද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගේ සමීපයෙන් යශස් ලැබගන්නේය.

තවද දරුවෙනි! නොපැකිල පවත්නාවූ ඥන ඇති පුරුෂතෙමේ තමහට වැඩ කැමැත්තේවීනම් බහුශ්‍රැතවූ සිල්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ එක්වන් උපස්ථාන කරන්නේද, ධාර්මිකවූ මහණබමුණන්ට තමාගේ කුලපරම්පරාගෙන් දෙමින් එන දන්වැට නොපිරිහෙළන්නේද, දන්දෙන කල්හි ආවාවූ යාචකයන් දැක ඔවුන්ගෙන් කිසිඑකකුත් නොනවත්වන්නේද කාරණාකාරණා පරීක්ෂාකරන්නාවූ ඥානයෙන් සමන්විතද, අවිකලවූ බුද්ධියෙන් යුක්තද, අනෙකප්‍රකාර දුසකමීකාරයන් යෙදුවමනා කෘෂිකර්මාදියෙහි නියොගකිරීමෙහි දක්ෂද, මේ දන්දෙන්නට කල, මේ සිල්රකින්නට කල, මේ පෙහෙවස් වසන්නට කලැයි මෙසේ දානාදියෙහි කල්දන්නේද, මේසඟා සමය මේ වපුරනසමය, මේ වෙළඳුම්කරන්නාසමය, මේ උපස්ථානකරනසමය,යි මෙසේ කෘෂිකර්මාදියෙහි සමය දන්නේද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේ සිත්ගෙන රාජභවනයෙහි වැස යශ පිරිවර ලැබගන්නේය.

තවද දරුවෙනි! තමා විසින් කටයුතු කෘෂි වාණිජකර්මාන්තාදියෙහි උඩානවීර්‍යය ඇත්තේද, සියලු කර්මාන්තයෙහි අප්‍රමාදද, සඤ්ඤාවිත ප්‍රඥ ඇත්තේද, ම්ලානකොට කරනලද කර්මාන්ත ඇත්තේද, එසේවූ රාජසෙවක තෙමේ රාජභවනයෙහි වසන්නට සුදුසු වන්නේය. තවද ඒ රජ්ජුරුවන් වහන්සේගේ කලවිටට දානශාලාදියට ගාලට කුඹුරට එක්වන් නොස් සඟපත නපුර විචාරා අඩුවැඩිය පිරිමසන සුලුද, මෙතෙකැයි අය දැන සියලු

ධාන්‍යයන් බඩසල් කොටුගුදු ආදියෙහි ලවා රැකවල් ලවා පරිහරණය කෙරේද, රජගෙයි පරිවාර ජනයා ගැණ මෙහෙකැයි පවණ දුන බත් මාළු පිසවාද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේ ඔත්ගෙන තමහට සම්පත් ලැබගන්නේය.

තවද දරුවෙනි! පඤ්චශීලාදියෙක්හි නොපිහිටියාවූ මෙබඳු පුතකු හෝ එසකුසේ ගොත් මල්බැයන් අතරෙන් එක්තරා එසකු හෝ සෙනෙවිරත් හතතුරු ආදිවූ එක්හරා තතතුරෙක නොපිහිටිවූ වන්නේය. කුමක් හෙයින්දයත්? ඒ අඥානවූ ශීලසංරක්ෂණාදිය නොකරන්නාවූ ඒ පුත්‍රභ්‍රාතෘහු අඹ සමාන නොවන්නාහ.

"අඹමෙනං මනුස්සානං-භාතා ලොකෙ පවුච්චති"

යනු හෙයින් ලොකයෙහි මල්බැයෝ තම් මනුෂ්‍යයන්ට අඹ සමාන කාරණයෙන් අඹ නම් වන්නාහ. එතකුදුවුවත් මේ දරුවන් හා මල්බැයෝ වූකලී ශීලාචාරාදී කිසි ගුණයක් නැතිහෙයින් අඹ නම් නොවෙති. මූලාවූ සත්වයෝ යම්සේ ශීලාචාරාදී කිසි ගුණයක් නැත්තාහුවෙද්ද, ඒ මූළාවූවන් හා සමානවන්නාහ. එසේහෙයින් මේ පුත්‍රභ්‍රාතෘහු ආධිපත්‍යස්ථානයෙහි නොපිහිටිය යුත්තාහ, ඔවුන්ට බත් හා පිළි පවණක් තමාගේ ගෙදොරට අවුත් උන් විටෙක ප්‍රේතයන්ට දෙනදෙයක්මෙන් ඝාසච්ඡාදන මාත්‍රයක්ම ලාභෙළා නිසරණොට දෙන්නේය. ආධිපත්‍යස්ථානයෙහි පිහිටු විය යුතු හෙසේවූවන්දයත්? පඤ්චශීලාදි එක්තරා ශීලයෙක්හි මනාකොට පිහිටියාවූ රාජකාර්‍යයෙහි දක්ෂවූ උඩානවීර්‍යයෙන් යුක්තවූ මෙබඳුවූ දූසයන් හා මෙහෙකරුවන්ද සෙවකයන්ද ඓශ්වර්‍යයෙහි පිහිටුවන්නේය, නවුවාවූ පුත්‍රදරුවන් ඇත්තාහටත් දිළිඳුවූ සත්වයාහටත් රාජසෙවය කිරීම බැරෑරුම් හෙයින් අතිසිතය අති උෂ්ණයයි නොකියා රැදුවල් නොකුසිතව නැගී සිට කෘෂිවණිජ්ක් ආදිවූ කර්මාන්තයන් කරන්නේ උඩානවීර්‍ය ඇත්තානම්වෙයි. එබඳුවූ දූසකර්මකාරයන් හා සෙවකජනයන් ඓශ්වර්‍යයෙහි පිහිටුවිය යුත්තේය. තවද යම් සෙවකයෙක් ආචාරශීල ඇත්තේද, ලොභී නොවේද, නැවත රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි සෙනහඇතිව වාසයකෙරේද, ඒ රජ්ජුරුවන්වහන්සේට සම්මුඛයෙහිත් පරාඩ්මුඛයෙහිත් හිතසිත් ඇත්තේද, එසේවූ රාජසෙවිතෙමේ රාජභවනයෙහි වැස සැපත් ලබන්නට සුදුසුවන්නේය. තවද යම් රාජසෙවකයෙක් ඒ රජ්ජුරුවන් වහන්සේගේ අභිප්‍රාය දනීද, නැවත ඒ රජ්ජුරුවන් වහන්සේගේ සිතට වසඟව පැවත අභිප්‍රාය දුන මෙහෙකෙරේද, ප්‍රතිපක්ෂ නොවී අනුකූලව පවතීද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන් වහන්සේගෙන් සැපත් ළබාගන්නේය. තවද යම් රාජසෙවකයෙක් රජ්ජුරුවන් වහන්සේගේ ඇඟ උලාද, ඉස්සොධා නහවාද, නාඹුරුව යට බලා හෙළා ඇසැතිව සිට පතුල්දෙවීද, පතුල් දෙවමින් සිට කර උඩුකුරුකොට රජ්ජුරුවන් වහන්සේගේ මුහුණ නොබලාද, ගෙයිදී නොයෙක් බරලන කල් හිත්නොකිපේද, එසේවූ රාජසෙවක තෙමේ රජ්ජුරුවන්වහන්සේගේ ඔත්ගෙන රාජභවනයෙහිවැස තමාට බොහෝ යශපිරිවර හා නන්නානාතුරුලාභ පදසා බවට පැමිණෙන්නේය. තමහට වැඩකැමැත්තාවූ පුරුෂයෙක් පූණිකුම්භයක් දැක ඇඳිලිබැඳ පැදකුණු කරන්නේය. කපුටුවකු දැක ඇඳිලිබැඳ පැදකුණු කරන්නේය. එසේ ඇඳිලි බැඳ පැදකුණුකරන පුරුෂයාහට ඒ පූණිඝටය හෝ කාක ශෘගාලාදීහු කිසි අභිමතාර්‍ථයක් සිද්ධකරන්නාහු නොවෙති. එසේ

ණයෙන් සියලු සම්පත් සිඹකොට දෙන්නාවූ නුවණැත්තාවූ අවල ගුණ ඇති විපදයන්ට උතුම්වූ රජ්ජුරුවන්වහන්සේට කවර කාරණයකින් අඤ්ජලිකම්ය නොකටයුතුද, සම්ප්‍රකාරයෙන්ම යටත්ව රජ්ජුරුවන් වහන්සේට නමස්කාර කටයුත්තේය. තවද යම් රජ්ජුරුකෙනකුන් වහන්සේ හෝනා හිදිනා දෑ දෙනසේක්ද, හඳින්නට සුදුසු පිළිදෙනසේක්ද, ඇතුන් අසුන් රථ දෙලි කුනම් ආදිවූ යානවාහන දෙනසේක්ද, සැපසේ වසන්නට සුදුසුවූ ගෙවල් දෙනසේක්ද, සියලු සත්වයන්ට මේඝයමෙන් හිරණ්‍යසුවණ්ණාදි අනෙකප්‍රකාර උපභොග පරිභොග වසතු නමැති වර්ෂා වස්වා සත්වයන්ගේ සිත් තෙමා සන්හනසේක්ද, එසේවූ රජ්ජුරුවන්වහන්සේ කවර කාරණයකින් නොවැන්ද යුතුද, වැන්ද යුතුය, පිදියයුතුය, සිතින් ප්‍රේම කටයුතුය, සම්මුඛ පරාඩ්මුඛයෙහි ගුණ කියයුතුත් නොයෙක් පරිද්දෙන් සිත්ගෙන විසියයුතුත් මෙබඳුවූ රජ්ජුරුවන් වහන්සේගේමය. එසේහෙයින් දරුවෙනි! යම් මේ රාජව්‍යසනියෙක් මාවිසින් නිරවශෙෂකොට කියනලද්දේවිනම් ඒ මේ රාජව්‍යසන නම් දෙය රාජසෙවකයන් පරම්පරාවෙන් කොට එන හෙයින් යම්බඳුවූ මේ රාජව්‍යසනියෙහිවූ පරිද්දෙන් පවත්නාවූ පුරුෂතෙමේ යම් කාරණයකින් සිත් ගනීද,ඒ කාරණයෙන්ම ඒ සවාමිවූ රජතු සමීපයෙන් සත්කාරසම්මානයෙන් ප්‍රශංසාත් ලබන්නේයයි මෙසේ අසමඛ්‍රවූ විධුර පණ්ඩිතයෝ සවිඤ්ඤවිලාසයෙන් වුත්තප්‍රකාර කාරණා හිතාඛ්‍යාශයෙන්කියා ධර්මපාලකුමාරයන් ප්‍රධාන කොට ඇති පුත්‍රයන් දහසක් දෙනාට ඉගැන්වූහ. පුත්‍රදාරවත් හා යහළු විශ්වාසයන් ආදිවූ බොහෝදෙනාට අවවාද අනුශාසනා කරන්නටම ඒ බොසි සත්වයන්ට තුන්දවසක් ඉකුත්වූයේය.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ නියමකළ දවස් පිරුණු නියාව දැන උදැසනක්සේම අනෙකප්‍රකාරවූ රසමසවුලෙන් යුක්තවූ අග්‍රභොජනය අනුභවකොට රජ්ජුරුවන් වහන්සේට දන්වා මානවකයා හා සමඟ යෙමිසි සිතා ඛඬුවගීයා විසින් පිරිවරනලදුව රාජභවනයට ගොස් රජ්ජුරුවන් වැඳ පැදකුණුකොට එකත්පස්ව සිට දෙහොත් මුදුනෙහි තබා මෙසේකිහ. සතුරන් දමනයෙහි ලන්නාවූ මහරජ්ජුරුවන් වහන්ස! මේ මානවක තෙමේ තමාට හැඟුනක් කරනු කැමැතිව මා ගෙනඅන්නේය. එසේහෙයින් මාගේ්නැයන්ට වැඩක් කියම් සිත්හෙළා අසා වදාළමැනව, මාගේ මේ! කුමාරුදිවූ දරුවන් කළ අපරාධයෙක් ඇත්නම් සිත නොතබා ඊට ක්ෂමාකොට දුකෙහි අත්නොහැර රැක වදාළමැනව, මාගේ ගෙයි මුතු මැණික් ආදිවූ යම් ධනයෙක් ඇත්නම් ඒ සියලු ධනඅත් නුඹවහන්සේ විසිනුත් අන් රජදරුවන් විසිනුත් මට දෙන ලද්දාවූ ප්‍රාමාණාතික්‍රාන්තවූ යම් අන්‍ය වසතුයෙක් ඇත්නම් ඒ සියලු වස්තුවත් නුඹවහන්සේම සොරුන් සතුරන්ගෙන් උපද්‍රවයකුත් වැඳ්දනොදී රක්ෂාකළ මැනව. මා පලාගිය කල්හි මාගේ බඳු සමූහයෝ පසුව යම්සේ සැපයෙන් නොපිරිහෙත්නම් එපරිද්දෙන් උනුන් රැක වදාළමැනව.

තවද යම්සේ බිම පැකිල ගිය පුරුෂයෙක් බිමම සරණකොට පිහිටාද, නුඹවහන්සේ පිහිට නොබලා මේ මානවකයා සන්තකයෙහිසි සැනලද මාගේ මේ පැකිලීමත් එසේම වන්නේය, බිම පැකිල බිම සරණකොට ඇති පුරුෂයාමෙන් මමත් නුඹවහන්සේ කෙරේ පැකිල නුඹවහන්සේම සරණකොට ඇත්තෙමි. එසේහෙයින් රජ්ජුරුවන් වහන්සේ කුමක් වත් යේක්දැයි මානවකයා අතින් විචාළකල්හි නුඹවහන්සේ මූහුණ නොබලා

සැබෑ බස රක්නා නිසා මම දැසෙමියි' කියන්නා මාගේ යම් අපරාධයෙක් ඇත්නම් ඒ අපරාධය දක්මි. මෙහෙස්මුත් අනික් මාගේ වරදෙක් නොදක්මි. ඒ මාගේ අපරාධයට ක්ෂමාකළ මැනව, මෙපමණ වරදෙක් සිහ නබා පසුව මාගේ පුත්‍රදූරුවන්ට සියි ගැහැවක් නොකළ මැනවැයි කිහ.

එබස් අසා ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ පණ්ඩිතයෙනි! තොපගේ ගමන මට අනිප්‍රාය නොවන්නේය. එසේහෙයින් මානවකයා උපායෙන්ම කැඳවා ගෙන්වාගෙන මෙතැනදීම මරා සතුවාදියම්හ. ඒ මට අභිප්‍රාය වන්නේයයි ප්‍රකාශනොට කිහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු දෙව ගන්වහන්ස! නුඹවහන්සේට එබදුවූ අදහසක් සුදුසුනොවන්නේය. අනර්ථයෙහිත් අකුශලයෙහිත් නුඹවහන්සේගේ සිත නොපිහිටුව මැනව, ආත්මාර්ථ පරාර්ථයෙහිත් දශකුශල ධර්මයෙහිත් යුක්තවුව මැනව. ප්‍රාණඝාතාදීවූ යම් අකුශලකර්මයක් නොට සත්වයෝ අපරාමර නොවෙද්ද? පසුව චුතියෙන් මත් පොහි නරකයට යෙද්ද, එසේහෙයින් කුසල් නොවන්නාවූ ලාමක අකුශල ධර්මයන්ව හින්දෑවේවයි මේතෙමේ කාරණයකුත් නොවන්නේය. කටයුත්ත කුදු නොවන්නේය. මරන්නටත් තළන්නටත් හිංසාකරන්නටත් සවාමි පුරුෂතෙමේ දැසයාට ඉසුරුමත් බැවින් සුදුසුවන්නේය. මේ කාරණයෙන් මට ඔහු හෙරහි ආඥා මාත්‍රවූ කොපයකුත් නැත. දුන් තැන් පටන් ඔහු කුමක් කරනත් ඉවසන්නටම සුදුසුය. එසේහෙයින් මම මානවකයා හා කැටුව යෙමියි කිහ. මෙසේ කියා මහබෝසතාණෝ රජ්ජුරුවන්වැඳ අනතුරු පුර සත්‍රීන්වත් රාජපිරිසටත් අවවාදකොට ඔවුන් අවවාද අසා හැමදෙනා සිටිපල සිවගතනොහී මහහඬින් හඬමින් සිටියදීම මාලිගාවෙන් නික්මුණහ. එකල්හි සියලු නුවරවාසීහු අපගේ පණ්ඩිතයන්වහන්සේ මානවකයා හා යන සේක්ල, එසේහෙයින් උන්වහන්සේ දක්නා පිණිස යම්හයි නියාගොස් රාජාඩම්බරයෙහිදීම බොධිසත්වයන් දුටහ. මහබෝසතාණෝ ඔවුන් හැම දෙනා රඳවා තෙපි හැමදෙන කිසි සැකයක් නොකරව. සියලු සංස්කාරධර්ම අනිත්‍යයෝමය. එසේහෙයින් දානශීලාදි කුශලධර්මයෙහි අප්‍රමාදව වාසයකරවයි කියා අවවාදකොට හැමදෙනා රඳවා තමන්ගේ ගෙට අභිමුඛව නික්මුණහ. එසඳ ධර්මපාල කුමාරයෝ මලුන් දහසත් පිරිවරා පියාණන්ට පෙර ගමන්කරම්හයි නික්මුණු තැනැත්තෝ ගෙදොරදීම පියාණන්ට සම්මුඛවූහ, මහබෝසතාණෝ ඒ ධර්මපාල කුමාරයන් වැළඳගෙන ළෙඟි හොවා සිත ඇති ශොක දුරුකොට ඉක්බිත්තෙන් සදුළු පිරුණාවූ දැසින් යුක්තව තමන් වසන මාලිගාවටගොස් වන්හ. ඒ මහබෝසතාණන්ගේ ගෙයි පුත්තු දහසෙක, දූවරු දහසෙක, භායර්‍යාවෝ දහසෙක, කම්මිත්තෝ සත්සියයක් කැයි මේ සියල්ලගෙනුත් අවශෙෂවූ ඥාතිමිත්‍රයන් හා දැසකම්කාරයන් ගෙනුත් විදුර පණ්ඩිතයන්ගේ සියලු මාලිගාව යුගාන්ත මාරුතයෙන් පැහැර වනුරුවනලද සල්ගස් ඇති සල්වනයක් මෙන් අතුරු සිදුරු නැතිවිය.

තදිද ඒ විදුර පණ්ඩිතයන්ගේ මාලිගායෙහි දහසක් පිරිමි පුතුන් හා දහසක් දූන් හා දෙවිඟනන්වැනි දහසක් භාර්‍යාවන් හා සත්සියයක් කම්මිත්තන් හා අවශෙෂ දැසකම්කාරබන්ධිමිත්‍රාදීවූ මෙතෙක්දෙන වණ්ඩමාරුතයෙන් පැහැර වනුරුවනලද සුපිපි සල්වනයක් මෙන් ශොභනවැනි වණ්ඩවාතයෙන්

ගසා බිම වැටුරුවනලද්දාහු හඬමින් බිම ඇතමැත පෙරළෙත්නාහ. තවද ඒ විධුර පණ්ඩිතයන්ගේ මාලිගායෙහි වෑපාරයන් හා බ්‍රාහ්මණාදී, හස්ත්‍යාචාර්‍යයන්හා අශ්වාචාර්‍යයන්ද, රථාචාර්‍යයන් හා පාබළ සෙනාවද, රාජ්‍ය දෙපාර්ශ්වයේ සෝද, එසේමරැස්වූ නියම්ගම්වැසිකෙළඹි ජනයෝද, සාමීනි! අප තවරකාරණයකින් හැරයනසේක්දැයි දෙහොත් හිස තබා හැඬූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ ඒ සියලු මහජනයා අස්වසා මිත්‍රයන් සේවායන් පුත්‍රදාරාවන් මල්බෑ ආදීවුන්ට ගෙයි කළමනා කවයුතු මේ මේයයි කම්නත විධානකොට ගෙයි රත්න කොෂ්ඨාගාරාදියෙහි තුබූ වස්තුද ඒ ඒ තැන පිහිටුවා නිධාන පත් ධනය එළවුවමනා තැන්දැයි මෙතෙක්දා සියා ඉක්බිත්තෙන් පූණිකයාට මෙසේ කීහ. කාහ්‍යායනය! තෝ මාගේ ගෙයි තුන්දවසක් විසූසෙයිය. මා ගෙයි කළමනාකාර්‍යය විධානත් නොව නිමවන ලද, මා විසින් පුත්‍රදාරාවන්ටත් අනුශාසනා කරන ලද්දේය. එසේහෙයින් අභිප්‍රාය ලෙස කැමැති පරිදි දෙන් මා ඇරගෙන නික්මෙවයිකීහ. එබැවින්ද, පූණිකයා කියන්නේ ඉදින් විධුර නම් අමාත්‍යයාණෙනි! තොපගේ පුත්‍රදාරාවන්ටත් තොප නිසා ජීවත්වන්නාවුන්ටත් ඉදින් අනුශාසනා කරන ලද්දේ විනම් එසේ දැන් වහා යනු කැමැත්තේවීනම් මෙසේ නැගිඑව, අපට අභිමුඛ යෙහි යායුතුවූ මේ මාර්ගය ඉතා දුරවන්නේය. එසේහෙයින් මේ ආජානීය සෛන්ධවයාගේ වාලධිය නොබා අල්වාගනුව, මේ තොපගේ සම්පත්තියෙහි කෙළවර දැක්මවන්නේයයි ඒ පූණිකයා යටමාලට නොබැස මහුමාලේ සිටිමි ආකාශයෙන් යනු කැමැතිව මෙසේ කීයේය. එකල්හි මහබෝසතාණෝ ඕහට කියන්නාහු මානවකය! කයින් වචසින් මනසින් කරනලද යම් අකුශල කර්මයක් නිසා සත්වතෙමේ දුගතියට යන්නේවිනම් එබදුවූ මා විසින් කරනා ලද අකුශලකර්ම සංඛ්‍යාතවූ නපුරෙක් නැත. එසේ නිවරදවූ මම් කවර කාරණයකින් බම්දැයි (මේ වචනය මහබෝසතාණෝ ආජානීය සෛන්ධවයාගේ වාලධිය නිර්භීතව අල්වාගනුවයි මානවකයා කී බැවින්) කීහ.

මෙසේ ඒ මහබෝසතාණෝ සිංහනාදකොට අසම්භීතවූ කොශල සිංහ රාජයකු පරිද්දෙන් නිර්භීතව මා වහන්නාවූ මේ වස්තුය මාගේ අනිත්‍යයෙන් නොම්දේවයි කියා අධිෂ්ඨාන පාරමිතාව පෙරදැරිකොට වස්තුය ම්රිකා ඇද ගෙන අසුගේ වාලධිය පීරා දෙකක්කොට බෙදා දැතින් තරකොට අල්වා ගෙන දෙපසින් අසුගේ කලවය වෙළා කොකුගසාගෙන මානවකය! මාවිසින් අසුගේ වාලධිය අල්වාගන්නාලද, දැන්වූකලී තෝ කැමැති පරිද්දකින් නික්මෙවයි කීහ. එසඳ පූණිකයා මනොමය සෛන්ධවයාට සන්කෙළේය. ඒ සෛන්ධවයා පණ්ඩිතයන් ඇරගෙන ආකාශයෙහි දිවගත්තේය. එසඳ පූණිකයා සිතන්නේ දුරට නොගොස්ම විධුර පණ්ඩිතයන් හිමාලයවන ප්‍රදේශයෙහි වෘක්ෂ පර්වතවල ගසා තළා මරාපියා හෘදයමාංශය ඇරගෙන මෘතකලේබරය පර්වත අහරකට දමාපියා නාගභවනයට යෙමියි සිතා ඒ පූණිකයා වෘක්ෂ හා පර්වතත් නොවලහා ඒ වෘක්ෂපර්වතමැදින්ම සෛන්ධවයාවිභිදුවූයේය. මහබෝසතාණන්ගේ ආනුභාවයෙන් වෘක්ෂත් පර්වතත් මහබොධිසත්ත්වයන්ගේ ශරීරය දැලයෙහි රියනක් පමණ තැන් ඉවත්වන්නේය. එසඳ පූණිකයා මේලේදේ නොමේලේදේ හෝයි කරකෑවී මහබෝසතාණන් මූණබලන්නේ රන් කැටපතක් මෙන් විශෙෂයෙන් ප්‍රසන්නවූ මුහුණ දැන මේතෙමේ මෙසේ

නොමියන්නේය. දැන් මහත්වූ වෙරඹ වාතයෙන් සුණුවිසුණුකරමිසි සිතා ක්‍රෝධයෙන් මඩනාලදුව සත්වැනිවූ වාතස්කන්ධයට දිවගත්තේය. ඉක්බිත් තෙන් වෙරඹ වාතයෙහුත් මහබෝසතාණන්ට කිසි අන්තරායක් නුවූ නියාව දැන බොධිසත්වයන් ඇරගෙන කාළගිරි නම් අස්‍රජන පර්වත මස්තකයට ගියේය.

මේසේ ඒ පූර්ණකයා මහබෝසතාණන් ඇරගෙන ගියසඳ පණ්ඩිතයන් ගේ පුත්‍රාදිහු පූර්ණකයා වයන හැතට ගොස් මහබෝසතාණන් නොදැක පා සුන්නවුන් මෙන් බිම වැටී අතමැත පෙරළෙමින් මහහඬින් හැඬූහ. තවද දහසක් අන්තඃපුරස්ත්‍රීන් හා සත්සියයක් හා කම්මිත්තෝ පූර්ණකනම් යක්‍ෂයා මානවක වෙශයෙන් අවුත් විධුර පණ්ඩිතයන් ඇරගෙන යන්නේයයි දැහොත් හිස තබා හැඬූහ. තවද අවශෙෂ පුරස්ත්‍රීන් හා රාජකුමාරවරුද වැපාරියන් හා බමුණෝද, හස්ත්‍යාචාර්‍යය හා අශ්වාචාර්‍යයන් ආදිවූ පාබල සෙනාවද රැස්වූ දනවැසියන් හා එසේම රැස්වූ නියම්ගම් වැසි සෙලෙඹි ජනයෝද, පූර්ණකනම් යක්‍ෂයා මානවක වෙසින් අවුත් විධුරපණ්ඩිතයන් ඇර ගෙන යන්නේයයි දැහොත් හිස තබා හැඬූහ. තවද ඒ මහබෝසතාණන් ගේ අන්තඃපුරස්ත්‍රීන් ආදිවූ වූකනප්‍රකාරබොහෝ ජනයෝ අපගේ විධුරපණ්ඩි තයන් වහන්සේ නොසිටියසේක් අපෝහෝසි කියා මහබෝසතාණන් ඇර ගෙන ආකාශයෙන්යන්නා දැකත් අසාත් මෙපරිද්දෙනුත් හඬා ඒ අන්තඃපුර සත්‍රීන් හා පුත්‍රාදිවූ හැමදෙනම සියලු නුවරවාසීන් හා සමග හඬමින් වලප මින් රජ්ජුරුවන් වහන්සේගේ මාලිගා දොරකඩට ගියහ.

එසඳ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ මහත්වූ විලාප ශබ්දය අසා සියු මැදුරු නවුඵව හැර කුමක් නිසා අවුදැයි විචාළහ. එසඳ රජ්ජුරුවන්ට ඔහු හැමදෙනමකියන්නාහු දෙවයන්වහන්ස! ඒ මානවකයා වූකලිබ්‍රාහ්මණයෙක් නොවෙයි. යක්‍ෂයෙක, බ්‍රාහ්මණ වෙශයෙන් අවුත් පණ්ඩිතයන් ඇරගෙන ගියේය. ඒ පණ්ඩිතයන් නැතිව අපගේ ජීවත්වීමෙක් නැත. ඉදින් අදට සත්වැනි දවස් පණ්ඩිතයෝ නාවාහුවීනම් අපි හැමදෙනම සියගණන් දහස් ගණන් ගැලින් දරඇද කැටිකොට හැමදෙනම ගිනිවැද මිය්මිහයි කිහ. (සළිඳයන් වහන්සේ පිරිනිවි කල්හිත් අපි ගිනිවැද මියම්හයි කී කෙනෙක් නැත.) මහාබොධිසත්වයන් විසින් නුවර මහජනයා සිත්ගෙන විසූ පරිදි ඉතා විස්මය නියාය ඉතා යාපත් නියායයි සිතා රජ්ජුරුවෝ ඔවුන් හැමදෙනාගේ බස්අසා පණ්ඩිතයෝ මිහිරිවූ ධම්කථා ඇත්තෝය. එසේහෙයින් මානවකයා ධම්කථාවෙන් පොළඹවා තමන්ගේ පාපිට හෙළාගෙන නොබෝකලකින්ම කදුළු මුසු මුහුණු ඇති මේ සියලුදෙනා සතුටුකරවම්න් එන්නාහ. එසේ හෙයින් තොපි හැමදෙනම ශොක නොකරවසි කියන්නාහු මහජනයෙනි! ඒ විධුර පණ්ඩිතයෝ විචාරණ ප්‍රඥයෙන් සමන්විතයෝය, අවිනාභිකාරණා කාරණා දක්වා බිණ්ඩිමෙහි සමර්ථයෝය, තික්ෂණයෝය, සථානොචිත කාරණා දන්නාවූ ප්‍රඥයෙන් සමන්විතයෝය. එසේහෙයින් වහාම තමන් යක්‍ෂයා අතින් ගැලවීගෙන මද දවසකින් තොප ඇස් හමුවට එන්නාහ, එසේහෙ යින් තොප හැම ශොක නොකරවසි මෙසේ නුවරවාසීන් අස්වැසූහ. එකල්හි නුවරවාසීහු විධුර පණ්ඩිතයෝ රජ්ජුරුවන් වහන්සේට කියා ගියෝවනැයි අස්වැසිලි ලත්හ. ඒ පූර්ණකතෙමේ මහාබොධිසත්වයන් වහන්සේ කාළගිරි පර්වත මස්තකයෙහි තබා සිතන්නේ මොහු ජීවත්වන කල්හි මට වැඩෙක්නම් නැත, මොහුමරා හෘදයමාංශය ගෙන නාගභවනයට ගොස් විමලාවගන්ට දී ඉරුදුනිය ගෙන දිව්‍යලොකයට යෙමියි සිතීය.

ඉක්බිත්තෙන් ඒ පුණ්ණකනම් යක්ෂසෙනාධිපතිතෙමේ ඒ කාළගිරි පර්වත මස්තකයෙහි සිට සිතන්නේ ක්ෂණ ක්ෂණයෙහි නොමරම්හයි කියාත් මරම්යි කියාත්. බොහෝ සිතිවිලි උපදවන්නේය. එසේනමුත් කිසිසේත් මෝහට ජීවිතදානය දෙම්යි යන සිතිවිල්ලෙක් මේවෙන ඉපද නියේ නම්ත් ඒ කාරණා නොවන්නේය. මොහුගේ ජීවත්වීමෙන් නාගභවනයෙහිදී මට සුළුපමාත්‍රවූත් කායික්‍යසිද්ධියෙක් නැත්තේය. එසේහෙයින් මොහු මෙතැනදී මරා මොහුගේ හෘදය මාංශය ගෙන යෙම්යි සිතිවුහත් නොලේය.

තවද සිතන්නේ මොහු සිය අතින් නොමරා භයංකාර රූපයක් මැවීමෙන් ජීවිතක්ෂයට පැමිණවූයෙම් වීනම් යහපතැයි භයංකාරවූ රාක්ෂස රූපයක් මවා මහත්කොට හඬගසමින් අවුත් ඒ බෝධිසත්වයන් නොලා මුඛයෙන් දළ ගස්සේ ලාගෙන කඩු කැමත්තක්හුමෙන් වූයේය. එසඳ මහබෝසතාණන්වහන්සේට ලොමුදහගැනීම් පමණකුදු නුවූයේය. ඉක්බිත්තෙන් සිංහරූපයක් සා මහත්වූ හස්තීරූපයක් මවාගෙන අවුත් සිංහ දළින්විනිවිදමස්අනුභවකරන්නාක්හුමෙන්ද ඇන්දළින්ඇන දෙසිදුරුකොට ජීවිතක්ෂයට පමුණුවන්නාක්හු මෙන්ද භයංකාර දක්වා එසේත් නොබන්නාවූ බෝධිසත්වයන්ට එක්දඹු ඔරුවක් සා මහත් සර්පවේෂයක් මවා සුස්මින් අවුත් සපාල ශරීරය වෙළා හිස්මුදුනේ එණගහිය තබාගත්තේය. එහා කුදුවුවත් ඒ බෝධිසත්වයන්ට තැතිගැනීම් පමණකුත් නුවූයේය. තැවත ඒ බෝධිසත්වයන් පර්වත මස්තකයෙහි සිට වැටී සුණු විසුණුවන්නේයයි සිතා කල්පාන්ත මාරුතයක් හා සමානවූ මහපවනක් හැමිවූයේය. ඒ මාරුතය බෝධිසත්වයන්වහන්සේගේ කෙසඟක් විවරකුත් සොලවාගත නුහුණුයේය. තැවත බෝධිසත්වයන් එසේම පර්වත මස්තකයෙහි තබා ඉදිගසන් අල්වා සොලවන මතැතක්හුමෙන් පර්වතය ඔබවොබ පෙරළා සෙලවූයේය. එසේ කොටත් බෝධිසත්වයන් සිවිතැනින් කෙසඟක් පමණකුත් සොලවාගත නුහුණුදේය.

ඉක්බිත්තෙන් ශබ්ද සන්ත්‍රාසයෙන් බෝධිසත්වයන්ගේ ළයපැළීම් භෙරෙමියි සිතා පර්වතය ඇතුළට වැද පෘථිවියත් ආකාශයත් එකනින් නාදසාරවමින් මහත් හඬගැසුයේය. එසේකළුන් බෝධිසත්වයන්ට කිසි චිත්ත සන්තාප මාත්‍රයකුත් නුවූයේය. මහාබෝධිසත්වයෝ වූකලී යක්ෂ සිංහ හස්ති නාගරාජවේශයෙන් ආයෙත් මහවැසි මහසුළං හා පර්වත චලනාදිය කෙළෙත් පර්වත ඇතුළත වැද මහත්කොට අඬගැසුයෙත් මානවකයාමය, අනිකෙක් නොවෙයි කියා නියමකොට දත්හ. ඉක්බිත්තෙන් යක්ෂයා සිතන්නේ මම මොහු බාහිරොපක්‍රමයෙන් මරන්නට අසමර්ථයෙම්යි සිය අතින්ම මොහු මරම්යි මහාබෝධිසත්වයන් පර්වත මස්තකයෙහි තබා පර්වත ප්‍රාන්තයට ගොස් ඉඳුනීලමාණික්‍යයක රත්පලස් හුයක් අවුනන්නාක් මෙන් සක්ෂණක්ෂණයෙහි රිරී පිට අඬගසමින් පර්වතය ඇතුළෙන්ම උඩතැගී මහාබෝධිසත්වයන් තරකොට අල්වාගෙන පෙරළා ඉස යටකොට පය උඩු කුරුකොට නිරාලම්බවූ ආකාශයෙහි දැමුවේය. මෙසේ ඒ බෝධිසත්වයන් සිස්වූ ආකාශයට දමා පසළොස් යොදනක් පමණ තැන් බටකල පර්වතය මුදුනෙහිම සිට තමාගේ ආනුභාවයෙන් අත දික්කොට අධිෂ්ඨිත්ව බස්නාවූ බෝධිසත්වයන් දෙකකුල අල්වාගෙන අධිෂ්ඨිකොටම ඔසවා මුඛය

බලා නොම්සේයයි දැන දෙවැනිවාරයකත් දැම්ය. කිස්යොදනක් පමණතැන් වටහාල එසේම ඔසවා මුගබලා කියි උපද්‍රවයකට නොපැමිණී බොධිසත්ව යන් දැන සිතන්නේ වුදිහු මේතෙමේ දුනුත් සැටයොදනක් පමණතැනුත් වැටු නොමියන්නේවීනම් දෙකකුල අල්වාගෙන පවිත මුදුනෙහි ගසා මරම්හි කියිය.

ඉක්බිත්තෙන් මෙසේ සිතා තුන්වැනිවාරයේ බොධිසත්වයන් අල්වා පවිත මුදුනෙන් හෙළා සැටයොදනක් පමණතැන්ම හුඟුකල තමාගේ ආයුෂාවයෙන් අත දික්කොට දෙකකුල අල්වා ඉස්සීය. එසඳ මහාබොධිසත්වයෝ සිතන්නාහු මේතෙමේ මා පළමුකොට පසළොස් යොදනක් පමණ තැනින් හෙළිය, දෙවැනි වාරයේ තිස්යොදනක් පමණ තැනින් හෙළිය, තුන්වැනි වාරයේ සැටයොදනක් පමණ තැනින් හෙළිය, නැවත මා නොහෙළන්නේය, උඩ ඔසවාගත් විටම පවිත මුදුනෙහි ගසා මරන්නේය, යම්පමණ කලකින් ඔසවා පවිත මුදුනෙහි නොගසන්නේවීනම් ඊට පළමු කොට අධිශීර්ෂව එල්ලී සිටම මා මරන්නාවූ කාරණය විචාරමියි සිතා භයක් වතිහයක් නැතිව පූණික නම් යක්ෂසෙනාපතිහට මෙසේ කිවුය, එමැලි පූණිකය! හෝ රූපයෙන් උත්තමවූ රූපශ්‍රී ඇති දිව්‍යපුත්‍රයන්හු වැන්නෙහිය, එහකුදුවුවත් කායවාක් සංයමාදී තාගේ කිසිම උත්තම ගුණයෙක් නැත්තේය, තවද කායවාරාදියෙන් අසඤ්ඤතවූ පාප ක්‍රියා කරන්නේය, එහකුදුවුවත් කායවාක් සංයමයන් ඇති එහක්හු මෙන් පෙනෙන්නේය, රෞද්දවූ කිසිම වැඩක් සිඳනොකරන්නාවූ ලාමක ක්‍රියාවක්ම කරමින් සිටියෙහිය, එසේහෙයින් තාගේ සිත සබලා මාත්‍රවූත් කුසලයෙක්වේවයි කරුණා මෛත්‍රියෙක්වේවයි නැත්තේය, මෙබඳුවූ තෝ මා මේ ප්‍රපාතයෙහි හෙළා මරනු කැමැත්තෙහි වීනම් එසේ මාගේ මැරීමෙන් තට කවර ප්‍රයෝජනයෙක් ඇද්ද? අද වූකලී තා මේ කරන්නාවූ කාශ්‍යීය අමනුෂ්‍යය කුගේ ක්‍රියාවක් මෙන් වන්නේය, නොවලහා මට කියව, තා යක්ෂයන් අතරෙන් කවර නිකායෙහ උපන් යක්ෂයෙක්දැයි විවාළහ.

එසඳ පූණිකතම් යක්ෂයා කියන්නේ එමබා විධුර පණ්ඩිතයෙනි! පොප්විසින් අට වියි යක් සෙනෙවියන් අතරෙන් පූණිකතම් යක්ෂසෙනාධිපතියෙක් ඇතැයි අසනලද්දේවීනම් එතෙමේ වෙසවුණු මහරජාණන්ගේ අමාත්‍යවන්නේය, තවද නාගභවනයෙහි වාසයකරන්නාවූ වරුණනම් නාගරාජයෙක් ආරොහපරිනාහයෙන් යුකතය. දිවිදළින් ඔප් නැඟු සතක රූපයක් මෙන් ඉතා නිමිලවූ ශරීරශ්‍රීහා දර්ශනීයවූ රූප සොභා ඇත්තේය. මහත්වූ කායබලයෙන්ද යුකතය. ඔහුගේ අනුජාත දුව ලබන්නා කැමැතිවිම්. ඔතොමෝ ඉරන්දතීනම් නාගකන්‍යාවය, අසුරෙන් පමණකට හැකි මධ්‍යම ප්‍රදේශ ඇති ඉරන්දතී නම් ඒ නාගකන්‍යාව ලබනු කැමැතිව තොපට මෙතෙක් උපක්‍රමයන්කොට මරනු කැමැතිවිම් කීය. එබස් අසා මහාබොධිසත්වයෝ මේ ලොකවාසී සත්වයෝ නිස්කාරණයේ ඇත්ව තිබූ කායශ්‍රීය තිබූසේ නිබැඳිදි වරදවා ගැන්මෙන් නස්නාහ. නාග කන්‍යාව පතන්නාවූ මෝහට මාගේ මරණින් කවර ප්‍රයෝජනයෙක් ඇද්ද එසේ හෙයින් මරන කාරණා හත්වූ පරිද්දෙන් දැනගනිමියි සිතා විචාරන්නාවූ බොධිසත්වයෝ යක්ෂය! තෝ මූස නොවව, මේ ලොකයෙහි බොහෝ සත්වයෝ අකාශ්‍යීය කාශ්‍යීය කොට ගෙන කාශ්‍යීය අකාශ්‍යීය කොට ගෙන නවහ, හස්තාපරිච්ඡ

මධ්‍යම ප්‍රදේශ ඇති ඉරණදති නම් ඒ නාගභවනයාව නිසා මාගේ මරණින් පට කවර ප්‍රයොජනයෙක් සිඛවේද? සඛද! තෝ මා මැරීමෙහි කාරණා කියාබලව ඒ කාරණා අසනු කැමැත්තෙමියි කීහ.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන්ට පූණිකයා මරන කාරණා කියන්නේ විධුර පණ්ඩිතයෙනි! මහත්වූ ආනුභාව ඇති වරුණ නම් නාරජ්ජුරුවන්ගේ දුවූ නාගකන්‍යාව නිසා ඇවිද උන්ට මම ඥති සම්බන්ධයක් කෙරෙමි. ඉරණදතිය ඉල්වන්නාවූ මට මයිල්ව සිටියාවූ වරුණනම් නාරජ්ජුරුවෝ මා කාමයෙහි ලොල් නියාව දැන පූණිකයා! තට මනාවූ රූප සොභා ඇති නිලූ පුල් පෙති බදුවූ ඇස් ඇති මඳ මිඳ සිනා ඇති වඳනාගරු ගල්වනලද ශරීර ඇති ඉරණදතිය දෙම්මය. එතකුදුවුවත් තෝ ඉදින් විධුර පණ්ඩිතයන්ගේ හෘදයමාංශය දැහැමින් ලැබ මෙහැනට ගෙනයෙහිවූනම් ඒ සතුටුපඬුරුනිසා ඉරණදතිය තෝලබන්නෙහිය. මෙසින් අන්‍යවූකවරවස්තුවක්වත් අපි ප්‍රාර්ථනා නොකරමිහසි කිවුය. එසේහෙයින් විධුර පණ්ඩිතයෙනි! මා මූසව කියනදෙයක්නැත. මාගේ බස් අසව, මා වරදවාගත් කිසිම කායික්‍යයකුත් නැත, තොපගේ හෘදයමාංශය දැහැමින් ලද්දේවීනම් ඒ නිසා ඉරණදති නම් නාගභන්‍යාව බාධාවක් නැතිව මට දෙන්නාහුය. ඒ කාරණයෙන් මම තොපට වධකිරීමෙහි නියුක්ත වීමි. තොපගේ මරණින් මට ප්‍රයොජන නම් මේ කාරණයවත් නේය. මේ නරක ප්‍රපාතයෙහි තොප හෙළා මරු තොපගේ හෘදය මාංශය ඇරගෙන යන අභිප්‍රාය ඇත්තෙමියි කීය.

ඒ පූණිකයාගේ බස් අසා මහබෝසතාණෝ සිතන්නාහු විමලාවන්ට මාගේ හෘදය මාංශයෙන් ප්‍රයොජන නැත, වරුණ නම් නාරජ්ජුරුවන් ධර්ම කථාව අසා කණ්ඨමාණික්‍යයෙන් පූජාකොට නාගභවනයට ගියතැනැත්තන් විසින් මාගේ ධර්මකථික භාවය වණ්ණනාකරන ලද්දේවන. ඉක්බිත්තෙන් විමලාවන්ට මාගේ ධර්මකථායෙහි දෙළෙක් උපන්නේවන. වරුණනම් නාරජ්ජුරුවන් විසින් වරදවා සිතාගෙන පූණිකයාහට නියොග කරනලද්දේවන. ඒ පූණිකයා තමා වරදවා සිතාගැන්මෙන් මා මරන්නට මෙබඳුවූ දුෂකට පැමිණවිය. මාගේ පණ්ඩිත බව හා සර්වඥතාවිත ප්‍රඥයෙහි සම්පන්නාවය මොහු මරන්නට උත්සාහ කරන වේලෙහි කුමක් කෙරේද? එබැවින් මාත වසාය! මම **සාධුනර ධර්ම** නම් දෙයක් දනිමි. යම්තාක් මම නොමියයෙම් නම් ඊට පළමුකොට මා පළිත මස්තකයෙහි ඉදුවා සාධුනර ධර්මය අසා පසුව යමක් කැමැත්තොහි වීනම් ඒ කරවයි කියා සාධුනර ධර්ම වර්ණනාකිරීමෙන් ජීවිතදානය ඉල්වාගත්තෙම් වීනම් යහපතැයි ඒ බොධිසත්ත්වයෝ අධිෂ්ඨාන කොට එලෙමින් මානවකයාට කියන්නාහු එඹල කාත්‍යාගතය! ඉදින් තට මාගේ හෘදය මාංශයෙන් ප්‍රයොජනය ඇත්නම් වහා මා මේ නරක ප්‍රපාතයෙන් උඩනහවා මේ ලොකයෙහි පවත්නා යම්කිසි සාධුනර ධර්මයෙකුත් ඇත්නම් ඒ සියල්ලම අද තට ප්‍රකාශකොට කියමියි කීහ. එබස් අසා පූණික නම් යක්ෂ සෙනාධිපතියාතෙමේ විධුර පණ්ඩිතයන් විසින් දිව්‍ය මනුෂ්‍යයන්ට පළමුකොට නොකිවිරු ධර්මයෙක් වනැයි සිතා වහාම උඩනහා සාධුනර ධර්මය අසමියි මහාබොධිසත්ත්වයන් උඩ ඔසවා පළිත මස්තකයෙහි හිඳුවා අස්වැසිලි ලැබ හුන්නාවූ අලාමකවූ ප්‍රඥාඇති බොධිසත්ත්වයන්ගේ මුහුණ බලා මෙසේ කීය. විධුර පණ්ඩිතයෙනි! තෙපි මා විසින් ප්‍රපාතයෙන් ගොඩනහනලදුව අද

තොපගේ හෘදය මාංශයෙන් මට ප්‍රයොජන ඇත. මේ ලොකයෙහි විද්‍යමාන යම්කිසි සාධුනර ධර්මයෙක් ඇද්ද, ඒ සියල්ල අද මට පහළකරවයි කිහ. මහ බෝසතාණෝ එබස් අසා ප්‍රණීතය! මම තා විසින් ප්‍රපාතයෙන් ගොඩනහා ලද්දෙම්වෙමි. ඉදින් තට මාගේ හෘදයමාංශයෙන් ප්‍රයොජන ඇත්නම් ලොකයෙහි විද්‍යමාන යම්කිසි සාධුනර ධර්මයෙක් ඇතද, ඒ සියල්ල අද තට ප්‍රකාශකොට කියමියි සිතා නැවත ඔහට කියන්නාහු ඵඹල මානවකය! මම කිලුටුවූ ශරීර ඇත්තෙමි. එසේහෙයින් ශරීරය නිර්මලකොට ශ්‍රම දූහ නිවා ජලස්නානයකරනු කැමැත්තෙමියි කිහ.

යක්ෂයා එබස් යහපතැයි ගිවිස නහනපැන් ගෙනවුත්දී බොධිසත්වයන් ස්නානය කළ කල්හි දිව පිළිද දිවමල් ආදිඅද, සම්භරණයන්ද ගෙනවුත් දින. එයින් සැරහි සිටිකල්හි දිව්‍යභොජනය දුන්නේය. මහාබොධිසත්ව සෝ දිව්‍ය භොජනය අනුභවකොට ක්ෂුධා පිපාස දෙක නිවාගෙන කාලගිරි පළිත මස්තකය විශේෂකොට සරඟවා අස්නක් පනවා සරඟනල්ද ආසන මස්තකයෙහි ඉඳ සිඳහ විලාසයෙන් සාධුනර ධර්මය කියන්නාහු මානවකය! උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරව. තෙත්වූ අත නොදව, මිත්‍රද්‍රොහී කමක් කිසිකලෙකත් නොකරව, අසත්පුරුෂ ස්ත්‍රීන්ගේ වසඟයට පැමිණිම්ත් නොකරවයි කිහ. යක්ෂතෙමේ සංක්ෂේපයෙන් කියනලද සාධුනර ධර්ම සතර දැනගත නොහි විස්තර වශයෙන් විචාරන්නේ විධුර පණ්ඩිතයෙනි! උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කරන්නේ කෙසේද? තෙත්වූ අත නොදවන්නේ කෙසේද? මිත්‍රද්‍රොහි නම් කවරෙක් වේද? අසත්පුරුෂ ස්ත්‍රීහු නම් කවුරුද? තත්වූ පරිද්දෙන් මේ සතර මට කියවයි කිහ.

එබස් අසා බොධිසත්වයෝ ඔහට කියන්නාහු මානවකය! යම් සත්වයෙක් පෙර නුදුටුවිරූ විශ්වාසයක් නැති එක් දවසකුත් සමීපයෙහි නොවිසූ සත්වයන්හු දැක බත් පැන් දෙන්නා තබා ඉදිනට අස්නක්දී උපචාරකිරීම් පමණකිහුත් සිත සතුටුකරවා උපකාර නොළේනම් සත්පුරුෂකම් දන්නා සත්වතෙමේ පූර්ව්‍යොපකාරිහට එකාන්තයෙන් වැඩ නිස්සක්ම කරන්නේය. නුවණැත්තාවූ සත්වයෝ පළමු උපකාරකළවුන්ට ප්‍රත්‍යුපකාරකිරීම් බලවත්වූ සත්පුරුෂ ධර්මයෙකැයි කියති. දිව්‍යරාජය! මේ පළමුවන සාධුනර ධර්මය වන්නේය. නැවත යමෙක් යම්කුගේ ගෙයි එක රැයකුත් ලැග්ගේ වීනම් යම් ගෙයකදී ආහාරපාන මාත්‍රයකුත් ලද්දේවීනම් ඒ ගෘහස්වාමිවූ ලග්නා තැන් දී බත් පැන් දුන් සත්වයාහට සත්පුරුෂතෙමේ නපුරක් කරන්නා තබා සිතිනුත් නොසිතන්නේය. යමෙක් ඔහට නපුරක් සිතුයේවීනම් ඒ මිත්‍රද්‍රොහියා නිරන්තරයෙන් අනුභවකිරීම නිසා සේදීමෙන් තෙත්වූ තමාගේ බත් කන අතම දූවිවානම්වෙයි, මානවකය! මෙසේ තෙත්වූ අත නොදැවීම් දෙවන සාධුනර ධර්මය වන්නේය. තවද මානවකය! යම් සත්වයෙක් යම් රුකක්මූල පවන්ගස්වා ඉදිමක් හෝ සැතපීමක් හෝ කෙළේවීනම් ඒ වෘක්ෂයෙන් අත්තක් වේවයි පතක් වේවයි කිසිසේත් නොකඩන්නේය. කුමක් හෙයින්ද යත්? ඉදින් යමෙක් එසේ කෙළේවිනම් ඌවිටුවූ මිත්‍රද්‍රොහියෙක් වන්නේය. මෙසේ ඡායාවෙහි ඉඳ ප්‍රයොජනවූත් සිත්හිත් නැති වෘක්ෂයේ අතුපත් කැඩීමෙන් මිත්‍රද්‍රොහිවන කල මනුෂ්‍යව සිට උපකාරකළවුන්ට ද්‍රොහිව උන්හේ යම්කිසි වක්ෂුවක් නසාපුවොත් මිත්‍රද්‍රොහිවන බව කියනුම කවරේද? එසේ

හෙයින් සත්පුරුෂයන්ට අසත්පුරුෂව ද්‍රොහ නොකිරීම තුන්වන සාධුතර ධර්මය වන්නේය. තවද මානවකය! යම් පුරුෂයෙක් මුක්තාමාණික්‍යාදි දශ විධ රත්නයෙන් සම්පූර්ණවූ මේ මුළුපොළොව පතිව්‍රතා ධර්මරක්ෂා කෙරෙසි සිතා විශ්වාසීවූ සත්‍රීයකට දුන්නේවිනම් එසේ ඒ මුළුපොළොව දුන් පුරුෂයාත් ඕතොමෝ අසඳිසිමයට අවසරයක් ලද්දිනම් කළ උපකාරය නොසිතා එ කාන්තයෙන් ඉක්ම පවත්නිමය, එසේවූ අසත්පුරුෂ ගුණයෙන් හරිත පාපසත්‍රීන්ගේ වශභයට කායිකා කායික දන්නා සත්වයෙක් කිසිසේත් නොපැමිණෙන්නේමය. මේ සත්‍රීන් නිසාත් පවුනොකිරීම් සතරවන සාධු නර ධර්මයවන්නේය. මානවකය! මෙසේ යටකී පරිදිදෙන් උපකාර කළ වුන්ට ප්‍රත්‍යුපකාර කිරීමත්, තෙත් අත නොදැවීමත්, මිත්‍රද්‍රොහී නොවීමත් පාපසත්‍රීන් වසභයට නොපැමිණීමත් උතුම්වූ සාධුතර ධර්මසතරසාසි විශෙෂ යෙන් දැනගෙන දිව්‍ය රාජවූ තෝ මෙබඳුවූ සාධුතර ධර්ම සතරින් යුකතව අධර්මය දුරුකොට ධර්මයෙහි යෙදීමසාරවසි අවවාද කළහ.

මෙසේ මහබෝසතාණෝ යක්ෂයාට සතර සාධුතර ධර්ම සම්බඳ විලාස යෙන් විසතාරකොට කිහ, පූර්ණකයා ඒ ධර්මය අසමින්ම සිට සිතන්නේ මේ සතර සාරාංශයෙන්ම පණ්ඩිතයෝ තමන් ජීවිතදානය ඉල්වති. මූ වූකලී පෙර ශ්‍රුදුවුවිරු කිසිම විශ්වාසයක් නැති මට බොහෝ සත්කාර සම්මාන කොළෝය. මම මුන්ගේ මාලිගායෙහි වෙසෙමින් තුන්දවසක් මුළුල්ලෙහි දිව්‍ය ඓශ්වර්‍යයක් හා සමානවූ ඓශ්වර්‍යය අනුභවකෙළෙමි. මම මුන්ගේ මැරීම සංඛ්‍යාතවූ පාපකර්මයකරන්නෙමි සත්‍රියක නිසාම කෙරෙමි. එසේ හෙයින් සර්ප්‍රකාරයෙන්ම මම මිත්‍රද්‍රොහිව සිටියෙමි. ඉදින් මම පණ්ඩිත යන්ට අපරාධයක් කෙළෙම්වීනම් සාධුතර ධර්මයෙහි නොපැවැත්තේවෙමි. නාගමානවිකාවගෙන් මට ප්‍රයොජන කිම්ද? ඉදිපත් නුවරවාසිවූ සත්ව යන්ගේ කදුළු මූසු මුහුණු සතුටුකරවමින් මොහු වහා ගෙන ගොස් ධර්මසභා මණ්ඩපයෙහි ලාපියා එමියි සිතා බොධිසත්වයන් හා සමග කථාකරන්නේ විධුර පණ්ඩිතයෙනි! මම තොපගේ ගෙයි තුන්දවසක් විසිමි. ආහාරපාන චගීරාදියෙන් උපස්ථාන ලදිමි. එසේ හෙයින් තෙපිමට ඉඟට මිත්‍රව සිටයව. මම තොප ඇරපියා යනු කැමැත්තෙමි. පොළොව හා සමාන උතුම්වූ නුව ණැති බොධිසත්වයෙනි! එකාන්තයෙන් තොපි තොපගේ මාලිගාවට සැක නැතිව පලාශ්ව, වරුණනම් නාරජුරුවන්ගේ විමලානම් නාගමාන විකා වා තොපගේ හෘදය මාංශයෙන් වන්නාවූ ප්‍රයොජනයත් නැතිවන්නේය. මටත් ඉරණතීනම් නාගකන්‍යාවගේ ලැබීම නැතිවන්නේය, තොපි තොපගේ සුභාෂිතය නිසා මාගෙන් අද සැපසේ මිදිගියේවේදැයි සතුතිකෙළේය. එසඳ මහබෝසතාණෝ ඔහට කියන්නාහු මානවකය! තෝ මාගේ ගෙට මා නොගෙනයව නාගභවනයට මාගෙනයව, තාගේ මසිල් වරුණනම් නාරජ හුටත් තටත් වැඩම සිඩකරම්. මමත් ඒ දිව්‍ය නාගරාජයා හා ඔහුගේ නුදුවූ විරු දිව්‍ය විමානය ගියොත් දක්නෙමි වේද, එසේ හෙයින් එහා මා ඔබ ගෙනයවයි කිහ. එබස් අසා පූර්ණකයා කියන්නේ පණ්ඩිතයෙනි! යම සත්ව යක්හු දුටුකල අවැඩෙක් සිඩවේ නම් ඔහු දක්නට සුදුසු නොවන්නේ යයි නුවණැත්තෝ කියති. ප්‍රඥවන්තවූ බොධිසත්වයෙනි! එසේ හිඹියදී කවරකාරණයකින් සතුර්න්ගේ ගමට යන්නට සිතව්දැයි කිහ.

එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු මානවකය! මමත් එකාන් තයෙන් අමිත්‍ර සමාගමයට යාම නපුරු නියාව දනිම්මය, නුවණැති සත්ප යෙක් සහුරන් දක්නට නුදුදුසුම වන්නේය. එතකුදු වුවත් මා විසින් කළ කිසි අකුශලයෙක් නැත්තේය, එසේහෙයින් මරණ පැමිණියේවේදැයි මා ඊට භයක් සංකාවක් ඇතැයි නොසිතව, තවද දිව්‍යරාජය! මාවිසින් නා බදුවූ රළු පරළුවූ යක්ෂයෝ පවා ධර්මකථායෙන් පොලඹවා මොලොක් කරනලදහ. දැන් තෝ නාගමානවිකාවගෙන් මට ප්‍රයොජන නැහ. තොපි තොපගේ ගෙවම පලායවයි කියමින් සිටියෙහිය. එසේ කිබියදී නාරජ්ජුරු වන්ගේ සිත මොලොක්කිරීමෙහි මට කවර බැරිරුමෙක්ද වහා මා ඔබ ගෙනයවයි කිහ. එබස් අසා පූණිකයා බොධිසත්වයන්ගේ වචනය ගඟපතැයි පිළිගෙන විධුර පණ්ඩිතයෙනි! යම්සේ වෙසවුණු මහරජ්ජුවෝ **නලිනී** නම් රාජධානියෙහි පඤ්චාංගික තූර්‍යනාදයෙන් සිත් සතුටු කෙරෙමින් වෙසෙද්ද, එපරිද්දෙන් වරුණ නම් නාරජ්ජුරුවෝ නැටුමෙන්ද ගී කීමෙන්ද සිත් සතුටුකොට යම් තැනෙක වෙසෙත් නම් එසේවූ මහත්වූ මහිම ඇති නාගලොකයට මාහා සමඟ අවුත් උන්ගේ ශ්‍රීවිභූති විශෙෂකොට දකුව, තවද ඒ නාගභවනය හා කන්‍යා සමූහයා විසින් හැම වේලෙහිම සංචාරණය කරන ලද්දේය. රෑ දවල් අතරක් නැතිව ආතත විතතාදි පඤ්චාංගික තූර්‍යීයන් ගත් අත් ඇති නාමෙනෙවියන් හැමවේලෙහිම ක්‍රීඩාකරන ලද්දේය, ගෙතු නොගෙතු නා සපු දුනුකේ සීතිද්ද බෝලිද්ද දැසමන් ආදීවූ නොයෙක් සුවඳ මලින් ගැවසී ගත්තේය. ආකාශයෙහි ගසන විදුලිය කලප් මෙන් ප්‍රාසාද කූටාගාර මණ්ඩපාදියෙහි ආලොකය දශදික් බබුළුවන්නේය. දිව්‍යවූ ආහාර පානවර්ගයෙන් හා නැටුම් ගීකිම් බෙරවැයිම් ආදියෙන් සිත් සතුටු කරවන්නේය. නැවත වස්ත්‍රාභරණාදියෙන් හා පෙරහර පාදංගුලි ආදිවූ සත්‍රී ආභාරණයෙන් සැරහුණාවූ නාග කන්‍යාවන් ගෙනුත් බබළී නිබෙන්නේයසි නාගභවනය විශෙෂයෙන් වර්ණනාකොට කීයේය.

ඉක්බිත්තෙන් ඒ පූණික නම් යක්ෂසෙනාධිපති තෙමේ කුරුරට වාසින්ගේ අමාත්‍ය ශ්‍රෙෂ්ඨවූ විධුර පණ්ඩිතයන් පශ්චිමාසනයෙහි හිඳුවා ගෙතු වරුණ නම් නාරජ්ජුරුවන්ගේ නාගභවනයට ගෙන ගියේය. එසේ ගෙනයන ලද ඒ විධුර පණ්ඩිතයන් වහන්සේ මහත්වූ මහිම ඇති ඒ නාග භවනයට පැමිණ පූණික නම් යක්ෂසෙනාධිපතිහුගේ මනොමය සෛන්ධවයා පිට පශ්චිමාසනයෙහි උන්නේය. ඒ පූණිකයා බොධිසත්වයන් පූර්‍වාසනයෙහි හිඳුවාගෙන යන ගමනේ පශ්චිමාසනයෙහි කුමක් පිණිස ඉඳවීදයත්? ඕහට මෙසේවූ සිතිවිල්ලෙක් උපන්නේය. ඉදින් වරුණ නම් නාරජ්ජුරුවෝ පණ්ඩිතයන් දැක මොලොක් සිතක් ඇතිවූ නම් ගඟපත, ඉදින් මාදු චිත්තයෙක් නුපන්නේ වීනම් ඒ නාරජහට නොපෑම සෛන්ධවයා මත්තෙහි උන්සේ ඉන්දදීම ඇරගෙන යෙමිසි පශ්චිමාසනයෙහි ඉඳුවූයේය. වරුණනම් නාරජ තමාහට බැණණුවූ ඒ පූණික නම් යක්ෂසෙනාධිපතිහු දැක පළමු කොට කථාකරනුයේ පූණිකයෙනි! තෙපි විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය සොයා මනුෂ්‍යලොකයට ගියාවද? අලාමකවූ ප්‍රඥ ඇති විධුර පණ්ඩිතයන් ඇරගෙන එමිසි කියා ගිය කාර්‍යය සමෘඩකොට ගෙන අවුදැයි විවාළේය. එසද පූණිකයා කියන්නේ වරුණ නම් නාරජ්ජුරුවෙනි! තෙපි යම් කෙනෙකුත් කැමැතිවීනම් ඒ පණ්ඩිතයෝ මෙතැනට අවුය. මාවිසින්

මේ ලොකප්‍රසිඩ දශකුසල ධර්මයෙහි යෙදී වාසයකරන්නාවූ ඒ විධුර පණ්ඩිතයෝ අන්නෑකින් ගෙන එන ලද්දෝ නොවෙති, දූහැමින්ම ගෙන එන ලදහ. දැන් වූකලී කුරවින නාද පරයන්නාවූ මධුරස්වරයෙන් ධර්මදෙශනා කරන්නාවූ බොධිසත්වයන් සම්බුද්ධයෙහිමි දැක්ම, සත්පුරුෂයන් හා එක ස්ථානයෙහි සමාගමය ඉතා සැපවන්නේයයි කීය. වරුණ නම් නාරජ බොධිසත්වයන් දැක කියන්නේ විධුර පණ්ඩිතයෙනි! තෙපි නුදුටුවිරු නාගභවනය දැක මරණ භයින් තැතිගෙන මට නමස්කාර නොකරව් නම් මේ කාරණය නුවණැත්තන්ට සුදුසුකායක්‍යයෙක් නොවෙයි කීය. මෙසේ නාරජ්ජරුවන් වැඳුම් පතන තැනැත්තන්ට මහබෝසතාණෝ තෙපි මා විසින් වැන්ද යුතු කෙනෙක් නොවෙයි නොකියා තමා නුවණැති බැවින් උපාය කෞශල්‍ය ඥානයෙන් මම වධප්‍රාප්තව සිටි බැවින් නොවදිමි කියන්නාහු නාරජ්ජරුවෙනි! නුදුටුවිරු නාගභවනය දැක විස්මයට පැමිණියෙත් නැත. සතුරන් සවම්පයට පැමිණියෙමි වේදැයි භයින් ත්‍රාසවූයෙත් නැත. බල එකක් කියමි, වධාර්හවසිටි පුරුෂයෙක් සවාමීව සිටි එතෙක්හට නමස්කාර නොකරන්නේය. වධයට යොග්‍යවූ පුරුෂයා ලවාද දණ්ඩනාදිය යොදවන්නට යොග්‍යවසිටි සවාමියාත් නමස්කාර නොකරවන්නේය. මෙබඳුවූ ලොකප්‍රසිඩ පණ්ඩිතයක් හට කිසි භයෙක්වත් චකිතයෙක්වත් නැත්තේය. යම් සත්වයෙක් යමක්හු මරනු කැමැතිව සවම්පයට ගෙන්වූනම් ඒ වධාර්හවූ පුරුෂයා සවාමීව සිටි තැනැත්තහුම කෙසේනම්වදීද? සවාමිවසිටි තැනැත්තේ වධාර්හවූ පුරුෂයා ලවා කෙසේ නම් නමස්කාරගනීද? මේ තෙමේ ලොක චාරිත්‍රයක්ව තිබියදී මේ අකාර්‍යයෙක්ම වේද? තොප මා ගෙන්වූයේ මරනු නිසා වේද? එසේ හෙයින් ඒ තොප කුමක්නිසා වදිම්දැයි කීය. එබස් අසා නාරජ්ජරුවෝ බොධිසත්වයන්ට සතුති කරන්නාහු අලාමකවූ ප්‍රඥා ඇති විධුර පණ්ඩිතයෙනි! තොප යමක් කිවුනම් ඒ තොප කීයේ ඇත්තමය. වධාර්හවූ පුරුෂයා සවාමියාහටත් නමස්කාර නොකරන්නේය. වධාර්හවූ පුරුෂයා ලවා සවාමීව සිටියෙත් නමස්කාර නොකරවන්නේය. යම් සත්වයෙක් වධ ප්‍රාප්තව සිටියේ වීනම් ඒ තෙමේ කෙසේ නම් වදීද? ඔහුලවා කෙසේ නම් නමස්කාර කරවාගත හැකිද? මේ තෙමේ ලෝකයෙහි ප්‍රසිඩව පවත්නා කාර්‍යයෙක් වේදැයි අභීත සිංහනාද කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ නාරජ්ජරුවන් හා සමඟ විළිසඳර කථාකරන්නාහු නාරජ්ජරුවෙනි! තොපගේ දිව්‍යවූ නාගසම්පත්තිය, දිව්‍යවූ ශරීර සොභාවය කායබලය, චෛතසික වීර්‍යය, නාගභවනයෙහි උත්පත්තියය සියලු ඓශ්වර්‍යය, දිව්‍යවිමානය, යනමේ සියල්ල අශාශ්වතය එකාකාරයෙන් නොපවත්නේය. එසේදවුවත් තෙපි එකාන්තයෙන් කල්පස්ථායීව පවත්නා කොට සිතව්ය, නාරජ්ජරුවෙනි! මෙබඳුවූ මේ ඓශ්වර්‍යය කෙසේ ලදුද? තොප මේ නාග ඓශ්වර්‍යය ලත් කාරණා තත්වූ පරිද්දෙන් නොවලහා මට කියව, තවද මේ සම්පත්තිය එක්තරා එක්කාරණයකින් ලබනලද්දේද? නොහොත් සෘතුවිපර්‍යාශයෙකින් ලබන ලද්දේද? සිය අතින්ම කොට ගන්නා ලද්දේද? නොහොත් දෙවියන් විසින් දෙන ලද්දේද? යම් පරිද්දෙකින් මේ දිව්‍ය විමානාදිවූ ඓශ්වර්‍යය තොප විසින් ලබන ලද්දේවීනම් ඒ සියලු කාරණා තත්වූ පරිද්දෙන් නොවලහා මට කියවයි කීය. එබස් අසා නාරජ්ජරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මාවිසින් මේ නාග ඓශ්වර්‍යය එක්කාර

ණයකින් ලබන ලද්දේත් නොවෙයි සෘතුවිපස්සීඝයකින් ලබන ලද්දේත් නොවෙයි, සිය අතින් කරනලද්දේත් නොවෙයි. දෙවියන් විසින්දෙන ලද්දේත් නොවෙයි, වැළි කුමකින් ලබන ලද්දේද? අලාමකවූ තමා විසින් පූර්ව ජන්මයෙහි කරනලද කුශල කර්මයෙන්ම දිව්‍ය ප්‍රාසාදාදිවූ සියලු නාග සම්පත්තිය ලබනලද්දේයයිකිහ. එසඳ මහබෝසතාණෝ කියන්නාහු වරුණ නම් නාරජ්ජුරුවෙනි! පූර්ව ජන්මයෙහි තොප විසින් කරනලද ව්‍රත සමාදානය කවරේද? දුන් දන් කවරේද? රැකි සිල් කවරේද? සෘඩි මහිමය, බලය, ඊශ්‍යර්‍ය, නාගලොකොත්පත්තිය, දිව්‍ය ප්‍රාසාදාදිවූ නාගසම්පත්තිය, යන මේ සියල්ල පූර්ව ජන්මයෙහි කරනලද කවර සුචරිතයක්හුගේ විපාකයෙන් උපන්නේදැයි විචාළහ.

එසඳ නාරජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මාහා මාගේ භාර්‍යාවවූ විමලාවත් හා අපි දෙදෙන පෙර මනුෂ්‍ය ලොකයෙහිදී බලවත් සැදැහැ ඇතිවූම්හ. තුමූ නපුරක් කා යහපතක් දන් දෙන්නාහු **දානපතිහු** නම් වෙති. තුමූ යහපතක් ප්‍රයොජන විඳ අනුන්ටත් යහපතක් දන්දෙන්නාහු **දානසභාය** නම් වෙති. තුමූ යහපතක් ප්‍රයොජන විඳ අනුන්ට නපුරක් දන්දෙන්නාහු **දානදූස** නම් වෙති, මෙබඳුවූ දානපතිය, දානසභා යය, දාන දූෂය, යන තුන් පක්ෂය අතරෙන් අපි දෙදෙන දානපතිවූම්හ. එසමයෙහි මනුෂ්‍යලොකයෙහිදී අපගේ ගෙය සියලුසත්වයන්ට සතරමංසඤ්ඤා යෙන් කරනලද ළිඳක් පොකුණක්වීය. දුගී මගී යාචකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණ යන්ටත් බොහෝ ආහාර පාන වගිදිය දීමෙන් සිත් සතුටුකොට පිනවන ලදහ. තාවද මනුෂ්‍යලොකයෙහිදී ගෙතු නොගෙතු නා සපු දුනුකේ සීනිද්ද බෝලිද්ද දූසමන් ආදිවූ නොයෙක් සුවඳ මල්ය, ජබාදු සඳුන් සාන්දු ආදීවූ නොයෙක් සුවඳය, ඇඟ ඵලන්නට සුදුසු කසා සුණු සඳුන් ආදියය, පුදන්නට සුදුසු තෙල් කඩ කබල් ආදියය, හෝනට ඉඳිනට සුදුසු ඇඳ පුටු තෙලි සම් පිඩාම් ආදියය, සැපසේ සතර ඉරියව්වෙන් දවස් යවන්නට සුදුසු ලැගුම් ගෙවල්ය, අඳින්නට සුදුසු සළුසෝලි පිළිය, නැවත බජ්ජ භෝජ්ජ ලෙය්‍ය පෙය්‍ය සංඛ්‍යාතවූ චතුර්විධ ආහාර වර්ගය, මධු මුද්දිකාදීවූ අෂ්ටවිධ පානවර්ගය, යන මේ සියල්ල සකස්කොට ඇදර ගෞරව ඇතිව දුගී මගී යාචකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණාදි සියලු සත්ත්වයන්ටම මහවතුරක් මඩනාකලක් පරිද්දෙන් විශේෂකොට දන් දුන්නම්හ. විධුර පණ්ඩිතයෙනි! මනුෂ්‍ය ලොකයෙහි අහුරට කාලවම්පා නුවරදී මා විසින් මේ දාන ශීලාදීවූ සියලු කුශල ධර්මය කරනලද්දේය. සෘඩිය, ප්‍රතාපය, කාඉබලය, ඥානබලය, චේතසිකඊශ්‍යර්‍ය, නාගලොකොත්පත්තියය, දිව්‍ය ප්‍රාසාදාදි ශ්‍රී විභූතිය, යන සියල්ල පූර්ව ජන්මයෙහි කරනලද යථොක්ත සුචරිත විපාකයෙන් උපන්නේයයි කිහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු නාරජ්ජුරුවෙනි! තොප විසින් මේ සියලු නාගසම්පත්තියම කරනලද දානශීලාදි කුශල බලයෙන් ලබන ලද්දේවිනම් කුශලයෙහි විශේෂත් කුශල ඵලයෙන් උපන් දිව්‍යඓශ්වර්‍යයෙහි විශේෂත් කොපමදත්තේවේද, එසේහෙයින් නැවතත් මේ නාගභවනයෙහි වැස නාමෙනෙවියන් හා සමඟ පඤ්චකාමරතියෙන් අභිරමනයකොට උද්‍යාන විමාන පුෂ්කරණී ආදීවූ සියලු ස්ථානයෙහි ඇවිද සිටසේ නාග විභූතීන් අනුභවකරන්නට අභිප්‍රාය ඇත්නම් දානශීලාදි දශකුශල ධර්මයෙහි අප්‍රමාදව හැසිරෙවයි අවවාද කළහ.

එසඳ නාරජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! යම් උත්තම කෙනකුන්ට දන්දී මේ දිව්‍ය ඓශ්වර්‍යය ලබමෝතම් එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මේ නාගභවනයෙහි නැත්තාහ, එසේ හෙයින් බොහෝ කලක් මෙහි වාසයකොට මේ නාගසම්පත්තිය අනුභවකරමෝ නම් ඊට සුදුසු කාරණා අපට කියවයි කිහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු නාරජ්ජුරුවෙනි! මේ නාගභවනයෙහි උපන් සාමාන්‍ය නාගමානවිකාවෝය, තොපගේ පුත්‍රදුහිවෝය, තොප නිසා ජීවත්වන සෙවක නාගමානවිකාවෝය, යන මේ සියලු සත්වයෝ මෙහි බොහෝකොට ඇත, ඔවුන් විෂයෙහි තෙපි කයින් වචසින් මනසින් නිරන්තරයෙන් වෙෂයක් කොපයක් නොකරව, නාරජ්ජුරුවෙනි! මෙසේ තෙපි පුත්‍රාදිවූ සියලු සත්වයන් කෙරෙහි වෙෂයක් නූපදවා කාශවාක් මනඃ යන චාරිත්‍රයෙන් හික්මෙව මෙත් සිත් උපදවා සතුටු සිතින් ලෙහිලා වඩනදරු කෙනකුන්මෙන් රක්‍ෂා කළාහු වූ නම් මේ නාගලොකයෙහි තොපට ප්‍රතිනියතවූ ආයුවශයෙන් දිව්‍ය සම්පත් විඳ මෙයින් මත්තේ වාතුම්මහාරාජිකාදි සදිව්‍යලොකයටත් මෙම කුශලධම්මයෙන්මයන්නේවේදැයි දැනලද මෛත්‍රී චිත්තයම බලවත් කුශලකම්මයක් වන්නේවේදැයි කිහ.

එසඳ නාරජ්ජුරුවෝ බොධිසත්වයන්ගේ ධම්මකථාව අසා සන්තුෂ්ටව පණ්ඩිතයන් පිටත ප්‍රපඤ්චකොට රඳවන්නට නොපිළිවන. විමලාවන්ට මූන් පා මුන්ගේ සුභාෂිතය අස්වා දෙළ සන්හිදුවා ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් සතුටුවන පරිද්දෙන් විධුර පණ්ඩිතයන් යවන්නට වටනේයයි සිතා බොධිසත්වයන්ට කියන්නාහු විධුරපණ්ඩිතයෙනි! තොපගෙන් වියෝව වසන්නාවූ ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ එකාන්තයෙන්ම හැම වේලෙහිම ශොකකෙරෙති. නුවරවාසීන් හා සමඟ දුක් උපුලා පිඬිතව වසන රජ්ජුරුවෝ තොප නුවරට වහා ගියොත් තොප හා එක්ව සන්තුෂ්ටව කයින් වචසින් මනසින් සැපවිඳින්නෝ වේදැයි කිහ. එබස් අසා මහබෝසතාණෝ රජ්ජුරුවන්වහන්සේට සතුතිකරන්නාහු වරුණ නම් නා රජ්ජුරුවෙනි! මහාකොට පුරුදුකරනලද සුචරිත කොට්ඨාසය සිහිකරන්නාවූ තෙපි එකාන්තයෙන් සත්පුරුෂවූ බුබාදි මහොන්නතවයන්ගේ ධම්මයක්ම් කියව, මෙබඳුවූ අපදුවකට පැමිණ භය ඉපද තිබියදිත් අපබඳු නුවණැත්තන්ගේ ප්‍රඥාවිශෙෂය පෙනුනේවේදැයි කිහ.

එබස් අසා නාරජ්ජුරුවෝ වඩවඩා සතුටුව විධුරපණ්ඩිතයෙනි! තෙපි අපට කියවයි නිස්කාරණයේ කිසිසෙනකුන්ගේත් දිමක් නැතිව මොහු අනට පැමිණියාද? නොහොත් දූකෙළ දෑත ක්‍රීඩායෙහි පැරදි රජ්ජුරුවන් විසින් දෙනලදුව ගෙනඑනලදද? මේ පුණ්ණකයා විධුර පණ්ඩිතයන් ඇන්නැයෙන් නොගෙනාම්. දැනැමින්ම ගෙනාම්කියයි. එසේහෙයින් තෙපි මොවුන් අනට පැමිණ කෙසේ අවුදැයි විවාළහ. එසඳ මහබෝසතාණෝ කියන්නාහු රජ්ජුරුවෙනි! ඒ කුරරව ඉදිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝය යන යම් රජ්ජුරුකෙනෙක්වූනම් ඒ රජ්ජුරුවන් මේ පුණ්ණකනම් සෙනාධිපතියා දූකෙළ පැරදවිය, දෑත ක්‍රීඩායෙන් පැරදි රජ්ජුරුවෝ වඩිඹයට සිලවිකොට මා මෝහට දුන්හ. එසේහෙයින් යුකතියෙන්ම මා මොහු අනට පැමිණියෙමි. ඇන්නැඟයකින් මොහු අනට පැමිණියෙමි නොවෙමි කිහ. අෂ්ටලොක ධම්මයෙහි අකම්පිත්‍යවූ සවරූප ඇති ඒ මහාබොධිසත්වයන්ගේ ධම්

කථා සංඛ්‍යාත සුභාෂිතයන් අසා සතුටුව ඔදවැඩියාවූ සිත් ඇති වරුණනම් නාරජ්ජුරුවෝ අලාමකවූ ප්‍රඥා ඇති මහා බොධිසත්වයන් අත අල්වාගෙන විමලා නම් නාගමාතෘකාව සමීපයට ගියහ.

මෙසේ විමලාවන්ගේ මාලිගාවට වැද කියන්නාහු විමලාවෙනි! නොපැ යම් හෙනකුන් නිසා පඬුවන්ව සුදුමැලිවූ ශරීර ඇතිවූද, යම්හෙනකුන් නිසා දිව්‍යවූ ආහරපානමගේ අනුභවකිරීමට අනිප්‍රාය නැතිවීද, දිව්‍යලොක මනුෂ්‍යලොක දෙක්හි යම්බිදු හෙනකුන්ගේ ගුණය පැහිර පැවැත්තේවිනම් එබදු පැහිර පැවැති ගුණයෙක් අනික් කිසිහෙනකුන්ට නැද්ද, යම්හෙන කුන් හෘදයමාංශය පිළිබඳව නොපැ දෙළ උපන්ද, සියලු ලොකවාසිවූ සත්වයන්ගේ සන්තානගහනයෙහිලය නමැති අදුරු දුරුහොට දහම් නමැති ආලොකය පහුරුවා සත්වලොකය එකාලොක කරන්නාවූ විඛුර පණ්ඩිත යෝ නම් මුතුමුත්තන්හ. උන්ගේ මිඛුරවූ ධම්මකථාව අසා නොපැ උපන් දෙළුදුක් සන්හිදුවා ගනුව, නැවත මුන්ගේ දර්ශනය ඉතා දුර්ලභ වන්නේයයි කිහ, පොළොව හා සමාන ක්‍රුවණ ඇති විඛුර පණ්ඩිතයන් දැක විමලානම් නාගමාතෘකාවෝ දෝසනඛසමොධාන සමුජ්ජලිතවූ දෙහොත් මුදුනේ හබා වැඳ හටගත්තාවූ බලවත් ද්‍රිති සෞමනස්‍යයෙන් යුකතව කුරු රටවාසින්ගේ අමාත්‍ය ශ්‍රේෂ්ඨවූ බොධිසත්වයන්ට මෙසේකිවුය. විඛුර පණ්ඩි හයෙනි! නොපැ නුදුටුබිරු නාගභවනය දැක මරණභයින් නැතිගෙන මට නමස්කාර නොකරව් නම් මේ කාරණය නුවණැත්තන්ට සුදුසු කාරණයෙක් නොවෙයි කිහ. මෙසේ නාගමාතෘකාවට (තමන්ගේ වැදුම් පහන නැනැත් තියට) මහබෝසතාණෝ නෙපැ මාළුයින් වැන්දයතු කෙනෙක් නොවෙයි නොකියාට තමන් නුවණැති බැවින් උපාය කෞශල්‍ය ඥානයෙන් මම වධ ප්‍රාප්තව සිටි බැවින් නොවදිමියි කියන්නාහු විමලාවෙනි, නුදුටුබිරු නාග භවනය දැක්ක විෂ්මයට පැමිණියෙන් නැත. සතුරන් සමීපයට පැමිණි යෙම් වේදුයි හයින් ත්‍රාසවූයෙත් නැත, බල එකක් කියම්, වධාභිවසිටි පුරු ෂයෙක් සවාමීව සිටි එනක්හට නමස්කාරනොකරන්නේය. වධයට යොග්‍යවූ පුරුෂයාලවාද දණ්ඩනාදිය යොදවන්නට යොග්‍යව සිටි සවාමියාත් නමස් කාර නොකරවන්නේය. මා බදුවූ ලොකප්‍රයිඬ පණ්ඩිතයක්හට කිසිවෙක්හි හයෙක් චකිතයෙක්නම් නැත්තේය. යම් සත්වයෙක් යම්ක්හු මරනු කැමැ තිව සමීපයට ගෙන්වූයේවිනම් ඒ වධාර්හවූ පුරුෂයා සවාමීව සිටි තැනැත් තනුට කෙසේනම් වදීද? සවාමීව සිටි තැනැත්තේ වධාර්හවූ පුරුෂයා ලවා කෙසේනම් නමස්කාරකරවාගනීද? මේතෙමේ ලොකවාරිත්‍රඥක්ව හිඹියදී අඥ.යෂියෙක්වේද? නොපැ මා හෙන්වූයේ මරහුනිසාවේද? එසේහෙයින් මම නොපැ කුමක්නිසා වදිම්දැයි කිහ. එබස් අසා විමලාවෝ මහාබොධිසත්වයන්ට සකුනිකරන්නාහු අලාමකවූ ප්‍රඥා ඇති විඛුරපණ්ඩිතයෙනි! නොපැ යම්ක් කිවුනම් ඒ නොපැ කීයේ ඇත්තමය. වධාර්හවූ පුරුෂයා සවාමිහටත් නමස් කාර නොකරන්නේය. ඔහුලවා සවාමීව සිටියෙත් නමස්කාරනොකරවන් නේය. යම්සත්වයෙක් වධප්‍රාප්තවසිටියේවිනම් එතෙමේ කෙසේනම් වදීද! ඔහුලවා කෙසේනම් නමස්කාරකරවාගතහැකිද? මේතෙමේ ලොකප්‍රයිඬව පවත්නා කායඥියෙක්ම වේදුයි අභීතනාද කළහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණෝ විමලාවන් සමඟ පිළිසඳරකථාකරන්නාහු විමලාවෙනි! තොපගේ දිව්‍යවූනාගසෘඞ්ධිය, දිව්‍යවූ ශරීරසොභාවය, කාය බලය, වෛභාසිකභෞග්‍යය, නාගභවනයෙහි උත්පත්තිය, සියලු ඵෙශ්වර්‍යය, දිව්‍යවිමානය, යන මේ සියල්ල අශාශ්වතය ඵකාකාරයෙන් නොපවත්නේය. ඵසේද වූවත් තෙපි ඵකාන්තයෙන් කල්පසථායිව පවත්නාකොට සිතව විමලාවෙනි! මෙබදුවූ මේ ඵෙශ්වර්‍යය තෙපි කෙසේලදුද? තෙපි මේ නාග ඵෙශ්වර්‍යය ලත් කාරණා තත්වූපරිද්දෙන් නොවලහා මිට කියව. තවද මේ සම්පත්තිය එක්තරා එක් කාරණයකින් ලබන ලද්දේද? නොහොත් සෘතුවි පර්‍යාශයකින් ලබනලද්දේද? නොහොත් දෙවියන් විසින් දෙනලද්දේද? නොහොත් සියඅනින්ම කොටගන්නාලද්දේද? යම් පරිද්දකින් මේදි ඍද්ධිමා නාදීවූ ඵෙශ්වර්‍යය තොපවිසින් ලද්දේවිනම් ඒ සියලු කාරණා ඇතිසැටියේ මට කියවයි කිවුය. එබස්අසා විමලාවෝ කියන්නාහු විධුරපණ්ඩිතයෙනි! මවිසින් මේ නාගඵෙශ්වර්‍යය එක් කාරණයකින් ලබනලද්දේත් නොවෙයි, සෘතු විපර්‍යාශයකින් ලබනලද්දේත් නොවෙයි. සියඳතින් කරනලද්දේත් නොවෙයි. දෙවියන් විසින් දෙන ලද්දේත්නොවෙයි. වැළඳි කුමකින් ලබන ලද්දේද? අලාමකවූ තමා විසින් පූර්‍වජන්මයෙහි කරනලද කුශලකර්‍මයෙන්ම මේ දිව්‍යප්‍රාසාදාදීවූ සියලු නාගසම්පත්තිය ලබනලද්දේයයි කිවුය. එසඳ මහබෝසතාණෝ කියන්නාහු විමලාවෙනි! තෙපි මේ දිවසැපත් ලබන්නට පූර්‍වජන්මයෙහි තොප විසින් කරන ලද වතසමාදානය කවරේද? දුන්දන්කවරේද? රැකිසිල්කවරේද? සෘඩිමහිමය කවරේද? බලය, වීර්‍යය, නාගොත් පත්තිය,දිව්‍යප්‍රාසාදාදීවූ නාගසම්පත්තිය, යන මේ සියල්ල පූර්‍වජන්මයෙහි කරනලද කවර සුචරිතයක්හුගේ විපාකයෙන් උපන්දැයි විවාළහ.

එසඳ විමලාවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! මා හා මාගේ සවාමි පුත්‍රවූ වරුණනම් නාරජුරුවෝද පෙර මනුෂ්‍යලොකයෙහිදී බලවත් සැදැහැ ඇතිවූමිහ. නපුරක් කා යහපතක් දන්දෙන්නාහුදැනපතිහු නම් වෙති. තුවූත් යහපතක් ප්‍රයොජන විද අනුන්ටත් යහපතක් දෙන්නාහු දැනසහාය නම් වෙති. තුමූ යහපතක් ප්‍රයොජන විද අනුන්ට නපුරක් දෙන්නාහු දැනදූස නම් වෙති. මෙබදුවූ දැනපතිය, දැනසහායය, දැනදූසය යන තුන්පසෙය අතරෙන් අපි දෙදෙන දැනපතිවූම්හ, එසමයෙහි මනුෂ්‍යලොක්යෙහිදී අපගේ ගෙය සියලු සත්වයන්ට සතර මංසන්ධියෙහ කරනලද ළිඳක් පොකුණක් මෙන් විය. දුගීවඩි යාවකයන්ට හා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ටත් බොහෝ ආහාර පානවගීාදිය දීමෙන් සිත් සතුටුකොට පිනවනලදහ. තවද මනුෂ්‍ය ලොකයෙහිදී ගෙතු නොගෙතු නා සපු දුනුකේ සිනිඳිද බෝලිඳිද දැසමන් ආදිවූ නොයෙක් සුවඳ මල්ඇ, කස්තුරි කපුරු ලමඟ තකුල්ජබාදු සඳුන් සාහු ආදිවූ නොයෙක් සුවඳය, ඇඟඋලන්නට සුදුසු කසාසුණු, සඳුන්සුණු, ආදියය, පහන් පුදන්නට සුදුසු තෙල් කඩකඩල් ආදියය, සෑහෙන්නට ඉඳිනඹ සුදුසු ඇඳපුටු තෙලිසම් පිඩාම් ඇතිරි ආදියය, සැපසේ සතර ඉරියව්වෙන් දවස් ගවන්නට සුදුසු ලැගුම් ගෙවල් ආදියය, අඳින්නට සුදුසුවූ නොයෙක් දෙශ යෙන් ගෙනඵනලද උතුම්පිළීය, නැවත ඛාද්‍ය භොද්‍ය ලෙය්‍යපෙය්‍ය සංඛ්‍යාත චතුර්විධ ආහාරවගීය, මධුමුද්දිකාදි අෂ්ටවිධ පානවගීය, යන මේ සියල්ල සකස්කොට ආදර ගෞරව ඇතිව දුගීවඩි යාවකයන් හා ශ්‍රමණ බ්‍රාහ්මණාදි සියලු සත්වයන්ට මහවතුරක් මඬනාකලක් පරිද්දෙන් විශෙෂකොට දන්

දුනුම්හ. විධුර පණ්ඩිතයෙනි! මනුෂ්‍ය ලොකයෙහි අතුරරට කාලවම්පා නුවරදී මා විසින් මේ දානශීලාදිවූ සියලු කුශල කර්මය කරනලද්දේය. සෘද්ධිපාදයය, කායවලයය, ඥානබලයය, වෛනයිකදේවතාවය, නාගලොකාන්පත්තියය, දිව්‍ය ප්‍රාසාදාදී ලැබුනියය, යන මේ සියල්ල පූර්ව්‍යජන්මයෙහි කරනලද යථොක්තවූ සුචරිත විපාකයෙන් උපන්නේයයි හිඳුය. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු විමලාවෙනි! නොප විසින් මේ සියලු නාග සම්පත්තිය පූර්ව්‍යයෙහි කරනලද දානශීලාදි කුශල කර්මයෙන් ලබනලද්දේවීනම් කුශලයෙහි විශෙෂයත් කුශලඵලයෙහි උපන් දිව්‍ය ඓශ්වර්‍යයෙහි විශෙෂයත් නොපිම දන්නා වද, එසේනොසිටින් නැවතත් මේ නාගභවනයෙහි වැස පඤ්චකාමරතියෙන් අභිරමනය කොට උදුම්බරවිමානපුෂ්කරණී ආදි සියලු ස්ථානයෙහි ඇවිද සිත්සේ නාගඵලුහි අනුභවකරන්නට අභිප්‍රාය ඇත්නම් දානශීලාදි දශ කුශල ධර්මයෙහි අප්‍රමාදව හැසිරෙවයි අවවාද කළහ. එසඳ විමලාවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! යම් උත්තම සෙනකුන්ට දන්දී මේ දිව්‍ය ඓශ්වර්‍යය ලබමෝ නම් එබදු ශ්‍රමණ බ්‍රාහ්මණයෙනෙක් මේ නාගලොකයෙහි නැත්තාහ. එසේනොසිටින් නැවත බොහෝ දවස්හි මෙහි වාසය කිරීමෙන් මේ නාග සම්පත්තිය අනුභවකරමෝ නම්වී සුදුසු කාරණා අපට කියවයි කීහ.

එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු විමලාවෙනි! මේ නාග භවනයෙහි උපන් සාමාන්‍ය නාගමානවකයෝය, දුදරුවෝය, නොප නිසා ජීවත්වන සෙවක නාගමානවකයෝය, යන මේ සියලු සත්වයෝ මෙහි බොහෝකොට ඇත. ඔවුන් විෂයෙහි නොපි කයින් වචසින් මනසින් නිරන්තරයෙන් චෙෂයක් නොපයක් නොකරව, විමලාවෙනි! මෙසේ නොපි පුත්‍රාදී සියලු සඤ්ඤයන් කෙරෙහි වෙෂයක් නොපයක් නුපදවා කායවාක් මනඃ යන වාරත්‍රයෙන් හිතෙහිව මෙන් සිත්උපදවා සතුටු සිතින් ළෙහිලා වඩනදාරකෙනකුන්මෙන් රක්ෂාකොළේවිනම් මේ නාගලොකයෙහි නොපට ප්‍රතිනියත ආයුවිෂයෙන් දිව සැපත්විද මෙයින් මත්තේ වාතුම්මහාරාජිකාදි සදිව්‍ය ලොකයටත් මෙම කුශල කර්මයෙන්ම යන්නේවේද, දානයටත් වඩා ඇසිල්ලෙක කරනලද මෛත්‍රිචිත්තයම බලවත් කුශලකර්මය වන්නේවේදැයි කීහ. නැවත් විමලාවෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු විධුර පණ්ඩිතයෙනි! නොප ගෙන් වියෝව වසන්නාවූ ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ එකාන්තයෙන් හැම වේලෙනිම ශොක කෙරෙති. නුවරවාසින් සමඟ දුක් උසුලා පිඹුරුව වසන රජ්ජුරුවෝ නොප නුවරට වඩා ගියොත් නොප හා එක්ව සන්තුෂ්ටව කයින් වචසින් මනසින් සැප විඳින්නෝ වේදැයි කීහ. එබස් අසා මහබෝසතාණෝ විමලාවන්ට සතුටුකරන්නාහු විමලාවෙනි! මහාකොට පුරුදුකරනලද සුචරිත කොට්ඨාශය සිහිකරන්නාවූ නෙපි එකාන්තයෙන් සත්පුරුෂවූ බුබාදි මහොත්තමයන්ගේ ධර්මයක්ම කියව, මෙබදුවූ ආපදාවකට පැමිණ භය නිඛියදීත් අපබදුවූ නුවණැත්තවුන්ගේ ප්‍රඥාවිශෙෂය පෙනුණුනියාව දුටුවාදැයි කීහ.

එබස් අසා විමලාවෝ වඩ වඩා සතුටුව විධුර පණ්ඩිතයෙනි! නෙපි අපට කියව, නිස්කාරණයේ කිසිකෙනකුන්ගේත් දීමක් නැතිව මොහු අතට පැමිණියේද? නොහොත් දූකෙළ දෑත ක්‍රීඩායෙහි පැරදී රජ්ජුරුවන් විසින් දෙනලදුව ගෙනඑනලද්දේද? මේ පූර්ණකයා විධුර පණ්ඩිතයන් ඇත්තෙ

යෙන් නොගෙනාම්, දැනැමින්ම ගෙනාම් කියයි. එසේහෙයින් තෙපි මෝහු අහට කෙසේ පැමිණ අවුදැයි විවාළහ. එසඳ මහබොසතාණෝ කියන්නාහු විමලාවෙනි! කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝය යන සම්රජ්ජුරු කෙනෙක්වූ නම් ඒ රජ්ජුරුවන් මේ පූණිකනම් යක්ෂසෙනාධිපතියා දූකැළ පැරදවිය. දහුත ක්‍රීඩායෙන් පැරදි රජ්ජුරුවෝ වඩිඬියට සිලව් කොට මා මෝහට දුන්හ. එසේහෙයින් යුක්තියෙන් මා මොහු අහට පැමිණියෙමි, ඇන්නැවකින් මොහු අහට පැමිණියේම් නොවේම් කිහ. වරුණ නම් නාරජ්ජුරුවෝ මහාබොධිසත්වයන් අතින් යම් ප්‍රශ්නයක් විවාළෝනම් විමලා නම් නාගමානවිකාවත් මහාබොධිසත්වයන් අතින් එම ප්‍රශ්නයම විවාළාය, මහාබොධිසත්වයෝ වරුණනම් නාරජ්ජුරුවන් ප්‍රශ්නවිස්සර්ජනයෙන් සම්සේ සතුටුකරවූද, විමලානම් නාගමානවිකාවත් එපරිද්දෙන්ම ප්‍රශ්න විස්සර්ජනයෙන් බලවත්ව සතුටුවූ නියාව දැන කම්පාවක් භයක් චකිතයක් ලොමුඳැහැගෙන්මක් නැතිව වරුණනම් නාරජ්ජුරුවන්ට මෙසේ කිහ. වරුණනම් නාරජ්ජුරුවෙනි! මිත්‍රද්‍රොහිකමක් කෙරෙමියි තෙපි නොබව, කෙසේ නම් මම මුන් මරු පියම්දැයි කියාත් නොසිතව, තොප සඞ්ගම්පයට මම්ම පැමිණ සිටියෙමි, මාගේ හෘදය මාංශයෙන් හා ශරීර මාංශයෙන් තොපවත් ප්‍රයෝජනයක් ඇත්නම් විඳගනුව. ඉදින් තෙපි මුන්සඞ්ගම්පයෙන් මා විසින් ධර්ම්ය අසනලදැයි මා මරන්නට මැලිවිනම් මම්ම තොපගේ අදහස යම් පරිද්දෙකින් සමුඛීවෙනම් එපරිද්දෙන් මාගේ හෘදය මාංශය හා ශරීරමාංශය තොපට උදුරාදෙමි. ඒ ඇරගෙන තොපගේ මනොරථය සම්පූණීකොට ගනුවයි කිහ. එබස් අසා නාරජ්ජුරුවෝ කියන්නාහු විධුර පණ්ඩිතයෙණි! නුවණැති සත්වයන්ගේ හෘදය මාංශය නම් එකාන්තයෙන් ප්‍රඥාවම වන්නේය. එසේහෙයින් අපි වූකලී දැන් තොපගේ උත්තම ප්‍රඥා විශෙෂයෙන් සතුටුවූවිමහ. තොපගේ ප්‍රඥ විශෙෂය ප්‍රකාශකොට අපට කියනලද උතුම්වූ ධර්ම්යම හෘදය මාංශය නම්. ඒ ප්‍රඥා ප්‍රකාශවූ ධර්ම්ය නමැති හෘදය මාංශය අපි දෙදෙන ලැබ ප්‍රයොජන විඳ අපගේ මනදෙළ පුරා ගතුම්හ. එහෙයින් අපගේ මනොරථය සම්පූණී වූවාසේම මේ පූණීක නම් යක්ෂසෙනාධිපතියාත් ඉරන්දතීනම් නාගකන්‍යාව තමාගේ අභිප්‍රායවූ පරිද්දෙන්ම ලබාවයි අපිත් ඉරන්දතිය පූණීකයාහට දෙමෝමය. ඒ පූණීක නම් යක්ෂසෙනාධිපතියාත් තොප අදම කුරුරට ඉඳිපත් නුවර වාසිවූ සත්වයන්ගේ සිත් සතුටුකරවා සවකිය ස්ථානයට පමුණුවයිකීහ.

මෙසේ කියා වරුණනම් නාරජ්ජුරුවෝ ඉරන්දතීනම් නාගකන්‍යාව පූණීකනම් යක්ෂසෙනාධිපතියාහට පාවා දුන්හ. ඒ පූණීකයා ඉරන්දතිය ලැබ සතුටුව ඔදවැඩියාවූ සිත් ඇතිව ප්‍රීතියෙන් පිනා කුල්මත්ව කුරුරට වාසීන්ගෙ අමාත්‍ය ශ්‍රෙෂ්ඨවූ බොධිසත්වයන්ට මෙසේ කිය. විධුර පණ්ඩිතයෙනි! තොප මාගේ අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් මේ ඉරන්දතී නම් නාගකන්‍යාව හා සමඟ කෙළේ වීනම් එපරිද්දෙන්ම තොපත් තොපගේ රජ්ජුරුවන් ආදි නුවරවාසි බන්ධුවගීයා හා සමඟ සිත් සතුටුකරවම්, ඒ මතු ඵොවෙයි. පණ්ඩිතයෙනි! මම තොපගේ උතුම්වූ ගුණයෙහි ප්‍රසන්නව තොපට සුදුසුවූ බලවත් සංග්‍රහයක් කරන්නා කැමැත්තෙම්, එසේහෙයින් තොපට චක්‍රවර්ති රජ්ජුරුවන් ප්‍රයොජන විඳිනා මේ චින්තා මාණික්‍යය පඬුරුකොට දෙමි, අදම තොප ඉඳිපත් නුවර වාසීන්ගේ සිත්සතුටුකරවම්න් මාලිගායෙහිලා

යෙමියි කිවුය, එසඳ මහබෝසතාණෝ ඕහට සතුතිකරන්නාහු කාහ්‍යාය නය! තාහේ මේ ප්‍රිය නායකිාව සමග මෛත්‍රිය අනාවරණය බොහෝකලක් පවත් වයි ඉරහදුනිය ලැබීමෙන් සිතට උපන් බලවත් ප්‍රීති සෞමනස්‍යයෙන් හා තුටු පහටු ඕද වැඩි කුහුලින් යුක්තව මාණික්‍ය රත්නයත් දී මාත් ඉදිපත් නුවරට පමුණුවයි කිය. එසේ අසා පූර්ණානම් යක්ෂසෙනාධිපති හෙමේ කුරුරට වාසින්ගේ අමාත්‍ය ශ්‍රේෂ්ඨවූ අලාමිසා ප්‍රඥා ඇති අසම්බුරවූ විධුර පණ්ඩිත යන් දිව්‍ය මනොමය සෞඛ්‍යවයාගේ පෙරහඬ ඉදුවා ගෙන ඉදිපත් නුවරට ඇඩිල්ලෙකින් පැමිණිවූයේය. කෙසේ පැමිණිවිදයත්? මනුෂ්‍යයන්හු ගිහනම් දුරට නොයන්නේය, එහකුදුවුවත් දුරුලම්බන ග්‍රහණය කරන හෙයින් දුරවතිස්සයි ලොභ ව්‍යවහාර වශයෙන් කියනු ලැබෙයි. එසේ හෙයින් ඔහ අරමුණු ගන්නාට පළමුකොට වහා ඒ මනොමය සෞඛ්‍ව යාගේ ගමන වූයේය, සිතූ සිත හා සමග ගොස් ඉදිපත් නුවර පෙනුණේය, ඒ පූර්ණක භාම් යක්ෂසෙනාධිපතියා බොධිසත්වයන් අසු පෙරහඬ ඉදුවා ගෙන යමින් සිව කියන්නේ විධුර පණ්ඩිතයෙනි! තෙල පෙනෙන්නේ හොපගේ ඉදිපත් නුවර හා සිත්කලුවූ අඹ උයන් ආදි සිඟල්ලය, ඒ නුවර දැක සින් සතුටුකරව, මිමත් ඉරහදුනිනම් නාගකන්‍යාව හා සමග ම්, හෙපිත් හොපගේ වාසස්ථානයවූ ඉදිපත් නුවරට පැමිණියේවේදැයි ආශිර්වාද වචන කියමින් සතුතිකොට බොධිසත්වයන් ඉදිපත් නුවර ධර්මසභා මණ්ඩපයෙහි සිටුවා තමාගේ වාසස්ථානයටම ගියේය. මහාබොධිසත්වයන් නුවරට පැමිණෙන දවස් අලුයම් වේලෙහි ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ සුපිනයක් දුටහ.

කෙසේවූ සුපිනයක්ද යත්?

රජ්ජුරුවන්ගේ මාලිගා දෙරහඬ සුමීපයෙහි (ප්‍රඥා නමැති) කඳ ඇති (සිල්නමැති) අතුපතරඇති (පස්ගෝරසනමැති) ඵලඇති සියලු හස්ත්‍යශ්වාලංකාරාදීන් සැරහුණු හත්ති අශ්වරථ පදාති සංඛ්‍යාත චතුරංගිනී සෙනාවෙන් ගැවසිගත් මහා වෘක්ෂයෙක් පිහිටියේය. මහජනයා ඒ වෘක්ෂයට මහත්වූ පූජා සත්කාරාදිය කොට දෙහොත් මුදුනේ තබා නමස්කාරකොට සිටියේය. එසඳ භාග්‍යවූ ප්‍රරුෂයෙක් රතක් ඇඳ රතක් පෙරවා දෙකන රත්මල් ගන්වා සවුවක් අතින් ගෙන අවුත් මහජනය හැරගන්වා සියල්ලන් අඩම්න් වැල පෙමින් සිටියදීම ඒ වෘක්ෂය මූලින් කපා ඇරගෙන ගොස් නැවත ගෙනවුත් පළමු පිහිටියාවූ ස්ථානයෙහි පිහිටුවා ගියේය. රජ්ජුරුවෝ මේ සුපිනය දැක පරීක්ෂාකරන්නාහු මහාවෘක්ෂය වැනිවූයේ අනික් කිසිවෙක් නොවෙයි. විධුර පණ්ඩිතයෝය. මහජනයා අඩම්න් වැලපෙමින් සිටියදී මූලින් සිඳ හැරගෙන ගිය පුරුෂයා වැනිවූයේ අනික් කිසිවෙක් නොවෙයි, පණ්ඩිතයන් ඇරගෙන ගිය මානවකයාය, ඒ වෘක්ෂය ගෙනවුත් සථා ස්ථානයෙහි පිහිටුවා ගිය ආකාරයෙන් සෙට දවස්මානවකයා පණ්ඩිතයන් ගෙනවුත්ධර්මසභා මණ්ඩප දෙරහඬ සිටුවා යන්නේය; ඒ කාරණයෙන් අද අවි පණ්ඩිතයන් දකුම්හයි සතුටුවන්නා කොට සොම් නසට පැමිණ සියලු නුවර දිව්‍ය පුරයක් මෙන් සරහා ධර්ම සභා මණ්ඩපයත් සරහවා පිළියෙළ කරතලද රත්න මණ්ඩපයෙහි ධර්මාසනයන් පනවා එක් සියයක් රාජධානියේ රජදරුවන් හා අමාත්‍ය මණ්ඩලයා හා නුවරවාසීන් ජනපදවාසීන් විසින් පිරිවරාගලදුව අද පෙරි හැමදෙනම් විධුර පණ්ඩිතයන් දක්නේද, හය නොවවසි මහාජනයා අස්වස්සීන් මහාබොධිසත්වයන් එන පෙරමග බල බලා ධර්ම සභා මණ්ඩපයෙහි උන්හ, පූර්ණකයාත් පණ්ඩිතයන් අසුපිටින්බා ධර්මසභාමණ්ඩපයෙහි දෙසාරඬ පත්දී මධ්‍යස්ථානයෙහි සිටුවා ඉරහදුනිය නෙත අජානීය සෛන්ධවයා පිටව පැන නැඟී ඇතිරිය යෙන් තමාගේ දිව්‍යලොකයටම් ගියේය

ඉක්බිත්තෙන් මහාබෝධිසත්ත්වයන් දැක අනිෂසින් සන්තුෂ්ටවූ සිත් ඇති ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ හුනස්නෙන් නැගී සිට දැනින් බදාපලා අල්මා වැළඳගෙන මාගධජනයා මධ්‍යයෙහි හයක් සාංකාවක් පසුවැස්මත් නැතිව අහ අල්මාගෙන තමන්ට අනිවුබකොට ධර්මසභා මණ්ඩපයෙහි සරහා පිළියෙළ කරනලද ධර්මාසන මස්තකයෙහි ඉඳුවූහ, මේසේ [illegible] බෝධිසත්ත්වයන් සමඟ සතුටුව පිළිසඳර කථාකරන්නාහු යම්සේ රථාචාර්යයෙක් රථාලංකාරයෙන් සරහා පිළියෙළකරන්නද රථයක් මනොමිය සෙසු වයන් යොදා කැවිටක් ගෙන සන්තෙරෙමින් තමාට අභිප්‍රාය සථානයකට ගෙනගොස් පමුණුවාද, එපරිද්දෙන්ම නෙපි අපට කාරණයෙන් ඥානයෙන් අර්ථයෙන් ධර්මයෙන් වැඩෙහි හැසිරීමෙන් මේලෝ පරලෝ සැපයට පමුණුවන්නාහුය, කුරුරවාසිහු තොපගේ දර්ශනය හෙතුකොටගෙන බලවත් සන්තොෂයට පැමිණෙති, මා විසින් විචාරනලද්දාවූ තෙපි නොවලහා කියව. මේ මානවකයා අතින් තෙපි කෙසේ ගැලවුණාද? තෙපි ගලවා ඇරගෙන යන්නාවූ මානවකයා සවම්පයෙන් තොප කෙසේ ගැලපීගෙන ගියේදැයි විවිාළහ. එබස් අසා මහබෝසතාණෝ කියන්නාහු ජන ප්‍රධානවූ රජ්ජුරුවන් වනන්ස! මානවකයායයි නුඹවහන්සේ සමකුට කියනසේක්දිනම් ඒ තෙමේ මනුෂ්‍යයෙක් නොවෙයි. නරවීර ශ්‍රේෂ්ඨවූ රජ්ජුරුවන්වහන්ස! නුඹවහන්සේ විසින් අටවිසි යක්සෙනෙවියන් කෙරෙහි ඇතුළත්වූ පූණිකනම් යක්ෂයෙක් ඇතැයි ඉදින් අසනලද්දේවීනම් එතෙමේ වෙසවුණු මහරජ්ජුරුවන්ගේ අමාත්‍යයාය, නාගභවනයෙහි වසන්නාවූ වරුණනම් නාරජ්ජුරුවෝ මහත්වූ ආරොහපරිනාහයෙන්හා උතුම්වූරූපශොභායෙන් හා කායබලඥානබලයෙන් යුක්තයෝය. ඒ නාරජ්ජුරුවන්ගේ අනුජාතපුත්‍රිවූඉරන්දතිය පූණිකයා ලබන කැමැතිවිය. ඒ දුව ඉරන්දතීනම් නාගකන්‍යාවිය. අසුරෙන් පමණ කට හැති මධ්‍යම ප්‍රදේශ ඇති ඒ ඉරන්දතිනම් නාගකන්‍යා නිසා පූණිකයා මිට වෛතෙක් ආයාස පැමිණ වූයේය.

තවද මහරජ්ජුරුවන් වහන්ස! ඇසුව මැනව. ඒ වරුණ නම් නාරජ්ජුරුවෝ වතුකොටින ප්‍රශ්නය විස්සජ්ජනයෙන් ප්‍රසන්නවූ සිත් ඇතිව කණ්ඨමාණික්‍යයෙන් මට පූජාකොට නාගලොකයට ගිය හැනැත්තෝ විමලා නම් නාගමානවිකාව විසින් තොපගේ කණ්ඨමාණික්‍යය කොයිදැයි විවාළ කල්හි මා ධර්මකථිකා නියාව වර්ණනා කොළෝය. විමලාවෝ මාගේ ධර්මකථාව අසනු කැමැතිව මාගේ හෘදය මාංශයෙහි දෙළඉපදවූය. නාරජ්ජුරුවෝ විමලාවන් කිබසෙහි අවි දැනගත නොහී වරදවාගෙන ඉරන්දතිනම් දුවණියට කියන්නාහු ඉරන්දතිනි! තොපගේ මැනියෝ විමලාවෝ විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශයෙහි දෙළ ඉපදවූය. උන්ගේ හෘදය මාංශය ගෙනෙන්නට සමර්ථවූ වල්ලභයක්හු සොයා ගනුවයි කිවූය. එබස් අසා ඉරන්දති වල්ලභයන් සොයන්නී වෙසවුණු මහරජ්ජුරුවන්ගේ බෑනාවූ පූණිකනම් යක්ෂසෙනාධිපතිහු දැක ඔහු තමා කෙරෙහි පිළිබඳ සිත් ඇතිනියාව දැන පියරජ්ජුරුවන් සවම්පයට කැඳවාගෙන ගියාය. එසඳ ඒ වරුණ නම් නා රජ්ජුරුවෝ විධුර පණ්ඩිතයන්ගේ හෘදය මාංශය ගෙනෙන්නට සමර්ථවූයේමිනම් ඉරන්දතිය ලැබෙන්නේවේදැයි පූණිකයාට කිවූය. එතෙමේ වෙපුල්ලපර්වතයෙන් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පර්හොගයට සුදුසුවූ විනතාමාණික්‍යය ගෙන නුඹවහන්සේ හා සමඟ දූකෙළ මා ලැබගෙන තුන්දවසක් මාගේ ගෙයි වැස මා ලවා අශ්වයාගේ වාලධිය ගන්වා හිමාලය

වනඝෙනි ගසින්ගස ගලින්ගල ගසා මරන්නට අසමර්ථවූයේ සත්වැනි වාතස් කඬයේ වෙරම්බමුඛයට පැනනැගී සාරයොදුන් උස ඇති කාළගිරි පර්වත මස්තකයෙහි ගබ්බ සිංහ ව්‍යාඝ්‍රාදි නොයෙක් භයංකාර වේස ම්වා භයගන්වා නැවත නැවත සැරයොදුන් කාළගිරි පර්වත මස්තකයන් වර්ෂ දෙවරක් තුන්වරක් නිමිතෙළාන් මරන්නට අසමර්ථව මා විසින් පූර්ණයෝ! තෝ මා මරන්නට උත්සාහකරන්නේ භවර කාරණයක් නිසාදැයි විවාළාල්ගි මරන් කාවූ කාරණය කිහ. එසඳ මම ඔහුට **සාධුනරධම්ම** නම්වූ ධර්මදේශනාවක් කෙළෙමි. ඒ ධර්මය අසා ප්‍රසන්නවූ සින් ඇතිව නාගලොකයට නොගොස් මා මෙතැනට ගෙනඑනු කැමැතිවිය. එසඳ ඔහු ඇරගෙන මම නාගභවනයට ගොස් නාරජ්ජුරුවන්ට හා විමලාවන්ට ධර්මදේශනා කෙළෙමි. සියලු නාග ස්ත්‍රීන් විශේෂයෙන්මි ප්‍රසන්නවූහ. නාරජ්ජුරුවෝ එහි මාසදවසක් විසූකල මිතුල්කොට ඉරඳතිය පූර්ණාහයාට දුන්හ. එතෙමේ ඉරඳතිය ලැබ ප්‍රසන් නවූ සින් ඇතිව මට මාණික්‍යරත්නයෙන් පූජාකොට නාරජ්ජුරුවන් විසින් විධුර පණ්ඩිතයන් ඇරගෙන ගොස් ඉඳිපත්නුවරට පමුණුවයි නියොග්කරන ලද්දේ මා මනොමය සෛඛ්‍යය සෙයින් පිටට නංවා පූර්වස්ථානයෙහි ඉදුවා තෙමේ ඒ මධ්‍යස්ථානයෙහි ඉරඳතිය ඒ පත්වීම ආසනයෙහිද ඉදුවා මෙතැනට ගෙනාවුත් පසින් මධ්‍යයෙහි අසුපිටින් බා ඉරඳතිය ගෙන තමාගේ දිව්‍යභව නයට ගියේය. මේසේ මහරජ්ජුරුවන් වහන්ස! ඒ පූර්ණභ නම් යක්ෂයා අසුරයන් ගැනනැකි වලහැරි ඉරඳතිය නිසා මා මරන්නට උත්සාහ කෙළේය. එසේ උත්සාහකළත් ඒ හෙමේ මානිසාම භාර්‍යාවගේ සමාගමයට පැමිණියේය. මාගේ ධර්මදේශනාව අසා ප්‍රසන්නවූ සින් ඇති නාරජ්ජුරුවන් විසින් මමත් මාගේ නුවරට එන්නට අනුදන්නා ලදිමි. ඒ පූර්ණභ නම් යක්ෂ සෙනාධිපතිහුගෙන් ඉෂ්ටාර්ථප්‍රසවය කරන්නාවූ චක්‍රවර්ති රජදරුවන්ගේ පරිභොගයට යොග්‍යවූ මේ මාණික්‍යරත්නය ලබනලද, රජ්ජුරුවන්වහන්ස! මේ මාණික්‍යය ගතමැතැවැයි කියා චින්තාමාණික්‍යය රජ්ජුරුවන්ට දුන්හ. රජ්ජුරුවෝ අලුයම්වේලෙහි තමන්විසින් දුටු සිහිපත්‍ය නුවරවාසීන්ට කියනු පිණිස පින්වත්වූ නුවරවාසීනි! අද මාවිසින් දක්නාලද සිහිපත්‍ය අසවැසිකියා හැමදෙනාටම ප්‍රකාශකොටකියන්නාහු පින්වත්වූනුවරවාසීනි! මාගේ මාලිගා දොරකඩ මහත්වූ වෘක්ෂයෙක්අටගත, ඒ වෘක්ෂයෙහි ප්‍රඥාමැනි සාදක් හා සිල් නමැති ශාඛාවන්නේය. තවද ඒ වෘක්ෂය මෙලෝපරලෝ වැඩ සාධාදීලන්නට සමර්ථය, පඤ්චාරස නමැති ඵලයෙන් යුක්තය. හස්‍යාශ්වාලංකාරයෙන් සැරසුණු ඇතුන් අසුන් විසින් ගැවසීගත්තේය. එබදු වෘක්ෂයට මහජනයා නැවිත ගීතිම් බෙරගැසීම් ආදී නොයෙක් පූජාසත්කාර කෙරෙමින් සිටියදීම එක් චාළ ඉනිසෙක් අවුත් එම වෘක්ෂය මුලින්සිඳ පිරිවරා සිටි මහසේනාව භයභන්වා පලවා ඇරගෙන ගියේය. නැවත වෘක්ෂය අවුත් අපගේ මාලිගා දොරකඩ සවම්පයෙහිම පිහිටියේය. අප ගේ මේ මහා වෘක්ෂයක් වැනි පණ්ඩිතයෝ සවුස්ථානයට අවුත් මෙතැන සිටියෝය. දැන්කළී නොප කැමදෙනම ප්‍රඥා වෘක්ෂ නමැති විධුර පණ්ඩිතයන්ට මහත්වූ පූජා සත්කාර කරව. තවද අප පින්වත්වූ අමාත්‍යයෙනි! මා නිසා ලබනලද යශසින් සතුටුසිත් ඇති යම් සත්වයෙක් ඇත්නම් ඒ සියල්ලෝම අද තමන් තමන් සන්තොෂය ප්‍රකාශකෙරේවිසි රන් රුවන් මුතු මැණික් වස්ත්‍රාභරණ ආහාරපාන වනීදී බොහෝ පඬුරුගෙන මේ ප්‍රඥා වෘක්ෂයට පූජාසත්කාර කරව.


තවද මාගේ පිළිතෙයහි යවත්පිරිසෙසින් කෙළනා පිණිස මැදිරි දම් ආදියෙන් බඳිනලද වූ නිරා මොනර සැළලිහිණි ආදි පක්ෂීන් හා හූරන් ගෝණුන් මූවන් ආදි මෘග සමූහ කෙනෙක් ඇත්නම් ඒ සියල්ලවුන් බඳින යෙන් මුදන්වයි. යම්සේ විධුර පණ්ඩිතයෝ යක්ෂ නාග දෙපක්ෂයේ ඇත්ත වුන්ගේ ආහින් මරණබඳිනයෙන් මිදී අවුදා, එපරිද්දෙන්ම මේ සියලු පක්ෂීහුත් අනුබඳිනය, රජ්ජුබඳිනය, සඬලිකබඳිනය, යනාදියෙන් මුදන් වයි. මේ මාය මුලුල්ලෙහි සි සාහා නහුල් ගෙන උඩ බිඳවා හුවර බෙර හසු රුවා සියලු මිනිසුන්යෝ සම්භාරණයෙන් සැරසී ඇඳපැලඳ මිහත්වූ ස්ත්‍රීවිභූතීන් පූජාතාව උපසව කෙළිකෙළිත්වයි, බ්‍රාහ්මණයෝ රසමිසදුලෙන් සුකතවූ නොජනය තලු පැහැර පැහැර සිත්සේ අනුභව කෙරෙත්වයි සුරාපානයෙහි අති ප්‍රාය ඇති පුරුෂයෝ සුරාපාන ගෙන තමන් තමන් කැමැති ආපානමණ්ඩලවල සැපසේ නිඳ බඹම් පුරා උතුරුවා උතුරුවා මස් හා සහ සුරාපානය කෙරෙත්වයි, තවද සර්වඥ පිළිඥයෙළකරනලද මහත්වූ රාජ විධියේ හුන්වා සඬි නීයා සිටිනා සම්භාරණයෙන් සැරසුණු වෛශ්‍යාස්ත්‍රීහු නැමැවිලෙනිවි කෙලශවසභයෙන් පිසිතවූ සිත් ඇත්තාහු තමන් බදු සෙලශවසභ සිත් ඇති ජනයන් අඬගා ඔවුන් හා සමග පළකාමරතියෙන් අභිරමනය කෙරෙත්වයි, ආරක්ෂා මඳකොට කරනලද බැවින් නහුල් උඩ බැඳ මේ වෘක්ෂයට පූජාසත්කාර කරන්නාහු යම්සේ ඔවුනොවුන්ට පීඩා නොකෙරෙද්ද, එපරිද්දෙන් රාජ්‍යයෙහි අතුරු නැතිකොට රක්ෂාවරණසංවිධානය කෙරෙත්වයි, කිය. මෙසේ ඒ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ ප්‍රීතිවාක්‍ය පවත්වා උදන් අනන්ත බලක් පරිද්දෙන් සතෙතාඝවාක්‍ය පැවැත්වූහ.

මෙසේ රජ්ජුරුවන් විසින් නියොගකරන ලද්දී අන්තඃපුර සත්‍රීන්ය, රාජ කුමාරවරුය, වෙළෙන්දෑය, බමුණෝය, ඇතරුවෝය, අසරුවෝය, ඇණීනායකවරුය, රථාචාර්යවරුය, පාබල සේනාවය, රිස්වූ දනව් වැස්සෝය, නියම්ගම් වැස්සෝය, යන මේ සියලු සත්වයෝ මහත්වූ උත්සව ක්‍රීඩා සරහා සියලු බඳිනගත සත්වයන් බඳිනයෙන් මුදා හැර වස්ත්‍රාභරණ ආභාරපාන වගීාදී සියලු පඬුරු සරහා ගෙන රජ්ජුරුවන් හා සමග බොධිසත්වයන්ට මහ වතුරක් මඬහා කලක් පරිද්දෙන් එකපාහැර පඬුරු දී සම්භාවනා කළහ. බොධිසත්වයන් දැක බොහෝ ජනයෝ ඔදවැඩියාවූ සිත් ඇතිව විශෙෂයෙන් ප්‍රසන්නවූහ. උත්සව ක්‍රීඩාව මසක් මුලුල්ලෙහි පැවත්තේය. මහාබොධිසත්වයෝ බුඬකෘත්‍යයක් සිඬකරන්නාක් මෙන් මහජනයාට ධර්මදෙශනා කොට අවවාදානුශාසනා කෙරෙමින් දිවි පමණින් සිට ආයු කෙළවර ගොස් ත්‍රයත්‍රිංශත් දිව්‍යලොකයෙහි උපන්හ. බොධිසත්වයන්ගේ අවවාදයෙහි පිහිටි රජ්ජුරුවන් ප්‍රධානකොට ඇති සියලු කුරුරටවාසී සත්වයෝ දානාදි පින්කම් කොට ආයු කෙළවර ගොස් දිව්‍යලොකයෙහි උපන්හ.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙන හැර දක්වා වදාරා මහණෙනි! දැන් මතු නොවෙසි පෙරත් සම්භවරයෝ ඥාන බල සම්පන්නයෝය, උපායෙහි දක්ෂයෝමයයි වදාරා පුබ්බාපරසන්ධි ගළපා මේ විධුර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි විධුර පණ්ඩිතයන්ගේ දෙමවුපියෝ නම් දැන් සුඛෝදන රජ්ජුරුවන් හා මහාමායා දෙවිය. ප්‍රධාන බිසව් නම් බිම්බාදෙවිය, ප්‍රධාන පුත්‍රයා නම් රාහුලකුමාරයාය, වරුණ නාගරජ්ජුරුවෝ නම් ශාරීපුත්‍රස්ථවිර යෝය, ගුරුළුරජ නම් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයෝය. ශක්‍රදෙවෙන්ද්‍රනම් අනුරුද්ධස්ථවිරයෝය, ධනඤ්ජය කොරව්‍යරජ්ජුරුවෝනම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි ප්‍රඥාවිශේෂයෙන් පූර්ණකයා වරුණ නම් නාගරජ්ජුරුවන් විමලා වන් ඇතුළුවූවන්ගේ අනිත්‍යතාදිය සිඳකිරීමෙන් සිත් සතුටුකොට ඔවුන් හැමදෙනාගේ අනුග්‍රහයෙන් සිය නුවරට පැමිණ ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියලු නුවරවාසීන් සිත් සතුටු කරවා අට්ඨයෙන් ධර්මයෙන් ආනුශාසනා කොට සියල්ලවුන්ට සවඟී සම්පත් සාධා දුන් විධුර පණ්ඩිතයෝ නම් නිලෝතුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වෙමි දැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

විධුර ජාතකය නිමි.



එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ සමන්තභද්‍රවූ අසමසමවූ ත්‍රෛලෝක්‍ය තිලකවූ ත්‍රිභුවන චූඩාමාණික්‍යවූ කරුණා නිධානවූ මෛත්‍රී නිවාසවූ ප්‍රඥාවට වල්ලභවූ සාගරයසේ අවින්‍යය ගුණ ඇති මහපොළොවසේ නිශ්චල ගුණ ඇති මහමේරුවසේ උස්වූ ගුණ ඇති දූරහම්ණක්සේ නිර්මලවූ ගුණ ඇති මාගේ සූර්‍යාම්දරුවූ සර්වඥ සම්බුදුරජාණන් වහන්සේ ක්ෂීරසාගරයෙන් නැගි හරඛමාලාවසේ සුධාධවල ප්‍රභාරවලයෙන් පරික්ෂිප්තවූ කනක රජතාදීන් කොබනාවූ විසිතුරුසැදුම්ලද මාලිගා ගෙවල් හා දෙරටුආදියෙන් යුක්තවූ සල් සවුන් පුන අඹ දෙඹ ආදිවූ ඵල පල්ලවයෙන් සඤ්ඡන්න තරුවරශතයෙන් කොබහා විසිතුරු උද්‍යානයෙන් හා පස්පියුමෙන් සැදුම්ලද නිර්මල ජල සම්පූර්ණ පුෂ්කරණී ශතයෙන් කොබනාවූ නානාභරණ විභූෂිත නරනාරී ගණාකීර්ණවූ **සැවැත්** නම් නුවර නිසා නදුන්වනයට අපහාසකරන්නාක් වැනිවූ සියලු සිරිසරින්සාරවූ වඩක්‍රමණ පරිවේණාදි විහාර ශතයෙන් හොබනාවූ **ජේතවන** නම් උයන්හි මෛත්‍රී කරුණා මුදිතොපෙක්ෂා සඞ්ඛ්‍යාත සතර ආයාචිඤ්ඤායෙන් දවස් යවනසේක් තමන්වහන්සේගේ භවත්‍රයෙන් සැහවී තුබූ **ප්‍රඥාපාරමිතාව** අරභයා මේ ජාතකය වදාළසේක.

කෙසේදයි සිතනොත්?

එක් දවසක් හිරු අස්තඤ්චලගත වේලෙහි ශීලසමාධි ප්‍රඥාදි ගුණාඩ්‍ය සඞ්ඝත ප්‍රවර භික්ෂු සඞ්ඝයා වහන්සේ තමන්වහන්සේ වසන රාත්‍රිස්ථානයෙන් අවුත් සුඛභූමියකට රැස්වන්නාවූ සුවිනීත යොධමුල්ක්සේද මැණික් සත්‍යාත්ථ

සබ්බාඩම්බ නානාලඞ්කාරයෙන් සැදුම්ලද ගඳැත්මුලක්සේද එකවර සිංහසමූහයක්සේද සඳැවලාබඳුවූ සුරකතවර පවුල්පෙරෙවහඬදම් පුෂ්පදාමාවලම්බිත කනකරජතමණිතාරකායෙන් විචිත්‍රවූවිතාන ඇති නානා ප්‍රභාසමූදය සමූ ජ්වලිත අලඞ්කෘත ධම්සභායෙහි ශක්‍රාගමනය බලමින් සුධම්මා නම් දිව්‍යසභා යෙහි රැස්ව උන් දිව්‍යසමූහයාසේ ධම්රාජන්වූ ධම්ාධිපතිවූ ධම්සේනාම්වූ තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේ වඩනා පෙරමඟ බලබලා ධම්සනය පිරිවරා ඡිද බුදුන්ගේ නුවණ පැරැම් වණනසේක් ඇවැත්නි! බුදුහු ශීලස්කන්ධාදියෙහි පවත්නා මහත්වූ නුවණගතියක් ඇතිසේක, මුහුදුපිට ඉඹි සුවඳ තෙලක්මෙන් දනයුතුවූ සියලු ධම්යන් කෙරෙහි පැතිර පවත්නාවූ නුවණ ගතියක් ඇති සේක, සියලු ධම්මයන් කෙරෙහි තුඹට බහුලව පවත්නා නුවණ ගතියක් ඇතිසේක; යලු ලොඇ මණ්ඩලයෙහි ජවන හංසගතියක් මෙන් දිවන්නාවූ නුවණ ගතියක් ඇතිසේක, අඵ ධම් නිරුකති ප්‍රතිභාණාදියෙන් දිරාශිය පරණලා පැතෙක නොපැකිල යන්නාවූ දවසක් මුදුල්ලෙහි රත්කළ ගහුලක් මෙන් සියුම්ව දුවන්නාවූ නුවණ ගතියක් ඇතිසේක; අතුල්නෙලෙහි ගුබු දූරහම්ණක්සේ සියලු ධම්යන් සම්ාකාරයෙන් විනිවිද දක්නාවූ නුවණ ගති යක් ඇතිසේක; දෘෂ්ටිජාලානුගත අන්‍ය තිර්ථික ජනයන්ගේ ශාස්වතෝ චෙජ්දාදි වාද මර්දනය කරනසේක; තමන්වහන්සේගේ අසාධාරණවූ විදුරු නුවණින් කුටදන්ත බ්‍රාහ්මණ, වෙරඤ්ජ බ්‍රාහ්මණාදීවූ අනෙක බ්‍රාහ්මණ ශත යන්ද, සඤ්චයපරිබ්‍රාජක බාහිය පරිබ්‍රාජකාදි පරිබ්‍රාජක සමූහයන්ද, අඞ්ගුලි මාලාදිවූ චණ්ඩඵරුෂවූ බොහෝ සොරුන්ද, ආලවකාදීවූ මනුෂ්‍ය මාංශ භක්ෂණයෙහි දක්ෂවූ යක්ෂයන්ද, ඉසුරුමදයෙන් ප්‍රමාදව තුනුරුවන් කෙරෙහි ජනිත ප්‍රසාද විරහිතවූ ශක්‍රදෙවෙන්ද්‍රයා ආදීවූ දෙවතාවන්ද; ශාස්වත දෘෂ්ටිජාලානුබඳව අමාඝී ප්‍රතිපන්න බක බ්‍රහ්මාදීවූ බ්‍රහ්මයන්ද; තමන්වහන්සේගේ අසාධාරණවූ සර්ඥ මහිමයන් ඔවුන්ගේ මාන මර්ද නයකොට පාප නමැති විෂ විනාශකොට සවඥීමොක්ෂ සම්පත් සාධාදී වදුළ සේක. තවද මේ බුදුරජාණන්වහන්සේ විසින් කායවාරාදියෙහි සම්‍යක් ප්‍රතිපත්තීන් යුකතකොට ප්‍රව්‍රජ්‍යාව සාධාදී බොඉහෝදෙන සතර මහ සතර ඵලයට පමුණුවා වදුළසේක. ඇවැත්නි! මෙසේ බුදුහු වුකත ප්‍රකාර මහ නුවණ ඇතිසේකැයි බුදුන්ගේ ශීලසමාධ්‍යාදි අනෙක ප්‍රකාර ගුණ වණීණනා කොට කොට ධම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන්සේක.

ඉක්බිති සතරමර ලොකාවූඩාමණීමරිව් මඤ්ජරී පුඤ්ජ පූජිත චරණාම්බුජ ඇති ලොකසවාම්වූ ලොකනායකවූ ජගදනඳ ලොචනවූ මාගේ සවාමිදරුවාණන්වහන්සේ ධම්සභාමණ්ඩපයෙහි උපන් කථාසවරූපය ගඳ නැළි පිරිවෙහෙහි වැඩහුන්සේක් දිවකතින් අසාවදුරා වරරුවිරශඞ්කුටි වාසය මහා කරුණායෙන් දුරුකොට සමාපත්තීන් නැගී ලාක්ෂාරසයෙන් පෙත්වූ මුරුහ මල්කලඹක් හා සමානවූ අඳනා සිඹුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදන යෙන් සංවිධාන කොට හැඳ සඞ්ඝාටි ඝන වලායෙක ගසනලද සියරැලි විදුලියක් සමානවූ පටිධානුත්වහන්සේ ඊමත්තේ බැඳ සකුරුන් දැගැබක් රත්පලසකින් වසන්නාක්හු මෙන්ද, අටලොස් රියන් රන් ඇඟැයකට පබළු දුලක් දමන්නාක්හු මෙන්ද, චිත්‍රකූට පර්වතය වැදමල්දමකින් වටකරන් නාක්හුමෙන්ද, රන්ගල් මුදුනෙහි සුපක්ව ලාක්ෂාරසවත්කරන්නාක්හුමෙන්ද, මෙරු මඳරාදීන් එකපැහැර සම්පාකෙරෙමින් සුපක්ව විලිකුන් හුගඵල

යෙන පැහැබදුවූ සුගත් මහා පාංශුකූලචීවරය පෙරෙව සුප්පතිට්ඨිත පාදතා දීවූ දෙතිස් මහා පුරුෂලක්ෂණයන් කරණකොටගෙන පිළිවෙළින් ගොතා තුබූ සුඝට්ටමණ්ඩලයන් දෙතිස් දෙනකුගේද, චන්ද්‍රමණ්ඩලයන් දෙතිස් දෙන කුගේද, චක්‍රවර්තීන් දෙතිස් දෙනකුගේද, මහා බ්‍රහ්මයන් දෙතිස් දෙනකු ගේද, ත්‍රිවිහුනි අභිභවමින් අසීත්‍යා නුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කෙතුමාලා ලඞ්කාරයෙන් විරාජමානව අනන්ත කාලයක් මුලුල්ලෙහි පුරනලද සුචරිත නුභාවයෙන් හෙමේ තමාට අරනලද දෙර ඇති ගඳකිළි පිරිවෙනින් මේඝ කූටයකින් නික්මුණු හිරුමඬලක්සේද, වලාපටලයකින් නික්මුණු පුන්සඳ මඬලක්සේද, රන්ගල් ගුහායෙකින් සොඝරා සළා විදහා නික්මුණු අජිත සොඝර සිංහරාජයකුසේද, නික්ම තමන් වහන්සේ ජාති ජාතියෙහි බුඬාදි නුවණැත්තන් සඞ්ගම්පයට නුකුසිතව එළඹි කුසල මහිමයෙන් පොළොව පලාගෙන නැඟි සත්බුදු මහපියුම් මත්තෙහි අටතුරාසියක් මහල්ලකුණෙන් සැදුම්ලද ත්‍රිපාද ප්‍රාසාදය තබ තබා වියදඬු පමණෙක හෙළනලද්දාවූ නෙත කාන්තින් මහිකාන්තාවට අමෘතාභිසේක දෙමින් අනන්තවූ බුඬ විලාස යෙන් ධම්සභා මණ්ඩපයට වැඩ නිලපිතාදි සවණක් රසින් සකල ධම් සභාව එකපැහැර බබුළුවමින් සතරන් මාලිගාවෙහි දිලියෙන ඉඳුනිල්මිණි කාවුළු සහලක් වැනිදෙනෝ නොනොත් රන්දාගැබක්සේ බබළන මුනුණ නමැති පියුම් ගැබෙහි හැසිරෙන බඹර ප්‍රාණියක් හා සමානවූ, දිහු පුළුල් පස්පෑ දිස්නා ඇස්සහල විදහා සන්රැවන් නැවක් මෙන්ද පිපී වැනීගිය රන් පියුම් වනයක්දෝ නොනොත් රන්දාගැබක් වටකොට පුදනලද මල්කලඹක් හා සදෘශවූ සඞ්ඝරාජයන් බලා වදුරා මේ මහණ පිරිස දැමුණු ඉඳුරන් ඇත් හා; නිවුණාවූ චිත්තසන්තාන ඇත්හාහ, කයින් වචසින් මනයින් සන්සුන් ගුණ ඇත්හාහ; එහෙයින් මම් පළමුකොට කථාවක් නොකෙළෙම් නම් මේ පෙරටුකොට බැණ නැහෙන මහණෙක් නැහැයි සිතා වදුරා අනල්ප කල්පකෝටි ශතසහස්‍රයක් මුලුල්ලෙහි පුරනලද කායවාක් සුචරිත්තෙන් එන සුගතිවූ නිබෙන මූඛපද්මය විදහා මහණෙනි! මා එන්නාට පුළුහාග් යෙහි කවර නම් කථාවකින් යුක්තව උනුද? නොපට නොදනෙන කථාවක් හොප සිත උපන් සැනයෙක් ඇත්නම් ඒ මට කියව්. මම මාගේ අසාධා රණවූ බුදු නුවණැසින් පිරිසිඳ දැන කියමිසි වදුරා ධම්යට මුඛදී තූෂ්ණීම්භූතව වැඩ උන්සේක.

එවේලෙහි සඞ්ඝයා වහන්සේ සවාමිනි! බුදුන් විසින් නොකියන්නට වදුළ රාජ කථා චෝරකථාදිවූ දෙතිස් කථාවෙන් යුක්තව නුන්නම්හ, බුදුන්ගේ සුවිශුඬවූ තික්ඛණ ප්‍රඥා ගුණ රසාස්වාදයෙන් පිණ පිණා උන් නම්හසි කි කල්හි මහණෙනි! දැන් මතු නොවෙසි බුදුහු මහනුවණැත්තෝ වූයේ පූර්වයෙහිත් (සසර සිටියා කල හුළුසළ නුවණෙහි සිට මෙම සම්බුදු ඥානය සිඳකරන පිණිස පාරමීධම්යන් පුරා ඇවිදිනා කාලයෙහිත්) නුවණැත් හෝමෙන්දැයි වදුරා මුවෙන් නොබැණ වැඩහුන් කල්හි එක්කොනකුන් වහන්සේ විසින් හැමදෙනා වහන්සේගේ අනුමතියෙන් ඒවූරු එකස්සකොට පෙරෙව ඇදිලි බැඳසිට දන්වන්නාහු බුදුන් මහනුවණ ඇතිසේ ප්‍රසාදය හෙයින් ඇහෙසි, පූර්වජන්මයෙහි හුළුසළ නුවණෙහි සිට පාරමී ධම්යන් පුරන කල්හි මහ නුවණ ඇති පරිදි භවයෙන් සැහෙවී නිබෙසි, එහෙයින් සවාම්දරුවාණෙනි! අපට නොහැහෙයි, වදුළනොත් යහපැතැයි ආරාධනා කළ කල්හි කඩතුරාවක් පහළකාට විචිත්‍ර චිත්‍ර කම්මාසායක් දක්වන්නාසාක් මෙන් අතීත කාල ප්‍රවෘත්තවූ කථාසම්පදාය ගෙනහැර දක්වා වදුළසේක.

ගේ මොකේදයස්?

ශවගිය දවස මියුලු නුවර වෙදෙහ නම් රජ්ජුරුකෙනකුන් රජ්ජය කරන සමයෙහි උන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකරන **සෙනකය, පුන්කුසය, කාවින්දය, දෙවින්දය,** යන පණ්ඩිතවරු සතරදෙනෙක් වූහ. එසමයෙහි වෙදෙහ රජ්ජුරුවෝ පුරනලද පාරමිතා ඇති බුඩාඩිකුරවූ මහ බෝසතාණන්වහන්සේ මව්කුස පිළිසඳ ගන්නා දවස් අලුයම් වේලෙහි මෙබඳු සුපිනයක් දුටහ. සෙණ්ඩුවාලුව ඇතුළෙහි සතර පවුරු කොත නාඹ තල්කඳ සා ගිනි කඳ සතරෙක් පවුරෙහි තලකටුව උසට නැගී දිලිසෙන්නේය. ඒ ගිනිකඳ සතරට මධ්‍යයෙහි කඳෙපැණියකු සා ගිනි පුපුරක් නැගිලා එම් ඇසිල්ලෙහි සතරකොන සිටි ගිනිකඳ සතරෙහි. අලොක මැඩගෙන බඹලොව උසට මුලුලෙවිහි ආලොක පතුරුවමින් දිලිසෙන්නේය. ඝටත් පිරිසෙසින් බිමහුණු සඹිපමාත්‍රයකුදු පෙනෙන්නේය. සියලු දෙවිමිනිසුන් සහිත ලෝවැස්සෝ ගඳින් මලින් පූජා කෙරෙමින් ඒ ගිනිදැල් ඇතුළේම වැද ඇවිදිනාහුය. එසේ ගිනිදැල් ඇතුළෙහිම ඇවිදිනා උන්ගේ ඇඟින් රොමකූප මාත්‍රය කුදු හුණු නොවන්නේය.

වෙදෙහ රජ්ජුරුවෝ මේ සිහිනය දුටු වේලෙහි පටන් මරණ භයින් භය පත්ව නොනිදහිඳ පහන්කළහ. උදැසනක්සේ සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන රජගෙට ගොස් රජ්ජුරුවන් වැඳ රෑ දවස සුවසේ නිදිලත් සැටි විචාරා රජ්ජුරුවන් විසින් මට සුවයෙක් නම් කොහින්ද? මෙබදු සිහිනයක් දිටිමි, කිකල්හි පණ්ඩිතවරු සතරදෙනාගෙන් සෙනක පණ්ඩිතයෝ දෙව යන්වහන්ස! නොබව මැනව, මේතෙමේ මඩගල සිහිනය එහෙයින් නුඹ වහන්සේට වැඩෙක් වන්නේයයි කියා කවර කාරණයකින්දැයි රජ්ජුරුවන් කිකල්හි අප පණ්ඩිතවරුන් සතරදෙනාම අභිභවා අපගේ නුවණ යට කොට නුඹවහන්සේට අනික් පස්වන පණ්ඩිත කෙනෙක් උපදනාහ; අප සතරදෙනා මේ රජාඩ්ගණයෙහි සතර කොන නැඟි ගිනිකඳු සතරක් වැන්නමහ; මඩ්‍යයෙහි නැඟි ගිනිකඳ මෙන් පස්වන පණ්ඩිතයෝ උපදනාහ; ඒ පණ්ඩිතයෝ සියලු දෙවිමිනිසුන් සහිත ලොකයෙහි අසමානවූ නුවණැත්තාහ; සියලු ගුණයෙන් අසදෘශයහයි කියා දන්වූහ. දැන් කොයිදැයි රජ්ජුරුවන් කිකල්හි දෙවයන්වහන්ස! අද උන්ගේ මවුකුස පිළිසිඳගැන්මම හෝ මවු කුසින් බිහිවීම හෝ වන්නේයයි තමන්ගේ ශාස්ත්‍ර බලයෙන් දිවැසින් දුටු සෙනකුන් මෙන් සිහිනයෙහි අර්ථරජ්ජුරුවන්ට කිහ.

රජ්ජුරුවෝ එදා පටන් ඒ වචනය සිහිකළහ. මියුලුනුවර වතාහි චාසල් සවම්පයෙහි දකුණු යවමැදුම්ගමය, බටහිර යවමැදුම් ගමය, උතුරු යවමැදුම්ගමය, නැඟෙනහිරි යවමැදුම්ගමය්යි නියම්ගම් සතරෙක් විය. ඒ ගම් සතරින් **නැඟෙනහිරි යවමැදුම්ගම සිරිවඩ්ඪන** නම් සිටාණකෙනෙක් වූහ. උන්ගේ ඇඹෙණියෝ **සුමනා** නම් දෙවී කෙනෙක, **මහාසුභද්දා** ණන්වහන්සේ එදවස් රජ්ජුරුවන් සිහිනය දුටු වේලෙහිම **තාවතිංස** දෙව්ලොකයින් චුතව සිරිවඩ්ඪන සිටාණන්ගේ සුමනා නම් දෙවීන් කුස පිළිසිඳගත් සේක. අනිකුත් දිව්‍යපුත්‍රයෝ දහසක් ඒ දෙව්ලොවින් චුතව නැඟෙනහිරි යවමැදුම්ගම බලා වැඩිමහලු සිටුවරුන්ගේ ඇගවල පිළිසිඳගත්හ.

සුමිත්‍රාදෙවීත් පිරිපුන් දසමසකින් අභිනව චන්ද්‍රරෙඛාවසේ දෙහෝ තොහොත් සතරන් පිළිමයක් බදුවූ රන්වන් පුතණුදු කෙතකුත් වැදූය. ඒ ඇසිල්ලෙහි සක්දෙව්රජාණෝ මිනිස්ලොව බලන්නාහු, මහබෝසතාණන් වහන්සේ මවුකුසින් නික්මුණුබවදැන මේ බුඩාඩිකුරයණන් දෙවිමිනිසුන් සහිතලොකයෙහි ප්‍රසිඩසොඳ ලනබව සුද්දසුසසියිතා උන්වහන්සේමවුකුසින් බිහිවනවේලෙහි නොපෙනෙන ශරීර ඇතිව අවුත් ඔබ අත රන්වන් සඳුන් හැඳියක් තබාලා තමන් වසන ශක්‍රභවනයටම යැයග.

මහබෝසතාණෝ ඒ සඳුන් ගැටය මිටින් ගත්සේක. මහබෝසාතාණන්වහන්සේ මවුකුසින් බිහිවන වේලෙහි මැනියන්දැට මඳ විලිවෙදනාව කුත් නොවී ඔබරුවකින් වැහෙන දියත්තක් මෙන්ද ධම්ඝනයකින් බස්නා පඩිරුවනක් මෙන්ද, සුවයෙන් නික්මුණුසේක. මැනියන්දැ උන්වහන්සේ අත තුබූ සඳුන්ගැටය දැන ප්‍රතණඩ! නොපඅත නිම්දැයි කිදැග. මැනියන් වහන්ස! මහොෂධඅතැයි කියා දිවසඳුන්ගැටය මැනියන්දැ අහ තබා වදාළසේක. ඔෂධය මැනියන්ද, අතටදී මැනියන් වහන්ස! මේ ඔෂධය හැරගෙන යම්කිසි රොගයකින් පීඩිත කෙනකුටනැතිව දෙවුව මැනවැයි වදාළසේක.

මැනියන්දැත් තුටුපහටුව සිරිවඩ්ඪන සිටාණන්ට කීග. ඒ සිටාණන්ට වනාහි සත්අවුරුද්දක් මුදුල්ලෙහි පහරන ඉසරුජාවෙක් ඇත්තේග, තුමූ තුටුපහටුව මේ කුමාරයා මවුකුසින් බිහිවන්නේ මහොෂධයක් අතින්ගෙන ආග, උපන් ඇසිල්ලෙහිම මැනියන් හා කථාකෙළේග. මෙබදුවූ පිනැත් තනු විසින් දුන් මේ බෙහෙද මහත්වූ ආනුභාව ඇත්තේගයි සිතා බෙහෙද අතටගෙන සඳුන්සණ මදක් ගහා නළල ගැල්වූහ. සත්අවුරුද්දක් පබඩියෙන් පහළ ඉසරුජාව නෙළුම්පතෙහා නොඇලිරුරුගෙන යනදියත්තක්සේ ගියේග.

සිටාණෝ මහානුභාව ඇති ඔෂධයෙකැයි සොම්නසට පැමිණියග. මහබෝසතාණන් වහන්සේ මහොෂධයක් අතින්ගෙන මවුකුසින් බිහිවූ නියාව හැමිතැනම ප්‍රසිඩවිය. කාසශ්වාසාදිවූ රොගයෙන් පීඩිත කිසි මිනිස් තොරොක් ඇද්ද, ඒ සියල්ලෝම සිරිවඩ්ඪන සිටාණන්ගේ ගෙට ගොස් මහොෂධය ඉල්වති, සිටාණෝ ඒ සඳුන්ගැටය සඳුන්සණගහා කල්හා සුහක්ගෙන පැහැ කලහා හැමදෙනාටම දෙන්නාග. දිව්‍යමයවූ ඔෂධය ශරීරයෙහි වැකි පළමුන්ම සියලු ව්‍යාධිහු සන්සිඳෙන්නාග. සන්හුන්නාවූ රොග ඇති මිනුස්සයෝ සිරිවඩ්ඪන සිටාණන්ගේ ගෙයි ඔෂධය මහත්වූ ආනුභාව ඇත්තේගයි වණිනාකෙරෙමින් යන්නාග. මහබෝසතාණන් වහන්සේට නම් තබන දවස් පියාණෙනි, මාගේ පුතණුවන්ට මුතුන්මිත්තන් ආදින්ගේ නමින් ප්‍රයොජන නැත, මහොෂධ නාමයම වේවයි කියා උන්වහන්සේට මහොෂධ කුමාරසෝගයි නම් තුබූහ. තවද ඒ සිටාණන්ට මාගේ පුතණුවෝ පින් ඇත්තෝය, එහෙයින් උදකලාව නූපදනාහ, මුන් හා සමඟ උපන් දරුවන් නවක්ඇත මැනවැයි මෙසේවූ සිතෙක් ඇතිවිය. මේසේ සිතා තුමූ තමන්ගේ මිනිසුන් යවා ගම් ගෙගක් පාසා බිලවා එකදු උපන් කුමාරවරුන් දහසක් දුටු බව අසා සිටාණෝ හැමදෙනාටම කුමාර පුලඳනාදී කිරිමවුන් යවා මහබෝසතාණන් වහන්සේ හා සමඟ උපන් නන්වත් සියලු මිතුල් කළහ. කුමාරවරුන් දහස සරිහා දවස දවස මහබෝ

සතාණන්වහන්සේ ළඟට ගෙනෙන්නාහ. බෝසතාණන්වහන්සේ උන් හා එක්ව කෙළිමින් සත්හැවිරිදි කල්හි සතරන් පිළිමයක් මෙන් මනා රූ ඇතිවූ සේක. ඉක්බිති කුමාරවරුන් හා කැටිව ගම්වැදී කෙළනා උන්වහන්සේගේ කෙළිමඬලු ඇතුන්අසුන් වැසි ආදිය ආකල්හි මැනෙන්නේය, අවි සුලං දැසි වේලෙහි කුමාරවරු මිරිකෙන්නාහ.

එක් දවසක් උන් කෙළිමින් සිටියදී නොකල් වැස්සෙක් නැගිය. වැසි නහන්නා දැක ඇත් සමාන බල ඇති මහබෝසතාණන් වහන්සේ දුවමින් ගොස් එක් ගේකට වන්සේක. සෙසු කුමාරවරු පසුපස්සේ දුවන්නාහු ඔවුන් පය පැකිල වැටී දණහිදීම් ලේ ලීම් ආදියට පැමිණියෝය. මහ බෝසතාණන් වහන්සේ මේතැන කෙළනට ගෙයක් කරවන බව සුදුසුය. එසේවූ කල්හි නොම්රිනෙම්හයි සිතා ඒ කුමාරවරුන්ට මේ සථානයෙහි සුලං අමනකල්හි වේවයි වැසිවස්නා කල්හි වේවයි අවි පහරන කල්හිවේවයි නොම්රිකී ඉඳිනට සිටිනට වැදහෝනට යොගෘකොට ගෙයක් කරවම්හ, එකිඑකි මස්සක් බැගින් ගෙනෙවයි වදාළසේක. උයිත් වදාළලෙසම් කළහ.

ඒ මසු දහස ගෙන බොධිසත්වයන්වහන්සේ වඩු ආචාර්යයකු ගෙන්වා මෙතැන ගෙයක් කරවයි මසුදහස දුන්සේක. වඩු ආචාර්යයාත් යහපතැයි මසු දහස ගෙන, හිම සමකරවා කණුගස්වා රණ දික්කොට හෙළාලීය. බෙදන නියාව මහබෝසතාණන් වහන්සේගේ සිත් නොගත්තේය. බෝසතාණන්වහන්සේ වඩු ඇදුරුට රණ ලනසැටිය වදාරනසේක් මේ ලෙස රණ නොලා මනාකොට රණදින්කරවයි වදාළසේක. සවාමිනි! මේ මාගේකාර්‍යය ඇති මට්ටමයි රණඑළිම්, මීට වඩා අනික් සැටියක් නොදනිමියි කිය. මෙපම ණකුත් නොදන්නේ අප සිත්ගෙන කෙසේ කෙරේදැයි වදාරා මෙසේ රණ ගෙනෙව රණලා ගෙය බෙදුදීලම්. රණ ගෙන්වාගෙන තමන් වහන්සේ දික්කළසේක. විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් රණ එළාලූ කල්හි මෙන් ගෙය බෙදිගියේය. ඉක්බිති වඩුවාඇතින් මෙසේ රණ එළාලියහෙයිදැයිවිවාළසේක, නොපිළිවන සවාමිනි!යි වඩුවා කිය. මා කී සැටියේ ගෙය කළනැකිදැයි වදාළ සේක, වදාළ ලෙසනට කළහැමියි කිය.

මහබෝසතාණන් වහන්සේ ඒ ශාලායෙහි යම් පරිද්දකින් දුක්පතුන් වසන තැන එක් සථානයක වීද, එසේම දුක්පත් ගැණුන් වදන නිඹිරිහෙය එක්තැනක. ආගන්තුක මහණ බමුණන් වසන තැන, සෙසු ආගන්තුක මිනිසුන් වසන තැන, ආගන්තුක වෙළඳුන්ගේ බඩු තබන තැන, මෙපරිද්දෙන්ම සියලු සථානම පිටතින් දොරකඩ තබා, ශාලාව විධානකොට කරවූසේක. එහිම කෙළිමඬුල්ලද විනිශ්චය ශාලාවද බමිසභාවද කරවූසේක. කීප දවසකින් නිමියාවූ ශාලායෙහි සිත්තරුන් ගෙන්වා තමන්වහන්සේ විධානකොට ඇලුම් කවයුතු සිත්තම් කරවූසේක. ඒ ශාලාතොමෝ සුධම්මා (නම් ශාලාව හා සමාන වාය. ඉක්බිති මෙපමණකින් මෙ හොබනේ නොවෙයි, පොකුණක් කරවන බව සුදුසුයයි පොකුණක්කණ උදවුව ගන්වා ගෙන්වා තමන් වහන්සේ මිලදී විධානකොට දහසක් වක් ඇති මනහර පිය ගැට පඩිසහිත් යුකතවූ සියයක් තොට ඇති පොකුණක් කරවූසේක. ඒ පොකුණ මෙන් පස්පියුමෙන් සැදුම් ලැබිය, තවද තමා පොකුණ මෙන් පිය. තැවත ඒ පොකුණතෙර අඹ

දෙඔ නා පනා සපු දුනුකේ ඇසළ පුවතු ආදීවූ මල්පල්ලෙන් සැදී සිටිනා නොයෙක් ශස් රොපණයකරවා උයනක්ද නඳුන් උසන සා කරවූසේක. එම ශාලාව තිසාම ධාර්මිකා මහණ බමුණන්වද, බැහැරින් අවුත් ඒ ශාලාවේ ලඟින්නන්වද. එනි ලැග බැහැර යන්නන්වද, සෙසු දුක්ඛතුන් ආදීන්වද දන්වැට හැඳිබවූහ. ඒ මහානාණන්වහන්සේගේ ක්‍රියා තොමෝ සියලුතන්හි පහළුය. බොහෝ මිනිස්සු ඒ සවරුපය අසා එතැනට එළඹෙන්නාහ. මහ බෝසතාණන් වහන්සේ ශාලායෙහි වැඩහිඳ ආ කෙනකුන්ට කළමනා යුකුති අයුකුති විචාරතසේක. මේසේ මහබෝසතාණන් වහන්සේ බුදුන් ලොව පහළවූ තල්හි මෙන් පහළවූසේක.

එසමයෙහි වෙදෙහ රජ්ජුරුවෝ සිතය දුටු සත් අවුරුද්දක් ගියකල පණ්ඩිතවරුන් සතරදෙනා "අප අනිහවා පස්වැනි මහනුවණ ඇති පණ්ඩිත තොතෙක් උපදනාහ"යි මට කිය. දැන් ඒ පණ්ඩිතයෝ කොයිදැයි සිහිකොට උන් වසනතැන් දහුවයි සතර වාසලින් ඇමැතියන් සතරදෙනකු යැවූහ. සෙසු වාසල් තුනින් නික්මුණුවූ අමාත්‍යයෝ තුන්දෙන මහබෝසතාණන් හුදුවූහ. නැගෙනහිර වාසලින් නික්මුණු අමාත්‍යතෙමේ නැගෙනහිරි ගවමැදුම්ගමට ගොස් බොධිසත්වයන් වහන්සේ විසින් කරවන්ලද ශාලාදිය දැන නුවණැති තොනකුන් මේ තෙය තවන් නෝ කළමැනව, අනුන් ලවා හෝ කරවුව මැනව. මේ ගෙය සවර වඩුවකු විසින් කරන ලදැයි විවාළේය. මිනිස්සු කියන්නෝ මේ ගෙය වඩුවකු තමා නුවණ බලයකින් කළ දෙයක් නොවෙයි, සිරිවඩ්ඪන සිටාණන්ගේ පුතණුවූ මහෞෂධ පණ්ඩිතයන්ගේ විධානයෙන් උන් හි සැවිසේ කරනලදැයි කිහ. ඒ පණ්ඩිතයෝ කී හැවිරිදි දෙදැයි විවාළේය, පිරිපුන් සත්හැවිරිදි සේකැයි කිවුය.

ඇමැතිතෙමේ රජ්ජුරුවන් සිනය දුටුදා, පටන් ගැණ සිනය දුටු නියාව සරිමය, සෙනක පණ්ඩිතයන්ට පස්වනුව පහළවන පණ්ඩිතයෝ නම් මුමයහි සිටුහන්කොට රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස! නැගෙනහිරි ගවමැදුම්ගම සිරිවඩ්ඪන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිත නම් කෙනෙක් සත්හැවිරිදි වඳස් ඇත්තාහු මෙබදු ශාලාවක්ද, පොකුණක්ද, උයනක්ද, කරවූහ. මේ පණ්ඩිතයන් ගෙනෙම්ද නොගෙනෙම්දැයි මෙහෙවර කරන්නකු යැවීය. රජ්ජුරුවෝ එපවත් අසා සතුටුසිත් ඇතිව සෙනක පණ්ඩිතයන් ගෙන්වා එපවත් උන්ට කියා කිමෙක්ද සබඳ සෙනක පණ්ඩිතයෙනි! පණ්ඩිතයන් ගොන්නමෝදැයි විවාළහ. ගුණවකුවූ ඒ සෙනකයා දෙවයෙනි! ගෙවල්ආදිය කරවාපි පමණකින් පණ්ඩිත නම් නොවෙති. යම්කිසි කෙනෙක් ඒ කරවා පියන්නාහ, ඒ ඉතා සවලපයයි කීය, වෙදෙහරජ්ජුරුවෝ උන්ගේ බස්අසා මෙසිත් එක්කාරණයෙකැයි මුවෙන් නොබැණ එම ගමම හිඳ පණ්ඩිතයන් විමසවයි අමාත්‍යයාට කියා යවූහ.

එබස් අසා ඇමැතිතෙමේ ඒ නියම්ගම වසන්නේ පණ්ඩිතයන් වහන්සේ පරීක්ෂා කෙළේය. මේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ මත්තෙහි විමසූ පැනයන්හි සංක්ෂේපයෙන් හිබසී.

මංසං හොණෙහාසුසි සුත්තං සුත්තං හොළ රථෙන ච
දණ්ඩා සිසා අතිමෙව් කුකකුටෝ මණ්ඩිච්ජාසනං
ඔදනං වාලුකාවාපි නිලාකුඤ්ඤාන මච්ඡ ගදුහෝ මණී.

එහි පළමුවැනිවූ මාංශ ප්‍රශ්නය කෙසේදයත්?—එක් දවසක් බොහෝ සඟයන්වහන්සේ කෙළිමඬලට වඩනා වේලෙහි එක් උකුස්සෙක් අංගාතිසේ මස් කොළොම්බුවකින් මස් වැදුල්ලක් ගසාගෙන ආකාශයටපැන නැංගේය. දහසක් කුමාරවරු ඒ දැක මස්වදුල්ල එවමින්හිස උකුස්සා ලුහුබැඳගෙන දිවුන්නාහ. උකුස්සාත් ඇස් මැත් බලා පියාඹන්නේය. කුමාරවරු උඩබලාගෙන උකුස්සා පසුපස්සෙහි දිවන්නාහු කැට ගල් ආදියෙහි පැකිල වීඳාවන්නාහ. ඉක්බිති මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ මේ මස් වැදුල්ල එවාවියම්දැයි ඒ කුමාරවරුන්ගේ විවාළසේක. එළෙවිව මැනව සවාමිනියි කිහ. එවිට්හම් බුලවයි පණ්ඩිතයන් වහන්සේ උඩහොබලාම පවනට බිඳු වෙගයෙන් දිව උකුස්සාගේ ඡායාව මැඩගෙන අත්ලෙන් අත්ලගසා මනත්වූ නාද කළසේක. ඒ මහතාණන්වහන්සේගේ ආනුභාවයෙන් ඒ නාදය උකුස්සාගේ ළෙන් ඇනී පිටින් නැහෙන්නාසේ වූයේය. ඒ උකුසු භයපත්ව මස්වැදුල්ල හෙළීය. මහබෝසතාණන්වහන්සේ ඔහු ඒ මස් වැදුල්ල නෙළන්නාවූ ඡායාව දුන බිම වැටිය නොදෙමියි කියා අල්වාගත්සේක. ඒ ආශ්චර්ය්‍ය දුන වෙහෙස දෙන ඔල්වරසන් දුන්නාහ. අත් පොළසන් දුන්නාහ. විනාශාදකළහ. ඒ අමාත්‍යයා එපවත් දැන රජ්ජුරුවන්ට මහෞෂධපණ්ඩිතයෝ මේ උපායෙන් උකුස්සා ගසාගත් මස් වැදුල්ලක් එළැහැ, දේවයන්වහන්ස! මේ අරුමය දන්නාසේක්වයි කැඩපත් සැවිය. රජ්ජුරුවෝ එපවත් අසා සෙනහ පණ්ඩිතයෙනි! කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයන් ගෙන්නමෝදැයි විවාළහ. සෙනහ පණ්ඩිතයෝ උන් මේ නුවරට ආතැන් පටන් අපි හිරු දුටු කඳපාණි නන්සේ නිම්ප්‍රභා වම්හ. රජ්ජුරුවෝ අප ඇති බවත් නොදන්නාහ. එසේ හෙයින් උන් මෙයට ගතඑනු හුදුන මැනවැයි සිතා හමා ගුණමකු බැවින් දේවයන්වහන්ස! මෙපමණකින්ම පණ්ඩිත නම් නොවෙන්මය, මේ ඉහාම අල්පදෙයකැයි කිහ. රජ්ජුරුවෝ මධ්‍යස්ථව එහිමි හිඳ විමිසන්නේයයි කැවෙන අසුන් යවූහ.

දෙවැනිවූ ගොන් ප්‍රශ්නය කෙසේදයත්?—යව මැදුම්ගම් වසන පුරුෂයෙක් වැසිදිය එළාලූකල සීසාමිසි අසල් ගමකින් ගොන් තෙයක් මිලයට ගෙන අවුත් තමාගේ ගෙසිම ලඟගවා දෙවන දවස් හුණ කවුනු පිණිස තණ බිමට ගෙන ගොස් ගොනකු පිට ඉඳ තණකවමින් විඩාව ගොනු පිටින් බැස ගසක්මුල හිඳ නිදන්නට වන. ඒ ඇසිල්ලෙහි එක් සොරෙක් ගොන් ගෙඔ ඇරගෙන නැඟී ගියේය. ඒ පුරුෂයා පිබිද ගොස් ගොන් ගෙයෙහි නොදැක බිඹොබ බලා ඇවිදින්නේ ගොන් ගෙය ඇරගෙන යන සොරු දැක එහා දිවී ගොස් මාගේ ගොන් සොයි ගෙනයෙසිදැයි ඇසිය. සොරු කියන තැනැත්තේ මාගේ ගොන් මා කැමැති තැනකට ගෙනයෙමියි කියා ඊන් දෙන්නාගේ කලහය අසා බොහෝදෙන රැස්ව හියාහ. පණ්ඩිතයන් වහන්සේ උන් දෙන්නා බබරකොටගෙන ශාලාව දෙරකඩින් යන්නවුන්සේ කලහ ශබ්දය අසා දෙන්නාම ගෙන්වා උන් දෙන්නාගේ එන සැටියෙන්ම දැන මේ සොරාය මේ ගොන් හිමි නැනැත්තේයයි දන්නාසේකුදු කුමක් හෙයින් බබරකරවුදැයි විවාළසේක. ගොන් ඇති තැනැහැ පණ්ඩිතයන් වහන්ස! මම මේ ගොන්ගෙය අසවල් ගම මෙහාම් තැනැත්තහු අතින්මිලදී ඇරගෙන අවුත් රැ ගෙසි. ලඟගවා උදැසන තණබිමට හුණ කවන්නට ගෙනගියෙමි; එතැනදී මාගේ ප්‍රමාදයක් දැකලා මේ තෙමේ ගොන් ගෙය ඇරගෙන පලා ගියේය. ඒ මම ඔබ වැඩබ බලන්නෙම් ගොන් දෙන්නා

බැඳගෙන යන මේ සොරා දැන ලුහුබැඳ අල්වාගනිමි, අසවල්ගම ඇත්තෝ මේ හොන්ගෙය ගත් නියාව දන්නියි කිය. සොරු කියන්නේ මේ මාගේ වදු වඩාගත් හොන්ගෙයය, මේසා බොරු කියයි කිය. ඉක්බිති පණ්ඩිත යන් වහන්සේ ඔවුන් දෙන්නාගේම බස් අසා මම තොපට යුකහිය දහැමින්ම විනිශ්චයකොටදී ලමි. මා කී යුකහියෙහි සිටිව්දැයි විචාරා සිටුම්හයි කිකල්හි බොහෝදෙනා ළඟන්මා යුකහිය පසිඳිනා බව සුදුසුයයි පළමු කොට සොරා කැඳවාලා නෝ මේ හොන් ගෙය කුමක් කොා පොා වැඩිදැයි විචාළසේක. සොරු කියන්නේ උළුකැන් පොා තලමුරුවට හා උදුකවන ලදැයි කිය. ඉක්බිති හොන් ඇති තැනැත්තහු කැඳවා නෝ කුමක් කොා පොා වැඩිදැයි විචාළ කල්හි ඒ කියන්නේ සවාමිනි මා දුක්පත් තැනැත්ත හුට උළුකැන් හා බල ආදිය නොසින්ද? තණම කවනලදැයි කිය. පණ්ඩිතයන්වහන්සේ දෙන්නාගේ බස් අසා සභායෙහි උන්න වුන් යිවිස්වා, පුවහුකොළ ගෙන්වාගෙන කොටා පැන්මඩවා ගොනුන්ව පෙළුසේක. ගොනුන් නුණම නාහුහ, පණ්ඩිතයන්වහන්සේ බොහෝ දෙනාට මේ බලවයිපැ නා සොරෙහිද? නොසොරෙහිදැයි විචාළ සේක. ඒ තෙමේ සොරෙමියි කිය. එසේවිනම් මෙතැන් පටන් සොරකම් නොකරවයි අවවාදකොට මෙබදු නොකට යුත්තක් නොකරවයි වදාළසේක. බොධිසත්වයන්වහන්සේගේ පුරුෂයෝ වනාහි ඔහු එතැනින් පිටිපස්සට ගෙන අතින් පයින් හළා දුම්ල නළහ. ඉක්බිති පණ්ඩිතයන්වහන්සේ ඔහු ගෙන්වා මේ ජන්මයෙහිම මේසා දුනකට පැමිණියෙහිය, පරලොව වනාහි නිරයාදියෙහි ඉපිද බොහෝ දුක් අනුභවකරන්නෙහිය, මෙතැන් පටන් සොරකම් නොකරවයි අවවාදකොට පන්සිල් දුන්සේක. අමාත්‍යයා එපවත් අසා තමිය පෙර පරිද්දෙන් රජ්ජුරුවන්ට කියා යැවීය. රජ්ජුරුවෝ සෙන කයන් විචාරා දෙවයෙනි! හොන් යුක්තිනම් යම්කිසි කෙනෙක් පසිඳපියහි, තවද ඇම්මුණ මැනවැයි කිකල්හි රජ්ජුරුවෝ මධ්‍යසථව නැවත පෙර පරිද්දෙන්මි අමාත්‍යයාට කියා යවූහ.

අමාත්‍යයා රජ්ජුරුවන්ට කියා යවන නියාවද රජ්ජුරුවෝ සෙනක සන්නිවාරණා නියාවද, සෙනකයන් ඒවලකන නියාවද රජ්ජුරුවෝ අමාත්‍ය යාට කියා යවන නියාවද, හැම පැනෙහිම මෙම ලෙසයයි දතයුතු.

නා දූ තුන්වැනිවූ ගැටහු පලඳනාවේ විනිශ්චය කෙසේදයන්?— එක් දුක්පත් ගැණියක් නීලපිතාදි නානාවණීණහුයින් ගැටිගසා කරනලද හැටහු පලඳනාවක් කරින් ගෙවා සඩමත්තේ තබා පණ්ඩිතයන්වහන්සේ විසින් කරවනලද පොකුණෙන් නහන්නට වන, අතික් ළදරු බාල එකියක් ඒ පලඳනාව දැන ලොභ උපදවා ඔසවාගෙන මැනියෙනි! මේ පලඳනාව ඉතා හොබනේය. කවරකෙනකුන් විසින් කරනලද්දේද? මමත් මට මේසෙම් පලඳනාවක් තෙරෙම් කරපැලඳ පමණ බලාපියම්දැයි විචාරා වඩා ගිහින් නැති සැටිය විසින් යහපත යෙහෙළතියණි පමණ දැනපියවයි කීකල්හි කර පැලඳ ගෙන නැගී ගියාය. පලඳනාව ඇති තැනැත්තී දැසලා වහා ගොඩනැගී කඩ ඇදගෙන ලුහුබැඳගොස් මාගේ පලඳනාව ඇරගෙන ගොසියේදැයි එකුරුතු පටගත. අනික් තැනැත්තී තොපගේ පලඳනාවක් මම නොගතිමි. මේ මා කරලන පලඳනාවයයි කිය. ඒ කලහයඅසා බොහෝ දෙන රැස්වූහ පණ්ඩිතයන්වහන්සේ කුමාරවරුන් හා සමඟ කෙළනාසේක්

ඒ ගැණුන් දෙන්නා ඔබරකොට කොට ශාලා දොරින් යන්නවුන්නේ කලහ ශබ්දයඅසා මේ කුමන අරගලයෙක්දැයිවිචාරා දෙන්නාගේ කලහ කාරණාඅසා දෙන්නාම ගෙන්වා එනසැටියෙන්ම මෝඝපුරය, මේ පලඳනාව ඇති තැනැත්තියයි දැන ඔබර කාරණා විචාරා මාගේ ප්‍රක්තියෙහි සිටිවී දැයි විචාරා දෙන්නා එසේය සවාමිනි! සිටුහම්හසි කිකල්හි පළමුකොට සොර තැනැත්තිය අතින් තී මෙපලඳනාව පලදිනෙහි කවරසුවදක් ගැල්වීදැයිවිචාළ සේක. ඕ මම නිරන්තරයෙන් සඳි සංහාරක නම් සුවදක් ගල්වමියි කිව. සඳිසංහාරක සුවදනම් සියලු සුවද එක්කොට කරනලද සුවදය. ඉක්බිති පලඳනාව ඇති තැනැත්තිය විචාළ කල්හි සවාමිනි! මා දුක්පත් තැනැත්තියට සඳි සංහාරක නම් සුවද කොසින්ද ? නිරන්තර යෙන්ම පුවහු මලෙහි සුවද කවමියි කිව. පණ්ඩිතයන් වහන්සේ පැන් තලියක් ගෙන්වාගෙන ඒ පලඳනාව පැන් තලියෙහි ලවා ඔසද වටුවකු ගෙන්වා මේ තලියෙහි පැන් සිඹ අසවල් සුවදයයි දැනැසි වදළසේක. ඔසද වටුවා පැන් සිඹ හුදු පුවහු මලෙහි සුවද නියාව දැන ගාථාවකින් සඳි සංහාරක සුවඳෙක් මෙහි කොසින්ද? පුවහු මලෙහි සුවද හමන්නේය, මේ ළදුරි බාල ධුතීන සත්‍රී බොරු කිව මැහැලි තැනැත්තිය කියේ සැබෑයයි කිය. මහබෝසතාණන්වහන්සේ ඒ කාරණාව බොහෝදෙනාට හඟවා තී සෙරෙහිද? නොසෙරෙහිද? කියා සෙර නියාව හිමිස්වූසේක. එතැන් පටන් මහ බෝසතාණන්වහන්සේගේ පණ්ඩිතභාවය බොහෝදෙනාට ප්‍රසිඛවිය.

සතර වැනිවූ හුවැටියෙහි විනිශවය කෙසේදයත්?—කපුසේනක් රක්නා එක් සත්‍රියක් කපු රක්තී තමා රක්නා සේනෙහි සවස පිපි කපු කඩා ගෙන සකස්කොට කඩා පොළා වලුකොට සින්හූකැට කැටිකොට ඒ හූවැටිය ඉන තබාගෙන ගමට එන්නී මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් කරවන ලද පොකුණෙන් නහමිසි කඩ ගලවා ගොඩතබා කඩමත්තේ හූවැටිය තබා නහන්නට දියට බට. අනික් සත්‍රියක් හූවැටිය දැක එහි ලොල් සිත් දැතිව ඒ අතට ගෙන අහන! ඉතා යහපත හූයෙහි සීන් ඇත, නැහණියෙනි! නොප විසින්ම සාටානාලදදැයි ආශ්‍රවශ්‍රීවත්ව බලන්නියක මෙන් ඉතූ තබා ගෙනනැඟී හියාය. පෙර ගැටහූ පලඳනායෙහි පරිද්දෙන්ම කලහකොටකොට ශාලාව සවමිපයෙන් යන දෙදෙනා ගෙන්වා විචාරා තමන්වහන්සේ කී යුකති යෙහි සිටුහම්හසි කී පසු බොධිසත්‍වයන්වහන්සේ නී මේ හූවැටිය කරන්නී කුමක් ඇතුළේලා කළාදැයි සොරතැනැත්තිය විචාළසේක. සොර තැනැත්ති යන්නී සවාමීනි! කපු ඇටක් ඇතුළේ ලා වටකොළෙමිසි කිව. ඇගේ බස් අසා හූවැටිය ඇති තැනැත්තිය අතින් තී කුමක් ඇතුළේ ලා වටකළාදැයි විචාළසේක. ඕ තිඹිරි ඇටක් ඇතුළේ ලා වටකොළෙමිසි කිව. දෙන්නාගේ බස් අසා සභායෙහි උන්නවුන් හිමිස්වා හූවැටිය ගලවා ඇතුළේ තිබූ තිඹිරි ඇටයදැක අෑ සෙර බව හිමිස්වූසේක. බොහෝදෙනා ප්‍රක්තිය පසුන් නියාවට තුටු පහටුව දහස් ගණන් සාධුකාර පැවැත්වූහ.

පස්වැනිවූ ප්‍රශ්නය කෙසේදයත්?—එක් සත්‍රියක් පුතකු වඩා ගෙන පණ්ඩිතයන්වහන්සේගේ පොකුණට ගොස් ආදිකොට පුතු නහවා නමාගේ කඩමත්තේ හිඳුවා තොමෝ ඉස් සොඩා නහන්නට බට. අෑ නහන්

නව බව ඇසිල්ලෙහි යකින්නියක් ඇගේ පුතු දැක කෑ කැමැතිව ගැණු වෙසක් ගෙන දරුවන් සැම්පයට අවුත් යෙහෙළිය! මේ දරුවෝ ඉතා හොබනාහ, මූ තොපගේ දරුවොනෙක්දැයි විචාරා එසේය යෙහෙළියනියි කී කල්හි මේ දරුවන් කිරි පොවමිදැයි ඇසීය. මැනියන් විසින් යහපතැයි, කී කල්හි ඕ දරුවන් ගෙන මදක් කිරිපොවාලා වඩාගෙන පලා ගිය ය. මැනියෝ තමන්ගේ දරුවන් ඇරගෙන යන්නිය දැක දිවගෙන ගොස් මාගේ පුතු කොයි ගෙනයේදැයි අල්වාගත්. යකින්නි කියන්නි තී කොයින්ලත් පුතෙක්ද? මූ මාගේ පුනණුවෝයයි භයක්නැතිව කිව. ඔව්හු දෙන්නා කලහ කෙරෙමින් ශාලාව දෙරකඩින් යන්නාහ. මහබෝසතාණන්වහන්සේ කළහ ශබ්දය අසා දෙන්නාම ගෙන්වා මේ කුමන ඩබරදැයි අසා ඇස් නොම රන බැඳින්ද ඔලිඳැට දෙකක්සේ රත්ව තිබෙන බැවින්ද මේ යකින්නයයි දැන මා කී ප්‍රක්නියන සිටිවුදැයි විචාරා එසේය සිටුමිහයි කිකල්හි ඕම හිරක් අදමා හිරමැද දරුවන් හොවා යකින්න ලවා දැත හා මැනියන් ලවා දෙපය ගන්වා දෙන්නා ඇදගත්තුවයි ඇදගත් එතකුටය පුතණුවෝයයි වදාළසේක. දෙන්නාම දරුවන් ඇදගත්හ. දරුවෝ දෙන්නා විසින් අදනා ලබන්නාහු දුකට පැමිණියහ. මැනියෝ ළය පැලුණු සැලක් මෙන් ශොකයට පැමිණ දරුවන් අතහැර අඩමින් සිටියාහ. බෝසතාණන්වහන්සේ දරුවන් කෙරෙහි වැදුවන්ගේ ළය මොළොක්ද? නොහොත් නොවැදුවන්ගේ ළය මොළොක්දැයි බොහෝදෙන විචාළසේක. බොහෝදෙනා පණ්ඩිතයන් වහන්ස! වැදුවන්ගේ ළය වේද මොළොක් වන්නේයයි කිවාහුය. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ කිමෙක්ද? දැන් දරුවන් වඩාගෙන සිටි තැනැත්ති මැනියනැයි වැටහේදැයි හැමදෙනාම විචාළසේක හැමදෙනම දරුවන් හැර සිටි තැනැත්තෝ වෙත්ද පණ්ඩිතයන් වහන්ස! මැණියෝයයි කිහ කිමෙක්ද? හෙපි හැම මේ දරු සෙර දනුදැයි හිංවළසේක. හැමදෙනම නොදනුම්හ පණ්ඩිතයන්වහන්සැයි කිකල්හි එම්බා! මෝ යකින්නක, දරු වන් සත පිණිස ගතැයි වදාළසේක. කෙසේදන්සේක්ද? පණ්ඩිතයන් වහන්සැයි කිහ. ඇසිපිය නොමරන බැවින්ද, ඇස්දෙක රත් බැවින්ද, ඡායාවක් නැති බැවින්ද, කිසිකෙනකුන් කෙරෙහි සෑහයක් නැති බැවින්ද, දයාවක් නැති බැවින්දැයි මෙතෙක් කාරණයෙනැයි වදාළසේක. ඉක්බිති මෙලෙස වදාරා ති කවරෙක්දැයි යකින්න විචාළසේක. යකින්න කිම් සැමිනි! කිව. කුමක් පිණිස මේ කුමරුවා ගත්තෙහිදැයි විචාළසේක. සත පිණිසය සැමිනි කිව. නුවණ නැත්තිය පෙරත් ති අකුසල්කොට යකින් නව උපන්නෙහි වේද? දැන් වනාහි නැවතත් අකුසල් කරන්නෙහිවීද? අහහ! නුවණ නැත්තිය කියා අවවාදකොට ඉක්බිති ඇ පන්සිල් පිහිටුවා යැවූසේක. කුමරුවාගේ මැනියෝ බොහෝකලක් ජීවත්වුව මැනව සැමිනියි මහබෝසතාණන්වහන්සේට සතුතිකොට පුතණුවන් වඩාගෙන නැගී ියහ.

සවැනිවූ කාළගොළ ප්‍රශ්නය කෙසේදයත්?—මිටි හෙයින් ගොළයයි කියාද කළපැ ඇතිහෙයින් කාළයයි කියාද (කාළගොළයයි) ලබනලද නම්වූ එක් මිනිහෙක් විනාහි සත් දවුරුද්දක් කඹුව අඹුවකළද. ඕ නමින් **දික්තල** නම්. ඒ පුරුෂයා එක් දවසක් තමාගේ අඹුව බණවා සොඳුර! දෙමවුපියන් බලාපියම්හ. කැවුම්පෙවුම් ඉදිකොටලවයි කියා ඇ විසින් මවුපියන්ගෙන් කාරණ කිම්ද? නොබණැයි ප්‍රතිෂේපකරනලද්දේ තුන්වර

දක්ව, කියා තුන්වැනි වාරයෙහි ගිවිස්වා කැවුම් පියවාගෙන පලාඛන් ආදි මාඝෝපකරණද කැවුම් ආදි දෙමවුපියන්ට ගෙනයාහුතු පඹුරුද ඇර ගෙන ඒ අඹුව හා සමඟ මහව පිළිපන්නේ අතරමඟ පැනිර දියයන ඔයක් දිටී. තොගඹුරුවුවත් ගඟ දියට ඔහු දෙදෙනම් බානාඟ. එසේනෙයින් ඒ ගඟින් එපරව යාගත නොහෙන්නාහු ගංතෙර සිටියාහ. එවේලෙහි දිඝ් පිවිසා යන නමක් ඇති එක් දුක්පත් පුරුෂයෙක් ඒ ගංතෙර ඇවිදින්නේ උන් දෙන්නා සිටි තැනට පැමිණියේය. ඉක්බිති ඔහු දැඟ සඟලු මේ ගඟ ගැඹුරු නෝ නැද්දැයි පිළිවිස්සහ. ඒ තෙමේ ඔවුහු දියට බාන්නාඟයි දැන මේ ඉතා ගැඹුරුය. නිඛුලුන් හා දැනිවුවර ආදිවූ වණඬ මනුෂ්‍යයන්ගෙන් ගහණයයි කීය. එබස් අසා සබඳ! තෙපි කෙසේ එතරවිවි දැයි විවාළහ. මේ ගඟ නිඛුලුන් හා දැනිවුවර ආදිවූ වණඬ අය හා අප හා පුරුදුකම් ඇත. එහයින් අප නොබඳින්නාහයි කීය. එසේවීනම් සබඳ! අපත් එතර කර වසි කිවුය. ඒ පුරුෂයාත් යහපතැයි ගිවිස්සේය. ඔහු ඵිවිසිකල දෙමහල්ලෝ කන බොඟද ඕනට දුන්හ. ඒ පුරුෂයා කරනලද ආහාර කෘත්‍යය ඇත්තේ සබඳ කවුරුන් පළමුකොට ගෙන යෙම්දැයි විචාළේය. එබස් අසා කාළ ගොළුඹා නොපමේ බැතුණියන්දු පළමුකොට ගෙනයව, මා පසුවගෙන යවයි කීය. ඒ පුරුෂයාත් යහපතැයි දික්තල කරහිඳුවාගෙන සියලුම මාඝෝප කරණත් කැවුමුත් ඇරගෙන ගඟට බැස මදක් තැන් ගොස් කෙළිල්ලෙන් බැස හිඳ හිඳ ගියේය. කාළගොළුයා ගංතෙර සිටියේ මේ ඉතා ගැඹුරුය, වෙසේ උස්තැනැත්තවුට පවා මෙතෙක් දියමාරුනොවන්නේය මා නොපොවන්නේයයි සිතීය, දික්පිටියා දික්තල ගඟමැදට ගෙනගොස් සොදුර! මම තොප රක්ෂාකෙරෙමි. ඟඳපැලඳ දෙවඟනක්සේ කැමැති පරිද්දෙන් සැරසි දැසිදස්සන්විසින් පිරිවරනලදුවඇවිදුව, තොපට මේඅහුවුම්ටියා කුමන පොහ්‍ය යක් තමා දීලියහෙන්නේද? මාඹේ බස් ගිවිසුවයි කීය. ඔතොමෝ දික්පිටියා කි බස් අසාම සත්අවුරුද්දක් තමා නිසා ගෙයි කඹුළ තමාගේ සැමියා කෙරෙහි සෙනහ සිඳ ඒ ඇසිල්ලෙහිම එකි දික්පිටියා කෙරෙහි පිළිබඳ සිත් ඇතිව සවාමිනි! ඉදින් මා නොහරින්නෙහිනම් මම තොප කිවා කෙරෙමියි ගිවිස්සීය. ඔව්හු දෙදෙනම එතර ගොස් විශෙෂයෙන්ම සහතුෂ්ටව කාළ ගොළුයා හැරපියා තෝ එසේ සිටුවයි කියා ඔහු බලබලා සිටියදීම කැවුම් කඩා ඇන්නට වන්හ. කාළගොළුයාත් උන් දෙන්නාගේ ක්‍රියාව දැක මුන් දෙන්නා එක්වගෙන මා ඇරපියා යෙති. ඇත්මෑත් බලා දිවන්නේ මදක් දියට බැස හසින් ගොඩ නැඟී නැවත උන් දෙන්නා කෙරෙහි කොපයෙන් මියෙම්වා රැකෙම්වාසි ගඟට පැන දියට බටුයේය. දිය මඳ නියාව දැන ගඟින් එතරව දික්පිටියා කරා පැමිණ කොල දුෂ්ටවූ සොදුර! මාගේ අඹුවන් කොයි ගෙනයේදැයි විවාළේය. දික්පිටියාද කොල අහුවුම්ටිය! තට අඹුවෝ කොයින්ද? මේ මාගේ අඹුවයයි කියා කාළගොළුයා කර අල්වා දමාලීය. කාළගොළුයාද ඒ දික්තල අත අල්වාගෙන නි නොයිට කොහියේද? සත් අවුරුද්දක් ගෙයි කඹුට ලත් මාගේ අඹුවවේදැයි කියා දික්පිටියා හා සමඟ කලහ කෙරෙමින් ශාලාව සමීපයෙන් යන්නේය. බොහෝදෙනා කලහ ශබ්දය අසා රැස්වූහ. මහබෝසතාණන්වහන්සේ මේ කුමන අරගලයෙක් දැයි විචාරා, උන්දෙන්නාම ගෙන්වා දෙන්නාගෙන්ම ඔවුනොවුන් කියන බව අසා මා කී යුකතියෙක සිටිවුදැයි කියා සිටුහමිහයි කීකල්හි පළමුකොට දික්පිටියා බණවා තෝ කිනම්දැයි විවාළසේක. දික්පිටියා නම් සවාමිනියි

කිය. තාගේ අඹුවන්ගේ නම කිම්දැයි විචාළසේක. ඇගේ නම නොදන්නේ අනික් නමක් කිය. තාගේ මෑනියෝ පියාණෝ කිනම්දැයි යන්නා මේ මේ නම්සිකිය. තාගේ අඹුවන්ගේ මෑනියෝ පියාණෝ කිනම්දැයි විචාළසේක. ඒ නොදනු අනික් නමක් කිය. ඉක්බිත්තෙන් ඔහුගේ බස් සහාසයෙහි උන්නවුන් හිවිස්සවා ඔහු එනැතින් විටින්විටවා කාළගොළුයා ගෙන පෙරපරිදි දෙවම් හැම්දෙනාගේම නම් විචාළසේක. ඒ පූපරිදිදෙන්මි දන්නේ නොවර දවාම කිය. ඔහු එනැතින් පිටින්කරවා දික්නල ගෙන්වා ඒ කිනම්දැයි විචාළසේක. ඕ මම් ඩවාමිනි! දික්නල නම් කිව. තිගේ සැමියා කිනම්දැයි විචාළසේක. ඕ සොරසැමියාගේ නම නොදන්නී අනික් නමක් කිව. තිගේ මෑනියෝ පියාණෝ කිනම්වූදැයි විචාළසේක. සවාමිනි! අසච්චි නම්මූයයි කිව. තිගේ සැමියාගේ මිදුටිය දෙන්නකිම්වූදැයි විචාළසේක. ඕ හන්දෙඩන්නියක මෙන් අනික්කක් කිව. මහෙෂධ පණ්ඩිතයන්වහන්සේ දික්පිටියා හා කාළ නොළුයා දෙන්නා ගෙන්වාගෙන මැඟේ බස් හා දික්විටියාගේ බස් සමද? කාළගොළුයාගේ බස් සවදැයි විචාළසේක. හැම්දෙනම පණ්ඩිතයන්වහන්ස! කාළගොළුයාගේ බස් හා සවයයි කිය. ඉක්බිති මේ කාළගොළුයා මැඟේ සැමියාය, දික්විටියා සොරසැමියා යයි කියා ඔහු විචාරා සොරසැමියා නියාව හිවිස්වූසේක.

සත්වැනි රථ ප්‍රශ්නය කෙසේදයත්?—එක් පුරුෂයෙක් රථයක ඉඳ මූහුණ සෝදන විණිස නික්මුණේය. ඒ ඇසිල්ලෙහි **සක්දෙව්** මහරජාණෝ මනුෂ්‍යලෝකය බලන්නාහු **මහෙෂධ** පණ්ඩිතයන්වහන්සේ දැක මේ **මහෙෂධ** බුඩාඩිකුරණාගේ ප්‍රඥුනුභාවය ප්‍රකාශකෙරෙමියි සිතා මිනිස්වෙසින් අවුත් පුරුෂයා පදිමින් සිටි රථයෙහි පසුකඹ අල්වාගෙන යන්නාහුය. රථයෙහි උන් පුරුෂයා කුඩෙනි! කුමන නාටයුන්නක් නිසා අවුදැයි විචාරා නුඹ දැ සවම්පයෙහි සිවිනා නිසා ආම්සිණිකල්හි යහපතැයි හිවිස රථයෙන් බැස ශරීරකෘත්‍යය පිණිස නිවසේය. ඒ ක්ෂණයෙහි ශක්‍රයෝ රථයට පැනනැඟී වනවනා රථය පදනාහ. රථය ඇති පුරුෂයා ශරීරකෘත්‍යයකොට නික්මුණේ රථය හැරගෙන යන්නාවූ සක්දෙව් රජහු දැක යුහුව ගොස් සිටුව සිටුව මාගේ රථය කොයි ගෙනයේදැයි කියා තොපගේ රථය අපිකක් වන්නේය. මේ වීනාහි මාගේ රථය වන්නේයි කිකල්හි, ඔහු හා සමග කලහ කොරමින් ශාලාව දෙරකඩව පැමිණිසේය. පණ්ඩිතයන්වහන්සේ මේ කුමක්දැයි බැණ, එන්නාවූ දෙන්නාම දැක කිසි භයක් නැති බැවින්ද ඇස් නොමරන බැවින්ද මේඝක්‍රියායා, මේ රථස්වාමියායයි දක්සේක. එසේවුවද කලහකාරණ විචාරා මාගේ ස්‍රියාතියෙක සිරිවිදැයි විචාරා සිටුම්හයි කී කල්හි මම රථය පදවිමි. තොප දෙන්නාම රථය පස්සෙන් ගනුව රථය ඇති තැනැත්තේ නොහරනේය. අනික් තැනැත්තේ හරනේයයි කියා සමන්දූගේ පුරුෂයකුට රථය පදුවසි වදුළසේක. ඒ යුහුව රථය පදනට වත. ඔව්හු දෙන්නත් රථය පස්සෙන් අල්වාගෙන යන්නාහ. රථය හිමි තැනැත්තේ මඳ තැනක් ගොස් රථය පස්සෙන් දිවිය නොහෙන්නේ රථය හැරපියා සිටි සේය. ශක්‍රයා රථය හා සමග දිවන්නේමය. පණ්ඩිතයන්වහන්සේ රථය පැදීම් නවත්වා මිනිසුන්ට මේ පුරුෂයා මදක් ගොස් රථය හැරවියා සිටි සේය. මේ වනාහි රථය හා සවහම දිව රථය හා සමගම වැලැක්කේය. මොහුගේ ශරීරයෙහි ඩා බින්දුවක් පමණකුත් නැත. ඇතිමකුත් නැත්තේය. භයකුත් නැත්තේය නොමරනලද ඇස් ඇත්තේය. මේ තෙමේ

සක්දෙව් රජයයි වදළසේක. ඉක්බිත්තෙන් ඔහුට තෝ දිව්‍ය රජයෙනිදැයි විචාරා එසේයයි කී කල්හි, කුමක් නිසා මේ මනුෂ්‍ය ලොකයට අවුදැයි විචාරා නුඹවහන්සේගේ නුවණ ප්‍රකාශකිරීම් විෂයය පණ්ඩිතයන්වහන්සැයි කී කල්හි එසේවීනම් මෙහන්දක් මතු නොකරවයි වදුරා අවවාද සළසේනා සක්දෙව්රජාණෝත් හමන්ගේ ශක්‍රභාවය දක්වමින් ආනාගතයෙහි සිරි නුඹ වහන්සේ විසින් රථ යුගාතිය යහපත්කොට පිහිදිනාලදැයි පණ්ඩිතයන්වහන්සේට සතුහිකොට, තමන් වසන දිව්‍යලොකයටම වැඩියාහුය. එදවස් පටන් බරණැස රජ්ජුරුවන් විසින් පණ්ඩිතයන්ගේ නුවණ පරීක්ෂාකරවයි කියා නැණෙහිරි යව මැදුම්ගම සිටුවහලද ඒ ඇමැති තොමෝ රජ්ජුරුවන් සැම්පසඳ හොස් දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසින් රථ යුග්මයෙක් මෙසේ පහිදනලද, ඒ පණ්ඩිතයන් විසින් සක්දෙව්රජ පවා පරදවනලද, කුමක්හෙයින් පුරුෂ විශෙෂය නොදක්නාසේන්ද? දෙවියන්වහන්සැයි කිය. රජ්ජුරුවෝ සෙනක පණ්ඩිතයන් කිමෙක්ද පණ්ඩිතයෙකැ! මිනිසෙකුගේ පණ්ඩිතයන් ගෙන්වා ගනුමෝදැයි විචාළහ. දෙවියන්වහන්ස! මෙපමණකින්ම පණ්ඩිතයන් නම් නොවන්නාහ. තවත් බැලුවි මැනවයි පරීක්ෂාකොට වියා දන්න මෝවේදැයි කිය.

අටබැගිලූ කිහිරි දණ්ඩන් ඔමඬු ප්‍රශ්න කෙසේදැක්?—ඉක්බිත් තෙන් එක් දවසක් පණ්ඩිතයන් විමසූහුයි කිහිරි දණ්ඩක් ගෙන්වා එයින් වියනක් පමණගෙන තත්තකාරයකුගෙන්වා සකස්කොට ලියවා නැණෙහිරි යවමැදුම්ගම වසන පුරුෂයෝ නුවණැත්තෝල මේ කිහිරි දණ්ඩහි මේ අගය මේ මූලයයි දනිත්වයි, ඉදින් නොදතිත්නම් දහසක් දඩයයි කියා යවූහ. ගම්වැස්සෝ රැස්ව කිහිරි දණ්ඩහි අග මූල දැනගත නොහෙන්නාහු ඔවුන් වඩසන සිටාණන්ට කියසේත් මහෞෂධ පණ්ඩිතයෝ දැනගන්නාහ. උන් ගෙන්වාගෙන විචාරවයි කිවෝය. සිටාණෝ ඒ පණ්ඩිතයන් කෙළිමඩලෙන් ගෙන්වා එපවත් කියා පුත! අපි ගැම කිහිරිදණ්ඩහි අගමූල දැනගන්නට නොපොහොසතුම්හ. කිමෙක්ද? පුත තෙපි පොහොසතුදැයි විචාළහ. වියාණන් කී බස් අසා පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන්ට මේ කිහිරි දණ්ඩයි, අතින් වේවයි මූලින් වේවයි ප්‍රයොජනයෙක් නැත, මා විවසනු පිණිස එවන ලද්දේ වන්නේයයි සිතා ගෙනෙව කුඩාවරුනි! මම පොහොසත්මියි ගෙන් වාගෙන කිහිරිදණ්ඩ අතින් අල්වාගෙනම මේ අගය මේ මූලයයි දැනත් බොහෝදෙන සිත්ගන්නා පිණිස පැන් තලියක් ගෙන්වා කිහිරි දණ්ඩ මැදින් භූලනුවකින් බැඳ භූලනුව අග අල්වාගෙන කිහිරි දණ්ඩ දිය පිට තබාලූසේක. මූල බර බැවින් පළමුකොට දියේ ගැලිණ. ඉක්බිත් තෙන් ගසෙහි නම් මූල බරවේද? නොහොත් අග බරවේදැයි බොහෝදෙන විචාළසේක. හැමදෙනම පණ්ඩිතයන්වහන්ස! මූල බරවේදැයි කිහ. එසේ වීනම් කිහිරිදණ්ඩහි පළමුකොට ගැලුණු අත මූලයයි මේ සලකුණෙන් අගත් මූලත් වදළසේක. ගම්වැස්සෝද මේ අගය මේ මූලයයි රජ්ජුරුවන්ට කියා යැවූහ. රජ්ජුරුවෝ සතුටුව මේ අග මූල කවරෙක් දන්නේ වේදැයි විචාරා සිරිවඩ්ඪන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝයයි අසා සතුටුව කිමෙක්ද සෙනකය මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදැයි විචාළහ ඉවසුව මැනුව දෙවියන්වහන්ස! අනික් උපායකිනුත් විමසා ගසි නැවතුහ.

නවවැනිවූ ගැණු ඉසකින් හා පිරිමි ඉසකින් විමසූ ප්‍රශ්නය කෙසේ දෙසක්?—ඉක්බිත්තෙන් එක් දවසක් ගැණියාගේද, පිරිමියකුගේද හිස් දෙකක් ගෙන්වා මේ ගැණුහිසය මේ පිරිමිහිසයයි දනිත්වයි නොදන් නාහුගේ දහසක් දඩයසි නැහෙනහිරි යවමැදුම්ගම් වැස්සන්ට යැවූහ ගම් වැස්සෝ විහාග නොදන්නාහු හිස්දෙක ගෙන බෝසතාණන්වහන්සේ විවාළහ. උන්වහන්සේ හිස්දෙක දැකලාම මේ ගැණුහිසය, මේ පිරිමි හිසයයි දත්සේක. පිරිමි හිස මැස්ම වක්නොව ඉදිවයන්නේය, ගැණු හිස මැස්ම වක්වන්නේය, සරාටෙසියන්නේය. බෝසතාණන්වහන්සේ මේ සලකුණෙන් මේ ගැණුහිසය මේ පිරිමිහිසයයි ගම්වැස්සන්ට වදාළසේක. ගම්වැස්සෝ රජ්ජුරුවන්ට ඉස් දෙක තෝරා යවූහ, රජ්ජුරුවෝ විවාළ නියාවද සෙනක පණ්ඩිතයන් වැලකූ නියාවද පෙරසේමැයි.

දසවැනිවූ සජියන් දෙදෙනාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදසක්? නැවත එක් දවසක් නසකු හා සැපින්නක ගෙන්වාගෙන මේ සජියාය, මෝ සැපින්නයයි දනිත්වායි නොදන්නහු නම් දහසක් දඩයයි නැහෙනහිරි යවමැදුම ගම්වැස්සන්ට යවූහ. ගම්වැස්සෝ නොදන්නාහු පණ්ඩිතයන්වහන්සේ විවාළහ. පණ්ඩිතයන්වහන්සේ දෑසලාම දැනගත්සේක. සජියාගේ නහුට මහත්වන්නේය, සැපින්නගේ නහුට සිහින්වන්නේය, සජියාගේ හිස මහත්වන්නේය, සැපින්නගේ හිස දික්වන්නේය. සජියාගේ ඇස් වටවන්නේය, මහත්වන්නේය, සැපින්නගේ ඇස් දක්ව කුඩාවන්නේය, සජියාගේ පෙණය හාත්පසින් සම්පූර්ණව තිබෙන්නේය, සැපින්නගේ පෙණය එහා දිහාවකින් සැහැපුවාසේ අඩිව තිබෙන්නේය, මේ සලකුණෙන් මේ සජියාය, මෝ සැපින්නයයි වදාළසේක. සෙස්සයට කියනලද්දාවූ ක්‍රමය මැයි.

එකොළොස්වැනිවූ කුකුළාගෙන් විමසූ ප්‍රශ්නය කෙසේදසක්?—ඉක් බිත්තෙන් එක් දවසක් නැහෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ සඟිාංගයෙන් ධවලවූ, පය අං ඇති ඉස මොළලියක් ඇති කාලත්‍රය නොසික්මවා හඬන්නා වූ ශොනකු එවත්වයි ඉදින් නොඑවුනම් දහසක් දඩයයි කියා යවූහ. ඒ ගම්වැසසෝ ප්‍රශ්නයෙහිවිභාගනොදන්නාහු පණ්ඩිතයන්වහන්සේවිවාළහ. පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවෝ තොප අතින් හැළිකුකුළකු ගෙන්වතියි වදාළසේක. කුකුළා වනාහිපය පොරකටුඇති බැවින් පය අංඇත්තේ නම; ඉස මල් ඇති බැවින් ඉසමොල්ලියක් ඇත්තේ නම, ත්‍රසව දිඝී ප්ලුත යන කුන්කාලයට උච්චාරණ ශුඛකොට හඬ නහන හෙයින් කාලත්‍රය නොසික්මවා හඬින්නේ නම. එසේහෙයින් මෙබඳු කුකුළකු යවව්යයි වදාළසේක. ගම්වැස්සෝද එබඳු කුකුළකුයවූහ.

දොළොස්වැනිවූ මැණිකකින් විමසූ ප්‍රශ්නය කෙසේදසක්?—ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් **කුසරාජ්ජරුවන්ට** දුන් මැණිකතෙමේ අටහැනිනින් වක්වූයේය. ඒ අටවක් මැණිකෙහි ශක්‍රයන් ඇවුණු පුරාතන හුය දිරාගොස් කැඩිගියේය. පරණහුය හැරපියා අලුත් හුයක් අවුණාලන්නට කිසිවෙක් නොපොහොසත්ය. එක් දවසක් මේ මැණිකෙහි පරණ දිරාගිය හුය හැරපියා අලුත් ලනුවක් ලවත්වායි කියා නැහෙනහිරි යවමැදුම් ගම්වැස්සන්ට

වෙදෙහ රජ්ජුරුවෝ යවූහ. ගම්වැස්සෝ පරණහුය අරින්නටත් අලුත් හුය ලන්නටත් නොහැක්කාහු තමන්ට නොපිළිවන් බව මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට කිවාහුය. පණ්ඩිතයන්වහන්සේ තෙපි නොසිතව මී ටික ගෙන්වාගනුවයි කියා ගෙන්වාගෙන මැණිකෙහි දෙතොළවර සිදුරෙහි මී කිත්දු ගල්වා පලස් හුසින් ලනුවක් අඹරා ලනු අග මියෙහි ගලා මිදක් මැණිකේ සිදුරට වද්දලා කුහුඹුවන් නික්මෙන බිලයක තබාලූසේක. කුහුඹුවෝ මියෙහි ගඳින් බිලයෙන් නික්ම මැණිකෙහි දිරුයිය පරණ හුය කාගෙන පලස්හු අග බැගෙන යටින් අදනාහු අනික් ඇලයෙන් විවත් කොටපිහ. පණ්ඩිතයන්වහන්සේ මැණිකෙහි ලනුව ඇවිණි හිය බැව් දැන ගෙන රජ්ජුරුවන්ට දෙවයි කියා ගම්වැස්සන්ට මැණිය දුන්සේක. ගම් වැස්සෝ රජ්ජුරුවන්ට යවූහ. රජ්ජුරුවෝ ලනුව ඇවිණු උපාය අසා සතුටු වූහ.

නෙළෙස්වැනිවූ විජාඝනප්‍රශ්නය කෙසේදයත්?—එක්දවසක් වනාහි රජ්ජුරුවන්ගේ මඟුල් ගොනු උදු බොහෝකොට කවා බඩ මඟත්කොට හම් සකස්කොට සිඹාංගයෙහි තෙල් ගල්වා කසා නාවා නැහෙනහිරි යවමැදුම් ගම් ඇත්තන්ට "තෙපි නුවණැත්තෝල මේ රජ්ජුරුවන්ගේ මඟුල් ගොනාය පිහිටි දරුගබ් ඇත්තේය. මොහු වදවාපියා වස්සා සහිතකොට එවව්, එසේ නොඑවූවොත් දහසක් දඩයයි යවූහ. ගම්වැස්සෝ මේ ගොනු දරුවන් වදන්නට නොපිළිවන, කුමක්කරමෝදෝයි පණ්ඩිතයන්වහන්සේ විචාළහ. උන්වහන්සේ සමාන පැනයකින් විසඳියයුතුයයි සලකා රජ්ජුරුවන් හා සමඟ කියන්නට එක් බුහුටි පුරුෂයෙක් කැඳවූහ. ඉක්බිත්තෙන් මහ බෝසතාණන්වහන්සේ එව, පින්වත් පුරුෂය! තෝ තාගේ ඉසක්ගේ පිටමැද හෙලාගෙන නොයෙක් පරිද්දෙන් මහ විලාප කියා හඬ හඬා රජගෙයි වාසල ටයා. සෙස්සවුන් විචාරනලදුයෙහි කිසිවක් නොකියා මහරජ්ජුරුවන් විසින් ගෙන්වාහඬන කාරණා විචාරනලද්දෙහි දෙවයන්වහන්ස! මපියාණෝ වදගතනොහි අදට විලිපහරනේ සද්දවසය, මට පිළිසරණ වුවමැනව, වදන උපායෙක් වදුලමැනවයිකියා රජ්ජුරුවන් විසින් කිමෙක්ද?තා නන්දෙඩයිද? මේ කාර්ණයෙක් නොවෙයි, පිරිමින් වදන්නාහු නැතැයි කියාල්හි දේවයන් වහන්ස! එසේවීනම් නැහෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ මඟුල් ගොනා වදවද්දැයි විචාරවයි වදුලසේක. ඒ පුරුෂයාත් මහබෝසතාණන් වදුල වචනය පිළිගෙන වදුල පරිද්දෙන්ම කෙළේය. රජ්ජුරුවෝ සමාන ප්‍රශ්නය කා විසින් සිතනලදදැයි විචාරු මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

තුදුස් වැනිවූ පැසිඛතින් විමසූ ප්‍රශ්නය කෙසේදයත්?—එක් දවසක් පණ්ඩිතයන් විමසම්හයි කියා නැහෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ අපට අට කාරණයකින් සමන්විතවූ පැසි ඛතක් පිස එවත්වයි පැසිඛත කියන්නේ මේ අට කාරණයයි= සාලිනුත් නොපිසුව මැනව, දියෙනුත් නොපිසුව මැනව,සැළි යෙනුත් නොපිසුව මැනව, ගින්නෙනුත් නොපිසුව මැනව, දරුඳුනලාත් නොපිසුව මැනව, මෙසේවූ පැසිඛත ගැණියක අහත් නොඑවුම් මැනව, පිරිමියකු අහත් නොඑවුව මැනව, මහෙකත් නොඑවුව මැනව, මේ අට කාරණයෙන් යුක්ත පැසිඛත නොඑවුවහොත් දහසක් දඩයයි කියා යවූහ. උන්

වහන්සේ නොසිහවයි සිය නොසැලෙන්නම් සුන්සැල්ගෙන, නොදිය නම් පිනිදිය ගෙන නොසැළිය නම් අතින් බදනත් ගෙන, නොඋදුනන්නම් අලුත් කණුගසා, නොගිනින්නම් පියවිගිනි හැර දමෙන්නෙහෙළු ගිනිගෙන, නොදර ආම් පරඩලා ගෙන, පැසිබන වසවා අලුත් බදනා ලා අස් ඔබා නොගැණු නොපිරිමියකු නම් නපුංසකයකු ඉස නබාලා නොමකින්නම් මාවත පියා පිය හසරකින් රජ්ජුරුවන්ට යවයි කියේය. රජ්ජුරුවෝ ප්‍රශ්නය කා විසින් විසඳනාලදදැයි විචාරා මහෞෂධ පණ්ඩිතයන් විසිනැයි අසා සතුටුවූහ.

පසළොස්වැනිවූ වැලියොතින් විමසූ ප්‍රශ්නය කෙසේදයන්?—එක් දවසක් පණ්ඩිතයන්වහන්සේ විමසතු පිණිස, නැහෙනහිර යවමැදුම් ගම් ගම්වැස්සන්ට අස්නක් යවූහ. ඒ කෙයේවූ අස්නක්ද යත්?—රජ්ජුරුවෝ ඕවිල්ලෙහි සොළොස් කැමැත්තෝය, පරණ වැලියොත කැඩියේය. එක් වැලියොතක් අඹරා එවන්වයි, නොඑවූ නම් දහසක් දඩයයි කියා යවූහ. ඒ අර්ථය නොදුන පණ්ඩිතයන්වහන්සේ විචාළහ. පණ්ඩිතයන්වහන්සේ මේ පැනයන් සමාන පැනයකින්ම විසඳිය යුතුයයි සිතා ගම්වැස්සෙනි! නොසිතවයි අස්වසා කියමෙහි බිණිමෙහි දක්ෂවූ පුරුෂයන් දොතුන්දෙනකු බණවා යව ගොස් රජ්ජුරුවන්ට කියව දෙවයන්වහන්ස! ගම්වැස්සෝ ඒ වැලියොතෙහි සින් වේවයි දළ වේවයි පමණ නොදන්නාහ. පරණ වැලියොතින් වියහක් පමණ රිණමාල්ලක් එව්ව මැනව. ඒ වැලිරිණමාල්ල බලා ඊ සින් දළ පමණින් වැලියොතක් අඹරන්නාහයි කියව, ඉදින් තොපට රජ්ජුරුවෝ අපගේ ගෙයි වැලියොතක් නම් කයිසලෙකත් නොවූවිරුයයි කියත් නම් එසේ කි රජ්ජුරුවන්ට වැළි දෙවයන්වහන්ස! ඉදින් එසේවී නම් නැහෙනහිර යවමැදුම් ගම්වැස්සෝ කෙසේ වැලියොතක් අඹරා එවද්දැයි කියාලව" යි යවූසේක. ඒ පුරුෂයෝ මහබෝසතාණන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝද ඒ අසා මේ සමාන පැනය කා විසින් සිතන ලදදැ යි විචාරා මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ විසිනැයි අසා සතුටුවූහ.

සොළොස්වැනිවූ පොකුණකින් විමසූ නමාභ ප්‍රශ්නය කෙසේදයන්?—එක් දවසක් රජ්ජුරුවෝ දියකෙළිනා කැමැත්තෝය. රතන, නීල, සෙහාදී පස්පියුමෙන් ගැවසීනත් පොකුණක් එවත්වයි එසේ නොඑවූ නම් දහසක් දඩය" යි නැහෙනහිර යවමැදුම් ගම්වැස්සන්ට කියා යවූහ. ගම්වැස්සෝ ඒ අර්ථය නොදුන පණ්ඩිතයන්වහන්සේට දන්වූහ උන්වහන්සේ මෙයින් සමාන ප්‍රශ්නයකින් විසඳිය හැක්කැ"යි සිතා" මුඛරිවූ මිනිසුන් කිපදෙනකුන් කැඳවයි සිය, නෙනාකල්හි ඒ පුරුෂයන්ට මෙසේ කිවුය. පෙපි දියකෙළ ඇස් ඔලිඳුටසේ රත්කොට නෙත් ඉසකේ ඇතිව අදනාලද නෙත් ඔළු ඇතිව මඩ වැකුණු ශරීර ඇතිව වියදඬු කැවිටි, බහන්, කැටමුහුරු, ගත් අත් ඇතිව රජගෙයි වහසලටත් ගොස් වාහලෙහි සිටි බැව් රජ්ජුරුවන්ට කියා යවා රජ්ජුරුවන් විසින් එන්නේ යයි කියනලද අවකාශ ඇතිව රජගෙට වැද, දෙවයන්වහන්ස! නුඹවහන්සේ විසින් වහාම නැහෙනහිර යවමැදුම් ගම්වැස්සෝ පොකුණක් එවත් වයි කියා යවනලද හෙයින් අපි නුඹවහන්සේට දියකෙළනට සුදුසුවූ පස් පියුමෙන් සැදුණු පොකුණක් ඇරහෙන ආම්හ. ඒ පොකුණ තමා මේ නෙහි වැසගත් බැවින් නුවර දැක අටවාල පවුරු පදනම් අගල හා වාසල්

ආදිය බලා වෙව්ලා හසින් බහින් කඩාගෙන ගොස් වලටම හියාය. අපි කැටුම්නුරා ආදීන් මරාද නවතාගත හුහුතමිහ. හුඹවහන්සේ මිසින් හිය දවස වලින්ලද පොකුණක් එවිඳ දැනව. ඒ පොකුණ හා අපගේ පොකුණ එක්කොට යොදා ගෙනෙම්හයි. කියා රජ්ජුරුවන් විසින් කිසිකලෙකත් මා විසින් පොකුණක් නොගෙන්වනලද විරුය, කිසිවක්නව මා විසින් එක්කොට යොදා ගෙනෙන පිණිස පොකුණක් නොයවනලද විරුයයි කී කල්හි ඉදින් දෙවයන්වහන්ස! එසේවීනම් නැගෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ කෙසේ පොකුණක් ඔබවහන්සේට එවද්දැයි කියවයි යවූසේක. උසිත් බෝසතාණන්වහන්සේ වදාළ ලෙසම කළහ. රජ්ජුරුවෝ ඒ මිනිසුන් අතින් කාවුරුන් විසින් මේ පැනය විමසන ලදදැයි විචාරා පණ්ඩිතයන් විසිනැ'යි අසා සතුටුවූහ.

සනලොස්වැනිවූ උඩැනින් විමසූ ප්‍රශ්නය කෙසේදයන්?-

නැවත එක්දවසක් අපි උයන්කෙළි කෙළනා කැමැත්තම්හ. අපගේ උයන පරණව ගියේය. නැගෙනහිරි යවමැදුම් ගම්වැස්සෝ වව්පකාශොක වකුල නිලකාදීන් සුපුෂ්පිත තරුවරාකිණි අලුත් උයනක් එවත්ව"සි කියා යවූහ. පණ්ඩිතයන්වහන්සේ මෙසිත් පැනයකින් විසඳිය යුතුය"සි ගම්වැස්සන් අස්වසා මුඛරි මිනිසුන් කිපදෙනකුන් කැඳවා පෙර පොකුණට කියා යවූ පරිද්දෙන්ම කියා යවූසේක. එදවසුත් රජ්ජුරුවෝ සතුටුව සෙනක පණ්ඩිතයන්ට කියන්නාහු "පණ්ඩිතයන් ගෙන්වාගනුමෝදූ"සි විචාළහ. එහෙමේ ලාභ මිතසයිනිසා මෙපමණකින්ම පණ්ඩිතනම්නොවෙති, ඇම්මුණවසිකිය.

ඒ සෙනකයාගේ බස් අසා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයෝ තුමූ වැලිකෙළියෙහි පවත් පඤ්ඩු මාණ්ඩ ප්‍රශ්නය ආදිවූ ප්‍රශ්න සතින්ම මාසිත් ගත්තාහ. මේබදු උන්ගේ දැඩිවූ පැන විසඳිමෙහිද අප විසින් යවන ලද්දාවූ ප්‍රශ්නවලට සමානවූ ප්‍රශ්න චින්තායෙහිද උන්ගේප්‍රශ්න විසඳීනය බුදුකෙනකුන්වහන්සේගේ ප්‍රශ්න විසඳීනයක් හා සමානය. සෙනකයා මේබදුවූ පණ්ඩිතයන් ගෙන්විය නොදෙයි, සෙනකයාගෙන් මධ්‍යාඅයිකම්දැයි ඒ මහෞෂධ පණ්ඩිතයන් ගෙනෙන්සි මහත්වූ හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් යුතුතව පණ්ඩිතයන් වහන්සේ වසන නැගෙනහිරි යවමැදුම් ගමට යන්නට නික්මුණාහ් මහලසු නැගීගෙන යන්නාවූ රජ්ජුරුවන්ගේ මහුලසුගේ පය පැකිලී වළක වැටී බිඳිගියේය. රජ්ජුරුවෝ එතැනම සිට නැවතී නුවරට වන්නාහ. ඉක්බිත්තෙන් අතරමඟ සිටආ වෙදෙනා රජ්ජුරුවන් සමීපයට සෙනක පණ්ඩිතයෝ එළඹ දේවඋන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන් ගෙනෙන්නට යවමැදුම් ගමට වැඩිසේක්වේදැයි විචාළහ. එසේය පණ්ඩිතයෙනියි රජ්ජුරුවෝ කීහ. දෙවයන්වහන්ස! මා අවැඩකරුකොට දත්සේක. තවත් ඇම්මුණ මැනවයි සිතද්දිත් ඉතා ඉක්මන්ව ගොස් ආදිම යන නමනේ මහුලසුගේ පය බිඳී ගියේවේදැයි කීහ රජ්ජුරුවෝ සෙනක පණ්ඩිතයන් කී බස් අසා තුෂ්ණීම්භූතව නැවත එක්දවසක් සෙනකයන් හා සමඟ කථාකරන්නේ සෙනක පණ්ඩිතයෙනි! මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වමෝදැයි විචාළහ. එසේවීනම් දෙවයන්වහන්ස! හුඹවහන්සේ නොගොස් පණ්ඩිතයෙනි! තොපගේ සමීපයට එන්නාවූ අපගේ මහුලසුගේ පය බිඳිගියේය. අඟුතරයකු නෝ ශ්‍රේෂ්ඨතරයකු එවයි මෙනෙවරකරන්නෙකු යැව්ව මැනව, ඉදින් අඟුතරයකු එවත්නම් තුඹුම එන්නාහ. ශ්‍රේෂ්ඨතරයකු එවත්නම් පියාණන්

එවන්නාහ. මේ තෙමේ අපට ප්‍රශ්නයෙක් වන්නේමයයි කිහ. රජ්ජුරුවෝ ඝනපතැයි හිටිස සෙනසඟන් කිලෙසම් කියා මෙහෙවර කරන්නකු යවූහ.

පණ්ඩිතයන්වහන්සේ මෙහෙවර කරන්නහුගේ බස් අසා රජ්ජුරුවෝ මාද මසියාණන්වහන්සේද දක්නා කැමැත්තෝයයි සිතා පියාණන් වහන්සේ සමීපයට ගොස් වැඳලා පියාණන්වහන්ස! රජ්ජුරුවෝ නුඹ වහන්සේද මාද දක්නා කැමැත්තෝය, නුඹවහන්සේ පළමුකොට සිටුවරුන් දහසක් පිරිවරා වැඩිය මැනව, වඩනාසේක්ද සිසතින් නොගොස් අලුත් හෙළහිතෙල් පිරූ සදුන් කරඬුවක් හැරගෙන වැඩිය මැනව, රජ්ජුරුවෝ නුඹවහන්සේ හා සමඟ පිළිසඳර කථාකොට සුදුසු අස්නක් බලා හිඳුවයි කියති, නුඹවහන්සේ එබඳු අස්නක් පරීක්ෂාකොට හුන මැනව, නුඹවහන්සේ කථාකොට නොට හුන් වේලෙහි මම එම්, රජ්ජුරුවෝ මා හා සමඟත් පිළිසඳර කථාකොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක් බලා හිඳුවයි කියති. ඉක්බිත්තෙන් මම නුඹවහන්සේගේ මූණ බලමි, ඒ සලකුණෙන් හුනස්තෙන් නැඟී සුවඳ මිහෙණෙඹ පණ්ඩිතයෙනි! මේ අස්නේ හිඳුවයි වදාළ මැනව. එසේ කල්හි එක් පැනයෙක් අපට වන්නේයයි වදාළසේක.

සිවාණෝ ඝනපතැයි හිටිස පුතණුවන්ද කී සැටියේම ගොස් තමන් වාසල සිටිබව රජ්ජුරුවන්ට කියා යවා එන්නේයයි කියා යැවූකල්හි රජ ගෙට වැද රජ්ජුරුවන් වැඳ එකත්පස්ව සිටියහ. රජ්ජුරුවෝ සිවාණන් හා සමඟ කථාකොට සිවාණෙනි! තොප පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ කොසිදැයි විචාළසේක. පස්සෙහි එහි දෙවයන්වහන්සැයි කිහ. රජ්ජුරුවෝ එහි යනු අසා සතුටු සිත් ඇතිව තොපට සුදුසු අස්නක්බලා හිඳුවයි කිහ. සිවාණෝ තමන්ට සුදුසු අස්නක් බලා එකත්පස්ව හුන්නාහ. මහබෝසතාණන්වහන්සේද සම්පූර්ණාභරණයෙන් සැරහුණුසේක් කුමාරවරුන් දහස විසින් පිරිවරනලදුව සරහනලද උතුම් රථයක හිඳ නුවරට වදනාසේක් අගල පිටතණ කත එක් කොවළුවකුදුක ශක්තිසම්පන්න තරුණපුරුෂයන්ට මේ කොට ළුවා ලුහුබඳවාගෙන යම් පරිද්දකින් ශබ්දනොසොරේද එපරිද්දෙන්ම ඔහුගේ මුඛය බඳිනයකොට එක් පරක්කුවකින් කරතබා නොපෙන්නා ගෙන එවයි වදාළසේක. ඒ මානවකයෝ බොධිසත්වයන් වදාළ ලෙසම කළහ. බොධිසත්වයන්වහන්සේ ද මහත් පිරිසින් යුක්තව ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන් නුවරට වන්සේක.

බොහෝදෙන සිරිවඩන සිවාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝනම් මූල, උපන්නානු බෙහෙත් ගුළියක් අතින්ගෙන උපන්නෝනම් මූල, ඒමසු මෙතෙක් ප්‍රශ්නයන්ගේ අවි විභාගය දත්තෝ හෙවත් පැන විසඳුවෝ මල යි මහබෝසතාණන් වහන්සේට සතුතිකරන්නාහු තෘප්තියට නොපැමිණෙන්නාහ. පණ්ඩිතයන්වහන්සේ රජගෙයි වාසලට ගොස් තමන් වහන්සේ ආ පවත් දෙරටුපාලයා අත කියා යවූසේක. රජ්ජුරුවෝ ඇසූ පමණින්ම හුටුපහටුව මපුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ වහා එත්වයි කිහ. මහබෝසතාණෝ කුමරුන් දහස පිරිවරා පහසට නැඟ රජු වැඳ එකත්පසෙක සිටිසේක. රජ්ජුරුවෝ ඔහු දැක සොම්නසට පැමිණ මිහිරි කථා කොට පණ්ඩිතයෙනි! සුදුසු අස්නක්බලා හිඳුවයි කිහ. පණ්ඩිතයන්වහන්සේ පියාණන්ද මූණ බැලූසේක. ඉක්බිත්තෙන් උන්වහන්සේගේ පියාණෝ බැලූ සලකුණෙන් අස්නෙන් නැඟී පණ්ඩිතයෙනි! මේ අස්නේ හිඳුවයි කිහ. පණ්ඩිතයන්වහන්සේ ඒ අසමින් පියාණන් හුන් අස්නෙහි වැඩහුන්සේක.

පියාණන් අස්නෙන් නහාපියා ඒ අස්නෙහි උන්නාවූ පණ්ඩිතයන් දැකලාම සෙනහ ප්‍රත්‍යුස නාවිඳ දෙවිඳ යන පණ්ඩිතවරු සතරදෙනද සෙසු හුවණැ තාහුද අත්ලෙන් අත්ල ගසා මහත්සොට සිනාසී මේ හුව ණනැත්තහු හුවණැත්තෝයසි කියති, ඒ හෙමේ පියාණන් අස්නෙන් නහා පියා හෙමේ ඒ අස්නෙහි උන්නේය, මොහු හුවණැහැසි කියන්නට සුසති නොවන්නේයසි වෙහෙසුය, රජ්ජුරුවෝ දුර්මුඛවූහ.

ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ දුර්මුඛව උන් රජ්ජුරු වන්වහන්සේට කිමෙක්ද දෙවයන්වහන්ස! කණස්සල්ල සේක්දැයි විචාළසේක එසේය පණ්ඩිතයෙනි! කණස්සල්ලෙමි, තොපගේ සවරූප ඇසිමෙන් සිත් ගත දැක්මෙන් සිත් නොගැනැයි කිහ. මාගේ සවරූප ඇසිමෙන් සිත් ගත් නෙත් දැක්මෙන් සිත් නොගත්හෙත් කුමක් නිසාදැයි විචාළසේක පියාණන් අස්නෙන් නහා හුන් හෙයිනැයි කිහ. කිමෙක්ද දෙවයන්වහන්ස! හුඹ වහන්සේ හැමතන්හිම පුතුන්ට වඩා පියෝම උතුම්හයි කියනසේක්දැයි විචාළසේක එසේය පණ්ඩිතයෙනි! කිහ. ඉක්බිත්තෙන් මහබෝසතාණෝ රජ්ජුරුවන්ට දෙවයන්වහන්ස! හුඹවහන්සේවිසින් අපට අඥචතුරයකු හෝ ශ්‍රේෂ්ඨතුරයකු හෝ එවන්නේයසි අසුන් යවනලද්දේවේදැයි කියා හුනස් නෙන් නැඟි කොටළුවා ගෙනා මානවකයන් මුණ බලා තොප විසින් ගන්නා ලද කොටළුවා ගෙනෙවයි ගෙන්වා ගෙන රජ්ජුරුවන්ගේ පාමුල නොවාලා දෙව යන්වහන්ස! මේ කොටළුවා කෙතෙක් අගීදැයි විචාළසේක. රජ්ජුරුවෝ ඉදින් උපකාර ඇත්තේවිනම් අටමස්සක් අගනේයසි කිහ. මු නිසා සෙසුවූ කුලයෙහි වෙළඹ බඩ උපන් ආජානීය අශ්වයා කෙතෙක් අගීදැයි විචාළසේක. පණ්ඩිතයෙනි! අගය නැතැයි කිහ. දෙවයන්වහන්ස! කුමක් හෙයින් එසේ කියනසේක්ද? හුඹවහන්සේ විසින් දැන් හැමතන්හිම පුතුන්ට වඩා පියෝම උත්තමයහයි කියන ලද්දේවේද? ඉදින් ඒ සැබෑවිනම් හුඹවහන්සේගේ වාද යෙහි ආජානීය අශ්වයාට වඩා කොටළුවා උතුම්වන්නේය, කිමෙක්ද දෙව යන්වහන්ස! හුඹවහන්සේගේ පණ්ඩිතවරු මෙපමණකුත් දැනගන්නට අස මර්ථව අත්ලෙන් අත්ල ගසා සෙන්නාහ. හුඹවහන්සේගේ පණ්ඩිතවරුන්ගේ හුවණ විශෙෂය ආශ්චර්‍යය, හුඹවහන්සේ කොයින් මුන් අත්පත්ගා ලත් සේක්දැයි පණ්ඩිතවරුන් සතරදෙනාට පරිභව බැණ රජ්ජුරුවන්ට ගද්‍ය ප්‍රශ්නයෙහි එම කාරණා ගාථාවකින් කියා, දෙවයන්වහන්ස! පුතණුවන්ට වඩා පියාණෝ උතුම්නම් මපියාණන් හුඹවහන්සේට වැඩපසස්නා පිණිස ගතමැනව, ඉදින් පියන්ට වඩා පුත්‍රයෝ උත්තමයෝ නම් මා හුඹවහන්සේ සඩමීපයෙහි රදවාගත මැනවයි වදාළසේක. රජ්ජුරුවෝ සොම්නස්වූහ. සියලු රාජපර්ෂද් පණ්ඩිතයන් විසින් ප්‍රශ්නය මනාකොට කියනලදැයි ඔල්වරහඬ ගසමින් සාධුකාර ශබ්දපැවැත්වූහ. අසුරාසන්ද දහස්ගණන්පිළී ඉසතැවිළිද පැවැත්වූහ. සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන දුර්මුඛවූහ.

(මවුපියන් ගුණ දන්නට බොධිසත්ත්වයන්වහන්සේ හා සමානයෙනෙක් නැත. වැළි උන්වහන්සේ කුමක් නිසා පියාණන්වහන්සේ අස්නෙන් නහා ඒ අස්නෙහි වැඩඋන්සේක්ද යත්? පියාණන්දැට අවමානයෙක් පිණිස නොවෙයි, රජ්ජුරුවන් විසින් අඥචතුරයකු හෝ එවන්නේය, ශ්‍රේෂ්ඨතුරයකු හෝ එවන්නේයයි අසුන් යවනලද හෙයින් ඒ පැනය විසඳන පිණිසත්

නම්වහන්සේත් නුවණැති බව අහවත පිණිසත් සෙනහාදි පණ්ඩිතවරුන්ගේ සාරදෙනාගේ නුවණින් බැබලීම නැතිකරන විතිසත් මෙසේ නොලෝයයි දත යුතු.)

ගද්‍රභ ප්‍රශ්නයයි.

රජ්ජුරුවෝ ගද්‍රභ ප්‍රශ්නයාගේ විස්සජ්ජිතයෙහි සතුටුව සුවඳ පැන් පිරූ රන් සොණ්ඩිකාව අතින් ගෙන නැහෙහිරි යවමැදුම්ගම පමුණුකොට අනුභව්‍යාවයි සිටාණන් අත පැන් වත්කොට සෙසු දහසක් සිටුවරු සිරිවඩ්ඪන සිටාණන්ම සම්මත වෙන්වයි කියා බෝසතාණන් වහන්සේගේ මැනියන්දුව සිටුතාන් තෝඩු හැලි වැල් පවටකාර පාසලඹ පාදජාලාදිවූ සියලු සත්‍රී ආභරණයා සොටළු පැනයෙහි පහන්ව මහබෝසතාණන්වහන්සේ දරුකොට ඉඹාගන්නා පිණිස මහසිටාණන්ට සිටාණෙනි! මහෞෂධ පණ්ඩිතයන් මට දරුකොට දෙවයි කිහ.

සිටාණෙනි දෙවයන්වහන්ස! දරුවෝ තවම ළදරුවෝය, අද දක්වාත් දරුවන් හුඩ කිරි සුවඳ අමයි, වැඩිගත්කල නුඹවහන්සේ සම්පයෙහි වසන්නේයයි කිහ. සිටාණෙනි! මේවක් පවන් පණ්ඩිතයන් කෙරෙහි ආලය හරුව, මූ අදපටන් මිපුතණුවෝය, මම මාගේපුතණුවන් රක්නටපොහොසත්මි නෙපියවයි සිටාණන්ට ගම්මයන්නට සමුදුන්හ. සිටාණෙනි රජ්ජුරුවන්වැඳ පුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් සිපගෙළහි හොවාගෙන ඉඳ සිඹ පුතණුවන්ට අවවාදදුන්හ. උන්වහන්සේ සිටාණන් වැඳ පියාණන්වහන්ස! නොසිතුව මැන වැසිකියා පියාණන් සවූසේක. රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ අතුළුනදි කව්ද? නොහොත් පිටනදි කව්දැයිවිචාළහ. උන්වහන්සේ මාගේ පරිවාර බොහෝය, මා විසින් පිටනදි බත් අනුභව කිරීම සුදුසුයයි සිතා පිට නදී අනුභව කෙරෙමියි වදුළසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේට සුදුසු ගෙයක් දී කුමාරවරුන් දහස ආදිකොට සියලු පරිවාරයට විශ්‍රම දෙවා සියලු උපකරණ ගෙහිලා දෙවූහ පණ්ඩිතයන්වහන්සේ එතැන්පටන් කොට රජ්ජුරුවන් සම්පයෙහි අනුශාසනා කෙරෙමින් සිරිසේක.

රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේ විමසනු කැමැතිවූහ. එසේනම්හි නුවර දකුණු වාසලට නුදුරුවූ තන්හි පොකුණුතෙර එක් තල්ගසක් උඩ නවුඩු කැදල්ලෙක මිණිරුවනෙක් වූයේය. ඒ මැණිරුවන ඡායාව පොකුණෙහි පෙනෙන්නේය. පොකුණෙහි මැණිකකැයි රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ සෙනකයන් කැඳවා පොකුණෙහි මිණිරුවනක් පෙනේල, ඒ මැණික කෙසේ ගනුමෝදැයි විචාරා සෙනකයන් විසින් පැන් ඉස්සවා පියා ගන්නාබව සුදුසුයයි කී කල්හි එසේවීනම් එලෙසම කරවයි සෙනකයන්ට භාරකළහ. සෙනකයෝත් බොහෝ මිනිසුන් රැස්කරවා පොකුණෙහි දියත් ඔඩත් අරවා බිම් කණවා මැණික නුදුටුවාහ. නැවත පොකුණෙහි දිය පිරී ගිය කල්හි මැණිකෙහි ඡායාව පෙනෙන්නේය. සෙනකයෝ නැවත නැවත එසේකරවා මැණික නුදුටුවාහුමය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ කැඳවා පොකුණෙහි මැණිකොක් පෙනෙන්නේය. සෙනසුරෝ දියත් මඩත් අරවා බිම බිඳ මැණික නුදුවූවාහ, පොකුණෙහි දිය සිරි හිය කල නැවතත් පෙනෙයි. මෙය ගන්නට පොහොසතුදැයි විචාළසේක. උන්වහන්සේ දෙව යන්වහන්ස! ඒ බැරිතැනෙවෙයි වැඩියමැතව, නුඹවහන්සේට මැණික පාමියි වදාළසේක. රජ්ජුරුවෝ මැණික පාමියි කී බසින් සතුටුවූ අද පණ්ඩිත යන්ගේ නුවණෙහි බල දකුම්හයි කියා බොහෝදෙනා විසින් පිරිවරනලදුව පොකුණු තෙරට ගියහ. මහබෝසතාණෝ පොකුණුතෙර සිටි මැණික බලන සේක්ම මේ මැණික පොකුණෙහි නොවෙයි, මේ තල්ගස උඩ විය යුතුයයි දැන දෙවයන්වහන්ස! පොකුණෙහි මැණික නැත.යි කියා පෙනෙන්නේ මැණික නොවිදුසි කී කල්හි පැන්තලියක් ගෙන්වා බැලුව මැනව, දෙව් යන්වහන්ස! මේ මැණික පොකුණෙහි ම පැතු පෙනෙන්නේ නොවෙයි, තලි යෙහිත් පෙනෙන්නේයයි කියා රජ්ජුරුවන් විසින් පණ්ඩිතයෙනි! මැණික කොසිං වියයුතුදැයි කී කල්හි දෙවයන්වහන්ස! පොකුණෙහි ඡායාවම් පෙනෙන්නේය. මැණික පොකුණෙහි නොවෙයි, මැණික වනාහි මේ තල් ගස උඩ කවුඩු කැදැල්ලේය. මිනිසකු නංවා බැංගත මැනවැයි වදාළසේක. රජ්ජුරුවෝ බොධිසත්වයන්වහන්සේ වදාළ ලෙසම මිනිසකු නංවා මැණික බැවූහ. පණ්ඩිතයන්වහන්සේ ඒ මැණික තමන් අතට ඇරගෙන රජ්ජුරු වන් අහ තුබුසේක. බොහෝදෙන පණ්ඩිතයන්වහන්සේට සාධුකාර දී සෙනස පණ්ඩිතයන්ට බණින්නාහු මැණික තල්ගස උඩ තිබැද්දි සෙනසුරෝ දුන්නක් දමාගිය එසක්හු කළයෙහි අඟුරුනාසේ ශකුනිමින් ප්‍රාණයන් ලවා පොකුණම බිඳිය. නුවණැතිවතොත් මහෞෂධ පණ්ඩිතයන්සේ වියයුතු යයි මහබෝසතාණන්වහන්සේට සතුතිකළහ. රජ්ජුරුවෝ බොධිසත්වයන් වහන්සේට සතුටුව තමන් කර පැලඳි රන් ලඤ්ඡයක් පුස්නා ඇත්හරයදි කුමාරවරුන් දහසට මුතුපට දුන්නාහ. රාජසෙවයට එනවිට මේ පැලඳගෙන එන්නේයයි මහබෝසතාණන්වහන්සේවද කුමාරවරුන් දහසවද සම්මත කළහ.

මාංශ ප්‍රශ්නය ආදිවූ පැන දසනවය නිමි.

නැවත එක් දවසක් රජ්ජුරුවෝ පණ්ඩිතයන් හා සමඟ උයනට ගියාහ. එදවස එක් බොහොඩෙක් තොරණ අග වසන්නේය. ඒ තෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක තොරණ අඟින් බැස බිම වැඳහොත්තේය. රජ්ජුරුවෝ ඒ බොහොඩාගේ ක්‍රියාව බලා මහෞෂධ පණ්ඩිතයෙනි! මේ බොහොඩා කුමක් සෝරැදැයි විමාළහ. දෙවයන්වහන්ස! නුඹවහන්සේට සෙවය කරන්නේයයි වදාළසේක. රජ්ජුරුවෝ ඉදින් එසේවීනම් අපට කරන සෙවය සිස් නොවෙයි, ඕහට වසතුවක් දෙවයි කිහ. බෝසතාණන් වහන්සේ දෙවයන්වහන්ස! ඕහට වසතුවෙන් ප්‍රයෙජන නැත. කැයුතු දැයක් ඇත්නම් පමණයයි වදාළසේක. මේ තෙමේ කුමක් කන්නේදැයි රජ්ජු රුවෝ කිහ. දෙවයන්වහන්ස! මස් අනුභව කෙරෙන්නේයයි වදාළසේක. කෙතෙක් දෙය ලැබිව යුතුදැයි විචාළහ. දෙවයන්වහන්ස! දියැට සමාරක් පමණ රන්රන් පුස්නා මසැයි වදාළසේක. රජ්ජුරුවෝ එක් පුරුෂ යකුට රජ්ජුරුවන් දෙන දෙය තම් වියැවසමාරක් පමණ නුසුදුසුයයි කියා

මෝහට රත්ථින් දෙවියාට සමාරක් අගනා මස් නිබඳම ගෙනහැර දෙවයි කියා නියොග කළහ. ඒ පුරුෂයාත් යහපතැයි කියා එතැන් පටන්කොට රජ්ජුරුවන් විඛානකළ ලෙසටම මස් ගෙනහැර බොහොඩාට දෙන්නේය.

ඒ පුරුෂයා එක් දවසක් උපොසථ දිනයෙහි රාජසම්මත හෙයින් පණිවාසළපුන් නැතිකල්හි නුවර වූළුල්ලෙහි මස් සොයා නොලැබ එම දෙවියාට සමාරක් පමණ රත්ථින් මැදින් විද අමුණා බොහොඩාගේ කරේ බැන්දේය. ඉක්බිත්තෙහි ඒ බොහොඩාට රත්ථින් දෙවියාට සමාර නිසා මාන යෙක් උපන්නේය. එදවස් රජ්ජුරුවෝ නැවත උයනට ගියහ. ඒ බොහොඩ තෙමේ රජ්ජුරුවන් එන්නවුන් දැක වසතුව නිසා උපන් මානය කාරණකොට ඒගන වෙදෙහෙනි! නොවිම් නොව මහත් වසතු ඇත්තෝය, මිමත් වසතු ඇත්තෙමියි රජ්ජුරුවන් හා සමඟ තමා සමසරන්නේ නොරණ අතින් නොබැස නොරණ අනම් හිඳ හිස සලමින් වැදහොත්නේය. රඤ්ඤුරුවෝ ඔහුගේ ක්‍රියාව දැක මිනෙෂධ පණ්ඩිතයෙනි! මේ හෙමේ පෙර දුටු පරිද්දෙන් අද නොබස්නේය. නවර කාරණයකින් ඒ තද මානය ඇතිවීදැයි ගාථාවකින් විවාළහ. පණ්ඩිතයන්වහන්සේ පෙනෝදවස් පණිවා නොකිරීම නිමිත්තෙකොට ගෙන මස් නොලබන්නාවූ රාජපුරුෂයා විසින් තමා සාර බැඳි රත්ථින් දෙවියාට සමාර නිසා උපදනා මානය ඔහුට විනයුතුයයි දැන එම කාරණය ගාථාවකින් කියනසේක් නොලත් විර. අඩිමාඝන සම්මතවූ වසතුවක් ලදින් මේ තෙමේ මියුලුනුවර ගේඛොට ඇත්තාවූ හෝ නොහොත් දැන ප්‍රියවචන අථවායඝ සමානාතමතා, සඞ්ඛ්‍යාත සතර සංග්‍රහ වසතුවෙන් ජනයා සිත්හන්නාවූ වෙදෙහ රජ! තොපි තොප පමණට වසතු ඇත්තාහ. මමත් මා පමණට වසතු ඇත්තෙමි. එසේහෙයින් තොපට මා අඩුකිමෙක්දැයි ඉක්බිත් සිතන්නේය. හෙළා දැක්කේයයි මේ **ඝනඝණ්ටඝ ප්‍රශ්නය** විසඳා වදාළ සේක. රජ්ජුරුවෝ කටුසු බොහොඩාට මස්ලන්නට නියමකළ පුරුෂයා නෙත්වාපණ්ඩිතයන්කිවා සැබෑදැයි විවාළහ. ඒ වූ පරිද්දෙන්ම කියේය. රජ්ජුරුවෝ කිසිකෙනකුන් නොවිවාරාම සියල්ල බුදුකෙනකුන්වහන්සේ විසින් දත් අදහසක් මෙන් පණ්ඩිතයන් විසින් බොහොඩාගේ අදහස දන්නාලදැයි වඩාලා පැහැද පණ්ඩිතයන්වහන්සේට සතර වාසලින් නිමන සුන්වත් අයදුන්හ. බොහොඩාට වනාහි රජ්ජුරුවෝ කිපි තමන් තුබූ වෘත්තිය අරවන්නට වන්හ. පණ්ඩිතයන් වහන්සේ වනාහි තබාලූ වෘත්තිය හරවාපීම් සුදුසු නොවන්නේයයි වැලකූසේක.

ඝනඝණ්ටක ප්‍රශ්නයයි.

——(ඉ)——

ඉක්බිත්තෙන් මියුලුනුවර වැසි **පිඹුතුතර** නම් ළදරුවෙක් **නක්ඛලා** නුවරට ගොස් **දිසාපාමොක්ඛ** ආචාර්‍යයන් සමීපයෙහි ශිල්ප උගන්නේවහාම උගත. ඒ තෙමේ උගත් ශිල්ප වන පොත් දී මම සම්බුගනිමියි ආචාර්‍යයන්ට කීය. ඒ ආචාර්‍යයන්ගේ කුලයෙහි වනාහි ඉදින් වැඩිවිය පැමිණි දියණියක් නැත්නම් වැඩිමහල් අතවැස්සාණන්ට දියයුත්තාහයි පැවත එන වහෙක් ඇත. ඒ ආචාර්‍යයන්ගේ දෙවහනක් හා සමානවූ විශිෂ්ටරූ ඇති

එක් දියණියෙකුනෙක් ඇත්තාහ. ඉක්බිත්තෙන් ඒ දියණියන් පුත! තොපට දෙමි උන් හැරගෙන යවයි ආචාර්යයෝ කිහ. මානවකයා වහාම පින් හැත්තේය. කාලකණ්ණියය, කුමාරිකා තොමෝ මහ පින් ඇත්තියය. ඔහුට ඒ කුමාරිකාව දැක සිත නොඇලුණේය. ඒ මානවකයා කුමාරිකා නුරුස්නේම ආචාර්යයන්ගේ බස මරුත්තු නොකෙරෙමයි කියා ඉවසිය, බමුණාණෙනි මානවකයාට තමන්ගේ දියණියන් දුන්හ. ඒ තෙමේ රාත්‍රීභාගයෙහි සකස්කොට අතුරාලද ශ්‍රීශයනයෙහි සැතපුන කුමාරිකා අතින් ඇදිවිට නැඟෙන්නාහාම මානවකයා තත නමින් ඇඳින් බැස ගිහිගෙට වැදගෙන්නේය. ඒ කුමාරිකාද ඇඳින් බැස ඒ මානවකයා සමීපයට ගියාය. එහෙනින් නැගිසිට නැවත ඇඳට පැනනැංගේය. නැවත ඒ කුමාරිකාද ඇඳට නැංගාය. ඒ හෙමේ නැවත ඇඳින් බවුගේය. කාලකණ්ණියා නම් ස්ත්‍රීන් තාව හා සමග අසසට පොළොවේ ළංනොවන්නේය එසේහෙයින් කුමාරිකා යනහෙහිම සැනපුනීය. ඒ කාලකණ්ණියා හිමි වැදගෙන්නේය. නැවතත් මෙසේ සතියක් දවස් යවා කුමාරිකාව සෙරෙහි සෙනහ නැතිවන් ආචාර්යයන්ගේ බස මරුත්තු කොටගත නොහි හැරගෙන ආචාර්යයන් වැද සමුගෙන තමාගේ නුවරට නික්මුණේය. අනුරමහ පෙර පසු කථා පමණ කුත් ඔවුනොවුන් හා නැත්තේය. නොකැමැතිවම ඔහු දෙදෙන මිසුලුනුවරට පැමිණියහ. පිඹුතුතුරා නම් මානවකයා නුවර සඩමීපයෙහි පලඟත් දිඹුල් ගසක් දැක සාදුකින් පීඩිතවූයේ ගසට නැඟිලා දිඹුල් කඩාගෙන කන්නට වන. කුමාරිකාද සාදුකින් පෙළුනි මටත් දෙවයි කිව, හැයි නිව අත්පා නැද්ද? තොමෝත් ගසට නැඟී දිඹුල් කඩාගෙන කාසි කිය. සාදුකව වඩා දුකක් නැති හෙයින් කුමාරිකා තොමෝම නැඟි දිඹුල් කඩාගෙන කන්නට වන. මානවකයාත් ඇ ගසට නැඟි බව දැන වහ වහා ගසින් බැස ගසවට කටු ගසාලා කාලකණ්ණියය කෙරෙන් මිදිනිමි කිය ලා නුවරට නැඟිසියේය. කුමාරිකා ගස මූල කටු හෙයින් බැස පිය න්නට නොපිළිවන්ව උඩම හුන්නිය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ එදවස් දවල් උයන් කෙළි කොළ සරහා නලද ඇහකුපිට හිඳ සවස් වේලෙහි නුවරට වදනාහු දිඹුල්ගස උන් කුමාරිකාව දැක එළිබඳ සිත් ඇතිව පුරුෂයන් ඇත්ත නැත්ත විචාරා යවූහ. කුමාරිකාත් සවාමිනි! මාගේ දෙමවුපියන් විසින් පාවාදෙනලද සැමියන්ද කෙනෙක් ඇත. ඒ සැමියාණෝම මේ ගස උඩ ඉදුවා හැරපියා පලාගියෝයයි කිව. විචාරන්නට ගිය අමාත්‍යයා එපවත් රජ්ජුරුවන්ට කිය. රජ්ජුරුවෝ ඒ අසා හිමියන් නැති වසතුනම් රජ්ජුරුවන්ට පැමිණෙන්නේයයිකියා කුමාරිකාවගසින් බස්වා ඇතුපිට නංවාගෙන මාලිගාවට ගොස් රුවන් රැසක් දිට සිටුවා අග මෙහෙසුන් කළහ. ඛිසව් රජ්ජුරුවන්ට ප්‍රියයෝය, මනවඩනි, දිඹුල්ගසදී දුටු බැවින් උදුම්බරාදෙවියයි ප්‍රසිඩවූහ. ඉක්බිත්තෙන් එක් දවසක් රජ්ජුරුවෝ උයන්කෙළියට යන පිණිස වාසල්කඩ ගම්වැස්සන් ලවා මාගිය ඉදිසාරවූහ. පිඹුතුතුරායාද රාජසම්මතයෙන් මෙහෙවර කරන්නේ කැසපට කවා ගෙන උදුල්ලකින් මහ සසින්නට වන. මාණිය සරහා නොනිමෙනුරු රජ්ජුරුවෝ උදුම්බරාදෙවීන් හා සමග උතුම් රථයකනැඟි උයන්කෙළියට මහපෙර හරින්නික්මුණාහ. උදුම්බරාදෙවිද මහ සසිනුන් සිටි ඒ කාලකණ්ණියා දැක මේබඳු සවපතතියක් ඛරාගතනුහුණුයේයයි ඌ දිශාවබලමින්සිනාසුනාහ. රජ්ජුරුවෝ කිසවුන් සිනාසෙන්නා දැක කිපී කුමක් පිණිස සුනුහිදැයි විචාළහ. දෙවයන්වහන්ස! මේ මහ සසිනා මිනිහා මා ආදියෙන් රක්ෂාකළ මිනිසාය,

මා දිඹුල්ගසට නාවා මූණුවුනසා නියේ මූය, මම මූ බලා මෙබඳු ක්‍රියක් ධරා ගත හුණුයෙමි මේ කාලකණ්ණියායි සිතායිනිමියි හිව. රජ්ජුරුවෝ නී කියන්නේ බොරුය, අනික් කියි පුරුෂයකු දූකය නී සුනුයේ නී මරමියි කඩුව කොපුවෙන් ඇදගත්හ. බියෙන් හයපත්ව දෙවයෙනි! යළි පණ්ඩිතවරුන් විවාළ මැනවයි කිහ. රජ්ජුරුවෝ මෑ කි බස් අදහව්දැයි සෙනහයන් විවාළහ. සෙනහයෝත් නොඅදනමි දෙවියන්වහන්ස! කවරෙක් නම් මෙබඳු ගැණී යක් හා.ර පියා නැතියේදැයි කිහ. බියෙන් සෙනකයන්ගේ බස් අසා වඩාලාම හයවුහ

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සෙනහයා කුමක් දනිද මහෞෂධ පණ්ඩි තයන් විචාරමි සිතා ගාථාවකින් පණ්ඩිතයන්වහන්සේ විවාරන්නාහු මහෞ ෂධ පණ්ඩිතයෙනි! සත්‍රියක් නොමෝ අධික රූ ඇත්තිවුවද ආචාර ශීල යෙන්ද යුක්තාවුව ඒ සත්‍රිය පුරුෂයෙක් නොකැමැත්තේල, තෙපි ඒ අද හඳුයි මිවාළහ එබස් අසා දෙවයෙනි! මම අදහමි, පුරුෂයා දෙවිය නැත්තේ වීනම්, ශ්‍රීකාන්තාවිද කාලකණ්ණියාද යන මොහු දෙදෙනා මූහුද එතෙර මෙතෙරවේද අසඟ හා පොළොවසේද එක්නොවන්නාහයි වදුළසේක. රජ්ජුරුවෝ මියගොස්හුන් වදුළ කාරණය ඔහට නහා සත් හුන් සිත් ඇතිව පණ්ඩිතයන්වහන්සේට සතුටුව පණ්ඩිතයෙනි! ඉදින් තෙපි මේහාත නැත්නාහුනම් අද මේ හුවණකැති සෙනහයාගේ බස් නෙත මෙබඳු ගැහැණුරුවන්ක් නොලැබෙමි, දැන් නොප නිසාය මේ බිසවුන් ලද්දේයයි කියා පණ්ඩිතයන්වහන්සේට මස්සෙන් දහසක් පුජාකළහ. ඉක්බිත්තෙන් බිසව් රජ්ජුරුවන් වැඳ දෙවයන්වහන්ස! පණ්ඩිතයන් නිසාය මා දිවි ලද්දේ; මුන් මම මල්තනහුරහි තබන්නට වර ඉල්ලමියි කිහ. රජ්ජුරුවෝ යහපත දෙවිනි! තොප ඉල්වූ . වරය දෙමි ගනුවයි කිහ. දෙවයන්වහන්ස! මම අද පටන් මාගේ මළ ඇටවත් හැරටියා කිසි මිනිරි රසයක් අනුභව නොකරමි, මෙතැන් පටන් මේලඩවත් නොවේලකවත් වාසල් දොර හරවා පණ්ඩිත සන්ව මිනිරි රසෑක් යවන්නට ලබන වරයක් ගනිමියි කිහ. යහපත සොඳුර! ඒ වර ගනුවයි කියා රජ්ජුරුවෝ වර දුන්නාහ.

සිරිකාලකණ්ණි ප්‍රශ්නයයි.

එක් දවසක් රජ්ජුරුවෝ දහවල් මෙහෙ නිමවා සඳල්ලෙහි සක්මන් කරන්නාහු සිමිඳුරකවුළුවෙන් එක් එළුවකු හා බල්ලකු විත්‍රසඤ්ඤාවය කරන් නවුන් දුටුහ. ඒ එළුවනාහි ඇත්හල ඇතුව ඉදිරියෙහි ලාලූ තණ නොකනහුරු කන්නේය. ඉක්බිත්තෙන් ඇත්හලයෝ ඔහු තණ කන්නා දූක මරා පලාපිහ. අඬගසාගෙන සන්නාවූ ඔහු දැක එක් ඇත්හලයෙක් ලුහුබැඳ ගොස් දණ්ඩ කින් පිට අවුරා පහරක් ගැසීය. ඒ තෙමේ පිට නම නමා වෙදනාවෙන් වෙව් ලමින් ගොස් රජගෙයි මහබිතක්කණ නිසා පිට පදනම වැදහොත්තේය. එදවස්හි රජ්ජුරුවන්ගේ මූළුතැන්නෙයි ඇට හා මස් ආදිවූ දෙය කා වැඩි බල්ලෙක් අරක්කැමියා බත් මාලූ පිස වසුන්කොට ගෙන් පිටත ඇඟ බාදිය සිදිමින් සිටියදී, මත්ස්‍යමාංශයෙහි ගන්ධය ඉවසාගතනොහී මූළුතැන්ගෙට වැද වලන් වැසූ මලා ආදිය හෙලා මාංශ අනුභවකළේය. අරක්කැමියා

චලන් හුණු හඬ අසා ඇඳුළුගෙට වැද මාළු කමින් සිටි බල්ලා දැක දෙර පියාලා කෑට මූතුරු ආදීන් තැළීය. ඒ තෙමේ තමා කෑ මාළු නහපියා හඬා ගෙන දිවගහ. අරක්කැමියා ඔහු දිවගත් බව දැන ලුහුබැඳ දණ්ඩකින්පිට අවුරා ගැසීය. එසිත් පිට නම නමා කෙතෙක් ගැසුවත් පයක් වක්කිරීම බල්ලන්ගේ සුභාවයක් හෙයින් එක් පයක් ඉසවාගෙන එළුවා වැදහොත් නැතුවම ගියේය. ඉක්බිත්තෙන් එළුතෙමේ සබඳ! තෝ පිට නම නමා එන් නෙහි කිමෙක්ද තා පිට රැජාවෙක් පහරිදැයි බල්ලා විවාළේය. හේ බල්ලාද හෝන් පිට නමාගෙන වැදහොත්තෙහි කිමෙක්ද තොප පිට රැජාවෙක් පහ දැයි එළුවා අතින් විවාළේය. එළුවා තමාගේ සවරූප බල්ලාට කිය. බලුත් එළුවාට තමාගේ සවරූප කිය. ඉක්බිත්තෙන් එළුවා බල්ලාට කිමෙක්ද? තෝ නැවත මුළුතැන් ගෙට යන්නට පොහොසත්දැයි විවාළේය. නොපෙ, හොසතිමි, හියොත් මාගේ දිවි නැහැයි කිය. තෝ වනාහි ඇත්හලට යන්නට පොහොසත්දැයි කිය. එළුවා මාවිසිනුත් ඇත්හලට යන්නට නොවිළිචන. හියොත් මාගේ දිවි නැතැයි කිය. ඔහු දෙන්නා කෙසේ අපි දෙන්නා ජීවත්වමෝදැයි උපායක් සිතූහ. ඉක්බිත්තෙන් එළුවා තෙමේ ඉදින් දෙන්නම සමගිවගහ හෙමෝනම් එන් උපායෙක් ඇහැයි කියා බල්ලා විසින් එසේවිනම් කියවයි කි කල්හි සබඳ! තෝ මෙතැන් පටන් ඇත්තලවයා, බල්ලන් හණ නොකන හෙයින් මේ තණ නොනයි කියා ඇත්තලයෝ තා කෙරෙහි සැක නොකෙරෙති, තෝ සහවා මට තණ කැරැල්ලක් ඔහැගෙනවුත් මහඹිතක්ඛණහි තබව, මමත් මුළුතැන්ගෙට යෙමි එළුවන් මස් නොකන හෙයින් මේ මස් නොඛයි. කියා අරක්කැමියා මා කෙරෙහි සැක නොකෙරෙයි, මමත් තට මස් කන්නට ඔහැගෙන එමියි කිය. මේ උපාය තෙමේ අප දෙන්නා ජීවත්වීමට ඇතැයි දෙන්නම හිවිස බලු ඇත්හලට ගොස් තණ කැරැල්ලක් ඔහැගෙන අවුත් මහඹිතක්ඛණ පිට පදනම තබයි. එළුද මුළුතැන්ගෙට ගොස් මස්නාබැල්ලක් මුවපුරා ඔහැගෙනවුත් එහිම තබයි. මේ උපායෙන් දෙන්නම මහඹිතක්ඛණ පිට පදනම සැපසේ වෙසෙති.

රජ්ජුරුවෝ උන් දෙන්නාගේ මිත්‍ර ධර්මය දැන මා විසිනුත් නුදුටු විරූ කාරණයක් දක්නාලද මොහු දෙන්න ඔවුනොවුන්ට පසම්තුරුවන් සමගව වාසය කෙරෙති. මේ කාරණය අල්වා පැහයක්කොට පණ්ඩිතවරුන් පස්දෙනා විවාරන්නෙමි, මේ පැහය නොදත් සෙනකුන් රටින් යවන්නෙමි, දත් සෙනකුන්ට වෙබඳු පණ්ඩිත කෙනෙක් නැතැයි. උපහාර කරන්නෙමි, අද වෙලා මදව හිඳිව, සෙට සේවයට ආකල විවාරන්නෙමියි සිතූහ. මෙසේ සිතා රජ්ජුරුවෝ අනික් දවස් පණ්ඩිතවරුන් සේවයට අවුත් උන් කල්හි ප්‍රශ්න විවාරන්නාහු ගාථාවක් කියා "මේ සඬලොකයෙහි යම් සඬසෙනකුන්ගේ විශ්වාසයෙක් කිසි කලෙකත් සත් පියවරකුත් පවා නොවූවිරූද, එසේ පසම්තුරුවූ දෙදෙනෙක් සබඳවූහ, සබඳවත් අදහාගෙන තෙවන් මිත්‍රසඤ්ඤය කොට ඇවිදිනාහ, එයට කරුණු කිවෙක්දැයි කිහ. මෙසේද කියා නැවත "අද පෙරවරු වේලෙහි ඉදින් මේ පැහය මට කියන්නට නොපොහොසත්හු වුනම් තොප හැමදෙනම රටින් නෙරපමි, නුවණ නැත්තවුන්ගෙන් මට ප්‍රයොජන නැහැ"යි කිහ. සෙනකයෝ මුල් හස්නෙහි හුන්හ. මහොෂධ පණ්ඩිතයෝ කෙළවර හස්නෙහි වැඩහුන්සේක. උන්වහන්සේ ඒ පැහය පරීක්ෂාකොරෙමින්

අවී නොදක "මේ රජතෙමේ බොළඳ ගුණ ඇත්තේය, මේ පැනය සිතාගෙන දැනගන්නට නොපොහොසත, ඔහු විසින් කිසිවක් දක්නා ලදැයි සිතා එක දවසකට අවසර ලබන්නෙම් වීනම් මේ පැනය දැනගනිමි. සෙනඟයෝ කිසි උපායකින් අද එක දවසක් පමණ රඳවාපියති"යි සිතුවේය.

සෙනඟාදි පණ්ඩිතවරු සතරදෙනද අදුරු ගබඩාවකට වන්නවුන් මෙන් කිසිවක් නුදුටුවහ. සෙනකයෝ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රවෘත්ති සිමෙක්දෝහෝයි මහබෝසතාණන්වහන්සේ දෙස බැලූහ. මහබෝසතාණන් වහන්සේද සෙනකයන් දෙස බැලූසේක. සෙනකයෝ බෝධිසත්ත්වයන්වහන්සේ තමන්දෙස බැලූ ආකාරයෙන්ම උන්වහන්සේගේ හිතදැන පණ්ඩිතයන්ට පැනය නොවැටහුණුසේක. එසේ හෙයින් එක්දවසකට අවසර ඉල්වන්නා කැවිත්තෝය. උන්ගේ මනදෙළ පුරමි. රජ්ජුරුවන් හා සමඟ විශ්වාස යෙන් මහන්සොට සිතාසි දෙවයන්වහන්ස! අප ඇමදෙනා පැනය කියාගත නුහුණහොත් රටින් යවනසේක්ද? මේත් එක් පැනයක්යයි සිත නසේක්ද? අපි මේ පැනය කියන්නට නොපොහොසතුමෝ නොවම්හ, එතකුදුවුවත් මදක් ගැටලුසු පැනයක, බොහෝදෙනාගේ මැදයෙහි කියන්නට නොපිළිවන, තනිව ඉඳ සිතා පසුව නුඹවහන්සේට කියම්හ, අපට අවසරයක් දුනමැනවැ"යි මහබෝසතාණන් සලකා ගාථා දෙකකින් කිහ. 'මහජනයාගේ රැස්වීමෙහි ජනයාගේ දැඩි කොලාහලයෙන් එසපැහැර අරගල කළ සල්ලි විසුරුණු සින් ඇතියමෝ හෙවත් නානාලම්බනයෙහි පැවැති සිත් ඇතියමෝ මේ පැනය කියන්නට නොපොහොසතුම්හ ජන ප්‍රධානවූ රජ්ජුරුවන්වහන්ස! විවෙකයට ගියාවූ එසේහෙයින්ම එකඟවූ සිත් ඇති පණ්ඩිතවරු පස්දෙන එකී එකී දෙන වෙන වෙනම තනිව හිඳ පරීක්ෂාකොට ප්‍රශ්නාර්ථයන් සිතා පසුව කියති"යි කිහ. රජ්ජුරුවෝ සෙනකයන්ගේ බස් අසා නොසතුටුවූවද ඇහපතැයි සිතා පියා මේ පැනය කියනුහුණහොත් රටින් යවන්නෙමියි භයගැන්වූහුමය. සෙනඟාදි පණ්ඩිතවරු සතරදෙනද මාලිගාවෙන් බටහ. සෙනකයෝ අනික් තුන්දෙනාට "රජ්ජුරුවෝ සියුම් පැනයක් විවාළහ, පැනය කියනුහුණහොත් මහා අලාභවන්නේය, තෙපි තුන්දෙන සැප ආහර අනුභවකොට මනාකොට පරීක්ෂාකාරිවව"යි කියා තමන් තමන්ගේ ගෙට ගියාහ.

මහෞෂධ පණ්ඩිතයෝද හුනස්නෙන් නැඟී උදුම්බරා දෙවීන් සවම් පයට ගොස් "දෙවීන්වහන්ස! අද වේවයි රජේ වේවයි රජ්ජුරුවෝ බොහෝ වේලාවක් කොතැන සිටියේද"යි විචාළසේක. මලණ්ඩ! සීමාදුරු කඳුළුවෙන් පිටත බලමින් නඩයෙහි සක්මන්කළහයි බිසව් කිහ. ඉක්බිත්තෙන් පණ්ඩිතයන්වහන්සේ රජ්ජුරුවන් විසින් මේ දිශාවෙන් කිසිවක් දක්නාලද වන්නේයයි සිතුසේක. ඒ සථානයට ගොස් පිටත බලා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දැඩ මුන්දෙන්නා දුක රජ්ජුරුවන් විසින් පැනය සලකනලදැයි සනිටුහන්කොට ගෙට වැඩිසේක. පුක්කුසාදිවූ අනික් තුන්දෙනත් ප්‍රශ්නයෙහි අවී කල්පනාකොට කිසිවක් නොදැන සෙනඟ පණ්ඩිතයන් සවම්පයට ගියාහ. සෙනකයෝ තොප විසින් පැනයෙහි අවී දක්නාලදැයි. විවාළහ. නොදක්නාලදැයි කිහ. "මමත් නොයෙක්

ලෙස සලකා පැනයෙහි අර්ථ නුදුටිමි"යි කිහ. තුන්දෙනම නුඹවහන්සේ පැනයෙහි අර්ථ නොදක්නාකල අපි කෙසේ දනුමෝදැයි කිහ. මෙසේ සෙනඟාදි සතරදෙනම ප්‍රශ්නයෙහි අර්ථ නොදැන රජ්ජුරුවන් සඬ්ඛ්‍ය යේදී එක දවසකට අවසර ලදුමෝ නම් සලකා ප්‍රශ්නය විසඳමින්සි සිංඝනාද පාපියා ආම්හ. පැනය නොකී කල්හි රජ්ජුරුවෝ කිපෙනි කුමක් කරවෝදැ"යි සිතා උකටලිව පණ්ඩිතයෙනි! මේ පැනය අප විසින් හවුරුදිදක් ඉඳ සිතුවත් දක්නට නොපිළිවන, එසේ හෙයින් මහෞෂධ පණ්ඩිතයන් විසින් මේ පැනය ඝනසඝ්‍ර ගුණයෙන් සිතා නිමවනු ලැබෙයි. ගම්භීර නොයිඳ උන් සමීපයට යම්හ"යි. උන් සතරදෙනා ගොසින් තමන් අවුත් සිටි බව කියා යවා එන්නට කියවයි කිකල මාලිගාවට වැද සිහි නටයුතු සුවඳුක් දෙඩා එකත්පස්ව සිටියාහු මහෞෂධ පණ්ඩිතයෙනි! නුඹවහන්සේ විසින් පැනය සිතනලදදැයි මහබෝසතාණන් විචාළහ.

උන්වහන්සේ මා පැනය නොසිතනකල මේ ත්‍රිවනත්‍රයෙහි අනික් කවරෙක් සිතන්නේද? එසේය පැනය සිතනලදැයි වදළසේක. පණ්ඩිත වරු සතරදෙන එසේවීනම් අපටත් වදළමැනවැයි කිහ. සියලු සතුන් කෙරෙහි පතළ කරුණායෙන් යුකතවූ මහතාණෝ "ඉදින් මම මුන් සතර දෙනාට පැනය නොකියෙම් නම් රජ්ජුරුවෝ මේ ජඩ කොල්ලන්ගෙන් කායඃක්ලිෂ්ය කිමිදැයි උන් සතරදෙනාම රවින් තෙරණහ. මෙවැනි පඬිරුවනෙක් නැතැයි මට සත්රුවනින් පූජාකරන්නාහ. එසේ වන්නාට ඒ මාගේ කරුණාවට හරම්නොවෙයි, මේ අඥානයෝ මා වැනි පණ්ඩිත කෙනකුන් ඇතිව ඉන්දදී නොනසිත්වායි උන් කෙරෙහි පතළ කරුණා යෙන් පැනය උන්ට කියම්"යි සිතා සෙනඟාදි පණ්ඩිතවරුන් මිටි අස්නෙහි හිඳුවා තමන්වහන්සේ දිශාවට සතරදෙන දෙහොත් මුදුනේ තබා වැඳ ගෙන ඉඳිනා නියායෙන් සම්මතකොට රජ්ජුරුවන් දුටු නියාව නොනහවා රජ්ජුරුවන් විචාළකල මේ ලෙස කියවයි සතරදෙනාටම ගාථා සතරක් බැඳලා ඒ ගාථාවල අර්ථ නුගන්වා පාළිය පමණක්ම උගන්වලා යැවූසේක. ඔහු සතරදෙනද "මහබෝසතාණන්වහන්සේද දෙවන දවස් රාජසෙවයට ගොස් රජ්ජුරුවන් දැක පනවනලද අසුන් මත්තෙහි උන්නාහ.

රජ්ජුරුවෝ සෙනකයෙනි! පැනය දක්නාලදදැයි සෙනක පණ්ඩිතයන් විචාළහ. සෙනඟයෝ "දෙවයන්වහන්ස! මා පැනය නොදක්නාකල අනික් කවරෙක් දකිදැ"යි වැදුවන් ඉදිරියේ කොළොම්බු ලන්නාසේ බොධිසත්වයන් මධ්‍යයෙහි තමන්ගේ විශයත්නම් අහවා එසේවීනම් කියවයි රජ්ජුරුවන් කී කල්හි ඇසුවමැනව දෙවයන්වහන්සැයි කියා පණ්ඩිතයන්වහන්සේ උගන්වාලූ සැටියේම ගාථාව කිහ. එහි අර්ථ වෙසේ දතයුතු:—"ප්‍රයිඩ අමාත්‍ය පුත්‍රයන්වද රජදරුවන්වද එළුමස් ප්‍රියය, මනවැඩි, අමාත්‍ය පුත්‍රාදීහු බලුමස් අනුභව නොකරන්නාහ. එසේවූ එළුවාගේ හා බල් ලාගේ සමඟ සඞ්ඛ්‍යාත විශ්වාසය වී" ගාථාව කී බව මුත් සෙනඟ පණ්ඩිතයෝ අර්ථ නොදන්නාහ. රජ්ජුරුවෝ වනාහි තමන්ට ප්‍රත්‍යක්ෂ විසින් අර්ථ දන්නාහු සෙනකයන් විසින් පැනය දක්නාලදය, පුක්කුසයන් විචාරම්සි දෙවැනිව උන් පුක්කුසයන් විචාළහ. ඒ පුක්කුසයෝ රජ්ජුරුවන්ට "කිමෙක්ද! ඔබ නොපණ්ඩිතයෙම්ද"යි උගත් සැටියේ ගාථාව

කිහ. එහි අවී මෙසේ දහයුතුයි:—අසු පිට ආසාරණ සුව පිණිස එළු වාගේ සම් නහන්නාහ. එසේ ආසාරණ සුව කැමැති ජනයෝ බල් ලන්ගේ සම් අසුපිට නොවසුරන්නාහ, එසේද වුවත් එළුවාගේ හා බල් ලාගේ හා සමහි සමාගම සඞ්ඛ්‍යාත විශ්වාසය ඒ," ඒ ප්‍රත්කුස පණ්ඩිතයා ගාථායෙහි අවී නොදන්නේමය රජ්ජුරුවෝ තමන්ට අවිය ප්‍රහරණයෙ සින් "මුන් විසිනුත් පැනය දක්නාලදැ"යි සිතා ඌව්වැනිව හුන් සාවි සු පණ්ඩිතයන් විවාළහ. උසින් තමන් උගන් ගාථාව කිය. ගාථායෙහි අවී මෙසේ දහයුතුයි:-"එළු තෙමේ ඇඹරී ගිය අං ඇන්පේය, බල්ලාගේ අං නොම ඇන්පේය, එළු තණ කන්නේය. බල්ලු මස් කන්නේය, එසේ වුවත් එළුවාගේ හා බල්ලාගේ හා සමහි සඞ්ඛ්‍යාත විශ්වාසය ඒ" රජ්ජුරුවෝ මුන් විසිනුත් පැනය දන්නේයයි, සතරවැනිව හුන් දෙවිඳු පණ්ඩිතයන්ගේ විවාළහ. උසින් තමන් උනන් ගාථාව කිහ. එහි අවී මෙසේ දහයුතුයි:—"එළුතෙමේ තණ හා කොළ කන්නේය. බලුතෙමේ තණ කොළ නොකන්නේය, වැළි කුමක් කන්නේදයන්? බලුතෙමේ ස්වුන් හ, බළලුන් කන්නේය, එසේද වුවත් එළුවාගේ හා බල්ලාගේ හා සමහි සමාගම සඞ්ඛ්‍යාත විශ්වාසය ඒ"

මෙසේ සෙනකාදි සතරදෙන තමන් තමන් උගත් ගාථා පවණක් කී කල්හි රජ්ජුරුවෝ තමන්ට අවී ප්‍රඥාව හෙයින් ගාථාවල අවී උන් අතින් නොවිචාරා පස්වැනිවහුන් අසරණ සරණ කරණා නිධාන ජනමූර්ධනිවූ මහෞෂධ පණ්ඩිතයන් අතින් "පණ්ඩිතයෙනි! තෙපි පැනය දනිව්දැ"යි විවාළහ. දෙවයන්වහන්ස! අවිඹියෙහි පටන් භවාග්‍රය දක්වා මා විසා අතින් කවරෙක් මේ පැනය දනිදැ"යි සිංහනාද කළසේක. රජ්ජුරුවෝ එසේවිනම් කියවයි කිහ. ඇසුවමිනව දෙවයන්වහන්සැයි කියා එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව හන්වූ පරිදිදෙන් දන් බව ප්‍රකාශ්‍යාරනසේක් ගාථා දෙකකින් කීසේක. ඒ ගාථාවල අභිප්‍රාය නම්:-පා අවෙක් ඇති හෙවත් සතර පයෙහි අවකුරෙක් ඇති එළුතෙමේ මස්ගන්නා වේලෙහි කිසිඝෙනකුන්ට නොපෙනී මේ බල් ලාව මස්ගෙනෙන්නේය, මේ බල්ලාද එළුවාට තණ ගෙනෙන්නේය, බල්ලා ගේද එළුවාගේද යන මොවුන් දෙන්නාගේ ගොවර පිණිස ඔවුනොවුන්ට මෙහෙවර කරන පෙරළිය ජනප්‍රධානවූ වෙදෙහ නම් රාජොත්තම තෙමේ ප්‍රාස දයෙහි සිටියේ ප්‍රත්‍යක්ෂකොට දිවිලසි වදළසේක. රජ්ජුරුවෝද මහ බෝසතාණන් නිසා සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙන පැනය දන්බව් නොදූන මේ පණ්ඩිතවරු පස්දෙනම තමන් තමන් හුවණ බලයෙන්ම පැන යෙහි අවී දුටුනසි සිතන්නාහු සොම්නස්වූවා ගාථා දෙකකින් "මෙබඳු පණ්ඩිතවරහු යම් බඳුවූ මාගේ කුලයෙහි වෙදේද, එසේහෙයින් එකාන්තයෙන් මට වූයේ බොහෝ ලාභයෙකැයි කිහ. මෙසේ පණ්ඩිතවරුන්ගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටුවූ මා විසින් උන්ට උපකාර කළමනා වේදැයි උපකාරස්මෘතිකරන්නාහු "සුවිනිශ්චිත ප්‍රශ්න විස්සජ්ජිතය කරණකොටගෙන වෙසෙසින්ම සතුටු සිත් ඇත්තෙම්, පණ්ඩිතවූ තොප හැමිදෙනාටම ආජානීය අශ්වයන් යෙදූ එකි එකී රථයක්ද, වස්ත්‍රාභරණ ධන ධාන්‍යයෙන් සමෘඩ්ධවූ එකි එකී ගම්වරක්ද දෙමි"යි කියා මෙකී සියල්ල පණ්ඩිතවරුන් පස්දෙනාට දෙවූහ.

එළක ප්‍රශ්නය යි.

උදුම්බරාදෙවී වනාහි සෙනකාදි පණ්ඩිතවරු සතරදෙනාම මහෞෂධ පණ්ඩිතයන් නිසා ප්‍රශ්නය දන්බව දැන "රජ්ජුරුවන්වහන්සේ මූනා උදුහා වෙනසක් නොකරන්නාක්හු මෙන් පස්දෙනාටම උපකාර සිටියේ කළහ. මාගේ මලණුවන් මහෞෂධ පණ්ඩිතයන්ට විශෙෂයොව සත්කාර කරන බව සුදුසුම්වේදැ"යි රජ්ජුරුවන් සමීපයට ගොස් "දෙවයන්වහන්ස! නුඹවහන්සේට පැනය කා විසින් කියනලදැ'යි විචාළහ. මොදුරු! පණ්ඩිතවරු පස්දෙනා විසිනැයි කිහ. "දෙවයනි! සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන ඒ පැනය කා නිසා දන්හසි සිතුසේක්දැ"යි විචාළහ. මොදුරු! නොදනිමියි කිහ. "දෙවයන්වහන්ස! ඒ සෙනකාදි සතරදෙන කුමක් දනිද්ද? මහෞෂධ පණ්ඩිතයෝ වනාහි මේ අඟුනයෝ නොනසිස්වයි කියා පැනය ඉගැන්වූහ. නුඹවහන්සේ හැම දෙනාටම සමසම්යේ උපකාර කළසේක. ඒ අසුකුනියය, මහෞෂධ පණ්ඩිතයන්ට වැඩියක් උපකාර කරන බව සුදුසුය"යි කිහ. රජ්ජුරුවෝ තමන් නිසා පැනය දන්බව නොකිවුයයි මහෞෂධ පණ්ඩිතයන්වහන්සේට සතුටුව වඩා උපකාරයක් කාහු නැමැත්තෝ 'වින්නාඋය මිපුතණුවන් එක් පැනයක් විචාරා ඒ පැනය කිසල මිනත් සත්කාර කරන්නෙමි"යි සිතූහ.

මෙසේ සිතා රට සුදුසු පැනයක් සිහන්නාහු **ඔරිඤ්ඤ ප්‍රශ්නය** සිතූහ. ඒ ප්‍රශ්නය චින්තනයකොට එක්දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා සෙවයට අවුත් පිළිසඳර කථායෙන් සුවසේ ඉන්කල්හි සෙනකපණ්ඩිතයන්ට "ඉසින පණ්ඩිතයෙනි! පැනයක් විචාරම්"යි කිහ. දෙවයන්වහන්ස! විචාළ මැන වැ"යි කිහ. රජ්ජුරුවෝ සිරිමඤ්ඤ ප්‍රශ්නයෙහි පළමුවන ගාථායෙන් "නුවණ ඇති සම්පත් නැති හස්ත්‍යශ්වාදි පරිවාර සම්පත් ඇති නුවණ නැති මුන් දෙන්නා අතරෙන් නුවණැත්තෝ කවුරුන් උතුමැයි කියද්ද? සෙනකයෙනි! එකෙක් පොළොව හා සමාන නුවණ ඇත්තේය, දිළිඳුය, එකෙක් පරිවාර සම්පත් ඇත්තේය, අඟුනය, මුන් දෙන්නාගෙන් කවුරු උත්තමයයි කියාපට වැටහේද? මේ කාරණය කියා බලව"යි කිහ. මේ පැනය වනාහි සෙනක පණ්ඩිතයන්ගේ පරම්පරායෙන් පැවත ආයේය. එසේ හෙයින් ඒ සිරිමඤ්ඤ ප්‍රශ්නය මහාම රජ්ජුරුවන්ට කිහ. කෙසේදයත්? "ජනප්‍රියාන රජ්ජුරුවෙනි! එකාන්තයෙන් නුවණැත්තෝද නුවණ නැත්තෝද හස්ත්‍යශ්වාදි ශිල්පයෙන් යුක්තයෝද කිසි ශිල්පයක් නොදන්නාහුද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි උතුම් ජාති ඇත්තාහුද යන සියල්ලෝම ජාතියෙන් හීන දුවත් සම්පත් ඇති හැනැත්තවුට කී නොකී දෙය කොට සෙවාව යටත්වන්නාහ. මේ කාරණය දැන මම කියම්, නුවණැති තැනැත්තේ යටත්මය, සම්පත් ඇති තැනැත්තේම උතුමැ"යි කිහ.

රජ්ජුරුවෝ සෙනකයාගේ බස් අසා පුක්කුසාදි තුන්දෙන නොවී වාරාම පස්දෙනාට කෙළවර උන් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට "අලා මකවු නුවණ ඇති සියලු ධර්මයන් සවිකාරයෙන් දන්නාවූ මහෞෂධ පණ්ඩිතයෙනි! තොප විචාරම්, නුවණැති පරිවාර සම්පත් නැති නුවණ නැති පරිවාර සම්පත් ඇති මේ දෙදෙනා අතරෙන් නුවණැත්තෝ කා උතුමැයි කියද්ද? කියා බලව"යි කිහ. ඉක්බිත්තෙන් මෙසේ විචාළ රජ්ජුරුවන්ට ඇසුව මැනව දෙවයන්වහන්ස්යි ගාථාවකින් සථානාන්තරාදි කියි ලාභයක් සම්පත්තියක්

ලදින්ම මේ උතුමැයි සිතන්නාවූ අඥාන තෙමේ පාණාතිපාතාදි පාපධර්මයන් කරන්නේය. එසේ හෙයින් මේ ලොව බලන්නේ ඒකාන්තයෙන්ම දුක්ඛ ඵල දෙන්නාවූ පාපකර්ම බලයෙන් නරකාදියෙහි අනන්ත දුඃඛයට භාජනවන්නේ යයි මෙසේ උපේක්ෂා පූර්වංගමවූ විතර්කයක් නැතිව පරලොව නොබලන්නේ දෙලොවෙනිම හෙවත් ඉසුරු මදයෙන් පව්කොට නරකාදියෙහි උපදනේ පරලොවද, නැවත එයින් චුතව දිළිඳු කුලයෙහි නොයෙක් දුකට භාජනව උපදනේ මේලොවදූසි මෙසේ දෙලොවෙහිම නුවණ නැති තැනැත්තේ පරාජයක් ගන්නේය, හෙවත් විනාශයට පැමිණෙන්නේය; මේ කාරණය දැන මම නුවණැත්තේමි උතුම, යසසින් යුකතවූ නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමි"යි වදාළසේක.

මෙසේ බෝසතාණන්වහන්සේ විසින් වදාළ කල්හි රජ්ජුරුවෝ සෙන කයන් මුහුණ බලා මහෞෂධ පණ්ඩිතයෝ නුවණැත්තහු උතුමැයි කියති' කොබඳුද ආචාර්යයියෙනි! සි කිහ. සෙනකයෝ "දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ ළදරුවෝය, අද දක්වාත් උන්ගේ මුඛය කිරිසුවඳ අමයි, මේ බාල දරුවෝ කුමක් දනිද්දැ"යි කියා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, "මේ ශිල්ප තෙමේ හෙවත් නුවණතෙමේ ධන ධාන්‍යාදීවූ භොග සම්පත් සිඹ නොහරන්නේය, පුත්‍රාදරාදිවූ නෑයෝද රූප සම්පත්තියද. ධන ධාන්‍යාදිවූ සම්පත් සිඹනොහරන්නාහ. ඊට දෘෂ්ටාන්ත කවරේදැයි යහොත්? පොළ පොලුවූ හෙවත් අනවරතයෙන් දෙකොළින් බස්නා බෙළඳාරු ඇති රූප සම්පත්තියක් නැති හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා ධනධාන්‍යාදි සම්පත්තීන් යුකතව සුව විඳිනා මේ **ගොරිමඤ්ඣ නාම සිවුහු ශ්‍රීෂ්ඨානනා** සෙවුනීය. දෙවයන් වහන්ස! බලා වදාළ මැනව. මේ කාරණය දැන නුවණැතිවත් දිළිඳු තැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ඉසුරුමත් තැනැත්තේම උතුමැයි මම කියමි"යි කිහ.

ඒ ගොරිමඤ්ඣ සිටාණෝ වනාහි කෙසේවූ කෙනෙක්දයත්? ඒ මියුරු නුවරම අසූකෙළක් සම්පත් ඇති සිටාණ කෙනෙක. උන්ගේ බැලියයුතු රූපයකුත් නැත්තේය, පුත්‍රකෙනකුත් නැත්තාහ. දියණි කෙනකුත් නැසිය කෙනකුත් නැත්තාහ, කිසි ශිල්පයකුත් නොදන්නාහ, බැණනැඟි කල්හි ඒ ගොරිමඤ්ඣ සිටාණන්ගේ දෙකොළින් කෙළඳාරුවන් වැහිරෙන්නේය, එසේ වැහෙන්නාවූ කෙළඳාරුවන් දෙවඟනන් සමාන රූ ඇති සම්පූර්ණාලංකාරයෙන් සැරහුණු ගැණු දෙන්නෙක් සුළඟි නිලුපුල් කලබ් දෙකක් ගෙන දූලයෙහි සිට නිලුපුල් මලින් පිස මල් වීජියට දමන්නාහ. රූ සොඬහුද රාහලට යන්නාහු නිලුපුලින් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ ගොරිමඤ්ඣ සිටාණන්ගේ ගෙදොරට ගොස් "ස්වාමිනි ගොරිමඤ්ඣ සිටාණන්වහන්සැයි කියන්නාහ, ඒ සිටාණෝ රූ සොඬුන්ගේ බස් අසා සිමිදුරු කවුළුව සඛීපයේ සිටකිමෙක්ද දරුවෙනි! කියන්නාහ. ඉක්බිත්තෙන් බැණ නැංගාවුන්ගේ දෙකොළින් කෙළඳාරු වැහෙන්නේය. නිලුපුල් මල් ගත් අත් ඇතිව සැරහී දූලයෙහි සිටි ගැණු දෙන්නා මලින් කෙළවිස මල් අතුරු වීජියට දමන්නාහ. රූ සොඬහු ඒ මල් ගෙන දියෙහි සලා පියා පැලඳගෙන රාහලට වදනාහ. ඒ ගොරිමඤ්ඣ සිටාණෝ නම් මෙබඳු සම්පත් ඇත්තාහ. සෙනකයෝ මේ දෘෂ්ටාන්තයොට රජ්ජුරුවන්ට කිහ.

සෙනකයන් කී බස් අසා රජ්ජුරුවෝ පුන මහෞෂධ පණ්ඩිතයෙනි! සි කිහ. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ "දෙවයන්වහන්ස! සෙනකයෝ කුමක් දනිද්ද? බන්හුලු වැගිරගිය තැන අවුලා කන සුළුවකු වැන්නේය. ඉසංහන මුගුරු නොබලා දී බොන්නට වන් බල්ලකු වැන්නේය, මේලොව විඳගන්නා සම්පත්ම බලයි, ඉස වැවෙන අපා දුක් නමැති මහගුරු නොබලයි, ඇසුව මැනව දෙවයන්වහන්සැයි ගාථාවකින් කාරණයක් දක්වනසේක් "නුවණ නැත්තේ සුවයක් ලදින් එහිම ඇලුණේ කුශල කැමැත්තෙහි පමාවන්නේය. ප්‍රමාද ප්‍රත්‍යයෙන් පව් කරන්නේය, සසුනිවසනාදිවූ අනෙක ප්‍රකාරවූ දුකින් මඩනාලද්දේ විශෙෂයෙන්ම මුළාඛවට පැමිණෙන්නේය, අමුතු අමුතුව චක්‍රාකාරයෙන් පවත්නාවූ සුව දුකින් පිඩිතවූයේ ග්‍රීෂ්මකාලයෙහි දියෙන් ගෙනහැර අව්වෙහි ලූ මසකු මෙන් වෙව්ලන්නේය, මේ කාරණය දැන මම් නුවණැත්තේම උතුම්, ඉසුරුමත් නැනැත්තේ උතුම් නොවෙයි කියම්"සි වදාළසේක.

මහබෝසතාණන්වහන්සේ වදාළකා රණය අසා රජ්ජුරුවෝ කෙබඳුද ආවායීයෙනියි කිහ. සෙනක පණ්ඩිතයෝ "දෙවයන්වහන්ස! මූ කුමක් දනීද? මිනිස්සු සිටින්වා හෙවත් මිනිසුන් නබා වැඩ හවගත් ගසක් ඵල සම්පන්නවීනම් එසේවූ ගසටම පක්ෂීහු එළඹෙන්නාසේ කියා ගාථාවකින් එම උපමාව දක්වන්නාහු "වල හටගත් මිදුරු පක් ඇති වෘක්ෂයට අනෙක ප්‍රකාරවූ ශාරිකා ශකුණාදි ලිහිණියෝ හාත්පසින් යම්සේ අවුත් රැස්වෙද්ද, එපද්දෙන්ම පොහොසත් රත්රන් අමුරන් ආදි ධන සහිතවූ අවශ්‍යෙත උපභොග පරිභොග වසතු ඇති මෙබඳු පුරුෂයා කොහෝදෙන නමන්ට වඩ පිණිස සෙවිනාහ. මේ කාරණය දැක මම් නුවණැත්තේ දිළිඳු නැනැත්තේ උතුම් නොවෙයි, නුවණ නැතිවත් ශ්‍රීමත් නැනැත්තේම උතුමැයි කියම්"සි කිහ.

සෙනකයන් කී කාරණය අසා රජ්ජුරුවෝ කිමෙක්ද පුන මහෞෂධ පණ්ඩිතයෙනි! සි කිහ. "මේ සෙනක පණ්ඩිතයෝ කුමක් දනිද්ද? ඇසුව මැනව දෙවයන්වහන්සැ"සි කාරණයක් දක්වන නැනැත්තෝ ගාථාවකින් "පවත්වනලද අණසක ඇති නුවණ නැත්තේ උතුම් නොවෙයි. කුමක් හෙයින්ද යත්? නාඩන බඹුනාදි නොයෙක් දරුණුකම්න් ජනයන්ට දුක් දී වසතු ලබන්නේය. එසේවූ අඥානයා බලවත් පශ්චාත්තාප දුඃඛයෙන් අභිභූතව හඬන්නාම භයානකවූ නරකයට යමපල්ලෝ නොකැමැතිසේම අදනාහ, හෙවත් නරකයෙහි බොහෝ දුකට පැමිණෙන්නේය, මේ කාරණයද දැක මම දිළිඳු වුවත් නුවණැත්තේම උතුම, ඉසුරුමත් වුවත් නුවණ නැත්තේ උතුම් නොවෙයි කියම්"සි වදාළසේක.

නැවත රජ්ජුරුවන් විසින් කිමෙක්ද සෙනකයෙනි, සි කිකල්හි ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, 'ඇල හෝ සඳු රැලි ආදී කිසි ජලාශය කෙනෙක් නිමිනව ගොස් ගහට අඩා බසිද්ද, ඔහු හැමදෙනම තමන් තමන්ගේ සථොකතවූ හොඹ, ඇල ඇනාදි නම්ගොත් හරණාහ, ඒ ඇල, හෝ, ආදින්ගේ ප්‍රවෙශයට ආධාරවයෙන් ගංනාවොමේ මහමුදව වදනා ලබන්නී ගංනාය යන ව්‍යවහාරය නැතිව ගොස් මුහුද හා එක්වීමෙන් මුහුද

යයි යන ව්‍යවහාරයට යන්නේද? එපරිද්දෙන් ලෝවැස්සෝ තුමූ සමඟත් ඇත්තවූහුම පිනිවසොට ඇත්තාහ, හෙවත් මහානුභාවඇත්තෝද ඉසුරුමත් නැනැත්තවුන් කරා පැමිණ මුහුදවවුන් ගඟක්සේ තෙජස් නැති හෙයින් ප්‍රසිද්ධව නොපෙනෙන්නෝය, මේ කාරණය දැන මම නුවණැත්තේ උතුම් නොවෙයි. ඉසුරුමත් නැනැත්තේම උතුමැයි කියමි"යි කිහ.

නැවත රජ්ජුරුවෝ කිමෙක්ද මහෞෂධ පණ්ඩිතයෙනි! කිහ. පණ්ඩිතයන්වහන්සේ "ඇසුව මැනව දෙවයන්වහන්ස්‌යි කියා ගාථා දෙකකින් කාරණයක් වදාරතසේක් "මහත්වූ සාගරයෙක් උපමා කොරෙද්ද, ඒ සාගරයට නානා යම්තණ ලේවරවැනි ආදිවූ අනෙකප්‍රකාර ගං හෝ හැමකල්හිම ඇදෙනෙක් හැන, මෙතෙක් නොය, යන ප්‍රමාණයක් නැතිව නොයෙක් දිගින් හැඩ බඩින් ද, සමුද්‍ර සඞ්ඛ්‍යාත ඒ සාගරය තෙමේ අනවරතවූ සියදහස්ගණන් මහත්වූ රළ වෙන ඇත්තේ වෙරළ ඉක්මගහනොහී වෙරළම ගැසි කිදෙද්ද, එපරිද්දෙන්ම නුවණ නැත්තහුගේ තෙපුල් නුවණැත්තහු ඉක්ම නොයවන්නේමය. යම් කිසි අවිනීතයෙක්හි උපන් සැකයෙක් ඇත්නම් ඉසුරුමත්හුද දිළිඳු වූවත් නුවණැත්තහු කරා පැමිණ නිශ්චය කරගන්නාහුය, මේ කාරණය දැන මම නුවණැත්තේ උතුම, ඉසුරුමත් නුවණැත්තේ උතුම් නොවෙයි කියමි"යි වදාළසේක.

බෝසතාණන්වහන්සේ වදාළ කාරණය අසා රජ්ජුරුවෝ කිමෙක්ද සෙනානියෙනි!යි කිහ. සෙනානියෝ "ඇසුව මැනව දෙවයන්වහන්ස්‌යි ගාථාවකින් කාරණයක් දක්වන්නෝ "කායාදි සංයමයක් නැතිවත් යමෙක් පරිවාර සම්පත් ඇත්තේවිනම් එබඳු ඉසුරුමත් පුරුෂයෙමේ මහපිරිස් පිරිවරා අධිකාරණයෙහි හිඳ අනුන්ට පරලොවින් වැඩක්වන කාරණයක්වත්, අවැඩක්වන කාරණයක්වත් කියන්නේ වීනම් තෙජස් වී හෙයින් සභාමධ්‍යයෙහි ඔහුගේ බසට නැනෙන්නේය ඉසුරුමත් නැනැත්තේ හිමියන් නොතිමිකිරීම් ආදිවූ අවැඩට සුදුසු බසකුදු කිවහොත් සභාවට ඇදගියයුතු බව ශ්‍රීසංඝනාම කරන්නිය, ප්‍රඥතොමෝ එසේ කොටලිය නොහෙන්නීය. මේ කාරණයද දැන මම නුවණැත්තේ යටත්මය, ශ්‍රීමත් නැනැත්තේම උතුමැයි කියමි"යි කිහ.

නැවත රජ්ජුරුවන් විසින් 'කිමෙක්ද පුත මහෞෂධ පණ්ඩිතයෙනි!යි කී කල්හි පණ්ඩිතයන්වහන්සේ "මේ කෙළතොලු සෙනානියා කුමක් දනීදැයි වදාරා ගාථාවකින් කාරණයක් වදාරතසේක් "මඳ නුවණැති බාල තෙමේ අනුන් නිසාවත් තමා නිසාවත් බොරු බෙණෙයි නම් හේ සභා මැද නිගුත් ලබයි, පරලොව අපාය ගාමීද වෙයි, මේ කරුණත් බලා නුවණැත්තේම උතුම්, නුවණ නැති ඉසුරුමත් නැනැත්තේ උතුම් නොවෙයි මම කියමි"යි වදාළසේක.

ඉක්බිත්තෙන් සෙනක පණ්ඩිතයෝ ගාථාවකින් කාරණයක් දක්වන්නාහු 'ඒ නාළියක් සාල්නාළියක්වෙල්නාල් නාළියක් පමණවත් නැති, අසක් මස්සක් පමණවත් වැකුවක්නැති, එසේහෙයින් වෙලා යෙන්වෙලාවට දුකසේ ජීවත්වන්නාවූ පොළොව සමානවූ නුවණැත්තේ සභාමධ්‍යයේ ඉඳ, ඉදිරිකාරණයකුදු කියානම් ඔහුගේ ඒ වචනය සභාවට නොනැහෙන්නේය. යමෙක්

නුවණ නැතිවත් ඉසුරුමත්වීනම් ශ්‍රී ඔහු සෙවිනීය, එසේ හෙයින් ඉසුරුමත් තැනැත්තහුසම්මුඛයේ නුවණැත්තේ කඳෙපැණියෙක්මෙන් වැටහෙන්නේය. මේ කාරණය දැක මම ප්‍රඥවන්ත තැනැත්තේ හිහවිය, ඉසුරුමත් තැනැත්තේම උත්කෘෂ්ටයයි කියමි"යි කිහ.

නැවත රජ්ජුරුවන් විසින් 'කිමෙක්ද! ප්‍රභා මහෞෂධ පණ්ඩිතයෙනි! යි කිඹල්හි පණ්ඩිතයන්වහන්සේ සෙනකයා කුමක් දනිද! මේ ලොව විද ගන්නා යශස බලයි, පරලොව අපාය දුක් නොබල'යි කියා ගාථාවකින් කාරණයක් දක්වනසේක්, උදරවූ නුවණැත්තේ අනුන්ගේ හිඳීම පිණිස වේවයි බොරුවක් නොකියන්නේය, සබ්‍රහ්මචාරීන්වූ හෙතෙමේ මහ පිරිස් මැද බොහෝදෙනා විසින් 'කී නියා යහපතැ'යි පිදිය යුතු වන්නේය, පරලෙව්හිදු සුභාෂිත කාරණයෙන් සුගතියටම යන්නේය. මේ කාරණයද දැක මම නුවණැත්තේම උතුම, නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ උතුම් නොවෙයි කියමි"යි වදළසේක.

නැවත සෙසේදැයි විවාළ රජ්ජුරුවන්ට සෙනකයෝ ගාථාවකින් උත්තරයක් කියන්නෝ "මහරජ! ඇසුව මැනව, ඇතුන් අසුන් ගවමහිෂාදි වස්තු හා මුතු මැණික් ආදිවූ රුවන්ද, මැණික්මය කුණ්ඩලාභරණ හා කණකඩවන නූපුර යනාදි ආභරණයෝද, ඉසුරු කුලයෙහි උපන්නාවූ දෙවඟනන් හා සමාන වරඟනෝද, අවශෙෂ පරිවාර ජනයෝද යන සියල්ලම පොහොසත් තැනැත්තහුට උපභොග පරිභොග පිණිස වන්නාහ. නුවණ ඇතත් දුක්පත් තැනැත්තවුට එසේ වන්නාහු නොවෙති, මේ කාරණයෙනුත් නුවණැත්තේ උතුම් නොවෙයි. සම්පත් ඇත්තේම උතුම්වෙයි කියමි"යි කිහ.

ඉක්බිත්තෙන් පණ්ඩිතයන්වහන්සේ වදරනසේක් "මේ නුවණ නැති සෙනඟා කුමක් දනිද"යි එක් කාරණයක් ගෙනහැර දක්වන්නෝ ගාථාවකින් "නොසලකා කරනලද මෙලොවින් පරලොවින් අනර්ථයකවූ කටයුතු ඇති අඥානවූ තෙපුල් ඇති මඳ නුවණැත්තහු දිරාගිය සැවයක් නිරපේක්ෂා කොට හැරපියා යන සේක්මෙන් ශ්‍රී නොමෝ හරනීය. තවද ඊට කාරණා කිමෙක්ද යතහොත්? ප්‍රථම කල්පයෙහි අකුසල් නම් කළු බව සුදු බව නොදන්නා මිනිසුන්ට ආයු බොහෝ සවයෙහි දඹදිව චෙතිය නම් රජකෙනෙක් ඇතිවූහ. උන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමන්නේය. මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමන්නේය. ආකාශයෙහි පලක් බැඳගෙන ඉඳිනට සමවූ සෘඩි ඇත්තාහ. කාමාවචර දෙවියෝ සහාරදෙනෙක් නිරන්තරයෙන් රැ දුවල් ආරක්ෂා ඇතිව රැකවල් ගෙන සිටිනාහ. අනන්ත ඇතුන් අසුන් ආදිවූ සියුරහ සෙනගින් යුක්තව දසදහසක් යොදුන් දඹදිවට අගරජ කරන්නාහ. එසේවූ ඒ චෙතිය රජ්ජුරුවන් කී බොරුවෙන් ශරීරයෙන් නික්මෙන වන්දනගන්ධයද මුඛයෙන් නික්මෙන උතුපල ගන්ධයද නැතිව දුගඳ හමන්නට වන. සතරදිග රැකවල් ගෙන සිටි දෙවියෝද ඔහු හැරපියා නැගී ගියාහ. ආකාශයෙහි පලක් බැඳ සිටිනට සමර්ථ සෘඩි නැතිව බිමටම බට්ටාහුය. කිවාවූ මුසාවාදය කාරණාකොටගෙන ජීවමාන ශරීරයෙන්ම පොළොව විවරව අවිචියෙන් හිනිදැල් අවුත් රත් පලසක් බදුව වළඳිනා ලද්දාහු නරකයෙහි

උපන්හ. සතරදිග දෙවියන් රැකවල් ගත් එබඳු ඔහුගේ සැපත පවා නුවණ නැතිව අපායට යනකල පිටිවහල් නොවී මුහුදු එතෙරට මෙතෙර සේද, ආකාශයට පොළොවසේද නොළංවිය. එසේහෙයින් මේ කාරණය දැක මම නුවණැත්තේම උතුම, නුවණ නැති තැනැත්තේ උතුම් නොවෙයි කියමි"යි වදාළසේක.

ඉක්බිත්තෙන් රජපුරුවෝ "කිමෙක්ද සෙනකයෙනි!යි කී සාල්හි කිමෙක්ද දෙවඟන් වහන්ස! මේ බාලදරුවෝ කුමක් දනිද්ද? තවත් මා කියන කාරණයක් ඇසුවැනැවැයි "පණ්ඩිතයන්වහන්සේ කරඬුවම් හෙවත් කියනලද උත්තරයක් ඇත්නම් නැතිකෙරෙමියි" සිතා ගාථාවකින් කාරණයක් දක්වන්නාහු, දෙවඟන් වහන්ස! නුවණින් තීරණය කටයුතුවූ කාරණයෙහිම සෑක උපන්කල සෙනකාදි පණ්ඩිතවරුන් කැඳවයි අප හැම කැඳවා යවූ ඔබවහන්සේගේ සැකයදුරලන මෙසේවූ ප්‍රඥාසම්පන්නවූ අපි පණ්ඩිතවරු පස්දෙනම දෙහොත් මුදුනෙහි බැඳගෙන ඔබවහන්සේට සම නොවෙමුව අප ඔබවහන්සේ දෙදෙව්ලොව දෙවියන් පිරිවරා ඔවුන්ගේ ආනුභාව මැඩ පවත්වන්නාවූ සක්දෙව් රජතුමෙන්, කිතීනි හා තෙජසින් පරිවාර සම්පත්තීන් මැඩගෙන පවත්නාසේඃ. ඉදින් නුවණැත්තවුන් උතුම්වුවහොත් අප අනුශාසකව සිටි බැවින් ඔබවහන්සේ අපට යටත් වූවමනාවේද, එසේද නොවන හෙයින් මේ කාරණය, දැක මම නුවණැත්තේ උතුම් නොවෙයි පරිවාර සම්පත් ඇති තැනැත්තේම උතුමැ"යි කියම් කිහ.

සෙනකයන් විසින් කියනලද දැන් මේවූ කාරණයම අසා රජපුරුවෝ "සෙනකයන් විසින් ගෙනහැර දක්වන ලද්දාවූ මේ කාරණය ඉතාම යහපතැ. මපුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ මේ සෙනකයාගේ වාදය බිඳ අනික් කාරණයක් ගෙනහැර දක්වන්නට පොහොසත්හුදෝ?"යි සිතා මේ කිමෙක්ද? පණ්ඩිතයෙනි!යි කිහ. සෙනකයා තමන් විසින් මේ කාරණය නෙනහැර දැක්වූකල මහබෝසතාණන් වහන්සේ විනා ඒ වාදය බිඳින්නට සමර්ථ අනික් කෙනෙක් මුළු දඹදිව නැත්තාහ. එසේහෙයින් බොධිසත්ත්වයන් වහන්සේ තමන් වහන්සේගේ විදුරක් සදෘශ අසාධාරණවූ ප්‍රඥානුභාවයෙන් ඒ සෙනක පණ්ඩිතයන්ගේ වාදය බිඳිනාසේක්, "දෙවඟන් වහන්ස! මේ නුවණ නැති සෙනකයා කුමක් දනිද? මේ ලොව විඳගන්නාවූ යසස් බලයි. නුවණැති අරුම නොදන්නේය. නුවණැති අරුම ඇසුව මැනව දෙවඟන් වහන්සැ"යි කියා ගාථාවකින් කාරණා දක්වනසේක්, "නුවණ ඇත්තන් විසින්ම පසිඳවිය යුතුවූ එබඳු කටයුත්තක් උපන් කල්හි නුවණ නැති ඉසුරුමත් තැනැත්තේ නුවණ ඇත්තවුට ගැත්තකුමෙන් පවත්නේය නුවණැත්තේ ප්‍රඥයෙන් කටයුතුවූ සියුම්වූ යුක්ති ආදි ගැටලුසු කාරණයක් සෑහැර කියාද, එබඳු කාරණයෙහි නුවණැත්තේ අවලොකනය කොට ගත නොහී ඒක්ෂණයෙහි කණගෙරි වල්වන්නාසේ මුළා බවට පැමිණෙන්නේය. මේ කාරණය දැන නුවණැත්තේම උතුම, සම්පත් ඇති නුවණැත්තේ උතුම් නොවේ'යි කිහ. මෙරගල් මුදුනෙහි සත්රුවන් ගෙනහැර වගුරුවන්නාක්හු මෙන්ද, ආකාශයෙහි පුන්සඳ මඬල ඔසවා පාන්නාක්හු මෙන්ද උත්තර නෙනහැර දැක්වූසේක. මෙසේ මහබෝසතාණන් වහන්සේ විසින් නුවණෙහි අරුම වදාළ කල්හි, ඉක්බිත්තෙන් රජපුරුවෝ සෙනක පණ්ඩිතයන්ට කිමෙක්ද? සෙනකයෙනි! පෝසතු තම් උත්තරයක් කියව"යි කිහ.

සෙනකයාත් කොටුමෙහි පටවා තුබූ වී කා නිමවා කොටුපත්ල අතහා පියා රැකෙන මාන සිතන එකක්හු මෙන් උගත් උත්තර නිමවාපියා ඔත් තෙහි වැටහෙන උත්තරයක් නැත්තේ එසේහෙයින් කරබාගෙන කොදුර කොදුරා සිතිවිල්ලේ හුන්නේය. ඉදින් ඒ සෙනකයෝ අනික් උත්තරයක් ගෙනගැර කිවු නම් ගාථා දහසකින්වත් මේ **උම්මග්ග ජාතකය** නොතිමෙන්නේය. ඒ සෙනකයන් කියහෙන උත්තරයක් නැති කල්හි ගැඹුරු මහවතුරක් එකපැහැර තමන්නාක්හු මෙන්ද, ආකාශ ගංගාව පොළෝතලයට බහන්නාක්හු මෙන්ද, මහබෝසතාණන් වහන්සේ මත්තේ ප්‍රඥාවම වර්ණනාකරනසේක් ගාථාවකින් "එකාන්තයෙන්ම බුදු **පසේබුදු මහරහතුන්** ආදීවූ නුවණැත්තවුන් විසින් නුවණ උතුමැයි පසස්නා ලදී. යම්හෙයකින් නුවණ නැති මිනිස්සු සම්පතෙහි ඇලුණාහු නම් එහෙයින් ශ්‍රී කාන්තාව උතුමැයි කියති. මෙලොව පරලොව දන්නා නුවණින් වැඩසිටියන්ට මේ යසස් නම් ගැරවිල් කුණක් හා සමානය. ප්‍රඥාව අසදෘශවූ සවරූප ඇත්තිය. එසේහෙයින් මහාසාගරයට වෙරළ ඉක්මගත නොහැන්යාසේ ශ්‍රී කාන්තා තොමෝ කිසිකලෙකත් ප්‍රඥාවන්තයා ඉක්මගත නොහෙන්නිය, දෙවයන්වහන්ස"යි වදාළසේක.

ඒ අසා රජ්ජුරුවෝ මහබෝසතාණන්වහන්සේගේ ප්‍රශ්න විසඳීමෙන් සතුටුව බුදු හෙනකුන් පරිද්දෙන් අපට විසඳා කිහ. ඒ තොපගේ ප්‍රශ්න ව්‍යාකරණයෙහි සතුටුවූ මම, ගෙදරි දහසක්ද, නැහෙන්නට උතුම් හස්ත්‍යාලඞ්කාරයෙන් සරහන ලද්දාවූ සුශික්ෂිත හස්තිරාජයෙක්ද, අජානීය අසුන් ඔදනලද රථාලඞ්කාරයෙන් සරහනලද රථ දහසක්ද, ධන ධාන්‍ය යෙන් සමෘඩවූ එකි එකි ගමින් අවුරුද්දකට ලක්ෂයක් බැගින් අය නිමෙන ගම් සොළොසක්ද යන මෙකී වස්තූන් තොපට දෙමි"යි කියා සිඟල්ල දෙවූහ.

සිරිමණ්ඩ ප්‍රශ්නය යි.

එතැන් පටන් කොට මහබෝසතාණන්වහන්සේගේ යශස කිරිමුහුදු පරිද්දෙන් මහත්වූයේය. ඒ සියලුසම්පත් බුහණියෝ උදුම්බරාදෙවිම වීවාරත්. බෝසතාණන්වහන්සේ සොළොස් හැවිරිදි වූකල "මාගේ මලණුවෝ වැඩි මාලුව ගත්හ, උන්නේ යශසත් මහත, උන්ට සමාන කුලයකින් සරණපාමා දෙන බව සුදුසුය"යි සිතූහ. මෙසේ සිතා එපවත් රජ්ජුරුවන්ට දන්වූහ. රජ්ජුරුවෝ ඒ අසා සොම්නස්ව "යහපත සොඳුර! එපවත් උන්ට කියව"යි කිහ. දෙවිත් මහබෝසතාණන්වහන්සේට එපවත් දන්වූහ. පණ්ඩිතයන්වහන්සේවිසින් යහපතැ'සිගිවිසිකල්හි එසේවීනම් මලණඹ! සුදුසුතැනකින්තුමා රිඤාවක් ගෙනෙමෝදැ"යි කිහ. මහබෝසතාණන්වහන්සේ "ඉදින් මුන්වහන්සේලා විසින් ගෙන්වා පාවාදෙනලද කුමාරිඤාවක් කිසිසේත් මට අභිප්‍රාය නොවන්නිය. එහෙයින් මම පළමුකොට සුදුසු එකක් පරීක්ෂාකොරම්"යි යිතා දෙවිවරුන්ට! කීපදවසක් රජ්ජුරුවන්වහන්සේට මා අසවල් කාර්‍යය සාධා ගියයි නොකිව මැනව. එක් කුමාරිඤාවක් පරීක්ෂාකොට මම අභිප්‍රාය එකක් ලදිම්නම් නුඹවහන්සේට දන්වාලම්"යි කිහ. බිසවුන් විසින් "යහපතැ ලණඹ! එලෙසකරව"යි කීකල්හි මහබෝසතාණන්වහන්සේ බිසව් වැද

තමන්වහන්සේගේ ගෙට ගොස් හිත හිතුණත්ට එපවත් කියා එක්තරා වෙශ්‍යකින් සන්නාලි උපතරණ ගෙන, උදකලාවම උතුරු වාසල් දොරින් නික්ම උතුරු යවමැදුම්ගමට වැඩිසේක.

එසමයෙහි වනාහි උතුරු යවමැදුම්ගම දුක්පත්ව සිටි පුරාතන සිටු කුලයෙක් විය. ඒ සිටුකුලයෙහි අමරාදෙවි නම් එකම දුවණියෙනෙක් බැලූ වන්ට ප්‍රියකරුවූ රූ ඇත්තාහ. සියලු සත්‍රීලක්ෂණයෙන් සමපතනයහ, මහ පින් ඇත්තාහ. ගැණු රුවට හොබවනලද ඇඳි රූකඩක් සමානයහ. ඒ අමරාදෙවී තුමූ එදවස්ම හුළඟැන් පිසගෙන පියාණන් සානතැනට යෙමිසි නික්ම මහ බෝසතාණන්වහන්සේ වඩනා මඟට පිළිපන්හ. මහබෝසතාණන්වහන්සේ ඉදිරියට එන්නාවූ ඒ කුමාරිකාව දැක සත්‍රීලක්ෂණයෙන් සමන්විත ,සත්‍රියකා ඉදින් සවාමීන් නැත්තිනම් නම් ''මෝ තොමෝ මට බිරින්දට සුදුසුය''සි සිතූසේක. ඒ අමරාදෙවිද මහබෝසතාණන් දැනලාම ''ඉදින් මෙබදු පුරුෂයක්හුගේ ගෙයි වූයෙම්නම් කුටුම්බ සණ්ඨාපනය කරන්නට හෙවත් වසතුරුස්කරන්නට පිළිවනැ''සි සිතූහ. ඉක්බිත්තෙන් මහබෝසතාණන්වහන්සේ ''මැගේ සැමියන් ඇති නැතිබව නොදනිමි. එපවත් හසාමුද්‍රයෙන් විචාරම්. ඉදින් මෝ නුවණැත්ති විනම් හසාමුද්‍රයෙන් විචාළා දැනගන්නිය''සි සිතා දුර සිටම ඇඟිලි හකුළුවා මිට සාළසේක ඒ අමරාදෙවීත් ''මේ පුරුෂයා මාගෙන් සැමියන් ඇත්ත නැත්ත විචාරන්නේය''සි දැන අත්ල විදහා ලූහ. මහබෝසතාණන්වහන්සේ ,සරණ නුවුණ බව දැන සවම්පයට ගොස් ''සොඳුර! තෙපි කිනම්මුදැ''සි විචාළසේක. සවාමිනි! ගිය දවස වේවයි දැන් වේවයි මතු දවස වේවයි සමසතා ලොකයෙහි යම් නමෙක් නැත්නම් මම ඒ නම්''සි කිහ. ''සොඳුර! ලොව උපන් සතුන්ගෙන් නොමියන කෙනකුන් නැති හෙයින් ''අමරා'' නාමය නැත්තේය; තෙපි එනම්මුදැ''සි විචාළසේක. එසේය සවාමිනි!සි කිහ. සොඳුර! කවුරුන්ට කැඳ ගෙනයව්දැයි විචාළසේක. පුළු දෙවතාවන්ටයයි කිහ. පුළු දෙවතාවෝ නම් මවුපියෝය. ''තොපගේ පියාණන්ට කැඳ ගෙනයව්දැ''සි විචාළසේක. සවාමිනි! එසේයයි කිහ. තොපගේ පියාණෝ කුමක් කෙරෙද්දැයි විචාළසේක. එනක් දෙනක් කෙරෙතියි කිහ. එනත් දෙනත් කිරීම නම් සීසෑමය,සි සාදැයි සොඳුර! විදුළසේක. සවාමිනි! එසේයයි කිහ. තොපගේ පියාණෝ කොතැනක සාද්දැයි විචාළසේක. ''යම් තැනකට එන වරක් ගිය කෙනෙක් නොඑද්දිද, එතැනය''සි කිහ. එසවිටෙක ගිය කෙනකුන්ගේ පසුව නොඑන තැන සුසානය, සොඳුර! සෝනක් සවම්පයෙහි සාද්දැයි'' විචාළසේක් එසේය සවාමිනි!සි කිහ. සොඳුර! අදම එවිදැයි විචාළසේක. ඉදින් ආවොත් නොඑම්. නාවොත් එම්''සි කිහ. ''සොඳුර! තොපගේ පියාණෝ ගහකින් එතරක සාති, එයට කාරණා කිමෙක්දැයි යතහොත්? ගහ දිය ආවොත් නොඑන නියාය, දිය නොආවොත් එන හෙයිනැ'සි වදාළසේක. එසේය සවාමිනි!සිකිහ.

මෙසේ මෙපමණක් පෙර පසු කථාකොට අමරාදෙවී තුමූ හුළඟැන් දුවි මිනෙව සාමිනි!සි පැවිරුහ. බෝසතාණන්වහන්සේ ආදියෙන් කිපෙරුත්ත නොඉවසිම් අවමඟුලැ''සි සිතා ගහපත බොමිසි වදාළසේක. අමරාදෙවී කැඳ සැළිය ඉසින් බා තුබූහ. මහබෝසතාණන්වහන්සේ ''ඉදින් මිණඩය නොදෙව අතට පැන් නොදීම කැඳ අතට දිනිනම් මෙතැනම හැරියා යෙම්''සි සිතූසේක. ඒ අමරාදෙවී වනාහි මිණඩයෙන් පැන් ඇරගෙන

අවුත් අතට දීලා සිස් මණ්ඩය අත නොතබා බිම තබාලා සැළියේ කෑද අලලා හුළුකැහිනින් මණ්ඩය පුරාලූහ. වැළිත් ඒ කෑදෙනි හුළු මිදවූයේය. ඉක්බිති බෝසතාණන්වහන්සේ "කිමෙක්ද සොඳුර! හුළුකැන් ඉතාම් බොල් වනැ"සි වදාළසේක. පැන් නොලද්දේය සවාමිනියි කිහ. "තොපගේ කුඹුර පුදිනා අග දිය නොලදුයි සිතමි"සි වදාළසේක. අමරාදෙවීන් එසේය සවාමිනි කිහ. අමරාදේවි පියාණන්ට හුළුකැන් තබා බෝසතාණන්වහන්සේට හුළු කැන් පෙවූහ. උන්වහන්සේ හුළුකැන් අනුභවකොට අත කට සොධා සොඳුර! තොපගේ ගෙට යමිහ, අපට මහ කියවයි වදාළසේක. අමරාදෙවි යහපතැයි කියා තමන්ගේ ගෙට මහ කියන්නාහු "මේ මහ ඔස්සේ හොස් ඇතුළු ගමට වන්කල යම් තැනෙක හස්සුණු තබා විකුණන සල්පිලද, ඉන්ඕබ්බට ගියකල කෑද තබාගෙන විකුණන සල්පිලක්ද, ඉන් ඔබ්බට ගියකල විපි සිටි නොවලිල ගසෙක්ද ඇත්තේය. ඒ ගස මුලට ගියකල යම් අතකින් අනුභවනරද්ද ඒ අත මග යන්නට කියමි. යම් අතකින් නොනද්ද, ඒ අත යන්නට නොකියමි. හෙවත් දකුණත මහවැඩිය මැනව, වමත මහ නොවැඩිය මැනව, ඒ මහය, හෙවත් යවමැදුම් ගම අපගේ දෙමව්පියන්ගේ ගෙට මහය, මා සනහා කී මහ දැන වදාළ මැනවයි" කිහ.

ජනපථ ප්‍රශ්නයයි.

මෙසේ ඒ අමරාදෙවී තුමූ බොධිසත්වයන්වහන්සේට මහ කියාලා දියාණන්ට හුළුකැන් ඇරගෙන නැගීගියහ. මහබෝසතාණන්වහන්සේත් අමරාදෙවින් කී මහින් උන්ගේ ගෙට වැඩිසේක. ඉක්බිත්තෙන් අමරාදෙවින්ගේ මැනියෝ පණ්ඩිතයන්වහන්සේ දැන හිඳිනට අස්නක්දිලා පුතණ්ඩ! බොන පරිද්දෙන් හුළුකැන් අතට වඩාලම්දු'සි කිහ. මැනියන්වහන්ස! අපගේ නැහණියෝ අමරාදෙවී කැඳින්තක් පෙවූහ"සි වදාළසේක. අමරාදෙවින්ගේ මැනියෝ මාගේ දියණියන් නිසා ආ සොහොයක් වනැසි සිතූහ. මහබෝසතාණන්වහන්සේ උන් දුක්පත්නියාව දන්නාහුද "මැනියන්වහන්ස! මම සන්නාලියෙකිමි, ගෙත්තම් කටයුතුවූ කිසිවක් ඇද්දු', යි විචාළහ. පුතණ්ඩ! විද්ද යුතු කොට්ට මාවුලා ආදිය ඇත ඒ විද්දවාගෙන දී ලන්නට සුදුසු මිලයෙක් නැතැ"යි කිහ. මැනියන්වහන්ස! මිලයෙන් කාර්‍යයෙක් නැත. ගෙනෙව විද දිලමි"සි වදාළසේක. අමරාදෙවින්ගේ මැනියෝ කඩරෙදි හැරගෙන ගෙත්තම් කරන පරිද්දෙන් දුන්හ. මහබෝසතාණන්වහන්සේ හෙනා ගෙනා රෙදි හා වුව මනා වුවමනා දෙයද නිමවූ සේක්මය. (පිනැත්තන් කරන දෙය සිතූලෙස ටම සමෘඩ වන්නේය.) ඉක්බිත්තෙන් බොධිසත්වයන්වහන්සේ අමරාදෙවින් ගේ මැනියන්ට මැනියෙනි! වීපියක් පාසා අඩගාවියව'සි වදාළසේක. අමරාදෙවින්ගේ මැනියෝ ගම මුළුල්ලේම අඩගැහ. මහබෝසතාණන්වහන්සේ ගම් ඇත්තන් ගෙනා ගෙනා කඩින් සන්නාලි මේවරකොට එක දවසින්ම මසු දහසක් ලත්සේක. අමරාදෙවින්ගේ මැනියෝද බොධිසත්වයන්වහන් සේට දවල් බත් පිස කවා පුතණ්ඩ! රැට සාල් සොහොක් ගරම්දුයි විවා ළහ. මැනියන්වහන්ස! මේ ගෙයි යම් පමණෙක් කත්තම් එපමණින්ම බත් පිසුවමැනවැයි වදාළසේක. අමරාදෙවින්ගේ මැනියෝත් බොහෝවූ රස මසුවුලෙන් යුක්තකොට බත් පිසූහ. අමරාදෙවිත් ඉසින් දරම්පියක් හා හිනින් පලා ගිනක් ඇරගෙන වලින් අවුත් ඉදිරියේ දෙර දරම්පිය හෙළා

පැලඳෙරින් ගෙට වන්නුය. උන්ගේ පියාණෝ වනාහි ඇඳිරි ගැසී ගිය සාල ගෙට ආහ. බොධිසත්වයන්වහන්සේට අනෙකප්‍රකාර අනගි රසයෙන් යුක්තවූ ආහාර අනුභවකරවූහ. අමරාදෙවී මවුපිය දෙදෙන බත් කවා පසුව තුමූත් කා මවුපිය දෙදෙනා පය සෝධවා තෙල් ගල්වා මහබෝසතාණන් වහන්සේ පය සෝධවා තෙල් ගැල්වූහ. පණ්ඩිතයන්වහන්සේ අමරාදේවීන් විමසනසේක් සිප දවසක් එහිම වසනසේක.

ඉක්බිත්තෙන් එක්දවසක් උන් විමසනසේක් "සොඳුර අමරාදෙවිනි! සාල් මනාවක් පමණ ඇරගෙන ඉන් මට කැඳත් බතුත් අවුලුපතුත් පිස ව"සි වදාළසේක. අමරාදෙවීන් "එහා සාල් මනාවෙන් මෙතෙක්ද තෙසේ පිසම්ද"සි නොකියා යහපතැයි වදාළ බස ගිවිස ඒ සාල් මනාව පැස මුල් සාලින් බත්ද කඩසාලින් කැඳද සුන්සාලින් කැවුම්ද පිස ඊට සුදුසුවූ අවුලුපත් පිස, මහබෝසතාණන්වහන්සේට අවුලු සහිත කැඳ දුන්හ. කැඳ කබලක් මුඛයට ගත් පමණකින්ම සියලු රස නහරවැල් පිනා සිටහත්හ. පණ්ඩිතයන්වහන්සේ උන් විමසන පිණිසම "සොඳුර! තොප පිසමන් නොදන්නාකල තුමක් පිණිස මාගේ සාල් නසාපුද"සි කියා මුඛයට ගත් කැඳ කබල කාරු දමාපියසේක. අමරාදෙවීත් නොකිපී කැඳ යහපත් කොවිනම් කැවුම් කැවැමැනව සවාමිනි!සි කියා කැවුම් අතට දුන්හ. කැවුම් මුඛයෙහි ඵුබූ පමණකින්ම රස නහරවැල් පිනානියේය. එයද එසේම කාරුදමූසේක. ඊටත් නොකිපීම් "එසේවිනම් බත් අනුභව සළ මැනව"සි කියා බත් අහ තිබුහ. එසින් ආලොපයක් මුඛයෙහි තබන්නාම සියලු රස නහරවැල් පිණා ගියේය. බොධිසත්වයන් වහන්සේ ඒ බත්ද එසේම කාරුදමා "තොප පිස මන් නොදන්නාකල මා දුනසේ සොයාගත් දෙය කුමට නැසුදැ"සි කිපි හොනකුන් මෙන් තුන්වඟයම එක්කොට අඹරුපියා අමරාදෙවීන් ඉස පටන් ඇඟ මුළුල්ලෙහි ගල්වා දෙර අව්වෙහි සිටින්නට වදාළසේක. අමරාදෙවීන් ඊට මදකුත් නොකිපීම යහපත සවාමිනි!සි දෙර අව්වෙහි හුන්නාහ. මහ බෝසතාණන්වහන්සේ අමරාදෙවීන් මන් නැතිබව දැන "සොඳුර! මෙහි එව"සි වදාළසේක. ඔවුන් දෙවිටක් නොකැඳවනතුරු එකබසින්ම සවමීපයටඑවූහ. මහබෝසතාණන් වහන්සේ නුවරින් එනසේක්ම මසු දහසක් හා එක් සීන් කඩක් බුලත්පසියෙහි ලාගෙන වැඩිසේක. උන්වහන්සේ ඒ කඩමැත්තොට අමරාදෙවීන් අත තබා "සොඳුර! තොපගේ යෙහෙළනියන් සමඟ ගොසින් නාවියා මේ කඩ ඇඳගෙන එව"සි වදාළසේක. ඔවුත් වදාළ ලෙසම කළහ. පණ්ඩිතයන් වහන්සේ සන්නාලි කමින් උපයාගත් මසුරන්ද නුවර සිට ගෙනා මසුරන්ද යන මේ සියල්ල අමරාදෙවීන්ගේ මවුපිය දෙදෙනාට දීලා දෙමහල්ලන්ට "නුඹවහන්සේ රජුනුවට නොසිතුව මැනව"සි අස්වසා අමරා දෙවීන් හැරගෙන නුවරට ගොස් තවත් විමසන පිණිස දෙරටුපාලයාගේ ගෙයි නිදුවා දෙරටුපාලයාගේ අඹුවට සවරූප කියාලා හාමන්වහන්සේ ගෙට ගොස් පිරිමින් දෙදෙනකු සැඳවා "අසවල් ගෙයි ගැණියක රඳවා ආමි; මේ මසු දහස ඇරගෙන ගොස් ඇ විමසව"සි මසු දහස දී යවූසේක. උසිත් බොධිසත්වයන් වදාළ ලෙසම ගොසින් අමරාදෙවීන්ට මසු දහස දික්කොට පිවාළහ. අමරාදෙවි මේ මසු දහස මාගේ සමුණන්ගේ පයපිසුන් නොඅගනේ ය"සි කියා උන් කි බස් නොගිවිස්සාහ. ඒ පුරුෂයෝ ගොස් පණ්ඩිතයන්

වහන්සේට දැන්වූහ. ඉක්බිත්තෙන් බොධිසත්වයන් වහන්සේ ඒ පුරුෂයන් නැවත නැවත තුන්වරක් දක්වා යවා නොගිවිස්නා හෙයින් සාරවහ වාර යෙහි "එසේවීනම් ඇ අත අල්වා ඇදගෙන එව"යි වදළසේක. ඒ පුරුෂයෝ ගොස් නොකැමැති පරිද්දෙන් ඇදගෙන ගියහ.

අමරාදෙවී මහබෝසතාණන් වහන්සේ සැපතෙහි සිටියවුන් හැඳින ගත හුහුණුවහ. මූහුණ බලා සිතාසුනාහ. නැවත හඬාවැටිහ; පණ්ඩිතයන් වහන්සේ අමරාදෙවී සිතාසුණු කාරණයත් හැඬූ කාරණයත් විචාළසේක. ඉක්බිති බොධිසත්වයන් වහන්සේට අමරාදෙවී සවාමිනි! හුඹවහන්සේගේ මූණ බලා සිතාසෙන්නෙම්, ඔබවහන්සේගේ දිව්‍ය සැපතක් හා සමානවූ සැපත් බලා මේ සම්පත් නොකාරණයෙහුත් ලදදෙයක් නොවෙයි. පුළිජාති යෙහි පින්කම් කොට ලබනලද කුශලකර්මයාගේ විපාකය නොසිතියහැකි නියාය සිතා සමාධින් සිතාසුණිමි; හඬන්නෙම් වනාහි, දැන් මිවස් පත ලැබෙයි කියා අහුන් විසින් රක්ෂිත ගොපිතව සිටි සත්‍රින් කරා එළඹ හෙවත් පරදාරකර්මකොට මහු නරකයට යන්නාහ'යි සිතා ඔබවහන්සේ කෙරෙහි දයාගෙන් හැඬිමි"යි කිහ. බොධිසත්වයන්වහන්සේ උන් පරීක්ෂාකොට පිරිසුදු අදහස් අතිබඹ දැන "යව මුන් මෙසේ මා නොගිවිස්සෙන් උන් ගෙනා තැනම ලාපියව"යි කිහ. අමරාදෙවීන් යවා නැවත තමන්වහන්සේ සන්නාලි වෙස් ගෙන එදා රෑ උන්දැගේ ළඟට ගොස් සැතපිලා දෙවන දවස් උදස නක්සේ රජගෙට ගොස් උදුම්බරාදෙවීන්ට සුදුසු කුමාරිකාවක් ගෙනා බව වදළසේක. ඛිසවුත් රජ්ජුරුවන්ට එපවත් කියා අමරාදෙවී පාවූදු පාඩහන් පාසලඹ පාදජාලා ශිරෝජාලා කණ්ණාභරණ ග්‍රීවාලඞ්කාර නෙපෝරිටු සිරි කන් ආදිවූ සියලු සත්‍රී ආභරණයෙන් සරහා මහත් හිදෙළුයෙහා හිදුවාලා ඉක්බිති රජ්ජුරුවන්ගේ විධානයෙන් ඒසා මහත් සත් සොඳුන් මියුලුනුවර නොයෙක් පරිද්දෙන් සරහා රන්ධජ නනා විසිතුරුකොට සරහා නිම්වනලද උතුම්වූ මංගල රථයෙක්හි වඩා "රථයෙහි දෙවින් උන්හොත් කැළි බවත් එළලි බවත් උස් බවත් මිටි බවත් රෑ ඇති බවත් නැති බවත් නුවර වාසින්ට නොපෙනෙන්නේ වේදැ"යි සිතා, දෙවින්ගේ රූපවිලාසය නුවරවාසි සියල් ලන්ම සුවයේ දක්නා පරිද්දෙන් රථයෙහි සිටුවා දෙවතාවන් හා සමඟ දිව්‍ය විථියෙහි නමාගත් තරුණදිව්‍යසත්‍රියන පරිද්දෙන් මහපෙරහරින් මහබෝසතාණන්ගේ ගෙට ගෙනවුත් සරණපාවාදී මඟුල් කළහ. රජ්ජුරුවෝ බොධිසත්වයන්ගේ සරණ මහුලහි එකි එකි වසතුවෙන් දහස් ගණන් මිල වටනා පඬුරු යවූහ වාසල් බලන්නවුන් ආදිකොට ගොපල්ලන් දක්වාත් මියුලුනුවර වාසින් ගෙන් පඬුරක් නොගෙන ගිය එකද සත්වයෙක් නැත. අමරාදෙවීද රජ්ජුරුවන් යැවූ පඬුරුසමයේ දෙකක්කොට බෙදා එක් භාගයක් ගෙවගෙනා අනික්භාගය නැවත රජ්ජුරුවන්ට යවූදැය. මෙම ක්‍රමයෙන් උදුම්බරාදෙවීන් ඇතුළුවූ නුවර වාසින් විසින් එවනලද සියලු පඬුරුසරියේ දෙකක්කොට බෙදා භාගයක් ගෙන නැවත භාගයක් උන් උන්ට යවා ඒසා මියුලුනුවර වාසින් හැමදෙනම එන දවසින්ම එක ඇයිල්ලෙන්ම සිත් ගත්හ. එවක්පටන් තුන්ලොවට ඇසක් වැනි මාගේ බොධිසත්වයන්වහන්සේ අමරාදෙවීන් හා සමඟ වාසයෙන් වාසය කරනසේක් රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළසේක.

සත්‍රී ප්‍රශ්න නිමි.

ඉක්බිති එක් දවසක් සෙනක පණ්ඩිතයෝ පුක්කුසාදි අනික් තුන් දෙනා තමන් සවමීපයට අවුත් බණවා "පින්වත්නි! අපි ගොවියා පුතු මහෞෂධ පණ්ඩිතයාව නොසැලෙමිහ, දැන් ගොවියා පුතු විසින් තමාට වඩා වියත් අඹුවක් ගෙනෙනලද කිසිවක් කියා රජ්ජුරුවන් සෙරේ ඌ බිදුවා පුව මැනවැ"සි කිහ. ආචාර්යයන්වහන්ස! අපි කුමක් කරමෝද නුඹවහන්සේම ඊට සුදුසු කාරණා සිතුව මැනවැ" සි කිහ. "මන්නාටය, නෙපි නොසිතව, උපායෙක් ඇහ, මම රජ්ජුරුවන්ගේ චූඩා මාණික්‍යය සොරා ගනිමි· පුක්කුසයෙනි! නෙවි රන් මාලාව ගෙනෙව, කාවින්දයෙනි! නෙපි රජ්ජුරුවන් පොරවනා පලස ගෙනෙව, දෙවින්දයෙනි! නෙපි රන්මිරිවැඩිසහල ඉගනෙව"සි කිහ. මෙසේ ඔහු සතරදෙනම වසඳවාගෙන් යටකි වසතු සතර රජගෙන් පිටත්කොට ගත්හ. ඉක්බිත්තෙන් "බොහෝදෙන නොදන්වා ගොවියා පුතු ගෙට යවම්හ"සි කියා සෙනකයෝ පළමුකොට තමන් ගත් මැණික මෝරු කළයක බහාලා සොල්ලක අත තබා "මේ මෝරු කළය අනික් කෙන කුන් ගතිහොත් නොදී, මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙයි ඉදින් ගනිත් නම් මිල නොහෙන කළුයෙන්ම දිපියා එව"සි කියාලා යවූහ.

ඒ කෙලි පණ්ඩිතයන්වහන්සේගේ ගෙදොරට ගොස් මෝරු ගනුවයි කිය කියා දුරවත් නොගොස් ඊ දුවවෙන්නීය. අමරාදෙවී දෙර යිපි තැනැත්තෝ ඒ කෙල්ලගේ ක්‍රියාව දැන මෝ අනික් තැනකට නොගොස් මෝරු ගනුවයි කිය කියා මෙතැනම දුවවෙන්නීය; එක් කාරණයක් වුවමැ නවයි සිතා තමන් ගෙයි කෙල්ලන්ට ඉඟිකොට ඔබ්බටයවා තුමූම අම්ම! මෙසේ එව මෝරු ගනුඉහයි ඒ කෙල්ල බණවා ඈ තමන් සවමීපට ආ කල්හි තමන්ගේ කෙල්ලන් අඩනා ආදිම කියාලූ හෙයින් නොඇසුවාසේ තමන් සවමීපයට නොඑන්නා "යව අපගේ කෙල්ලන් මෙතැනට බණවාලව"සි ඇම යවා කළුයෙහි අතලා ඇතුළෙහි තුබූ මැණික දැක ළඟට ආ කෙල්ලට "මැනියෙනි! නෙපි නවුරුන් සවමීපයෙහි සිට අවුදැ"සි විචාරා සෙනක පණ්ඩිතයන්වහන්සේගේ සොල්ලකිම්"සි කී කල්හි ඉක්බිති ඇගේද මවගේද නම් විචාරා එසේවිනම් මෝරු දෙවයි කියා "අම්ම නුඹදැ මෝරු ගන්න, කල මවිමිලයෙන් කායර්‍යය කිම්ද? කළුයෙන්ම ගතමැනවැ"සි කී කල්හි එසේවිනම් යවයි කියා ඈ යවා අසවල් මස අසවල් දවස සෙනකාචාර්‍යයෝ තුමූ තමන්ගේ අසවල් සොල්ල දුව අසවල් තැනැත්තිය අත රජ්ජුරුවන් වහන්සේගේ චූඩා මාණික්‍යය පණයම් පිණිස එවූහ"සි පතෙක ලියාගෙන ගත්හ.

පුක්කුස පණ්ඩිතයෝ රන් මාලාව සමන් මල් කරඹුවක ලාලා සෙන කාචාර්‍යයන් යැවූ ලෙසම යැවූහ. කාවින්ද පණ්ඩිතයෝ පලස පලා පැසෙක ලාලා යැවූහ. දෙවින්ද පණ්ඩිතයෝ රන් මිරිවැඩිසහල පිදුරු කැරැල්ලක් ඇතුළේ ලාලා යැවූහ. අමරාදෙවී උන් හැමදෙනා යැවූ දෙය හැරගෙන පතෙන වන දවස හා ගියවුන්ගේ නම් ලියා මහබෝසතාණන්වහන්සේට සඳරූප කියාලා තබාලූහ. ඒ සෙනකාදි සතරදෙනම වසතු සතර උපායෙන් බෝසතාණන්ගේ ගෙට යවා, රජගෙට ගොස් කිමෙක්ද? දෙවයන්වහන්ස! "ඔබවහන්සේගේ ආභරණවූ චූඩාමාණික්‍යය නොපලඳිනා සේක්ද"සි එවා ළහ. පලඳිම් ගෙනෙව"සි කිහ. මැණික භාණ්ඩාගාරයේ සොයා නුදුටුවහ. සෙස්සන් එසේමය.

ඉක්බිත්තෙන් සෙනකාදි සතරදෙනම දෙවයන්වහන්ස! ඔබවහන්සේගේ දාහරණ මහෞෂධ පණ්ඩිතයන්ගේ ගෙහිය; තුමූ එකී වසතු පල දින්නාහ. දෙවයන්වහන්ස! ගොවියා පිත් නුඹවහන්සේට සතුරුය"යි රජ්ජුරුවන් කෙරේ බෝසතාණන් බිඳවූහ. ඉක්බිත්තෙන් එපවත් බෝසතාණන් වහන්සේට වැඩ පසස්නා මිනිස්සු ගොස් කීහ. පණ්ඩිතයන්වහන්සේත් රජ්ජුරුවන් දැන ඒ සඵරුප දනිමිසි රාජසෙවයට වැඩිසේක. රජ්ජුරුවෝ සෙනකාදී දුජිනයන්ගේ බස් අසා මහබෝසතාණන්වහන්සේට කිපී "නොදකිමි. නුඹ අවුත් කුමක් කෙරේදැ"යි තමන් දැක්ක නුදුන්හ. පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවන් කිපි බව දැන තමන්වහන්සේගේ ගෙටම වැඩිසේක. රජ්ජුරුවෝ මහෞෂධයා ගනුවයි අණකළහ. බෝසතාණන්වහන්සේ තමන් වහන්සේට වැඩ පසස්නා මිනිසුන් අතින් එපවත් අසා "පලායන්නට සුදුසු කලැ"යි අමරාදෙවින්ට සලකුණුදී අප්‍රසිඛ වෙශයෙන් නුවරින් නික්ම දකුණු යවමැදුම්ගමට ගොස් කුඹල් ගෙයක කුඹල්කම් කොට වසනසේක. නුවර මුළුල්ලෙහිත් "මහෞෂධ පණ්ඩිතයෝ පලාගියහ"යි එක කොලාහලව ගියේය. සෙනකාදී සතරදෙන පණ්ඩිතයන් වහන්සේ පලාගිය බව දැන කනස්සලු නොවන්නාහු, "කිමෙක්ද? අපිත් පණ්ඩිතවරු නොවමෝදැ"යි ඔවුනොවුන් නොදන්නාම අමරාදෙවින්ට පත් යවූහ. අමරාදෙවි සෙනකාදී සතරදෙනම යැවූ පත් අතට ගෙන 'අසවල් වෙලාවට එන්නේය'යි කියා යවා වෙන වෙනම උන් තමන් තමන්ට අවධිකළ වෙලාවට ආ කල්හි අල්වා ගෙන නොසැලෙන අන්දමට බඳවාලා ඉසකේ කප්පවා පරණ නානාවර්ණ යක හොවාලා බොහෝ දුකට පමුණුවා පැදුරුමාලුවල හා පැස්මාලුවල හොවා වසා බන්දවා රජ්ජුරුවන්ට කියා යවා ඒ පණ්ඩිතවරුන් සතරදෙනා හා සමඟ වසතු සතරත් ගෙන්වාගෙන ගොස් රජ්ජුරුවන් වැඳ එකත්පස්වසිට දෙවයන් වහන්ස! "මහෞෂධ පණ්ඩිතයෝ සොර නොවෙති, ඔබවහන්සේගේ භාණ්ඩාගාර සොරකම්කොළෝ මේ කොල්ලෝ සතරදෙනාය, මුන් සතර දෙනාගෙන් සෙනකයා මැණික් සොරුය, පුක්කුසයා රන්මාලා සොරුය, කාවින්දයා පලස්සොරුය, දෙවින්දයා රන් මිරිවැඩි සොරුය, අසවල්මස අසවල් දවස අසවල් කෙල්ලගේදුව අසවල් තැනැත්තියඅත මොවිහුසතරදෙන මෙකී වසතු පණයම් පිණිස එවූහ, මේ මා ලියා තුබූ පත් බලා වදාළ මැනව, ඔබවහන්සේ සතු මෙකී වසතු පාවාගත මැනව, මෙකී සොර කොල්ලතුත් පාවාගත මැනව දෙවයන් වහන්සැ"යි රජ්ජුරුවන් වැඳ ගෙට ගියාහ. රජ්ජුරුවෝ බෝසතාණන් නැඟී ගිය බැවින් උන්වහන්සේ කෙරේ සැකයෙන්ද අනික් මන්ත්‍රී කෙනකුන් නැති බැවින්ද සෙනකාදී පණ්ඩිතවරුන් සතරදෙනාට කිසිවක් නොකියා 'නාපියා තොප තොපගේ ගෙවලට යව්ය'යි කීහ.

ඉක්බිති රජ්ජුරුවන් දළපුඩුසේසත අධිගෘහිත දෙවතා වූ මහබෝසතාණන්ගේ කුරච්චික නාදයක් හා සමානවූ කටහඬ විහිදුවා වදාරන්නාවූ ම්හිරි ධම්දෙශනායෙහි ශබ්ද නොඅසන්නී "කිමෙක්දෝහෝ"යි පරීක්ෂාකොට ඒ සාරණය දැන පණ්ඩිතයන් ගෙන්වන උපායක් කෙරෙමි"යි මධ්‍යම රාත්‍රියෙහි දළපුඩු සේසත් සිදුරෙහි සිට අඩි ශරීරයක් දක්වා දෙවතා ප්‍රශ්නයෙහි,

"හනති හරෙහි පාදෙහි මූඛං පරිසුම්භති,
සවෙ රාජ පියො හොති කං තෙන මනිපස්සසි."

යනාදි ගාථා සතරකින් දක්වනලද ප්‍රශ්න සතරක් රජ්ජුරුවන්ගෙන් විචාළිය. රජ්ජුරුවෝ එහි අර්ථ නොදන්නාහු මම නොදනිමි, 'සෙනකාදි පණ්ඩිතවරුන් විචාරමි'යි එක් දවසකට අවසර ඉල්වාගෙන දෙවන දවස් 'පණ්ඩිතවරු සතරදෙන එත්ව'යි අසුන් යවා පණ්ඩිතවරුන් විසින් "අපි මුඛ හිස් ඇරගෙන පිටියට බස්නට විලි ඇත්තමෝ"යි කී කල්හි පයි සතරක් විද්දවා යවා 'තෙල ඉසලාගෙන එත්ව'යි කියා යැවූහ. ඒ ඉස්පයි ඇතිවූයේ එතැන් පටන් කොටල. පණ්ඩිතවරු ඉස්පයි ඉසලා අවුත් රජ්ජුරුවන් වැඳ පනවනලද අසුන් මත්තෙහි හුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ "සෙනකයෙනි! ඊයේ රෑ මධ්‍යම රාත්‍රී වේලෙහි දළපුඩු සේසත වසන දෙවි දූ මා පැන සතරක් විචාළිය. මම එහි අර්ථ නොදන්නෙමි, 'පණ්ඩිතවරු විචාරමි'යි කිම්, ඒ ප්‍රශ්න මට කියව"යි කියා **"හනති හනන්තිගි පාදෙති"** යනාදි පළමුවන ගාථාව කිහ. සෙනකයෝ ගාථාව අසා "කිං හනන්ති කං හනන්ති"යි කියා කටට ආ දෙයක් දෙඩා කිසිවක් දැනගත නුහුණුවන. සෙස්සෝත් කිසිවක් කියා ගත නොහී සාරබාගත්හ.

රජ්ජුරුවෝ දෙම්නස්වූහ. දෙවන දවස් රෑ දෙවතා දූ විසින් "පැන සතරෙහි අර්ථ දුටුදැ"යි විචාරන ලද්දාහු "මා විසින් පණ්ඩිතවරුන් සතර දෙනා විචාරන ලදහ. උයිත් එහි අර්ථ නොදත්හ"යි කිහ. දෙවතා දූ "මූ හැම දෙනම කුමක් දනිද්ද? මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මේ පැනය කියන්නට සමර්ථ කෙනෙක් නම් නැත. ඉදින් මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා මේ පැනය උන් ලවා නොකියවූ නම් මේ දිලිඳයන ශකුළින් තොප ගේ හිස සත් පලුවක්කොට බිඳපියම්"යි රජ්ජුරුවන් භයගන්වා "රජ්ජුරු වෙනි! ගින්නෙන් ප්‍රයොජනයක් ඇතිකල්හි ඝණමැදිරියන් පිඹින්නටද කිරෙන් ප්‍රයොජනයක් ඇතිකල්හි අහඇල්වාගෙන අේනටද සුදුසු නොවන්නේ ය"යි කියා **ඛජ්ජොපන ප්‍රශ්නයෙහි** මේ මතු කියන කාරණා කිහ. "ගිනි නැතිව ගිනි සොයා ඇවිදිනා පුරුෂයෙක් දිලියෙන්නාවූ කඳෙපැණියෙක් ගිනි පුපුරකැයි සිතා ඒ කඳෙපැණියා මත්තෙහි ගොමවැරටි හා තණ රොඩු පොඩි බොඩි කොට ලාලා 'ඝණමැදිරියා ගිනි පුපුරකැ'යි යන විපරීත සල කුණෙන් දෙදණ බිම ඇන ඇස් පිපිරෙනතුරු පිඹත් ගිනි දල්වාගත නොහේද, යමෙක් කිරිඇම්යි ලොට තන තබාලා අහ අල්වාගෙන දවසක් මුළුල්ලේ ඇදත් කිරි පිහිරකුත් දැවගත නොහේද, එපරිද්දෙන් නුවණ නැති හෙයින් තිරිසනුන් හා සමානවූ කෙනෙත්තේ උපායවත් කමක් නැති හෙයින් තමහට අභිවෘඩියක් නොලබන්නේය. පසම්තුරන්ට නිග්‍රහකිරී මේනිද සත්වයෝ නොයෙක් වැඩට පැමිණෙන්නාහ. සෙනාවට නායක අමාත්‍යයන්ගේ උපදේශයනිද වැඩ පසස්නා මිත්‍රයන්ගේ උපදෙශයනිද රජ දරුවෝත් රාජ්‍යයට පැමිණ සුවසේ වාසය කරන්නාහ. තොපසේ, නුවණැති අමාත්‍යයන් පලවාපියා නොවසන්නාහ නි තබා කඳෙපැණියන් පිඹින්නාසේද, ලොට තන තබා අහ ගෙන කිරිඳේනාසේද, තරුදිය තබා ලා අතින් කිරනසේද, මේනියා ගැට මුසු පැන මහෞෂධ පණ්ඩිතයන් නොවිචාරා සෙනකාදිවූ පණ්ඩිතවරු විචාරන්නට ඒ කොල්ලෝ කුමක්දනිද්ද? උන් හැම කඳෙපැණියන් හා සමවූහ. ඉදින් තොපගේ පණ රකිනා කැමැත්තෙහි නම් ගල් මුදුනෙහ දිලියෙන මහ ගිනිකඳක්සේ නුවණින් දිලියෙන්නාවූ මහෞෂධ පණ්ඩිතයන් ගෙන්වා විචාරා මට පැන සතරෙහි අර්ථ කියාලව, එසේ නොකොළෙහි නම් තොපගේ ජීවිතය නැහැ"යි රජ්ජුරුවන් භයගන්වා සැහවී ගියාය.

ඛජ්ජොපන ප්‍රශ්නයයි.

ඉක්බිති රජ්ජුරුවෝ මරණ භීයෙන් තැතිගෙන දෙවන දවස් අමාත්‍යයන් සතරදෙනකු කැඳවාලා "දරුවෙනි! තෙපි සතරදෙන රථ සතරක නැගී නුවර සතර වාසලින් නික්ම යම් තැනකදී මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් දුටුහුනම් එතැනදීම උන්ට සත්කාර කොට වහා කැඳවාගෙනඑව"සි කියා යැවූහ. උන් සතරදෙනා අතරෙන් (තුන්දෙනෙක් මහබෝසතාණන් නුදුටුවහ.) දකුණු වාසලින් නික්මුණු අමාත්‍යයා වනාහි දකුණු යවමැදුම්ගම මහබෝසතාණන් වහන්සේ මැටි ඇරගෙන කුඹල් ආචාර්යයන්ට සෑහ වටා මැටි වැකුණු ඇඟින්ම පිදුරු බිස්සෙන හිඳ මිටි මිටි කොටගෙන යවසාලේ බත් අනුභව කරන්නවුන් දුටුයේය. කුමක් පිණිස එබඳු දුකක් ගෙන කුඹල් කම්මාන්තය කළසේක්දැයි යතහොත්? "මහෞෂධ පණ්ඩිතයෝ මහා නුවණැත්තෝය, නිසැකයෙන් රාජ්‍යය ගන්නාහ"සි සැකයක් රජ්ජුරුවෝ කොළෝනම් "කුඹල් කම්මාන්ත කොට ජීවත්වනු අසා සැක නොවන්නාහ"සි සිතා මේ කාරණය පිණිස මෙබඳු දුෂ්කර්ම ගත්සේක. මහබොසතාණන් වහන්සේ රජ්ජුරුවන්ගේ අමාත්‍යයා දැක, තමන්වහන්සේ කැඳවා ආබැව් දැන "මාගේ සම්පත පෙර පරිද්දෙන්ම වන්නේය, අමරාදෙවීන් විසින් ඉදි කරනලද අනඟි රසමසවුලෙන් සුක්‍ෂතවූ බත්ම අනුභව කෙරෙමි"සි සිතා අතින් ගත් බත්පිඬ හෙළා නැඟී සිට අත කට සොධාපියා සිටිසේක. ඒ ඇසිල්ලෙහිම අමාත්‍යයා ළඟට ගියේය. ඒ වැළිත් සෙනක පණ්ඩිතයන් ලබ්ධිගත් එකෙන, එතෙයින් මහබෝසතාණන් වහන්සේට "පණ්ඩිතයෙනි! ඉසුරුමත් තැනැත්තේ උතුමැයි යම් බසක් ආචාර්යයෝ කිවුනම් ඒ සෙනක ආචාර්යයෝ කී බස සැබව; තොපගේ යශස පිරිහුණු කල්හි එබඳු නුවණ තොපට පිටිවහල් වන්නට නොපොහොසත්වීය. දැන් මැටි වැකුණු ඇඟින් පිදුරු බිස්සෙක හිඳ මෙබඳු බතක් අනුභවකරව; ඉදින් තොපගේ වාදය සැබැවිනම් යශසින් පිරිහුණු තොපට තොපගේ නොපිරිහුණු වීර්‍යයත් සමෘති ශක්තියත් පිටිවහල් වුවමනාවේදැ"සි කීය.

ඉක්බිති මහතාණන් වහන්සේ "නුවණ නැත්තව! මම මාගේ නුවණ බලයෙන් නැවත ඒ මාගේ පිරිහුණු සම්පත මූහුකුරවන්නෙමි මේ සැඟවෙනු මනා කාලයයි මේ පිළිසිඳීමට මනා කාලයයි කල් නොකල් දැන රජ්ජුරුවන් කිපුණු කල සැඟවී ඇවිද සතුටුවූකල එළි බැස, පෙර පරිද්දෙන් විදි සම්පත් නෙහි පිහිටන පිණිස කුඹල් කම්මාන්තයට මෙබඳු රස තැනි යව සාලේ බත් අනුභව කරන්නෙම් වීර්‍යකරණයට කල් දැන මාගේ නුවණින් පුරාතන සම්පත්හි පිහිටා සැටයොදුන් රත්ගල් තලා මුදුනෙහි විහරණය කරන සිංහ රාජයක්හු මෙන් අසමසිතව හැසිරෙන්නාවූ මා දකුව"සි වදාළසේක. නැවත අමාත්‍යයා "රජ්ජුරුවන්ගේ සේසත වසන දෙව් දූ රජ්ජුරුවන් පැන සතරක් විවාළීය. රජ්ජුරුවෝ සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විවාළහ. එක් කෙනකුත් ඒ පැනය කියාගත නුහුණුවහ. එසේහෙයින් රජ්ජුරුවෝ තොප සමීපයට එවූහ"සි කීහ. එසේකල නුවණෙහි බල දුටුයෙහි වේද? එසේවිට ඉසුරු සැපත් පිටිවහල් නොවන්නේය. නුවණැති තැනැත්තේම පිටිවහල් වන්නේය"සි මහතාණන් වහන්සේ නුවණෙහි ආනුභාව වර්ණනා කළසේක. අමාත්‍යයා පණ්ඩිතයන් දුටු තැනදී නහවාපියා හඳවාලා ගෙනෙව"සි කියා රජ්ජුරුවන් කී විසින් දුන් පිළිසඳලත් මසුරන් දහසත් මහබෝසතාණන්වහන්සේ අත තුබුයේය. කුඹලාණෝත් 'මා මෙහෙගත්තේ මහෞෂධ

පණ්ඩිතයන් අනිනැ'සි සිතා බාහියහ. පණ්ඩිතයන් වහන්සේ "නොබව ආචාර්යයෙනි! තොපි මට බොහෝ උපකාරීව සිටියහ"සි අස්වසා කුඹලා ණන්ට මසු දහස දී මැටි වැකුණු ඇඟින්ම රථයෙහි හිඳ සිත්සේ වනයෙහි ඇවිද එසන හැනට ගමන්ගත් හස්තිරාජයකු පරිද්දෙන් නුවරට වැඩිසේක. ඇමැතියා රජුරුවන්ට බෝසතාණන් වහන්සේ වැඩි නියාව කිය. "පුත! පණ්ඩිතයෝ තොප විසින් නොසිදි දක්නාලදද"සි කී කල්හි "දෙවඟන් වහන්ස! දකුණු යවමැදුම්ගම කුඹල්නම්කොට ජීවත්වෙති: ඔබවහන්සේ කැන්ද එවූහයි අසමින් නොනාම මැටි වැකුණු ඇඟින් අවුය"සි දැන්වීය. රජුරුවෝ "ඉදින් මට පසම්පුරුවිනම් සම්පතෙහි පිහිටා සෙනාව ඇතිකොට ගෙන ඇවිදිනි, මූ මට සතුරු නොවෙති"සි සිතා "මපුතණුවන් තමන්ගේ ගෙට ගොස් ඉස්සොධා නහා සර්වාලඞ්කාරයෙන් සැරහී මා දුන් පෙරහරින් දකින්නට එන්නට කියව"සි කිහ එබස් අසා පණ්ඩිතයන් වහන්සේ රජුරුවන් කී ලෙසම සැරහී, සියුරහ සෙනහ පිරිවරා විජයොත් මහපායෙන් සුදම් දෙවිසබාවට වඩනා සක්දෙව්රජාණන් පරිද්දෙන් අවුත් රජ්ජුරුවන් විසින් 'එන්නේය'සි කිකල්හි රජගෙට වැද රජුරුවන් වැඳ එකත්පස්ව සිටිසේක. රජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේ හා සමඟ සුවදුක් දෙඩා පණ්ඩිතයන් විමසන්නාහු "සමහර කෙනෙක් ඉසුරු සම්පතෙහි පිහිටා සිට මෙනෙක් සැපත් අපට ඇතැසි සම්පත් නිසා පණිවා ආදි පව් නොකරන්නාහ. සමහර කෙනෙක් තමන්ට සැපත් දුන් උන්ට වැරැදීමෙයයි අනුන් බණන පිණිස පව් නොකරන්නාහ. සමහර කෙනෙක් කිසිවක් කරන්නට නොපොහොසත් හෙයින් පව් නොකරන්නාහ. සමහර කෙනෙක් නුවණ නැතිව අමන්ත්‍රී හෙයින් පව් නොකරන්නාහ. හෙවි බොහෝවූ අවි විහන හෙයි දඹව සිතුවහොත් දසදහසක් යොදුන් දඹදිව රජදරුවන් මරා රාජ්‍යය ගන්නට පොහොසත්ව කුක්නිසා මට නොවැරැදීදුද? මා මරාපියා රාජ්‍යය නොගතුදු"සි කිහ.

එබස් අසා මහබෝසතාණන් වහන්සේ නුවණැත්තෝ තමන්ට සුව පිණිස පව්කම නොකැසිරෙන්නාහ. යශසින් පිරිහි කාසිය වෛතසික දුකින් පෙළෙන ලදුවත් එක්තොකුන් කෙරෙහි සෙනෙහසයෙන් වේවයි, උරණින් වේවයි පැවත එන සුචරිත ධර්මය නොහරනාහ"සි වදාළසේක. නැවතත් රජුරුවෝ බොධිසත්ත්වයන් විමසන රාජ මායමක් කියන්නෝ "මොලොක්වූ හෝ දරුණුවූ හෝ යම් කිසි කාරණයකින් සත්තෙමේ බැගෑබවට පැමිණ තමා සම්පත පිහිටා පසුව ආචාර ධර්මයෙහි හැසිරෙන්නේය"සි කිහ. ඉක්බිති බොධිසත්ත්වයන් වහන්සේ එසේ කී රජුරුවන්ට ගසක් උපමාකොට දක්වනසේක් "යම්ගසක්මූල සෙවන සැතපී යමෙක් හුන්නේවිනම්වේවයි වැද හොත්තේ හෝ සිටියේ හෝ වීනම් ඒ සැතපුණු ගස අත්තක් වේවයි පතක් වේවයි සත්පුරුෂ තැනැත්තේ නොබිඳිනේය, ඉදින් බින්දේවීනම් පව්වූ මිත්‍රද්‍රෝහිය"සි වදාරා "දෙවඟන් වහන්ස! සැතපුණු රුක කොළ අත්තක් පමණ නඩාපී මිත්‍රයෙකින් මිත්‍රද්‍රෝහි වන කල, මපියාණන් වහන්සේවද බොහෝ සැපත් දී මාත් මේසා ඉසුරු සම්පතෙහි පිහිටුවා රකිමින් සිටි ඔබ වහන්සේ හෙරේ වරදනා මම හෙසේනම් මිත්‍රද්‍රෝහි නොවෙමිද"සි සියලු සැටියේම තමන් වහන්සේ මිත්‍රද්‍රෝහි නොවනබව වදාරා රජුරුවන්ගේ අවවාරණට චෝදනාකාරනසේක්, "යම් පුරුෂයක්හු සමීපයෙන් යමෙක්තෙමේ

සවලාවූ කාරණයකුදු මිවාරා දත්තේද; යම් නුවණැති කෙනෙක් තුමූ යමක් හට සිතළුපත් සැහයකුත් දුරුකෙරෙද්ද, ඌ තුමූ සැක විවාරාගත් තැනැත්ත නවුට පිහිටව සිටිමෙන් පිළිසරණ වන්නාහ, සැහ දුරුකිරීමෙන් ආවාහයි තනතුරෙහි සිරි නුවණැත්තවුන් හා සත්පුරුෂ තැනැත්තේ විශ්වාසය නොහරනේය"යි වදාරා; දැන් රජ්ජුරුවන්ට අවවාද කරනසේක්, "රජ්ජුරුවන් වහන්ස! පස්හම් සුව අනුභවකරන ගෘහස්ථයෙම් කුසිතවීනම් යහපත් නොවන්නේය; තමා පිදිනා පස්කම් සැප තරකොට ගත නොහෙන්නේය; කායාදි සංගිදීමක් නැති මහණද ඒ මහණ ධර්මය පුරාගත නොහෙන්නේය: එසේම යහපත අයහපත නොවිමසා සංග්‍රහ නිග්‍රහ කරන්නාවූ රජද යහපත් නොවෙයි; යම් නුවණැත්තෙක් තෙමේ සොපවිනම් අමාසෙයි වසඹින්දුවක් හුණුවාසේ ඔහුගේ සන්තානයෙහි පිහිටි සියලු හුණම් නස්නා හෙයින් එසිත් උතුම් නොවන්නේය. දෙවයන් වහන්ස! රජතෙමේ පරීක්ෂාකාරිව රාජ්‍යය කරන්නේය. අපරීක්ෂිතව රාජ්‍යයනොකරන්නේය; පරීක්ෂිතව දශරාජධර්මයෙන් රාජ්‍යයකරන්නාවූ රජ්ජුරුවෝ යසස් පරිවාරගුණ කීර්ති ඵලානුභාවයෙන්ම වඩන්නාහුය"යි වදාළසේක.

භූරි ප්‍රශ්නය.

මෙසේ වදාළකල්හි රජ්ජුරුවෝ මහාබෝසතාණන්වහන්සේ නහන ද දළපුවු සේසත් ඇති රජ අස්නෙහි වඩා හිඳුවා, තුමූ මිටි අස්නෙහි හිඳ "පණ්ඩිතයෙනි! සේසතෙහි වසන දෙවිඳු මා පැන සතරක් විවාළිය; මම ඒ පැන දැනගත නුහුණුයෙමි; මේ සෙනකාදි පණ්ඩිතවරුන් සතරදෙනාට කී තැන උන්ටත් නොවැටහිණ; පුත! ඒ පැන මට කියව"යි ආරාධනා කළහ.

එ දවස් මහ බෝසතාණන්වහන්සේ සැට යොදුන් රන්ගල් මුදුනෙහි සිංහනාද කරන අහිත කෙහෙර සිංහයකුසේ "දෙවයෙනි! සේසතෙහි වසන දෙවතාවා වේවයි, චාතුම්මහාරාජිකාදිවූ සදිව්‍ය ලොකයෙහි දෙවතාවෝ වෙත්වයි, සොළොස් බඹ තෙලෙහි බඹහු වෙත්වයි, යම් කිසි කෙනකුත් විසින් විචාරනලද්දාවූ පැන නියුණු මුවහත් ඇති නඩුවකින් ඇඹුල මල් මිටියක් කපා වහුරුවන බල ඇති පිරිමියක්හු මෙන්, මාගේ නිමිලවූ නුවණ නමැති නඩුවෙන් පිරිසිඳ කියමි; කියව දෙවයෙනි! දෙව් දූ විවාළ පැනය"යි සවිඥ ප්‍රවාරණයක් පරිද්දෙන් වදාළසේක. (එ දවස් මහ බෝසතාණෝ සව්ඥෝ නොදන්තෝ නම් කෙසේද? මතු ලොවුතුරා බුදුව සියලු සතුන් සිත සැහ දුරුකොට ධර්ම සිංහනාද කිරීමට මෙම දෘෂ්ටාන්ත නොවේද? වැලිතෙළිගෙහිදි එතෙක් පැන විසඳූ ඒ මහතාණන්වහන්සේට දැන් එසා දෙවතාවකු විවාළ පැනයක් විසඳීම නම් කවර අරුමයක්ද?) ඉක්බිති රජ්ජුරුවෝ දෙවතා දුව විවාළ ලෙසම කියන්නාහු,

"හනන්ති හත්ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති
සවෙ රාජ පියෝ හොති කං තෙන මභිපස්සසි"

යනුවෙන් දක්වනලද පළමුවන පැනය කීහ.

මහබෝසතාණන්වහන්සේට ගාථාව අසමින්ම ආකාශයේ නහාලූ පුන් සඳ මඩලක් මෙන් අර්ථාවබෝධයවිය. ඉක්බිති බොධිසත්වයන්වහන්සේ අසව දෙවයෙනි වදාරා "යම්කිසිවෙලෙක්හි මැනියන්ගේ ඇකයෙහි නොත්තාවූ ළදරු

කුමාරයා කිරි බී බඩපුරාගෙන සතුටුව මැතියන් හා සමඟ කෙළනේ තමාගේ ළාඟෝපලුපත් සේ මොලනැටි අතින් මැතියන් මරන්නේද, ඉඟයක් ඇද කඩන්නේද, මිටින් මැතියන් මූණ අන්නේද, එවේලෙහි වගුළ සඳරැසින් ඔදවැඩි කිරිමුහුදසේ ස්නෙහයෙන් ඔදවැඩියාවූ සිත් ඇති මැතියෝ පුතණුවන්ට "සෙරමේ පුතා! මා කුමට මරන්නේදැ" යි යනාදී සෙනහ වශයෙන් කියා සෙනහ ධරාගන්නට අසමර්ථව දරුවන් ළෙඟි හොවා සිපගනිති, මෙසේ ඔර හිඳ තමන් මරා කෙළනා වේලෙහි මැතියන්ට දරුවෝ ආදි ඇති ප්‍රෙමයට වඩාලාම ප්‍රිය වන්නාහ; පියාණන්ටත් එසේම ප්‍රියවෙති" මෙසේ නහොමධ්‍යයෙහි සූර්‍ය්‍ය මණ්ඩලය ඔසවා පාන්නාක්හුමෙන් ප්‍රශ්නය පහළකොට වදාළසේක. ඒ ප්‍රශ්න විස්සජ්ජනය අසා දෙවතා දූ දළපුඩු සේසත් විවූයෙන් මැත්ව අඩි ශරීරයක් දක්වා "ප්‍රශ්නය වදාළ නියාව ඉතා යහපතැ"යි මිහිරි නටහඬින් ශබ්ද පවත්වා සත්රුවන් කරඬුවක් දිවමල් දිවසුවඳින් පුරා මහබෝසතාණන් වහන්සේට පූජාකොට සැඟවී ගියාය.

රජ්ජුරුවෝද මහබෝසතාණන් වහන්සේට ගඳින් මලින් පූජාකොට දෙවන පැනඟට ආරාධනාකොට 'කියව දෙවගෙනි'යි වදාළ කල්හි:—

"අක්ඛාසති යථා කාමං ආගමඤ්ච න ඉච්ඡති
සචෙ රාජ! පියො හොති තං තෙ න මභිපස්සසි"

යන ගාථාවෙන් දෙවන පැනය කීහ.

ඉක්බිති රජ්ජුරුවන්ට බෝසතාණන්වහන්සේ "රජ්ජුරුවෙනි! කකුල් දඩ ගොසින් කි දේ කටලන්නට සමර්ථ සත්ඇවිරිදි පුතණුවන්ට කෙතට යව සල්පිලට යව කියා "ඉදින් මට මේ මේ කැවුම් දුන්නේවීනම් යෙමි"යි කියන්නා 'එසේද පුතණඩ!යි උන් කැමැති කැමැති කැවුම් ඉදිකොට දුන් කල්හි ඒ කැවුම් කාලා "තොපි සිහිල් සෙවනේ ගෙයි හිඳුව, මම තොපට පිටත ඇවිද මෙහෙවර කෙරෙම්දැ"යි කියා ඝර්ම විකාර මුඛ විකාරාදී නොයෙක් උසුළු පපාකී මෙහෙවරට නොගොසින් සිටිනා පුතණුන්ට, මැනිතොමෝ කිපී මරන්නට දණ්ඩක් හැරගෙන "මා සන්තක දෙය කාලා කුඹුරේ කුරුල්ලන් පමණ පලවාපියන්නටත් නොයෙසිදැ"යි භයගැන්වූ කල වෙගයෙන් දිවගත් පුතණුවන් ලුහුබැඳ අල්වාගන්නට අසමර්ථව සෝනට යේ වසි බිල්ලට යේවසි සොරු නා කඩ කඩ කොට කපා පියත්ව"යි යනාදීන් කියා කැමැති පරිද්දෙන් නටහෙළන පමණක් හැවිලි අවන්නී යමක් මුඛයෙන් බෙණේ නම් ඉන් සිහිත්තකුත් දරුවන්ට වන්නා නොකැමැත්තිය. ඒ කුමාරයා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක්ව කෙළපියා සවස ගෙට වදනට නොපොහොසත් වූයේ, නැයන්ගේ ගෙට යන්නේය. මැනියෝද "දරුවෝ දැන් එත්දෙහෝ දැන් එත්දෙහෝයි පෙරමඟ බලබලා හිඳ සවස්වනතුරු නොඑන්නා දැක "මාඋරණ ගෙයින් ගෙට එන්නට භය ඇතිව නොඑති"යි සිතශොකයෙන් පුරාගෙන කදුළු පිරුණු මුහුණින් යුක්තව නැයන්ගේ ගෙවල් බලන්නාහු පුතණුවන් දැක වඩාගෙන සිප සනහාපියා දැතින් තරකොට අල්වාගෙන 'පුත! මා කී බසුත් සිත තබද්දැ'යි ආදි ඇති ප්‍රෙමයටත් වඩාලා ප්‍රෙම උපදවන්නාහ. මෙසේ දෙවයෙනි! දරුවෝ මැනියන්ට කිසි කලෙකත් වඩාලාම ප්‍රිය වන්නාහ"යි වදාරා දෙවනපැනය විසඳා වදාළසේක. දෙවතා දූ පෙර පරිද්දෙන්ම සාධුකාරදී පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට තුන්වන පැනයට ආරාධනාකොට 'කියව දෙවයෙනි! වදුළ කල්හි

අබ්භක්ඛානි අභූතෙන අලිකෙන අනිසාරයෙ
සවෙ රාජ! පියො හොති කා තෙන මභිපසසසි"

යන ගාථාවෙන් තුන්වන පැනය කිහ.

ඉක්බිති මහ බෝසතාණන්වහන්සේ දේවයෙනි! යම් වේලෙක අබු සැමි දෙමහල්ලෝ රහසිගතව ලොකස්වාදරහිසයෙන් කෙළනාහු ඔවුනොවුන්ට 'තොප මා කෙරෙහි මදකුත් ප්‍රේමයක් නැත, තොපගේ සිත ඔහැරය'යි මෙසේ ඔවුනොවුන්ට නැත්තක් කියද්ද, බොරුවෙන් වොදනා හෙරෙද්ද, එවේලෙහි ඔහු දෙමහල්ලෝ ඔවුනොවුන්ට අධිකව ප්‍රියවන්නාහ"යි මෙසේ මේ ප්‍රශ්නයේ අවී දනුවසි තුන්වන පැනය වදුළසේක. දෙවතා දූ පෙරසේම පූජාකළාය.

රජ්ජුරුවෝද පූජාකොට අනික් පැනයට ආරාධනා කොට 'කියව දෙවයෙනි! වදුළ කල්හි:-

"හරං අන්නංව පානංව වත්ථසනාසනානිව
අසඤ්ඤදඤ්ඤු හරාසන්නා
තෙ වෙ රාජ! පියා හොන්ති කං තෙන මභිපසසසි"

යන ගාථාවෙන් සතරවන පැනය කිහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවන්ට "දෙවයෙනි! මේ පැනයතෙමේ ධර්ම්මවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සඳහාය; ඔවුන් තමන්ගේ ගෙදොර සිහා සිටිකල්හි තමන් විසින් පිළිගන්වනලද ආහාරාදිය පිළිගෙන යන්නාවූද, හොස් වළඳන්නාද දූන අපම ඔහන්නාහ, අපම සන්තකවූ ආහාරාදිය ගෙනයන්නාහ හොස් අනුභවකරන්නාහ"යි ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයෙහි වඩාලාම ප්‍රේම ඇතිවන්නාහ, මෙසේ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්, සැදුහැති උපාසක කුලයෝ තමන් දෙනලද්දාවූ සතරපසය දූක්ඛාදී අනුභවකරන කල්හි, "අධිකයක්ම ප්‍රියකරන්නාහ"යි සතරවන පැනය වදුළ කල්හි දෙවතා දූ පෙර පරිදෙන්ම පූජාකොට සාධුකාර දී සත්රුවන් පිරු රුවන් කරඬුවක් "ගනුව පණ්ඩිතයෙනි!යි මහබෝසතාණන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි පූජාකළාය. රජ්ජුරුවෝද පැහැද සෙනෙවිරත් තනතුරු දුන්හ. එතැන් පටන්කොට මහබෝසතාණන් වහන්සේගේ යශස මහත්වූයේය.

දෙවතා ප්‍රශ්නයයි.

නැවත සෙනාකාදි සතරදෙන "ගොවියා පුතු වඩාලා මහත් යශසට පැමිණියේය. කුමක් කරමෝද"යි මන්ත්‍රණය කළහ. ඉක්බිත්තෙන් සෙනක පණ්ඩිතයෝ අනික් තුන්දෙනාට කියන්නාහු"ඌ මහත් යශසට පැමිණියෙන් කායක්ලේශකිම්ද, රජ්ජුරුවන් කෙරෙහි බිදුවා වියන්නට මා විසින් උපායක් දක්නාලද්ද"යි කිහ. "කුමන උපායෙක්ද ආචාර්යයෙනි!යි කී කල්හි, ගොවියා පුතු සමීපයට ගොස් 'රහස්තම් දෙය කාට කිවහොත් යහපත්ද"යි විචාර

මිහ. ඒ හෙමේ මහාමන්ත්‍රී හෙයින් 'කිසිවක්හට කිය නොහැක්කැ'යි ඉදින් කියේ වී නම් ඉක්බිති "ගොවියා පුතු දෙවයන්වහන්ස! ඔබවහන්සේට වරද නට යිරිනේවේදැයි බිදුවාපියහෙ"යි කියා ඔව්හු සතරදෙනා සිංහරාජයකු සමී පයට ඇත්නාවූ ජරපත් ගෘහාලයන් සතරදෙනකු පරිද්දෙන් පණ්ඩිතයන් වහන්සේගේ හෙට ගොස් සුව දුක් දෙඩා "පණ්ඩිතයෙනි! පැනයක් විචාරම් හ"යි කියා බොධිසත්වයන්වහන්සේ 'විචාරව'යි කී කල්හි සෙනකයෝ "පණ් ඩිතයෙනි! පුරුෂයා ඊසින් ආදිකොට කුමක්හි පිහිටිය යුතුද'යි විචාළහ. 'සබවසෙහි පිහිටිය යුතුය'යි වදාළසේක. 'සබවස පිහිටියවුන් විසින් කුමක් කටයුතුද'යි විචාළහ. වසතු සෙවිය යුතුයයි වදාළසේක. 'ඔසතු උපයාගෙන කුමක් කටයුතුද'යි පිළිවිස්සාහ. 'මන්ත්‍රණය උගත යුතුය'යි වදාළසේක. 'පසු කුමක් කටයුතුද'යි පිළිවිස්සාහ. 'තමා සිත රහස් කටයුතු අනුන්ට නොකිය යුතුය'යි වදාළසේක.

ඔව්හු සතරදෙන 'යහපත පණ්ඩිතයෙනි!යි සතුටු සිත් ඇතිව ගොවියා පුතු පිටුදකුම්හ'යි රජපුරුවන් සමීපයට ගොස් "දෙවයන්වහන්ස! ගොවියා පුත් ඔබවහන්සේට වරදනට සිවිසේය"යි කිහ. රජපුරුවෝ "මම නොපගේ බස් නොඅදහමි, ඌ තුමූ මට නොවරදති"යි නොඉවිස්සාහ. දෙවයන්වහන්ස! අප කී බස් නොඅදහනසේක් වීනම් උන් ඔබවහන්සේ දක්නාට ආකල 'පණ් ඩිතයෙනි! තමා සිත උපන් රහස් කටයුත්ත කාට කියයුතුද'යි උන් විචාළ මැනව. ඉදින් ඔබවහන්සේට සතුරු නොවෙත්නම් 'අසවලුන්ට කිය යුතුය'යි කියති. ඉදින් දොහි වෙත් නම් කිසිවක්හට නොකිය යුතුය 'මන දෙළ පිරුණු කල කියයුතුය'යි කියති. "එවිට අප අදහාගෙන සැකඟළුමැනව"යි කිහ. රජපු රුවෝත් 'යහපතැ'යි උන් කිවා ගිවිස එක් දවසක් පණ්ඩිතවරුන් පස්දෙනා එක්ව අවුත් දැනලා උන් කල්හි රහස් කිය යුත්තන් විචාරන්නාහු "පණ්ඩිත වරුන් පස්දෙනාත් එක්වූහ. ප්‍රශ්නයක් මට වැටහෙයි, ප්‍රශ්නය හැමදෙනම අසව, නින්ද කටයුතු හෝ ප්‍රශංසා කටයුතු හෝ රහසක් කවරක්හට කියන් නේද? රහස් කිවමනා කාටදැ"යි මෙසේ කී කල්හි සෙනකයෝ 'රජපුරුව නුත් අප හා එක්කොට ගනුම්හ'යි සිතා පොළොවට ඉසුරුවූ රජපුරුවන් වහන්ස! ඔබවහන්සේ අපට රක්ෂාස්ථානව සිටිසේක, අපගේ සියලු කෘත්‍යභාර ය උසුලා සිටිසේක; එසේ හෙයින් නුඹවහන්සේම ආදිකොට වදාළ මැනව ඔබවහන්සේගේ අදහස පරීක්ෂාකොට හෙවත් වදාළක් අසා පණ්ඩිතවරු පස්දෙනාත් කියන්නාහ"යි කිහ. ඒ අසා රජපුරුවෝ තමන් කෙලෙස් වසඟ හෙයින් "යම් සත්‍රියක් නොමෝ ආචාර ශීලයෙන් යුක්තද, පුරුෂයන් කරා නොඑළඹෙන්නීද; හෙවත් පතීව්‍රතා ධර්ම රක්ෂාකරන්නීද; පුරුෂයාගේ අද හස් දැන පවතීද, ප්‍රියද මනවඩන්නීද, එසේවූ තමාගේ අඹුවට නිහතකටයුතු හෝ ප්‍රශංසා කටයුතු රහස් කියන්නේය"යි කිහ.

ඉක්බිති සෙනකයෝත් "අප කෙරේ රජපුරුවෝ ඇතුළත්වූහ"යි සතු ටුව තමන් කළ කාරණයම ප්‍රකාශකරන්නාහු "යමෙක් තෙමේ දුකට පැමිණි ආතුරයානට සරණව පිටිවහල්වේද, එසේවූ දුකෙහි නොහරන තමා ගහඑවාහට රහස් කිය යුතුය"යි කිහ. ඉක්බිති රජපුරුවෝ "පුක්කුස යෙනි! තොපට ගොස් වැටහේද? රහස් කියයුතු කාටදැ"යි පුක්කුසයන් විචාළහ. පුක්කුසයෝ "දෙවයන්වහන්ස! යමෙක්තෙමේ තමාට වැඩිමහලුද,

නොහොත් මැදිබව සිරියේද, නොහොත් කිස්දෙවුන්ද, ඉදින් එකකුසෙහි හොත් තැනැත්තේ ආචාර ශීලයෙන් යුක්තවීනම් තමාට පැමිණි සුවදක් දෙනෙහි තණස්සලුව පසුබැස නොසිරිනම්, එසේවූ තමාගේ හිතකාමිවූ මලු වේවයි බැයා වේවයි සහොදරයාට රහස් කියයුතුය"යි කිහ. ඉක්බිත් හෙත් රජ්ජුරුවෝ කාවිඳුයන් විචාළහ. කාවිඳුයෝද, 'දෙවසන්වහන්ස! යම් පුත්‍රයෙක් තෙමේ පියාණන්ට වහලෙක්සේ මෙහෙවර කොටහෙන වංශයත් රක්ෂාකෙරේද, (අනිජාත අනුජාත අවජාත පුත්‍රයෝ තුන්දෙන නම් කවුරුදැයි යතහොත්?)"පියාණන්ට වඩා සැපත් රැස්කොටගෙන ඨානාන්තරයට පැමිණෙන්නේ අනිජාත නම්වෙයි. පියා සතතන වසතුවූ නුවා ධූසිතව වසන්නේ, අවජාත නම්වෙයි. පියා සතතක සම්පත් සිදිරකොටහෙන වංශයත් රක්ෂාකරන්නේ අනුජාත නම්වෙයි.) එසේවූ අනුජාත පුත්‍ර තෙමේ අලාමකවූ නුවණ ඇත්තේද, එවැනි තමා පුතුට රහස් කියයුතුය"යි කිහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ දෙවිඳුයා විචාළහ. දෙවිඳුයෝද "දෙපා ඇත් තවුන්වූ අධිපතිවූ රජ්ජුරුවෙනි! යම් මැනිකෙනෙක් තුම්බ ප්‍රේමයෙන් යුක්තවූ සිනින් තමන් පුනණුවන්ට සියලු පොෂ්‍යය කෙරෙද්ද, එසේ හිතකාමිවූ මැනි සන්ට රහස් කියයුතුය"යි කිහ. සෙතකාදි පණ්ඩිතවරුන් සතරදෙනා විචාරා රජ්ජුරුවෝ මහෞෂධ පණ්ඩිතයන් විචාළහ. ඉක්බිති පණ්ඩිතයන් වහන්සේ රජ්ජුරුවෙනි! රහස් දෙය නම් නිතු කටයුතුවත් කිම, ප්‍රශංසා කටයුතුවත් කිම, සැහැසීම උත්තමය; රහස්ප්‍රකාශකිරීම නුවණැත්තන්විසින් ප්‍රශංසා නොවන්නේය. තමා සිතූ දෙය මිත්‍රයන් නොපැමිණියේ වීනම් නුවණැති සාර පුරුෂතෙමේ ඒතාක් කල්ම කිසි කෙනකුන්ට ප්‍රකාශ නොකරන්නේය, ඒ සිතූ කටයුත්ත මිදුන් පැමිණියේ වීනම් එවිට සහා මධ්‍යයෙහි කිසි සැකයක් නැතිව ප්‍රකාශකරන්නේයයි වදළසේක. පණ්ඩිතයන්වහන්සේ විසින් මෙසේ වදළ කල්හි රජ්ජුරුවෝ නොසතුටුවූහ.

ඉක්බිත්තෙන් සෙනකයෝ රජ්ජුරුවන් මුණ බැලූහ. රජ්ජුරුවෝත් සේනකයන් මුණ බැලූහ. බෝසතාණන් වහන්සේ උන් දෙන්නාගේ ක්‍රියාව දැකලා "මුන් සතරදෙනම දූසා කියා පළමුව රජ්ජුරුවන් කෙරේ මා බිඳුවාපි වන්හ. පරීක්ෂාකරන පිණිස ප්‍රශ්න විචාරන ලද්දේ වනැ"යි සිතූසේක. රජ්ජුරුවන් හා පණ්ඩිතයන් කථා කෙරෙමින් සිටියදීම නිරූ හසා යට ගියේය. රාජභවනයෙහිත් ඒ ඒ ස්ථානයෙහි වට විලක්කු වල පහනුත් නහනලද්දේය. පණ්ඩිතයන් වහන්සේ "රජ්ජුරුවන්ගේ කටයුතු නම් බැරි දෙයත්, කුමක් වත බවත් නොදැනෙයි, වහා මෙතැනින් නැගී යන බව සුදුසු ය"යි හුනස්නෙන් නැගී රජ්ජුරුවන් වැඳ රාජභවනයෙන් නික්මෙනසේක:- "මුන් සතරදෙනාගෙන් එක්කෙනෙක් 'යහළුවාට රහස්කිම යහපත' එක්කෙනෙක් 'මල්බැයන්ට රහස් කිම යහපත' එක්කොනෙක් පුතණුවන්ට රහස්කිම යහපත. එක් කොනෙක් 'මැනියන්ට රහස්කිම යහපතැ'යි කිහ. මුන් විසින් තමන් තමන් කළ දෙයක් වත් දුටු දෙයක්වත් කියනියි සිහම්. වත්තාවය අදම ඒ තත්ත්වයත් දනිමි'යි සති ටුහන් කෙරෙමින් ඔහු සතරදෙනම මෙතෙක් දවස් රජගෙන් නික්ම මාලිගා දොරකඩ එක් හඬු හොරුවක් මත්තේ හිඳ කළමනා කටයුතු බැණ තමන්තමන්ගේ ගෙවලට යන්නාහ. එසේහෙයින් පණ්ඩිතයන් වහන්සේ "මුන්ගේ රහස් හඬු හොරුව යට වැදහොත්තොත් දහහැක්නැ"යි සිතා ඒ හඬු හොරුව තමන් වහන්සේගේ මිනිසුන් ළවා උසුලවා උඩ නංවා යට සැතපෙනඳ අතුරුවා

හොරුව යට වැදගෙව නමන්වහන්සේගේ පුරුෂයන්ට "තෙපි මුවාව සිට. පණ්ඩිතවරුන් සතරදෙනා කථාකොට නැගිසිය කල්හි අවුත් මා හැරගෙන යව"යි සම්මතකළසේක. ඔවිහුත් "යහපතැ"යි මුවාවගත්හ. සෙනකයෝද දෙවයන්වහන්ස! අප කිවක් නුඹවහන්සේ නොඅදහසේක්වේද? දැන් අප කිවා ශ්‍රී බුධියට නැගේදැ"යි කිහ. රජපුරුවෝ භෙදකාරින්ගේ බස් ගෙන පරීක්ෂා නොකොට හසින් තුස්තව "දැන් කුමක් කරමෝද? සෙනකයෙනි"යි විචාළහ. "දෙවයන්වහන්ස! කල්නොයවාම කිසිසෙනකුන් නොදන්නා ලෙස නොටියාපුතු මැරවාපිම යහපතැ"යි කිහ. සෙනකයෙනි! තොප විනා මිට අනිසෙක් නම් නැත, තෙපිම තොපගේ මිත්‍රයන් හැරගෙන වාසල්කඩ ඇලි සිවි නොවියා පුතු උදුසන රජසෙවයට එමින් වාසල් ඇතුළුවූ විටම කඩුවෙන් ඉස කපාපියව"යි තමන්ගේ මිනුල් කඩුව සෙනකයන් අතට දුන්හ. ඔවිහු සතරදෙනාන් යහපත දෙවයන්වහන්ස! හඟ නුවුව මැනව, අපි නොවියා පුතු මරම්හ"යි කියා රජගෙන් නික්ම "අප විසින් පසම්තුරුගේ පිටු දක්නාලදැ"යි කියා හඬු නොරුව මිත්තේ හුන්නාහ.

ඉක්බිත්තෙන් සෙනකයෝ "කොල! නොවියා පුතු ගසන්නේ කව රෙක්දැ"යි කිහ. අනිත් තුන්දෙන "ආචාර්‍යයන්වහන්ස! නුඹවහන්සේම ගැසුව මැනව"යි ඔනුවම භාරකළහ. නැවත සෙනකයෝ ඉන් අනික් තුන් දෙනාට "තෙපි රහස් නම් අසවලුන්ට අසවලුන්ට කියයුතුය"යි කිවුය. කිවෙක්ද "නොප හළ දෙයක්ද? නොහොත් දුටු දෙයක්ද? ඇසූ දෙයක්ද"යි විචාළහ. ආචාර්‍යයන්වහන්ස! ඒ පසුතළ මැනව, නුඹදැ "රහස් නම් යහළුවාට කිය යුතුය"යි යමක් වදලසේක් ඕනම් "ඒ නුඹවහන්සේ හළ දෙයෙක්ද? නොනොත් දුටු දෙයෙක්ද? ඇසූ දෙයෙක්දැ"යි විචාළහ. සෙනකයෝ "තොපට ප්‍රයොජන කිම්දැ"යි කිහ. "කිව මැනව ආචාර්‍යයන්වහන්සැ"යි කිහ. "මේ රහස් කවයුත්ත රජපුරුවන් දහහොත් මාගේ දිවි නැතැ"යි කිහ. "නොබව මැනව ආචාර්‍යයන්වහන්ස! මෙතැන නුඹවහන්සේගේ රහස් ප්‍රකාශකාරන කෙනෙක් නැත. සැක නොකොට කිවමැනව"යි කිහ. සෙනක පණ්ඩිතයෝ හඬු හොරුව නියපිටින් ගසා "මේ හොරුව යට ගොවියා පුත් ඇද්දෝනෝ"යි කිහ. "ආචාර්‍යයන්වහන්ස! ගොවියා පුත් තමාගේ ඓශ්වර්‍යයෙන් මත්ව සු විදිහේ මෙබඳු අපවිත්‍ර තැනකට කුමට වදිද නොවදිය. නුඹවහන්සේ කිව මැනව"යි කිහ. සෙනකයෝ තමන්ගේ රහස් ප්‍රකාශ කරන්නාහු "මේ නුවර අසවල් වෛශ්‍යා දුව හඳුනව්දැ"යි කිහ. එසේය හඳුනමිහ ආචාර්‍යයෙනි"යි කිහ. "දැන් ඒ වෛශ්‍යා දූ පෙනේදැයි කිහ. "නොපෙනෙයි ආචාර්‍යයෙනි"යි කිහ. "එසේවීනම් එම්බා! මම මහුල් සල් උයනේදි ඇ හා සමඟ පුරුෂ කෘත්‍යය කොට හෙවත් සැතපී ඇගේ පලඳනා ලොභයෙන් ඇ මරාපියා ඇගේම හන්කඩින් ඒ ආභරණ පොදියක් කොට බැඳගෙන අපගේ ගෙයි අසවල් මාලේ අසවල් ගබඩාවේ මුවඇ කොක්කේ එල්වාලීම්, තව දක්වා ඉන් කිසිවක් අලෙවි කෙළේ නැත, පරණව ගන්නා තුරු බලා ඉඳිම්; මේබඳු රූප අපරාධ කවයුත්ත මාගේ යහළුවාට කිම්, ඌ කිසිසෙනකුන්ට නොකී මිරුය. 'මේ කාරණයෙන් යහළුවාට රහස් කියයුතුය'යි කියෙම්'යි කිහ. පණ්ඩිතයන්වහන්සේ සෙනකයන්ගේ රහස අසා සිහ තබාගත්හ. පුක්කුසයෝද තමන් රහස ප්‍රකාශ කරන්නාහු "එම්බා! මාගේ කුලවුසේ අසාධ්‍ය කිලිසක කුෂ්ඨයක් ඇත්තේය. මාගේ මලණුවෝ

උදයනක්සේම කිසි කෙනකුත් නොදන්වා ඒ කිලාසය කසට පැනින් සොඩා පියා බෙත් ගල්වා මත්තෙහි මොලොක් නොට කඩිරෙදි වසා බඳනාහ. රජ්ජුරුවෝ මා හෙරෙහි මොලොක් සිතින් 'මේසේ ථව පුක්කුසයෙනි! සිහදුවාලා බොහෝසේම මගේ කලවයෙහි ඉස නවාගෙන සැතපෙන්නාහ, ඉදින් නොකවුරු දත්තුනම් මා මරාපියන්නාහ, ඒ රහස් මාගේ මිලණුවන් විනා අනික් දන්නා කෙනෙක් නම් නැත, ඒ කාරණය හෙතුකොටගෙන රහස් නම් මල්බැයන්ට කියයුතුයයි මා විසින් කියනලදැ,'යි කීහ.

කාමිඳුයෝද තමන්ගේ රහස් ප්‍රකාශකරන්නාහු "එම්බා! මා වරද අසව්, අව පසළොස්වක් දවස් **ගරදෙව නම් යක්ෂයෙක්** මා ඇතට නැගෙන් නේය, ඒ යක්ෂයා නැඟි කල්හි මම මියරු හුණු බල්ලකු පරිද්දෙන් හඬම්; මම ඒ යක්ෂ විකාරය මට ඇති තියාව මාගේ පුතණුවන්ට කිමි; ඌ මා ඇතට යක්ෂයා ආවෙශවූ බව දැන ඇතුළු ගෙයි මා හුවැටි බැම්මෙන් බැඳ හොඹලා දෙර පියාගෙන ගෙන් පිටත්ව මා හඬන බලු හඬ කිසිකෙනකුත් නොඅසනු පිණිස දෙර ළඟ රහමඬුලු බන්දු අරගල කරන්නාහ; මේ කාරණය හෙතුකොටගෙන 'රහස්නම් පුතණුවන්ට කියයුතුයයි මා කියේය"යි කීහ ඉක්බිති තුන්දෙනම දෙවිඳු පණ්ඩිතයන් විවාළහ. උසිත් තමන්ගේ රහස් ප්‍රකාශ කරන්නාහු "එම්බා! ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් කුසරජ්ජුරුවන්ට දුන්නාවූ ශ්‍රී සම්පත් එළවන්නාවූ මාණික්‍ය රතනය රාජ පරම්පරාවෙන් පැවත අවුත් රජ්ජුරුවන් සතු කව භාණ්ඩාගාරයේ තුබුවා මැණික් මවසව් කරවන්නාවූ මා විසින් සොරා හැරගෙන මාගේ මැනියන්ට දෙනලද, මැනියෝ කිසිකෙනකුත් නොදන්වා රජගෙට යන වේලෙහි ඒ මැණික මට දෙන්නාහ. මම ඒ මැණිකින් ශොභාව මුණට පතුරුවාගෙන රජගෙට යෙමි. රජ්ජුරුවෝ තොප හැමදෙනා හා කථානොකොට පළමුකොට මා හා සුව දුක් දෙඩන්නාහ. දවසක් පාසා අට කහණුවක් හෝ සොළොස් කහවණුවක් හෝ දෙනිස්කහණුවක්හෝ සූසැට කහණුවක්හෝ මසුරන් වියදම් දෙන්නාහ. ඉදින් ඒ මිණිරුවන සොරුගත් බව රජ්ජුරුවෝ දත්තු නම් මාගේ දිවි නැත. මේ කාරණය හෙතුකොට ගෙන 'රහස් නම් මැනියන්ට කියයුතුය'යි මා කියේය"යි කීහ. බෝසතාණන්වහන්සේ මේ හැමදෙනාගේම රහස් ප්‍රත්‍යක්ෂකොට සිත නබාගත්සේක. ඔහු වනාහි තමන්ගේ බඩ පලා බඩවැල් පිටත්කරවන්නවුන් මෙන් රහස් ඔවුනොවුන්ට කියා හැමදෙනම 'පමානොව උදයනම එව, ගොවිය පුතු මරම්හ'යි කියා හුන් තැනින් නැඟි සිට තමන් තමන්ගේ ගෙවලට ගියාහ.

ඒ සෙනකාදි පණ්ඩිතවරුන් ගිය කල බොධිසත්ත්වයන් වහන්සේගේ පුරුෂයෝ අවුත් ඔරුව ඔසවා මහබෝසතාණන් ගෙනගියහ. උන්වහන්සේ ඉස් සොඩා නහා ගඳවිලවුන් ගෙන සැරහී දිව්‍යභොජනයක් හා සමානවූ රස මසවුලෙන් යුක්ත ආහාරය අනුභවකොට "අද මාගේ දුනණීයෝ උදුම්බර දෙවි රජගෙන් මට සවරූප කියා අස්නක් එවති"යි දුන "රජගෙන් ආ නොහකුන් වහා ඇතුළට ඇරගෙන මට පැලව"යි කියා ඇදහිලි පුරුෂයකු වාසල සිටවූසේක. මේසේ විධානකොට විවිත්‍රාසනාරණයෙන් විභූෂිතවූ ශයන මස්ත කයෙහි බ්‍රහ්ම කුමාර විලාසයෙන් සැතපුණුසේක. රජ්ජුරුවෝද ඒක්ෂණයෙහි ශ්‍රී ශ හන්හි සැතපුණාහු පණ්ඩිතයන් වහන්සේගේ ගුණ සිහිකොට "මහෙ

ඔබ පණ්ඩිතයෝ සත්ඇවිරිදි කල් පටන් මා සෙවය කරන්නාහු, මට කිසි අවැඩක් නොසළහ. දෙවතාදූ වීවාළ පැනයෙහි පණ්ඩිතයන් නැතහොත් මාගේ ජීවිතයද නැත්තේය. වෛරී පසම්පුරන්ගේ බස්ගෙන 'අසමානවූ නුවණැති මහෞෂධ පණ්ඩිතයන් මැරවයි කියා මිහුල්කඩුව දුන්නාවූ මා විසින් සෙළේ අයුතුයය. සෙට පටන් කොට එවැනි පණ්ඩිත රතනනයක් දක්නට නොලැබෙය"යි ළය පැලියන පරිද්දෙන් හොඳ ඉපදවූහ. ශරීර යෙන් බා බිඳගත්තෝය. ශොභයෙන් මඩනා ලද්දාහු, විත්තාසාදයක් නොලද්දහ. උදුම්බරදෙවී රජ්ජුරුවන් හා සමඟ එහා යහනෙහි ඉඳ රජ්ජුරුවන් විත්තාසාදයක් නොලැබ සැතපෙන්නා දැක 'කිමෙක් දෙහෝ මිාගෙන් කිසි වරදෙක් ඇද්දෙහෝ නොහොත් අනික් කිසි කාරණයෙක් රජ්ජුරුවන් සිත්හි උපන්දෙහෝ"යි විචාරන්නාහු "රජ්ජුරුවෙනි! නෙපි ශ්‍රාම දෙම්නස් වුව, නොපගේ සිතට නොහැඟිලෙස මා කළ වරදෙක් නැත්තේය, අනික් කවුරුන් කළ වරදෙක් සිතටගෙන දෙහෝ නොහොත් කවුරුන්ගේ විෂයෙහි නොපට කොනයක් ඇතිවිද? ඒ මට කියව'යි කිහ. ඉක්බිති රජ්ජුරුවෝ "සොඳුර! සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන මහෞෂධ පණ්ඩිතයෝ නොප මරාපියා රාජ්‍යය ගන්නට සිතති'යි මට කිහ. මා විසින් නඩිය පරීක්ෂා නොකොට 'එසේවිනම් උන මරාපියව'යි මිහුල් කඩුව අතට දිලා පණ්ඩිතයන් මරන්නට විධාන කරනලද, ඒ කාරණය සලකන්නාවූ මම 'මහෞෂධ පණ්ඩිතයන් මරණට පෙරතුකොට මට මරණයවිනම් යහපතැ'යි උන්ගේ වාක්විෂයාතික්‍රාන්ත ගුණ භූවණ සලකන්නෙම් 'එවැනි පණ්ඩිතරතනයක් සෙට පටන් නොදකිමි'යි සිත උපන් බොහෝ ශොකයෙන් දෙම්නසිමි"යි කිහ. එබස් අසා උදුම්බරදෙවීන්ට ඉඛොධිසත්වයන් වහන්සේ විෂයෙහි පළුහයකින් මඩනාලද පරිද්දකින් ශොක උපන්නේය.

ඉක්බිති 'උපායකින් රජ්ජුරුවන් අස්වසමි'යි සලකා 'රජ්ජුරුවන් නිදන්නට වන් කල්හි මාගේ මලණුවන්ට සචරූපකියා පත්යවමි' සිතා "රජ්ජුරුවන් වහන්ස! හොවියාපුහු මේසා මහත් ඓශ්වර්‍යයක පිහිටුවා නෙපිමවද ඇතිකෙළෙහිය, නොප කෙරෙන්ම සෙනෙවිරත් ධුරයට පැමිණ දැන් නොප ටමි වරදනට සිරිසෝය; එම්බා! පසම්තුරෝ නම් කුඩා නොවෙති. මැරිය යුත්තෝමය, නෙපි නොසිතව්ය"යි රජ්ජුරුවන් බිසව් වඤ්චාවෙන් අස්වැසූහ. රජ්ජුරුවෝ බිසවුන් කී බසින් තුනි කරනලද ශොක ඇතිව නිදන්නටවන්හ. බිසව් රජ්ජුරුවන් නිදන නියාව දැන නැඟී සිට ශ්‍රී යහන් ඉඛඩාවට වැද, පනක් පන්හිදක් ගෙන "මහෞෂධ පණ්ඩිතයෙනි! සෙනකාදි පණ්ඩිතවරු සතරදෙන රජ්ජුරුවන්ට දූසා කියා නොප බිඳුවාපිහ. රජ්ජුරුවෝ කිපී සෙට උදැසනම නොප රජගෙට එන වේලෙහි වාසලදී මරන පරිද්දෙන් විධාන කොට තමන්ගේ කඩුව සෙනකයාට දුන්හ. සෙට රජගෙට නොඑව, ඉදින් එවිනම් නුවර මුළුල්ල අත්පත්කොටගෙන යුඛයක් වී නමුත් කරන පරිද්දෙන් බල ඇතිව එව"යි පත ලියා අකුළුවා අග්ගලාවක් පලා ඇතුළේලා නොපෙනෙන ලෙස හුයකින් අග්ගලාව වෙළා සුවඳ කවා අලුත් සැළියක ලා අස්ඛබා තමන්ට වැඩපසස්නා කම්මිත්තකට "මේ ගෙන ගොස් මාගේ මලණුවන්ට දී එව"යි කියා දුන්හ. කම්මිත්තත් බිසව් කී ලෙසට කළාය. (රැකවල් ඇති තැන කෙසේ ගියාදැ'යි නොසිනිය යුතුය. රජ්ජුරුවන් විසින් බිසවුන්ට පළමුකොටම 'කැඳැති වේලක අදූත්තක් නොපගේ මල්ණුවනට යැව්ව රැක

වල් නැතැ'යි වර දෙනලද, එසේහෙයින් කිසිකෙනකුත් නොවැලකූහ.) බොධිසත්ත්වයන්වහන්සේ බිසවුන් යැවූ පඬුරු සඛ්‍යාත අග්ගලාව අතවගෙන 'මා මේ පඬුරුගත් තියාව බිසවුන්ට කියාලව'යි කියා නම්මිත්ත යවූසේක. ඔසිත් රජගෙට අවුත් යැවූ දෙය පණ්ඩිතයන් වහන්සේට දුන් තියාව බිස් වුන්ට කිව. එවිට බිසව් ගොස් රජ්ජුරුවන් සමීප සැතපුණාහ.

බෝසතාණන් වහන්සේද, අග්ගලාව බිඳ ඇතුළෙහි තිබූ පත [illegible] එපවත් තත්වූ පරිද්දෙන් දැන නුවර කළමනා කටයුතු මුළුල්ල විමාරා, යා නෙහි සැතපුණුසේක. සෙනකාදි සතරදෙන රාත්‍රිභාගය වම්සියන් මේන් දිස් කොට සිතන්නාහු 'භවර විවක පහන් මේදෙහෝ'යි විරජිත කරන ලද තිදි ඇතිව උදැසනක්සේම කඩුගත් අත් ඇතිව වාසල ඇලි රැක සිව පණ්ඩිතයන් වහන්සේ නොදැක දෙම්නස්ව බොධිසත්ත්වයන් වහන්සේගේ මුළු ලොව පතළ මෛත්‍රී නමැති වණ්ඩ වාතයෙන් උදුරා දමනලද්දාවූ වාසෘ සතරක් මේන් රජ්ජුරුවන් සමීපයට ගොස්, "කිමෙක්ද පණ්ඩිතවරුනි! තොප විසින් ගොවියා පුතු මරනලදදැ"යි කී කල්හි 'දෙවයන් වහන්ස! ගොවියා පුතු නුදුවි මුය"යි කිහ. මහබෝසතාණන් වහන්සේද හිරු නැහෙමින් සිටියදිම් සත් යොදුන් මියුලුනුවර මුළුල්ලම තමන්වහන්සේ වසඟකොට, ඒ ඒ ස්ථානයෙහි රැකවල් තරකොට ලවා බොහෝදෙනා විසින් පිරිවරන ලදුව සම්පූර්ණ ඍද්ධාරයෙන් සරහනලද උතුම් රථයානාවෙහි නැගී මහත්වූ හස්ත්‍යශ්වාදි පරිවාරයෙන් හා අනුපමවූ ශ්‍රී සෞභාග්‍යයෙන් උපලක්ෂිතව රජගෙයි වාසලින් බැහිසේක. රජ්ජුරුවෝ සීමාදුරු කවුළුව හැරපියා බොධිසත්ත්වයන්වහන්සේ එන්නා බලා සිටියහ. ඉක්බිති මහබෝසතාණන් වහන්සේ රථයෙන් බැස පියා එතැනදීම රජ්ජුරුවන් වැඳිසේක. 'රජ්ජුරුවෝ ඉදින් පණ්ඩිතයෝ මට පසම්තුරුවෙත් නම් මා නොවඳනාහ'යි සිතූහ. මෙසේ සිතා ඉක්බිති 'මප්‍රතිණුවෝ වහා එත්ව'යි වහා කැඳවා යවා රාජාසනයෙහි හුන්හ. මහබෝසතාණන් වහන්සේද ගොස් එකත්පස්ව හුන්හ. සෙනකාදි පණ්ඩිතවරු සතර දෙනත් එතැනම උන්හ.

ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේට කිසිවක්ම නොදන්නා කෙනකුන් මෙන් "පුත මහෞෂධ පණ්ඩිතයෙනි! ඊයේ පෙර සක්‍යාසෙහි ගියෙහිය, දැන් හිරු නැඟී මෙතෙක් වේලෙන්, අවුත් මා දුටුව, මා මේසේ කුමට හළුවාද? කුමක් අසා තොපගේ සිතට කුමන සැකයෙක්වීද? කවුරු තොපට රජ්ජුරුවන් දැක්මට නොළුවසි කුමන බසක් කිව්දැයි සවරාප අසන්නා කැමැත්තම්හ; එබැවින් තොප පමාවූ කාරණය කියව"යි විවාළහ. ඉක්බිති මහබෝසතාණන් වහන්සේ රජ්ජුරුවන්ට 'දෙවයන් වහන්ස! ඔබවහන්සේ විසින් මට සතුරුවූ සෙනකාදි සතරදෙනා බස්ගෙන මා මරන්නට නියොග කරනලද්දේ වේද, එසේහෙයින් නොආයෙමි"යි රජ්ජුරුවන්ට බොදනා කරතසේක් "ජනප්‍රධානවූ දෙවයන් වහන්ස! ඔබවහන්සේ විසින් ප්‍රඥාසම්පන්න මහෞෂධ පණ්ඩිතයෝ මැරිය යුත්තෝයයි වෛරිවූ සෙනකාදීන්ගේ බස්ගෙන මා අපරීක්ෂිතව මරන්නට නියොගකරනලද, යම්හෙයකින් ඊයේ මධ්‍යම රාත්‍රී වේලෙහි බිසවුන්වහන්සේට රහසිගතව කියනලදද; එබදුවූ කුඹුවහන්සේගේ රහස් කවයුත්ත ප්‍රකාශකළවිට මා විසින් අසනලදැ"යි විදළසේක. රජ්ජුරුවෝ, ඒ අසාලාම "මා විසින් කියනලද රහස එවිට තමා මිලුට කියා යවාලදැ"යි කිපී බිසවුන් මූණ බැලූහ.

රජ්ජුරුවන් බිසවුන්ට කිටි නිසාව දැන, මහබෝසතාණන් වහන්සේ "දෙවියන්වහන්ස! බිසවුන් වහන්සේට කුමකට කිපෙනසේක්ද? මම අතීතානාගත වර්තමාන සර්වඥතා ඥානයෙන් වුවද බිසල්ලම දනිමි; දෙවියන්වහන්සේගේ රහස් මනාකොට දැන්නේ මිට පෙරාතු වීසින් කියනලද්දේවේවා; ආචාර්ය සෙනක යන්ගේ හා පුක්කුසාදීන්ගේ රහස් මට කාවිසින් කියනලදද? මම උන්ගේ රහස්හු දනිමියි"සි කියා සෙනකයන්ගේ රහස් පළමුකොට වදාරනසේක් "දෙවියෙනි සෙනකයා මේ නුවර අසවල් වෙසඟුදුව මනුල් සල් උයන්දී මරුටියා ඇ පලන් ආහරණ ඇරගෙන හන්කඩින් පොදියක්කොට බැඳගෙන අවුත් තමාගේ ගෙයි අසවල් තැන තුබුසේක. ඉක්බිති තමා කළ ලාමක පාප කර්මය තමාගේ එක් යහළුවකුට රහසිගතව කිය. ඒ රහසද කාවිසින් අසනලදද, මම දෙවියන් වහන්සේට සතුරු නොවෙමි. සෙනකයා සතුරුය, ඉදින් ඔබවහන්සේගේ පසම්පුරාකුගෙන් කායඥයෙක් ඇත්නම් සෙනකයා ඇල්ලුව මැනව"සි වදාළසේක. රජ්ජුරුවෝ සෙනකයන් මූණ බලා 'සැබෑද සෙනක යෙනි'සි විචාරා 'සැබෑ දෙවියන් වහන්සැ'සි කී කල්හි ඔහු සාරථය මස්වා සිරගෙයි ලන්නට විධාන කළහ.

පණ්ඩිතයන්වහන්සේද පුක්කුසයන්ගේ රහස් වදාරනසේක් 'දෙවියන් වහන්ස! මේ පුක්කුසයානම් රජ්ජුරුවන් කරා නොඑළඹිය යුතුවූ අසාධ්‍ය කුෂ්ඨරෝගයක් කලවයෙහි ඇති එකෙක. ඒ කුෂ්ඨරෝගය අතලන්නටත් පිළිකුල් වන්නේය. නුඹවහන්සේ 'පුක්කුසයාගේ කලව මොලොකැ'සි කොහෝසේ ඔහුගේ කලවයෙහි ඉස තබාගෙන සැතපෙනසේක. ඒ මේ වග යෙහි බැදිනාඩ රෙදිදෙහි මොලොකය දෙවියන්වහන්සැ"සි කියා "එසේ නම්ගේ රහස මලුට කියේය. ඒ රහස කියනකල මාවිසින් අසනලද්දේය"සි වදාළසේක. රජ්ජුරුවෝ පුක්කුසයන් මූණ බලා 'සැබෑද පුක්කුසය'සි විචාරා 'එසේය දෙවියන්වහන්සැ'සි කී කල්හි උනුත් දහගෙයි ලැවූහ. පණ්ඩිතයන් වහන්සේ කාවින්දයාගේ රහස් වදාරනසේක් "දෙවියන්වහන්ස! යම් යක්ෂ විකාරයක් ඇතිවූ කල්හි සඬතෙමේ විසරුහුණු බල්ලකුසේ හඬා ඇවිදීද, ඒසේවූ නපුරු සවභාව ඇති නරදෙවනම් යක්ෂයෙක් අව පසළොස්වක්හි මොහුඇඟට ආවෙශවූ කල්හි සහර පා බිම බබාගෙන ඇවිදින උනමත්ත සුනඛයකු මෙන් ගේ මුළුල්ලෙහි අඬා ඇවිදීද, ඒ යක්ෂ විකාරයය තමාට ඇති නියාව තමාගේ පුතුට රහසේ කියේය. ඔහු පුතුට ප්‍රකාශකළ නියාව මා විසින් අසන ලදැ"සි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද කාවින්දය"සි විචාරා 'සැබෑය'සි කී කල්හි උනුත් දහගෙයි ලැවූහ. පණ්ඩිතයන්වහන්සේ දෙවින්දයාගේ රහස් ප්‍රකාශ කරනසේක් "දෙවියන්වහන්ස! **ප්‍රභාවති** බිසවුන් නිසා, ඒසා යුඬයක් සජ්ජිතකොට ආ රජ්ජුරුවන් සත්දෙනකු 'මම(සිංහ සවර) **කුස රජ්ජ**' යන වචන මාත්‍රයකින් පරාජය කොට ශත්‍රු සෙනායෙහි කිසි කෙනකුන් ඇඟින් මැස්සකු බොන පමණත් ලේ පොදක් නොසොල්වා වණඹ පවනකින් එහා පැහැර වගුල් තල් වනයක් පරිද්දෙන් විසංඥකොට හෙළා යුඬයේ ජයලත් නුඹවහන්සේගේ මී මුත්තණුවන් කුසරජ්ජුරුවන්වහන්සේට සතුටුවිය; ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් දෙනලද්දාවූ මංගල සම්මත අජවඩක **මාණික්‍යරත්නය** ඔබ වහන්සේගේ භාණ්ඩාගාරයෙහි තුබුවා දැන් දේවින්දයා අහට ගියේය, තමා මැණික සොරුගත් නියාව රහස්කොට මවට කීයේය, උඹ මවට කී රහසත් මා විසින් අසන්ලද; දෙවියන්වහන්ස! මම

ඔබවහන්සේට පසම්පුරු නොවෙමි, මේකී පණ්ඩිතවරු සහරදෙන ඔබවහන්සේට පසම්පුරෝය, පසම්පුරන්ගෙන් ඔබවහන්සේට කායකියෙක් ඇත්නම් මේකී පණ්ඩිතවරුන් සහරදෙනා අල්වාගෙන කැමැත්තක් කළමැනවැ"යි වදාළසේක. රජ්ජුරුවෝ 'සැබෑද දෙවිඳුයනි අසා 'සැබෑවැ'යි කී කල්හි උතුන් දහගෙයි ලැවූසිඟ.

මෙසේ සෙනකාදි පණ්ඩිතවරු "බොධිසත්ත්වයන් වහන්සේ [illegible] හැමදෙනම ශිරඟෙට වන්හ බොධිසත්ත්වයන්වහන්සේද "දෙවියන් වහන්ස... තමන් සිත උපන් රහස් කටයුත්ත මුදුන් පැමිණියොත් මුත් අනුන්ට නොකියයුතුයයි කියේ මේ නිසාය"යි කිසේක. "අසවලුන්ට රහස් කිම් යහපතැයි කිවාහු මහත් විනාශයට පැමිණියෝය"යි වදාරා මන්තෙහි ධර්මදේශනා කරන සේක් මහරජ රහස් නම් දෙය සැහවීමම යහපත, නුවණැත්තෝ 'රහස් ප්‍රකාශකිරිම උතුමැ"යි නොකියන්නාහ; යම්හෙයක් නිසා සිතූදෙය මුදුන් නොපැමිණියේ නම් ඒහෙයක්ම නිධානයක් මෙන් නුවණැත්තේ ඉවසන්නේය; නිෂ්පන්නවූ අර්ථ ඇත්තේ කාමැති පරිද්දෙන් ප්‍රකාශ කරන්නේය. තවද දෙවියන්වහන්ස! විශෙෂයෙන්ම රහස් නොකිය යුත්තන් අසා විඳුළ මැනවි මේ ලොකයෙහි සත්‍රු නෝමේ හදවතක්සේ වෙසේ නමුත් නුවණැත්තේ ගැහණිටත් රහස් නොකියන්නේය. යමෙක් ආමිෂයෙන් සිත් ගතයුතු නම් එසේවූ තැනැත්තවුවද, යමෙක් සතුරුව මිතුරකුසේ මුඛයෙන් එනක් බැණ සිතින් එහක්ඕතානම් එසේවූ කුට සිත් ඇත්තාහටද, රහස් නොකියන්නේය. යම් අඥානයෙක් කිසිවක්හට ප්‍රකාශ නොකටයුතු රහස් යමක්හට කියේදිනම් ඔහු මරතත් ආක්‍රොශ පරිභව බණතත් දැඩයකු පරිද්දෙන් 'තමා කී රහස් ප්‍රකාශතෙලේ විනම් නපුරැ'යි යන සිතින් සියලු නිදුම් ඉවසන්නේය. තවා සිත උපන් රහස් යම්තාක් දෙන දනිත් නම්, ඒ මන්ත්‍රණය කළාවූ එතෙක් දෙනා කෙරෙහි 'මුන් විසින් ප්‍රකාශ වේදෝහෝ'යි එතෙක්මේ භය ඕහට උපදනේය. එසේ හෙයින් රහස් කිසිවක්හට නොකියන්නේය. දහවල් රහස් මන්ත්‍රණයක් කරනු කැමැත්තහොත් අවකාශයක් කරවාගෙන තෙලිතැනකදි මන්ත්‍රණය කරන්නේය. ඉදින් රෑ මන්ත්‍රණයක් කරනු කැමැතහොත් කන් සීමා නොඉක්මවා උන්ගේ කණින් බැහැරට තෙප්ල නොයන ලෙස සෙමෙන් ප්‍රකාශ කරන්නේය. 'කුමක් හෙයින්දැ'යි යනහොත්? නිත්‍යව ප්‍රාකාරයදි ප්‍රවිශ්‍ය සථානයෙහි සිටි කෙනෙක් ඇත්නම් මන්ත්‍රණය අසන්නාහ. "එසේ හෙයින් දෙවියන්වහන්ස! ඒ මන්ත්‍රණය හෙද වන්නේය"යි වදාළසේක.

රජ්ජුරුවෝ මහබෝසතාණන් වහන්සේගේ ධර්මකථාව අසා "මොවුහු තුමූම රාජද්‍රොහිව නිරපරාධවූ පණ්ඩිතයන් මට ද්‍රොහි කරන්නාහ'යි කිපි යව කොල! මේ කොල්ලන් මරමරා නුවරින් පිටත්කොට වාසල්දොර සමීපයෙහි අගල් ඔස්සේ ගෙනගොස් 'හුල හෝ හිඳුවා ඉස්කඳවියා අගලට හෝ දමාපිය ව'යි නියමකළහ. උන් පිටිතල හඬා බැඳ සඤ්ඤසියෙහි සිටුවා කටුසැමිටියෙන් සියගණන් පහර ගසගසා මරන්නට ගෙනයන වේලෙහි පණ්ඩිතයන් වහන්සේ 'දෙවඟනෙනි! මොවුහු තුමූ ඔබවහන්සේගේ පුරුහත අමාත්‍යයෝය, උන්ගේ වරද ක්ෂමාකළ මැනව'යි රජ්ජුරුවන්ට වදාළසේක. රජ්ජුරුවෝ 'යහපතැ'යි ගෙන්වා බොධිසත්ත්වයන් වහන්සේටම දස්කොට පාවාදුන්හ. උන්වහන්සේ වනාහි පණ්ඩිතවරුන් එනැනදීම නිදහස්කළසේක. 'එසේවී නම් මාගේ විජිතයෙහි සිටිය නොහැක්කැ'යි රටින් නෙරතට නියොගකළ

සේක. පණ්ඩිතයන් වහන්සේ 'නුවණ නැත්තන්ගේ වරද සහමාකළ මැන වැසි දිව්‍ය ඖෂධයකින් අසාධ්‍ය ව්‍යාධියක් සංසිඳුවන්නාක්මෙන් තමන්වහන්සේගේ විවෙනෙහෙස්ලොව් රජ්ජුරුවන්ගේ කොප ව්‍යාධිය සංසිඳුවා සහමාසා රවා උන්ගේ නානාවූ පෙර පරිද්දෙන් දෙවා වදාළසේක. රජ්ජුරුවෝ 'පඤ්චාලපුරන් කොරෙහිදු වැන්නේ මේත්‍රීය මෙබඳුය, සෙස්සවුන් හෙරේ මෙත්‍රී කොහිදු වැන්නිදැ'යි පණ්ඩිතයන් වහන්සේට වැඩියහම් සතුටුවූහ. එහෙත්පාර් කොට සෙනහාදී පණ්ඩිතවරු සතරදෙන දළ උදුරපු සර්පයන් මෙන් වැඩියහුන් පුහු කයැයියක් නැතිව බොධිසත්වයන් වහන්සේට කිසිවක් කියන්නට අසමර්ථවූහ.

පඤ්චාල පණ්ඩිත ප්‍රශ්නයයි.

පරිබ්බාජක කථා නිමි.

එහෙන් පවත් කොට පණ්ඩිතයන් වහන්සේම රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරනසේක. උන්වහන්සේ රජ්ජුරුවන්ට ධර්ම්ලක්ෂත්‍ර යමය රාජ්‍යය විචාරන්නෙම් නම් මෙය. එසේහෙයින් මා විසින් නොපමා ව්‍ය යුතුය'යි සිතා සත්‍යෝදුන් මියුලුතුවර වටාසාගර සාගරයෙන් නැගී හරණ මාලාවන්සේ, ඛවලවූ අවළොස් රියන් පමණ උස මහා සිමා පවුරක් ලැවූසේක. ඒ පවුර ගාවා ඇතුළතින් තරස පිණිස මහා පදනමක්ද වට කොට සියගණන් වාරි නෙවල් හා ඒවබද වෙටටම්ද ලවා වාසලක් පාසා විවිත පුලිඹුබම්ද ඒ ඒ ස්ථානයෙහි බලකොටුද කරවූසේක. සිමා පවුරු වටා පිට නින් සුංසුමාර මකරාදී වණඩ මත්‍ස්‍යයන් විසින් ගහණවූ පඤ්චවිධ පර්මයෙන් සයුත්තවූ දිය පිරුණු අගලක්ද, ඒ වටා කලල් අගලක්ද, ඒ වටා පොලෝ අගලක්දැයි තුන් අගලක් බිඳවූසේක. ඇතුළු ගෙවල මුළුල්ල කටුකොහොල් ඇරවූසේක. ඒ ඒ ස්ථානයෙහි මහ පොකුණු බින්දවා එහි දිය පිරවූසේක. නුවර සියලු කොටු ගෙවල් වි පිරවූසේක. හිමායවන ප්‍රදේශයෙන් කුලුපග තාපසවරුන්ලවා අරුණුවන් මඩ හා ඇඹුල් බිජුවට ගෙන්වා තැබ්බවූසේක. බොහෝ කලක් බොරගසා වැලි බොර සිටි අශුඛ ඇල හෝ ආදිය සතස් කරවා වාරි මාගි සුණු මැටි කාවා සිටි නුවරද සුන් බුන් තැන් පිරියම්කරවූ සේක. මේ කුමක් නිසාද යතහොත්? මන්තෙහි සතුරන් විසින් වන භය වලකන පිණිසය. "ඒ ඒ නුවරවලින් ආ වෙළඳුන් අතින් කොසිසිට අවුදැ' සි විචාරා 'අසවල් රට සිට ආම්හ'යි කී කල "තොපගේ රජ්ජුරුවන්ට කුමක් ප්‍රිය දැ"යි විචාරා අසවල් දෙය ප්‍රියය' යනු අසා ඒ වෙළඳුන්ට කළමනා සත්කාර කොට යවා තමන්වහන්සේගේ එක්සියයක් යොධයන් බණවා, 'සබඳි නි! මා දුන් පඩුරුගෙන දඹදිව එක්සියයක් රාජධානියට ගොස් මේ පඩුරු තොප සෙරෙහි සෙනහස හබන පිණිස ඒ ඒ රජදරුවන්ටදිලා ඒ ඒ රජදරුවන්ටම සේවාකම්කොට උන්ගේ භරත ක්‍රියාවක්වත් බණන මන්ත්‍රයක්වත් කියා එවඑවා එහිම වසව්; මම තොපගේ අඹුදරුවන් රක්ෂා කෙරෙම්"යි කියා සම ගර රජදරුකෙනකුන්ට මැණික්මය කුණ්ඩලාභරණද, සමහර රජකෙන කුන්ට ඔසිතුරු මඟුල්කඩුද, සමහර රජදරුකෙනෙකුන්ට රන්මාලාද තමන්වහන්සේ නම අකුරු කොටා "යම් දවසක මානේ සායන්හියෙහි නිෂ්ඵා වෙක් වේද, එදවස් මේ අකුරු බැලුවන්ට පෙනේව"යි අධිෂ්ඨානකොට ඒ එක්සියයක් යොධයන් අත යැවූසේක.

ඒ යොධයෝ ඒ ඒ නුවරට ගොස් ඒඒ රජදරුවන්ට තමන්ගේ ගෙනියෑ පඬුරුදී ඔබවහන්සේට සෙවකම් කරන්නට ආශිංසි කියා රජදරුවන් විසින් 'සොයි සිට අවුදැ'සි විචාරන ලදිදුහු තමන් ආ නුවර තබා අතික් නුවරක්ම කියා රජ්ජුරුවන් විසින් 'යහපතැයි රදවනලදුව සෙවාකම් කරන්නාහු ඒ ඒ රජදරුවන්ට ආත්ම සමානවූහ. එසමයෙහි **ජඟඩලරට ගඞ්ගපාල** රජ්ජුරු සොහොක් ආයුධ සන්නාහ සැපයීම කරන්නාහ. සෙනෑව රැස්කරන්නාහ. ඒ රජ්ජුරුවන් සවමීපයෙහි සිටි යොධයෝ පණ්ඩිතයන් වහන්සේට "මේ රට රජ්ජුරුවෝ මෙසේවූ ප්‍රයොගයක් කෙරෙති; කුමක් බව්ත් නොදනිමි. සුදුසු සොහකුන් එවා තබය දනමැනව"යි කියා එවූහ. ඉක්බිති මහබෝසතාණන් වහන්සේ **ගිරිපොතකයන්** බණවා "සබඳ! ගොස් එක ඔලරට ගඞ්ගපාල රජ්ජුරුවෝ මෙනම් ප්‍රයොගයක් කෙරෙති; ඒ දැනගෙන දඹදිව මුළුල්ලෙහි ඇවිද ඒ ඒ රට පවත් දැනගෙන එව"යි කියා විලද කවා මිපැණි පොවා ඝනපාක සහශ්‍රපාක තෙලයෙන්ද දෙපියාහස්ස මැඩ, නැහෙණහිරි සිමැදුරු කවුළුවෙ සවමීපයෙහි සිටුවා ගිරිපොතකයන් හළසේක. ගිරිපොතකයෝද එකඔලරටට ගොස් ගඞ්ගපාල රජ්ජුරුවන්ගේ සවමීපයෙහි සිටි යොධයන් අතින් රජ්ජුරුවන්ගේ පවත්තත්වූ පරිද්දෙන් දැන දඹදිව මුළුල්ල පරික්ෂා කරන්නාහු **කම්පිල්ලරට උත්තර පඤ්චාල නුවරට** පැමිණියහ.

එසමයෙහි උත්තර පඤ්චාල නුවර **චූලනී** බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවන්ට **කෙවට්ට** නම් බමුණුතෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාහ. උභ තුමූ නුවණැත්තාහ. වියත්හ. ඒ කෙවට්ටබ්‍රාහ්මණයන්ගේ තුමූ එක්දවසක් අලුයම් වේලෙහි පිබිද සුවඳ තෙලෙහි නහනලද පහන්ද ආලොකයෙන් ගඞ්ධදම පුෂ්පදාමවලම්බිත නානා වර්ණාභරණ විචිත්‍ර විතානොපලක්ෂිත අලඞ්කෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු මහත්වූ සම්පත් දැක "මේ මාගේ යශස කවුරුන් සන්තකයෙහෝ"යි සිතන්නාහු "අනික් කෙනකුන් සන්තක නොවෙයි, චූලනී බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් සන්තකය; මෙබඳු සම්පත් දුන් රජ්ජුරුවන් සියලු දඹදිවට අගරජ කොළොත් යහපත, එසේ වුවහොත් මමත් අග්‍ර පුරොහිත වන්නෙමි" සිතා උදැසනක්සේම රජ්ජුරුවන් සවමීපයට ගොස් රැ දවස සුඛයෙන් නිදිලත් පරිදි විචාරා "දෙවයන්වහන්ස! නොට පියසුතු කථාවෙක් ඇතැ"සි කීහ. රජ්ජුරුවෝ "කියව ආචාර්‍යයෙනි!සි කීහ. "දෙවයන්වහන්ස! ඇතුළු නුවරදී රහස් කියන්නට නොපිළිවන; මහුල් උයනට යමහ"සි කීහ. රජ්ජුරුවෝ 'යහපත ආචාර්‍යයෙනි!සි කියා බමුණා හා සමඟ උයනට ගොස් සෙනෑව පිටත සිටුවා වටකොට රැකවල් ලවා බමුණාණන් හා සමඟ ඇතුළු උයනට වැද මහුල් සලවට හුන්හ. හිරු පණ්ඩිතයෝ මේ ක්‍රියාව දැක "මේ එක් කාරණයෙක් වුවමැනව, අද පණ්ඩිතයන්වහන්සේට කිසයුතු කිසිවක් අසමි"සි උයනට වැද මහුල් සල්ගස කොළ අතර සැඟවී උන්හ. රජ්ජුරුවෝ බමුණාණන්ට 'කියයුතු රහස් කියව ආචාර්‍යයෙනි!සි කීහ. "දෙවයන්වහන්ස! ඔබවහන්සේගේ තන මැතට නමාලුවමැනව; මේ මන්ත්‍රණය සතරකන්මත්‍රණයවන්නේය. එබැවින් ඔබවහන්සේගේ දෙතන හා මාගේදෙතන හා මුත් අනික් කනකට නොඇයුතු වන්නේය. ඉදින් දෙවයන්වහන්ස! මා කීවා කරනසේක් නම් සියලු දඹදිවට ඔබවහන්සේ අග්‍රරජ කොට ලමි"සි කීහ. චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද මහත්වූ රාජ්‍ය ලොභයෙන් යුකත බැවින්

බමුණාණන්ගේ බස් අසා සතුටුව "කියව ආචාර්යයෙනි! තොප කිවක් කරම්යි කිහ. "දෙවයන්වහන්ස! අපි සෙනාව රැස්කොට පළුවකොට කුඩා නුවරක් වටකොට ගනුම්හ මම කුරුබිලියෙන් ඇතුළු නුවරට වැද ඒ නුවර රජ්ජුරුවන්ට 'දෙවියෙනි! තොප හා අප හා සටන් කොට කාර්යයෙක් නැහැ, හුදක් අප නතුවව, නොපගේ රාජ්‍යය නොපටම වන්නේය, සටන් කොළොත්නම් අපගේ සෙනා වාහන මහත් හෙයින් ඒ කාර්යයෙන්ම පරදුව"යි කියම්. ඉදින් මා කී ලෙස නොකොළොත්නම් සටන්කොට අල්වා ගෙන මිරිවියා, උන්ගේ සෙනාවත් හැරගෙන අනික් නුවරකට යම්හ. ඒ නුවරත් එසේම සටන්කොට ගෙන ඉන් අනික් නුවරකැ"යි මෙම සැටියේම සියලු දඹදිව රාජ්‍යය ගෙන ජයපානය කරම්හ'යි කියා එක්සියයක් රජ දරුවන් අපගේ නුවරට ගෙනවුන් උසන්දී රු මිණ්ඩලයක් සාදා උන් හැම දෙනා 'රු බොන්නටය'යි රු මැඩිල්ලේ හිඳුවාලා විශ යොදා කරබාලදිදුවු රු අනුභවකරවා උන් හැමදෙනාම ජීවිත විනාශයට පමුණුවා ගඟ දියට දමා එක්සියයක් රජධානියෙහි රාජ්‍යය අත්පත්කොට ගනුම්හ. එසේකල්හි නුඹවහන්සේ සියලු දිඹදිවට අගරජ වනසේකැ"යි කිහ.

රජ්ජුරුවෝ "සහපත ආචාර්යයෙනි! තොප කි ලෙසම කෙරෙමි"යි කිහ. "දෙවයන්වහන්ස! මේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණය නම් වෙයි. අනික් හොතකුන් දත නොහැක්කේය. එසේහෙයින් කල් නොයවා යහපත් නකතකින් වහා නික්මුණ මැනව"යි කිහ. "රජ්ජුරුවෝ යහපතැ'යි ගිවිස්සාහ. ගිරා පොහකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණය කොට අනතුරෙහි සාල්ලෙක ලාලා පාතට බාන කෙතකුන් මෙන් හෙවටට බමුණා හිස වර්වස් පිඬක් හෙළා 'කිමෙක්දැ'යි කටදල්වා ගෙන උඩ බැලු තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්වස් පිඬක් හෙළා 'ත්‍රින්' යන අනුකරණයෙන් ගඩිමින් කොළත්තෙන් උඩ නැඟි "කේවට්ටය! නෝ තමාගේ මන්ත්‍රණය සතරකන් මන්ත්‍රණයයි සිතයිද? දැන්ම සතනකට කියේය. නැවත අට කතකට ගොස් පසුව සියදනස් කතට යන්නේය"යි කිහ. හොල! 'නිරවා ගනුව ගනුව'යි කියදීම පවනට බඳුවූ වෙගයෙන් පියාසර කොට ගෙන මියුලුනුවරට ගොස්, මනොඝධ පණ්ඩිතයන්වහන්සේගේ ප්‍රාසාදයට වන්හ.

ඒ ගිරා පණ්ඩිතයන්ගේ වනාහි මෙබඳු වහෙක් ඇත්තේය. ඉදින් කිසිතැනකින් ගෙනා අස්නක් පණ්ඩිතයන්වහන්සේට පමණක් කියයුතු විනම් උන්වහන්සේගේ දසරුවට බස්නාහ. ඉදින් අමරාදේවිනුත් ඇසුව මනා විනම් ඇතෙයෙහි ගොස් ඉදිනාහ. ඉදින් බොහෝදෙනාත් ඇසුවමනා විනම් බිමට බස්නාහ. එදවස් ගිරා පණ්ඩිතයෝ පණ්ඩිතයන්වහන්සේගේ දසරුවෙහි බැසඋන්හ. ඒ සලකුණෙන් 'රජය බිණිය යුතුය'යි බොහෝදෙනා ඉවත්වගියහ. පණ්ඩිතයන්වහන්සේ සුවපොහයන් හැරගෙන මතුමාළුතලයට නැඟී "සබඳ! තොපවිසින් කුමක් දක්නාලදද කුමක් අසනලදදැ"යි විචාළසේක. ඉක්බිති ගිරාපණ්ඩිතයෝ බොධිසත්වයන්වහන්සේට "මම දෙවෙයෙනි! සියලුදඹදිව අනික්රජ්ජුරුකෙනකුන් සවමිපයෙන් කිසිහයක්නුදුවිම්. එහතාර පඤ්චාලනුවර වූලනීබ්‍රහ්මදත්තරජ්ජුරුවන්ගේ කෙවටටනම් පුරොහිතයාණෝ

රජ්ජුරුවන් උසනට ගෙන ගොස් සතර කන් මන්ත්‍රණයක් කළහ. මම මහුල් සල් ගස කොළ අතරේ සැඟවී ඉඳ මන්ත්‍රණය අසා නිමවා ගෙන කෙවට්ට බමුණා කට වර්වස් පිඩක් එළා පියා ආම්'සි කියා සියලු තමන් දුටු දෙයත් ඇසූ දෙයත් පණ්ඩිතයන්ට දන්වූහ. උන්වහන්සේ විසින් 'රජ්ජුරුවෝ ඊවිස්සෝදූ'සි විවාළ කල්හි 'ශිවිස්නාලදය පණ්ඩිතයන්වහන්සැ'සි කීහ. පණ්ඩිතයන්වහන්සේ ගිරා පොතකයන්ට කළමනා සත්කාරකොට හෙවත් මීයෙන් ඇනූ විලඳ කවා මීපැන් පොවා බේත් තෙලින් පියාසහල මැඩ මොළොක් ඇතිරිලි අතුරනලද රන් මැදිරියෙහි සතපසා "කෙවට්ටයා මා මහෞෂධ පණ්ඩිත බව නොදනිති"සි සිතමි. දැන් ඔහු කළ මන්ත්‍රණය 'මුදුන් පැ මිණිස නොදෙමි"සි සිතා ඇතුළු නුවර හුන් දිළිඳුන් පිටත්කරවා පිටි නුවර ලැවූසේක. පිටරටින් දනවවලින් සතර වාසල නියම්ගම් සතරින් වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘඩවූ ඉසුරුමතුන් ගෙන්වා ඇතුළු නුවර වැස්වූසේක. බොහෝ ධනධාන්‍ය රැස්කරවූසේක.

මූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද කෙවට්ටයින්ගේ බස්ගෙන හස්ත්‍යශ්වාදි සෙනහ පිරිවරා ගොස් එක් කුඩා නුවරක් වටලා ගත්හ. කෙවට්ට බමුණු තමා යට කී සැටියේම කුරුඹිලියෙන් ඇතුළු නුවරට වැද කාරණා කාරණා ඒ රජ්ජුරුවන්ට කියා තමන් වසඟකොට ගෙන දෙ සෙනාව එක්කොට ගෙන අනික් නුවරක රජ්ජුරුවනැයි, මෙසේ චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙවට්ට ආචාර්‍යයන්ගේ අවවාදයෙහි සිට ඒ වෙදෙහ රජ්ජුරුවන් තබා සෙසු සියලු දඹදිව රජදරුවන් තමන් නතුකළහ. බොධිසත්වයන්වහන්සේ විසින් ඒ ඒ රජදරුවන් සම්පයෙහි සිටුවන ලද පුරුෂයෝද බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විසින් 'අදවසට මෙතෙක් නුවර ගන්නාලදැයි පණ්ඩිතයන්වහන්සේ නොපමාවන සේක්ව"සි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන්වහන්සේද ඒ ගොධයන්ට 'මම මෙහි පමාවක් නැත්තෙමි, නෙපි උකටලි නොව නොපමාව වසව්ය'සි කියා යවනසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සත්හවුරුදු සත්මස් සත් දවසකින් වෙදෙහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය තබා සෙසු දඹදිව රාජ්‍යයන් ගෙන කෙවට්ට බමුණන්ට ද ආචාර්‍යත්වයෙනි! මියුලු නුවර වෙදෙහ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගනුම්හ'සි කීහ. 'දෙවයන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයන් වසන නුවර රාජ්‍යය ගන්නට නොපොහොසතුම්හ. ඒ පණ්ඩිතයෝ වනාහි මෙබඳු නුවනැත්තාහ. ඉනාම උපාය වනතැයහ'සි මෙසේ ඒ කෙවට්ට බමුණු ආචාර්‍යයෝ විසතරකොට සඳමඩලෙහි අදනා සොනකුන් මෙන් මහබෝ සත්ත්වාණන්වහන්සේගේ ගුණ රජ්ජුරුවන්ට කීහ. ඒ ආචාර්‍යයෝ වනාහි තුමූත් උපායවත්නුමය. එසේහෙයින් "මියුලුනුවර රාජ්‍යය නම් ඉතා සුලපය, සියලු දඹදිව රාජ්‍යය අපට සැහෙයි, එක් රාජ්‍යයකින් අපට කාර්‍යය කිමදැ"සි උපායෙන් රජ්ජුරුවන් ගිවිස්සූහ. සෙසු රජදරුවෝ 'අපි මියුලුපුර රාජ්‍යය ගෙනම ජයපානය බොම්හ'සි කියන්නාහ. කෙවට්ට ආචාර්‍යයෝ උකුත් කාරණා කියා වලකා "වෙදෙහ රජුගේ රාජ්‍යය ගෙන කුමක් කරමෝද? ඒ රජ්ජුරුවෝත් අප නතුවෝමය, නවතුව"සි එක්සියයක් රජ දරුවන් උපායෙන් ගිවිස්වූහ.

ඒ රජ්ජුරුවෝ කෙවට්ට නම් බමුණාගේ බස් අසා මියුලු නුවරට යන හමන් නැවැත්තාහ. බෝසතාණන්වහන්සේට ඔබවඟන්සේගේ වරපුරුෂයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් පිරිවරා මියුලු නුවරට නික්

මූණාහුළ නැවත තමන්ගේ නුවරටම නැගී ගියහ'යි හසුන් එවූහ. බෝධි සත්වයන්වහන්සේද ඒ පුරුෂයන්ට 'මෙතැන් පටන්කොට රජ්ජුරුමන් කරන ක්‍රියාවන් දැන එවස්ව'යි කියා නැවත අසුන් යැවූසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද හෙවැටයන් හා සමඟ "විෂ මිශ්‍ර සුරාපානය අනුභව කරවා රජදරුවන් මැරීම් සඳහා ඒ කවයුත්ත දැන් කරමිහ"යි මන්ත්‍රණය කොට "අපි ජයපානය බොමිහ"යි කියා මිඟුල් උයන තද්දන් උයනයේ සරණා දහස් ගණන් ඔඩම්වල විෂ මිශ්‍ර රා පුරා තබවා අනෙක ප්‍රකාර මිසවුළු ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස්කොට තබව'යි අමාත්‍යයන්ට විධාන කළහ. එපවත්ද පණ්ඩිතයන්වහන්සේට අත්තසසර පුරුෂයෝ කියා යවූහ. ඔව්හු වනාහි විෂ යොදා රජදරුවන් මරන්ට කැමැති නියාව නොදනිති මහාසත්ත්ව බෝධිසත්වයන්වහන්සේ වනාහි ශිරාපොහොසතයන් අතින් ඇසූ බැවින් දන්නා සේක. එසේහෙයින් උන්වහන්සේගේ අත්තසසරයන්ට 'ජයපානය බොන දවස් කියම්හොට කියා එවව්ය'යි නැවත අසුන් යවූසේක. ඒ යොධයෝ වැදැළ ලෙසම් දවස් නියම්හොට යවූහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ "මා බදු පණ්ඩිත සොහොකුන් ජීවත්ව හින්දදිමි මෙතෙක් රජදරුවන් මියයාම යුතුනොවන්නේය; උන්ට මා පිටි වහල්වුව මැනව"යි සිතා තමන්වහන්සේ හා එකදවස උපන් යොධයන් දහස බණවා සබඳිනි! චුලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරහවා එක්සියයක් රජදරුවන් පිරිවරා සුරාපානය අනුභවකරනු කැමැත්තෝල: තෙපී ඔබ ගොස් රජදරුවන්ට අසුන් පණවාලව්. හැල කිසිසොහොකුන් නොහිඳිනාතුරුම් චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හිඳිනට පැනවූ අස්හට ඉක්බිති පැනවූ මාහැඟි අස්නක් අපගේ රජ්ජුරුවන්ටය"යි ගෙන ඒ රජ්ජුරුවන්ගේ සෙනාව විසින් 'තෙපි කවුරුන්ගේ සෙනාවදැ"යි කියල 'වෙදෙහ රජ්ජුරුවන්ගේ සෙනාව වම්හ'යි කියව. කුමක්ද? අපි සත්හවුරුදු සත්මස් සත්දවසක් මුළුල්ලෙහි දඹදිව රාජ්‍යය ගන්නමෝ එක්දවස කුත් වෙදෙහ රජ්ජුරුසොහොකුන් නුදුටුම්හ; වෙදෙහ රජ්ජුරුවෝ නම් කවුරුදැ? යව උන්ට වුවමනාවිනම් කෙළවර අස්නක් ගනුව'යි තොප හා සමඟ කළහ කරන්නාහ. තෙපි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් විනා අපගේ රජ්ජුරුවන්ට වැඩිහැම් සොහොකුත් නැතැ'යි කලහ වඩාගෙන 'අපගේ රජ්ජුරුවන්ට හස්නක් පමණකුත් නොලබන්නවෝ දැන් තොපට රාත්තිය නොදෙම්හ, මස් අවුළු ආදියත් කෑ නොදෙම්හ'යි වාසි බෙණෙම්න්, සිංහනාද ඇසූ මුවපොල්ලන් පරිද්දෙන් තොපගේ අහිත ශබ්දයෙන්ම උන් භයගන්වා, යමුගුරු බාලා සියලු රා මස් පිරූ සැලවල් බිඳ තූ තූ කොටපියා වහා රා මස් අවුළු විසුරුවා නොකෑ හැකි පරිද්දෙන් කොට දිවීමෙන් ගොස් සෙනා මධ්‍යයට වැද ශක්‍රපුරයට වන් අසුර හටයන් පරිද්දෙන් මහත් අරගල කොට අපි ඉසුලනුවර මහෞෂධ පණ්ඩිතයන්ගේ යොධයම්හ, පිළිවන්නම් අප අල්වා ගනුව"යි තොප ගිය බව අහවා එව"යි කියා යොධයන් දහස බණවා යවූසෙක. ඒ යොධයෝත් බෝධිසත්වයන්වහන්සේ වැදැළ බස මුදුනෙන් පිළිගෙන වැද සම්මුගෙන දුනු මුගුරු අඹයට පත්කොහොල් පාරිච්ඡත්තයයි යන උසඹාසුධ සන්නඬව උදුරු පසල් දනව්වට ගොස් තදුන් උයන මේන් සරහනලද උයනට වැද, නිහතලද දළපුඩු සේසත් ඇති එක්සියයක් රාජාසන ආදිවූ පිළියෙළකොට හබනලද ශ්‍රීභූතීන් දැක මහබෝසතාණන්වහන්සේ විසින් වදුරනලද ක්‍රමයෙන් සියල්ල කොට සෙනාව මධ්‍යයට වැද බොහෝ දෙනා කෑහෑ කොට තමන්ගේ මියුලුදුවරු බලා ගියහ. රාජපුරුෂයෝද එදවස් ඔවුන්ගේ රජදරුවන්ට දැන්වූහ.

චූළනී රජද "එක්සියයක් රජදරුවන් මරණ විණිස ඇඹියලා ඉදිතරන ලද මේඛදූ සුරාපානයට මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධාකෙළේය"යි කිපුණාහ. එක්සියයක් රජදරුවෝ 'අපට ජයපානය බිනහ හුදන්නයි කිපුණාහ. සෙනාවද 'අපි නොමිළයේ බොන සුරාපානය නොලද්දමිනැ'යි කිපුණාහ. ඉතින් දත්ත රජ්ජුරුවෝද, එක්සියයක් රජදරුවන් බණවා "එව පින්වත්නි! මියුලු නුවර ගොස් වෙදෙහ රජ්ජුරුවන්ගේ ඉස කඩුවෙන් කපා පියා හාල්පැල් පලක් මඩනාසේ දෙපසින් මැඩගෙන හිඳ ජයපානය බොමිහ; සෙනාව ගම නට සැරහිගෙන එන පරිද්දෙන් පිධාන කරව"යි කියා නැවත රහසිගතව නෙවට්ටයන්ටද එපවත් කියා 'අපගේ මේඛදූ මින්ත්‍රණයකට බාධාකළ වූ පස මිතුරු ගනුම්හ, එක්සියයක් රජදරුවන් හා අටලොස් අක්ෂෞහිණියක් පමණ සෙනාව පිරිවරා ඒ මියුලු නුවරට යම්හ: අප හා සැරිව් එව ආචාර්යයිනි!යි කිහ. බමුණාණෝ තමන් නුවණැති හෙයින් වෙදෙහරජ්ජුරුවන් "මහෞෂධ පණ්ඩිතයන්ද නිසා ගන්නට නොපිළිවන. යියොත් අපටම මහා ලජ්ජාවන් නිය; කාරණා කියා රජ්ජුරුවන් නවතමියි සිතා රජ්ජුරුවන්ට "දෙවියෙනි! මේ වෙදෙහ රජුගේ බලයෙක් නොවෙයි, මහෞෂධ පණ්ඩිතයන්ගේ පිධාන යය, ඌ තුමූ මහානුභාව ඇත්තාහ. ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නා ලද මිපිලා නම් රාජධානිය සිංහයෙකු විසින් රක්නාලද රත්ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසිකොනකුන් විසින් ගන්නට නොහැක්කේය; ගියොත් හුදක් අපටම ලජ්ජාවන්නිය; ඔබ ගමන 'නොකමැත්තෙමි"යි මෙසේ කිහ. රජ්ජුරුවෝ වනාහි රාජමානයෙන්ද ඉසුරු මදයෙන්ද මත්ව, දණ්ඩකින් පහළ සිඳිරාජයකුසේ, කොපයෙන් දිලිහි 'ඒ මහෞෂධයා කුමක් කරන්නේද'යි කියා එසේම අභිමාන පුරස්සරවූ එක්සියයක් රජදරුවන් පිරිවරා වෙරම්බ වාතයෙන් හැලලී ගිය මහා සාගරයසේ කොප නමැති වාහනයන් ඇලලිගිය අටලොස් අක්ෂෞහිණියක් සෙවනාවෙන් යුක්තව නික්මුණාහ. කෙවට්ටයෝද තමන්ගේ බස් රජ්ජුරුවන් සිතට නංවාගතනොහී 'රජ්ජුරුවන්ට පවහැණි විම්තම් යුතුනොවේව'යි සිතා රජ්ජුරුවන් හා සමග නික්මුණාහ.

බොධිසත්ත්වයන් වහන්සේ විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ ජයපානය විධ්වංසනය කරන්නට එවනලද්දාවූ දහසක් යොධයෝ තමන් ආ කටයුතු සම්පාදනයසොට එකදවසින්ම රාත්‍රිය මුළුල්ලෙහි ගොස් මියුලුනුවරද පැමිණ තමන් කළ කටයුතු පණ්ඩිතයන් වහන්සේට දන්වූහ. පළමු ඒ ඒ රජදරුවන් සමීපයට යවතලද්දාවූ චරපුරුෂයෝද පණ්ඩිතයන් වහන්සේට චූළනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ "වෙදෙහ රජ්ජුරුවන් ගනුම්හ"යි එක්සියයක් රජුන් පිරිවරා එන්නාහ. "පණ්ඩිතයන් වහන්ස! පමා නොවන සේක්ව"යි හසුන් එවූහ. "අද අසවල් තැන ලැගුම්ගන්නාහ, අද අසවල් තැන ලැගුම්ගත් නාහ. අද වනාහි නුවරට එන්නාහ'යි පණ්ඩිතයන් වහන්සේට නිරන්තර යෙන් හසුන් එවන්නාහ. ඒ අසා මහාබෝසතාණන් වහන්සේ වඩාවඩාලාම කලමනා විධානයෙහි නොපමාවූසේක. වෙදෙහ රජ්ජුරුවෝ වනාහි 'චූළනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මේ නුවර ගන්නට එන්ල'යි පරම්පරා ශබ්දයෙන් අසූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පෙර සඤ්ඤායෙහිම ගන්නා ලද්දවූ ලක්ෂණයන් දඩුවැට පහන් ආලොකයෙන් හොස් සියලු සත්‍යොදුන් මියුලු නුවර පිරිවරාගත්හ. කෙසේ වටකොළෝදයත්? පළමුකොට පොළෝ අගල වටා රන් සත්‍යාඝ ලන ලද්දවූ රන්සත් රන්පොරොදු ආදි හස්ත්‍යාලඞ්කාර යෙන් සරඝන ලද්දවූ සොඬින් නන්නාලද මුතුරු ඇති ලොහ ප්‍රකාරවූවිනමුත් පිටින් ඇන සුණුවිසුණු කරන්නට සමර්ථ ශක්ති ඇති, දෙකපොළය හා සොඬය යන තුන්තැනින් වැහෙන්නාවූ එක් මදයකින්ද, යථොක්ත සථාන තුන හා දෙකන්සිදුරු දෙඇස් සිදුරුයයි යන සප්තසථානයෙන් වැහෙන්නාවූ එක් මදයකින්ද එම සප්ත සථානය හා දෙනොසාප්‍රවය ගුදමාගීය යන දශ සථානයෙන් වැහෙන්නාවූ එක්මදයකින්දැයි මෙසේ ගිලිහෙන තුන්මදයකින් යුක්තවූ සඞ්ගාමරණයෙන් ඊහුම්බා ජයඅකුසු හා තොමරාදි ආයුධගත් අත්ඇතිව පිට හිඳිනා ඇතරුවන් විසින් ගැවසිගත් ඒ ඒ රජ්ජුරුවන්ගේ කොප නමැති ගින්නෙන් නැති දුම්නදක්සේ, උස්වූ කන්තලින් කන්තල ගසා සිටුවනලද්දවූ ඇත්වළල්ලකින්ද, යුඛයට ලනලද්දවූ සන්නාහ ඇති අශ්වාලඞ්කාරයෙන් සරහනලද සිඟු කාමෝඛ්‍ය සොණකාදි උත්තමදෙශයෙහි උපන්නාවූ නානා හරණ ප්‍රතිමණ්ඩිතව සන්නාහ සන්නඛව පිට හිඳිනා අසරුවන් විසින් ගැවසී ගත් 'සතුරු හසුකොට ගනිමි'සි ඔදවැඩියාවූ රජ්ජුරුවන්ගේ සිත් නමැති ආකාශ ගඞ්ගායෙහි බිදිබිදී දිවන්නාවූ රළපතරසේ, යුඛයට පිඹිනාලද් කාහල ශබ්දයෙන් සතුටුව පැන පැන සිටින්නාවූ ග්‍රීවයෙන් ග්‍රීවය ගසා සිටුවනලද්දවූ අස් වළල්ලකින්ද, සිංහ ව්‍යාඝ්‍ර ආදි සම් අතුරනලද්දවූ රථාලඞ්කාරයෙන් සරහා නන්නලද නානාවණ් ධ්වජ පඞ්ක්ති ඇති, සෛඛ්වයන් සොදනලද සර්‍වාලඞ්කාරයෙන් සැරසි පිට බඳනාලද ගියවුරු ඇති, නැහෙනලද ධනුර්ධර යන් විසින් උපලක්ෂිතවූ සෙනා නමැති සමුද්‍රයෙන් නැංගාවූ තල්මස් කැලසේ, රියසකින් රියසක ගසා සිටුවනලද රථ වළල්ලකින්ද, "සිඛාවී කුමාරයන් සමනිස් පැරැම්පුරා මුළුකොටගෙන, බොධිද්‍රැමයක් පිටිවහල් ලදින් සත්තිස් බොධිපාක්ෂික ධර්මසඞ්ඛ්‍යාත යොධයන් බලකොටගෙන විදුරසුන් අරා බුදුවන් නම් උන් වේලෙහි ජයගැන්ම පිළිවන් හෝ වේවයි නොපිළිවන් හෝ වේවයි දුරතබාම්, අන්‍යතර ජාතියෙක අන්‍යතර යුඛයක්කොට බැලුවමැනව"සි සිතා, චූලනී රාජ්‍යාභිජයෙන් ආ වශවර්ත්ති මාරයාගේ සිංහ මුඛ හස්ති මුඛ අශ්ව මුඛ ව්‍යාඝ්‍ර මුඛාදිවූ භයඞ්කරවූ මුඛ මවා අසි සත්ති තොමර භෙණ්ඩිවාල කරවාලා දිවූ දීප්තිමත් නානාවිධ අවි ගනිමින්, අනෙකප්‍රකාර විකාර වෙශයෙන් ආ දසඛිම්බරක් මාරසෙනාවසේ භයඞ්කරවූ සෙනායෙහි බාහුවෙන් බාහුව ගසා සිටුවන ලද්දවූ යොධ වළල්ලකින්දැයි; මෙසේ සතරවළල්ලකින් ඒ සත් යොදුන් මියුලුනුවර වටලවා ඒ ඒ සථානයෙහි බළඇණි සිටුවූහ.

මනුෂ්‍යයෝ ඔල්වරහඬ දෙන්නාහු අත්පොළසන් දෙන්නාහු පහන් නාහු 'වටලාගතුම්හ' යන සමාධියෙන් නටමින් ගජිනාකරමින් සිටගත්හ. අටළොස් අක්ෂොභිණියක් පමණ සෙනායෙහි නහනලද මිණිදඹු වැටෙහි ලක්ෂගණන් පහන් ආලොකයෙන්ද එක්සියයක් රජදරුවන් හා හස්ත්‍යශ්වාදි සෙනාව පළන් ආභරණයෙහි ආලොකයෙන්ද සියලු සත්‍යොදුන් මියුලු නුවර ඒ මහෞෂධ පණ්ඩිතයන්ගේ ප්‍රඥ නමැති සූර්‍යයා පහළව සත්‍යයන්ගේ මොහාන්ධකාර විගමනයෙන් හෙළිවූ කලක් පරිද්දෙන් ආලොකවිය. ඇතුන්ගේ කුසඬනාදයෙන්ද අසුන්ගේ හෙසාරවයෙන්ද, රථයෙහි චක්‍රනාද

යෙන්ද පාඛළ සෙනහෙනි ගජිනාවෙන්ද, සක්සින්නම් හර තහතිරිපට ගැටි පවන මහ බෙර පනා බෙර රන් සක් රිදී සක් ආදිවූ පංචාඞ්ගික තූර්‍යනාද යෙන්ද, සපොළොව පැළියන පරිද්දෙන් වූයේය. සෙනකාදිවූ පණ්ඩිතවරු සතරදෙන මහත්වූ තොලාහල ශබ්දය අසා කුමන අරගලයක්ඛවත් නොදන්නාහු, වෙදෙහ රජ්ජුරුවන් සමීපයට ගොස් "දෙව්යෙනි! මහත්වූ තොලාහල ශබ්දයෙහා, අපි කුමක් බවත් නොදනුම්හ, 'කුමන අරගලයක්දැ'යි විමසුව හොත් යහපතැ"යි කිහ. එබස් අසා රජ්ජුරුවෝ 'යළි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආවාහුදෝ'යි සිතුදුරු කවුළුව හරවා පිටත බලන්නාහු උන් ආ බැව් දැන භයින් ත්‍රස්තව ඉතිකින් අපගේ දිවි නැත, බ්‍රහ්මදත්තයාහෙමේ දැන් දැන් අප හැම මරන්නේය"යි සෙනාකාදීන් හා සමඟ කථාකරමින් හුන්න.

මහබෝසතාණන් වහන්සේ වනාහි චූලනී රජ්ජුරුවන් ආඛ්‍යව දැන, සිංහයකුමෙන් කියිහයක් නැතිව දුවර මුළුල්ලෙහි රුකවල් සකස්කොට ලවා "රාජාදිහු භයින් දිලිගිලා ඉඳිනි; මා උන් අස්වසාලුව මැනව"යි මතුමාලයට නැණී රජ්ජුරුවන් වැද එකත්පස්ව සිටියේක. රජ්ජුරුවෝ මහබෝසතාණන් වහන්සේ දැක ලබනලද අස්වස් ඇතිව 'මපුතණුවන් මහෞෂධ පණ්ඩිතයන් විනා අනික් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙනෙක් නම් නැතැ'යි සිතා, පණ්ඩිතයන් වහන්සේ හා සමඟ කථාකරන්නාහු මහෞෂධ පණ්ඩිතයෙනි! පඤ්චාලදෙශ වාසීවූ බ්‍රහ්මදත්ත රජතෙමේ එක්සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සෙනාවහා සමඟ ආයේය. පඤ්චාල රාජධානි සන්තකවූ මේ සෙනා තොමෝ 'මෙතෙනැ'යි පමණ නැත්තිය. ඉහා මහත් වාරට්ටාලාදිවූ නොයෙක් කම්මන්තයට පිවින් ගෙනඑන්නාවූ දුව පත්‍ර සංහාලියම් වෙටම් ලැලිආදිවූ දරුසම්භාරයන්ගෙන ඇවිදිනාවූ වඩුසෙනහින්යුක්තවූ සියලු සඬ්ග්‍රාමයෙහි දක්ෂවූ ඇතුන් අසුන් ආදිවූ බළ සෙනහ ඇත්තිය. ගහණ බැවින් තමා අතරට වන්නවුන් නොපෙනෙන පරිද්දෙන් පස ඛ්මිගැවිය නොදී උරපිටින් ගෙන යන්නිය. හස්ති ශබ්දය, අශ්ව ශබ්දය, රථශබ්දය, වීණා ශබ්දය, මෘදඞ්ග ශබ්දය, ගීත භබ්දය, තාල ශබ්දය, 'විදුව ගනුව අනුව'යි මෙසේ දශවිධ ශබ්දයෙන් යුක්තවූය. ඇතුන් ආදිවූ සියුරහ සෙනහෙහි පවත්නා නාදය මූදුපරගානෘසේ පවත්නා හෙයින් මූඛ එව, ඔඛ යව, ඝුඛ කරව. පමානොවව යනාදිවූ ඒ ඒ කටයුත්තෙහි නියොග වචන ඛාග්හෙද ඉයන් දක්වන්නට නොපිළිවන් හෙයින් මෘදඞ්ග මද්දලාදිවූ නානාප්‍රකාර හෙරිශබ්දයෙන් හා ශඞ්ඛ කාහළ ශබ්දයෙන් හඟවන්නාවූ ඒ ඒ කටයුතු ඇත්තිය. සත්රුවනින් විසිතුරුවූ සන්නාහයෙන් හා සවණ්ණජාල ඝණ්ඨිකුණ්ඩල විශෙෂයෙන්ද රුජ රුජ මහාමාත්‍යාදීන් පළඳනාලද්දාවූ කනක කටක රූන නුපුර නාඛඛකවලය තිසරපට අවුල්හර උදරබන්ධන ගැටතිමුල්හර පස්රූ පස් වළලු පේරුස් එක්වැටි පාමුදු පාඛගන් පාඨලඞ්ඝ පාදජාලා පාදත්‍ර පාදාභරණා දිවූ ශරීරාභරණගෙන්ද නොබනිය. කනක රජතාදින් විචිත්‍රවූ රුකනතිලාදිවූ නානා වස්ත්‍රයෙන් සවුජවලිත රථාදියෙහි නඟනලද නානාප්‍රකාර ධවලච්ඡත්‍ර පඞ්ක්තියෙන් ගැවසීගත්තිය. ඇත්වාහන අස්වාහනරථ වහනයෙන්යුක්තය. හස්ති ශිල්පය, අශ්ව ශිල්පය, රථ ශිල්පය, ධනුශ්ශිල්පය, ආදිවූ අටළොස් මහා ශිල්පයෙහි කෙළ පැමිණියන් විසින් විශෙෂයෙන් සමඟය. මේ සෙනා තොමෝ සිංහ සමාන වික්‍රම ඇත්තිය. සූර යොධයන් විසින් සුප්‍රතිෂ්ඨිතය. මේ සෙනායෙහි පොළොව හා සාමන්ත නුවණ ඇති රහස් මන්ත්‍රණ කරන

සුලුවූ, හෙවත් දෙදවසක් තනිව හිඳ සිතුවහොත් මහපොළොව පෙරලන්නටද අහස හා පොළොව ගැටලන්නටද පොහොසත්වූ පණ්ඩිතවරු දසදෙනෙක් ඇත්තාහ. ඒ පණ්ඩිතවරුන්ට වඩා අධිකවූ ප්‍රඥ ඇති රජ්ජුරුවන්ගේ මැනියෝ **නලනා**දෙවි පණ්ඩිතවරුන් දසදෙනාට එකොළොස්වැනිව හිඳ එලනි රජ්ජුරුවන්ගේ දසනාථ අනුශාසනා කරන්නාහුය.

එලිදු ඒ **නලනා** දෙවින්ගේ ප්‍රඥාව කෙසේද යත්හොත්?— එක්දවස් මිනිසෙක් සාල් නැළියක්ද පලාඹක් මුලක්ද මසුරන් දහසක්ද හැරගෙන ගඟින් එතර යමි්සි ගඟ මැදට හොස්, දිය සැඩ හෙයින් එතරව ගත නොහී එහර සිටි මිනිසන්ට 'පින්වතුනි! මා අත සාල් නැළියක් හා ඹත් මුලක්ද මසුරන් දහසෙක්ද අහ, මෙකී තුනින් මට යමක් රැවිච්චනම් ඒ දේමි, තොප ඇමදෙනා කෙරෙන් 'යම් කෙනෙක් මා එතරකළ හෙයි නම් උඹ මා එතර කරේව'යි මෙසේ කිය. ඉක්බිති ශක්තිමත් සම්පන්න පුරුෂයෙක් කඩිය තරකොට හැඳගෙන ගඟට බැස ඒ පුරුෂයා අත අල්වාගෙන එතර කොට 'මට දියයුතු දෙය දෙව'යි කිය ඒ තෙමේ 'සාල් නැළිය හෝ ඹත්මුල හෝ ගනුව'යි කියේය. ඒ අසා දියෙන් එතරකළ පුරුෂයා, "මම මාගේ ජීවිතය නොසලකා තොප එතර කෙළෙමි, මට සාල් නැළිය හා ඹත්මුලින් ප්‍රයෝජන නැත, මසු දහස දෙව'යි කිය. ඒ අසමින් යමක් මට රැවිච්චනම් ඒ දෙන්නෙමි කියෙමි, දැන් මට යමක් රැවිච්චනම් ඒ දෙමි, 'කැමැතහොත් ගනුවයි කිය. ඒ තෙමේ සමීපයෙහි සිටි එකෙකුට එවත් කිය. එයින් 'යමක් තමන්ට රැවිච්චනම් ඒ තොපට දෙමි කියාවේද උන් කියේ: උන් දෙනු කැමැති දෙයක්' හැරගනුවයි කියේය. ඒ පුරුෂයා උන් කී බසත් නොසිට 'එසේ මා ගන්නේ නැතැ'යි ඔහු ඇරගෙන අධිකරණ නායකයන්ට සවරූප කිය. අධිකරණයේ ඇත්තෝද දෙන්නාගේ බස් අසා 'උන් දැන් දෙයක් ගනුව'යි එලෙසම කිහ. ඒ පුරුෂයා අධිකරණ නායකයන්ගේ යුකති යෙහි නොසිට රජ්ජුරුවන්ට දැන්වීය. රජ්ජුරුවෝ අධිකරණ නායකයන් ගෙට හෙන්වාගෙන උන් මැදයේ දෙන්නාගේ බස් අසා එලෙසම කියා යුකතිය පසිඳිනාසේ නොදන්නාහු තමාගේ ජීවිතයෙහි ආසාවක් නැතිව ගඟ බට නැනැත්තවුම් පැරදවූහ. එවේලෙහි රජ්ජුරුවන්ගේ මැනියෝ තලතාදෙවී තුමූ එතැනට තුදුරු තැනක හුන්නාහු රජ්ජුරුවන් යුකතිය නපුරුකොට පසුන්බව දැන 'පුත! යුකතිය නපුරුකොට පසුන්බව දැන 'පුත! යුකතිය සලකාපියා කියව'යි කිහ. මැනියන්වහන්ස! මා දන්නේ මෙපමණක්මය; ඉදින් තුඹවහන්සේ අඹුත්තක් දන්නාසේක් නම් පසිඳුව මැනව"යි කිහ. තලතාදෙවී 'යහපත යුකතිය පසිඳිමියි කියා ඒ දියෙන් යන්නට සිටි පුරුෂයා බණවා 'මෙසේ එව දරුව! තොප අත ඩුබූ සාල් නැළියත් ඹත් මුලත් මසු දහසත් තුනම පිළිවෙළින් බිම තබා ලව'යි කියා පිළිවෙළින්ම තබවා 'තෝ දියෙන් යන්නෙහි මුට කුමක් කියෙහිදැ'යි විචාරා 'මෙලෙස කිමි' කී කල්හි, 'එසේවීනම් තව රැවියක් හැරගෙන යව'යි කිහ. ඒ හෙමි මසු දහස අතට ගත. ඉක්බිති මඳතැනක් 'ගියකල බිසව් උඹ ගෙන්වා "දරුව! මසු දහස තොපට අභිප්‍රාශදැ'යි විචාරා එසේය කැමැත්තෙමි'යි කී කල "දරුව! තොප විසින් මින් මට යමක් රැවිවීනම් ඒ දෙමි මෝහට කියනලදද? නොකියන ලදදැ"යි අසා 'කියනලදැ'යි දෙවින්වහන්ස! කී කල එසේ වීනම් මේ මසු දහස මෝහට දෙවයි කිය.

ඒ තෙමේ හඬමින් වලපමින් මපු දැස ඕනට දුන්නේය. එවේලෙහි රජ්ජුරු වෝද අමාත්‍යයෝද සතුටුව සාධුකාර දුන්හ. එතැන් සටන් තලතාදෙවින්ගේ නුවණ දඔදිව මුළුල්ලෙහි පතළවිය. (මේ නිසාය චූලනී රජ්ජුරුවන්ගේ මැනියෝ තලතාදෙවී එකොළොස්වනුව සෙනාවට අනුශාසනා කෙරෙනී'යි කියේ.)

නැවත ඒ සෙනායෙහි පඤ්චාල රාජ්‍යයෙහි අනූනවූ පරිවාර සම්පත් ඇති බ්‍රහ්මදත්තයා මිසින් හැරගත් රටවල් අයිති මිරණ හසින් තැතිගත් එක්සියයක් රජදරුවෝ මේ චූලනී රාජයා සමඟ සෙති. අටළොස් අක්ෂෝහිණියක් සෙනාවෙන් මේ මිථිලා නම් රාජධානිය වටලා; පළමුව ඇත් පවුරෙක, දෙවැනිව අස් පවුරෙක, තුන්වැනිව රථ පවුරෙක, සතරවැනිව යෝධ පවුරෙකැයි මෙසේ සතර වළල්ලක් හා අස්වළල්ලව අතරෙහි එක් වීථියෙක, අස් වළල්ලට හා රථ වළල්ලට අතරෙහි එක් වීථියෙක, රථ වළල්ලට හා බළ වළල්ලට අතරෙහි එක් වීථියෙක, මෙසේ තුන්සැකියකින් වටකරනලද වෙදෙහ රටවාසීන්ගේ මිථිලා නම් රාජධානිය හාත්පසින් නැණ උඩ නහන කලක් පරිද්දෙන් පවුරු පදනම් බඳ දුන් දුන් සුණුවිසුණු කරනු ලැබෙයි, මහෞෂධ පණ්ඩිතයෙනි! හාත්පසින් යම්බදු සෙනාවක් පිරිවරනලදද, ඒ සෙනාවට මත්තෙහි පෙනෙන නොදෙයක් සියදහස් ගණන් මිණිදඬුවැට පහන් කරණකොටගෙන තරු වැලෙයන් ගහනවූ ආකාශය වැන්න. පණ්ඩිතයෙනි! අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා තොප හා සමාන නුවණැති කෙනෙක් නම් නැත. නුවණ නම් මෙසේවූ තැනට වේද, එහෙයින් තෙපිම දනුව මේ මහා සෙනාවෙන් අප ගැලවීමෙක් කෙසේ වේදැ"යි කීහ.

මෙසේ රජ්ජුරුවන් මරණ හසින් යුක්තව කියන්නාවූ බස් අසා මහ බෝසතාණන් වහන්සේ "මේ රජ්ජුරුවෝ මුතා මරණ හසින් භයපත්ව කියති. රෝගයෙන් පෙළෙන එකාගට අවසථා පිළියමක් දන්නා වෙදකුමුත් අනිකෙක් පිළිසරණ නොවන්නාසේද, සාදුකින් පෙළෙන එකකුට හොජනය මුත් අනිකක් පිළිසරණ නොවන්නාසේද, පිපාසා ඇති එකකුට පැන්පෝවා, මුත් ඒ පිපාසය නොසන්සිඳෙන්නාසේද, මේ රජ්ජුරුවන්ට මා මුඛ් අනික් පිළිසරණෙක් නැතැ"යි රජ්ජුරුවන් අස්වසාලම් සිතුසේක. ඉක්බිති රජ්ජුරු චන්ද මහබෝසතාණන්වහන්සේ සැට යොදුන් රත්ගල්තලා මස්තකයෙහි නාදකරන සිංහරාජයකු මෙන් "නොබව මැනව දෙවයන්වහන්ස! රාජ්‍යසුව අනුභවකළ මැනව. මම කැටක් ගෙන කපුටු රැළක් පලවන එකක්හු මෙන්ද, දුන්නක් අල්වාගෙන වඳුරු මුළක් පලවන එකකු පරිද්දෙන්ද, මේ අටළොස් අක්ෂෝහිණියක් පමණ සෙනාව බඹබන්කඩ පමණකටත් අසාමිකකාරවා නිගණ්ඨ සෙනාවක් පරිද්දෙක් ඉස්සු ලූ අතඳුනුබදවා පියම්; එය මට භාරය, 'සටනෙකැ'යි සිතක් නොතබා භය නොගෙන සුවසේ රාජ්‍යශ්‍රී අනුභව කළමැනව"යි කීසේක. මෙසේ කියා රජ්ජුරුවන් අස්වසාලා මාලිගාවෙන් බැස නුවර බෙරලවා හැමදෙනාට වදුරන්නෙක් "පින්වත්නි! තෙපි හැම 'සතුරෝ වටලාගත්තෝවේදැයි නොසිතා මල්ඟඳවිලවුන් හා අට ලොස් වගීයේ කාවුම් හා රු මස් ආදි නොයෙක් අන්නපාන සපයා වසන්නාහ රණයෙන් සැරහි උත්සවයට පවන් ගනුව, සමඟර කෙනෙක් තොප තොපට

සුදුසු පරිද්දෙන් බොව්තම් මහාපානයත් බොව, බෙර ගසව, ගී කියව, එළසින් ඔල්වර සත් අසුරු සත් දෙව, සියල්ලක් නැති නෙතකුන්ට මාගෙන් දෙමි, මහෞෂධ පණ්ඩිතයෝ නම් මමය, කිසි භයක් නොකරව, මාගේ ආනුභාව බලව"යි කියා අස්වසා වැළැළෙවා. ඒ බසින් නුවර වාසීහු සත්අවුරුද්දේදී පටන් ඔබගේ බල තමන් ඇමි ඉදුරා දන්නා හෙයින් කිසි භයක් නැතිව ශඝ්කාරහිතව නැටුම් ආදී සියල්ලෙන්ම මහාගණන් වදාළ පරිද්දෙන් උත්සවයට පටන්ගත්හ නුවර ඇතුළෙහි ගී කියන වයන අරහල පිටත සිටි සතුරෝ අසත්නාහ. සතුරන්ගෙන් බොහෝදෙන කුරුබිලියෙන් අතුළු නුවරට වදනාහ. සතුරුව ආ බිටෙක මුත් දුටු දුටුවන් නොඅල්වන් නාහ, එසේහෙයින් සතුරන්ගේ සංචාරය නොසිදෙන්නේය; නුවරට වන් වින් මනුෂ්‍යයෝ උත්සව කෙළනාත් ජය පානය බොන්නාත් ජය කොලාහලයත් දක්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් ඇතුළු නුවර කොලාහල අසා සමීපයෙහි සිටියවුන්ට කියන්නාහු "ඉන්වන්නි! අටළොස් අක්ඛෞහිණියක් පමණ මේ සෙනාව ගෙනවුත් තමන්ගේ නුවර වටලාගත් නියාවට කිසි භයක්වත් තැතිගැන්මක්වත් නැත්තේය; සතෙකුගේ යුකතව පස් වණක් ධ්‍රුතින් පිනා ගියවුන්සේ අත්පොළසන් දෙන්නාහ, එළසන් දෙන්නාහ, ගී කියන්නාහ, බෙරගසන්නාහ, කොල! කුමන ආශ්චර්‍යයෙක්ද"යි කිහ.

එසේ කී රජහට වරපුරුෂයෙක් බොරුවක් ගොතා ගෙන කියන්නේ 'දෙවයන්වහන්ස! මම කිසි කටයුත්තක් නිසා කුරුබිලියෙන් ඇතුළුනුවරට වන්නෙමි සැනසෙළි හෙළනා ජනයන් දැක පින්වත්නි! සියලු දඹදිව රජ දරුවන් සෙනා සහිතව අවුත් තොපගේ නුවර වටලාගෙන සිටියදී, තොප හැම මෙසේ ප්‍රමාදව වසන්නට කාරණා කිම්දැ"යි විවාළෙමි. ඔහු මට කියන්නාහු 'අපගේ රජ්ජුරුවන් කුමාර කාල මෙසේවූ දෙළෙක් විය; හෙයේ දැන්? දසදහසක් යොදුන් දඹදිව රජුන් මුළුල්ලෙ සෙනාව පිරිවරා අවුත් මා උන් නුවර පිරිවරා සිටිකල සැනසෙළි හෙළිම් සි දෙළෙක් උපන. ඒ දෙළ දැන් මුදුන් පැමිණියේය. එබැවින්, සත්දවසක් සැනසෙළි හෙළුව'යි නුවර බේරලවා තමන් වහන්සේගේ මාලිගාවේ මතු මහලේ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා හිඳ මහා සතෙකුගකින් මත්ව ජයපානය බොනසේක් මේ රජ්ජුරුවන් හා සෙනාව ආ නියාව ඔබ තමා දන්නාසේක්දැ"යි කිහ. මම එබස් අසා 'රජකු බොළඳ නියාය'යි නිතුහොළෙමි කිය. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩන් ගෙනලද ආශිවිෂයක්හු මෙන් ක්‍රොධයෙන් දිලිනි කිපුණාහු 'කොල! වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු දෙරටු අටලු වාසල් බලකොටු ආදිය බිඳ සුණු විසුණු කරමින් විහා නුවරට වැද ගැල් පුරා ගෙනවුන් හොවිඩ්ඩ බාහාසේ මහජනයන් ඉස් සූපාගෙන, වෙදෙහරජහු ඉසත් වහ ගෙනෙව"යි කිහ.

එබස් අසා බලසම්පන්න යෝධයෝ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව 'නුවර ගනුම්හ,යි පවුරු වාසල් සමීපයට ගියාහු, බොධිසත්ත්වයන්වහන්සේගේ යොධියන් විසින් දමනලද කලල් වැලි ආදියෙන් මහාවිනාශයට පැමිණ නුවර බිඳිනා තබා, පවුර සමීපයත් යා නොහී නැවත යන්නාහ. ඉන් සමහර කෙනෙක් නොහැවත 'පවුර බිඳුම්හ'යි වාසි කියා සාහසිකව

ගොස් අගල බටුනම් අන්තරවාලවල සිටියෝ ඊ දඩුවුණ කොහොල් නොමර හෙණ්ඩිවාලාදීන් දවා මහා විනාශයට පමුණුවන්නාහ. බොධිසත්ත්වයන්වහන්සේනේ යොධයෝ බ්‍රහ්මදත්තයන්ගේ යොධයන්ට අතින් මුහුණින් උසුළු විසුළු පෑ නොයෙක් ප්‍රකාරයෙන් ආක්‍රොශ පරිභව බෙණෙමින් හැඟැට කරන්නාහ. මවිජ මාංශ හා කන බොන දෑ හා රිත් ඔවුන් ආදිය පුරාගෙන පිටත සිටියවුන්ට දික්කොට පුළුන්නන්වා නැවත තුවුම කන්නාහ, බොන්නාහ. මෙසේ සතුරන් කිපෙන සුලුවූ නොයෙක් විකාරකරමින් පවුරෙන් ඇතුළේ පදනම උන්ට පෙනෙන තියාගෙන් සක්මන්කරන්නාහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යොධයෝ උන්ට කිසිවකුත් කොටගත නොහී ගෙඩි බැට කා අහ පය හිස නළල සීලේ පිස පසු බල බලා දිවන්නාහු රජ්ජුරුවන් සමීපයට ගොස් "දෙවයන්වහන්ස! සෘද්ධිමත්තෙනකුන් ආකාශයෙන් ගොසින් වදුන් මුත්, මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරිය" යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ නොසතුටුව සතරපස් දවසක් රඳා නුවර ගන්නා උපායක් නොදන්නාහු කෙවටයා විවාළහ 'ආචාර්‍යයෙනි! නුවර ගන්නා තබා පවුර ළඟට යන්නටත් සමර්ථ එකද සඬ්ඝෙක් නැත. කුමක් කරමෝදැ'යි කීහ. එබස් අසා බමුණා කියන්නේ "වන්නාටය; මහරජ! නුවරට පැන් නම් පිටතින් වන්නේය, කීපදවසක් පැන් නවතාලන්නා පැන් නොලදින් කලාතතවූවාහු දෙර හැරපියන්නාහ: එවිට අපි සිත්වූ පරිද්දෙන් සතුරන්ට කටයුතු කරම්හ" යි කීය 'කොල! එසිත් උපායෙකැ'යි එහැන් පටන් පැන් වැද්ද නොදෙන්නාහ. එපවත් බොධිසත්ත්වයන්වහන්සේගෙන් රජහු සමීපයෙහි සිටි වරපුරුෂයෙක් පතෙක ලියා ඊදණ්ඩෙන බැඳ ඇතුළු නුවරට විදපිය.

බොධිසත්ත්වයන් වහන්සේද සතුරන් ආ දවස් විධානයක් කරනසේක් "යමෙක් ඊදණ්ඩක ලියා විදපි පතක් දුටුවේවිනම් වහා ගෙනවුත් මට දෙව" යි වදාළසේක. එබැවින් එක් පුරුෂයෙක් ඒ පත ගෙනවුත් දිනැ. සඬ්ඝාමදරුවා නෝ ඒබව දැන මේ කෙවටමහල්ලා ඇතුළුවූ අඥාන ජනයෝ මා කවමි මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හ'යි සිතා සැට රියන් උණදණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා ඇතුළු පිට ගැට හරවා ශුඛකොට එක්නොට තබා සමින් වසා බඳවා පිට මැටිගාවා තාපස්වීන් ලවා හීමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුලු අලගෙන්වා පොකුණුඅස දියෙහි මැටිතබා මැටිපිට උණ දණ්ඩ සිටුවා ඇතුළේ පැන්පුරවාලුවේක. එකරැසින්ම පැලයනැඟී උණදණ්ඩ මුදුනෙන් රියනක් පමණවැඩීමලෙක් පිපිසිටියේය. ඒ අභිමතාර්‍ථසාධකවූ චින්තාමාණික්‍යයක් බඳුවූ මාගේ සඬ්ඝාමදරුවූ බොධිසත්ත්වයන් වහන්සේ ඒ මල් දඬු මුලින් උදුරුවා මේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට දෙව'යි තමන්වහන්සේගේ පුරුෂයන්ට දුන් සේක. ඔහු ඇඹුල දණ්ඩ වළල්ලේලා 'කොල බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි සසින් නොමිය තෙල මල කඩා ඉස පැලඳගෙන ඇඹුල දඬු හුයාගෙන බඩ පුරා කා පියවයි" යි පවුරෙන් පිටත දමාලුහ. එසිත් බොධිසත්ත්වයන් වහන්සේගෙන්ම සිටි වරපුරුෂයෙක් හැරහෙන රජ්ජුරුවන් සමීපයට ගොස් 'බැලූ බැලූතව දෙවයන්වහන්ස! මෙබදු ඇඹුල මලක් හා මේ දිග ඇඹුල දණ්ඩක් දුටු විරැදැ? නැහැ'යි කීය. 'රජහු මැන බලව'යි කී හෙයින් වරපුරුෂයා මතන්නේ සැටරියන් දණ්ඩ අසූ රියන් කොට මැනපිය. නැවත රජහු "මේ කෙසේවූ තැනක ඇතිවිදැ" යි කී කල්හි ඉන්ම එකෙක් රජහු කවින් බස උදුරා

ගත්තාසේ බොරුවක් ගොතාගෙන කියන්නේ 'දෙවයන්වහන්ස! මම එක් දවසක් රා පිනක් බීපියනු කැමැතිව කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි. නුවර වාසීන් දියකෙළනා මහ පොකුණක් දිටිමි. බොහෝ මනුෂ්‍යයෝ ඔරු අහුල් ආදියෙහි ඉඳගෙන මල්හඬා දිය කෙළ ඇවිදිනාහ. මේවූනලි, ඒ පොකුණේ ගොඩ අස පිපි මලෙක් සැටිය, ඉදින් ගැහැරු හැනෙක පිපි මලෙක් ඒනම් සියක් රියනටත් වඩා ඇත්තේ වේදැයි කිය. ඒ අසා "ආචාර්‍යයෙනි! පැන් නවයා මේ නුවර ගනුම්හයි නොසිතුව; ඒ තොපගේ උපායෙක් නොවෙයි ඒ හැරපියව"සි කිහ. "එසේ කල දේවයන්වහන්ස! මෙවිට මා සිතූ දෙය ඉතාම යහපත, නුවරට ඒ සාල් තම් පිටතින්ම වන්නේය, ඒ විසාල් වැදිදනොදෙම්හ බහින් පිඬිතවූ මනුෂ්‍යයෝ දෙරහැර පියන්නාහ, එවිට අල්වාගෙන කැමැත්තත් කරම්හ"සි කිහ. 'රජ්ජුරුවෝ ආචාර්‍යයෙනි! එසේ වේව'සි කිහ.

ඒ මන්ත්‍රණයත් පළමු පරිද්දෙන් පතකින්ම දැන, 'මේ නිවටවූ සෙව වයා මා නුවණැති නියාව නොදන්නා වනැ'සි කියා 'අනුප්‍රාකාරය'සි කියන ලද පදනම මුදුනේ කලල් අහුරුවා රිපිට ඒ ඉස්වාලූසේක. (බොධිසත්වයන් ගේ අභිප්‍රාය නම් සිඹවන්නේය; එබැවින්) ඒ ඒ එකරුසින්ම පැලනැඟී සත් ගොදුන් මිසුලු නුවර ඔට පවුර මුදුනෙහි ඉහා නිල්වලා සඹහයක්සේ අතිනිලව පෙනෙන්නට වන. ඒ දුටු රජ්ජුරුවෝ 'පවුර මුදුනේ ඉහා නිල්ව අර මේ පෙනෙන්නේ කිම්දැ'සි සිටියවුන් විචාළහ. චරපුරුෂයෙක් කියන්නේ "දෙවයන්වහන්ස! හොවියා පුත් මහෞෂධ පණ්ඩිතයා තමා ප්‍රඥ බලයෙන් මතුවන්නාවූ භය දැන තමාගේ විධාන වැටෙන්නාවූ මේ ජනපදයෙහි ඒ විසක් ඇතිවිද, එකහෙළා ගෙන්වා ගෙන මේසා මහත් නුවර හැමදෙනාගේ කොටු ගෙවල් පුරවා ඉතිරි ඒ පවුරපිට හා ඒපිසේ ඒ ඒ ස්ථානයෙහි ලවාපිය, ඒ ඒ තාක්වූඑල්ල අව්වේ වියලි වැස්සේ තෙමී පැල නැඟී ගොයම්ව ගියේය. මම එක් දවසක් කටයුත්තක් පිණිස කුරුබිලියෙන් ඇතුළු නුවරට වන්නෙමි, අසතුබු වියෙන් ඒ මිටක් ඇරගෙන "තොල! ඉහා යහපත් වියෙකැ, ඉස්තෙමි" කියා විපියට දමාපිමි. ඒ දැන එහැන සිටි ජනයෝ මා වෙහෙසන්නාහු 'ඉහාම බඩසාය සැටියෙකැ, කැමැත්තෙකි ඒනම් තිලින් පොදියක් කොට බැඳගෙන ගොස් පැහැරපියා පිසගෙන බඩපුරා කා නොමියසි කිය. ඒ ඒ මා ඇල්ලුසේ 'ඉහා නපුරුස් ලජ්ජාවට පැමිණියෙමි'සි කිය. ඒ අසා රජ නෙවට්ටයාට කියන්නේ 'ඒ නවතාලාන් මේ නුවර ගහ නොහැක්ක; තාගේ එසිත් උපායෙක් නොවෙයි හැරපියව'සි කිය. "දෙවයන්වහන්ස! නොසිතා වදුල මැනව, අනික් බලවත් මාගේ උපායෙක් ඇත, නුවර ඇතුළේ වලක් නැති හෙයින් දරනම් පිටතින් මුත් නෙතා නොහැක්කේය; දර නවතාලා නුවර ඇරගනුම්හ'සි කියේය. රජ්ජුරුවෝ ආචාර්‍යයෙනි! එසේ වේව'සි කිහ. ඒ මන්ත්‍රණයත් පෙර පරිද්දෙන්ම දැන වදුරු පවුරු පිටින් ඒ හා ගොයම් හරවා පිටත පෙනෙන නියායෙන් දර රැස්කරවූසේක. පවුරේ උන් මනුෂ්‍යයෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෝධයන්ට සිතාසිසී වෙනසෙන්නාහු 'කොල! දර නැතිව පිස කෑ නොහී සඹින් පිඬිතව නොහිද නැති කෙනෙක් උඳකැන් බත් ආදිය පිස කව බොව'සි කියමින් 'තෙල ඇර ගන්ව'සි මහත් මහත් දර කඳන් ඇහට දමාලන්නාහ. සමහරු ඒ වැදගෙන තැළි තැළි මහත් දුක පැමිණෙන්නාහ. රජ්ජුරුවෝ දර රාශිය පෙනෙන්නා දැක 'තෙලෙ කිමෙක්ද'සි විචාළහු. එකෙනසිටි චරපුරුෂයන්ගෙන් එකෙක් "ඇසි මහරජ! නොදන්

නාසේක්ද ගොමයා පුත් මහෞෂධයා මතු වන්නාවූ භයදැන වල දරක් කිඹිද, එබඟෙළා අදිද ගෙනවුත් නුවර ගෙයක් පනහා පැලදොරවල් පුරා ඉනිරිවන දර පවුර පිට රැස්කරවාපිය"යි කීය. රජ්ජුරුවෝ ඒ අසා නොවටය! මේ නුවර දර නවතාලාත් ඇරගන්නට නොපිළිවන: තාගේ එයින් උපා යෙක් නොවෙයි ඇරපියව"යි කිහ. ඉතා ඇවිලි අවන්නාවූ නිවටවූ නොවටයා කියන්නේ "මහරජ! නොසිතා වදුළ මැනව; මාගේ බලවත් අතික් උපා යෙක් ඇතැ"යි කීය. ඒ අසා ආචාර්‍යයෙනි! උපායනම් තමා කිම්ද? මිමි මේසා මහත්වූ තොපගේ උපායකින් වැඩකුත් නිමිවකුත් නුදුටිමි; මේ නුවර වෙදෙහ රජු අල්වාගන්නට නොපිළිවන, එබැවින් අපගේ නුවරටම යම් හ"යි කිහ

නැවත අඥානවූ මනලු බවුණු කියන්නේ "දෙවයන්වහන්ස! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා ඒ සා මහත් චතුරඞ්ගිනී සෙනාවත් ගෙන වෙදෙහ රජු අල්වාගත නොහී පැරද පලාගියහ"යි අපට මහත් ලජ්ජා වන්නේය; එබැවින් නුවණැත්තෝනම් මහෞෂධ පණ්ඩිතයෝම මතු නොවෙති; මමත් මහා නුවණැත්තෙමි; එක් ලෙසකින් ඔහු පරදවාපියම් හ"යි කිය ආචාර්‍යයෙනි! ඒ ලෙසනම් තමා කිම්ද'යි කිහ. ධම් යුඬ නම් දෙයක් කෙරෙම්'යි කීය. ධම් යුඬ නම් කිම්ද'යි කිහ. "මහරජ දෙසෙනාව සටන් නොකොට මැනව, රජ්ජුරුවන් දෙදෙනාගේම පණ්ඩිතවරු දෙදෙන එක් තැනකට එද්ද; ඉන් එක්කෙනෙක් වැන්දවූ නම් වැඳි පක්‍ෂයේ රජහට පරාජය වන්නේය. වැදුම් ලත් පක්‍ෂයේ රජහට ජයවන්නේය. එබැවින් ඒ මන්ත්‍රණය මහෞෂධ පණ්ඩිතයෝ නොදන්නාහ. මම ඉතා වැඩිමහල්ලෙමි. මිහෞෂධ පණ්ඩිතයෝ බාලයෝය. ආදර දන්නා නුවණැති පණ්ඩිතයන් හෙයින් ඔහු මා දුටුකල සැක නැතිව වදනාහ. එවෙලෙහි වෙදෙහ රජ සැබවින් පරාද්‍ධ නම් වන්නේය. එසේ කොටත් වෙදෙහ රජු පරදවා පියා නැගී යම්හ. එසේ කල අපට ලජ්ජා නොවන්නේය, ධම් යුඬ නම් මේය"යි කීය. පණ්ඩිතයන්වහන්සේ ඒ රහස් කථාවත් පෙර පරිද්දෙන්ම දැන වදුරා "ඉදින් නොවටයාට මිනුත් මම පැරැද්දෙමි නම් මාගේ කුමන පණ්ඩිතකමෙක්ද"යි සිතූසේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් 'ආචාර්‍යයෙනි! ඒ උපාය ඉතා යහපතැ'යි සෙට උදැසන දැහැමෙන් සෙමෙන් ධම් යුඬය වන්නේය, පණ්ඩිතවැන් දෙදෙනාගේ සම්වූ ධම්යෙන් ජය පරාජය වන්නේය. "ඉදින් යමෙක් ධම් යුඬයට නොඇතම් එයින් පරාද්‍ධ නම් වන්නේය"යි පත ලියා කුරුඹිලියෙන් වෙදෙහ රජහට යවූහ.

ඒ අසා වෙදෙහ රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ද කැඳවා එපවත් කිහ. ඒ අසම්න් සකල ජනානන්දකරවූ තිලෝගුරු බොධිසත්ත්වයන්වහන්සේ "යහපත දෙවයන්වහන්ස! සෙට උදැසනම බස්නාහිර දොරැලින් පිටත ධම්යුඬ මණ්ඩලය සරසත්වා. ධම් යුඬ මණ්ඩලයට එන්වයි පත් ගැව්ව මැනව"යි වදුළසේක. රජ්ජුරුවෝ ඒ අසා ආවාවූ දූතයා අතමු හපුන් ගැවූහ. බොධිසත්ත්වයන්වහන්සේ දෙවන දවස් කෙවටයාටම් 'පරාජය වේව'යි කියා බස්නාහිර වාසලින් පිටත ධම් යුඬ මණ්ඩලය සැරහැවූසේක. එතකුදු වූවත් ඒ ඒ රජුන් කෙරෙහි සිටි වූරපුරුෂයෝ එක්සියයක් දෙනා 'කවුරු දනිද්ද කිම් දැ'යි 'බොධිසත්ත්වයන්වහන්සේට ආරක්‍ෂා පිණිස කෙවටයා පිරිවරා සිටගත්හ.

බ්‍රහ්මදත්තයන් හා එක්සියයක් දජ්දරුවෝ ධර්ම යුද්ධ මණ්ඩලයට ගියාහු, පුර දිගවන යහපත් දවස් සඳ බලන්නට එක්සිත්ව එනදිසාව බලන්නවුන් පරිද්දෙන් පැදුම්දිය බල බලා සිටියහ. එසේම තිවටවූ සොවටයන් නැඟෙනහිර දිශාව බල බලා 'කල් යේනුයි කල් යේනුයි' කියා කියා සිටියේය. තමන් පා පියුම් ලෝ මුදුන්හළ තිලෝගුරු බොධිසත්වයන් වහන්සේ එදවස් උදැසන සොළොස් කළයක් සුවඳ පැනින් ඉස් සෝධා නහා ලක්ෂයක් වටනා කසී සළුවක් හැඳ සව්හරණයෙන් විභූෂිතව, තොයෙක් රසයෙන් අග්‍රවූ අමරුදෙවින් පිසන ලද භෝජනය අනුභවකොට මහත් පෙරහරින් වාසල් දොරකඩට ගොස් ආ නියාව කියා යවා 'මපුතණුවෝ වහා එත්වා'යි රජ්ජුරුවන් විසින් කී කල්හි රජ ගෙට වැද රජ්ජුරුවන් වැඳ එනත්දස්ව සිට 'කිමෙක්ද පුත මෙහෙණසඳ පණ්ඩිතයෙනි! සි රජ්ජුරුවන් කී කල්හි 'ධර්ම යුධයට යෙමි'යි වදාළ සේක. 'පුත මා විසින් කුමක් කළ මනාද'යි කිහ. 'දෙවයන්වහන්ස! කෙවටටයා මැණිකකින් වඤ්චනාකරනු කැමැත්තෙමි; එබැවින් අඟවඩක මාණික්‍යාරතනය ලදමැනව'යි වදාළසේක. 'පුත! එයින් මට කියාද ගන්නේ ඇරගනුව'යි කී කල්හි ශක්‍රයන් පළමුත් තමන්වහන්සේට දුන් මාණික්‍යාරතනය ශ්‍රී හස්ත යෙන් ගෙන රජහු වැඳ මාලිගාවෙන් බටසේක.

තමන්වහන්සේ හා එසා දවස උපන් ඔබයන් දහස හා සියුරහ සෙනහ පිරිවරා අනුදහසක් රන් වටනා හැළි අසුන් යොදනලද සම්පූර්ණාලංකාර යෙන් සැරහුණු රථසතපැනනැඟි දුවල් මේ නිමවන වේලාවට වාසලසම්පයට පැමිණිසේක. කෙවටටයෝද 'මහෞෂධ පණ්ඩිතයෝ දැන් එති දැන් එති'යි මහබෝසතාණන්වහන්සේ වඩනා පෙරමඟ කර ඔසව ඔසවා බලාගෙන සිටීමෙන් කොක් කරක්සේ දික්වූ කර ඇතිවූහ. මහබොධිසත්වයන්ගේ දිගනතර යෙහි පතලාවූ තෙජස් පරිද්දෙන් පහරන්නාවූ හිරු රැසින් ඕ වැහෙන්නාවූ ශරීර ඇතිවූහ. මහබෝසතාණන්වහන්සේද ඔදවැඩියාවූ සාගරඝ පරිද්දෙන් පොළොව මැඩපියන්නාසේ ඵිපිය පුරාගෙන යන්නාවූ ඇත් අස් ආදිවූ පරිවාරයෙන් යුකතව, අසම්භිතව වාසල් දොර ඉරවා නුවරින් නික්ම රථයන් බැස කෙසරු සලා විදහා කිළිපොළන්නාවූ සිංහරාජයකුසේ විජෘම්භනය කෙරෙමින් ධර්ම යුධ මණ්ඩලයට වැඩිසේක. එක්සියයක් රජදරුවෝ ඒ මහතා ණන්වහන්සේගේ ඓරූපශ්වර්‍යය දැක"නුවණින් සියලු දඹදිව තමන්ට දෙවැනි කෙනකුන් නැති සිරිවඩන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ නම් මූලය"යි සමාධින් ඔල්වර හඬ සියගණන් පැවැත්වූහ. පණ්ඩිතයන් වහන්සේද, දෙදෙවි ලාව දෙවියන් පිරිවරා අසුර යුධයට නික්මුණු සක්දෙව් රජහු පරිද්දෙන්, උපමාවිෂයාතික්‍රාන්තවූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුකතව ඒ අඟට වඩක මාණික්‍යාරතනය අතින් ගෙන කෙවටටයන් ඉදිරියෙහි ළංව වැඩිසේක.

කෙවටට බමුණා මහබෝසතාණන්වහන්සේ දැකලාම ඔබගේතෙජසින් සිටි පළ සිටින්නට නොපෝසත්වී පෙර ගමන්කොට "මහෞෂධ පණ්ඩිතයෙනි! අපි දෙන්නාවේම පණ්ඩිතවරු වම්හ, තොප නිසා අවුත් මෙතෙක්කල් මෙතැන වසන අපට නෙපි අවුතු පඬුරක් පමණවත් නොඑවූ විරූය, කුමක් නිසාද මෙසේම සාදරයක් නොකෙළේය"යි කීය. එසේ කී කෙවටටයන්ට බෝසතාණන්වහන්සේ, පණ්ඩිතයෙනි! තොපට සුදුසු පඬුරක් සොයන්නෙම් අද මේ මිණිරුවන ලදිමි, හැරගනුව මෙබඳු මිණිරුවනෙක් මේ මුත්

නැතැ'යි වදළසේක. කෙවට්ටයෝ පණ්ඩිතයන්වහන්සේ අත දිලිසෙන මිණි රුවන දැක මේ 'පණ්ඩිතයෝ මට මිණිරුවනක් නෙනාවන්නාහයි සිතා 'එසේ වීනම් දෙව'යි අත දික්කළහ. බෝසතාණන් වහන්සේද ගනුවයි කියා අත දික්කොට අත ඇඟිලි අග මැණික එළාලූසේක. බඹුණාණෝ බරවූ මිණිරු වන ඇඟිලි අගින් රදවා ගත නුහුණුවහ. මැණික පෙරලිගෙන හොස් බොස තාණන්වහන්සේගේ පාමුල වැටී ගියේය. බඹුණාණෝත් ලොභයෙන් 'මැණික ගනිමි'යි බොධිසත්වයන්වහන්සේගේ ශ්‍රීපාද මූලයට නැඹුරු වූහ. ඒ දැක බෝසතාණන්වහන්සේ බඹුණාණන් නැඹුරුවූ තැනැත්තාවූ තර බසවා ගත නොදිමි, එක් අතකින් පිටිකර හා එක් අතින් පිටිමුල තරයේ අල්වා ගෙන 'නැගී සිටුව ආචාර්‍යයෙනි! නැගී සිටුව ආචාර්‍යයෙනි! මම බාලයෙමි, හොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි, මා නොවදුව මා නොවදුව යි කියා මුණ හා සම්බන තළල පෙරළ පෙරළා හොරසඞ් බිම උලා රත් වද මලක් සේ ලේ හා පස් වකා නුවණ නැත්තව! තෝ මා අතින් වැදුම් ගන්නට සිතයිදැ'යි බොටුව අල්වාගෙන දමාලූසේක. තෙමේ ඉස්බක් පමණ තැන වැටී ගොස් නැගී සිට වැලි පිස පිස පලාගියේය. මැණික වනාහි මහබෝසතාණන්වහන්සේ ඕනිස්සුම් ඇරගත්හ. 'නැගි සිටුව ආචාර්‍යයෙනි! නැගි සිටුව ආචාර්‍යයෙනි! මා නොවදුව මා නොවදුව'යි කියා මහබෝසතාණන්වහන්සේ බැණනැගී අඩ සියලු චතුරඞ්ගිනී සෙනායෙහි අරගල ඇඩගෙන සිටියේය. කෙවට්ට බඹුණා විසින් මහෞෂධ පණ්ඩිතයන්වහන්සේගේ පා වඳනා ලදැ'යි සියලු පෂිත් කොක්සන් දිදී පිළිඉස සීසාරු අත්පොළසන් දී කොලාහල කළහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක්සියයක් රජදරුවන් ඇතුළුවූ හැම්දෙනම කෙවට්ටයා මහෞෂධ පණ්ඩිතයන් පා පිට නැමූනා දුටුවාහුමය. නැවත කියන්නාහු 'අපගේ කෙවට්ට ආචාර්‍යයන් විසින් මහෞෂධ පණ්ඩිතයෝ වද ගියාලදහ, එබැවින් අපි පැරද්දමිහ, අපගේ ජීවිත මෙවිට නොදෙන්නාහ'යි හසින් තැනිගෙන තමන් තමන්ගේ අසුන් පිට නැඟී උත්තර පඤ්චාල නුවරට මුණලා නමාගත්හ.

ඒ යන්නවුන් දැක බොධිසත්වයන්වහන්සේගේ පිරිස එක පැහැර 'කොල! බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා සෙනාව ඇරගෙන බිදී පලාගන්නාහ'යි මහත්කොට හඬගසා කොලාහල කළහ. ඒ අසා රජදරුවෝ තාක් මුළුල්ල වඩ වඩා භයපත්ව පලා යන්නාහුමය. ඔවුනොවුන් නොබලා මහා සෙනාවෝත් බිදී ගියහ. බොධිසත්වයන්වහන්සේගේ පිරිස ඒ දැකත් වඩ වඩා කොලාහල පැවැත්වූහ. කරුණා නිධානවූ මාගේ සවාමිදරුවාණෝ 'බිදී යන්නවුන් ලුහුබඳව'යි යන බසකුත් නොකියා තමන්වහන්සේගේ සෙනාව පිරිවරා නුවරට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජුරුහන් හා ඒසා මහත් සෙනාව දෙළොස් ගවුවක් තැන් බිදී පලාගියහ. ඉතා අලජ්ජීවූ දුෂ්ටවූ කෙවට්ටයා අසු නැඟි කටින් ලේ දම දමා තළල ලේ පිස පිස දිවන්නේ සෙනාවට ආසන්නාව අසුපිටම හිඳ 'පින්වත්නි! නොයව, මම ගොළුයා පුතු නොවැන්දෙමි; සිටුව සිටුව'යි කිය. එසේ කිවත් සෙනාව නොරඳාම දිවන්නාහු මෙසේ කියන්නාහ. "කොල! පව්වූ දුෂ්ට අඩම්මිඤ්ඤවූ නිකාරුඤ්ඤ අන්‍ය වාර්‍යයී සවරූප ඇති අවලක්ඛණවූ අඤ්ඤ බඹුණු මහල්ලි! තෝ ධම්ස්‍යුඛසෙතෙ මී"යි කියා ගොඹින් නව මුණුබුරු තරමටත් නැති ඉතා බාල තැනැත්තන් වැඳපිය. මේ මනුෂ්‍ය ලොකයෙහි උපන් සත්ත්වයන්ගෙන් ජඩවූ යම් එනක්හු

කළමනා යම් නොකවයුත්තෙක් ඇත්නම්, ඒ සියල්ලෙන් තා විසිනුත් නොකළමනා දෙයක් ඇද්ද? "ජඩය! මැත නොදෙඩ, තොයිත් තාගේ පණ නොනසා යන අතෙහ නැගී යා"යි යනාදීන් කියා කියා ඔහුගේ බස් තමන් සතෙක නොගෙණුම ඔහට ආක්‍රොශ පරිභව බෙණෙමින් නොරැඳුම දිවන්නාහ.

ඒ බමුණා එහා වහාම දිවගෙන ගොස් සෙනාව මැදට පැන මෙයේ කියාලිය. "ඇයි කුමක් කියවිද? "මම ගොවියා පුතු නොවැන්දෙමි, මම ගොවියා පුතු නොවැන්දෙමි," කොල! වදින සොනෙක් නළල දණ වැලමිට ලිල් ලානෙනත් වඳිද්ද? මේ වැදීම් මාත නොප අතින් අද ඇසීම්; ඒ ගොවියා පුත් මාණ්ඩව්‍ය රහතාණන් මා වසඳවා කොටපිය"යි නොයෙක් කාරණා කියා හිඳිස්වා තමා වසඟ නොට එසේ බිඳී තුන් යොදනක් පලාගිය ඒ සා මහත් සෙනාව රඳවා නැවත හෙනවුත් පළමු පරිද්දෙන්ම වටලාගත.

බොධිසත්ත්වයන්වහන්සේගේ ආනුභාවයෙන් නොසිතූ හෙයින්මුත්, ඒ සෙනාව එකි එකී පස්මිටක්වත් කැටක්වත් දැමුවේවිනම් අගල් තුන ප්‍රමාණ ගෙත අටලොස් රියන් පවුර පිට නැවත එපමණ නොඛකරන්නටත් වඩා ඇතිවන්නේය; ඒ එසේ මැයි. නිලෝගුරු බුදුරජාණන්වහන්සේ ශ්‍රී මුඛයෙන්ම **බොධිසත්තානං අධිප්පායානාම ඉජ්ඣන්ති**" (බෝසතුන්ගේ අදහස් නම් සිදුවෙති.) වදළ බැවින් අභිමතාර්ථසාධකවූ චින්තාමාණික්‍යයක් බදුවූ මාගේ බොධිසත්ත්වයන්වහන්සේගේ තේජසින්ම පස්මිටක්වත් කැටක්වත් තුවර දිශාවට දමන්නා තබා සිතිනුත් සිතූ එකද සත්ත්වයෙක් නැත්තේය. සියල්ලෝම අවුත් තමන් පළමු උන්නාවූ ස්ථානයෙහිම හිඳගත්හ.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ 'ආචාර්‍යයෙනි! මෙවිට කුමක් කරමෝද'යි කෙවට්ටයා විචාළහ. ඒ දුෂ්ටයා කියන්නේ 'දෙවඟන්වහන්ස! කිසිකෙනකුත් මහ වහ වාසලින් තබා කුරුඛිලියෙනුත් පිටත්විය නොදෙම්හ. එසේ කාල මනුෂ්‍යයෝ උකටලිව තුමූම දෙර හැරපියන්නාහ. එවිට අපි අනායාසයෙන් සතුරන් අල්වාගෙන කැමැත්තක් කරම්හ"යි කීය. ඒ වූ නියාවත් බොධිසත්ත්වයන්වහන්සේගේ වරපුරුෂයෙක් පියදූ පහකින්ම දැන වදුරා "මේ සතුරන් බොහෝ දවසක් මෙතැන වීසිමෙන් අප හැමදෙනාගේම සිතට සැපයක් නැත්තේය; උපායකින්ම මුන් පලවාපියම් සිතා මන්ත්‍රණයෙහි දක්ෂවූ උපායවත් පුරුෂයක්හු පරීක්ෂා කරනසේක් අනුකෙවට්ටයාය යන එකකු දැක ඔහට වදුරනසේක් 'අපගේ කටයුත්තෙක් ඇත, තොප විසින් සමඟකොට දුන යහපතැ'යි වදුළසේක. "සාමීනි! කුමක් කෙරෙම්ද වදුළ මැනවැ'යි කීය. "තෙපි මහ පවුරෙහි පදනම සිට අපගේ මිනිසුන්ගේ ප්‍රමාදයක් බලාලා, අතරතුරේ බ්‍රහ්මදත්තයන්ගේ පිරිස සිටියවුන්ට කැවුම් මවජ්මාංශාදිය විසිකොට "පින්වත්නි! ඉඹ මේ දේකඹ, උකටලී නොව කිප දවසක් රැඳන්නට උත්සාහකරව, නුවරවාසී සියල්ලෝම මැදිරියෙහි අසුවූ කුකුළන් පරිද්දෙන් ඉතා උකටලිව ගියහ. කිප දවසකින් තුමූම දෙර හරින්නාහ; එවිට තෙපි වෙදෙහයාත් දුෂ්ටවූ ගොවියා පුතුත් අල්වා ගනුව'යි කියව, මවජ්මාංශ කන බොන දැ දීමෙන් ඔවුන් සිත්ගෙන කියා ඇවිදුව, ඒ තොපගේ කථාව අපගේ මනුෂ්‍යයෝ අසා තොපට ආක්‍රොශ පරිභව බැණ තොප අල්වා ගෙන බ්‍රහ්මදත්තයාගේ මිනිසුන් බල බලා සිටියදීම් දැත දෙපය තරව අල්වා

ගෙන උණ පත්තෙන් මරන්නාසේ පැලා ඉන් බාගෙන ඉස පස් කොණ්ඩ යක් බඳවා ඇඟ උළු සුණු ගල්වා රත් මල් කෑණිරු මල් වඩම් කරලා කිප පාරක් ගසා පිට ගඩු නංවා පිටිතල ගසා බැඳ පවුර පිට නහා සාල්ලෙක හිඳුවා යොතකින් පිටත බාවා බ්‍රහ්මදත්ත රජුගේ මිනිසුන්ට 'මන්ත්‍ර නෙදක සොරයා'යි කියා දක්වන්නාහ. බ්‍රහ්මදත්තයන්ගේ මිනිස්සු නොප ගෙන ගොස් රජහට පානාහ; රජ්ජුරුවෝ 'තොපට මෙවැන්නක් කරන්නට තොපගේ අපරාධය කවරේදැ'යි විචාළෝතම් තොප කියනකල 'මහරජ! මාගේ සම්පත් බොහෝය, ගොවියා පුත් මහෞෂධයා මන්ත්‍ර නෙදක සොරය'යි මට කිපී රජහට කියා මාගේ සම්පත් උදුරාගත; 'ඒ නිසා දැන් මම මාගේ සම්පත් නැසුවාවූ සොරවූ ගොවියා පුතුගේ ඉස දෙවා පියන්නට සිතන්නෙමි, නුඹවහන්සේගේ සෙනාව මේ නුවර සාධාරණතොහී උකවලිවන හෙයින් එහි ඉහා කනස්සලුව ඔවුන්ට අතරතුරේ කන බොනදැන් දෙමි; ඇතුළු නුවර අඩු වැඩියන් කියමි; ඒ දැන මාගේ පරණ වෛරයත් සිත තබාගෙන මට මේසා මහත් ව්‍යසනයක් කරවීය. මේ සියල්ලම් නුඹවහන්සේගේ මනුෂ්‍යයෝ දන්නාහ'යි කියා රජහු නොයෙක් පරිද්දෙන් ගිවිස්වා තොප හෙරේ තරව ඇදගිලිව ගත්කල නැවත නෙපි මෙසේ කියව—'මහරජ මෙවිට මා ලත් පසු නොසිතා වදුළ මැනව, දැන් වෙදෙහ යාන් ගොවියා පුත් මහෞෂධයාන් දිවි නැත්තේය. මම් මේ නුවර පවුර තර තැනුත් නොතරතැනුත් අගල මුවරුන් හා කිඹුලුන් ඇති තැනුත් නැති තැනුත් ඉදුරු දනිමි; නොබෝ දවසකින් නුවර ගෙනදී ලම්'සි කියව. ඉක්බිති රජ්ජුරුවෝ 'සැබවැ'යි ගිවිස තොපට බොහෝ සත්කාර සොට නවන්ගේ සෙනාව තොපට පාවාදෙති; නෙපි ඒ සෙනාව හා සටනට ගොස් වණඹවූ කිඹුලුන් හා මුවරුන් ඇති තැනටම බාලව, කිඹුලුන් හා මුවරුන් නෙන් භය පත්වූවාහු සටන් තබා අගල සම්පයටත් ළං නොවන්නාහ. එවිට නෙපි අවුත් "දෙවයන්වහන්ස! නුඹවහන්සේගේ මේ සෙනාවෝ ගොවියා පුත් විසින් භිත්තාව ගියහ; කෙවටයා ඇතුළුව සියලු රජදරුවන් අතරෙන් ඔනු අතින් අත්ලස්තොගත් එකද කෙනෙක් නැත්තාහ; හුදක් නුඹවහන්සේ පිරිවර ඇවිදිනා බව මුත් මේ සියල්ලෝම ගොවියා ළුත් සන්තකයහ; නුඹවහන්සේට හිත නම් මම්මය; මෙතෙක්දෙනා නුඹවහන්සේට වෙනස් කල මම තනිව කුමක්කොට ලියහෙම්ද; ඉදින් මා බස් නොඅදහන සේක්වීනම් සියලු රජදරුවෝ සම්භාරණයෙන් සැරහිඅවුත් මා දකින්වයි නියොගකළ මැනව'සි කියව; ඒ බසින් හැමදෙනම සැදී පැහැදී ආ කල්හි "ගොවියාපුත් තමාගේ නම අකුරු ලියාදෙනලද වස්ත්‍රාභරණ සාඩු ආදිය අකුරු බලා තෙල අදහානත මැනව"සි කියව; ඔහු නොප කී පරිද්දෙන් 'රජ දරුවන්ට එන්නට කියව'සි නියොගකොට ඔවුන් සැරසී ආ කල්හි, නොප කී පරිද්දෙන් අකුරු දැක හසින් තැකිගෙන බියගත්තාහු රජදරුවන්ට සමුදී යවා 'මෙවිට කුමක්කරමෝද ආචාර්‍යයෙනි! විචාරති, ඒ විචාළ රජ හට නෙපි මෙසේ කියව, මහරජ! ගොවියා පිත් බොහෝ මායම් දන්නේය, ඉදින් කිප දවසක් මෙනැන රැඳුණු සේක්නම් නුඹවහන්සේගේ සියලු සෙනහ තමා වසහකොටනෙන නුඹවහන්සේ ජීවිතක්ෂයට පමුණුවා'සි, ප්‍රපඤ්ච නොකොට අදම මධ්‍යම රාත්‍රියෙහි අසුපිට හිඳගෙන පලායෑහ'සි කියව: 'සතුරන් අත මියන මිරෙක් අපට නොවේවා'සි මෙසේ කී කල්හි, රජ්ජු රුවෝ ගිවිස තොප කීලෙසම කරන්නාහ: නෙපි උන් නික්මෙනවේලා දැන, නැවත අපගේ මනුෂ්‍යයන්ට ඒ බව අහවාලව"සි වදුළසේක.

ඒ අසා අනුකෙවට්ටබ්‍රාහ්මණයා 'පණ්ඩිතයන් වහන්ස! මානිසා වැඩෙක් වේනම් නුඹවහන්සේ වදාළ ලෙසම සෙරෙමි'සි කිය. 'එසේවීනම් උන්ට පෙනෙන පරිද්දෙන් පහර කිපයක් ඉවසාපුව යහපතැයි වදාළසේක. "පණ්ඩිත යන වහන්ස! මාගේ ප්‍රාණයත් දුන් දෙපයත් නොනසා සම්‍යංගය මුළුල්ල නුඹවහන්සේ කැමැත්තක් කරවුව මැනවැ"සි කිය. එවේලෙහි අනුකෙවට්ටයාගේ අඹුදරුවන් පවන් උන් සත්තසා කිසිකෙනකුන් නොවරදවා සංග්‍රහ කොට, අනුකෙවට්ටයන් හිස පස් කොණ්ඩයක් බැඳ පෙනෙන ලෙස පහර කිපයක් ගසා, ගඩු තහා සම්බාධයෙහි උළුසුණු ගල්වා රත්මල් කණේරු මල් වඩම් කරලා මිහා, විප්‍රකාරයට පමුණුවා සාල්ලෙක හිඳුවා, ලනුවෙක බැඳ පිට තව බාවා බ්‍රාහ්මදත්තයන්ගේ මනුෂ්‍යයන්ට දුන්වූවාහ. රජපුරුවෝ අනුකෙවට්ටයන් නොයෙක් පරිද්දෙන් විමසා, අදහාගෙන ඕනට ප්‍රසාද දී සෙනාව පාවාදුන්හ. ඒ තෙමේ සෙනාව ගෙන 'නුවරගන්මි'සි ගොස් 'මෙහැනින් බටකල නිරුපද්‍රවය, මෙහැන පවුරත් දුර්ලය, මෙහැන රැකවලුත් නැහැ'සි ගෙන ඉගොස් පොවාලූ ඇඟිල්ල සඩා සහන තරම් වණ්ඩවූ කිඹුලුන් හා මුවරුන් ඇති නොවවලවම බාලයි, බටුබටුවන් ගසා කන්නාහ; අට්ටාලවල සිටියාහු හී මුණ කෝල් හෙණ්ඩිවාල තොමරුදියෙන් දමා ඇන මහා විනාශයට පමුණුවන්නාහ; සෙනාව මහා ව්‍යසනයට පැමිණ නැවත ඒ දිශාවට යන්නා තබා බලන්නටත් අසමර්ථවූහ. අනුකෙවට්ටයෝ රජහු සමීපයට ගොස් "මහරජ! නුඹවහන්සේ නිසා සටන් කරනුකැමැත්තෙක් නැත්තාහ. හැමදෙනම ගොවියෝ, පුතුගෙන් අත්ලස් ගත්තාහ; මා බස් නොඅදහනසේක් වීනම්, රජදරුවන් සැරහී එන්නට කියා ගෙන්වා හන් පලන් වසුන්නාහරණාදිය අකුරු බලා, සැකහළ මැනවැ"සි කිය.

රජපුරුවෝ ඔහු කී පරිද්දෙන් හැම ගෙන්වා නොයෙක් ආභරණාදියෙහි ලියා තුබුවා දැක "එකාන්තයෙන් හැමදෙනම අත්ලස් ගත්සේ සැබෑය"සි අදහාගෙන උන් හැම යවා 'ආචාර්‍යයෙනි! මෙවිට කුමක් කරමෝදැ'සි විචාරා "දෙවයන් වහන්ස! මෙවිට අනික් කටහැකි දෙයක් නැහැ; ඉදින් ප්‍රපඤ්චකොට කල් යැවූසේක් වීනම්, ගොවියාපුත් නුඹවහන්සේ අල්වාගන්නේය, වැලිත් කෙවට්ටයාත් නළල වණයක්කොට ගෙන ඇවිදිනා බව මුත් ඔහු විසිනුත් අත්ලස් ගත්තේමය, ධම්ඝුඩයෙහිදී අනඹිවූ මාණික්‍යරතනයක් කාටත් නොදන්නා පරිද්දෙන් ඇරගෙන නුඹවහන්සේ තුන්ගොදුනක් පලාගියවුන් නැවත ගිවිස්වාගෙනවුත් මේ මර උනුලේ ලාපිය. එයිත් නුඹවහන්සේට එකාන්තයෙන්ම අහිතමය, එබැවින් එකරියකුත් මෙතැන 'රදන්නා නොකැමැත්තෙමි, අද මධ්‍යම රාත්‍රියෙහි නැගී යන්නා කැමැත්තෙමි, මාවිනා නුඹවහන්සේට මනාසිත්කෙනෙක් මේ සෙනාවෙන් එකාකුත්නැතැ'සි කිකල්හි ඒ අසා වඩ වඩා හසින් තැනිගෙන "එසේවීනම් ආචාර්‍යයෙනි! තොප විනා මට හිත කෙනෙක් නැත, තෙපිම අසකු සදු ගමන නිල කරව"සි කීහ. අනුකෙවට්ටයාත් රජහු එකාන්තයෙන් යන බව දැන "මහරජ නොබා වදාළ මැනව"සි අස්වසාලා. ඒක්ෂණයෙහි අවුත් වරපුරුෂයන්ට කියන්නේ "අද රජපුරුවෝ පලායෙති කොල! නිදුවයම්හයි නොසිතව"සි අවවාදකොට. රජහට අසු සදන්නේ 'යම්සේ රදන්නට කඩියාදුම්මහාලූකල නොරඳම ඉදිරියට දිවේද, එපරිද්දෙන් අවකල්පන සැදීමෙන් අසු සදලා මධ්‍යම රාත්‍රියෙහි අවුත් 'අසු සදලා ගෙනාමි. වේලා දත මැනව, වහා නික්මුණ මැනව"සි කීය.

රජ්ජුරුවෝ අපු තැගි පලා ගියහ. අනුකෙවට්ටයාත් අසකු තැගි රජු හා එක් වයන්හා මෙසේ මදක් තැන් ගොසින්ලා රදු ගියේය. අවකලපන සැදීමෙන් සැදු අපු රදවන්නට හයාලුයේද නොරදම් ඉදිරියට දිවන්නේ බ්‍රහ්මදත්ත රජු හැරගෙන පලාගියේය.

අනුකෙවට්ටයා සෙනාව මැදට වැදලා "චූලනී බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පැලහ"යි මහත්තොරහඬගසාලීය. වරපුරුෂයෝද තමන්තමන්ගේ අතවැසි පුරුෂයන් හා සමඟ මහත්තොට හඬගසා ශබ්ද පැවැත්වූහ. එක්සියයක් රජදරුවෝ ඒ අසා සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ වාසල් හරවා පිටත්වූ වන්හ, මෙවිට අප හැමගේ ජීවිතය නැත්තේය"යි හඬින් තැතිගෙන උප භෝග පරිභෝග වස්තුවෙන් කිසිවකුත් නොගෙන මහුල් කඩු හා උතුරු සළු ආදිවූ වස්ත්‍රාභරණාදියටත් ආලය නොකොට තිනණ්ඩ සෙනාවක්සේ ඉස් ලූ ලූ අත උනුන් නොබලාම දිවගත්හ. වරපුරුෂයෝ එවිටත් එක්සියයක් රජ දරුවෝ පැලහ'සි වඩ වඩා කොලාහල පැවැත්වූහ. ඒ අසා නුවර වාසල් අට්ටාල පවුරු පදනම් ආදියෑ සිටියාහුද මහත්තොට කොලාහලකළහ. එවේ ලෙහි පිටත සිටි වරපුරුෂයෝ ඇතුළු නුවර මනුෂ්‍යයන් හා එක පැහැර ශබ්ද පවත්වා කොලාහල කළහ. ඒ ගැසූ සියලු ගඩ පොළොව පැලියන්නාසේ, වාතවෙගයෙන් මහාසමුද්‍රය ඇලලී ගියාසේ ක්ෂොභවගොස් පිටිනුවරත් ඇතුළු නුවරත් කොලාහලයෙන් එකනින් නාදවිය. අටළොස් අක්ෂෞහිණියක් පමණ මනුෂ්‍යයෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයන් විසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා එක්සියයක් රජදරුවෝ එකාන්තයෙන්ම 'අල්ලා ගන්නාලදහ'සි මරණ භයින් තැති ගත්තාහු කිසි සරණක්වත් පිටිවහලක්වත් ගැලවෙන්නට කිසි උපායක්වත් නොදන්නාහු සෙසුදු තබා හන්සඛවත් අසාමිකව සියල්ලක්ම උන්උන් තැනම ඇරපියා පළමු පැලැවුන්සේ ඉස් ලූ ලූ අත දිවගත්හ. ඒ සා මහත් රාජසෙනාවක් කඳවුරබැඳ හුන්නැන එකද මනුෂ්‍යයෙක් නැතිව සිස්වූ යේය. චූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජදරුවන් හා සමඟ බිදී තමන්ගේ නුවරටම ගියහ.

ඒ පැවැති කොලාහලයෙන් ඇත් අස් ආදීහු කඹ දම් ආදීන් කඩා බිඳ ගෙන ගොස් වල් නැංගාහ. දෙවන දවස් උදැසන නුවර වාසල් හැර බල ඇණි නුවරින් පිටත්ව, ඒ මහා විප්‍රකාර දැක අභිමාඑසාධන විනතාමාණකය යක් බදුවූ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ සමීපයට ගොස් 'පණ්ඩිතයන් වහන්ස! මේ සමපතට කුමක් කරමෝද'සි විචාළහ. ඔබ වදාරනසේක් 'උන් ඇමදෙනා නොකැමැතිකරවා උදුරාගත් දෙයක් නොවන පසු, උන් තමන්ම ආලය තැතිව දමාපියා නිරාලයව ගිය වස්තුහෙයින් සියල්ලම අප සතතක වන්නේය. 'ඉනුත් රජදරුවන් සතතක වස්තු අපගේ රජ්ජුරුවන්ට දෙව; සිටුවරුන් හා කෙවට්ටයාසතතක වස්තු තාක්මූළුල්ල අපටගෙනෙව, සෙසු අට ළොස් අක්ෂෞහිණියක් පමණ මහාසෙනාව සතතක වස්තුමූළුල්ල නුවරවාසිහු ගනිත්ව'සි වදාළසේක. ඉන් මාහැඟි රන්රුවන් ආදි වස්තුවම අදනවුන්ට දෙපෝයක්ම ඉක්ම ගියේය. වී සාල් ආයුධ ආදිවූ අවශෙෂ වස්තු අදනවුන්ට සාරම්සෙක් ඉක්ම ගියේය. බොධිසත්ත්වයන්වහන්සේ අනුකෙවට්ටයන්ට බොහෝ සත්කාර කළහ. වල ගිය ඇත් ආදීන් බඳවා ගෙන්වා ගත්හ. එවක් සටන් මියුලු නුවර වාසීහුද දශචක්‍රරතනයෙන් සමෘඩ්ධීහ. බ්‍රහ්මදත්ත රජ්ජු රුවන් එක්සියයක් රජුන් හා එක්ව බිදී ගොස් උත්තර පඤ්චාල නුවර වසන් නාවුන්වද අවුරුද්දක් ඉකුත්ව ගියේය.

එක් දවසක් කෙවටට මහලු බමුණු කැඩපහකින් හමා මුහුණ බැලුයේ, තළල කබරව ද, හියාසේ වණ සැලල දැක "මේ අනිකෙක් නොවෙයි. ගොවියා පුත් මහෞෂධයා අත කණිටාභාතෘය ඔහු විසින් එක්සියයක් රජුන් හා මේ සෙනාව මඩ්‍යයෙහි මම ලජ්ජාවට පමුණුවන ලදිමි'සි දණෙඩන් ගසන ලද ආඝාතයකු පරිද්දෙන් වඩනලද ක්‍රොධ ඇත්තේ කවර දවසෙහා ඔහු පිටි දැක පියන්නෙම්දෝ,සි සිතන්නේ 'ඒ වන්නා බලවත් උපායෙක් ඇත, අපගේ රජ්ජුරුවන්වහන්සේගේ පඤ්චාල චණ්ඩි කුමාරිකාවෝ දිව්‍යප්සරා වක්සේ උතුම් රූ ඇත්තාහ. සියු සැටක් පමණ සත්‍රී ලක්ෂණයෙන් යුක්තයහ. ඒ කුමාරිකාවන් වෙදෙහ රජහට දෙමහ'සි කියා රජු කාමයෙන් පොළඹවා බිලියක් ගිලූ මසතු ගොඩ ලන්නාසේ මහෞෂධ පණ්ඩිතයා හා සමඟ මේ නුවරට ගෙන්වා දෙන්නාම මරා ජයපානය බොම්හසි සතිටුහන් කොට සිතා නිමවා රජහු සමීපයට ගොස් 'දෙවයන්වහන්ස! එක් රහස් කථා මන්ත්‍රණයක් ඇතැ'සි කිය. පළමු තාගේ මන්ත්‍රණය නිසා අපගේ උතුරු සළුවටත් අසවාම්කව දමාපියා ආමිහ; මේ මන්ත්‍රණයෙන් කුමක් කෙරෙසිද? මූවෙන් නොබැණැ'සි කිවුය. 'මහරජ! මේ උපාය හා සමාන උපායෙක් නම් නැතැ'සි කිය. 'එසේවිනම් කියව'සි කිය. 'මහරජ! අප දෙන්නා මතු තනි වීය යුතුය'සි කියා 'රජ්ජුරුවන් යහපතැ'සි කී සාල ඔහු ඇරගෙන මාලිගාවේ මතුමාලට නැගි 'මහරජ වෙදෙහරජ කාමයෙන් පොලඹවා ගොවියා පුතු සමඟ මේ නුවරට ගෙන්වා ජීවිතක්ෂයට පමුණුවාපියම්හ'සි කිය. ඒ වන්නා තොප කිවා ඉතාම යහපත, කවර උපායකින් පොලඹවා මේ නුවරට ගෙන්වමෝදැ'සි කිහ 'මහරජ! නුඹවහන්සේගේ දියණියෝ පඤ්චාල චණ්ඩි කුමාරිකාවෝ උතුම් රූ ඇත්තාහ; ඒ ලක්ෂණ සම්පන්නවූ කුමාරිකාවගේ රූපවිලාසය කවින් ලවා ගී බඳවා කාව්‍යකරවා ඒ කාව්‍ය මියුලු නුවර ගායනාකරවා මෙබඳු සත්‍රී රත්නයක් නොලබන්නාවූ වෙදෙහ රජහට රූජ්‍ය යෙන් ප්‍රයොජන කිම්දැ'සි රූපශ්‍රී ඇසූ පමණින්ම ඔහු ශ්‍රවණ සංසර්ගයෙහි බැඳුණු කල මම්ම ඔබ ගොස් දවස් නියම දැන නැඟත්ලා එන්නෙමි; ඒ රජ් දවස් නියමකොට මා ආ කල්හි බිලියක් ගිලූ මසකුසේ ගොවියා පුතු හා සමඟ මේ නුවරට එන්නේය; එවිට උන් දෙන්නා අල්වාගෙන මරා ජීවිතක්ෂයට පමුණුවාපියම්හ"සි කිය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා ගිවිස ඉතා සතුටුව 'ආචාර්‍යයෙනි! ඒ උපාය ඉතා යහපතැ'සි කියා තොප කී ලෙසම කෙරෙම්'සි ගිවිස්සාහ.

මේ දෙදෙනාගේ රහස් කථාව චූලනී රජ්ජුරුවන්ගේයාන බලන එක් සැළලිහිණියක් සහස්කොට අසා සිත තබාගත. ඉක්බිතිව රජ්ජුරුවෝ යහපත්කොට අදළ කාව්‍යකාරයන් ගෙන්වා ඒ වූ නියාව කියා බොහෝ වසතු දී ඔවුන්ට දුවණියන් පෙන්වා 'කුඩාවරුනි! මේ කුමාරිකාවගේ රූපශ්‍රී වර්ණනා කෙරෙමින් මුත් නිසා කාව්‍ය කරවිය'සි කිහ. ඒ කාව්‍යකාරයෝ කණ්ඨරසායන කොට අති මනොහර කොට ගී බැඳ රජහු ඇස්දූහ. එදවස් රජ්ජුරුවෝ බොහෝ ප්‍රසාද දුන්හ. කවින් අනින් විද්දත් නායකයෝ ඉගෙන බොහෝදෙනා මධ්‍යයෙහි ගායනා කළහ. ඒ ගීතිකා ඇසූවන්ට කණීරසායනමය; මේසේ කාව්‍ය ගීතිකා බොහෝදෙනා අතරේ ප්‍රසිද්ධවූ සැළලි රජ්ජුරුවෝ ගී කියන්නවුන් කැඳවාකියන්නාහු "දරුවෙනි! තොපි කොස් ලිහිණියන් අල්වාගෙන රූ ගස්ඵඩ ඉඳ ගීතිකාවන් කියා අලුයම් වේලෙහි

උන් කර කසිතාලම් බැඳ උන් ආකාශයට හැරපියා කාන් නොදන්වා බැස පියව"සි කීහ. ඒ කුමක් පිණිසදයත්? බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන්ගේ රූපවිලාසය දෙවතාවෝ පවා කියන්නාහ'සි දඹදිව ප්‍රසිද්ධවන පිණිස කරවූහසි දතයුතු.

නැවත රජ්ජුරුවෝ කවින් කෑදවා "කුඩාවරුනි! දැන් තෙපි කියන කල මෙවැනි රූ ඇති කුමාරිකාවක් දඹදිව අනික් රජක්නට හරම් නොවසි, මියුලු නුවර වෙදෙහ රජහවම තරමැසි වෙදෙහ රජ්ජුරුවන්ගේ රාජ්‍යශ්‍රී හා කුමාරිකාවන්ගේ රූප වණ්නාව හා එක්කොට ගී බැඳ කාව්‍යකරවිශ"සි කීහ. ඔව්හු ගී බැඳ රජ්ජුරුවන් ඇස්වූහ. රජ්ජුරුවෝ ගායකයන්ට බොහෝ ප්‍රසාද දී 'දරුවෙනි! මියුලු නුවරට ගොස් මේ උපාගෙන්ම ගායනා කරවිය'සි කියා යවූහ. ඔව්හු එතැන් පටන් වන් වන් තැන ගායනා කොරෙමින් සාරසියගක් ගව් ගෙවා මියුලු නුවරට පැමිණ බොහෝ දෙනා රැස්වූ සභායෙහි ගායනාකළහ. ඒ අසා බොහෝ ජනයෝ ඕල්වර හඬ දහස්ගණන් පවත්වා මහා සන්නොෂයෙන් වසතු දුන්හ. ඒ ගායකයෝ රූ ගස්වලද හිඳ ගායනාකොට, අලුයම් වේලහි කොස්ලිහිණියන් කර කාසුතාලම් බැඳ ආකාශයට හැර බස්නාහ. ආකාශයෙහි ඒ කාසුතාලම් හඬ අසා චූලනී රජ්ජුරුවන් දුවණියන්ගේ රූපවණ්නාව දෙවතාවෝ පවා කියන්නාහ'සි නුවර මහත්වූ කොලාහල විය. වෙදෙහ රජ්ජුරුවෝ ඒ අසා ගායනාකාරයන් කැඳවා තමන්ගේ රජගෙයිදී බොහෝදෙනා මධ්‍යයෙහි කියවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තමන්ගේ මෙබඳු රූපශ්‍රීන් විරාජමානවූ දුවණියන් මට සරණ දෙත්ල'සි මහත්වූ සොම්නසට පැමිණ නාටකයන්ට බොහෝවූ ප්‍රසාද දී මහත්වූ සත්කාර කළහ. ඔව්හු නැවත අවුත් ඒ බව චූලනී රජ්ජුරුවන්ට කීහ. ඊට අනතුරුව කෙවට්ටනම් බමුණු කියන්නේ 'මහරජ! දැන් මම ගොස් නැකත් ලාලා දවස් නියමකොට එමි'සි කීහ. 'යහපත ආචාර්‍යයිනේ! කුමක් ලදමනාදැ'සි කීහ. 'යම්තම් පඬුරක් ලද මැනවැ'සි කිය. 'යහපත ගන්ව'සි කියා මාහැඟි පඬුරු දෙවූහ. ඒ බමුණු මහපිරිවරින් ගොස් වෙදෙහ රජ්ජුරුවන්ගේ රටට පැමිණියේය. ඔහු එන ගමන අසා "බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තමන්ගේ දුවණියන් අපගේ රජ්ජුරුවන්ට සරණ දෙත්ල; රජදරුවන් දෙදෙනාගේ බඳුබඳයත් මිත්‍රකමත් යහපත් විය්‍යෙන්ය කෙවට්ට බ්‍රාහ්මණයා නැකත් ලාලන්නට එමින් සිටියේල"සි නුවර එනකොට ලාහල විය; එපවත් වෙදෙහ රජ්ජුරුවෝත් ඇසූහ.

පරසිත් දන්නා බොධිසත්වයන්වහන්සේ එපවත් අසා සිතනසේක් "මේ විවාහය කියා කෙවට්ටයා එන ගමන මට රැස්නේ නොවෙයි, එහි තත්ත්වය දැනපිම්නම් යහපතැ"සි සිතා චූලනී රජ්ජුරුවන් කෙරෙහි සිටිය චරපුරුෂයන්ට 'මේ මන්ත්‍රණය හත්වූ පරිද්දෙන් කියා එවත්වයි හසුන් යැවූසේක. නැවත ඔව්හු කියා එවන්නාහු "අපිත් එහි තත්ත්වය නොදනුම්හ; කෙවට්ටයෝ රජ්ජුරුවන් හා මාලිගාවේ ඉතුම්ලේ ශ්‍රීයහන් ගබඩාවේ හිඳ මන්ත්‍රණයක් කළහ. රජ්ජුරුවන්ගේ යාන බලන සැළලිහිණියක් ඇත, ඕ නොමේ එහි තත්ත්වය ඉදුරා දන්නීය"සි නැවත කියා යවූහ. ඒ අසා බොධිසත්වයන් වහන්සේ සිතනසේක් 'යම්සේ සැපුරන්ට අවකාශයෙක් නොපෙනේද එබැවින් මා විසින් සුරක්ෂිත

කොට රක්නාලද මේ නුවර මේ දුෂ්ටවූ කෙවට්ටයාට නොපාම්'සි සිතා නුවර මහවාසල පවින් රජගෙයි දොරකඩ දක්වාද එතැන් පටන් තමන් වහන්සේගේ දොරකඩ දක්වාද ඇතුළු වීථි මාර්ග දෙපාර්ශ්වයෙහි බට පැලලි හදවා මුදුනෙහිත් පැදුරු වැදවා සිත්තම් කරවා බිම සුදුවැලි ලවා පස්වණ්ණ මල් ඉස්වා දෙපාර්ශ්වයෙහි පුන්කලස් හා මාරුක්මල් තබා කෙහෙල් ගස් බඳවා ධජ තංවා සරහාලූසේක. සෙවට්ටයාත් ඒ නුවරට වන්නේ නුවර ගෙවල් ආදිවූ භය ඉදුරා නොදැක 'රජහු විසින් මා එන්නාවූ මහුල් පිණිස සරහන ලද්දේවනැ'සි සිතිය. ඒ බමුණු තමාට නුවර නොපානා පිණිස කළ නියාව නොදන්නේය. සෙවට්ටයාත් සරහනලද වීථියෙන් ගොස් රජපුරුවන් දැක, ගෙනා පඬුරු පාවාදී මිපුරු කථාකොට එකත්පස්ව හිඳ රජහු විසින් කරනලද සත්කාර සම්මාන විඳ තමා ආ කාරණය කියන්නේ මහ රජ! අපගේ රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ හා ඥති සම්බන්ධයෙන් අනිඝයින් හිතමිත්‍රව හිඳිනා කැමැතිසේක, අනඹිවූ රුවන් ආදිවූ පාක්කුඩම් එවූසේක, මිහිරිවූ ප්‍රියහෙපුල් දන්නා දූතයෝ එරටින් මෙහි එත්වා, යම් බසක් ප්‍රිය මනාප නම් එසේවූ මෘදු හෙපුල් කියත්වා, පඤ්චාලයෝද වීදෙහයෝද යන දෙපක්ෂය එක්වෙත්වා, මෙසේද කියා නැවත කියන්නේ "යම් යම් බසෙක් සහෙතාෂයට කාරණා වීනම් ඔවුනොවුන්ට එසේවූ ප්‍රිය හෙපුල් කියත්වා, කුමක් නිසාදයත්? පඤ්චාලදෙශයෙහි රජ්ජුරුවන් හා වෙදෙහ රජ්ජුරුවන් හා දෙදෙන ආවාහ විවාහයෙන් එකාත්මිකවූ ඔවුනොවුන් හෙරෙහි සතුටුව වසන්නාහ; එබැවින් අවමතුල් වචනයක් නොකියා, මඩගල සන්නිශ්‍රිතවූ බසක්ම කියත්වා"සි කියා නැවත කියන්නේ "හවත් ඒ මතු නොවෙයි, තමන්ගේ දූ රුවන හා උතුම් උතුම් මාහැඟි රුවන් එවන සේක; මෙවක් පටන් දෙරටින් ඔවුනොවුන්ට පාක්කුඩම් ගෙන මිහිරිවූ ප්‍රිය හෙපුල් දන්නා දූතයෝ මොඹින් ඔබ යෙත්වා, ඔඹින් මොබ එත්වා මේ දෙරට සබඳකිවූ නියාව කුමක්වැනිදයත්? ගංගානම් ගඟ දිය හා යමුනා නම් ගඟ දිය එක්වූ කලක් පරිද්දෙන් ඔවුනොවුන් එක්සිත්ව සමගිව සහෙතාෂව වෙසෙත්වා"සි කීය. මෙසේද කියා නැවත කියන්නේ "අපගේ රජ්ජුරුවන්වහන්සේ අනික් මහා අමාත්‍යයකු එවනු කැමැතිවත් අනික් හෙතෙක් මේ මඩගල වචනය සිත්ගෙන ඉදුරා කියාලන්නට අසමර්ථය"සි සිතා මට කියනසේක්. 'ආචාර්‍යයෙනි! තෙපිම ගොස් මේ මහුල් කියා රජ්ජුරුවන් සහපත්කොට සතුටුකරවා කැඳවාගෙන එව'සි කීසේක. එබැවින් රාජෝත්තමයාණන්වහන්ස! වහා වැඩිය මැනව; ඔබ හියාවූ නුඹවහන්සේට වැඩදෙකෙක් වන්නේය. ඒ කවරේදයත්? "අසමාන රූ ඇති කුමාරිකාවන්ට ලබනසේක, අපගේ රජ්ජුරුවන් හා සමාන මෛත්‍රී සිතත් අධික වන්නේය"සි කීය.

රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා සතුටුව 'උතුම්වූ රූ ඇති කුමාරිකාව ලැබේය'සි ඇසූ බස් ප්‍රමාණකිම්ම බැඳී ගොස් නැවත කියන්නාහු "ආචාර්‍යයෙනි! නොපෙ හා මෛත්‍රෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා ධර්ම යුද්ධයෙහි පළවූ වාදයෙක් වූයේවේද? යව මපුතණුවන් දකුව, නොපෙ දෙදෙනාම පණ්ඩිත වරුන් බැවින් ඔවුනොවුන් ක්ෂමාකරවා ප්‍රිය කථාකොට එව"සි කීහ. ඒ අසා කෙවට්ටනම් බ්‍රාහ්මණයේ 'යහපත පණ්ඩිතයන් දකිම්'සි ඔබ දක්නා

විණිස යන්නට නමාගත; බොධිසත්ත්වයන්වහන්සේද එදවස් උදැසන' ඒ පවිටා හා මාණවක්ව කථාවෙක් නොවේව' යි සිතා උදැසනම් තමන්ගේ ඔසට කැප විණිස එළඟිතෙල් සුහක් අනුභවකොට ගෙයි ගොම් පිරිබඳ ගාවනසේක් දැහුල් බොල ඇතිබොට ගාවා මිදුණු තෙල් කප්වල ගාවා ඛොධිසත්ත්වයන් වහන්සේ වැදගෝනා එක් පවු හැදක් පමණ තබා සෙසු ඇඳ පුටු ආදිය ගෙන් පිටත් කරවූ ස්ක. නැවත සිරියවුන්ට ඕධාන කරනසේක් "බමුණ මා හා කථාවට ආරම්භකළ කල බමුණ! පණ්ඩිතයන්වහන්සේ හා නොදෙඩව; අද බෙහෙත් තෙලක් අනුභවකළසේකැ'යි ඔහු නවතා මාත් දෙඩින්නට වන් කල්හි "සවාමීනි! බෙහෙත් තෙලක් වැළඳූ සේක් වේද? නොදෙඩා වදාළ මැනැවැයි කියව"යි විධානකොට රතක් පොරවාගෙන සත්වන දොර ටුවේ යටි මාලේ පටු හැඳ වැදහොත් සේක.

කෙවටටයාත් පළමුවන දොරකඩට අවුත් රැකවලුන්ට 'පණ්ඩිතයෝ කොයිදැ'යි කිය. සිටියෝ කියන්නෝ "බමුණ මහත්කොට නොදෙඩා අරගල නොකොට බැණ නොනැගී ගොළුවකුසේ කරබාගෙන නැගී වර, අද අපගේ සවාමි බෙහෙත් තෙලක් වැළඳූසේක එබැවින් මහත්කොට දෙඩීම් හා අරගල කිරීම් නොකැමැත්තේය"යි කිහ. සෙසු දොරටුවල සිටියානුත් එපරිද්දෙන්ම කිහ. බමුණු මුවෙන් නොබැණ කරබාගෙන සත්වන දොර ටුව ගෙවා බොධිසත්ත්වයන් සමීපයට ගියේය.

බොධිසත්ත්වයන්වහන්සේ ඒ ගිය බමුණා හා කථාවට ආරම්භ දැක්වූ සේක. ළඟ සිටියානු "සවාමීනි! ඉතා සූක්ෂමවූ තෙලක් වළඳන ලද්දේ වේද එබැවින් මේ දුෂ්ටවූ බ්‍රාහ්මණයා හා කථාවෙන් ප්‍රයොජන කිම්දැ"යි කියා නැවතුහ. කෙවටටයා බොධිසත්ත්වයන්වහන්සේ සමීපයෙහි හිඳිනා ආසන යක්වත් වැනිරගෙන සිටිනා ආධාරයක්වත් බොධිසත්ත්වයන්වහන්සේගෙන් මිහිරි කථා මාත්‍රයක්වත් නොලදින්, වැසි සමයෙහි ගවරිපිරි ගොවුදකට වන්ගොන් ළිමාල්ලකු සේ බොල් ගොම ඇතිලි අසුවලින් පලව පලවා, මිරි මිරියේ ඒ පසින් ඒ පය ලලා මිරිකමින් සිටියේය. ඒ සිටියාවූ බමුණා මුණ බලා එකෙක් තමාගේ නුවන කසාලීය. එකෙක් තමාගේ බැම උඩනහාලීය. එකෙක් තමාගේ වැලමිට කසාලීය. බමුණු ඔවුන්ගේ මේ ක්‍රියාව දැක ඉතා කරුව ඇත් මැත් බලන්නේ, 'පණ්ඩිතයෙනි! අපි යම්හ"යි කියා අතිසාකු විසින් "කොල අරිටු බමුණ! නොදෙඩව'යි කියදිත් දෙඩදෙඩාම සිටියොහොත්ද? දැන් නොපගේ ඇට බැට තළා පියම්හ"යි කී කල්හි හසින් ත්‍රස්තව නැවත පිටපස්ස බැලීය. ඉක්බිති එසේ බැලූ බමුණාට එකෙක් හුණපත්තෙන් පිටට පහරක් ගැසිය. එකෙක් 'යෙසිද නොයෙසිද'යි කියා කර අල්වාගෙන දැමිය, එකෙක් දිවමින් ගොස් පිටිදූ මැද අතුල් පහරක් ගැසිය, ඒ තෙමේ දිවීයකු කටින් ගැලවුණු මුව මාල්ලකු මෙන් හසින් තැතිගෙන වෙව්ල වෙව්ලා දිවන්නේ දුකසේ ගොස් රජගෙට පැමිණියේය.

රජපුරුවෝත් 'ම පුතණුවෝ අද මාගේ විවාමහුල් අසා අතිශයින් සතුටු වන්නාහ, නවද පණ්ඩිතවරුන් දෙදෙනාගේ ධර්මයෙන් යුක්තවූ කථා වකුත් වන්නේය, අද දෙදෙනා ඔවු නොවුන් ක්ෂමාකාරවා ගන්නාහ; එබැ මින් මට වූයේ මහත් ලාභයෙකැ"යි සිත සිතා උන්නාහ; එවේලෙහි ආන ආනා අවුත් එතැනට වන් කෙවටටයා දැක දෙදෙනා ඔවුනොවුන් දැක කළ කථා සංසඳනය විවාරන්නාහු මේ ගාථාවෙන් කිහ.

කථාහනු කෙවටට! මහොසධෙන, සමාගමෝ ආයි තදිඝස බ්‍රූහි,
කච්චි හෙ පටිනිජ්ඣතෙතා, කච්චි තුයෝ මහොසධෝ-ති-

මේ ගාථාවෙන් රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද කෙවටට පණ්ඩිත යෙනි! මහෞෂධ පණ්ඩිතයන් හා තොප හා එදවස් ධර්ම යුද්ධයෙහිදී වූ සාණස් සල්ල හැර සමාකාරවා ගතුද? නැවත තොප දෙදෙනාගේ මිහිරි කථා නෙසේ විද? තොපගේ රජ්ජුරුවන් කියා එවූ විවාමතුල් අසා මපුතණුවෝ සතුටුවූද? ඒ මට නොවලහා හත්වූ පරිද්දෙන් කියව"යි කිහ ඒ අසා නෙවටටයා කියන්නේ:-

අනරිය රූපෝ පුරිසෝ ජනින්ද අසමෙමාදසෝ ථඩෝ අසබ්භි රූපෝ,
යථා ච්‍ඡගොව බධිරෝව න කිඤ්චාපීං අභාසථා-ති-

මේ ගාථාවෙන් කිය.

"ජනප්‍රධාන රජ්ජුරුවන්වහන්ස! ඒ මහෞෂධ පණ්ඩිතයා තම් අනාර්‍යයි සවරූප ඇති සාධු ගුණයක් නැති ඉතා තද එකෙක, සවභාවයෙන්ම ඉටා තද එකෙක, අසත්පුරුෂයෙක, ගොළුවකුසේ බසකුත් නොකියේය, බිරකු මෙන් මාගෙන් බසකුත් නොඇසුසේය; ඒ පණ්ඩිතයා නුඹවහන්සේ වම තරම, ඔහු තරම් දෝනයෙක් මනුෂ්‍යයන් කෙරෙහි එනද කෙනෙක් නැහැ"යි ඉහා දෙවමිලවූ බමුණුමාලු තමා කවට ආවක්ම කියේය. තමා කෑ නෙඳි බැටයෙහි නමකුත් නොකියේය. (හන්දරුවා සෑ බැටනම් තමා මේයයි සිතමි. එහෙයින්) තමා ලත් අවමානය නමකුත් නොකියා මහා ණන්ගේ නුගුණම කිය. රජ්ජුරුවෝ තුටුද නොවී විරුඬයකුදු නොකියා සෙවටටයා හා කැටිව ආවුන්ට බත් වියදම් දී නවාතැන් ලවා යව ආවායි යෙනි! සැහපි ගනුවයි කිහ. ඔහු යවා ඉක්බිති රජ්ජුරුවෝ සිතන්නාහු "මපු තණුවෝ ඉතා නුවණැත්තාහ, ප්‍රිය තෙපුල් ඇත්තාවූ කෙනෙක, මේ බමුණා හා සාථාවකුත් නොකළාහ, දූත සතුටු පමණකුත් නොවූහ. කිමෙක්ද? මොහු ආගමනේ මතු වන්හාවූ භයක් මපුතණුවන් දුටුදෙහෝසි සිතමි; එබැවින් මේ සෙවටටයා ආ ගමන අපට වැඩක් හා අභිවෘඬියක් නිසා නොවෙයි, සරණ දෙම්හයි සාමයෙන් පොලඹවා ඔබ ගෙන්වා ගෙන මරන පිණිස මා කැඳවා ආවහයි සිතමි; ඒ බව දූනලා වන, මපුතණුවන් ඕහට කිසිවකුත් නොකියේය"යි සිතා භය ගෙන හුන් කල්හි සෙනකාදි ප්‍රභූ සමූ දායෝ සහරදෙන ආහ.

සෙනකයාට රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද සෙනකය! උත්තර පඤ්චාලයට ගොස් වුලනී රජ්ජුරුවන්ගේ දූවණියන් ගෙනෙමෝද? ඒ ගමන තෙපි ඇම කැමැත්තෝදැ"යි විවාළහ. ඉක්බිති සෙනකයා කියන්නේ "මහරජ! කුමක් කියන සේක්ද? තමා කරා එන ශ්‍රී සන්නාව ගසා දුරුකරන කෙනෙක් ඇද්ද, ඉදින් ඔබවහන්සේ ඔබ ගොස් ඒ කුමාරිකාව ගෙනා සේක් වීනම් ඛ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හැර සියලු දඹදිවම නුඹවහන්සේ හා සමාන රජෙක් නැත්තේය. ඒ කුමක් පිණිසදයත්? නාගක රජ්ජුරුවන්ගේ දූවණියන් රැකගෙන එයිනි. නාවද ඒ රජ්ජුරුවෝ සිතනකල සෙසු රජදරුවෝ තම් මාගේ සෙවකයෝය. මා හා සමානයෝ නැම් එකම වෙදෙහ රජ්ජුරුවෝය"යි සිතා දඹදිව සියලු සන්ධාන්ට වඩනා රූ ඇති දූවණියන් නුඹ වහන්සේට දෙන්නාහ. නුඹවහන්සේට වන්නේ මහත්

අභිවාඩියෙන, යම් කිසි කෙනෙක් නුවණ මැදව ඊට බාධා කෙරෙත් නම් ඊට කිසි සැකයක් නොකොට වැඩිය මැනවැ; අපිත් නුඹවහන්සේ හා ගියහොත් වස්ත්‍රාභරණ අන්නපානාදියෙන් සංග්‍රහ ලබන්නෙමු”යි කෙවිටයාව නොඅඩුවූ ගුණ ඇති ඉතා දැඩිමිලුවූ තුණවිකු සවභාවයෙන් ඉතා ලොකුවූ සෙනහ නම් බමුණුතෙමේ රජහු අභිශයින් පොලඹවා ගිවිස්නා පරිදෙන් සිතට නහා කිහ. පුක්කුසාදී සෙසු පණ්ඩිතවරුන් විවාළ කල ඔහුත් එලෙ සම කිව්ය. ඔවුන් හා සමග කථාකරමින් උන්තැනට කෙවිටයා තමා නුන් නැතින් අවුත් ‘මහරජ! අප රදන්නට නොපිළිවන යම්හ’යි කිහ. රජ්ජුරුවෝ ඔහට සත්කාර්‍යකොට යවූහ.

බොධිසත්ත්වයන්වහන්සේ ඔහු ගිය බව දැන නහා සැරසි රාජසෙවයට අවුත් රජ්ජුරුවන් වැඳ එකත්පස්ව උන්සේක. රජ්ජුරුවෝ සිතන්නාහු “මපුතණුවෝ මහා මන්ත්‍රීය, සියලු මන්ත්‍රණයෙහි පාරප්‍රාප්තය; අනාගතප්‍රත්‍යුත්පන්න යන තුන්කල්හි වන්නාවූ අර්ථයන් පරොපදෙස රහිතව සවයම්භූඥනයෙන් මනාකොට දන්නාහ. එබැවින් අප ඔබ යන ගමනේ යහපත නපුර මේ පණ්ඩිතයෝ දනිති”යි සිතා තමන් පළමු සිතූ ලෙස නොරැඳ රාගයෙන් මත්ව මොහයෙන් මුසව විචාරන්නාහු මේ ගාථාවෙන් කියත්.

ඡන්නංගි එකාව මතී සවෙති, යෙ ඉණ්ඩිතා උත්තම භූරිපඤ්ඤා;
යානං අයානං අථාවාපි යානං, මහොසධෝ තම්පි මතිං කරෙහි.

පුන මහොෂධ පණ්ඩිතයෙනි! “සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය, කෙවිටය, වෙදෙහය, යන අප සදෙනාගේ අදහස් උත්තර පඤ්චාල දෙශයට බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ දුවණියන් ගෙනෙන්නට යාම යහපතැ”යි එක්වූ නියාව ගඛොදකය හා යමු නොදකය හා වෙනසක් නැතිවූවාක් මෙන්ය. මහොෂධ පණ්ඩිතයෙනි! තෙපිත් කියව; ඔබ යාමවත් නොගොස් රැඳීමවත් යහපත නපුර යන මේ දෙකින් එකක් නොපගේ සූක්ෂ්මවූ ප්‍රඥාවෙන් මනාකොට සිතාලා කියව, ‘ඔබ යමෝද නොයමෝදැ”යි කිහ. ඒ අසා මහතාණෝ සිතන සේක් “මේ රජ තමා නුවණ මදංගෙයින් මුන් සතරදෙනාගේ බස් ගිවිස නුවණින් අඩව කාමයෙහි ගිජුව එකාන්ත යෙන්ම යන්නේය, ගොස් මහා විනාශයට පැමිණෙන්නේය, ගමනෙහි දොෂ කියා නවතිත් නම් නවතාලම්”යි සිතා මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් පඤ්චප්‍රකාර බලයෙන් යුක්ත නියාව නොදන්නා සේක්ද? පළමුත් තමන් මේ නුවරට අවුත් පැරද පලාගිය හෙයින් ලජ්ජා පසිඳ ගන්නා පිණිස ‘දුව සරණ දෙමි’යි ඔබ නෙන්වා දැල මුවකු අසුවූ කල වැද්දකුසේ තමන් කැමැත්තක් කරනි’යි සිතම්, නවද ඇම කෙරේ ගිජුවූ මත්ස්‍යයා ඇට තුඩු බිලිය නොදැක ගැලපියා නස්නා පරිදෙන් කාමයෙහි ගිජුවූ ඉදින් පඤ්චාල දෙශයට ගිය සේක් වීනම් ඒ බිලිය ගිලූ මත්ස්‍යයා පරිදෙන් වහා නස්නා සේක. නවද පණ හසුවූ මුවකු පරිදෙන් මහත්වූ විනාශයෙහි පැමිණෙන සේක. එබැවින් ‘ඇහ යන ගමන මම නොකැමැත්තෙමි”යි වදාරන සේක්:-

ජානාසි ඛො රාජ! මහානුභාවො, විහඞ්ගමො චුල්ලනි බ්‍රහ්මදත්තො;
රාජාව තං ඉච්ඡති කාරණත්ථං, මිගං යථා ඔකවරෙන ලුද්දො.

ඇථාපි මච්ඡා බලිසං වඩ්ඨං මංසෙන ඡාදිතං
කාමගිද්ධෝ න ජානාසි මච්ඡාව මරණ මත්තනෝ.

එවමෙව තුවං රාජ චූළනී යස්ස ධීතරී
කාමගිද්ධෝ න ජානාසි මච්ඡාව මරණ මත්තනෝ.

සචෙ ගච්ඡසි පඤ්චාලං, ඛිපමත්තනං ජහිස්සසි
මිගං පඨානුපත්තංව, මහන්තං භයමෙස්සසි'යි–

ගාථාසතරකින් වදාළ කල්හි නුවණ නැති රජ එබස් අසා නුවණින් සලකා ගතනොහි 'තමන්ට හෙලා දෙඩුව'යි සිතා "මේ තමාගේ දූසයකුත් කොව" සිතා රජ්ජුරුවෝය'යි මදකුත් නොතකා දඹදිවට අග්‍රවූ රජ්ජුරුවන් "තමන්ගේ ළෙඟිදූ දුවණියන් සරණ දෙමි"යි කියා තමන්ගේ දූතයන් එවූ නියාව දැන දැනම, මඟුලට නිසි එන බසකුත් නොකියා මා කෙළතොලුවකුසේද, බිලියක් ගිලූ මසකුසේද, පණ හසුවූ මුවකුසේද, මහත්වූ භයට හා මරණයට පැමිණෙ"යි කියයි කිපී මඟුලට නිසි කථා දන්නෝනම් සෙන කාදි පණ්ඩිතවරු සතරදෙනා හා කෙවටට පණ්ඩිතයෝය; තා නිමුත්මිට එලිගෙන සිසා කන ගොවියා පුතු අතින් මේසා උතුම් මංගල වචන විචාලාවූ අපිම නුවණ නැති කෙළතොල්ලම්හ"යි බොධිසත්ත්වයන් වහන්සේට නොයෙක් පරිද්දෙන් නින්දා පරිභව බැණපියා "මේ ගොවියා පුතු මෙතැනින් පිටත ලවයි" නියොගකරන්නාහු "මාගේ මේ නියා සත්‍රිරතන ලාභයාගේ අන්තරායට සූදුසු බස් කිවාවූ මොහුගේ කර අල්වාගෙන මාගේ විජිතයෙන් පිටත ලව"යි කිහ.

බොධිසත්ත්වයන්වහන්සේ රජහු කිපි බව දැන සිතන සේක් ඉදින් මෙහි යමෙක් නුවණ නැති රජුගේ බස් ගෙන මා අතවත් කරවත් ඇල්වූයේ වීනම් මා දිවිහිමියෙන් ලජ්ජාවට එම සැහෙන්නේය; එබැවින් මම්ම යෙමි'යි සිතා හුනස්නෙන් නැඟී රජහු වැඳ තමන්වහන්සේගේ ගෙට ගියසේක. රජ්ජුරුවෝත් කිපී බස් කී බව මුත් බොධිසත්ත්වයන් කෙරෙහි ගෞරවයෙන් එකක් හිටි තුලු ගසව පිටත ලව'යි නොකිහ. එසේ හෙයින් තම තමන් මූණු බලා එකක්හට නොකී හෙයින් බොධිසත්ත්වයන් ළඟට ගිය එකද කෙනෙක් නැත්තාහ. ඒ එසේමැයි. රජගෙයි වසන්නවුන් විසින් රජහු යමක්හට කිපී 'තුලු ගසව මරව පිටත ලව'යි සාමාන්‍යයෙන් කී කල්හි සිටියවුන් එබස් අසා සිටියෙන් නොසිඟිලි රජහු මූහුණ යටසින් බල බලා සිටියවුන් අතක් නොදෙල්විය යුතුය. එකකු මූහුණබලා කී කල ඒ නියොගලද්දහු මුත් අනිකක්හු කිසිවකුත් නොකටයුතුය. ඒ නියොගය ලද්දහු තබා අනිකෙක් නොමේව රෙහි මේවර කෙළේ නම්, අෑට කළමනා නිග්‍රහ වරදවා කළ නැනැත්තේ විදහන්නේය; එබැවින් රජහු එහෙක්හට චෝරා නොකී හෙයින් බොධිසත්ත්වයන් ළඟට ගොස් සෙසු නිග්‍රහ තබා 'පිටත ගිය මැනව'යි යන බසක් පමණකුදු කී එසේද සත්‍රියකුත් නැත්තේ විය.

ඉක්බිති බොධිසත්ත්වයන්වහන්සේ සිතන සේක් "රජ්ජුරුවෝ නුවණ නැතිව හිතයන් අහිතයන් නොදැන කාමයෙහි ගිජුව බ්‍රහ්මදත්තයන්ගේ දුව ලබන්නෙම්යයි සිතා මතු වන භය නොදැන ගොස් මහා විනාශයට පැමිණෙන්නාහ; එබැවින් මට බොහෝ යශද කාවූ උපකාරව සිටි රජ්ජුරුවන්ගේ

බස් සිත තිබීම මට තරම් නොවෙයි, මා විසින් මේ‍ාහට පිටිවහල් විය යුතු ය”යි සිතා ‘පළමුකොට නිරවාණන් යවා තමය දැන පසුව මම යන්නෙමි’යි සිතා ඒ නුවරට නිරවාණන් යවූසේක. (පණ්ඩිතයන්වහන්සේ නිරවාණන් යවා තත්වූ පරිදි දත් නියාව බුදුව වැඩහිඳ වදාරන මාහේ සැමිදරුවූ නිලෝ‍ගුරු බුදුරජාණන්වහන්සේ:—

තතෝ ච සෝ අපක්කම්ම, වෙදෙහස්ස උපන්තිකා
අථ අමාත්‍යයි දූතං, මාසරං සුවපණ්ඩිතං.

එහි සම්ම! හරිපක්ඛ, වෙය්‍යාවච්චං කාරෙහි මේ
අත්ථි පඤ්චාල රාජස්ස, සාළිකා සයනපාලිකා

තං පඤ්හෙන පුච්ඡයසු, සාහි සබ්බස්ස කොවිදා
සා වෙ සබ්බං පජානාති, රඤ්ඤෝ ච කොසියස්ස ච.

ආමෙති සෝ පටිස්සුත්වා, මාසරෝ සුවපණ්ඩිතෝ
අගමාසි හරිපක්ඛෝ, සාළිකාය උපන්තිකං

තතෝ ච සෝ ඛෝ ගන්ත්වාන, මාසරෝ සුවපණ්ඩිතෝ
අථ අමාත්‍යයි දූතෝ, සාලිකං මඤ්ජුභාණිකං.

කච්චි ඤරෙ ඛමනීයං, කච්චි.වෙස්ස අනාමයං
කච්චි තෙ මධුනා ලාජා, ලබ්භරෙ සුඤරෙ තව.

කුසලසෙව මෙ සම්ම! අනාමය මථෝ මම
අථෝ මෙ මධුනා ලාජා, ලබ්භතෙ සුවපණ්ඩිත!.

කුහොනු සම්ම! ආගම්ම, කස්සවා පහිතෝ තුවං
නව මෙ‘සි ඉතෝ පුබ්බෙ, දිඨෝ වා යදිවා සුතෝ–සි.

මේ ගාථාවන්ගෙන් වදාරන සේක් එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහ රජ්ජුගෙන් උදහස් අසා තමාගේ ගෙට ගියාහු තමන් වැඩූ මාසර ගොත්‍රයෙහි උපන් ගිරුපැටවාණන් කැඳවා ඔහට දූත මෙහෙවර කියා යවන්නාහු ‘රන්වන්වූ පඤ්චවයක් ඇති සබඳ ගිරුපණ්ඩිතයෙනි! මෙසේ එව; තොප විසින් මට කළමනා මෙහෙවරෙක් ඇතැ’යි කිහ. ගිරවාණෝ එබස් අසමින් තමන් හුන් රන්මැදිරියෙන් බිටත්ව මහාසනෙහාශයට පැමිණ තමන් දෙපියාමුදුනේ තබා වැඳ එකත්පස්ව සිට කී යම් මෙහෙවරක් කොට දීලමි, සැකනොකොට වදාළ මැනව”යි. කිහ. ඒ අසා පණ්ඩිතයන්වහන්සේ වදාරනසේක් මාසර ගොත්‍රයෙහි උපන් ගිරු පැටවාණෙනි! කෙවටට බ්‍රාහ්මණයා හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා දෙදෙනා ‘සරණ දෙම්හ’යි කළ කථාව රහස හෙයින් ‘සැබෑද බොරුදැයි තජහුගේ ඇත්ත බල්න ඕළලිහිණිය හා විශ්වාසව ඇ අතින් තත්වූ පරිද්දෙන් විවාරා දැනගෙන වහා අවුත් මට කිය ව”යි කියාලා මී හා විලඳ කවා මී පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් ඳෙපියා අතර මැඬිකල්හි ඉතා සියුම්වූ නුවණැති ගිරවාණෝ අසාගත් මෙහෙවර ඉදුරා සිත තබාගෙන මහතාණන් තුන් විටක් පැදකුණුකොට වැඳලා මාලිගාවේ මතුමාලේ හරුනලද සීමැදුරු කවුළුවෙන් නික්මුණාහු වාත වෙග යෙන් සිව් රට දිශාවට මුණලා නික්ම ගොස් එහි පවත් සිත තබා ගෙන

සැළලිහිණිය සමීපයට ගියාහ. ඒ කෙසේද යත්? ගිරවාණෝ ගොසින් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මාලිගාවේ රන්කොත් කැරැල්ල මුදුනේ හුන්නාහු මධුරස්වරයෙන් රාගතීව්‍රත අසින් ඇඬුහ. ඒ කුමක් පිණිසද යත්? සැළලිහිණිය කවර මාලෙක කවර ශබ්ධාවේක බවත් නොදනිමි. "මේ මාගේ ශබ්දය අසා මට ප්‍රතිවචනදී නොමෝන් හඬයි, ඒ සලකුණෙන් ඇ සමීපයට යෙමි"යි සිතා ඇඬුහ; ඔසුත් ඒ ශබ්දය අසා ඒ රජ්ජුගේ ශ්‍රී යහන් සමීපයේ රන්කැඳිරියේ උන් තැනැත්තී රාගයෙන් මත්වූ සිත් ඇත්තී පිට පිට තුන් අඩක් ඇඬිය. ගිරවාණෝ මදක් ගොසින් නැවත නැවත ශබ්දය අසා ඒ අනුසාරයෙන් කුමයෙන් ගොස් සිමැදුරු කවුළුවේ එලිපහ පිට හිඳ ගෙයි මිනිසුන් ඇත්ත නැත්ත පරීක්ෂාකොට නැතියේ දැන ඇ සමීපයට ගියාහ.

මෙසේ හෙළේ කුමක් පිණිසද යත්? "මේ සඬලොකයෙහි සත්‍රීන් නිසා ගොස් ඇත තොල්මිටි බිඳවාගෙන මහා පීඩාවට පැමිණෙන්නාහු ඇත; ඉදින් මේ ගෙයි යමෙක් මා දුටුයේවිනම් මටත් අවවාදයක් හෙළේනම් නපුරැ"යි සිතා එසේ පරීක්ෂා කළහ. නැවත සැළලිහිණිය 'සබඳ! මෙසේ අවුත් රන්මැදිරියේ හිඳිනැ'යි කිව. ගිරවාණෝ මැදිරියට වැද සැළලිහිණියයි බැණවූහ. කිමෙක්ද සඬමීනි! කිව. කිමෙක්ද තොප මේ රන් මැදිරියේ වසන්න වුන්ට දෙම්නසෙක් නැද්ද? මී හා විලඳ සුවසේ ලැබේදැ'සි විවාළහ. තොමෝත් කියන්නී 'මා මෙහි වසන්නියට ඉතා සැපය, දෙම්නසෙකුත් නැත, විලඳ හා මී සුවසේ ලැබෙයි, යහළුව! තෙපි නොයි සිට අවුද? කවරකුගේ බසට හෝ ආයෙනිදැ'සි කිව. ගිරවාණෝ ඇ කී බස් අසා 'ඉදින් මම මියුලු නුවර සිට ආ කිම් නම් තමා පණයේ නමුත් සමාගමයක් නොවන්නේය'සි සිවිදෙස යෙහි අරිඤ්ඤපුරය සඳහන්කොට ඔබ සිට ආ කියා සිවිරජ්ජුරුවන් එවිවා කොට බොරු ගොහාගෙන කියන්නාහු:—

අහොසිං සිවිරාජස්ස, පාසාදෙ සයනපාලකො
තතො සො ධම්මිකො රාජා, ඛැඩෙ මොවෙසි බන්ධනා.

යනමේ ගාථාවෙන් 'සොඳුර! මම වැළිත් එසේ මෙසේ හෙනෙක් නොවේමි; සිවි රජ්ජුරුවන්ගේ යාන බලන්නාවූ ගිරවෙකිමි; අපගේ රජ්ජුරුවෝ ඉතා ධර්මිෂ්ඨ කෙනෙක, එසේ හෙයින් දහගෙයි හිඳිනා මනුෂ්‍යයන්ද මැදිරිවල හිඳිනා පක්ෂීන්ද හරවනසේක්, මාත් රන්මැදිරියෙන් හැරි සේක; මම මා කැමැති තැනක ඇවිද ගොඳුරු කා අවුත් දවස් පතා මාගේ රන් මැදිරියේ වෙසෙමි; තොපසේම මැදිරියෙන් පිටත් නොවී ඇතුළු මැදිරියේ හිඳිනෙමි නොවෙමි"යි කිහ. එසේ කී ගිරවාණන්ට සැළලිහිණී තමාට රන් මැදිරියෙහි ලා තුබූ විලඳ කවා මීපැන් පොවා අනතයෙහි කියන්නී 'සබඳ! තෝ ඉතා දුරසිට ආයෙහිය, කුමක් පිණිස අවුදැ'සි කිව, ගිරවාණෝ ඇගේ බස් අසා සිතන්නාහු මේ ලොව බොරුවක් නොකියා බොරු සිතාවක් නොකොට සත්‍රීන් නම් සිත්හත නොහැක්ක; එබැවින් බොරුවක් කියා ඇ නම්මා නෙතා රහස් විවාරා ගනිමි, සිතා කියන්නාහු:=

තස්‍ස මෙකා දූතිකා'ඝි, සාළිකා ම ඤ්ඤහාණිකා
තං තත්‍ර අවධි සෙනෝ, පෙක්ඛතො සුසරෙ මමං'සි.

මේ ගාථාවෙන් එම්බා සොඳුර! තොපගේ කුලෙහිම වූ මාගේ පළමු ඇඹෙනි යෙනෙක් වූවා, උයින් එසේ මෙසේ සොඳනක් නොවන්නාහ; පුරුෂයන් සිත් ගන්නා හැරම් ළඳ බොලඳ මිහිරි ප්‍රිය තෙපුල් දන්නාහ; මාගේ ඇසට රසායනයක් හා සමානවූ ඒ මාගේ භායර්‍යාව මා බලා බලා සිටියදී මා අස් හමුවේ උකුස්සෙක් අල්වාගෙන මරාවියා පලා ගියේය"යි කිහ. එවේ කී කල්හි සැළලිහිණි ටිවාරන්නී 'තොපගේ අඹුවන් උකුස්සා කෙසේ මරාවියා ඇරගෙන ගියේදැ"යි කිව. ගිරවාණෝ ඇ ඩිතව් නැතෙන පරිද්දෙන් බොරු ගොතා කියන්නාහු "එක් දවසක් අපගේ රජ්ජුරුවෝ දියසෙල්ලියට යන්නාහු මාත් කැඳවූසේක. මම මාගේ අඹුවන් කැඳවාගෙන ගොඩින් දිය කෙළපියා සවස රජ්ජුරුවන් හා සමඟ අවුත් ඕලිහාවට් නැඟී ඇත දිය වියලා ගන්නා පිණිස මාගේ බිරින්ද කැඳවාගෙන සිමැදුර කවුළුවෙන් නික්මිලා පිවත කුටාගාර කුක්ෂියෙහි කොබෝ ගෙඩි වළල්ලෙහි උන්නෙමි, ඒ ඇඩිල්ලෙහි උකුස්සෙක් කුළුගෙය ආසින් යන්නේ අප අල්වාගන්නට දිවිය; මම මරණ භයින් තැනිගෙන වහා දිවපිම්; උන් දැරි ඇති නෙසින් බඩ බරව් වහා යානුහුණුවාහ; එවිට මා බල බලා සිටියදීම අල්වාගෙන මරාවියා ඇරගෙන ගියේය, උන් කෙරෙහි ශොකයෙන් හඬන්නාවූ මා දැක, අපගේ රජ්ජුරුවන්වහන්සේ "සබඳ! කුමට හඬාදැ"යි විචාරා ඒ බව අසා 'සබඳ නොහඬව, අනික් බිරින්දක් සොයා යව'යි කිහ.

"එබසට මම කියන්නෙම් 'සත්‍රිහු නම් බොහෝසේ අනාචාර ශීලිහුය; එසේ අනාචාර දුස්සීල එකියක ගෙන රිමට වඩා උදකලාව විසීම 'යහපතැ'යි කිමි. එබසට කියනසේක් තොපහේ ඇඹෙනියන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩනා ශීලාචාර සම්පන්න සැළලිහිණියක් චූලනි රජ්ජුරුවන්ගේ යාන බලා ඉඳිනිය; ඕ ඉතා යහපත් එකක, තෙපි වහා ඔබ ගොස් ඇගේ අදහස් පරීක්ෂා කොට පියා 'යහපත ඉඳිමි'යි ගිවිස්සි නම් ඇගෙන් අවකාශයක් ලද්දා නම් තෙපිත් කැමැත්තාහු නම් වහා අවුත් කියව, මමවත් ඕසව්වත් ගොසින් මහ පෙරහරින් ගෙනවුත් පාවා දෙන්නෙමි'යි කියා තොප සමීපයට එවූවේය. මම තොප සරණ බණවා ආමි'යි කිහ. ඉක්බිති නියන්නාහු "ඉඳින් තෙවි මා කැමැත්තා නම් වහා කියව; මා රඳන්නට නොපිළිවන; මා තෙරේ රැකෙන්නා කැමැත්තා නම් අපි දෙන්නම සමඟ වාසයෙන් එක්සිත්ව යුවසේ වසම් හ'යි සිත ඇත්ත නොවලහා කියව"යි කිහ.

උන්ගේ බස් අසා සැළලිහිණී ඉතා මහත් සොම්නසට පැමිණ තමා සතුටු බව නොහඟවා නොකැමැත්තියක මෙන් හඟවන්නී:-

සුවොව සුවිං කාමෙය්‍ය, සාළිකොපන සාළිකං
සුවස්ස සාළිකායව, සංවාසො හොති කිදිසො.-ති-

මේ ගාථාවෙන් කිහ—

මෙහි අභිප්‍රායනම්:-"ගිරපණ්ඩිතයෙනි! කුමක් කියව්ද? ගිරවෙක් රක්‍ෂා කෙරේ නම් ගිරධෙනුවක; සැළලිහිණියෙක් රක්‍ෂාකෙරේ නම් සැළලිහිණියක; ගිරවකු විසින් සැළලිහිණියක රක්‍ෂාකිරීම නම් කවර කලෙකවූවිරූ දෙයක්ද? එසේ දෙයක් මා ඇසූ විරූ දැන් නැතැ"යි කිව. ඒ අසා ගිරවාණෝ

සිතන්නාහු "දැරිය බැහැවුම් කියන බව මුත් මා නොකැමැති සැරිය නොවේ"යි සිතින් ඉතා කැමැත්තිය. නොයෙක් පරිද්දෙන් කාරණා කියා හිවිස් වාගන මැනව"යි සිතා කියන්නාහු

යා යං නාරී කාමයති, අපි චණ්ඩාලිකාමපි
සබ්බත්ථ සදිසා හොති, නත්ථි කාමේ අසාදිසෝ.

මේ ගාථාවෙන් කියන්නාහු "එම්බල! යම් ස්ත්‍රියක් යම් පුරුෂයෙක් හෙමේ කැමැත්තේ නම් චණ්ඩාල වුවත් උත්තම වුවත් ඇමදෙනම පසඳ කාමයෙන් සමයහ; ඒ විෂයෙහි අඩු වැඩියක් නැත. මනුෂ්‍යයන් විෂයෙහි පවා නොයෙක් ජාති වෙන වෙන ඇතත් ප්‍රමාණ නම් කාම වෙතනාවමය"යි අහවන්නාහු.

අත්ථි ජම්බාවති නාම, මාතාසිවිස්ස රාජිනෝ
සා හරියා වාසුදෙවස්ස, කණ්හස්ස මහෙසී පියාසි.

මේ ගාථාවෙන් කිහ.

"යටගිය දවස **බාරවති නුවර** රජකළ කෘෂ්ණ යන ගොත්‍රයෙහි උපන් දසබෑ රජුරුවන්ට වැඩිමාලු **වාසුදෙව රජ්ජුරුවෝ** නුවරින් නික්ම උයන් කෙළියට යන්නාහු චණ්ඩාල ග්‍රාමයෙන් තමාගේ යම් කටයුත්තක් නිසා නුව රට එමින් සිට මගින් ඉවත්ව සිටි අතීක් රූ ඇති එක් කුමාරිකාවක දැක පිළිබඳවූ අදහස් ඇතිව ඇගේ ජාති විචාරා චණ්ඩාල කුලයෙහිය'යි කිවත් බලවත් ප්‍රේම ඇති බැවින් අස්වාමික බව අසා උයනට නොගොසින් ඈ රැගෙන නැවත මාලිගාවට ගොසින් රුවන් රැසක් පිට සිටුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායකකොට වොටුනු පලඳවා අගමෙහෙසුන් කළහ. ඒ බිසව් රජහට ඕසිනම් පුතකු වැදූහ. ඒ කුමර පියරජහු ඇවැමෙන් **බාරවති නුවර** රජහොළේයයි උදාහරණකොට එබදු ක්ෂත්‍රිය කුලයෙහි උපන් රජුරුවෝ පවා චණ්ඩාල ස්ත්‍රියක් රක්ෂාකළහ. නොපත් අපත් තිරිසනුන් හෙයින් සවර වෙන්සෙක්ද? අපට ප්‍රමාද නම් ඔවුනොවුන් කැමැති පමණෙක්මය"යි කියා නැවත අනික් කාරණයක් දක්වන්නාහු:—

රථාරති කිම්පුරිසී, සාපි වච්ඡං අකාමයි
මනුස්සා මිගියා සඬ්ං, නත්ථි කාමේ අසාදිසා-සි-

මේ ගාථාවෙන් කිහ:—

මේ ගාථායෙහි අභිප්‍රාය නම් යටගිය දවස එක් බමුණෙක් පසඳකාම යෙහි ආදීනව දැන තමාගේ බොහෝ සැපත් හැර හිමාලයවනයට වැද තවුස් පැවිද්දෙන් මහණව පන්සලක් කොට වසන්නේය. එතැනට නුදුරු තැනෙක්හි එක් ගල් ගුහාවෙක බොහෝ කිඳුරෝ වසන්නාහ. එතැනට නුදුරු තැනෙක මහ මකුළුවකුත් වසන්නේය. ඒ මකුළුවා කිඳුරුලෙන දෙර දැලක් බැඳ උදැසන එකකුබැගින් කිඳුරන් ඉස්කඩා ලේ බොන්නේය. කිඳුරෝ තම් ඉතා දුර්ලභ සත්ව කෙනෙක, සවභාවයෙන් බාහිරුල්ලහ, මකුළුවා නම් රථසතක පමණ ඇති මහා ශරීර ඇති කෙනෙක. කිඳුරෝ ඕහට කිසිවකුත් කොට නොහී තැපසයන් සමීපයට ගොස් මිහිරි කථාකොට ආ කටයුතු විචාළ කල්හි "සවාමීනි! එක් මකුළුවෙක් අපගේ ජීවිතහරණය කෙරෙයි; නුඹවහන්

සේ හැර අනික් පිටිවහලෙක් නැත, උඹ මරා අප ඇම්දිවිරුන්ත දී අපු සුවපත් කළමැනවැ"සි කීහ. ඒ අසා තපස්වී "අප වැන්නෝත් ප්‍රාණ වධ කෙරෙද්ද? මෙහැනින් පහවයා"සි අසුරගසා නෙරපීහ. එවිට කිදුරෝ සිතන්නාහු "අප ගේ රථවනී නම් කින්නරාඞ්ගනාව අසාමිකය, ඇ සරහාලා ගෙනවුත් යාචඤ්ඤ කරමිහ'සි තපස්වී ළඟට ගෙනවුත් මෑ නුඹවහන්සේට පාදපරිචාරිකා වේවා, අපගේ සහුරා මරා වදුළ මැනව'සි කීහ. තාපසයා ඇ සෙරේ පිළිබඳ ගිත් ඇතිව ඇ සමඟ වැස අලුයම් වේලෙහි කිදුරන්ගේ ලෙන දොර සැතපිසිට ගොදුරට ආ මකුළුවා මුහුරකින්ගසා ජීවිතක්ෂයට පමුණුවාපිය. ඇ හා සමඟ වසන තාපස්වියා එහිම දූදරුවන් ලදින් බොහෝ දවස් වැස කාලක්‍රියා කෙළේය. ගිරවාණෝ මේ උදාහරණය ගෙනහැර දක්වා "එම්බල! ඒ තාපසයෝ මනුෂ්‍යත්ව සිට තිරිසන් කින්නරාඞ්ගනාව සමඟ විසූහ. අපි දෙපක්ෂයම් පක්ෂි වම්හ; එබැවින් තොප හා අප හා සරණ මනුලට ප්‍රමාද නම් ඕවු නොවුන් කැමැතිවීමය"සි කීහ.

එවිට සැළලිහිණි ගිරවාණන්ගේ බස් අසා "සවාමීනි! හැම දවස්ම සිතා නම් එකලෙස තිබෙන්නේ නොවෙයි; ප්‍රිය විප්‍රයොගය ඉතා නොකැමැත්තෙම්, හෙවත් නුඹවහන්සේගෙන් මතු වියෝ වීමෙක් ඇත, දැන්ම නැවැත්ත මැනව, පසුව වියෝවීම ඉතා නොකැමැත්තෙම්"සි කිව. ගිරවාණෝ තමන් ඉතා නුවණැති හෙයින් හා සත්‍රී මායමෙහි දක්ෂ හෙයින් තවත් විමසනු පිණිස

හඤ්ඤෝ 'හං ගමිස්සාමි, සාළිකෙමඤ්ඤ භාණිකෙ
පච්චක්ඛානුපදං හෙතං අතිමඤ්ඤසි නූන මං-සි

මේ ගාථාවෙන් කීහ:-

මේ ගාථාව කියා තොප මෙසේ මා නොකැමැතිව කියන හෙයින් අපි යම්හ; මේතැනට මා තනිව අවුත් යාචඤ්ඤකරන හෙයින් තෙපි මා නිසාම් එසකුයයි සිතුද? මම ඉතා රාජපූජ්‍යයෙමි. මට අඹුවෝත් අරුමැද? අනි කෙක් සොයාගනිමි; එබැවින් දැන්ම යෙමි"සි කීහ. සැළලිහිණිය! "දැන්ම යෙමි කී බස් අසම්න්ම ළය පැළියන තරම් ශොකයෙන් පිඩිතවන්නී, ඔහු දුටු විටම උපන් සෙනහයෙන් හා කාමචෙතනාවෙන් සම්‍යොගයෙහි දහ වැදහන් නාසේ වියෝ ගින්නෙන් පැලඟෙන්නී, තවත් තමාගේ සත්‍රී මායාවෙන් නොකැමැත්තියක මෙන් හඟවා නොයාදී රදවන්නට උපමා මිශ්‍රකොට කියන්නී:

න සිරී තරමානස්ස, මාසර සුවපණ්ඩිත!
ඉධෙව තාව අවජ්ඣස්සු, යාව රාජා න දක්ඛසි
සොඤ්ඤ සද්දං මුනිඞ්ගානං, ආනුභාවං ච රාජිනො-සි

මේ ගාථාවෙන් කිවාය:-

මෙහි අර්ථ නම්:- ගිරු පණ්ඩිතයෙනි! යම්සේ සිත ඇත්තක් සාදුගන්නා එක්තු ඉක්මන් නොවිය යුතුය; ඉක්මන් තැනැත්තවුව ශ්‍රීසානතා නොම්ම දුරුවන්නීය; එබැවින් අද මෙහිම රදව, ගෘහවාසය නමුත් බිරින්දක් රක්ෂාකිරීම නමුත් ඉතා ඉක්මන්ව බැරිය, ඉක්මන්ව කළ දෙය ඔබින්නේ නොවෙයි, එබැවින් අද රෑ මෙහි රදව; ඉදින් රුදුනා නම්; අපගේ රජ්ජුරුවන්ගේ මහත්වූ රූපෛශ්වර්‍යය දැක උතුම්වූ රූ ඇති සම්භරණයෙන්

සැදුණු නාටකාඛ්‍යානවත් ලිය නිදුරන් සවර හා සමානව කියන්නාවූ ගීතිකා ඇසුව මැනව; ඔවුන් මිසින් වයනලද මෘදඞ්ග නාදයන් අසව; ඉක්මින් නොවී සැලවින් අද රැදුනා නම් වැඩෙක් මුත් අවැඩෙක් නැත්තේය; තොප ගේ ගම බිරින්දන් නැත. අග්‍ර බිරින්ද උකුස්සා ගෙනගිය'සි කිව. තොප ඉක්මන්වන්නේ ඇයිද? රැදුනා නම් නොපගේ අභිමතාර්ථය සිඳවන්නේය"සි බැහැවුම් වනසයෙන් රඳන්නා කැමැත්තවම කිව.

ගිරවාණෝ 'නොප මෙසේ කියන පසු රඳ, යෙම්'සි කියා රැදුණාහු නොයෙක් අලලාප සල්ලාපයෙන් අැ සිත් ගෙන එදවස් සවස් වේලේ ලොක සාධාරණයෙහි යෙදී සහතුටුවව ඔවුනොවුන්ට ප්‍රාණ සම වූහ. ඉක්බිති ගිරා පණ්ඩිතයෝ "මෙවිට වෝ හදා සිතඇති යම්ම රහසක් මට නොවලහා කියයි. ප්‍රපඤ්ච නොකොට ව්‍යාකරණෙන මෙහැනින් වහා නැගී යෙම්"සි සිතා සැළලිහිණියට කිව. 'කිමෙක්ද සවාමිනි!සි කිව. 'යමක්විවාරන්නා කැමැත්තෙම් කියවිදු'සි කිහ. යහපත කිවමැනව, අද අපගේ මහුල් දිනය, පසු දවසේ කිව මැනව, ඉදින් මහුලට නිසි දෙයක් වීනම් අද කිව මැනව; අවමහුලක් වීනම් නොකිව මැනවැ'සි කිව. 'තෝ කුමක් කියසිද! මියේ මි වත්නලාසේ මහුල් පිට මහුලෙහ මා කියන්නේය'සි කිහ; එසේනම් කිව මැනව'සි සැළලිහිණි කිව. ඉදින් අසන්නා කැමැත්තෙහි නම් කියම්'සි කියා කිමෙක්ද බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඉතා රූපශ්‍රීන් බබළන්නාවූ තමන්ගේ දුවණියන් තමන් වසඟව හිඳිනා එක්සියයක් රජදරුවන්ට නොදී, සතුරුවූ වෙදෙහ රජ්ජුරුවන්ට කුමක් පිණිස දෙදදු'සි කිහ.

සැළලිහිණි ගිරවාණන්ගේ බස් අසා ඉතා නොඅතුටුව කියන්නී 'සවාමිනි! අපගේ රීතියා මහුල් දවසේ මෙවැනි අවමහුලක් කුමක් නිසා කියෙහිදු'සි කිව. ගිරවාණෝ කියන්නාහු "මම 'මහුලැ'සි කියම්, තෙපි 'අවමහුල'සි කියව; අප දෙන්නාගේ බස් විපරිතවන්නේ කුමක්දැ"සි කිහ. "සවාමිනි! මෙසේවූ මහුල් දිනයෙහි කිවමනා දෙයක් නොවෙයි; 'නොකියම්'සි කිව. 'සොඳුර! අවශ්‍යයෙන්ම මට කිවමැනව'සි කිහ. සවාමිනි! එසේවූ නොඇසිය යුත්තෙක් සමඟ ලොකයෙහි නැත, එබැවින් කියන්නට නොපිළිවන, නොකියම්"සි කිව, 'එසේද, නොප සිත ඇති රහස් වට නොකියන කල තොපගේ හා මාගේ හා සමඟ වාසයෙන් ප්‍රයෝජන කිමිදැ'සි කිහ. සැළලිහිණි එබසට ශොකයෙන් පිරුණු ළය ඇත්තී 'එසේ නොකියෙම් නම් ම, ඇරපියා පලාගියෝ නම් නපුරැ'සි සිතා 'එසේවීනම් කියම්, ඇසුව මැනව'සි කියන්නී බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් හා වෙදෙහ රජ්ජුරුවන් හා දෙන්නාගේ විවාහ මහුලසේවූ මහුලෙක් නොපගේ සතුරන්ටත් නොවේව'සි කිව. ගිරවාණන් ඊට කාරණා කිමිදැයි කී කල්හි එහි තත්ත්‍වය කියම්, ඇසුව මැනවැයි කියන්නී

නෙදිසා තෙ අමිත්තානං, විවාහො හොතු මාසර!
යථා පඤ්චාලරාජස්ස, වෙදෙහෙන භවිස්සති-සි

යන්නෙන් බ්‍රහ්මදත්ත ඊජ්ජුරුවෝ දුවණියන් සරණ දෙමිහ"සි කියා වෙදෙහ රජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා මායම්න් මේ නුවරට ගෙන්වාගෙන මරන්නාහ; ඉදින් අවුනම් උන්ට මර බාධා නැහ, මිත්‍රකමට කරන දෙයෙක් නොවෙයි, ඒ මහුල නිසා වන්නාවූ අභිවෘඩියක්

නාහැ"යි කිව. නැමත කියන්නී සරණ දෙන්නා තබා දුව ඇසවත් නොපා නාහ. 'දෙන්නාම මරා ජයපානය බොන්නෙමු"යි කෙවට්ටයා හා රජ්ජුරුවන් හා දෙන්නා මා උන් ශ්‍රී යහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණය කොට දුන් සෙවට්ටයා රජු ගිවිස්වා ගෙනෙන්නට ගියේය'යි දෙන්නාගේ රහස් කථා මෙන් මදකුත් නොවරදවාම ගිරා පණ්ඩිතයන්ට කිව.

ඒ අසා 'කෙවට්ටයාගේ නුවණ ඉතා යහපත් නියාය; මේ උපායෙන් රජහු මේ නුවරට ගෙන්වා මරන්නට බැරි නොවෙයි; සිතූ නියාව ඉතා යහපතැ'යි කෙවට්ටයාට කයිවාරු කොට 'අපගේ මේ නියා මහුලේ අවමඟුලක් කිමෙන් ප්‍රයොජන කිම්ද? ඒ නොකියැ'යි කියා නවතා, තමන් ආ තම්සැප සුණු බව දැන ඒ රාත්‍රියෙහි ඇ හා සමඟ දවස් යවා පාන්වූ කල්හි "සොදුර! මම සිවි රට ගොසින් 'මා සිත් වන් බිරින්දක් ලදිමි' මාගේ රජ්ජුරුවන්ට කියන්නට යෙමි. මට සත්දවසකට සමුදෙව, අටවෙනි දවස මගපෙරහරින් එන්නෙමි. මා එනතෙක් තෙපි මා කෙරේ ශොකයෙන් නොකා නොබී වැහැර නොගොස් උකටලී නොව සුවසේ ඉඳුව"යි කීහ. සැලලිහිණිය ගිරවා ණන් වියෝ දුක් ඉවසිය නොහී සමණන්ට උත්තර කීමෙහි අසමර්ථව යහපත සද්දවසකට අවකාශදෙමි, අවවැනිදෑනා යෙහිනම් එකාන්තයෙන් මාමළුතැනට නුඹ එන්නෙහිය. සැබවින් මා කැමැතහොත් සද්දවස ඇතුළත අවමැ ෑවැ"යි කිව. සොදුර! කුමක් කියව්ද ඉදින් අටවැනිදා තොප නුදුටිම්නම් මාගේජීවිතය නාමෑ ඇද්ද? දැරි ඇති අඹුව නොකලේ මියයාමක් හා අළුත් අඹුවන් රැකෙන සද්දවසකින් මළකල මාගේ ළය ගලෙක්ද? තෙපි මා එන ගමන සැක නොක රව'යි කියා සිතින්සිහන්නාහු 'තෝ මියේවා රැකේවා' නීගෙන් මට ප්‍රයොජන කිම්ද'යි මැඳිරියෙන්නික්ම සිවිරටදිශාවට මුහුණලා මදක්තැන්ගොසින් නැවත මියුලුනුවරට ගොස් බොධිසත්වයන්වහන්සේගේ උරයට බටහ. මහතාණෝ මතුමහල්තලයට වඩාගෙන විචාළ කල්හි සැලලිහිණිය කී කළ දු මුළුල්ල ආද්‍යන්ත නොවරදවාම කීහ. බොධිසත්වයන්වහන්සේ මී හා විලඳ කවා ම්පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා අතර මැඩ කකුල් සඤ්ඤි මිරිකා ඉතා සැපවූ රන්මැඳිරියේ සැතැප්පූසේක. ඒ බව ප්‍රකාශකොට වදාරන බුදු රජාණන්වහන්සේ :-

තතෝ ව ඛෝ සෝ ගන්ත්වාන මාසරෝ සුවපණ්ඩිතෝ
මහොසධස්ස අක්ඛාසි, සාලියා වචනං ඉදං-යි-

මේ ගාථාවෙන් වදාරනසේක:- 'එම්බා මහණෙනි! ඒ ගිරා තෙමේ සැලලිහිණියගෙන් රහස් කථා ගෙනවුත් මහෞෂධ පණ්ඩිතයන්ට කියේවේදැ"යි වදාළසේක.

බිරවාණන්ගෙන් බස් අසා අනතුරුව බොධිසත්වයන්වහන්සේ සිතන සේක් මේ "රජ්ජුරුවෝ මා නොකැමැති කරවා ගොසින් මහා විනාශයට පැමිණෙන් නාහ. මෙවැනි යශදායකවූ රජ්ජුරුවන්ගේ බස් සිත තබා ඒ බව දැන පිටිව හල් නුවූහ'යි දත්කෙනෙක් නිසු කෙරෙති. මා වැනි පණ්ඩිතයකු ජීවත්ව ඉන්දදී මේ රජ කුමක් පිණිස නස්නේද, රජහට පළමුව ගොස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් දැක වෙදෙහ රජ්ජුරුවන්ට යහපත් නුවරක් සෑරිවලා ගව්වක් ප්‍රමාණ සුළු උමඟක් හා දොරුව්වක් පමණ මහ උමඟක් කරවලා වූලනී රජ්ජුරුවන්ගේ දුවණියන් අපගේ රජ්ජුරුවන්ට අභිෂෙක කරවා දී, එක්සියයක්

රජදරුවන් හා අවලෝස් අසූදහසක් පමණ මහා සෙනාව අප උන් නුවර වටලාගෙන සිටියදී අපගේ රජ්ජුරුවන් රාහුමුඛයට වත් සඳක් පරිද්දෙන් ගලවාගෙන එන ගමන මට හාරවන්නේය'යි සිතුවේය. මෙසේ සිතන්නාවූ සර්වාර්ථසිද්ධ බෝධිසත්ත්වයාණන්ගේ ශරීරයෙහි පස්වණක් ප්‍රීති උපන්නේය. ප්‍රීති වෙගයෙන් උදන් අනනසේක් "යම් පුරුෂයෙක් යම් රජක්හුගෙන් සියලු සම්පත් ලදින් කිසිවෙකුත් අතුනාව මහා ආඩ්‍යවූ වෙසෙනම්, එසේවූ දැහැමි පුරුෂයා විසින් තාය වාක් මනඃ යන මාර්ත්‍රයෙන්ම ඒ රජහට වැඩෙහි හැසිරිය යුතුය; ඔවුන්නේ ආපදාවක් උදා කල්හි ඉන් මුදාලන්නට ශක්තිය ඇතිවත් ඊට පිටිවහල්නොවී නම් මිත්‍රද්‍රෝහියාය; එබැවින් රජහු නුවණැතිව නොදැන කියාපු යම්හම් බස් පමණක් ඇහ තබා ගැන්ම මට හරම් නොවේ"යි සිතා සොළොස් කළයක් සුවඳ පැහැති ඉස් සෝධා නහා සර්වාභරණයෙන් සැරසී මහ පෙරහරින් රජගෙට ගොස්, රජහු වැඳ එකත්පස්ව සිට "කිමෙක්ද මහරජ උත්තර පඤ්චාල දෙශයට යන සේක්මද්ද'යි විමසුසේක.

"එසේය පුත යෙමි, **පඤ්චාලචණ්ඩී** කුමාරිකාව නොලබන්නාවූ මට රාජ්‍යයෙන් ප්‍රයොජන කිමිද? තෙපිත් මා අත්නොහැර කැටිව එව; ඔබ යාමෙන් වැඩ දෙකෙක් වන්නේය, සත්‍රුතනයන් ලබම්, රජ්ජුරුවන් හා තෑවීමෙන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී සිතත් පිහිටන්නේය"යි කිය. ඉක්බිති රජ්ජුරුවන් වහන්සේට පණ්ඩිතයෝ කියන්නාහු "මහරජ! එසේවීනම් මම පළමුකොට ගොස් නුඹවහන්සේ ඉඳිනා මාලිගා ආදී ගෙවල් නංවාලා යම් දවසෙක නියා එවිමි නම් එදා වැඩිය මැනවැ"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ එසාන්නතයෙන් දරුවන් මා අත්නොහරනා සැටිය'යි ඉතා සතුටුවී යින් ඇතිව 'පුත! තෙපි පළමු යන්නවුන්ට කුමක් ලදමනාද්ද'යි කිය, 'බල වාහන ලද මැනවැ'යි කිය. යම් පමණක් කැමැත්තානම් එපමණක් ගෙන යව'යි කිය. ඒ මහතාණන්වහන්සේ "සිරගෙවල රැකවල් ලා සිටිනා බල සම්පන්න යොධයන් මා හා කැටිව එව්ව මැනවැ"යි වදාළසේක. රජ්ජුරුවෝ කියන්නාහු "මට කියන්නේ කිම්ද තොප කැමැත්තක් කරව"යි කිය. ඒ මහතාණෝ සිරගෙවල දොර හරවා ගිය ගිය තැන සිතු සිතු අර්ථයක් සාදා දෙන්නට බල ඇති සූර වීර යොධයන් යදම් බිඳුවා පිටත්කරවා ගෙන 'මට සේවය කරව'යි ප්‍රසාද දෙවා වඩු කඹුරු සොම්මර චිත්‍රකාරාදිවූ නොයෙක් කම්මන්තයෙහි දක්ෂවූවන්ගෙන් අවලෝස් කුලයක් හා වැ පොරෝ උදලු යහුත් ආදිවූ වුවමනා බොහෝ උපකරණ හාණ්ඩ ගෙන්වාගෙන මහ සෙනාව පිරිවරා නික්මුණු සේක. බෝධිසත්ත්වයන්වහන්සේ නික්මුණු නියාව ප්‍රකාශකොට වදාරන බුදුරජාණන්වහන්සේ:-

තතෝ ව පායාසි පුරේ මහොසධෝ
පඤ්චාල රාජස්ස පුරං සුරම්මං
නිවෙසනානි මාපෙතුං, වෙදෙහස්ස යසස්සිනෝ-නි

මේ ගාථාවෙන් වදාරන සේක් "එම්බා මහණෙනි! ඒ මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහ රජහට පළමු ගොස් නුවර හා ගෙවල් කරන පිණිස බල වාහන ගෙන නික්මුණේ වේද"යි වදාළසේක. බෝධිසත්ත්වයන්වහන්සේ වඩනාසේක් සතර ගව්වෙන් සතරගව්වට එකි එකි ගමක් බැගින් ගම් කරවා ගමකට ඇමැත්තකු බැගින් සිටුවා මෙසේ විධානකරනසේක් "තෙපි අපගේ

රජ්ජුරුවන් පසළොස්වණ්ඩ කුමාරිකාවන් ඇරගෙන එනකල, ඇත් අස් රථ ආදිවූ වාහන සරහා කැටිව ආ දුප්පිල වාහන රදවාගෙන තොපගේ වාහන වලට නංවා සතුරන්ට අසුවිය නොදී වහා මියුළු නුවරට යවා ලවසි වදුළුසේක.

මෙසේ මාඝීසංවිධානයෙන් ගොස් ගංතෙරට පැමිණ **ආගන්තු** කුමාර යයි යන එකක්හු කැඳවා "තොපි තුන්සියයක් පමණ නැව් වඩුවන් ඇරෑගන උඩු ගං බලා ගොස් හර ඇති දඩු සප්පවා තුන්සියයක් නැව් කරවා මාලිගා වාසල් දොරටු අටවාල ගෙවල් ආදිය කරවා ගන්නාලෙස දුරු සම්භාර ඔබදිම් ලැබූ කොට සස්වා නැව් තුන්සියය පුරාගෙන එව'සි විධාන කොට යවූ තමන්වහන්සේ ගඟින් එතරව බැස පියවරසතින් ගණනසේක් "මේ දෙගුව් චක් පමණ තැන මහ උමඟ වන්නේය; ඒ ඉක්බිති මෙතැන්හි අපගේ රජ්ජුරුවන් හිඳිනා නුවර වන්නේය; නැවත මෙතැන් පටන් රජගෙය දක්වා මේ ගව්වක් පමණ තැන සුළු උමඟ වන්නේය"සි සවකීය ප්‍රඥාවෙන්මි නියම දැන මඟ පෙරහරින් නුවරට වන් සේක.

බොධිසත්ත්වයන්වහන්සේ එන නියාව චුලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අසා 'මෙවිට මාගේ මනදෙළ පිරෙන්නේය, එකාන්තයෙන්ම මාගේ සතුරන් පිටිදක්නෙමි, මහෞෂධයා ආකල වෙදෙහයාත් නොබෝ කලකින් එන්නේය; මෙවිට දෙන්නාම මරා ජයපානය බී සියලු දඹදිව එකසත් කොට රජකරන්නෙමි'සි ඔදවැඩි සතුටුව ශියාඟ ජන නෙත්‍ර රසාඤ්ජනවූ සෞම්‍ය රූවාණන් නුවරට වදුත්ම අයම් දිතරින් අටසාලිස් ගව්වක් පමණ ඇති ඒසා මඟත් නුවර වාසී මනුෂ්‍යයෝ එකඟෙලා "මහෞෂධ පණ්ඩිතයෝ නම් මූලු, එක්සියයක් රජුන් හා අටලොස් අක්ෂෞහිණියක් සෙනාව කැටක් දමා කපු රැසක් තෙරණා සේ ඉස් ලුලූ අත ලුහුබඳවාපුවෝ නම් මේ මහතාණෝ දැ"සි බලා ඇස් ඇදගත නොහී මහා ආශ්චර්‍යයට පැමිණියහ. සියලු නුවර එදවස් සඳරැස්වන් කිරිමුහුදසේ ක්ෂොභව හිඳේය.

මෙසේ ඒ නුවර වාසීන් තමන්වහන්සේගේ රූප දර්ශනයෙන් සන්තෝෂව බල බලා සිටියදීම රජ ගෙදරට ගොස් ආ නියාව කියා යවා 'එන්නට නියව'සි කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් වැද එකත්පස්ව සිටිසේක. එවිට රජ්ජුරුවෝ මියුරු කථාකොට 'පුත! රජ්ජුරුවෝ කවරදැ එද්දැ'සි කීහ. මා කියා යැවූ කලඅ'සි වදුළුසේක. "තෙපි පළමු කුමක් පිණිස අවුදැ"සි කීහ. දෙවඟන්වහන්ස! 'අපගේ රජ්ජුරුවන්ට මඟුලට මාලිගා නංවන්නට ආම්' සි වදුළුසේක. 'යහපතැ'සි කියා බොධිසත්ත්වයන්වහන්සේ හා කැටිව ආ සෙනාවට බත්මියදම් දෙවා මහතාණන්ට මහත් සත්කාරකොට ඉදිනට යහපත් මාලිගාවක් දී 'පුත! රජ්ජුරුවන් එනතෙක් උකටලී නොව අපටත් සළමනා දෙය කරවාලා සුවසේ ඉඳුව'සි කීහ. ඔබත් රජගෙට ඇතෙන අස්ක්ම මතු මාලට නැඟෙන හිණිපාමුල සිට මෙතැන්හි **සුළු** උමඟ දෙර යඬය'සි සිතුසේක. නැවත ඔබට මෙසේවූ අදහසකුත් වූයේය. මේ රජ්ජුරුවෝ 'අපටත් සළමනා දෙය කරවා ලව'සි තුවුම් කීහ. එබැවින් උමඟ කණන කල මේ හිණ නොවැටෙන ලෙසක් කෙරෙමි"සි සිහා නැවත රජ්ජුරුවන්ට වදුරනසේක් "මහරජ! මාලිගාවට නැඟෙන්නෙම් හිණි පාමුල

සිට මාලිගාවේ නව කම්මාන්ත බැලීම්, සෙසු මා දුටු නපුරෙක් නම් නැත. නැහෙන හිණ යම්තම් වරදෙක් ඇත, කැමැතිසේක් නම් රට තරම් දඬුපත් ලදිම් නම් නිසාම් වඩුවකු තබා විශ්වකර්මයාත් 'නපුරු'යි නොකියන ලෙස කරවාලම්"යි වදාළසේක. "යහපත තොප කැමැතිලෙස කරවාලව'"යි දරු සඟහාර දෙවූහ. ඒ මහතාණෝ 'උමඟ දෙර මෙතැන විය යුතුය'යි සිතා ඉදුරා සලකාගෙන පරණ හිණ හරවා යම් තැනක උමඟ දෙර වේද, එතැන පස් නොවැටිරෙන පරිද්දෙන් පෝරු අතුරුවා නියවලකොට හිණ සිටුවාලූ සේක. රජ්ජුරුවෝ මේ අන්තරාය නොදන්නාහු තමා කෙරේ ඉත සිහින්ම කෙරෙයි"යි සිතූහ. ඒ පරණ හිණ ඔබ දුටු වරද. නම් 'යටින් උමඟ බිඳින කල හිණ හිණිතම් නපුරු'යි යන මෙපමණෙක්මය.

මෙසේ එදවස් නව කම්මාන්තයෙන් දවස් යවා දෙවන දවස් රජ්ජුරුවන්ට සියනසේක් "දෙවයන්වහන්ස! ඉදින් එක් නිලයක් ලදුමෝ නම් අපගේ රජ්ජුරුවන් හිඳිනා පරිද්දෙන් යහපත් නොට මාලිගා ආදිවූ ගෙවල් නංවාලන්නමෝ වේද"යි වදාළසේක. "යහපත පුත! මාගේ මාලිගාව හැර මේ භූවරින් යම් නෙයක් කැමැත්තෙහි නම් ඒ ගනුව"යි කීහ. මහරජ! අපි ආගන්තුකයම්හ, ඔබවහන්සේගේ බොහෝවල්ලභයෝය, ඔව්හු තමන් තමන්ගේ ගෙවල් ගන්නා කල අප හා කලහ කරන්නාහ, උන්ට අපි කුමක් කරම්ද"යි වදාළසේක. පණ්ඩිතයෙනි! තෙපි උන්ගේ බස්නොගිවිස නොපකැමැති ගෙයක්ම ගන්ව"යි කීහ. "දෙවයන්වහන්ස! ඔව්හු නැවත නැවතත් අවුත් ඔබවහන්සේට කියන්නාහුය, එයින් ඔබගේ සිතට සැපයෙක් නොවන්නේය. ඉදින් නුඹවහන්සේ කැමැතිසේක් නම් අප ගෙය නිලකොට ගන්නාතෙක්ම අපගෙන් දෙරකඩ රුකවල් ඉවත් කියන්නට ආවාහු වැද්ද නොදෙන්නෙම් පලා යන්නාහ. එසේකල අපටයි නුඹවහන්සේගේ සිතටත් දෙම්නසෙක් නැත්තේය"යි වදාළසේක. රජ්ජුරුවෝත් "ඉතා යහපත්, නොපගෙන්ම රුකවල් ලවාගන්ව"යි කීහ. බොධිසත්වයන් වහන්සේද හිණි ඉසය රජගෙයි දෙරකඩය යන මේ හැමතන්හිම රජගෙට කාත් වැද්ද නොදෙවයි තමන් වහන්සේගෙන්ම රුකවල් ලැවූ සේක. පළමුකොට ගොස් "රජ්ජුරුවන්ගේ මැනියන් **නලනා**දෙවින්ගේ ගෙය බිඳුව"යි නියොග කළ සේක. ගියාවූ පුරුෂයෝ දෙරටුයෙහි පටන් හිත්ති පදනම් ඇතුළුව උළු සුණු මැටි ආදිවූ දෙය බිඳ හරනට පටන්ගත්හ. රාජමාතාවෝ එපවත් අසා වහ වහා ගෙන් අවුත් 'කොල! අපගේ ගෙය බිඳුනෝ නවුරුදු'යි කීහ. මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ ගෙය බිඳුවා තමන්වහන්සේගේ රජ්ජුරුවන්ට මාලිගා නංවනසේක"යි කීහ. 'ඇයි දරුවෙනි! මේ ගෙයි හුන්කල කිම්දැ'යි කීහ. අපගේ රජ්ජුරුවන්ගේ බොහෝ සෙනාව හෙයින් මේ ගෙය ඉතා කුඩාය, 'මහත් කොට මාලිගා කරවන්නටය'යි කීහ. එ බසට බිසව් කිපී "කොල! තෙපි මා රජ්ජුරුවන්ගේ මැනියන්බව නොදනුද? දැන් මපුතණුවන්ට කියාලා තොපට කියවිදන්නෙම් වේද"යි කීහ. නුඹවහන්ස කුමක් දෙඩන සේක්ද? අපි රජ්ජුරුවන්ගේ බසින් බිඳුම්හ. ශක්තිය ඇතිදැ හීනම් නවතා ගන්නැ"යි කීහ. 'තොපට කියවි දන්නෙම්'යි කිපී රජගෙට කියන්නට ගියහ. දෙරකඩ සිටි රුකවල්ලු 'නොවදුව'යි කියා නැවතූහ. "කුමක් කියව්ද? මම රජ්ජුරුවන්ගේ මැනියෙමි, මට පෙර රුකවලෙක් නැත, මා යා දෙව"යි කීහ. "කාත් වැද්ද නොදෙව"යි නොයෙක් රජ්ජුරුවන් විසින්ම කියන ලද, තෝ මේතැන නොය

සිට පලා යා" යි කීහ. බිසව් කිසිවක් කියන්නට නොපොහොසත්ව තමන් ගේ ගේ බිදුනා බල බලා සිටියාහ. එසේ සිටියවුන් එකෙක් නැගී සිට මෙතැනින් යෙයිද? නොයෙසිදැ'යි බොටුව අල්වාගෙන තරවා දමාළිය. ඒ මැඟැලිවහන්සේ මුහුණින් හිඳියා දුකසේ යැගි සිට සිතන්දැ "එකානෙකයෙන් රජ්ජුරුවන් කියේ ඇබෑ සැටිය, ඉන් බිසක් මට මෙසේ කරන්නට සමර්ථ එකෙක් ඇද්ද, පණ්ඩිතයන් සම්පයට යෙමි"යි සිතා ගොස් "පුත මිහෙණඩ පණ්ඩිතයෙනි! මාගේ ගෙය කුමක් නිසා බිඳුවාදැ"යි කීහ. ඔබ උන් හා කැටිව එක බසකුත් නොකියා නොඇසූ කන්ව ඒ දසාව නොබලා සිටි සේක. ළඟ සිටි පුරුෂයෝ "දෙවීන්දැ කියන්නේ කිම්දැ"යි කීහ. "දරුවෙනි! පණ්ඩිතයෝ මාගේ ගෙය කුමට බිඳුවද්දැ"යි කීහ. වෙදෙහරජ්ජුරුවන්ට මාලිගා කර වන්නටය'යි කීහ. "ඇයිදරුවෙනි! මේසා නුවර අනික් ගෙයක් නොලැබෙයි සිතව්ද? මාගේ මේ මසු ලක්ෂය ගෙන අනික් තැනකින් ගෙයක් ගෙන මාලිගා කරව"යි කීහ. ඒ වන්නා නුඹගේ මේ ලක්ෂය ඇරගෙන ගෙය අරවාවියමිහ, මේනුවර අපොහොසත් කෙනකුන් මදවුව, එසේ හෙයින් අනික් ගෙයක් අල්වා ගත් කල උසින් අත්ලස් දෙන්නටම සිතති, එසේ කළ ගත් ගත් ගෙවල් අත් ලසටම අරනකල අප ගෙවල් ලබන්නේත් මාලිගා නහන්නේත් කෙසේද? වන්නාටය, නුඹවහන්සේ මෙසේම අඩා දෙඩා යාච්ඤා කොට අත්ලස්දී ගෙය අරවාගත් නියාව ඔබ්බට නොකියතොත් හැරයියමිහ"යි කීහ. "දරුවෙනි! කුමක් කියව්ද? රජ්ජුරුවන් මැතියෝ පවා අත්ලස් දී ගෙය හරවාගත්හ"යි කී කල මටත් ලජ්ජාවන්නේය; එබැවින් මා පණ තබා කාටත් නොකියන් නෙමි කීහ. ඔහු 'යහපතැ'යි බිසවුන් දුන් මසු ලක්ෂය ඇරගෙන ගෙය බිස වුන්ටම අළහ.වැළිත් ඒ මසුරන් ලක්ෂය නම් දැන් මේසමයෙහිදු තඹ ආදී පස් ලොසින් ගැසූ රනෙක් නොවන්නේය. ඒ රනට 'නිලනාමාපණය'යි කියති, ඉන් සතර අනෙකුත් මාස රත්රන්ය. සතර අනෙක් පස්ලෝසැ එබැවින් ඒ බිසවුන් දුන් මසුරන් ලක්ෂයෙන් පනස් දෙසෙක් 'මාස රත්රනැ'යි දතයුතු.

ඒ ගෙය හැර එනැතින් ගොස් කෙවට්ටයාගේ ගේ බාගෙන පළඳ පරිද්දෙන් දෙරටුයෙහි පටන් බිඳිනට වන්හ. ඒ බමුණු පැන නැගී "ගොවියා පුත් තමාගේ නුවරදී එක්සියයක් රජදරුවන් හා සෙනාව බල බලා සිටියදී තමාට සතුරුව හිය මෙතෙක් දෙනාගෙන් මාගේම බොටුව අල්වාගෙන බිම උලා නළල මූණ ආදීවූ තැන් ලේ මඩුලු සොට පියා දැන් කබරව ද, හියාසේ ලජ්ජාවට පමුණුවාපිය, නැවත විවා මතුල කියා හියාවූ මා තමාගේ ගෙයිදී තනිකොට ගෙන තමාගේ බලසම්පන්න පුරුෂයන් ලවා උණ පත්තෙන් මරවා පිටිකර ගස්වා මා නොමිය නියාවත් නොටපිය, ඒ මදින්දේ දැන් මීට අවුත් මේසා නුවරින් මාගේ ගෙය බිඳුවා මා උන් තැනින් නෙරණ මාන කෙරෙයි, වන්නාටය,උගේ රජු නාවත් දෙන්නාටම කළමනා දෙය මූටකරවමි"යි තරව කිපී රජහට කියන්නට රජගෙයි දොරට හියේය. රැකවල සිටියාහු 'බමුණු මාල්ල! මැත නේ'යි කියව කියවා තමා වලලනකමට දොරකඩට හියෝය. රැකවලුන් නොල නිතෘඤ්ඣ ගුණ ඇති දුෂ්ටවූ බමුණ! මැත නේයි කියව කියවා එසිදැ'යි එකෙක් නැගී සිට ගසන්නේ තමා පසඟිල්ල බමුණා පිටිකර පෙනෙන පරිද්දෙන් ගසා ගඩු නහාපිය. ඒ පාර ලදින් තුෂ්ණීම්භූතව ඉඟි කරුව නකිය නකියා අනික් උත්තරයක් කියන්නට අසමර්ථව දතයුත්තක් නොදන්නේ මසු ලක්ෂයක් දී ගෙය අරවාගත. මේ උපායෙන් එදවස් සවස්

වන දුහුරේ යියලූ නුවර ගෙවල් බිඳුවා නැවත නගරයට ගෙන් අස්ලස් රන් එක් හොට නව හොටියෙක් වන්නේ ය. ඒ නව හොටියෙන් සතරහොට පනස් ලක්ෂයක් මිලදී ගැනීමේ දායකයහු.

නැවත බොධිසත්ත්වයන්වහන්සේ නුවර මුළුල්ලෙහි ඇවිද රජගෙට වැඩි සේක. රජ්ජුරුවෝ 'පැහැදියෙනි! මසත තැනක් ලදුදැ'යි විමසූහ. 'මහරජ! හොඳෙන සොහොයක් නම් නැත, එසේ වුවත් බොහෝ දවසක් වැදහුන් ගෙවල් ගන්නා සුලු මහත් දෙමිනියන් සමඟ වන්නාහ, උන් උන්ට ප්‍රිය විප්‍රයෝග සිරීම අපට නැති නොවෙයි, මේ නුවරින් පිටත ගංගාවටත් නුවරටත් මැද ගව්වක් පමණ මෙහෙම් තැන බිම අවකාශයෙක් ඇත, එතැන අපගේ රජ්ජුරුවන්ට ගෙවල් මාලිගා නගමින්යි වදුළුසේක. ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු 'ඇතුළු නුවරදී සවන් නැත්ත සුලු සතුරන් දහ නොහැක්ක, පිටතදී විනම් වට ලාගෙන සුවසේ සතුරන් මිරිකා ජයගන්නහැක්කැ"යි සිතා සොම්නස්ව "යහපත පුත! හොඳ සැලකූ තැනමි නිලකරව"යි කිහ. මහරජ! 'අපි වන්නා ඒ සියල්ල සාරම්හ. බුඔවහන්සේගේ මිනිසුන් ඒ දසාවට දර පලාඇදි යම් කිසිවක් පිණිස අපගේ නව කම්මාන්ත භූමියට නොයායුතුය, ගිය කෙනෙක් යම්සේ සලහයක් නොදෙත්මය, එවේලෙහි නුඔවහන්සේගේ හා අපගේ සිතට සැප යෙක් නැත්තේස'යි වදුළුසේක. "යහපත පුත! මෑනින් ඒ දසාවට යන මිනිසුන්ගේ ගමන් නවත්වාලමේ"යි කිහ. දෙවයන්වහන්ස! අපගේ ඇත්තු දිය කෙළියට රැස්වන්නාහ, එක්වන්දියෙහිම කෙළනාහ. පැන් මඩවූ සැල 'මහෞෂධ පණ්ඩිතයන් ආවාක් පටන් පහන් පැනක් බී පියන්නට නොලබම්හයි නුවර වාසිහු කිපෙත් නම් එයින් ඉවසුව මැනවැ'යි වදුළුසේක. පුත තොපගේ ඇත්තු සුවසේ ගිමි නිවා දියකෙළිත්ව'යි කියා නැවත රජ්ජුරුවෝ "මහෞෂධ පණ්ඩිතයන්ගේ නව කම්මාන්ත භූමියට මේ නුවරින් යම් කෙනෙක් ගියාහු නම් දහසක් දඩය"යි නුවර බෙර ලැවූහ.

බොධිසත්ත්වයන්වහන්සේ රජහු වැඳ තමන්වහන්සේගේ පිරිවර හා සමඟ නුවරින් නික්ම තමන් විසින් නියමකරගත් තැන නුවර කරවන පිණිස ගෝසින් ගසින් එතර 'ගහුල්ලමුවෂ'යි ගමක් කරවා ඇත් අස් රථ ආදිවූ වාහනද • ගෙරි සරක්ද එහි රඳවා නුවර කම්මාන්තයට විධාන කරන සේක් 'මේතෙක් දෙන මේ මේ කරව මෙතෙක් දෙන මේ මේ කරව'යි කම්මාන්ත බෙදා උමඟ කම්මාන්තයට පටන්ගත් සේක. මහඋමඟ දෙරකඩ ගංගායෙහි අසවිය. බලසම්පන්න දසදහසක් පමණ යෝධයෝ මහඋමඟ කණන්නාහා මහත්වූ සම්පත්වලින් පස් පුරුගෙනවුත් ගහදියෙහි ලන්නාහ, ලූ ලූ පස් මුළුල්ල ඇත්තු මඩනාහ, එබැවින් ගඟ පැන්කැලඹී මඩවන්නේය. නුවරවාසිහු 'මහෞෂධ පණ්ඩිතයන් ආවාක් පටන් පැනක් පහන් බීපියන්නටත් නොලබම්හ. ගඟ පැන් කැලඹී මඩවන්නේය, මීට කාරණා කිම්දැ"යි කියන්නාහ. ඔවුන්ට මහාණන්ගේ අනුචරයෝ "මහෞෂධ පණ්ඩිතයන්ගේ ඇත්තු දිය කෙළනාහ ඉන් ගඟ පැන් මඩවන්නේය, මැඩ මැඩ මඩ මතුකරන්නාහ"යි කියති, එබැවින් සැඟ නොකරන්නාහ.

(බොධිසත්ත්වයන්ගේ අභිප්‍රායනම් සිඳවන්නේය. එසේහෙයින්) ඒ උමඟ ගලෙක්වත් මුලෙක්වත් නැතිව බිහිලිඳ අත්තඤාන විය. සුලු උමඟ දෙරකඩ උපකාරී නුවර වූයේය. සත්සියයක් පමණ යෝධයෝ ඒ උමඟ කණන්නාහ,

සම්පත්වලින් පස් නෙනවුත් නුවර ලන්නාහ. ලූලූ පස් පැනින් මිරිකා අනා පවුරු බඳනාහ. ගෙවල් මැටි ආදි කම්මාන්ත හෝ කරන්නාහ. මිහ උම්මග්ග වදනා දෙරුකඩ එම නුවර වූයේය. උම්මග්ග විනාහි අවේළාස් රියන් උස ඇති යන්ත්‍රයෙන් යුක්ත දොරවලින් ගැවසී ගත්තේය. ඒ උම්මග්ග මූළුල්ල එක ඇණයක් මිරිකාලන්නා සියලු දොරවල් පිහී යන්නේය, අනික් ඇණයක් මිරිකා ලන්නා ඇරියන්නේය ඒ උම්මග්ග දෙපාශ්වය උළින් බඳවා සුණු කණාන්ත කරවූ සේක. මුදුනේ මියන් පෝරු අතුරුවා සඟලා ගාවා මිකුරුළුන් අතිධවල කරවූ සේක. ඒ මහ උම්මග්ග අසූ මහදොරක් හා සූසැට්ක් සුළු දොර වූයේය. ඒ මූළුල්ල යන්ත්‍රයෙන් යුක්ත වූයේය. ඒ උම්මග්ග දෙපාශ්වයෙහි නොයෙක් සිය දහස් ගණන් පාන් ගබඩාත් වූයේය. එසිත් යන්ත්‍රයෙන් යුක්ත අතුලුම් වූයේය. තවද ඒ උම්මග්ග දෙපාශ්වයෙහි එක්සියයක් රජ දරු වන්ට එක්සියයක් ශ්‍රී යහන් ගබඩාත් වූයේය. එසිත් යන්ත්‍රයෙන් යුක්ත අතුලුම් වූයේය. එයි එකී ගබඩායෙක්හි නොයෙක් පැයෙන් යුක්තවූ නොදුලස් ආදියෙන් අතුට සරහා තබනලද සැතපෙන මහ යානකුත් ඇත්තේය. තඹතලද ධවලච්ඡත්‍ර ඇති එසේම සරසනලද එකි එකී සිංහාසනයකුත් ඇත්තේය. ශ්‍රී යහන් ගබඩාවල මහ යහන් ළඟ උතුම්වූ රූ ඇති දිව්‍යස්ත්‍රීන් බඳු සම්භාරණියෙන් සරහා සිටුවනලද පෙතැලි රූන් ඇත්තේය. ඒ පෙතැලි රූ නොදන්නවුන් අතින් පිරිමැදුම්ත් ඒ 'අජීවය'යි නොදත හැක්කේය. තවද ඒ උම්මග්ග දෙපාශ්වයෙහි දක්ෂවූ චිත්‍රකාරයන් ලවා අතිමනොහරවූ සිත්තම් කරවන ලද්දේය, ඒ සිත්තම් කවරේද යත්? ශක්‍ර විලාසය, මහාසම්මතරජ්ජය, සත්තරමහාසමුද්‍රය, සතරමහාචිපය, හිමාලයපර්වතය, අනවතප්තවිලය, සිරියෙල් අතලය, චන්ද්‍රමණ්ඩලය, සූර්‍යමණ්ඩලය, චාතුර්මහාරාජිකාදි කාමාවචර සදිව්‍යලෝකය, ඡොඛඡවිධ ඉරූපලෝකය, ඝනාදි ලෝක විද්‍යමාන ආශ්චර්‍යවත් දෙයත් උම්මග්ග සිත්තම් කරවාලූසේක එහි බිම රිදී පවක් හා සමානවූ සුදු වැලි ඉස්වා ඒ උඩුවියන ත්‍රිවිධ උඩ බලා තෙම් බිම බලා එල්වන ලද සුපුෂ්පිතවූ පදම වනයක් පරිද්දෙන් අඳවාලූ සේක. උම්මග්ග දෙපාශ්වයෙහි නොයෙක් බඳු පුරා තිබෙන සල්පිලින් සැදවූසේක. ඒ උම්මග්ග ඒ ඒ ස්ථානයෙහි ගඤ්ඡදම්ම පුෂ්පදාමයන් එල්වූ සේක. ඒ උම්මග්ග සුධර්ම තුම් දිව්‍ය සභාව සේ ඉතා අලඞ්කාර විය.

පළමු යැවූ ආනන්ද නම් අමාත්‍යයා තුන්සියයක් වඩුවන් ලවා සැස නිම වනලද දරුසම්භාර නැව් තුන්සියයක් පුරා ගඟින් ගෙනවුත් බෝධිසත්ත්වයන් වහන්සේට කීය. බෝධිසත්ත්වයන් වහන්සේ දඹදිව් නුවරට බානෙන 'තෙල නැව් සඟවා තබා, මා කී යම් දවසක ගෙනෙව'යි නික්මෙන තොට උඩු ගඟින් නුදුරු තැනෙක්හි සඟවා තැබ්බවූසේක. නැවත ඒනුවර 'පැන් අගලය කලල් අගලය වියලි අගලය'යි අගල් තුනකුත් කැණවූ සේක. තවද ඒ නුවරටු අවුරුද්දාරියන් උස පවුරුද පවුරටතරම් පදනමද, වාසල් අටමාල බලකොටු කුරුබිලිආදියද, රජගෙය ආදිවූ නොයෙක් ගෙවල් සමූහද, ඇත්හල් අස්හල් පැන් පොකුණු ආදියද, යන මේ සියල්ල නිමාවට පැමිණවූයේය. සුදු මහඋම්මග්ග උමඟය, ඒසාමාන්‍ය බිම පිය කරවූනුවරය යනමේ සියල්ල සාරමසකින් නිමවා ඉක්බිති බෝධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන් කැඳවා දූතයන් යැවූසේක. ඒ බව ප්‍රකාශකොට පිදුරන බුදුරජාණන්වහන්සේ:-

නිවෙසනානි මාපෙත්වා, වෙදෙහස්ස යසස්සිනෝ
අථස්ස පහිණී දූතං,
එහි දූනී මහාරාජ! මාපිතා තෙ නිවෙසනං-ති.

මේ ගාථාවෙන් වදාරනාසේක්:-"එම්බා මහණෙනි! මහෞෂධ පණ්ඩිත යෝ වෙදෙහ රජහට පළඳුව ගොස් කුවර උමං රජගෙවල් ආදිය කරවා සාරම්භයින් නිෂ්ක්‍රාන්තවට වෙදෙහ රජු කැඳවා දූතයන්ගවූහ"යි වදාළසේක.

පෙරමහ බල බලා උන්නාසේ, රජ්ජුරුවෝ දූතයාගේ බස් අසමින්ම සෙනාව පිරිවරා නික්මුණාහ. ඒ බව ප්‍රකාශ කොට වදාරන බුදුරජාණන් වහන්සේ:-

තතෝ ච රාජා පායාසි, සෙනාය චතුරඞ්ගියා,
අනන්තවාහනං දට්ඨුං, පිතං කම්පිල්ලියං පුරං-ති

මේ ගාථාවෙන් "එම්බා මහණෙනි! අටලොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත ඒයා මහත් සතුරු සෙනාවක් හා එක්සියයක් රජුන් හුන්නාවූ උත්තර පඤ්චාල දෙශයෙහි කම්පිල්ල නුවරට කාමයෙහි ගිජුවූ නුවණින් අඞ්කවූ ඒ වෙදෙහ රජ මොහයෙන් මූසව අවීනව් දෙක ඉදුරා සලකාගත නොහි, චතුරඞ්ගිනි සෙනාව පිරිවරා නික්මුණේවේද"යි වදාළසේක:-ඉක්බිති රජ්ජුරුවෝ ක්‍රමයෙන් සාරම්භයක් ගව් නෙවා ගොස් ගංතෙරට පැමිණියහ. ආනියාව අසා බොධිසත්වයන් වහන්සේ රජ්ජුරුබන්ට පෙරගමන් කොට කැඳවා අවුත් තවන්වහන්සේ කරවූ නුවරට ගෙන ගිය සේක. රජ්ජුරුවෝ මාලිගාවට නැඟී අග්‍රවූ භොජනය අනුභව කොට මඳක් සැතපී පස්වරු වේලේ තමන් ආනියාව වූලනී රජ්ජුරුවන්ට කියා දූතයෙක් යැවූහ. ඒ බව වදාරන බුදුරජාණන්වහන්සේ:-

තතෝ ච ඛෝ සෝ ගන්ත්වාන, බ්‍රහ්මදත්තස්ස පාහිණී,
ආගතොස්මි මහාරාජ තව පාදූනි වන්දිතුං.

දදාහි 'දූනි මෙ හරියං, නාරිං සබ්බඞ්ගසොභිතං,
සුවණ්ණන්ත පටිච්ඡන්නං, දසීගණ පුරක්ඛතං-ති.

මේ ගාථා දෙකින්:-"එම්බා මහණෙනි! වෙදෙහ රජ බ්‍රහ්මදත්ත රජහට දූතයකු අත කියා යවන්නේ 'මහරජ! නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳනා පිණිස ආමි; සත්‍රාභරණයෙන් සරහනලද ශරීර ශොභා ඇති දැසි දස සමූහයා විසින් පිරිවරනලද නුඹවහන්සේගේ දියණියන් මට බිරිඳ කොට වහා එවුව මැනවැයි කියා, යැවේවේ වේදැ'යි වදාළසේක:-අඹුවන් කෙරේ ලොභයෙන් 'වදිමි'යි කීබව මුත් වෙදෙහ රජ්ජුරුවෝ ඉතා වැඩිමහල්හ, වූලනී රජ්ජුරුවෝ වූකලි මුනුබුරු තරමටත් නැත්තාහ. දූන් රක්ෂාකරනකල කෙසේ මහලු වුවත් හොසේ පොහොසත් වුවත් වැන්දමනා හෙයින් එසේ තමාත් සිත් ගෙන කුමාරිකාව ලැබ ගනිම් නම් යහපතැයි සිතා කෙලශයන් විසින්මඩනාලද අදහසින් වැද යවූහ"යි දතයුතු.

වෙදෙහ රජ්ජුරුවන්ගෙන් ගිය දූතයාගේ බස් අසා චූලනී රජ්ජුරුවෝ මහත් සොම්නසට පැමිණ 'මෙවිට මාගේසතුරු කොයේද, සෙට දෙන්නාගේ ඉස් කපාපියා පසින් මැඩගෙන හිඳ ජඝපානය බොම්මැ'යි සිතින් ක්‍රොධ උපදවා බසින් දූතයාට සතුට අහවා ඕනට ප්‍රසාද දී නැවත කියා යවන්නාහු-

සාගතං තඞ් වෙදෙහ අථොතෙ අදූරතෝ,
නකඛත්තඤ්ඤුවූ පරිපුච්ඡ, අහං භණ්ඩඤ්ච දදාමි තෙ,
සුවණ්ණෙණ්ණ පටිච්ඡන්නං, දාසිගණ පුරක්ඛතං-ති-

මේ ගාථාවෙන් කීහ:-

මේ ගාථාවෙහි අභිප්‍රාය නම් "වෙදෙහ රජ්ජුරුවෙනි! තෙවන් දිවි ආ ගමින් නුපුරු ගමනෙක් නොවෙයි; ඉතා යහපත් ගමනෙක; [illegible] විවාළුම්හා නම් මිතුරුට යොග්‍ය නක්ෂත්‍රයක්මය; සවණ්ණාලඞ්කාරයෙන් සරහා නිවමනලද හොබනා අවයව ඇති මාගේ දුවණියන් දාසි දස් සඳහයා පිටින් පිරිවරන ලදුව හොපට පාවා දෙමි"යි කියා යවූහ. ඒ දූතයා හොස් වෙදෙහ රජ්ජුරුවන්ට "දෙවයන්වහන්ස! ඔබින් බාධාවෙක් නැත, මිතුලට හදුළ නැකැත් වහා විවාළ මැනව, රජ්ජුරුවෝ දුවණියන් කුඹිවහන්සේට පාවා දෙන්නාහ"යි කීහ. ඉක්බිති රජ "අදම නැකත් යහපතැයි දූතයා අත කියා යළිය'යි වදාරන බුදුරජාණන්වහන්සේ

තඤ්ච රාජා වෙදෙහො, නකඛත්තං පරිපුච්ඡතෙ,
නකඛත්තං පරිපුච්ඡිත්වා, බ්‍රහ්මදත්තස්ස පාහිණි.

දදා හි 'දානි මෙ භරියං, නාරිං සබ්බඞ්ගසොභිනිං,
සුවණ්ණෙණ්ණ පටිච්ඡන්නං, දාසිගණ පුරක්ඛතං-ති-

මේ ගාථාදෙකින්:-"මහණෙනි! ඒ ඉක්මන් රජ අද නැකැත් යහපත; සියලු සත්‍රී ලක්ෂණයෙන් ශොභනවූ දුවණියන් පරිවාර සහිතව වහා එව්ව මැනවැයි කියා යැවිය"යි වදාළසේක.

බ්‍රහ්මදත්ත රජ නැවත කියා යවන්නේ "සියලු බිසෝ පලදනාවෙන් හොබනාවූ මාගේ දුවණියන් සියලු පිරිවර හා සමඟ මහ පෙරහරින් දැන්ම එවමි, දැන්ම එවමි"යි බොරු කියා ආ දූතයා යවා එක්සියයක් රජ දරුවන්ට කියා යවන්නේ 'එදවස් මියුලු නුවරට ගියා සේ අටළොස් අක්ෂෞහිණී මහා සෙනාව හා පඤ්චායුධ සන්නඬව උපකාරී නුවර බලා නික්මෙන්නට කියව, සතුරන් දෙන්නාගේ ඉස් කපා සෙට ජයපානය බොම්හ'යි කියා යැවිය. ඒ සියල්ලෝම රජහු කී පරිද්දෙන් චතුරඞ්ගිනී සෙනාව නෙන නික්මුණාහුය රජහු තුමූත් නික්මෙන්නාහු මැනියන් **නලනාදෙවිඳුදෑ**, 'අගමෙහෙසුන් **නන්දාදෙවිඳුදෑ**, පුහණුවන් **පඤ්චාලචණ්ඩ** කුමාරයන්ද, දුවණියන් **පඤ්චාල චණ්ඩි** කුමාරිකාවන්ද, යන මේ සතරදෙනා මාලිගාවේ දෙවන මාලේ රදවා සුරක්ෂිතකොට රැකවල් ලවා පහරී නුවරට බැහැර.

බෝධිසත්වයන් සහන්සේ වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව ආ මහ සෙනාවටත් බොහෝවූ සත්කාර කළ සේක. ඉන් සමහර කෙනෙක් රා බොන්නාහ, සමහර කෙනෙක් මස් මාංශ කන්නාහ, සමහර කෙනෙක් ඉක්මන්ව එන රජ්ජුරුවන් හා කැටිව එන්නාහු නොසෑතෙ දිවා දිවා ආ හෙයින් ශ්‍රාන්තව නිදන්නාහ, වෙදෙහ රජ්ජුරුවෝද සෙනකාදී **පණ්ඩිත**වරුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සරහනලද මාලිගාවේ මතු මහලේ ශ්‍රීයහන් මුදුනෙහි මිහිරි කථා කෙරෙමින් උන්නාහ.

එවේලේ චූලනී රජුරුවෝද එක්සියයක් රජදරුවන් හා අටළොස් අමාත්‍යනිගමසම්බන්ධ සෙනාව හෙනවුන් එදවස් මියුලු නුවර වටලුවා සේ තුන් සක්‍රියකින් හා සතර වළල්ලකින් කිසිතැනකිනුත් සිදුරක් නොපෑ වටලාගත්හ. විලක්කු සියදහස් ගණනින් යුක්තව අරුණු නැගෙනතෙක්ම නාල්ලම්හ'යි සනිටුහන් නොට සිටගත්හ.

අනිමිනාථිසාධකවූ චිත්තාමාණික්‍යායක් බදුවූ මාගේ සවාමිදරුවූ ශ්‍රීමහා බොධිසත්වයන්වහන්සේ බ්‍රහ්මදත්ත රජුරුවන් ආ බව දැන සහජාත යොධ යන් තුන්සියයක් දෙනා හෝරාගෙන "හෙපි හැම සුලු උමඟින් පලාගොස් බ්‍රහ්ම දත්ත රජුරුවන්ගේ මැනියන්ද අගමෙහෙසුන් කිසිවුන්ද දරුවන්දෙදෙනාද යන මේ සතරදෙනා මාලිනාවෙන් බාගෙන එම උමඟින් ගෙනැවිත් මහ උම ඟට බාලා නෙනවුන් උමඟින් පිටත්නොනොට ඇතුළු උමඟම රදවාගෙන අප එනතෙක් රැහවල් ගෙන සිට අප ආ කල උමඟින් පිටත්කොට **මහවිසල් මලු වේ සිටිය**"යි උන්ට වදුළසේක. යොධයෝ මහතාණන්ගේ බස් මුදුනෙන් පිළිගෙන සුලු උමඟින් පලාගොස් රජගෙයි හිණිපාමුල පණ්ඩිතයන්වහන්සේ විසින් අතුරනලද්දවූ පෝරුවේ සටපිටන් උහුලුවා නිලඝර දොරකුළු ඇර උඩ නැගි හිණිපාමුලය හිණිඉසය මාලිගාවේ මෙතෙක් තැන්හි රැකවල් සිටිය වුන්ද, පිරවරා සිටි කුරුන් කුදුන් ආදින්ද අල්වාගෙන දැන් දෙපා එක්කොට සරව බැඳ බැණ නොනැහෙන පරිද්දෙන් සට කඩරෙදිඹබා මූවාව තිබෙන් නාවූ ඒ ඒ සථානයෙහි කොකුවල් එල්වා රජහට ඉදිකළාවූ රසමසවුලෙන් යුක්තාව සපයා තුබූ නොයෙක් වගියේ අනඝිවූ කැවුම් ජාති නාක් මුළුල්ල සවිඝරක් තුබූම අනුභවකොට පියා සමඟරක් සුඹුවිසුඹුකොට පියා මාලිගා වේ මැටු මාලව නැඟාහ. එ දවස් තලතාදෙවි යෙහෙළඹියන් හා මුනුබුරන් දෙන්නා හා සතරදෙන එක යානට නැඟී ඔවුනොවුන් වැළඳගෙන 'සටන් නම් චපල දෙයක නුවුරු දැ නිද්ද? ජය පරාජය නම් කාට වන්නේදැයි සිතිය හැකිදැ'යි සිත සිතා වැඳහොත්තාහ.

එවේලෙහි ගිය යොධයෝ ඔවුන් උන් ගබඩායෙහි දොරකඩසිට බැණ වූහ. එබස් අසා තලතාදෙවි යානයින් නැඟි සිට 'කිමෙක්ද දරුවෙනි!'යි කියමින් දොරකඩට ආහ. යොධයෝ ඔවුන්ට කියන්නාහු 'දෙවීන්වහන්ස! අප ගේ රජුරුවන්වහන්සේ වේදෙහරජුන් මහෞෂධ පණ්ඩිතයාත් අල්වාගෙන මරා පියා සියලු දඹදිව රාජ්‍යය එක්සත් කොට එක්සියයක් රජුන් හිරිවරා මහ පෙරහරින් ජයපානය බොන්නාහු ඒ මහුලට නුඹ සතරදෙනාත් කැඳවා යන ලිණිස අප එවූහ; වැඩිය මෙනවැ'යි කිහ. එබස් අසමින් අතිශයින් සතුටුවූ වාහු දෙර අැර සතරදෙනා මාලිනාවෙන් බැස හිණිපාමුලට ගියාහ. යොධ යෝ ඔවුන් ඇරගෙන සුලු උමඟට වන්හ. එවිට රජදරුවෝ කියන්නාහු "අපි මෙතෙක් කල් මෙහි වසන්නමෝ එක දවසකුත් මේ විපියට නොබට විරැම්හ. මේ ලිපිය කිනම්දැ"යි කිහ, එබසට යොධයෝ කියන්නාහු 'කුමක් කියන් නේද? මේ ලිපියට ඇමදුම බට නොහැක්ක, මේ මඩගල ලිපි නම, අද ජයපා නය බොන දවස් මහුල් හෙයින් රජුරුවෝ නුඹ සතරදෙනා මේ මඟින් කැඳ වා එවූහ'යි කිහ. එබස 'සැබෑවැ'යි ගිවිස උමඟ විසතර බලමින් කෙළිමින් සෙ මින් සෙමින් සනෙතාෂයෙන් යන්නාහ. යොධයන්ගෙන් සවිහර සෙනෙක් රඳා නැවත රජගෙට ගොස් රුවන් ගබඩාවල දොරවල් ඇත බිඳපියා තමන් තමන් නෙනඟන පමණ සාරවූ අනඝිවූ රුවන් පොදි බැඳගෙන උමඟට බැස දොර අතුළු ගෙන පැලඟ.

රජදරුවන් සතරදෙනා පළමු ගෙනගිය යොධයෝ දිවය පුරයක් මේන් සරහනලද මහ උමඟට බාගෙන නම්ගත්හ. ඔහු සතරදෙන සිතිනෙහුත් නුදුටුවිරූ ඒ විසතර බලබලා රජ්ජුරුවන්ට මතුලවම් කළහ'සි සිතූහ. යෝධයෝ උන් සතරදෙනා උමඟින් පිටත්නොකොට ඇතුළු උමඟ සරහනලද එක් ශ්‍රියඟන්ගබඩාවෙහ ඉදුවා සමහර කෙනකුන් රැකවල සිටුවා සමහර තෙක් උන් ගෙනාබව බොධිසත්ත්වයන් වහන්සේට හොසින් කිහ. උන්ගේ බස් අසා ජනානන්දනාරවූ මාගේ සහෝදරුවාණෙනි "යෙවිට මාගේ මහාදෙව්‍ර මුදුන්පත්වීය"යි ඔදවැඩි සතුටුව රජ්ජුරුවන් සමීපයට හොස් වැඳ එහක්පස්ව සිටිසේක.

රජ්ජුරුවෝ කෙලඟයන් විසින් මඩනාලද අදහස් ඇතිව උන් බැහින් 'දුවණියන් දැන් එවති දැන් එවති'සි සිත සිතා උන්නාහු වහා හුනස්නෙන් නැඟී සීමැදුරු කවුළුව හැර පවුරෙන් පිටත බලන්නාහු (මාගේ සහෝදරුවූ තිලෝගුරු ශ්‍රී මහා බොධිසත්ත්වයන් මතු බුදුවන කලක් තුන්ලෝවාසින් කරන්නාවූ ප්‍රදීපපූජාවට පෙරනිමිති පාතා කලක් පරිද්දෙන්) සවස පවන් දිලි යෙන්නාවූ විලක්කු සියදහස් ගණනින් යුක්තවූ අනන්තාපරිමාණ චතුරඞ්ගිනී මහබළ සෙනාව නුවර වටලා සිටියවුන් දැක කිමෙක්දෝයි සිතා ළය ඉපිළ අතිශයින් සැකව, සෙනකාදී ප්‍රඥාසම්පන්න පණ්ඩිතවරුන් හා සමඟ මන්ත්‍රණය කරන්නාහු 'ඇත් අස් රථ ආදිවූ සන්නාහ සන්නද්ධවූ 'ගනුව මරව' යනාදි යුද්ධයෙහි කිවමනා බස් බණන්නාවූ සෙනාව, ශරදඍතුශයෙහි තාරකාවන් පරිද්දෙන් බබලන්නාවූ විලක්කු ආලොකයෙන් මේ නුවර හිරුනැඟි කලක් මෙන් අතිශයින් බබළා ගියේය. චූලනි රජ්ජුරුවෝ මරසෙනඟක් පරිද්දෙන් මේසා සෙනාවක් ගෙනාවාහු අපකෙරේ සතුරින් අවුද? නොහොත් රුහුණිව අවුද? පණ්ඩිතවරුනි! මේ කුමකැ'සි සිතත්දැ'සි

හත්ථි අස්සා රථා පත්ති, සෙනා තිඨන්ති වම්මිතා,
උක්කා පදිත්තා ඛායන්ති, කිං නු මඤ්ඤන්ති පණ්ඩිතා.ති–

මේ ගාථාවෙන් කිහ: –

ඒ අසා සෙනක පණ්ඩිතයා කියන්නේ "මහරජ! නොසිඟා වදුල මැනව. බොහෝ විලක්කු ආලොක පෙනෙයි; නැවත වේලා නොවරදවා සරණ දෙන පරිද්දෙන් දුවණියන් හැරගෙන බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ආහයි සිතමි කිහ. නැවත පුක්කුසයා කියන්නේ "මහරජ! නුඹවහන්සේට සත්කාර පිණිස නොරට ආ හෙයින් රැකවල්ගෙන සිටිනා නියාය" කිය. ඒ අඳුන පණ්ඩිතයෝ සතරදෙන යමක් සිතුවෝ වීනම් නන් දෙඩන්නවුන් මෙන් කවට ආවක්ම කීහ.

වෙදෙහ රජ්ජුරුවෝ "මේ මේ ස්ථානයේ මෙහෙක් මෙහෙක් සෙනාව බැඟින් සිටුවා මේ ස්ථානයෙහි සුරක්ෂිත කොට රැකවල් රකුව, පමානොවව, නොනිදව" යනාදි කියන්නාවූ බස්ද අසමින් සන්නාහ සන්නඬව යුඬයට සැරහි සිටින්නවුන්ද දැක, මරණ භයින් තැතිගෙන බොධිසත්ත්වයන් වහන්සේගේ බසක් ප්‍රාර්ථනා කරන්නාහු මෙසේ කියන්නාහ. ඇත් අස් රථ පදික යන අනන්තාපරිමාණවූ චතුරඞ්ගිනී සෙනාව සන්නාහ සන්නඬව සිටිනිය. ප්‍රමාණාතික්‍රාන්තවූ විලක්කු ආලොකයෙන් එකොහාසව්ය. මෙසේ මහා පණ්ඩිතයෙනි! නොපි 'මේ කුමකැ'සි සිතව්ද? මේ සෙනාව අපට කුමක්

කරන්නිදු'සි කිහ. එබස් අසා කලහදෑමියක් වැනි තිලෝගුරු බොධිසත්ව යන්වහන්සේ සිහනසේක් "මේ අතුනුවු ඊතු මිදක් මරණ ගින්නෙන් තවාලා පසුව මාගේ බල දක්වාලා අස්වසාලම්"සි සිතා වදාරනසේක් "මහරජ! අභිබල ආදිවූ පසඳු ප්‍රභාව බලයෙන් අසමානවූ බුහ්මදත්ත රජුරුවෝ "වේදෙහරාජු රුවෙනි මේ නුවරට ඇවිත් පැමිණීසෝය, දුනසේ මිත්තොට ගහිමිහ, පලා ගිය නම් නපුරැ"සි අද මේ වෙලෙනි පවන් හුන්යම් රාත්‍රියෙහි සුරක්ෂිතකොට රැකවල් ලවා රැකඩිව පාන්වූ බල නුඹවහන්සේ අල්වාගෙන මරන්මය, මිඳ හුත් දම්ණියන් සරණ දෙන්නට හා තිනතමිව ආ ගමනෙක් නොවෙ"සි වදාළසේක.

එබස් අසමින්මි සෙනඟයා ආදිවූ සියල්ලෝම මරණ භයින් තැතිගෙන හිසිවිහුන් සියන්නට අසම්මිවූහ රජහු උතුර වියලි සෙළ සිදිහිසේය; ඇඟින් ඩා සෙල්දි හොස් මරණභයින් වලපන්නාහු මෙසේ කියන්නාහ. "මහෙෂධ පණ්ඩිතයෙනි! ඉතා මිදුවූ ළා දරුවක් පරිද්දෙන් මාගේ ළය වෙව්ලන්නේය, මිඩයෙනි සෙළ සිදිහිසේය, නින්නෙන් පැලති ගිය එනක්හු අවිවේ ලු කලක් පරිද්දෙන් මේ භයින් ගැලවීමක් නොදන්නේ සැනසිලි නොලබම්; තවද සඟුරන්නේ උදුනෙහි ගිනි ඇතුළෙන් දවන්නේය, පිටතට නොපෙනෙන්නේ ය, එපරිද්දෙන්ම මාගේ ළෙහි ගත් ගිනි හෘදය ඇතුළෙන් දන්නේය, පිටහට නොපෙනේන්නේස"සි කියා ඇඬුහ. බෝසතාණන්වහන්සේ රජුගේ බැගෑ පත්ව වලපන්නා හඩ අසා 'මේ නුවණින් අඬවූ රජ මා පළමු කිවා නොකෙළේය, මිතු කිසරුවන ලෙස තවත් නිග්‍රහ කොට අදුන්වාලම්'සි සිතා වදාරන සේක් "මහරජ! නුඹවහන්සේ කාමලොභයෙන් අඬුවූසේක් මොහයෙන් මුළාවූ සින් ඇතිව ගමන් විවාළතැන මාගේ ප්‍රඥාවෙන් මතු මේ නියාහයෙක් වින් නේයයි නියව කියවා ඒ 'නපුරැ'සි නොගිවිස සෙනහාදීන්ගේ බස් 'යහපතැ'සි ගිවිස. නිත්‍ය මන්ත්‍රණයෙන් මේසා මහත්වූ භයසට පැමිණිසේක. ඒ මහා මන්ත්‍රීවූ සෙනහාදි පණ්ඩිතවරැන් සතරදෙනාගේ බසින් සරණ හිදුවා රජුරුවන් හා නැනම් සඹඬිය කළා ඉතා යහපත, නුඹවහන්සේගේ සිත භින්න කොට හුම්ම ඇමින් 'ඉනතඩක් පිඩක් ලැබ ගනුම්හ'සි ලොභවෙතනායෙන් කයි වාරැ කොට නෙනාවෝ මේ දැකින් ගලවා නොගනිදිද? වන්නාටය, උන් ගල වාගන්නාත් දකිමි, උන්ගේ බලත් දක්නෙමි වේදැ"සි වදාළසේක.

මෙසේද කියා "මෙලොවින් පරලොවින් වැඩක්ම වන්නා කැමැති සියල්ලන්ම උතුම් අමාත්‍යව සිටි මාගේ බස් නොගිවිස කාමයෙන් ඇලුණු සින් ඇතිව, යම් කිසිවක්හි ලොභයෙන් මුවකු අවුත් දැඩිමලෙක බැඳුනාසේ පඤ්චාලවණ්ඩි කුමාරිකාව ලැබපියම්හ"සි යන ලොභයෙන් අවුත් මරුමුවෙහි අසුවූසේක. එ දවස්ම 'පඤ්චාල දෙශයට ගමන් යහපත්දැ'සි විචාළ නුඹවහන්සේට 'මෙම උපමා කොට කියෙමි වේදැ'සි වදාළසේක. මෙසේද කියා නැව නත් වදාරන සේක් "ජනප්‍රධානවූ රජුරුවන්වහන්ස! 'අභාවාර සඩරූප ඇති අසත්පුරුෂයා හා මිත්‍රධර්මයක් නොකළ - නැව, ඉදින් ඔහුගේ බස් ගිවිස සරණ සොයා ගිය සේක් වීනම් මෙලොවින් පරලොවින් වන වැඩෙක් නම් නැත, දෙලොවින්ම ඕහට දුක්මවත්ෙන්ය'සි කියව කියවා ඊ - කීවා නොසොට ඔහු කීවාම කළසේක්වේද? ඉදින් මා කීවා කළසේක් වීනම් අද මෙසා දුකොත්වත් හයෙක්වත් නැත්තේවේදැ"සි වදාරා නැවත සිතනසේක් මේ රජහු මතුත් නොකීකරු නොවන ලෙස තරකොට නික්මවා නිග්‍රහසට පවුණුවා, පළමු කී

වාම කියා හය හා ලජ්ජාවට පමුණුවමි'සි සිතා වඳුරුනසේක් 'මහරජ! එදවස් ගමන් නොනිය මැනවැ'සි කිවුවු මට නුඹවහන්සේ කියන්දු 'සෙවවට පණ්ඩිතයන් ආදීහු පණ්ඩිත වරුමය, රජහෙයි හසළුයෝත් රජදරුවන්ගේ අදහස දන්නෝත් මනුලව හිසි බස් දන්නෝත් උන්මය. මේ නොමියා පිත් නිමුන් මිට එලිහෙන සී සා සතසේ දන්නා බව මුත් රජහෙයි කායර්‍ය්‍ය හා මනුල් බැවහාර දනිදැ'සි මට කිපී 'කොල! ගොවියා පිත් බොටුව අල්වාහෙන මාගේ විජිතයෙන් ඇත ලව්'සි වදුළුසේක් නොවේද? එදවස් එසේ කී නුඹවහන්සේ දැන් එසේවූ ප්‍රඥාසම්පදයන් සිටියදී මා නොමියාපුතු අතින් ගැලවෙන උපාය විචාරන සේ ඉතා නොයෙදෙන්නේය, මා අතින් උපාය විචාරන නුඹවහන්සේමය' කොළතොලුසේකුත්, නුවණ නැතිසේකුත්, මා දන්නේ සිසා සත මාන පමණක්ය, වුවමනාසේක්වීනම් සී සාන මාන විචාරගත මැනව, නුවණැත් නෝත් පණ්ඩිතවරුන් මේ මරින් ගැලවෙන උපාය දන්නෝත් සෙනසාදී පණ්ඩිතවරුය; නුඹවහන්සේ මට කිවමනා වීනම් එදවස් කිවාසේ සර අල්වා පිටත ලන්නට කිවමැනව, අටළොස් අක්ඛෞහිණී සඛ්‍යාත මේ සෙනාව අතරෙන් සෙනසාදිහු ගලවාගනිත්වා, මම කුමන් දනිමිදැ''සි වදුළුසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු "පණ්ඩිතයෝ පළවූ මා කී අපරාධයම කියන්නාහ, මපුහණුවෝ මේ මතුවන්නාවූ භය තමන්ගේ ප්‍රඥා චක්ෂුසින් මනාකොට දුටුවහ, එබැවින් මා තරවා නිග්‍රහයට පමුණුවාලනි; අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල් දන්නාවූ වජ්‍ර බුද්ධිවූ ජනහිත නිරතවූ ඒ මාගේ පුතණුවෝ 'අනාගතයේ මෙබදුවූ භයෙක් වන්නේය'සි දැන දැනත් සාරමසක් මුළුල්ලෙහි හිඳි නාහු නිකම් නොසිඳිනාහ; ඒකාන්තයෙන් ගැලවෙන උපායෙක් සෙරෙත්මය; එසිත් මා විසින් පරීක්ෂාකළ මැනව''සි සිතා කියන්නාහු "පුත මහෞෂධ පණ්ඩිතයෙනි! නුවණ නැතිව ගිය දවස කළ දුසිකම් හා නොදැන කියාපි බස් පමණක් සිත තබාගෙන කිය කියා දුකට පැමිණියන්ට නුවණැත්තෝ නිග්‍රහ නොකරන්නාහ, තෙපිත් මහත්වූ නුවණැත්තෝය, අනුවණින් කියාපි වරදම කියව, සතුරු සෙනාවක් වටලාගත් කල්හි පිට හිඳුවාගෙන නැඟියන්නට තරම් ජවසම්පන්න සඳ සිටියාවූ අසකුට තියුණු හියකින් විදුනා කලක් පරිද්දෙන් කුමට මා විදුද? ඉදින් කියව් නම්, ගැලවී නැඟියන උපායක්වත් සතුරන්ට අසුනොවී නැඟි යන තැනක්වත් දනුනම් ඉන් මට අනුශාසනා කරව, හිය දවස මා නුවණ නැතිව කියාපි කථා සිහි නොට තෙපගේ වචන නමැති හියෙන් මා නොවිදුව, තරකොට බැඳි හසු කැවිටින් විදිනාසේ මා නොවිදුව. ගැලවෙන උපායක් කියව, තොප හැර මට අනික් පිටිවහලෙක් නැතැ''සි කියා හැඬුහ.

එබස් අසා කරුණාවට ආකරවූ සබාම්දරුවාණෝ සිතනසේක් 'මේ රජහට මා විනා අනික් පිටිවහලෙක් නැත්තේය, මේ රජ ඉතා අඹ බාලය; තවා නුවණ නැති හෙයින් පුරුෂ විශෙෂය මදතුත් නොදන්නේය; තවත් මදක් හවාලා පසුව අස්වසාලමි''සි සිතා වඳුරුනසේක්:—

අතීතං මානුසං කම්මං, දුක්කරං දුරභිසම්භවං,
න හා සක්කොමි මොචෙතුං, තම්පි ජානාසු ඛත්තියා-ති-

යන මේ ගාථාවෙන්:— "මහරජ! මේ සා සෙනාවක් වටලාගෙන සිටි කල ඉන් මිදී යන තරම් උපායක් කොට ගැනීම මනුෂ්‍යයන්ට ඉතා බැරි

වන්නේය: මිනිසුන් චන්ද්‍රමණ්ඩලයක් ඇත්නම්, ඒ සියල්ල සහරන් වවලා සිටිහෙයින් මනුෂ්‍යයන්ට අවිෂය, එසිත් ඉක්මනියේය. දැන් මෙවිට ගැලවෙන උපායක් කරන්නා නම් සිතින් සිතන්නටවත් නොවිළිවන; දැන් කරන උපායකින් නුඹවහන්සේ ගලවාගන්නට මම අසමර්ථයෙමි; මහරජ! නුඹවහන්සේ ගැලවෙන උපායක් දනමැතැ'යි වදාරන්සේක්:—

සහන්ති වෙහාසයා නාගා, ඉද්ධිමන්තෝ යසස්සිනෝ,
නෙවි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා.

සහන්ති වෙහාසයා අස්සා, ඉද්ධිමන්තෝ යසස්සිනෝ,
නෙවි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා.

සහන්ති වෙහාසයා පක්ඛී, ඉද්ධිමන්තෝ යසස්සිනෝ,
නෙවි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා.

සහන්ති වෙහාසයා යක්ඛා, ඉද්ධිමන්තෝ යසස්සිනෝ,
නෙවි ආදාය ගච්ඡෙය්‍යුං, යස්ස හොන්ති තථා විධා-ති-

මේ ගාථා සතරින්:- "සමහර රජදරුවන්ගේ මෙසේවූ දුකෙහිදී ගලවා ආකාශයෙන් ඇරගෙන යන්නාවූ උපොසථය ශබ්දනාමය යන සෘඩි සම්පන්නවූ ඇත් සෙනෙක් ඇත්තාහ. එසේවූ ඇත්කෙනෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා අහසින් ගෙනයෙත්වා, නැවත සමහර රජදරුවන්ගේ සෘඩිමත්වූ වලාහක අශ්වයෝ ඇත, එසේවූ අස්කෙනෙක් නුඹවහන්සේගේ ඇත්නම් උසින් නුඹවහන්සේ ආකාශයෙන් ගෙන යෙත්වා; තවද සමහර රජදරු සෙනකුන්ගේ ආකාශ චාරිවූ ගරුඬ වාහනත් ඇත්තේය; තවද සමහර රජදරුවන්ගේ එසේම පක්ෂි වාහනත් ඇත්තේය; තවත් සෘඩිමත්වූ යක්ෂ සෙනෙක් ඇත්තාහ; එසේවූ වාහනයෙක් නුඹවහන්සේට ඇත්නම් මේ දුකින් ගලවා ගනිත්වා; මම ආකාශචාරිවූ ඇත් අස් පක්ෂි යක්ෂ ආදින් පරිද්දෙන් නුඹවහන්සේ ආකාශයෙන් ගෙනගොස් මියුලු නුවරට ලාලන්නට අසමර්ථයෙමි"යි වදාළසේක. එබස් අසා රජ්ජුරුවෝ මුවෙන් නොබැණ උන්හ.

එවිට සෙනකුයා සිතන්නේ "රජ්ජුරුවන්ටත් අපටත් පණ්ඩිතයන් විනා අනික් කිසි සරණක් නැත්තේය. රජ්ජුරුවෝ වනාහි පණ්ඩිතයන්ගේ බස් අසා හසිත් තැතිගෙන කිසිවකුත් කියන්නට අසමර්ථහ. මෙවිට මමත් තමා පණ්ඩිතයයි දනපත නියවා යාච්ඤා කොට බලම්"යි සිතා කියන්නේ;

අතිරදස්සි පුරිසෝ, මහන්තෙ උදකණ්ණවෙ,
යත්ථ සෝ ලහතෙ ගාධං, තත්ථ සෝ විඳතෙ සුඛං;

එවං අම්හංව රඤ්ඤාව, ත්වං පතිඨා මහොසධ!
ත්වං නොසි මන්තිනං සෙට්ඨෝ, අමෙහ දුක්ඛා පමොචයා=ති-

මේ ගාථා දෙකින්:— යම්සේ සයුරෙක හුණු පුරුෂයෙක් දුකසේ ගොඩක් දුටුසේනම් ගොඩ දුටුවේලෙහි ඒ ටන් ඕනට මහා සැප වන්නේය එපරිද්දෙන් අපටත් රජ්ජුරුවන්ටත් නුවණින් හා මන්ත්‍රීකම්න් උතුම් සේක් නුඹවහන්සේවේද, එබැවින් මේ දුකින් මුදා අප ගලවාදෙන මැනවැ"යි කීය. එසේ කී සෙනකුයාට තරව භය උපදවා නිග්‍රහ කරන්නේ;—

අතීතං මානුසං කාමං, දුක්කරං දුරතිසම්භවං,
හතා සඤ්ඤාමි මොවෙතුං, තුවංපි ජානාසූ සෙනකා=ති=

මේ ගාථාවෙන්:— එම්බල අඤ්ඤය! එදවස් 'මේ ගමින් නොකැමැත්තේ'යි මා කියතුත් රජුට නොයෙක් කාරණා කියා උගන්වාගෙන ආයෙනිත් නෝමය, ගෙනවුත් මේසා දුකකට පමුණුවා මේසා අනර්ථයක් යෙදුයෙනිත් නෝමය, එම්බල අසත්පුරුෂය! මනුෂ්‍යයන් විසින් ගැලවෙන්නට නොහැකි යම් උපදේශයෙක් ඇත්නම් මෙවිට මේ ඇසිල්ලෙහි කරන්නා නබා සිතන් නවත් නොපිළිවන, ඒ සියල්ලම ඉකුත්ව ගියේය, මා විසින් දැන් හොට සාදා ගත හැකි කිසිවකුත් නැත්තේය, මට නොපිළිවන, තෙපිත් පෙර 'අප මුත් නැහැ'යි බැහැවෙන පණ්ඩිතවරු වූහ, තොපගේ නුවණින් මේට උපායක් සිතා තෙපිත් ගැලවී රජ්ජුරුවනුත් ගලවා ගනුව"යි වදාළසේක. මෙසේද කියා නැවත 'තෙපි සපන්නම් ආකාශයෙන් ගෙන ගොස් මියුළු නුවර ලාවි යව'යි වදාළසේක.

රජ්ජුරුවෝ ගැලවෙන්නට උපායක් සිතන්නාහු මරණ භයින් තැති ගෙන බොඩිසත්වයන් හා සමඟ කිසිවකුත් කියන්නට අසමර්ථව "යම්සේ මේ සේනකයාත් පණ්ඩිතයකුවුව. කිසිම උපායක් දනිනම් විචාරම්"යි සිතා සෙනකය! මේ උපන් භයින් ගැලවී යන්නට සුදුසු උපායක් දනිනම් කියව'යි,

සුණෝහි එතං වචනං, පස්සසෙතං මහබ්භයං,
සෙනකං දානි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි-ති-

මේ ගාථාවෙන් වදාළ රජ්ජුරුවන්ට සෙනකයා "යම්සේ මසක් මංමුලාවූ එකොක් සමඟක් මංමුලාවූ එකකු අතින් මං විචාළේද, එපරිද්දෙන් මේ රජ්ජුරුවෝ මා අතින් ගැලවෙන උපාය විචාරන්නාහ, යහපත් වුවත් නපුරු වුවත් මා කටට ආවක්ම කියම්"යි සිතා එක් උපායක් සලකාගෙන කියන්නේ.

අග්ගිං දුවාරතො දෙම, ඡණ්ණාමසෙ විතක්කතං;
අඤ්ඤමඤ්ඤං වධිත්වාන, ඛිපථං හෙස්සාම ජීවිතං;
මා නා රාජා බ්‍රහමදත්තෙනා, විරං දුක්ඛෙන මාරයි-ති-

මේගාථාවෙන් කියා:—

මේ ගාථාවේ අර්ථයනම් "මහරජ! කරන සේක් විතම්මා කියන උපාය යහපත, මේ අප හැම උන් මාලිගාවට අපි හැම වැදලා දෙර පිටතින් බන්දලා ගිනි ගස්වාලා නිසුණු මුවහත් ඇති කඩුවක් බැගින් නමකට එක එක කඩුව ගෙන ඔවුනොවුන් කොටා මියයමිහ; එසේ මළාවූ නුඹවහන්සේ හා අප හැමදෙනාට සෑහූ මාලිගාව එක දරසැයක් වන්නේය. බ්‍රහමදත්තයෝ අල්ලා ගත්තු නම් ජනමානන්තර වෛරී හෙයින් වධකොට බොහෝ දවසකින් දුක්දී මරන්නාහ; එබැවින් වහා මියයාම උත්තමය"යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ 'හාට හා තානේ අඹුදරුවන්ට මෙබඳු දරුණු කුත් වෙසේ මරකුත් වේව'යි මට මෙවැනි මරක් නොවේව'යි කියා පුක්කුස ආදි තුන්දෙනා විවාළහ. ඔවුනුත් නුවණ නැතිව හමන් තාටට ආවක්ම කිහ, එසේ හෙයින් කියනලදී.

සුණෝහි එතං වචනං, පසසසෙතං මහබ්භයං
පුච්ඡාමුසං 'දුනි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි. - නි -

මේ ගාථාව අසා පුක්කුසයා කියන්නේ "මහරජ! බ්‍රහ්මදත්තයෝ අල්වා ගත්තු නම් ජනාධිපතිතුමා වෛරී හෙයින් නොයෙක් වධ කොට විරාත් කාලය කින් දුක් දී මරන්නාහ: කෙසේ කොටින් මරණ නොනවත්නා බැවින් අපි හැම දෙනම උන්වූ ඒකයක් කාපියා වහා මියයමිහ"යි කිය. උගේ බස් අසා නොසතුටුව "හාගේ අඹුදරුවන් හා සමඟ හෝ වස කා මිය යව, මට මේවැන් නක් නොකියව"යි කියා කාවින්දයා එවාළහ.

කාවින්දයාත් පණ්ඩිතයකු වුව, ඒ ගැලවෙන්නට උපායක් දනී නම් කියව,,යි

සුණෝහි එතං වචනං, පසසසෙතං මහබ්භයං,
කාවින්දං දුනි පුච්ඡාමි කිං කිච්චං ඉධ මඤ්ඤසි.-නි -

මේ ගාථාවෙන් කිහ-.

ඒ අසා කාවින්දයා කියන්නේ "මහරජ! බ්‍රහ්මදත්ත රජතෙමේ අප අල් වාගෙන බොහෝ වධ කරවා මහ දුක් දී බොහෝ දවසකින් මරන්නේය; ඔහු අතින් වධ විඳ මියන්නා නොබලාත් නමකට ලැනුවක් බැඟින් ඇරගෙන මාලි ගාවේ මතුමැලට නැඟි සිමැදුරු කවුළුවෙන් පිටත කොබෝ ගෙඹි වළල්ලේ රිණ බැඳලා මල ඉදිකොට කරලාගෙන පැන මියමිහ, නොහොත් කර වැල් ලාගෙන මියමිහ, නැත, ගැඹුරු ප්‍රපාතයකට පැන පියා වහා මියමිහ"යි කිහ ඒ අසා රජපුරුවෝ 'එසේ කර වැල් ලාගෙන මියයන මරෙක් තාගේ අඹුවන් ට හා නට වේව'යි 'එසේවු දෙයක් මට නොවේව'යි කියා "දෙවිඳය! මේ උපන් භය තොසිත් දුටුයෙහිවේද? ඉදින් නොසිත් උපායක් දනී නම් කියා බලව"යි

සුනොහි එතං වචනං, පසසසෙ තං මහබ්භයං,
දෙවින්දං 'දුනි පුච්ඡාමි, කිං කිච්චං ඉධ මඤ්ඤසි.-නි

මේ ගාථාවෙන් කිහ :=

මේ ගාථාව අසා ඒ පැන නැඟි අනිකක් සොයා ගන්නට අසමර්ථව 'සෙ නක පණ්ඩිතයා නී ලෙසම කියමි'යි සිතා "මහරජ! බ්‍රහ්මදත්තයා අල්වා ගනී නම් නමා කැමැති වධයක් කරවා බොහෝ දුක් දී කලාතුරකින් මරන්නේය, එසේ දුක් විඳ සතුරන් අත මියයන්නා නොබලාත් මේ මාලිගාවේ දෙර පිට තින් වසා බන්දලා ගිනි ගස්වාලා නමකට කඩුවක් බැඟින් ඇරගෙන ඔවු නොවුන් කොටා මියයමිහ; මේ විසිතුරු මාලිගාව බ්‍රහ්මදත්ත යාට ප්‍රයෝජන වත් නොවී අප හැමදෙනාට එකම දරසැඟක් වන්නේය, මේ විනා මා දන්නා අනික් උපායෙක් නැත, පොළොව පැකුලුනන්ට එම පොළොව පිහිටවන්නා සේ මේ දුකින් අප හැමදෙනා සුවසේ මුදුපියත් නම් කරුණා නිධානවූ ජන හිත නිරතවූ මහෞෂධ සවාමීන්වහන්සේ විනා අපසේ නුවණින් අඹයන්ට ඒ විෂය නොවෙයි, ඇවිලෙන ගිනි තබා කණමැදිරියන් පිඹින්නාසේ ප්‍රඥා නමැති වහ්නිසඤ්ඤයෙන් සමසත ලොකය ඒකාලොකකර බබුළුවන්න මේ උත්තමයාණන් සිවිසුදී අප සතරදෙනාසේ නුවණින් අඹයන් අතින් ගැල

වෙන උපාය විචාරන්නේ අපටත් වඩා නුවණ නැති නියාද? කරන යාඋසු, එහෙ අපි හැමදෙනම පණ්ඩිතයන් වහන්සේව කරමින්" යි මේසේද කියා "අපි හැමදෙනම එක්ව බැඳගෙපත්ව නඩා දෙවා "අප ගලවාගන්න මැනවැ"යි යාඋසු කරම්හ, සතුරන් හෙරෙනිත් මිතුරන් හෙරෙනිත් සඳරුස්නන් කිරිමුහුදු සේද, සක කිරි වන්නාළා සේද, සම්බුදු මෛත්‍රී ඇති මේ උත්තමයාණෙනි තමන්ට විෂය නිහම් මේහෙත් දෙනා අනාථ මිරණින් මියයා නොදන්නාහ, උන්වහන්සේත් තරව නොසිළිවෙන්යි කිවනොත් සෙනක පණ්ඩිතයන් කි ලෙස දෙර බැඳ ගිනි ගස්වා උදුනුන් කොටා මියමිහ"යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ පෙර තමන් බොධිසත්වයන්ව සිටි කී අපරාධ සඳහන් කොට ඔබ හා සමඟ කිසිවකුත් කියන්නට අසමර්ථව මිනහාණන් දැස අසා සිටියදී ඔබ ළය සම්පාවන පරිද්දෙන් බැගෑපත්ව හඬන්නාහු.—

යථා කදලිනෝ සාරං, අඤ්ඤං නාධිගච්ඡති,
එවං අඤ්ඤත්‍ර ඤාණා, පඤ්ඤං නාජ්ඣ ගමාමසෙ.

යථා සිම්බලිනෝ සාරං, අඤ්ඤං නාධිගච්ඡති,
එවං අඤ්ඤත්‍ර ඤාණා, පඤ්ඤං නාජ්ඣ ගමාමසෙ.

අදෙසෙවත නොවුත්ථං, කුසග්ගරානං වනොදකෙ,
සඤාසෙදුම්මනුස්සානං, බාලානම විජානතං.

උබ්බෙධති මෙහදයං, මුඛං ච පරිසුසසති,
නිබ්බුතිං නාධිගච්ඡාමි, අග්ගිදඩ්ඩොව ආතපෙ.

කම්මාරානං යථා උක්කා, අන්තොඩ්ඩායති නොබහි,
එවම්පි හදයං මයහං, අන්තොඩ්ඩායති නොබහි – ති – මේ ගාථා වන් කියා හැඬුහ.–

මේ ගාථාවන්හි අභිප්‍රාය නම්:– "යම්සේ කෙහෙල් ගස් හර ඇතැයි වරදවා සිතාගත් නුවණ මඳ පුරුෂයෙක් කැපෙන යතඹයක් නැවීහත් ගා මුවහත සියුම්කොටගෙන මහත්වූ රඹවනයකට වැද මහත් මහත් කෙහෙල් ගස් කපා බඹ දක්වා බිඳලු හ රත් එහි කිසි හරයක් නොදකිද, එපරිද්දෙන් මින් ගැලවෙන උපාය සොයන්නාවූ මම කිසි කෙනකුන්ගෙනුත් නුවන නමැති සාරයක් නොදුටුයෙමි; නවද ඉඹුල් හරයකින් ප්‍රයෝජන විඳිනා කැමැති පුරුෂයෙක් කෙහෙල් හර, සෙව් පුරුෂයාසේ ඉඹුල් වනාහ කොටා එක ගස කත් හර නොදකිද, එපරිද්දෙන් මේ දුකින් ගැලවී ගන්නා උපායක් සොයන්නාවූ මම හරනැති ඉඹුල් රුකක්සේ වූ මොවුන් හැමදෙනාගේ ප්‍රඥ නමැති සාරයක් මදකුත් දුටුවිද නැත්මි; පින් නැති මහ වනයෙක්හි විසූ මහ ඇතෙක් ගිම් සමයෙහි සම්මයෙන්. පිඬිත වූවහු සේ දුකට පැමිණි කල්හි දුකින් ඉදගලවා ගන්නට තරම්වූ උපායක් නොදන්නා අඳුනන්ත සමීපයේ අනේ මා විසූ නියාවත් ඉතා නපුරුය; දැන් මාගේ ළය සුළඟට වෙව්ලන්නාවූ ළඳ පලල වයක්සේ කම්පිත වන්නේය, කට තෙළ සිදී උගුර වියළී, හිත් නෙත් හැවුණු එකක්හු අව්වේ ලූ කලක් පරිද්දෙන් කිසි අස්වැසිල්ලක් නොලබමි; තවද සාඹුරු උදුනේ ගිනි ඇතුලෙන් දවයි, ඒ ගිනි පිවතට නොපෙනෙයි; එපරිද්

දෙන් දැන් මාගේ ළෙහි මරණ හිනි ඇතුළෙන් දවන්නේය, පිටතට නොපෙනෙන්නේය; මේ පණ්ඩිතවරුන් අමාත්‍ය ධුරයෙහි නුවණට හා මන්ත්‍රීකමට හබා මිසු තියාව පැන් නැති මහ වනයෙහි ඇතු මිසුවෙක් වැන්න, නුවණ නැති පුරුෂයා නෙහෙල් සර ඉඳුල්හර සෙවීවා වැන්න, ඒ නිරූ දහ වනයෙහි මිසු ඇත් උදහයෙන් පිඹිනවුයේ නොබෝ කාලකින් සතුරන්ගේ හසහ ප්‍රාප්ත වේද, එපරිද්දෙන් නුවණ නැති පණ්ඩිතවරුන්ගෙන් එකකුත් මේ දුකින් මුදලන්නට සමර්ථ නොවේ"යි බැගෑපත්ව ඇඬුහ.

මෙසේ ඇසුවන් ළඟ කමපාවන පරිද්දෙන් අඩන්නාවූ රජ්ජුරුවන්ගේ අඳෝනා හඬ අසා සරණාගත වත්සලකුරුයක් වැනිවූ මාගේ සවාමිදරුවූ බොධිසත්වයන්වහන්සේ "මේ රජ මරණ භයින් ඉතා කලාන්ත විය, සා පිපාසා ඇත්තවුන්ට අන්නපාන දෙන පිටිවහල් වන්නාසේ ගිලනුන්ට වෙදුන් පිටිවහල් වන්නාසේ මේ රජ හටත් මා මුත් අනික් පිටිවහලෙක් නැත, මෙවිට මොහු අස්වසා නොලා තවත් හදවිනම්, නොකඟෙන් ළඟ පැලී ගියනම් නපුර, සාරම්සක් මුළුල්ලේ මා ගත් දුක් නිෂ්ඵල වන්නේය, එබැවින් අස්වසා ලම්"යි සිතා අස්වසා වදාළසේක. (ඒ බව ප්‍රකාශකොට වදාරන බුදුරජාණන් වහන්සේ)

භතෝ සෝ පණ්ඩිතෝ ධීරෝ, අස්සදාසි මහොසධෝ,
වෙදෙහං දුක්ඛිතං දිස්වා, ඉදං වචනමබ්‍රවි. -ති-

මේ ගාථාවෙන්:- එම්බා මහණෙනි! ඒ රජතෙමේ මහෞෂධ පණ්ඩිත තෝ නොකැමැති කර තමන් සරණ සොයා ගොස් හුන් උපකාරී නුවර බ්‍රහ්මදත්තයා එක්සියයක් රජුන් සහිතව මහ සෙනාව ගෙනවුත් වටලාගත් කල්හි, අඹුවන් තබා තමා ගැලවීගත නොහී මිදෙන උපාය විචාළේය. ඕහට මහෞෂධයන් 'ඔබ නොගිය මැනව, ගියහොත් මහා විනාශයට පැමිණෙන්නේය. නොයා හැක්කැ'යි කීම්. 'ඒ මා කටයුතු නොදනිති'යි වරදවා බැණ නිග්‍රහයෙන් පිටත ලවා ඔබ ගියමැනව, ගියහොත් මහත් වැඩ වන්නේය'යි කියන ලද සෙනකාදීන් බසින් නුඹවහන්සේ ආ සේක් වේද, දැන් ඒ පණ්ඩිතවරුන් අතින් උපාය විචාරාගත මැනවැ"යි කී කල්හි සෙනකාදිවූ සතරදෙනාත් විචාරා උන්හැමදෙනා කියනලද මරණෝපාය අසා නොසතුටුව මහෞෂධ පණ්ඩිතයන්ට කිය නොහී භය ඇතිව උන්ට ඇසෙන පරිද්දෙන් අඩන්නාවු වෙදෙහ රජු බස් අසා මේවිට අස්වසා නොලිම් නම් ළඟ පැලී නැසී ගියහොත් මා දිවා රෑ ගත් දුක් මුළුල්ලම ව්‍යර්ථවන්නේය, තවද මතු බොහෝවා දහස් මුළුල්ලෙහි සදමඬල ඇන්දසේ පෙනෙන්නාවූ මාගේ ප්‍රඥා විශෙෂය ජල රෙඛාවක් පරිද්දෙන් තුවජ වන්නේයයි සිතා රජහු අස්වසන්නාහු:—

මාභවං භාසි මහාරාජ! මාභවං භාසි රථෙසභ!
අහං භවං මොචයිස්සාමි රාහුගහිතංව චන්දිමං.

මාභවං භාසි මහාරාජ! මාභවං භාසි රථෙසභ!
අහංභවං මොචයිස්සාමි රාහුගහිතංව සූරියං.

මාභවං භාසි මහාරාජ! මාභවං භාසි රථෙසභ!
අහං භවං මොචයිස්සාමි පඛෙක සන්තංව කුඤ්ජරං.

මාඛා භාසි මහාරාජ! මාඛං භාසි රථෙසභ!
අහං ඛං මොචයිස්සාමි පෙළාබඬංව පන්නගං.

මාඛං භාසි මහාරාජ! මාඛං භාසි රථෙසභ!
අහං ඛං මොචයිස්සාමි මච්ඡජාලගතෙරිව.

මාඛං භාසි මහාරාජ! මාඛං භාසි රථෙසභ!
අහං ඛං මොචයිස්සාමි සයොග්ගබල වාහනං.

මාඛං භාසි මහාරාජ! මාඛං භාසි රථෙසභ!
අහං ඛං මොචයිස්සාමි කාකසෙනංව ලෙඩ්ඩුනං.

අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රය වතිහිවූ සියලු පදාර්ථයන් සවයම්භූඥානයෙන් පරොපදෙශ රහිතව තමන්ම දත් හෙයින් ඉතා ත්‍රිවණැති වූ මහෞෂධ පණ්ඩිතයෝ වෙදෙහයන් මරණ භයින් පීඩිතව විලප්නවුන් මෙසේ කියා සන්හිදුවම්න් "මහරජ! නොබව මැනව, මේ එක්සියයක් රජුන් හා අටලොස් අක්ෂොභිණී සඞ්ඛ්‍යාත සෙනාව වටලාගෙන සිටියදී රාහු මුඛයට වන් සඳමඬල ගලවාගන්නාසේ ගලවා ගනිමි; සූර්‍යමණ්ඩලය ගලවාගන්නා සේ ගලවා ගනිමි; තවද මහ මඩෙහි එරී ගිය ඇතක්හු ගොඩ ගන්නාසේ ගලවා ගනිමි; තවද මේ සෙනාවෙන් කිසිකෙනකුත් නොදන්නා පරිද්දෙන් පෙළාවක හසුවූ නයකු ගලවා ගන්නාසේ බ්‍රහ්මදත්ත රජ නමැති අභිතුණ්ඩිකයාගේ සෙනා නමැති පෙළායෙහි හසුවූ වෙදෙහ නමැති නාගරාජයා ගලවා ගෙන ගොස් මියුලු නුවර ලා ලන්නෙමි; තවද මැඳිරියේ හසුවූ පක්ෂීන් ගලවා හරණාසේ සුවසේ ගලවා ගනිමි; තවද දැල බැඳි මසුන් ගලවා ගන්නාසේ, ගලවා ගනිමි. තවද මහරජ නොබව මැනව, නුඹවහන්සේ මතු තනිව ගලවා ගනිම්යි නොසිතුව මැනව; නුඹවහන්සේ හා කැටිව ආවාවූ ඇත් අස් රථ පදාත්‍යාදීවූ සෙනාවෙන් එකක් හටත් මේ සතුරාගෙන් කිසි උපද්‍රවයක් විය නොදී සුවසේ ගලවාගෙන ගොස් මියුලු නුවර ලාලම්; තවද මහරජ! නොබව මැනව, ඉදින් සිතිම් නම් එක්සියයක් රජදරුවන් හා අටලොස් අක්ෂොභිණියක් පමණ රාජසෙනාව අතීක් කෙනකුන්ගේ උපදෙශයක් හා යුධ ප්‍රයෝගයක් නැතිව මාගේ ප්‍රඥ බලයෙන්ම කැටක් දමා කපුටු සමූහයක් ඛෙරනාසේ පලවා පියන්නටත් බැරි නොවන්නේය; නුඹවහන්සේ නොබව මැනව (" යි අස්වැසූහයි වදළ සේක.)

ඒ එසේමැයි=සෙස්සවුන්ගේ නුවණින් ප්‍රයොජන කිම්ද? අමාත්‍යයෝ නමුත් නුවණැත්තෝ නමුත් මෙසේවූ දුකෙහිදී පිටිවහල්ව ඒ දුකින් මුදලන්නාවූ උත්තමයෝ නොවෙද්ද? තවද බොධිසත්ත්වයන්වහන්සේ වදාරන සේක් මහරජ! නුඹ වහන්සේට පළමු මම ආයෙම් කුමක් පිණිස ආහසි සිතූ සේක්ද? මතු නුඹවහන්සේට මෙවැනි භයෙක් වන්නේයයි කියා ප්‍රඥ නමැති දිවැසින් දුටුවාවූ මම නවතා ලීම්, ඒත් නොනවත්නා හෙයින් ඒ බව දැන නුඹ වහන්සේ නැසියාදී ඉදීම මට තරම් නොවෙයි සිතා මට උදහස් වූවත් ඒ මා සිත නොතබා නුඹ වහන්සේට පළමු අවුත් සරමස්ක් මුළුල්ලෙහි මෙහි හිඳ කුමක් කළහයි සිතූසේක්ද? මහරජ! නොබව මැනව; මේ හසින් මුදා සුවසේ ගලවාගෙන ගොස් මියුලු නුවර ලාලම්"යි වදළසේක. ඉවදෙහ රජ්ජුරුවෝද - බොධිසත්ත්වයන්වහන්සේ ශඞ්කාරහිතව අභීත කෙශර සිංහරාජයකුසේ කියූ

භයක් නැතිව කියන්නාවූ එස් අසා 'මෙච්ච මාගේ ජීවිතය ලැබිමි'යි අභියාසින් සතුටුව අස්වැසිලන්න බොධිසත්වයන්වහන්සේ මේසේ ධර්මනාද කළ කල්හි සෙනානයා ආදිවූ බොහෝදෙන සතුටුව හියහ. බොධිසත්වයන්වහන්සේ 'නොබිව හොත නැමින් සුවසේ ලෙවගනිමි'යි හියත්ම සෙනානයා ආගවයහි යව පැමිණියේස් 'සවාමීනි! මේසා සෙනාවක් අවුත් තුන් සතියකින් හා සතර වළල්ලකින් යුක්තව අහුරු සිදුරු නැතිව වටලාගෙන සිටියදී කවර උපාය කින් ගලවාගෙන යන දේක්කද'යි කිය. එම්බල සෙනානය! මේ සතුරන් ලුහු බඳුවා දියා වාසලින් පිටත්ව සතුරන් බලා බලා සිටියදී යන්නෙම් මි නමුත් මේ බැරි හොවෙයි එහකුදු මුවින් උන් නැමි නොදන්නා පරිදෙන් සරහන ලද උමිඟින් ගෙනයෙමි"යි වැළඳේහ.

මේසේද කියා 'සෙනානය! තෝ ගමනව සැරහිගනැයි වදුරා උමඟ දෙර හරහට හමින්වහන්සේනේ ගොධයන්ව මිඩාහ කරනසේක්;—

එථ්වානව උදෙථථ මුඛං සොඩෙථ සඞ්ගිනෝ
වෙ: දනෝ සහමිවෙච්ඡි උම්මඤ්ඤෙන ගච්ඡසති-නි-

යනුවෙන්:— කුඩාවිරුනි! වනා නැඟී ගොසින් උමඟ දෙර හරිව්, වෙදෙහ රජ්ජුරුවන් වහන්සේ අමාත්‍ය සමූහයා සිහින් පිරිවරන ලදුව උම ඟින් වඩනා සේකැ"යි වදුළසේක. ඔහු ගොසින් උමඟ දෙර හැරපිහ. සියලු උමඟ සරහනලද සුධම්මා නම් දිව්‍ය සභාවසේ අති මනොහරවිය. (බොධි සත්වයන් වහන්සේගේ විධානයෙන් ගොධයන් උමඟ දෙර හළ නියාව ප්‍රකාශ කොට වදුරන් බුදුරජාණන්වහන්සේ:—

තස්සතං වචනංසුත්වා පණ්ඩිතස්සානු කාරිනෝ
උම්මඤ්ඤ වාරං විවරිංසු සන්තා යුත්තෙතව අඟහලෙ-නි-

මේ ගාථාවෙන්:-එම්බා මහණෙනි! මිහෙණඩ පණ්ඩිතයන්ගේ සුශික්ෂිත කිඳරු ගොධයෝ ඒ පණ්ඩිතයන්ගේ නීතිඥවූ ප්‍රඥාවෙන් කරනලද උමඟ යන්ත්‍රයෙන් යුක්තවූ දෙර අතුළු හැර ඒ බව බොධිසත්වයන්ට කිහ"යි වදුළ සේක. ඒ අවසර බොධිසත්වයන්වහන්සේ'වැඩියමනා කලැ'යි වෙදෙහරජ්ජුරු වන්ට දන්වූ කල්හි රජ්ජුරුවෝ මාලිගාවෙන් බටහ. එවිට සෙනානයා එදවස් අවිරුදෙවින්දු නිසා තමා ලත් ඉස් පය්‍ය ඉසින් ගලවා කෝනමක් තරවා හැඳ කඩ නකුළු තමා සිහ වන් හය සේ පොව්වනියත් එල්ලාගෙන ඇත් මැත් බලබලා ඉඛ්කාරුව සලෙසිකඩ ඉරා දණ වැලම්පි නළල් ආදිවූ සථාන යෙහි නොවැනේදයි නොසිතම්. මොහු මේ කරන්නාවූ විකාර මුළුල්ල බොධි සත්වයන් වහන්සේ දැක 'නුවණ නැත්තව! හොලෙ කුමක් හෙරේ'යි දැසි වදුළ සේක. පණ්ඩිතයන්වහන්ස! උමඟින් ඔහ කල නම් කෝනමක් හැඳගෙන හන්පලන් වස්ත්‍රාභරණාදි සියලු අලඞ්කාර හැර තබා දණ නමාගෙන වේද යන්නේ, එසේ හෙයින් මමත් උමඟින් යන්නට සැරහෙමි"යි කිය. ඕහට වදු රනසේක් "එම්බල සෙනානය! තෝ වැළින් උමඟට වදනාකල් දණ ගිම් ඔබා නැඟුරුව ගෙන ගොයකුසේ බඩගායෙමි'යි නොසිහ, තෝ ඉදින් ඇතකු පිටින්වත් අසකු පිටින්වත් රථයකින්වත් යන්නා කැමැත්තෙහි වීනම් ඉන් කැමැති වාහනයකට නැඟී යව, මා විසින් කරනලද උමඟ උසින් අටළොස්

රියෙනෙක, ඉතා උස්වූ පළල්වූ වාසල් හා දොරටු ඇත්තේය, එබැවින් නෝ උමඟින් යන්නට හෝනමක් නොහැඳ දණ තබ නොබැඳ හා සැරසෙන යම් අලඬකාරයකින් සැරසී කැමැති වාහනයකට නැඟී රජ්ජුරුවන්ට පළමු කිත් මෙව"සි වදාළසේක.

බොධිසත්ත්වයන්වහන්සේ ඒ ඉතා භයපත්වූ සෙනකයා පළමුවී යන්නටත් රජ්ජුරුවන් මඬ්යෙහි යන්නටත් නිලනොවලා තමන්වහන්සේ පසුව ගමන්ගත්සේක. කුමක් නිසාදයත්? සෙනකයා සතුරන් දැක තරව බා හියේය, කිසිවෙකුත් ආලය නොකොට පසු නොබලා දිවන්නේය, රජ්ජුරුවෝ තමන් සිහිනෙනුත් නුදුවුවිරූ පිසිතුරු කොට සරහනලද උමඟ විසාර බලා වහා නොයන්නාහ, එබැවින් තමන්වහන්සේ 'මහරජ! වහා වැඩිය මැනව වහා වැඩිය මැනව"සි තමන්සන් කොට කොට යන පිණිස රජහට පසුවූසේක"සි දහයුතු. ඒ උමඟ ඇතුළේ මහ ජනයාට බොහෝ කැළඹුත් මෙළු කනබොනදූ මෙහෙකැයි පමණ නැතිවිය, එහි වන් මනුෂ්යයෝ කන්නාහු බොන්නාහු උමඟ විසාර බලමින් මහත්වූ සන්තොෂයෙන් යන්නාහ. බොධිසත්ත්වයන්වහන්සේ 'මහරජ! වහාවැඩිය මැනව වහා වැඩිය මැනවැ'සි කිම්සන් කෙරෙමින් රජහුගේ පස්සෙන් වඩිනාසේක. රජ්ජුරුවෝ සුදම් දෙවි සහා වයේ ඉතා සිත්කලුවූ උමඟ බලමින් යන්නාහ. (උමඟින් යන පරිදි වදාරන බුදුරජාණන්වහන්සේ):—

පුරතෝ සෙනකෝ යාති, පච්ඡතෝ ච මහොසධෝ,
මජ්ඣේ ච රාජා වෙදෙහෝ, අමච්චපරිවාරිතෝ=නි–

මේ ගාථාවෙන්:—එම්බා මහණෙනි! එදවස් උමඟින් යන ගමනේ සෙනකයා පළමුවයෙයි; මහෞෂධපණ්ඩිතයෝ පස්සෙහි යන්නාහ, දෙදෙනා මඬ්යෙහි වෙදෙහ රජ අමාත්ය මණ්ඩලයා පිරිවරා නික්මිණැ"සි වදාළසේක.

රජ්ජුරුවන් හා පණ්ඩිතයන්වහන්සේ ආ බව දැන රුකාවල සිටි යොධයෝ ඛ්රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මැනියන් ආදිවූ රජදරුවන් සතරදෙනා උමඟින් පිටත්කොට මහ විසල් මලුවේ සිටුවාලූහ. රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් හා සමඟ උමඟින් පිටත්වූහ. ඔහු සතරදෙන බොධිසත්ත්වයන්දුන් රජ්ජුරුවනුත් දැක "එකාන්තයෙන් සතුරන් අත්පත්වූවිමහ, අපගෙනාවන් පණ්ඩිතයන්ගේ යොධයන් සැටිය"සි මරණ භයින් තැතිගෙන මහ හඬින් හැඬූහ. ඔහු සතරදෙනා ඇඹුවේලෙහි ඛ්රහ්මදත්ත රජ්ජුරුවෝත් 'වෙදෙහ රජ පලා යෙයි යන ක්රොධයෙන් ඒ නුවරවට තුන්ගව්වක් මානයේ රුකවල් බලා අවුත් ගංතෙරට නුදුරු තැනෙක්හි සිවියාහු නිශ්ශබ්දව හුඬු මඬ්යම රාත්රියෙහි ඒ හැඬූ ශබ්දය අසා නන්දාදෙවීන්ගේ සාටහඬ වැන්නැ'සි කිම් නම් "කොසිත් නැතුදෙවිය!ඉඟ යම්ම තැනෙක නැතුදෙවිසදහන්නෙ කොට හිදින දවසෙක්නැතැ"සි අනුන් කියන බසට ලජ්ජාවෙන් කවුරුන්වත් නොකිහ. බොධිසත්ත්වයන්වහන්සේ මහවිසල් මලුවේදීම රුවන් රැසක් පිට සිටුව. පසඳා ල විණ්ඩි කුමාරිකාවන් අතිශෙකයට පවුණුවා රත් කෙණ්ඩියෙන් සුවඳ පැන් එත්කොට් "මහරජ! නුඹවහන්සේ මේ කුමාරිකාව ගෙන යන්නට අවුදින් මේසා භයකට පැමිණියේක. එබැවින් නුඹවහන්සේට අගමෙහෙසුන් වන්නී යයි වදාළසේක.

එවේලෙහි තුන්සියයක් නැව් ගෙනවුත් ගොට හබාලූහ, රජපුරුවෝ මහ විසල් මලුවෙන් ගොස් සරහතලද නැවෙනට නැංගාහ, බ්‍රහ්මදත්ත රජපුරුවන්ගේ මෑනියන් ඇතුළුවූ රජදරුවෝ සතරදෙනාත් එම නැවට නැංගාහ, (ඒ බව ප්‍රකාශ කොට වදාරන බුදුරජාණන්වහන්සේ)

උම්මිඝාහි නිකඛිත්තාන, වෙදෙහො නාව මාරුහි,
අභිරුළ්හාංව තං ඤත්වා, අනුසාසි මහොසධො.

අයං තෙ සසුරො දෙව, අයං සස්සු ජනාධිප
යථා මාතු පටිපත්ති, එවං හෙ හොතු සස්සුයා.

යථාපිතිසකොහාතා, සොදරියෙ එකමාතුකො,
එවං පඤ්චාල චණ්ඩාතෙ, දයිතබ්බා රථෙසභ

අයං පඤ්චාල චණ්ඩිතෙ, රාජපුත්තී අභිජ්ඣිතා,
කාමිංකරොහිහොතායං, භරියාතෙ රථෙසභා-ති-

මේ ගාථාවන්ගෙන් වදාරනසේක්:- එම්බා මහණෙනි! එදවස් වෙදෙහ රජ උම්ඔඟින් පිටත්ව නැවට නැංගේය. ඔහුට මහෞෂධ පණ්ඩිතයෝ 'මහරජ! මේ පඤ්චාලචණ්ඩකුමාරයෝ නම් සුහුරුබඩුණුවෝය, මේ නන්දා දෙවී නම් නුඹවහන්සේගේ නැන්දණියෝය, නැන්දණියන් කෙරෙහි වැදූ මෑනිකෙනකුන්ට කරන ආදරයක් පරිද්දෙන් පිළිපැද්ද මැනව, නැවත පඤ්චාලචණ්ඩ කුමාරයෝ සුහුරු බඩුණුවෝ යයි ආලිස්සන් නොකොට එක කුසින් උපන් මල් බෑ කෙනකුන්ට පරිද්දෙන් දයා කටයුතුය. මේ පඤ්චාලචණ්ඩ කුමාරිකාවෝ නම් උභය කුල පරිශුද්ධ ක්ෂත්‍රිය කන්‍යාවෝය; උන් නුඹවහන්සේ කැමැති පරිද්දෙන් රාජෛශ්වර්‍යයෙහි පිහිටුවා රක්ෂාකළ මැනවැ'යි කියා අවවාද කළහ"යි වදාළසේක.

මෙසේ අනුශාසනා කෙළේ කුමක් පිණිසදයත්? "සරණ දෙම්හයි ම, යළින් අප ගෙන්වාගෙන මේ සා භයකට පමුණුවා ගැහැට කළ රජුගේ මව මරව, අඹුදරුවන් මරවයි මැරුයේ විනම් ව්‍යාපාරැ"යි සිතාත් "දුවණියන්ටවඩා නපු දෙවින් අධික රු ඇති හෙයින් අඹුවූ මුළාවූ රජපුරුවෝ දුවණියන්තබා මෑනියන් කෙරේ ලොභ උපදවා නැකම් වරදවාපිහු නම් නපුරැ"යි සිතා පළමුකොට රජපුරුවන් අතින් ප්‍රතිඥ ඇරගත්හයි දතයුතු. රජපුරුවෝත් "පුත! නොප කී ලෙසින් කිසිවකුත් නොවරදවා කෙරෙම්"යි ඔබගේ අවවාද සිතින්ම පිළිගත්හ. එසේ අවවාද කරන සේක් රාජ මාතාවන් තලතා දෙවින්ගේ නමකුත් නොවදාළසේක. කුමක් පිණිසද යත්? උන් මැහැලි හෙයින්ම කිසිවකුත් නොවදාළසේක. මේ සියලු කථාව මහාබොධිසත්ත්වයන් වහන්සේ ගංතෙරදී ගොඩ සිටම වදාළසේක. ඉක්බිති රජපුරුවෝ නැවින් වහා යනු කැමැතිව 'පුත! තෙපි ගොඩ සිටම දෙඛව්ය, වහා නැවට නැහෙව, කුමක් පිණිස ගොඩ සිටුද? සතුරන් අතින් දුකසේ මිදුනම්හ, එබැවින් වහා නැගී යම්හ"යි

ආරුයහ නාවං තරමානො, කිනාහුනීරමහි තිඨසි,
කිවජා මුත්තමහ දුක්ඛාතො, යාම'දූනි මහොසධා-ති-

මේ ගාථාවෙන් කීහ:=

ඒ අසා දෙවයන්වහන්ස! 'නුඹවහන්සේ හා එක්ව නැගී යාම යුක්ත නොවේ'යි කියා ගාථා දෙකකින් වදාරනසේක්:—

නෙස ධම්මෝ මහාරාජ, සෝ'හං සේනාය නායකෝ,
සෙනඞ්ගං පරිහාපෙත්වා, අත්තානං පරිමෝචයෙ.

නිවෙසනම්හි තෙ දෙව සෙනඞ්ගං පරිහාපිතං,
දිත්තං ව බ්‍රහ්මදත්තෙන, ආනයිස්සං රථේ සහා-ති-

"මහරජ! සෙනාවට නායක කෙනෙක් සෙනාව සංහරන්ට අත්පත්වූ කල තමා දන්නා යම් උපායකින් ඒ සෙනාව ගලවාගෙන යාමක්වත් නොහොත් එක්ව නැසී යාමක්වත් නොකෙළේ වීනම් උන්ගේ සෙනානායක කමින් ප්‍රයොජන නැත්තේය, ඒ නමා ධර්මිෂ්ඨකමකුත් නොවන්නේය, දැන් මමත් සෙනානායකව අවුත් සෙනාව සතුරන් හසා ප්‍රාප්තව ඇතුළු නුවර සිටියදී (යෙමිද) අප වැන්නෝත් තනිව දිවි රැකගැන්මක් කෙරෙද්ද? "මහරජ! නුඹවහන්සේ හා කැටිව සාරසියයක් ගවි ගෙවා ආ සෙනාවගෙන් සමහර කෙනෙක් මාගීයෙහි ශ්‍රමයෙන් ශ්‍රාන්තව නිදන්නාහ, සමහර කෙනෙක් අන්නපානාදියෙන් සන්තුෂ්ටව මේ ගමන් තමා නොදන්නාහ, තවද මා හා කැටිව ආවුන්ගෙන් සාරමසක් මුළුල්ලෙහි උමඟ හා අගල පවුරු ආදි සියලු කම්නතකොට රැපාන අනවරතයෙන් දුක් ගෙන විඩාවූවාහු මේ එන තියාව දැසින් නොදන්නාහ. එබැවින් උන් හැම මට උපකාරව සිටියන්ගෙන් එක කුත් ඇරපියා ඊම මට තරම් නොවෙයි, ඒ සියලු සෙනාවම බ්‍රහ්මදත්ත රජු ගෙන් ජයගෙන උන් දුන් සෙනාවක් පරිද්දෙන් නැවත හැරගෙන එමි. මහරජ! නුඹවහන්සේ අනන්තරාය මාගීයෙහි ඇසිල්ලකුත් නොරඳා, වහා වැඩිය මැනව, පළමු මා විසින් නුඹවහන්සේට යොත්තකට ගමක් බැඟින් ගම් කරවා ඉඩම් ලවා අතරමඟ ගම් සියයෙහිම වස්ත්‍රාභරණ අන්නපානයෙන් සමෘඩ කරවා ඇත් අස් ආදි වාහන සරහා පිහිටුවන ලද, ගම්න් ගමට පැමිණි කල කැටිව යන වාහනයෙන් දුර්ලභයන් එහි රඳවා එහි තුබූ වාහනයකට නැගී වහා මියුලු නුවරටම වැඩිය මැනවැ"යි වදාළසේක. ඒ අසා රජ්ජුරුවෝ

අපපසෙනෝ මහාසෙනං, කථං වීගහයහ ඨස්සසි,
දුබ්බලෝ බලවන්තෙන, විහඤ්ඤිස්සති පණ්ඩිතා=ති-

මේ ගාථාවෙන් කීහ:-

මෙහි අභිප්‍රාය නම් පුත "මහෞෂධ පණ්ඩිතයෙනි! තෝපගේ සෙනාව මඳවුව, බ්‍රහ්මදත්තයන්ගේ මහා සෙනාවය, කෙසේ ජයගනුද? බලවන්තයෝ දුර්ලභයන් නසාපියා මහා විනාශයට පමුණුවාපියති"යි කීහ. ඒ අසා බොධිසත්වයන් මහන්සේ වදාරනසේක්:—

අපපසෙනොපි වෙ මන්ත්‍රී, මහාසෙනං අමන්තිනං,
ජිනාති රාජ රාජානං, ආදිවෙවා වො දසං තමං ති-

මේ ගාථාවෙන් මහරජ! ඇසුව මැනව; මහා සෙනාව ඇතිවත් අමන්ත්‍රී තැනැත්තවු අල්ප සෙනාව ඇති මහා මන්ත්‍රියා ජයගන්නේය, එබැවින් අමන්ත්‍රීවූ බ්‍රහ්මදත්ත රජුගේ එක්සියයක් රජුන්හා අටලොස් අක්ෂෞහිණී සඞ්ඛ්‍යාත මහා සෙනාව මහා මන්ත්‍රීවූ මම මාගේ ප්‍රඥා බලයෙන් ජයගතිමි.

නවද අවන්ත්‍රී සොව්වීරයා ඇති මහා සෙනාව සහිතවූ බ්‍රහ්මදත්ත රජහු මහා මන්ත්‍රීවූ මා වැනි එක් ඇමැතියෙක් ඇති මද සෙනාව සහිතවූ නුඹවහන්සේ ජය ගන්නා සේක. ඒ කුමක් වැනිද යත්? සමීපත්ත ලොකයෙහි එහා පැනිර පවත්නාවූ මහා අන්ධකාරය ඉරුඑතුබළ බැබළී එහා පැනැර දුරුව ආලෝක වන්නේය. එබැවින් සෙනාව දෙවුවන් ජය ගන්නෙම් නම් මේ මේ විය, නුඹ වහන්සේ සතු නොව වැඩිය මැනවැ"යි මඳුරා රජපුරුමන් වැද රැඳුණුසේක;

ඉක්බිති රජපුරුවෝ 'සහුරන් අතින් මිදුනම්හ, සොයා ආ කිසවුනුත් ලදුම්හ, අපගේ මිනිදෙළුන් ඉදුන් පැමිණියේය'යි බෝධිසත්වයන්ගේ ගුණ සිහිනොට උපන්නාවූ පස්වණක් ප්‍රීතින් පිණවිණා ඔබගේ ගුණ සෙනඟයාට කීයන්නාහු:—

සුසුඛං වත සංවාසෝ, පණ්ඩිතෙනිති සේනඟ
පඨවිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡේ ජාලගතෙරිව
අමිත්තා හත්ථේ ගතෙ, මෝචයි නෝ මහොසධෝ.–ති–

මේ ගාථාවෙන් සෙනඟය! නුවණැත්තන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය, මෙලොවිනුත් පරලොවිනුත් සැපවන්නේය, මැදිරියෙහි බැඳි ලිහිණියන් සෙසින්ද දැල බැඳි මසුන්පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප හැමදෙනම මහෞෂධ පණ්ඩිතයෝ ගලවා හැරපිය, එබැවින් නුවණැත්තවුන් හා එක්ව විසීම උතුමැ"යි මුඛතොසැහෙන පරිද්දෙන් කීහ. ඒ අසා සෙනඟයාත් තමා ඇතිතෙක් පවන් මහතාණන්ගේ ගුණයක් කියන්නේ:—

එවමෙතං මහාරාජ, පණ්ඩිතාහි සුඛාවහා,
පඨවිව පඤ්ජරෙ බද්ධෙ, මච්ඡේ ජාලගතෙරිව,
අමිත්තා හත්ථේ ගතෙ, මෝචයි නෝ මහොසධෝ–ති–

මේ ගාථාවෙන්:—"මහරජ ඒ සැබෑ, ඉතා සැබෑමය. නුවණැත්තවුන් හා එක තැන විසීම ඉතා සැපවන්නේය, මැදිරියෙහි හසුවූ ලිහිණියන් සෙසින්ද දැලක බැඳි මසුන් පරිද්දෙන්ද සතුරන්ට අත්පත්වූ අප හැම මහෞෂධ පණ්ඩිතයෝ සුවසේ ගලවා ඇරපුහ"යි කීහ.

ඉක්බිති වෙදෙහ රජපුරුවෝ ගතින් එහර බැස බෝධිසත්වයන් වහන්සේ විසින් යොදනෙන් යොදන කරවනලද ගම්වලට පැමිණ ඔබ විසින්ම පළමු විධාන අසාගත් අමාත්‍යයන් සපයා එවනලද හස්ත්‍යශ්වාදි වාහන හා අන්නපානාදියෙන් හා නොයෙක් වගීසේ කැවුම් හා කන බොන දෙසින් සනතුෂ්ටව ගමන් විඩාවූ වාහන එහි රඳවා නව වාහනයන්ට නැඟී යන්නාහු ගමින් ගමට පැමිණ මහතාණන්ගේ විධාන පරිද්දෙන් මාගී විඩා සන්හිඳුවා නොපමාව යන්නාහු සාරසියයක් ගව් ගෙවා දෙවන දවස් පෙරවරු බතට මියුලු නුවරට පැත්ත.

බෝධිසත්වයන් වහන්සේ රජහු යවා උමඟ දෙරට වැඩ නමන්වහන්සේ උරෙහි එල්වා ගිය මහුල් කඹුව කොපුවෙන් මැත්කොට උමඟ දෙර මුහු, විසල් මලුවේ වැලි පීරා යට සහවා තබා උමඟින් ගොස් උපකාරී නුවරට වැද සොළොස් කළයක් සුවඳපැනින් ඉස්සෝදා නානා නොයෙක් රසයෙන් අනඹුවූ

හොජනය අනුභව කොට යහන මත සැතපුණු සේක් මෑ ගේ මනදෙළ මුදුන් පැමිණියේය'යි සිතා පස්වනක් ව්‍රතීන් පිණ පිණා සුවසේ සැතපුණුසේක.

ඒ රාත්‍රිය පහන්වූ ඇසිල්ලෙහි චූලනී රජ්ජුරුවෝ සෙනාව සවිනට මෙහෙයන්නාහු නුවරට සමීපවූහ. (ඒ රජහු සෙනාවට විධාන කොරමින් සැරසී ආ නියාව ප්‍රකාශකොට වදාරන බුදුරජාණන්වහන්සේ:)—

රාඛිත්වා කසිනා රත්තිං. චූලනීයෝ මිහබ්බලෝ,
උදග්ගෝ අරුණුග්ගමයි, උපකාරිං උපාගමි.

ආරුයහ පවරං නාගං, බලවන්තං සට්ඨිහායනං,
රාජා ආවොව පඤ්චාලෝ. චූලනියෝ මහබ්බලෝ.

සන්නද්ධෝ මණිවම්මෙන, සරමාදාය පාණිනා,
පෙසසියෙ අජ්ඣභාසිත්ථ, පුත්‍ථුගෙහෙ සමාගතෙ-ති-

මේ ගාථාවෙන්:— එම්බා මහණෙනි! බලවාහන සහිතවූ බ්‍රහ්මදත්ත රජ තුන්යම් රාත්‍රියෙහි තුන් සන්ධියක් හා සතර වළල්ලකින් අතුරු සිදුරු නොපෑ ඒ ඒ ස්ථානයෙහි බලඇණි සිටුවා තුබූ රැකවල් ලවා ඇවිද අරුණු නැගී පහන්වන්නාහාම ඒ උපකාරී නුවරට ආයේය. තවද පඤ්චප්‍රකාර බල යෙන් යුක්තවූ බ්‍රහ්මදත්තරජ සැට හවුරුද්දෙන් මද නැගී විහිදුනාවූ කන්පට තුන් තැනකින් පැලී තිබෙන්නාවූ සවන්හි ජය බිම් හඳුනන්නාවූ කිය කිය තැන සතුරන් බිඳ ජයගන්නට සමර්ථවූ මහ බල ඇති සළු ලක්ෂණ සම්පන්න සියලු හස්ත්‍යාලඞ්කාරයෙන් සරහනලද උතුම් මඟුලැතක්හු පිටට පැන නැගී මැණික් ඔබා කරතලද රන් සන්නාහ සන්නඬව හියක් නියපිට ලා ධනුශ්ශිල්ප යෙහි දක්ෂවූ සන්නාහ සන්නඬ අනෙක ප්‍රකාර යොධයන්ට මෙසේ විධාන කෙරෙමින් නුවරට සමීපවීය'යි වදාළසේක.

ඒ රජහු සෙනාව මෙහෙයූ පරිදි කෙසේදයත්?

හත්ථාරොහෙ අණීකඤ්ඤෙ, රථිකෙ පත්තිකාරිකෙ,
උපාසනමහි කතහත්ථෙ වාලවෙධෙ සමාගතෙ-ති-

මෙවිට චූලනී රජ්ජුරුවෝ වෙදෙහරජ ජීවග්‍රාහයෙන් අල්වාගන්නට ආඥාකරන්නාහු "ඇතුන් නැහෙන්නාවූද අශ්වයන් නැහෙන්නාවූද රථ නැහෙන් නාවූද පඤ්චායුධ සන්නඬව ආවාවූ මහා සෙනාවදැ; ඉතුත් ධනුශ්ශිල්පයෙහි දක්ෂවූ කෘත හස්තවූ එක්වන් කරනලද අභ්‍යාස ඇති එසේ හෙයින්ම, සත් හස් ලොම කරබටුවක් බැඳ දඹු බස්නා මානයේ දෙදණඬක් හිඳුවා එහි සරස බැඳි වියල දණ්ඩේ බැඳ කරබටුව එල්වූ කළුහස් ලොම විදුලිය ආදිවූ යම් කිසි ආලෝකයකින් පලා විදපියන්නට සමර්ථවූ යොධයෝ වහා සන්නඬව එත්වයි" කියාද, තවද චූලනී රජ්ජුරුවෝ 'වෙදෙහ රජ නොමරා අල්ලා ගන්මි'යි කියමින් සැට අවුරුද්දෙන් මදහෙන්නාවූ මට සිලුටුවූ දළ ඇති කුඤ්ජරයයි කියනලද බලසම්පන්න යොධ ඇත්සමූහයන් සියදහස් ගණන් මෙහෙයා'මෙම වෙදෙහ රජු නිසා මහෞෂධ පණ්ඩිතයා විසින් කරනලද මේ උපකාරී නුවර අවලොස් රියන් පවුරු මිරිකාපියව'යි කියාද- 'පවද බාල වස්සන්ගේ දත්සේ ඉතා සුදුවූ තියුණු මුවහත් ඇති විදිනාඝල ඇට

පලා විදපිඟත් මුත් මැනසා නොරදවන්නාවූ ධනුශ්ශිල්පයෙහි දක්ෂ යොධයෝ මහා වශීවක් පරිදෙන් ශරවර්ෂා වස්වත්වයි;තවද සෞරවීය්‍ය ඇති අනෙකප්‍රකාර විචිත්‍රවූ පඤ්චායුධ සන්නාඩව සංග්‍රාමයෙහි එහි පසු නොලා ඉදිරියටම දිවන්නාවූ තමන් ඉදිරියෙහි ඇතුන් දුටත් දළ අල්වාගෙන වෙවුල්වා පියන්නටත් සමර්ථවූ තරුණ යොධයෝ වහා එත්වයි, තවද ආයුධම බලකොට ඇත්තාවූ නොයෙක් බලවත් ආයුධ ගත්තාවූ සන්නාහ සන්නාඩවූ සටනෙහි පිටිපා නොයන්නාවූ මාගේ යොධයන් අතින් වෙදෙහ රජ කෙසේ නම් මිදී පලායන්නේද? ඉදින් යම් කිසි භාග්‍යයෙකින් පක්ෂියෙකු පරිදෙන් ආකාශයෙන් යේ නමුත් මාගේ දුනුවා යොධයෝ යා නොදෙන්නාහ:– තවද මාගේ තිස්දහසක් පමණ බලසම්පන්නවූ අසමාන යොධයෝ සංග්‍රාමයට සිස් අතින් ගියාහු වී නමුත් සතුරන් අත ආයුධම උදුරාගෙන සතුරන් සාධාගන්නාහ; උන් සමාන එනකුත් දඔදිව එක් රජක්හු සමීපයෙහිත් මා දැකින්නේ නැත; එබඳුවූ යොධයන් ඇත්තෙම් මමය; උසිත් සන්නාහ සන්නාඩව වහා එත්වයි. තවද රන් සන්නාහයෙන් සරහනලද බලසම්පන්න අසුන් පිට උන් නාවූ මනාවූ දැකුම් ඇති රාජකුමාරවරු වහා අසුන් මෙහෙයන්වයි, තවද රන්වන් පිළී ඇඳ සවණිලඬකාරයෙන් සැරහී රන්වන් අඬහරාග ගල්වා පඤ්චායුධ සන්නාඩව රන්සැත් රන්පොරොදු ආදි සවණිලඬකාරයෙන් සරහනලද ඇතුන් නැඟි නදුන් වන උයන්හි දෙවතා සමූහයක් මෙන් අසමානවූ යොධයෝ සියදහස් ගණන් වහා එත්වයි. තවද පෙරියන් බඳ පැහැ සමාන වණී ඇති සකස්කොට ධාරු නහනලද නුවණැති පුරුෂයන් විසින් සුවිනිතකොට තුන් සතගා නිමවන ලද ඉදින් සුළඟින් මුවහතට සම්ප්‍රාප්තවූ පුළුන් රළ වුවත් කැපී සිදී යන තරම්වූ තීක්ෂණවූ මුවහත් ඇති මඬ්‍යාහන යෙහි සූර්‍ය්‍යමණ්ඩලය මෙන් බබළන්නාවූ ශරපත්කොට කරතලද කඩු ගත්තාවූ (ඒ කෙසේවූ කඩු ජාතියෙක්ද යත්? ජාති වානේ කැට පිහිරින් ගා සුණුකොට ඒ සුණු දඩමස් හා එක්කොට අනා ඒ මස් කොස් ලිහිණීයන් කවා උන් ලූ වසුරු දවා වානේ ගෙන නැවත ගාගනා පළමු පරිදෙන් ඒ පක්ෂීන් කවා එම පරිදෙන් සත්වාරයෙක කවා දවාගත් වානයෙන් කළ කඩු ජාතියෙකැයි දතයුතු.) යොධයෝ සතුරන්ට නොවරදවා පහර දෙන්නාවූ කොපුවෙන් අදනාලද කඩු ගෙන වහා එත්වයි. තවද මාගේ අසමානවූ තිස්දහසක් පමණ පතාක යොධයෝ වහා එත්වයි. (ඔහු කෙසේවූ යොධයෙනෙක්ද යත්? යම්සේ මාරසෙනාවක් බඳුවූ සතුරු සෙනාවක් අගල පවුර අට්ටාල බලකොටු වාසල් සහිතවූ අයොධ්‍ය පුරය හා සමාන එක් නුවරෙක උන්නාවූ නමුත් ඉම් මාගේ පතාක යොධයෝ ඉන් පිටත සිටියාවූ එබඳු අවිෂය ස්ථානයෙහි සිටි සතුරන් සාධම්හ'සි සිතුනම් පිටත සිටි නැනම සිට ආකාශයට කරණම් පැන එසේ උඩපිනූ කරණම්න්ම නැවතත් බිම නොහි නැවත නැවත කරණම් පනන්නාහු ආකාශයෙන් ගොස් අහතුබූ ආයුධයෙන් ඇතුළුනුවර උන් සතුරන් නිරවශෙෂයෙන් සාධා නැවත එපරිද්දෙන්ම කරණම් පැන පැන ආකාශයෙන් අවුත් තමන් පළමු සිටිතැන සිටිනට පෝසත්හ. ඒ දයෝධයෙනි, ඉදින් ඇත් කඳ වී නමුත් තමන්ගේ කඩුවෙන් එක පහරින් මැදින් පොළඟසන්නට සමර්ථයහ;) එම්බල වෙදෙහ කොල්ල! පළමු තාගේ ගොවියා පුතුගේ මන්ත්‍රිකම්ත් හා ඔහුගේ ප්‍රඥාභාවයෙන් ගැලවිණ. දැන් වූ කලි තට මිදී යාමේක්නම් කොයිද? දැන් තාගේ රාජානුභාවයත් තාගේ පණ්ඩිතයාගේ මන්ත්‍රිකමත් මින් ගැලවී මියුලු නුවරට

යාමත් බලමි. දැන් තෝ කරප ඔළාගත් මිසකු පරිද්දෙන් අසුවූයෙහි වේදැ"යි කියා වෙදෙහ රජහට තතනමින් 'දැන් අල්වමි දැන් අල්වමි'යි කියා වජ්‍රාඛ්‍යුහයෙන් ඇතු මෙහෙයන්නාහු 'ගනුව, බිඳුව, විදුවයි' කියා කියා සෙනහ මෙහෙයමින් උපකාරී නුවර මැඩ වතුරක් ගලන්නාක් පරිද්දෙන් අවුත් වන්හ.

ඉක්බිති බොධිසත්වයන් වහන්සේගේ වරපුරුෂයෝ තමන් තමන්ගේ ආණ්ඩු පිරිස හා සමඟ "කවුරු දනිද්ද? කිමිද? ඉදින් පවුරු බිඳ නුවර මිරිකා ගෙන වදින් නම් ඒ සියයක් රජුන් හා බ්‍රහ්මදත්තයන්ගේ ඉස් ගසාලා අපගේ පණ්ඩිත සවාමීන්ගේ පාපිට දමාලම්හ"යි තමන් තමන් සිටින්නාවූ රජදරුවන් පිරිවරා ගත්හ. එවේලෙහි තුන්ලෝ තිලකවූ ත්‍රිලොකෙක ධුරාවූ පූර්ණ ශතා මර්දනවූ ප්‍රතාප හා ගම්භීර ප්‍රඥ විශෙෂ ඇති සකල චක්‍රවාළ ඝන්‍ධා ගජ මර්දනයට හාසවර කෙශර සිංහරාජ වික්‍රම ඇති මාගේ සවාමිදරුවූ ශ්‍රී මහා බොධිසත්වයන් වහන්සේ රැ සැතපුණු ශ්‍රී ශයනියන් නැගී සිට ශරීර කෘත්‍යය සපයා පෙරවරු බත කල් යනා අනුභවකොට, රන්පට රුවන් සෝළ කණිණ කුණ්ඩලාභරණ තාඩිඩික නාගවඩම් කාදු කාප්පු මුතුපට පටෝඩම් බාහු දණ්ඩි මිණිවළලු ගිගිරි වළලු මණි කයිවඩම් පස්රු රුවන්වැල රන්සවඩි පාද සඛලා පාදාභරණ පාසලඔ පාද කිංකිණික පාදජාලා මේ ආදිවූ ආභරණ යෙන් සැරහී ලක්ෂයක් වටනා කසී සළුවක් ඇඳ ලක්ෂයක් වටනා රත් පලසක් එකාංශකොට පොරවා ඝනරන්මය රුවන් කම්මතයෙන් විසිතුරුවූ සෝලු ලියක් අතින්ගෙන රන් මිරිවැඩිසඟලක් පයලා දෙවඟනන් පරදවන රූ ඇති සම්‍යොහරණයෙන් සැරහුණාවූ තරුණ සත්‍රීන් දෙදෙනකු ලවා සුදු චාමර දෙකක් සල්වන සේක් සිත්කලුකොට සරහනලද තමන්වහන්සේගේ මාලිගාවේ සීමාදුරු කවුළුව හරවා චූලනී රජුරුවන්ට තමන් වහන්සේ පෙනෙන පරිද්දෙන් ශක්‍ර දෙවෙඳු ලීලාවෙන් ඇත් මැත් බල බලා සක්මන්කළසේක. චූලනී රජ්ජුරුවෝ ඒ මහතාණන් වහන්සේගේ රූපශ්‍රී බලා සිත පහදවා ගත නොහී 'දැන්ම මොහු අල්වාගනිමි'යි සිතා වහ වහා ඇතු මෙහෙයන්නාහ.

ඒ දැක පණ්ඩිතයන් වහන්සේ සිතනසේක් "මේ රජ එකාකූතයෙන් වෙදෙහයා මාවිසින් අසුකරන ලදැ"යි සිතා වහ වහා ඇතු මෙහෙයමින් එන්නේමය, තමන්ගේ අඹුදරුවන් ඇරගෙන අපගේ රජ්ජුරුවන් මිසුලු නුවර ගිය නියාව "නොදන්නේය"යි සිතා "සකස්කොට ඔප් නැඹු රන් කැඩ පතෙක පැහැ සමානවූ මාගේ මුහුණ මේ රජුට දක්වාලා රැකි හා සමඟ කථා කරමියි සිතා සීමාදුරු කවුළුවෙන් රජහු මුහුණ බලා මධුර සවරයෙන් රජහු හා කථාකරන සේක් මෙසේ වදාරන සේක.

කිනනු සන්තර මානොව, නාගං පෙසෙසි කුඤ්ජරං,
පහඨරූපො ආපතසි, ලඛතෙථාසමිති මඤ්ඤසි.

ඔහරෙතං ධනුං චාපං, බ්‍රූපපං පටිසංහර,
ඔහරෙතා සුභං චම්මං, වෙළුරියමණී සුසඤ්ඨිතා-ති-

"ඇයි මහරජ! ඉක්මන් ඉක්මන්ව ඇතු මෙහෙයන සේක් තමාගේ අභිමතාර්ථය සිඩවියයි සිතනසේක්ද? කියි විටෙකත් එසේ නොසිතුව මැනව; මහරජ! නුඹවහන්සේ සිත ඇත්ත තබාපියා මෙවිට මා කියක් කළ මැනව,

රජ්ජේ දවස් පස්වරු දුනුම්ට තරවා අල්වාගත් අහ තව දක්වා මිට මිරිකා ගැන්මෙන් සිරිහි හියයි යිහාම්, එසේ හෙයින් අහ තුබූ තෙලේ මැඩගතු දුන්නෙන් කායඝ්‍රිය කිම්ද? දමා හෝ පුව මැනව, එසේ නැත අනිකකු අතට හෝ දෙවාපුව මැනව; තවද වෛද්‍යයෝ මාණිභාෂ්‍යමය නොව කරනලද ඉතා ශොභමානවූ තෙල සභාභාගයත් රජ්ජේ පස්වරුම ලාගත් හෙයින් ශරීරය හිදී නුඹවහන්සේට බොහෝ පීඩායයි සිතම්, නොහොත් ශරීරය පබුවන් පැහැදියයි සිතම්, තවද රජ්ජේම පස්වරු පටන් තුන්යම් රාත්‍රියෙහි නිදිමරා විඩාව හියසේක. තවද ඉර අවකා කලානත නොවී නිදා නැගී නුඹවහන් සේගේ නුවරට හොස් මාලිගාවේ සුවසේ සැතපී වදාළ මැනව"යි රජු හා කෙළතාසේ වෙහෙසුහ.

රජ්ජුරුවෝ ඔබගේ බස් අසා "ගොවියා පිත් මා හා කෙළනේය,'යි බොධිසත්වයන් වහන්සේට තර්ජනය කොට 'තට කළමනා දෑ දැන් දන්නෙම් වේදැ'යි සැතෙන්නාහු

පසන්නා මුඛවණ්ණාසි, මිහිත පුබ්බං ව භාසසි,
හොතිඛෝ මරණ කාලෙ, තාදිසි වණ්ණ සම්පදා-හි-

මේ ගාථාවෙන් කිහ:—

මෙහි අභිප්‍රාය කෙසේද යත්? තාගේ මුඛය හෙවත් තාගේ මුහුණ ඔප් නැඟූ රන් කැඩපතක්සේ යහපත්ව බබළන්නේය, සිතා පෙරදුරිකොටම බස් කියයි; ඒ තට මතු නොවෙයි, සමහර කෙනකුන් මරණාසන්නයෙහි මෙබඳු මිහිරි බස් හා මුහුණ පැහැ ඇතිවන්නේය; දැන් නොසිත් නොබෝ කලකින් මියෙයි, එබැවින් මෙබඳු රූපශ්‍රීන් බබළයි; දැන් දැන් තා මරා ඉස කපා ජයපානය බොම්"යි කිහ. මෙසේ රජහු බොධිසත්වයන් හා දෙඛන වේලෙහි මහතාණන්ගේ රූප ශොභාව දුටුවාවූ මහ සෙනාව අපගේ රජ්ජුරුවන් හා මහෞෂධ පණ්ඩිතයන් හා දෙන්නා කථාවක් කෙරෙති, ඒ කුමක් බවුත් නොදනුම්හ; කොල! අසන්නට යම්හ'යි එක්සියයක් රජුන් හා සෙනාව රජහු සමීපයට හියහ. මහතාණෝද රජහුගේ බස් අසා සිතනසේක් "මේ රජ තවම මා මහෞෂධ පණ්ඩිත බව නොදනී; මම මා මරුගත නොදෙමියි වදාරනසේක් "මහරජ! යම් දවසක නුඹවහන්සේ හා කෙවටියා හා දෙන්න සිතින් එකක් සිතා බසින් එකක් කියා කළ මන්ත්‍රණයෙන් සිතින් සිතුවා නොවීය, බසින් කීවාම වීයයි ප්‍රකාශකොට වදාරනසේක්:—

මොඝං තෙ ගජ්ජිතං රාජ!, භින්න මනෙනාසි ඛත්තිය,
දුග්ගහණෙහා හි භයා රාජ, ඛලුඩෙක නෙව සික්ඛවෝ.

තිණ්ණාහි රාජා ගඞ්ගං, සාමච්චෝ සපරිජ්ජනෝ,
හංසරාජං යථාවක්කෝ, අනුජවං පපතිස්සතී-හි-

මෙසින් වදාරා "මහරජ! නුඹවහන්සේ හා කෙවටියා හා දෙන්න මතු මාලේ තනිව ශ්‍රීයහන් ගබඩාවේ හිඳ රහස් මන්ත්‍රණයක් කළාහු අප දෙන්නා මුත් අනික් දන්නෝ නැතැ''සි සිතා කළ ඒ මන්ත්‍රණය මා නොදනිතියි සිතූසේක්ද? එසේ නොසිතුව මැනව, ඒ මන්ත්‍රණය මට කියාලූ දෙයක්සේ ඉදුරුම දනිමි, නුඹවහන්සේගේ මන්ත්‍රණය භින්නවංගියේය, වල විදි සැර

යක්සේ ඉන් ප්‍රයොජන නැත, එසේ හෙයින් අපගේ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට පලාගියහ, ඉදින් 'ලුහුබඳවා ගනිමිදැ සිතනසේක්වීනම් එසිත් නොපිළිවන, අපගේ රජ්ජුරුවෝ ජාති සෛඤ්ඤියකු නැති බලවත් අශ්වාචාර්‍යයකු වැන්නාහ, නුඹවහන්සේ කොටළුවකු නැති ඉතා ඛාන සුලුවූ පුරුෂයකු වැන්නාහ, එසේ හෙයින් ලුහුබඳවා අල්වාගන්නට නොපිළිවන, කෙවට්ටයා කොටළුවා වැන්න, නුඹවහන්සේ කොටළුවා නැති පුරුෂයා වැනි සේක, මම අජානීය සෛඤ්ඤවයා වැන්නෙමි, අපගේ රජ්ජුරුවෝ ඒ සෛඤ්ඤවයා නැති පුරුෂයා වැන්නාහ"යි උපමා කොට වදාළසේක. "මහරජ! වැළිත් අපගේ රජ්ජුරුවෝ ගසින් එතරව යන්නාහු තනිව ගියාහු නොවෙති, සෙන, වාහන සහිතව අමාත්‍ය මණ්ඩලයා පිරිවරාගෙන මහපෙරහරින් වැඩිසේක. ඉදින් නුඹවහන්සේ 'ලුහුබඳවා අල්වා ගනිමි'යි සිතා දිවනසේක් වීනම් අල්වා ගත නොහී අතරමඟ නස්නාසේක. කුමක් මෙන්ද යත්? සවණිණ හංසයකු ලුහුබඳවා දිවන කොකකු මෙනැ"යි කියා නැවතත් අසම්භිත කෙශර සිංහ රාජයකු පරිද්දෙන් උපමාවක් දක්වන සේක්:—

සිගාලා රත්ති භාගසම්ං, ථුල්ලං දිසවාන කිංසුකං,
මංසපෙසිති මඤ්ඤන්තා, පරිබ්බුළ්හා මිගාධමා.

ඒති චත්තා සුරත්තිසු, උග්ගතසම්ං දිවාකරෙ,
කිංසුකං ථුල්ලිතං දිසවා, ආසවජ්ජන්තා මිගාධමා.

එව මෙව තුවං රාජ!, වෙදෙහං පරිවාරිය,
ආසවජ්ජෙන්තා ගමිස්සසි, සිගාලා කිංසුකං යථා. -ති-

මේ ගාථාවන්ගෙන් මහරජ! නුඹවහන්සේ මේසා සෙනාවක් ඇරගෙන තුන්යම් රාත්‍රියෙහි නිදිමරා සිතූ අර්ථයෙන් සවලා මාත්‍රයකුත් සාධාරණ නුහුණු නියාව කුමක් වැනිද යත්? යම්සේ ගොදුරු සොයා ඇවිදින්නා සිවල් මුලෙක් සුපුෂ්පිතවූ කැලවෘක්ෂයක වන්ද්‍රාලෝකයෙන්වත් තාරකාලෝකයෙන්වත් විද්‍යුල්ලතාදි යම්කිසි ආලෝකයකින් එලෙන්නාවූ මල්කැන් දුටුවාහු 'මේ වූකලි එකාන්තයෙන් මස් වැදලිය'යි වරදවා සිතාගත්තේ අනික් ගොදුරක් සොයා නොගොස් 'දඩමස් කම්හ'යි ගස් වටකොට හිඳ අරුණු නැඟී පහන්වූ කල සුපුෂ්පිතවූ කැල මල් දැක ශෘඟාලයෝ ඔවු නොවුන්ට 'කොල! මස් වැදලි නොවෙයි, කැල මල් කැනැ'යි නියමයෙන් දැන එහි ආලය හැරපියන්නේද. එපරිද්දෙන් මහරජ! නුඹවහන්සේ ,වෙදෙහ රජ අසුකෙළෙමි'යි සිතා රාත්‍රිය මුළුල්ලෙහි නිදිමරා ඇවිද මෘගාධමවූ කැනඹිලුන් පරිද්දෙන් අපගේ රජ්ජුරුවන් කෙරෙහි ආලය හැර යන සේක් වේදැ"යි වදාළසේක.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේ කිසි වකිතයක් නැතිව නිර්භීතව කියන්නාවූ බස් අසා සිතන්න හු "මේ ගොවියා පිත් බුනුටිව 'රජහු පැලැන්'සි කියන්නේය. මොහු විසින් රජහු ගවාප්‍රවෝ සැබෑ සැටිය"සි අභිශ්‍රද්ධාසින් කිපී 'පෙරත් අපි මේ ගොවියා පුතු නිසා මොහුගේ නුවරට ගියමේ හන්කඩවත් එතුරු සළුවටත් අසවාම්කව දමාපියා ආම්හැ දැන්. හස්තප්‍රාප්තවූ පස මිතුරා පලවා පියනලද, මූ තරම් අනර්ථකාරි එකෙක් නැත, රජ්ජවත් මූටත් කළමනා ඉස් සිදීම් ආදිවූ යම් වධයක් ඇත්නම්, මූටම කෙරේමි"සි විධාන කරන්නාහු "මේ මහෞෂධයා මා හස්තප්‍රාප්තවූ සතුරු වෙදෙහ රජු ගලවාගවා පිදැ, එසේ

කළාබු මොහුගේ දැත් දෙපා කන් නාසා කපා ගරුම, ඇහ මස් සපා ලියා උල අවුණා ගින්නේ ලා පලහාපියව, තවද සිංහ ව්‍යාඝ්‍ර වෘකාදී මෘග ආදීන්ගේ සම් බිම වතා වට කණු ගසා වියළන්නාහ, එපරිද්දෙන් මේ මහෞෂධයා බිම හොවා සතර අතට කණු ගසා වධකරව, තවද මොහු බිම හොවා තියුණු මුව ගත් ඇති කඩුවෙන් කොටා පලා ව්‍යාඝ්‍ර මෘග සූකාරාදීන්ගේ මාංශ පරිදිදෙන් ඉරා ලියා වධකරවිය'යි කිහ.

(මේ එක් රජකු තබා දසදහසක් සක්වළ රජදරුවෝ එක්වත් මාගේ සවාමිදරුවාණන්ට එවැන්නක් කරන්නට අසමර්ථයහ.) ඒ රජහුගේ බසමුත් කිවාඩින් කිසිවකුත් කළ නොහෙන්නාහ. බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජහුගේ බසමුත් කියෙන් කිසිවකුත් කළ නොහෙන්නාවූ හිස් බස් අසා වලා යෙන් නික්මෙන සඳමඬලක්සේ දනත මරිවින් නිහීන කොට නෙවත් මඳසිතා පහළකොට වදාළසේක. ඒ රජහු කිපෙත් කිපෙත් මාගේ සවාමිදරුවාණන් මූණ පෙම්වඩන නියාව කුමක් වැනිදයත්? බ්‍රහ්මදත්ත රජහුගේ ඉතා රළුවූ ක්‍රෝධ නමැති සුන්නෙන් උලා ඔප් නැඟූ රන් කැඩපතක පැහැ සමානව වඩා වඩා ශොභාමත්ව අතිශයින් බබළන්නට වන, එවිට සිතන සේක් "මේ නුවණ නැති රජ තමාගේ නැයන් ආ ගිය අත් නොදැන මට වධවිධාන කරන්නේය. මැනියනුත් අඹුදරුවනුත් ගෙන්වාගෙන, මියුලු නුවරට ඇවූ නියාව නොදැන මට සැහෙන්නේය. මේ රජ මහා ඓශ්වර්‍යයෙහි පිහිටා සිටියේ මා කළ දෙයක් කෙළේය'සි සිතා ක්‍රෝධ වශයෙන් අත තුබූ හීනෙන් විදපී නමුත් අන් කිසි උපක්‍රමයකින් නසාපී නවුත් නපුර, මේ රජහු ශොකයෙන් මූර්ඡාකරවා හුන් ඇතුපිටම විසංඥකරවා අතුරුමාපියා නැවත අස්වසාලම්,සි සිතා වදාරන සේක්:—

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං පඤ්චාල චණ්ඩස්ස, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මෙ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං පඤ්චාල චණ්ඩියා, වෙදෙහො ඡෙදයිස්සති

සචෙ මේ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං නන්දස්ස දෙවියා, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මේ හත්ථ පාදංච, කණ්ණනාසංච ඡෙජ්ජසි,
එවං තෙ පුත්තදාරස්ස, වෙදෙහො ඡෙදයිස්සති.

සචෙ මංසංච පාතබ්බං, සූලෙකත්වා පචිස්සසි,
එවං පඤ්චාල චණ්ඩස්ස, වෙදෙහො පාචයිස්සති.

සචෙ මංසංච පාතබ්බං, සූලෙකත්වා පචිස්සසි,
එවං පඤ්චාල චණ්ඩියා, වෙදෙහො ඡෙදයිස්සති.-ති-

මේ ආදි ගාථාවන්ගෙන් "මහරජ! ඉදින් නුඹවහන්සේ මාගේ අත් පා කන් නාසා කප්පවා වධ කරවූ සේක් වීනම් නුඹවහන්සේ මට කරවූ වධ මුළුල්ල නුඹවහන්සේගේ පුතණුවන් දියණියන් නඳුදෙවීන් නුඹවහන්සේ වැදූ මැනියන් යන සතරදෙනාට අපගේ රජ්ජුරුවෝ අත් පා කන් නාසා කප්පවා වධ කරවන්නාහ. මහරජ! මාගේ ඇහ මස් ලිහා උල අවුණා වධ කර

වාපි දූ වීනම්, අපගේ රජ්ජුරුවෝත් නුඹවහන්සේගේ නැගණි සතරදෙනාට මට කළ වධයට දිවුණක් කරවන්නාහ. තවද සිංහ ව්‍යාඝ්‍ර මෘග වෘකාදීන්ගේ සම් බිම් වනා කණු ගසා මියලන්නාසේ මට වධ කරවාපිදූ වීනම්, නුඹවහන්සේගේ නැගණි සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ නොයෙක් විත්‍ර වධ කරවන්නාහ. තවද මහරජ සම්භාරුවන් ලවා සම් සියක්පටින් සතස් කරවා, වැළඳගන්නාලද සන්නාහය තමහට බැහැරින් වදනා සැර ආදි උපද්‍රව නිවාරණය කොට ආත්ම රක්ෂාව පිණිස වන්නේද එපරිද්දෙන්ම මම මෑගේ රජ්ජුරුවන්ට සම් සියක් පටින් කළ සන්නාහයක් පරිද්දෙන් ඉදිරිය සිට කිසි භයක් නොවැද්දදී සැප ඵලවම් යි වදාළසේක.

මෙසේද කියා නැවත වදාරනසේක් "මහරජ! වැළිත් මේ නිකම් කියන දෙයෙකැ"යි නොසිතුව මැනව, නුඹවහන්සේගේ අඹුදරුවන් හා මැනියන් අපගේ රජ්ජුරුවන්ට පාවාදී මියුලු නුවරට යන්නෙම්, 'මහරජ! ඉදින් චූලනී රජ්ජුරුවෝ නුඹ වහන්සේ හමන්ට සොරා යවාපිහ'යි මා අල්වාගෙන කන්නාසා අත් පා කප්පවා වධ කරවූ නම් කුමක් කරන සේක්දැයි කී හෙයින් මහෞෂධ පණ්ඩිතයෙනි! ඒ රජ සැබවින් තොපට වධයක් කෙළේ වීනම් ඒ තොපට කළ වධ මුළුල්ලම ඒ රජ තමා මහබල ඇති හෙයින් ඔහට කළ නොහෙතත් ඔහුගේ අඹුදරුවන් මැනියන් යන සතරදෙනාට, තොපට කළ වධයට දිවුණක්ම කරවම්" කියා ප්‍රතිඥා කෙරීමියි කියා මහරජ! නුඹවහන්සේ මා එකතැනැත්තවුට එක් වධයක් කරවූසේක් වීනම් නන්දෘ දෙවින් හා දරුවන් දෙන්නා ඇතුළුවූ නැගණි සතරදෙනාටත් අපගේ රජ්ජුරුවෝ තමන්ට පිළිවන් වධ බන්ධන කරන්නාහ"යි වදාළසේක. මෙසේද කියා මහරජ! නුඹවහන්සේගේ ප්‍රඥා නමැති භීයට මම සම් සියක් පටින් කළ සන්නාහයන්ව ඉදිරිව සිට මාගේ රජ්ජුරුවන්ට ඒ සැරයෙන් වන්නාවූ උපද්‍රව දුරුකොට සැපයක්ම ඵලවම්"යි වදාළසේක.

ඒ අසා චූලනී රජ්ජුරුවෝ සිතන්නාහු "මේ ගොවියා පිත් කුමක් කියාද, මම යම් වධයක් තමාට කරවම් කිම් නම් මේ තෙමේ තමාගේ රජ්ජුරුවෝ මාගේ අඹුදරුවන්ට කරවතියි කියයි. මම ඊයේ එන්නෙම් මාගේ අඹුදරුවන්ට සුරක්ෂිත කොට රැකවල් ලවාලා ආම්, ඒ නියාව නොදන්නා වත, නොබෝ කලකින් මේ මියයන්නේය, එබැවින් මරණ විකලයෙන් නන්දෙඩ ව"යි කියා මහනාගයන්ගේ බස් නොහැදහුහ.

පර සිත් දන්නා නුවණැති මාගේ බොධිසත්ත්වයන්වහන්සේ රජු සිතුවා දැන "මේ රජ මා මරණ භයින් නන්දෙඩනී සිතයි, සැබවින්ම අඹුදරුවන් මියුලු නුවරට යැවූ නියාව දන්වා ලම්"යි සිතා වදාරන සේක් "මහරජ! මරණ භයින් නන්දෙඩනියි සිතූ බැවින් මාගේ බස් අදහන පිණිස තොපගේ අන්තඃපුරයට මිනිසුන් යවා මාලිගාව බැලවුවමැනව, නන්දාදේවීන් හා දරුවන්දෙනා හා නුඹවහන්සේගේ මැනියන් ඇතුළුවූ නැගණි සතරදෙනා සුළු උමඟින් බාගෙනවුත් වෙදෙහ රජ්ජුරුවන්ට පාවාදී මහ උමඟින් මියුලුනුවරට යවා පියනලද්දාහු, මෙහැනට සාරඝියයක් ගවී ගෙවා මියුලු නුවරට යන්නාහ"යි වදාළසේක.

එදිට රජ්ජුරුවෝ සිතන්නාහු "පණ්ඩිතයෝ ඉතාම තරව බුහුටිවම කියන්නාහ, මධ්‍යම රාත්‍රියෙහි ගංතෙර රුහුවල් බලා ඇම්දින මා මිසිනුත් නහුදෙව්න්ගේ ශබ්දයක් සේම සාධාරණයනුත් අසනලදී, මේ පණ්ඩිතයෝත් එසේ මෙසේ කෙනෙක් නොවන්නාහ; මුන් හා සමාන ප්‍රඥ ඇති කෙනෙක් නොයෙත් නැත්තාහ, එබැවින් මුන්ගේ බස් නුපුරුසි සිහා සැබෑ සැටිය"යි උපන්නාවූ බලවත් ශොක ඇත්තාහු රාජ්‍යෛශ්වර්‍යය උපදවාගෙන නිශ්ශොකි එසක්හුමෙන් එක් අමාත්‍යයකු කැඳවා මාලිගාව බලවන්නාහු "එම්බා දරුව! මේ මහෞෂධ පණ්ඩිතයෝ කියන්නාහු "මාගේ අඹුදරුවන් ආදිවූ අවශ්‍ය බඩුත් සහරදෙනා උමඟින් ගෙන්වා තමා රජ්ජුරුවන්ට සාවාදී මියුලු නුවරට යවාපිම්" කිවුය. උන්ගේ බස් සැබෑද බොරුද පරීක්ෂාකොට පියා වහා එව"යි

ඉංඝ අන්තොපුරං මියහං, ගන්ත්වානච්චිනාථනං,
යථාඉමස්සවචනං, සච්චංවාඅදිවාඋසා-ති.-

මේ ගාථාවෙන් කිහ:—

ඒ අසා අමාත්‍යයා සෙනාව පිරිවරා මාලිගාවට ගොස් දෙර හැර රජ ගෙට වැද, ඒ රජගෙයි රුහුවල සිටියවුන් අල්වා අත් පා බැඳ කට කඩරෙදි ඔබා හිත්හි හොකුවල එල්වාපියා තුබූ අන්තඃපුර රකින්නන්ද, කුදුන් කුරුන් ආදි වූවන්ද, බදුන් බිඳ ඒ ඒ ස්ථානයෙහි විසුරුවාපියා තුබූ කන බොනදුද, රුවන් ගබඩාවල දෙර හැර රුවන් උකාගත්තැන ඉසපියාතුබූ රුවන් සමූහ ඇද, දෙර හැර තුබූ ස්ත්‍රී ගණන් ගබඩාද, එසේම ඇරපියා තුබූ සීමැදුරු කවුළු වෙන් ඇතුළට වැද උනුනුන් කටින් පූ උදුරා කන්නාවූ කාරිස්බැඳ ඇවිදිනාවූ කපුටුසමූහයන්ද, මූදුබඩ නෙවුළන් හැරපියාගිය සැඟිගමක්සේද, අමුසොහොනක්සේද, ඉතා තීක්ෂ්ණවූ රාජභවනය බලාපියා ඇවිත් කියන්නේ-

එවමෙතං මහාරාජ, යථා ආහ මහෝ සඩෝ,
සුඤ්ඤං අන්තොපුරං සබ්බං. කාක පටවනකං යථා.-ති-

මේ ගාථාවෙන්:—මහරජ! යම්සේ මහෞෂධ පණ්ඩිතයෝ කිවුද, උන් කිවාසින් එහා බසකුත් බොරුවෙක්නැත, ඒ සැබෑමය, පෙර නුඹවහන්සේගේ මාලිගාව දිවපුරයක් වැන්නැයි සිතම්, එසේවූ රජගෙය දැන් මූදුතෙරබඩ කෙවුළන් ඇරපියා ගිය ගමෙහ මස් ගඳට හැසිරෙන්නාවූ කාක සමූහයක් සෙසින් ඒ මාලිගාව කපුටු සමූහයන්ගෙන් අතුරා සිදුරා නැතිව තුබුයේය, ඒ රජගෙයි නුඹවහන්සේගේ අඹුදරුවෝත් මැනියෝත් මා දුටුවෝ නැත, අන් ගිය තැනක් ඇසූදුත් නැතැ"යි පණ්ඩිතයන් කියේ සැබෑමය"යි කිහ. රජ්ජුරුවෝ නැයන් සහරදෙනාගේ වියෝ දුකින් කම්පිතව වෙව්ලන්නාහු 'මේ දුඃඛය ගොවියා පුතු නිසාම මට වූයේය'යි දණ්ඩන් පහරලද ආශීවිෂයකු පරිද්දෙන් බොධිසත්වයන් කෙරේ පළමු තරමටත් වඩා ක්‍රොධ ඉපදවූහ.

බොධිසත්වයන්වහන්සේ රජ්ජුගේ ආකාරයෙන්ම දැනලා සිතන සේක් "මේ රජ්ජුරුවෝ මහා යසස් හා කීර්ති හා පරිවාර ඇත්තාහ, යම්සේ ක්‍රොධ වශයෙන් තමාට මිතු මා නිසා වන්නාවූ අනිවෘඩි නොසලකා රාජමාන යන් 'ඔවුන්ගෙන් මට ප්‍රයෝජන කිම්දැ'යි නොසොයා මට හිංසාවක් කොළෝනම් නපුර නුවණ නම් මේසේවූ තැනට වේද, උපායකින් මේ රජ්ජු මාකරා නමා

ගන්නම්"යි සිතා නාගදේවීන් පෙර මේ රජු නුදුටු මිරු කෙනකුන් මෙන් ඒ බිසවුන්ගේ රූපශ්‍රී වර්ණනා කෙළේමනම් බිසවුන් සඳහන්කරන්නහුට මේ මිනිස් ඔඩ පණ්ඩිතයන් මරාපිම් නම් එබඳු මාගේ සත්‍ර රහසය නොලබන්නෙම්, වුදින් තොමැරීම් නම් එකාන්තයෙන් නැයන්. සතරඉදනා ලබන්නෙම්"යි සිතා තමන්ගේ බිසවුන් සොරේ කළ සෙනහයෙන් මව කිසි අපරාධයක් නොකරන්නාහ'යි සිතා තමන්වහන්සේගේ ආත්ම රක්ෂාව පිණිස මාලිනාවේ මිතුමහලේ සිටි සේක්ම සක්‍රියා වලාපවලයක් හස්සෙන් ගැසූ විදුලියක් පරිදිදෙන් පෙරව සිටියාවූ රත්පලය යටින් රන්වන්වූ ශ්‍රීගසනාඝ මැත් කොට ගෙන නාගදේවීන් හිය මහ මේයයි කියන්නාසේ උන්ගේ රූපය වර්ණනා කරනසේක් මෙසේ වදාරනසේක.

ඉතෝ ගතා මහාරාජ, නාරී සබ්බඞ්ගසොභනා,
කොසුම්භ එකල සුසෝණී, හංසගග්ගර භාණිනී.

මහාරාජ! ඉතෝ නීතා, නාරී සබ්බඞ්ගසොභනා,
කොසෙය්‍යවසනා සාමා, ජාතරූප සුමේඛලා.

සුරත්ත පාදූ කල්‍යාණී, සුවණ්ණමණී මේඛලා,
පාරාපතක්ඛිසුතනූ, බිම්බොට්ඨා තනුමජ්ඣිමා

සුජාතාඋජ්ඣගලටඨිව, වෙල්ලිව අනුමජ්ඣිමා,
දීඝස්ස සෙසා අයිතා, ඊසකග්ග ප්වෙල්ලිතා.

සුජාතා මිගජාපිව, හෙමන්තෙගිනි සිඛාරිව,
නදීව ගිරිදුග්ගෙසු, සංජ්‍ඣන්නා බුද්ධවෙජසි.

නාගනාසූරූ කල්‍යාණී, පඨමාතිම්බරූඵනී,
නෙවාතිදීඝානාරස්සා, නාලොමානාති ලොමසා-ති=

මේ ගාථාවන්:— වදාරා "රජ්ජුරුවන්වහන්ස! සිවුසැටක් පමණ සත්‍රී ලක්ෂණයෙන් විරාජමානවූ නාගදෙවී මෙසේ ගියාහ, කෙසේ ගියාද යත්? උන්මා විසින් උම්මඟින් පිටත්කරවා වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව මියුලු නුවරට යවාපියනලද, නවද මහරජ! නුඹවහන්සේ ඒ බිසවුන් කෙසේවූ රූ ඇති කෙනකුනැ"යි සිතනසේක්ද, උන්ගේ උපමා රහිතවූ රූපශ්‍රී විලාසය මා අතින් අසාගත මැනව; ගතරන් පෝරුවක් බදුවූ ඉහා මට සිලූටුවූ ශ්‍රෝණී ප්‍රදෙශ ඇත්තාහ, බාල හංස පොතකයන්ගේ ශබ්ද හා සමානවූ මිහිරිවූ ළද බොළඳ ප්‍රිය තෙපුල් දන්නාහ, කශීදෙශයෙහි රන් කම් කළ තිහිරි පිළි ඇන්දාහ, සභාවයෙන්ම රන්වන් ශරීර ඇත්තාහ, ජාත රූපයෙන් කරනලද මිණිමෙවුල් දම් පැලැන්දාවූ, සම්‍ඵාගසුන්දරවූ ඒ නාගදෙවී මා විසින් මෙසේ යවාපියන ලදැ"යි වදළසේක.

නවද අලතා පිරියම් කළාක් වැනිවූ රත්වූ පතුල් ඇත්තාහ, ළද මීව පොල්උන්ගේ ඇස් හා සමානව, කනට රහස් කියන්නට හියාක් වැනිව දික්ව කෘෂ්ණ මණ්ඩලය පරෙවියන්ගේ ඇස්මෙන් ඉතා වටව, නිලුපුල් පෙති පරද වන්නාවූ පස්පෑ දිස්නා නෙත්‍ර ඇත්තාහ, මනාව විලිකුන් බිඹු වැලසේ රත්වූ අධරපල්ලව ඇත්තාහ, නවද දැහිගුල් පල්ලෙක්හි හා වැදිදු සුක් කැබලි පෙළක්සේ ශොභමානවූ දන්තපන්ති ඇත්තාහ, නවද මනාව ගටගත් කළු

මල් ලතාවක් මෙන් ඉතා වඳුබල ගාත්‍ර ඇත්තාහ, සිහින්වූ මධ්‍ය ප්‍රදේශ ඇත්තාහ, තවද ඉතා නිල්වූ දික්වූ සිනිදුවූ අක් බඹුරු සෙය බලාප ඇත් තාහ, තවද අතිනව මංගල්‍යවක්සේ ඉතා යහපත් බැල්ලම් ඇත්තාහ, තවද ලෙමිනත භාලයෙහි හිනි සඳක්සේ ඉතා පැහැපත්ව බබළන්නාහ, හෙවත් ලෙමිනත භාලයෙහි හිනිසඳක්මෙන් බැලූ බැලුමන් ඇසට ඉතා ප්‍රිය වන්නාහ (ඇයි හිනිසඳක් දැසත් ප්‍රිය වෙන්ද යත්? ඒ මෙසේයයි දතයුතු. හිම සම යෙහි හින්නක් දුටු සැල්හි එහි අත හවාපියන්නට නොසිතන කෙනෙක් නැත්තාහ,) එසේ පැහැපත්වූ වත්හි රූශියක් මෙන් සියලු රූපශ්‍රීන් බබළන් නාවූ ඒ නඳුදෙවීන් දුටුයේ නම් උන් ප්‍රාර්ථනානොහාරන එසඳ පුරුෂයෙක් නැහ, තවද සප්‍රීතප්‍රාණතයෙන් හුණු ගඩගාවක් දෙහිත්තියෙන් දියට හී එක පිඩ ගමින්ගෙන සිටි සිහින් නළ කොළ සමූහයෙන් හොබනීද, එපරිද්දෙන්ම ඒ බිසවුන් ඇඟ හුනුවූ නොදික්වූ නිල්වූ එකඟි සිවියාවූ රෙම රාජියෙන් හෙබියාහ.

තවද නඳුදෙවි ජවිකල්‍යාණිය, මාංශකල්‍යාණිය වයඃකල්‍යාණිය, දන්ත කල්‍යාණිය, නෙත්‍ර කල්‍යාණිය යන ඉතා ආශ්චර්‍යවූ පඤ්චකල්‍යාණියෙන් යුක්තාය. තවද ඉතා යහපත් සුවඳින් එලකයෙහි තබාලූ රන් තිබිරි ඵල දෙකක්සේ ඉතා සතෙකාම කරවූ දරුවන් නෙතෙක් ලදත් ආයුෂ නොනෙක් හියත් සොළොස් ඇවිරිද්දෙහි තන මෙන් ඉතා දැඩිවූ තන සඟල ඇත්තාහ, (ඒ බිසවුන්ගේ තන දැඩි නියාව කියන්නට කාරණා කිම්ද යත්? යම් සත්‍රියක් දිව්‍යාඞ්ගනාවක්සේ යහපත්වූ රූ ඇති නමුත් එසේවූ සත්‍රිය නඛාග්‍රයෙහි පටන් නෙඟාග්‍රය දක්වාත් ඇඟේ සම්‍යාඞ්ග යෙහි ඒ ඒ ස්ථානයෙහි සැරහුවමනා විචිත්‍රවූ නොයෙක් පලඳනාවෙන් අනූ නව සැරහී සිටියා නමුත් ඇඟේ තනය මොලොක් වීනම් පුරුෂයන් ඇ කෙරෙහි කරන්නාවූ සෙනහ සුහත් තනය සේම මොලොක් වන්නේය, එබැවින් "බිසවුන්ගේ රූවත් සිත්කලුය, තන දෙකත් ඔවුන් දුටු පුරුෂ යන්ගේ සෙනහය වඩනා පරිද්දෙන් ඉතා දැඩිය,) එසේවූ සිව්මැලි බිසව් මෙසේ මියුලු නුවර බලා හියහ"යි ශ්‍රී හසනය ඔසවා පෑ වදුලසේක.

මේසේ ඒ මහතාණන් වහන්සේ නන්දදෙවීන්ගේ රූප ශ්‍රී වර්ණනා කරත් කරත් චූලනි රජ්ජුරුවෝ නඳුදෙවීන් පෙර තමන් නුදුටුව්රූ කෙන කුන් පරිද්දෙන් බලවත් සෙනහ ඉපදවූහ. රජහුගේ සෙනහය ආකාරයෙන් දැන වදුරා 'මහරජ! මේබඳු රූපත් බිසවුන් මිය යාමෙහි සතුටු සේක්ද? උන් මළ කල නුඹවහන්සේට කිසි අප්‍රතෝජනයෙක්ම නැද්ද? නවත් උන් මළ හොත් මට සතෙකාමකරය. කාරණා කිම්ද යත්? නුඹවහන්සේ මා මොබදී මණුපුතම් මාගේ රජ්ජුරුවෝ ඔබින් නඳුදෙවීන් මරවා පියති. එකල නඳු දෙවීත් මටත් දෙන්නා සමව යමරජ ළඟට යම්හ, ඉතා ධර්මිෂ්ඨවූ යම රජ අප දෙන්නා බලාපියා සියනකල පුරුෂයන්ගෙන් මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙනකුත් නැහ, සත්‍රීන්ගෙන් නඳුදෙවීන් වැනි කෙනකුත් නැහැයි කියා නඳුදෙවී මහෞෂධ පණ්ඩිතයන්ට තරම්හ, නඳුදෙවී මටම පාවාදී පියන්නාහ, එබැවින් මා මිටත් එබඳු සත්‍රී රත්නයක් ලබන කල සෙසු යුවක් නම් මට සිඩ නොවේද? එබැවින් මා මියයාමෙහි කිසි හානියක් නැතැ'යි වදුලසේක. බොධිසත්ත්වයන් වහන්සේ මෙපරිද්දෙන් නඳුදෙවීන්ම වර්ණනා කළසේක. සෙස්සවුන්ගේ නමකුත් නොකී සේක. කුමක්නිසාද

යත්? පුරාණයෝ නම් හවින් විරිය හායාවන් සොරෙකි මෙන් සෙස්සවුන් සොරෙහි සෙනහ නැත්තාහ. ඒ නසුදෙවින් සඳහන් කරන්නෝ දරුවෙහි නාත් සඳහන් කරත්මය'යි සිතා, නසුදෙවින්ම වර්ණනා කළසේක. තලහා දෙවී මැහැලි හෙයින් උන්ගේ නමකුත් නොවදුළසේක. ප්‍රඥා සම්පන්න ඒ මාගේ සවාමිදරුවාණන් නුවණින් යෙදී මධුරස්වරයෙන් වර්ණනා කරන්න කරත්ම නසුදෙවී අවුත් තමා ඉදිරියේ පෙණිගියාස් වැටහිණ.

එවිට රජ්ජුරුවෝ සිතන්නාහු 'මේ මහෞෂධ පණ්ඩිතයන් හැර අන්‍යයෙනක් නසුදෙවින් ගෙනවුත් මට දෙන්නට සමර්ථ නැතැ'යි සිතූහ. මෙසේ ඒ බිසවුන් සිතන්නාවූ රජහට බලවත් ශෝක උපන්සේය. ඒ බව තමන්වහන්සේ දැන "මහරජ! නොසිතා වදුළමැනව, නසුදෙවින් පුතණුවෝත් මැනියන් වහන්සේත් තුන්දෙනම එන්නාහ; උන් හිට එන්නට බාධා නම් මා නොයන පමණක්මය. මා ගිය විටම එන්නාහ"යි වදුළසේක. මෙසේද කියා නැවත වදාරන සේක් "මහරජ! මා ඉන්දදී මේවිවරනට ශොක නොකළ මැනව, අස්වැසුන මැනවැ"යි රජහු අස්වසා වදුළසේක. එවිට රජ්ජුරුවෝ සිතන්නාහු ඉතා ආශ්චර්‍ය්‍ය නියාය මම මාගේ නුවර සුරක්ෂිත කොට රැකවල් ලවා මහත්වූ බළඇණි පිරිවරා අවුත් මේ නුවර මෙසේ රැකවල් ගෙන සිටියදී මේ පණ්ඩිතයෝ නුවරින් නසුදෙවින් ඇතුළුවූ මාගේ නැයන් සතරදෙනා කිසිකෙනකුන් නොදන්නා පරිදි දන් ගෙන්වාගෙන වෙදෙහ රජුට පාවාදී අප හැම තමා හුන් මේ නුවර තුන්යම් රාත්‍රියෙහි නිදි මරා රැකවල් ගෙන සිටියදී අපගෙන් කාත් නොදන්නා පරිද්දෙන් වෙදෙහ රජු හා සෙනාව නුවරින් පිටත් කොට යවාපීය. දිව්‍ය මායමක් දනිද්දෝ නොහොත් ඉන්‍ද්‍රජාලයක් දනිද්දෝ හෝයි විචාරා බලමි"යි සිතා කියන්නාහු:-

දිබ්බං අධියසෙ මායං, අකාසි චක්ඛුමොහනං,
යෝ මෙ අමිත්තානං හත්ථගතං, වෙදෙහං පරිමොචයි-ති-

මේ ගාථාවෙන්:—මේ කිමෙක්ද පණ්ඩිතයෙනි! මේසා රාජසෙනාවක් වට ලාගෙන සිටියදී එසේ රැකවල උන් මාගේ නැයන් සතරදෙනා ගෙන්වා මාගේ සතුරු වේදෙහ රජුත් එක්කොට නුවරින් පිටත්කොට යවපු තෙපි දිව්‍ය මායමක් දනුදැ? නොහොත් ඇසට ඉන්‍ද්‍රජාලයක් දනුදෝහෝ"යි විචාළහ. ඒ අසා මහතාණෝ වදාරනසේක් "මහරජ! මම දිව්‍යමායමුත් දනිමි. ඉන්‍ද්‍රජාලයත් නොදන්නෙමි නොවෙමි, නුවණැත්තාහු දිව්‍ය මායම් උගෙන යම්සේ තමහට භයක් පැමිණි කල ඒ භයින් තුළුත් ගැලවී ආශ්‍රය කළවුනුත් ගලවන්නෝ වෙත්ය"යි වදාරන්නාහු:—

අධියනෙත මහාරාජ! දිබ්බමායිධ පණ්ඩිතා,
තෙ මොච යන්ති අත්තානං, නිසසිතෙ මන්තිනෝ ජනෙ.

සන්ති මානව ප්‍රත්තා මෙ, කුසලා සන්ති ජේදකා,
තෙසං කතෙන මඝෙහන, වෙදෙහො මිවිලං ගතො.-නි-

මේ ගාථාවන්ගෙන්:—මහරජ! මා විසින් කළ මායමකුත් නැත., ඇසට ලූ ඉන්‍ද්‍රජාලයකුත් නැත, එසේකල කෙසේ ශියෝදශත්? උම්ං බිදීමෙහි දක්ෂවූ මාගේ තරුණ යොධයන් විසින් දිව්‍යපුරයක්මෙන් විසිතුරුසොඟ සරහනලද උමඟකින් වෙදෙහ රජ්ජුරුවෝ නුඹවහන්සේගේ නැයනුත් ඇරගෙන මියුලු නුවරට ප්ලාඛියසේක"යි වදුළසේක.

ඒ අසා රජ්ජුරුවෝ සිතන්නාහු "එකකු දෙන්නකු පමා උමඟින් සතළොස් මහා ව්‍යසනයෙන් දුකසේ පිටත්වන්නේය, මේ පණ්ඩිතයෝ සෙනා සහිත රජ්ජුරුවන් උමඟින් සුවසේ පැලහ"යි කියති: 'ඒ උමඟ කොබඳුදෝ හෝ'යි උමඟ දක්නා කැමැත්තට බොධිසත්වයන්වහන්සේ රජ්ජුරුවන්ගේ ආඥාවෙන්ම "රජහු උමඟ දක්නා කැමැති සැටිය, උන්ගේ මනදොළ පුරා උමඟ දක්වා පියමි"යි සිතා රජහට වදාරන සේක්:—

ඉඞ්ඝ පස්ස මහාරාජ! උම්මඟ්ගං සාධු මාපිතං,
හත්ථිනම්පි අස්සානං, රථානම්පි පත්තිනං
ආලොක භූතං තිඨන්තං, උම්මඟ්ගං සාධු නිම්මිතං-නි-

මෙසේ වදාර "මහරජ! මා විසින් කරනලද උමඟ චිත්‍රකාරයන් විසින් සරහා සිටුවනලද ඇතුන්ද, අසුන්ද, එසේම රථාලඞ්කාරයෙන් සරහා සිටුවනලද රථවාහනද, යුඞ්ගයට සැරසී සිටියාක්මෙන් සජ්ජවයක් මුත් අජීවයහි වහා නොදහා නැක්කාවූ නොයෙක් ආයුධගත් අත් ඇතිව සිටි මහත්වූ පාබල සෙනාවද, යන සියලු අලඞ්කාරයෙන් දිව්‍යසභාවක් මෙන් දස දහසක් සක්වළ එනද හැනෙහෙන් මේ බදු ආශ්චර්‍යයක් නැත, එබදු උමඟ බලා වදාළ මැනවැ"යි කියා නැවත වදාරන සේක්:—

මහරජ! මාගේ ප්‍රඥා නමැති වඳුරා හා උපාය නමැති සූත්‍රයා එක්ව හැංගාවූ ස්ථානයෙහි සරහනලද උමඟ අසූවක් පමණ මහදෙර ඇත්තේය, සියුසැටක් පමණ සුලුදෙර ඇත්තේය, එක්සියයක් ශ්‍රීඝන් ගබඩා ඇත්තේය, නොයෙක් සියගණන් පහන් ගබඩා ඇත්තේය, මේ සියල්ලම දක්නා පිණිස වැසිවායිනක් නැතිව සතුටු සිතින් අවෙරිව අවමැනව, එක්සියයක් රජදරුවන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා මේ උපකාරී නුවරට වැඩිය මැනව.

ඉදින් එසේ නොව වෙදෙහ රජහු ගියත් අඩියක් ලද්දේ පණ්ඩිතය'යි කිවාසේ මා කෙරේ මායම්න් හිත සිත් අහවා නොසතුටු ලෙසින් නුවරට වැද, "දෙන්නාට කළමනා දෙය මූවම කෙරෙමි"යි සිතා මා අල්වාගන්නට මායම් සිතකින් ආසේක් ජිනම් මේ එක දසදහසක් යොදුන් දඹදිව එක්සිය යක් රජුන් හා අටළොස් අක්ඛෞහිණී සඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී සෙනාවක් තබා සෘඞ්ධිමත්වූ චක්‍රවර්ති රජෙක් තමාගේ ආනුභාවයෙන් සතරමහා ව්‍යපයෙහි සෙනාව ඒ රජදරුවන් සහිතව ගෙනාසේ ජීනම් මාගේ එකඳ, උපන් යොධයන්ගෙන් එක් යොධයෙක්ම ඒ සෙනාව මරා ලුහුබඳවා ජයගෙන මා රැකගන්නට පොහොසත් වන්නේය, එබැවින්"මහරජ! මා කෙරේ පරණ වෛරයක් සිත ඇත්නම් එසේවූ දුර්මතයක් නොසිතා වහා වැඩිය මැනවැ"යි උපකාරී නුවර වාසල් හරවා වදාළසේක.

වූලනී රජ්ජුරුවෝ එක්සියයක් රජුන් හා අමාත්‍ය මණ්ඩලයා පිරිවරා උපකාරී නුවරට වන්හ. අනිමිත්තාපී සාධක විඤ්ඤාණක්ඛන්ධයක් බඳුවූ ජන නෙත්‍ර රසායනවූ මාගේ සවාමිදරුවූ නිලෝහුරු බොධිසත්වයන්වහන්සේ ඇත් සෙනාවක් මැදට නොබා, නික්මුණු අතීත කෙශව සිංහරාජයකුසේ මාලිගාවෙන් බැස රජ්ජුරුවන් වැඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජදරුවන් හා මහා සෙනාව පිරිවරා උමඟට වන්සේක. බ්‍රහ්මදත්ත රජ්ජු

රුවෝ රාජ මාඩගල්‍යයට සරහනලද මාඝාඝිවූ නුවරක් බඳුවූ ඉතා අශ්චර්‍යවත්වූ උම්මග්ග දඟ බොධිසත්ත්වයන්ගේ නුණ කියන්නාහු "එම්බා රජදරුවෙනි! යම් රජක්හුගේ ජනපදයෙහිද, එක රටද එක නුවරද, එක රජගෙයිද, මේ මහෞෂධ පණ්ඩිතයන් වැනි කෙනෙක් වෙසෙත්නම් ඒ ජනපදයටත්ඒ රටටත් ඒ නුවරටත් ඒ රජුටත් ලාභයෙක් මුත් අලාභයෙක් නැත්තේය; එහේ හෙයින් පණ්ඩිතයන් හා සමඟ වසන්නාවූ වෙදෙහ රජතව එසේමි මහා ලාභයෙකැ"යි බොධිසත්ත්වයන්ට සතුතිකරන්නාහු වෙදෙහ රජු කෙරේ ව්‍යාජයෙන් "ඉදින් මහෞෂධ පණ්ඩිතයෝ මා සමීපයෙහිවත් මාගේ නුවරවත් මාගේ ජනපදයෙහිවත් මාගේ ආඥ පවත්නා රට දනවියෙහිවත් වෙසෙත්නම් මටත් වන්නේ මහ වැඩෙක්මය, මහා අභිවෘද්ධියෙක්මය"යි මහ පසාරයෙන් කීහයි දතයුතු.

ඉක්බිති බොධිසත්ත්වයන්වහන්සේ එක්සියයක් ශ්‍රී යහන්ගබඩා දැක්වූසේක. ඉන් එක් ගබඩාවෙක දෙර හළ කල මුළු ගබඩා වලම දෙර හැරෙන්නේය; එකක් පිහිටාල මුළු දෙර පිහි යන්නේය; වෙසේ අශ්චර්‍යවත්වූ උම්මග්ග විසතර බලමින් රජුරුවෝ පළමුව යන්නාහ, පණ්ඩිතයන්වහන්සේ පසුව යෙති, එක්සියයක් රජදරුවන් හා රජුරුවන්ගේ අගමැසි සෙනාව උම්මග්ගව වන්නාහ, මහ උම්මග්ග දෙගව්වක් පමණ ගෙවාගෙන ගොස් රජුරුවෝ උම්මග්ග දෙර එළිපැනින් පිටත්වූහ. බොධිසත්ත්වයන්වහන්සේ රජහු පිටත්වූ බව දැන, තමන්වහන්සේ පිටත්වනසේක් අනික්හු පිටත්විය නොදී උම්මග්ග දෙර පියනසේක් නොහඟවා එක් ඇණයක් වැඩිලූසේක. ඒ ඇසිල්ලෙහි අසූවක් මහදෙරය, සූසැටක් යුලුදෙරය, එක්සියයක් ශ්‍රී යහන් ගබඩාවල දෙරය, සියදහස් ගණන් පහන් ගබඩාවල දෙරය, යන සියලු දෙරවල් ඒක්ෂණයෙහි පිහි අතුලුහි ගියේය; ඒ සියලුම උම්මග්ග ලොකාන්තරික නරකය මෙන් අන්ධකාරව ගියේය. මහජනයා හසින් නැතිගෙන ගියේය; උම්මග්ග හසුවූවෝ ඔ නොවුන්ගේ ශබ්දයමුත් 'මූ මූය'යි නොදන්නාහ. බොධිසත්ත්වයන්වහන්සේ ඊයේ මධ්‍යම රාත්‍රියෙහි සරණ පාවාදී වෙදෙහ රජුරුවන්යවා නැවත උම්මග්ගට වදිමින් හවන්වහන්සේගේ මහල් කඩුව වැල්ලේ සඟවා තුබූසේක්ද, ඒ කඩුව තුබූ තැනින් වනාම අහට ගෙන අටළොස් රියනක් පමණ තැන් ආකාශයට පැනනැඟි බිමට බැස වමතින් රජහු අත අල්වාගෙන කඩුව බොටුවට පැ අමෝරා භය ගන්වා, මහරජ! මේ සිදුලු දඹදිව රජ්‍යය කාවද'යි විවාළසේක.

රජුරුවෝ හසින් තැතිගෙන 'පණ්ඩිතයෙනි! තොපටමය තොපටමය තොපටමය'යි හුන්වරක් කියා 'මා නොමරා මට අභය දෙව'යි කීහ. එබසට බොධිසත්ත්වයන් වහන්සේ වදාරනසේක් "මහරජ! නොබව මැනව, නුඹවහන්සේ මරන පිණිස කඩුව එසවූයෙම් නොවෙමි, මාගේ ප්‍රඥාවේ ආනුභාව දක්වන පිණිස කඩුව එසවීමි" කියා රජුරුවන් අහට කඩුව දුන්සේක් "මහරජ! ඉදින් මා මරනු කැමැතිසේක් වීනම් මේ කඩුවෙන් දුන්ම මා මැරුව මැනව, තොමරන සේක් වීනම් අභය දුනමැනවැ"යි වදළසේක. ඒ අසා රජුරුවෝ "මා විසින් තොපට අභය දෙනලද්දේය, හෙවි මා කෙරෙහි සැක නොකරව"යි මතුත් බවුනොවුන්ට නොවරදනා ලෙස කඩුව ගෙන සපථ කළහ. ඉක්බිති රජුරුවෝ කියන්නාහු 'පණ්ඩිතයෙනි! තොපගේ වෙබදු ප්‍රඥ බල හා කාය බල ඇතිව කුමක් පිණිස රාජ්‍යය නොගනුදු"යි කීහ. මහරජ! "ඉදින් කැමැත්

තෙම් නම් සියලු රජදරුවන් මරා රාජ්‍යය ගනිම් අහුන් මරා යැයි ගැන්මෙ නුවණැත්තන් විසින් නිතැ කරනලදැ"යි වදාළසේක. රජපුරුවෝ එබසට සතුටුව කියන්නාහු "පණ්ඩිතයෙනි! උමිහව්හසුවූ මහජනයා උමිං දෙර නොහරනෙන් වලප්නාහ, උමිං දෙර හැර ඒ සත්වයන්ට ජීවිතදානය දෙව"යි කිහ.

සකල ජනාන්ධකාරවූ තිලෝගුරුවූ අනාථ නාථවූ කරුණානිධානවූ (මාණෙ) සවාම්දරුවාණෝ එවේලෙහි දෙරහළසේක. සියලු උමඟ ඉරා හැංගසේ එකාලොක විය. මහජනයා අස් වස් ලදින් සැපසේ සිටියහ. එක්සිය යක් රජදරුවෝ තමන් හමන්ගේ අගම්පති සෙනාව හා සමඟ උමඟින් පිටත්ව බොධිසත්වයන් වහන්සේ සිටි තැනට ගියහ. ඉක්බිති රජදරුවෝකියන්නාහු "තොප නිසාය පණ්ඩිතයෙනි! අප ජීවිත ලැබුයේ, මිඳ ඇසිල්ලකින් දෙර නොහළුවෝ නම් අප සැම උමඟ මළුම්හ"යි කිහ. සවාම්දරුවාණෝ වදාරන සේක් 'දැන්, මතුනොවෙයි තොප හැම මා නිසා රැකුණේ, පළමුත් රැකුණේ වේදැ"යි වදාළසේක. පළමු තමන් ඔබ නිසා රැකුණු නියාව නොදන්නා රජ දරුවෝ 'ඒ කවර කලකද? පණ්ඩිතයෙනි! යි කිහ. සවාම්දරුවාණෝ උන් හැම ගිවිස්වා සලකුණු වදාරතසේක් "රජදරුවෙනි! අපගේ ප්‍රියලු නුවර තබා සියලු දඹදිව රාජ්‍යය ගෙන මේ උත්තරපඤ්චාලනුවරට අවුත් මිහුල් උයනදී 'ජයපානය බොම්හ'යි මන්ත්‍රණය කර රා මස් ආදි සියල්ලක් සැරහූ දවස් සිහි කරවිය"යි වදාළසේක. එසේය පණ්ඩිතයෙනි! සිහි වැනැ'යි කිහ. "එසේ වී නම් මේ රජපුරුවන් හා කෙවට්ටයා කළ නපුරුමන්ත්‍රණයකින් කෙවට්ටයාගේ බස් ගෙන විෂ මිශ්‍ර රා හා මිවිෂ මාංශ කවා තොප හැම මරන පිණිස කළාවූ මන්ත්‍රණය මම් දැන 'මා සේවූ පණ්ඩිතයකු ජීවත්ව ඉන්දදී මා බල බලා මේ රජදරුවෝ අනාථ මරණින් නොමියෙත්ව'යි සිතා මාගේ සහජාතයොධයන් එවා රා හා මිවිෂ මාංශ පිරූ ඒ සැලවල් බිඳුවා මොවුන් දෙදෙනාගේ මන්ත්‍රණය බිඳ තොප හැමදෙනාටම් ජීවිත දානය දුන්නෙම් වීද"යි වදාළසේක.

• ඒ රජදරුවෝ කලකිරුණු සිත් ඇතිව 'සැබෑද? මහරජ! එසේකෙළේ'යි කිහ. කෙවට්ටයාගේ බස් ගෙන මා එසේ නොළේ සැබෑය, බොරුවක් නොවෙයි, පණ්ඩිතයන් කී බස් සැබව'යි කිහ. ඒ රජදරුවෝ සැමදෙනම බොධිසත්වයන් සිපගෙන 'පණ්ඩිතයෙනි! අප හැමදෙනාට පිහිටව සිටියෝ නෙපි මිස, තොප නිසා අප දිවි ලැබුයේය'යි තමන් තමන් පලන් වොටුනු සහිතවූ ස්ත්‍රීන්ට ආභරණයෙන් බොධිසත්වයන්ට පූජාකළහ. ඒ පූජා විඳගෙන සිට චූලනී රජපුරුවන්ට උපන් සණස්සල්ල හරණසේක් "මහරජ! නොසිතුව මැනව, නුඹවහන්සේගේ වරදෙක් නොවෙයි, මේ වූකලී දුෂ්ටවූ කෙවට්ටයාගේ පාප මිත්‍ර සංසර්ගයෙන්වූ දෝෂයකි, මහු වෙවැන්නක් නොකරන්නෙම්'යි මේ රජදරුවන් හැම ක්ෂමාකරගතමැනවැ"යි වදාළසේක. රජපුරුවෝ කියන්නාහු "රජදරුවෙනි! මාගේ නුවණින් නොප හැමදෙනා කෙරෙහි ජන්මාන්තර වෛරයකින් මා කළ දෙයක් නොවෙයි, තෙරු ඉපා දුර්ජිනවූ ගුණමකු ලාමිසවූ කෙලෙහි ගුණ නොදන්නාවූ අලජ්ජිවූ අනාර්‍යයි සදරූප ඇති අවැසණවූ කෙවට්ටතම් ජඩයා නිසා මා නොදැන කළ අපරාධය ක්ෂමාකරව, නැවත මා පණතබා මේවැන්නක් කරන්නේ නැතැ"යි ක්ෂමා කරවූහ. මෙසේ රජදරු වන් ඔවුනොවුන්ගේ වරද දෙසා හැම එක්සිත් වීමෙන් සමාගම්වූහ.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ බොහෝ කන බොන දෑ හා මිල් හඳ මිලවුන් ගෙන්වා සියලු රජදරුවන් හා උත්තර පඤ්චාලය වේදෙනය යන දෙරට සෙනාව එක්ව සත් දවසක් උම්ඟ ඇතුළතින් තෙළ ඉන් නැඟී උපකාරි නුවරට වැද බෝධිසත්ත්වයන්වහන්සේට බොහෝ සත්කාර සම්මාන කොට එක් සියයක් රජදරුවන් පිරිවරා මාලිගාවේ මතුමහල්තෙලෙහි හුන්නාහු බෝසත්වයන් තමන් සමීපයෙහි රඳවා හැමොහොට කියන්නාහු, "මිහෙණෙඩ පණ තයෙනි! දවස්පහා ජීවිත වෘත්තියට දෙනලද ඉඩකඩම් ආදියද; ගම් බිම් ගව මහිෂ ඇත් අස් ආදී වාහන සමූහයද, මුතු මැණික් පබළු වෛඩූර්‍ය්‍ය මසාර ගල්ල ලොහිතඞ්ක රජත සුවණ්ණාදි දශවිධරත්න සමූහයද දෙමි. ඒ ඒ දෙශයෙහි අනෙකප්‍රකාර වස්ත්‍රාභරණ සමූහයන්ද, දැසි දස ආදිවූ නොයෙක් කම් කාරයන්ගෙන්ද, මාගේ රාජාභිෂේකයට දෙවැනිකොට සිටුවාලමි, වෙදේහ රජ්ජුරුවන් තබාදුන් වෘත්තියට හැමදෙසින්ම කිසිවකුත් නොවරදවා විගුණ කොට නොයෙක් පරිද්දෙන් ආඥ්‍යකොට දෙවාලමි, එකදෙශයට නායක වෙ දෙහ රජ්ජුරුවන් හොප රැකලියහෙනකල,දසදහසක් යොදුන් දඹදිවට නායක කවු මම රැක්ක නොහෙමිද? තවද තෙපි මියුලුනුවර එක වෙදෙහ රජ්ජුරු වන්ට හා වෙදෙහරටට සෙනෙවිරත්නකම කරන පමණෙක්වේද, මා සමීපයෙහි රැඳුනාහු විනම් දසදහසක් යොදුන් දඹදිවටත් එක්සියයක් රාජධානියෙහි රජදරුවන්ටත් මටත් තොප තනිව සෙනෙවිරත් ධුරය කරන හෙයින් රජහු එක්සියයක් දෙනහට එක සෙනෙවිරද්දුගු; රජදරුවන් මුළුල්ලට වඩා තොපගේ ආඥාවත් තෙජසත් ප්‍රඥාවත් කීර්ත්තියත් සිටිනේය;ඉදින් මෙහි තෙපි රදා උනුනම් එක්සියයක් රාජධානිවල අමාත්‍ය මණ්ඩලයා සහිතවූ මනුෂ්‍යයෝ තොප මුත් අප ඇතැයි කියා නොදන්නාහ. තවද අවශෙෂවූ මනුෂ්‍යයන් හා එක්සියයක් රජදරුවන් හබා මමත් තොප කීවා මුත් සිතින් සිතා කිසිවකුත් නොකරම් රඳව"යි කීහ.

රජුගේ සම්පත බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රතික්ෂෙප කරන සේක්මෙසේ චදුරන සේක. 'මහරජ! යම් පුරුෂයෙක් බොහෝ දවසක් බොහෝ සම්පත් දී හනීනා සවාමීව රක්ෂාකළ රජක්හු සම්පයෙන් අනික් රජක්හු ඒ සම්පතට වඩා සැපත් දෙමි කියා ඒ විරුත් කාලයක් මුළුල්ලෙහි රැකි රජහු හැර අමුතුව සැපත් දෙමි කී රජහුගේ සමපත් නිසා එහි ලොභයෙන් ගියේ වීනම් ඕහට තමා විසි ුත් නිසුමය, අනුන් විසිනුත් නිසුමය"යි වදළසේක. ඒ කෙසේද යත්? තමා විසින් ලබන නිසු නම් මේ රජ්ජුරුවෝ තමහට සෙසුනැසියකමක් නැතිව සත්ඇවිරිද්දෙහි පටන් මා තමන් සමීපයෙහි රඳවා මා නිසාම මාගේ දෙමව්පියන්ට ඒසා මහත් උපකාරයකුත් කොට මා මේසා මහත් තනතුරෙක තබා මහාඓශ්වර්‍ය්‍යයෙහි පිහිටුවා රකිමින් සිටියහ. ඒ රජහු අත්හැර 'වඩා සැපත් දෙමි' කියවසි මා කළ දෑ නපුරුයි තමා තමාටම නිසු කරන්නේය.

තමා බාල අවස්ථායෙහි පටන් කාරණා කාරණා උගන්වා සියලු සම්පත් සමඟ මෙසා තනතුරෙක තබා රකිමින් සිටි රජහු හැර 'සැපත් වඩා දෙමි'යි කී පමණින් මෙතෙක් දවස් කළ උපකාර ජල රෙඛාවක් පරිද්දෙන් කෙළේය. නැවත අන් රජහටත් මෙහෙක් වේදැයි අනුන්ගෙනුත් නිසු ලබමි, අනුන්ගෙන් ලබන නිසු නම් මේය, මේ සේ දෙතැනින් නිසුගෙන් මට ගැලවීමෙක් නැත, එබැවින් මාගේ රජ්ජුරුවෝ යම්තාක් ජීවත්ව ඉඳිද්ද, ඒ

තාක් කල් මූළුල්ලෙහිම 'වෙදෙහ රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි කිවවුන් ලවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ මහෞෂධ පණ්ඩිතයෝය'යි නොකියවමි. මිසුලු නුවර මහෞෂධ පණ්ඩිතයෝය'යි කිවවුන් ලවා උත්තර පඤ්චාල දෙශයෙහි මහෞෂධ පණ්ඩිතයෝය"යි නොකියවමි, මේ මාගේ රජ්ජුරුවන් ජීවත්ව ඉන්දදදි මා රදන්නේ නැහැ"යි වදාළසේක.

නැවත රජ්ජුරුවෝ කියන්නාහු "එසේවීනම් පණ්ඩිත යෙනි! තොපගේ රජ්ජුරුවන් සවස්සවූ කල 'එම්' කියා මට ප්‍රතිඥ දෙව"යි කිහ. මහරජ ජීවිතය නම් 'මහලුය බාලය'යි නියමයෙක් නැත. එහෙයින් මම රැකි උනිම් නම් එම්'යි වදාළසේක. ඉක්බිති රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්වහන්සේට ප්‍රණාමාති ක්‍රියාත්‍ත මහා සත්කාර කරවූහ. සත් දවසක් ඉකුත්වූ කල්හි මහා තාණෝ ගමනට සමු ඉල්වූසේක. නැවත රජ්ජුරුවෝ "පණ්ඩිතයෙනි! තොපට මේ මේ දෙය දෙමි ඒ නෙතයව"යි ප්‍රසාද කියන්නාහු:—

දම්මි නික්ඛසහස්සං තෙ, ගාමාසීති ච සාසිසු,
දසිසතානි චත්තාරි, දම්මි හරියා සතංචතෙ,
සබ්බසෙතඛ මාදාය, සොත්ථිං ගච්ඡ මහොසධා=ති=

මේ ගාථාවෙන් කිහ:= මෙහි අභිප්‍රාය නම්, මහෞෂධ පණ්ඩිතයෙනි! තොපට නික් දහසක් දෙමි, තෙවන් රන් පස්විසි දහසක් දෙමි, තවද තොපගේ වෙදෙහ රටට ආසන්නවූ සාසි දෙශයෙන් එකි එකී ගමකින් අවූ රුද්දකට ලක්ෂයන් අය නිමන්නාවූ මෙසෙයින් අවූරුද්දකට අසූ ලක්ෂයක් නිමන උත්තම තරමේ සැඟම් අසූවක් දෙමි, තවද නොමැහැලිවූ බාලපරු යෙහි සිටි කෙල්ලන් සාරසියගක් දෙමි, තවද නොයෙක් බිසෝ පලඳනා වෙන් සරහා නිමවනලද ශරීර ශොභා ඇති සළු ලක්ෂණ සම්පන්නවූ බිසෝ වරුන් සියගක් බිරින්දන්කොට පාවා දෙමි, තවද මාගේ ඇත් අස් රථ පදාති සෙනාවන් තොපට නින්දේම ප්‍රසාද සෙනාවක් කොට දෙමි, තොපගේ සෙනාවත් මිගෙන් දුන් සෙනාවත් ඇරගෙන සුවසේ තොපගේ රටට යව"යි සමුදුන්හ.

ඉදින් නඤදෙවින් හා නැගන් සතර්දෙනා වෙදෙහ රජ්ජුරුවෝ නේවත් නමුත් පණ්ඩිතගන් වහන්සේ තමන්ගේ යාවිඤ්ඤවට රැදුණු දැ වීනම් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් චක්‍රරතනය හස්තප්‍රාප්තවූ සක්විති රජක්හු මෙන් සතුටුවත් මුත්පිට් මාගේ බිසවුන් හා නැ කෙනෙක් ඇත්තේ වේදැ"යි කියන්නා තබා සිතුනුත් නොසිහන්නාහ.

බොධිසත්ත්වයන් වහන්සේ සමුදුන් රජ්ජුරුවන් අස්දිසා වදාරනසේක් "මහරජ! නුඹවහන්සේගේ නැගන් 'මාගේ නැගෝ සාරසියගක් ගව්වෙන් පිටත වේදැ'යි නොසිතුව මැනව, මම මාගේ රජ්ජුරුවන් නික්මෙන දවස්ම මෙසේවූ සම්මතයක් කෙළෙමි, සෙසේද යත්? මහරජ! තෙල නඤදෙවින් මේ තනතුරේ තබා දුටමැනව, පඤ්චාලචණ්ඩ කුමාරයන් මල්තනතුරේ තබා දුටමැනව'යි කියා පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් අභිෂෙකයට පමුණුවා සොළොස් දහසක් බිසෝවරුන්ට නායක සෙනවුන්ට වොටුනු පලඳනා රජයට පාවා දී යැවීමි, නුඹවහන්සේගේ නැගන් මැනියන්වහන්සේත් බිසවුන්වහන්සේත් ඥාතිබ්‍රාහ්මණයන්දුත් මා ගිය නොබෝදවසකින් එහා එවාලන්නෙමි"යි වදාළසේක.

"යහපත පණ්ඩිතයෙනි! කියා තමන්ගේ දුවණියන්ට දුනමිතා දයාද යට දැසි දස වස්ත්‍රාභරණ අලංකාරවලින් ඇඳුම් ආදි දෙසවිධ රුවන් සමූහයද, රත්නාලඞ්කාරයෙන් සරහනලද ඇත් අස් රථ ආදිවූ වාහන සමූහයද, යන මේ දයාද මුළුල්ල කිසිවෙකිනුත් අඩුනොකොට තමන්ගේ නායක තනතුරට හා 'රජව මුත් මෙසේ දියහැකිදැ'යි කට කට කියවාරු කරන පරිද්දෙන් නොයෙක් සම්පත් මුළුල්ල 'මාගේ දුවණියන්ට දෙව'යි බොධිසත්වයන්ට පාවාදී, බොධිසත්වයන් හා කැටිව යන සෙනාවට දිය යුතු වියදම් ආදි සියල්ල විධාන කරන්නාහු එහි නියුක්තයන්ට මෙසේ කියත්, නෙසේද යත්?—

එම්බා සගයෙනි! වෙදෙහ රජ්ජුරුවන්ගේ සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, ඒ තරමට නොමඳවූ සෙනාවය, යන සියල්ලෝම වෙදෙහ රජ්ජුරුවන් හා කැටිව පළමු පලාගියහ. පණ්ඩිතයන් කැටිව සිටියාහු බොහෝදෙනෙක් නොවන්නාහ, උන් තමන්ට අගම්පඬිව සිටින්නාහු, සොළොස් දහසක් ඇත් ඇණිය, සොළොස් දහසක් අස් ඇණිය, සොළොස් දහසක් රථ ඇණිය, ඒ තරමටම වඩා සිටිනාවූ මහාසෙනාව, උන් උන්ට දෙන්නේ වැඩියෙක් නොවෙයි, උන් උන්ට පළමු දෙන තරම් පණ්ඩිතයන්ගේ වියදම් කැමැත්තන් අතින් නියම දැන පළමු උන්ගෙන් දෙන්නාට දෙන වියදම් දැන් එනකුට බැගින් සියල්ලන්ට දෙන වෘත්තිය උත්තමයන් කෙරේ පටන් අධමයන් දක්වා ඇතුන් පිරින් හවයන් දක්වා පළමු වියදම් කා සිටිය වුන්ට කිසිවෙකිනුත් රැකැණි නොකරවා අන්නපාන වස්ත්‍රාභරණ ආදිවූ සියල්ලකිනුත් අඩුනොකොට වහා දෙවවි, එසේකල සාරසියයක් ගවි ගෙවා යන්නාහු මහ සුවසේ නිදුකින් කලානත නොවී යන්නාහ"යි විධාන කළහ.

නැවත බොධිසත්වයන් වහන්සේට සමු දෙන්නාහු මෙසේ කියත්:—

> හත්ථි අස්සා රථා පත්ති, ගවෙජ්ඣ වාදය පණ්ඩිත!
> පස්සතු තං මහාරාජා, වෙදෙහො මිථිලං ගතං-ති-

මෙසින් කියා "ඓශ්වර්‍යඥාන පණ්ඩිතයෙනි! ඇත් අස් රථ පදාති සෙනාව පිරිවරා මහාසෙනාඝයෙන් අසුරවිජයකොට ජයලත් ශක්‍රදෙවේන්ද්‍රයා පරිද්දෙන් වහා නික්මෙව; නොපමා සුවසේ මියුලු නුවරැ ගියවුන් දකින්නට පුලුවන් උන් වෙදෙහ රජ්ජුරුවන් හා පෙරමග බලා බලා ඉඳිනා නුවර වාසිහු නොපමා ගියවුන් දැන සතුටු වත්ව"යි කිහ. ඒ සියයක් රජදරුවෝද බොධිසත්වයන් වහන්සේට බොහෝ සත්කාර කොට බොහෝ පඬුරු දුන්හ.

ඒ ඒ රජදරුවන් අතරේ සිටි වරපුරුෂයෝ එක්සියයක්දෙන තමන්ගේ පතිත් හා සමඟ අවුත් පණ්ඩිතයන්වහන්සේ පිරිවරා ගත්හ. ඒ මහතා ණන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ නොගොත් මෙතෙකැයි පමණ නැත්තාවූ චතුරඞ්ගිනී සෙනාවෙන් යම්සේ ගොඩ ගමන්ගත් මහා සමුද්‍රය පරිද්දෙන් නික්මුණුසේක්, අතරමඟ සිට ඉහමදහස රජ්ජුරුවන් දුන් සඳගම් අසුවේහි අය ගෙනෙව'යි මිනිසුන් යවා තමන්වහන්සේගේ වෙදෙහ රටට සම්ප්‍රාප්ත වූසේක.

එදවස් 'උමඟින් යන්නටය'යි කී බසින් දණ නළල වැලමිට තබරෙදි බැඳ තෝතමක් හැඳ සැරහුණු ප්‍රඥ සමුද්‍රවූ ඉතා ගැටවා සෙනකයා මතු වන්නා දැන, අතරමඟ එක් ප්‍රාර්ථයකු සිටුවන්නේ මෙසේ කියා:- "එම්බ, කුඩෙනි! වූලනි රජ්ජුරුවන් මැත එන්නක් වත් අනික් කිසිසෙනකුන් මැත එන්නක් වත් වහා අවුත් මට කියව"යි කියා සිටුවිය. ඒ ප්‍රාර්ථයා මියුලු නුවර දෙළොස් ගව්වකින් ඔබ්බේ වඩනා මහබෝසතාණන්වහන්සේ දැන 'මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ මහපෙරහරින් වඩිමින් සිටි සේකැ"යි අවුත් සෙන සයාට කිය. ඒ අසමින්සෙනකයා වහා රජගෙට ගොස් රජහට කිය. රජ්ජුරුවෝ පණ්ඩිතයන්වහන්සේ එන නියාව දැන මාලිගාවේ මතුමහලට නැඟී සී - ඉදුරා කවුළුවෙන්පිටත බැලුනාල්හි සෙනාව දැක කියන්නාහු අපගේ පණ්ඩිතයන්ගේ සෙනාව මදය, උන් හැම හමා සොළොස්දහසක් ඇත්ඇණිය, සොළොස්දහසක් අස් ඇණිය, සොළොස්දහසක් රථඇණිය, එපමණ තරම් සෙනාවට වඩා බලසෙනාවය, ඉතා භයානකයයි හසින් තැතිගෙන සෙනකයා අසින් විචාරන්නාහු-

හත්ථි අස්සා රථාපත්ති, සේනාසා දිස්සතෙ මහා,
චතුරඞ්ගිනි භිංසරූපා, කිනනු මඤ්ඤසි පණ්ඩිතා-ති-

මේ ගාථාවෙන්:- ඇත්සෙනාවය, අස්සෙනාවය, රථසෙනාවය මෙතෙකැයි පමණනැති පදාතිසෙනාවෝ ඝන ඉතා භයානක සවරූප ඇත්තාවූ චතුරඞ්ගිනි මහා සෙනාව පෙනෙයි. සෙනකයෙනි! තෙපි උන් කවුරුනැයි සිතව්දැයි කිහ.

සෙනකයා රජහු සැකහරවා තත්වූපරිද්දෙන් කියන්නේ "මහරජ! නොබා වදාළ මැනව, නුඹවහන්සේට උතුම් සන්තොෂයෙක් වන්නේය, ඊට කාරණා කිම්දයත්? එක්සියයක් රජදරුවන්ගේ සෙනාවය, බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෙනාවය, මියුලු නුවරින් ගිය සෙනාවය"යි ඝන සෙනාවන් ඇතුළුවූ චතුරඞ්ගිනි සෙනාව පිරිවරා සුවසේ එනසේක්වේද, අපට යශදායකවූ අපගේ ළයක් වැනි අපගේ ඇසක්වැනි අපගේ ජීවිතයක් වැනි අපගේ සවාමි දරුවූ ජනානන්දකරවූ ලොකසවාමීවූ කිළෝගුරුවූ නිලොක තිලකවූ ප්‍රඥ සම්පන්නවූ සරණාගත වජ්‍ර පඤ්ජරවූ ප්‍රඥප්‍රදීපවූ අපගේ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ වඩනා සේකැ"යි කිය.

සෙනකය! කුමක් කියවිද? පණ්ඩිතයන්ගේ සෙනාව මදය, මේ සෙනාව එදවස් බ්‍රහ්මදත්තයන් ආ නියාව මෙන් මහා සෙනාවකැ"යි කිහ. නැවත සෙනකයා කියන්නේ "මහරජ! නොසිතා වදාළ මැනව, අපගේ සවාමිදරුවණන්ගේ ඉතා මිහිරි කණීරසායනයක් බඳුවූ ධර්මාන්විතවූ මධුර කථාවෙහි බැඳුණ රජ්ජුරුවන් විසින් ඔබ සොරෙහි පැහැද ඔබට ප්‍රසාදයෙන් දුන් සෙනාවය, සැන නොසොට වදාළ මැනවැ"යි කිය.

ඒ අසා රජ්ජුරුවෝ ඉතා සතුටුව නුවර බෙර ලවන්නාහු "මේ මාගේ සත්යොදුන් මියුලුනුවර දිව්‍යපුරයක් මෙන් සරහා පණ්ඩිතයන්ට පෙරගමන් කොරෙත්ව"යි කියා බෙරලැවූහ. නුවර වාසිහු දැක්මට පුල පුලා උන්නාහු එබස් අසමින්ම අටවිසි ගව්වක් පමණ ඒසා මහත් නුවර අසුර විජයකොට

ජඟලදින් එන ශක්‍රදෙවෙන්ද්‍රයාට සරහා නිම්වන ලද ශක්‍රභවනයක් මෙන් අති මනොහර කොට ධජ පතාකා පූර්ණකලස් කදලි තොරණ ආදියෙන් හා සුදුවැලි ලදපස්මල් ආදියෙන් විසිතුරු කොට සරහා, නුවර වාසිත්‍ර සම්භාරණයෙන් සැරහී සවාමිදරුවාණන්ට පෙර ගමන් කොට වඩාහෙතනාහ. පණ්ඩිතයන් වහන්සේ ඒ නුවර වාසිවූ සත්‍රී පුරුෂයන්ගේ නෙත්‍ර සමූහයන් සතුටු කළුලෙන් පුරා තුමාරයෙන් ආදීවූ නිලුපුල් පෙති සේ කොරෙමින් ඇස් ඇත් තිවා තමන්වහන්සේ දැක්මසක් මුළුල්ලෙහි නුදවුවන්ගේ ශොක සන්නිදුර්ලෙහි අම්දිය එව, ඇසට රසාඤ්ජන දෙන්නාක්හුමින් අනන්තයාසේ දහසක් මුඛ මවා ඉදින් කිවහොත් ඒ මහතාණන්ගේ ශ්‍රී විලාසයෙන් සඳලැ මාත්‍රයකුත් කියන්නට අසමර්ථවූ අනොපමෙයවූ ශ්‍රී විභූතින් රජගෙට වැද රජ්ජුරුවන් දැටුවේක.

රජ්ජුරුවෝ බොධිසත්වයන් දැක, ඛුද්දක ප්‍රීතිය, ඛණික ප්‍රීතිය, උවෙග ප්‍රීතිය, අවක්‍රාන්තික ප්‍රීතිය එරණ ප්‍රීතිය යන පස්වණක් ප්‍රීතින් පිණා ගියාහු. වහා හුනස්නෙන් නැඟී ඉදිරියට අවුත් සිපගෙන ඉසසිඔ සනහා නැවතහොස් ආසනයේ ඉඳ, සිහිකටයුතුවූ මිහිරි කථාකොට උපමාවක් කියා බලමි සිතා:-

යථා පෙතං සසානසමිං, ඡඩ්ඩෙත්වා චතුරෝ ජනා,
එවං කම්පිල්ලියෙ භිංව, ඡඩ්ඩයිත්වා ඉධාගතා.

අථ භිං කෙන වණ්ණෙන, කෙන වාපන හෙතුනා,
කෙන වා අත්ථජාතෙන, අත්තානං පරිමොචයි-ති-

මේ ගාථාවන්ගෙන්:—"එම්බා පණ්ඩිතයෙනි! යම්සේ මළමිනිසකු සතර දෙනෙක් කුරුලයන ලා උසුලාගෙන ගියාහු අඹුසොහොනේ දමාපියා ඔහු කෙරේ කිසි අපෙක්ෂාවක් නැතිව නැඟී එද්ද, එපරිද්දෙන්ම, අපිත් තොප කම්පිල්ල දෙශයෙහි ලා පියා අපගේ පණ ගලවාගෙන තොප කෙරේ කිසි අපෙක්ෂාවක් නැතිව නැඟී ආම්හ; දැන් තෙපි කවර කාරණයකින් කවර උපායකින් කවර නුවණකින් කවර හෙතුවකින් තෙමේත් රැකී සෙනාවත් රැකගෙන කෙසේ ගැලවී අවු දැ"සි විවාළහ.

ඒ අසා පණ්ඩිතයන් වහන්සේ:—

අත්ථං අත්තෙන වෙදෙහ! මන්තං මන්තෙන ඛත්තිය!
පරිවාරයිස්සං රාජානං, ජම්බුදීපංව සාගරෙ-ති-

මේ ගාථාවෙන් වදාරතසේක්:-"මහරජ! බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සිතින් සිතූ යම් අර්ථයක් මාගේ තීක්ෂණවූ ප්‍රඥාවෙන් අනික් අර්ථයක් සිතා ඔහු සිතූ යම්ම අර්ථයක් ජය ගතිමි; ඒ රජ යම් මන්ත්‍රණයක් සිතූයේ නම්, ඔහුගේ මන්ත්‍රණය මාගේ මන්ත්‍රණයෙන්ම ජය ගතිමි; තවද මහරජ! දඹදිව පිරිවරා සිටි සාගරය පරිද්දෙන් දඹදිවට අධිපතිවූ එක්සියයක් රජුන් හා සෙනාව මාගේ ප්‍රඥා බලයෙන් මා පා පිට ගස්වා මම චක්‍රවර්ත්ති රජහු සේ සියලු රජුන් හා සෙනාව පිරිවැරුයෙමි වේදැ"සි වදළසේක.

මෙසේද කියා නැවත වදාරන සේක් "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සටනට සෙනාව මෙහෙයූ තැන් පටන් නුවර වාසල් හරනතුරා කී කළ දෙයත් නැවත උම්මඟට වන් තැන් පටන් උමඟින් රජ ගෙනගොස් මහවිසල් මලුවේදී කඩුව

සැඟවූ තැන් දක්වාත් එතැනදී සපථකොට රජුගේ යාවිඤ්ඤුවෙන් උමඟ අසුවූ රජුන් සහිත සෙනාව දෙර හැර මරණින් මුදා නැවත සත්දවසක් උමං කොළි යෙන් දවස් යවා ඉක්බිති රජදරුවන් හැමදෙනා තමන්වහන්සේට දුන් ධඩ්ඩරූ හා නැවත බ්‍රහ්මදත්ත රජුරුවන් දුන් නොයෙක් ප්‍රසාද හා නැවත එම රජහු දුවණියන්ට දුන් දාසාදා හා නැවත චූලනී රජුරුවන් ඇතුළුවූ සියලු රජදරුවන් තමන්වහන්සේට දුන් ප්‍රසාදත් 'මේ මේය'යි වදාරනසේක්:-

දින්නං නික්ඛ සහස්සං මෙ, ගාමසීතිව කාසිසු,
දසිසතානි චත්තාරි, දින්නං හරියා සතංව මෙ,
සබ්බසෙනඤ්ච මාදාය, සොත්ථිනමයි ඉධාගතොඃ=ති.

මෙසින් වදාරා "මාස රත්රන් පස්විසි දහසක් දුන්හ; සම්භාරණයෙන් සැරසූ ශරීර ශොභා ඇති නත සිටි බාල තෙල්ලන් සාරසියයක් දුන්හ. නොයෙක් පලදනාවෙන් සැදි ඛිසෝවරුන් සියයක් මට බිරින්දන් කොට පාවා දුන්හ අපගේ මේ වෙදෙහ රටට ආසන්න තමන්ගේ කාශිදෙශයෙන් ගමකින් අවුරුද්දකට ලක්ෂයක් බැගින් අය නිමන්නාවූ ගම් අසූවක් දුන්හ; බ්‍රහ්මදත්ත රජුරුවන් හා සියලු රජදරුවෝත් තමන්ගේ චතුරඞ්ගිනී සෙනාව කෙරෙහි නිරපෙක්ෂව ප්‍රසාද සෙනාවක්කොට මටම දුන්හ; ඒ සියලු සෙනාව පිරිවරා උකටලියක් නැතිව මහා සන්නාහයෙන් යුකතව නැඟී ආමි"යි වදාළසේක.

ඒ අසා ප්‍රීතින් පිණා ගිය රජුරුවෝ බොධිසත්ත්වයන්ගේ ගුණ කියන්නාහු:—

සුසුඛං වත සංවාසො, පණ්ඩිතෙහිති සෙනක!
පක්ඛිව අණ්ඩරෙ බද්ධෙ, මච්ඡ ජාලගතෙරිව,
අමිත්ත හත්ථගතෙ, මොවසි නො මහොසධොඃ=ති.

මේ ගාථාවෙන්:— "සෙනකය! නුවණැත්තන් හා එක්ව විසීම ඉතා යහපත් වන්නේය; ඉතින් මේ මහෞෂධ පණ්ඩිතයන් හා එක රටක එක නුවරක එක තැනක යමෙක් වෙසෙත් නම් මෙලොව සොර සතුරු බියෙක් වත් පරලොව අපාය භයෙක්වත් නැත්තේය; ඊට කාරණා තෝම දුටු යෙහිවේද? අටළොස් අක්ඛෞහිණී සඞ්ඛ්‍යාත ඒසා මහත් සතුරුසෙන වක් මැද මැදිරියක බැඳි සියොතුන් සේද, දැල බැඳි මසුන් සේද, හසුවූ තොප දෙවූ රයක ගලවාගත් බව තොපටම දැනෙන්නේ වේද? එසේ හෙයින් නුවණැත්තවුන් හා එක්ව විසීම ඉතා යහපතැ"යි ගුණ වර්ණනා කළාහ. සෙනකයාත් රජහු බස මුදුනේන් පිළිගෙන සැබවයි කියා තමා ඇතිවක් පටන් සම් සිතින් බොධිසත්ත්වයන්ගේ ගුණ කියන්නේ "මහරජ! ඒ සැබව, නුවණැති පණ්ඩිතවරු නම් මෙලොවින් පරලොවින් ඉෂ්ටයක් මුත් අනිෂ්ටයක් විය නොදෙන්නාහ; මැදිරියෙක බැඳි සියොතුන් සේද, දැල හසුවූ මසුන් පරිද්දෙන්ද, සතුරන්ට අත්පත්ව ජීවිත විනාශයට පැමිණ සිටියාවූ අප හැම දෙනා ගලවා සැපයෙහි පිහිටුවාලූ සේක; සමසත ලොකයෙහි නුවණැත්තාවූ සියලු සත්ත්වයන්ට ශත සහස්‍ර ගුණයෙන් වඩනා සේක්, අපගේ මේ මහෞෂධ පණ්ඩිතයන්වහන්සේය"යි තමාගේ මුඛ නොසැඟෙන පරිද්දෙන් වෙනසක් නැති සම සිතින්ම ගුණ වර්ණනා කෙළේය.

ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙරලවන්නාහු "සත්දවසක් සැනකෙළි කෙළෙව, යම්කෙනෙක් මට හිතයෝනම්, ඒ සියල්ලෝම පණ්ඩිතයන්ට නොයෙක් පඬුරෙන් සත්කාර සම්මාන කෙරෙත්ව"යි විධාන කළහ. (ඒ බව ප්‍රකාශකොට වදාරන බුදුරජාණන්වහන්සේ මෙසේ වදාරන සේක.)

ඔරෝධා ච කුමාරා ච, වෙසියානෝ ච බ්‍රාහ්මණා,
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං.

හත්ථාරුහා අණීකට්ඨා, රථිකා පත්තිකාරකා,
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං,

සමාගතා ජානපදා, නෙගමා ච සමාගතා,
බහුං අන්නං ච පානං ච, පණ්ඩිතස්සාභිහාරයුං,

බහුජ්ජනෝ පසන්නොසි, දිස්වා පණ්ඩිතමාගතෙ,
පණ්ඩිතම්හි අනුපපන්නෙ, වෙලුකෙකපා අවඩ්ඪථා-නි.

මේ ගාථාවන්ගෙන්:— "එම්බා මහණෙනි! ඒ වෙදෙහ රජුගේ විධානයෙන් සියලු වීනාවාද්‍ය ඉතා සිත් කලුකොට ගායනා කළහ. තවද කරසක් භේරියක් ජයතුරුසක් ආදිවූ පඤ්චප්‍රකාර සඬ්ගනාද පැවැත්වූහ. ආතතය විතතය, විතතාතත, ඝනය, ගුෂිරය, යන පඤ්චාඬ්ගික තූර්‍යනාද පැවැත්වූහ, නුවරවාසීන් හා ජනපද වාසීහු සවභාවයෙන්ම සත්මිදරුවාණන්ට සත්කාර කරන්නට සිතන්නාහු බෙර හඬ අසමින් වඩ වඩා සතොසුව තමන් තමන්ගේ දිහවානු රූපකොට මහත්වූ සත්කාර සම්මාන කළහ. උදුම්බර නම් අගමෙහෙසුන් බිසව ඇතුළුව සොළොස් දහසක් බිසෝවරුද, රාජකුමාරයෝද ව්‍යාපාරයෝද, බ්‍රාහ්මණයෝද, යන සියල්ලෝම කන බොන දෑ හා බොහෝ පඬුරු ගෙනගියහසි වදාළසේක. තවද ඇත් අස් රථාදි වාහන නැහෙන්නෝද, පාබල මහ සෙනාවද, ජනපද වාසීහුද, නියම්ගම් වැස්සෝද බොහෝ කන බොන දෑ පඬුරු ගෙන පණ්ඩිතයන්ගේ ගෙට ගියාහ"යි වදාළසේක.

"එක්සියයක් රජදරුවන් හුන් තැනට තමන්ගේ රටින් සාරසියයක් ගව් ගෙවා ගොස් තමන් මරන්නට වටලාගත් රජ දරුවන් හා ඒසා මහත් චතුරඞ්ගිනී සෙනාව තමන්ගේ ප්‍රඥා බලයෙන් තනිවජයාගෙන උත්තර පඤ්චාල දෙශයෙන් මියුලු නුවරට ආ දවස් රැස්වූ බොහෝ ජනයෝ සුවසේ ආවාවූ පණ්ඩිතයන් දැක බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ඇතුළුවූ එක්සියයක් රජුන් ජය ගෙන ආසේකැ"යි ඉතා ප්‍රසන්නව ඔදවැඩිව සතුටුවූවාහු, ඒ පණ්ඩිතයන්ගේ කීර්තිය පැතිරෙන්නාක් පරිද්දෙන් සත්දවසක් මුළුල්ලෙහි පිළිතිස සිසාරා නෙය්‍යාඩන් කෙළියහ"යි වදාළසේක.

මෙසේ බොධිසත්වයන්වහන්සේ සත්දවසකින් සැණකෙළි අත්හාවූ කල්හි රජ්ජුරුවෝ ඉක්බිති "මහරජ! ඵලනි රජ්ජුරුවන්ගේ මැනියන්ද, පුතණුවන්ද, බිසවුන්ද, වහා යැව්වමැනවැ"යි වදාළසේක. "යහපත පුත! මට කියන්නේ කිමද? යවාපියව"යි කිහ. බොධිසත්වයන්වහන්සේ හුන්දෙනාට වෙන වෙනම බොහෝ සත්කාර සම්මානකොට එක්සියයක් රජදරුවන් හා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් තමන්ට ප්‍රසාදසේ දුන් චතුරඞ්ගිනී මහා සෙනාවට

බොහෝ ප්‍රසාද දීමෙන් සත්කාර සම්මාන කරවා ඒ මහා සෙනාවත් බ්‍රහ්ම දත්ත රජ්ජුරුවන් තමන්ට පාවා දුන් නිසෝවරුන් සියයක් හා කම්මිත්තන් සාරසියයක්ද නඤුදෙව්න්ට පාවාදී, ප්‍රසාද සෙනාවත් උන් ඇරලාලා එන පරිද්දෙන් උන්වම පාවාදී මහ පෙරහරින් යවූසේක.

ඒ රජදරුවෝ තුන්දෙන අපමණවූ රජපෙරහරින් යන්නාහු සියක් යොදුන් මග ගෙවා උත්තරපඤ්චාල නුවරට පැමිණියහ. බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ මැනියන් විචාරන්නාහු "කිමෙක්ද මැනියන්වහන්ස! වෙදෙහ රජ්ජුරුවෝ 'සතුරාගේ මැනියෝය'යි මානෙ-ර් කළ වෛරයෙන් නුඹවහන්සේ හෙරෙහි නොසතුටුව විසූද? නොහොත් සංග්‍රහකොළෝදැ"යි කිහ.

දෙව් කියන්නාහු පුතණුඩ! 'කුමක් කියන්නේද? මා මව් තනතුරටත් වඩා දෙවනා තනතුරෙහි තබා දුටිහ, නඤුදෙව්න් මව් තනතුරෙහි තබා දුටහ, පඤ්චාලචණ්ඩ කුමාරයන් එක කුසින් උපන් මල් තනතුරේ තබා දුටහ, බොහෝ සත්කාර සම්මානයෙන් බොහෝ ආචාර සමාචාරයෙන් සඞ්ග්‍රහකළහ"යි මැහැලින්වහන්සේ තමන් මුඛ නොසැහෙන පරිද්දෙන් ගුණ කිහ, රජ්ජුරු වෝ එවස් අසා වඩ වඩා සතුටුසයට පැමිණ බැණණු වන්ට බොහෝ පාක්කුඩම් හා පඩුරු යැවූහ.

වෙදෙහ රජ්ජුරුවන් කළ සඞ්ග්‍රහ මැනියන් අතින් විචාරන්නටත් නඤුදෙව්න් අතින් නොවිචාරන්නටත් කාරණා කිම්ද යත්? නඤුදෙව් තරම් රූ ඇති නෙතෙක් මුළු දඹදිව අතික් තැනක ඇත්තේ නැත, මා සමී පයෙන් ගොස් සාරසියයක් ගව්වේ උන් තැනැත්තී මා කළදෙයක් කෙළේය"යි සිතා මා කෙරෙහි ආදරයක් භයක් නැතිව අනාචාර ශීලිව තමා සිත්වූ පරිද්දෙන් වැසපු නම් විවාළ කල නැත්තක් මුත් ඇත්තක් නොකියන්නිය, නැන්දේ නම් යෙහෙළියන්ට කුකුළන් හා බළලුන්සේ කෙනෙක, ඇත්තක් තබා නැත්තක් කියා බිඳුවන්නට කියනහ, එසේ හෙයින් බිසවුන් අතින් නොවිචාරා මැනියන් අතින් විචාළහයි දතයුතු. එතැන් පටන් දෙපක්ෂයේ ඇත්තෝම ඔවුනොවුන් හා සමඟ එක්සිත්ව විසූහ.

මහා උම්මග්ග කාණ්ඩය නිමි.

දිය රකුසු පැනය.

පඤ්චාලචණ්ඩ බිසව් වෙදෙහ රජ්ජුරුවන්ට ප්‍රියව සිත්ගෙන වසන්නාහු දෙවන හවුරුදු පුතණු තෙනකුන් වැදූහ. ඒ කුමාරයන් වැඩී දසහැවිරිදි කල වෙදෙහ රජ්ජුරුවෝ සඟගීසඨවූහ. බොධිසත්ත්වයන්වහන්සේ දස හැවිරිදි කුමාරයන් ධවලච්ඡත්‍ර නංවා රාජ්‍යයෙහි පිහිටුවා දෙවයන්වහන්ස! නුඹවහන්සේගේ මුතුන් රජ්ජුරුවන් සමීපයට යෙමි"යි වඳුළසේක. කුමාරයෝ "මා බාල තැනැත්තවූ ඇරපියා නොසව. මම තොප පියතනතුරේ තබා රකිමි, සියල්ලෙන්ම ආදර කෙරෙමි"යි කිහ. ඒ අසා පඤ්චාලචණ්ඩ බිසව් කියන්නාහු "මාගේ මව්පියන් ඇතත් මට පිය තනතුරේ සිට මේ සාරසිය යක් ගව්වට මා සරණ දුන් දැත් නුඹදැමය, ජනමාන්තර වෛරී රජදරුවන්

කිරඹ සේ එක් කරවා අවෙරි කළ දැන් නුඹදැමය, එසේ හෙයිනුත් මිටත් මදු තණුවන්ටත් අභිවෘඩිදැ නුඹදැමය, නුඹ මේ නුවරින් ගිය කල අපට කිසි පිටි වහලෙක් නැත, නොගිය මැනව, දරුවන්ගේ පිය රජ්ජුරුවන් සිටියාසේ සියලු සම්පත් වළඳා රාජ්‍යය කළ මැනවැ"යි කිහ.

එබසට වදුරනසේක් "ඒ එසේමය, එදවස් මා එන ගමනේ වෙදෙහ රජ්ජුරුවන් මළ කල එන්නෙමියි නුඹවහන්සේගේ පිය රජ්ජුරුවන්ට ප්‍රතිඥා දී එනලද, එසේ හෙයින් නොගොස් රඳන්නට නොපිළිවනැ"යි කියා මියුලු නුවර බොහෝ ජනයන් කරුණාවෙන් බැගෑව හඬමින් සිටියදී අමරාදෙවීන්දු හා සහජාත යොධයන් හා අවශෙෂවූ දැසි දස් ආදීන්ගෙන් කැවිව එතු කැමැත්තන් ඇරගෙන නික්මුණු සේක්, සියක් යොදුන් මහ ගෙවා ගොස් උත්තර පඤ්චාල නුවරට පැමිණිසේක. මහෞෂධ පණ්ඩිතයන්වහන්සේ එන සේකැ"යි චූලනී රජ්ජුරුවෝ අසා චතුරඞ්ගිනී සෙනාව පිරිවරා පෙර ගමන් කොට ඉදිරියට අවුත් මහ පෙරහරින් ගෙනගොස් ඉඳිනට මාහැඟි මාලිගා එක් දුන්හ. පළමු දුන් සළුගම් අසූව විනා අඹුතුව දුන් කිසිවකුත් නැත්තේය. එසේ වුවත් එහි කිසි කනස්සල්ලක් නොව කළමනා රාජ්‍යවේවය පමා නොව කරනසේක.

එසමයෙහි ඉතා නුවණැත්තාවූ කිමෙහි බිණීමෙහි දැඟවූ කාරණා කාරණා දන්නා ඉතා ධර්මිෂ්ඨවූ හෙරි නම් පරිබ්‍රාජිකා කෙනකුන්දු එක්වන් රජගෙයිදී වළඳා මහුල් උයන ඉඳිනාසේක. 'මහෞෂධ පණ්ඩිතයෝය'යි යන කෙනෙක් රජ්ජුරුවන්ට සේවය කෙරෙත්ල, 'උන් හා සමාන කෙනෙක් නැත්ල'යි පරිබ්‍රාජිකාවන්දු නමින් අසා දන්නා සේක. "මෙබඳු ගුණ ඇති කෙන කුන්දු රජගෙයි වළඳනසේකැ"යි බොධිසත්ත්වයන් වහන්සේද අසා දන්නා සේක; එක දවසකුත් ඔවුනොවුන් දුටු විරූන් නැත්මය, නතුදෙවින් එද වස් උමඟින් සොරුගෙන ගොස් මසක්වන ගණන් රජ්ජුරුවන් කෙරෙන් මා වියෝකොට පිහ"යි තමන්ගේ එපමණ ප්‍රිය විප්‍රයොගයට බොධිසත්ත්වයන් කෙරෙහි නොපහන් තැනැත්තෝ වෛරයෙන් තුමූත් කිසිවකුත් කොඳහන්නට අසමර්ථව තමන් කෙරේ වලඳහ සත්‍රින් පස්දෙනකුන්ට කියන්නාහු "නෙපි හැම මහෞෂධ පණ්ඩිතයාගේ අපරාධයක් පරීක්ෂාකොට රජ්ජුරුවන්ට කියා බිඳුවාපියව"යි කිහ. ඔවිහු පස්දෙන මහතාණන්ගේ වරදක් සොයන්නාහු ඔබ් යන එන තැන අනුන්ට කිසිවකුත් නොහඟවා පරීක්ෂාකොට ඇවිදිනාහ. එක්දවසක් පරිබ්‍රාජිකාවන්දු රජගෙයිදී වළඳා තමන්වහන්සේගේ ආශ්‍රමයට වඩනා සේක් බොධිසත්ත්වයන්දු රාජසේවයට වඩනා වූන් (රාජාඞ්ගණයෙහි) මිදුලෙහි දුටුසේක. මහතාණෝ පරිබ්‍රාජිකාවන්දු වැඳලා සිටිසේක. පරිබ්‍රාජිකාවන්දු සිතනසේක් "මේ පණ්ඩිතයෝ නුවණැත්තෝල, එබැවින් ඔුන් නුවණ පරීක්ෂා කෙරෙමි"යි සිතා 'බසින් කිවා නුවුරා නොදනිද්ද, හස්ත මුද්‍රා නම බැරි දෙයෙක, එබැවින් හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විවාරමි'යි සිතා බොධිසත්ත්වයන්දු මුණ බලා අතක් විදහා පෑසේක. ඒ කුමක්නිසාද යත්? "කිමෙක්ද පණ්ඩිතයෙනි! රජ්ජුරුවෝ තොප රටින් මෙරටට ගෙන්වාගෙන අභ විදු සම්පත් දී සියා සුවසේ රකින්දැයි නොරකින්දැ"යි සිතින් සිතා බසින් නොකියා අත්ල ඉදහා පෑ නියාය. බොධිසත්ත්වයන්දු සිතන සේක් "මා අතින් හස්තවුද්‍රාවෙන් ප්‍රශ්න විසඳන සේක් වනැ"යි තමන්වහන්සේගේ ප්‍රඥා නමැති

දිවැසින් දුන ඒ ප්‍රශ්න විසඳන සේක්. තමන් වහන්සේගේ මිට අකුළුවා පෑ සේක. කුමක් කි නියාද යත්? 'මා සමීපයට එව'යි ප්‍රතිඥ ගෙන මාගේ රටින් මා ගෙන්වා ගෙන මිටින් තරව ගත් දෙයක් අනුන්ට නොදෙන්නාසේ, අමුතු කිසිවකුත් මට නොදෙන්නාහ"යි සිතා අතින් ප්‍රශ්නය විසඳූ නියාය. පරිබ්‍රාජකාවන්දූ ඔබ දුනගත් නියාව දුන අත ඔසවා තමන්දුගේ ඉස පිරිමැඩලූ සේක. කුමක් කි නියාද යත්? ඉදින් උකටලි වුනම් අපසේ මහණව නොසුදුසු හැඟවූ නියාය. එයින් දුනලා තමන්වහන්සේගේ බඹ පිරිමැඩලූසේක. ඉන් හැඟවූසේ "මා විසින් රකිනා බඹවල් බොහෝය, එබැවින් පැවිදි වන්නට නොපිළිවනැ"යි කි නියාය. මෙසේ ඒ පරිබ්‍රාජිකාවන්දූ හසකවූදුවෙන් ප්‍රශ්න විචාරා තමන්වහන්සේගේ ආවාසයටම වැඩිසේක. බොධිසත්වයන් දුන් පරිබ්‍රාජිකාවන් වැඳ රාජ සේවයට ගියසේක.

(IV/12)

නඳුදෙව්න්ගේ වල්ලභ සඤ්ඤ රජගෙයි සිමැදුරු කවුළුවෙන් පිටත බැලුවාහු මේ ක්‍රියාව දුක, රජපුරුවන් සමීපයට ගොස් දෙවඟන්වහන්ස! මහෞෂධ පණ්ඩිතයෝ පරිබ්‍රාජිකාවන් හා එක්ව නුඹවහන්සේ සතු රාජ්‍යය ප්‍රාර්ථනා කරන්නාහ, නොබෝ කලකින් නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාහ"යි බිඳුවාපිහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු "කිමෙක්ද තොප දුටු දෙයෙක්ද? ප්‍රත්‍යක්ෂකොට ඇසූ දෙයෙක්දූ"යි කිහ. "අසා වදුළ මැනව, පරිබ්‍රාජිකාවන්දූ ඊයේ රජගෙයිදී වළඳා යන්නවුන් දූ රජගෙයි මිදුලේදී මහෞෂධ පණ්ඩිතයන් දුක බොහෝ දෙනා හෙයින් බසින් මනාකණගට හඬ ඇතිව අතින් ඉඟිපානාහු 'පණ්ඩිතයෙනි! තෙපි නුවණැති තැනැත්තවුන් වුව, දඹදිව සියලු රාජ්‍යය අතුල් තලයක් මෙන්ද, නොඑොත් කල මඩලක් මෙන්ද; තනාගෙන රාජ්‍යය තොප අත්පත් කරන්නට නොපෝසත්දූ'යි තමන්ගේ අත්ල විදහා උපමා කොට පෑදූය. පණ්ඩිතයෝත් ඒ දුනගෙන 'කඩුව මිරිකා ගනිම් නම් කිහිප දවසකින් රජහු මරා රාජ්‍යය අත්පත්කොට ගනිම්, කඩුව ගන්නා ලෙස මිට අකුළුවා පැහ. පරිබ්‍රාජිකාවෝ 'එසේ වීනම් රජහු ඉස කපා හැරපියව"හි තමන් ඉස පිරිමැඩ ලූහ. එවිට පණ්ඩිතයෝ 'ඉසට ගැසූ පහර මාගේ හසින් අකවැරදී මුදුනෙන් හිස පලා ගිය නම් නපුර, බඳ මැදින් පොලුකෙරෙම්,යි සිතා තබා බඹ පිරිමැඩලීය. මහරජ! ඇසූ දෙයක් කුමටද නියමෝද? අපි සියැසින්ම දුටුම්හ"යි කියා නැවතත් කියන්නාහු "අප්‍රමාදවත් මහෞෂධ පණ්ඩිතයා මරුපුව මැනව"යි කිහ.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා මෙසේ සිතුහ. පණ්ඩිතයන් විසින් මා කෙරේ වරදනට නොපිළිවන, පණ්ඩිතයන් කීවයි කියන කාර්‍යය පරිබ්‍රාජිකාවන්දූ අතින් විමාරු දුනපියම් සිතා දෙවන දවස් පරිබ්‍රාජිකාවන්දූ වළඳා අනතැනෙහි උන්දූ විචාරන්නාහු "කිමෙක්ද පණ්ඩිතයෝ දුටුදූ"යි කිහ. "මහරජ! ඊයේ රජගෙයි වළඳා යන්නමෝ අතරමහදී දුටුම්හ"යි කීසේක. 'උන්හා කළ කථාවෙක් ඇද්දූ'යි කිහ. "මහරජ! උන් හා බසින් කි දෙයක් නැත; 'උහු නුවණැත්තාහ'යි ගනු අසා 'ඉදින් නුවණැත්තාහු වීනම් දුනගන්නාහ'යි සිතා පරීක්ෂා කරන පිණිස හසකවූදුවෙන් ප්‍රශ්නයක් විමාළම්හ; අප විමාළ ප්‍රශ්නය දුන අප සිත්වූ පරිද්දෙන් විසඳූහ"යි ඒ වූ තීන්දුවෙන් වදුළුදේකු 'ස්වාමිනි! පණ්ඩිතයෝ නුවණැත්තෝදූ'යි කිහ. "මහරජ! නුවණැත්තෝය

උන් හා සමාන කෙනෙක් එක තැනකත් නැත්තාහ"යි වර්ණනා කළසේක. රජ්ජුරුවෝ පරිබ්‍රාජිකාවන්ගේ බස් අසා වැද පන්සලට යැවූහ.

උන්වහන්සේ ගිය ඉක්බිති බොධිසත්ත්වයන්දු ආසේක. පරිබ්‍රාජිකාවන් විවාළ නයින්ම 'කළ කථා කිම්දැ'යි කිහ. ඔබ "මා හා බසින් කි දෙයක් නැහැ; හස්තමුද්‍රාවෙන් ප්‍රශ්නයක් විවාළසේක; ඔබ විවාළ ප්‍රශ්නය මෙතන් නොවරදවා හස්තමුද්‍රාවෙන්ම විසඳිමි"යි පරිබ්‍රාජිකාවන්දු කී. පරිද්දෙන් නොවරද වාම වදුළසේක.

එදවස් රජ්ජුරුවෝ මහතාණන් කෙරෙහි පැහැද දසදහසක් යොදුන් දඹදිව මුළුල්ලට නායක කොට සෙනෙවිරත් ධුරය දී පවඬැන්දූහ. "යියලු රජ්‍යය මුළුල්ල පණ්ඩිතයන් කිවක් නෙළේමය; මෙවක් පවත් උන් කිවාක් මා කරන්නේය"යි යනාදීන් සියලු දඹදිව විධානම උන්වහන්සේට පවා දුන් හ. හිමාලයෙන් හුණු පඤ්චමහා ගංගාවන් මහමුහුදට වදනා කලක් පරිද්දෙන් බොධිසත්ත්වයන්වහන්සේගේ ගෙට සියලු සම්පත් හා ඓශ්වර්‍යය මහමුහුදට වඩා දියසේ ප්‍රමාණාතික්‍රාන්තව ඉතා බොහෝ විය.

රජහු තමන්වහන්සේට යසස් දුන් ඉක්බිති නුවණැති මහතාණන්වහන්සේ මෙසේ සිතුසේක. කෙසේදයත්? "රජ්ජුරුවෝ එකවිටම මේසා මහත් තන තුරක් දී තමන් හැර මා මුත් සියලු සම්පත්තීන් ආස්‍ය කෙනකුන් නැති තියා වට මේසා මහත් ඓශ්වර්‍යයෙහි පිහිටුවාලූහ; රජදරුවෝ යමක්හු කෙරෙහි වෛරවූ නම් පස්වරු නසත් නම් පෙරවරු බොහෝ සම්පත් දෙන්නාහ; දැන් මටත් මෙතෙක් දවස් කිසිවකුත් නොදී මහොඝයක් සේ මේසා මහත් සම්පත් එකපැහැර දීපිහ; රජ්ජුරුවන් මා කෙරෙහි ඉත සිතින් දුන් බවත් අහිත සිතින් දුන් බවත් නොදනිමි; කල් නොයවා එයින් දූනපිම් නම් යහපතැ"යි සිතා රජ්ජුරුවන්ගේ අදහස් තත්වූ පරිද්දෙන් දූන පියන්නට අන් කෙන කුන්ට නොපිළිවන; හෙයි පරිබ්‍රාජිකාවන් වහන්සේ මහා නුවණැති සේක, උන්වහන්සේ එක්උපායකින් ඒ දූනපියන්නට තරම් සේකැ"යි බොහෝසුවද මල් හා ගිලාන ප්‍රත්‍යයෙන් කිසිවකුත් ගෙන්වාගෙන පන්සලට ගොස් සුවදින් මලින් පූජාකොට "ස්වාමිනි! නුඹවහන්සේ මාගේ ගුණ කිවක් පවසා රජ්ජුරුවෝ තමන් හැර සම්පත්තීන් මා මුත්අනික් කෙනකුන් නැති තියාවට මිහව තුරක් පරිද්දෙන් මාගේ මාලිගාව කොයෙක් අයුරෙන් සමඟකොටපිහ; ඒ මා කෙරෙහි සමසිතින් දුන් බවත් මා නසාපියන සිතින් දුන්බවත් නොදනිමි; රජහු මා කෙරෙහි ඇති සමාධි ගුණය තත්වූ පරිද්දෙන් දූනපිය මැනව"යි වදුළසේක.

පරිබ්‍රාජිකාවන්දූන් 'යහපතැ'යි ගිවිස දෙවන දවස් රජගෙට යන ගම් නේදීම 'දිසරකුස්‍ස පඤ්හ'යි එක් ප්‍රශ්නයක් සිතා නැවත මෙසේ සිතන්සේක් "පණ්ඩිතයන් හා එක්ව කථාකළ චරපුරුෂයකු සේ නොව, උපායකින් ප්‍රශ්න විවාරා රජ්ජුරුවන්ගේ හිත අහිත දෙක දූනපියම්හ"යි වළඳ අනතයෙහි රජ්ජුරුවන් ඇවිත් වැඳ උන්කල්හි පරිබ්‍රාජිකාවුන්දූට මේසේවූ අදහසක් වූසේක, කෙසේද යත්? "ඉදින් මේ ප්‍රශ්නය බොහෝදෙනා මැදගෙනි විවාළම් නම් රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි වෛරී වූනම් බොහෝදෙන මධ්‍ය යෙහිම වෙයි බව කිවුනම් යුක්ත නොවේ"යි සිතා "මහරජ! තනිව රහස්

කථාවක් කියනු කැමැත්තම්හ"යි වදාළ සේක. රජ්ජුරුවෝ සම්පයෙහි මිනිසුන් පිටත්කරවූහ. එවිට පරිබ්‍රාජිකාවන්දෑ කියන්නේ 'මහරජ! තොප අතින් ප්‍රශ්නයක් විචාරමි'යි වදාළසේක. 'විචාළමැනව සාමිනි! දනිම් නම් කියමි'යි කිහ. එවිට හෙරී නම් පරිබ්‍රාජිකාවෝ කියන්නානු දියරකුසු පැනයෙහි පළමු වන ගාථාව වදාරනසේක්:—

සවෙවෝ වුය්හමානානං, සත්තන්නං උදකණ්ණවෙ,
මනුස්සබලි මෙසානෝ, නාවං ගණ්හෙය්‍ය රක්ඛසෝ,
අනුපුබ්බං සංහි දත්වා, මුඤ්චෙය්‍ය දකරක්ඛනෙ–ති=.

මේ ගාථාවෙන් කිහ. "එසේ වීනම් මහරජ! තොපගේ වැදූ මැනියන් **නළුනාදෙවිය**, තොපගේ නායක බිසව් **නන්දාදෙවිය**, තොපගේ එක කුස හොත් මලණුවෝ **චිත්තසම්භවකුමාරයෝය**, තොපගේ යහළුවූ **ඛණ්ඩහාල කුමාරයෝය**, අග්‍රපුරෝහිත **සෙවට්ට** බ්‍රාහ්මණයෝය, **මහෞෂධ පණ්ඩිත** යෝය, තෙපිය, යන මේ සත්දෙනා මහා සමුද්‍රයෙහි එක නැවකින් යන්න වුන් මිනිසුන් නා ඇවිදිනා උදක රාක්ෂසයෙක් මිනිස් බිල්ලක් සොයා ඇවිදින්නේ, තොප සත්දෙනා නැඟි යන්නාවූ නැව දැක මුහුදු දිය දෙබේකොට අවුත් නැව අල්වාගෙන තොපට කියන කල 'මහරජ; මේ තොප හා කැටිව නැවෙන් යන සදෙනා පිළිවෙළින් දුනහොත් මුත් නැව නාරිමි'යි කි නම් ඒ සදෙනාගෙන් කවුරුන් පළමුව දෙව්ද? දෙවැනිව තුන්වැනිව සතරවැනිව පස්වැනිව දී කවුරුන් අන්තකොට බිලිදී ඒ ජල රාක්ෂසයා අතින් ගැලවෙව් ද"යි විචාළහ.

ඒ අසා රජ්ජුරුවෝ තමන් සිත වඤ්චා නැතිව අදහස්වූ පරිදිදෙන් කියන්නාහු:—

මාතරං පඨමං දජ්ජං, භරියං දුතිය්‍ය භාතරං,
තතෝ සහායං තතිය්‍ය, පඤ්චමං දජ්ජ බ්‍රාහ්මණං,
ඡට්ඨාහං දජ්ජ මත්තානං, නෙව දජ්ජං මහොසධං.–ති–

මේනාථාවෙන්කිහ:- මේ ගාථායෙහි අභිප්‍රාය නම් "සාමිනි; සැබවින් ජල රාක්ෂසයා නැව අල්වාගෙන'සදෙනාමට පිළිවෙළින් බිලිදී නෙපි ගැලවෙව්'යි කි නම් ඔහට බිල්ලට පළමුකොට මාගේ මැනියන් දෙමි, දෙවැනිව නන්දාදෙවීන් දෙමි; තුන්වැනිව ඛාගේ මලනුවන් දෙමි, සතරවැනිව මාගේ යහළුවා දෙමි, පස්වැනිව සෙවට්ටයා දෙමි, පස්දෙනා දී මහෞෂධ පණ්ඩිතයන් හා මාහැ දෙන්නාම මතු ඉිටි කාල්හි, තවත් බිලි ඉල්වානම් පිළි තරවහැඳගෙන කැඟ: පට නවාගෙන දසදහසක් යොදුන් දඹදිවට මා කරන්නාවූ රාජ්‍යශ්‍රී නොසිතා 'එම්බල! මා කාපියව'යි කියා මහෞෂධපණ්ඩිතයන් මා පටිපක්ෂට දමාපියා, ඒ රාක්ෂසයා කට දල්වාලූ කාල්හි පණ්ඩිතයන් මාරුවෙහි ඔහු කටට පැන මම ඔහට බිලිවෙමි නවුත් මා පණ ඇතිව හිඳ මා ඇසින් බල බලා මාගේ පණ්ඩිත යන් රාක්ෂසයාට නොදෙම්මය"යි කිහ.

මේ ප්‍රශ්නය මෙතෙකින්ම නිමියේය. එහකුදු වුවත් "රජ්ජුරුවන් පණ්ඩිතයන් කෙරේ ඇති ඉත සිහත් මා විවාළ ප්‍රශ්නයත් මා ඇසූ පමණින්ම දුසිඛවන්නේ නොවේ, එබැවින් මුහුදු දිය පිට ඉසලූ තෙලිත්තක් මුළුල්ලෙහි

විනිදයන පරිද්දෙන් කෙළෙම් නම් ගහපතැ"යි සිතා "මහරජහු! සවතින් මාලිගාවෙන් බැස ජනසමාගමය කරවා එතැනත් රජහු අතින් විවාරම්, රජුරුවෝ මට පළමු කී ලෙසම 'පස්දෙනා පිළිවෙළින් දී පණ්ඩිතයන් රකියි, එතැන මම් මැනියන් ආදී පස්දෙනාගේ ගුණ බොහෝදෙනා මැද්දේ කියම්, පණ්ඩිතයන්ගේ නුගුණ කියම්, රජුරුවෝ උන් හැමදෙනා ගුණ බොහෝ කොට කියා පණ්ඩිතයන්ගේ ගුණ කියති. එසේ කල්හි බොධිසත්වයන්ගේ ගුණ ආකාශයෙහි පූර්ණචන්ද්‍රයා පරිද්දෙන් ප්‍රසිද්ධ වන්නේය"යි සිතා, "මහරජ! තොපගේ අන්තඃපුරවාසීන්ද, රාජකුමාරවරුන්ද, මේසා මහත් නුවර ප්‍රසිද්ධ ජනයන් එකහෙළා රැස්කරවා රාජාඩම්බරයෙහි මාගෙහි ආසනයක් පනවා විසිතුරු රකව"යි අනඤ්ඤ ආසන පනවා එහි උන් පරිබ්‍රාජිකාවන්ද රජහු අතින් පළමු තැවි විවාළ පරිද්දෙන් ප්‍රශ්න ආදියෙහි පවින් විවාරා රජුරුවනුත් තමන් පළමු කී පරිද්දෙන්ම ඒ රාක්ෂසයාට "පළමු මැනියන් හා සවැනිව තමන් පිළිවෙළින් කිලිදි මහෞෂධ පණ්ඩිතයන් රකිම්මය, මා පණ තබා ඇසිල්ලකුත් මාගේ පණ්ඩිතයන් කෙරෙන් වියෝව විසිය නොහෙම්"යි කී කල්හි පරිබ්‍රාජිකාවන්ද කියන සේක්:—

"මහරජ! සිත එසක් තබා බසින් එකක් නොකියව, අප වැන්නන්ටත් මායම් කියද්ද? තොප කියන්නේ කවුරුන් අදහාගන්නා බසෙක්ද? "දිස රකුසා නැව අල්වාගත්කල වැදූ මැනියනුත් පවන් තොප සදෙනා පිළිවෙළින් කිලිදී පණ්ඩිතයන් රකිම්"යි කිව. බැලූ කල මහෞෂධ පණ්ඩිතයන් තරම් තොපට සතුරෙක් නැත, වැදූ මවුන් තම් සඬයන්ට උන් විතා උපකාරී කෙනකුත් නැත, ඉනුත් තොපගේ මැනියෝ සෙස්සවුන්සේ මවුන්ගේ අලප වූ ගුණ ඇති කෙනෙක් නොවෙත්, තොපට බොහෝ උපකාරිවූව, එසේවූ ගුණ ඇති මැනියන් කුමක් පිණිස දෙව්ද"යි රජහට ප්‍රත්‍යක්ෂකොට දැතෙන පරිද්දෙන්:-

පොසෙතාතෙ ජනෙත්ති ව, දීඝරත්තානුකම්පිකා,
ජබ්බා සි පදුඨසම්මං, පණ්ඩිතා අත්ථදස්සිනි,
අසඤ්ඤං උපනිසං ඤත්වා, වධාතං පරිමෝචයි.

තං තාදිසිං පාණදයිං, ඔරසා සබ්බධාරිණිං,
මාතරං කෙන දෙසෙන, දජ්ජාසි දනරක්ඛතෝ. —ති

මෙසේ වදළසේක= මේ ගාථාවන්හි අර්ථ කෙසේද යත්? මේ චූලනී රජුරුවන්ගේ පියාණන් සමයෙහි චූලනී කුමාරයන් බාල කල ඒ රජහු පිරිවරා සිටි ජබ්බ නම් පුරොහිත බමුණා හා මේ බලතා දෙවිත් ලොකඝාත රතියෙන් සතුටුව සමඟව වසන්නාහු විෂ මිශ්‍ර හොජනයකින් රජහු මරා බමුණාට ධවලඡත්‍ර නංවා ඕනට අගමෙහෙසුන්ව බමුණා රාජ්‍යය කරන සමයෙහි එක් දවසක් චූලනී කුමාරයන් 'මැනියන්වහන්ස! බඩසාය'යි කී කල්හි ඕහට සකුරු මී ආදි පැණියක් හා කැවුම් දෙවූහ. එහි මැස්සෝ පිරිවරා ගත්හ. කුමාරයෝ රන් තැටියෙන් මී බිඳු බිම හෙළා තැටියේ උන් මැස්සන් ගසා නෙරපූහ. ඉඳ මැසි සමූහයා ගොසින් බිම මී බිඳුවල වසා ගත්හ. එවේලෙහි කුමාරයෝ මැස්සන් නෙරපූ කැවුම් හා අත කට සුඩකොට කෙළියට ගිය.

බමුණු මේ ක්‍රියාව දුන සිටන්නේ "මේ ඉස නොනැගීම තමා සතු කැවුමේ මිස්සන් පලවා කැවුම් කෑය. ඉදින් නොනැසී වැඩිණි නම් මට රාජ්‍යය නොදෙන්නේය, මොවුන්ගේ දුන්නම මරවාපියමි"යි සිතා එපවත් හල නොදෙවින්ට කිහ. බිසව් සියන්නාහු "දෙවයන්වහන්ස! මම හුඹ කෙරෙහි කළ සෙනහසෙන් මාගේ එවැනි රජපුරුවන් පමා විතලවා මරුපිමි; එබැවින් මට මන්ගෙන් ප්‍රයොජන කිමිද? සැලනොනොට සොරා මරුපියම්හ"යි කියා බමුණා අස්වසාලා ඉනා නුවණැති බිසව් උපායක් සලමිනයෙහි සිතා අරක් කෑයියා සාදවා "දරුවේ! මිපුතණුවෝ චූලනී කුමාරයෝත් නොපමේ පුතා ධනුග්ගහ කුමාරයාත් එකඳ උපන්හ; සමානවූ කුමාර පෙරහරින් වැඩියාහ. එබැවින් ඔවුනොවුන් ප්‍රාණය සමාන යහළුවහ; දැන් ශබ්ද නම් බ්‍රාහ්මණයා මිපුතණුවන් මරනු කැමැත්තේය; නොපි මා දරුවන් දිවි රැකදෙව"යි කිහ. යහපතා දෙවින්වහන්ස! කුමක් කෙරෙමිද'යි කී කල්හි 'එසේවීනම් මාගේ පුතණුවෝ එක්වන් නොපමේ ගෙයිම වෙසෙන්වා, කවුරුනුත් සෑක නොක රන පරිද්දෙන් හා කැමදෙනාම දන්නා පරිද්දෙන් කිප දවසක් තුන්දෙනම තනිව මිහ එහාන් ගෙයි වැදහෙව, චූලනී කුමාරයන් හා අරක්කැමියා හා පුතුඇතුව තුන්දෙනා මුළුහාන්ගෙයිම දවස් යවන්නේ සෑහ නැතිවූ කල නොප වැදහොත් තැන එළුවන්ගේ ඇට ඇද ලාපියා, මිනිසුන් රෑ නිදිගත් කල මුළුතැන්ගේ ගිනිලාපියා කිසිතෙනකුන්වත් නොහඟවා මාගේ පුතාත් නොපමේ පුතාත් හැරගෙන මේ නුවර ගළ පැලැල්ලෙන් පළමු නික්ම පසල් දනව්යෙහි අතික් නුවරකට පලා නොස් මිපුතණුවන් රාජ කුමාර බව නොහඟවා දිවි රැකදෙව"යි කිහ.

ඒ 'යහපතැ'යි ගිවිස්සේය. දෙවිතුමු මුතු මැණික් ආදිවූ රුවනින් යම් තාක් දෙයකුත් දුන්හ. ඒ අරක්කැමියා ආදි තුන්දෙනම මුළුතැන්ගේ ගිනිලා යන්නාහු ක්‍රමයෙන් ගොස් **මදුරට සාගලපුර** නුවරට වැද රජපුරුවන් වැද තමන්ගේ ජාති ඇහවූහ.

මිදු රජපුරුවෝ තමන්ගේ පරණ අරක්කැමියා ඇර ඔහුගේ මුළු තැන් ගේ රක්නා ධුරය ඕනට පාවා දුන්හ. කුමාරවරු දෙදෙන ඔහු සමහම එක්වන් රජගෙට යන්නාහු ය. රජ්ජුරුවෝ 'කුමාරවරු කාගේ දරුවෝදැ'යි විචාළහ. "මාගේ දරුවෝය"යි කී කල්හි 'මේ එක්වැනියා මේ එක්වැනි නොවේ'යි කී කල්හි 'මාගේ බිරින්දන් දෙන්නාගේ දරුවෝ දෙන්නාය; එබැවින් මේ මා වැනිය, මේ මැනියන් වැනිය'යි කිය. එසේ කල් යත් යත් ඔවිහු යහළුව ගොස් මදුරුජ්ජුරුවන්ගේ දුවණියන් හා එක්ව රජගෙයිම කෙළනාහ. නැවත චූලනී කුමාරයන් හා කුමාරිකාවන් හා දෙදෙන එක්වන් දුක්මෙන් ඔවුනොවුන් කෙරෙහි පිළිබඳවූ අදහස් ඇතිවූහ. කෙළිමඩලේදී චූලනී කුමාරයෝ තමන් කෙළනා පලස් හුවටත් ලනුවත් කුමාරිකාවන් ලවා තෙලේ ගෙනෙව්යි යනාදීන් තමන් සිටි තැනට ගෙන්වන්නාහුය. සමහර විටෙක නොගෙනාව තරව ඔලුවේ ඇත ලන්නාහ. කුමාරයා තමාගේ රාජමානයෙන් තරව ගැසූ පහර සමහරවිට සෙනහයෙන් ඉවසාපියනි. සමහරවිට ඉතාම රිදී යන්නා ඉවසිය නොහී අත්ගහා හඬන්නාහ. ඒ අසා රජපුරුවන් 'මාගේ දරුවන්ට ගැසුවෝ කවුරුදැ'යි කිංකාල කිරි මවු ගොස් විචාළ කල 'ඉදින් මුම මේ මට ගැසුයේ යයි කිම් නම් මියාණෝ ඕනට රාජාඥ කරවන්නාහ'යි සිතා ඔහු කෙරේ සෙනහයෙන් ඒ බව වලහා 'කුමක් කියව්ද? මා භාවුරු මරද්ද! නිකම් අඩිපිම්'යි යට කරන්නිය.

නැවත එක් දවසක් මරන්නවුන් රජ්ජුරුවෝ තුමූම දැක මෙසේ සිතක් පහළ විය. 'මේ කුමාරයා මූ හා එන සැටියත් නොවෙයි, සැබෑම ප්‍රතිඥාවක් සේ බැලූ බැලුවන්ට ප්‍රසාද ඵලවන්නේය, 'මේ රජ්ජුරුවන්ගේ දුවනැයි වත් රජ්ජුරුවන්ගේ පුතණුවෝයි වත් මම නොරවටන් ආමිසි වත් අරක්කැමියාගේ පුතෙනිම්සි වත් නිසි භයක් නැතිගැන්මක් නැත්තේය, මිට වලනා කිව මුත් මේ අරක්කැමියාගේ පුතෙක් නොවෙයි සිතා එවක් පටන් විමසන්නාහ. සිරිවිබුදු කුමරිකාවන් සෙළනා තැනට කැවුම් නෙනයන්නාහ. කුමාරිකාවෝ සෙසු බාල දරුවන්වත් බෙදා දෙන්නාහ සෙස්සෝ දික්කළ කැවුම් ගන්නාසල දණවන නමාගෙන නැඹුරුව අතුන් දික්කොට ඇරගෙන කන්නාහ. චූලනී කුමාරයෝ සෙළමින් සිට අතින් උදුරාගෙන කන්නාහ. එසින් රජ්ජුරුවෝ තුමූම දුටහ.

නැවත එක්දවසක් චූලනී කුමාරයන් සෙළනා බවර දමාපුව, රජ්ජුරුවන්ගේ කුඩා යහන යට වැදගියේය. ඒ ගන්නා කුමාරයෝ තමන්ගේ රාජමානයෙන් 'මේ ප්‍රත්‍යන්ත රජ්ජුගේ ඇඳ යටට ඉස නැමීම් නම් ඔහු වැන්දට අඩුදැ'යි අභිමානව දණ්ඩකින් මැත්තොට ගත. රජ්ජුරුවෝ ඒ ක්‍රියාවත් දැන 'එකානතයෙන් මේ අරක්කැමියාගේ පුතෙක් නොවේයි සිතා අරක්කැමියා කැඳවා 'මේ කාගේ පුතෙක්දැ යි පුතෙක්දැයි විවාළහ. 'මාගේම පුතාය'යි කිය. 'එම්බල! තාගේ පුතාත් නොපුතාත් මම දනිමි; බොරු නොකියා ඇති සැටියේ කියව; බොරු කියෙහි නම් දන්නෙම් වේදැ"යි තද්‍ධුව අමෝරා හඝ ගැන්වූහ. ඒ මරණ භයින් තැතිගෙන 'තනිව දන්වාලමි'යි කී කල්හි රජ්ජුරුවෝ මිනිසුත් දුරකළහ. එවිට අභය ඉල්වාගෙන මාලු චූලනී රජ්ජුරුවන්ගේ විෂ බේත් ලවා මැරූ තැන් පටන් රජහු විවාළ තැන් දක්වා තමන් කොට ආ පවත් කථාව වූ පරිදිදෙන් නොවලහා කිය. රජ්ජුරුවෝ තත්වූ පරිදිදෙන් අසා දැන තමන්ගේ දුවණියන් බිසෝ පලදනාවෙන් සරහා චූලනී කුමාරයන්ට පාවා දුන්හ. මේ චූලනී කුමාරයන් මදු රට විසූ නියාවය.

අරක්කැමියා හා කුමාරවරුන් ගිය දවස් "අරක්කැමියාත් පුතාත් චූලනී කුමාරයෝත් තුන්දෙන මුළුතැන් ගෙයි ගත් ගින්නෙන් ද මළහ"යි සියලු නුවර මුළුල්ලෙහි එකකොලාහල විය. තලතා දෙවී එපවත් අසා බමුණාට කියන්නාහු "නුඹ හා අප හා සිත ඇත්ත මුදුන්පත් විය. ඒ තුන්දෙනා එතැනෙයි ද මළහ"යි කිහ. බමුණු ඔදවැඩි සතුටු විය. ඒ තලතාදෙවි 'චූලනී කුමාරයන්ගේ ඇටය'යි එළු ඇට ගෙන්වා බමුණාට පෑ ශිවිස්සූහ. මේ කිසා පරිබ්‍රාජිකාවන්ද අනික් උපක්‍රමයක් තමන්ගේ නුවණින් දක්වා 'තොප මිරණින් මුදු රැක්කිය' කියා 'ඒසා අපමණ සැපක් දුන් එවැනි මැනියන් කවුර චරදනින් ජල රාක්ෂසයාට දෙව්දැ'යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ කියන්නාහු "මාගේ මැනියන්දැගේ ගුණ බොහෝ බවත් දනිමි, නුඹවහන්සේ වදාළ ගුණයට වඩා මා දන්නා නුගුණ බොහෝය"යි කියන්නාහු "ස්වාමිනි! උන්දැ නුගුණ හැටි කියන්නට නොපිළිවන යම්හෙම් දෙයක් නියමි, අසා වදාළ මැනව.

දහරුවිය අලංකාරං, ධාරෙති අවිලඤ්ඤං,
දෙවාරිසෙ අණ්ණතෙ, අතිවෙලං පජඤ්ඤති.

තඤ්ඤාපි පිටිරාජානං, සයං දූති සාසති,
මාතරං තෙන දෙසෙන, දජ්ජාහං දාරකඤ්ඤතෝ-ති-

තමන්ද ඉතා වයස්ගතව සිට බාල සත්‍රීන් පලඳනාවූ මිණි මෙවුල්දමා ආදි නොපැලඳියමනා පලඳනා පැලඳ මෑ අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන්නල්හි බොහෝ දෙනාට පෙනෙන පරිද්දෙන් සක්මන්කොට ඇවිදිනාදුය, පැලැන්දවූ මිණිමෙඛලා දුම්දියෙහි ශබ්දය සියලු රජගෙය එකනින්නාද කරමින් සිටිනේය, අමාත්‍ය මණ්ඩලයා මැද උන් මම මුන්ව හන්සේ පැලඳි ආභරණයෙහි ශබ්දය නිසා දැන ලජ්ජාවෙන් තරබාමි, අමාත්‍ය සමූහයා ඔවුනොවුන් මුහුණ බලන්නාහ, නවත්ත නොකට යුත්නක් බලා වදාළ මැනව, මුන්දුගේ ඉදුල් කන්නටත් තරම් නුවූ දෙරටුපාල කොල්ලන්ද ඇත් ගොව්වන් ආදින්ද කැඳව කැඳවා බොහෝ වේලක් උන් හා සමඟ මහත් කොට සිනාසෙනදුය, මා සතු ප්‍රභාසනක රජදරුවන්ට මා යැව්වාකොට පත් ලියා යවනකල 'මාගේ මැනියන්ද මැහැලි නොවනදුය, සොළොස් ඇවිරිද්දෙහි සිටියන්ටත් මුන්ද වඩනාදුය, මෙතම් රජ්ජුරුවෝ අවුත් තමන්ට බිරින්දු කොට යෙත්ව'සි මට සොරු පත් යවනදුං, රජදරුවෝ පත් බලා පියා හයින් තැතිගෙන නැවත මට පත් එවන කල "අප තමන්වහන්සේගේ සේවකයන්වූව, මෙසේ නොතරම් කටයුතු කියා එව්වේ ඇයිද'සි පත් එවන්නාහ, ඒ ගෙනා පත් සබයෙහි කියන්නට වන් කල ඉස් වද්දන තැනක් නැත්තාසේ මහා ලජ්ජාවෙන් පොළොව පැලී නොයනසේය'සි සිතමි, සවා මිනි! මේ වැරදිනිසා මැනියන් දියරකුසාට දෙමි'කිහ

මැනියන් මේ වරදින් ජලරාක්ෂසයාට දෙව:- තොපගේ භාර්‍යාවෝ නම් තොප ඉතා බාල අවස්ථාවෙහි පටන් තොපට උන් තරම් ගුණ ඇති කෙනෙක් නොවියයි නඤ්ඤදේවීන්ගේ ගුණ කියන මේ පරිබ්‍රාජිකාවන්ද:—

ඉත්ථි ගුම්බස්ස පවරා, අච්චන්ත පියවාදිනී,
අනුග්ගතා සීලවතී, භාසාව අනපායිනී.

අක්කොධනා පඤ්ඤවතී, සුණිතා අත්ථදස්සිනී,
උබ්බරිං සෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛතෝ-ති-

මෙයින් කියා "මහරජ! මේ නඤ්ඤදේවී නම් තොපගේ සොළොස් දහස් ඔස්සෝවරුන්ට නායකව පඤ්චකල්‍යාණයෙන් හා සියලු රූපශ්‍රීන් විරාජමානව බාල්‍යයෙහි පටන් සිවුකියවූ භාර්‍යාවක් පරිද්දෙන් තොප අත්තොහැර පවත්නීය, උන්ගේ ගුණ කියන්නම් මදුරට සාගල නුවර තොප වසන සමයෙහි, තොප තළා මැරූ කල ගෙඩි කන් මුත් තොපගේ ආඥාව මරුත්තු නොකොට තොප කෙරේ සෙනහසෙන් දෙමව්පියන්වත් නොකිවුය, මෙබඳු ගුණ ඇති නොකියෙන සුළු ඉතා නුවණැති අභිප්‍රාය දන්නා තොප සිත්වූ පරිද්දෙන් වැස තොප සේ පිනැති දූ දරුවන් වද, රජාභිවාඩිය වඩා දුන් නඤ්ඤදේවීන් කවර වරදකින් ජල රාක්ෂසයාට දෙවිදැ"යි කිහ. රජ්ජුරුවෝ ඒ අසා උන් ගේ නුගුණ කීඟන්කාහු මෙසින් කිය:—

ඛිඩ්ඩා රතිසම්පන්නං, අනත්ථ වසමාගතං,
සා මං සකානං පුත්තානං, ආයාවං යාචතෙ ධනං.

සොහං දදාමි සාරත්තො, බහුං උච්චාවචං ධනං,
සුදුච්චජං චජිත්වාන, පච්ඡා සොචාමි දුම්මතො,
උබ්බරිං භොන දෙසෙන, දජ්ජාමි දකරක්ඛනෝ-ති-

"සවාමිනි! මේ නාගදේවී රහසිගතව ලොකස්වාද රතියෙන් සතුටුවුව මා තමා වසහඩියට පවුණුවා මාගේ සෙසු බිසෝවරුන්ට හා උන්ගෙන් උපන් දරුවන්ට මා විසින් සෙනහයෙන් කරවා පලදවනලද නොඉල්විය යුතු පලඳනා මා අතින් ඉල්වාපි, 'මම ඒ දුන් කල මතු ඒ නිසා වන පසුතැවිලි යෙක් ඇතැයි නොසිතා, කාම රාගයෙන් දවනලද අදහසින් ඇරගනුවයි ඉල්වූ පලඳනා උදුරා දෙමි; මෝ රජහු විසින් මට දෙනලදැ"යි දරුවන් හඬ්දී ඇරගෙන 'දරුවන්ට දුන් පලඳනා උදුරා ගත්මි'යි අනිශයින් සතුටුවේයි. එකල බිසෝවරුන් හා දරුවෝ අවුත් 'මේ කීවා දුන්නෙත් ඇයිද? නැවත උදුරාගත්තෙත් හැයිදැ' යිසහාවේ උන් මට 'ඇ මැදෙනත් නියාය'යි මැසිවිලි කියති, බාල දරුවන් අඩත් අඩත් මටත් ශොක උපදනේය, 'මා කළදු නපුරුයි පසුතැවිලියට පැමිණ නැවත භාණ්ඩාගාරයෙන් ඇරගත්තාට දිවුණක් දීත් උන්හැම සංතිදුවාගත නොහෙමි, මේසා දෙම්නසෙක් වන්නේ උන් නිසා වේද? මේ වරද මුල්සොට නාගදේවීන් ජලරාක්ෂසයාට දෙමි'යි කිහ.

ඒ වන්නා මේ වරදින් බිසවුන් බිලිදෙව, කොපගේ මලණුවෝ මහා උපකාරී වූහ, උන් කවර වරදින් රාක්ෂසයාට දෙව්දැයි කියන සේක්:—

යෙ නොවිතා ජනපදා, ආනීතාව පරිග්ගහං,
ආහතා පර රජ්ජානි, අභිහටඤ්ච බහුං ධනං.

ධනුග්ගහානං පවරං, සූරං නිබ්බිණ මන්තිනං,
භාතාරං සෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛනෝ-ති-

මෙසින් කියා "මහරජ! නොප සවදෙශයෙන් ගොස් අන්‍ය දෙශයෙහි උන්නවුන් තමන්ගේ උපායෙන් ගෙනවුත් සියලු සම්පත්තීන් සම්බඩවූ රාජ්‍ය යෙහි පිහිටුවා, නවද දස දහසක් ගොදුන් දඹදිව දුනුවායන්ට අග්‍රවූ ඉනා වැර සැරවූ තීක්ෂණ මන්ත්‍රීවූ එකතුසින් උපන් මලණුවන් කැර වරදකින් බිලිදෙවි දැ"යි විවාළසේක. ඒ තීක්ෂණ මන්ත්‍රී කුමාරයෝ නම් මැණියන් තලතාදෙවින් මාලූ චුලනී රජ්ජුරුවන් විෂලවා මරා බමුණා හා එක්ව වසන කල උපන්හ. එසේ බව මුත් උපන්නේ කාලූ චුලනී රජ්ජුරුවන්ටදැවය. ඒබමුණු කුමාරයන් වැඩුණු කල නඩුවක් අතට දී්ලා "මේ ඇරගෙන එක්වන් මාළඟ සිටුව"යි කිහ. ඒ කුමාරයෝත් 'බමුණාණෝ තමාගේ පියාණෝමය'යි සිතා සේවය කරන්නාහ. (එතලත් දුන් සේම වියරුවෝ ඇතිවන්නාහ) එක් අමාත්‍ය යෙක් සෙමින් කියන්නේ "කුමාරයෙනි! තෙපි මූගේ පුත් නොනෙකැ"යි නොසිතාව, නොප මවු කුස වසන සමයෙහි තොප මවු මේ බමුණා පිණිස නොප පියාණන් මරා මෝහට ධවලච්ඡත්‍ර නුවා මොහු රාජ්‍යයෙහි දිසිටුවූහ. නෙපි මහා චුලනී රජ්ජුරුවන්ගේ පුතණුදෑය"සි කිහ.

ඒ කුමාරයෝ දණ්ඩන් ගැසූ නයකු සේ කිපී 'එක් උපායකින් මේ බමුණා මරම්'යි සිතා රජගෙට ගොසින් වැද ඒ බමුණු තමන්ට දුන් සඩුව තමන් ළඟ සිටි එකක්හට දී අනිසක් හට කියන්නාහු "හෝ තෙලේ සඩුව

'මාගේ කඩුවයි'යි වැදකොට කලඹ කරවා"යි කියා රජගෙට වැන්හ. ඔහු දෙදෙන 'මේ මාගේ කඩුව උදුරා තට දුන්නේ කවුරුදැ'යි කලඹ කළඹ කුමාරයෝ පළමු නොදන්නාවන්ව 'සොල! කුමන කලහයෙක්ද'යි එහකු බලන් නට යවූහ. ඒ අවුත් 'හුඹවහන්සේගේ කඩුව අනිසෙක් තමාගේ කඩුවයයි උදුරා කලඹ කෙරෙති'යි කිහ. බමුණා ඒ අසා 'කුමක්ද'යි විවාළ කල්හි 'හුඹ වහන්සේ මට දුන් කඩුව අනික් සොහොකුන්ගේ කඩුවය'යි කිහ. කුමක් කියවිද? මාගේ භාණ්ඩාගාරයෙහි සිය දහස් ගණන් කඩු තිබියදී තොප එහා පුතණුවන්ට අනුන්ගේ කඩුවක් කුමනට දෙම්ද'යි කිහ. "එසේ වීනම් හුඹ වහන්සේ මට දුන් කඩුව ඇඳින ඟහ හෙන සේක්ද! පරීක්ෂාකරන පරිද්දෙන් හෙන්වමෝද"යි කිහ. 'අයි පුත! මා දුන් කඩුව මම නොහඳුනම්ද? වහා ගේනෙව'යි කිහ. කුමාරයෝ කඩුව ගෙන්වා කොපුවෙන් මැත්කොට 'බැලුව මැනවැ'යි කඩුව පානා එහක්හු පරිද්දෙන් වමනින් කොපුව ගෙන විදුලියක් ගැසූ ඇසිල්ලක් මෙන් එහා පහරින්ම බමුණා හිස කපා තමන් පාපිට හෙළා ගත්හ. ඒ මළ බමුණා රජගෙන් පිටත්කොට ගෙය පවිත්‍ර කරවා කුමාරයන්ට ධවලච්ඡත්‍ර නංවා සිටි තල්හි මැනියෝ චූලනී කුමාරයන් සාගල නුවර වසන නියාව කිහ. ඒ අසා තික්ඛණ මන්ත්‍රී කුමාරයෝ චතුරඞ්ගිනී සෙනාව පිරිවරා ගොස් බැණන් ගෙනවුත් රාජ්‍යභිෂේක කරවා රාජ්‍යයෙහි පිහිටුවූහ. ඒ කුමා රයෝ ක්ෂණයෙහි සිතා පියන බුද්ධි ඇත්තාහ, එසින් තික්ඛණමන්ත්‍රී කුමාරයෝ යයි දඹදිව ප්‍රසිද්ධවූහ. පරිබ්‍රාජිකාවන්දෑ මෙවැනි කුමාරයන් නවර වරදකින් රාක්ෂසයාට දෙවිදැ"යි විවාළසේක.

ඒ අසා රජපුරුවෝ මලණුවන්ගේ නුගුණ කියන්නාහු:-

මයොවිතා ජනපදා, ආනීතාව පරිග්ගහං,
ආහතං පර රජ්ජෙහි, අභිඣාය බහුං ධනං.

ධනුග්ගහානං පවරෝ, සූරෝ නිබ්බණ මන්තිසෝ
මයා සෝ සුඛිතෝ රාජා, අතිමඤ්ඤති දූරතෝ.

උපට්ඨානම්පි මෙ අය්‍යෝ, නසෝ එති යථාපුරෙ,
ආතරා තෙන දෙසෙන, දජ්ජාහං දකරක්ඛතෝ-ති-

මේ ගාථා කියා "නිඩිතීව වසන්නහු මේ නුවරට ගෙනවුත් තමන්ට පැමිණි රාජ්‍යයෙහි මහා ඓශ්වර්‍යයෙහි පිහිටුවාලීම් කියාත්, අදුම් විදුමෙහිත් නද දුනු ඇදීමෙහිත් ධනුශ් ශිල්පයෙහිත් මට වැඩි දක්ෂ එකෙක් දසදහසක් යොදුන් දඹදිව නැතැයි කියා ද, සෙස්ස තබා පෙර රාජ සේවයට එන කල බොහෝදෙනාට කල් තබා එන්නාහ, දැන් මෙම තියා අභිමානයෙන් කල් යවාත් එන්නේය, සමහර දවස් තමාම නොඑන්නේය, මේ වරද නිසා ජල රාක්ෂසයාට බිලි දෙම්"යි කිහ. මලණුවන් ඒ වරදින් දෙව. ධනුශෙඛර කුමාර යන්ගේ ගුණ කියන සේක්:—

එකරත්තං ව උභයෝ, තිංසාපි ධනුසෙඛරෝ,
උහොජාතෙහි දක්ඛාලා, සහායා සුසමාවසා.

වරියායං අනුබන්ධිත්වා, එකදුක්ඛ සුඛොතව,
උසසුකෙකා හෙ දිවාරත්තං, සබ්බකිච්චෙසු ව්‍යාවටෝ,
සඛායං කෙන දෙසෙන, දජ්ජාසි දකරක්ඛතෝ-ති-

මේ ගාථාවන්ගෙන් "මහරජ! ඛත්තියෝරය නම් තද දුනු ඇදීම් ආදි ධනුශ්ශිල්පයෙහි ඉතා දක්ෂය, මේ පඤ්චාල භූවර නොපහා එක දවස් උපන, නොපගේ ශ්‍රායාව පරිදීදෙන් සුව දුක් දෙක එක්ව සිඳ ඇතිද ආය. භවිද නොපගේ රාජ සෘත්‍යයෙහි රැ දෙවෙනි අප්‍රමාදව වසන්නේය, එසේවූ බමුණන් හා සමාන යහළුවා කවර වරදකින් දිය රකුසාට දෙවිද"සි කිහ. ඉක්බිති යහළුවාගේ නුගුණ කියන්නාවූ රජ්ජුරුවෝ:-

වරියායං අයං අය්‍යෙ, පජග්ඝිතෝ මයා සහ,
අජ්ජාපි නෙත වණ්ණෙණ්ණ, අතිවෙලං පජග්ඝති.

උබ්බරියාපි මෙ අය්‍යෙ, මඤ්ඤයාමි රහොගතා,
අනාමනෙත්තාව පඤ්ඤති, පුබ්බ අපපටිවෙදිතෝ.

ලඛවාරෙ කතොකාසෙ, අතිරිකං අනාදරං,
සහාඝං තෙන දොසෙන දජ්ජාහං දකරක්ඛනෝ-ති-

මේ ගාථාවන්ගෙන් "සවාමිනි! මාගේ යහළුවා කුමාර කල පටන් එක්ව කා බී සිට එක්ව හිඳ සිට කෙළ බොහෝ දවසක් මා කෙරෙහි භය රහිතව විසූ පමණකින් දැන් මා රජව මේසා සම්පත විහිටි කලත් පළමු පරිද්දෙන්මි මා කෙරෙහි ගෞරව ආදර නැත්තේය. තවද තමාට රුකවල් නැති හෙයින් කවර වේලකත් බිසවුන් හා රහස් කථාවක් කෙරෙමි නමුත් සිටි රුකවලුන් නැවතුවත් උන්ට එරුම බැණ උන් හයගන්වා නිර්භිතව හඬිව උන් තැනට ගොස් වදනේය, අනාදර කරන්නේය, මා ඉදිරියෙහි අතපොළා සෙන්නේය, මා දුක්පත් සමය සේ දැනුත් සිතන්නේය, පළමු කියා නේවාමි මා උන් යෑම් තැනකට වහා එන්නේය, මේ වරදින් යහළුවා දිය රකුසාට දෙමි"සි කිහ.

"ඒ අසා වන්නාට යහළුවා ඒ වරදින් දියරකුසාට දෙව, මේ කෙවට්ට නම් පුරොහිත බමුණු නොපට බොහෝ උපකාරීය"සි ඔහුගේ ගුණ කියන සේක්:--

කුසලෝ සබ්බ නිමිත්තානං. රුදඤ්ඤූ ආගතාගමෝ,
උප්පාදෙ සුපිනෙ යුත්තෝ, නීත්‍යා නෙව පවෙසනෙ
පණ්ඩා භූමන්තලික්ඛසිං නක්ඛත්ත පද කොවිදෙ,
බ්‍රාහමණං තෙන දොසෙන, දජ්ජාසි දකරක්ඛනෝ==ති

මේ ගාථාවන්ගෙන් කිහ:—මේ ගාථාවන්හි අභිප්‍රාය නම්, "මහරජ! මේ කෙවට්ටයා නම් බසින් නොකියා අනුන් සිතූ දෙයක් තමා ඇසූ දුටු දෙයක් සේ ශාස්ත්‍ර බලයෙන්ම දන්නාවූ කිමෙහි බිණීමෙහි දක්ෂවූ රාජ නීති ආදි ලොකව්‍යවහාරයෙහි දක්ෂවූ දුටුවාවූ සිහිනයෙහි වැඩ අවැඩ අතැඟිලසේ දන්නාවූ ගමනා ගමනයෙහි අභිඥ මේයසි නොවරදවා දන්නාවූ චන්ද්‍රග්‍රහණ සූර්‍යග්‍රහණ ආදිය තත්වූ පරිද්දෙන් නොවරදවා දන්නාවූ ඉදින් සිතීම්නම් අඟස පොළොව දෙක ගැටලන තරම් සිඟලු උපායෙහි දක්ෂවූ සිතූ අර්ථයක් සාධාගන්නා තරම් නුවණ හා මන්ත්‍රිකම්හි අග්‍රවූ කෙනෙක, ඒ බ්‍රාහමණයා කවර වරදකින් දියරකුසාට දෙව්ද"සි කිහ. ඒ අසා බමුණාගේ වරද කියන්නාවූ රජ්ජුරුවෝ මේ ගාථාවෙන් කියන්:=

පරිසානමපි මේ අය්‍යෙ, මීලසිත්වා උදික්ඛති,
තසමා අවචහමුං ලුද්දං, දජ්ජාහං දකරක්ඛනො-ති-

මේ ගාථාවෙන් කියේ "මම අමාත්‍යමණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪව උන්නෙමි, මේ තමාගේ බැම රැළියෙන් වැසි තිබෙන්නාවූ ඇවිකුළන් ඇස් මෙන් ඉතා රත්වූ ඇසින් බැමය නහාලා කිපී බලන එකකු මෙන් එක්වන් මා මුහුණ බලන්නේය, සිතෙන් දුටුවන් බාන තරම් මොහුගේ රූපවිලාසය හා කඩ දත් හා මුණ හා රත්වූ ඇස් ඇති මොහු රාක්ෂසයකු දුටුවාසේ ඉතා භයපත්ව දකිනා සේකැයි සිතමි; එසේම විරූපවූ බැටුම් නපුරුවූ මේ බමුණා මෙසෙසින් දිය රකුසාට දෙමි"යි කීහ.

ඒ අසා පරිබ්‍රාජිකාවන්දෑ "වැදූ මැනියන් ආදිවූ පස්දෙනා රකුසාට බිල්ලට දී මේ සා රාජ්‍ය සම්පත්තියක් හා ශ්‍රී විභූති අලුයම දැමූ කෙළ පිඬුක්සේ නොසිතා තොපගේ ජීවිතය මහෞෂධ පණ්ඩිතයන්ට දෙමියි කිව. ඒ පණ්ඩිතයන්ගේ පෙර හිය දවසවත් දැන්වත් මතු එන දවසවත් කවර ගුණයක් දැක එවැන්නක් නරවිදැ"සි රජ්ජුරුවන්ගේ යසස් හා කීර්තිය වර්ණනා කරන පරිබ්‍රාජිකාවන්දෑ:—

ස සමුද්දපරියායං, මහිං සාගර කුණ්ඩලං,
වසුන්ධරං ආවසසි, අමච්ච පරිවාරිතො.

චාතුරන්තො මහාරඨො, විජිතාවි මහබ්බලො,
පථව්‍යා එකරාජාසි, යසො තෙ විපුලං ගතො.

සොළසිත්ථි සහස්සානි, ආමුත්තමණිකුණ්ඩලා,
නානාජානපදා තායො, දෙවකඤ්ඤසු සමාපහා.

එවං සබ්බඞ්ග සම්පන්නා, සබ්බකාම සමිඞ්ඪිනං,
සුඛිතානං පියං දීඝං, ජීවිතං ආහු ඛත්තිය.

අථබ්භංකෙන වණ්ණෙන, කෙනවාපන හෙතුනා,
පණ්ඩිතා අත්තරක්ඛනෙතා, පාණං චජසි දුච්චජං-ති-

මෙසින් කියා "මහරජ! තෙපි වූකලි සතර දිසින් මුහුදු දිය කෙළවර තොට ඇති දසදහසක් යොදුන් දඹදිවට අගරජව, තොපට සේවකවූ සෙසු රජදරුවන්ටඅනුශාසනාකරව,අමාත්‍යසමූහයා පිරිවරා බලවාහනයෙන්යුක්තව සියල්ලවුන් ජයගතුව. ශක්‍රදෙවෙන්ද්‍රයා මෙන් යසස් හා කීර්තිඇත්තව, තවද ඛහා පලඳනාලද මාණික්‍ය කුණ්ඩලා භරණාදිවූ නොයෙක් බිසෝපලඳනා වෙන් විභූසිතාවූ සොළොස් දහසක් පුරසත්‍රීන් විසින් පිරිවරන ලදුව. මෙසේවූ ජනපද ගම් නියම් ගම් රාජධානි ගෘහ උද්‍යාන ක්ෂෙත්‍ර වස්ත්‍රාභරණ අන්න පාන දැසි දස් පුත්‍රදාර ඔව මහිෂ රත්රුවන් ආදියෙන් හා ඇත් අස්රථ පෙලිකුනම් ආදියෙන් හා චතුරඞ්ගිනීසෙනාව ආදි නොයෙක් බල වාහනයෙන් හා පඤ්ච කාමඇට නිවාසස්ථානයක්බඳු මේ තොපගේ ආත්ම සභාවය ත්‍රුවණැත්තවුන් විසින් 'තමාගේ ජීවිතය සේ තමාට ප්‍රිය වස්තුයෙක් නැතැ'යි වර්ණනාකරන ලද්දේය, ඒආත්මය කුමක් නිසා මේ මහෞෂධ පණ්ඩිතයන් මාරුවේදී මනුෂ්‍යයන් විසින් නොකොට ගත හැකි නොසිතිය හැකි ප්‍රාණ පරිත්‍යාගය කරවිදැ"යි වදාළසේක.

ඉක්බිති රජ්ජුරුවෝ "සවාමිනි! කුමක් වදාරන සේක්ද? පණ්ඩිත යන්ගේ ගුණ මා තබා දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයන් හා නාග සුපණ්ණා දිවූ දෙවියෝද ඒ ඒ සක්වළ අනන්ත නම් නාගයෝද තමන් එකි එකී දෙනා දහසක් මුඛ මවා එකි එකී මුඛයකින් හි ගුණ අනික් මුඛයකින් ද, කියා එකි එකී මුඛයෙන් එකි එකී ගුණයෙක්ම කියත් නම්, මහොෂධ පණ්ඩිතයන්ගේ ගුණ තමන් තමන් ආයු පමණින් කියාත් උන් උන්ගේ ආයුෂය ගෙවත් මුත් ගුණයෙහි නිමාවක්වත් කොළවක් දකින්නක්වත් හැක්කැයි නොසිතමි, එසේවූ ප්‍රමාණාතික්‍රාන්ත ගුණ හා නුවණ ඇති පණ්ඩිත කෙනෙක් ඉන් විනා ගිය දවස උපන්නොත් නැත; එන දවස උපදින්නොත් නැත; මේ දවස උපන්නොත් නැහ; එබැවින් උන්ගේ අනල්පවූ ගුණයන් සැලූ මාත්‍රයක් ඉදිකටු මලින් ආකාශය පානාසේ කියමි"යි කියා:=

යථාපි ආගතෙ අය්‍යෙ, මම හත්ථං මහොසධෝ,
නාභිජානාමි ඛිරස්ස, අදූමිතභාවමත්තකං.

සවෙ ච කිසමිවි කාලෙ, මරණං මෙ පුරෙ සියා,
පුත්තෙන ච මෙ පපුත්තෙන ච, සුඛාපෙය්‍ය මහොසධෝ.

අනාගතං පච්චුපපන්නං, සබ්බමත්ථං විපස්සති,
අනාපරාධකම්මන්තං, නෙව දජ්ජං මහොසධං=ති-

මේ ගාථාවන්ගෙන්:— සවාමිනි! මේ මහෞෂධ පණ්ඩිතයන් මොබ ආවක් පටන් අද මේ වෙලාව දක්වා සැලූ මාත්‍රයක් පමණ මා නුරුස්නා වරදක් දුටුදැ නැත, අසූදැත් නැත. ඉදින් තමන්ට පළමු මාගේතම පිරිහුණුයේ විනම් මාගේ දරුවන්ද මුනුබුරන්ද තමන්ගේ ප්‍රඥ බලයෙන් උන් හැමදෙනා වම කිසි දුකක් නොවැදිදැ සැපයෙහි පිහිටුවා ලන්නාහ; තවද අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යන තුන්කල්හි පවත්නාවූ ඉෂ්ටානිෂ්ට දෙක ලොවු තුරා සිඳ්ඟ කෙනකුන් මෙන් තමන්ගේ ප්‍රඥ බලයෙන් ඉදුරාම දන්නාහ; නිරපරාධකාරී අසමධුරවූ පණ්ඩිතයන් මා පණ තබා මම රැකි උදක රාක්ෂසයාට බිල්ලට නොදෙම්මය'යි බොධිසත්වයන්ගේ ගුණ සදමිච්චු අදනාසේ තමන් සිත්වූ පරිද්දෙන් නොසහවා නොවලහා සියලු ජනයාට ඇසෙන පරිද්දෙන් කිහ.

රජහු සිත දෙවලයක් නොකොට තමන් සිත්වූ පරිද්දෙන් නොව ලහා කී කල්හි පරිබ්‍රාජකාවන්දැ ඒ සා මහා ජනසමාගමයෙහි රැස්වූ බොහෝ දෙනාහට ඇසෙන පරිද්දෙන් තවත් හරකොට ප්‍රසිඩවනලෙස කියන සේක්:-

ඉදං සුණොථ පඤ්චාලා, චූළනීයස්ස භාසිතං,
පණ්ඩිතා අනුරක්ඛන්තා, පාණං වජති දූවචජං.

මාතු භරියාය භාතුච්ච, සඛිනො බ්‍රාහ්මණස්සච,
අත්තනොවාපි පඤ්චාලෝ, ඡන්නං වජති ජීවිතං.

එවං මහිඩිකා පඤ්ඤා, නිපුණා සාධු චින්තනී,
දිඝ ධම්ම හිතත්ථාය, සම්පරාය සුඛාඝවා-ති-

මේ ගාථාවන්ගෙන්:- "එම්බා මින්වත්නි! මා කියන්නක් අසව; චූලනි රජ්ජුරුවෝ තෘෂ්ණාවේ වැඳ මැනියන් ඇතුළුවූ අවශ්‍ය බන්ධුන් පස්දෙනාත් හුදු තමන්ගේ ජීවිතයත් සදෙන ජල රාක්ෂසයාට බිලිදීවත් මේ මහෞෂධ පණ්ඩිතයන් රකින්ලා. ඒ බව මින්වත්වූ නුවර වාසි හැමදෙනාම ඉදුරා අසා සිත තබත්වා"යි කිහ.

මෙසේ ප්‍රඥා තොමෝ සිතූ සිතූ අර්ථසාධන බැවින් මහා ඍද්ධි ඇත්තිය, සියක්වර පැළෑ ඇස් රෙම් අගක් සෙයින් ඉහා සියුම්, ඓහ ලෞකික සහ ලාභී ජාතය පිණිසත් එසේම පාර ලෞකික සකලාර්ථය පිණිසත් අත්‍යන්තෝපකාර බැවින් 'කෙවල ප්‍රඥාය'යි සිතිය යුත්තිය, කියා පරිබ්‍රාජිකාවන්ද සත්‍ය රුවින් මාලිගාවක මැණික් තොනක් පලදවන්නාක් මෙන් බොධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රඥා ගුණ සමූහය තමන් වහන්සේගේ නුවණින් දෙශනාකොට කුළුගන්වා දියරතුසු පැනයෙන් මේ **උම්මග්ග ජාතකය** නිමවා වදාළසේක.

මෙසේ ඒ මාගේ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ **දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය, යන චතුරාර්ය සත්‍යය, ප්‍රතිඝාතකොට** ධර්මශාලායෙහි රැස්වූ භික්ෂූන්වහන්සේ මධ්‍යයෙහි තමන් වහන්සේගේ **ප්‍රඥා පාරමිතාව** සදමඩල අදහසේ දෙශනාකොට ජාතකය නිමවා වදාළසේක. ඒ ධර්මදේශනාවේ බොහෝ දිව්‍ය මනුෂ්‍ය නාග සුපර්ණයන්ට අභිවාඩිදයකවිය. මෙසේ ජාතකය නිමවා වදාරා අනන්තයෙහි මහෞෂධ පණ්ඩිතයන් ආදිවූ එවක් ප්‍රසිද්ධයන් වෙන වෙනම හෝරා වදාරන බුදුරජාණන් වහන්සේ:—

> හෙරි උපපල වණ්ණාසි, පිතා සුඩොදනො අහු,
> මාතා ආසි මහාමායා, අමරා බිම්බ සුන්දරී.
>
> සුවෝ අහොසි ආනන්දෝ, සාරිපුත්තෝසි චූලනී,
> මහොසධෝ ලොකනාථෝ, එවං ධාරෙථ ජාතකං=ති.

මේ ගාථාවන්ගෙන්:—'එම්බා මහණෙනි! එසමයෙහි පරිබ්‍රාජිකාවන්ද, නම් මාගේ සත්තෙහි **උපුල්වන්** මහා **සත්ත්වියි**. පණ්ඩිතයන්ගේ පියාණෝ සිරිවඩ්ඪන සිටාණෝ නම් **සුඩොදන මහ රජ්ජුරුවෝය**. පණ්ඩිතයන්ගේ මැනියෝ සුමිත්තා දෙවි නම් දැන් **මහාමායා දෙවිය**, පණ්ඩිතයන්ගේ බිරින්ද අරුදෙවි නම් දැන්මෙවන එක්ලක්ෂ සයානුදහසක් කිසෝවරුන්ට නායකව මිපුතණුවන් රාහුල කුමාරයන් වැඳූ **යශොධරා දෙවිය**. පණ්ඩිතයන්ට රහස් මේවිරඹාව සියලු වැඩ සාධා දුන් ගිරවා තෙමේ නම් මාගේ සස්නෙහි බුදුන්ට උපස්ථාන කරන්නවුන්ට අග්‍රවූ ධර්ම භාණ්ඩාගාරිකවූ සිහි නුවණ ඇත්තවුන්ට අග්‍රවූ බුදුන් කෙරේ වලලනවූ මාගේ බුදුසසුන් නමැති ආකාශයෙහි පූර්ණ චන්ද්‍රයා වැනිවූ මාගේම මල්වූ ජනානන්ද කරවූ **ආනන්ද සත්ථවිර තෙමේය**. එසමයෙහි පණ්ඩිතයන් හුන් නුවරට අවලොස් අක්ෂෞහිණියක් පමණ සෙනාව ගෙනවුත් පැරද බිඳී පැලවූ චූලනි බ්‍රහ්මදත්ත රජ නම් දැන් මට දකුණත් සවිවූ මාවිනා නුවණැත්තවුන්ට අග්‍රවූ **සාරිපුත්ත** සත්ථවිරයෝය. එසමයෙහි සත් අවුරුද්දෙහි පවත් සෙනකය, පුක්කුසය, කාවින්දය, දෙවින්දය

කෙවට්ටය, යන ප්‍රඥාසම්පන්න පණ්ඩිත වරුන් හුවණින් ජයගත්තාවූ මහෝෂධ පණ්ඩිතයෝ නම් දැන් ලොවුතුරා බුදුවූ මම්මයි'සි තමන් වහන්සේ දක්වා වදාළසේක.

අථවාහි (කෙවට්ටෝ දෙවදහෙනා'සි, තලතා වුල්ලනඳිකා;
පඤ්චාලචණ්ඩි සුන්දර, දෙවිවාසි යසස්සිකා.

අඔඝෝ ආසි කාවිළෙ, පොට්ඨපාදෙසි පුඤ්ඤසෝ;
පිලෝතිකොව දෙවිළෙ, සෙනකොවාසි සච්චකෝ.

දෙවී උදුම්බරා දිට්ඨමංගලී;
සාළිකා වාපි කුණ්ඩලී, වෙදෙහෝ ලාලුදයිති.)

මහාඝස ජාතකය නිමි.

වෙසසන්තර ජාතකය.

තවද එක්සමයෙක්හි කරුණාවට හෙතුවූ දහමට ලයැති අසන්නවුන් කන්හි අමා නමන මධුරවූ ධම්දෙසනා ඇති බැලූ බැලූවන් ඇස් නිමවන මනහර රූ ඇති සිහන්නවුන් සිත් නිවන මනොඥ ගුණඇති දෙව් බඹුදුන්හි කෙළනා පාපියුම් ඇති ලොකසාමිවූ අවය වාදිවූ අතුල්‍යවාදිවූ අමෘතවාදිවූ චිතයවාදිවූ විමුකති වාදිවූ ධම්යවරවූ ධම්රාජන්වූ ධම්ාධිපතිවූ ධම්ලොව නවූ ධම්ාහරණවූ ධම්ාමෘතවූ ශාක්‍යසිංහවූ ශාක්‍යතෙතුවූ ශාක්‍යාධිපතිවූ ශාක්‍යකුලතිලකවූ කරුණාමෞලි මාලාලඞ්කෘතවූ සමන්තභද්‍රවූ පරදුඃඛදුඃඛිතවූ අසරණ සරණ සරණාගත වජ්‍රපඤ්ජරවූ ත්‍රිභුවනවන්දුවූ ජගදනන්ද ලොචනවූ දෙවාතිදෙවවූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මාති බ්‍රහ්මවූ වන්දනීයාතිවන්දනීයවූ පූජනීයාති පූජනීයවූ දශබලධාරීවූ චතුවෛශාරද්‍ය විශාරදවූ චාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණ ගිත්‍යානුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කෙතුමාලාලඞ්කාරයෙන් විරාජමානවූ අලෙපචිත්තවූ සන්තුෂ්ටවූ අසංඝාඨවිහරණ ඇත්තාවූ ආරබධ වීර්‍යවූ චවනක්ෂමවූ පාපවෙදනාවූ ශික්ෂාකාමීවූ ජිතෙන්ද්‍රියවූ ජිතක්ලෙශීවූ ශීල සමාපන්නවූ සමාධිසමාපන්නවූ විමුකතිසමාපන්නවූ සම්‍යක්සිඹි ප්‍රඥාසාර විත්තා මාණික්‍ය භද්‍රඝට කල්‍යදමාය මානවූ සසරට ප්‍රතිපක්ෂවූ නිවනට දෙරහළුවූ සඛගීයට තිණ්ණපෙති පෙළක් බදුවූ අපායට අකුල්හෙළු වියත්බැව්හි අනතැන් පත්වූ මුළුසක්වළ සතුන් දැල්වූ දැල්වූ ඇස්හි පෙනියන්නාවූ සිතූ සිතූ සිත්හි ඇඳියන්නාවූ බැඳියන්නාවූ ඇස් ලූලූ දිශාවට සියලු සම්පත් දී ලන්නාවූ නිරලෝගුරු බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්නුවර නිසා නිග්‍රොධාරාමයෙහි වැඩවසනසේක් බන්ධුසමාගමයෙහි පොකුරුවැසි වැසීම අරභයා මේජාතකය වදාළසේක:—

ගේ සොඳේදයන්? —

ලොකසාමිවූ බුදුරජාණන්වහන්සේ පස්මරුන් බිඳ සව්නේ නෙවා දුන බරණැස ඉසිපතනආරම්භිදී ධර්මචක්‌ක ප්‍රවර්තනය කොට වදාළ සේක. එකල බරණැස රජකම්කරන ලද මහාසත්වයන් වහන්සේ ඒ ධර්මදේශනාව අසා සෝතාපත්ති ඵලයට පැමිණි කල්හි **උදය** හෙවත් විසින් ගාථාසැටකින් මාගධේශ්වර භාරතලද්දේ විසිදහසක් මහරහතන් පිරිවරා සුතිසඤ්ඤිත පිණිස කිඹුල්වත්පුර නුවරට වැඩියේක. එකල ශාක්‍යරජදරුවෝ අපගේ නෑ උතුමාණන් දක්‌ක නොමසිඳි රැස්ව නාගෘහවතුන් වහන්සේට වැඩවසන තැනක්‌ විමසන්නාහු **නිග්‍රෝධ** නම් ශාක්‍ය රජපුරුවන්ගේ උසස යහපතැයි සලකා එහි ගඳකිළි පිරිවෙන් සක්‌මන් මලු රුක්‌සථාන දිවාසථානාදිය කරවා සුවඳමල් ආදිය ගත් අතී ඇතිව බුදුන් පෙරමගට යන්නාහු සියලු අලඬකාරයෙන් සොභමානවූ නුවරවාසිවූ සොළොසැවිරිදි සිටුකුමරුවන් පන්සියයක්‌ හා සිටුකුමාරිකාවන් පන්සියයක්‌ පළමුකොට යවූහ. ඉක්‌බිති සොළොසැවිරිදි ශාක්‍යකුමරුවන් පන්සියයක්‌ හා කුමාරිකාවන් පන්සියයක්‌ද පිටත්කොට ඔවුන්ට අනතුරුව තුමූද ගොස් සුවඳමල් සුවඳසුණු ආදියෙන් පූජාකරමින් බුදුරජාණන්වහන්සේ වැඩහිටිය ගෙන නිග්‍රොධාරාමයට නියාහුය. බුදුරජාණෝ විසිදහසක්‌ මහරහතන් පිරිවරා පනවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. මානජාතිකවූ අභිමානයෙන් යුත් ඒ ශාක්‍යරජදරුවෝ සිහන්නාහු සිව ජිකුමාරයෝ ඉතාබාලයහ. අපගේ කණිටුසොහොවුරුහ. අප ගේ බෑණාහ. අපගේ පුත්‍රයහ. අපගේ මුණුබුරුහ. යනාදීන් සිතා ළදරුකුමරුවන් ළඟට කැඳවා දරුවෙනි! තෙපි පෙරට පෙරටම සිට බාහිකුමාරයන් වඳිව්. අපි තොප හැමට පසුව, ලා නොහඟවා වඳුම්හ. මේ මන කානට්ත් නොදන්වවයි උගන්වාලූහ. එබස් අසා බුදුන්ට බාලවූ රජකුමරුවෝ පෙරටම සිට බුදුන් වැඳ මහලුනැඟන්ට අවකාශ නොදීම සිටිගත්හ.

මෙසේ මහලුනැඟෝ තමන්වහන්සේ නොවැඳ සිටි කල්හි බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ අදහස්‌ දැන මේ නැයෝ මොවුන්ගේ අභිමානයෙන් මා නොවඳනාහුය. එබැවින් "දැන්ම මොවුන්ගෙන් වැඳුම් ලබම්' සිතා වදුරු අභිඤ්ඤාදානවතුඝ්‍යානයට සමවැද අහස්කුසට පැනනැඟ ඒ නැයන්ගේ හිස්මුදුන්හී පස් වහුරුවන්නාසේ ගණඬඹ නම් අඹරුක්‌මුල්හිදී යමාමහ පෙළහර පෑමාසේ ජේළහර පා වදුළසේක. ඒ ආශ්චර්‍යය දුටු **ශුඩොදන** රජපුරුවෝ පුතණුවන් වහන්සේගේ ශ්‍රීපාදමූලයට ගොස් මෙසේ සැලකළ සේක. "සාමිනි! මම නුඹවහන්සේ උපන්දා **කාල දෙවල** නම් යෂින් වඳ නට එළවූ නුඹවහන්සේගේ ශ්‍රී පතුල්දෙස පෙරළා බමුණගේ මසකයෙහි විනිවිදා දැස සතුටුව වැන්දෙමි. ඒ මාගේ පළමුවන වැඳීමය. නවද නුඹ වහන්සේට පස්මස්වූතල **වස්මහල්ද** දඹගසමුලදී කළාවූ ප්‍රාතිහාර්‍යය දැක සතුටුව වැන්දෙමි. ඒ මාගේ දෙවන වැඳීමය, දැන් මා විසින් පෙරනුදුටු විරූ ආශ්චර්‍ය වූ පෙළහර දැකද නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳිමි. මේ මාගේ තුන්වන වැඳීමයයි කියා වැන්දහ. සුදෙවුන් මහරජාණන් වැඳි කල්හි එකම රජදරුවකුත් නොවැඳ සිටීමට නොපොහොසත්ව සියල්ලෝම වැන්දහ.

මෙසේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සියලු නැයන් වන්දවා අහසින් බැස පනවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. එකල සියලු බඹුහුම් බිදුණාවූ මින්අැතිව එකනවූ ඝත් ඇතිව බුදුන් සමීපයෙහි හුන්නාහුය. ඉක්

කිති අකාල මේඝයක් නැඟී පොකුරුවැස්සක් වටුයේය. ඒ වැස්සෙහි තෙත වන් දිය රැව් දෙමින් පොළොවෙහි දිවෙයි. ඉන් තෙමේනු කැමැත්තෝ තෙමෙති. නොතෙමේනු කැමැත්තන් සිරුරෙහි දියබින්දුවකුදු නොවැටෙයි ඒ ආශ්චර්‍යය දැක භික්ෂූහු බුදුන්ගේ ධර්මසභාගමයෙහි මේඝදූ පොකුරුවැස්සක් වටුයේ ඉතා ආශ්චර්‍යයයි කථාවක් ඉපදවූවාහුය. බුදුරජාණන් වහන්සේ ඒ කථාව අසා වදාරා මහණෙනි! පොකුරුවැසි වටුයේ දැන් මතු නොවෙයි. පෙරත් මාගේ ධර්මසභාගමයෙහි මහාමේඝය පොකුරුවැසි වටුයේමවේදැයි වදාරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත් වත් දස්වා වදාළසේක.

හේ කෙසේදයත්?

අවන්තිය දවස දඹදිව සිවිරට ජයතුරා නම් නුවරෙක් විය. එනුවර මහඹුහුද මැද ඇවිද කෙළයන රළපනනිසේ නිරන්තරයෙන් දිවන්නාවූ අශ්වයන්ගේ හෙසාරවයෙන් හා එසේම නානාප්‍රකාර සවණිකඹල අතුලාවූ නොයෙක් රථයන්හි චක්‍රනාදයෙන් හා හස්තීන්ගේ කුසුඬනාදයෙන් හා සඬ්ඛනාදයෙන් එකතින්නාදවූ සත්‍රිපුරුෂයන්ගේ නානාප්‍රකාර මඬලයන්හි ගයන නටන නොයෙක් නෘත්‍ය ගීතවාද්‍ය ප්‍රසඬ්ගයෙහි ගසනලද මිහි භූබෙර ආදින්හි ගම්භීර නාදයෙන් ශ්‍රවණ රම්‍යණීයවූ ප්‍රවීණ වීණාකාරයන්ගේ වීණාසමරයෙන් හා සපාසවරයෙන්ද නානාප්‍රකාර වෙශභා භූෂණයෙන් යුක්තවූ සම්පත්තියෙන් අනූනවූ යෞවනයෙන් උත්තමයවූ රූපයෙන් මනොහරවූ කුලයෙන් අතිඳිතවූ විද්‍යුයෙන් පරිශුඬව ශරපුමහි තැන් වැසිවූ ක්‍රීඩායෙහි දක්ෂවූ අනන රඬහ වහිරඬහ කාර්‍යයෙහි ප්‍රමාදයක් නැත්තාවූ සත්‍රිපුරුෂයන් ගෙන් ගැවසි ගත්තාවූ නුවරෙක් විය. මෙසේ සියලු සම්පත්තියෙන් සමෘඬ්ධවූ ඒ ජයතුරා නුවර සිවි නම් මහරජෙක් රජ්‍යය කරන්නේය. ඒ රජහට සඤ්ජය නම් පුත්‍රයෙක් උපන්නේය. ඒ සිවි මහරජතෙමේ පුත්‍රයා වැඩිවිය පැමිණි කල්හි ඔහට මදුරජ දුවූ ඵුසතී නම් රාජකන්‍යාව ගෙන්වා අගමෙහෙසුන් කොට රජ්‍යය පාවාදුන්නේය. ඒ ඵුසතී දෙවී තොමෝ පුළුයෙහි කුරතලද මහපින් ඇත්තිය.

මෙයට එකානූවන කප ලොව පහළවූ විපස්සී නම් බුදුන් සමයෙහි මේ ඵුසතී දෙවීතොමෝ රාජධීතාවක්ව ඉපද ඒ විපස්සි නම් බුදුරජාණන් වහන්සේට සදුන් සුණු පූජාවක් කොට මතු බුදුකෙනකුන්ට මවුචන්නෙමියි කරන ලද ප්‍රාර්ථනා ඇත්තී එයින්චුතව දෙව්මිනිස් දෙගතියෙහි සැරිසරා හැසිරෙමින් අවුත් පසු කලක සක්දෙව් රජහට අග්‍රමහෙෂිකාව උපන්නීය. ඉක්බිති ඇය ඒ දෙව්ලොව ආයු ඇතිතාක් සිට පස් පෙරනිමිති පහළවූ කල්හි සක්දෙවිරජ ඇනේ ආයු ගෙවුණ බව් දැන ඇ කැඳවා ගෙන නඳුන්වනයට ගොස් එහි යහනක් සරසා එහි හොවා ඇට මෙසේ කීය. සොඳුර ඵුසනිදෙවිය! තට වර දසයක් දමි. ඒ ගන්‍රුවසී කියා වරදසය කියන්නේ:- සෑම විටයේහි සම්‍ය වසතුවෙක් කිට ප්‍රියද, ඒ ඒ ප්‍රියවූ වසතුව දසදොටසක් කොට ගන්‍රුවයි කීසේය. ඒ දිව්‍ය සත්‍රිය තමා දෙව්ලොවින් චුතවන බව නොදන්න කිස්නිදේවිරජ! ඔබහට නමිස්කාරවේවා, මහාවෘක්ෂයක් පහකරන මහපවනක්සෙයින් අපගේ මේ දිව්‍යලොකයෙන් මා පහකරන්නට මා විසින් කවර අකුශලයෙක් කරන ලද්දේදැයි කිව. එසඳ සක්දෙවිරජ කියන්නේ තොප විසින් පවක් කරන

ලද්දේ නොවෙයි. මට තී අවුදෙන නොවෙයි. තිගේ පින්ද ආයුපද පිරිහිණ. එසේ හොසින් කිමියි කියා නී අපසොරෙන් වියෝවීමක් වෙයි. එබැවින් මා නෙන් ඒ දසවරය ගනුමයි කිය.

එසඳ ඒ දෙවිදු කියන්නී සියල දෙවියන්ට අධිපතිවූ සක්දෙව්රජ ණෙනි! භුක්වියන්සේ මට වර දෙනු කැමැත්තෙහිවීනම් ඒ වරදසය ගනිමි කියා වරදසය ඉල්වන්නී "මම මෙසින් උපන් යොස් මිනිස්ලොව ඉපද සිවිරට සඳමහරජහට අගමෙහෙසුන්ව වෙසෙම්වා, එක්හෑවිරිදිමුවපොල්ලන්ගේ ඇස් මෙන් නිලුපුල් පෙතිපැහැයෙන් යුත් ඇස් ඇතිවෙම්වා, දෙව්දුහු මෙන් අති නිලවූ භාලතා ඇතිවෙම්වා, ඵුසතිදෙවිය යන නම්ම් යුකතවෙම්වා, (සියලු දඹදිව දසදහසක් රජුන්විසින් පූජිතවන්නාවූ යශස්කීර්ති පිරිවර ඇතිවෙම්වා,) අඛඛඩිරාදි සොළොස්සාවතයන්ගේ අඩ්‍යාසයට යොනාවූ ඉල්වූ දෙය නොම සුරුව දෙන්නාවූ ඉස් ඇස් ආදිය ඉල්වූකාල නොපසුබැස දෙන්නාවූ උතතමවූ ගුණයන්හෙන් යුකතවූ රූපයෙන් යසසින් සියලු සතුන්ට ප්‍රියවූ පුතණු කෙනකුත් ලබම්වා, තවද මා ගභීනිවූකල සමෘකාට ගා ගෙදූ දුනුම්වක්සේ මාගේ මඛ්‍යමප්‍රදේශය නූස්නොමඟත්වේවා, මානේ පයොධරයෝ දෙදෙන හැමකල්හි නොනි උඩබලා සිටිත්වා, මා හිස නර නොනැගේවා, සියලු සතියන්ට ප්‍රියවූ මනවඩන්නාවූ වණවත්වූ සියුම් සිහි ඇතිවෙම්වා, රාජාපරාධකොට වධයට පැමිණියවුන් මරණින් ගලවම්සි සිතුකල තමන්ගේ බලයෙන් මුදා හරින්නට සමර්ථ වෙම්වා, (මෝනරුන් කොස්ලිහිණින් විසින් රැව්පිළිරැව් දෙනලද උතතම සත්‍රින් ගෙන් ගැවසීනත් කුරුන්කුදුන් ළදරුවන් හා බිලතුන් අරක්කැමියන් කිළිහුන් විසින් වණනලද සත්රුවනෙන් විසිතුරු දෙර කවුළුවෙන් නෙඹියාවූ පසහතුරුරැවින් යුතු රාජමන්දිර ඇති නොයෙක් මිධුරාහාරපානයන් කව බොව යන ඝොෂායෙන් යුත් මහජනයා ඇති සියලු ගුණයෙන් සමෘඩිවූ සිවිරට සඳමහරජහට අගමෙහෙසුන් වෙම්වා,) කියා ඒ ඵුසනිදෙවි මේ දසවරය ගත. එසඳ සක්දෙවිරජ කියන්නේ සෞඛසෙන් හොබනාවූ ඵුසනි දෙවිය! මා විසින් දුන්නාවූ දසවරය ගෙන සඳමහරජහුගේ සමීපයෙහි වසවයි සමුදින.

ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී දෙව්ලොවින් සැව අවුත් මදුරට ක්ෂත්‍රිය කුලයෙහි උපන. ඕතොමෝ සඳමඩල වැනි මුහුණ ඇත්තිය. නිලුපුල් පෙති වැනි නුවන් ඇත්තිය, කොඳ කැකුළු වැනි දත් ඇත්තිය, රන්වන්වූ ශරීර ඇත්තිය, මනාවූ වට පයොධර ඇත්තිය, යනාදීන් වණිනා කරත් කරත් කියා නිමවා ගත නොහැකි රූ ඇත්තිය. නවයෞවනයෙන් යුකතවූවාය, මහත්වූ ඵෙශ්වයී ඇත්තිය, සාරාසඛ්‍ය කල්පලක්ෂයකින් මත්තෙහිදී බුදුකෙනකුන්ට මවුවෙම්සි පතා ආ මතු මහාමායාදෙවි වන්නිය, එසින් ගොස් මාතෘදිව්‍යපුත්‍රව එහි සිට නිවන්පුර වදනවුන්ගේ ගුණ කවුරු කියා නිමවා ගනිද්ද, මේලෙස ඒ රාජකුමාරිකාව දෙවහනක මෙන් වැඩිවිය පැමිණ වසන කල්හි සිවිමහරජාණෝ ඒ ඛ්‍යවුන්ගේ රූප සොභා අසා මනත් පෙරහරින් ගෙන්වා පුත්‍රවූ සඤ්ජය කුමරහට අගමෙහෙසුන් කළහ.

මේසේ ඒ දෙදෙන සුවසේ වසන සමයෙහි පිරූ පාරමිතා ඇති ත්‍රෝවට ඇසක් වැනිවූ මතු බුදුවන මහතාණෝ සිය්ලු ලෝවැසියන් සසරින් මුදනු සදහා දෙව්ලොවින් සැව අවුත් ඵුසති දෙවීන්ගේ කුසහිළිසිඳගත් කෙණෙහිම,

සැටදහසක් පමණ කුමාරයෝ ඒ ඒ අමාත්‍යයන්ගේ නෙවල සත්‍රින් කුස පිළිසිඳ ගත්හ. ඔවුන් පිළිසිඳගත් කෙණතිම මහබෝසතාණෝ මද්‍රකුස පිළිසිඳ ගනුත්ම දෙව්ලොව මෙබඳු දෙයළෙක් උපන. දවස සලකුණයක් ඛන වියදම් සොව සඳන්හල් කරවා දිළිඳුවූ යාචකයන්ට දන් දෙන්නේ දෙළ උපන. (සාවි ඉවිද තමන් සමීපයට ආ යාචකයන්ට තිති මැදට පැන ඇන මස් පලහා දුන්නාවූ, සිවිරජව තමන් කරා ඇස් ඉල්වා ආ ශක්‍රබ්‍රාහ්මණයාට නිලුපුල් මල්සඳුන් වැනි තමන් වහන්සේගේ දැස ලෝවැසියන් හඬව හඬවා තමා සියඇතින් උපවා දුන්නාවූ මහතාණන් වහන්සේ දශපාරමිතාව ඉදුන් පත්ව සිව මැනියන් කුස පිළිසිඳගන්නවුන්ට මෙසේවූ දෙළෙක් උපදිනි යනු කවර ආශ්චර්‍යයක්ද?) ඒ තිමියාණන් මවුකුස පිළිසිඳගත් දවස් පටන් දඹදිව නොයෙක් රාජ්‍යයෙහි රජදරුවන් එවන රත්රුවන් ආදිවූ නොයෙක් පඬුරෙන් අතුරු නැතිවිය, සඳමහරජාණෝ බිසවුන්ට උපන් දෙළ අසා නුවර සඳන්හල් කරවා දෙවීන් දෙළ නිවා යාචකයන් සිත් නිවා දන්දෙන කල්හි ක්‍රමයෙන් දසමසක් පිරුණේය. එසඳ බිසවුන්ට නුවර පැදකුණු කරන සිහෙක් උපන. සඳ මහරජාණෝ එපවත් අසා අමාත්‍යයන් කැඳවා නුවර සඳවන්නාහු කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා දෙර දෙර කෙහෙල් තොරණ, රන්තොරණ, රිදී තොරණ, සත්රුවන්තොරණ, පිළිතොරණ, යනාදි තොරණ පඬුරුනින් හා කෙහෙල් තැඹිලි ධජපතාකාදීන් සදවා තැන තැන පුන්කලස් තිරිකුඩම් තබා ඒ පුන්කලස රන්පැන රිදීපැන තබා ඒ වටා පහන් නංවා මේසේ සියලු නුවර දෙවිනුවරක්සේ සදවා මනහර කොට රථයක් සරහවා බිසවුන් එහි වඩා හිඳුවා මහත්වූ පෙරහරින් රාජ වීථියට බැස ගමන් ගත්හ. සඳට පළවූ ගමන් ගත් තරුකාලන් මේන් සෑම මෙහෙතැන් පෙරටව අවුත් පිරිවරා ගත්හ. එසේම සිට සලන සුදුවාමර රන්වාමර රන්තල්වැට රිදිතල්වැටින් වසන්තයා සියවෙසින් ආවසි සිතම්. සරසුන් විසින් ගත් සුදු සේසතින් එදා ඒ පුරය දෙව්පුරයක්ව ගියේයයි සිතම්. කිරිවුහු: ඔදවැඩි දුවන රළ පනිසේ එනුවර දිව සිටින අශ්වසමූහයෙන් හා හස්ත්‍යාලඞ්කාරයෙන් සැරහී සිටින පළිත වැනි ඇත් සමූහයෙන් හා රිදීමයවූ පස්වණක් පැහැයෙන් දිලීයෙන ධජපතාකායෙන් හා විසිතුරුවූ ඇතුන් අසුන් රථාන් ආදින් අදනා මින හර රථපෙළින් හා සත්රුවන්මය ධජපතාකා පෙළින් හා රන්වන් කලස පෙළින් එනුවර බැලු බැලුවන්ට අමෘතාස්ඵනයක් වැන්නැයි සිතම් ඒ සත් රුවන් මඩුයෙහි සිට නටන මනහර යොවුන් පත් සත්‍රිහු නටාගෙන එන කල දිව්‍යස්ත්‍රීන් කැඳවතියි සිතම්. රැකවල් බල බලා ඒ ඒ දිගින් දිවන කුරුන් පෙළින් හා නපුංසකයන් විසින් පිරිවරන ලද දසමෙහෙතැන් විසින් මනහර සෙබළුන් විසින් ගසනලද බලත් ඛඩින් හා ඒ ඒ තැන මඩුලු බැඳ ගසන ලද හෙරිතූර්‍යනාදයෙන් හා අසුන්ගේ හෙසාරවයෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා ඒ ඒ දිගින් එන සෙඛායෙන් හා මේසේ මඟ්ත්වූ පෙරහරින් බිසවුන් නුවර පැදකුණු කරවමින් ව්‍යාපාර වීථියට වන් සඳ බිසවුන්ට විලිපහරනට පටන් ගත එපවත් ඇසූ සඳමහරජාණෝ එතෙණෙහිම පසුතුරු මඩුවක් කරවා වටකිර බඳවා රැකවල් ලැවූකල්හි ලොවට ඇසක්වැනිවූ යාචකයන්ට ධනරාශියක් බදුවූවිරූ භාරම්තා ඇති අප මහබෝසතාණෝ මවුකුසින් බිහිවෙත්ම අඩ දිගුකරමින් මෑනියන් වහන්ස! දන් දෙන්නට සුදුස්සක් ඇද්දැයි කිහ. එබස් ඇසූ මෑනියෝ දහසින් බැඳි වියල් ලක් මහබෝසතාණන් දික්කළ අත තබා ලූහ. (නුවණැසැ සෙඛාවූ වෙස තුරු කුමාරයන් කී තෙපුල් කවරනම් සත්‍යකුගේ කතට අමා නොවේද? කවර නම් සතෙක් ඊට සතුරුවේද? කාට නම් අප්‍රියවේද?)

ඒ ආශ්චර්‍යවූ පුරුෂවූ මහතාණන් උපන්දම ඔවුන් පූජිතයෙහි කළාවූ කුශල බලයෙන් සොළොස්කුටයසේ රිදී පර්වතයක්සේ අතිධවලවූ **පණ්ඩර** නම් මහලැත්පොව්වකු දෙටියෝ තමන්ගේ ආනුභාවයෙන් ඇත්හල ලා සියහ. බෝධිසත්ත්වයන්ගේ ප්‍රියමහ රජාණෝ පුහණුවන්ට නම් තබන්නාහු වහුමේදයෙහි **නිපුණ** බව්‍රූණන් ගෙන්වා ව්‍යාපාරවීථියෙහි උපන් හෙයින් **වෙස්සන්තර කුමාරයෝය** යි නම් තැබූහ. ඉක්බිති රජපුරුවෝ මෙවැනි උත්තම පුරුෂයෙක් හුදසලාව නූපදනේයයි ඇමැතියන් කැඳවා සියලු නුවර පරීක්ෂා කරවා එතැ උපන් කුමාරවරුන් සැටදහසක් දෙන ගෙන්වා පුහණුවන්ට පිරිවර කොට පාවාදුන්හ. අතිදිඝාදි දෙඝයන්ගෙන් තොර මිහිරිතිරි ඇති ලක්ෂණ සම්පන්න සුසැටක් කිරිමවුන් තෝරා ගෙන උන්ට සම්පත් තබා දුන්හ. මෙසේ සැටදහසක් කුමාරවරුන් පිරිවරා තෙළනා බෝසතාණන් වහන්සේ නැකත් තරුමැද බබළන පුන්සඳක්සේ කුමාරුභරණයෙන් සැදී රජ්‍යශ්‍රියෙන් දිලිහි දිලිහි වැඩෙන කල එක්හැවිරිදි අවස්ථායෙහි තමන් පලදවාලූ ලක්ෂයක් වටනා ආභරණ කිරිමවුන්ටම දන්දුන්හ. පියමහරජාණෝ ඒ පලදනා දන්දුන් බව අසා සතුටුව මාහැඟි පලදනා යවා පලදවති. බෝසතාණෝ තමන් පැලඳවූ පලදනා දන්ගන්නා සිඟන්නන් නැත්තෙන් නවවාරයක් කිරිමවුන්ටම දන් දුන්නාහ. එසේ වූවද ළඳ බොළඳ වයසින් එක්ඇවිරිදිය, මුවෙන් නොහළ කිරි සුවඳ ඇත්තේය. එසේ කල මේවැනි දානාධ්‍යාශයෙක් මුළුලොව කවුරුන් කෙරේ ඇද්ද? මෙසේවූ අද්භූතයක් දුටුවිරුවෝ ඇද්ද? මෙවැනි ආශ්චර්‍යයක් අසූ විරුවෝ ඇද්ද? මෙසේ විස්මයක් කොළෝ ඇද්ද? (ඒ මහතාණන් හා එක්වමෝවා එතුමා උපනුපන් තැන උපදුමෝවා මෙවැනි අදහසක් සියලු සතුන්ට වාසනාවේවා.)

මෙසේ ළඳබොළඳව සිට දන්දීම කෙළී කොට සිතා දන්දෙන්නාහු අවඇවිරිදිවූකල **වෙසතුරු** කුමාරයෝ වෙසතුරු ප්‍රාසාදයෙහි ශ්‍රී යශන්මසානයෙහි පහවනලද අස්නෙහි පලක් බැඳ හිඳ සිතතසේක් මම දානක්‍රියා යෙහි සුව නොවිඳ බොහෝ කලක් ඉක්ම ගියේය. ඒ දැන් අවඅවුරුද්දෙක. තවද මෙසේම දවස් යේදෙහෝසි සිතන්නාහු මහවතුරක් මෙන් මා දෙන රන්රුවනී ආදිවූ දානප්‍රවාහය කැට කැබිලිති සේ මා සිත් නොපිනවයි. ඉදින් යාචකයෝ ඇවිත් සිට මහරජ! ඔබගේ නිලුපුල් මල් සඟලක් වැනි ඇස් උපුටා දෙවයි කිවුනම් ඒදිගු පුළුල් නිල් නුවන් දෙක තල් ලොදු දෙකක්සේ උපුටා අත තබාලම්. යාචකයෝ අවුත් මහරජ! ඔබගේ හෘදය මාංශය මට දෙවයි කිවුනම් තියුණු ශස්ත්‍රයෙන් ළය පලා පියා හදවත දෙම්. එසේම යමෙක් ලේ ඉල්වූ නම් තෙලියත්හි ලා පෙළා ලේ දෙම්මය. යම් පුරුෂයෙක් ඉස දන් ඉල්වූනම් මාගේ මිහුදු නඩුවෙන් ඉස සිඳ දෙම්මය. යමෙක් අවුත් මට ගැනිමෙහෙවර කරවයි කිවුනම් මුළුරටවාසීන්ට මා ගැනි බව දනුවයි අස්වා කියා ගැනි මෙහෙ කෙරෙම්මයයි මෙසේ සිතන් සිතන් දෙලක්ෂ සතලිස්දහසක් යොදුන් ඝනඝඩ බොල් මහපොළොව අතෙක ගජිනා කෙරෙමින් සතුටුව නටන්නට ඔත. එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උස ඇති මහමෙරු පර්වතයද ඒ මහතාණන්ගේ දානචේතනා බලයෙන් තමාගේ කුළු නමැති අත් ඔසවා නටන්නියසා මෙන් නටන්නට වත. ඒ මහතාණන්ගේ මහත්වූ දානාධ්‍යාශ බලන්නකු මෙන් ඒ සප්තකුල පර්වතයෝ කුල්මතින් නටමින් ඔවුනොවුන් ඇඟ ගැසෙන්නට වත. මෙසේ මහපොළොව ගුගුරුවා

දන්දෙන්නාවූ මහතාණෝ සඳුන්රිත අතුඅතලෙලෙන කළුවැල්ලියක් සේ තමන්ගේ රූපශ්‍රී ප්‍රභූ ලතායෙන් හොඬවමින් ක්‍රමයෙන් වැඩී සොළොස් ඇවිරිදි වයසට පැමිණ සුසැට ශිල්පයෙහි හා අට්ඨාදස විද්‍යයෙහි නිපුණවූහ.

එසමයෙහි පිය මහරජාණෝ පුතණුවන්ගේ කීර්ත්‍යාදි හා යශෝ ශ්‍රී බලා ත්‍රිභිනමැති සාගරයාගේ උත්පාතන වෙශයෙන් මාගේ පුතණුවන්ගේ රාජ්‍යශ්‍රී මා ඇස් හමුයෙහි මාගේ නුවන් දැලිදුරු හළ මැනවැයි සිතා **මෙහිසරට** රජ්ජුරුවන්ගේ දුවු සියලු සත්‍රීන්ගේ රූපශ්‍රී එකතැන කැටිකොට මවාලූ රූපයක් බඳුවූ රූපශ්‍රීන් දිලියෙන්නාවූ **මද්දදෙවීන්** හෙන්වා මිහුල් පෙරහරින් මහබෝ සතාණක්ට අගමෙහෙසුන් කොට පාවාදුන්හ. සඳමහරජාණෝ පුතණුවන් වොටුනු පලඳවා තමන්ගේ රාජ්‍යශ්‍රීය පාවාදි පුතණුවන්ගේ රාජ්‍යශ්‍රී බල බලා සතුටු සොම්නසින් පින පිනා වවසන කල්හි බොධිසත්ත්වයෝද සිසුසහරුවනින් හා දශරාජධර්මයෙන් නොවෙන්ව රාජ්‍යශ්‍රී විද සහතයෙන් මවුපිය දෙදෙනාව වැඳ පුදා උපස්ථාන කොට සියලු යාචකයන්ට සඳන්හල් කරවා අනෙකප්‍රකාර යෙන් දන්දිවසන්නාහ. එසේවසනකල පුතණුකෙනකුන් හා දියණිකෙනකුන් ලදින් වතුපේදශයහි නිපුණ බමුණන් හෙන්වා පුතණුවන්ට **ජාලිඝ** කුමාරයෝ යසිද දියණියන්ට **කෘෂ්ණාජිනාවෝඝ** සි නම් තබා මේසේ සුවයෙන් රාජ්‍යශ්‍රී අනුභව කරන්නාහ. වෙතියරට රජ්ජුරුවන් හා **ජයතුරා** නුවර රජ්ජුරුවන් හා රටවැස්සන් හා සතුටුව දෙනුවර වැස්සෝ නොවෙනස්ව වසන කල්හි **කලිඟුරට** වැසි නැතිව දුර්භික්ෂයක් ඇතිවිය. එරට මනුෂ්‍යයෝ ජීවත්වන්නට නොහැක්කාහු සොරකම් කරන්නට පටන්ගත්තාහුය. දුර්භික්ෂයෙන් පීඩිතවූ දනවි වැස්සෝ රාජාඩඟණයෙහි රැස්ව මාත්වූ ශබ්ද පැවැත්වූවාහුය. රජ්ජුරුවෝ ඒ ශබ්දය අසා ඔවුන් කැඳවා දරුවෙනි! තෙපි කුමක් නිසා ඝොෂා කරවිදැයි ඇසූකල දෙවයන්වහන්ස! වැසි නැත්තෙන් ජනපදය දුර්භික්ෂයට පත්විය. එහෙයින්ම සොරුන්ගෙන් පීඩාවට පත්විසයි සැල කළාහුය. රජ්ජුරුවෝ එසේනම් දරුවෙනි! වැසිවස්වන්නෙමිසි ඔවුන් යවා සිල්සමාදන්ව පෙහෙවස් වසන්නේද වැසිවස්වන්නට නොහැකිවූවාහුය.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ නුවරවැසියන් කැඳවා දරුවෙනි! මම පෙහෙවස් වැස සීලසම්පන්නවද වැසිවස්වන්නට නොහැකිවිය. දැන් කුමක් කරමෝදැයි ඇසූහ. ඇමැත්තෝ කියන්නාහු ඉල්වූ දෙයක් නැතැයි නොකියා දන් දෙන්නෝ වෙස්සන්තර රජ්ජුරුවෝය. උන්ට දෙවියන් විසින් දෙනලද සඞ්ඛයය සෙවතමය පණ්ඩර නම් වැසි වස්වා පියන තරම් මහානුභාව ඇති හැළි ඇහෙක් ඇත. ඒ ඇතු ගෙනාවොත් අපගේ රට වැසි වැස දුර්භික්ෂ භය සන්හිඳෙයි කිහ. එසඳ රජ්ජුරුවෝ වෙදත්‍රයෙහි නිපුණවූ බමුණන් අටදෙනකු ගෙන්වා කියන්නාහු බ්‍රාහ්මණයෙනි! වෙස්සන්තර රජ්ජුරුවන්ගේ වැසි වස්වන ඇළි ඇතෙක් ඇත. තෙපිගොස් ඔහු ඉල්වාගෙන එවයි කිහ. බමුණෝ රජ්ජුරුවන් ගෙන් සම්මගෙන නොබෝ දවසකින් සිවිරටට වන්නාහ. බුඩාඩකුරුවූ ඒ වෙසතුරු මහරජාණෝ එදවස් පෝය දන් දෙන්නට සතර දෙර සතරදන්හල් විවාරන්නට යන්නාහු සුඛදපැහින් ඉස්සොධා නහා සළු පෙරළා සළු නැඳ සුවඳවිලවුන් ගල්වා සුසැට ආභරණයෙන් සැරහී දෙවෙනුලීලායෙන් සිට ඇතු සඳ ගෙනෙවයි කිහ. එවිට ඇතු සඳ ගෙනෙන්නෝ ඔහු සතරපය සාරලක්ෂණයක් වටනා පලඳනායෙන් සඳ යට බඳ ලක්ෂණයක්

වටහා පලසකින් වසා පිට රුවන්දුල් මුහුදුල් කිසිණිදුල් මිණිරුස් පෙළින් හා මේ ආදී සත්රුවනින් ඇතු සද, එළවූ සද රන් හිණින් ඇත්කුඹයට පැන නැඟී දළපුඩුසේසත් නිසට කරවා සත්රුවන් මාසල්වලව රජ සුවරජ ඇමති මිඹුලු පිරිවර සියුරන සෙනහ පිරිවර ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන් නැහෙන හිර දියායෙහි දන්හලට යන රජ්ජුරුවන් බමුණෝ දැස දනව රැස්වූ සිහන්නන් බොහෝදෙන හෙයින් මේහි රජ්ජුරුවන් දැකිම උගහටයයි කියා දකුණුදිග දන්හලට යන මහ උස් තැනක සිටියාහුය. රජ්ජුරුවෝ දකුණුදිග වාසල සමීපයෙහි සිටි බමුණන් අවදෙනා දැස උන් සිටි දිහාවට ඇතුමෙහෙයූහ. බමුණෝ අවදෙන අත් නහා සිට **"ජයතු භවං වෙස්සන්තර මහාරාජ!** යි ආශීර්වාද කොට සිටියහ. රජ්ජුරුවෝ මේ බමුණෝ මඳ දෙයක් නොඉල්වතියි ඇතු ආසන්න කොට බමුණෙනි! තොප කැමැත්තක් ගනුවයි කිහ. එකල බමුණෝ කියන්නාහු යියලු සඬයන්ට මිවුපියන් බදුවූ රජ්ජුරුවෙනි! තොප නැඟි තෙලෙ ඇතු අපට දන් දෙවයි කිහ.

එබස් ඇසූ මහබෝසතාණෝ කියන්නාහු බමුණෙනි! මාගේ ශරීර යෙන් භාගයක් නොඉල්වා නිලුපුල්වන් ඇස් උපුටා දෙවයි නොකියා ඇතුම් ඉල්වන්සි මඳක් දෙම්නස්ව යහපත බමුණෙනි! තොප කැමැති ඇතු තොපටම දන් දෙම්හයි සොම්නසින් පින පිනා දන්දෙනු පිණිස නැවත ඇතු සරා වන්නාහු ලක්ෂයන් වටහා රත්පලසකින් පිට සඳවා ලක්ෂයක් වටහා මුතු දුලය, ලක්ෂයක් වටහා මිණිරුස්දම් පටලය, ලක්ෂයක් වටහා රන්දුලය, ලක්ෂයක් වටහා මැණික්දුලය, එහි බඳනා මිණිදෙක දෙලක්ෂයක් වටනේය. භාණ්ඩාභරණදෙන දෙලක්ෂයක් වටනේය. වටංසන තුන තුන්ලක්ෂයක් වට නේය, යට බඩ සැදූ පලස ලක්ෂයක් වටනේය. කුඹ සැදූ ආභරණය දෙලක්ෂ යක් අගනේය. දැදළ සැදූ ආභරණ දෙලක්ෂයක් අගනේය. සහරපය සැදූ ආභරණ සාරලක්ෂයෙකි. වාලධිය සැදූ ආභරණ ලක්ෂයෙකි. ගෙලෙහි මුතුදුල ලක්ෂයෙකි. ඇතු නැහෙහි හිණ ලක්ෂයෙකි. ඇතු බත් කවන රන්භාජනය ලක්ෂයෙකි. මෙසේ ඇතු සැදූ ආභරණම සුවිසිලක්ෂයක් අගනේය. පිට මැණිකය, මුදුනෙහි මැණිකය, මුතුහරෙහි මැණිකය, අකුස්සෙහි මැණිකය, කණ්ඨ්‍යෙ වෙළන මුතුහරෙහි මැණිකය, ඇත්කුඹෙහි මැණිකය, යන මේ මැණිකසය අනඝිය, (නොඅගෘන්ය) මෙසේ අඝ්‍යානඝී සියලු ආභරණයෙන් ඇතු සද, ඇත්වෙදුන් ඇත්රැටියන් ඇතුළුවූ පන්සියයක් කුල වාසින්ද ඇතු නාවන කවන පොවන ඔහට සියලු කළමනා මෙහෙයට නිසි පරිවාරජනයන් ද දී බමුණන්ට ප්‍රසාද දී සිත්ගෙන රුවන්කොණ්ඩියෙන් අතපැන් වත්කොට එකාන්තයෙන් ලොවුතුරා දැදු වෙම්වසි කියා ඇතු දන් දුන්හ. ඒ මහතා ණන් ඇතු දන් දෙත්ම මහමෙර නැමී නමස්කාර කෙළේය. මහපොළොව සතුටුව හුනුළේය.

ඉක්බිති ඒ බමුණෝ දකුණු දෙරදී ඇතු ලදින් ඇතු පිට නැඟී මහජනා කීර්ණවූ රාජවීථියට බ හ. නුවරවාසී මහජනයෝ කියන්නාහු එම්බා බ්‍රාහ්මණ යෙනි! අපගේ ඇතු නැඟී නෙපි කොයි ගෙනයවූදැයි කීවාහුය. බමුණෝ කියන්නාහු වෙස්සන්තර මහරජහු විසින් අපට ඇතු දෙන ලද්දේය. නෙපි කවරහුද? කෙසේ වලහාවිදැයි ගසා විදාර මුඛ විකාරාදි උසුලු විසුලු කොට බැණ ඇතු නැඟි ගෙන ගියහ. එකල රජ බමුණු වෙළඳ ගොවි ආදීන් හා අදිකාර සෙනෙවිරත් ඇපා කියා පඤ්චප්‍රධානවූ මණ්ඩලිකඅමාත්‍යයෝද මුළු මුළුව

ගෙන තනතනමින් පුපුරමින් දත්කමින් සියලු නුවර ඇලලී ගොස් සිටි වෙස්සන්තර රජාණන්ගේ පියාණන් සඳමහරජාණන් කරා ගොස් හඬා වැලපී සවාමිනි! අප දන්වන්නක් ඇසුව මැනව. සූචිසිලාකූඨයක් ආහරණයෙන් සැදුනාවූ සියලු හස්ත්‍යාලඞ්කාරයෙන් ඛඩ්ගන්නාවූ සර්වාඞ්ගය අතිඛවලවූ වැසි චස්වාලන ආනුභාව ඇති දෙවියන් විසින් මිනිස්ලොවට දුන්නාවූ හස්ති ශ්‍රී යෙන් දිලියෙන අපගේ ඇත්රුවන නුඹගේ පුත්‍රණුවෝ කලිතුරවින් ආ ඛම්බණන්ට දන්දෙමින් අප නැසූ සේක. අනේ සවාමිනි! ශ්‍රද්ධාව ඇතියා නම් තෙසු ඇතුන් දන් දී පිය නොහැකිද? නොයෙක් රන් රුවන් දී පිය නොහැකිද? මේසා දුර්ලභවූ මුළුලොවට වැඩ සිටිකරවූ ඇතු දන් දුන්නේ කුමටදැයි කිය කියා හඬන්නට පටන්ගත්තාහුය.

එකල්හි සඳමහරජාණෝ නුවර වාසින්ගේ රැහැනි බලවත. කළ මනා කිම්ද්‍යෝහෝසි සිතා බාලයන් විසින් නොකළමනා දෑ කළ කල උන්ට තොප කැමැති දඹුවමක් කරවන්නමෝ ෙවිදැයි කිහ. එවිට නගරවාසිහු මදක් සන්හිදී කියන්නාහු වෙස්සන්තර රජපුරුවන් දහසෙයි ලකත් නොපිළිවන. දිවිගනුත් නොපිළිවන අපගේරට හිඳ අප නැසූ තැනත්තන් රටින්දුරුකොට චඞ්කගිරි නම් පර්වතයට යවන්නා කැමැත්තම්හ. අදම යැවුව මැනවයි කිහ. එසද සඳමහරජාණෝ කියන්නාහු දැන් මුන්ට මිහිරිකොට කියවා පදුව දුටුවක් කරම්හයිසිතා මහජනයාටකියන්නාහු අඹුදරුවන්ට සමුදී සෙට යනපරිද්දෙන් අවකාශ දෙවයි කිහ. ඒ ඇසූ නගර වාසිහු සවාමිනි! නුඹවහන්සේට හැනුනක් කළ මැනවයි වැඳ සවුගෙන නැගී ගියහ. එසද සඳමහරජාණෝ මහාශෙනිව නුවර වාසින් කිපුණු බව පුතණුවන්ට කියා යවන්නාහු **ඝණෝ** නම් ඇමැත්තා යැවූහ. ඒ ඇමති ගොස් දිව්‍යවිමානයක් මෙන් සැදුණු ප්‍රාසාදයෙහි ඇමතියන් පිරිවරා ඇතු දන් දුන් සතුටුසොම්නසින් පින පිනා ශරත් කාලයෙහි නැගි පූර්ණචන්ද්‍රමණ්ඩලය පරිද්දෙන් වැඩහුන් චෙසකුරු මහරජාණන් දැක වැඳලා පියරජපුරුවන් කියා එවි හසුන් නියන්නට හයව ශ්‍රීප්‍රාදය වැඳ වැඳ හඬා නැගී නොසිටියේහ. බොධිසත්වයෝ අත අල්වා නහා සිටුවා තෝ නොබා කියවයි වදළහ. ඇමති තෙමේ කියන්නේ සවාමිනි! ඇලි ඇතු දන් දුන්හයි නගරවාසිහු කිපී බොහෝදෙන රැස්ව නුඹවහන්සේගේ පිය මහරජාණන් ළහට පැමිණ නුඹවහන්සේ මේ නුවරින් පහකොට සෙට චඞ්කගිරි නම් පර්වතයට යවන්නට සම්මත කළහයි කිහ.

එබස් අසා වෙස්සන්තරමහරජාණෝ සිතා පහළු කොට වදරන්නාහු මා අතින් ඇස් ඉල්වා එත් නම් මනාමය, මස් ඉල්වා එත් නම් මනාමය ලේ ඉල්වා එත් නම් මනාමය ඇඟින් අඬියක් ඉල්වුනම් මාගේ ශරීරය වෙන් වෙන් කොට දෙම්මය බාහිරවූ ඇතු දන්දුන්හයි වරද කොට සිවිරට වාසිහු රැහැනි වුනම් මැනව, ඒ වඞ්කගිරි ගමන මට මැනව, මා දෙන දන් නොනවත්වමි. දුක් බොහෝවූ ගැලවෙන්නට දුර්ලවූ සසරෙහි උපන්නන්ට දුකඵල සුව මිස අනික් සුවයෙක් නම් නැහ. පින් නොකටයුතුයයි නගරවාසිහු කියත් නම් චනවාසයට යන බව ඉතා සිත් කලුය, නගර වාසිහු කිවා කරම්හ, උන් කිවා මුදුන් පත් වේවයි නගර වාසිහු බොහෝ කලක් ජීවත් වෙත්වයි,ඇසිල්ලකුත් සියලු ජනයාට මා පිණිස කලකිරිමක් නොවේවයි වදරාකන්නාහ නම් ඇමැත්ත! බල එකක් කියමි, පියාණන්වහන්සේට කියා නුවර වාසින් කැමැතහොත්

සෙට සප්තාහජාත මහදන්දී පියා අන්ද වලට යනු කැමැත්තෙමි. එපවත් පියාණන් වහන්සේට කියවයි වදුරා සහතා නම් අමාත්‍යයා යවා තමන් වහන්සේ ළඟ සිටි සෙනෙවිරදුන් කැඳවා කියන්නාහු ඇතුන් සත්සියයක, අසුන් සත්සියයක, රථ සත්සියයක, සත්‍රින් සත්සියයක, දෙනුන් සත්සියයක, දැසින් සත්සියයක, දැසයන් සත්සියයක, යනාදි සියල්ලෙන් සත්සිය බැගින්ද නානා ප්‍රකාරවූ ආභාරපානාදියද යන දියයුතු සියල්ලම පිළියෙළ කරවයි අමාත්‍යයන්ට විධාන කොට හුනස්නෙන් නැගි සිංහවිලාසයෙන් මදුදෙවින් උන් බිසෝගෙට ගොස් ශ්‍රී යහන් මඤ්චකයෙහි වැඩහිඳ බිසවුන් කැඳවත් බිසව් අවුත් ත්‍රිපාදය වැඳ සිටියාහ. එවිට රන්ලියක්සේ සිටි මදුදෙවින් කැඳවා කියන්නාහු බිසවුනි! මා විසින් දුන්නාවුද දෙමවු පියන්ගෙන් ගෙනාවා වුද නොයෙක් රන්රිදි මුතුමැණික් ආදි සියලු ධනය නිධාන්කොට තබවයි කිහ. බිසව් කියන්නාහු සවාමීනි! නුඹවහන්සේ පෙර දන් දෙන්නට කියන බව මුත් නහා නියන්නට නොකියනසේක. දැන් කුමක් සඳහා මෙසේ කි සේක්දැයි විමැවිස්සාහ. වෙසඹතර රජ්ජුරුවෝ කියන්නාහු සොඳුර! නහා නිබිම නම් දන්දීමය දන් නොදෙන්නාහු විලිකුන් ඵලය වැළඳ ගත් දිමියන් වැන්නාහ. තුමූද නොනති, අනුන්ද නෑ නොදෙති, එසේ වුවාහු පරලොවට වසතු නහා නොතබන්නාහු වෙති, එසේ හෙයින් නහා තබවයි කියේ නම් දන් දෙනු සඳහාමය, මනාවූ තපස්වීන් නමැති ක්ෂේත්‍රයෙහි බිජුවට බොහෝ රොපනය කරන්නට කියෙමි වේදැයි වදාළසේක. බිසව් කියන්නාහු නුඹ වහන්සේ හැම වේලෙහිම දන් දීමෙහි සිත් ඇති බව නොදන්නාසේක්ද? යට අමුතුව මෙවැනි බස් කියන්නට කාරණා කිමිදැයි කිහ.

එකල්හි වෙසතුරුමහරජාණෝ කියන්නාහු සොඳුර! අප ඇතු දන් දුන්හයි දෙඹ නොට නගරවාසිහු කිපි අප මෙරට ඉන්නට නොදී වඞ්කගිරි පර්වතයට යන්නට සම්මත කළහ. එසේහෙයින් අප වනයට යම්හ. අප ගිය හයි දළ සෝදුකින් නොතැවී සුවසේ ජීවත්ව දරුදෙදෙනා කෙරෙහි දයා ඇතිව නොප දිවිරැකුමෙහි සිහි ඇතිවව, අප ගිය කල තොප රක්ෂා කරන සවාඹිකෙනකුන් ඇත. උන්ට කීකරුවව, අත්පා මෙහෙකරව, තවද දරුදෙ බිඟින්නන් කෙරෙහි බියපත්වයි කිහ. එකල කාමරතියට අනඛයා බදුවූ සරසවතියට බ්‍රහ්මයා බදුවූ වෙසතුරු රජ්ජුරුවන් වහන්සේ මෙසේ කියත්ම රූපශ්‍රීන් සියලු සත්‍රින් කෙරෙහි අග්‍රවූ මදුදෙවි බිසව ළෙන් නැඟි සොකාග්නීන් තැවෙන්මින් කඳුළු ඉසිමින් සුළඟින් වැනෙන්නාවූ රන්ලියක්සේ වැනෙමින් පිදෙමින් ළඟ අල්වාගෙන සවාමීනි! මේ කුමන බසෙක්ද? මෙසේ නොඉව සිය හැක්කක් මා කන කුමට කිණිද? නුඹවහන්සේගෙන් වියෝව ජීවත් වීමට වඩා නුඹවහන්සේ හා කැටිව මියයාම උතුම, මීනියා රාජ්‍යශ්‍රිය කැටිව බෙදා වළඳා නුඹවහන්සේ කෙරෙහි අගමෙහෙසුන් ශ්‍රීලදින් ඉඳ දැන් ඔබ වලට යාදි අපි මේ නුවර ඉඳින්නන් කෙරෙහි ඉදුමෝදැයි කියා පළමුකොට මාගේ දෙදරුවන් වඩාගෙන නුඹට පළමු කොට මා වලට යන නියාව නොදන්නේද සවාමීනි! කියමින් තමන් ළෙහි ඇවිලගත් ශොකගිනි ඒ මහතාණන් හා කැටිවයෙමි යන සිත් නමැති විල්හි ගලා නිවන්නාහු දැන නමැති සත්‍යක්‍රියා දෙඹයට කිපි නගරවාසීන් සිත් ගන්නට නොපිළිවන. නුඹවහන්සේ වනාන්ත රයෙහි වැඩහිඳිම මැනවැයි බිසවුන් වනවර්ණනාව කරන්නාහු:— රජ්ජුරුවන් වහන්ස! ඒ හිමාලයෙහි මල් පිපී වැඟිර ගිය කල රමණීය මල් යහන් මැද

කැලි කදුරු හා මුළු බැඳ සිටිනා මුවදෙනුන් මද මත් රැව් දිදී දිවන වෙහෙල මුවකැලුන් දක්නාවූ අපට රාජ්‍යශ්‍රී සඳහන් නොවෙයි. ඒ ඒ තන්හි සෙබඩන් මැද බැස නැටුම් ගත් මත් මොනරුන් දකුත් රාජ්‍යය සිහි නොවෙයි. ඇති මුළු පෙරටු කොට සතහ සතහා යන මිතැතුන්හා නොයෙක් මිල් පල්ලෙන් ගැවසී ගත් හෝ වැල්ලේ සිට ලැහැප් බැඳ කෙළනා මස්කැලුන් හා එසේම නොයෙක් වනමල් පැලඳ මඩුලු බැඳ ලිය හී නහා ගායනා කරන ලියකිදුරන් මැද නැටුම්ගත් කිමපුරුෂයන්දකුත් අපට රාජ්‍යය සඳහන් නොවෙයි. පිපි සිටි සල් සපු නා පනා සලල අගරු දේවදූරු නදුන් සඳුන්ආදි නොයෙක් රුක් රජුන්දක්නාවූ අපට රාජ්‍යශ්‍රීය සඳහන් නොවෙයි. කවර නම් දුහෙක් සඳහන් වේද, වනමල් පැලඳ රුක්සෙවනින් රුක්සෙවනට ගොස් කෙළනා දරුදෙබි භින්නන්දකුත් අන්කවර නම් දුහෙක් සිහිවේද, සවාමීනි! නුඹවහන්සේ ඇන් සල්හි වඩා හිඳුවා වනමූල් වන ඵලා ඵල කඩාගෙනෙර්මට මහාරයසි යනාදින් මද්‍රිඛිසවි හිමවත වසන කෙනකුන් මෙන් හිමාලය වර්ණනාව කළහ.

එකල්හි ථූසති දෙවිය පුත්‍රයාගේ මේ කටුකවූ හස්න අසා පුතණුවන් කෙරෙහි ඇත් ශොකයෙන් හඬමින් කියන්නාහු සෙලින් හී මියෙම්මය, දිව ඇද කා මියෙම්මය, වසකා මියෙම්මය, ගිනි වැද මියෙම්මය, මදවරදකුත් නැති මාගේ පුතණුවන් දන්දුන් දෙඅයට වනයට යවත් නම් මහරජ! තොපගේ මේ නුවර යම් තැනක මී සැලූකල මැස්සන් පලායන් නාසේ සියල්ලන් සාධාරණව නැසි යන්නේවේද, තෙපි මපුතණුවන් නොවැලකූ නම් මා දිවි නොතිබෙසි, කියා හඬන බිසවුන් දැක සදමහරජාණෝ ශොකයට පත්ව නගරවාසීන්ගේ ක්‍රොධ බලවත් හෙයින් තෙපි ශොක නොකරව මපුතණුවන් වනාන්තරයට යවම්, නොබෝ දවසකින් වනයට යැවූ මපුතණුවන් නාගරවාසීන්ලවා ගෙන්වා ගනිම් කියා ශොක සන්හිදවූහ. වෙස්සන්තර රජපුරුවන් දුක්පත් වූවා දැක මම දුක්පත් බව නොබලමිසි කියන්නකු මෙන් හිරු සැඟවිණ. මෙසේ එදා රාත්‍රිය යවා දෙවන දවස් සෙනෙවිරද්දු අවුත් සපානශතක මහා දානය සැරහූ බව දන්වූහ.

එබස් ඇසූ මහබෝසතාණෝ සිරුරුකිස නිමවා මේ නිමවා රජගෙයි රුකවල් හරවා සියලු යාචකයන් රජගෙයි මිදුලේ රැස්කරවා දැන සම්භාර කැටිකොට ලා සමීඝගයෙහි සුවඳ පසහුල් දෙමින් සවණිලඬකාරයෙන් සරහන ලද්දාවූ රන්ධජ නඟනලද්දාවූ රන් දැලින් වසනලද්දාවූ ඇතුන් සත් සියයක් හා එසේම අසුන් සත්සියයක් හා අසුන් යොදා සීංහසම් ඔබා සත් රුවන් කම්මන්තයෙන් නිම්මාවූ රන්ධජ නඟනලද්දාවූ රථ සත්සියයක් හා ඉගාන් සත්සියයක්ද මිදෙනුන් සත්සියයක්ද කිරිදෙනුන් සත්සියයක්ද සමීහරණයෙන් සරහන ලද්දාවූ දෙවඟනන් වැනි රාජකන්‍යාවන් සත්සිය යක්ද, සුශික්ෂිතාචාර ඇති දාසීන් සත්සියයක්ද, එසේම සමීහරණ විභූෂිතවූ දාසයන් සත්සියයක්ද, යනාදි නොයෙක් දෙය සත්සියය සත්සියය බැගින් සදවා රුවන්ගබඩාවල දොර හරවා තොප කැමැති විවරක් වසතු ගනුවයි නියොග කළහ. යාචකයෝද සුපිපි පියුම් වනයක්ට වදනා බඹරකැලන්සේ රන් රිදී මුතු මැණික් රන්තෝඩු සංඛලා තිසර රුවන්තෝඩු රුවන් මුදු රුවන් වළලු ආදි වසතු කැමැති කැමැතිසේ උකාගෙන යන්නට වන්හ. සමහරු පටකඩ පවෙටාලි දෙවඩග පිඩාම් සළු පිළි සම්වඩම් ගෙනයන්නෝ

සියදහස් ගණන. පාදඞ්ගුලි පාදසතවක පස් පෙරහැර එක්වැටී පාමුදු රන් මිරිවැඩිහිතසෙස්විළලු දෙපට විදූ අතුල් දසරු බාහු මුතුලැල් මැණික් මාලා දම් සතපසේවි සන්අතා තිලක මිණිවොටුහු ආදි සියලු පලඳනාද යාවතා යන්ට දන් දුන්හ.

මේසේ මහබෝසතාණන්වහන්සේ සහසතු මහදන් දුන් කෙණෙහි මේ මහපොළොව හුහුරුවා නැංග, මේරු පව්තය සතුටුව නටන්නකුමෙන් නටන්නට වන. සපතකුල පව්තයෝද හුයාපි වෙයගබඩත් සේ නැමී වැදුම්ගත්හ. මිදි දෙවිද තමාගේ පලදනා හා ධන ධාන්‍ය සියලු යාවතායන්ට දන්දුන්නාහ. එදවස් දන්දුන් හෙයින් යා නොහි දෙවන දවස් වෙස්සන්තර රජපුරුවෝ අඹු දරුවන් කැඳවාගෙන පියාණන් හා මැනියන් සමීපයට ගොස් වැඳ සිටියාහ. බොධිසත්වයන්ගේ මැනියෝ මිදි දෙවින්ට කියන්නාහු යෙහෙලණියෙනි! දන් දුන් දෙතයට මපුතුන් වනයටයැයි දෙව, තෙපි නොයවයි කියා වනාන්තරයෙහි දුක් බොහෝය, ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා තොප ගිය කල මහා ව්‍යසනය, දරුවන් රක්‍ෂාකිරීම ඉහාම දුෂ්කරයයි කිහ. මිදිදෙවී කියන්නී මාගේ සැමියන් හා වලවසන කල ගම් ඉන්නාට වඩා පහසුය. කැටිව ගියකල ගෙයි ඉන්නා වැන්නැයි කිවාය

එසඳ බොධිසත්වයෝ මිදි දෙවී මුහුණබලා කියන්නාහු සොඳුර! වල වසනකල මහත්හය ඇත. හිමාලය වනයෙහි දුරපිඹුරෝය යන සතිවයී යක් තමන් දරණින් සොඳුන් දෙයොදුන් වල් වටකොට ගෙන තමන් මුවට හසුවූ සිංහ ව්‍යාඝ්‍රයන් ඇතුන් දක්වා අල්වාගෙන ගැල පියති. තවද සොඳුර! ඒ වනාන්තරයෙහි ගල්ගිහි හිඳ සිංහනාද කරන සිංහයන්ගේ හඬින් කන් පැලී යන්නා වැන්න. ව්‍යාඝ්‍රයන්ගේ ගජ්ජිනාවෙන් ළය පැලී යන්නා වැන්න. ඒ වෙනෙහි යක්‍ෂ රක්‍ෂස භූත ප්‍රෙතයන්ගෙන් භය ඇත. සියලු ශරීරය ඇට දක්වා බිඳ ලේ බොන මදුරුවෝ ඉතා බොහෝය, ඇස්සනෙක දුට ගැලවී යා නොදන වලසුන් විසින් නහණය, බොහෝකොට කිමෙන් කිමිද? ඒ වෙනෙහි සත්‍රින් වාසය කරන්නට බැරිමයයි කිවාය. එබසට මිදි දෙවී කියන්නී සැමිනි! වදුල හැම දුක්ගෙන වෙසෙම් කිහ. එසඳ බොධිසත්වයෝ බාලදරුවන් කැටුපාසාණ පිට නොඇවිදුවා සුවයහන්හි හොත්තවුන් ගල් යනන් පිට නොහොවා ධවල චාමරයෙන් පවන් විදිනවුන් අවි සුළං ඇහ නොගස්වා රසහොජනයෙන් මේ නිම්වූවන් ඵලාඵල අනුභව නොකරවා මපියාණන් වහන්සේ කෙරෙහි ඉදුවා එවයි කිහ. සැමිනි! මම නුඹවහන්සේ නොදුක නොහැම්මෙම්. දරු දෙදෙන මා නොදුක නොහැම්මෙනියි කිව. දෙමහල්ලන් කථා ඇසූ ජූසති දෙවී තොමෝ වෙනෙහි ගොස් පුතණුවන් ගන්නා දුක් සිතම්න් මහත් ශොකයෙන් තැවෙමින් හඬා පෙරළෙන්නට වන්නීය, සොළොස් දහසක් පුරහනෝද නගරවාසිහුද ප්‍රවණ්ඩ වාතයෙන් එක්පැහැර පොළොව පිට වැගිර ගිය මහ සල්වනයක් මෙන් එකපැහැර හඬා වැතිර ගියහ. එකෙණෙහි ඇමැත්තෝ මනහර කොට රථයක් සැදූ වඩනා කල් දන්වූහ. එසඳ මිදි දෙවී සමනන්ට පළමුකොට දියණියන් වඩාගෙන පුතණුවන් ඇඟිල්ල අල්වාගෙන පලාගොස් රථයට පැන නැංගාය.

ඉක්බිති බොධිසත්වයෝ දෙමව්පියන් දැඳ සමූගෙන පුර සත්තන්ව සමූදී යියලු ජනසමූහයාට අවවාද කොරෙමින් ක්ෂමා කොරෙමින් තමන් දුන් දන්හි පින් අනුමෝදන් කරවමින් මහජනයා ගඬ හඬා සිටියදී රථය පැදගෙන රාජ් ඒවියට නික්මුණාහු ආ ආ වුන්ට පින්දී නෙවී හැමිද පින් කරව්, යියලු සංඝකාර ධම්යන් අනිත්‍යය දුක්ඛය අනාත්මයසේ සිතව්. සම්පත්නම් අලපාත ඔත් දියත්තක්සේ අස්ථිරයයි සිතව්. මරණය තමා කරා එන බව සිහි කරව්. ඔවු නොවුන් හා වීවාද නොකරව්. ඔවුනොවුන් කොරෙහි මෛත්‍රී කරව්. අප කි බිණු දෙයට ක්ෂමා කරව් කියා මෙසේවූ ප්‍රිය තෙපුළෙන් අවවාද කොට නුවර වැස්සන්ට සමූදී නුවරින් පිටත්ව උතුරුදික් බලා වඩනට පටන් ගත්හ. මෙසේ වඩනා බුඩාඩකුරවූ මහතාණන් නුවර පෙරළා බලම්සි සිතූ ක්ෂණයෙහි රථයක් ප්‍රමාණ තැන පොළොව භිඳී පෙළා රථය නුවර දිශාවට නමාලිය. එසඳ බොධිසත්වයෝ තමන්ගේ දෙමව්පියන්ගේ ප්‍රාසාදාදී පුරසම්පත් බලා සතුටුව මෙසේ වඩනා කල්හි බොධිසත්වයන්ගේ මෑනියෝ සිතන්නාහු මපුහ ණුවෝ වොටුනු මාලාදී රාජාභරණ හා ධන ධාන්‍යාදිය අවලොස් වරෙක දන් දුන්හ. දැන් මද්‍රී දෙවින් හා දෙදෙන හුදකලාව වනයට යන්නාහ. ඒ යන ගම න් දන්දෙත්වයි සිතා වස්ත්‍රාභරණයෙන් හා සත්රුවනින් දහසක් ගැල් පුරා ගැවූහ. මෑනියන් එවූ වසතුබලා සතුටුව රථය සිහන්තන් කරා පදවා වසතු සිහන්තන්ට දන් දෙවා වනාන්තරයට නික්මුණාහ.

එකල්හි වෙස්සන්තර රජ්ජුරුවෝ කොසිදැයි විචාරා බමුණෝ සතර දෙනෙක් අවුත් පිළිවිස වඩකඉරියට යනු නිසා නික්මුණු බව අසා රුහැනිව අහ සලා පියා "යන කල ගෙන ගිය දෙයක් ඇද්ද "යි විචාරා රථය මුත් අනික් ගෙන ගිය දෙයක් නැතැයි අසා එසේද වුවත් යායුතුයයි දිව ගෙන ගොස් ඇස් හමුයෙහි වඩනා බොධිසත්වයන් දැක පින්වත්වූ රජ්ජුරුවෙනි! සිටුවයි හඬගැහ. බොධිසත්වයෝ ඒ හඬ අසා රථය නැවැත්තූහ. බමුණෝ ඉදිරියට ගොස් ආශි ර්වාද කොට සිටිගත. එවිට බොධිසත්වයෝ බමුණෙනි! කුමට ආවහුදැයි විචාළහ. බමුණෝකියන්නාහු අපපින් මද හෙයින් ඔබ සපාගතක මහාදානයට පැමිණ දන්ගන්නට නොහැකිවූම්හ තෙල රථය අදනා අශ්වයන් අපට දුන්නමැනවැයි ඉල්වූහ. බොධිසත්වයෝ සතුටුව මද්‍රී දෙවින් හා දරුදෙබිඳින්නන් රථයෙන් බස්වා සෙකවයන් සතරදෙන බමුණන්ට දන්දුන්හ. බමුණෝ බොධිසත්ව යන්ට සතුති කොට අසුන්රුගෙන ගියහ. එසේ අශ්වයන් දුන් කල රථධුරය අහසෙහි සිටියේය. ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ ඒ දැක දිව්‍යපුත්‍රයන් සතරදෙනකු කැඳවා කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෝ තපසට යන්නෝ රථාශ්වයන් බමූ ණන්ට දන්දී පයින්වඩිති. තොප ගොස් රථය අදුවයි නියොග කෙළේය. දිව්‍ය පුත්‍රයෝ සතරදෙන රොහිත මෘගවෙස් මවා රථයෙහි යෙදී රථය අදනා කල්හිඅනික් බමුණෙක් පෙරසේමඅවුත් කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවෙනි! සිටුවයි හඬගැහ. ඒ හඬ අසා මහතාණෝ රථය නැවැත්වූහ. බමුණු ඇවිත් කියන්නේ රජ්ජුරුවෙනි! ඉතාවැඩයෙමි. රොගියෙමි. ගමන් විඩායෙන් මිරි කුණෙමි. තෙල රථය දෙවයි කියා රජහට ආශීර්වාද කෙළේය. බොධිසත්වයෝ සතුටුව අඹුදරුවන් රථයෙන් බස්වා බමුණාට රථය දන් දුන්හ. "බිසවුන් පයින් යා නොහෙති. දරුවෝද යා නොහෙති." කොසිතා එදා ඒ මහ තාණෝ රථය දන් දෙත්ම රථය අදිමින් සිටි දෙවියෝ අන්තර්ධානවූහ.

ඉක්බිති මද්දෙව්දරුදෙදෙන අත අල්වාගෙන වනාන්තරයට නික් මුණාහ. බොධිසත්වයෝ බිසවුන්ට කියන්නාහු සොඳුර! ජාලියකුමාරයන් මම වඩාගනිමි. කෘෂ්ණාජිනාවන් තොප වඩාගනුමැයි කියා දෙදෙන දරු දෙදෙනා වඩාගෙන සෙල්ලිහැනිල්ල් කටපහරණ ගල් බොරළු මඩිමින් හුණු වැල්ල මඩිමින් ඇලදෙල වැද නාමින් ලියමිලුයෙහි සිහිල් සෙවන සැත පෙමින් දෙදෙන ඔවුනොවුන් සතුටුව සෙමින් තමන් දුන් දන් සිහි කෙරෙ මින් සතුට සතුටුව වඩනවුන් දුටු දුටුවන් විසින් ඔවුන් දෙදෙනාගේ යිව් මැලි නම් සිනමින් යන්නේ සොඳුයි විවාළ කල වඩාසිරි පළිහයට යසි කියති. ඒ අසා බෝපාව කඳුළු මුසු මුහුණින් යුක්තාව හඬන්නාවූ ජනයාට අවවාද කෙරෙමින් වඩනා කල්හි මහදෙපස සිටි අඹ දඹ ජම්බීර නාපනා නාරං, ආදි වෘක්ෂයන්හි ඵලාඵල දරුවෝ දැස ඊට ඇවිටිලිව දෙඅත් ඔසවා අම්ම! පියා ණෙනි! කිය කියා හඬමින් යෙති. ඒ වෙස්සන්තර නම් බුඩාඩ්කුරොත්තම යාණන් වහන්සේගේ පුණ්‍යතේජානුභාවයෙන් වෘක්ෂයෝ තුමුම නැමී ඵලා ඵල දරුවන් අත තිබෙයි. බෝසතාණෝ දරුවන් කැමති කැමති දෑ දෙමින් පොකුණු පතැස් විල්තෙර සැතපෙමින් දෙවතානුභාවයෙන් තිස්යොදුන් මග ගෙවා එකදවසින්ම ගොස් වේතිය රට නගර ශාලාවට වන්හ (දෙවතාවෝ ළඳ බොලඳ සිව්මැලි කුමාරවරුන් කෙරෙහි අනුකම්පා වෙන් පෘථිවිය ගුස්වැසෙනාට නැතුහ.) මද්දෙව් ශාලාව ඇමද බොධිසත්වයන්ට ඉදිනා අසුන් පනවා වඩා හිඳුවා පන්ලෙහිවූ ධූලි පිස පියා දරුදෙදෙනා ඔවුන් ළඟ ඉඳුවා නගර වාසින්ට පෙනුවා මිනිවසි සිතා බොධිසත්වයන්ටද පෙනෙන පරිද්දෙන් නුදුරුව සිටියාහ. එසේ ඉන්නට කාරණා කිම්දයක්?:— බොධිසත්වයෝ තමන්ගේ නුවරට ආහෙයින් අපහැර ගියා අේහෝසි යිතුව නොත් හෙතු නොවෙයි සිතා බොධිසත්වයන්ට පෙනෙනසේ සිටියහ.

එසේ සිටියාවූ බිසවුන් යන එන්නෝ දැක වැද නගරවාසීන්ට කිකල නගරවැසිහු රුස්ව වේතියරජ්ජුරුවන්ට කියා යැවූහ. එකල වේතිය රජ්ජුරු වන් ඇතුළුවූ සැවදහසක් රජදරුවෝ අවුත් බොධිසත්වයන් පා පිට හඬා හුණහු. හඬා නැවත කියන්නාහු කිම්ද? මහරජ! ඔබට ලෙඩදුක් නැද්ද? නුඹගේ පියාණන් සඳමහ රජ්ජුරුවන්ට දුක්නැද්ද? නුවර වාසීන්ට පීඩා නැද්ද? මේනම් කුමන විෂමයක්ද? ආවරණ විපත්තියෙක්ද? මෙසේවූ අනාථ ගමනෙක් කුමක්නිසා තොපටවීද? දෙවගෙනි! තොපි නැගී ආ වාහන සොසිදුණි යනාදීන් විවාළහ. බෝසතාණෝ කියන්නාහු මාගේ දෙමවුපියන් වද පීඩා නැත. වංළි එසක් කියමි. මාගේ කෛලාසකූටය වැනි සම්භාවය අනිඩවලවූ සුවිශිලෂයක් පලඳනා වෙන් හොබනාවූ පරිවාර සහිත මාගේ පණ්ඩර නම් ඇළි ඇතු කලිහුරට වැඩි බමුණන්ට දන් දන්හයි සිවිරට ඇන්හෝ මවියාණන්ටද මිටද කිපී මා රටින් ගිය මැනවැයි කිවුය. එසේ හෙයින් ආමි කිහ. වෙතියරජ්ජුරුවෝ ඒ අසා ආයේ ඉතා යහපතැයි සතුටුව "සිවිරට ඇන්හත් සතුටුව ආරාධනා කොට ගෙනයන තුරු අපගේ රට රජ කම් කළ මැනවැ"යි වෙතියරජ්ජුරුවන් හා සැවදහසක් රජදරුවෝ තමන් තමන්ගේ රාජ්‍යයට ආරාධනා කළහ.

එකල්හි මහබෝසතාණෝ කියන්නාහු තොපව රාජ්‍යය නොකරමි. "අප නෙරපූ රජ්ජුරුවන් උන් නවතා හෙන රාජ්‍යය කරවනි"යි සිවිරට වාසිහු තොප කෙරෙහි වෛර බැඳ එනුහුන් යුඩකොට දෙරුව ඇන්තෝ විරෝධ

වෙයි එබැවින් එසේ නොකෙරෙමි. වංකගිරි පර්වතයට යන බව මැනව ඒ හාක් විසිවට සුදුසු හැනෙක් කියවයි කිව විචාරා කියමින රජතෙව වැඩිය මැනවැයි රජදරුවෝ කිව. බෝසතාණෝ රජතෙව නොයම්හයි කියල ඇතුළුනුවරට ගොවඩහා හෙයින් ඒ යාලාවම දිව්‍ය විමානයක්සේ සරහා සැට දහසක් රජදරුවෝ ශාලාව වටකොට රැකවල් ගත්හ. බොධිසත්වයන් සුවඳ පැහීන් නාවා සුළු පෙරළා සුළු හඳවා රස භොජනය වළඳවා සතුටුකළහ. බෝසතාණෝ එදවස් රෑ එහි ලැග දෙවැනි දවසින් වංකගිරි පර්වතයට යම්හයි කියද රජපුරුවෝ නියන්නාහු ඔබ වඩනාතල පෙරනමින් පසුගමින් කරන්නට බොහෝදෙන ඇත්තාහ. එබැවින් වල ගස්වා මහ එළිකරන තෙක් වැඩහුනමැනවැයි වලකා සත්දවසක් එහිම රඳවා ගත්හ. මහ එළි සළ කල වංකගිරි පර්වතයට යම්හයි බොධිසත්වයෝ නික්මුණාහ. එකල වෙහෙසරජපුරු වන් හා සැටදහසක් රජදරුවෝ බොධිසත්වයන් සමඟ ගියාහ. එසේ ගොස් පසළොස් යොත්තක් මහ ගෙවා පසළොස් යොත්තක් ඉදිරියෙහි නිමියදී මහවනය සමීපයෙහි සෙනාධිපතියකු රැකවල් ලවා සිව දකුණහා ඔසවා මහ කියන්නාහු සවාමීනි! මෙතැන සිට ඉදුරා දකුණු දික් බලා ගියකල නහා සිටුවූ නිල් වලාකුළක්සේ තෙල පෙනෙන්නේ එලා ඵලයෙන් විපුලවූ විපුල නම් පර්වතයය, ඒ පර්වතප්‍රාන්තයෙහි සිව බැලූ කල නොයෙක් සුගන්ධයෙන් යුත්ගන්ධමාදන පර්වතය පෙනෙන්නේය. ඒ පර්වතය වට නදුන් සදුන් කළුවැල් කිහිරි සපු පුවහු දුනුකේ වැටකේ නා පනා සල් සලල අහුරු දෙවිදුරු ආ නොයෙක් වෘක්ෂයෙන් ප්‍රතිමණ්ඩිතය, ඊ සැතපී තොප අඹුදරුවන් එලාඵල කවා ගිරිඋලෙන් බට සිහිල් පැන් බී ශරීරකලාන්ත නිවාගෙන ඉන් ඔබ්බට වැඩිකල මනාවූ තොට පතර ඇති නොයෙක් මස්කැස්බන් විසින් ගැවසි ගත් කෙතුමතී නම් මහාගඟෙක් ඇති. ඒ දෙපාශ්වයෙහි රිදිපටක් හයාලුවාසේ මනාවූ වැලිතලායෙහි වවින් හමන්නාවූ සිහිල් සුළඟ ඇඟ ගස්වා සැතපී හෙන වැද්දක්හු විසින් දුන් මී හා මස් වළඳ, ඔහුගේ සහායයෙන් ඒ ගඟින් එතරව ඕහට රන්වොටුන්න තදකරන ලක්ෂයක් අගනා රන් ඉද්ද දෙවා ඉන් ඔබ්බට වැඩිකල ඉන්ද්‍රනීල මාණික්‍යයක්සේ බබළන සානු නම් පර්වතයෙක් ඇත. ඒ පර්වත සිඛරයෙහි පිහිටි මහා නුගගසෙහිවූ අමාඵල වැනි මධුරරස ඇති නුග ඵල අනුභව කොට ඒ ගසමුල සැතපී ඉන් ඔබ්බට වැඩිකල සතරහුල් උසඇති රතිදු ගොව්වන් සහිත නිල්වූ මහත් ඊතණ වනයය. ඒ ගෙවා වඩනේ මුව ලිඳ නම් විල්තෙරින් ගොස් පූර්වොත්තර කොණයට (ඊසාන දෙසට) පැමිණ එකපදික මාගීයෙන් ගොස් වන ලැහැබට පැමිණිකල පස්පෑයෙන් යුත් පියුමෙන් හා වැල්ලෙන් ගැවසී ගත් නිල්වූ දියසළාඟෙන් යුත් ඉදුනිල් මිණි අතල පැරයූ මී බී මත් බමරගණන් විසින් ගැවසී ගත් හංසශ්‍රේණීන් ගෙන් විරාජමානවූ සතරැස් පොකුණෙක් ඇත. ඒ දැක ඒ පොකුණට දකුණු දිග බලා ගිය කල නොයෙක් ඵලාඵලයෙන් ගැවසී ගත් අවඩකාවූ වංකගිරි පර්වතය. ඒ පර්වතයේ පන්සල් කොටගෙන ධ්‍යානසුවයෙන් දවස් යවමින් අඹුදරුවන් හා සමඟ වාසය කරවයි කියා නැවතූ සැටදහසක් රජදරුවෝ බොධිසත්වයන් වැඳ සමූගෙන පෙරළා තමන්නුවරවලටම ගියහ.

එදවස් ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ තමන්ගේ දහසක් නුවණැසලා මනුෂ්‍ය ලොකය බලන්නේ අප මහබෝසතාණන් සතසතු මහදන් දී තපස්කරන්නට වඩකාගිරි පර්වතයට නික්මුණු බව දැක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා කියන්නේ

වෙස්සන්තර රජ්ජුරුවෝද මිදී දෙවිඳ තපස්සරන්නට වඩාගිරිපමිහසටයෙනි ගෝ එහි ගොස් පන්සල් දෙකක් හා සක්මන්මලු දෙකක් හා නොයෙක් මල් වැලින් ගැවසීගත් මල් ගස් හා සෙහෙල් මනයක් හා අදුන් දිවිසම් රිටි සුඹුළු බෙහෙත් සැරයටි පැස් සුලු මිල යහුල් ආදිවූ දෙය මවා "තපස් සරන්නවුන්ට හැපෙයි"යි කිත්තියේ අකුරු ලියා පන්සලට නිස්ගවිවක් මානයේ වහුන් මල් සුන් සිංහ ව්‍යාඝ්‍රයන් ආදී සියු දාවුන් හා යක්බූ පිසසුන් හා භයානක ශබ්ද ඇති සෙන පක්ෂීන් පලවා හැර එවයි නියොග කෙළේය. ඒ විස්කම් දෙවිපුත් සක්දෙවිරජහුගේ නියොගය පරිදිදෙන් එකි සියල්ල නිම්මිතකොට තබා දෙවිලොවටම යියේය.

බොධිසත්වයෝ කී සලකුණෙන් යන්නෝ සැතපී හිඳිමින් සිටිමින් සහරැස් පොකුණට ගොස් පොකුණ විස්තරබලා තෙපි මෙතැන සිටුවයි කියා මද්දිදේවී පොකුණුහෙර සිටුවා දකුණුදිග හසරක් දැක ඒ හසරින් ගොස් විශ්වකර්මයා මැවූ පන්සල දැක මහතාණෝ ශක්‍රයා අප ආඛව දන්නේවනැයි සිතා තමන් වහන්සේ අහ නිබූ රන්හඬුව තබා පන්සල ඇතුලට වැද බිත් තියේ තිබූ අකුරු දැක කියවා බලා තපසට කැප බැව් දැන එහි හිඳ ජටා බැඳ ගන්සළු ගලවා බබා වල්කලා හැඳ අදුන් දිවිසම් පොරවා පාත්‍රය හෙන සැරයටියත් අතින් හෙන සක්මින් මලුයෙහි සක්මන් කෙරෙමින් සිටියාහ. මද්දිදේවී බොධිසත්වයන් ලැබූ හෙයින් සතරැස් පොකුණෙන් නික්ම බොධි සත්වයන් ගිය හසරින් ගොස් හෙට විලාසයෙන් සිටි සමනන් දැක ළය පැලී යනතරම් ශොකයෙන් හඬා බිම හි ස්වාමිනි! පෙර සිවිරට ආදි දෙශයන්හි මිනිසුන් මියින් නුඹ සඳමහරජාණන් දුකණුවෝ වෙස්සන්තර රජ්ජුරුවෝයයි නට නට නුඹගේ රූප ශ්‍රී කියනු ඇසිමි. මාගේ ඇසින්ද නුඹගේ ඒ රූප ශ්‍රී දිටිමි. දැන් මෙවැනි තවුස් වෙශයක් දිටිමි. පෙර නුඹ රජ්ජුරුවෝයයි ප්‍රසිද්ධව දැන් තපස්වියයි යන නම් විය. පෙර මිණිකොඩොලින් බබළන වොටුනු පලන් තෙල හිස දැන් දළමිඬුල්ලට සුදුසුවිය. පෙර දළමුතුහර එකාවැල පලන් තෙල් උරය දැන් මුවසම් ලන්නට සුදුසුවිය. පෙර කසීසළු හන් තෙල උකුල දැන් නිය සහිත අදුන්දිවිසම් ලන්නට සුදුසුවිගයි මෙසේවූ වෙශයක් දකින්නට මාගේ දැස තුබූ නියාහ. මෙසේවූ දෙයක් නුඹවහන්සේ වන් වූයේ වත. මෙවැනි විලාසයක් දුටු මා ළය හැම්මෙන නියාශයි හඬා වැලප සොහ සන්හිදුවාගෙන සමනන් වහන්සේ ගත් තවුස් වෙස් මාත් ගත මැනවැයි සිතා ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් කැඳවාගෙන අනික් පන්සලට වැද තමන්වහන්සේ හන් සළු ගලවා තබා අදුන්දිවිසම් රිටි සුඹුළු වල් කලා ජටා ධරව ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන්ටද අදුන්දිවිසම් රිටිසුඹුළු හදවා හිස ජටා බදවා තුන්පුතු මවි බෝසතාණන් කරා ගොස් වැඳ නැගිසිට වහන්ස! නුඹ අතින් මා ගන්නා වරයෙක් ඇතැයි වර ඉල්වන්නි මිම වනමුල් වනඵලාඵල ගෙනෙන්නට යෙමි. ඵලාඵල සොයා යාදී පෙරවරු නුඹවහන්සේ දරු දෙදෙන රකුණා කළ මැනවැයි කිවාය. මහබෝසතාණන් වහන්සේ යහපතැයි උන්ට වරදී කියන්නාහු මා විසින්ද තොපගෙන් ගන්නා වරයෙක් ඇත. වේලේමුත් නොවේලේ මාගේ පන්සලට නොවදුවයි කියා උන් අතින් වර ලදින් මෙසේ වසන කල්හි මද්දිදෙවීන් වනමුල් වනඵලාඵල ගෙනෙහැර බෝසතාණන් වළඳවා අත් පා මෙහෙකොට සත්මසක් පිරුණු සඳ බොධිසත්වයෝ තමන් අතින් දන් ගන්නවුන් නැත්තෙන් දුක්පත්ට පරහට සුව දෙන්නට උපන් මහතාණෝ වනමුල් වනඵලාඵල ඇද්ද නැද්දැයි සිහත් මුත් සෙස්සක් නොපතන්නාහ.

මෙසේ වසන සමයෙහි කලිඟුරට දුන්නිවිටයි නම් බමුණුගම ජූජක නම් බමුණෙක් බාල කල සිට සිහන්නේ වෘඩ අවස්ථාව දක්වා සිනාගෙන සතවණු සියයක්ලදින් අනාථ එක් බමුණකු කෙරෙහි තබා ගොස් හල්යාමකින් අවුත් යහළුව මාගේ සතවණු දෙවයි කියා ඉල්වීය. ඒ බමුණු කියන්නේ යහළුව මා අනාථ විසින් තාගේ සතවණු විකුට කාපීම්. තාගේ සතවණු නියාවට මාගේ අමිත්තනාථ නම් දුවණියය ගෙනයවයි දුවණියන් නාර කෙළේය. ඌගෙන් අනික් ලැබෙන දෙයක් නැත්තෙන් තමන් කාමදාස බැවින් ඒ බැමිණිය තමන්ගේ ගෙදරට කැඳවාගෙන ගොස් තමාට අඹු කෙළේය. ඒ බැමිණියද ජූජකයා කෙරෙහි මහත් ගෞරවයෙන් උපස්ථාන කෙරෙමින් සිත්සේ වෙසෙයි. එකල ඒ බමුණුගම සෙසු තරුණ බමුණෝ තමන් තමන්ගේ අඹුවන්ට රැහැණිව කියන්නාහු ජරා දුප්පිල වෘඩ බමුණාට මෙවැනි තරුණ සත්‍රියක් ඌ සින්සේ මෙහෙවර කොට වෙසෙයි. තෙපි අපට මෙහෙවර කිරීමෙහි ප්‍රමාදවන්නේ කිම්දැයි කියා ගැහැට කෙරෙති.

එබස් අසූ බැමිණියෝ ජූජකයාගේ හෘදයෙන් ඈ තොරකරම්හයි සම්මත කොට නෙන එක්දවසක් අමිත්තතාපා නම් බැමිණිය පැන්තොට දී දැන එනම සෙසු බැමිණියෝ කියන්නාහු එම්බල පව් කළ තැනැත්තිය! තී දත් හුණු නරමහල්ලකුට මෙහෙ කෙරෙහිද? මේ කඩදත් මහල්ලාට තී පාවා දුන් තිගේ දෙමවුපියෝ නිට සතුරු වන්නාහ. තී උන්ට සතුරුවන නියාය, තී අප්‍රිය වන නියාය, තී පින් නොකළ තැනැත්තියක. තී ගිය ජාතියෙහි නවවක් යාගයෙහි කපුටුවන්ට ලු බත් පළමුකොට කෑ මහලු කපුටියක් වන. එසේ හෙයින්වද තී මේ නරමහල්ලාට අඹුවූයේ, යෙහෙළිය! මෙසේවූ ජරා මහල්ලා හා එක්ව පඤ්චකාම විෂයෙහි කවර නම් ඇල්මක් ඇද්ද? ඌ කට දත් දල්වාගෙන සිනාසෙන වේලෙහි තසිතට කවර නම් සමාධියෙක්ද? කිඹුල්පිටක්සේ උගේ ශරීරයෙහි ගැටි කවර නම් සමාධියෙක් වේද? ගැරඬි සමක් වැනි ඇඟ රැලි ඇති කඩදත් ඇති කෙළතොලු මහලු බමුණා හා තිගේ කවර නම් පඤ්චකාම සම්පත්තියෙක්ද? සොදුර! තිගේ කොමලවූ ශරීරය මිරිකා ඒ බමුණු කනාටුවාට මෙහෙ කොට දුක් නොගෙන ති සේවූ අභිරූප ළදරු සැමියකු සොයාගනැයි කීහ. මෙසේ ඕ තමාහට පරිහව බණින්නාවූ ගැණුන් බලා හඬා වැලප නියඬුරු හුරුලාලා පැනට ගිය කළුය ගල්ගසා බිඳපියා අත පොරවා ගෙන ගෙට අවුත් ජූජක නම් බමුණුගේ රුවුල තරයේ අල්වාගෙන බමුණුමාල්ලාට තතනවින් බෙණෙමින් දත්කමින් බමුණුමාල්ල! තා සේ වූ කෙළතොල්ලන් කෙරෙහි උන් විපාක අදම් ලදිමි. (යහපත් සරණෙක මා ආයේ,) අද මේ ගම දැරියෝ එක්ව ගෙනලා මාහිස බෝල්කළහ. පැන් නොවදී මට උන් නොකළ පරිභවයෙක් නැත. තා කෙරේ හිඳ මෙසේවූ ඛස් අසන්නාට වඩා කරවැල් ලාගෙන මියයාම යහපත. සිරිහිකා මියයාම යහපත වනා ගොස් දැසඟකු හෝ දැසියක නෝ ගෙන එව නැතහොත් තා කෙරෙහි නොසිඳ ඉමියි කිවාය.

එබස් අසා බමුණු තමා දත් වැගිර ගියත් අඹුසොඬ නෙයින් කී බසට කවිපාව කියනුයේ එම්බා, සොදුර! නුඹ රැහැණි නොවව, මහලුවූ බැමින් දැස දැසින් ලද්දේත් නොහැක. මෙවක් පටන් දරත් මම්ම ගෙනෙමි. දියත් මම්ම ගෙනෙමි. සෙසූ කළමනා යම්ම දෙයක් ඇත්නම් මම්ම සොරෙමි. අදපටන් තෙපි මෙහෙ නොකරව, තෙපි ගෙඇ රැක ඉඳුවයි බැමිණිය අස්වසා

කීහ. 'අනෝ බ්‍රාහ්මණය! සැමියන් අහිත් මෙහෙ ගත්තා වූලයෙක මා උපන්නේ නැහැ. නපුරු බස් නොකියා යුසියන මෝ දුසයකු මෝ ගෙන එවයි කිවුය, සොදුර! යුසියන් කෙසේ ලබම්දුයි කීය. අනෝ මිහලු බමුණ! එවිවරකුත් නොදන්නෙහිද? හට උපායක් කියම්. මහා යසස් ඇති හුණ සඉපත්තවූ වෙස්සන්තර රජ්ජුරුවෝ ඉටුවාදන් දෙති. උන්ගෙන් වස්තු ගෙන අනාථයන් සුව විදිනේය. දැන් ඒ උන්හාමයා වඞ්කගිරි පව්තයෙහි තපස් කෙරෙති. හෝ ඔබ ගොස් මට මේහෙකරන වහලක් ගෙනෙයි නම් ඉඳිමි, නැත්නම් මාගේ දෙමවුපියන්ගේ ගමට ගොස් මෙසේම ළදරු දසුන් ඇති අතික් බමුණකු කෙරෙහි ඉඳිමි. හා බල බලා සිටියදි උඹ හා මා හා සොළහා කල් මහල්ල! හා සිහට සුවයෙක් නම් නැහැයි කිහ. ඒ අසන්නාම බමුණා ළය ඉවිල හිණ. ළය පිරුණු මහත් ශොකයෙන් නිහඬුරු හුරුලාලා කියන්නේ සොදුර! මම ඉයාති නැත්තෙම්. වෘඩයෙම්. යා නොහෙම්. වඞ්ක ගිරි පව්තය ඉතා දුරය, ගෙයි වහල් කළමනා යම් මෙහෙවරෙක් ඇත්නම් මම්ම කෙරෙම්, තෙපි රිට අසමාධි නොවවයි කිය.

එබස් අසා බැම්ණි කියන්නි තෙපි සඞ්ග්‍රාම භූමියට නොවැදුම පැරදී එකකු වැන්න, එම්බල ජඩ කඩදත් කොරසැඞි තඹව්ටි කම්මැලිය! මට සත්තාලම් නොවිරුවා ගොස් වෙස්සන්තර රජ්ජුරුවන් අහින් කෙල්ලක කොල්ලකු ගෙනවයි කියා බමුණා වෙර මස් කයි. ඉන්ද සිටිය නොදී ඇත මැත ගැසෙමින් හවමින් බෙණෙමින් වෙසෙයි. බමුණු අඹුව කරන ගැහැට විඳගත නොහි ඇ කෙරෙහි හයින් යහපත සොදුර! වහලක් ගෙනෙමියි ගිවිස අඹුවට වලින් දර ගෙනවුත් ගෙය පුරවා දිය ඇද වලන් පුරවා ගෙය සිසාරා වැට කොට ඇට බත් බුලත් තබාලා ඇ විසින් සපයා දුන් අක්සුණු ආදි මාඟෝපකරණද ගෙන ගමනට සැරහී සිට අඹුව පැදකුණු කොට තුන් විටක් වැඳලා පසුබැස සතරහැනෙහා බැස හෙව වැඳ ඇ කෙරෙහි කළ හයින් හැකිල හැකිල පාත බැස සිපගෙන නිහට ගෙන සතහා ඇට කියන්නේ සොදුර! මම නොලස්ව එම්. තෙපි බිය නොවවයි සමුගෙන වහන්සඟලක් පයදා කුඩු මහල්ලක් ගෙන කෙණ්ඩියකින් පැන් ගෙන ගමනට ගත් උප කරණ පය්ය කරට නහාගෙන අඹු ළදරිකතුන් පෙරළි පෙරළී සිට බල බලා වඞ්කගිරි පව්තයට යන මහට ගොස් මහදී සිතන්නේ සිව්රටට ගොස් නුදුවිම් නම් පසු වඞ්කගිරි පව්තයට යෙමි සිතා සිව්රටට ගොස් වෙස්සන්තර රජ්ජුරුවෝ කොසිදැයි විචාළේය.

නුවර වාසිහු ඒ අසා කිපී තවත් දන් ගැන්මෙහි නවතුද? අපගේ සාමීන් රටින් යන පරිද්දෙන් කෙළෙහිය, තවත් කුමට පිළිවිසිදැයි කිපී පොලුමුහුරැකැට පහණ ගෙන ලුහු බඳවා ගත්හ. බමුණු වැටෙමින් පිරිහෙමින් හොල බොල් සිඳ බිඳගෙන දණඋතුවැලම්පි ලේ ලාගෙන දිවන කල ලුහුබඳවා ගොස් උණපත්තකින් සම්පොත්ත උණපත්තේ ඇලියන පරිද්දෙන් පැහැර පියා බමුණ! මතු ඊම් නුවරට අයි නම් දන්නෙහි වේදැයි භයගැන්වූහ. බමුණු මරණභයින් දිවන්නේ උතුරුදික් බලා ගමන් ගත. බමුණා මහ නොහඳුනන හෙයින් දෙවතාවෝ බෝසතාණන්ගේ දන පාරමිතාව පුරනු සඳහා වඞ්ක ගිරිපව්තයට යන්නට මහ පැහ. බමුණු ක්‍රමයෙන් වනාන්තරයට ගොස් ඉරමුදුන්වේලෙහි **වෙනෙයසුත්‍ර** නම් මුවවැද්ද සිටි රැකවලට වැද ඒ

වැඳුගේ කිනබල්ලෝ බමුණා දැක සිසාරා වට කොට ගත්හ. බමුණු හසින් මහඟින් හඬා සඝලව තමාගේ තවින නම් අක්සුඹු පය්යත් කුඩියත් සැර යටියත් වහන්සඟලුත් හෙළාපියා හිසකේ උදුරා දිවිගෙනගොස් ඝසඝාව නැති සිට හඬන්නේ පසඳුම්මහාගඹාවන්ට සපතමනා සාගරය වැනිවූ වැසිලිහිණි යන්ට මහා මේඝයක් බඳුවූ ඝනාඹ්කාරයට ප්‍රදීපාලොකයක් බඳුවූ සොළොස් ඟාවකයන්ට කප්රුහක් වැනිවූ සිතූ සිතූ දෙය සිඹකරදෙන චින්තාමණිකය යක් බඳුවූ ගමන් පිඩාවූවන්ට සිහිල් සෙවනක් බඳුවූ තැම්සඹියන්ට විත්පැන් ඟාලාවක් බඳුවූ ඉල්වූ දෙයක් නැතැයි නොකියන්නාවූ පසඳුම්මා පදමියෙන් පිරුණු පොකුණක් බඳුවූ සියලු සතුන්ටම හිතවත්වූ වෙස්සන්තර රජ්ජුරුවෝ ඒකාසිදුයි හැඬිය.

ඒ වෙන පුත්‍ර නම් මුවවැදිතෙමේ බමුණාගේ හඬ අසා දිව අවුත් බමුණා දැක කියන්නේ තමන්ගේ රාජ්‍යය හැර පියා මේ හිමියට ආ රජ්ජුරුවන් සොයා ආයේ බිසවුන් වත් ඉල්වා ආයේදෝහෝසි කිපී පිටතොල දන්න මින් වට පිට බලමින් අවුත් දුෂ්ට බමුණුමහල්ල! දැන් දැන් තා දිවි ගනිමිසි දුන්න හයා විෂ පෙවූ හිය දුනුමුඩ ලාභයාගෙන සොරබමුණ! දැන් තාගේ හෘදයමාංශය ලේ වම්ම වම්මා කපාගෙන පඤ්චකුණයන්ට බිලි දෙමි. තා සල්ව සල්වා දැන් තාගේ බඩවැල් ඇරගෙන පක්ෂීන්ට දෙමි. තාගේ පසඳු මධුරමාංශයෙන් හා හෘදයලෙහෙයෙන් දෙවියන්ට බිලිදෙමි. දැන් තාගේ ඇහෙමස් තෙල බල්ලන්ට ලා කවමි, වහා ගසින් බසුවසි කිය. බමුණු මරණ භයින් භයපත්ව අතික් වදනා නැහැක් නිත්තෙන් මහඬින් හඬා බොරුවක් කියා මා මුන් අතින් ගැලවුණ මැනවැයි සිතා කියන්නේ මා එසේ මෙසේ මැරිය නොහැක්ක. මම සඳමහරජ්ජුගේ දූතයෙකිමි. මදවරකුත් නැත්තෙමි, මා දිවි නොගෙන මද ඇසිල්ලක් මාගේ බස් අසව. සඳමහරජ්ජුරුවන් හා සිවි රටවැස්සන් හා සැදැහැයෙන් වෙස්සන්තරරාජ්ජුරුවන් කරා ගිය මැනවැයි කිහෙයින් එක්වන්ව බිසවුන් වලප්නා හෙයින් මව්පිය දෙදෙනාගේ ඝොෂ බල වත් හෙයින් වඞ්කගිරි පර්වතයට ගොස් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ සුවදුක් හා සවරූප දක්නා පිණිස යවයි සඳමහරජ්ජුරුවන්ගේ ඇණෙවරින් ආමි කිය.

එබස් අසා වැදි පුත් සතුටුව යමයන්සේ වටලා ගත් බල්ලන් ගස්වල බැඳ ජූජකබමුණා ගසින් බස්වාගෙන අඟුරෙනි පැලහු මිස් හා මී හා මිහිරි ආහාර කවා ගමන් ශ්‍රමදූර නිවා සතප්වා යන්නට නික්මුණු කල මඟට පිරුණාවූ මී ලබුවක් හා මුවමස් පිඬක් (පුඤ්ඤාමිගඤ්ඤිඤ්ඤව, අඟුරෙහි පැලහු මුව ගානයක්ද, දී පසු ගමන්කොට දකුණත ඔසවා බෝසතාණන්වහන්සේ වසන දිශාවට මඟ කියන්නේ බමණ! හෙල දියවලාහඬක්සේ පෙනෙන්නෝ ගඳමාදන පර්වතය, ඒ ගල්පඝන කිහිරි කුඤ්ඤ ඉගි ඇසටු කෙළිඳ ගිවුලු බෙලි අඹ දඹ ඛක්මි කොහෙල් කට්ඨපාමිඤ්ඤිය නදුන් සදුන් නා පනා සපු දුනුකේ සල්සලල අගරු දෙවිදුරු ආදි මල් පල්ලෙන් සැදුණේය. ගැලි ගසා දිවන ගංහෝ ආදියෙන් ගැවසිනත් ලිය කිදුරන්ට කුරවි කෙවිල්ලන්ට ගෙයක් බඳුවූ ඔත් හලුවූ ගල්කුලෙන් රමනියවූ ඒ වනයෙන් එලා එල කඩා කමින් හඬා වැගිරෙන නොයෙක් දැලදෙලවල් සිනිල් දියෙන් නාමින් පැන් බොමින් සැනසෙමින් එහැතින් ඔබ්බෙහි ගිය කල පස්පියුමෙන් සැදුම්ලත් පොකුණෙක් ඇත. ඒ පොකුණේ නෙළුම්පත් පිට වහුළ මල්රෙණුසේ සඳරු පරයන පොකුරුම් කමින් නොස් මහ ලැග රුක්ෂයන් විසින් ගඟනවූ විපුලි නම් පර්වතයෙක් ඇත.

ඒ පර්වතයේ **අට්ඨවු න** නම් තපස්වී කෙනෙක් ඇත. ඒ තපස්වීන් වසන පන්සලට වැද සැතපී උන්හෙන් මහ ධර්මිවිස ගහුවයි සුලුමනය විසාර නොට මහ කිය. බම්මණු උඹ කි පරිදිදෙන්ම ගොස් විපුල නම් පර්වතය සමීපයෙහි තපස්වීන් වසන පන්සලට ගොස් තපස්වීන් දැක සුවදුක් විචාරන්නේ සුවදුක් සෙසේද? මැසිමදුරුවන්හෙන් දුක් නැද්ද? දිවියන් වගුන් වලසුන් සිංහයන්ගෙන් උපද්‍රව නැද්ද? ඵලා ඵල ලැබේදැයි විචාරා සිටියේය.

එකල තපස්වී කියන්නේ නා කි දේවලින් මට කිසි දුකෙක් නැත. ඵලා ඵලාදියද ලැබෙයි කියා ඔහුගේ ගමන් ශ්‍රමදූන නිවා ඵලා ඵල කෑවා සැතපී උන් කල බම්මණ! මේ වනාන්තරයට කුමක් සඳහා අවුදැයි විවාළේය. බම්මණු කියන්නේ වෙස්සන්තර රජ්ජුරුවන් කරු ආම් කිය. එවිට තාපස තේමේ කියන්නේ රාජ්‍යය හැර ඒන් වනයෙහි තපස් කෝට වසන වෙස්සන්තර රජහට ධන ධාන්‍යාදි භොග සම්පත්තියක් නැත. එබැවින් දුක්පත්වූ ඒ රජ්ජුරුවන් කරු නෙපි කුමක් නිසා යවිදැයි ඇසූයේය. බම්මණු කියන්නේ තාපස යෙනි! වසනු සඳහා ආයෙම් නොවෙමි. වෙස්සන්තර රජ්ජුරුවන් බාල කල උන් අකුරු කරවීම්. උන් මා නොදක්නෙන් දැන් සත්මසක්විය, බලාපියනු සඳහා ආම් කිය. වෙසේ කියා එදවස් එහිම ලැග පාන්වූ කල තපස්වී බොරු නොදන්නා හෙයින් මු කියේ සැබෑවේහෝයි සිතා මහ පාන්නේ බම්මණ! මෙසේ ගිය කල දකුණත් හසරින් වඩකනිරි පර්වතයට ගොස් ඔය රුස් පොකුණට ගිය කල ඒ පොකුණ පස් පියුමෙන් සැදුණේය, ඒ පොකුණ සිසාරා අඹ දඹ කිණි කුඹුක් ආදී රුක්වලින් සජ්ජිතය, නිල්මගමේ නැගි කල වලාතඹක් බඳුන්නා වැන්න, එතැන සුළඟින් පැහැර ගෙන බිඳී නිබෙන මල්හිස බම්බරාන්පියාවලින් නිති වැගිරෙන මල්මුවරදින් යුකතය, මල් කෙසරු කඩා කටපුරා නා, මත්ව කුල්නා කෙවිල්ලන් ඇති. ඒ පර්වත සිඛර යෙහි ලිය ගිනහා නවන ලියකිදුරන් ඇති. ඒ ඒ දෙලවල ලියමඹුලුයෙහි රිසියේ හැසිරෙන විද්‍යාධරයන් ඇති, රන්ගිරිකුළු මුදුන මුළු මුළුව නවන මින් මොනරකැලන් ඇති, පර්වතොපමවූ නොයෙක් ඇත්කැලය, තොලින් තොල තබා ඉවුනොවුන් සතහ සතහා යන නොයෙක් මුවරැළය, ඒ ඒ තැන විලික්සව නිබෙන ඇත්දළ සා ගෙඩි ඇති කෙහෙල් වනයය, මිදියකළ සීා ගෙඩි ඇති කොස්වනයය, විලිඤව වැගිරෙන මී ඇති මීඅඹ වනයය, පුවක්දඹු සා දඹු ඇති උක්වනයය, බම්මණ තා මේ වනයට වැද කැමැති කැමැති ඵලා ඵල අනුභව කෙරෙමින් සැතපෙමින් ගොස් වඩකගිරි පර්වතය සමීපයෙහි පන්සලට වැද වෙස්සන්තර රජ්ජුරුවන් දකුවයි කිහ. බම්මණු ඒ අසා සතුටුව තුන්විටක් තපස්වීන් වැද සමුගෙන කි කි ලකුණු බල බලා ගොස් සතරුස් පොකුණද වනයද දැක ඒ වනයෙහි එක් ගිරිගුහාවක් දැක බම්මණු සිතන්හන් මේ වේලෙහි බිසවු වෙස්තුරු රජ්ජුරුවන් වනමුල් ඵලා ඵල ගෙන හැර වළඳවති. සත්‍රිහු නම් දනට බාධා කරන්නාහුය, එහෙයින් කුමාරවරුන් දන් ලබාපියන්නට නොදෙති. එබැවින් මේ ගුහායෙහි අද ලැග සෙට උදැසන මිදී දෙවී ඵලා ඵල සොයා ගිය කල දරුවන් දන් ගනිමියි සිතා එදා රෑ ඒ ගුහායෙහි ලැගුම් ගත්තේය.

එදවස් මිදී දෙවී පාන් වන වේලෙහි නපුරු සවපානයක් දැක භයපත්ව හිඳ සිතන්නී මේ මුළු පොළොව වෙස්සන්තර රජ්ජුරුවන් හා සමාන සවපාන දන්නාහු නැතැයි සිතා බොසතාණන් වහන්සේගේ පන්සල් මළුයෙහි පිය

වරසන් කොට සිටි කල බොධිසත්වයෝ දෙර කදුරුදසි විවාළහ. එහෙස්! මම්මයි කිවාය, දෙවිනි! මා කරා නොවේලේ නොඑන්නට වර ලද්දේම් වේදැයි කිහ. දෙවී කියන්නී සවාමීනි! කෙලෙස වෘසයෙන් අන්‍යතර සිතකින් ආයේ නොවම්. මා දුටු සවපාය කියන්නට ආමි කිව, මහබෝසතාණෝ කියවයි වදාළහ. මද්‍රී දෙවී කියන්නී සවාමීනි! එක් කළමිතියෙක් කසාවිලී දෙකක් හැඳ දෙකත රත්මල් පැලඳ ගෙන කඩුවක් ඉස සිසාරමින් මා කරා දුවත් මට නොයෙක් තුඩවැඩි බැණ මා හිස ජටාව අල්වා ගෙන ඇද උඩුකුරු කොට බිම හෙළා ගෙන මා හඬව හඬවා මාගේ දූස උදුරා ගෙන දූතත් කපා ගෙන ළය පලා ලේ පෙර පෙරා හෘදයමාංසය උදුරා ගෙන ගියේ වනැයි කිවාය. බෝසතාණෝ සිතය අසා සිතන්නාහු මාගේ සත්මසක් පිරිසී ගියාවූ දානපාරමිතාව සම්පූර්ණවෙයි සතුටුව දරුවන් දෙන්නා ගෙනයන්නට වනයට බමුණකු ආයේවනැයි සිතා බිසවුන්ට නියන්නාහු දෙවීනි! තෙපි මිහුරු ආහාර වළඳා සුවයහන්වල වැදහොව, තොප දූන් එලා එල වළඳා සුවයහන් නොලදින් දඩුමැස්සෙහි හෝනෙන් පෙනෙන සිනැසි කියා බිසවුන් සන්හිදුවා යැවූසය. පාන්වූ කල මද්‍රී දෙවී මලුව හැමද දූහැරි පැන් තබා මල්පුදා දරු දෙදෙන කැඳවා වැළඳගෙන මූණ තබා සිඹ සනහා දරු වෙනි! මා රැ දුටු සිතය නපුර තෙල්බින්දුවක් සාත් යහපතෙක් නැත. තොප පියාණන් ඇලයෙන් බැහැර නොයව,කෙළිනා තැන බිය පත්වවයි බැවාදී බෝසතාණන් කරා ගොස් වැඳ නැගිසිට සවාමීනි! මේවනයේ මට නැයෝ කම්නුඹ හා මේ දරුදෙබිහින්නෝය, සවාමීනි! මම වන එලා එල සොයා යෙමි. මම වනයට යන බවමුත් මාගේ දෙබිහින්තන් කෙරෙහි අප්‍රමාද වුව මැනව, නුඹ වහන්සේත් සිහි ඇතිව හුන මැනව, මා යන මුත් මාගේ ළය නුඹබව දූන වදාළමැනැවැයි කියා දරුදෙදෙනා පාවාදී මල්කරුව හා පෙට්ටිය ඇරගෙන වන මුල් වන එලා එල සොයා යන්නී හඬමින් වලපමින් වනදෙවියනි! මාගේ දරුවන් රක්ෂා කරව්, මා කම්කිළියගේ එකලා කම්බලවයි දෙවියන්ට යදිමින් ගියාය.

බොධිසත්වයෝ බිසවුන් වලට යාදී සක්මන්මලුයෙහි සෙළවර බමුණුඑන පෙරමඟ බල බලා උන්හ. දරුවෝ දෙදෙන බොධිසත්වයන් ඉදිරියේ වැලි කෙළ කෙළ උන්හ. ඉක්බිති බමුණු මද්‍රීදෙවීන් එලා එලයට යන වෙලායයි උන් වල සිට නොඑනතුරු ගොස් දරුවන් ඉල්වා ගනිමි සිතා පන්සලට ගියේය. බොධිසත්වයෝ එන්නාවූ බමුණා දුරදීම දැක සත්මසක් මුළුල්ලෙහි බහා තබනලද දානපාරමිතා නමැති ධුරය නහා සිටුවන්නටමෙන් එන කල්‍යාණමිත්‍රයෙක. සුලුවනය පසළොස් යොදනක් හා මහවනය පසළොස්යොදනක් ඇතුළුව තිස්යොදුන් මහ ගෙවා බමුණු නිසාමට නොඑන්නේය, දරුවන් දන් ඉල්වා ආයේවනැයි සිතා සතුටුවූ නියාව දරුවන් කෙරෙහි කළ ප්‍රේමය ටත් වැඩිව සිටියේය. මහබෝසතාණෝ ජාලියකුමාරයන් කැඳවා කියන්නාහු කුමාරයෙනි! පෙරමහට ගොස් බමුණා අත කෙණ්ඩිය පිරිසර ඇරගෙන තබවයි කියා ඉදිරියට යවූහ. ජාලියකුමාරයෝ සතුටුව ගොස් කෙණ්ඩිකාවට අත දික්කළහ. බමුණු සිතන්නේ මූ වෙස්සන්තර රජ්ජුරුවෝ මට දන් දෙන දරුවෝයයි සිතා දූන් මාමුන්ට මොළොක් වුවහොත් මතුවට මෙහෙ නොනෙරෙනි. දූන්ම මුන් භයගන්වාලම් සිතා උරණව කුමාරයන් මූහුණ බැලිය, ජාලියකුමාරයෝ භයවගන පලා අවුත් බොධිසත්වයන් ළඟට වන්හ. උන්

පසු පස්සෙහි බඹුණු ඇවිත් බොධිසත්වයන් දැන සතුහි කොට අසන්නේ ශ්‍රී වහනය! තොප ශරීරයට සැපද? මැසිමදුරුවන් සිංහ ව්‍යාඝ්‍රයන් යක්ෂප්‍රේත යන්හෙන් දුක්නැද්ද? වනමුල් වනඵලාඵල ලැබේද? තපසට අන්තරාය නැද්ද? දනව බාධා නැද්දැයි ඇසීය. ඒ අසා බොධිසත්වයෝ කියන්නාහු බඹුණ! හා කි මෙතෙක් දෙසින් දුක්නැත, තපසට අන්තරාය නැත, දනට බාධා නැත, පින්වත! හාගේ ශ්‍රමඳුන නිවා තෙල අඹ දඹ හෙහෙල් කටුඵරම්නිය, මියේ රසවැන්හ, ඒ ඵලා ඵල කා පැන් බී සැහපී ඉඳුවයි වදාළහ. බඹුණු කි ලෙසම ඵලා ඵල කා පැන් බී සැහපී උන්කලට මහබෝසතාණෝ හා ආ කරුණු කිවී දැයි බඹුණා විචාළහ. බඹුණු කියන්නේ මහා පුරුෂය! යම්සේ පඤ්චමහා ගඞ්ගායෙහි ජලසඤ්ඤය කෙතෙක් දෙන ඇද බී පුවත් සඳ කල්ම ක්ෂයනො වේද? එමෙන් ශ්‍රද්ධා ජලයෙන් පිරුණු සියලු යාචකයන්ගේ යිත් පුරා උත්තමයෙක්වූ නුඹවහන්සේ ළඟට අහිස් වැඩි නාටුයහකට ආයෙම් නො මෙමි. ඔබගේ දරුදෙදෙනා ඉල්වා ගම් කිය.

මේසේ බුදුවන්නාවූ ලොවිවැඩඹ සිතන්න වූ ඒමහා ණන්වහනසේ බඹුණා කි බස් අසා දරුවන් මුහුණ බලා බඹුණාගේද මුහුණ බලා ළඟට ගිය විසටුන් යිතිකොට යිය උපන් දළ සෝගිනි නිවා වදාරා දන් දීමෙහි එක් සිත් වූසේක. (එදු එසේ නොසිතුවසේ නම් මහබෝමැඩ වජ්‍රාසනයෙහි හිඳ මාරසෙනන ප්‍රලය නොට සෙසේ නම් බුදුවන්නසේක්ද? මෙසසරඅවුලෙහි බැඳුණු සත්ත්වයෝ සා මුණ බලා ගැලවෙද්ද? මෙම සත්ත්වයන් නිවන්පුරයවන්නෝ කවුරුද? එදු ඒ දරුවන් දන්දීමෙහි පසුබටවූ නම් බුදුවූ මහානුභාවයන් කරා මෙතෙයාවූ **ගිරිමේඛලා** නම් ඵරුෂ ඇත් ශ්‍රී පාදය වැඳ සෙසේ නම් හොඳද? සොරවූ සමිහු වැනිවූ **ඵාලෙය්‍ය** නම් යක්ෂයා කුමකට බිදී නැමී ශ්‍රීපාදය වැඳ හොඳද? එදු ඒ දරුවන් දන් දීමෙහි මිසුරුවූ නම් මිනිමැරු අඞ්ගුලිමාලඟා දැන් තමන් සස්නෙහි කුමට කුලගැනිවේද? **දෙවදත්ත** සථවිරයන් හිසට පෙරළූ ගල පොළොවින් ගල්දෙනක් මැවී කුමකට පිළිගනිද? තවද මහමෙර **සත්දරණ** පවුසින් වෙළාගෙන තමන්වහන්සේට කිපී විෂ තෙජසින් දිලියෙන්නාවූ **නාළාගිරිහත්ථි** නම් නාහරාජයා සෙසේ නම් හික්මවන සේක්ද? ඒ දරුවන්ට සෙහා ඒනිව දන්දීමෙහි පමාවූසේ නම් දෙදෙව්ලොව දෙවියන්ට අධිපතිවූ **සක්‍රදේවේන්ද්‍රයෝ** තමාගේ එක්සිය විසිරියන් **ජාලිකුමාරයන** තුඩ පොපියන හෙන් කුමකට පිඬිද? ඛ්‍රහ්මතෙජසින් දිලියෙන්නාවූ **මහාබ්‍රහ්මයා** සඟමිදරුවන්ගේ මිසකසඟට තමාගේ **ඛවලවජ්ඣඝ** ධරා කුමකට සිරිද? එදු ඒ දරුවන් නොදෙමිසි ඒ බඹුණු යැවූ නම් පස්වාදහසක් කල් මුළුල්ලෙහි නිවන්පුර දෙර හැර හබා තමන් පිරිනිවන් පෑ දවස් ශ්‍රී ශරීරයෙන් දහිය අසපින්වද වැළදූ පාත්‍රයවද පිටිවහල්වූ ශ්‍රී මහාබොධියවද තමන් වදහළ දහමවද වැඳ පිදූ සියලු මිනිසුන්ද දෙවිබඹුන්ද සෙසේ නම් නිවන්පුර පිහිටුවනසේක්ද? එසේවීනම් මේ සියල්ලම නොසිදුවන්නේය, නොහැකිවන්නේය.

මෙසේ දරුවන් දන්දෙමියි එක්සිත්වූ මහබෝසතාණෝ "දරුදෙදෙන ඉල්වමි"යි කි බඹුණාගේ බසට තමහට රාජ්‍යය පාවාදී වොටුනු පලදවමියි කි බසකට සෙසින් සතුටුව කියන්නාහු බඹුණ! හා මට පරලොව අමුත්තෙක. හාසේ මට මිත්‍රයෙක් නැත, සෙසු යාචකයෝ ඉල්වත් නම් ඇතකු හෝ ඉල්වති, අසකු හෝ ඉල්වති, රන්රුවන් හෝ ඉල්වති, මේ මහවලට අවුත් අනිත්

දෙයක් නොඉල්වා අපගේ දරුවන් ඉල්වූ බව ඉතා යහපත එය වැලකීමක් සිහිනෙනුත් නොසිතමි, දරුවන් තව සමසිනින් පාවා දෙමි. බලඑකක් කියමි. බමුණ! මේ ළඳ බොළඳ කුමාරයෝ කිසි දුකක් නොදුටු විරූය, දැන් මා දරුවන් දෙමි. උන් ගෙනගියෙහි වී නම් සා විඩා වෙති. එසේ හෙයින් ඔසවුන් වල් ගොස් අවුදින් දරුවන් දෙදෙන නාවා වනමුල් වන ඵලා ඵල කෑවා වැළඳ ගෙන ළඳ බොළඳ සුරතල් බස් අස අසා ඇවිලෙන ගිනි නිවා සැනහුණ කල අද රෑ මෙහි ලැග සෙට දරුවන් දෙදෙනා ගෙනයව, නවිද ඒ දරුවන්ගේ මැනියෝ දරුවන් අපට පාවාදී එකලාව වල් ගියෝය. ඵලා ඵල ගෙනවුත් දරුදෙන්නා නුදුටු නම් උන් ළය පැලියෙනියි සිතමි,මාගේ ඉෂ්ට මිතුවූ බමුණ! තට ගැති වනලද මේ දරුවෝ දෙදෙන ඉතා සිව්මැල්ලෝය, රජකුමරුවෝ ගැතිමෙහෙයේ නොහසළ විරූය තදින් මොලොකින් මෙහෙ උගන්වා ගෙන ගැතිමෙහෙ කම් ගනුවයි කියා අද මේවෙලාව හැම්මෙවයි වදුළසේක.

එබස් ඇසූ බමුණු කියන්නේ රජපුරුවෙනි! සත්‍රිහු නම් දනට බාධා කරන සුල්ලහ. ශුභකර්මාන්ත නොදනිති, අද මම මෙහි ලගිනට නොපොහොසතිමි. දරුවන් දන් දෙවි නම් මට කල් නොයවා දැන්ම දෙව, නොදෙවු නම් මම නැඟී යෙමියි කිය. එබස් අසා බොධිසත්ත්වයෝ බමුණාට කියන්නාහු දරුවන් දෙමි කියාලා නොදෙමි නොකියමි, දනට පසුබස්නා සිතකින් නොවෙයි බිසවුන් එනතුරු නොහැම්මෙහි නම් මේ සිව්මැලිදරුවන් මහ තලව තලවා සතප සතපා අස්වසමින් කැඳවා ගෙන සිවිරටට යව, ගොස් මා දරුවන් මුන් තණුවූ සඳමහරජපුරුවන්ට මෙපවත් කියාල මපියාණන් වහන්සේ අපකෙරේ කළ ප්‍රේමයෙන් මුනුබුරන් දුටු සතුටින් ඔවුන්ගේ මිහිරිබස් අසමින්ම තට කෙලිසොල්ලන් හා බොහෝ වසතු දෙතියි කිහ. එබස් අසා බමුණු ඉස සලා සලා කියන්නේ යහපත, අප දිවි ගන්නට සිතූ නියාව, රජපුරුවෙනි! නොපමේ උපාය කෙසේ උගතුද? මුනුබුරන් දුටු සඳමහරජ්ජුරුවෝ මට කියවි කියති, බමුණ! තෝ අප මුනුබුරන් ගැතිකොට ගෙන එයි දැයි කියමින් අත් පා කන්නාසා කපා දිවි ගනිති, වහල් තබා දිවි රැක ගනුත් යහපත, තෙපි දරුවන් දෙවි නම් දෙව, නොදෙවි නම් නොදෙව, තෙල බස් අප රකින් හොත් නොකියවයි කිය. බමුණා කියන බස්ද පියරජ්ජුරුවන් වහන්සේ තම දෙඛිනින්නන් වහල්කොට දෙමියි කියන බස්ද අසමින් භයපත්ව සිටි නොනි දිවියන් දැක මරණ භයින් දිවන මුවපොල්ලන් දෙන්නකුසේ ඉගි කරලා ඉගිල බමුණු ලුහුබඳවා එන්නේයයි ආපසු බලමින් දිවන්නාහු පන්සල පිටිපස්සේ වැද භයින් එතැනද සිට ගතනොහී වනලැහැබකට වැද සැඟවුණාහු බැලු බැලූ දිශායෙහි බමුණා දිවඑන්නාසේ පෙනෙන්නේය, එතැනත් නොසිට අනේ නඟණ්ඩ කුමක් කරමෝදැයි කියමින් කටුවැලින් හිරිගෙන හඬා දිවන්නාහු සතරැස් පොකුණට වැද අපි ඔවු නොවුන් සැඟවුණු තැන් නොපාමිහයි දෙඛිනින්න බැණ ගෙන ඔවු නොවුන් ඇඟ එල්බගෙන පොකුණ කරවටක් දියට බැස නෙළුම්පතින් හිස් වසාගෙන සැඟවී සිට කන්දී සොල්මන් අස අසා මැනියන්දැ ඊයේ රැදුවු සීතය නපුරුයි කිදැය, මැනියෝ පියාණන් හැර බැහැරකට නොයවයි කිවුය, පියාණන්ට අප බලන්නට පාවාදී ගියෝය, මැනියෝ අප වැලි සෙළිතියි සිතද්දෝ මෙවැනි දුක්වූ බව නොදනිද්දෝහෝ මේ දින දෙවියනි! නෙපි අපදෙදෙන රැක වහා දිවි ගොස් මැනියන්ට කියව්, මැනියන් දැක උන්දැ පිටහී හඬා පියා උන් දැ කිවා කරම්හයි .මෙසේ බැගෑපැවැ හඬ හඬා වෙවුලමින් කරවටක් දියෙහි සැඟවී සිටියාහ.

බොධිසත්ත්වයෝ දරුවන් සැහවුණුබව නොදැන බමුණාට දන්දෙන්නට යැයි දරුවන් කැඳවූහ. දරුවන් නොහිඳුන් හෙයින් බමුණු කියන්නේ වෙස්සන්තර රජුපුරුවැවැරි! නොපසේ බොරු දන්නෝ මේ මුළුරට නැත. නෙවි දරුවන්ට ඉඟි ලා ලා සහවාලා නොදන්නාවනම් හිද දරුවන් කැඳවාද, මේ තැන් වැයි දන් දෙනා තොපසේවූ බොරු කෙතෙකුත් හුදුටුවිරුමිසි කිය. ඉක්බිති බොධිසත්ත්වයෝ බොරු කිවයි යන බසට ලජ්ජාව කියන්නාහු බමුණ! මම දන්සොඬ යෙසින්ද මැනියන් හුවූ දෙදෙන නොදක්නා හෙයින්ද තෑගේ රළුකම් සිතා භයපත්ව පැලාවන්හ බමුණ තා මඳක් හැම්මෙවයි කියා නැගි සිට පන්සල පිටිපස්සට ගොස් වනලැහැබට බැස එහි නොදැක දරුවන්ගේ පියසලකුණෙන් පොකුණට ගොස් වන් බව දැනලා මෙකප බුදුවෙන සියලු දොළොවට සාහැති එළවන ඒ මහතාණෝ ළය (දුක්) වා ගෙන හඬගාතාහු මපුතණුවෙනි! ජාලිය කුමාරයෙනි! සි හඬගැහ. (බුදු වන ජාතියෙහි **රහල් කුමරු** වන මහපින් ඇති) ඒ ජාලිය කුමාරයෝ පියරජුරුවන් හඬ අසමින් බමුණා මැදිවී ගනිවා, මා ගැති තෙරේවා මපියාණන් වහන්සේ හඬ ගැ හඬ අසා නොසිටිම්සි සිතා පියාණනි! කියමින් හිස වසාගෙන සිටි නෙළුම්පත් දැතින් පිරිගෙන දිව අවුත් පියාණන් දකුණුපය ගෙන හඬන්නට වන්හ, බොධිසත්ත්වයෝ පුතණුවන්ගේ බැගැපත් හඬ අසා සංප්‍රාප්ත සහ සන්සිඳුවා ගෙන පුත! තොපගේ නැහණියෝ කොසිදැයි විවාළහ. ජාලිය කුමාරයෝ නොසියමහයි පළමු දෙන්න බැණගත් හෙයින් පියාණන් දහන්ද! හයින් පලායන මෘගජාතිනු දුනුනුන්ට කියා පලාගෙදැයි අසවූ දැ එබන්දක් වැන්නැසි කිහ. ඒ අසා බොධිසත්ත්වයෝ මාගේ දියණියෙනි කෘෂ්ණාජිනා වෙති!යි හඬගැහ. (බුදුවන ජාතියෙහි තමන් සස්නෙහි **උපුල්වන් මහා සඵ්ඨි** යයි ප්‍රසිඩ වන මහ ජනැති) ඒ දියණියෝ පියාණන් හඬගැ හඬ අසා බමුණා අප දිවී ගනිත්වා, මපියාණන් වහන්සේ හඬ ගැ හඬ අසා සිටිම්දැයි සිතා හිස නෙළුම්පත් හැරපියා දෙවිදුවක මෙන් අවුත් බොධිසත්ත්වයන් වම් පස වැළඳ ගෙන හඬන්නට පටන්ගත්හ. දරුවන් දෙදෙනා හඬා වැනුළ කඳුළු බොධිසත්ත්වයන්ගේ පිපි පියුම් වැන් දෙපත්ලෙහි දැහැරෙයි, බෝසතාණන් වහන්සේ දරුවන්ගේ දුක් බලා හඬන්නාවූ කඳුළු රන්පිටාටු වැන් දරුදෙබිඹින්නන් පිට වැහිරෙයි, මෙසේ හඬා සැනසී සිතන්නාහු මා හඬා ශොකවිමෙන් බුදුබව නොසැදෙයි, දරුවන් බමුණාට දෙමියි සිතා හඬමින් හොත් දෙදරුවන් නහා සිටුවා ළෙහි හොවාගෙන සිඹ සනහා පියා මනහාවූ මාගේ දරුවෙනි! මා දන්සොඬ බව නොදනුද? මේ සංසාරසාගරයට තොප පසුරුකොට ගෙන මම සංසාර සාගරයෙන් එතරව ගොඩ දකිම්. මම ගොඩ දැක තොප ඇතුළුවූ දෙව් බඹ මිනිසුන් සහිත ලොකයා ගොඩ දක්වාලම්, දරුවෙනි! මාගේ දැනපාරමිතාඛ්‍යාසය මස්තකප්‍රාප්ත කොට ලුව මැනවැයි අස්වසාලමින් පුතණුබ! තෙපි නිදහස්වනු කැමැත්තෙහි වීනම් බමුණාට (රන්) නික්දහසක් දෙමින් නිදහස්වුව මැනව, තොප නැහතියන් නිදහස් කොට ගන්නා කැමැත්තෙහි වීනම් බමුණු හට දැසයන් සියයක්ද දැසින් සියයක්ද ඇතුන් සියයක්ද අසුන් සියයක්ද වෘෂභයන් සියයක්ද (රන්) නිසඟ සියයක්ද යනාදියෙන් සියයක් බැගින් දී නිදහස් කොට ගනුවයි කියා දෙදෙනා වදිනා මිලකොට පන්සලට කැඳවාගෙනවුත් බමුණා කැඳවා කුමාරවරුන්ගේ අත් ගෙන කෙණ්ඩිකාවෙන් බමුණා අත පැන් වත් කොට සිත්කැලුවූ මේ දරුවන් දෙන්නා දන් දුන් විත්තයෙන් සවිනේ ගෙවා ලොවුතුරා සම්මා සම්බෝධියට පැමිණෙම්වා"යි කියා (ප්‍රාර්ථනා කොට) දරුවන්ගේ අත් ගෙන බමුණා අත තබා දන් දුන්හ.

මේසේ දරුවන් දන් දෙත්ම ළය කකියවා හඬන පක්ෂපාත මිඩියන සේ මහපොළොව කම්පිතව නටන්නට වන. මහමේරු පර්වතයද සපතකුට පලිහයෝද දරුවන් දන්දුන් ශොකයෙන් හඬන්නාසේ ඔවු නොවුන් ඇත ගැසෙමින් සතුටුව නටන්නට වන. සුවාසූ දහසක් යොදුන් ගම්භීරසාගරය තමාගේ රළ නමැති අතින් සත්රුවන් ඉස ඉස සොම්නසින් සැලෙන්නටවන දෙවියෝ සතුටුව සාධුකාරදී මල්වැසි වැස්වූහ. මහබෝසතාණෝ මා විසින් මනහර දනක් දුන්නෙමි. ඒ ඉතා ආශ්චර්යයයි ප්‍රීති උපදවා කුමරුවන් බලමින් සිටියාහ, ජූජක බමුණාද වනලැහැබට පිවිස දනින් වැලක් කඩා ගෙනවුත් ජාලිය කුමාරයන්ගේ දකුණත ගෙන කුමරියගේ වමත හා එකට බැඳ එම වැල් කෙළවරින් තළලින් ගෙන ගියේය, ඒ දරුවන් සිරුරුවල ගැසූ ගැසූ තැන සම් ඉගිල ලේ වැගිරෙසි, බැයන් පිට ගැසූ පහර නැහණියෝ පිට ලවා ගනිති. නැහණියන් පිට ගැසූ පහර බැයෝ පිට ලවා ගනිති. මේසේ දරුවන් රැගෙන යෙමින් සිටි බමුණා සෙලකින් බස්නේ සෙලින් පැකිල මුණින් වැටී හිණ.

බමුණා නොනැඟී සිටින තෙක්ම දරුවෝ දෙදෙන ගැලවී දිවගෙන අවුත් පන්සලට වැද බොධිසත්වයන් දෙපත්ලෙහි හිස තබාගෙන හඬා කියන්නාහු සවාමීනි! අම්මා නපුරු සීනයක් දැක නුඹවහන්සේට අප පාවාදී එකලාව චල් යන්නාහු කී බසට නුඹම දෙස් නොවේද? පියාණෙනි! ඒ සිහි නැද්ද? අප නුදුටු අම්මාණෝ ළය තෙහේ නම් වැවේද? අම්මා ආකල උන් වැඳ අඩා අපගේ දුක් පාපියතතුරු අප රැකනන්න අපි නුඹ ඇර පියා ගොස් හැම්මියනෙමෝද? පියාණෙනි! ඒ අවලක්ෂණ බමුණාට අප දන් නොදී අතික් බමුණකුට දෙන්න, මුගේ පා බකලය, නියපිරිතිය, යටට ගිලිහී ගිය පිණ්ඩික මාංශ ඇත්තේය, දික්වූ තොල් ඇත්තේය, කෙළ තොලුය, දැත් බොලුය, බිදුණු නාසා ඇත්තේය, තඹවන් දැළි රැවුලු ඉසකේ ඇත්තේය, බඩමහතය, වමරැසිය, බළල් ඇස් වැනි ඇස් ඇත්තේය, කන්කොරිය, ඇඟ රළු ගැසුණේය, කළුතල කැලලින් ගැවසුණේ සිරුරු ඇත්තේය, නාමුණු සිරුරු ඇත්තේය, යන එන කල හඬනැහෙන අසපි සඬින් යුත් සිරුරු ඇත්තේය, අවලක්ෂණයෙක, (නොහොත් මිනිස්වෙසින් ආ යක්ෂයෙක,) මෙසේ අවලක්ෂණ බමුණකුට අප නොදෙන්න, නොවලකා අප දෙන්නාහු නම් මා දින් දෙන්න, මාගේ නැහණියෝ ඉතා සිව්මැලියෝය, තමන් මොලකැටි හෙයින් මිඩිමෙනෙ නොසළ හෙනි, මම නැහණියන්ට වැඩිමහලු හෙයින් මම දුක් ගතහැක්කේ වෙමි, උන්කරන වෙහෙත් මම කෙරෙමි, කෘෂ්ණාජිනාවෝ මිඩිවූ කල සිවි මහා රාජවංශයට පරිනවය, නැහණියන් රැක මා උන්ට ගැතිකොට දුන මැනව, මැනියන්ට මා දුන්බව කියා නැහණියන් පාලා බැණ අස්වසා මැනියන් රැක පියන්නැයි යයා හැඩුහ.

බොධිසත්වයෝ මෙතෙක් දෑ කියතුදු මුවෙන් නොබැණ උන්හ. ජාලිය කුමාරයෝ කියන්නාහු පියාණන් වහන්ස! මෙතෙක් දෑ මා කියදී මුවෙන් නොබණනදුය, නුඹවහන්සේගේ ළය ගලක්වූයේය, පසකින් වැසුණේ වත. මේ කුමන දැඩිකමෙක්ද? මුවෙන් නොබැණ ඉඳිනට කුමන වරදක් කෙළේ දැයි කියමින් සිටි තැනට නිග්‍රිකවූ ඒ බමුණු නරියා තමා හුණු තැනින් එලි එන්නාගේ සිට දෙදණ වැලි පිස ලේ හුණු තැනින් වැගිරෙන ලේ දකිමින් පිටි

තොල් දත් තම්න් යමයකු සේ අවුත් වැඳ සිටියේය. දරුවෝ උඹ දැන හය පත්ව වෙවුලන්නාට පටන් ගත්හ. මෙසේ සිටි දෙදරුවන් බොධිසත්ත්වයන් බල බලා හින්ද දී අල්වා ගෙන යයහ. රාහු විසින් ගලනලද නොවැලසා යහ හිරසඳ මෙන් යම්න් සිටි දෙදරුවෝ පෙරළී පියාණන්ත් බලමින් පියුම් පෙති වැනි දුන් ඉස්මුදුනේ හබා වදිමින් අපගේ පිට වැහිරෙන් ලේ බලන්න, අප බැඳි බැම්ම බලන්න, පියාණෙනි! මූවෙන් නොබැණ ඉදිනේ මේ යකු අප කා මරවියහ. හුරුද? මැනියන්ට කියන කල අප වැඳ සමුගත් බව කියන්න. අප සුවපත් බවද නැවත දැක්මක් නැති බවද කියන්නැයි මෙසේ කිය කියා හඬා යෙමින් සිටියාහ.

බොධිසත්ත්වයෝ දරුවන් දෙන්නාගේ බැගෑපත් හඬ අසා ළය සැකියවා අතේ බමුණකු ඉහා දැඩි නියාය. මාගේ ඇස් හමුයෙහිදී මෙසේ දැඩිව මරන කල ඔබ්බෙනි දී තමා කැමැත්තක් නොකෙරේද, එන ද අප දෙදෙනා ඔක් හොන් ආ දරුවෝ දුන් කඳු බැවිල් සාටු බොරලු කෙසේ යෙද්දේ හෝ, සසින් මිඩාවූ දරුවන් කවුරු සතහා කිරි පොවාලද්දේ හෝ, පතුල් ඉදිමුණ දරු වන් කවුරු සතපා ලද්දේහෝ, සිත සුළං සා වෙවුලනා දරුවන් කවුරු සත හා නලවා ගතිද්දේ හෝ, මැනියන් තත මැද සැතපුණු දරුවන් අද රෑ නොතැනෙක වැදහෙව නිදද්දේ හෝ දරුවන් නෙරෙහි සෙනහයෙන් මා පිට හඬා පෙරළෙන්නාවූ බිසවුන් කෙසේ නම් අස් වසන්නෙම් දෙහෝසි සිතා මහත්වූ ශොකය ධරා ගන්නට නොහැකිව බමුණා ලුහුබැඳ ජීවිතය විනාශ නොව දරුවන් ගෙනෙමැයි සිතා නැවත ඒක්ෂණයෙහි සිතන්නාහු මතා නොට සිත් සතුටින් දන්දී තපස් චරන්නාහු සිත් කලකිරවා ගනිත්ද? පෙර උත්තමයෝද පළවූ කොට දසපෙරුමන්ද, දස උපපෙරුමන්ද, දසපරමත් පෙරුමන්ද, පුරා පඤ්චමහා පරිත්‍යාගය කොට බුදුවූහ. මමද එසේ බුදු වෙමියි සිතා මහත්වූ ප්‍රඥා උපදවා ගෙන මා සිතූසේ ඉතා නපුරැස, බුදුබවට හේතුවූ පාරමිතා නමැති සාගරය පිහිනා ගොඩ දක්නා සඳහා සිහිල් පොකුණෙහ දියෙහි ගැලුන පරිද්දෙන් මාගේ සිත් වියවුල් කෙරෙම්දැයි සිතා ඒ සිත් දුරැකොට මුඳ ලොව කිසිම සතකුට නුපුළුවන් මෙවැනි දරුවන් දන් දුනිමි. එකාන්තයෙන් මේ මා දුන් දනයෙන් ලෙව්තුරු බුදු වෙම්වයි සතුටුව පන්සලින් නික්ම පන්සල දොරකඩ පහන් පුවරුවෙක වැඩ උන්හ.

එවේලෙහි දරුදෙදෙන යම්න් සිට තමන් කෙළ ඇවිදිනා වෘක්ෂ සෙව නලු දැක ගස් සිදුරුගල්තුහා මැටියෙන් ඇඹු ඇතුන් අසුන් රථ ගොන් පෙතැල්ලන් ගිරවුන් වලිකුකුළන් කුරවි කෙවිල්ලන් වනමෘගයන් කිඳුරන් හා සතරැස් පොකුණු දැක ගස් මුල් දැක කියන්නාහු මනහරවූ මල් පිපී සිටිනා වෘක්ෂයෙනි! තොප හා පුරුදුව තොප මුල්හි වැලි කෙළ අදින් වියෝවූ අපි තොප වැඳ සමුගනුම්හ. පැහැපෙනුදුල වැලිතලායෙනි! අප දිය කෙළනා මන ඉර ගතුල් හැල්ලෙනි! තොප අතින් සමුගෙන මෙහෙයට යමිහ. මියුරු ගායනා හඬන කුරුම්බෙවිල්ලනි! අත්තල ගස ගසා අප ඉදිරියේ නටා ඛේදා ලියකියනුරුවෙනි! අපගේ මැනියන්ට අප වැඳ සමුගත් බව කිවව්, අනේ මේ වනදෙවියනි! අප හා පුරුදු ඇත්තෙනි! මැනියන්ට අප අතුල් පතුල් ඉදිම යානොහන බව කියව්. අප විදිනා සුව කියව් අපගේ අම්මා එතොත් මේ මහ ඔස්සේ දිවවයි කියා මෙසේ හඬමින් වලපමින් කැවිව කෙළනා වනමෘගයෙනි

සතරැස් පොකුණෙනි! අද තොප ගෙන් වියෝවූවිහසි කියා සමුදී යෙමින් සිටියදැය, අකුරුම්ශ්‍ර මහ ගොස් දරුවන් මිරිකුණු බවට මහදෙපාශීවයෙහි පිනි ගත් වෘක්ෂ වලප්නා වැන්න. වනවෘක්ෂයෝ බොහෝ බරව පිපෙන මල් නමැති මුඛ විවෘත කොට මද්‍රී දෙවින්ට දරුවන් ගිය බව කියන්නාක් වැන්න. ඒ වෙනෙහි මෘගපක්ෂීහු දෙඛිහින්නන් කෙරෙන් වියෝවූවිහසි ගජ්ජනා කළහ.

ඉක්බිති වලට ගිය මද්‍රීදෙවී සිහන්නී ඊයේ රෑ මම නපුරු සිහපායක් දුටිමි. මානේ දරුවෝ වහන්සේ ළඟින් පන්සලින් පිටත්වූයේහෝයි ළය කකියවා වනමුල් වන ඵලාඵල නෙ. නන සඳ අත යහුල වැටී යෙසි. පෙට්ටිය වැටියෙයි. දකුණැස මස් සැලෙයි, දෙපය වෙව්ලයි, හෘදය කකියවයි, මේ පළිතයේ දෙවියනි! මට කිමෙක් වේද්‍යෙහෝ මේ වනයෙහි නපුරු සිහන පෙනෙන්නේ කුමටද්‍යෙහෝයි. ළය කකියවමින් පන්සලට එනසඳ ශක්‍ර දෙවෙඳුතෙමේ දිව්‍යපුත්‍රයන් සතරදෙනකු කැඳවා කියන්නේ බොසිසතියෝ දරුවන් දන්දෙමින් සිටියහ. එතැනට බිසවු ගියෝ නම් නපුරුය, නෙපි ගොස් සිංහ ව්‍යාඝ්‍ර වලස් වෙස් මවාගෙන මහ අවුරා වැද හොවයි සම්මත කෙළේය, දෙවියෝද එසේම වෙස් මවාගෙන මහ අවුරා වැද ඉන්හ. බිසවු එන්නාහු භයඞ්කාර රූප දක කියන්නාහු මම යම්දවසක මේ මහ යන එන ක‍ෑ වෙසේවූ සතුන් නුදුටු විරිමි. මුවන් මොණරුන් වලිකුකුළන් වඳුරන් දකුත් මුත් මෙසේවූ සතුන් නුදුටු විමි. මේ වෙනෙහි වෘක්ෂ දෙවතාවෙනි පළිතයන්හි දෙවියනි! මොවුන් යවව, (රාමයන්ට සිතාවන්සේ) මාගේ සවා මීන්ට මම පතිවෘතාවීමි නම් වහන්ස කුඩාවරුනි! මහින් ඉවත්වයි මහන් කොට හඬගසා නොයන විසින් අනික් යන මහක් නැත්තෙන් පෙරමහට දරුවෝ අවු නම් නපුරුයි සිතා මම ඒ මහ හොත් සතුන් විසින් නො ඇ හෙමියි ළය කකියවා, තුමූම නැඟී යෙද්‍යෙහෝයි සිව කියන්නාහු දරුවෙනි! මම තොප නැසිය කොට වනාන්තරයට ඇ, වෙස්සන්තර රජ්ජුරුවන්ගේ අඹු වෙමි. හොපවුන් මාගේ නැසියෝ නැත. මා නුදුටු දරුවෝ නොහැඹෙනි. රෑ නොවනතුරු මා නැඟී යා දෙවයි කිහ. එසේ කිවද නොයන විසින් මහන් කොට හඬ නහා අත්පොළසන් දී තොපට කුමන වරදක් කෙළේද්‍යෙහෝයි කිහ. පතිවෘතාවන් මෙසේ කියත්ම මෘගජාතීහු භය ඇතිව නිදි පුබුදුවුවන් සේ හඬා හිර බට බවු දැන නොපෙනී ගියහ.

මද්‍රී දෙවී සඳරැසින් යුත් රාත්‍රියෙහි වනමුල් වන ඵල ඵල ගෙනෙමින් දරුවන් මෙහැන දකිම්ද්‍යෙහෝයි සිතා එන මහ නොදැක මා දරුවන්ට කුමක් වීද්‍යෙහෝයි සිව කියන්නී මාගේ දරුවන් ගෙන් මිහිරි බසක් මා කන නොහිණ. ළද බොළඳ බසක් නොඇසිමි. ළා සඳක් වැනි මුහුණු නුදුටුයෙමි. පෙර කෙළනා රූක්මුල නොදක්නෙමි. ජාලියකුමාරයෝ පෙරමහට අවුත් අම්ම! අඹ නැද්දැයි හින බලති. කෘෂ්ණජිනාවෝ අවුත් තනය ගනිති. මේ නුගමුල වැලි කැටි කොට කෙළනා තැනැයි බලමින් ගොස් පන්සලට වැද කනෙහි කිර ඉසිමින් සියොලඟ වෙවුලමින් මුව ඇයලි ළය කඩියවා වහන්සේ කෙරෙහි නැත්නුසි කොහෑ හි නිදිගන්වූයේහෝයි යම් කිසි රූකක්මුල නිදිගනිද්‍යෙහෝයි ඇත්කඳ ලිහිණියෝ ගෙන යියෝද්‍යෙහෝයි යක්ෂ භූත ප්‍රෙතයෝ ගෙන ගියෝද්‍යෙහෝයි ළද බොළඳ මියුරු බසක් නාවර ඒවෙනා ඇසිය හෙම්ද්‍යෙහෝයි ළද බොළඳ සිනාවක් නාවර පිටෙන ඇසිය හෙම්ද්‍යෙ

හෝයි මැනියෙනි! පියාණෙනි! කියන බසක් කවර විටෙක ඇසිය හෙම්දෝ හෝයි හඬා වැලප බෝසතාණන් අතින් මිවාරන්නි සවාමිනි! දරුවන් සිහන් නන්ට දන්දුන්ටුදුසි විමාළාය. බෝසතාණෝ මුවෙන් නොඑණ වැඩහුන් හෙයින් බිසව් කියන්නාහු වහන්ස! දරුවන් නොදක්නා ශොක තබා නුඹ වහන්සේ මුවෙන් නොබණන ශොකය බොහෝයයි කියා මෙසේ හඬතුදු එතබසකුත් නොකියාම වැඩහුන්හ. ඉක්බිති බිසව් කියන්නාහු පෙර මේ වෙලාවට පින්දර ඇතිකොට නිදිනදුය, අද මුවෙන්වත් නොබණන දැය, මා එතතුරු දරුවන් ඇසිමියි මිට වර දුන්දැ වේද? දරු සෙනහයෙන් මා අඩා ඇවිදිනාතුරු නොඛණ වැඩහිදිනාදුය. ඔබගේ දරුවන් කැඳවාලා එලා එල වැළඳවුව මැනව, නොබණනදුනම් නුඹ කොරෙන් මාගේ ජීවිතය හොරකෙ රෙඹියි කිහ.

එසඳ බොධිසත්වයෝ සිතන්නාහු මොහු දරුවන් කෙරෙහි සෙනහ බොහෝදුය, දැන් මා දරුවන් දුන් බව කිම් නම් නපුරුයි සිතා කල්යවා කියන්නාහු තෙපි වහාමුල් වන එලා එල පිණිස උදුසනම ගොස් මෙවේලේ සඳපහනේ ආයෙහිද? අද මා දරුවන්ට සෙනහ බොහෝ වේද? තොප පසුබකල්‍යාණයෙන් යුත් රූප සම්පන්නයව, මේ වෙනෙහි වනවරකයෝද රැසිවරයෝද තාපසවරුද ඇත. මෙපමණ වෙලා නොප කුමක් කොළෝදැයි කවුරු දනිද්ද? "මාගේ දරුවන්ගේ පවත් කෙසේද? සවාමිහුගේ පවත් කෙසේදැ"යි මෙපමණ සිතකුදු නුවූයේයයි තර්ජනය කොට කිය.

එබස් අසා මද්‍රී දෙවි මාලස්වූ හෙයින් නොබැණවුන්දැවැයි සිතා කියන්නි මම වේලේ ආමි, මේ වෙනෙහි පක්ෂි ආදිහු මහත්කොට හැඬූ හඬ අසා මා දරුවන්ට කුමක් වීදෝහෝයි ළය කකියවා එමින් සිටි සඳ මහ සිංහ වලස් ආදි වෙස් ගත් තුන්දෙනෙක් මා එන්න නොදී මහ අවුරා ඔත්හ. එසේ හෙයින් ලස්සීම් කිවාය, මේසේ බිසවුන් කියතුදු නොබැණ ඉන්න හිසින් ළය කකියවා වෙවුලමින් හඬා ගෙන පන්සල පිටිපසට ගොස් හඬහ සන්නාහු මාගේ ළයක් වැනි ජාලිඝකුමාරයෙනි! සිව්මැලි සෘෂණජිනාවෙනි! නොපානාවන්නට වලින් නසාගෙනාම්. මාගේ ළය වැනි කුමාරයෙනි! මා කල් කිලිය කරු නොඑවුදුයි මහත්කොට හඬාලා බසක් නොලදින් මාගේ දරුවන්ට නැස්මෙක්වනැයි නියත කොට සිතා රාත්‍රියෙහි මහා සෝදුකින් හඬා ඇවිදින්නාහු මාගේ දරුවන් කෙළනා පොකුණයයි පොකුණ බලා දරුවන් එක්ක කෙළනා මුව පොල්ලෝයයි මුවන් බලා දරුවන් කෙළනා රුක්මුලැයි රුක්මුල් බලා නොදැක එතැනින් ඔබ්බට ගොස් මා දරුවන් සමඟ කෙළන නටන මොනරුනැයි මොනරුන් බලමින් දියණියන් බස් වැනි කුරවි කොවිල්ලෝයයි කුරුවි කෙවිල්ලන් බලමින් මාගේ දියණියන් වැනි යහපත් වූ ඇස් ඇති මෘගාඛහනා වෝයයි රැලෙහි යන මුවන් හා මුවදෙනුන් බලා දරුවන් හා එක්ව ඇවිදිනවුන් දකිමින් මා දරුවන් නොදක්මියි බිසවු මහ හඬින් හඬා සිසන් නැතිව වැටී හි මද විගසකින් සිසන් ලදින් මාදියණියන් කෙළනා කෙළිවලදැයි කෙළිවලන් බලමින් දියණියන්කෙළනාමැටි ගිරවියයි ගිරවුන් බලමින් බිඹ නි නොයෙක් වාරයේ හඬා රාත්‍රියෙහි ගලවනපහන ගැසි ඇලදෙල කදු බැවිල් ගංගෝ මේ ආදි සථාන බල බලා වඤකගිරිපබ්භත යෙහි පසළොස්ගවුවක් බඳ මානයේ සඳපානේ තුන්විටක් වට කොට බලා ඇවිදිදැහ. බිසවු බලා ඇවිදිදදී බොධිසත්වයෝ ආසිවිය නොඔබා නිදිවියෝව උන්හ. පහන්ව හිරු නැහෙමින් සිටි වේලෙහි මද්‍රී දෙවී බළලකු ගත් කිකිළි යසා මෙන් වෙවුලා හඬා සිසන්න නැතිව හොත්හ.

බොධිසත්වයෝ මද්දදෙවී හොත් පිලස් බලා ළය හකියවා මේ වෙතෙනි මාගේ නෑ කෙනෙක් නැත. තෙවි වනාන්තරයෙහි මළාදැයි කියා සිත් කැලඹී ගොස් බෝසතාණෝ හොකපත්ව හුවණින් හොඳා දුරුකොට නෙළුම් පොකුණට ගොස් දිය ගෙනවුත් සත්මසක් පිසූ බුහ්මවියහියෙන් සහාක්‍රියා කොට බ්‍රහ්මවියහියෙහි ඇල්මක් නොකොට මද්දදෙවින් හිස (දෙකලව) ඔර පිට තබාගෙන ඔයුමක් වැනි අත්ලෙන් ළය අතගගා මූහුණට දිය ඉස අනින් ලෙහි දිය ගසා සිතන්නාහු සිවිරට හෙව මියගියෝ නම් මහත් රජපෙරහරින් දවන්නාහ. මා උදකලාව මේ වෙනෙහි කුමක් නොරෙළුදැයි සිතා මහත්වූ හොකයෙන් තැවි තැවී උන්කලට බිසව් කල්යාමකින් සිසන්නලදින් ලජ්ජාව මහබෝසතාණන් වැඳ විවාරන්නාහු වහන්ස! මා දරුවෝ කොසිදැයි විචාළහ බොධිසත්වයෝ කියන්නාහු දෙවිනි! ඉතා වයොවෘධිවූ බමුණෙක් සැටයෝදුන් මහ ගෙවා දන් පිණිස ආයේය, ඕහට දරුවන් දන් දුනිමි කිහ. එවිට මහ පොළොව හඬා ගුගුළාය, සියලු දෙවියෝ සාධුකාර දුන්හ. මහාමේරු පර්වතයද සහාකුල පර්වතයෝද රැව් පිළිරැව් දිදී නටන්නට වන්හ. දෙවිනි! දානපාරමිතාවට යම් සිතක් නොසිතා පින් අනුමෝදන්වවයි වදළහ. බිසවු කියන්නාහු සවාමීනි! මට මෙසේ නොකියා හඬා ඇවිද්දදී නොබැණහුන්න දැයයි කියමින් දෙහොත් මුදුනේ තබාගෙන පින් අනුමෝදන් වේමැයි කියා සාධුකාරදී පින් අනුමෝදන්ව ගෙන කියන්නාහු සවාමීනි! දරුවන්ට වැඩියෙන් දහසින් ලක්ෂයෙන් බුදුබව උත්තමයයි සතුටුව සිත් සන්සිඳුවා ගෙන සවාමීනි! මටම පින් දෙනදැ, මුළුලොව සතුන්ටත් පින්තම් දුනමැනවැයි පින් දෙවා සිත් ප්‍රසන්න කොට දානපාරමිතාව මුදුන්පත් කළහ. සියලු දෙවියෝ සතුටුව සාධුකාර දී පින් අනුමෝදන්ව මල්වැසි වැස්වූහ.

ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ සිතන්නේ බොධිසත්වයෝ තමන්ගේ දරු දෙදෙනා බමුණාට දන් දුන්හ. බිසවුහුදු යම් කිසි හින පුරුෂයක් හට දන් දුනහොත් නපුරුයි සිතා දිව්‍ය ශරීරය හැරපියා මහලු බමුණු වෙසක් ගෙන අවුදින් කියන්නේ ගමන් විඩායෙන් මිරිකුණෙමි, රජ්ජුරුවෙනි! කොතැනක උන්නාදැයි කිය කියා ළඟට අවුත් බෝසතාණන් දැක කිඳන්නේ රජ්ජුරුවෙනි! ඔබගේ සුවදුක් කෙසේද? යැපෙන පමණ ආහාර ලැබේද? වනමුල් ඵලා ඵල ලැබේද? මැසි මදුරු ආදීන්ගෙන් හා වන සියුනුවුන්ගෙන් උපද්‍රවනාද්දැයි යනාදීන් පුළුවුන්හ. බොධිසත්වයෝ කියන්නාහු තා කිමේහැම දෙයින් කියි අඩුවෙක් උපද්‍රවයෙක්ද්‍යැත. ඒ සියල්ලම හොඳින් ලැබෙන්නේය, තා ආ කාර්‍යය කිමෙක්දැයි විචාළහ. බමුණු කියන්නේ රජ්ජුරුවෙනි! ඉතා වයොවෘධයෙමි. ගමන් විඩායෙන් මිරිකුණෙමි. තොප අතින් රන් රුවන් මුතු මැණික් ඉල්වා ආයෙමි නොවෙමි. මාගේ ගෙයි මෙහෙ කරන වැලක් නැත් තෙමි. තොපගේ බිසවුන් මෙහෙ කිරීමට ඉල්වා ආමි කිහ. බොධිසත්වයෝ කළමනා කිමෙක්දෝ හෝයි සිතා බිසවුන් මූහුණ බැලූහ. බිසව් බොධිසත්වයන් සිතූ අනිප්‍රාව දැන කියන්නාහු මව්පියෝ නම් සත්‍රීන්ටද වෙනස්හ, නැයෝ නම් තමාගේ සවාමියා පින් සඳහා දෙත් මනාමය, වසතු සඳහා දෙත් මනාම යයි (සතුටුවන්නාහ.) සවාමීන්ට ඉන් වන ඵලාභයෙක් නැත. නුඹවහන්සේ මට අධිපතිය, එබැවින් යමක් හට දුස බවට දෙනු කැමැතිසේක් නම් එසේ දුන මැනව, වසතුව සඳහා දෙනු කැමැතිසේක් නම් එසේ දුන මැනව, යමක් හට (මසින් ප්‍රයෝජන නම්) මස් පිණිස දෙනු කැමැතිසේක් නම් එසේ දුන මැනව, තවද නුඹවහන්සේට අනිමිනයක් කළ මැනවැයි කිහ.

එසේ කී කල මහබෝසතාණෝ සතුටුව බ්‍රාහ්මණයා කැඳවා අත පැන් එව පියුම්ක් බිඳුවූ බිසවුන්ගේ අතගෙන එකාන්තයෙන් සම්‍යක්සම්බෝධියට පැමිණ සියලු ලෝවැස්සන් නිවන්පුරයෙහි පිහිටුවා ලිය හෙම්වයි පතාගෙන බුදුරජාට දන් දුන්හ. මෙසේ බිසවුන් දන් දෙත්ම මහපොළොව සතුටුව ගුගුළාය, මේරුපර්වතය හා යුගන්ධරාදි සප්තකුට පර්වතයෝද සතුටුව නට මින් සාධුකාර දුන්හ. සදෙව්ලොව දෙවියෝද සතුටුව සාධුකාර දුන්හ. බ්‍රාහ්මණ සියන්නේ රජ්ජුරුවෙනි! තොප බිසවුන් මට දන් දුන් බැවින් බිසව් අප සහායකයෝය, තොප සතු දෙයක් මුත් අනුන් සතු දෙය දන් දිය නොහැක්කේ වේදයි කියා මා එනතෙක් බිසවුන් තොපට පාවාදිනිමි. තොපි මේ බිසවුන්ට සුදුස්සව, තොපට මූ සුදුස්සහයි බොධිසත්වයන්ට පාවාදී ශක්‍ර දෙවෙන්ද්‍ර බව හැරවා ශක්‍රවිලාසයෙන් සිට කියන්නේ රජ්ජුරුවෙනි! තොප දරුවන් දන් දුන් විටම දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝනකඩ මහබෝල්පොළොව මහඟින් හඬා ගුගුළාය, එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උසඇති මහාමේරුපර්වතයද සප්තකුල පර්වතයෝද සතුටුව නැටුම් ගත්හ. තලාටු භූමිටු දෙවියෝද සතුටුව නැටුම් ගත්හ. සදෙව්ලොව දෙවියෝද සොළොස් බඹතෙලෙහි මහ බ්‍රහ්මයෝද සතුටුව නැටුම් ගත්හ. සාධුකාර දුන්හ. එසේම හොපට ඡ්‍ඣාහත්තෙන් ලොව්තුරා බුඩත්ව සිඩවේවා යි කියා තොපගේ දරු දෙදෙනා මුහුන් මිත්තන් කරු බමුණා ගෙන ගියේය. අනික් සත්දව සකින් තොප කරු දරුවෝ එති. එබැවින් වරඅටක් ගනුවයි දිව්‍යානුභාවයෙන් දිලියෙන්නේ ළඟිරුමඩලමෙන් අහසෙහි සිඩ කියේය.

සක්දෙව්රජාණන් කී වරඅට ගන්නාවූ බෝසතාණෝ වර ඉල්වන්නාහු එසේ වී නම් ශක්‍රදෙවෙන්ද්‍රයෙනි! මම මේ වනයෙන් ගොස් සඔකිය ශාඛයට පැමිණිකල මාගේ පියතෙමේද මේ දැනය අනුමෝදන්ව මා කෙරෙහි සතුටුව රාජ්‍යයෙන් පවරනු ලබම්වා, කිසිවක්හටත් වධකිරීමට රුචි නොවූයේ රාජාපරාධ කළවුන්ද වධයෙන් මුදනු ලබම්වා, ළදරු මහලු මධ්‍යම ඝන (වයස්ගිවූ) සියලු දෙනම මාගෙන් ජීවත්වනු ලබාවා, පරදුරකමීයෙහි නොඇලුනේ සඔකිය භාග්‍යාව හා සතුටුවූයේ සත්‍රීන්ගේ වසඟයට නොපැමිණෙම්වා, තවද ශක්‍රදෙවෙන්ද්‍රය! දීඝායුෂ්කාවූ දැහැමෙන් සෙමෙන් ජීවත්වන්නාවූ පුත්‍රයෝ ලබම්වා, මෙයින් චුතව ගොස් තුසිපුරයෙහි උපන්නේ විශෙෂවූ දිව්‍යානුභාවය ඇති වෙම්වා, දන් දෙන කල වසතුව ක්ෂය නොවූයේ දන්දී නොතැවෙන්නේ සිත පහදවාගනු ලබම්වා, ඒ තුසී පුරයෙන් සැව මිනිස් අත්බවට පැමිණියේ නැවත නූපදිනු ලබම්වා (නොහොත්) සම්‍යක්සම්බුදුරජාණන් වහන්ස යට පැමිණ කෙළවර නිවන් දකිනු ලබම්වාසි වරගත්හ. මෙසේ එදවස් වරදී ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ දෙව් ලොවටම ගියේය.

එකල ජූජක බමුණාද දරුදෙබිඹුන්ව ගෙන සැටයොදුන් මහට පිළිපන්නේහ, දෙවතාවෝ කුමරුවන් අරක්ගත්තාහුය, ජූජකයා හිරු හඳහන යට ගිය වේලෙහි දරුදෙදෙනා ගස්වල බැඳ කිම් වැද නොවා තමන් වහුන් වලසුන් කෙරෙහි ගත් හයින් රැකකට නැඟී කදවෙලෙප් අතරෙහි නිදසි. එකෙණෙහි එක් දිව්‍යපුත්‍රයෙක් වෙස්සන්තර රජ්ජුරුවන්ගේ වෙශයෙන්ද එක් දෙව්දුවක් මද්‍රී දෙවීන්ගේ වෙශයෙන්ද අවුත් කුමරුවන් මුදා සුවද පැනින් නාවා පිළි හඳවා බත් අනුභව කරවා දිව යහනෙක හොවා බඩ දී ගෙන

හෙව දරුවන් නිදිගන්වා පාන්වූකල කුමාරවරුන් පළමු බැඳලූ සැටියේම හොවා නොපෙනී නැගිගියහ. ඉක්බිති බමුණු පිබිද පියා පාන්වූ බව දැන ගසින් බැස පියා දරුවන් තමාගේ රටට ගෙනයම්සි සිතන්නේ දෙවිතානුභාවයෙන් කලිඟුරටට නොගොස් ඔවුන්ගේ මුතුන් මිත්තන්ගේ රටවූ ජය තුරා නුවරට පැමිණියේය

එදවස් වනාහි සඳමහරජාණෝ සවජනයක් දක්නෝ තමා මහාවිනිශ්චයෙහි යෙදී හුන්කල එක් පුරුෂයෙක් පියුම් දෙනක් ගෙනවුත් තමා අත තැබුයේය, රජ්ජුරුවෝ එයගෙන දෙකන පළඳගත්හ. එහි රේණු යිලිනි රජ්ජුරුවන්ගේ උදරයෙහි වැටුණේය, රජ්ජුරුවෝ පිබිද පියා වතුඵේදයෙහි නිපුණ බමුණන් ගෙන්වා තමන් දුටු සවජනය විචාළහ. බමුණෝ කියන්නාහු සවාමිනි! තොප සිත් ප්‍රියවන දරු දෙදෙනෙක් එන්නේ වනැසි නිවා හුය. රජ්ජුරුවෝ එබස් අසා සතුටුව උදුසන්හිම නොගෙක් අග්‍ර රසයෙන් යුකතවූ භොජනය අනුභවකොට විනිශ්චයාසනයෙහි වැඩහුන්හ. දෙවතානුභාවයෙන් බමුණා දරුදෙදෙන ගෙනවුත් රාජාඩඹණයෙහි සිටුවූයේය. රජ්ජුරුවෝ ජාලියකුමාරයන් හා කෘෂ්ණාජිනාවන් ඇරගෙන බමුණෙක් ආයේ වනැසි යනු අසා බමුණා ගෙන්වා දරුවන් දෙදෙනා දැක සතුටුව බමුණ මේ දරුවන් දෙදෙන කොසිසිට ගෙනා සේ දැසි විචාළහ.

ඉක්බිත්තෙන් බමුණා බොරුවක් කියා මා මුන්ගෙන් ගැලවුන මැන වැසි සිතා "අනික් රජකු නමක් කියමි" සිතා කට දැල්වූ සඳ දෙවතානුභාවයෙන් වෙස්සන්තර රජ්ජුරුවෝ මට දන්දුන්හයි කිය, ඉක්බිති මේ සාවර රටෙක්දෙහෝයි බමුණු සිතන්නේ සඳමහරජාණන්ගේ රටබව දැන මා දිවි නැත. කුමක් කෙරෙම්දෙහෝයි සිතා වෙවුලන්නට වන. සඳමහරජාණෝ පුතණුවන් වෙතෙහි හිඳ දන් දුන් බව සිතා මහත්කොට හඬා කඳුළු පිස දරුවන් ආ බව නගර වාසීන්ට කිහ. නුවර වාසීහු කියන්නාහු සවාමිනි! දරුවන් දන් දෙන කල ඒ උත්තමයාගේ ළය ගලෙක් වීදේ යපතකින් වැසුදේ බමුණු මාල්ලකුට මෙවැනි දරුවන් දන් දුන් ඒ ළඳ කෙසේ වාගෙන උන්නේදේ, අපි ඔවුන් ඇළි ඇතුදන්දුන්සේ නපුරුයි රැහැනිව වඩකළිරි පඳිතයට ඇවුම්හ. දැන් මෙවැනි මනහර ළද බොළඳ සිවිමැලි දරුවන් දන්දුන්හ. මෙබඳු සිත් ඇති ඒ උත්තමයාගේ ගුණ දැන නුගුණ පහකොට් ගොස් ඔහු ගෙනෙම්හයි කීහ. නුවරවාසින්ගේ බස් අසා ජාලිඝකුමාරයෝ කියන්නාහු අප දන් දෙන පියාණෝ බමුණා කෙරෙහි කරුණාවෙන් දන් දුන් දැය, කෘෂ්ණාජිනාවන් කී එකවචනය අසා එකොණෙහි තබවන් ඇසින් කඳුළු වගුරුවා මහත්වූ ශොකයෙන් දන් දුන් දැය, මපියාණන්වහන්සේ ඉතා තදයයි කුමට නිදු කොළෝදැයි කීහ.

එබස් අසා නුවරවාසීහු සතුටුව සවාම්දරුවාණෙනි! සිවිමැලි කුමාරයන් වහන්ස! නුඹ පියාණන්වහන්සේගේ අගුණ නොකිම්හ. ඒ උත්තමයා කිසිවකු විසින් නොකොට ගතහැකි තොප බඳු දරුවන් දන් දුන් නියා ඉතා බැරියයි සතුතිකළ බව මුත් නුගුණයකට නොකිම්හ. සවාමිනි! ඊට ක්ෂමා වුවමැනවැයි කියා සිටියහ. එකල සඳමහරජාණෝ ඇසින් කඳුළු හෙත කියන්නාහු මපුතුන්ගේ මනහර දරුවෙනි! මාගේ සිවිමැලි මුනුබුරෙනි!

මෙසේ අවුත් මාගේ ඇතෙහි හිඳුවයි කිහ. ජාලියකුමාරයෝ මුත්තණුවන්ගේ බස් අසා සියන්නාහු බමුණන්ගේ ගැත්තොත් රජදරුවන් ඔර හිඳිද්දූයි කිහ. එසඳ නගරවාසිහු මහා ශොකයට පත්වූහ. රජ්ජුරුවෝද වැලප ඉඳ සියන්නාහු ජාලිය කුමාරයෙනි! පොප දනට දෙන සාල තොපගේ පියාණෝ කෙපෙක් (මිල) අනය කොට දුන්නෝදූයි ඇසූහ. ජාලිය කුමාරයෝ කියන්නාහු දෙවයන්වහන්ස! මා දන් දෙන්නාවූ පියාණෝ (නික්) දහසක් අඟයකොට දුන්හ. නැනණියන් දන් දෙන්නාවූ පියාණෝ ඇත් අස් ආදි සියල්ලෙන් සියය සියය හා බරේ බර වසතු අඟයකොට දුන්හයි කිහ.

සඳමහරජාණෝ කුමාරයන්ගේ මිහිරි තෙපුල් අසා සතුටුව ජාලිය කුමාරයන්ට දහසක් දී කෘෂ්ණජිනාවන්ට උන්ගේ භාරයෙන් රන්රුවන් හා බොහෝ වසතු හා සත්මහල් ප්‍රාසාදයක්ද බමුණාට දී දෙඛිහින්නන් ගලවා ගත්හ. බමුණාට දෙනලද පිරිවරද බොහෝවූහ. බමුණු ධනය තැන්පත් කොට තබා ඉස් සොධා නහා අවුත් රජ්ජුරුවන් විසින් තමන්ට පිළියෙළ කරන පරිද්දෙන් පිළියෙළ කරවා දුන් රසභොජනය අනුභව කොට (තමහට දුන්) ප්‍රාසාදයට නැගී මහයහනෙහි හොත්තේය, රජ්ජුරුවෝ කුමරුවන් ඉස් සොධා නහවා බත් කවා ජාලියකුමාරයන් රජ්ජුරුවන්ගේ ඇතෙහිද කෘෂ්ණජිනාවන් බිසවුන්ගේ ඇතෙහිද හිඳුවා ගෙන සතුටු සතුටුව සිඹ සතහා සඳ මහ රජ්ජුරුවෝ කියන්නාහු ජාලියකුමාරයෙනි! තොපගේ මැනියන් හා පියාණෝ සුවයෙන් වෙසෙද්ද? ලෙඩදුක් නැද්ද? මැසිමදුරුවන් ගෙන් හා සිංහව්‍යාඝ්‍රාදීන් ගෙන් පීඩා නැද්දූයි ඇසූහ. කුමාරයෝ කියන්නාහු මුත්තණුවන් වහන්ස! දෙදෙනම නිරොගිව වසත්. කියනලද කිසිවකින් පීඩාවක් නැත්තේය, පියාණන් වහන්සේ නුඹ කෙරෙන් වියෝවූ දුකින්හා තපස් කිරීමෙන් දවස් හළ දූය. මැනියෝ ඵලාඵල පිණිස ගොස් අව්සුළඟින් පැහැර අතින් පිරිමැදීමෙන් මලානිකව ගිය පියුමක්මෙන් මලානිකවූ මුහුණු ඇතිව මහවනයෙහි හැසිරීමෙන් බමරුන්සේ කළුපැහැ ඇති කෙසකලාපය අතුපතර ඇලලීමෙන් තුනිව දෙකිසිල්ලෙන් වැහෙන ඩහදියෙන් තෙමිවූ සිරුරුළුඇතිව දවස් හළ දූයයි කියා නැවත මුත්තණුවන්ට වොදනා කරන්නෝ සියලු සත්ත්වයන්ටම තමන් තමන්ගේ දරුබිලිදුන් ප්‍රිය වන්නාහ. නුඹ වහන්සේ දරුවන්ට ප්‍රේම කිරීම ඉතා මදයයි කිහ. ඒ ළඳ බොළඳ බස් අසා මින් රජ්ජුරුවන් හා නුවරවාසිහු මහත්වූ ශොකයට පැමිණියහ.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ කුමාරයන්ගේ බස් අසා සැබව කුඩෙනි! කිසිවරදක් නැති මපුතණුවන් නගරවාසීන්ගේ බස් ගෙන තෙරපීමියි හඬා වැලප අමාත්‍යයන් කැඳවා කියන්නාහු වඩකනිරි පර්වතයට යනු පිණිස සියුරඟ සෙනඟ පිළියෙළ කරවයි කිහ. එදිව අමාත්‍යයෝ නුවර බෙරලවන්නාහු මෙයින් සත්වැනි දවසෙහි වඩකනිරි පර්වතයට යනු පිණිස යොධයෝ සැටදහසක් දෙන නානා වණ්ණ වසත්‍ර හැඳ පැලඳ සන්නාහ සන්නඩව ඇත් අස් රථ පදික ඝන සියුරඟ සෙනඟ පිරිවරා ගෙන දහස් ගණන් ඇතුන් අසුන් පිටට පැන නැගී එත්වාසි අණබේර ලැවූහ. ඉක්බිති රජ්ජුරුවෝ ජයතුරා නුවර පවන් වඩකනිරි පර්වතය දක්වා අට ඉස්බක් පමණවූ මාගීයද අලඬකාර කරවයි නියොග කළහ. අමාත්‍යයෝ මහ සරසන්නාහු කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා කෙනෙල් නැඹිලි පුන්කලස ධජපතාකාදියෙන් මහ සරසා ලද

පස්මල් ඉස මල් ගඳ විලවුන් ගල්වා උඩුවියන් බැඳ එහි මල් දම් එල්වා මල් ඇඟැරුවන් ඇඟැ ආදියෙන් සරසා පිපාසිත වූවන්ට බොනු පිණිස රා මස් ආදිය තබ්බවා පඤ්චාඞ්ගික තූර්‍යඝොෂායෙන් යුක්ත කරවා මහ සැරසුන-පූජකයාද රාජ භොජනය පමණ ඉක්මවා අනුභව කිරීමෙන් දිරවා ගත නොහැකිවූයේ එදවස් මධ්‍යම රාත්‍රියෙහි කලුරිය කෙළේය. රජ්ජුරුවෝ ඔහුගේ සිරුර මහත් පෙරහරින් ගෙනගොස් දවා බවුණාගේ නැකැතෙක් ඇත්නම් මේ වසතු ගනිත්වයි නුවර බෙරලවා නැ කෙනකුන් නොදැක ඒ වසතු රාජ භාණ්ඩාගාරයෙහිම තැබ්බවූහ.

ඉක්බිත්තෙන් සත්වැනි දවසෙහි සඳමහ රජ්ජුරුවෝ සියලු සෙනහ රැස් කරවා මහත් පිරිවරින් යුක්තව ජාලියකුමාරයන් හා කෘෂ්ණ ජිනාවන් ඇතුපිට නංවා ගෙන මාගීනායක කොට තුබූ පසුවලා හිද ක්‍රමයෙන් ගොස් වෙතිය රටට වන්හ. වෙතිය රජ්ජුරුවෝ දැක සතුටුව උපස්ථාන කොට සියු රහ සෙනහ පිරිවරා සඳමහ රජාණන් හා එක්ව නික්මුණාහ. ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හෙසාරවයෙන් හා පඤ්චාඞ්ගික තූර්‍යඝොෂාදි යෙන් යුක්තව යන්නාහු සැට යොදුන් මහාමාගීය ගෙවා වෙස්සන්තර රජ්ජුරු වන් වසන්නාවූ වඞ්කගිරි පර්වත ප්‍රදෙශයට පැමිණියාහුය.

ඉක්බිති බොධිසත්වයෝ හෙරිතුර්‍යඝොෂාවන් හා සඞ්ඛනාද හා ඇතුන් ගේ කුඤ්චනාද හා අසුන්ගේ හෙසාරව හා රථයන්හි චක්‍රනාද හා මෙසේ මහත්වූ ඝොෂා අසා මද්‍රි දෙවිට කියන්නාහු දෙවිනි! මපියාණන් වහන්සේ මහලු විසින් යම්කිසි සතුරු රජෙක් මපියාණන් මරා අප මෙහි වාසය කරන බව දැන අප කරා එන්නේදෝහෝයි පරීක්ෂා කරවයි කීහ. මද්‍රි දෙවි වඞ්ක ගිරි පර්වතයට නැඟී බලා මහත්වූ සෙනාව දැක තමන්ගේ සෙනාව වියයුතුයයි සිතා සවාමීනි! නුඹවහන්සේට කවර නම් සතුරු කෙනෙක් ඇද්ද? නුඹ පිය වර මැඩපියන සව කෙනෙක් ඇද්ද? සවාමීනි! එදවස් ශක්‍රදෙවෙන්ද්‍රයා කියන්නේ අපගේ දරුවන් මුතුන් මිත්තන් කරා ගොස් වන්හයි අනික් සත් දවසකින් නුඹවහන්සේ කරා එතියි කියේය. නුඹ පියාණන් වහන්සේ එන ගමනෙක් වනැයි කියා දෙදෙනම තමන් තමන්ගේ පන්සල් දෙරකඩට පැමිණ සිටියාහ.

ඉක්බිති සඳමහරජ්ජුරුවෝ තන්හි තන්හි ආරක්ෂා පිණිස ඇතුන් අසුන් ඇතුළු බලකාය හිඳුවා වඞ්කගිරි පර්වතයට ආසන්නව ගොස් තමන් ඇඹෙනියන් ථූසතිදෙවින් කැඳවා කියන්නාහු දෙවිනි! අපෙයලු දෙනම එක විට ගියකල්හි දරුවන් හා අප හා එකවිට දක්නා ශොක බොහෝය, පළමු මා හොස් උන් දැක ශොක සන්හිඳුවූ කල තොපි එවයි කියා රථයකට නැඟී නික්ම ගොස් රථය මහ රඳවා තුබූගොස් පන්සලට වැද කෙසරසිංහයකු සේ වැඩහුන් බෝසතාණන් දුටහ. බොධිසත්වයෝ පියාණන් දැක හුනස්නෙන් නැඟී පෙරගමන් කොට බැස හෙව වැඳ වැඩ හිඳිනා අසුන් පනවා වැඩහිඳුවූහ රජ්ජුරුවෝ බෝසතාණන් සුවදුක් විමාරු හුන් කලට මද්‍රිදෙවි මිසිලණුවන් දැක බැස ගොව වැඳ සුවදුක්විමාරු සවාමීනි! මා දරුවන් ගෙන ගිය බවුණු කොයිදී දුටුදැයි ඇසුවාය, සඳමහ රජ්ජුරුවෝ කියන්නාහු යෙහෙළණියෙනි! මාගේ රටදී දැක බවුණාට මිල දී ගලවා ගතිමියි කියත්ම බිසවුන්ට මහත්වූ සොම්නස් උපන.

ඉක්බිති බොධිසත්ත්වයන්ගේ මැනියෝ මහ පෙරහරින් යුක්තව බොධි සත්ත්වයන් වසන පන්සලට වන්හ. බෝසතාණන් හා මද්‍රදේවී මැනියන් වැඳ අසුන් පනවා වඩා හිඳුවා සුවදුක් විචාරා හුන්නාලට ජාලියකුමාරයන් හා කාෂ්ණජිනාවන් ඇතුළට නංවා පෙරටු කොටලා චෙතියරජ්ජුරුවන් ඇතුළුවූ රජදරුවෝ ඥාතියන් හා හෙරියුග්‍ය සඞ්ඝනාදයෙන්ද යුක්තව මහසෙනඟ පිරිවරා එනකල මද්‍රදේවී කුමාරයන් දැක හඬා හි පෙරමහට ගියහ. මැනියන් දැ දැක දරුදෙබිඩියන්ත ඇතු පිටින් බැස මැනියන් දෙපත්ලේ හිස තබා ගෙන හඬන්නට වන්හ. බිසවුන් දෙනනයෙන් කිරිධාරා විහිද දෙබිඩියන්නන් හිස් තෙම් ගියේය, බොධිසත්ත්වයෝද දෙබිඩියන්නන් දැක මහත්වූ ශොකයෙන් හඬා හුණහ. බොධිසත්ත්වයන්ගේ මවුපිය දෙදෙනද මහත්වූ ශොකයෙන් සිසන්න නැතිව හඬා හුණහ. චෙතිය රජ්ජුරුවන් ඇතුළුවූ රජදරුවෝද හඬා හුණහ. ඒ දැක බොධිසත්ත්වයන් හා සහජාතවූ සැටදහසක් යොධයන් හා මහසෙනඟ එකහෙළා මහපවතින් වැගිරි ගිය සල්වතයක් මෙන් මහහඬින් හඬා හුණහ. එකෙණෙහි මහාමේරුපර්වතය ආදි පර්වතයෝ තුගුළහ. මහමුහුද කල්පාන්ත මාරුතයෙන් ක්ෂොභවූ කලක් මෙන් කැලඹුණේය, කාමාවචර දිව්‍යලොකයන්හි එක කොලා හල විය.

එසඳ ශක්‍රදෙවෙන්ද්‍රයෝ රජදරුවෝ සයදෙන පිරිස් සහිතව සිසන්න නැතිව හොත්තාහු දැක එනකුදු නැඟිට කිසිවකුගේ සිරුරෙහි දියබින්දුවකුදු ඉසින්නට අසමර්ථ බව දැක පොකුරුවැස්සක් වස්වමියි සිතා ඒ ක්ෂත්‍රිය සමාගමයෙහි පොකුරුවැස්සක් වැස්වූහ. ඒ වැස්සෙන් තෙමෙනු කැමැත්තෝ තෙමෙති තොතෙමෙනු කැමැත්තන්ගේ සිරුරෙහි දිය බින්දුවකුදු නොවැටෙයි. ඒ පොකුරුවැස්සෙන් තෙම් සියලු ජනයෝ සිසන්න ලදින් විෂමයපත් බවට පැමිණ වෙසසතර රජ්ජුරුවන් ළඟට ගොස් කියන්නාහු සවාමීනි! නුඹවහන්සේගේ ගුණ නොදැන නුවරින් නහාපුම්හ. ඊට ක්ෂමා කොට අපගේ නුවරට අවුත් වොටුනු පැලඳ අප රක්ෂා කළ මැනවැයි යාච්ඤා කළහ. බොධිසත්ත්වයෝ ඒ අසා රට වැසියෙනි! මා වොටුනු පලඳවන්නට තෙපි අදහස් නොකරව්යයි කියා නොගිවිස්සාහ. නුවරවාසිහු යාච්ඤා කොට නොගිවිස්නා බැවි දැන රජ්ජුරුවන්ට කියන්නාහු සවාමීනි! අපි කිවද නොගිවිස්නාදැයි නුඹවහන්සේ යාච්ඤා කළ මැනවැයි කීහ. ඉක්බිති සඳමහරජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු පෙර මා කියමන් ගෙන මේවනයට ආවාදැ? නුඹත් මා කියමන් ගෙන වොටුනු පැලඳ රාජ්‍යය කරව, ගුරුන් කිවා කරන බව සත්පුරුෂයන්ට අයිති ධර්මයෙක. පුත්‍රයන් විසින් ජීවිත පරිත්‍යාගකොට නමුත් මවුපියන්ගේ ශොක දුරු කටයුතු වන්නේය, එබැවින් පුත්‍රය! තාපස වෙශය හැර රජවෙස් ගනුවයි කීහ.

බොධිසත්ත්වයෝ දෙමවුපියන්ගේ බස් මැඩපීම සුදුසු නොවන්නේ වේදැයි සිතා පියාණන්ගේ ආරාධනාව පිළි ගෙන පන්සලට වැද වල්කඩා අදුන් දිවිසම් ආදී සෘෂි භාණ්ඩ බහා තබා පන්සලින් නික්ම "මා සත්සමක් මහණදම් කොට පාරමී ධර්මයන් කුළුගන්වන්නහු විසින් පොළොව කම්පා කරවනලද තැනය"යි සලකා පන්සල වට තුන්වරක් ප්‍රදක්ෂිණා කොට පසඟ පිහිටුවා වැඳ අවුත් සහජාත සැටදහසක් යොධයන් විසින් පිළිගෙළ කරනලද සුවඳ දියෙන් නහා සළු හැඳ සුසැට ආභරණයෙන් සැරසී වොටුනු

පැලඳ දෙවෙන්දලීලායෙන් සිටියාහ. සියලු ජනයා මහත්වූ සන්තොෂයට පැමිණ මද්දි දෙවිඳුන්ද ඉස් සොඬා නහවා දිව්‍යාඞ්ගනාවකමෙන් සරහා වොටුකු පැලඳවූහ. එසඳ මහබෝසතාණන් බැලූ බැලූ තැන නවපාවිය. සියලු තුයිය්‍යෝමහත් ඝොෂා පැවැත්වූවාහුය, මහා සාගරය මෙඝගම්භීරාවක් සෙසින් මහත් ශබ්ද පැවැත්විය. අමාත්‍යයෝ **පණ්ඩර** නම් ඇළි ඇතු සඳ ගෙනාහ. බොධිසත්වයෝ ඇතු දැක රැහැනිව සිතන්නාහු මපියාණන් වහන්සේ මා දන් දුන් ඇතු ගෙන්වා ගත් දැ වනැයි සිතා ලජ්ජාවූහ. ඒ බව දත් නගර වාසිහු සවාමීනි! කලිහුරට රජ්ජුරුවෝ තමන් රට වැසි වැස ඔත්බුලත් සුල භවූ හෙයින් තුමූම ඇතු එවාපූහ. ඇතු පිට නැඟී වදාළ මැනැවැයි කිහ. බොධිසත්වයෝ ඇතු පිට නැඟී මහත් පෙරහරින් වඞ්කගිරිපර්‍යන්තයෙන් නික්ම ඒ්සමීපයෙහිවූ සඳමහ රජ්ජුරුවන්ගේ කඳවුරට පැමිණියහ. සඳමහ රජා ණෝද මසක් පමණ පිරිවර හා වනයෙහි කෙළ ඇවිද කඳවුරට පැමිණ වෙසසනතර රජ්ජුරුවන් හා සෙනා වාහන ගෙන ජයතුරුනුවරට යන අලඞ්කාරකොට පිළියෙළ කරනලද සැට ඔදුන් මහට පිළිපන්නාහුය. මෙසේ මහට පිළිපන් රජ්ජුරුවෝ දෙමසකින් ඒ මහ ගෙවා සම්පූර්ණාලඞ්කාරයෙන් සැරසූ ජයතුරු නුවරට පැමිණියහ. සියලු නුවරවාසීහු රැස්ව සතුටුව කෙළි මින් නටමින් පිළි හිස සිසාරමින් නොයෙක් කුහුලින් ආකුලව ඒ වෙසතුරු රජ්ජුරුවන් රජගෙට වඩා ගෙන ගියහ.

ඉක්බිති මේ නුවර මෙතැන් පටන් වෙසසනතර රජ්ජුරුවන්ගේ ආඥාව යයි අණබෙර ලැවූවාහුය. ඒ වෙසතුරු මහරජාණෝ යටත් පිරිසෙසින් බළලුන් දක්වා සියලු සත්වයන් බහිනයෙන් මිදවූහ. ඒ රජ්ජුරුවෝ නුවරට පැමිණි දිනයෙහිම අලුයම්කාලයෙහි සිතන්නාහු පහන්වූ කල මා ආ බැව් අසා යාචකයෝ පැමිණෙති, ඔවුන්ට කුමක් දන් දෙන්නෙම් දැයි සිතූහ. එකෙණෙහි සක්දෙවිරජාණන්ගේ පඬුපුල් සලස්න තමන් නොකැමැතිසේ උණුසුම් වූයේය. හෙතෙමේ ආවජ්ජනා කොට බලන්නේ ඒ කරුණ දැනූ රජ නිවෙසනය හාත්පස කවිප්‍රදෙශය පමණ උසට ඝන වශ්‍රාවක් මෙන් සත් රුවන් වශ්‍රාවක් වැස්වූයේය, සියලු ජයතුරු නුවරද දණක් පමණට සත් රුවන් වැසි වැස්වූයේය. දෙවැනි දවසෙහි බොධිසත්වයෝ නගරයෙහි ඒ ඒ ගෘහ සම්පයෙහි වට ධනය ඔවුන්ටම දෙවා අවශෙෂ ධනය භාණ්ඩාගාරයෙහි රැස්කරවා දන් වැට තබවා සදන්හල් කරවා සියලු සීවකයන්ට දන් දෙමින් සියලු ජනයා කුසල්හි පිහිටුවමින් දශරාජධර්මය අකෙප්‍ය කිරීමෙන් රාජ්‍යය කොට ජීවිතයාගේ කෙළවර සහ පිරිවරින් ගොස් තුසිපුර උපන්හ. තිලෝගුරු බුදුරජාණන්වහන්සේ **ගාථා දහසකින්** ප්‍රතිමණ්ඩිතවූ මේ **වෙසසනතර ජාතකය** දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගලපා ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ජූජක බමුණා නම් දැන් දෙවදත්ත ස්ථවිරයෝය, අම්තත නාප බැමිණි නම් විඤ්ඣමානවිකා වෝය, චෙතපුත්‍ර වැද්ද නම් ඡන්න අමාත්‍යයාය, අචුත තාපසයෝ නම් ශාරිපුත්‍ර ස්ථවිරයෝය, ශක්‍රයෝ නම් අනුරුඬ මහා ස්ථවිරයෝය. සඳමන රජ්ජුරුවෝ නම් ශුඬොදන රජ්ජුරුවෝය, ඵුසති දෙවී නම් මහාමායා දෙවිය, මද්දි දෙවී නම් යශොධරා


දෙවිය, ජාලිය කුමාරයෝ නම් රහුල සථවිරයෝය, කෘෂණාජිනාවෝ නම් උත්පලවණ්ණ මහාසථවිරිය, සෙසු පවත් නම් බුදුපිරිසය, එකල වලව ගොස් සත්මසක් තපස් කොට නැවත රාජ්‍යයට අවුත් දහරාජධර්මයෙන් රාජ්‍යයකොට තුසිත දිව්‍යලෝකයෙහි උපන්නාවූ වෙස්සන්තර රජුරුවෝ නම් ශ්‍රීලෝකුරු සම්‍යක්සම්බුදුරජවූ මම්මම වේදැයි තමන්වහන්සේ දන්වා වදාළසේක.

වෙස්සන්තර ජාතකය නිමි.

දහජාතක කථා වස්තුව සමාපතයි.

-(සිඹිරසතු.)-

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු